## සූත්‍රාන්ත පිටකයෙහි
10 වන ග්‍රන්ථය

# සංයුත්ත නිකාය
(චතුර්ථ භාගය)

## සළායතන වර්ගය

ත්‍රිපිටක පරිවර්තන කාරක සභායෙහි
සංයුත්තනිකාය ශෝධක මණ්ඩලය විසින්
සිංහල භාෂායෙන් පරිවර්තිත වැ

---

ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය විසින් පාඨශෝධන පූර්වක වැ
සංස්කරණය කරන ලදී.

---

ශ්‍රී බු. ව. 2557
රාජ්‍ය ව. 2013

Buddha Jayanti Tripitaka Series, Volume 19

The Tenth Book in the

**Suttanta-Pitaka**

**10**

# SAMYUTTANIKĀYA (IV)

## SALĀYATANAVAGGA

With the Sinhala Translation by

**The Samyuttanikāya Editorial Board of**
**The Tripitaka Translation Committee**

Revised and Edited by

**The Editorial Board of**
**The Tripitaka Translation Committee**

**Published by**
**Dharma Chakkra Child Foundation**
Rerukana Road, Veedagama, Bandaragama -12530, Sri Lanka
Tel: +94 38 2291771, Fax: +94 38 2291253, website: http:// www.samadhi-buddha.org /
**Co-published, printed and donated by**
**The Corporate Body of the Buddha Educational Foundation**
11F, 55 Hang Chow South Rd. Section 1, Taipei, Taiwan, R.O.C.
Tel: +886 2 23951198, Fax: +886 2 23913415
Email: overseas@budaedu.org; Website: http: // www.budaedu.org/
**B.E. 2557**
**C.E. 2013**

# සම්බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව නැවත මුද්‍රණය කිරීම.

බුදු රජාණන් වහන්සේගේ ඉගැන්වීම හැඳින්වීම සඳහා අනාදිමත් කාලයක සිට විවිධ යෙදුම් යොදා ගෙන ඇත. ධම්ම, ධම්ම-විනය, බුද්ධ වචන, පාවචන බුද්ධානුසාසන ආදිය මින් සමහරකි. දම්ම - විනය වැනි යෙදුම් බුදුරජාණන් වහන්සේ විසින්ම යොදාගෙන ඇත. මේ ධම්ම විනය අඩංගු වී ඇත්තේ ත්‍රිපිටකයෙහිය. පිටක යන්න කූඩය, භාජනය යන අරුත්වල පාලි හා සංස්කෘත යන භාෂාවන් හි යෙදේ. සංස්කෘත භාෂාවෙන් ත්‍රිපිටක නැතහොත් පාලි භාෂාවෙන් තෙපිටක යන්නෙන් අදහස් කෙරෙන්නේ එවන් පිටක තුනකින් සමන්විත එකතුවකි. පාලි ත්‍රිපිටකය බුදු රජාණන් වහන්සේ ගේ ඉගැන්වීම් අඩංගු පැරණිතම මූලාශ්‍රය වශයෙන් ථෙරවාද සම්ප්‍රදාය මගින් පිළිගනු ලැබේ.

චිරාගත ථෙරවාද සම්ප්‍රදාය වන්නේ ත්‍රිපිටකය බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ගතවුණු පසුව මහා කස්සප මහා රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් අජාතශත්‍රැ මහරජතුමන්ගේ ප්‍රධාන දායකත්වයෙන් රජගහ නුවර වේභාර පර්වත අසබඩ සප්තපර්ණී ගුහාවෙහි පන්සියයක් මහරහතන් වහන්සේගේ සහභාගීත්වයෙන් පැවැත්වුණු ප්‍රථම ධර්ම සංගායනාවේ දී සජ්ඣායනය කොට අනුමත කෙරුණු බවය. මෙම ත්‍රිපිටකය සමන්විත වන්නේ විනය පිටකය, සුත්ත පිටකය හා අභිධම්ම පිටකය යන පිටකත්‍රයෙනි.

මෙසේ ප්‍රථම සංගායනාවේදී ඊට සහභාගී වුණු මහා රහතන් පන්සියයක් දෙනා වහන්සේලා විසින්ම ඒකමතිකව පිළිගනු ලැබුණු ත්‍රිපිටකය එතැන් පටන් රහතන් වහන්සේලා කණ්ඩායම් මගින් මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන එනු ලැබුණු අතර, ඉන් වසර සියයකට පසු කාලාශෝක රජු දවස විශාලා මහනුවර පැවැත්වුණු දෙවන ධර්ම සංගායනාවේ දී හා ඉන් අනතුරුව ධර්මාශෝක රජු සමයේ දී පාටලී පුත්‍ර නගරයේ දී පැවැත්වුණු තුන්වන සංගායනාවේ දී ද සජ්ඣායන කොට අනුමත කරනු ලැබිණි.

මිහිඳු මහා රහතන් වහන්සේ ප්‍රමුඛව ධර්ම දූතයන් වහන්සේලා විසින් ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබුනේ මෙලෙස සංගීති තුනකදී සජ්ඣායනා කරනු ලැබ, අනුමතව කෙරුණු ත්‍රිපිටකයය. ශ්‍රී ලංකාවේ දී ද අඛණ්ඩව මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන එනු ලැබුණු සම්මා සම්බුද්ධ දේශනාව අඩංගු ත්‍රිපිටකය ක්‍රි.පූ. පළමුවන සියවසේ අගභාගයේ දී පමණ වළගම්බා රජු දවස මාතලේ අළුවිහාරයේ දී ග්‍රන්ථාරූඪ කෙරුණු බව වංස කථාවල දැක්වේ. දැනට භාවිතයේ පවතින පාලි ත්‍රිපිටකයට පාදක වී ඇත්තේ මෙලෙස මහා සංඝරත්නය විසින් ජීවිත පූජාවෙන් ඇප කැපවී නිර්මලව සුරක්ෂිත කොට ගෙන ආ මේ ත්‍රිපිටකයය.

ත්‍රිපිටකයේ විනය පිටකයට මහා විභංග හා භික්ෂුණී විභංග යන දෙකොටස අඩංගු සුත්ත විභංගය ද, මහා වග්ග හා චුල්ලවග්ග යන දෙකොටස අඩංගු ඛන්ධකයන් ද පරිවාර නම් කොටස ද ඇතුළත් ය. විනය පිටකයේ ගොනු කොට ඇත්තේ භික්ෂු-භික්ෂුණී චරියාව සකසා ගැනීමට අදාල නීති මාලාවන්ය.

ධර්මය අතින් ඉතා වැදගත් වන්නේ සූත්‍ර පිටකයය. මෙයට දීඝනිකාය, මජ්ඣිමනිකාය, අංගුත්තර නිකාය සහ ඛුද්දක නිකාය අයත් ය.

සුත්ත පිටකයේ අඩංගු ධර්මයේ සාරය ඉතා ක්‍රමවත්ව ඉදිරිපත් කරමින්, විශ්ලේෂණය කොට අර්ථකථන ඉදිරිපත් කෙරෙන්නේ අභිධර්ම පිටකයෙනි. ඊට ධම්මසංගීති, විභංග, ධාතු කථා, පුග්ගලපඤ්ඤත්ති, කථාවත්ථු, යමක, පට්ඨාන යන ග්‍රන්ථ හත ඇතුළත් ය.

මෙම සම්පූර්ණ ත්‍රිපිටකය අද අපට ඉතිරිව ඇත්තේ පුරාණයේ වැඩ විසූ මහා සංඝරත්නය අප්‍රතිහත ධෛර්යයෙන් හා ඉමහත් කැපවීමෙන් එය සුරක්ෂිත කොටගෙන, ඉමහත් වෙහෙස දරා පුස්කොළ පොත්වල

ලේඛන ගතකොට ප්‍රචලිත කිරීමේ හේතුවෙනි. විනයධර - ධර්මධර පුරාණ මහා සංඝයා වහන්සේලා අනුව යමින් වත්මන් මහා සංඝපීතෘවරයන් වහන්සේලා ද ත්‍රිපිටකය ආරක්ෂා කොට ප්‍රචලිත කිරීමේ කාර්යභාරයට උරදුන් හේතුවෙන් ත්‍රිපිටකයෙහි පාලි පෙළ හා එහි සිංහල අනුවාද සකස් කොට පළ කිරීමට අවස්ථාව උදාවීම ධර්මලැදි සැමගේම භාග්‍යයක් බව අමුතුවෙන් කිවයුතු නැත. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා නම් ශීර්ෂය යටතේ ශ්‍රී ලංකා රජය මගින් මුද්‍රණය කොට පළ කරන්නට යෙදුණු සිංහල අනුවාදය සහිත මෙම ත්‍රිපිටක ග්‍රන්ථමාලාව පිටපත් අවසන් වී දැන් බොහෝ කලක් ගත වී ඇත.

මෙම ත්‍රිපිටක ග්‍රන්ථ ලබා ගැනීමට ඉමහත් ආශාවෙන් විශාල පිරිසක් සිටින බව අපට දැනගන්නට ලැබුණි. ත්‍රිපිටකය චිරාත් කාලයක් පවත්වාගෙන යාමට කටයුතු යෙදීමත්, දහම් ලැදි සැදැහැවත් ගිහි පැවිදි දෙපිරිසගේම ධර්මාවබෝධය සහ ධර්මසංවේගය සඳහා ත්‍රිපිටකය ප්‍රචලිත කොට සුලභ කිරීමත් වර්තමාන මහා සංඝයාවහන්සේ මත අනිවාර්යයෙන් ම පැවරෙන භාරදූර වගකීමකි. වත්මන් සමාජය දෙස බලන විට මෙවන් කර්තව්‍යයක අවශ්‍යතාව වඩා ඉස්මතු වී පෙනන බව කාහටත් පැහැදිලි වනු ඇත.

නොයෙකුත් විද්වත් බෞද්ධ පිරිස් සමඟ කතා බහ කිරීමේදී අපට ඒත්තු ගියේ මෙම අවශ්‍යතාව සපුරාලීමට ගතයුතු ඉතා ඵලදායී ක්‍රියාමාර්ගය නම්, දැනට ලබා ගැනීමට නොහැකි බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව නැවත මුද්‍රණද්වාරයෙන් පළ කිරීම බවයි. මෙම අති විශාල කර්තව්‍යය සඳහා මාගේ කාරුණික ඉල්ලීම අනුව තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනම ඉදිරිපත් වීම සැදැහැවත් සිංහල පාඨකයින්ගේ මහත් භාග්‍යයක් බව අපේ හැඟීමයි.

මෙම ත්‍රිපිටක ග්‍රන්ථ උනන්දුවෙන් පරිශීලනය කිරීම මගින් ධර්මඥානය වර්ධනය කර ගැනීමට මෙන්ම ධාර්මික ජීවිත සකසා ගැනීමට ද සැදැහැවත් ඔබ සැම උත්සුක වනු ඇතැයි සිතමි.

**තෙරුවන් සරණයි.**

## බෝදාගම චන්දිම නායක ස්ථවිර

**තායිවානයේ ප්‍රධාන සංඝනායක තායිපේ ශ්‍රී රතනජෝති ථේරවාදී බෞද්ධ මධ්‍යස්ථානාධිපති**
**බණ්ඩාරගම ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනමේ නිර්මාතෘ රත්මලාන ශ්‍රී විජයාරාම විහාර වාසී**

ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනම,
වීදාගම,
බණ්ඩාරගම.

2557
—
2013

බුද්ධ ජයන්ති ත්‍රිපිඨක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කොට නොමිලේ

බෙදා හැරීමේ මහා පුණ්‍ය කර්මය

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක

වි.ජ.මු ලොකුබණ්ඩාර මැතිතුමාගේ ඉල්ලීම පරිදි

තායිවානයේ ප්‍රධාන සංඝනායක

## ආචාර්ය බෝදාගම චන්දිම නාහිමියන්ගේ අනුශාසනා පරිදි

## තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනම

මගින් බුද්ධ වර්ෂ 2549 (ක්‍රි. ව. 2005) දී ආරම්භ කරන ලදි.

මෙම මහා පුණ්‍ය කර්මයේ දී ඉත සිතින් කටයුතු කළ පහත සඳහන් මහා සංඝරත්නය හා උපකාරක පිංවතුන් විශේෂයෙන් සිහිපත් කරමු.

- පූජ්‍ය අත්තුඩාවේ ඤාණානන්ද නාහිමි
- පූජ්‍ය කන්ඩක්කුලමේ ධම්මකිත්ති නාහිමි
- ආචාර්ය පූජ්‍ය පල්ලේවෙල සාරද හිමි
- ශාස්ත්‍රවේදී පූජ්‍ය කුඹුක්වැවේ පඤ්ඤාකිත්ති හිමි
- දර්ශනපති පූජ්‍ය කරගහඋල්පත සුගතනන්ද හිමි
- ශාස්ත්‍රපති පූජ්‍ය නාගොඩ අමරවංශ නාහිමි
- ශාස්ත්‍රපති පූජ්‍ය මඩපාත ධම්මසාර නාහිමි
- පූජ්‍ය බබරුන්දේ ධම්මසිරි හිමි
- පූජ්‍ය පානදුරේ පසන්න හිමි
- මිලිනා සුමතිපාල මැතිණිය
- ජගත් සුමතිපාල මැතිතුමා
- ආචාර්ය ප්‍රණීත් අබේසුන්දර මහත්මා
- දොස්තර අරුණ රබෙල් මහත්මා
- සුජිත් මොහොට්ටි මහත්මා
- රංජිත් අමරසිංහ මහත්මා
- ගාමිණී කාරියවසම් මහත්මා
- අධිනීතිඥ චන්ද්‍රදාස සූරියාරච්චි මහත්මා
- ආචාර්ය සෙනරත් විජේසුන්දර මහත්මා
- මහාචාර්ය චන්ද්‍ර වික්‍රමගමගේ මහතා
- සිරිසේන හේරත් මැතිතුමා
- විල්ප්‍රඩ් අබේවර්ධන මැතිතුමා

*සියලු දෙනාට රත්නත්‍රයේ ආශිර්වාදයෙන් ධර්මාවබෝධය පහලවේවායි ප්‍රාර්ථනා කරමු.*

සුත්තන්තපිටකෙ

# සංයුත්තනිකායො

චතුත්ථො භාගො

## සළායතනවග්ගො

සූත්‍රාන්තපිටකයෙහි

# සංයුත්තනිකාය

චතුර්ථ භාගය

## ෂඩායතන වර්ගය

"තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡන්නො."

"මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය හා විනය විවෘත වූයේ බබළයි. වැසුණේ නො ම බබළයි."

(අඞ්ගුත්තරනිකාය, තිකනිපාත – හරණ්ඩුවග්ග, 9 සූත්‍රය)

# පටුන
# CONTENTS


| | | | | පිටු |
|---|---|---|---|---|
| සංස්කාරක නිවේදනය | ... | .. | ... | xi |
| ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය | | ... | ... | xiii |
| සඞ්කේත නිරූපණය | .. | ... | ... | xiv |
| පාළි හෝඩිය | ... | ... | ... | xv |
| සළායතනවග්ග විසය සූචිය | | ... | ... | xvii–xxx |
| පෙළ හා පරිවර්තනය | ... | ... | ... | 2–709 |
| ගාථාදිපාද – අනුක්කමණිකා | | ... | ... | 711 |
| සඤ්ඤානාම – අනුක්කමණිකා | | ... | ... | 713–714 |
| විසෙසපදනුක්කමණිකා | ... | ... | ... | 715–719 |
| ශුද්ධාශුද්ධ නිරූපණය | ... | ... | ... | 720–721 |

# සංස්කාරක නිවේදනය

බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලායෙහි සොළොස් (16) වැනි ග්‍රන්ථය වශයෙන් ද, සූත්‍රාන්තපිටකයෙහි දසවැනි ග්‍රන්ථය වශයෙන් ද සම්මත කළ, සංයුත්තනිකායෙහි සතරවැනි 'සළායතනවග්ග'ය **ශ්‍රී ලංකා බෞද්ධමණ්ඩලය** විසින් සිංහල භාෂායෙන් නඟාලීම සඳහා පවරන ලදුයේ විද්‍යෝදය **පිරිවෙන්හි** ආචාර්ය රාජකීය **පණ්ඩිත ගලගම සරණංකර ස්ථවිරයන්** වහන්සේට ය. උන් වහන්සේ විසින් යථාකාලයෙහි නිමහම් කළ එ මැ පරිවර්තනය සංයුත්තනිකාය සංශෝධක මණ්ඩලයට අයත් **පණ්ඩිත හැගොඩ ධම්මින්ද, පණ්ඩිත වතුගෙදර අමරසීහ, පණ්ඩිත ගලගම සරණංකර** යන තෙරවරුන් විසින් පාළියෙහි ලිපිදෝෂාදිය බැහැර කොට පාඨාන්තර යොදා සිංහල පරිවර්තනය සකස් කරන ලද්දේ ය.

ත්‍රිපිටක සංස්කාරකමණ්ඩලයෙහි ප්‍රධාන සම්පාදක ධුරය දැරූ **දර්ශනවිශාරද පරවාහැර සිරි වජිරඤාණ නාහිමිපාණන්** වහන්සේගේ මාර්ගෝපදෙශ අනුවැ පෙයියාලමුඛ, සූත්‍රනාම, සූත්‍රසංඛ්‍යා ආදිය ද යථෝක්ත මණ්ඩලය මගින් මැ සකස් විය.

මුද්‍රණ අවස්ථාවට පැමිණ වර්තමාන ත්‍රිපිටක සම්පාදක මණ්ඩලයේ මහතෙරවරුන්ගේ විශේෂ පරිශ්‍රමයෙන් මහාවිහාරාන්වයෙහි ආගත වාචනාමාර්ගය සලකමින් පාඨශෝධනය ද, සිහබසෙහි වාක්සම්ප්‍රදය සුරක්ෂිත වනසේ පරිවර්තනය ද බෙහෙවින් සකස් කරන ලද්දේ විය.

විවිධ හේතූන් නිසා ත්‍රිපිටක ග්‍රන්ථයන්ගේ මුද්‍රණය මෙතෙක් ප්‍රමාද වෙමින් පැවැති නමුදු ශ්‍රීලංකාද්වීපයෙහි **අතිගරු ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන** උතුමාණන්ගේ කාරුණික අනුග්‍රහය ද, ගරු සංස්කෘතික අමාත්‍ය තැන්පත් **ඊ. ඇල්. බී. හුරුල්ලේ** මැතිතුමාණන්ගේ මෙහෙයීම ද, සංස්කෘතික අතිරේක ලේකම් **සෝමපාල ජයවර්ධන** මහතාණන්ගේ බුද්ධිපූර්වක උද්‍යෝගය ද නිසා සංයුත්තනිකායෙහි මෙ මැ සතරවැනි භාගය මෙසේ නිමහම් කරන්නට හැකි විය. **මෙහි තෘතීය භාගය** රජයේ මුද්‍රණාලයෙහි මුද්‍රණය වෙමින් පවත්නේ යි.

තවද ආරම්භක බෞද්ධමණ්ඩලයෙහි හැම සුධීන් හා මෙ මැ සත් කාර්යයෙහි සහාය වන හැමදෙන ද **'තිසර'** මුද්‍රණාලයාධිකාරීහු ද සද්ධර්මප්‍රවර්තක කුශල හේතුයෙන් සුබභාගී වෙත්වායි ආශංසනය කරම්හ.

මෙවගට, ශාසනෝදයකාරී,

**ලබුගම ලංකානන්ද**

මහානායකස්ථවිර

ත්‍රිපිටකමණ්ඩලයේ ප්‍රධාන සම්පාදක.

**1981 නොවැම්බර්මස 28 වැනි දින**
**ත්‍රිපිටකකාර්යාලයේ දී ය.**
**115, විජේරාම මාවත**
**කොළඹ 7.**

# ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය

**උපදේශක :**

අග්ගමහාපණ්ඩිත, බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය මහානායක මහාස්ථවිරපාදයන් වහන්සේ.

**සභාපති :**

අහංගම විද්‍යාචන්ද්‍රපරිවෙණාධිපති, ත්‍රිපිටකවාගීශ්වරාචාර්‍ය්‍ය, කෝදගොඩ ශ්‍රී ඥානාලොක දක්ෂිණලඞ්කායෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

**ප්‍රධාන සම්පාදක :**

මොල්ලිගොඩ ප්‍රවචනෝදය පරිවෙණාධිපති ත්‍රිපිටකවාගීශ්වර, ලබුගම ශ්‍රී ලඞ්කානන්ද — කෝට්ටෙ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඞ්ඝ සභායෙහි මහානායක ස්ථවිරයන් වහන්සේ.

**සම්පාදක :**

කිරුළපන පූර්වාරාමාධිපති හා අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්ම පීඨාධිපති, ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, රද්දල්ලේ ශ්‍රී ප්‍රඥාලොක — කෝට්ටෙ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඞ්ඝසභායෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

හෙරලියාවල ශ්‍රී සුධර්මාරාමාධිපති, ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, වේඩරුවේ ශ්‍රී අනවමදර්ශී අනුනායක ස්ථවිරයන් වහන්සේ.

හිඟුලේ—මාකඩවරවිහාරාධිපති, රාජකීය පණ්ඩිත, කරහම්පිටිගොඩ සුමනසාර ස්ථවිරයන් වහන්සේ.

කොළඹ තිඹිරිගස්යායේ අශෝකාරාමාධිපති, රාජකීය පණ්ඩිත, කරදන ශ්‍රී ප්‍රඥාලඞ්කාර නායක ස්ථවිරයන් වහන්සේ.

අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්මපීඨයෙහි, ත්‍රිපිටක අංශයෙහි මහාචාර්‍ය්‍ය, ශාස්ත්‍රාචාර්‍ය්‍ය, රාජකීය පණ්ඩිත, උඩුවේ ජනානන්ද ස්ථවිරයන් වහන්සේ.

**ලේකම් :**

කොළඹ බෞද්ධාලෝක මාවතෙහි බෞද්ධාලෝක විහාරාධිපති, පණ්ඩිත, දෙරගමුවේ සිරි ධම්මපාල—කොළඹදිශායෙහි ප්‍රධාන සඞ්ඝ නායක ස්ථවිරයන් වහන්සේ.

# සංකේත නිරූපණය

සී 1. පැල්මඩුල්ල මහාවිහාරයෙහි පුස්කොළ පොත

සී 2. ගාල්ල පරමානන්ද විහාරයෙහි පුස්කොළ පොත

සිමු. සිංහලාක්ෂර-මුද්‍රිත සංයුත්තනිකාය

සයා. තායාක්ෂර-මුද්‍රිත සංයුත්තනිකාය

මඡසං. බුරුමරට ඡට්ඨසංගීතිශෝධිත සංයුත්තනිකාය

PTS. Pali Text Society Edition.

# THE PALI ALPHABET

## IN SINHALA CHARACTERS

## VOWELS

අ a  ආ ā  ඉ i  ඊ ī  උ u  ඌ ū  එ ē  ඔ ō

## CONSONANTS

| | | | | |
|---|---|---|---|---|
| ක ka | ඛ kha | ග ga | ඝ gha | ඞ ṅa |
| ච ca | ඡ cha | ජ ja | ඣ jha | ඤ ña |
| ට ṭa | ඨ ṭha | ඩ ḍa | ඪ ḍha | ණ ṇa |
| ත ta | ථ tha | ද da | ධ dha | න na |
| ප pa | ඵ pha | බ ba | භ bha | ම ma |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ය ya | ර ra | ල la | ව va | ස sa | හ ha | ළ ḷa | අං ṃ |
| ක ka | කා kā | කි ki | කී kī | කු ku | කූ kū | කෙ kē | කො kō |
| ඛ kha | ඛා khā | ඛි khi | ඛී khī | ඛු khu | ඛූ khū | ඛෙ khē | ඛො khō |
| ග ga | ගා gā | ගි gi | ගී gī | ගු gu | ගූ gū | ගෙ gē | ගො gō |

## CONJUNCT-CONSONANTS

| | | | |
|---|---|---|---|
| ක්ක kka | ඤ්ඤ ñña | ත්‍ර tra | ම්ඵ mpha |
| ක්ඛ kkha | ඤ්හ ñha | ද්ද dda | ම්බ, ඹ mba |
| ක්‍ය kya | ඤ්ච ñca | ද්ධ ddha | ම්භ mbha |
| ක්‍රි kri | ඤ්ඡ ඤ්ඡ ñcha | ද්‍ර dra | ම්ම mma |
| ක්ව kva | ඤ්ජ ñja | ද්ව, ද්ව dva | ම්හ mha |
| ඛ්‍ය khya | ඤ්ඣ ñjha | ධ්ව dhva | ය්‍ය, ය්‍ය yya |
| ඛ්ව khva | ට්ට ṭṭa | න්ත nta | ය්හ yha |
| ග්ග gga | ට්ඨ, ට්ඨ ṭṭha | න්ථ ntha | ල්ල lla |
| ග්ඝ ggha | ඩ්ඩ ḍḍa | න්ද nda | ල්‍ය lya |
| ඞ්ක ṅka | ඩ්ඪ ḍḍha | න්ධ ndha | ල්හ lha |
| ග්‍ර gra | ණ්ණ ṇṇa | න්න nna | ව්හ wha |
| ඞ්ඛ ṅkha | ණ්ට ṇṭa | න්හ nha | ස්ස ssa |
| ඞ්ග ṅga | ණ්ඨ ṇṭha | ප්ප ppa | ස්ම sma |
| ඞ්ඝ ṅgha | ණ්ඩ, ණ්ඩ ṇḍa | ප්ඵ ppha | ස්ව sva |
| ච්ච cca | ත්ත tta | බ්බ bba | හ්ම hma |
| ච්ඡ ccha | ත්ථ ttha | බ්භ bbha | හ්ව hva |
| ජ්ජ jja | ත්ව tva | බ්‍ර bra | ළ්හ ḷha |
| ජ්ඣ jjha | | ම්ප mpa | |

ා ā  ි i  ී ī  ු ු u  ූ ූ ū  ෙ ē  ො ō

# සංයුත්තනිකායො

## චතුත්ථො භාගො

# සළායතනවග්ග – විසයසූචි


## 1. වෙදනාසංයුත්තං 2 – 449

### 1 අනිච්චවග්ගො 2–13

1. අජ්ඣත්තානිච්ච සුත්තං .. .. 2 – 5
2. අජ්ඣත්තදුක්ඛ ,, .. .. 4 – 5
3. අජ්ඣත්තානත්ත ,, .. .. 6 – 7
4. බාහිරානිච්ච ,, .. .. 6 – 7
5. බාහිරදුක්ඛ ,, .. .. 8 – 9
6. බාහිරානත්ත ,, .. .. 8 – 9
7. දුතියඅජ්ඣත්තානිච්ච ,, .. .. 8 – 11
8. දුතියඅජ්ඣත්තදුක්ඛ ,, .. .. 10 – 11
9. දුතියඅජ්ඣත්තානත්ත ,, .. .. 10 – 11
10. දුතියබාහිරානිච්ච ,, .. .. 12 – 13
11. දුතියබාහිරදුක්ඛ ,, .. .. 12 – 13
12. දුතියබාහිරානත්ත ,, .. .. 12 – 13

### 2. යමකවග්ගො 14–29

1. සම්බාධ සුත්තං .. .. 14 – 15
2. දුතියසම්බාධ ,, .. .. 16 – 17
3. අස්සාදපරියෙසන ,, .. .. 18 – 19
4. දුතියඅස්සාදපරියෙසන සුත්තං .. .. 20 – 21
5. නොචෙඅස්සාද ,, .. .. 20 – 23
6. දුතියනොචෙඅස්සාද ,, .. .. 24 – 25
7. අභිනන්දන ,, .. .. 26 – 27
8. දුතියඅභිනන්දන ,, .. .. 28 – 29
9. උප්පාද ,, .. .. 28 – 29
10. දුතියඋප්පාද ,, .. .. 28 – 29

### 3. සබ්බවග්ගො 30–55

1. සබ්බ සුත්තං .. .. 30 – 31
2. පහාන ,, .. .. 30 – 31
3. දුතියපහාන ,, .. .. 32 – 33
4. අපරිජාන ,, .. .. 32 – 37
5. දුතියඅපරිජාන ,, .. .. 36 – 39

## විසය සූචි

## 1. වෙදනාසංයුත්තං 2–449

### 3. සබ්බවග්ගො 30–55


6. ආදිත්තපරියාය සුත්තං .. .. 38 – 43
7. අන්ධභූත ,, .. .. 42 – 45
8. සාරුප්පපටිපද ,, .. .. 44 – 47
9. සප්පායපටිපද ,, .. .. 46 – 51
10. දුතියසප්පායපටිපද .. .. 50 – 55


### 4. ජාතිධම්මවග්ගො 56–61


1. ජාතිධම්ම සුත්තං .. .. 56 – 57
2. ජරාධම්ම ,, .. .. 58 – 59
3. ව්‍යාධිධම්ම ,, .. .. 58 – 59
4. මරණධම්ම ,, .. .. 58 – 59
5. සොකධම්ම ,, .. .. 58 – 59
6. සංකිලෙසධම්ම .. .. 58 – 59
7. ඛයධම්ම ,, .. .. 58 – 59
8. වයධම්ම ,, .. .. 58 – 59
9. සමුදයධම්ම ,, .. .. 58 – 59
10. නිරොධ ධම්ම .. .. 60 – 61


### 5. සබ්බානිච්චවග්ගො 62–67


1. අනිච්ච සුත්තං .. .. 62 – 63
2. දුක්ඛ ,, .. .. 62 – 63
3. අනත්ත ,, .. .. 62 – 63
4. අභිඤ්ඤෙය්‍ය ,, .. .. 62 – 63
5. පරිඤ්ඤෙය්‍ය ,, .. .. 64 – 65
6. පහාතබ්බ ,, .. .. 64 – 65
7. සච්ඡිකාතබ්බ ,, .. .. 64 – 65
8. අභිඤ්ඤෙය්‍ය–පරිඤ්ඤෙය්‍ය .. .. 64 – 65
9. උපද්දුත ,, .. .. 64 – 65
10. උපස්සට්ඨ ,, .. .. 64 – 67


පඨමො පණ්ණාසකො

## විසය සූචි

## 1. වෙදනා සංයුත්තං 2 – 449

### 6. අවිජ්ජාවග්ගො 68 – 79


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | අවිජ්ජාපහාන | සුත්තං | .. | .. | 68 – 69 |
| 2. | සඤ්ඤොජනපහාන | ,, | .. | .. | 70 – 71 |
| 3. | සඤ්ඤොජනසමුග්ඝාත | ,, | .. | .. | 70 – 71 |
| 4. | ආසවප්පහාන | ,, | .. | .. | 72 – 73 |
| 5. | ආසවසමුග්ඝාත | ,, | .. | .. | 72 – 73 |
| 6. | අනුසයප්පහාන | ,, | .. | .. | 72 – 73 |
| 7. | අනුසයසමුග්ඝාත | ,, | .. | .. | 74 – 75 |
| 8. | සබ්බූපාදනපරිඤ්ඤා | ,, | .. | .. | 74 – 77 |
| 9. | සබ්බූපාදනපරියාදන | ,, | .. | .. | 76 – 77 |
| 10. | දුතියසබ්බූපාදනපරියාදන | | .. | .. | 78 – 79 |


### 7. මිගජාලවග්ගො 80 – 101


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | මිගජාල | සුත්තං | .. | .. | 80 – 83 |
| 2. | දුතිය මිගජාල | ,, | .. | .. | 82 – 85 |
| 3. | සමිද්ධි–මාරපඤ්හා | ,, | .. | .. | 86 – 87 |
| 4. | සමිද්ධි–සත්තපඤ්හා | ,, | .. | .. | 86 – 89 |
| 5. | සමිද්ධි–දුක්ඛපඤ්හා | ,, | .. | .. | 88 – 89 |
| 6. | සමිද්ධි–ලොකපඤ්හා | ,, | .. | .. | 88 – 91 |
| 7. | උපසෙන | ,, | .. | .. | 90 – 93 |
| 8. | උපවාණ | ,, | .. | .. | 92 – 95 |
| 9. | පඨමඡඵස්සායතන | ,, | .. | .. | 94 – 97 |
| 10. | දුතියඡඵස්සායතන | ,, | .. | .. | 96 – 99 |
| 11. | තතියඡඵස්සායතන | ,, | .. | .. | 98 – 101 |


### 8. ගිලානවග්ගො 102–119


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | ගිලාන | සුත්තං | .. | .. | 102 – 105 |
| 2. | දුතිය ගිලාන | ,, | .. | .. | 106 – 109 |
| 3. | අනිච්ච | ,, | .. | .. | 108 – 111 |
| 4. | දුක්ඛ | ,, | .. | .. | 110 – 111 |
| 5. | අනත්ත | ,, | .. | .. | 110 – 113 |
| 6. | අවිජ්ජා | ,, | .. | .. | 112 – 113 |
| 7. | දුතිය අවිජ්ජා | ,, | .. | .. | 114 – 115 |
| 8. | සම්බහුලභික්ඛු | ,, | .. | .. | 114 – 117 |
| 9. | ලොක | ,, | .. | .. | 116 – 119 |
| 10. | ඵග්ගුණ | ,, | .. | .. | 118 – 119 |

විසය සූචි

## 1. වේදනා සංයුත්තං 2–449

### 9. ඡන්නවග්ගො 120–151


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | පලොකධම්ම | සුත්තං | .. | .. | 120 – 121 |
| 2. | සුඤ්ඤලොක | ,, | .. | .. | 120 – 123 |
| 3. | සඞ්ඛිත්තධම්ම | ,, | .. | .. | 122 – 125 |
| 4. | ඡන්න | ,, | .. | .. | 124 – 133 |
| 5. | පුණ්ණ | ,, | .. | .. | 132 – 139 |
| 6. | බාහිය | ,, | .. | .. | 138 – 141 |
| 7. | එජා | ,, | .. | .. | 142 – 145 |
| 8. | දුතියඑජා | ,, | .. | .. | 144 – 147 |
| 9. | ද්වය | ,, | .. | .. | 146 – 147 |
| 10. | දුතියද්වය | ,, | .. | .. | 148 – 151 |


### 10. ඡළවග්ගො 152–179


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | ඡඵස්සායතන | සුත්තං | .. | .. | 152 – 155 |
| 2. | මාලුඞ්ක්‍යාපුත්ත | ,, | .. | .. | 156 – 163 |
| 3. | පරිහානධම්ම | ,, | .. | .. | 164 – 167 |
| 4. | පමාදවිහාරී | ,, | .. | .. | 166 – 169 |
| 5. | සංවර | ,, | .. | .. | 168 – 171 |
| 6. | සමාධි | ,, | .. | .. | 170 – 171 |
| 7. | පටිසල්ලාන | ,, | .. | .. | 172 – 173 |
| 8. | නතුම්හාක | ,, | .. | .. | 172 – 175 |
| 9. | දුතියනතුම්හාක | ,, | .. | .. | 174 – 177 |
| 10. | උද්දක | ,, | .. | .. | 176 – 179 |


### දුතියො පණ්ණාසකො

### 11. යොගක්ඛෙමිවග්ගො 180–193


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | යොගක්ඛෙමි | සුත්තං | .. | .. | 180 – 181 |
| 2. | උපාදය | ,, | .. | .. | 180 – 183 |
| 3. | දුක්ඛසමුදය | ,, | .. | .. | 182 – 185 |
| 4. | ලොකසමුදය | ,, | .. | .. | 184 – 187 |
| 5. | සෙය්‍ය | ,, | .. | .. | 186 – 187 |
| 6. | සඤ්ඤොජන | ,, | .. | .. | 188 – 189 |
| 7. | උපාදාන | ,, | .. | .. | 188 – 189 |
| 8. | පරිජානන | ,, | .. | .. | 188 – 189 |
| 9. | දුතියපරිජානන | ,, | .. | .. | 190 – 191 |
| 10. | උපස්සුති | ,, | .. | .. | 190 – 193 |

## 12. ලොකකාමගුණවග්ගො 194–225


| | | | | |
|---|---|---|---|---|
| 1. | මාරපාස සුත්තං | .. | .. | 194 – 195 |
| 2. | දුතිය මාරපාස ,, | .. | .. | 196 – 197 |
| 3. | ලොකන්තගමන ,, | .. | .. | 196 – 205 |
| 4. | කාමගුණ ,, | .. | .. | 204 – 213 |
| 5. | සක්කපඤ්හ ,, | .. | .. | 212 – 215 |
| 6. | පඤ්චසිඛපඤ්හ ,, | .. | .. | 214 – 217 |
| 7. | සාරිපුත්තසද්ධිවිහාරික | .. | .. | 216 – 219 |
| 8. | රාහුලොවාද ,, | .. | .. | 220 – 223 |
| 9. | සංයොජනිය ,, | .. | .. | 224 – 225 |
| 10. | උපාදාන ,, | .. | .. | ,, ,, |


## 13. ගහපතිවග්ගො 226–251


| | | | | |
|---|---|---|---|---|
| 1. | වෙසාලි සුත්තං | .. | .. | 226–227 |
| 2. | වජ්ජී ,, | .. | .. | 228–229 |
| 3. | නාලන්ද ,, | .. | .. | ,, ,, |
| 4. | භාරද්වාජ ,, | .. | .. | ,, –233 |
| 5. | සොණ ,, | .. | .. | 232–235 |
| 6. | ඝොසිත ,, | .. | .. | 234–237 |
| 7. | හාලිද්දිකානි ,, | .. | .. | 236–239 |
| 8. | නකුලපිතු ,, | .. | .. | 238–241 |
| 9. | ලොහිච්ච ,, | .. | .. | 240–247 |
| 10. | වෙරහච්චානි ,, | .. | .. | 246–251 |


## 14. දෙවදහවග්ගො 252–265


| | | | | |
|---|---|---|---|---|
| 1. | දෙවදහ සුත්තං | .. | .. | 252–253 |
| 2. | ඛණ ,, | .. | .. | 254–255 |
| 3. | සගය්හ ,, | .. | .. | ,, –257 |
| 4. | ගය්හ ,, | .. | .. | 258–259 |
| 5. | පලාස ,, | .. | .. | ,, ,, |
| 6. | දුතිය පලාස ,, | .. | .. | 260–261 |
| 7. | අජ්ඣත්තඅනිච්ච ,, | .. | .. | ,, ,, |
| 8. | අජ්ඣත්තදුක්ඛ ,, | .. | .. | 262–263 |
| 9. | අජ්ඣත්ත අනත්ත ,, | .. | .. | ,, ,, |
| 10. | බාහිර අනිච්ච ,, | .. | .. | ,, –265 |
| 11. | බාහිර දුක්ඛ ,, | .. | .. | 264– ,, |
| 12. | බාහිර අනත්ත ,, | .. | .. | ,, ,, |

## විසය සූචි

### 15. නවපුරාණ වග්ගො 266–281


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | කම්ම | සුත්තං | .. | .. | 266–267 |
| 2. | සප්පාය | ,, | .. | .. | 268–269 |
| 3. | දුතිය සප්පාය | ,, | .. | .. | ,, ,, |
| 4. | තතිය සප්පාය | ,, | .. | .. | 270–271 |
| 5. | චතුත්ථ සප්පාය | ,, | .. | .. | ,,–273 |
| 6. | අන්තේවාසික | ,, | .. | .. | 272–275 |
| 7. | කිමත්ථිය | ,, | .. | .. | 274–277 |
| 8. | අත්ථිනුඛොපරියාය | ,, | .. | .. | 276–279 |
| 9. | ඉන්ද්‍රියසම්පන්න | ,, | .. | .. | 278–281 |
| 10. | ධම්මකථික | ,, | .. | .. | 280– ,, |


### 16. නන්දික්ඛයවග්ගො 282–295


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | අජ්ඣත්තනන්දික්ඛය අනිච්ච | සුත්තං | | .. | 282–283 |
| 2. | බහිද්ධානන්දික්ඛය අනිච්ච | ,, | | .. | ,, ,, |
| 3. | අජ්ඣත්තනන්දික්ඛය යොනිසො | ,, | | .. | ,, –285 |
| 4. | බහිද්ධානන්දික්ඛය යොනිසො | ,, | | .. | 284– ,, |
| 5. | සමාධි | සුත්තං | .. | .. | ,, –287 |
| 6. | පටිසල්ලාන | ,, | .. | .. | 287– ,, |
| 7. | කොට්ඨිත අනිච්ච | ,, | .. | .. | ,, –289 |
| 8. | කොට්ඨිත දුක්ඛ | ,, | .. | .. | 288–291 |
| 9. | කොට්ඨිත අනත්ත | ,, | .. | .. | 290– ,, |
| 10. | මිච්ඡාදිට්ඨිප්පහාන | ,, | .. | .. | ,, –293 |
| 11. | සක්කායදිට්ඨිප්පහාන | ,, | .. | .. | 292– ,, |
| 12. | අත්තානුදිට්ඨිප්පහාන | ,, | .. | .. | 294–295 |


### 17. සට්ඨිපෙය්‍යාලො 296–311


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | අනිච්චඡන්ද | සුත්තං | .. | .. | 296–297 |
| 2. | අනිච්ච රාග | ,, | .. | .. | ,, ,, |
| 3. | අනිච්චඡන්දරාග | ,, | .. | .. | ,, ,, |
| 4– 6. | දුක්ඛඡන්ද-දුක්ඛඡන්දරාග සුත්තානි | | | .. | ,, ,, |
| 7– 9. | අනත්තඡන්ද | ,, | .. | .. | 298–299 |
| 10–12. | බාහිරානිච්චඡන්ද | ,, | .. | .. | ,, ,, |
| 13–15. | බාහිරදුක්ඛ ඡන්ද | ,, | .. | .. | ,, ,, |
| 16–18. | බාහිරානත්ත | ,, | .. | .. | 300–301 |
| 19. | අතීතානිච්ච | සුත්තං | .. | .. | ,, ,, |
| 20. | අනාගතානිච්ච | ,, | .. | .. | ,, ,, |
| 21. | පච්චුප්පන්නානිච්ච | ,, | .. | .. | ,, ,, |
| 22–24. | අතීත දුක්ඛ | සුත්තානි | .. | .. | 302–303 |
| 25–27. | අතීතානත්ත | ,, | .. | .. | ,, ,, |
| 28–30. | බාහිර අතීතානිච්ච | ,, | .. | .. | ,, ,, |
| 31–33. | බාහිරාතීතදුක්ඛ | ,, | .. | .. | ,, ,, |
| 34–36. | බාහිර අතීතානත්ත | ,, | .. | ,, | ,, ,, |

| | | | | | |
|---|---|---|---|---|---|
| 37. | අතීතයදනිච්ච | සුත්තං | .. | .. | 304–305 |
| 38. | අනාගතයදනිච්ච | ,, | .. | .. | ,, ,, |
| 39. | පච්චුප්පන්නයදනිච්ච | ,, | .. | .. | ,, ,, |
| 40–42. | අතීතයංදුක්ඛ | සුත්තානි | .. | .. | 306–307 |
| 43–45. | අතීතයදනත්ත | ,, | .. | .. | ,, ,, |
| 46–48. | බාහිරාතීතයදනිච්ච | ,, | .. | .. | ,, ,, |
| 49–51. | බාහිරාතීතයංදුක්ඛ | ,, | .. | .. | 308–309 |
| 52–54. | බාහිරාතීතයදනත්ත | ,, | .. | .. | ,, ,, |
| 55. | අජ්ඣත්තායතනඅනිච්ච | සුත්තං | | .. | ,, ,, |
| 56. | අජ්ඣත්තායතනදුක්ඛ | ,, | | .. | ,, ,, |
| 57. | අජ්ඣත්තායතනඅනත්ත | ,, | | .. | 310–311 |
| 58. | බාහිරායතන අනිච්ච | ,, | | .. | ,, ,, |
| 59. | බාහිරායතන දුක්ඛ | ,, | | .. | ,, ,, |
| 60. | බාහිරායතන අනත්ත | ,, | | .. | ,, ,, |

## 18. සමුද්දවග්ගො 312-339

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | සමුද්ද | සුත්තං | .. | .. | 312–313 |
| 2. | දුතියසමුද්ද | ,, | .. | .. | 312–315 |
| 3. | බාළිසිකොපම | ,, | .. | .. | 314–317 |
| 4. | ඛීරරුක්ඛොපම | ,, | .. | .. | 316–323 |
| 5. | කොට්ඨිත | ,, | .. | .. | 323–327 |
| 6. | කාමභූ | ,, | .. | .. | 326–329 |
| 7. | උදායී | ,, | .. | .. | 328–331 |
| 8. | ආදිත්තපරියාය | ,, | .. | .. | 332–337 |
| 9. | හත්ථපාදුපම | ,, | .. | .. | 336–337 |
| 10. | දුතියහත්ථපාදුපම | ,, | .. | .. | 338–339 |

## 19. ආසිවිසවග්ගො 340-389

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | ආසිවිසොපම | සුත්තං | .. | .. | 340–345 |
| 2. | රථූපම | ,, | .. | .. | 344–349 |
| 3. | කුම්මොපම | ,, | .. | .. | 348–351 |
| 4. | දරුක්ඛන්ධොපම | ,, | .. | .. | 350–355 |
| 5. | දුතියදරුක්ඛන්ධොපම | ,, | .. | .. | 354–355 |
| 6. | අවස්සුතපරියාය | ,, | .. | .. | 354–363 |
| 7. | දුක්ඛධම්ම | ,, | .. | .. | 362–369 |
| 8. | කිංසුකොපම | ,, | .. | .. | 368–375 |
| 9. | වීණොපම | ,, | .. | .. | 374–379 |
| 10. | ඡප්පාණක | ,, | .. | .. | 378–383 |
| 11. | යවකලාපි | ,, | .. | .. | 384–389 |

## විසය සූචි

### 1. සගාථාවග්ගො 390–411


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | සමාධි | සුත්තං | .. | .. | 390–391 |
| 2 | සුඛ | ,, | .. | .. | ,, ,, |
| 3. | පහාන | ,, | .. | .. | 390–393 |
| 4. | පාතාල | ,, | .. | .. | 392–393 |
| 5. | දට්ඨබ්බ | ,, | .. | .. | 394–395 |
| 6. | සල්ල | ,, | .. | .. | 394–399 |
| 7. | ගෙලඤ්ඤ | ,, | .. | .. | 398–403 |
| 8. | දුතියගෙලඤ්ඤ | ,, | .. | .. | 404–409 |
| 9. | අනිච්ච | ,, | .. | .. | 408–409 |
| 10. | ඵස්සමූලක | ,, | .. | .. | 410–411 |


### 2. රහොගතවග්ගො 412–435


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | රහොගත | සුත්තං | .. | .. | 412–415 |
| 2. | ආකාස | ,, | .. | .. | 414–415 |
| 3. | දුතිය ආකාස | ,, | .. | .. | 416–417 |
| 4. | අගාර | ,, | .. | .. | ,, ,, |
| 5. | සන්තක | ,, | .. | .. | 416–419 |
| 6. | දුතියසන්තක | ,, | .. | .. | 418–421 |
| 7. | අට්ඨක | ,, | .. | .. | 420–423 |
| 8. | දුතිය අට්ඨක | ,, | .. | .. | 422–423 |
| 9. | පඤ්චකඩ්ග | ,, | .. | .. | 424–431 |
| 10. | භික්ඛු | ,, | .. | .. | 432–435 |


### 3. අට්ඨසතපරියාය වග්ගො 436–449


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | මොලියසීවක | සුත්තං | .. | .. | 436–439 |
| 2. | අට්ඨසතපරියාය | ,, | .. | .. | 438–439 |
| 3. | භික්ඛු | ,, | .. | .. | 440–441 |
| 4. | පුබ්බෙ | ,, | .. | .. | ,, ,, |
| 5. | ඤාණ | ,, | .. | .. | 442–443 |
| 6. | සම්බහුලභික්ඛු | ,, | .. | .. | ,, ,, |
| 7. | සමණබ්‍රාහ්මණ | ,, | .. | .. | ,, ,, |
| 8. | දුතිය සමණබ්‍රාහ්මණ | ,, | .. | .. | 444–445 |
| 9. | තතිය සමණබ්‍රාහ්මණ | ,, | .. | .. | ,, ,, |
| 10. | සුද්ධිකවෙදනා | ,, | .. | .. | ,, ,, |
| 11. | නිරාමිස | ,, | .. | .. | 444–449 |

## විසය සූචි

### 2. මාතුගාමසංයුත්තං 450–473

#### 1. මාතුගාමවග්ගො 450–459


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | මාතුගාම | සුත්තං | .. | .. | 450–451 |
| 2. | පුරිස | ,, | .. | .. | ,, ,, |
| 3. | ආවෙණික දුක්ඛ | ,, | .. | .. | 450–453 |
| 4. | තීහිධම්මෙහි | ,, | .. | .. | 452– ,, |
| 5. | අනුරුද්ධ | ,, | .. | .. | ,, ,, |
| 6. | කොධන | ,, | .. | .. | 454–455 |
| 7. | උපනාහී | ,, | .. | .. | ,, ,, |
| 8. | ඉස්සුකී | ,, | .. | .. | ,, ,, |
| 9. | මච්ඡරී | ,, | .. | .. | ,, ,, |
| 10. | අතිචාරී | ,, | .. | .. | 456–457 |
| 11. | දුස්සීල | ,, | .. | .. | ,, ,, |
| 12. | අප්පස්සුත | ,, | .. | .. | ,, ,, |
| 13. | කුසීත | ,, | .. | .. | ,, ,, |
| 14. | මුට්ඨස්සති | ,, | .. | .. | 458–459 |
| 15. | පඤ්චවෙර | ,, | .. | .. | ,, ,, |


#### 2. අනුරුද්ධවග්ගො 460–465


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | අනුරුද්ධ | සුත්තං | .. | .. | 460–461 |
| 2. | අක්කොධන | ,, | .. | .. | ,, ,, |
| 3. | අනුපනාහී | ,, | .. | .. | ,, ,, |
| 4. | අනිස්සුකී | ,, | .. | .. | 462–463 |
| 5. | අමච්ඡරී | ,, | .. | .. | ,, ,, |
| 6. | අනතිචාරී | ,, | .. | .. | ,, ,, |
| 7. | සීලවන්ත | ,, | .. | .. | ,, ,, |
| 8. | බහුස්සුත | ,, | .. | .. | 464–465 |
| 9. | ආරද්ධවිරිය | ,, | .. | .. | ,, ,, |
| 10. | උපට්ඨිතසති | ,, | .. | .. | ,, ,, |
| 11. | පඤ්චසීල | ,, | .. | .. | ,, ,, |


#### 3. බලවග්ගො 466–473


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | සුද්ධ | සුත්තං | .. | .. | 466–467 |
| 2. | විසාරද | ,, | .. | .. | ,, ,, |
| 3. | පසය්හ | ,, | .. | .. | ,, ,, |
| 4. | අභිභුය්‍ය | ,, | .. | .. | ,, ,, |
| 5. | අඞ්ග | ,, | .. | .. | 468–469 |
| 6. | නාසිතබ්බ | ,, | .. | .. | 468–471 |
| 7. | හෙතු | ,, | .. | .. | 470–473 |
| 8. | ඨාන | ,, | .. | .. | ,, ,, |
| 9. | විසාරද | ,, | .. | .. | 472– ,, |
| 10. | වඩ්ඪී | ,, | .. | .. | ,, ,, |

## 3. ජම්බුඛාදක සංයුත්තං 474-487


| | | | |
|---|---|---|---|
| 1. | නිබ්බාන | සුත්තං .. .. | 474–475 |
| 2. | අරහත්ත | ,, .. .. | ,, ,, |
| 3. | ධම්මවාදී | ,, .. .. | 476–477 |
| 4. | කිමත්ථිය | ,, .. .. | ,, ,, |
| 5. | අස්සාස | ,, .. .. | 478–479 |
| 6. | පරමස්සාස | ,, .. .. | ,, ,, |
| 7. | වේදනා | ,, .. .. | 480–481 |
| 8. | ආසව | ,, .. .. | ,, ,, |
| 9. | අවිජ්ජා | ,, .. .. | ,, ,, |
| 10. | තණ්හා | ,, .. .. | 482–483 |
| 11. | ඔඝ | ,, .. .. | ,, ,, |
| 12. | උපාදාන | ,, .. .. | ,, ,, |
| 13. | භව | ,, .. .. | 484–485 |
| 14. | දුක්ඛ | ,, .. .. | ,, ,, |
| 15. | සක්කාය | ,, .. .. | ,, –487 |
| 16. | දුක්කර | ,, .. .. | 486– ,, |


## 4. සාමණ්ඩකානි සංයුත්තං 488-489

## 5. මොග්ගල්ලාන සංයුත්තං 490-519


| | | | |
|---|---|---|---|
| 1. | සවිතක්ක | සුත්තං .. .. | 490–491 |
| 2. | අවිතක්ක | ,, .. .. | 492–493 |
| 3. | සුඛ | ,, .. .. | ,, –495 |
| 4. | උපෙක්ඛා | ,, .. .. | 494– ,, |
| 5. | ආකාසානඤ්චායතන | ,, .. .. | 496–497 |
| 6. | විඤ්ඤාණඤ්චායතන | ,, .. .. | ,, ,, |
| 7. | ආකිඤ්චඤ්ඤායතන | ,, .. .. | 498–499 |
| 8. | නෙවසඤ්ඤානාසඤ්ඤායතන | සුත්තං .. | ,, ,, |
| 9. | අනිමිත්ත | සුත්තං .. .. | 500–501 |
| 10. | සක්ක | ,, .. .. | 500–503 |
| 11. | දුතිය සක්ක | ,, .. .. | 502– ,, |
| 12. | තතිය සක්ක | ,, .. .. | ,, –505 |
| 13. | චතුත්ථ සක්ක | ,, .. .. | 506–507 |
| 14. | පඤ්චම සක්ක | ,, .. .. | 508–509 |
| 15. | ඡට්ඨ සක්ක | ,, .. .. | 510–511 |
| 16. | සත්තම සක්ක | ,, .. .. | ,, –515 |
| 17. | අට්ඨම සක්ක | ,, .. .. | 514–519 |
| 18–25. | නන්දන | සුත්තානි .. | 518– ,, |
| 26–33. | සුයාම | ,, .. .. | ,, ,, |
| 34–41. | සන්තුසිත | ,, .. .. | ,, ,, |
| 42–49. | සුනිම්මිත | ,, .. .. | ,, ,, |
| 50–57. | වසවත්ති | ,, .. .. | ,, ,, |

## විසය සූචි

### 6. චිත්තසංයුත්තං 520–555


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | සංයොජන | සුත්තං | .. | .. | 520–523 |
| 2. | ඉසිදත්ත | ,, | .. | .. | 524–527 |
| 3. | දුතිය ඉසිදත්ත | ,, | .. | .. | 526–531 |
| 4. | මහක | ,, | .. | .. | 532–535 |
| 5. | කාමභූ | ,, | .. | .. | 534–537 |
| 6. | දුතිය කාමභූ | ,, | .. | .. | 536–541 |
| 7. | ගොදත්ත | ,, | .. | .. | 540–545 |
| 8. | නිගණ්ඨ | ,, | .. | .. | 544–549 |
| 9. | අචෙල | ,, | .. | .. | 548–551 |
| 10. | ගිලාන | ,, | .. | .. | 552–555 |


### 7. ගාමණිසංයුත්තං 556–633


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | චණ්ඩගාමණී | සුත්තං | .. | .. | 556–559 |
| 2. | තාලපුට | ,, | .. | .. | 558–561 |
| 3. | යොධාජීව | ,, | .. | .. | 562–565 |
| 4. | හත්ථාරොහ | ,, | .. | .. | 564– ,, |
| 5. | අස්සාරොහ | ,, | .. | .. | ,, –567 |
| 6. | අසිබන්ධක | ,, | .. | .. | 566–571 |
| 7. | ඛෙත්තූපම | ,, | .. | .. | 570–575 |
| 8. | සඞ්ඛධම | ,, | .. | .. | 574–585 |
| 9. | කුල | ,, | .. | .. | 584–589 |
| 10. | මණිචූළක | ,, | .. | .. | 588–591 |
| 11. | භද්‍රක | ,, | .. | .. | 590–595 |
| 12. | රාසිය | ,, | .. | .. | 594–609 |
| 13. | පාටලිය | ,, | .. | .. | 610–633 |


### 8. අසඞ්ඛත සංයුත්තං 634–667

#### 1. අසඞ්ඛතවග්ගො 634-637


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | කායගතා සති | සුත්තං | .. | .. | 534–535 |
| 2. | සමථවිපස්සනා | ,, | .. | .. | ,, ,, |
| 3. | සවිතක්ක සවිචාර | ,, | .. | .. | ,, ,, |
| 4. | සුඤ්ඤත සමාධි | ,, | .. | .. | 636–637 |
| 5. | සතිපට්ඨාන | ,, | .. | .. | ,, ,, |
| 6. | සම්මප්පධාන | ,, | .. | .. | ,, ,, |
| 7. | ඉද්ධිපාද | ,, | .. | .. | ,, ,, |
| 8. | ඉන්ද්‍රිය | ,, | .. | .. | ,, ,, |
| 9. | බල | ,, | .. | .. | ,, ,, |
| 10. | බොජ්ඣඞ්ග | ,, | .. | .. | ,, ,, |
| 11. | මග්ගඞ්ග | ,, | .. | .. | 638–639 |

## 2. දුතියඅසඞ්ඛතවග්ගො 640 – 667


| | | | | |
|---|---|---|---|---|
| 1. | අසඞ්ඛත | සුත්තං | .. | 640–641 |
| 2. | විපස්සනා | ,, | .. | ,, ,, |
| 3. | සවිතක්කසවිචාර | ,, | .. | ,, ,, |
| 4. | අවිතක්කවිචාරමත්ත | ,, | .. | ,, ,, |
| 5. | අවිතක්කඅවිචාර | ,, | .. | 642–643 |
| 6. | සුඤ්ඤතසමාධි | ,, | .. | ,, ,, |
| 7. | අනිමිත්තසමාධි | ,, | .. | ,, ,, |
| 8. | අප්පණිහිතසමාධි | ,, | .. | ,, ,, |
| 9. | කායානුපස්සනා | ,, | .. | ,, ,, |
| 10. | වෙදනානුපස්සනා | ,, | .. | ,, ,, |
| 11. | චිත්තානුපස්සනා | ,, | .. | 644–645 |
| 12. | ධම්මානුපස්සනා | ,, | .. | ,, ,, |
| 13. | සම්මප්පධාන | ,, | .. | ,, ,, |
| 14. | දුතියසම්මප්පධාන | ,, | .. | ,, ,, |
| 15. | තතියසම්මප්පධාන | ,, | .. | ,, ,, |
| 16. | චතුත්ථසම්මප්පධාන | ,, | .. | 646–647 |
| 17. | ඡන්දිද්ධිපාද | ,, | .. | ,, ,, |
| 18. | විරියිද්ධිපාද | ,, | .. | ,, ,, |
| 19. | චිත්තිද්ධිපාද | ,, | .. | ,, ,, |
| 20. | වීමංසිද්ධි | ,, | .. | ,, ,, |
| 21. | සද්ධින්ද්‍රිය | ,, | .. | ,, ,, |
| 22. | විරියින්ද්‍රිය | ,, | .. | 648–649 |
| 23. | සතින්ද්‍රිය | ,, | .. | ,, ,, |
| 24. | සමාධින්ද්‍රිය | ,, | .. | ,, ,, |
| 25. | පඤ්ඤින්ද්‍රිය | ,, | .. | ,, ,, |
| 26. | සද්ධාබල | ,, | .. | ,, ,, |
| 27. | විරියබල | ,, | .. | ,, ,, |
| 28. | සතිබල | ,, | .. | 650–651 |
| 29. | සමාධිබල | ,, | .. | ,, ,, |
| 30. | පඤ්ඤාබල | ,, | .. | ,, ,, |
| 31. | සතිසම්බොජ්ඣඞ්ග | ,, | .. | ,, ,, |
| 32. | ධම්මවිචයසම්බොජ්ඣඞ්ග | ,, | .. | ,, ,, |
| 33. | විරියසම්බොජ්ඣඞ්ග | ,, | .. | ,, ,, |
| 34. | පීතිසම්බොජ්ඣඞ්ග | ,, | .. | 652–653 |
| 35. | පස්සද්ධිසම්බොජ්ඣඞ්ග | ,, | .. | ,, ,, |
| 36. | සමාධිසම්බොජ්ඣඞ්ග | ,, | .. | ,, ,, |
| 37. | උපෙක්ඛාසම්බොජ්ඣඞ්ග | ,, | .. | ,, ,, |

| | | | | |
|---|---|---|---|---|
| 38. | සම්මාදිට්ඨි | ,, | .. | ,, ,, |
| 39. | සම්මාසඞ්කප්ප | ,, | .. | ,, ,, |
| 40. | සම්මාවාචා | ,, | .. | 654–655 |
| 41. | සම්මාකම්මන්ත | ,, | .. | ,, ,, |
| 42. | සම්මාආජීව | ,, | .. | ,, ,, |
| 43. | සම්මාවායාම | ,, | .. | ,, ,, |
| 44. | සම්මාසති | ,, | .. | ,, ,, |
| 45. | සම්මාසමාධි | ,, | .. | 656–657 |
| 46– 101. | අන්ත | සුත්තානි | .. | 656–657 |
| 102– 147. | අනාසව | ,, | .. | ,, ,, |
| 158– 213. | සච්ච | ,, | .. | ,, ,, |
| 214– 269. | පාර | ,, | .. | ,, ,, |
| 270 - 325. | නිපුණ | ,, | .. | ,, ,, |
| 326– 381. | සුදුද්දස | ,, | .. | 658–659 |
| 382– 437. | අජර | ,, | .. | ,, ,, |
| 438– 493. | ධුව | ,, | .. | ,, ,, |
| 494– 549. | අපලොකිත | ,, | .. | ,, ,, |
| 550– 605. | අනිදස්සන | ,, | .. | ,, ,, |
| 606– 661. | නිප්පපඤ්ච | ,, | .. | ,, ,, |
| 662– 717. | සන්ත | ,, | .. | 660–661 |
| 718– 773. | අමත | ,, | .. | ,, ,, |
| 774– 829. | පණීත | ,, | .. | ,, ,, |
| 830– 885. | සිව | ,, | .. | ,, ,, |
| 618– 941. | ඛෙම | ,, | .. | ,, ,, |
| 942– 997. | තණ්හක්ඛය | ,, | .. | ,, ,, |
| 998–1053. | අච්ඡරිය | ,, | .. | ,, ,, |
| 1054–1109. | අබ්භුත | ,, | .. | 662–663 |
| 1110–1165. | අනීතික | ,, | .. | ,, ,, |
| 1166–1221. | අනීතිකධම්ම | ,, | .. | ,, ,, |
| 1222–1277. | නිබ්බාන | ,, | .. | ,, ,, |
| 1278–1333. | අබ්‍යාපජ්ඣ | ,, | .. | ,, ,, |
| 1334–1389. | විරාග | ,, | .. | ,, ,, |
| 1390–1445. | සුද්ධි | ,, | .. | ,, ,, |
| 1446–1501. | මුත්ති | ,, | .. | ,, ,, |
| 1502–1556. | අනාලය | ,, | .. | 664–665 |
| 1558–1613. | දීප | ,, | .. | ,, ,, |
| 1614–1669. | ලෙණ | ,, | .. | ,, ,, |
| 1660–1725. | තාණ | ,, | .. | ,, ,, |
| 1726–1781. | සරණ | ,, | .. | ,, ,, |
| 1782–1837. | පරායණ | ,, | .. | ,, 667 |

## විසය සූචි

### 9. අබ්‍යාකත සංයුත්තං 668 – 709


| | | | | |
|---|---|---|---|---|
| 1. | ඛෙමා | සුත්තං | .. | 668–677 |
| 2. | අනුරාධ | ,, | .. | 676–681 |
| 3. | උපගත | ,, | .. | 682–685 |
| 4. | සමුදය | ,, | .. | 684– ,, |
| 5. | පෙම | ,, | .. | 686–687 |
| 6. | ආරාම | ,, | .. | ,, –691 |
| 7. | ආයතන | ,, | .. | 690–697 |
| 8. | ඛන්ධ | ,, | .. | 696–701 |
| 9. | කුතූහලසාලා | ,, | .. | 700–703 |
| 10. | අත්ථත්ත | ,, | .. | 704–705 |
| 11. | සභිය | ,, | .. | ,, –709 |

සුත්තන්තපිටකෙ

# සංයුත්තනිකායො

චතුත්ථො භාගො

# සුත්තන්තපිටකෙ

# සංයුත්තනිකායො

## චතුත්ථො භාගො

## සළායතනසංයුත්තං

---

### 1. අනිච්චවග්ගො

**නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.**

**1. 1. 1**

**අජ්ඣත්තානිච්චසුත්තං**

1. එවං මෙ සුතං, එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි "**භික්ඛවො**"ති. "භදන්තෙ"ති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

චක්ඛුං භික්ඛවෙ අනිච්චං, යදනිච්චං තං දුක්ඛං, යං දුක්ඛං තදනත්තා, යදනත්තා තං නෙතං මම, නෙසො'හමස්මි, න මෙ'සො අත්තා, ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

සොතං අනිච්චං, යදනිච්චං තං දුක්ඛං, යං දුක්ඛං තදනත්තා, යදනත්තා තං නෙතං මම, නෙසො'හමස්මි, න මෙසො අත්තා'ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

ඝානං අනිච්චං, යදනිච්චං තං දුක්ඛං, යං දුක්ඛං තදනත්තා, යදනත්තා තං නෙතං මම, නෙසො'හමස්මි, න මෙසො අත්තා'ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

# සූත්‍රාන්තපිටකයෙහි

# සංයුත්තනිකාය

## චතුර්ථභාගය

# සළායතන සංයුත්තය

---

## 1. අනිච්ච වර්ගය

**ඒ භාග්‍යවත් අර්හත් සම්මාසම්බුද්ධරජාණන් වහන්සේට නමස්කාර වේවා.**

### 1. 1. 1

### අජ්ඣත්තානිච්ච සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලද. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් වූ අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩවසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි' යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු වහන්සැ යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක:

මහණෙනි, ඇස අනිත්‍ය ය, යමෙක් අනිත්‍ය වේ නම් එය දුක් වෙයි. යමෙක් දුක් වේ නම් එය අනාත්ම වෙයි. යමෙක් අනාත්ම වේ නම් එය ''තෙලෙ මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙලෙ මාගේ ආත්මය නො වේ''ය යි මෙසේ තෙලෙ ඇති සැටියෙන් මනානුවණින් දක්ක යුතු ය.

කන අනිත්‍ය ය, යමෙක් අනිත්‍ය වේ නම් එය දුක් වෙයි. යමෙක් දුක් වේ නම් එය අනාත්ම ය, යමෙක් අනාත්ම වේ නම් එය "තෙලෙ මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙලෙ මාගේ ආත්මය නො වේ'' යි මෙසේ තෙලෙ ඇති සැටියෙන් මනානුවණින් දක්ක යුතු ය.

නැහැය අනිත්‍ය ය, යමෙක් අනිත්‍ය වේ නම් එය දුක් වෙයි, යමෙක් දුක් වේ නම් එය අනාත්ම ය. යමෙක් අනාත්ම වේ නම් එය ''තෙලෙ මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි. තෙලෙ මාගේ ආත්මය නො වේ''යි මෙසේ තෙලෙ ඇති සැටියෙන් මනා නුවණින් දක්ක යුතු යි.

ජිව්හා අනිච්චා, යදනිච්චං තං දුක්ඛං, යං දුක්ඛං තදනත්තා, යදනත්තා තං නෙතං මම, නෙසො'හමස්මි, න මෙසො අත්තා'ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

කායො අනිච්චො, යදනිච්චං තං දුක්ඛං, යං දුක්ඛං තදනත්තා, යදනත්තා තං නෙතං මම, නෙසො'හමස්මි, න මෙසො අත්තාති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

මනො අනිච්චො, යදනිච්චං තං දුක්ඛං, යං දුක්ඛං තදනත්තා, යදනත්තා තං නෙතං මම, නෙසො'හමස්මි. න මෙසො අත්තාති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො චක්ඛුස්මිම්පි නිබ්බින්දති, සොතස්මිම්පි නිබ්බින්දති ඝානස්මිම්පි නිබ්බින්දති, ජිව්හායපි නිබ්බින්දති, කායස්මිම්පි නිබ්බින්දති; මනස්මිම්පි නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති, විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති, ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 1. 2

## අජ්ඣත්තදුක්ඛසුත්තං

2. සාවත්ථියං —

චක්ඛුං භික්ඛවෙ දුක්ඛං, යං දුක්ඛං තදනත්තා, යදනත්තා තං නෙතං මම, නෙසො'හමස්මි, න මෙසො අත්තා''ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

සොතං දුක්ඛං –පෙ– ඝානං දුක්ඛං –පෙ– ජිව්හා දුක්ඛා –පෙ– කායො දුක්ඛො –පෙ– මනො දුක්ඛො, යං දුක්ඛං තදනත්තා, යදනත්තා තං ''නෙතං මම, නෙසො'හමස්මි, න මෙසො අත්තා''ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

එවං පස්සං –පෙ– නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

දිව අනිත්‍ය ය, යමෙක් අනිත්‍ය වේ නම් එය දුක් වෙයි, යමෙක් දුක් වේ නම් එය අනාත්ම ය, යමෙක් අනාත්ම වේ නම් එය "තෙලෙ මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙලෙ මාගේ ආත්මය නො වේ" යි මෙසේ තෙලෙ ඇති සැටියෙන් මනානුවණින් දක්ක යුතු ය.

කය අනිත්‍ය ය, යමෙක් අනිත්‍ය වේ නම් එය දුක් වෙයි, යමෙක් දුක් වේ නම් එය අනාත්ම ය, යමෙක් අනාත්ම වේ නම් එය "තෙලෙ මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙලෙ මාගේ ආත්මය නො වේ" යි මෙසේ තෙලෙ ඇති සැටියෙන් මනානුවණින් දක්ක යුතු ය.

මනස අනිත්‍ය ය, යමෙක් අනිත්‍ය වේ නම් එය දුක් වෙයි, යමෙක් දුක් වේ නම් එය අනාත්ම ය, යමෙක් අනාත්ම වේ නම් එය "තෙලෙ මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙලෙ මාගේ ආත්මය නො වේ" යි මෙසේ තෙලෙ ඇති සැටියෙන් මනානුවණින් දක්ක යුතු ය.

මහණෙනි, මෙසේ දක්නා බහුශ්‍රැත ආර්යශ්‍රාවක ඇසෙහි දු කලකිරෙයි. කනෙහි දු කලකිරෙයි. නැහැයෙහි දු කලකිරෙයි, දිවෙහි දු කලකිරෙයි. කයෙහි දු කලකිරෙයි. සිතෙහි දු කලකිරෙයි. (හේ) කලකිරෙන්නේ විරක්ත වෙයි. විරාග හේතුයෙන් (සසරින්) විමුක්ත වෙයි. විමුක්ත වත් මැ 'විමුක්ත' යැ යන ඥානය උදවෙයි, උත්පත්තිය ක්ෂීණ වියැ. බඹසර වැසැ නිමවන ලද. කරණී කරන ලද. මෙ රහත්බව පිණිස කළයුතු අනෙක් කිසෙක් නැති යි නුවණින් දනියි.

## 1. 1. 2

## අජ්ඣත්තදුක්ඛ සූත්‍රය

2. **සැවැත්නුවර —**

මහණෙනි, ඇස දුක් වෙයි, යමෙක් දුක්වේ නම් එය අනාත්ම ය, යමෙක් අනාත්ම වේ නම් එය "තෙලෙ මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙලෙ මාගේ ආත්මය නො වේ" යි මෙසේ තෙලෙ ඇති සැටියෙන් මනානුවණින් දක්ක යුතු ය.

කන දුක් ය, ... නැහැය දුක් ය ... දිව දුක් ය ... කය දුක් ය ... සිත දුක් ය, යමෙක් දුක් වේ නම් එය අනාත්ම ය. යමෙක් අනාත්ම වේ නම් එය "තෙලෙ මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙලෙ මාගේ ආත්මය නො වේ" යි මෙසේ තෙලෙ ඇති සැටියෙන් මනානුවණින් දක්ක යුතු ය.

මෙසේ දක්නේ...මේ රහත් බව පිණිස අනෙකෙක් නැති යි දැනගනී යි.

## 1. 1. 3

### අජ්ඣත්තානත්තසුත්තං

3. සාවත්ථියං —

චක්ඛුං භික්ඛවෙ අනත්තා, යදනත්තා තං "නෙතං මම, නෙසො'හමස්මි, න මෙසො අත්තාති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

සොතං අනත්තා -පෙ- ඝානං අනත්තා -පෙ- ජිව්හා අනත්තා -පෙ- කායො අනත්තා -පෙ- මනො අනත්තා. යදනත්තා තං නෙතං මම, නෙසො' හමස්මි, න මෙසො අත්තාති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

එවං පස්සං -පෙ- නාපරං ඉත්ථත්තායා'ති පජානාතීති.

## 1. 1. 4

### බාහිරානිච්චසුත්තං

4. සාවත්ථියං —

රූපං භික්ඛවෙ අනිච්චං, යදනිච්චං තං දුක්ඛං, යං දුක්ඛං තදනත්තා, යදනත්තා තං නෙතං මම, නෙසො'හමස්මි, න මෙසො අත්තාති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

සද්දා -පෙ- ගන්ධා -පෙ- රසා -පෙ- ඵොට්ඨබ්බා -පෙ- ධම්මා අනිච්චා යදනිච්චං තං දුක්ඛං, යං දුක්ඛං තදනත්තා, යදනත්තා තං නෙතං මම, නෙසො'හමස්මි, න මෙසො අත්තාති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො රූපෙසුපි නිබ්බින්දති, සද්දෙසුපි නිබ්බින්දති, ගන්ධෙසුපි නිබ්බින්දති, රසෙසුපි නිබ්බින්දති, ඵොට්ඨබ්බෙසුපි නිබ්බින්දති, ධම්මෙසුපි නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති, විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති, ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 1. 3

### අජ්ඣත්තානත්ත සූත්‍රය

3. සැවැත්නුවර —

මහණෙනි, ඇස අනාත්ම ය, යමෙක් අනාත්ම වේ නම් එය "තෙලෙ මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙලෙ මාගේ ආත්මය නො වේ" යි මෙසේ තෙලෙ ඇති සැටියෙන් මනානුවණින් දක්ක යුතු ය.

කන අනාත්ම ය ... නැහැය අනාත්ම ය ... දිව අනාත්ම ය ... කය අනාත්ම ය ... මනස අනාත්ම ය, යමෙක් අනාත්ම වේ නම් එය "තෙලෙ මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙලෙ මාගේ ආත්මය නො වේ" යි මෙසේ තෙලෙ ඇති සැටියෙන් මනානුවණින් දක්ක යුතු ය.

මෙසේ දක්නේ ... මේ රහත් බව පිණිස අනෙකෙක් නැතැ යි දනගනී යි.

## 1. 1. 4

### බාහිරානිච්ච සූත්‍රය

4. සැවැත්නුවර —

මහණෙනි, රූපය අනිත්‍ය ය, යමෙක් අනිත්‍යවේ නම් එය දුක් වෙයි, යමෙක් දුක් වේ නම් එය අනාත්ම ය, යමෙක් අනාත්ම වේ නම් එය "තෙලෙ මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙලෙ මාගේ ආත්මය නො වේ"යි මෙසේ තෙලෙ ඇති සැටියෙන් මනානුවණින් දක්ක යුතු ය.

සද ... ගඳ ... රස ... පහස් ... දහම් අනිස ය, යමෙක් අනිස වේ නම් එය දුක් ය, යමෙක් දුක් වේ නම් එය අනත් ය, යමෙක් අනත් වේ නම් එය "මෙ මාගේ නො වෙයි, මෙ මම නො වෙමි, මෙ මාගේ ආත්මය නො වේ"යි මෙසේ මෙය තතුසේ මනානුවණින් දක්ක යුතු යි.

මහණෙනි, මෙසේ දක්නා බහුශ්‍රුත අරිසවු රූපයෙහි දු කලකිරෙයි, ශබ්දයෙහි දු කලකිරෙයි, ගඳෙහි දු කලකිරෙයි, රසෙහි දු කලකිරෙයි, පහස්හි දු කලකිරෙයි, දහම්හි දු කලකිරෙයි. කලකිරෙන්නේ නො ඇලෙයි. නො ඇල්මෙන් සසරින් මිදෙයි, මිදුණු කල්හි 'මිදිණැ'යි දනීම වෙයි. ජාතිය ක්ෂීණ විය, බඹසර වැස නිමවන ලද. කටයුතු කරන ලද. මේ රහත් බව පිණිස අනෙකෙක් නැතැ''යි දනගනී යි.

## 1. 1. 5

### බාහිරදුක්ඛසුත්තං

**5. සාවත්ථියං —**

රූපා භික්ඛවෙ දුක්ඛා, යං දුක්ඛං තදනත්තා, යදනත්තා තං නෙතං මම, නෙසො'හමස්මි, න මෙසො අත්තාති, එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

සද්දා -පෙ- ගන්ධා -පෙ- රසා -පෙ- ඵොට්ඨබ්බා -පෙ- ධම්මා දුක්ඛා. යං දුක්ඛං තදනත්තා. යදනත්තා තං නෙතං මම, නෙසො 'හමස්මි, න මෙසො අත්තාති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

එවං පස්සං -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 1. 6

### බාහිරානත්තසුත්තං

**6. සාවත්ථියං —**

රූපා භික්ඛවෙ අනත්තා, යදනත්තා තං නෙතං මම, නෙසො'හමස්මි, න මෙසො අත්තා'ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

සද්දා -පෙ- ගන්ධා -පෙ- රසා -පෙ- ඵොට්ඨබ්බා -පෙ- ධම්මා අනත්තා, යදනත්තා තං 'නෙතං මම, නෙසො' හමස්මි, න මෙසො අත්තා'ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

එවං පස්සං -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 1. 7

### දුතියඅජ්ඣත්තානිච්චසුත්තං

**7. සාවත්ථියං —**

චක්ඛුං භික්ඛවෙ අනිච්චං අතීතානාගතං, කො පන වාදො පච්චුප්පන්නස්ස, එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො අතීතස්මිං[1] චක්ඛුස්මිං අනපෙක්ඛො[2] හොති, අනාගතං චක්ඛුං නාභිනන්දති, පච්චුප්පන්නස්ස චක්ඛුස්ස නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොති.

---

1. අතීතස්මිම්පි - සිමු, සී 1, 2
2. අනපෙක්ඛො – මජසං, සයා.

## 1. 1. 5

## බාහිර දුක්ඛ සූත්‍රය

5. සැවැත්නුවර —

මහණෙනි, රූ දුක් ය, යමෙක් දුක් වේ නම් එය අනත් ය, යමෙක් අනත් වේ නම් එය "මෙ මාගේ නො වෙයි මෙ මම නො වෙමි. මෙ මාගේ ආත්මය නො වේ"යි මෙසේ මෙය තතුසේ මනානුවණින් දක්ක යුතු යි.

සද ... ගඳ ... රස ... පහස් ... දහම් දුක් ය, යමෙක් දුක් වේ නම් එය අනත් ය, යමෙක් අනත් වේ නම් එය "මෙ මාගේ නො වෙයි, මේ මම නො වෙමි, මේ මාගේ ආත්මය නො වේ"යි මෙසේ මෙය තතුසේ මනානුවණින් දක්ක යුතු යි. මෙසේ දක්නේ ... මේ රහත් බව පිණිස අනෙකෙක් නැතැ යි දැනගනි යි.

## 1. 1. 6

## බාහිරානත්ත සූත්‍රය

6. සැවැත්නුවර —

මහණෙනි, රූ අනත් ය; යමෙක් අනත් වේ නම් එය 'මෙ මාගේ නො වෙයි, මේ මම නො වෙමි, මේ මාගේ ආත්මය නො වේ'යි මෙසේ මෙය තතුසේ මනානුවණින් දක්ක යුතු යි.

සද ... ගඳ ... රස ... පහස් ... දහම් අනත් ය, යමක් අනත් වේ නම් එය 'මේ මාගේ නො වෙයි, මේ මම නො වෙමි, මේ මාගේ ආත්මය නො වේ'යි මෙසේ මෙය තතුසේ මනානුවණින් දක්ක යුතු යි.

මෙසේ දක්නේ ... මෙ රහත් බව පිණිස අනෙකෙක් නැති යි දැනගනි යි.

## 1. 1. 7

## දුතිය අජ්ඣත්තානිච්ච සූත්‍රය

7. සැවැත්නුවර —

මහණෙනි, අතීත වූ ද අනාගත වූ ද ඇස අනිස ය. පවත්නා රූපය පිළිබඳ ව කිනම් කථාවෙක් ද, මහණෙනි, මෙසේ දක්නා බහුශ්‍රැත අරියවූ ඉකුත් ඇසෙහිත් නිරපෙක්ෂ වෙයි. අනාගත ඇස නො පතයි. පවත්නා ඇස පිළිබඳ ව නිර්වෙදය පිණිස නො ඇල්ම පිණිස නිරොධය පිණිස පිළිපන්නේ වෙයි.

සොතං අනිච්චං -පෙ- ඝානං අනිච්චං -පෙ- ජිව්හා අනිච්චා අතීතානාගතා. කො පන වාදෙ පච්චුප්පන්නාය, එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො අතීතාය ජිව්හාය අනපෙක්ඛො හොති, අනාගතං ජිව්හං නාභිනන්දති, පච්චුප්පන්නාය ජිව්හාය නිබ්බිදය විරාගාය නිරොධාය පටිපන්නො හොති.

කායො අනිච්චො -පෙ- මනො අනිච්චො අතීතානාගතො, කො පනවාදෙ පච්චුප්පන්නස්ස, එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො අතීතස්මිං මනස්මිං අනපෙක්ඛො හොති, අනාගතං මනං නාභිනන්දති, පච්චුප්පන්නස්ස මනස්ස නිබ්බිදය විරාගාය නිරොධාය පටිපන්නො හොතීති.

## 1. 1. 8

## දුතිය අජ්ඣත්තදුක්ඛසුත්තං

8. සාවත්ථියං—

චක්ඛුං භික්ඛවෙ දුක්ඛං අතීතානාගතං. කො පන වාදෙ පච්චුප්පන්නස්ස. එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො අතීතස්මිං චක්ඛුස්මිං අනපෙක්ඛො හොති, අනාගතං චක්ඛුං නාභිනන්දති, පච්චුප්පන්නස්ස චක්ඛුස්ස නිබ්බිදය විරාගාය නිරොධාය පටිපන්නො හොති -පෙ- මනො දුක්ඛො අතීතානාගතො. කො පන වාදෙ පච්චුප්පන්නස්ස. එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො අතීතස්මිං මනස්මිං අනපෙක්ඛො හොති, අනාගතං මනං නාභිනන්දති, පච්චුප්පන්නස්ස මනස්ස නිබ්බිදය විරාගාය නිරොධාය පටිපන්නො හොතීති.

## 1. 1. 9

## දුතිය අජ්ඣත්තානත්ත සුත්තං

9. සාවත්ථියං—

චක්ඛුං භික්ඛවෙ අනත්තා අතීතානාගතං. කො පන වාදෙ පච්චුප්පන්නස්ස. එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො අතීතස්මිං චක්ඛුස්මිං අනපෙක්ඛො හොති, අනාගතං චක්ඛුං නාභිනන්දති, පච්චුප්පන්නස්ස චක්ඛුස්ස නිබ්බිදය විරාගාය නිරොධාය පටිපන්නො හොති. සොතං අනත්තා අතීතානාගතං. කො පන වාදෙ පච්චුප්පන්නස්ස -පෙ- ඝානං අනත්තා අතීතානාගතං. කො පන වාදෙ පච්චුප්පන්නස්ස -පෙ- ජිව්හා අනත්තා අතීතානාගතා කො පන වාදෙ පච්චුප්පන්නාය -පෙ- පටිපන්නො හොති. මනො අනත්තා අතීතානාගතො කො පන වාදෙ පච්චුප්පන්නස්ස, එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො අතීතස්මිං මනස්මිං අනපෙක්ඛො හොති, අනාගතං මනං නාභිනන්දති, පච්චුප්පන්නස්ස මනස්ස නිබ්බිදය විරාගාය නිරොධාය පටිපන්නො හොතීති.

කන අනිස ය ... නැහැය අනිස ය ... ඉකුත් වූ ද නො පැමිණියා වූ ද දිව අනිස ය. පවත්නා දිව පිළිබඳ ව කිනම් කථාවෙක් ද, මහණෙනි, මෙසේ දක්නා බහුශ්‍රැත අරිසවු ඉකුත් දිවෙහි නිරපේක්ෂ වෙයි. අනාගත වූ දිව නො පතයි. පවත්නා දිවෙහි කලකිරීම පිණිස නො ඇල්ම පිණිස නිරෝධය පිණිස පිළිපන්නේ වෙයි.

කය අනිස ය ... ඉකුත් වූ ද නො පැමිණියා වූ ද මනස අනිස ය. වර්තමාන මනසෙහි කිනම් කථා යැ, මහණෙනි, මෙසේ දක්නා බහුශ්‍රැත අරිසවු අතීත මනසෙහි නිරපේක්ෂ වෙයි. අනාගත මනස නො පැ යි. වර්තමාන මනසෙහි කලකිරීම පිණිස නො ඇල්ම පිණිස නිරෝධය පිණිස පිළිපන්නේ වෙයි.

## 1. 1. 8

## දුතිය අජ්ඣත්තදුක්ඛ සූත්‍රය

**8. සැවැත්නුවර—**

මහණෙනි, අතීත වූ ද අනාගත වූ ද ඇස දුක් ය. පවත්නා ඇසෙහි කිනම් කථාවෙක් ද, මහණෙනි, මෙසේ දක්නා ශ්‍රැතවත් අරියවු අතීත වූ ඇසෙහි නිරපේක්ෂ වෙයි. අනාගත වූ ඇස නො පතයි. පවත්නා ඇසෙහි කලකිරීම පිණිස නො ඇල්ම පිණිස නිරෝධය පිණිස පිළිපන්නේ වෙයි ... අතීතානාගත මනස දුක් ය. පවත්නා මනසෙහි කවර කථා යැ, මහණෙනි, මෙසේ දක්නා ශ්‍රැතවත් අරිසවු අතීත මනසෙහි නිරපේක්ෂ වෙයි. අනාගත වූ මනස නො පතයි. පවත්නා මනසෙහි කලකිරීමට නො ඇල්මට නිරෝධයට පිළිපන්නේ වෙයි.

## 1. 1. 9

## දුතිය අජ්ඣත්තානත්ත සූත්‍රය

**9. සැවැත්නුවර—**

මහණෙනි, අතීතානාගත වූ ඇස අනාත් ය. පවත්නා ඇසෙහි කිනම් කථා ද, මහණෙනි, මෙසේ දක්නා බහුශ්‍රැත අරිසවු අතීත වූ ඇසෙහි නිරපේක්ෂ වෙයි. අනාගත වූ ඇස නො පතයි. පවත්නා ඇසෙහි කලකිරීම පිණිස නොඇල්ම පිණිස නිරෝධය පිණිස පිළිපන්නේ වෙයි. කන අනත් ය. පවත්නා කනෙහි කවර කථාවෙක් ද ...

අතීතානාගත වූ නැහැය අනත් ය. පවත්නා නැහැයෙහි කවර කථා යැ ... අතීතානාගත වූ දිව අනත් ය. පවත්නා දිවෙහි කවර කථා යැ ... පිළිපන්නේ වෙයි. අතීතානාගත වූ මනස අනත් ය. පවත්නා මනසෙහි කවර කථා යැ මහණෙනි, මෙසේ දක්නා බහුශ්‍රැත අරිසවු අතීත වූ මනසෙහි නිරපේක්ෂ වෙයි. අනාගත වූ මනස නො පතයි. පවත්නා මනසෙහි කලකිරීම පිණිස නො ඇල්ම පිණිස නිරෝධය පිණිස පිළිපන්නේ වෙයි.

## 1. 1. 10

### දුතිය බාහිරානිච්චසුත්තං

**10. සාවත්ථියං —**

රූපා භික්ඛවෙ අනිච්චා අතීතානාගතා. කො පන වාදෙ පච්චුප්පන්නානං, එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො අතීතෙසු රූපෙසු අනපෙක්ඛො හොති, අනාගතෙ රූපෙ නාභිනන්දති, පච්චුප්පන්නානං රූපානං නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොති. සද්ද -පෙ- ගන්ධා -පෙ- රසා -පෙ- ඵොට්ඨබ්බා -පෙ- ධම්මා අනිච්චා අතීතානාගතා. කො පන වාදෙ පච්චුප්පන්නානං, එවං පස්සං භික්ඛවෙ, සුතවා අරියසාවකො අතීතෙසු ධම්මෙසු අනපෙක්ඛො හොති, අනාගතෙ ධම්මෙ නාභිනන්දති, පච්චුප්පන්නානං ධම්මානං නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොතීති.

## 1. 1. 11

### දුතිය බාහිරදුක්ඛසුත්තං

**11. සාවත්ථියං —**

රූපා භික්ඛවෙ දුක්ඛා අතීතානාගතා. කො පන වාදෙ පච්චුප්පන්නානං, එවං පස්සං භික්ඛවෙ, සුතවා අරියසාවකො අතීතෙසු රූපෙසු අනපෙක්ඛො හොති අනාගතෙ රූපෙ නාභිනන්දති පච්චුප්පන්නානං රූපානං නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොති, සද්ද -පෙ- ගන්ධා -පෙ- රසා -පෙ- ඵොට්ඨබ්බා -පෙ- ධම්මා දුක්ඛා අතීතානාගතා කො පන වාදෙ පච්චුප්පන්නානං, එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො අතීතෙසු ධම්මෙසු අනපෙක්ඛො හොති, අනාගතෙ ධම්මෙ නාභිනන්දති, පච්චුප්පන්නානං ධම්මානං නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොතීති.

## 1. 1. 12

### දුතිය බාහිරානත්තසුත්තං

**12. සාවත්ථියං —**

රූපා භික්ඛවෙ අනත්තා අතීතානාගතා, කො පන වාදෙ පච්චුප්පන්නානං, එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො අතීතෙසු රූපෙසු අනපෙක්ඛො හොති, අනාගතෙ රූපෙ නාභිනන්දති, පච්චුප්පන්නානං රූපානං නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොති, සද්ද -පෙ- ගන්ධා -පෙ- රසා -පෙ- ඵොට්ඨබ්බා -පෙ- ධම්මා අනත්තා අතීතානාගතා, කො පන වාදෙ පච්චුප්පන්නානං, එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො අතීතෙසු ධම්මෙසු අනපෙක්ඛො හොති, අනාගතෙ ධම්මෙ නාභිනන්දති, පච්චුප්පන්නානං ධම්මානං නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොතීති.

**අනිච්චවග්ගො පඨමො.**

**තස්සුද්දානං:**

අනිච්චං දුක්ඛං අනත්තා ච තයො අජ්ඣත්තබාහිරා
යදනිච්චෙන තයො වුත්තා තෙ තෙ අජ්ඣත්තබාහිරා.

## 1. 1. 10
## දුතිය බාහිරානිච්ච සූත්‍රය

**10. සැවැත්නුවර —**

මහණෙනි, අතීතානාගතවූ රූප අනිසය. පවත්නා රූප පිළිබඳ ව කිනම් කථා ද. මහණෙනි, මෙසේ දක්නා බහුශ්‍රැත අරීසවූ අතීත රූපයෙහි නිරපේක්ෂ වෙයි. අනාගත රූප නො පතයි. පවත්නා රූපයෙහි කලකිරීම පිණිස නො ඇල්ම පිණිස නිරෝධය පිණිස පිළිපන්නේ වෙයි. සද ... ගඳ ... රස ... පහස් ... අතීත අනාගත දහම් අනිස ය. පවත්නා දහම් පිළිබඳ ව කවර කථා ද, මහණෙනි, මෙසේ දක්නා ශ්‍රැතවත් අරීසවූ ඉකුත් දහම්හි නිරපෙක්ෂ වෙයි. අනාගත දහම් නො පතයි. පවත්නා දහම්හි කලකිරීමට නො ඇල්මට නිරෝධයට පිළිපන්නේ වෙයි.

## 1. 1. 11
## දුතිය බාහිරදුක්ඛ සූත්‍රය

**11. සැවැත්නුවර —**

මහණෙනි, අතීතානාගත රූප දුක් ය. පවත්නා රූප පිළිබඳ ව කවර කථා ද, මහණෙනි, මෙසේ දක්නා බහුශ්‍රැත අරීසවූ අතීත රූපයෙහි නිරපේක්ෂ වෙයි. නො පැමිණි රූප නො පතයි. පවත්නා රූපයෙහි කලකිරීම පිණිස නො ඇල්ම පිණිස නිරෝධය පිණිස පිළිපන්නේ වෙයි. සද ... ගඳ ... රස ... පහස් ... ඉකුත් නො පැමිණි දහම් දුක් ය. පවත්නා රූ පිළිබඳ ව කවර කථා යැ, මහණෙනි, මෙසේ දක්නා බහුශ්‍රැත අරීසවූ ඉකුත් දහම්හි නිරපේක්ෂ වෙයි. නො පැමිණි දහම් නො පතයි. පවත්නා දහම්හි කලකිරීම පිණිස නො ඇල්ම පිණිස නිරෝධය පිණිස පිළිපන්නේ වේ.

## 1. 1. 12
## දුතිය බාහිරානත්ත සූත්‍රය

**12. සැවැත්නුවර —**

මහණෙනි, අතීතානාගත රූප අනත් ය. පවත්නා රූපයෙහි කවර කථා ද, මහණෙනි, මෙසේ දක්නා බහුශ්‍රැත අරීසවූ ඉකුත් රූපයෙහි නිරපේක්ෂ වෙයි. නො පැමිණි රූප නො පතයි. පවත්නා රූපයෙහි කලකිරීම පිණිස නො ඇල්ම පිණිස නිරෝධය පිණිස පිළිපන්නේ වේ. සද ... ගඳ ... රස .... පහස් ... අතීත අනාගත දහම් අනත් ය. . පවත්නා දහම් පිළිබඳ ව කවර කථාවෙක් ද, මහණෙනි, මෙසේ දක්නා ශ්‍රැතවත් අරීසවූ ඉකුත් දහම්හි නිරපේක්ෂ වෙයි. නො පැමිණි දහම් නො පතයි. පවත්නා දහම්හි කල්කිරීම පිණිස නො ඇල්ම පිණිස නිරෝධය පිණිස පිළිපන්නේ වේ.

**පළමුවැනි අනිච්චවර්ග යි.**

**එහි උද්දානය:**

අනිච්ච යැ දුක්ඛ යැ අනත්ත යැ යි සූත්‍රයෝ තුන් දෙනෙකි. ඔහු අජ්ඣත්තබාහිර-වශයෙන් සිටීත්. ‘යදනිච්ච’ ශබ්දයෙන් වෙන් කොට කියූ සූත්‍රයෝ ද තුන්දෙනෙකි. ඔහු ද අජ්ඣත්තබාහිර-වශයෙන් සිටිති (අජ්ඣත්තබාහිර-භේදයෙන් දෙළොස් දෙනෙකි.)

# 2. යමකවග්ගො

## 1. 2. 1

## සම්බොධසුත්තං

13. සාවත්ථියං—

පුබ්බෙව මෙ භික්ඛවෙ සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො එතදහොසි. කො නු ඛො චක්ඛුස්ස අස්සාදො, කො ආදීනවො, කිං නිස්සරණං, කො සොතස්ස -පෙ- කො ඝානස්ස -පෙ- කො ජිව්හාය -පෙ- කො කායස්ස -පෙ- කො මනස්ස අස්සාදො, කො ආදීනවො, කිං නිස්සරණන්ති.

තස්ස මය්හං භික්ඛවෙ එතදහොසි: යං ඛො චක්ඛුං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං අයං චක්ඛුස්ස අස්සාදො, යං චක්ඛුං අනිච්චං දුක්ඛං විපරිණාමධම්මං අයං චක්ඛුස්ස ආදීනවො, යො චක්ඛුස්මිං ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහානං ඉදං චක්ඛුස්ස නිස්සරණං, යං සොතං -පෙ- යං ඝානං -පෙ- යං ජිව්හං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, අයං ජිව්හාය අස්සාදො, යා ජිව්හා අනිච්චා දුක්ඛා විපරිණාමධම්මා අයං ජිව්හාය ආදීනවො, යො ජිව්හාය ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහානං ඉදං ජිව්හාය නිස්සරණං. යං කායං -පෙ- යං මනං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, අයං මනස්ස අස්සාදො, යො මනො[1] අනිච්චො දුක්ඛො විපරිණාමධම්මො අයං මනස්ස ආදීනවො, යො මනස්මිං ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහානං ඉදං මනස්ස නිස්සරණං.

යාවකීවඤ්චාහං භික්ඛවෙ ඉමෙසං ඡන්නං අජ්ඣත්තිකානං ආයතනානං එවං අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං නාබ්භඤ්ඤාසිං, නෙව තාවාහං භික්ඛවෙ සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණ-බ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධොති[2] පච්චඤ්ඤාසිං.

යතො ච ඛො'හං භික්ඛවෙ ඉමෙසං ඡන්නං අජ්ඣත්තිකානං ආයතනානං එවං අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං අබ්භඤ්ඤාසිං, අථාහං භික්ඛවෙ සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධොති පච්චඤ්ඤාසිං. ඤාණඤ්ච පන මෙ දස්සනං උදපාදි, අකුප්පා මෙ චෙතොවිමුත්ති අයමන්තිමා ජාති, නත්ථිදානි පුනබ්භවොති.

1. යො මනො - මජසං.
2. අභිසම්බුද්ධො - සී.මු.

# 2. යමක වර්ගය

## 1. 2. 1

## සම්බෝධ සූත්‍රය

**13. සැවැත්නුවර —**

මහණෙනි, සම්බෝධියෙන් පෙර මැ සම්බුදු නො වූ බෝසත් වූ මැ මට මෙබඳු සිතෙක් වි ය: ඇසෙහි ආස්වාදය කිමෙක් ද, ආදීනවය කිමෙක් ද, නිස්සරණය කිමෙක් ද, කනෙහි ආස්වාදය කිමෙක් ද ... නැහැයෙහි ආස්වාදය කිමෙක් ද, ... දිවෙහි ආස්වාදය කිමෙක් ද, ... කයෙහි ආස්වාදය කිමෙක් ද, ... සිතෙහි ආස්වාදය කිමෙක් ද, ආදීනවය කිමෙක් ද, නිස්සරණය කිමෙක් ද යි.

මහණෙනි, මට මෙබඳු සිතෙක් විය: ඇස නිසා යම් සුවයෙක් සොම්නසෙක් උපදී නම් මෙ ඇසේ ආස්වාද යි. යම් ඇසෙක් අනිස වේ නම් දුක් වේ නම් වෙනස් වනසුලු වේ නම් මේ ඇසේ ආදීනව යි. ඇසෙහි යම් ඡන්දරාගය දුරුකිරීමෙක් ඡන්දරාග ප්‍රහාණයෙක් වේ නම් මෙ ඇසේ නිස්සරණ යි. කන නිසා යම් ... නැහැය නිසා යම් ... දිව නිසා යම් සුවයෙක් සොම්නසෙක් උපදී නම් මේ දිවේ ආස්වාද යි. යම් දිවක් අනිස නම් දුක් නම් වෙනස් වනසුලු නම් මේ දිවේ ආදීනව යි. දිවේ යම් ඡන්දරාගය දුරුලීමෙක් ඡන්දරාග ප්‍රහාණයෙක් වේ නම් මේ දිවේ නිස්සරණ යි. කය නිසා යම් ... සිත නිසා යම් සුවයෙක් සොම්නසෙක් වේ නම් මේ සිතේ ආස්වාද යි. යම් සිතක් අනිස වේ නම් දුක් වේ නම් වෙනස් වනසුලු වේ නම් මේ සිතේ ආදීනව යි. සිතේ යම් ඡන්දරාගය දුරුලීමෙක් ඡන්දරාග ප්‍රහාණයෙක් වේ නම් මේ සිතේ නිස්සරණ යි.

මහණෙනි, මම යම්තාක් මේ සවැදෑරුම් ආධ්‍යාත්මික ආයතනයන්ගේ ආස්වාදය ආස්වාද වශයෙනුත් ආදීනවය ආදීනව වශයෙනුත් නිස්සරණය නිස්සරණ වශයෙනුත් මෙසේ තතුසේ නො දත්තෙම් නම් මහණෙනි, ඒතාක් මම දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෙවිහි දෙව්මිනිසුන් සහිත මහණබමුණන් සහිත ප්‍රජාවෙහි නිරුත්තර වූ සම්‍යක් සම්බෝධිය අවබෝධ කෙළෙමි යි නො ම පිළින කෙළෙමි.

මහණෙනි, මම යම් කලෙක මෙ සවැදෑරුම් ආධ්‍යාත්මික ආයතනයන්ගේ ආස්වාදය ආස්වාද වශයෙනුත් ආදීනවය ආදීනව වශයෙනුත් නිස්සරණය නිස්සරණ වශයෙනුත් මෙසේ තතු සේ අවබෝධ කෙළෙම් නම් මහණෙනි, මම එකල්හි දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෙවිහි දෙව්මිනිසුන් සහිත මහණබමුණන් සහිත ප්‍රජාවෙහි නිරුත්තර වූ සම්‍යක් සම්බෝධිය අවබෝධ කෙළෙමි යි පිළින කෙළෙම්, මට ඥානදර්ශනය පහළ විය. මාගේ අර්හත්ඵලසමාධිය අකොප්‍ය ය. මේ අන්තිම ජාතිය යි. දැන් නැවත ඉපැදීමෙක් නැතැ යි.

## 1. 2. 2

### දුතිය සම්බොධසුත්තං

14. සාවත්ථියං—

පුබ්බෙව මෙ භික්ඛවෙ සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො එතදහොසි:

කො නු ඛො රූපානං අස්සාදො, කො ආදීනවො කිං නිස්සරණං. කො සද්දානං -පෙ- කො ගන්ධානං -පෙ- කො රසානං -පෙ- කො ඵොට්ඨබ්බානං -පෙ- කො ධම්මානං අස්සාදො, කො ආදීනවො කිං නිස්සරණන්ති.

තස්ස මය්හං භික්ඛවෙ එතදහොසි.

යං ඛො රූපෙ පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං අයං රූපානං අස්සාදො, යෙ[1] රූපා අනිච්චා දුක්ඛා විපරිණාමධම්මා අයං රූපානං ආදීනවො. යො රූපෙසු ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහානං, ඉදං රූපානං නිස්සරණං, යං සද්දෙ -පෙ- යං ගන්ධෙ -පෙ- යං රසෙ -පෙ- යං ඵොට්ඨබ්බෙ -පෙ- යං ධම්මෙ පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, අයං ධම්මානං අස්සාදො, යෙ ධම්මා අනිච්චා දුක්ඛා විපරිණාමධම්මා අයං ධම්මානං ආදීනවො, යො ධම්මෙසු ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහාණං ඉදං ධම්මානං නිස්සරණං.

යාවකීවඤ්චාහං භික්ඛවෙ ඉමෙසං ඡන්නං බාහිරානං ආයතනානං එවං අස්සාදඤ්ච අස්සාදතො, ආදීනවඤ්ච ආදීනවතො, නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං නාබ්භඤ්ඤාසිං -පෙ- අබ්භඤ්ඤාසිං, අථාහං භික්ඛවෙ සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධොති පච්චඤ්ඤාසිං. ඤාණඤ්ච පන මෙ දස්සනං උදපාදි, අකුප්පා මෙ චෙතොවිමුත්ති, අයමන්තිමා ජාති, නත්ථිදානි පුනබ්භවොති.

1. යං රූපා. - මජසං, සයා.

## 1. 2. 2

## දුතිය සම්බෝධ සූත්‍රය

**14. සැවැත්නුවර—**

මහණෙනි, සම්බෝධියෙන් පෙර ම සම්බුද්ධ නො වූ බෝසත් වූ ම මට මෙබඳු සිතෙක් විය:

රූපයන්ගේ ආස්වාදය කිමෙක් ද, ආදීනවය කිමෙක් ද, නිස්සරණය කිමෙක් ද, ශබ්දයන්ගේ ආස්වාදය කිමෙක් ද, ... ගන්ධයන්ගේ ආස්වාදය කිමෙක් ද, ... රසයන්ගේ ආස්වාදය කිමෙක් ද, ... ස්ප්‍රෂ්ටව්‍යයන්ගේ ආස්වාදය කිමෙක් ද ... ධර්මයන්ගේ ආස්වාදය කිමෙක් ද ආදීනවය කිමෙක් ද, නිස්සරණය කිමෙක් ද, යි.

මහණෙනි, මට මෙබඳු සිතෙක් විය:

රූපයන් නිසා යම් සුවයෙක් සොම්නසෙක් උපදී ද මේ රූපයන්ගේ ආස්වාද යි. යම් රූප කෙනෙක් අනිත්‍ය නම් දුක් නම් අනාත්ම නම් මේ රූපයන්ගේ ආදීනව යි. රූපයන්හි යම් ඡන්දරාගය දුරැලීමෙක් ඡන්දරාග ප්‍රහාණයෙක් වේ නම් මේ රූපයන්ගේ නිස්සරණ යි. ශබ්දයන් නිසා යම් ... ගන්ධයන් නිසා යම් ... රසයන් නිසා යම් ... ස්ප්‍රෂ්ටව්‍යයන් නිසා යම් ... ධර්මයන් නිසා යම් සුවයෙක් සොම්නසෙක් උපදී නම් මේ ධර්මයන්ගේ ආස්වාද යි. යම් ධර්ම කෙනෙක් අනිස නම් දුක් නම් වෙනස් වනසුලු නම් මේ ධර්මයන්ගේ ආදීනව යි. ධර්මයන්හි යම් ඡන්දරාග විනයෙක් ඡන්දරාග ප්‍රහාණයෙක් වේ නම් මේ ධර්මයන්ගේ නිස්සරණ යි.

මහණෙනි, මම යම්තාක් මේ සවැදෑරුම් බාහිර ආයතනයන්ගේ ආස්වාදය ආස්වාද වශයෙනුත් ආදීනවය ආදීනව වශයෙනුත් නිස්සරණය නිස්සරණ වශයෙනුත් මෙසේ තතුසේ නො දත්තෙම් නම් ... දත්තෙම් නම් මහණෙනි, එකල්හි මම දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෙව්හි මහණබමුණන් සහිත දෙවිමිනිසුන් සහිත ප්‍රජාවෙහි නිරුත්තර වූ සම්‍යක්සම්බෝධිය අවබෝධ කෙළෙම් යි පිළින කෙළෙමි. මට ඤාණදර්ශනය පහළ විය. මාගේ අර්හත්ඵල සමාධිය අකොප්‍ය ය. මේ අන්තිම ජාති යි. දැන් නැවත ඉපැදීමෙක් නැති යි.

## 1. 2. 3

## අස්සාදපරියෙසනසුත්තං

**15. සාවත්ථියං —**

චක්ඛුස්සාහං භික්ඛවෙ අස්සාදපරියෙසනං අචරිං, යො චක්ඛුස්ස අස්සාදෙ තදජ්ඣගමං, යාවතා චක්ඛුස්ස අස්සාදෙ පඤ්ඤාය මෙ සො සුදිට්ඨො, චක්ඛුස්සාහං භික්ඛවෙ ආදීනවපරියෙසනං අචරිං, යො චක්ඛුස්ස ආදීනවො තදජ්ඣගමං, යාවතා චක්ඛුස්ස ආදීනවො පඤ්ඤාය මෙ සො සුදිට්ඨො. චක්ඛුස්සාහං භික්ඛවෙ නිස්සරණ–පරියෙසනං අචරිං යං චක්ඛුස්ස නිස්සරණං තදජ්ඣගමං, යාවතා චක්ඛුස්ස නිස්සරණං පඤ්ඤාය මෙ තං සුදිට්ඨං.

සොතස්සාහං භික්ඛවෙ -පෙ- ඝානස්සාහං භික්ඛවෙ -පෙ- ජිව්හායාහං භික්ඛවෙ අස්සාදපරියෙසනං අචරිං යො ජිව්හාය අස්සාදෙ තදජ්ඣගමං. යාවතා ජිව්හාය අස්සාදෙ, පඤ්ඤාය මෙ සො සුදිට්ඨො. ජිව්හායාහං භික්ඛවෙ ආදීනවපරියෙසනං අචරිං. යො ජිව්හාය ආදීනවො තදජ්ඣගමං. යාවතා ජිව්හාය ආදීනවො පඤ්ඤාය මෙ සො සුදිට්ඨො. ජිව්හායාහං භික්ඛවෙ නිස්සරණපරියෙසනං අචරිං. යං ජිව්හාය නිස්සරණං තදජ්ඣගමං, යාවතා ජිව්හාය නිස්සරණං පඤ්ඤාය මෙ තං සුදිට්ඨං. කායස්සාහං භික්ඛවෙ -පෙ- මනස්සාහං භික්ඛවෙ අස්සාදපරියෙසනං අචරිං. යො මනස්ස අස්සාදෙ තදජ්ඣගමං, යාවතා මනස්ස අස්සාදෙ පඤ්ඤාය මෙ සො සුදිට්ඨො. මනස්සාහං භික්ඛවෙ ආදීනවපරියෙසනං අචරිං. යො මනස්ස ආදීනවො තදජ්ඣගමං, යාවතා මනස්ස ආදීනවො පඤ්ඤාය මෙ සො සුදිට්ඨො. මනස්සාහං භික්ඛවෙ නිස්සරණපරියෙසනං අචරිං. යං මනස්ස නිස්සරණං තදජ්ඣගමං, යාවතා මනස්ස නිස්සරණං පඤ්ඤාය මෙ තං සුදිට්ඨං.

යාවකීවඤ්චාහං භික්ඛවෙ ඉමෙසං ඡන්නං අජ්ඣත්තිකානං ආයතනානං අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං නාබ්භඤ්ඤාසිං. -පෙ- අබ්භඤ්ඤාසිං -පෙ- ඤාණඤ්ච පන මෙ දස්සනං උදපාදි, අකුප්පා මෙ චෙතො විමුත්ති, අයමන්තිමා ජාති, නත්‍ථිදානි පුනබ්භවොති.

## 1. 2. 3

## අස්සාද පරියෙසන සූත්‍රය

**15.** සැවැත්නුවර —

මහණෙනි, මම ඇසෙහි ආස්වාදය සෙවීම කෙළෙමි. ඇසේ යම් ආස්වාදයෙක් වේ නම් එය අවබෝධ කෙළෙමි. ඇසේ ආස්වාදය යම්තාක් වේ නම් මා විසින් එය නුවණින් මැනවින් දක්නා ලද්දේ ය. මහණෙනි, මම ඇසේ ආදීනවය සෙවීම කෙළෙමි. ඇසේ යම් ආදීනවයෙක් වේ නම් එය අවබෝධ කෙළෙමි. ඇසේ ආදීනවය යම්තාක් වේ නම් මා විසින් එය නුවණින් මැනවින් දක්නා ලද්දේ ය. මහණෙනි, මම ඇසේ නිස්සරණය සෙවීම කෙළෙමි. ඇසේ යම් නිස්සරණයෙක් වේ නම් එය අවබෝධ කෙළෙමි. ඇසේ නිස්සරණය යම්තාක් වේ නම් මා විසින් එය නුවණින් මැනවින් දක්නා ලද්දේ ය.

මහණෙනි, මම කනෙහි ... මහණෙනි, මම නැහැයෙහි ... මහණෙනි, මම දිවෙහි ආස්වාදය සොයාලීම කෙළෙමි. දිවෙහි යම් ආස්වාදයෙක් වේ නම් එය අවබෝධ කෙළෙමි. දිවෙහි ආස්වාදය යම්තාක් වේ නම් මා විසින් එය නුවණින් මැනවින් දක්නා ලද්දේ ය. මහණෙනි, මම දිවෙහි ආදීනවය සොයාලීම කෙළෙමි. දිවෙහි යම් ආදීනවයෙක් වේ නම් එය අවබෝධ කෙළෙමි. දිවෙහි ආදීනවය යම් තාක් වේ නම් මා විසින් එය නුවණින් මැනවින් දක්නා ලද්දේ ය. මහණෙනි, මම දිවෙහි නිස්සරණය සොයාලීම කෙළෙමි. දිවෙහි යම් නිස්සරණයෙක් වේ නම් එය අවබෝධ කෙළෙමි. දිවෙහි නිස්සරණය යම් තාක් වේ නම් මා විසින් එය නුවණින් මැනවින් දක්නා ලද්දේ ය. මහණෙනි, කයෙහි ... මහණෙනි, මම සිතෙහි ආස්වාදය සොයාලීම කෙළෙමි. සිතෙහි යම් ආස්වාදයෙක් වේ නම් එය අවබෝධ කෙළෙමි. සිතෙහි ආස්වාදය යම් තාක් වේ නම් මා විසින් එය නුවණින් මැනවින් දක්නා ලද්දේ ය. මහණෙනි, මම සිතෙහි ආදීනවය සොයාලීම කෙළෙමි. සිතෙහි යම් ආදීනවයෙක් වේ නම් එය අවබෝධ කෙළෙමි. සිතෙහි ආදීනවය යම් තාක් වේ නම් මා විසින් එය නුවණින් මැනවින් දක්නා ලද්දේ ය. මහණෙනි, මම සිතෙහි නිස්සරණය සොයාලීම කෙළෙමි. සිතෙහි යම් නිස්සරණයෙක් වේ නම් එය අවබෝධ කෙළෙමි. සිතෙහි නිස්සරණය යම් තාක් වේ නම් මා විසින් එය නුවණින් මැනවින් දක්නා ලද්දේ ය.

මහණෙනි, යම් තාක් මම මේ ආධ්‍යාත්මික ෂඩායතනයන්ගේ ආස්වාදය ආස්වාද වශයෙනුත් ආදීනවය ආදීනව වශයෙනුත් නිස්සරණය නිස්සරණ වශයෙනුත් තතුසේ නො දත්තෙම් ද ... දත්තෙම් ද ... මට ඥානදර්ශනය පහළ විය. මාගේ අර්හත්ඵලවිමුක්තිය අකොප්‍ය ය. මේ පැසුළු භවය යි. දැන් පුනර්භවයෙක් නැති යි.

## 1. 2. 4

## දුතිය අස්සාදපරියෙසනසුත්තං

**16. සාවත්ථියං —**

රූපානාහං භික්ඛවෙ අස්සාදපරියෙසනං අචරිං, යො රූපානං අස්සාදො තදජ්ඣගමං, යාවතා රූපානං අස්සාදො පඤ්ඤාය මෙ සො සුදිට්ඨො. රූපානාහං භික්ඛවෙ ආදීනවපරියෙසනං අචරිං, යො රූපානං ආදීනවො තදජ්ඣගමං, යාවතා රූපානං ආදීනවො පඤ්ඤාය මෙ සො සුදිට්ඨො. රූපානාහං භික්ඛවෙ නිස්සරණපරියෙසනං අචරිං, යං රූපානං නිස්සරණං තදජ්ඣගමං, යාවතා රූපානං නිස්සරණං පඤ්ඤාය මෙ තං සුදිට්ඨං. සද්දානාහං භික්ඛවෙ -පෙ- ගන්ධානාහං භික්ඛවෙ -පෙ- රසානාහං භික්ඛවෙ -පෙ- ඵොට්ඨබ්බානාහං භික්ඛවෙ -පෙ- ධම්මානාහං භික්ඛවෙ අස්සාදපරියෙසනං අචරිං, යො ධම්මානං අස්සාදො තදජ්ඣගමං, යාවතා ධම්මානං අස්සාදො පඤ්ඤාය මෙ සො සුදිට්ඨො. ධම්මානාහං භික්ඛවෙ ආදීනවපරියෙසනං අචරිං, යො ධම්මානං ආදීනවො තදජ්ඣගමං, යාවතා ධම්මානං ආදීනවො පඤ්ඤාය මෙ සො සුදිට්ඨො. ධම්මානාහං භික්ඛවෙ නිස්සරණපරියෙසනං අචරිං, යං ධම්මානං නිස්සරණං තදජ්ඣගමං, යාවතා ධම්මානං නිස්සරණං පඤ්ඤාය මෙ තං සුදිට්ඨං.

යාවකීවඤ්චාහං භික්ඛවෙ ඉමෙසං ඡන්නං බාහිරානං ආයතනානං අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං නාබ්භඤ්ඤාසිං -පෙ- අබ්භඤ්ඤාසිං -පෙ- ඤාණඤ්ච පන මෙ දස්සනං උදපාදි, අකුප්පා මෙ චෙතොවිමුත්ති, අයමන්තිමා ජාති, නත්ථිදානි පුනබ්භවො'ති.

## 1. 2. 5

## නො චෙ අස්සාදසුත්තං

**17. සාවත්ථියං —**

නො චෙදං භික්ඛවෙ චක්ඛුස්ස අස්සාදො අභවිස්ස, නයිදං සත්තා චක්ඛුස්මිං සාරජ්ජෙය්‍යුං, යස්මා ච ඛො භික්ඛවෙ අත්ථි චක්ඛුස්ස අස්සාදො, තස්මා සත්තා චක්ඛුස්මිං සාරජ්ජන්ති. නො චෙදං භික්ඛවෙ චක්ඛුස්ස ආදීනවො අභවිස්ස, නයිදං සත්තා චක්ඛුස්මිං නිබ්බින්දෙය්‍යුං, යස්මා ච ඛො භික්ඛවෙ අත්ථි චක්ඛුස්ස ආදීනවො. තස්මා සත්තා චක්ඛුස්මිං නිබ්බින්දන්ති. නො චෙදං භික්ඛවෙ චක්ඛුස්ස නිස්සරණං අභවිස්ස, නයිදං සත්තා චක්ඛුස්මා නිස්සරෙය්‍යුං. යස්මා ච ඛො භික්ඛවෙ අත්ථි චක්ඛුස්ස නිස්සරණං, තස්මා සත්තා චක්ඛුස්මා නිස්සරන්ති.

## 1. 2. 4

## දුතිය අස්සාදපරියෙසන සූත්‍රය

**16. සැවැත්නුවර —**

මහණෙනි, මම රූපයන්ගේ ආස්වාදය සෙවීමෙහි යෙදුනෙමි. රූපයන්ගේ යම් ආස්වාදයෙක් වේ නම් එය අවබෝධ කෙළෙමි. රූපයන්ගේ ආස්වාදය යම් තාක් වේ නම් මා විසින් එය නුවණින් මැනවින් දක්නා ලද්දේ ය. මහණෙනි, මම රූපයන්ගේ ආදීනවය සෙවීමෙහි යෙදුනෙමි. රූපයන්ගේ යම් ආදීනවයෙක් වේ නම් එය අවබොධ කෙළෙමි. රූපයන්ගේ ආදීනවය යම් තාක් වේ නම් මා විසින් එය නුවණින් මැනවින් දක්නා ලද්දේ ය. මහණෙනි, මම රූපයන්ගේ නිස්සරණය සෙවීමෙහි යෙදුනෙමි. රූපයන්ගේ යම් නිස්සරණයෙක් වේ නම් එය අවබොධ කෙළෙමි. රූපයන්ගේ නිස්සරණය යම් තාක් වේ ;නම් මා විසින් එය නුවණින් මැනවින් දක්නා ලද්දේ ය. මහණෙනි, මම ශබ්දයන්ගේ ... මහණෙනි, මම ගන්ධයන්ගේ ... මහණෙනි, මම රසයන්ගේ ... මහණෙනි, මම ස්ප්‍රෂ්ටව්‍යයන්ගේ ... මහණෙනි, මම ධර්මයන්ගේ ආස්වාදය සෙවීමෙහි යෙදුනෙමි. ධර්මයන්ගේ යම් ආස්වාදයෙක් වේ නම් එය අවබෝධ කෙළෙමි: ධර්මයන්ගේ ආස්වාදය යම් තාක් වේ නම් මා විසින් එය නුවණින් මැනවින් දක්නා ලද්දේ ය. මහණෙනි, මම ධර්මයන්ගේ ආදීනවය සෙවීමෙහි යෙදුනෙමි. ධර්මයන්ගේ යම් ආදීනවයෙක් වේ නම් එය අවබෝධ කෙළෙමි. ධර්මයන්ගේ ආදීනවය යම් තාක් වේ නම් මා විසින් එය නුවණින් මැනවින් දක්නා ලද්දේ ය. මහණෙනි, මම ධර්මයන්ගේ නිස්සරණය සෙවීමෙහි යෙදුනෙමි. ධර්මයන්ගේ යම් නිස්සරණයෙක් වේ නම් එය අවබෝධ කෙළෙමි. ධර්මයන්ගේ නිස්සරණය යම් තාක් වේ නම් මා විසින් එය නුවණින් මැනවින් දක්නා ලද්දේ ය,

මහණෙනි, යම් තාක් මම මේ බාහිර ෂඩායතනයන්ගේ ආස්වාදය ආස්වාද වශයෙනුත් ආදීනවය ආදීනව වශයෙනුත් නිස්සරණය නිස්සරණ වශයෙනුත් තතුසේ නො දත්තෙම් ද, ... දත්තෙම් ද, ... මට ඥානදර්ශනය පහළ විය. මාගේ අර්හත්ඵලවිමුක්තිය අකොප්‍ය ය. මේ අන්තිම ජාති යි. දැන් පුනර්භවයෙක් නැති යි.

## 1. 2. 5

## නො වෙ අස්සාද සූත්‍රය

**17. සැවැත්නුවර —**

මහණෙනි, ඉදින් ඇසෙහි ආස්වාදයෙක් නො වී නම් මේ සත්ත්වයෝ ඇසෙහි නො ඇලෙන්නාහ. මහණෙනි, යම් හෙයෙකින් ඇසෙහි ආස්වාදයෙක් ඇද්ද, එහෙයින් සත්ත්වයෝ ඇසෙහි ඇලෙත්. මහණෙනි, ඉදින් ඇසෙහි ආදීනවයෙක් නො වී නම් සත්ත්වයෝ ඇසෙහි නො කලකිරෙන්නාහ. මහණෙනි, යම් හෙයෙකින් ඇසෙහි ආදීනවයෙක් ඇද්ද, එහෙයින් සත්ත්වයෝ ඇසෙහි කලකිරෙති. මහණෙනි, ඉදින් ඇසෙහි නිස්සරණයෙක් නො වී නම් සත්ත්වයෝ ඇසින් නො මිදෙන්නාහ. මහණෙනි, යම් හෙයෙකින් ඇසෙහි නිස්සරණයෙක් ඇද්ද එහෙයින් සත්ත්වයෝ ඇසින් මිදෙති.

නො චෙදං භික්ඛවෙ සොතස්ස -පෙ- නො චෙදං භික්ඛවෙ ඝානස්ස -පෙ- නො චෙදං භික්ඛවෙ ජිව්හාය අස්සාදො අභවිස්ස, නයිදං සත්තා ජිව්හාය සාරජ්ජෙය්‍යුං, යස්මා ච ඛො භික්ඛවෙ අත්ථි ජිව්හාය අස්සාදො. තස්මා සත්තා ජිව්හාය සාරජ්ජන්ති. නො චෙදං භික්ඛවෙ ජිව්හාය ආදීනවො අභවිස්ස, නයිදං සත්තා ජිව්හාය නිබ්බින්දෙය්‍යුං, යස්මා ච ඛො භික්ඛවෙ අත්ථි ජිව්හාය ආදීනවො, තස්මා සත්තා ජිව්හාය නිබ්බින්දන්ති. නො චෙදං භික්ඛවෙ ජිව්හාය නිස්සරණං අභවිස්ස, නයිදං සත්තා ජිව්හාය නිස්සරෙය්‍යුං, යස්මා ච ඛො භික්ඛවෙ අත්ථි ජිව්හාය නිස්සරණං, තස්මා සත්තා ජිව්හාය නිස්සරන්ති.

නො චෙදං භික්ඛවෙ කායස්ස -පෙ- නො චෙදං භික්ඛවෙ මනස්ස අස්සාදො අභවිස්ස, නයිදං සත්තා මනස්මිං සාරජ්ජෙය්‍යුං. යස්මා ච ඛො භික්ඛවෙ, අත්ථි මනස්ස අස්සාදො, තස්මා සත්තා මනස්මිං සාරජ්ජන්ති. නො චෙදං භික්ඛවෙ මනස්ස ආදීනවො අභවිස්ස, නයිදං සත්තා මනස්මිං නිබ්බින්දෙය්‍යුං යස්මා ච ඛො භික්ඛවෙ අත්ථි මනස්ස ආදීනවො, තස්මා සත්තා මනස්මිං නිබ්බින්දන්ති. නො චෙදං භික්ඛවෙ මනස්ස නිස්සරණං අභවිස්ස, නයිදං සත්තා මනස්මා නිස්සරෙය්‍යුං. යස්මා ච ඛො භික්ඛවෙ අත්ථි මනස්ස නිස්සරණං තස්මා සත්තා මනස්මා නිස්සරන්ති.

යාවකීවඤ්ච භික්ඛවෙ සත්තා ඉමෙසං ඡන්නං අජ්ඣත්තිකානං ආයතනානං අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං නාබ්භඤ්ඤංසු[1]. නෙව තාව භික්ඛවෙ සත්තා සදෙවකා ලොකා සමාරකා සබ්‍රහ්මකා සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය නිස්සටා විසංයුත්තා විප්පමුත්තා විමරියාදීකතෙන[2] චෙතසා විහරිංසු.

යතො ච ඛො භික්ඛවෙ සත්තා ඉමෙසං ඡන්නං අජ්ඣත්තිකානං ආයතනානං අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං අබ්භඤ්ඤංසු; අථ භික්ඛවෙ සත්තා සදෙවකා ලොකා සමාරකා සබ්‍රහ්මකා සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය නිස්සටා විසංයුත්තා විප්පමුත්තා විමරියාදීකතෙන චෙතසා විහරන්තීති.

1. නාබ්භඤ්ඤංසු - මජසං
2. විමරියාදිකතෙන - සීමු, PTS. විපරියාදිකතෙන — සයා.

මහණෙනි, ඉදින් කනෙහි (ආස්වාදයෙක්) නො වී නම් ... මහණෙනි, ඉදින් නැහැයෙහි (ආස්වාදයෙක්) නො වී නම් ... මහණෙනි, ඉදින් දිවෙහි (ආස්වාදයෙක්) නො වී නම් සත්ත්වයෝ දිවෙහි නො ඇලෙන්නාහ. මහණෙනි, යම් හෙයෙකින් දිවෙහි ආස්වාදයෙක් ඇද්ද, එහෙයින් සත්ත්වයෝ දිවෙහි ඇලෙත්. මහණෙනි, ඉදින් දිවෙහි ආදීනවයෙක් නො වී නම් සත්ත්වයෝ දිවෙහි නො කලකිරෙන්නාහ. මහණෙනි, යම් හෙයෙකින් දිවෙහි ආදීනවයෙක් ඇද්ද, එහෙයින් සත්ත්වයෝ දිවෙහි කලකිරෙත්. මහණෙනි, ඉදින් දිවෙහි නිස්සරණයෙක් නො වී නම් සත්ත්වයෝ දිවෙන් නො මිදෙන්නාහ. මහණෙනි, යම් හෙයෙකින් දිවෙහි නිස්සරණයෙක් ඇද්ද, එහෙයින් සත්ත්වයෝ දිවෙන් මිදෙති.

මහණෙනි, ඉදින් කයෙහි (ආස්වාදයෙක්) නො වී නම් ... මහණෙනි, ඉදින් සිතේ ආස්වාදයෙක් නො වී නම් සත්ත්වයෝ සිතෙහි නො ඇලෙන්නාහ. මහණෙනි, යම් හෙයෙකින් සිතෙහි ආස්වාදයෙක් ඇද්ද, එහෙයින් සත්ත්වයෝ සිතෙහි ඇලෙති. මහණෙනි, ඉදින් සිතෙහි ආදීනවයෙක් නො වී නම් සත්ත්වයෝ සිතෙහි නො කලකිරෙන්නාහ. මහණෙනි, යම් හෙයෙකින් සිතෙහි ආදීනවයෙක් ඇද්ද, එහෙයින් සත්ත්වයෝ සිතෙහි කලකිරෙත්. මහණෙනි, ඉදින් සිතෙහි නිස්සරණයෙක් නො වී නම් සත්ත්වයෝ සිතින් නො මිදෙන්නාහ. මහණෙනි, යම් හෙයෙකින් සිතෙහි නිස්සරණයෙක් ඇද්ද, එහෙයින් සත්ත්වයෝ සිතින් මිදෙති.

මහණෙනි, යම් තාක් සත්ත්වයෝ මේ ආධ්‍යාත්මික ෂඩායතනයන්ගේ ආස්වාදය ආස්වාද වශයෙනුත් ආදීනවය ආදීනව වශයෙනුත් නිස්සරණය නිස්සරණ වශයෙනුත් තතුසේ නො දත්තාහු ද, මහණෙනි, ඒ තාක් සත්ත්වයෝ දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෝකයෙන් මහණබමුණන් සහිත දෙව්මිනිසුන් සහිත ප්‍රජාවෙන් නික්මගියාහු වෙන් වූවාහු මිදුනාහු ක්ලෙශ වර්ත සඞ්ඛ්‍යාත මයර්‍යාදා ඉක්ම වූ සිතින් යුක්තව නො ම විසූහ,

මහණෙනි, යම්කලෙක සත්ත්වයෝ මේ ආධ්‍යාත්මික ෂඩායතනයන්ගේ ආස්වාදය ආස්වාද වශයෙනුත් ආදීනවය ආදීනව වශයෙනුත් නිස්සරණය නිස්සරණ වශයෙනුත් තතුසේ දත්තාහු ද, මහණෙනි, එකල්හි සත්ත්වයෝ දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෝකයෙන් මහණබමුණන් සහිත දෙව්මිනිසුන් සහිත ප්‍රජාවෙන් නික්ම ගියාහු වෙන් වූවාහු මිදුනාහු ක්ලේශ වර්ත මර්යාද ඉක්මවූ සිතින් යුක්ත ව වෙසෙති යි.

## 1. 2. 6

## දුතිය නො චෙ අස්සාදසුත්තං

**18. සාවත්ථියං —**

නො චෙදං භික්ඛවෙ රූපානං අස්සාදො අභවිස්ස, නයිදං සත්තා රූපෙසු සාරජ්ජෙය්‍යුං. යස්මා ච ඛො භික්ඛවෙ අත්ථි රූපානං අස්සාදො. තස්මා සත්තා රූපෙසු සාරජ්ජන්ති. නො චෙදං භික්ඛවෙ රූපානං ආදීනවො අභවිස්ස, නයිදං සත්තා රූපෙසු නිබ්බින්දෙය්‍යුං. යස්මා ච ඛො භික්ඛවෙ අත්ථි රූපානං ආදීනවො, තස්මා සත්තා රූපෙසු නිබ්බින්දන්ති, නො චෙදං භික්ඛවෙ රූපානං නිස්සරණං අභවිස්ස, නයිදං සත්තා රූපෙහි නිස්සරෙය්‍යුං. යස්මා ච ඛො භික්ඛවෙ අත්ථි රූපානං නිස්සරණං තස්මා සත්තා රූපෙහි නිස්සරන්ති.

නො චෙදං භික්ඛවෙ සද්දානං –පෙ– ගන්ධානං –පෙ– රසානං –පෙ– ඵොට්ඨබ්බානං -පෙ- ධම්මානං අස්සාදො අභවිස්ස, නයිදං සත්තා ධම්මෙසු සාරජ්ජෙය්‍යුං. යස්මා ච ඛො භික්ඛවෙ අත්ථි ධම්මානං අස්සාදො, තස්මා සත්තා ධම්මෙසු සාරජ්ජන්ති. නො චෙදං භික්ඛවෙ ධම්මානං ආදීනවො අභවිස්ස, නයිදං සත්තා ධම්මෙසු නිබ්බින්දෙය්‍යුං. යස්මා ච ඛො භික්ඛවෙ අත්ථි ධම්මානං ආදීනවො. තස්මා සත්තා ධම්මෙසු නිබ්බින්දන්ති, නො චෙදං භික්ඛවෙ, ධම්මානං නිස්සරණං අභවිස්ස, නයිදං සත්තා ධම්මෙහි නිස්සරෙය්‍යුං. යස්මා ච ඛො භික්ඛවෙ අත්ථි ධම්මානං නිස්සරණං තස්මා සත්තා ධම්මෙහි නිස්සරන්ති.

යාවකීවඤ්ච භික්ඛවෙ සත්තා ඉමෙසං ඡන්නං බාහිරානං ආයතනානං අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං නාබ්භඤ්ඤඤ්සුං, නෙව තාව භික්ඛවෙ සත්තා සදෙවකා ලොකා සමාරකා සබ්‍රහ්මකා සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය නිස්සටා විසංයුත්තා විප්පමුත්තා විමරියාදීකතෙන චෙතසා විහරිංසු.

යතො ච ඛො භික්ඛවෙ සත්තා ඉමෙසං ඡන්නං බාහිරානං ආයතනානං අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං අබ්භඤ්ඤඤ්සුං, අථ භික්ඛවෙ සත්තා සදෙවකා ලොකා සමාරකා සබ්‍රහ්මකා සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය නිස්සටා විසංයුත්තා විප්පමුත්තා විමරියාදීකතෙන චෙතසා විහරන්තීති.

# 1. 2. 6

## දුතිය නො වෙ අස්සාද සූත්‍රය

18. සැවැත්නුවර —

මහණෙනි, ඉදින් රූපයන්ගේ ආස්වාදයෙක් නො වී නම් සත්ත්වයෝ රූපයන්හි නො ඇලෙන්නාහ. මහණෙනි, යම් හෙයෙකින් රූපයන්ගේ ආස්වාදයෙක් ඇද්ද, එහෙයින් සත්ත්වයෝ රූපයන්හි ඇලෙත්. මහණෙනි, ඉදින් රූපයන්ගේ ආදීනවයෙක් නො වී නම් සත්ත්වයෝ රූපයන්හි නො කලකිරෙන්නාහ. මහණෙනි, යම් හෙයෙකින් රූපයන්හි ආදීනවයෙක් ඇද්ද, එහෙයින් සත්ත්වයෝ රූපයන්හි කලකිරෙත්. මහණෙනි, ඉදින් රූපයන්ගේ නිස්සරණයෙක් නො වී නම් සත්ත්වයෝ රූපයන්ගෙන් නො මිදෙන්නාහ. මහණෙනි, යම් හෙයෙකින් රූපයන්ගේ නිස්සරණයෙක් ඇද්ද, එහෙයින් සත්ත්වයෝ රූපයන්ගෙන් මිදෙත්.

මහණෙනි, ඉදින් ශබ්දයන්ගේ ... ගන්ධයන්ගේ ... රසයන්ගේ ... ස්ප්‍රෂ්ටව්‍යයන්ගේ ... ධර්මයන්ගේ ආස්වාදයෙක් නො වී නම් සත්ත්වයෝ ධර්මයන්හි නො ඇලෙන්නාහ. මහණෙනි, යම් හෙයෙකින් ධර්මයන්ගේ ආස්වාදයෙක් ඇද්ද එහෙයින් සත්ත්වයෝ ධර්මයන්හි ඇලෙත්. මහණෙනි, ඉදින් ධර්මයන්ගේ ආදීනවයෙක් නො වී නම් සත්ත්වයෝ ධර්මයන්හි නො කලකිරෙන්නාහ. මහණෙනි, යම්හෙයෙකින් ධර්මයන්ගේ ආදීනවයෙක් ඇද්ද, එහෙයින් සත්ත්වයෝ ධර්මයන්හි කලකිරෙත්. මහණෙනි, ඉදින් ධර්මයන්ගේ නිස්සරණයෙක් නො වී නම් සත්ත්වයෝ ධර්මයන්ගෙන් නො මිදෙන්නාහ. මහණෙනි, යම් හෙයෙකින් ධර්මයන්ගේ නිස්සරණයෙක් ඇද්ද එහෙයින් සත්ත්වයෝ ධර්මයන්ගෙන් මිදෙත්.

මහණෙනි, සත්ත්වයෝ යම් තාක් මේ බාහිර ෂඩායතනයන්ගේ ආස්වාදය ආස්වාද හෙයින් ද ආදීනවය ආදීනව හෙයින් ද නිස්සරණය නිස්සරණ හෙයින් ද තතුසේ නො දත්තාහු වෙත් ද මහණෙනි, සත්ත්වයෝ ඒතාක් දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෝකයෙන් මහණබමුණන් සහිත දෙව්මිනිසුන් සහිත ප්‍රජාවෙන් නික්ම ගියාහු වෙන් වූවාහු මිදුනාහු විගතමර්යාද කළ සිතින් යුක්ත ව නො ම විසූහ.

මහණෙනි, සත්ත්වයෝ යම් කලෙක මේ බාහිර ෂඩායතනයන්ගේ ආස්වාදය ආස්වාද හෙයින් ද ආදීනවය ආදීනව හෙයින් ද නිස්සරණය නිස්සරණ හෙයින් ද තතුසේ දත්තාහු වෙත් ද, මහණෙනි, එකල්හි සත්ත්වයෝ දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෝකයෙන් මහණබමුණන් සහිත දෙව්මිනිසුන් සහිත ප්‍රජාවෙන් නික්ම ගියාහු වෙන් වූවාහු මිදුනාහු මර්යාද රහිත කරන ලද සිතින් යුක්ත ව වෙසෙති යි.

## 1. 2. 7

## අභිනන්දසුත්තං

**19. සාවත්ථියං —**

යො භික්ඛවෙ චක්ඛුං අභිනන්දති, දුක්ඛං සො අභිනන්දති. යො දුක්ඛං අභිනන්දති, අපරිමුත්තො සො දුක්ඛස්මාති වදාමි. යො සොතං අභිනන්දති. දුක්ඛං සො අභිනන්දති. යො දුක්ඛං අභිනන්දති අපරිමුත්තො සො දුක්ඛස්මාති වදාමි. යො ඝානං අභිනන්දති, දුක්ඛං සො අභිනන්දති. යො දුක්ඛං අභිනන්දති, අපරිමුත්තො සො දුක්ඛස්මාති වදාමි. යො ජිව්හං අභිනන්දති, දුක්ඛං සො අභිනන්දති. යො දුක්ඛං අභිනන්දති, අපරිමුත්තො සො දුක්ඛස්මාති වදාමි. යො කායං අභිනන්දති, දුක්ඛං සො අභිනන්දති. යො දුක්ඛං අභිනන්දති, අපරිමුත්තො සො දුක්ඛස්මාති වදාමි. යො මනං අභිනන්දති, දුක්ඛං සො අභිනන්දති. යො දුක්ඛං අභිනන්දති, අපරිමුත්තො සො දුක්ඛස්මාති වදාමි.

යො ච ඛො භික්ඛවෙ චක්ඛුං නාභිනන්දති, දුක්ඛං සො නාභිනන්දති. යො දුක්ඛං නාභිනන්දති, පරිමුත්තො සො දුක්ඛස්මාති වදාමි. යො සොතං නාභිනන්දති, දුක්ඛං සො නාභිනන්දති. යො දුක්ඛං නාභිනන්දති, පරිමුත්තො සො දුක්ඛස්මාති වදාමි. යො ඝානං නාභිනන්දති, දුක්ඛං සො නාභිනන්දති. යො දුක්ඛං නාභිනන්දති, පරිමුත්තො සො දුක්ඛස්මාති වදාමි. යො ජිව්හං නාභිනන්දති, දුක්ඛං සො නාභිනන්දති. යො දුක්ඛං නාභිනන්දති, පරිමුත්තො සො දුක්ඛස්මාති වදාමි. යො කායං නාභිනන්දති දුක්ඛං සො නාභිනන්දති. යො දුක්ඛං නාභිනන්දති, පරිමුත්තො සො දුක්ඛස්මාති වදාමි. යො මනං නාභිනන්දති, දුක්ඛං සො නාභිනන්දති. යො දුක්ඛං නාභිනන්දති. පරිමුත්තො සො දුක්ඛස්මාති වදාමීති.

## 1. 2. 8

## දුතිය අභිනන්දසුත්තං

**20. සාවත්ථියං —**

යො භික්ඛවෙ රූපෙ අභිනන්දති, දුක්ඛං සො අභිනන්දති. යො දුක්ඛං අභිනන්දති, අපරිමුත්තො සො දුක්ඛස්මාති වදාමි. යො සද්දෙ -පෙ- ගන්ධෙ -පෙ- රසෙ -පෙ- ඵොට්ඨබ්බෙ -පෙ- ධම්මෙ අභිනන්දති, දුක්ඛං සො අභිනන්දති. යො දුක්ඛං අභිනන්දති, අපරිමුත්තො සො දුක්ඛස්මාති වදාමි.

යො ච ඛො භික්ඛවෙ රූපෙ නාභිනන්දති. දුක්ඛං සො නාභිනන්දති, යො දුක්ඛං නාභිනන්දති, පරිමුත්තො සො දුක්ඛස්මාති වදාමි. යො සද්දෙ -පෙ- ගන්ධෙ -පෙ- රසෙ -පෙ- ඵොට්ඨබ්බෙ -පෙ- ධම්මෙ නාභිනන්දති, දුක්ඛං සො නාභිනන්දති. යො දුක්ඛං 'නාභිනන්දති පරිමුත්තො සො දුක්ඛස්මාති වදාමීති.

## 1. 2. 7

## අභිනන්ද සූත්‍රය

**19.** සැවැත්නුවර —

මහණෙනි, යමෙක් ඇස පිළිගනී නම් හෙතෙම දුක පිළිගනියි. යමෙක් දුක පිළිගනි නම් හෙතෙම දුකින් නො මිදුනේ යයි කියමි. යමෙක් කන පිළිගනි නම් හෙතෙම දුක පිළිගනියි. යමෙක් දුක පිළිගනි නම් හෙතෙම දුකින් නො මිදුනේ ය යි කියමි. යමෙක් නැහැය පිළිගනී නම් හෙතෙම දුක පිළිගනියි. යමෙක් දුක පිළිගනි නම් හෙතෙම දුකින් නො මිදුනේ ය යි කියමි. යමෙක් දිව පිළිගනි නම් හෙතෙම දුක පිළිගනියි. යමෙක් දුක පිළිගනි නම් හෙතෙම දුකින් නො මිදුනේ ය යි කියමි. යමෙක් කය පිළිගනී නම් හෙතෙම දුක පිළිගනියි. යමෙක් දුක පිළිගනි නම් හෙතෙම දුකින් නො මිදුනේ ය යි කියමි. යමෙක් සිත පිළිගනී නම් හෙතෙම දුක පිළිගනියි. යමෙක් දුක පිළිගනි නම් හෙතෙම දුකින් නො මිදුනේ ය යි කියමි.

මහණෙනි, යමෙක් ඇස නො පිළිගනී නම් හෙතෙම දුක නො පිළිගනියි. යමෙක් දුක නො පිළිගනි නම් හෙතෙම දුකින් මිදුනේ ය යි කියමි. යමෙක් කන නො පිළිගනි නම් හෙතෙම දුක නො පිළිගනියි. යමෙක් දුක නො පිළිගනි නම් හෙතෙම දුකින් මිදුනේ ය යි කියමි. යමෙක් නැහැය නො පිළිගනි නම් හෙතෙම දුක නො පිළිගනියි. යමෙක් දුක නො පිළිගනි නම් හෙතෙම දුකින් මිදුනේ ය යි කියමි. යමෙක් දිව නො පිළිගනි නම් හෙතෙම දුක නො පිළිගනියි. යමෙක් දුක නො පිළිගනි නම් හෙතෙම දුකින් මිදුනේ ය යි කියමි. යමෙක් කය නො පිළිගනී නම් හෙතෙම දුක නො පිළිගනියි. යමෙක් දුක නො පිළිගනි නම් හෙතෙම දුකින් මිදුනේ ය යි කියමි. යමෙක් සිත නො පිළිගනී නම් හෙතෙම දුක නො පිළිගනියි. යමෙක් දුක නො පිළිගනී නම් හෙතෙම දුකින් මිදුනේ ය යි කියමි යි.

## 1. 2. 8

## දුතිය අභිනන්ද සූත්‍රය

**20.** සැවැත්නුවර —

මහණෙනි, යමෙක් රූප අභිනන්දනා කෙරේ නම් හෙතෙම දුක අභිනන්දනා කරයි. යමෙක් දුක අභිනන්දනා කෙරේ නම් හෙතෙම දුකින් නො මිදුනේ ය යි කියමි. යමෙක් ශබ්ද ... ගන්ධ ... රස ... ස්පර්ශ ... ධර්ම අභිනන්දනා කෙරේ නම් හෙතෙම දුක අභිනන්දනා කරයි. යමෙක් දුක අභිනන්දනා කෙරේ නම් හෙතෙම දුකින් නො මිදුනේ ය යි කියමි.

මහණෙනි, යමෙක් රූප අභිනන්දනා නො කෙරේ නම් හෙතෙම දුක අභිනන්දනා නො කරයි. යමෙක් දුක අභිනන්දනා නො කෙරේ නම් හෙතෙම දුකින් මිදුනේ ය යි කියමි. යමෙක් ශබ්ද ... ගන්ධ ... රස ... ස්පර්ශ ... ධර්ම අභිනන්දනා නො කෙරේ නම් හෙතෙම දුක අභිනන්දනා නො කරයි. යමෙක් දුක අභිනන්දනා නො කෙරේ නම් හෙතෙම දුකින් මිදුනේ ය යි කියමි යි.

## 1. 2. 9

### උපපාදසුත්තං

**21, සාවත්ථියං —**

යො භික්ඛවෙ චක්ඛුස්ස උප්පාදො ඨිති අභිනිබ්බත්ති පාතුභාවො, දුක්ඛස්සෙසො උප්පාදො රොගානං ඨිති ජරාමරණස්ස පාතුභාවො. යො සොතස්ස -පෙ- යො ඝානස්ස -පෙ- යො ජිව්හාය -පෙ- යො කායස්ස -පෙ- යො මනස්ස උප්පාදො ඨිති අභිනිබ්බත්ති පාතුභාවො, දුක්ඛස්සෙසො උප්පාදො රොගානං ඨිති ජරාමරණස්ස පාතුභාවො.

යො ච ඛො භික්ඛවෙ චක්ඛුස්ස නිරොධො වූපසමො අත්ථංගමො[1], දුක්ඛස්සෙසො නිරොධො රොගානං වූපසමො ජරාමරණස්ස අත්ථංගමො[1]. යො සොතස්ස නිරොධො වූපසමො අත්ථංගමො[1]. දුක්ඛස්සෙසො නිරොධො රොගානං වූපසමො ජරාමරණස්ස අත්ථංගමො[1]. යො ඝානස්ස -පෙ- යො ජිව්හාය -පෙ- යො කායස්ස -පෙ- යො මනස්ස නිරොධො වූපසමො අත්ථංගමො[1], දුක්ඛස්සෙසො නිරොධො රොගානං වූපසමො ජරාමරණස්ස අත්ථංගමො[1]ති.

## 1. 2. 10

### දුතිය උපපාදසුත්තං

**22. සාවත්ථියං —**

යො භික්ඛවෙ රූපානං උප්පාදො ඨිති අභිනිබ්බත්ති පාතුභාවො, දුක්ඛස්සෙසො උප්පාදො රොගානං ඨිති ජරාමරණස්ස පාතුභාවො. යො සද්දානං -පෙ- යො ගන්ධානං -පෙ- යො රසානං -පෙ- යො ඵොට්ඨබ්බානං -පෙ- යො ධම්මානං උප්පාදො ඨිති අභිනිබ්බත්ති පාතුභාවො. දුක්ඛස්සෙසො උප්පාදො රොගානං ඨිති ජරාමරණස්ස පාතුභාවො.

යො ච ඛො භික්ඛවෙ රූපානං නිරොධො වූපසමො අත්ථංගමො, දුක්ඛස්සෙසො නිරොධො රොගානං වූපසමො ජරාමරණස්ස අත්ථංගමො. යො සද්දානං —පෙ— යො ගන්ධානං -පෙ- යො රසානං —පෙ— යො ඵොට්ඨබ්බානං —පෙ— යො ධම්මානං නිරොධො වූපසමො අත්ථංගමො, දුක්ඛස්සෙසො නිරොධො රොගානං වූපසමො ජරාමරණස්ස අත්ථංගමොති.

**යමකවග්ගො දුතියො.**

**තස්සුද්දානං:**

සම්බොධෙන ද්වෙ වුත්තා අස්සාදෙන පරෙ ද්වෙ
නො චෙ තෙන ද්වෙ වුත්තා අභිනන්දෙන පරෙ ද්වෙ
උප්පාදෙන ද්වෙ වුත්තා වග්ගො තෙන පවුච්චතීති.

---

1. අත්ථංගමො – මජසං, සත්‍ථා.

## 1. 2. 9

### උපපාද සූත්‍රය

**21. සැවැත්නුවර —**

මහණෙනි, ඇසෙහි යම් ඉපැදීමෙක් පැවැත්මෙක් නිපැද්මෙක් පහළවීමෙක් වේ නම් මේ දුකෙහි ඉපැදීම යි, රොගයන්ගේ පැවැත්ම යි, ජරාමරණයෙහි පහළවීම යි. කනෙහි යම් ... නැහැයෙහි යම් ... දිවෙහි යම් ... කයෙහි යම් ... සිතෙහි යම් ඉපැදීමෙක් පැවැත් මෙක් නිපැද්මෙක් පහළවීමෙක් වේ නම් මේ දුකෙහි ඉපැදීම යි, රොගයන්ගේ පැවැත්ම යි, ජරාමරණයෙහි පහළවීම යි.

මහණෙනි, ඇසෙහි යම් නිරොධයෙක් ව්‍යපශමයෙක් අස්තඞගමයෙක් වේ නම් මේ දුකෙහි නිරොධය යි, රොගයන්ගේ ව්‍යපශම ය යි, ජරාමරණයෙහි අස්තඞගමය යි. කනෙහි යම් නිරොධයෙක් ව්‍යපශමයෙක් අස්තඞගමයෙක් වේ නම් මේ දුකෙහි නිරොධය යි, රොගයන්ගේ ව්‍යපශමය යි, ජරාමරණයෙහි අස්තඞගමය යි. නැහැයෙහි යම් ... දිවෙහි යම් ... කයෙහි යම් ... සිතෙහි යම් නිරොධයෙක් ව්‍යපශමයෙක් වේ නම් මේ දුකෙහි නිරොධය යි, රොගයන්ගේ ව්‍යපශමය යි, ජරාමරණයෙහි අස්තඞගමය යි.

## 1. 2. 10

### දුතිය උපපාද සූත්‍රය

**22. සැවැත්නුවර—**

මහණෙනි, රූපයන්ගේ යම් ඉපැදීමෙක් පැවැත්මෙක් නිපැද්මෙක් පහළවීමෙක් වේ නම් මේ දුකෙහි ඉපැදීම යි, රොගයන්ගේ පැවැත්ම යි, ජරාමරණයෙහි පහළවීම යි. ශබ්දයන්ගේ යම් ... ගන්ධයන්ගේ යම් ... රසයන්ගේ යම් ... ස්ප්‍රෂ්ටව්‍යයන්ගේ යම් ... ධර්මයන්ගේ යම් ඉපැදීමෙක් පැවැත්මෙක් නිපැද්මෙක් පහළවීමෙක් වේ නම් මේ දුකෙහි ඉපදීම යි, රොගයන්ගේ පැවැත්ම යි, ජරාමරණයෙහි පහළවීම යි.

මහණෙනි, රූපයන්ගේ යම් නිරොධයෙක් ව්‍යපශමයෙක් අස්තඞගමයෙක් වේ නම් මේ දුකෙහි නිරොධය යි, රොගයන්ගේ ව්‍යපශමය යි, ජරාමරණයේ අස්තඞගමය යි. ශබ්දයන්ගේ යම් ... ගන්ධයන්ගේ යම් ... රසයන්ගේ යම් ... ස්ප්‍රෂ්ටව්‍යයන්ගේ යම් .. ධර්මයන්ගේ යම් නිරොධයෙක් ව්‍යපශමයෙක් අස්තඞගමයෙක් වේ නම් මේ දුකෙහි නිරොධය යි, රොගයන්ගේ ව්‍යපශමය යි, ජරාමරණයෙහි අස්තඞගමය යි.

**දෙවැනි යමක වර්ග යි.**

**එහි සූත්‍රනාමාවලිය :**

සමෙබෝධ නමින් දෙකෙක් කියන ලදී, අස්සාද නමින් අනෙක් දෙකෙකි. නො වෙ යන්නෙන් ද දෙකෙක් කියන ලදී. අභිනන්‍ද නමින් ද අනෙක් දෙකෙකි. උපපාද නමින් ද දෙකෙක් කියන ලදී. එයින් වර්ගය යි කියනු ලැබේ.

# 3. සබ්බවග්ගො

## 1. 3. 1

### සබ්බසුත්තං

**23. සාවත්ථියං —**

සබ්බං වො භික්ඛවෙ දෙසිස්සාමි[1] තං සුණාථ. කිඤ්ච භික්ඛවෙ සබ්බං: චක්ඛුඤ්චෙව රූපා ච සොතඤ්ච සද්දා ච ඝානඤ්ච ගන්ධා ච ජිව්හා ච රසා ච කායො ච ඵොට්ඨබ්බා ච මනො ච ධම්මා ච ඉදං වුච්චති භික්ඛවෙ සබ්බං.

යො භික්ඛවෙ එවං වදෙය්‍ය: අහමෙතං සබ්බං පච්චක්ඛාය අඤ්ඤං සබ්බං පඤ්ඤපෙස්සාමීති, තස්ස වාචාවත්ථුරෙවස්ස[2]. පුට්ඨො ච න සම්පායෙය්‍ය, උත්තරිඤ්ච විඝාතං ආපජ්ජෙය්‍ය, තං කිස්ස හෙතු යථා තං භික්ඛවෙ අවිසයස්මින්ති.

## 1. 3. 2

### පහානසුත්තං

**24. සාවත්ථියං —**

සබ්බප්පහානාය[3] වො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි: තං සුණාථ. කතමො ච භික්ඛවෙ සබ්බප්පහානාය ධම්මො: චක්ඛුං භික්ඛවෙ පහාතබ්බං, රූපා පහාතබ්බා, චක්ඛුවිඤ්ඤාණං පහාතබ්බං, චක්ඛු සම්ඵස්සො පහාතබ්බො, යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තම්පි පහාතබ්බං -පෙ-

ජිව්හා පහාතබ්බා, රසා පහාතබ්බා. ජිව්හාවිඤ්ඤාණං පහාතබ්බං, ජිව්හා සම්ඵස්සො පහාතබ්බො, යම්පිදං ජිව්හාසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි පහාතබ්බං -පෙ-

මනො පහාතබ්බො, ධම්මා පහාතබ්බා, මනොවිඤ්ඤාණං පහාතබ්බං මනොසම්ඵස්සො පහාතබ්බො, යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි පහාතබ්බං. අයං ඛො භික්ඛවෙ සබ්බප්පහානාය ධම්මොති.

---

1. දෙසෙස්සාමි - මජසං,
2. වාචාවත්ථුකමෙවස්ස මජසං, වාචාවත්ථුදෙවස්ස - සයා.
3. සබ්බං පහානාය - සයා

# 3. සබ්බවර්ගය

## 1. 3. 1

## සබ්බ සූත්‍රය

**23. සැවැත්නුවර —**

මහණෙනි, තොපට සියල්ල දෙසමි. එය අසව. මහණෙනි, සියල්ල යනු කිම යත්: චක්ෂුස යැ රූපයෝ යැ ශ්‍රොත්‍ර යැ ශබ්ද-යෝ යැ ඝ්‍රාණ යැ ගන්ධයෝ යැ ජිහ්වා යැ රසයෝ යැ කාය යැ ස්ප්‍රෂ්ටව්‍යයෝ යැ මනස යැ ධර්මයෝ යි. මහණෙනි, මෙ සියල්ල යි කියනු ලැබේ.

මහණෙනි, යමෙක් "මම තෙල සියල්ල පිළිකෙව් කොට අන් සියල්ලක් පනවමි" යි මෙසේ කියා නම් ඔහුගේ එ වදන් වචන මාත්‍ර මැ වන්නේ යැ. එ කවර හෙයින යත්: මහණෙනි, අවිෂය හෙයිනි යි.

## 1. 3. 2

## ප්‍රහාණ සූත්‍රය

**24. සැවැත්නුවර —**

මහණෙනි, තොපට සර්වප්‍රහාණයට දහම් දෙසමි. එය අසව මහණෙනි, සර්වප්‍රහාණයට දහම් කවරෙ යත්: මහණෙනි, චක්ෂුස (උපදවන තෘෂ්ණාව) ප්‍රහාණ කටයුතු යැ. රූපයෝ ප්‍රහාණ කටයුත්තාහ. චක්ෂුර්විඥානය ප්‍රහාණ කටයුතු යැ. චක්ෂුස්සංස්පර්ශය ප්‍රහාණ කටයුතු යැ. චක්ෂුස්සංස්පර්ශප්‍රත්‍යයෙන් උපදනා සුව වූ හෝ දුක් වූ හෝ නො දුක් නො සුව වූ හෝ යම් වෙදයිතයෙක් ඇත් නම් එ ද ප්‍රහාණ කටයුතු . . .

ජිහ්වා (උපදවන තෘෂ්ණාව) ප්‍රහාණ කටයුතු යැ. රසයෝ ප්‍රහාණ කටයුත්තාහ. ජිහ්වාවිඥානය ප්‍රහාණ කටයුතු යැ. ජිහ්වාසංස්පර්ශය ප්‍රහාණ කටයුතු යැ. ජිහ්වාසංස්පර්ශප්‍රත්‍යයෙන් උපදනා සුව වූ හෝ දුක් වූ හෝ නො දුක් නො සුව වූ හෝ යම් වෙදයිතයෙක් ඇත් නම් එ ද ප්‍රහාණ කටයුතු . . .

භවඞ්ගචිත්ත සඞ්ඛ්‍යාත මනස (උපදවන තෘෂ්ණාව) ප්‍රහාණ කටයුතු යැ ආලම්බන සඞ්ඛ්‍යාත ධර්මයෝ ප්‍රහාණ කටයුත්තාහ. මනෝවිඥානය. ප්‍රහාණ කටයුතු යැ. මනස්සංස්පර්ශය ප්‍රහාණ කටයුතු යැ. මනස්සංස්පර්ශ ප්‍රත්‍යයෙන් උපදනා සුව වූ හෝ දුක් වූ හෝ නො දුක් නො සුව වූ හෝ යම් වේදයිතයෙක් ඇත් නම් එ ද ප්‍රහාණ කටයුතු.

## 1. 3. 3

## දුතිය පහානසුත්තං

**25.** සාවත්ථියං —

සබ්බං අභිඤ්ඤා පරිඤ්ඤා පහානාය වො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි, තං සුණාථ.

කතමො ච භික්ඛවෙ සබ්බං අභිඤ්ඤා පරිඤ්ඤා පහානාය ධම්මො: චක්ඛුං භික්ඛවෙ අභිඤ්ඤා පරිඤ්ඤා පහාතබ්බං, රූපා අභිඤ්ඤා පරිඤ්ඤා පහාතබ්බා, චක්ඛුවිඤ්ඤාණං අභිඤ්ඤා පරිඤ්ඤා පහාතබ්බං, චක්ඛුසම්ඵස්සො අභිඤ්ඤා පරිඤ්ඤා පහාතබ්බො, යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අභිඤ්ඤා පරිඤ්ඤා පහාතබ්බං -පෙ-

ජිව්හා අභිඤ්ඤා පරිඤ්ඤා පහාතබ්බා, රසා අභිඤ්ඤා පරිඤ්ඤා පහාතබ්බා, ජිව්හාවිඤ්ඤාණං අභිඤ්ඤා පරිඤ්ඤා පහාතබ්බං, ජිව්හාසම්ඵස්සො අභිඤ්ඤා පරිඤ්ඤා පහාතබ්බො, යම්පිදං ජිව්හාසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අභිඤ්ඤා පරිඤ්ඤා පහාතබ්බං -පෙ-

මනො අභිඤ්ඤා පරිඤ්ඤා පහාතබ්බො, ධම්මා අභිඤ්ඤා පරිඤ්ඤා පහාතබ්බා මනොවිඤ්ඤාණං අභිඤ්ඤා පරිඤ්ඤා පහාතබ්බං, මනොසම්ඵස්සො අභිඤ්ඤා පරිඤ්ඤා පහාතබ්බො, යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අභිඤ්ඤා පරිඤ්ඤා පහාතබ්බං. අයං වො භික්ඛවෙ සබ්බං අභිඤ්ඤා පරිඤ්ඤා පහානාය ධම්මොති.

## 1. 3. 4

## අපරිජානසුත්තං

**26.** සාවත්ථියං —

සබ්බං භික්ඛවෙ අනභිජානං අපරිජානං අවිරාජයං අප්පජහං අභබ්බො දුක්ඛක්ඛයාය. කිඤ්ච භික්ඛවෙ සබ්බං අනභිජානං අපරිජානං අවිරාජයං අප්පජහං අභබ්බො දුක්ඛක්ඛයාය.

## 1. 3. 3

## දෙවැනි ප්‍රහාණ සූත්‍රය

**25. සැවැත්නුවර —**

මහණෙනි, තොපට සියල්ල (සවලක්ෂණාවබෝධයෙන්) වෙසෙසින් දත (සාමාන්‍යලක්ෂණාවබොධයෙන්) පිරිසිඳ දත ප්‍රහාණය පිණිස දහම් දෙසමි, එය අසව.

මහණෙනි, සියල්ල වෙසෙසින් දත පිරිසිඳ දත ප්‍රහාණයට දහම් කවරෙ යත්: මහණෙනි, චක්ෂුස වෙසෙසින් දත පිරිසිඳ දත ප්‍රහාතව්‍ය යැ. රූපයෝ වෙසෙසින් දත පිරිසිඳ දත ප්‍රහාතව්‍යයෝ යැ. චක්ෂුර්විඥානය වෙසෙසින් දත පිරිසිඳ දත ප්‍රහාතව්‍ය යැ. චක්ෂුස්සංස්පර්ශය වෙසෙසින් දත පිරිසිඳ දත ප්‍රහාතව්‍ය යැ. චක්ෂුස්සංස්පර්ශ ප්‍රත්‍යයෙන් උපදනා සුව වේවයි දුක් වේවයි නො දුක් නො සුව වේවයි යම් මැ වෙදයිතයෙක් ඇද්ද එ ද වෙසෙසින් දත පිරිසිඳ දත ප්‍රහාතව්‍ය යි ...

ජිහ්වාව වෙසෙසින් දත පිරිසිඳ දත ප්‍රහාතව්‍ය යැ. රසයෝ වෙසෙසින් දත පිරිසිඳ දත ප්‍රහාතව්‍යයෝ යැ. ජිහ්වාවිඥානය වෙසෙසින් දත පිරිසිඳ දත ප්‍රහාතව්‍ය යැ ජිහ්වාසංස්පර්ශය වෙසෙසින් දත පිරිසිඳ දත ප්‍රහාතව්‍ය යැ. ජිහ්වාසංස්පර්ශ ප්‍රත්‍යයෙන් උපදනා සුව වේවයි දුක් වේවයි නො දුක් නො සුව වේවයි යම් මැ වෙදයිතයෙක් ඇද්ද එ ද වෙසෙසින් දත ප්‍රහාතව්‍ය යි ...

මනස වෙසෙසින් දත පිරිසිඳ දත ප්‍රහාතව්‍ය යැ. ආලම්බන සඞ්ඛ්‍යාත ධර්මයෝ වෙසෙසින් දත පිරිසිඳ දත ප්‍රහාතව්‍යයෝ යැ. මනෝවිඥානය වෙසෙසින් දත පිරිසිඳ දත ප්‍රහාතව්‍ය යැ. මනස්සංස්පර්ශය වෙසෙසින් දත පිරිසිඳ දත ප්‍රහාතව්‍ය යැ. මනස්සංස්පර්ශප්‍රත්‍යයෙන් උපදනා සුව වේවයි දුක් වේවයි නොදුක් නොසුව වේවයි යම් මැ වේදයිතයෙක් ඇද්ද එ ද වෙසෙසින් දත පිරිසිඳ දත ප්‍රහාතව්‍ය ය. මහණෙනි, මේ සියල්ල අභිජානන කොට පරිජානන කොට ප්‍රහාණයට ධර්ම වේ.

## 1. 3. 4

## අපරිජාන සූත්‍රය

**26. සැවැත්නුවර —**

මහණෙනි, සියල්ල වෙසෙසින් නො දන්නේ පිරිසිඳ නො දන්නේ දුරු නො කරන්නේ පහ නො කරන්නේ දුක් ක්ෂය කිරීමට අභව්‍ය වෙයි. මහණෙනි, කවර සියල්ල වෙසෙසින් නො දන්නේ පිරිසිඳ නො දන්නේ දුරු නො කරන්නේ පහ නො කරන්නේ දුක් ක්ෂය කිරීමට අභව්‍ය වේ යැ යත්:

චක්ඛුං භික්ඛවෙ අනභිජානං අපරිජානං අවිරාජයං අප්පජහං අභබ්බො දුක්ඛක්ඛයාය, රූපෙ අනභිජානං අපරිජානං අවිරාජයං අප්පජහං අභබ්බො දුක්ඛක්ඛයාය, චක්ඛුවිඤ්ඤාණං අනභිජානං අපරිජානං අවිරාජයං අප්පජහං අභබ්බො දුක්ඛක්ඛයාය, චක්ඛුසම්ඵස්සං අනභිජානං අපරිජානං අවිරාජයං අප්පජහං අභබ්බො දුක්ඛක්ඛයාය යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනභිජානං අපරිජානං අවිරාජයං අප්පජහං අභබ්බො දුක්ඛක්ඛයාය -පෙ-

ජිව්හං අනභිජානං අපරිජානං අවිරාජයං අප්පජහං අභබ්බො දුක්ඛක්ඛයාය, රසෙ -පෙ- ජිව්හාවිඤ්ඤාණං -පෙ- ජිව්හාසම්ඵස්සං -පෙ- යම්පිදං ජිව්හාසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනභිජානං අපරිජානං අවිරාජයං අප්පජහං අභබ්බො දුක්ඛක්ඛයාය -පෙ-

මනං අනභිජානං අපරිජානං අවිරාජයං අප්පජහං අභබ්බො දුක්ඛක්ඛයාය, ධම්මෙ -පෙ- මනොවිඤ්ඤාණං -පෙ- මනොසම්ඵස්සං -පෙ- යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනභිජානං අපරිජානං අවිරාජයං අප්පජහං අභබ්බො දුක්ඛක්ඛයාය. ඉදං ඛො භික්ඛවෙ සබ්බං අනභිජානං අපරිජානං අවිරාජයං අප්පජහං අභබ්බො දුක්ඛක්ඛයාය.

සබ්බඤ්ච ඛො භික්ඛවෙ අභිජානං පරිජානං විරාජයං පජහං භබ්බො දුක්ඛක්ඛයාය. කිඤ්ච භික්ඛවෙ සබ්බං අභිජානං පරිජානං විරාජයං පජහං භබ්බො දුක්ඛක්ඛයාය:

චක්ඛුං භික්ඛවෙ අභිජානං පරිජානං විරාජයං පජහං භබ්බො දුක්ඛක්ඛයාය, රූපෙ අභිජානං පරිජානං විරාජයං පජහං භබ්බො දුක්ඛක්ඛයාය, චක්ඛුවිඤ්ඤාණං අභිජානං පරිජානං විරාජයං පජහං භබ්බො දුක්ඛක්ඛයාය, චක්ඛුසම්ඵස්සං අභිජානං පරිජානං විරාජයං පජහං භබ්බො දුක්ඛක්ඛයාය, යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අභිජානං පරිජානං විරාජයං පජහං භබ්බො දුක්ඛක්ඛයාය -පෙ-

මහණෙනි, චක්ෂුස වෙසෙසින් නො දන්නේ පිරිසිඳ නො දන්නේ දුරු නො කරන්නේ පහ නො කරන්නේ දුක් ක්ෂය කිරීමට අභව්‍ය වෙයි. රූපයන් වෙසෙසින් නො දන්නේ පිරිසිඳ නො දන්නේ දුරු නො කරන්නේ පහ නො කරන්නේ දුක් ක්ෂය කිරීමට අභව්‍ය වෙයි. චක්ෂුර්විඥානය වෙසෙසින් නො දන්නේ පිරිසිඳ නො දන්නේ දුරු නො කරන්නේ පහ නො කරන්නේ දුක් ක්ෂය කිරීමට අභව්‍ය වෙයි. චක්ෂුස්සංස්පර්ශය වෙසෙසින් නො දන්නේ පිරිසිඳ නො දන්නේ දුරු නො කරන්නේ පහ නො කරන්නේ දුක් ක්ෂය කිරීමට අභව්‍ය වෙයි. චක්ෂුස්සංස්පර්ශප්‍රත්‍යයෙන් උපදනා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වේදයිතයෙක් ඇත් නම් එ ද වෙසෙසින් නො දන්නේ පිරිසිඳ නො දන්නේ දුරු නො කරන්නේ පහ නො කරන්නේ දුක් ක්ෂය කිරීමට අභව්‍ය වේ ...

ජිහ්වාව වෙසෙසින් නො දන්නේ පිරිසිඳ නො දන්නේ දුරු නො කරන්නේ පහ නො කරන්නේ දුක් ක්ෂය කිරීමට අභව්‍ය වෙයි. රසයන් ... ජිහ්වාවිඥානය ... ජිහ්වාසංස්පර්ශය ... ජිහ්වාසංස්පර්ශයෙන් උපදනා සුව වූ හෝ දුක් වූ හෝ නො දුක් නො සුව වූ හෝ යම් වේදයිතයෙක් ඇත් නම් එ ද වෙසෙසින් නො දන්නේ පිරිසිඳ නො දන්නේ දුරු නො කරන්නේ පහ නො කරන්නේ දුක් ක්ෂය කිරීමට අභව්‍ය වේ ...

මනස වෙසෙසින් නො දන්නේ පිරිසිඳ නො දන්නේ දුරු නො කරන්නේ පහ නො කරන්නේ දුක් ක්ෂය කිරීමට අභව්‍ය වෙයි. ධර්මයන් ... මනෝවිඥානය ... මනස්සංස්පර්ශය ... මනස්සංස්පර්ශ ප්‍රත්‍යයෙන් උපදනා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වේදයිතයෙක් ඇත් නම් එ ද වෙසෙසින් නො දන්නේ පිරිසිඳ නො දන්නේ දුරු නො කරන්නේ පහ නො කරන්නේ දුක් ක්ෂය කිරීමට අභව්‍ය වේ. මහණෙනි, මෙ 'සියල්ල' වෙසෙසින් නො දන්නේ පිරිසිඳ නො දන්නේ දුරු නො කරන්නේ පහ නො කරන්නේ දුක් ක්ෂය කිරීමට අභව්‍ය වේ.

තවද මහණෙනි, සියල්ල වෙසෙසින් දන්නේ පිරිසිඳ දන්නේ දුරු කරන්නේ පහ කරන්නේ දුක් ක්ෂය කිරීමට භව්‍ය වෙයි. මහණෙනි, කවර සියල්ල වෙසෙසින් දන්නේ පිරිසිඳ දන්නේ දුරු කරන්නේ පහ කරන්නේ දුක් ක්ෂය කිරීමට භව්‍ය වෙයි යත්:

මහණෙනි, චක්ෂුස වෙසෙසින් දන්නේ පිරිසිඳ දන්නේ දුරු කරන්නේ පහ කරන්නේ දුක් ක්ෂය කිරීමට භව්‍ය වෙයි. රූපයන් වෙසෙසින් දන්නේ පිරිසිඳ දන්නේ දුරු කරන්නේ පහ කරන්නේ දුක් ක්ෂය කිරීමට භව්‍ය වෙයි. චක්ෂුර්විඥානය වෙසෙසින් දන්නේ පිරිසිඳ දන්නේ දුරු කරන්නේ පහ කරන්නේ දුක් ක්ෂය කිරීමට භව්‍ය වෙයි. චක්ෂුස්සංස්පර්ශය වෙසෙසින් දන්නේ පිරිසිඳ දන්නේ දුරු කරන්නේ පහ කරන්නේ දුක් ක්ෂය කිරීමට භව්‍ය වෙයි. චක්ෂුස්සංස්පර්ශප්‍රත්‍යයෙන් උපදනා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වේදයිතයෙක් ඇත් නම් එ ද වෙසෙසින් දන්නේ පිරිසිඳ දන්නේ දුරු කරන්නේ පහ කරන්නේ දුක් ක්ෂය කිරීමට භව්‍ය වෙයි ...

ජිව්හං අභිජානං පරිජානං විරාජයං පජහං භබ්බො දුක්ඛක්ඛයාය, රසෙ -පෙ- ජිව්හාවිඤ්ඤාණං -පෙ- ජිව්හාසම්ඵස්සං -පෙ- යම්පිදං ජිව්හාසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අභිජානං පරිජානං විරාජයං පජහං භබ්බො දුක්ඛක්ඛයාය -පෙ-

මනං අභිජානං පරිජානං විරාජයං පජහං භබ්බො දුක්ඛක්ඛයාය, ධම්මෙ -පෙ- මනොවිඤ්ඤාණං -පෙ- මනොසම්ඵස්සං -පෙ- යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අභිජානං පරිජානං විරාජයං පජහං භබ්බො දුක්ඛක්ඛයාය.

ඉදං ඛො භික්ඛවෙ සබ්බං අභිජානං පරිජානං විරාජයං පජහං භබ්බො දුක්ඛක්ඛයායාති.

## 1. 3. 5

## දුතියඅපරිජානසුත්තං

27. **සාවත්ථියං** —

සබ්බං භික්ඛවෙ අනභිජානං අපරිජානං අවිරාජයං අප්පජහං අභබ්බො දුක්ඛක්ඛයාය, කිඤ්ච භික්ඛවෙ, සබ්බං අනභිජානං අපරිජානං අවිරාජයං අප්පජහං අභබ්බො දුක්ඛක්ඛයාය:

යඤ්ච ඛො භික්ඛවෙ චක්ඛු යෙ ච රූපා යඤ්ච චක්ඛුවිඤ්ඤාණං යෙ ච චක්ඛුවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, යඤ්ච සොතං යෙ ච සද්දා යඤ්ච සොතවිඤ්ඤාණං යෙ ච සොතවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, යඤ්ච ඝානං යෙ ච ගන්ධා යඤ්ච ඝානවිඤ්ඤාණං යෙ ච ඝානවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, යා ච ජිව්හා යෙ ච රසා යඤ්ච ජිව්හාවිඤ්ඤාණං යෙ ච ජිව්හාවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, යො ච කායො යෙ ච ඵොට්ඨබ්බා යඤ්ච කායවිඤ්ඤාණං යෙ ච කායවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා යො ච මනො යෙ ච ධම්මා යඤ්ච මනොවිඤ්ඤාණං යෙ ච මනොවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, ඉදං ඛො භික්ඛවෙ සබ්බං අනභිජානං අපරිජානං අවිරාජයං අප්පජහං අභබ්බො දුක්ඛක්ඛයාය.

ජිහ්වාව වෙසෙසින් දන්නේ පිරිසිඳ දන්නේ දුරු කරන්නේ පහ කරන්නේ දුක් ක්ෂය කිරීමට භව්‍ය වෙයි. රසයන් ... ජිහ්වා-විඥානය ... ජිහ්වාසංස්පර්ශය ... ජිහ්වාසංස්පර්ශප්‍රත්‍යයෙන් උපදනා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වෙදයිතයෙක් ඇත් නම් එ ද වෙසෙසින් දන්නේ පිරිසිඳ දන්නේ දුරු කරන්නේ පහ කරන්නේ දුක් ක්ෂය කිරීමට භව්‍ය වෙයි ..

මනස වෙසෙසින් දන්නේ පිරිසිඳ දන්නේ දුරු කරන්නේ පහ කරන්නේ දුක් ක්ෂය කිරීමට භව්‍ය වෙයි. ධර්මයන් ... මනෝවිඥානය ... මනස්සංස්පර්ශය ... මනස්සංස්පර්ශප්‍රත්‍යයෙන් උපදනා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වේදයිතයෙක් ඇත් නම් එ ද වෙසෙසින් දන්නේ පිරිසිඳ දන්නේ දුරු කරන්නේ පහ කරන්නේ දුක් ක්ෂය කිරීමට භව්‍ය වේ.

මහණෙනි, මෙ 'සියල්ල' වෙසෙසින් දන්නේ පිරිසිඳ දන්නේ දුරු කරන්නේ පහ කරන්නේ දුක් ක්ෂය කිරීමට භව්‍ය වේ.

## 1. 3. 5

## ද්විතීය අපරිජාන සූත්‍රය

**27. සැවැත්නුවර —**

මහණෙනි, සියල්ල වෙසෙසින් නො දන්නේ පිරිසිඳ නො දන්නේ දුරු නො කරන්නේ පහ නො කරන්නේ දුක් ක්ෂය කිරීමට භව්‍ය නො වෙයි. මහණෙනි, කවර සියල්ල වෙසෙසින් නො දන්නේ පිරිසිඳ නො දන්නේ දුරු නො කරන්නේ පහ නො කරන්නේ දුක් ක්ෂය කිරීමට අභව්‍ය වේ යැ යත්:

මහණෙනි, යම් චක්ෂුසෙකුත් වේ ද යම් රූප කෙනෙකුත් ඇත් ද යම් චක්ෂුර්විඥානයෙකුත් වේ ද යම් චක්ෂුර්විඥානයෙන් දතයුතු ධර්ම කෙනෙකුත් ඇද් ද, යම් ශ්‍රෝත්‍රයෙකුත් වේ ද යම් ශබ්ද කෙනෙකුත් ඇද් ද යම් ශ්‍රෝත්‍රවිඥානයෙකුත් ඇද් ද යම් ශ්‍රෝත්‍රවිඥානයෙන් දතයුතු ධර්ම කෙනෙකුත් ඇද් ද, යම් ඝ්‍රාණයෙකුත් වේ ද යම් ගන්ධ කෙනෙකුත් ඇද් ද යම් ඝ්‍රාණවිඥානයෙකුත් වේ ද යම් ඝ්‍රාණ-විඥානයෙන් දතයුතු ධර්ම කෙනෙකුත් ඇද්ද, යම් ජිහ්වාවකුත් ඇද්ද යම් රසයෙකුත් ඇද්ද යම් ජිහ්වාවිඥානයෙකුත් ඇද්ද යම් ජිහ්වා-විඥානයෙන් දතයුතු ධර්ම කෙනෙකුත් ඇද්ද, යම් කයෙක් වේ ද යම් ස්ප්‍රෂ්ටව්‍ය කෙනෙකුත් ඇද්ද යම් කායවිඥානයෙකුත් වේ ද යම් කායවිඥානයෙන් දතයුතු ධර්ම කෙනෙකුත් ඇද්ද, යම් මනසෙකුත් වේ ද යම් ධර්ම කෙනෙකුත් ඇද්ද යම් මනොවිඥානයෙකුත් වේ ද යම් මනොවිඥානයෙන් දතයුතු ධර්ම කෙනෙකුත් ඇද්ද, මහණෙනි මෙ සියල්ල වෙසෙසින් නො දන්නේ පිරිසිඳ නො දන්නේ දුරු නො කරන්නේ පහ නො කරන්නේ දුක් ක්ෂය කිරීමට අභව්‍ය වේ.

සබ්බඤ්ච ඛො භික්ඛවෙ අභිජානං පරිජානං විරාජයං පජහං භබ්බො දුක්ඛක්ඛයාය. කිඤ්ච භික්ඛවෙ සබ්බං අභිජානං පරිජානං විරාජයං පජහං භබ්බො දුක්ඛක්ඛයාය:

යඤ්ච භික්ඛවෙ චක්ඛුං[1] යෙ ච රූපා යඤ්ච චක්ඛුවිඤ්ඤාණං යෙ ච චක්ඛුවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා -පෙ- යා ච ජිව්හා යෙ ච රසා යඤ්ච ජිව්හාවිඤ්ඤාණං යෙ ච ජිව්හාවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා -පෙ- යො ච මනො යෙ ච ධම්මා යඤ්ච මනොවිඤ්ඤාණං යෙ ච මනොවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, ඉදං ඛො භික්ඛවෙ සබ්බං අභිජානං පරිජානං විරාජයං පජහං භබ්බො දුක්ඛක්ඛයායාති.

## 1. 3. 6

## ආදිත්තපරියායසුත්තං

28. එකං සමයං භගවා ගයායං විහරති ගයාසීසෙ සද්ධිං භික්ඛුසහස්සෙන, තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි.

සබ්බං භික්ඛවෙ ආදිත්තං, කිඤ්ච භික්ඛවෙ සබ්බං ආදිත්තං, චක්ඛුං භික්ඛවෙ ආදිත්තං, රූපා ආදිත්තා, චක්ඛුවිඤ්ඤාණං ආදිත්තං චක්ඛුසම්ඵස්සො ආදිත්තො, යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි ආදිත්තං. කෙන ආදිත්තං: ආදිත්තං රාගග්ගිනා දොසග්ගිනා මොහග්ගිනා, ආදිත්තං ජාතියා ජරාමරණෙන, සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි ආදිත්තන්ති වදාමි.

සොතං ආදිත්තං, සද්දා ආදිත්තා, සොතවිඤ්ඤාණං ආදිත්තං, සොතසම්ඵස්සො ආදිත්තො, යම්පිදං සොතසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි ආදිත්තං. කෙන ආදිත්තං: ආදිත්තං රාගග්ගිනා දොසග්ගිනා මොහග්ගිනා, ආදිත්තං ජාතියා ජරාමරණෙන, සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි ආදිත්තන්ති වදාමි.

---

1. චක්ඛු - මජසං.

තවද මහණෙනි, සියල්ල වෙසෙසින් දන්නේ පිරිසිඳ දන්නේ දූරු කරන්නේ පහ කරන්නේ දුක් ක්ෂය කිරීමට භව්‍ය වෙයි. මහණෙනි, කවර සියල්ල වෙසෙසින් දන්නේ පිරිසිඳ දන්නේ දූරු කරන්නේ පහ කරන්නේ දුක් ක්ෂය කිරීමට භව්‍ය වෙයි යත්:

මහණෙනි, යම් චක්ෂුසෙකුත් ඇද්ද යම් රූප කෙනෙකුත් ඇද්ද යම් චක්ෂුර්විඥානයෙකුත් ඇද්ද යම් චක්ෂුර්විඥානයෙන් දතයුතු ධර්ම කෙනෙකුත් ඇද්ද ... යම් ජිහ්වාවකුත් ඇද්ද යම් රස කෙනෙකුත් ඇද්ද යම් ජිහ්වාවිඥානයෙකුත් ඇද්ද යම් ජිහ්වා විඥානයෙන් දතයුතු ධර්ම කෙනෙකුත් ඇද්ද ... යම් මනසෙකුත් ඇද්ද යම් ධර්ම කෙනෙකුත් ඇද්ද යම් මනෝවිඥානයෙකුත් ඇද්ද යම් මනෝවිඥානයෙන් දතයුතු ධර්ම කෙනෙකුත් ඇද්ද, මහණෙනි මෙ සියල්ල වෙසෙසින් දන්නේ පිරිසිඳ දන්නේ දූරු කරන්නේ පහ කරන්නේ දුක් ක්ෂය කිරීමට භව්‍ය වේ.

## 1. 3. 6

## ආදිත්තපරියාය සූත්‍රය

28. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ ගයාගම්නුදුරෙහි ගයාශීර්ෂයෙහි (එනම් ගල්තලාවෙහි) භික්ෂූන් දහසක් හා සමග වැඩවසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක.

මහණෙනි, සියල්ල ඇවිලගන්නා ලදී. මහණෙනි, කවර සියල්ල ඇවිලගන්නා ලද යැ යත්: මහණෙනි, චක්ෂුස ඇවිලගන්නා ලද යැ. රූපයෝ ඇවිලගන්නා ලදහ. චක්ඛුවිඤ්ඤාණය ඇවිලගන්නා ලද යැ. චක්ඛුසම්ඵස්සය ඇවිලගන්නා ලද යැ. චක්ඛුසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ වෙදනායෙක් උපදී නම් එ ද ඇවිලගන්නා ලද යැ. කිමෙකින් ඇවිලගන්නා ලද යැ යත්: රාග ගින්නෙන් දෙස ගින්නෙන් මොහ ගින්නෙන් ඇවිලගන්නා ලද යැ. ජාතියෙන් ජරාමරණයෙන් ඇවිලගන්නා ලද යැ. සෝකයෙන් පරිදේවයෙන් දුඃඛයෙන් දෙමනස්සයෙන් උපායාසයෙන් ඇවිලගන්නා ලදැයි කියමි.

ශ්‍රෝත්‍රය ඇවිලගන්නා ලද යැ. ශබ්දයෝ ඇවිලගන්නා ලදහ. සෝතවිඤ්ඤාණය ඇවිලගන්නා ලද යැ. සෝතසම්ඵස්සය ඇවිල-ගන්නා ලදයැ. සෝතසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වේදනායෙක් උපදී නම් හෙ ද ඇවිලගන්නා ලද යැ. කිමෙකින් ඇවිලගන්නා ලද යැ යත්: රාගගින්නෙන් දේස ගින්නෙන් මෝහගින්නෙන් ඇවිලගන්නා ලද යැ. ජාතියෙන් ජරා මරණයෙන් ඇවිලගන්නා ලද යැ. සෝකයෙන් පරිදේවයෙන් දුඃඛයෙන් දෙමනස්සයෙන් උපායාසයෙන් ඇවිලගන්නා ලදැයි කියමි.

ඝානං ආදිත්තං, ගන්ධා ආදිත්තා, ඝානවිඤ්ඤාණං ආදිත්තං ඝාන-සම්ඵස්සො ආදිත්තො, යම්පිදං ඝානසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි ආදිත්තං, කෙන ආදිත්තං ආදිත්තං රාගග්ගිනා දොසග්ගිනා මොහග්ගිනා, ආදිත්තං ජාතියා ජරාමරණෙන, සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි ආදිත්තන්ති වදාමි.

ජිව්හා ආදිත්තා, රසා ආදිත්තා, ජිව්හාවිඤ්ඤාණං ආදිත්තං, ජිව්හා-සම්ඵස්සො ආදිත්තො, යම්පිදං ජිව්හාසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි ආදිත්තං. කෙන ආදිත්තං ආදිත්තං රාගග්ගිනා දොසග්ගිනා මොහග්ගිනා, ආදිත්තං ජාතියා ජරාමරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි ආදිත්තන්ති වදාමි.

කායො ආදිත්තො, ඵොට්ඨබ්බා ආදිත්තා, කායවිඤ්ඤාණං ආදිත්තං, කායසම්ඵස්සො ආදිත්තො, යම්පිදං කායසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි ආදිත්තං, කෙන ආදිත්තං: ආදිත්තං රාගග්ගිනා දොසග්ගිනා මොහග්ගිනා, ආදිත්තං ජාතියා ජරාමරණෙන, සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි ආදිත්තන්ති වදාමි.

මනො ආදිත්තො, ධම්මා ආදිත්තා, මනොවිඤ්ඤාණං ආදිත්තං, මනොසම්ඵස්සො ආදිත්තො, මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි ආදිත්තං කෙන ආදිත්තං. ආදිත්තං රාගග්ගිනා දොසග්ගිනා මොහග්ගිනා ආදිත්තං ජාතියා ජරා-මරණෙන, සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි ආදිත්තන්ති වදාමි.

එවම්පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො චක්ඛුස්මිම්පි නිබ්බින්දති රූපෙසුපි නිබ්බින්දති, චක්ඛුවිඤ්ඤාණෙපි නිබ්බින්දති, චක්ඛුසම්ඵස්සෙපි නිබ්බින්දති, යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තස්මිම්පි නිබ්බින්දති, -පෙ- ජිව්හායපි නිබ්බින්දති රසෙසුපි නිබ්බින්දති, ජිව්හාවිඤ්ඤාණෙපි නිබ්බින්දති ජිව්හාසම්ඵස්සෙපි[1] නිබ්බින්දති, යම්පිදං ජිව්හාසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තස්මිම්පි නිබ්බින්දති -පෙ- මනස්මිම්පි නිබ්බින්දති, ධම්මෙසුපි නිබ්බින්දති මනොවිඤ්ඤාණෙපි නිබ්බින්දති මනොසම්ඵස්සෙපි

1. ජිව්හාසම්ඵස්සෙසුපි-සීමු.

ඝානය ඇවිලගන්නා ලද යැ. ගන්ධයෝ ඇවිලගන්නා ලදහ. ඝානවිඤ්ඤාණය ඇවිලගන්නා ලද යැ. ඝානසම්ඵස්සය ඇවිලගන්නා ලද යැ. ඝානසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වේදනායෙක් උපදී නම් එ ද ඇවිලගන්නා ලදි. කිමෙකින් ඇවිලගන්නා ලද යැ යත්: රාග ගින්නෙන් ද්වේස ගින්නෙන් මෝහ ගින්නෙන් ඇවිලගන්නා ලද යැ. ජාතියෙන් ජරාමරණයෙන් ඇවිල ගන්නා ලද යැ. සෝකයෙන් පරිදේවයෙන් දුක්ඛයෙන් දෙමනස්සයෙන් උපායාසයෙන් ඇවිලගන්නා ලදැයි කියමි.

ජිව්හාව ඇවිලගන්නා ලද යැ. රසයෝ ඇවිලගන්නා ලදහ. ජිව්හා-විඤ්ඤාණය ඇවිලගන්නා ලද යැ. ජිව්හාසම්ඵස්සය ඇවිලගන්නා ලද යැ. ජිව්හාසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වේදනායෙක් උපදී නම් එද ඇවිලගන්නා ලදි. කිමෙකින් ඇවිලගන්නා ලදයැ යත්: රාග ගින්නෙන් ද්වේසගින්නෙන් මෝහගින්නෙන් ඇවිලගන්නා ලද යැ. ජාතියෙන් ජරාමරණයෙන් ඇවිලගන්නා ලදයැ. සොකයෙන් පරිදෙවයෙන් දුක්ඛයෙන් දෙමනස්සයෙන් උපායාසයෙන් ඇවිලගන්නා ලදැයි කියමි.

කය ඇවිලගන්නා ලද යැ. ඵොට්ඨබ්බයෝ ඇවිලගන්නා ලදහ. කායවිඤ්ඤාණය ඇවිලගන්නා ලද යැ කායසම්ඵස්සය ඇවිලගන්නා ලද යැ. කායසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වේදනායෙක් උපදී නම් එද ඇවිලගන්නා ලදි. කිමෙකින් ඇවිලගන්නා ලද යැ. යත්: රාගගින්නෙන් දෙස-ගින්නෙන් මොහගින්නෙන් ඇවිලගන්නා ලද යැ. ජාතියෙන් ජරා-මරණයෙන් ඇවිලගන්නා ලද යැ සෝකයෙන් පරිදේවයෙන් දුක්ඛයෙන් දෝමනස්සයෙන් උපායාසයෙන් ඇවිලගන්නා ලදැ යි කියමි.

මනස ඇවිලගන්නා ලද යැ. ධම්මයෝ ඇවිලගන්නා ලදහ. මනෝවිඤ්ඤාණය ඇවිලගන්නා ලද යැ. මනෝසම්ඵස්සය ඇවිලගන්නා ලද යැ. මනෝසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වේදනායෙක් උපදී නම් එද ඇවිලගන්නා ලදි. කිමෙකින් ඇවිලගන්නා ලද යැ යත්; රාගගින්නෙන් ද්වේස-ගින්නෙන් මෝහගින්නෙන් ඇවිලගන්නා ලද යැ. ජාතියෙන් ජරා-මරණයෙන් ඇවිලගන්නා ලද යැ. සෝකයෙන් පරිදේවයෙන් දුක්ඛයෙන් දෙමනස්සයෙන් උපායාසයෙන් ඇවිලගන්නා ලදැ යි කියමි.

මහණෙනි, මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්යශ්‍රාවක ඇසෙහිත් කල කිරෙයි. රූපයන්හිත් කලකිරෙයි. චක්ඛුවිඤ්ඤාණයෙහිත් කලකිරෙයි. චක්ඛුසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වේදනායෙක් වේ නම් එහිත් කලකිරෙයි.... දිවෙහිත් කලකිරෙයි. රසයන්හිත් කලකිරෙයි. ජිව්හාවිඤ්ඤාණයෙහිත් කලකිරෙයි. ජිව්හාසම්ඵස්සයෙහිත් කලකිරෙයි. ජිව්හාසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වේදනායෙක් උපදී නම් එහිත් කලකිරෙයි. . . සිතෙහිත් කලකිරෙයි. ධම්මයන්හිත් කල-කිරෙයි. මනෝවිඤ්ඤාණයෙහිත් කලකිරෙයි. මනෝසම්ඵස්සයෙහිත්

නිබ්බින්දති, යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තස්මිම්පි නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති විරාගා විමුච්චති, විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති, ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාතී ති.

ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති. ඉමස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ තස්ස භික්ඛුසහස්සස්ස අනුපාදය ආසවෙහි චිත්තානි විමුච්චිංසූති.

## 1. 3. 7

### අන්ධභූතසුත්තං

29. එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දක නිවාපෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි.

සබ්බං භික්ඛවෙ අන්ධභූතං. කිඤ්ච භික්ඛවෙ සබ්බං අන්ධභූතං? චක්ඛුං භික්ඛවෙ අන්ධභූතං, රූපා අන්ධභූතා, චක්ඛුවිඤ්ඤාණං අන්ධභූතං, චක්ඛුසම්ඵස්සො අන්ධභූතො. යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තම්පි අන්ධභූතං. කෙන අන්ධභූතං: අන්ධභූතං ජාතියා ජරාමරණෙන, සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි අන්ධභූතන්ති වදාමි. සොතං -පෙ-

ජිව්හා අන්ධභූතා, රසා අන්ධභූතා, ජිව්හාවිඤ්ඤාණං අන්ධභූතං, ජිව්හා-සම්ඵස්සො අන්ධභූතො. යම්පිදං ජිව්හාසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අන්ධභූතං. කෙන අන්ධභූතං: අන්ධභූතං ජාතියා ජරාමරණෙන, සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි අන්ධභූතන්ති වදාමි. කායො -පෙ-

මනො අන්ධභූතො, ධම්මා අන්ධභූතා, මනො විඤ්ඤාණං අන්ධභූතං, මනොසම්ඵස්සො අන්ධභූතො, යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අන්ධභූතං. කෙන අන්ධභූතං: අන්ධභූතං ජාතියා ජරාමරණෙන, සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි අන්ධභූතන්ති වදාමි.

කලකිරෙයි. මනෝසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වේදනාවෙක් උපදී නම් එහිත් කලකිරෙයි. කලකිරෙන්නේ නො ඇලෙයි. නොඇල්මෙන් මිදෙයි. මිදුණු කල්හි මිදුණේ යයි දැනීම වෙයි. ජාතිය ක්ෂය වූවා ය. බඹසර වැස නිමවන ලදි. කටයුතු කරන ලදි. මෙ බැව් පිණිස අනෙකක් නැතැ යි දැනගනී යි.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සතුටු සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව පිළිගත්හ. මේ සූත්‍රය දෙශනා කරනු ලබන කල්හි ඒ භික්ෂූන් දහසගේ සිත් උපාදන රහිත ව කෙලෙසුන්ගෙන් මිදුණේ යි.

## 1. 3. 7

## අන්ධභූත සූත්‍රය

29. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **රජගහ** නුවර සමීපයෙහි **කලන්දකනිවාප** නම් වූ **වේළුවනාරාමයෙහි** වැඩවසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක.

මහණෙනි, සියල්ල මඩනා ලදි. මහණෙනි, කවරසියල්ලක් මඩනා ලද ද යත්: මහණෙනි චක්ෂුස මඩනා ලදි, රූපයෝ මඩනා ලදහ, චක්ඛුවිඤ්ඤාණය මඩනා ලදි, චක්ඛුසම්ඵස්සය මඩනා ලදි, චක්ඛු-සම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වේදනාවෙක් උපදී නම් හෙද මඩනා ලදි. කිමෙකින් මඩනා ලද ද යත්: ජාතියෙන් ජරාමරණයෙන් මඩනා ලදි. සෝකයෙන් පරිදේවයෙන් දුක්ඛයෙන් දෝමනස්සයෙන් උපායාසයෙන් මඩනා ලදැ යි කියමි. ශ්‍රොත්‍රය ...

ජිව්හාව මඩනා ලදී. රසයෝ මඩනා ලදහ. ජිව්හාවිඤ්ඤාණ මඩනා ලදි. ජිව්හාසම්ඵස්සය මඩනා ලදි. ජිව්හාසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වෙදනාවෙක් උපදී නම් එද මඩනා ලදි. කිමෙකින් මඩනා ලද ද යත්: ජාතියෙන් ජරාමරණයෙන් මඩනා ලදි. සෝකයෙන් පරිදේවයෙන් දුක්ඛයෙන් දෙමනස්සයෙන් උපායාසයෙන් මඩනා ලදැ යි කියමි. කය ...

මනස මඩනා ලදි. ධම්මයෝ මඩනා ලදහ. මනොවිඤ්ඤාණය මඩනා ලදි. මනොසම්ඵස්සය මඩනා ලදි. මනොසම්ඵස්සය නියා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වෙදනාවෙක් උපදී නම් එ ද මඩනා ලදි. කිමෙකින් මඩනා ලද ද යත්: ජාතියෙන් ජරාමරණයෙන් මඩනා ලදි. සෝකයෙන් පරිදේවයෙන් දුක්ඛයෙන් දෙමනස්සයෙන් උපායාසයෙන් මඩනා ලදැ යි කියමි.

එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො චක්ඛුස්මිම්පි නිබ්බින්දති, රූපෙසුපි නිබ්බින්දති, චක්ඛුවිඤ්ඤාණෙපි නිබ්බින්දති, චක්ඛුසම්ඵස්සෙපි නිබ්බින්දති යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තස්මිම්පි නිබ්බින්දති -පෙ- මනස්මිම්පි නිබ්බින්දති ධම්මෙසුපි නිබ්බින්දති, මනොවිඤ්ඤාණෙපි නිබ්බින්දති, මනොසම්ඵස්සෙපි නිබ්බින්දති, යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තස්මිම්පි නිබ්බින්දති. නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1.3.8

## සාරුප්පපටිපදසුත්තං

**30.** සාවත්ථියං —

සබ්බමඤ්ඤිතසමුග්ඝාතසාරුප්පං වො භික්ඛවෙ පටිපදං දෙසිස්සාමි. තං සුණාථ.

කතමා ච සා භික්ඛවෙ සබ්බමඤ්ඤිතසමුග්ඝාතසාරුප්පපටිපද ඉධ භික්ඛවෙ භික්ඛු චක්ඛුං න මඤ්ඤති, චක්ඛුස්මිං න මඤ්ඤති, චක්ඛුතො න මඤ්ඤති, චක්ඛුං මෙති න මඤ්ඤති, රූපෙ න මඤ්ඤති, රූපෙසු න මඤ්ඤති, රූපතො න මඤ්ඤති, රූපා මෙති න මඤ්ඤති. චක්ඛුවිඤ්ඤාණං න මඤ්ඤති, චක්ඛුවිඤ්ඤාණස්මිං න මඤ්ඤති. චක්ඛුවිඤ්ඤාණතො න මඤ්ඤති, චක්ඛුවිඤ්ඤාණං මෙති න මඤ්ඤති. චක්ඛුසම්ඵස්සං න මඤ්ඤති, චක්ඛුසම්ඵස්සස්මිං න මඤ්ඤති, චක්ඛු-සම්ඵස්සතො න මඤ්ඤති, චක්ඛුසම්ඵස්සො මෙති න මඤ්ඤති. යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි න මඤ්ඤති තස්මිම්පි න මඤ්ඤති. තතොපි න මඤ්ඤති. තම්මෙති න මඤ්ඤති -පෙ-

ජිව්හං න මඤ්ඤති, ජිව්හාය න මඤ්ඤති, ජිව්හාතො න මඤ්ඤති, ජිව්හා මෙති න මඤ්ඤති. රසෙ න මඤ්ඤති රසෙසු න මඤ්ඤති, රසතො න මඤ්ඤති, රසා මෙති න මඤ්ඤති. ජිව්හාවිඤ්ඤාණං න මඤ්ඤති, ජිව්හාවිඤ්ඤාණස්මිං න මඤ්ඤති, ජිව්හාවිඤ්ඤාණතො න මඤ්ඤති, ජිව්හාවිඤ්ඤාණං මෙති න මඤ්ඤති. ජිව්හාසම්ඵස්සං

මහණෙනි, මෙසේ දක්නා ශ්‍රුතවත් ආර්යශ්‍රාවක චක්‍ෂුසෙහිත් කලකිරෙයි. චක්ඛුවිඤ්ඤාණයෙහිත් කලකිරෙයි. රූපයන්හිත් කලකිරෙයි. චක්ඛුසම්ඵස්සයෙහිත් කලකිරෙයි. චක්ඛුසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වෙදනායෙක් උපදී නම් එහිත් කලකිරෙයි. . . මනසෙහි ද කලකිරෙයි. ධර්මයන්හිත් කලකිරෙයි මනොවිඤ්ඤාණයෙහිත් කලකිරෙයි. මනොසම්ඵස්සයෙහිත් කලකිරෙයි. මනොසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වෙදනායෙක් උපදී නම් එහිත් කලකිරෙයි. කලකිරෙන්නේ නො ඇලෙයි. නො ඇල්මෙන් මිදෙයි. මිදුණු කල්හි මිදුණේ යයි දැනීම වෙයි. ජාතිය ක්‍ෂය වූවා ය. බඹසර වැස නිමවන ලදි. කටයුතු කරන ලදි. මේ බැව් පිණිස අනෙකක් නැතැ යි දැනගනී යි.

## 1. 3. 8

## සාරුප්පපටිපද සූත්‍රය

**30. සැවැත් නුවර –**

මහණෙනි, තොපට සියලු (තෘෂ්ණාදෘෂ්ටිමාන) මඤ්ඤනා සමුග්ඝාතයට නිසි ප්‍රතිපදාව දෙසමි. එය අසවු.

මහණෙනි, ඒ සියලු මඤ්ඤනා සමුග්ඝාතයට නිසි ප්‍රතිපදා කවර යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ චක්‍ෂුස 'මම වෙමි'යි (තෘෂ්ණා දෘෂ්ටිමාන වශයෙන්) නො හඟියි. 'මම චක්‍ෂුසෙහි පිහිටියෙමි'යි නො හඟියි. 'මම චක්‍ෂුසින් බැහැර වෙමි'යි නො හඟියි. චක්‍ෂුස මාගේ යයි නො හඟියි. රූපයන් 'මම වෙමි'යි නො හඟියි. රූපයන්හි ආත්මය ඇතැයි නො හඟියි. රූපයෙන් බැහැර ආත්මය ඇතැයි නො හඟියි. රූපයෝ තමා අයත් වෙති නො හඟියි චක්‍ෂුර්විඥානය ආත්ම යයි නො හඟියි. චක්‍ෂුර්විඥානයෙහි ආත්මය ඇතැ යි නො හඟියි. චක්‍ෂුර්විඥානයෙන් බැහැර ආත්මය ඇතැ යි නො හඟියි. චක්‍ෂුර්විඥානය තමා අයත් යයි නො හඟියි. චක්ඛුසම්ඵස්සය ආත්ම යයි නො හඟියි. චක්ඛුසම්ඵස්සයෙහි ආත්මය ඇතැ යි නො හඟියි චක්ඛුසම්ඵස්සයෙන් බැහැර ආත්මය ඇතැ යි නො හඟියි. චක්ඛු–සම්ඵස්සය මාගේ යයි නො හඟියි. චක්ඛුසම්ඵස්සප්‍රත්‍යයෙන් උපදනා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වේදයිතයෙක් ඇත් නම් එ ද 'ආත්ම'යයි නො හඟියි. ආත්මය එහි වෙති ද නො හඟියි. ආත්මය ඉන් බැහැර වෙති ද නො හඟියි. එය මාගේ යයි නො හඟී.

ජිව්හාව ආත්ම යයි නො හඟියි. ජිව්හායෙහි 'ආත්මය ඇතැ'යි නො හඟියි. ජිව්හායෙන් බැහැර 'ආත්මය ඇතැ'යි නො හඟියි. ජිව්හාව මාගේ යයි නො හඟියි රසයන් ආත්ම යයි නො හඟියි. රසයෙහි ආත්මය ඇතැ යි නො හඟියි, රසයෙන් බැහැර ආත්මය ඇතැ'යි නො හඟියි. රසයෝ මාගේ යයි නො හඟියි. ජිව්හා–විඤ්ඤාණය ආත්ම යයි නො හඟියි. ජිව්හාවිඤ්ඤාණයෙහි ආත්මය ඇතැ යි නො හඟියි. ජිව්හාවිඤ්ඤාණයෙන් බැහැර ආත්මය ඇතැ යි නො හඟියි. ජිව්හාවිඤ්ඤාණය මාගේ යයි නො හඟියි. ජිව්හාසම්ඵස්සය

න මඤ්ඤති, ජිව්හාසම්ඵස්සස්මිං න මඤ්ඤති, ජිව්හාසම්ඵස්සතො න මඤ්ඤති, ජිව්හාසම්ඵස්සො මෙති න මඤ්ඤති, යම්පිදං ජිව්හාසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි න මඤ්ඤති, තස්මිම්පි න මඤ්ඤති, තතොපි න මඤ්ඤති, තමෙමති න මඤ්ඤති –පෙ–

මනං න මඤ්ඤති, මනස්මිං න මඤ්ඤති, මනතො න මඤ්ඤති, මනො මෙති න මඤ්ඤති. ධම්මෙ න මඤ්ඤති, ධම්මේසු න මඤ්ඤති, ධම්මතො න මඤ්ඤති, ධම්මා මෙති න මඤ්ඤති. මනොවිඤ්ඤාණං න මඤ්ඤති, මනොවිඤ්ඤාණස්මිං න මඤ්ඤති, මනොවිඤ්ඤාණතො න මඤ්ඤති, මනොවිඤ්ඤාණං මෙති න මඤ්ඤති. මනොසම්ඵස්සං න මඤ්ඤති, මනොසම්ඵස්සස්මිං න මඤ්ඤති, මනොසම්ඵස්සතො න මඤ්ඤති, මනොසම්ඵස්සො මෙති න මඤ්ඤති. යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි න මඤ්ඤති, තස්මිම්පි න මඤ්ඤති, තතොපි න මඤ්ඤති, තමෙමති න මඤ්ඤති.

සබ්බං න මඤ්ඤති, සබ්බස්මිං න මඤ්ඤති, සබ්බතො න මඤ්ඤති, සබ්බං මෙති න මඤ්ඤති. සො එවං අමඤ්ඤමානො න ච කිඤ්චි ලොකෙ උපාදියති, අනුපාදියං න පරිතස්සති, අපරිතස්සං පච්චත්තඤ්ඤෙව පරිනිබ්බායති. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති.

අයං ඛො සා භික්ඛවෙ සබ්බමඤ්ඤිතසමුග්ඝාතසාරුප්පපටිපදති.

## 1. 3. 9

## සප්පායපටිපදසුත්තං

**31. සාවත්ථියං —**

සබ්බමඤ්ඤිතසමුග්ඝාතසප්පායං වො භික්ඛවෙ පටිපදං දෙසිස්සාමි තං සුණාථ.

කතමා ච සා භික්ඛවෙ සබ්බමඤ්ඤිතසමුග්ඝාතසප්පායපටිපදා:

ආත්මයයි නො හඟී යි, ජිව්හාසම්ඵස්සයෙහි ආත්මය ඇතැ යි නො හඟියි, ජිව්හාසම්ඵස්සයෙන් බැහැර ආත්මය ඇතැ යි නො හඟියි, ජිව්හාසම්ඵස්සය මාගේ යයි නො හඟී, ජිව්හාසම්ඵස්සප්‍රත්‍යයෙන් උපන් සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වෙදයිතයෙක් ඇත් නම් එ ද ආත්ම යයි නො හඟියි. එහි ද ආත්මය ඇතැ යි නො හඟියි, එයින් බැහැර ද ආත්මය ඇතැ'යි නො හඟියි, එය මාගේ යයි ද නො හඟියි.

මනස 'ආත්ම' යයි නො හඟියි, මනසෙහි ආත්මය ඇතැ'යි නො හඟියි, මනසින් බැහැර ආත්මය ඇතැ'යි නො හඟියි, මනස ආත්මය අයත් යයි නො හඟියි. ධර්මයන් 'ආත්ම' යයි නො හඟියි, ධර්මයන්හි ආත්මය ඇතැ යි නො හඟියි, ධර්මයෙන් බැහැර ආත්මය ඇතැ'යි නො හඟියි, ධර්මය ආත්මය අයත් යයි නො හඟියි. මනොවිඤ්ඤානය ආත්ම යයි නො හඟියි, මනෝවිඤ්ඤානයෙහි ආත්මය ඇතැ'යි නො හඟියි, මනෝවිඤ්ඤානයෙන් බැහැර ආත්මය ඇතැ'යි නො හඟියි, මනෝවිඤ්ඤානය ආත්මය අයත් යයි නො හඟියි. මනෝසම්ඵස්සය ආත්ම යයි නො හඟියි, මනෝසම්ඵස්සයෙහි ආත්මය ඇතැ'යි නො හඟියි, මනෝසම්ඵස්සයෙන් බැහැර ආත්මය ඇතැයි නො හඟියි, මනෝසම්ඵස්සය ආත්මය අයත් යයි නො හඟියි, මනොසම්ඵස්සප්‍රත්‍යයෙන් උපදනා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වේදයිතයෙක් ඇත් නම් එ ද ආත්ම යයි නො හඟියි. එහිදු ආත්මය ඇතැ'යි නො හඟියි. එයින් බැහැර ද ආත්මය ඇතැ'යි නො හඟියි. එය ආත්මය අයත් යයි නො හඟී.

සියල්ල ආත්ම යයි නො හඟියි, සියල්ලෙහි ආත්මය ඇතැ'යි නො හඟියි, සියල්ලෙන් බැහැර ආත්මය ඇතැ'යි නො හඟියි, සියල්ල ආත්මය අයත් යයි නො හඟී. මෙසේ මඤ්ඤනා නො කරන්නේ ලෝකයෙහි කිසිවක් උපාදන නො කෙරෙයි. උපාදන නො කරනුයේ තෘෂ්ණා නො කෙරෙයි. තෘෂ්ණා නො කරනුයේ මෙඅත්බැව්හි මැ පිරිනිවෙයි. ජාති ක්‍ෂය වූ යැ. මහබඹසර වැස නිමවන ලද. කරණී කරනලද. මෙ රහත්බව පිණිස කළයුතු අන් කිසෙක් නැතැ'යි දනගනී.

මහණෙනි, මේ වූකලී ඒ සියලු (තෘෂ්ණා දෘෂ්ටි මාන) මඤ්ඤනා සමුග්ඝාතයට නිසි ප්‍රතිපද යි.

## 1. 3. 9

## සප්පායපටිපද සූත්‍රය

**31. සැවැත් නුවර —**

මහණෙනි, තොපට සියලු මඤ්ඤනාසමුග්ඝාතයට සත්ප්‍රාය වූ ප්‍රතිපදව දෙසමි. එය අසවු.

මහණෙනි, ඒ සියලු මඤ්ඤනාසමුග්ඝාතයට සත්ප්‍රාය වූ ප්‍රතිපද කවර යත්:

ඉධ භික්ඛවෙ භික්ඛු චක්ඛුං න මඤ්ඤති, චක්ඛුස්මිං න මඤ්ඤති, චක්ඛුතො න මඤ්ඤති, චක්ඛුං මෙති න මඤ්ඤති, රූපෙ න මඤ්ඤති -පෙ- චක්ඛුවිඤ්ඤාණං න මඤ්ඤති -පෙ- චක්ඛුසම්ඵස්සං න මඤ්ඤති -පෙ- යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි න මඤ්ඤති, තස්මිම්පි න මඤ්ඤති, තතොපි න මඤ්ඤති, තමෙමති න මඤ්ඤති.

යං හි භික්ඛවෙ මඤ්ඤති, යස්මිං මඤ්ඤති, යතො මඤ්ඤති, යමෙමති මඤ්ඤති, තතො තං හොති අඤ්ඤථා. අඤ්ඤථාභාවී භවසත්තො ලොකො භවමෙව අභිනන්දති -පෙ-

ජිව්හං න මඤ්ඤති, ජිව්හාය න මඤ්ඤති. ජිව්හාතො න මඤ්ඤති, ජිව්හා මෙති න මඤ්ඤති. රසෙ න මඤ්ඤති -පෙ- යම්පිදං ජිව්හාසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි න මඤ්ඤති තස්මිම්පි න මඤ්ඤති, තතොපි න මඤ්ඤති, තමෙමති න මඤ්ඤති. යං හි භික්ඛවෙ මඤ්ඤති, යස්මිං මඤ්ඤති, යතො මඤ්ඤති, යමෙමති මඤ්ඤති, තතො තං හොති අඤ්ඤථා. අඤ්ඤථාභාවී භවසත්තො ලොකො භවමෙව අභිනන්දති -පෙ-

මනං න මඤ්ඤති මනස්මිං න මඤ්ඤති, මනතො න මඤ්ඤති, මනො මෙති න මඤ්ඤති. ධම්මෙ න මඤ්ඤති -පෙ- මනොවිඤ්ඤාණං න මඤ්ඤති -පෙ- මනොසම්ඵස්සං න මඤ්ඤති, යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි න මඤ්ඤති, තස්මිම්පි න මඤ්ඤති, තතොපි න මඤ්ඤති, තමෙමති න මඤ්ඤති.

යං හි භික්ඛවෙ මඤ්ඤති, යස්මිං මඤ්ඤති, යතො මඤ්ඤති, යමෙමති මඤ්ඤති. තතො තං හොති අඤ්ඤථා. අඤ්ඤථාභාවී භවසත්තො ලොකො භවමෙව අභිනන්දති.

මහණෙනි, මෙසස්නෙහි මහණ චක්‍ෂුස ආත්ම යයි නො හඟියි, චක්‍ෂුසෙහි ආත්ම යයි නො හඟියි, චක්‍ෂුයින් බැහැර ආත්ම යයි නො හඟියි, චක්‍ෂුස මාගේ යයි නො හඟී. රූපයන් ආත්ම යයි නො හඟියි. . . චක්‍ෂුර්විඥානය ආත්ම යයි නො හඟියි, චක්ඛුසම්ඵස්සය ආත්ම යයි නො හඟියි, චක්ඛුසම්ඵස්සයෙන් උපදනා සුඛ වේවයි දුක්ඛ වේවයි අදුක්ඛාසුඛ වේවයි යම් මැ වේදයිතයෙක් වේ නම් එ ද ආත්ම යයි නො හඟියි, එහි දු ආත්මය ඇතැ යි නො හඟියි, එයින් බැහැර ද ආත්මය ඇතැ යි නො හඟියි, එය ආත්මය අයත් යයි ද නො හඟී.

මහණෙනි, යමක් ආත්ම යයි හඟී ද යම් තැනෙක ආත්මය ඇතැ'යි හඟී ද යමෙකින් බැහැර ආත්මය ඇතැ'යි හඟී ද යමක් ආත්මය අයත් යයි හඟී ද එයින් ඒ අන්ප්‍රකාරයෙන් වෙයි. (විපරීත වෙයි.) විපරීත ආකාරයෙන් වන භවයෙහි ඇලුණු ලෝකයා භවය මැ ප්‍රාර්ථනා කරයි. . .

ජිහ්වාව ආත්ම යයි නො හඟියි. ජිහ්වායෙහි ආත්මය ඇතැ'යි නො හඟියි, ජිහ්වායෙන් බැහැර ආත්මය ඇතැ'යි නො හඟියි, ජිහ්වාව මාගේ යයි නො හඟී. රසයන් ආත්ම යයි නො හඟියි. . . ජිහ්වාසම්ඵස්සයෙන් උපදනා සුඛ වේවයි දුඃඛ වේවයි අදුක්ඛාසුඛ වේවයි යම් වෙදයිතයෙක් වේ නම් එ ද ආත්ම යයි නො හඟියි, එහි ආත්මය ඇතැ'යි ද නො හඟියි, එයින් බැහැර ආත්මය ඇතැ'යි ද නො හඟියි, එය ආත්මය අයත් යයි ද නො හඟී. මහණෙනි, යම් හෙයකින් යමක් ආත්ම යයි හඟී ද යම් තැනෙකැ ආත්මය ඇතැ'යි හඟී ද යමෙකින් බැහැර ආත්මය ඇතැ'යි හඟී ද යමක් මාගේ යයි හඟී ද එයින් එය අන් ප්‍රකාරයෙන් වෙයි. අන් ආකාරයෙන් වන භවයෙහි ඇලුණු ලෝකයා භවය මැ ප්‍රාර්ථනා කෙරෙයි...

මනස ආත්ම යයි නො හඟියි, මනසෙහි ආත්මය ඇතැ'යි නො හඟියි, මනයින් බැහැර ආත්මය ඇතැ'යි නො හඟියි, මනස මාගේ යයි නො හඟියි. ධර්මයන් ආත්ම යයි නො හඟියි. . . . මනෝවිඥානය ආත්ම යයි නො හඟියි. . . මනෝසම්ඵස්සය ආත්ම යයි නො හඟියි. . . මනෝසම්ඵස්සප්‍රත්‍යයෙන් උපදනා සුඛ වේවයි දුඃඛ වේවයි අදුක්ඛාසුඛ වේවයි යම් වේදයිතයෙක් ඇත් නම් එ ද ආත්ම යයි නො හඟියි, එහි ආත්මය ඇතැ'යි ද එයින් බැහැර ආත්මය ඇතැයි ද නො හඟියි, එය මාගේ යයි ද නො හඟී.

මහණෙනි, යම් හෙයකින් යමක් ආත්ම යයි හඟී ද යම් තැනෙක ආත්මය ඇතැ'යි හඟී ද යමෙකින් බැහැර ආත්මය ඇතැ'යි හඟී ද යමක් මාගේ යයි හඟී ද එයින් එය අන් ප්‍රකාරයෙන් වෙයි. අන් ආකාරයෙන් වන භවයෙහි ඇලුණු ලෝකයා භවය මැ ප්‍රාර්ථනා කෙරෙයි.

යාවතා භික්ඛවෙ ඛන්ධධාතුආයතනං තම්පි න මඤ්ඤති, තස්මිම්පි න මඤ්ඤති, තතොපි න මඤ්ඤති, තමෙමන්ති න මඤ්ඤති, සො එවං න මඤ්ඤමානො න ච කිඤ්චි ලොකෙ උපාදියති, අනුපාදියං න පරිතස්සති, අපරිතස්සං පච්චත්තඤ්ඤෙව පරිනිබ්බායති, ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාති. අයං ඛො සා භික්ඛවෙ සබ්බමඤ්ඤිතසමුග්ඝාතසප්පාය[1]පටිපදති.

## 1. 3. 10

## දුතිය සප්පායපටිපදසුත්තං

**32. සාවත්ථියං —**

සබ්බමඤ්ඤිතසමුග්ඝාතසප්පායං වො භික්ඛවෙ පටිපදං දෙසිස්සාමි තං සුණාථ. කතමා ච සා භික්ඛවෙ සබ්බමඤ්ඤිතසමුග්ඝාතසප්පාය පටිපද:

තං කිම්මඤ්ඤථ භික්ඛවෙ චක්ඛුං නිච්චං වා අනිච්චං වාති? අනිච්චං භන්තෙ. යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? දුක්ඛං භන්තෙ. යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං එතං මම එසො'හමස්මි, සො මෙ අත්තාති? නොහෙතං භන්තෙ.

රූපා නිච්චා වා අනිච්චා වාති? අනිච්චා භන්තෙ. යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? දුක්ඛං භන්තෙ. යං පනානිච්චං දුක්ඛං විපරිනාමධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං ''එතං මම එසොහමස්මි එසො මෙ අත්තා''ති? නොහෙතං භන්තෙ.

චක්ඛුවිඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති? අනිච්චං භන්තෙ. යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? දුක්ඛං භන්තෙ. යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං, කල්ලන්නු තං සමනුපස්සිතුං; ''එතං මම එසො-හමස්මි, එසො මෙ අත්තා''ති? නොහෙතං භන්තෙ.

චක්ඛුසම්ඵස්සො නිච්චො වා අනිච්චො වාති? අනිච්චො භන්තෙ. යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? දුක්ඛං භන්තෙ. යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං ''එතං මම එසො'හමස්මි එසො මෙ අත්තා''ති? නොහෙතං භන්තෙ.

---

1. සප්පායා – මජ්ඣං, සයා.

මහණෙනි, යම් තාක් ස්කන්ධ ධාතු ආයතන ඇද්ද එ ද 'ආත්ම'යයි නො හඟියි, එහි 'ආත්මය ඇතැ'යි ද නො හඟියි, එයින් බැහැර 'ආත්මය ඇතැ'යි ද නො හඟියි, එය මාගේ යයි ද නො හඟියි. හෙ මෙසේ නො හඟනේ ලොව කිසිවක් උපාදන නො කෙරෙයි. උපාදන නො කරනුයේ 'තෘෂ්ණා නො කෙරෙයි. තෘෂ්ණා නො කරනුයේ ඉහාත්මයෙහි මැ පිරිනිවෙයි. ජාති ක්ෂය වූ යැ. මහ බඹසර වැස නිමවන ලද. කරණී කරන ලද. මෙ රහත්බැව පිණිස කළයුතු අන් කිසෙක් නැති'යි දනගනී. මහණෙනි. මේ වූකලී ඒ සියලු මඤ්ඤනා සමුද්ඝාතයට සත්ප්‍රාය වූ ප්‍රතිපද යි.

## 1. 3. 10

## ද්විතීය සත්ප්‍රායප්‍රතිපද සූත්‍රය

32. සැවැත් නුවර —

මහණෙනි, තොපට හැම මඤ්ඤනාසමුද්ඝාතයට සත්ප්‍රාය වූ ප්‍රතිපද දෙසමි එය අසවු. මහණෙනි, හැම මඤ්ඤනාසමුද්ඝාතයට සත්ප්‍රාය වූ ප්‍රතිපද කවර යත්:

මහණෙනි, එය කිමැ යි හඟිවු ද චක්‍ෂුස නිත්‍ය වේ ද නොහොත් අනිත්‍ය වේ ද? අනිත්‍ය යැ වහන්ස. යමෙක් අනිත්‍ය වේ නම් එය දුක් වේ ද නොහොත් සුඛ වේ ද? දුඃඛ යැ වහන්ස. යමෙක් අනිත්‍ය දුඃඛ විපරිණාමස්වභාව ඇත් නම් එය 'තෙල මාගේ යැ තෙලෙ මම වෙමි. තෙලෙ මාගේ ආත්ම යැ'යි දක්නට නිසි වේ ද? වහන්ස තෙල නො නිසි වේ මැ යැ.

රූපයෝ නිත්‍ය වෙත් ද නොහොත් අනිත්‍ය වෙත් ද? අනිත්‍ය යැ වහන්ස. යමෙක් අනිත්‍ය වේ නම් එය දුඃඛ වේ ද නොහොත් සුඛ වේ ද? දුඃඛ යැ වහන්ස. යමෙක් අනිත්‍ය දුඃඛ විපරිණාමස්වභාව වේ නම් එය තෙලෙ මාගේ යැ, තෙලෙ මම වෙමි, තෙලෙ මාගේ ආත්ම යැ'යි දක්නට නිසි වේ ද? වහන්ස තෙල නිසි නො වේ මැ යැ.

චක්‍ෂුර්විඥානය නිත්‍ය වේ ද නොහොත් අනිත්‍ය වේ ද? අනිත්‍ය යැ වහන්ස. යමෙක් අනිත්‍ය වේ නම් එ දුක් වේ ද නොහොත් සුව වේ ද? දුඃඛ යැ වහන්ස. යමෙක් අනිත්‍ය දුඃඛ විපරිණාමස්වභාව වේ නම් එය තෙලෙ මාගේ යැ තෙලෙ මම වෙමි, තෙලෙ මාගේ ආත්ම යැ යි දක්නට නිසි වේ ද? වහන්ස තෙල නිසි නො වේ මැ යැ.

චක්ඛුසම්ඵස්සය නිත්‍ය වේ ද නොහොත් අනිත්‍ය වේ ද? අනිත්‍ය යැ වහන්ස, යමෙක් අනිත්‍ය වේ නම් එය දුඃඛ වේ ද නොහොත් සුඛ වේ ද? දුඃඛ යැ වහන්ස. යමෙක් අනිත්‍ය දුඃඛ විපරිණාමස්වභාව වේ නම් එය තෙලෙ මාගේ යැ, තෙලෙ මම වෙමි, තෙලෙ මාගේ ආත්ම යැ'යි දක්නට නිසි වේ ද? වහන්ස තෙල නිසි නො වේ මැ යි.

යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තම්පි නිච්චං වා අනිච්චං වා ති? අනිච්චං භන්තෙ. යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? දුක්ඛං භන්තෙ. යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලං නු තං සමනුපස්සිතුං: "එතං මම, එසො 'හමස්මි එසො මෙ අත්තා"ති? නොහෙතං භන්තෙ. සොතං –පෙ–

ජිව්හා නිච්චා වා අනිච්චා වා ති? අනිච්චා භන්තෙ. යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වා ති? දුක්ඛං භන්තෙ. යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලං නු තං සමනුපස්සිතුං "එතං මම එසො'හමස්මිං එසො මෙ අත්තා"ති? නොහෙතං භන්තෙ.

රසා නිච්චා වා අනිච්චා වාති? අනිච්චා භන්තෙ. යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වා ති? දුක්ඛං භන්තෙ. යං පනානිච්චං දුක්ඛං විපරිණාම-ධම්මං, කල්ලං නු තං සමනුපස්සිතුං "එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා"ති? නොහෙතං භන්තෙ,

ජිව්හා විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති? අනිච්චං භන්තෙ. යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? දුක්ඛං භන්තෙ. යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලං නු තං සමනුපස්සිතුං: "එතං මම, එසො'හමස්මිං එසො මෙ අත්තා"ති? නො හෙතං භන්තෙ.

ජිව්හාසම්ඵස්සො නිච්චො වා අනිච්චො වාති? අනිච්චො භන්තෙ. යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? දුක්ඛං භන්තෙ. යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං, කල්ලං නු තං සමනුපස්සිතුං "එතං මම එසො'-හමස්මි, එසො මෙ අත්තා"ති? නො හෙතං භන්තෙ.

යම්පිදං ජිව්හාසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තම්පි නිච්චං වා අනිච්චං වා ති? අනිච්චං භන්තෙ. යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? දුක්ඛං භන්තෙ. යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලං නු තං සමනුපස්සිතුං "එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා"ති? නො හෙතං භන්තෙ. කායො –පෙ–

මනො නිච්චො වා අනිච්චො වා ති? අනිච්චො භන්තෙ. යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වා ති? දුක්ඛං භන්තෙ, යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලං නු තං සමනුපස්සිතුං: "එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තාති? නො හෙතං භන්තෙ.

ධම්මා නිච්චා වා අනිච්චා වා ති? අනිච්චා භන්තෙ. යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? දුක්ඛං භන්තෙ. යා පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලං නු තං සමනුපස්සිතුං: "එතං මම එසො'හමස්මි එසො මෙ අත්තා"ති? නො හෙතං භන්තෙ.

චක්ඛුසම්ඵස්සප්‍රත්‍යයෙන් උපදනා සුව වේවයි දුක් වේවයි නොදුක් නොසුව වේවයි යම් වේදයිතයෙක් ඇත් නම් එ ද නිත්‍ය වේ ද නොහොත් අනිත්‍ය වේ ද? අනිත්‍ය යැ වහන්ස. යමෙක් අනිත්‍ය වේ නම් එය දුඃඛ වේ ද නොහොත් සුඛ වේ ද? දුඃඛ යැ වහන්ස. යමෙක් අනිත්‍ය දුඃඛ විපරිණාමස්වභාව ඇත් නම් එය තෙලෙ මාගේ යැ, තෙලෙ මම වෙමි, තෙලෙ මාගේ ආත්ම යැ'යි දක්නට නිසි වේ ද? වහන්ස තෙල නිසි නො වේ මැ යි.

ජිහ්වා නිත්‍ය වේ ද නොහොත් අනිත්‍ය වේ ද? අනිත්‍ය යැ වහන්ස. යමෙක් අනිත්‍ය වේ නම් එය දුඃඛ වේ ද නොහොත් සුඛ වේ ද? දුඃඛ යැ වහන්ස. යමෙක් අනිත්‍ය දුඃඛ විපරිණාමස්වභාව වේ නම් තෙලෙ මාගේ යැ තෙලෙ මම වෙමි, තෙලෙ මාගේ ආත්ම යැ'යි දක්නට නිසි වේ ද? වහන්ස තෙල නිසි නො වේ මැ යි.

රසයෝ නිත්‍ය වෙත් ද නොහොත් අනිත්‍ය වෙත් ද? අනිත්‍ය යැ වහන්ස. යමෙක් අනිත්‍ය වේ නම් එය දුඃඛ වේ ද නොහොත් සුඛ වේ ද? දුඃඛ යැ වහන්ස. යමෙක් අනිත්‍ය දුඃඛ විපරිණාමස්වභාව වේ නම් එය 'තෙලෙ මාගේ යැ, තෙලෙ මම වෙමි, තෙලෙ මාගේ ආත්ම යැ'යි දක්නට නිසි වේ ද? වහන්ස තෙල නිසි නො වේ මැ යි.

ජිහ්වාවිඥානය නිත්‍ය වේ ද නොහොත් අනිත්‍ය වේ ද? අනිත්‍යයැ වහන්ස. යමෙක් අනිත්‍ය වේ නම් එය දුඃඛ වේ ද නොහොත් සුඛ වේ ද? දුඃඛ යැ වහන්ස. යමෙක් අනිත්‍ය දුඃඛ විපරිණාමස්වභාව ඇත් නම් එය 'තෙලෙ මාගේ යැ, තෙලෙ මම වෙමි, තෙලෙ මාගේ ආත්ම යැ'යි දක්නට නිසි වේ ද? වහන්ස තෙල නො වේ මැ යි.

ජිව්හාසම්ඵස්සය නිත්‍ය වේ ද නොහොත් අනිත්‍ය වේ ද? අනිත්‍ය ය. වහන්ස. යමෙක් අනිත්‍ය වේ නම් එය දුඃඛ වේ ද නොහොත් සුඛ වේ ද? දුඃඛ යැ වහන්ස. යමෙක් අනිත්‍ය දුඃඛ විපරිණාමස්වභාව ඇත් නම් එය 'තෙලෙ මාගේ යැ, තෙලෙ මම වෙමි. තෙලෙ මාගේ ආත්ම යැ'යි දක්නට නිසි වේ ද? වහන්ස තෙල නිසි නො වේ මැ යි.

ජිව්හාසම්ඵස්සයෙන් උපදනා සුව වේවයි දුක් වේවයි නොදුක් නොසුව වේවයි යම් වෙදයිතයෙක් ඇත් නම් එ ද නිත්‍ය වේ ද නොහොත් අනිත්‍ය වේ ද? අනිත්‍ය යැ වහන්ස. යමෙක් අනිත්‍ය වේ නම් එය දුඃඛ වේ ද නොහොත් සුඛ වේ ද? දුඃඛ යැ වහන්ස. යමෙක් අනිත්‍ය දුඃඛ විපරිණාමස්වභාව ඇත් නම් එය 'තෙලෙ මාගේ යැ, තෙලෙ මම වෙමි, තෙලෙ මාගේ ආත්ම යැ'යි දක්නට නිසි වේ ද? වහන්ස තෙල නිසි නො වේ මැ යි.

මනස නිත්‍ය වේ ද නොහොත් අනිත්‍ය වේ ද? අනිත්‍ය යැ වහන්ස යමෙක් අනිත්‍ය වේ නම් එය දුඃඛ වේ ද නොහොත් සුඛ වේ ද? දුඃඛ යැ වහන්ස. යමෙක් අනිත්‍ය දුඃඛ විපරිණාමස්වභාව වේ නම් එය 'තෙලෙ මාගේ යැ. තෙලෙ මම වෙමි, තෙලෙ මාගේ ආත්ම යැ'යි දක්නට නිසි වේ ද? වහන්ස තෙල නිසි නො වේ මැ යි.

ධර්මයෝ නිත්‍ය වෙත්ද නොහොත් අනිත්‍ය වෙත් ද? අනිත්‍ය යැ වහන්ස. යමෙක් අනිත්‍ය වේ නම් එය දුඃඛ වේ ද නොහොත් සුඛ වේ ද? දුඃඛ යැ වහන්ස. යමෙක් අනිත්‍ය දුඃඛ විපරිණාමස්වභාව වේ නම් එය 'තෙලෙ මාගේ යැ තෙලෙ මම වෙමි, තෙලෙ මාගේ ආත්ම යැ'යි දක්නට නිසි වේ ද? වහන්ස තෙල නිසි නො වේ මැ යි.

මනොවිඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති? අනිච්චං භන්තෙ. යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? දුක්ඛං භන්තෙ. යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං: 'එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා''ති? නො හෙතං භන්තෙ

මනොසම්ඵස්සො නිච්චො වා අනිච්චො වාති? අනිච්චො භන්තෙ. යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? දුක්ඛං භන්තෙ. යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං: ''එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා''ති? නො හෙතං භන්තෙ.

යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි නිච්චං වා අනිච්චං වාති? අනිච්චං භන්තෙ. යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වා ති? දුක්ඛං භන්තෙ. යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං, කල්ලන්නු තං සමනුපස්සිතුං: ''එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා''ති? නො හෙතං භන්තෙ.

එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො චක්ඛුස්මිම්පි නිබ්බින්දති රූපෙසුපි නිබ්බින්දති, චක්ඛුවිඤ්ඤාණෙපි නිබ්බින්දති, චක්ඛුසම්ඵස්සෙපි නිබ්බින්දති, යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තස්මිම්පි නිබ්බින්දති -පෙ- ජිව්හායපි නිබ්බින්දති; රසෙසුපි නිබ්බින්දති, ජිව්හාවිඤ්ඤාණෙපි නිබ්බින්දති, ජිව්හාසම්ඵස්සෙපි නිබ්බින්දති, යම්පිදං. ජිව්හාසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තස්මිම්පි නිබ්බින්දති -පෙ-

මනස්මිම්පි නිබ්බින්දති, ධම්මෙසුපි නිබ්බින්දති, මනොවිඤ්ඤාණෙපි නිබ්බින්දති, මනොසම්ඵස්සෙපි නිබ්බින්දති, යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තස්මිම්පි නිබ්බින්දති. නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති, විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති, ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති.

අයං ඛො සා භික්ඛවෙ සබ්බමඤ්ඤිතසමුග්ඝාත සප්පායපටිපදාති.

## සබ්බවග්ගො තතියො.

**තස්සුද්දානං:**

සබ්බඤ්ච ද්වෙපි පහානා පරිජානා අපරෙ දුවෙ
ආදිත්තං අන්ධභූතඤ්ච සාරුප්පා ද්වෙච සප්පායා
වග්ගො තෙන පවුච්චතීති.

මනෝවිඥානය නිත්‍ය වේ ද නොහොත් අනිත්‍ය වේ ද? අනිත්‍ය යැ වහන්ස. යමෙක් අනිත්‍ය වේ නම් එය දුඃඛ වේ ද නොහොත් සුඛ වේ ද? දුඃඛ යැ වහන්ස. යමෙක් අනිත්‍ය දුඃඛ විපරිණාමස්වභාව වේ නම් එය 'තෙලෙ මාගේ යැ තෙලෙ මම වෙමි, තෙලෙ මාගේ ආත්ම යැ'යි දක්නට නිසි වේ ද? වහන්ස. තෙල නිසි නො වේ මැ යි.

මනෝසම්ඵස්සය නිත්‍ය වේ ද නොහොත් අනිත්‍ය වේ ද? අනිත්‍ය යැ වහන්ස. යමෙක් අනිත්‍ය වේ නම් එය දුඃඛ වේ ද, නොහොත් සුඛ වේ ද? දුඃඛ යැ වහන්ස. යමෙක් අනිත්‍ය දුඃඛ විපරිණාමස්වභාව වේ නම් එය - තෙලෙ මාගේ යැ තෙලෙ මම වෙමි, තෙලෙ මාගේ ආත්ම යැ'යි දක්නට නිසි වේ ද? වහන්ස තෙල නිසි නො වේ මැ යි.

මනෝසම්ඵස්සප්‍රත්‍යයෙන් උපදනා සුව වේවයි දුක් වේවයි නොදුක් නොසුව වේවයි යම් වේදයිතයෙක් ඇත් නම් එද නිත්‍ය වේ ද නොහොත් අනිත්‍ය වේ ද? අනිත්‍ය යැ වහන්ස. යමෙක් අනිත්‍ය වේ නම් එය දුඃඛ වේ ද නොහොත් සුඛ වේ ද? දුඃඛ යැ වහන්ස. යමෙක් අනිත්‍ය දුඃඛ විපරිණාමස්වභාව වේ නම් එය 'තෙලෙ මාගේ යැ, තෙලෙ මම වෙමි, තෙලෙ මාගේ ආත්ම යැ'යි දක්නට නිසි වේ ද? වහන්ස තෙල නිසි නො වේ මැ යි.

මහණෙනි මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්යශ්‍රාවක චක්ෂුසෙහි දු කලකිරෙයි, රූපයන්හිදු කලකිරෙයි, චක්ෂුර්විඥානයෙහි දු කලකිරෙයි, චක්ඛුසම්ඵස්සයෙහි දු කලකිරෙයි, චක්ඛුසම්ඵස්ස ප්‍රත්‍යයෙන් උපදනා සුව වේවයි දුක් වේවයි නොදුක් නොසුව වේවයි යම් වෙදයිතයෙක් වේ නම් එහි දු කලකිරෙයි... ජිහ්වායෙහි දු කලකිරෙයි, රසයන්හි දු කලකිරෙයි, ජිහ්වාවිඥානයෙහි දු කලකිරෙයි, ජිව්හාසම්ඵස්සයෙහි දු කලකිරෙයි, ජිව්හාසම්ඵස්සප්‍රත්‍යයෙන් උපදනා සුව වේවයි දුක් වේවයි නොදුක් නොසුව වේවයි යම් වේදයිතයෙක් වේ නම් එහි දු කලකිරෙයි ...

මනසෙහි දු කලකිරෙයි, ධර්මයන්හිදු කලකිරෙයි, මනෝවිඥානයෙහි දු කලකිරෙයි, මනෝසම්ඵස්සයෙහි දු කලකිරෙයි, මනෝසම්ඵස්ස ප්‍රත්‍යයෙන් උපදනා සුව වේවයි දුක් වේවයි නොදුක් නොසුව වේවයි යම් වේදයිතයෙක් ඇත් නම් එහි දු කලකිරෙයි. කලකිරෙනුයේ විරක්ත වෙයි, විරාගයෙන් විමුක්ත වෙයි, විමුක්ත කල්හි විමුක්තයෙමි'යි ඥානය වෙයි. ජාති ක්ෂය වූ යැ බඹසර වැස නිමවන ලද. කරණී කරන ලද. මෙ රහත්බව පිණිස අන් කිසෙක් නැතැ යි දනගනී.

මහණෙනි, මෙ වූකලී හැම මඤ්ඤනා සමුද්ඝාතයට සත්ප්‍රාය වූ ප්‍රතිපද යි.

**තුන් වැනි සබ්බ වර්ග යි.**

**එහි උද්දනය:**

සබ්බ සූත්‍ර යැ ප්‍රහාණසූත්‍ර දෙක යැ අපරිජානසූත්‍ර දෙක යැ ආදිත්ත- පරියායසූත්‍ර යැ අන්ධභූතසූත්‍ර යැ සාරුප්පපටිපදසූත්‍ර යැ සප්පායපටිපදසූත්‍ර දෙක යි. එයින් වර්ගය කියනු ලැබෙ.

# 4. ජාතිධම්මවග්ගො.

## 1. 4. 1

### ජාතිධම්මසුත්තං

**33.** සාවත්ථියං —

33. සබ්බං භික්ඛවෙ ජාතිධම්මං කිඤ්ච භික්ඛවෙ. සබ්බං ජාතිධම්මං: චක්ඛුං භික්ඛවෙ ජාතිධම්මං, රූපා ජාතිධම්මා, චක්ඛුවිඤ්ඤාණං ජාතිධම්මං, චක්ඛුසම්ඵස්සො ජාතිධම්මො, යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි ජාතිධම්මං.

සොතං ජාතිධම්මං, සද්දා ජාතිධම්මා, සොතවිඤ්ඤාණං ජාතිධම්මං, සොතසම්ඵස්සො ජාතිධම්මො, යම්පිදං සොතසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි ජාතිධම්මං.

ඝානං ජාතිධම්මං, ගන්ධා ජාතිධම්මා, ඝානවිඤ්ඤාණං ජාතිධම්මං, ඝානසම්ඵස්සො ජාතිධම්මො, යම්පිදං ඝානසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි ජාතිධම්මං.

ජිව්හා ජාතිධම්මා, රසා ජාතිධම්මා, ජිව්හාවිඤ්ඤාණං ජාතිධම්මං, ජිව්හාසම්ඵස්සො ජාතිධම්මො, යම්පිදං ජිව්හාසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි ජාතිධම්මං.

කායො ජාතිධම්මො, ඵොට්ඨබ්බා ජාතිධම්මා, කායවිඤ්ඤාණං ජාතිධම්මං, කායසම්ඵස්සො ජාතිධම්මො, යම්පිදං කායසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි ජාතිධම්මං.

මනො ජාතිධම්මො, ධම්මා ජාතිධම්මා, මනොවිඤ්ඤාණං ජාතිධම්මං, මනොසම්ඵස්සො ජාතිධම්මො, යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි ජාතිධම්මං.

එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො චක්ඛුස්මිම්පි නිබ්බින්දති -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

# 4. ජාතිධම්ම වර්ගය

## 1. 4: 1

## ජාතිධම්ම සූත්‍රය

**33. සැවැත් නුවර —**

මහණෙනි, සියල්ල උපදිනසුලු යැ. මහණෙනි, කවර සියල්ලක් උපදිනසුලු ද යත්; මහණෙනි, ඇස උපදිනසුලු ය. රූපයෝ උපදිනසුල්ලහ. චක්ඛුවිඤ්ඤාණය උපදිනසුලු ය. චක්ඛුසම්ඵස්සය උපදිනසුලු ය. චක්ඛුසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වේදයිතයෙක් උපදී නම් හෙ ද උපදිනසුලු යැ.

කන උපදිනසුලු ය. ශබ්දයෝ උපදිනසුල්ලහ. සෝතවිඤ්ඤාණය උපදිනසුලු ය. සෝතසම්ඵස්සය උපදිනසුලු ය. සෝතසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වේදයිතයෙක් උපදී නම් හෙ ද උපදිනසුලු යැ.

නැහැය උපදිනසුලු ය. ගන්ධයෝ උපදිනසුල්ලහ. ඝානවිඤ්ඤාණය උපදිනසුලු ය. ඝානසම්ඵස්සය උපදිනසුලු ය. ඝානසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ නොදුක් නොසුව වූ හෝ යම් වේදයිතයෙක් උපදී නම් හෙ ද උපදිනසුලු යැ.

දිව උපදිනසුලු ය. රසයෝ උපදිනසුල්ලහ. ජිව්හාවිඤ්ඤාණය උපදිනසුලු ය. ජිව්හාසම්ඵස්සය උපදිනසුලු ය. ජිව්හාසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වේදයිතයෙක් වේ නම් හෙ ද උපදිනසුලු ය.

කය උපදිනසුලු ය. ඵොට්ඨබ්බයෝ උපදිනසුල්ලහ. කායවිඤ්ඤාණය උපදිනසුලු ය. කායසම්ඵස්සය උපදිනසුලු ය. කායසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වේදයිත යෙක් උපදී නම් හෙ ද උපදින සුලු යැ.

මනස උපදිනසුලු ය. දහම්හු උපදිනසුල්ලහ. මනෝවිඤ්ඤාණය උපදිනසුලු ය. මනෝසම්ඵස්සය උපදිනසුලු ය. මනොසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වෙදයි- තයෙක් උපදී නම් හෙ ද උපදිනසුලු යි.

මහණෙනි, මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්යශ්‍රාවක තෙමේ ඇසෙ- හි ත් කලකිරෙයි.... මේ රහත් බැව් පිණිස කළයුතු අනෙකක් නැතැ යි දැනගනී යි.

## 1. 4. 2

## ජරාධම්මසුත්තං

34. **සාවත්ථියං** —

සබ්බං භික්ඛවෙ ජරාධම්මං -පෙ-

## 1. 4. 3

## ව්‍යාධිධම්මසුත්තං

35. සබ්බං භික්ඛවෙ ව්‍යාධිධම්මං -පෙ-

## 1. 4. 4

## මරණධම්මසුත්තං

36. සබ්බං භික්ඛවෙ මරණධම්මං -පෙ-

## 1. 4. 5

## සොකධම්මසුත්තං

37. සබ්බං භික්ඛවෙ සොකධම්මං – පෙ –

## 1. 4. 6

## සංකිලෙසධම්මසුත්තං

38. සබ්බං භික්ඛවෙ සංකිලෙසධම්මං -පෙ-

## 1. 4. 7

## ඛයධම්මසුත්තං

39. සබ්බං භික්ඛවෙ ඛයධම්මං -පෙ-

## 1. 4. 8

## වයධම්මසුත්තං

40. සබ්බං භික්ඛවෙ වයධම්මං -පෙ-

## 1, 4. 9

## සමුදයධම්මසුත්තං

41. සබ්බං භික්ඛවෙ සමුදයධම්මං -පෙ-

## 1. 4. 2

## ජරාධම්ම සූත්‍රය

**34. සැවැත්නුවර —**

මහණෙනි, සියල්ල දිරනසුලු ය....

## 1. 4. 3

## ව්‍යාධිධම්ම සූත්‍රය

35. මහණෙනි, සියල්ල ලෙඩ වනසුලු ය....

## 1. 4. 4

## මරණධම්ම සූත්‍රය

36. මහණෙනි, සියල්ල මැරෙනසුලු ය....

## 1. 4. 5

## සොකධම්ම සූත්‍රය

37. මහණෙනි, සියල්ල ශෝක ස්වභාව යැ....

## 1. 4. 6

## සංකිලෙසධම්ම සූත්‍රය

38. මහණෙනි, සියල්ල කෙලෙසෙනසුලු ය....

## 1. 4. 7

## ඛයධම්ම සූත්‍රය

39. මහණෙනි, සියල්ල ක්ෂය වනසුලු ය....

## 1. 4. 8

## වයධම්ම සූත්‍රය

40. මහණෙනි, සියල්ල ව්‍යය වනසුලු ය....

## 1. 4. 9

## සමුදයධම්ම සූත්‍රය

41. මහණෙනි, සියල්ල හටගන්නාසුලු ය....

## 1. 4. 10

## නිරොධධම්මසුත්තං

**42.** සාවත්ථියං—

සබ්බං භික්ඛවෙ නිරොධධම්මං, කිඤ්ච භික්ඛවෙ සබ්බං නිරොධධම්මං: චක්ඛුං භික්ඛවෙ නිරොධධම්මං, රූපා නිරොධධම්මා, චක්ඛුවිඤ්ඤාණං නිරොධධම්මං; චක්ඛුසම්ඵස්සො නිරොධධම්මො යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි නිරොධධම්මං. සොතං -පෙ-

ජිව්හා නිරොධධම්මා, රසා නිරොධධම්මා, ජිව්හාවිඤ්ඤාණං නිරොධධම්මං, ජිව්හාසම්ඵස්සො නිරොධධම්මො, යම්පිදං ජිව්හාසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි නිරොධධම්මං. කායො -පෙ-

මනො නිරොධධම්මො, ධම්මා නිරොධධම්මා, මනොවිඤ්ඤාණං නිරොධධම්මං, මනොසම්ඵස්සො නිරොධධම්මො, යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි නිරොධධම්මං.

එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො චක්ඛුස්මිම්පි නිබ්බින්දති -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

**ජාතිධම්මවග්ගො චතුත්ථො.**

**තස්සුද්දානං:**

ජාතිජරාව්‍යාධිමරණං සොකො ච සංකිලෙසො ච[1]

ඛයධම්මං වයධම්මඤ්ච සමුදයධම්මං[2] නිරොධධම්මෙන තෙ දසාති.

1. සංකිලෙසිකං-මජසං., සංකිලෙසා-සතා
2. ඛයවයසමුදයං-මජසං.

## 1. 4. 10

## නිරොධධම්ම සූත්‍රය

**42. සැවැත්නුවර —**

මහණෙනි, සියල්ල නිරුද්ධ වන සුලු ය. මහණෙනි, කවර සියල්ලක් නිරුද්ධවනසුලු ද යත්: මහණෙනි, ඇස නිරුද්ධ වන සුලු ය. රූපයෝ නිරුද්ධ වන සුල්ලහ. චක්ඛුවිඤ්ඤාණය නිරුද්ධ වන සුලු ය. චක්ඛුසම්ඵස්සය නිරුද්ධ වන සුලු ය. චක්ඛුසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වේදයිතයෙක් උපදී නම් හෙ ද නිරුද්ධ වන සුලු ය. කන....

දිව නිරුද්ධ වන සුලු ය. රස නිරුද්ධ වන සුලු ය. ජිව්හාවිඤ්ඤාණය නිරුද්ධ වන සුලු ය. ජිව්හාසම්ඵස්සය නිරුද්ධ වන සුලු ය. ජිව්හා-සම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වේදයිතයෙක් උපදී නම් හෙද නිරුද්ධ වන සුලු ය. කය....

සිත නිරුද්ධ වන සුලු ය. දහම්හු නිරුද්ධ වනසුල්ලහ. මනෝ-විඤ්ඤාණය නිරුද්ධ වන සුලුය. මනෝසම්ඵස්සය නිරුද්ධ වන සුලුය. මනොසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වේදයිතයෙක් උපදී නම් හෙ ද නිරුද්ධ වන සුලු ය.

මහණෙනි, මෙසේ දක්නා ශ්‍රැතවත් ආය්‍ර්‍යශ්‍රාවක තෙමේ ඇසෙ-හිත් කලකිරෙයි ... මේ රහත් බැව් පිණිස කළයුතු අනෙකක් නැතැ යි දැනගනී යි.

**සිව් වැනි ජාතිධම්ම වර්ග යි.**

**එහි සූත්‍ර නාමාවලිය:**

ජාතිධම්ම, ජරාධම්ම ව්‍යාධිධම්ම මරණධම්ම සොකධම්ම සංකි-ලෙසධම්ම සූත්‍ර ද ඛයධම්ම වයධම්ම සමුදයධම්ම සූත්‍ර ද යි ඔහු නිරොධධම්මසූත්‍රයෙන් දශයෙක් වේ.

# 5. සබ්බානිච්චවග්ගො.

## 1. 5. 1

### අනිච්චසුත්තං

**43.** **සාවත්ථියං** —

සබ්බං භික්ඛවෙ අනිච්චං. කිඤ්ච භික්ඛවෙ සබ්බං අනිච්චං: චක්ඛුං භික්ඛවෙ අනිච්චං, රූපා අනිච්චා, චක්ඛුවිඤ්ඤාණං අනිච්චං, චක්ඛුසම්ඵස්සො අනිච්චො, යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චං. සොතං –පෙ–

ජිව්හා අනිච්චා, රසා අනිච්චා, ජිව්හාවිඤ්ඤාණං අනිච්චං, ජිව්හාසම්ඵස්සො අනිච්චො, යම්පිදං ජිව්හාසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චං. කායො –පෙ–

මනො අනිච්චො, ධම්මා අනිච්චා, මනොවිඤ්ඤාණං අනිච්චං, මනොසම්ඵස්සො අනිච්චො, යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චං.

එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො චක්ඛුස්මිම්පි නිබ්බින්දති –පෙ– නිබ්බින්දං විරජ්ජති; විරාගා විමුච්චති, විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 5. 2

### දුක්ඛසුත්තං

**44.** සබ්බං භික්ඛවෙ දුක්ඛං –පෙ–

## 1. 5. 3

### අනත්තසුත්තං

**45.** සබ්බං භික්ඛවෙ අනත්තා –පෙ–

## 1. 5. 4

### අභිඤ්ඤෙය්‍යසුත්තං.

**46.** සබ්බං භික්ඛවෙ අභිඤ්ඤෙය්‍යං –පෙ–

# 5. සබ්බානිච්ච වර්ගය

## 1. 5. 1

## අනිච්ච සූත්‍රය

**43.** සැවැත්නුවර —

මහණෙනි සියල්ල අනිත්‍ය ය. මහණෙනි, කවර සියල්ලක් අනිත්‍ය ද යත්: මහණෙනි ඇස අනිත්‍ය ය, රූප අනිත්‍ය ය, චක්ඛු-විඤ්ඤාණය අනිත්‍ය ය, චක්ඛුසම්ඵස්සය අනිත්‍ය ය, චක්ඛුසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වේදයිතයෙක් උපදී නම් එ ද අනිත්‍ය ය. කන....

දිව අනිත්‍ය ය, රස අනිත්‍ය ය, ජිව්හාවිඤ්ඤාණය අනිත්‍ය ය, ජිව්හා-සම්ඵස්සය අනිත්‍ය ය. ජිව්හාසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ නොදුක් නොසුව වූ හෝ යම් වේදයිතයෙක් උපදී නම් හෙ ද අනිත්‍ය ය. කය....

සිත අනිත්‍ය ය, දහම් අනිත්‍ය ය, මනොවිඤ්ඤාණය අනිත්‍ය ය, මනොසම්ඵස්සය අනිත්‍ය ය මනොසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වේදයිතයෙක් උපදී නම් හෙ ද අනිත්‍ය ය.

මහණෙනි, මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්යශ්‍රාවක තෙමේ ඇසෙහිත් කලකිරෙයි.... කලකිරෙන්නේ නො ඇලෙයි, නො ඇල්මෙන් මිදෙයි, මිදුණු කල්හි මිදුණේ යයි දැනීම වෙයි. ජාතිය ක්ෂය වූවා ය. බඹසර වැස නිමවන ලද කටයුතු කරන ලද. මේ බැව් පිණිස අනෙකක් නැතැ යි දැනගනී යි.

## 1: 5. 2

## දුක්ඛ සූත්‍රය

44. මහණෙනි, සියල්ල දුක් ය....

## 1. 5: 3

## අනත්ත සූත්‍රය

45. මහණෙනි, සියල්ල අනාත්ම ය....

## 1. 5. 4

## අභිඤ්ඤෙය්‍යා සූත්‍රය

46. මහණෙනි, සියල්ල වෙසෙසින් දතයුතු ය....

## 1. 5. 5

### පරිඤ්ඤෙය්‍යසුත්තං

**47. සාවත්ථියං —**

සබ්බං භික්ඛවෙ පරිඤ්ඤෙය්‍යං -පෙ-

## 1. 5. 6

### පහාතබ්බසුත්තං

48. සබ්බං භික්ඛවෙ පහාතබ්බං -පෙ-

## 1. 5. 7

### සච්ඡිකාතබ්බසුත්තං

49. සබ්බං භික්ඛවෙ සච්ඡිකාතබ්බං -පෙ-

## 1. 5. 8

### අභිඤ්ඤෙය්‍යපරිඤ්ඤෙය්‍යසුත්තං

50. සබ්බං භික්ඛවෙ අභිඤ්ඤෙය්‍යපරිඤ්ඤෙය්‍යං -පෙ-

## 1. 5. 9

### උපද්දුතසුත්තං

51. සබ්බං භික්ඛවෙ උපද්දුතං -පෙ-

## 1. 5. 10

### උපස්සට්ඨසුත්තං

52. සබ්බං භික්ඛවෙ උපස්සට්ඨං[1] කිඤ්ච භික්ඛවෙ සබ්බං උපස්සට්ඨං:

චක්ඛුං භික්ඛවෙ උපස්සට්ඨං රූපා උපස්සට්ඨා, චක්ඛුවිඤ්ඤාණං උපස්සට්ඨං, චක්ඛුසම්ඵස්සො උපස්සට්ඨො. යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි උපස්සට්ඨං. සොතං -පෙ-

---

1. උපසට්ඨං - මජසං.

## 1. 5. 5

## පරිඤ්ඤෙය්‍ය සූත්‍රය

47. සැවැත්නුවර —

මහණෙනි, සියල්ල පිරිසිඳ දතයුතු ය....

## 1. 5. 6

## පහාතබ්බ සූත්‍රය

48. මහණෙනි, සියල්ල ප්‍රහීණ කළ යුතු ය....

## 1. 5. 7

## සච්ඡිකාතබ්බ සූත්‍රය

49. මහණෙනි, සියල්ල, පසක් කළ යුතු ය....

## 1. 5. 8

## අභිඤ්ඤෙය්‍ය පරිඤ්ඤෙය්‍ය සූත්‍රය

50. මහණෙනි, සියල්ල වෙසෙසින් දතයුතු ද පිරිසිඳ දත යුතු වේ...

## 1. 5. 9

## උපද්දුත සූත්‍රය

51. මහණෙනි, සියල්ල උවදුරෙන් පෙළුණේ ය....

## 1. 5. 10

## උපස්සට්ඨ සූත්‍රය

52. මහණෙනි, සියල්ල පීඩා සිහිත ය මහණෙනි, කවර සියල්ලක් පීඩා සහිත ද යත්:

මහණෙනි ඇස උවදුරු සහිත ය, රූපයෝ උවදුරු සහිතයහ, චක්ඛුවිඤ්ඤාණය උවදුරු සහිත ය, චක්ඛුසම්ඵස්සය උවදුරු සහිත ය, චක්ඛුසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වේදනායෙක් උපදී නම් හෙ ද උවදුරු සහිත ය. කන.....

ජිව්හා උපස්සට්ඨා, රසා උපස්සට්ඨා, ජිව්හාවිඤ්ඤාණං උපස්සට්ඨං, ජිව්හාසම්ඵස්සො උපස්සට්ඨො, යම්පිදං ජිව්හාසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි උපස්සට්ඨං, කායො උපස්සට්ඨො -පෙ-

මනො උපස්සට්ඨො, ධම්මා උපස්සට්ඨා, මනොවිඤ්ඤාණං උපස්සට්ඨං, මනොසම්ඵස්සො උපස්සට්ඨො, යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි උපස්සට්ඨං.

එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො චක්ඛුස්මිම්පි නිබ්බින්දති -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතී ති.

**සබ්බානිච්චවග්ගො පඤ්චමො.**

**තස්සුද්දානං:**

අනිච්චං දුක්ඛං අනත්තා ච අභිඤ්ඤෙය්‍යං පරිඤ්ඤෙය්‍යං
පහාතබ්බං සච්ඡිකාතබ්බං අභිඤ්ඤෙය්‍යං පරිඤ්ඤෙය්‍යං
උපද්දුතං උපස්සට්ඨං වග්ගො තෙන පවුච්චති.

**පඨමො පණ්ණාසකො.**

**තස්ස වග්ගුද්දානං:**

අනිච්චවග්ගො යමකො සබ්බවග්ගො ජාතිධම්මො
සබ්බානිච්චෙන පඤ්චයො පඨමො තෙන පවුච්චති.

දිව උවදුරු සහිත ය. රස උවදුරු සහිත ය, ජිව්හාවිඤ්ඤාණය උවදුරු සහිත ය, ජිව්හාසම්ඵස්සය උවදුරු සහිත ය, ජිව්හාසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ වේදනායෙක් උපදී නම් හෙ ද උවදුරු සහිත ය.

මනස උවදුරු සහිත ය. දහම් උවදුරු සහිත ය, මනොවිඤ්ඤාණය උවදුරු සහිත ය. මනොසම්ඵස්සය උවදුරු සහිත ය, මනොසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ වේදනායෙක් උපදී නම් හෙ ද උවදුරු සහිත ය.

මහණෙනි, මෙසේ දක්නා ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ ඇසෙහි ත් කලකිරෙයි ... මේ බැව් පිණිස අනෙකක් නැතැ යි දනගනී යි.

**පස්වන සබ්බානිච්ච වර්ග යි.**

**එහි සූත්‍රනාමාවලිය:**

අනිච්ච, දුක්ඛ, අනත්ත, අභිඤ්ඤෙය්‍ය, පරිඤ්ඤෙය්‍ය, පහාතබ්බ, සච්ඡිකාතබ්බ, අභිඤ්ඤෙය්‍යපරිඤ්ඤෙය්‍ය, උපද්දුත, උපස්සට්ඨ යන සූත්‍රදශයෙන් වර්ගය කියනු ලැබේ.

**පළමුවන පණ්ණාසක යි.**

එහි වර්ගනාමාවලිය:

අනිච්ච වර්ගය, යමක වර්ගය, සබ්බ වර්ගය, ජාතිධම්ම වර්ගය යන මොහු ඒ සබ්බානිච්ච වර්ගයෙන් පළමු වන පණ්ණාසකය කියනු ලැබේ.

# 6. අවිජ්ජාවග්ගො

## 1. 6. 1

## අවිජ්ජාපහානසුත්තං

**53.** සාවත්ථියං —

අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: කථන්නු ඛො භන්තෙ ජානතො කථං පස්සතො අවිජ්ජා පහීයති, විජ්ජා උප්පජ්ජතීති?

චක්ඛුං ඛො භික්ඛු අනිච්චතො ජානතො පස්සතො අවිජ්ජා පහීයති, විජ්ජා උප්පජ්ජති. රූපෙ අනිච්චතො ජානතො පස්සතො අවිජ්ජා පහීයති, විජ්ජා උප්පජ්ජති. චක්ඛුවිඤ්ඤාණං අනිච්චතො ජානතො පස්සතො අවිජ්ජා පහීයති විජ්ජා උප්පජ්ජති. චක්ඛුසම්ඵස්සං අනිච්චතො ජානතො පස්සතො අවිජ්ජා පහීයති විජ්ජා උප්පජ්ජති. යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චතො ජානතො පස්සතො අවිජ්ජා පහීයති විජ්ජා උප්පජ්ජති.

සොතං -පෙ- ඝානං -පෙ- ජිව්හා අනිච්චතො ජානතො පස්සතො අවිජ්ජා පහීයති, විජ්ජා උප්පජ්ජති. රසෙ අනිච්චතො ජානතො පස්සතො අවිජ්ජා පහීයති, විජ්ජා උප්පජ්ජති. ජිව්හාවිඤ්ඤාණං අනිච්චතො ජානතො පස්සතො අවිජ්ජා පහීයති විජ්ජා උප්පජ්ජති. ජිව්හාසම්ඵස්සං අනිච්චතො ජානතො පස්සතො අවිජ්ජා පහීයති විජ්ජා උප්පජ්ජති. යම්පිදං ජිව්හාසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චතො ජානතො පස්සතො අවිජ්ජා පහීයති, විජ්ජා උප්පජ්ජති.

කායං -පෙ- මනං අනිච්චතො ජානතො පස්සතො අවිජ්ජා පහීයති, විජ්ජා උප්පජ්ජති. ධම්මෙ අනිච්චතො ජානතො පස්සතො අවිජ්ජා පහීයති, විජ්ජා උප්පජ්ජති. මනොවිඤ්ඤාණං අනිච්චතො ජානතො පස්සතො අවිජ්ජා පහීයති, විජ්ජා උප්පජ්ජති. මනොසම්ඵස්සං අනිච්චතො ජානතො පස්සතො අවිජ්ජා පහීයති, විජ්ජා උප්පජ්ජති. යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චතො ජානතො පස්සතො අවිජ්ජා පහීයති විජ්ජා උප්පජ්ජති. එවං ඛො භික්ඛු ජානතො එවං පස්සතො අවිජ්ජා පහීයති, විජ්ජා උප්පජ්ජතීති.

# 6. අවිජ්ජා වර්ගය

## 1. 6. 1

## අවිජ්ජාපහාන සූත්‍රය

**53.** සැවැත්නුවර —

ඉක්බිති එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට "වහන්ස, කෙසේ දන්නහුට කෙසේ දක්නහුට අවිද්‍යාව ප්‍රහීණ වේ ද, විද්‍යාව උපදී ද? යි මෙය සැලකළේ ය.

මහණ, චක්‍ෂුස අනිත්‍යය විසින් දන්නහුට දක්නහුට අවිද්‍යාව ප්‍රහීණ වේ, විද්‍යාව උපදී. රූපයන් අනිත්‍ය විසින් දන්නහුට දක්නහුට අවිද්‍යාව ප්‍රහීණ වේ, විද්‍යාව උපදී. චක්‍ෂුර්විඥානය අනිත්‍ය විසින් දන්නහුට දක්නහුට අවිද්‍යාව ප්‍රහීණ වේ, විද්‍යාව උපදී. චක්‍ෂුස්සංස්පර්ශය අනිත්‍ය විසින් දන්නහුට දක්නහුට අවිද්‍යාව ප්‍රහීණ වේ, විද්‍යාව උපදී. චක්‍ෂුස්සංස්පර්ශය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වේදනායෙක් උපදී නම් එ ද අනිත්‍ය විසින් දන්නහුට දක්නහුට අවිද්‍යාව ප්‍රහීණ වේ, විද්‍යාව උපදී.

නැහැය... දිව අනිත්‍ය විසින් දන්නහුට දක්නහුට අවිද්‍යාව ප්‍රහීණ වේ, විද්‍යාව උපදී. රස අනිස විසින් දන්නහුට දක්නහුට අවිද්‍යාව ප්‍රහීණ වේ, විද්‍යාව උපදී. ජිහ්වාවිඥානය අනිත්‍ය විසින් දන්නහුට දක්නහුට අවිද්‍යාව ප්‍රහීණ වේ, විද්‍යාව උපදී. ජිහ්වාසංස්පර්ශය අනිත්‍ය විසින් දන්නහුට දක්නහුට අවිද්‍යාව ප්‍රහීණ වේ. විද්‍යාව උපදී. ජිහ්වාසංස්පර්ශය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වේදනායෙක් උපදී නම් එ ද අනිත්‍ය විසින් දන්නහුට දක්නහුට අවිද්‍යාව ප්‍රහීණ වේ, විද්‍යාව උපදී.

කය... මනස අනිත්‍ය විසින් දන්නහුට දක්නහුට අවිද්‍යාව ප්‍රහීණ වේ, විද්‍යාව උපදී. දහම් අනිස විසින් දන්නහුට දක්නහුට අවිද්‍යාව ප්‍රහීණ වේ, විද්‍යාව උපදී. මනොවිඥානය අනිත්‍ය විසින් දන්නහුට දක්නහුට අවිද්‍යාව ප්‍රහීණ වේ, විද්‍යාව උපදී. මනස්සංස්පර්ශය අනිත්‍ය විසින් දන්නහුට දක්නහුට අවිද්‍යාව ප්‍රහීණ වේ, විද්‍යාව උපදී. මනස්සංස්පර්ශය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් විඳුමෙක් උපදී නම් එ ද අනිත්‍ය විසින් දන්නහුට දක්නහුට අවිද්‍යාව ප්‍රහීණ වේ, විද්‍යාව උපදී. මහණ, මෙසේ දන්නහුට දක්නහුට අවිද්‍යාව ප්‍රහීණ වේ, විද්‍යාව උපදී යි.

## 1. 6. 2

## සඤ්ඤොජනපහානසුත්තං

54. **සාවත්ථියං** —

කථන්නු ඛො භන්තෙ ජානතො කථං පස්සතො සඤ්ඤොජනා පහීයන්තීති?

චක්ඛුං ඛො භික්ඛු අනිච්චතො ජානතො පස්සතො සඤ්ඤොජනා පහීයන්ති, රූපෙ අනිච්චතො ජානතො පස්සතො සඤ්ඤොජනා පහීයන්ති, චක්ඛුවිඤ්ඤාණං අනිච්චතො ජානතො පස්සතො සඤ්ඤොජනා පහීයන්ති, චක්ඛුසම්ඵස්සං අනිච්චතො ජානතො පස්සතො සඤ්ඤොජනා පහීයන්ති. යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චතො ජානතො පස්සතො සඤ්ඤොජනා පහීයන්ති -පෙ- යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චතො ජානතො පස්සතො සඤ්ඤොජනා පහීයන්ති.

එවං ඛො භික්ඛු ජානතො එවං පස්සතො සඤ්ඤොජනා පහීයන්තීති.

## 1. 6. 3

## සඤ්ඤොජනසමුග්ඝාතසුත්තං

55. කථන්නු ඛො භන්තෙ ජානතො කථං පස්සතො සඤ්ඤොජනා සමුග්ඝාතං ගච්ඡන්තීති?

චක්ඛුං ඛො භික්ඛු අනත්තතො ජානතො පස්සතො සඤ්ඤොජනා සමුග්ඝාතං ගච්ඡන්ති. රූපෙ අනත්තතො ජානතො පස්සතො සඤ්ඤොජනා සමුග්ඝාතං ගච්ඡන්ති. චක්ඛුවිඤ්ඤාණං අනත්තතො ජානතො පස්සතො සඤ්ඤොජනා සමුග්ඝාතං ගච්ඡන්ති. චක්ඛුසම්ඵස්සං අනත්තතො ජානතො පස්සතො සඤ්ඤොජනා සමුග්ඝාතං ගච්ඡන්ති. යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනත්තතො ජානතො පස්සතො සඤ්ඤොජනා සමුග්ඝාතං ගච්ඡන්ති. -පෙ- යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනත්තතො ජානතො පස්සතො සඤ්ඤොජනා සමුග්ඝාතං ගච්ඡන්ති.

එවං ඛො භික්ඛු ජානතො එවං පස්සතො සඤ්ඤොජනා සමුග්ඝාතං ගච්ඡන්තීති.

## 1. 6. 2

## සඤ්ඤොජන පහාන සූත්‍රය

54. සැවැත්නුවර —

වහන්ස, කෙසේ දන්නහුට කෙසේ දක්නහුට සංයෝජන ප්‍රහීණ වේ ද? යි.

මහණ, චක්ෂුස් අනිත්‍ය විසින් දන්නහුට දක්නහුට සංයොජන ප්‍රහීණ වේ. රූප අනිත්‍ය විසින් දන්නහුට දක්නහුට සංයෝජන ප්‍රහීණ වේ. චක්ෂුර්විඥානය, අනිත්‍ය විසින් දන්නහුට දක්නහුට සංයෝජන ප්‍රහීණ වේ. චක්ෂුස්සංස්පර්ශය අනිත්‍ය විසින් දන්නහුට දක්නහුට සංයෝජන ප්‍රහීණ වේ. චක්ෂුස්සංස්පර්ශය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වෙදනාවක් උපදී නම් හෙද අනිත්‍ය විසින් දන්නහුට දක්නහුට සංයොජන ප්‍රහීණ වේ. මනස්සංස්පර්ශය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් විඳුමෙක් උපදී නම් එ ද අනිත්‍ය විසින් දන්නහුට දක්නහුට සංයොජන ප්‍රහීණ වේ.

මහණ, මෙසේ ‹න්නහුට මෙසේ දක්නහුට සංයොජන ප්‍රහීණ වේ යයි.

## 1. 6. 3

## සඤ්ඤොජන සමුග්ඝාත සූත්‍රය

55. වහන්ස, කෙසේ දන්නහුට කෙසේ දක්නහුට සංයොජන සහමුලින් නැසීමට යේ ද?යි.

මහණ, චක්ෂුස අනාත්ම විසින් දන්නහුට දක්නහුට සංයෝජන සහමුලින් නැසීමට යේ. රූප අනාත්ම විසින් දන්නහුට දක්නහුට සංයෝජන සහමුලින් නැසීමට යේ. චක්ෂුර්විඥානය අනාත්ම විසින් දන්නහුට දක්නහුට සංයෝජන සහමුලින් නැසීමට යේ. චක්ෂුස්සංස්පර්ශය අනාත්ම විසින් දන්නහුට දක්නහුට සංයෝජන සහමුලින් නැසීමට යේ. චක්ෂුස්සංස්පර්ශය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ වේදනායෙක් උපදී නම් එ ද අනාත්ම විසින් දන්නහුට දක්නහුට සංයෝජන සහමුලින් නැසීමට යේ ... මනස්සංස්පර්ශය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වේදනායෙක් උපදී නම් හෙ ද අනාත්ම විසින් දන්නහුට දක්නහුට සංයෝජන සහමුලින් නැසීමට යේ.

මහණ, මෙසේ දන්නහුට මෙසේ දක්නහුට සංයෝජන සහමුලින් නැසීමට යේ යි.

## 1. 6. 4

### ආසවප්පහානසුත්තං

**56. සාවත්ථියං —**

කථන්නු ඛො භන්තෙ ජානතො කථං පස්සතො ආසවා පහීයන්තීති.

චක්ඛුං ඛො භික්ඛු අනිච්චතො ජානතො පස්සතො ආසවා පහීයන්ති. රූපෙ -පෙ- චක්ඛුවිඤ්ඤාණං -පෙ- චක්ඛුසම්ඵස්සං -පෙ- යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චතො ජානතො පස්සතො ආසවා පහීයන්ති.

එවං ඛො භික්ඛු ජානතො එවං පස්සතො ආසවා පහීයන්තීති.

## 1. 6. 5

### ආසවසමුග්ඝාතසුත්තං

57. කථන්නු ඛො භන්තෙ ජානතො කථං පස්සතො ආසවා සමුග්ඝාතං ගච්ඡන්තීති?

චක්ඛුං ඛො භික්ඛු අනත්තතො ජානතො පස්සතො ආසවා සමුග්ඝාතං ගච්ඡන්ති. රූපෙ -පෙ- චක්ඛුවිඤ්ඤාණං -පෙ- චක්ඛුසම්ඵස්සං -පෙ- යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනත්තතො ජානතො පස්සතො ආසවා සමුග්ඝාතං ගච්ඡන්ති.

එවං ඛො භික්ඛු ජානතො එවං පස්සතො ආසවා සමුග්ඝාතං ගච්ඡන්තීති.

## 1. 6. 6

### අනුසයප්පහානසුත්තං

58. කථන්නු ඛො භන්තෙ ජානතො කථං පස්සතො අනුසයා පහීයන්තීති?

චක්ඛුං ඛො භික්ඛු අනිච්චතො ජානතො පස්සතො අනුසයා පහීයන්ති, රූපෙ -පෙ- චක්ඛුවිඤ්ඤාණං -පෙ- චක්ඛුසම්ඵස්සං -පෙ- යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චතො ජානතො පස්සතො අනුසයා පහීයන්තීති.

එවං ඛො භික්ඛු ජානතො එවං පස්සතො අනුසයා පහීයන්තීති.

## 1. 6. 4

## ආසවප්පහාන සූත්‍රය

**56. සැවැත්නුවර —**

වහන්ස, කෙසේ දන්නහුට කෙසේ දක්නහුට ආසුව ප්‍රහීණ වේ ද? යි.

මහණ, චක්‍ෂුස අනිත්‍ය විසින් දන්නහුට දක්නහුට ආසුව ප්‍රහීණ වේ. රූ .. චක්‍ෂුර්විඥානය ... චක්‍ෂුස් සංස්පර්ශය ... මනස්සංස්පර්ශය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වෙදනායෙක් උපදී නම් එ ද අනිත්‍ය විසින් දන්නහුට දක්නහුට ආසුව ප්‍රහීණ වේ.

මහණ, මෙසේ දන්නහුට දක්නහුට ආසුව ප්‍රහීණ වේ යි.

## 1. 6. 5

## ආසවසමුග්ඝාත සූත්‍රය

57. වහන්ස, කෙසේ දන්නහුට කෙසේ දක්නහුට ආසුව සහමුලින් නැසීමට යේ ද? යි.

මහණ, චක්‍ෂුස අනාත්ම විසින් දන්නහුට දක්නහුට ආසුව සහමුලින් නැසීම යේ රූප ... චක්‍ෂුර්විඥානය ... චක්‍ෂුස්සංස්පර්ශය ... මනස්සංස්පර්ශය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වෙදනායෙක් උපදී නම් එ ද අනාත්ම විසින් දන්නහුට දක්නහුට ආසුව සහමුලින් නැසීමට යේ.

මහණ, මෙසේ දන්නහුට මෙසේ දක්නහුට ආසුව සහමුලින් නැසීමට යේ යි.

## 1. 6. 6

## අනුසයප්පහාන සූත්‍රය

58. වහන්ස කෙසේ දන්නහුට කෙසේ දක්නහුට අනුසය ප්‍රහීණ වේ ද? යි.

මහණ, චක්‍ෂුස අනිත්‍ය විසින් දන්නහුට දක්නහුට අනුසය ප්‍රහීණ වේ. රූප ... චක්‍ෂුර්විඥානය ... චක්‍ෂුස්සංස්පර්ශය ... මනස්සංස්පර්ශය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වෙදනායෙක් උපදී නම් එ ද අනිත්‍ය විසින් දන්නහුට දක්නහුට අනුසය ප්‍රහීණ වේ.

මහණ, මෙසේ දන්නහුට මෙසේ දක්නහුට අනුසය ප්‍රහීණ වේ යි.

## 1. 6. 7

## අනුසයසමුග්ඝාතසුත්තං

59. **සාවත්ථියං —**

කථන්නු ඛො භන්තෙ ජානතො කථං පස්සතො අනුසයා සමුග්ඝාතං ගච්ඡන්තීති?

චක්ඛුං ඛො භික්ඛු අනත්තතො ජානතො පස්සතො අනුසයා සමුග්ඝාතං ගච්ඡන්ති, රූපෙ –පෙ– චක්ඛුවිඤ්ඤාණං –පෙ– චක්ඛුසම්ඵස්සං –පෙ– යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනත්තතො ජානතො පස්සතො අනුසයා සමුග්ඝාතං ගච්ඡන්ති.

එවං ඛො භික්ඛු ජානතො එවං පස්සතො අනුසයා සමුග්ඝාතං ගච්ඡන්තී ති.

## 1. 6. 8

## සබ්බුපාදානපරිඤ්ඤාසුත්තං

60. සබ්බුපාදානපරිඤ්ඤාය වො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි, තං සුණාථ. කතමො ච භික්ඛවෙ සබ්බුපාදානපරිඤ්ඤාය ධම්මො:

චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති[1] චක්ඛුවිඤ්ඤාණං තිණ්ණං සඞ්ගති ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, එවංපස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො චක්ඛුස්මිම්පි නිබ්බින්දති, රූපෙසුපි නිබ්බින්දති, චක්ඛුවිඤ්ඤාණෙපි නිබ්බින්දති, චක්ඛුසම්ඵස්සෙපි නිබ්බින්දති, වෙදනායපි නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති. විමොක්ඛා[2] පරිඤ්ඤාතං මෙ උපාදානන්ති පජානාති.

සොතඤ්ච පටිච්ච සද්දෙ ච උප්පජ්ජති සොතවිඤ්ඤාණං, තිණ්ණං සඞ්ගති ඵස්සො ඵස්සපච්චයා වෙදනා, එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො සොතස්මිම්පි නිබ්බින්දති. සද්දෙසුපි නිබ්බින්දති, සොත විඤ්ඤාණෙපි නිබ්බින්දති, සොතසම්ඵස්සෙපි නිබ්බින්දති, වෙදනායපි නිබ්බින්දති නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති විමොක්ඛා "පරිඤ්ඤාතං මෙ උපාදාන"න්ති පජානාති.

ඝානඤ්ච පටිච්ච ගන්ධෙ ච උප්පජ්ජති, ඝානවිඤ්ඤාණං තිණ්ණං සඞ්ගති ඵස්සො, ඵස්සපච්චයා වෙදනා. එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො ඝානස්මිම්පි නිබ්බින්දති, ගන්ධෙසුපි නිබ්බින්දති ඝාන-විඤ්ඤාණෙපි නිබ්බින්දති, ඝානසම්ඵස්සෙපි නිබ්බින්දති, වෙදනායපි නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති, විමොක්ඛා "පරිඤ්ඤාතං මෙ උපාදාන"න්ති පජානාති.

ජිව්හඤ්ච පටිච්ච රසෙ ච උප්පජ්ජති ජිව්හා විඤ්ඤාණං තිණ්ණං සඞ්ගති ඵස්සො. ඵස්සපච්චයා වෙදනා, එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො ජිව්හායපි නිබ්බින්දති, රසෙසුපි නිබ්බින්දති, ජිව්හාවිඤ්ඤාණෙපි නිබ්බින්දති, ජිව්හාසම්ඵස්සෙපි නිබ්බින්දති,

1. උප්පජ්ජති - සිමු
2. විමොක්ඛො - PTS

## 1. 6. 7

## අනුසයසමුග්ඝාත සූත්‍රය

59. **සැවැත්නුවර** —

වහන්ස, කෙසේ දන්නහුට කෙසේ දක්නහුට අනුසය සහමුලින් නැසීමට යේ ද? යි.

මහණ, චක්ෂුස අනාත්ම විසින් දන්නහුට දක්නහුට අනුසය සහමුලින් නැසීමට යේ. රූප... චක්ෂුර්විඥානය... චක්ෂුස්සංස්පර්ශය මනස්සංස්පර්ශය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වේදනායෙක් උපදී නම් එ ද අනාත්ම විසින් දන්නහුට දක්නහුට අනුසය සහමුලින් නැසීමට යේ.

මහණ, මෙසේ දන්නහුට මෙසේ දක්නහුට අනුසය සහමුලින් නැසීමට යේ යි.

## 1. 6. 8

## සබ්බුපාදනපරිඤ්ඤා සූත්‍රය

60. මහණෙනි, සියලු උපාදනයන් පිරිසිඳ දැනීම පිණිස වූ ධර්මය තොපට දේශනා කරන්නෙමි. එය අසවු. මහණෙනි, සියලු උපාදනයන් පිරිසිඳ දැනීම පිණිස වූ ධර්මය කවරේ ද යත්:

ඇසත් රූපයත් නිසා චක්ඛුවිඤ්ඤාණය උපදී. තිදෙනාගේ එක්වීම ස්පර්ශය යි. ස්පර්ශය නිසා වේදනාව වේ. මහණෙනි, මෙසේ දක්නා ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ ඇසෙහිත් කලකිරෙයි. රූපයන්හිත් කලකිරෙයි. චක්ඛුවිඤ්ඤාණයෙහිත් කලකිරෙයි. චක්ඛුසම්ඵස්සයෙහිත් කලකිරෙයි. වෙදනායෙහිත් කලකිරෙයි. කලකිරෙන්නේ නො ඇලෙයි. නො ඇල්මෙන් මිදෙයි. මිදීමෙන් මා විසින් උපාදනය පිරිසිඳ දන්නා ලද යි දැනගනී.

කනත් ශබ්දත් නිසා සොතවිඤ්ඤාණය උපදී. තිදෙනාගේ එක්වීම ස්පර්ශය යි. ස්පර්ශය නිසා වෙදනාව වේ. මහණෙනි, මෙසේ දක්නා ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙම කනෙහිත් කලකිරෙයි. ශබ්දයන්හිත් කලකිරෙයි. සෝතවිඤ්ඤාණයෙහිත් කලකිරෙයි. සෝතසම්ඵස්සයෙහිත් කලකිරෙයි. වේදනායෙහිත් කලකිරෙයි. කලකිරෙන්නේ නො ඇලෙයි. නොඇල්මෙන් මිදෙයි. මිදීමෙන් මා විසින් උපාදනය පිරිසිඳ දන්නා ලද යි දැනගනී.

නැහැයත් ගඳත් නිසා ඝානවිඤ්ඤාණය උපදී. තිදෙනාගේ එක්වීම ස්පර්ශය යි. ස්පර්ශය නිසා වේදනාව වේ. මහණෙනි, මෙසේ දක්නා ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ නැහැයෙහිත් කලකිරෙයි. ගඳෙහිත් කලකිරෙයි. ඝානවිඤ්ඤාණයෙහිත් කලකිරෙයි. ඝානසම්ඵස්සයෙහිත් කලකිරෙයි. වේදනායෙහිත් කලකිරෙයි. කලකිරෙන්නේ නො ඇලෙයි. නොඇල්මෙන් මිදෙයි. මිදීමෙන් මා විසින් උපාදනය පිරිසිඳ දන්නා ලැද යි දැනගනී.

දිවත් රසත් නිසා ජිව්හාවිඤ්ඤාණය උපදී. තිදෙනාගේ එක්වීම ස්පර්ශයයි. ස්පර්ශය නිසා වේදනාව වේ. මහණෙනි, මෙසේ දක්නා ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ දිවෙහිත් කලකිරෙයි. රසෙහිත් කලකිරෙයි. ජිව්හාවිඤ්ඤාණයෙහිත් කලකිරෙයි. ජිව්හාසම්ඵස්සයෙහිත් කලකිරෙයි.

වෙදනායපි නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති. විමොක්ඛා ''පරිඤ්ඤාතං මෙ උපාදන''න්ති පජානාති.

කායඤ්ච පටිච්ච ඵොට්ඨබ්බෙ ච උප්පජ්ජති කායවිඤ්ඤාණං තිණ්ණං සඞ්ගති ඵස්සො. ඵස්සපච්චයා වෙදනා, එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො කායෙපි නිබ්බින්දති. ඵොට්ඨබ්බෙසුපි නිබ්බින්දති කායවිඤ්ඤාණෙපි නිබ්බින්දති, කායසම්ඵස්සෙපි නිබ්බින්දති වෙදනායපි නිබ්බින්දති. නිබ්බින්දං විරජ්ජති විරාගා විමුච්චති. විමොක්ඛා ''පරිඤ්ඤාතං මෙ උපාදන''න්ති පජානාති.

මනඤ්ච පටිච්ච ධම්මෙ ච උප්පජ්ජති මනොවිඤ්ඤාණං. තිණ්ණං සඞ්ගති ඵස්සො. ඵස්සපච්චයා වෙදනා එවං ඵස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො මනස්මිම්පි නිබ්බින්දති. ධම්මෙසුපි නිබ්බින්දති. මනො-විඤ්ඤාණෙපි නිබ්බින්දති. මනොසම්ඵස්සෙපි නිබ්බින්දති. වෙදනායපි නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති, විමොක්ඛා ''පරිඤ්ඤාතං මෙ උපාදන''න්ති පජානාති. අයං ඛො භික්ඛවෙ සබ්බුපාදනපරිඤ්ඤාය ධම්මොති.

## 1. 6. 9

## සබ්බුපාදනපරියාදනසුත්තං

61. සබ්බුපාදනපරියාදනාය වො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි. තං සුණාථ. කතමො ච භික්ඛවෙ සබ්බුපාදනපරියාදනාය ධම්මො: චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං තිණ්ණං සඞ්ගති ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො චක්ඛුස්මිම්පි නිබ්බින්දති, රූපෙසුපි නිබ්බින්දති චක්ඛු-විඤ්ඤාණෙපි නිබ්බින්දති, චක්ඛුසම්ඵස්සෙපි නිබ්බින්දති, වෙදනායපි නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති, විමොක්ඛා ''පරියාදින්නං මෙ උපාදන''න්ති පජානාති, -පෙ-

ජිව්හං ච පටිච්ච රසෙ ච උප්පජ්ජති ජිව්හාවිඤ්ඤාණං. තිණ්ණං සඞ්ගති ඵස්සො. ඵස්සපච්චයා වෙදනා, එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො ජිව්හායපි නිබ්බින්දති, රසෙසුපි නිබ්බින්දති, ජිව්හාවිඤ්ඤාණෙපි නිබ්බින්දති, ජිව්හාසම්ඵස්සෙපි නිබ්බින්දති, වෙදනායපි නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති, විමොක්ඛා ''පරියාදින්නං මෙ උපාදනන්ති'' පජානාති –පෙ–

මනඤ්ච පටිච්ච ධම්මෙ ච උප්පජ්ජති මනොවිඤ්ඤාණං තිණ්ණං සඞ්ගති ඵස්සො, ඵස්සපච්චයා වෙදනා. එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො මනස්මිම්පි නිබ්බින්දති, ධම්මෙසුපි නිබ්බින්දති, මනොවිඤ්ඤාණෙපි නිබ්බින්දති, මනොසම්ඵස්සෙපි නිබ්බින්දති, වෙදනා-යපි නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති, විමොක්ඛා ''පරියාදින්නං මෙ උපාදන''න්ති පජානාති. අයං ඛො භික්ඛවෙ සබ්බුපාදනපරියාදනාය ධම්මොති.

වේදනායෙහිත් කලකිරෙයි. කලකිරෙන්නේ නො ඇලෙයි. නොඇල්මෙන් මිදෙයි. මිදීමෙන් මා විසින් උපාදනය පිරිසිඳ දන්නා ලද යි දනගනී.

කයත් ඵොට්ඨබ්බත් නිසා කායවිඤ්ඤාණය උපදී. තිදෙනාගේ එක්වීම ස්පර්ශය යි. ස්පර්ශය නිසා වෙදනාව වේ. මහණෙනි, මෙසේ දක්නා ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ කයෙහිත් කලකිරෙයි, ඵොට්ඨබ්බයන්හිත් කලකිරෙයි, කායවිඤ්ඤාණයෙහිත් කලකිරෙයි, කායසම්ඵස්සයෙහිත් කලකිරෙයි. වෙදනායෙහිත් කලකිරෙයි, කලකිරෙන්නේ නො ඇලෙයි, නොඇල්මෙන් මිදෙයි, මිදීමෙන් මා විසින් උපාදනය පිරිසිඳ දන්නා ලද යි දනගනී.

සිතත් දහමුත් නිසා මනොවිඤ්ඤාණය උපදී. තිදෙනාගේ එක්වීම ස්පර්ශය යි. ස්පර්ශය නිසා වේදනාව වේ. මහණෙනි, මෙසේ දක්නා ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ සිතෙහිත් කලකිරෙයි, දහම්හිත් කලකිරෙයි, මනෝවිඤ්ඤාණයෙහිත් කලකිරෙයි, මනෝසම්ඵස්සයෙහිත් කලකිරෙයි, වෙදනායෙහිත් කලකිරෙයි, කලකිරෙන්නේ නො ඇලෙයි, නොඇල්මෙන් මිදෙයි, මිදීමෙන් මා විසින් උපාදනය පිරිසිඳ දන්නා ලද යි දනගනී. මහණෙනි, මේ සියලු උපාදනයන් පිරිසිඳ දැනීම පිණිස වූ ධර්මය යි.

## 1. 6. 9

## සබ්බුපාදනපරියාදන සූත්‍රය

61. මහණෙනි, සියලු උපාදනයන් ක්ෂය කිරීම පිණිස වූ ධර්මය තොපට දෙශනා කරන්නෙමි. එය අසවු. මහණෙනි, සියලු උපාදනයන් ක්ෂය කිරීම පිණිස වූ ධර්මය කවරේ ද යත්: ඇසත් රූපත් නිසා චක්ඛුවිඤ්ඤාණය උපදී. තිදෙනාගේ එක්වීම ස්පර්ශය යි. ස්පර්ශය නිසා වේදනාව වේ. මහණෙනි, මෙසේ දක්නා ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ ඇසෙහිත් කලකිරෙයි. රූපයන්හිත් කලකිරෙයි. චක්ඛුවිඤ්ඤාණයෙහිත් කලකිරෙයි. චක්ඛුසම්ඵස්සයෙහිත් කලකිරෙයි. වේදනායෙහිත් කලකිරෙයි. කලකිරෙන්නේ නො ඇලෙයි. නොඇල්මෙන් මිදෙයි. මිදීමෙන් මා විසින් උපාදනය ක්ෂය කරන ලද යි දනගනී.

දිවත් රසත් නිසා ජිව්හාවිඤ්ඤාණය උපදී. තිදෙනාගේ එක්වීම ස්පර්ශය යි. ස්පර්ශය නිසා වේදනාව වේ. මහණෙනි, මෙසේ දක්නා ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ දිවෙහිත් කලකිරෙයි. රසෙහිත් කලකිරෙයි. ජිව්හාවිඤ්ඤාණයෙහිත් කලකිරෙයි. ජිව්හාසම්ඵස්සයෙහිත් කලකිරෙයි. වේදනායෙහිත් කලකිරෙයි. කලකිරෙන්නේ නො ඇලෙයි. නො ඇල්මෙන් මිදෙයි. මිදීමෙන් මා විසින් උපාදනය ක්ෂය කරන ලද යි දනගනී.

සිතත් දහමුත් නිසා මනෝවිඤ්ඤාණය උපදී. තිදෙනාගේ එක්වීම ස්පර්ශය යි. ස්පර්ශය නිසා වේදනා වේ. මහණෙනි, මෙසේ දක්නා ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ සිතෙහිත් කලකිරෙයි. දහම්හිත් කලකිරෙයි. මනෝවිඤ්ඤාණයෙහිත් කලකිරෙයි. මනෝසම්ඵස්සයෙහිත් කලකිරෙයි. වේදනායෙහිත් කලකිරෙයි. කලකිරෙන්නේ නො ඇලෙයි. නොඇල්මෙන් මිදෙයි. මිදීමෙන් මා විසින් උපාදනය ක්ෂය කරන ලද යි දනගනී. මහණෙනි, මේ සියලු උපාදනයන් ක්ෂය කිරීම පිණිස වූ ධර්මය යි.

## 1. 6. 10

## දුතිය සබ්බුපාදානපරියාදානසුත්තං

62. **සාවත්ථියං —**

සබ්බුපාදානපරියාදානාය වො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි තං සුණාථ. කතමො ච භික්ඛවෙ සබ්බුපාදානපරියාදානාය ධම්මො?

තං කිම්මඤ්ඤථ භික්ඛවෙ චක්ඛුං නිච්චං වා අනිච්චං වාති? අනිච්චං භන්තෙ. යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? දුක්ඛං භන්තෙ. යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං "එතං මම, එසො හමස්මි, එසො මෙ අත්තා"ති? නොහෙතං භන්තෙ.

රූපා නිච්චා වා අනිච්චා වා ති? අනිච්චා භන්තෙ –පෙ– චක්ඛුවිඤ්ඤාණං –පෙ– චක්ඛුසම්ඵස්සො –පෙ– යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං–පෙ–තම්පි–පෙ–සොතං–පෙ–සද්ද –පෙ– සොතවිඤ්ඤාණං –පෙ– සොතසම්ඵස්සො –පෙ– යම්පිදං සොතසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං–පෙ–තම්පි–පෙ-ඝානං –පෙ– ගන්ධා–පෙ–ඝානවිඤ්ඤාණං–පෙ–ඝානසම්ඵස්සො –පෙ– යම්පිදං ඝානසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං –පෙ– තම්පි –පෙ– කායො –පෙ– ඵොට්ඨබ්බා –පෙ– කායවිඤ්ඤාණං –පෙ– කායසම්ඵස්සො –පෙ– යම්පිදං කායසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං –පෙ– තම්පි –පෙ– මනො –පෙ– ධම්මා –පෙ– මනොවිඤ්ඤාණං –පෙ– මනොසම්ඵස්සො –පෙ– යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි නිච්චං වා අනිච්චං වාති? අනිච්චං භන්තෙ. යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වා ති? දුක්ඛං භන්තෙ, යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං: "එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා"ති? නොහෙතං භන්තෙ.

එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො චක්ඛුස්මිම්පි නිබ්බින්දති. රූපෙසුපි නිබ්බින්දති. චක්ඛුවිඤ්ඤාණෙපි නිබ්බින්දති, චක්ඛුසම්ඵස්සෙපි නිබ්බින්දති, යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තස්මිම්පි නිබ්බින්දති –පෙ– යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තස්මිම්පි නිබ්බින්දති. නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති. අයං ඛො භික්ඛවෙ සබ්බුපාදානපරියාදානාය ධම්මොති.

### අවිජ්ජාවග්ගො ඡට්ඨො.

**තස්සුද්දානං:**

අවිජ්ජා සඤ්ඤොජනා ද්වෙ ආසවා අපරෙ දුවෙ,
අනුසයෙන ද්වෙ වුත්තා පරිඤ්ඤා ද්වෙ පරියාදිනෙන තෙදසාති.

## 1. 6. 10

## දුතිය සබ්බුපාදනපරියාදන සූත්‍රය

**62. සැවැත්නුවර —**

මහණෙනි, සියලු උපාදනයන් ක්ෂය කිරීම පිණිස වූ ධර්මය තොපට දේශනා කරන්නෙමි. එය අසවු. මහණෙනි, සියලු උපාදනයන් ක්ෂය කිරීම පිණිස වූ ධර්මය කවරේ ද යත්:

මහණෙනි, ඒ කිමැයි හඟිවු ද? ඇස නිත්‍ය ද නොහොත් අනිත්‍ය ද? යි. වහන්ස, අනිත්‍ය ය. යමක් අනිත්‍ය නම් එය දුක් හෝ සුව හෝ වේ ද යි. වහන්ස, දුක් වෙයි. යමක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වනසුලු නම් එය ''තෙල මාගේ ය, තෙල මම වෙමි. තෙල මාගේ ආත්ම ය'' යි. දක්නට සුදුසු ද යි. වහන්ස, මෙය නොවේ ම ය.

රූප නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද යි. වහන්ස, අනිත්‍ය ය. චක්ඛුවිඤ්ඤාණය ... චක්ඛුසම්ඵස්සය ... චක්ඛුසම්ඵස්සය නිසා යම් වේදනායෙක් උපදී නම් එ ද ... සෝතය ... සද්දය ... සෝතවිඤ්ඤාණය ... සෝතසම්ඵස්සය ... සෝතසම්ඵස්සය නිසා යම් වේදනායෙක් උපදී නම් එ ද ... ඝානය ... ගන්ධය ... ඝානවිඤ්ඤාණය ... ඝානසම්ඵස්සය ... ඝානසම්ඵස්සය නිසා යම් වේදනායෙක් උපදී නම් එ ද ... කායය ... ඵොට්ඨබ්බය ... කායවිඤ්ඤාණය කායසම්ඵස්සය ... කායසම්ඵස්සය නිසා යම් වේදනායෙක් උපදී නම් එ ද ... චිත්තය ... ධම්මය ... මනෝවිඤ්ඤාණය ... මනෝසම්ඵස්සය ... මනෝසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වේදනායෙක් උපදී නම් එ ද නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද යි. වහන්ස, අනිත්‍ය ය. යමක් අනිත්‍ය නම් එය දුක් හෝ සුව හෝ වේ ද යි. වහන්ස, දුක් ය. යමක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වනසුලු නම් එය තෙල මාගේ ය, තෙල මම වෙමි. තෙල මාගේ ආත්මය යි දක්නට සුදුසු ද යි. වහන්ස, මෙය නො වේ ම ය.

මහණෙනි, මෙසේ දක්නා ශ්‍රැතවත් අයර්‍යශ්‍රාවක තෙමේ චක්ඛුයෙහිත් කලකිරෙයි. රූපයන්හිත් කලකිරෙයි. චක්ඛුවිඤ්ඤාණයෙහිත් කලකිරෙයි. චක්ඛුසම්ඵස්සයෙහිත් කලකිරෙයි. චක්ඛුසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වේදනායෙක් උපදී නම් එහිත් කලකිරෙයි ... මනෝසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වේදනායෙක් උපදී නම් එහිත් කලකිරෙයි. කලකිරෙන්නේ නො ඇලෙයි, නොඇල්මෙන් මිදෙයි. මිදුණුකල්හි මිදුණේ යයි දැනීම වෙයි. ජාතිය ක්ෂය වූ ය. බඹසර වැස නිමවන ලද සිවුමග කටයුතු කරන ලද, මේ රහත්බව පිණිස අනෙකක් නැතැ යි දැනගනී. මහණෙනි, මේ සියලු උපාදනයන් ක්ෂය කිරීම පිණිස වූ ධර්මය යි.

**සවැනි අවිජ්ජා වර්ග යි.**

**එහි සූත්‍රනාමාවලිය:**

අවිජ්ජා සූත්‍රය සංයෝජනසූත්‍ර දෙක ය, අනෙක් ආසුව සූත්‍ර දෙක ය, අනුසය නමින් කියන ලද සූත්‍රදෙකය, පරිඤ්ඤා සූත්‍රය, පරියාදන සූත්‍රදෙකය යි ඔහු දශයෙකි.

# 7. මිගජාලවග්ගො

## 1. 7. 1

## මිගජාලසුත්තං

63. සාවත්ථියං —

අථ ඛො ආයස්මා මිගජාලො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො ආයස්මා මිගජාලො භගවන්තං එතදවොච:

"එකවිහාරී එකවිහාරී"ති භන්තෙ වුච්චති, කිත්තාවතා නු ඛො භන්තෙ එකවිහාරී හොති? කිත්තාවතා ච පන සදුතිය[1] විහාරී ච හොතීති? සන්ති ඛො මිගජාල චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, තඤ්චෙ භික්ඛු අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨති, තස්ස තං අභිනන්දතො අභිවදතො අජ්ඣොසාය තිට්ඨතො උප්පජ්ජති නන්දි, නන්දියා සති සාරාගො හොති සාරාගෙ සති සඤ්ඤොගො හොති, නන්දිසඤ්ඤොජන සඤ්ඤුත්තො ඛො මිගජාල භික්ඛු සදුතිය[1] විහාරීති වුච්චති. සන්ති ඛො මිගජාල ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, තඤ්චෙ භික්ඛු අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨති, තස්ස තං අභිනන්දතො අභිවදතො අජ්ඣොසාය තිට්ඨතො උප්පජ්ජති නන්දි, නන්දියා සති සාරාගො හොති, සාරාගෙ සති සඤ්ඤොගො හොති. නන්දිසඤ්ඤොජන සඤ්ඤුත්තො[2] ඛො මිගජාල භික්ඛු සදුතිය[1] විහාරීති වුච්චති -පෙ-

සන්ති ඛො මිගජාල මනොවිඤ්ඤෙය්‍යා ධම්මා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, තඤ්චෙ භික්ඛු අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨති, තස්ස තං අභිනන්දතො අභිවදතො අජ්ඣොසාය තිට්ඨතො උප්පජ්ජති නන්දි, නන්දියා සති සාරාගො හොති, සාරාගෙ සති සඤ්ඤොගො හොති. නන්දිසඤ්ඤොජන-සඤ්ඤුත්තො ඛො මිගජාල, භික්ඛු සදුතිය විහාරීති වුච්චති.

එවං විහාරී ච මිගජාල භික්ඛු කිඤ්චාපි අරඤ්ඤෙ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවති අප්පසද්දානි අප්පනිග්ඝොසානි විජනවාතානි මනුස්සරාහසෙය්‍යකානි පටිසල්ලානසාරුප්පානි, අථ ඛො සදුතියවිහාරීති වුච්චති. තං කිස්ස හෙතු? තණ්හා හිස්ස දුතියා, සාස්ස අප්පහීනා, තස්මා සදුතිය විහාරීති වුච්චති.

---

1. සද්දුතිය - සී 1. 2. සීමු ॥
2. සංයුත්තො - සී 1. 2.

# 7. මිගජාල වර්ගය

## 1. 7. 1
## මිගජාල සූත්‍රය

**63. සැවැත් නුවර —**

ඉක්බිති ආයුෂ්මත් මිගජාල තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් ආයුෂ්මත් මිගජාල තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ.

වහන්ස, ''ඒකවිහාරී ඒකවිහාරී'' (එකලා ව වසනසුලු) යයි කියනු ලැබේ. වහන්ස, කෙතෙකින් ඒකවිහාරී වේ ද? කෙතෙකින් සදුතියවිහාරීත් (දෙවැන්නකු සමග වසනසුලුත්) වේ ද? යි. මිගජාල, ඇසින් දතයුතු ඉටු අරමුණු වූ සිත්කලු වූ මනවඩන්නා වූ ප්‍රිය ස්වභාව ඇති (කෙලශ) කාමයෙන් යුක්ත වූ රැදිය යුතු වූ රූ ඇත. ඉදින් මහණ තෙමේ එය පතා ද, ගුණවනා ද, (එහි) ගැලී සිටී ද, එය පතන ගුණවනන (එහි) ගැලී සිටින ඔහුට තෘෂ්ණාව උපදී. තෘෂ්ණාව ඇති කල්හි දැඩිඇල්ම වේ. දැඩිඇල්ම ඇති කල්හි බැඳුම වේ. මිගජාල, තෘෂ්ණා බැම්මෙන් බැඳුණු මහණ තෙමේ සදුතියවිහාරී යයි කියනු ලැබේ. මිගජාල ඉටු අරමුණු වූ සිත්කලු වූ මනවඩන ප්‍රියස්වභාව ඇති කාමයෙන් යුක්ත වූ රැදියයුතු දිවින් දතයුතු රස ඇත. ඉදින් මහණ තෙමේ එය පතා ද, ගුණවනා ද, (එහි) ගැලී සිටී ද, එය පතන ගුණවනන ගැලී සිටින ඔහුට තෘෂ්ණාව උපදී. තෘෂ්ණාව ඇති කල්හි, දැඩිඇල්ම වේ. දැඩිඇල්ම ඇති කල්හි බැඳුම වේ. මිගජාල, තෘෂ්ණා බැඳුමෙන් බැඳුණු මහණ තෙමේ සදුතියවිහාරී යයි කියනු ලැබේ....

මිගජාල, ඉටුඅරමුණු වූ සිත්කලු වූ මනවඩන ප්‍රියස්වභාවය ඇති කාමයෙන් යුතු වූ රැදිය යුතු සිතින් දතයුතු දහම් ඇත. ඉදින් මහණ තෙමේ එය පතා ද, ගුණ කියා ද, ගැලී සිටී ද, එය පතන ගුණවනන ගැලී සිටින ඔහුට තෘෂ්ණාව උපදී. තෘෂ්ණාව ඇති කල්හි දැඩිඇල්ම වේ. දැඩිඇල්ම ඇති කල්හි බැඳුම වේ. මිගජාල, තෘෂ්ණා බැම්මෙන් බැඳුණු මහණ සදුතියවිහාරී ය යි කියනු ලැබේ.

මිගජාල, මෙසේ වසනසුලු වූ ද මහණ තෙමේ ශබ්ද රහිත වූ ඝෝෂ රහිත වූ ජනහසරින් උපදනා පවන් රහිත වූ මිනිසුන් ගේ රහස් ක්‍රියාවන්ට සුදුසු වූ එකලා ව විසුමට සුදුසු වූ වනසෙනසුන් ද වානප්‍රස්ථ (=මනුෂ්‍යොපචාරයෙන් ඈත) සෙනසුන් ද ප්‍රාන්ත (=මනුෂ්‍යාවාසයෙන් ඉතා ඈත) සෙනසුන් ද සෙවුනේ නමුදු සදුතිය විහාරී යයි කියනු ලැබේ. ඒ කවර හෙයින යත්: තෘෂ්ණාව ඔහුගේ දෙවැන්නා ය. ඔහුගේ ඒ තෘෂ්ණාව ප්‍රහීණ නොවූවා ය. එහෙයින් සදුතිය විහාරී යයි කියනු ලැබේ.

සන්ති ච ඛො මිගජාල චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා තඤ්චෙ, භික්ඛු නාභිනන්දති නාභිවදති න අජ්ඣොසාය තිට්ඨති, තස්ස තං අනභිනන්දතො අනභිවදතො අනජ්ඣොසාය තිට්ඨතො නන්දි නිරුජ්ඣති, නන්දියා අ සති සාරාගො න හොති. සාරාගෙ අසති සඤ්ඤොගො න හොති, නන්දිසඤ්ඤොජන විසංයුත්තො ඛො මිගජාල භික්ඛු එකවිහාරීති වුච්චති. –පෙ–

සන්ති ච ඛො මිගජාල ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, තඤ්චෙ භික්ඛු නාභිනන්දති නාභිවදති න අජ්ඣොසාය තිට්ඨති, තස්ස තං අනභිනන්දතො අනභිවදතො අනජ්ඣොසාය තිට්ඨතො නන්දි නිරුජ්ඣති, නන්දියා අසති සාරාගො න හොති, සාරාගෙ අසති සඤ්ඤොගො න හොති. නන්දිසඤ්ඤොජනවිසංයුත්තො ඛො මිගජාල භික්ඛු එක-විහාරීති වුච්චති –පෙ–

සන්ති ච ඛො මිගජාල මනොවිඤ්ඤෙය්‍යා ධම්මා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, තඤ්චෙ භික්ඛු න අභිනන්දති න අභිවදති න අජ්ඣොසාය තිට්ඨති. තස්ස තං අනභිනන්දතො අනභිවදතො අනජ්ඣොසාය තිට්ඨතො නන්දි නිරුජ්ඣති. නන්දියා අසති සාරාගො න හොති. සාරාගෙ අසති සඤ්ඤොගො න හොති. නන්දිසඤ්ඤොජන විසංයුත්තො ඛො මිගජාල භික්ඛු එකවිහාරීති වුච්චති.

එවං විහාරී ච මිගජාල භික්ඛු කිඤ්චාපි ගාමන්තෙ විහරති ආකිණ්ණො භික්ඛූහි භික්ඛුණීහි උපාසකෙහි උපාසිකාහි රාජූහි රාජමහාමත්තෙහි තිත්ථියෙහි තිත්ථියසාවකෙහි, අථ සො එකවිහාරීති වුච්චති තං කිස්ස හෙතු? තණ්හා හිස්ස දුතියා, සාස්ස පහීනා, තස්මා එකවිහාරීති වුච්චතීති.

## 1. 7. 2

## දුතිය මිගජාලසුත්තං

64. අථ ඛො ආයස්මා මිගජාලො යෙන භගවා තෙනුපසඞ්කමි, –පෙ– එකමන්තං නිසින්නො ඛො ආයස්මා මිගජාලො භගවන්තං එතදවොච: සාධු මෙ භන්තෙ භගවා, සඞ්ඛිත්තෙන ධම්මං දෙසෙතු යමහං භගවතො ධම්මං සුත්වා එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරෙය්‍යන්ති.

මිගජාල, ඉටු අරමුණු වූ සිත්කලු වූ මනවඩන ප්‍රියස්වභාවය ඇති කාමයෙන් යුතු වූ රඳිය යුතු ඇසින් දතයුතු රූ ඇත. ඉදින් මහණ තෙමේ එය නොපතා ද, නොවනා ද, ගැලී නො සිටී ද, එය නොපතන නොවනන ගැලී නොසිටින ඔහුගේ තෘෂ්ණාව නිරුද්ධ වේ. තෘෂ්ණාව නැති කල්හි දැඩිඇල්ම නො වේ. දැඩිඇල්ම නැති කල්හි බැඳුම නො වේ. මිගජාල, තෘෂ්ණා බැම්මෙන් නො බැඳුණු මහණ ඒකවිහාරී යයි කියනු ලැබේ...

මිගජාල, ඉටුඅරමුණු වූ සිත්කලු වූ මනවඩන ප්‍රියස්වභාව ඇති කාමයෙන් යුතු වූ රඳිය යුතු දිවෙන් දතයුතු රස ඇත. ඉදින් මහණ තෙමෙ එය නො පතා ද ගුණ නො කියා ද, ගැලී නො සිටී ද, එය නො පතන ගුණ නො කියන ගැලී නො සිටින ඔහුගේ තෘෂ්ණාව නිරුද්ධ වේ. තෘෂ්ණාව නැති කල්හි දැඩිඇල්ම නො වේ. දැඩිඇල්ම නැති කල්හි බැඳුම නො වේ. මිගජාල තෘෂ්ණා බැම්මෙන් නොබැඳුණු මහණ තෙමේ ඒකවිහාරී යයි කියනු ලැබේ.

මිගජාල ඉටුඅරමුණු වූ සිත්කලු වූ මනවඩන ප්‍රියස්වභාව ඇති කාමයෙන් යුතු වූ රඳියයුතු සිතින් දතයුතු දහම් ඇත. ඉදින් මහණ තෙමේ එය නො පතා ද, ගුණ නොකියා ද, ගැලී නොසිටී ද, එය නොපතන ගුණ නොකියන ගැලී නොසිටින ඔහුගේ තෘෂ්ණාව නිරුද්ධ වේ. තෘෂ්ණාව නැති කල්හි දැඩිඇල්ම නො වේ. දැඩිඇල්ම නැති කල්හි බැඳුම නො වේ. මිගජාල, තෘෂ්ණා බැඳුමෙන් නොබැඳුණු මහණ තෙමේ ඒකවිහාරී ය යි කියනු ලැබේ.

මිගජාල, මෙසේ වෙසෙනසුලු මහණ ඉදිනුදු මහණුන්ගෙන් මෙහෙණන්ගෙන් උවසුන්ගෙන් උවැසියන්ගෙන් රජුන්ගෙන් රජමහ ඇමතියන්ගෙන් තොටුවන්ගෙන් තොටුසවුවන්ගෙන් ගැවසීගන්නා ලද්දේ ග්‍රාමාන්ත සෙනසුන්හි වෙසේ ද එහෙත් ඒකවිහාරී යයි කියනු ලැබේ. ඒ කවර හෙයින යත්: තෘෂ්ණාව ඔහුගේ දෙවැන්න ය. ඔහුගේ ඒ තෘෂ්ණාව ප්‍රහීණ වූවා ය. එහෙයින් ඒකවිහාරී යයි කියනු ලැබේ යි.

## 1. 7. 2

## ද්‍රුතිය මිගජාල සූත්‍රය

64. එකල්හි ආයුෂ්මත් මිගජාල තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ.... එකත්පස් ව හුන් ආයුෂ්මත් මිගජාල තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේගේ යම් දහමක් අසා එකලා ව ගණයා කෙරෙන් වෙන් වූයෙම් නො පමා ව කෙලෙස් තවන වෙර ඇතියෙම් නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති වැ වෙසෙන්නෙම් නම් භාග්‍යවතුන් වහන්සේ එබඳු දහමක් සැකෙවින් මට දේශනා කරන සේක්වා යි.

සන්ති ඛො මිගජාල චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා තඤ්ච භික්ඛු අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨති, තස්ස තං අභිනන්දතො අභිවදතො අජ්ඣොසාය තිට්ඨතො උප්පජ්ජති නන්දි, නන්දිසමුදයා දුක්ඛසමුදයො මිගජාලාති වදාමි -පෙ-

සන්ති ඛො මිගජාල ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා -පෙ- මනොවිඤ්ඤෙය්‍යා ධම්මා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, තඤ්ච භික්ඛු අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨති, තස්ස තං අභිනන්දතො අභිවදතො අජ්ඣොසාය තිට්ඨතො උප්පජ්ජති නන්දි, නන්දිසමුදයා දුක්ඛසමුදයො මිගජාලාති වදාමි.

සන්ති ච ඛො මිගජාල චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, තඤ්ච භික්ඛු න අභිනන්දති න අභිවදති න අජ්ඣොසාය තිට්ඨති, තස්ස තං අනභිනන්දතො අනභිවදතො අනජ්ඣොසාය තිට්ඨතො නන්දි නිරුජ්ඣති, නන්දිනිරොධා දුක්ඛනිරොධො මිගජාලාති වදාමි -පෙ-

සන්ති ච ඛො මිගජාල ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- සන්ති ච ඛො මිගජාල මනොවිඤ්ඤෙය්‍යා ධම්මා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, තඤ්ච භික්ඛු නාභිනන්දති නාභිවදති නාජ්ඣොසාය තිට්ඨති, තස්ස තං අනභිනන්දතො අනභිවදතො අනජ්ඣොසාය තිට්ඨතො නන්දි නිරුජ්ඣති, නන්දිනිරොධා දුක්ඛනිරොධො මිගජාලාති වදාමීති. අථ ඛො ආයස්මා මිගජාලො භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

අථ ඛො ආයස්මා මිගජාලො එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති තදනුත්තරං බ්‍රහ්මචරිය-පරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි, ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසි. අඤ්ඤතරො ච පනායස්මා මිගජාලො අරහතං අහොසීති.

මිගජාල, ඉටුඅරමුණු වූ සිත්කලු වූ මනවඩන ප්‍රියස්වභාව ඇති කාමයෙන් යුතු වූ රැඳීමට සුදුසු ඇසින් දතයුතු රූ ඇත. ඉදින් මහණ තෙමේ එය පතා ද, ගුණ කියා ද, ගැලී සිටී ද, එය පතන ගුණ කියන ගැලී සිටින ඔහුට තෘෂ්ණාව උපදී. මිගජාල, තෘෂ්ණාව හටගැනීමෙන් දුක හටගැනීම වේ යයි කියමි.

මිගජාල, ඉටුඅරමුණු වූ සිත්කලු මනවඩන ප්‍රියස්වභාව ඇති කාමයෙන් යුතු වූ රැඳීමට සුදුසු දිවෙන් දත යුතු රස ... ඉටුඅරමුණු වූ සිත්කලු වූ මනවඩන ප්‍රියස්වභාව ඇති කාමයෙන් යුතු වූ රැඳීමට සුදුසු සිතින් දතයුතු දහම් ඇත. ඉදින් මහණ එය පතා ද, ගුණ කියා ද, ගැලී සිටී ද, එය පතන ගුණ කියන ගැලී සිටින ඔහුට තෘෂ්ණාව උපදී. මිගජාල, තෘෂ්ණාව හටගැනීමෙන් දුක හටගැනීම වේ ය යි කියමි.

මිගජාල, ඉටුඅරමුණු වූ සිත්කලු වූ මනවඩන ප්‍රියස්වභාව ඇති කාමයෙන් යුතු වූ රැඳීමට සුදුසු ඇසින් දතයුතු රූ ඇත. ඉදින් මහණ තෙමේ එය නොපතා ද, ගුණ නොකියා ද, ගැලී නොසිටී ද, එය නොපතන ගුණ නොකියන ගැලී නොසිටින ඔහුගේ තෘෂ්ණාව නිරුද්ධ වේ. මිගජාල, තෘෂ්ණා නිරෝධයෙන් දුක්ඛ නිරෝධය වේ ය යි කියමි.

මිගජාල, ... දිවෙන් දත යුතු රස ඇත. මිගජාල, ඉටුඅරමුණු වූ සිත්කලු වූ මනවඩන ප්‍රියස්වභාව ඇති කාමයෙන් යුතු වූ රැඳීමට සුදුසු සිතින් දතයුතු දහම් ඇත. ඉදින් මහණ තෙමේ එය නොපතා ද, ගුණ නො කියා ද, ගැලී නොසිටී ද, එය නො පතන ගුණ නොකියන ගැලී නොසිටින ඔහුගේ තෘෂ්ණාව නිරුද්ධ වේ. මිගජාල, තෘෂ්ණා නිරෝධ-යෙන් දුක්ඛනිරෝධය වේ ය යි කියමි යි. ඉක්බිති ආයුෂ්මත් මිගජාල තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව පිළිගෙන අනුමෝදන් ව හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට නික්ම ගියහ.

ඉක්බිති ආයුෂ්මත් මිගජාල තෙරණුවෝ හුදකලා ව ගණයා කෙරෙන් වෙන් ව නොපමා ව කෙලෙස් තවන වෙර ඇතිව කාය ජීවිත දෙක්හි නිරපෙක්ෂ ව වසනුවෝ යම් අර්හත්ත්වයක් සඳහා කුලපුත්‍රයෝ ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වෙද්ද, මඟබඹසර කෙළවර කොට ඇති ඒ නිරුත්තර අර්හත්ත්වය ඉහාත්මයෙහි තුමූ විශිෂ්ට ඥානයෙන් දැන පසක් කොට (එයට) එළඹ විසූහ. ජාතිය ක්ෂය විය. මඟබඹසර වැස නිමවන ලදී. මේ බැව් පිණිස අනෙකක් නැතැයි අවබෝධ කළහ. ආයුෂ්මත් මිගජාල තෙරණුවෝ රහතුන් අතුරෙන් එක්තරා කෙනෙක් ද වූහ.

## 1. 7. 3

## සමිද්ධි-මාරපඤ්හසුත්තං

65. එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දක නිවාපෙ. අථ ඛො ආයස්මා සමිද්ධි යෙන භගවා තෙනුපසංකමි, උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සමිද්ධි භගවන්තං එතදවොච: මාරො මාරොති භන්තෙ, වුච්චති කිත්තාවතා නු ඛො භන්තෙ මාරො වා අස්ස මාරපඤ්ඤත්ති වාති?

යත්ථ ඛො සමිද්ධි අත්ථි චක්ඛු අත්ථි රූපා අත්ථි චක්ඛු-විඤ්ඤාණං අත්ථි චක්ඛුවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා. අත්ථි තත්ථ මාරො වා මාරපඤ්ඤත්ති වා -පෙ- අත්ථි ජිව්හා අත්ථි රසා අත්ථි ජිව්හාවිඤ්ඤාණං අත්ථි ජිව්හාවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා. අත්ථි තත්ථ මාරො වා මාරපඤ්ඤත්ති වා -පෙ- අත්ථි මනො අත්ථි ධම්මා අත්ථි මනොවිඤ්ඤාණං අත්ථි මනොවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, අත්ථි තත්ථ මාරො වා මාරපඤ්ඤත්ති වා.

යත්ථ ච ඛො සමිද්ධි නත්ථි චක්ඛු නත්ථි රූපා නත්ථි චක්ඛු-විඤ්ඤාණං නත්ථි චක්ඛුවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, නත්ථි තත්ථ මාරො වා මාරපඤ්ඤත්ති වා -පෙ- නත්ථි ජිව්හා නත්ථි රසා නත්ථි ජිව්හාවිඤ්ඤාණං නත්ථි ජිව්හාවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, නත්ථි තත්ථ මාරො වා මාරපඤ්ඤත්ති වා -පෙ- නත්ථි මනො නත්ථි ධම්මා නත්ථි මනොවිඤ්ඤාණං නත්ථි මනොවිඤ්ඤාණවිඤ්ඤා-තබ්බා ධම්මා, නත්ථි තත්ථ මාරො වා මාරපඤ්ඤත්ති වාති.

## 1. 7. 4

## සමිද්ධි-සත්තපඤ්හසුත්තං

66. රාජගහෙ —

සත්තො සත්තොති භන්තෙ වුච්චති, කිත්තාවතා නු ඛො භන්තෙ සත්තො වා අස්ස සත්තපඤ්ඤත්ති වාති?

යත්ථ ඛො සමිද්ධි අත්ථි චක්ඛු අත්ථි රූපා අත්ථි චක්ඛු-විඤ්ඤාණං අත්ථි චක්ඛුවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, අත්ථි තත්ථ සත්තො වා සත්තපඤ්ඤත්ති වා -පෙ- අත්ථි ජිව්හා අත්ථි රසා අත්ථි ජිව්හාවිඤ්ඤාණං අත්ථි ජිව්හාවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, අත්ථි තත්ථ සත්තො වා සත්තපඤ්ඤත්ති වා -පෙ- අත්ථි මනො අත්ථි ධම්මා අත්ථි මනොවිඤ්ඤාණං අත්ථි මනොවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, අත්ථි තත්ථ සත්තො වා සත්තපඤ්ඤත්ති වා.

## 1. 7. 3

## සමිද්ධි මාරපඤ්හ සූත්‍රය

65. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීපයෙහි **කලන්දකනිවාප** නම් **වේළුවන** අරම්හි වැඩවසන සේක. එකල්හි ආයුෂ්මත් **සමිද්ධි** තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් වැ හුන්හ. එකත්පස් වැ හුන් ආයුෂ්මත් සමිද්ධි තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙල සැලකළහ: ''වහන්ස, 'මාර යැ මාර යැ'යි කියනු ලැබෙයි. වහන්ස, කිපමණෙකින් මාර හෝ මාර ප්‍රඥප්ති වන්නේ දැ''යි.

සමිද්ධිය, යම් තැනෙක චක්ෂුස ඇද්ද, රූපයෝ ඇද්ද, චක්ෂුර්විඥානය ඇද්ද, චක්ෂුර්විඥානයෙන් දතයුතු දහම් ඇද්ද, එහි මාර හෝ මාර ප්‍රඥප්ති හෝ ඇත ... ජිහ්වා ඇද්ද, රසයෝ ඇද්ද, ජිහ්වාවිඥාන ඇද්ද, ජිහ්වාවිඥානයෙන් දතයුතු දහම් ඇද්ද, එහි මාර හෝ මාරප්‍රඥප්ති හෝ ඇත ... මනස ඇද්ද, ධර්මයෝ ඇද්ද, මනෝවිඥාන ඇද්ද, මනෝවිඥානයෙන් දතයුතු දහම් ඇද්ද, එහි මාර හෝ මාරප්‍රඥප්ති ඇති.

තවද සමිද්ධිය, යම් තැනෙක චක්ෂුස නැද්ද, රූපයෝ නැද්ද, චක්ෂුර්විඥාන නැද්ද, චක්ෂුර්විඥානයෙන් දතයුතු දහම් නැද්ද, එහි මාර හෝ මාරප්‍රඥප්ති හෝ නැත ... ජිහ්වා නැද්ද, රසයෝ නැද්ද, ජිහ්වාවිඥාන නැද්ද, ජිහ්වාවිඥානයෙන් දතයුතු දහම් නැද්ද, එහි මාර හෝ මාරප්‍රඥප්ති හෝ නැත ... මනස නැද්ද, ධර්මයෝ නැද්ද, මනෝවිඥාන නැද්ද, මනෝවිඥානයෙන් දතයුතු දහම් නැද්ද, එහි මාර හෝ මාරප්‍රඥප්ති හෝ නැතැ යි.

## 1. 7. 4

## සමිද්ධි සත්තපඤ්හ සූත්‍රය

66. **රජගහ නුවර —**

''වහන්ස, 'සත්ත්ව' යැ 'සත්ත්ව' යැ යි කියනු ලැබෙයි. වහන්ස, කිපමණෙකින් **'සත්ත්ව'** හෝ **'සත්ත්වප්‍රඥප්ති'** හෝ වන්නේ දැ''යි.

සමිද්ධිය, යම් තැනෙක, චක්ෂුස ඇද්ද, රූපයෝ ඇද්ද, චක්ෂුර්විඥාන ඇද්ද, චක්ෂුර්විඥානයෙන් දතයුතු දහම් ඇද්ද, එහි සත්ව හෝ සත්ත්වප්‍රඥප්ති ඇත ... ජිහ්වා ඇද්ද, රසයෝ ඇද්ද, ජිහ්වාවිඥාන ඇද්ද, ජිහ්වාවිඥානයෙන් දතයුතු දහම් ඇද්ද, එහි සත්ත්ව හෝ සත්වප්‍රඥප්ති ඇත ... මනස ඇද්ද, ධර්මයෝ ඇද්ද, මනෝවිඥාන ඇද්ද, මනෝවිඥානයෙන් දතයුතු දහම් ඇද්ද, එහි සත්ත්ව හෝ සත්ත්වප්‍රඥප්ති ඇති.

යත්ථ ච ඛො සමිද්ධි නත්ථි චක්ඛු නත්ථි රූපා නත්ථි චක්ඛුවිඤ්ඤාණං නත්ථි චක්ඛුවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, නත්ථි තත්ථ සත්තො වා සත්තපඤ්ඤත්ති වා -පෙ- නත්ථි ජිව්හා නත්ථි රසා නත්ථි ජිව්හාවිඤ්ඤාණං නත්ථි ජිව්හාවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, නත්ථි තත්ථ සත්තො වා සත්තපඤ්ඤත්ති වා -පෙ- නත්ථි මනො නත්ථි ධම්මා නත්ථි මනොවිඤ්ඤාණං නත්ථි මනොවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, නත්ථි තත්ථ සත්තො වා සත්තපඤ්ඤත්ති වාති.

## 1. 7. 5

## සමිද්ධි-දුක්ඛපඤ්හසුත්තං

67. දුක්ඛං දුක්ඛන්ති භන්තෙ වුච්චති කිත්තාවතා නු ඛො භන්තෙ දුක්ඛං වා අස්ස දුක්ඛපඤ්ඤත්ති වාති?

යත්ථ ඛො සමිද්ධි අත්ථි චක්ඛු අත්ථි රූපා අත්ථි චක්ඛුවිඤ්ඤාණං අත්ථි චක්ඛුවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, අත්ථි තත්ථ දුක්ඛං වා දුක්ඛපඤ්ඤත්ති වා -පෙ- අත්ථි ජිව්හා අත්ථි රසා -පෙ- අත්ථි මනො අත්ථි ධම්මා අත්ථි මනොවිඤ්ඤාණං අත්ථි මනොවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, අත්ථි තත්ථ දුක්ඛං වා දුක්ඛපඤ්ඤත්ති වා.

යත්ථ ච ඛො සමිද්ධි නත්ථි චක්ඛු නත්ථි රූපා නත්ථි චක්ඛුවිඤ්ඤාණං නත්ථි චක්ඛුවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, නත්ථි තත්ථ දුක්ඛං වා දුක්ඛපඤ්ඤත්ති වා -පෙ- නත්ථි ජිව්හා නත්ථි රසා -පෙ- නත්ථි මනො නත්ථි ධම්මා නත්ථි මනොවිඤ්ඤාණං නත්ථි මනොවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, නත්ථි තත්ථ දුක්ඛං වා දුක්ඛපඤ්ඤත්ති වාති.

## 1. 7. 6

## සමිද්ධි-ලොකපඤ්හසුත්තං

68. ලොකො ලොකොති භන්තෙ වුච්චති, කිත්තාවතා නු ඛො භන්තෙ ලොකො වා අස්ස ලොකපඤ්ඤත්ති වාති?

යත්ථ ඛො සමිද්ධි අත්ථි චක්ඛු අත්ථි රූපා අත්ථි චක්ඛුවිඤ්ඤාණං අත්ථි චක්ඛුවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, අත්ථි තත්ථ ලොකො වා ලොකපඤ්ඤත්ති වා -පෙ- අත්ථි ජිව්හා අත්ථි රසා -පෙ- අත්ථි මනො අත්ථි ධම්මා අත්ථි මනොවිඤ්ඤාණං අත්ථි මනොවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, අත්ථි තත්ථ ලොකො වා ලොකපඤ්ඤත්ති වා.

තවද සමිද්ධිය, යම් තැනෙක චක්ෂුස නැද්ද, රූපයෝ නැද්ද, චක්ෂුර්විඥාන නැද්ද, චක්ෂුර්විඥානයෙන් දතයුතු දහම් නැද්ද, එහි සත්ත්ව හෝ සත්වප්‍රඥප්ති නැත ... ජිහ්වා නැද්ද, රසයෝ නැද්ද, ජිහ්වාවිඥාන නැද්ද, ජිහ්වාවිඥානයෙන් දතයුතු දහම් නැද්ද, එහි සත්ත්ව හෝ සත්ත්වප්‍රඥප්ති නැත ... මනස නැද්ද, ධර්මයෝ නැද්ද, මනෝවිඥාන නැද්ද, මනෝවිඥානයෙන් දතයුතු දහම් නැද්ද, එහි සත්ත්ව හෝ සත්ත්වප්‍රඥප්ති හෝ නැතැ'යි.

## 1. 7. 5

## සමිද්ධි දුක්ඛපඤ්හ සූත්‍රය

67. වහන්ස, 'දුඃඛ යැ දුඃඛ යැ'යි කියනු ලැබෙයි. වහන්ස, කිපමණෙකින් 'දුඃඛ හෝ 'දුඃඛප්‍රඥප්ති' හෝ වන්නේ දැ'යි.

සමිද්ධිය, යම් තැනෙක චක්ෂුස ඇද්ද, රූපයෝ ඇද්ද, චක්ෂුර්විඥාන ඇද්ද, චක්ෂුර්විඥානයෙන් දතයුතු දහම් ඇද්ද, එහි 'දුඃඛ' හෝ 'දුඃඛප්‍රඥප්ති' හෝ ඇත ... ජිහ්වා ඇද්ද, රසයෝ ඇද්ද, ජිහ්වාවිඥාන ඇද්ද, ජිහ්වාවිඥානයෙන් දතයුතු දහම් ඇද්ද, එහි 'දුඃඛ' හෝ 'දුඃඛප්‍රඥප්ති' ඇත ... මනස ඇද්ද, ධර්මයෝ ඇද්ද, මනෝවිඥාන ඇද්ද, මනෝවිඥානයෙන් දතයුතු දහම් ඇද්ද, එහි 'දුඃඛ' හෝ 'දුඃඛප්‍රඥප්ති' ඇති.

තවද සමිද්ධිය, යම් තැනෙක චක්ෂුස නැද්ද, රූපයෝ නැද්ද, චක්ෂුර්විඥාන නැද්ද, චක්ෂුර්විඥානයෙන් දතයුතු දහම් නැද්ද, එහි 'දුඃඛ' හෝ 'දුඃඛප්‍රඥප්ති, හෝ නැත ... ජිහ්වා නැද්ද, රසයෝ නැද්ද ... මනස නැද්ද, ධර්මයෝ නැද්ද, මනෝවිඥාන නැද්ද, මනෝවිඥානයෙන් දතයුතු දහම් නැද්ද, එහි 'දුඃඛ' හෝ 'දුඃඛප්‍රඥප්ති' හෝ නැති.

## 1. 7. 6

## සමිද්ධි ලෝකපඤ්හ සූත්‍රය

68. වහන්ස, 'ලෝක' යැ 'ලෝක' යැ යි කියනු ලැබෙයි. වහන්ස, කිපමණෙකින් 'ලෝක' හෝ 'ලෝකප්‍රඥප්ති' හෝ වන්නේ දැ'යි.

සමිද්ධිය, යම් තැනෙක චක්ෂුස ඇද්ද, රූපයෝ ඇද්ද, චක්ෂුර්විඥාන ඇද්ද, චක්ෂුර්විඥානයෙන් දතයුතු දහම් ඇද්ද, එහි 'ලෝක' හෝ 'ලෝකප්‍රඥප්ති' හෝ ඇත ... ජිහ්වා ඇද්ද, රසයෝ ඇද්ද ... මනස ඇද්ද, ධර්මයෝ ඇද්ද, මනෝවිඥාන ඇද්ද, මනෝවිඥානයෙන් දතයුතු දහම් ඇද්ද. එහි 'ලෝක' හෝ 'ලෝකප්‍රඥප්ති' ඇත.

යත්ථ ච ඛො සමිද්ධි නත්ථි චක්ඛු නත්ථි රූපා නත්ථි චක්ඛුවිඤ්ඤාණං නත්ථි චක්ඛුවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, නත්ථි තත්ථ ලොකො වා ලොකපඤ්ඤත්ති වා -පෙ- නත්ථි ජිව්හා නත්ථි රසා -පෙ- නත්ථි මනො නත්ථි ධම්මා නත්ථි මනොවිඤ්ඤාණං නත්ථි මනොවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, නත්ථි තත්ථ ලොකො වා ලොකපඤ්ඤත්ති වාති.

## 1. 7. 7

## උපසෙනසුත්තං

69. එකං සමයං ආයස්මා ච **සාරිපුත්තො** ආයස්මා ච **උපසෙනො** **රාජගහෙ** විහරන්ති **සීතවනෙ සප්පසොණ්ඩික** පබ්භාරෙ තෙන ඛො පන සමයෙන ආයස්මතො උපසෙනස්ස කායෙ ආසිවිසො පතිතො හොති.

අථ ඛො ආයස්මා උපසෙනො භික්ඛූ ආමන්තෙසි: එථ මෙ ආවුසො, ඉමං කායං මඤ්චකං ආරොපෙත්වා බහිද්ධා නීහරථ, පුරායං කායො ඉධෙව විකිරති සෙය්‍යථාපි භුසමුට්ඨීති. එවං වුත්තෙ ආයස්මා සාරිපුත්තො ආයස්මන්තං උපසෙනං එතදවොච: න ඛො පන මයං පස්සාම ආයස්මතො උපසෙනස්ස කායස්ස වා අඤ්ඤථත්තං ඉන්ද්‍රියානං වා විපරිණාමං, අථ ච පනායස්මා උපසෙනො එවමාහ: එථ මෙ ආවුසො ඉමං කායං මඤ්චකං ආරොපෙත්වා බහිද්ධා නීහරථ, පුරායං කායො ඉධෙව විකිරති සෙය්‍යථාපි භුසමුට්ඨීති.

යස්ස නූන ආවුසො සාරිපුත්ත එවමස්ස: අහං චක්ඛූන්ති වා මම චක්ඛූන්ති වා, අහං සොතන්ති වා මම සොතන්ති වා, අහං ඝානන්ති වා මම ඝානන්ති වා, අහං ජිව්හාති වා මම ජිව්හාති වා, අහං කායොති වා මම කායොති වා, අහං මනොති වා මම මනොති වා, තස්ස නූන ආවුසො[1] සාරිපුත්ත සියා කායස්ස වා අඤ්ඤථත්තං ඉන්ද්‍රියානං වා විපරිණාමො. මය්හඤ්ච ඛො ආවුසො සාරිපුත්ත න එවං හොති: අහං චක්ඛූන්ති[2] වා මම චක්ඛූන්ති වා, අහං සොතන්ති වා මම සොතන්ති වා, අහං ඝානන්ති වා මම ඝානන්ති වා, අහං ජිව්හාති වා මම ජිව්හාති වා, අහං කායොති වා මම කායොති වා, අහං මනොති වා මම මනොති වා, තස්ස මය්හං ආවුසො සාරිපුත්ත කිං කායස්ස වා අඤ්ඤථත්තං භවිස්සති ඉන්ද්‍රියානං වා විපරිණාමොති?

---

1. තස්ස ආවුසො - මජ්ඣං, ස්‍යා.
2. චක්ඛූති - මජ්ඣං

තවද සමිද්ධිය යම් තැනෙක චක්‍ෂුස නැද්ද, රූපයෝ නැද්ද, චක්‍ෂුර්විඥාන නැද්ද, චක්‍ෂුර්විඥානයෙන් දතයුතු දහම් නැද්ද, එහි 'ලෝක' හෝ 'ලෝකප්‍රඥප්ති, හෝ නැත ... ජිහ්වා නැද්ද, රසයෝ නැද්ද ... මනස නැද්ද, ධර්මයෝ නැද්ද, මනෝවිඥාන නැද්ද, මනෝවිඥානයෙන් දතයුතු දහම් නැද්ද, එහි ලෝක හෝ ලෝකප්‍රඥප්ති හෝ නැතැ'යි.

## 1. 7. 7

## උපසේන සූත්‍රය

69. එක් සමයෙක්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝත් ආයුෂ්මත් උපසේන තෙරණුවෝත් රජගහ නුවර සීත වෙනෙහි සප්පසොණ්ඩික පර්වතගුහාවෙහි වැඩ විසූහ. එකල්හි ආයුෂ්මත් උපසේන තෙරුන්ගේ කයෙහි ආශීර්විෂයෙක් වැටුණේ වෙයි.

එකල්හි ආයුෂ්මත් උපසේන තෙරණුවෝ භික්ෂූන් ඇමතූහ: ඇවැත්නි, ''එව මේ කය බොල්මිටක් මෙන් මෙහි ම විසිරීමට පෙර මාගේ මේ කය ඇඳකට නඟා බැහැර කරව''යි. මෙසේ කී කල්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ආයුෂ්මත් උපසේන තෙරුන්ට මෙය වදළහ: ආයුෂ්මත් උපසේනයන්ගේ කයෙහි වෙනස්බවක් හෝ ඉඳුරන්ගේ වෙනස්වීමක් හෝ අපි නොම දකුම්හ. එහෙත් ආයුෂ්මත් උපසේන මෙසේ කියයි. ''ඇවැත්නි, එව මේ කය බොල්මිටක් මෙන් මෙහි ම විසිරීමට පෙර මාගේ මේ කය ඇඳකට නඟා බැහැර කරව''යි.

ඇවැත්නි ශාරිපුත්‍රයෙනි, යමකුට ''ඇස මම යැ කියා හෝ ඇස මාගේ යැ කියා හෝ කන මම යැ කියා හෝ කන මාගේ යැ කියා හෝ නැහැය මම යැ කියා හෝ නැහැය මාගේ යැ කියා හෝ දිව මම යැ කියා හෝ දිව මාගේ යැ කියා හෝ කය මම යැ කියා හෝ කය මාගේ යැ කියා හෝ සිත මම යැ කියා හෝ සිත මාගේ යැ කියා හෝ ඒකාන්තයෙන් මෙබඳු සිතෙක් වන්නේ ද, ඇවැත්නි, ශාරීපුත්‍රයෙනි, ඔහුගේ කයෙහි වෙනස්බවෙක් හෝ ඉඳුරන්ගේ වෙනස්වීමෙක් හෝ ඒකාන්තයෙන් වන්නේ ය. ඇවැත්නි, ශාරීපුත්‍රයෙනි, මට වූකලි ''ඇස මම යැ කියා හෝ ඇස මාගේ යැ කියා හෝ කන මම යැ කියා හෝ කන මාගේ යැ කියා හෝ නැහැය මම යැ කියා හෝ නැහැය මාගේ යැ කියා හෝ දිව මම යැ කියා හෝ දිව මාගේ යැ කියා හෝ කය මම යැ කියා හෝ කය මාගේ යැ කියා හෝ සිත මම යැ කියා හෝ සිත මාගේ යැ'' කියා හෝ මෙබඳු සිතෙක් නො වේ. ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, කිම? ඒ මාගේ කයෙහි වෙනස්බවෙක් හෝ ඉඳුරන්ගේ වෙනස්වීමෙක් හෝ වන්නේ ද? (නො වන්නේ ම ය.)

තථා හි පනායස්මතො උපසෙනස්ස දීඝරත්තං අහංකාර-මමිංකාර මානානුසයා සුසමූහතා,[1] තස්මායස්මතො උපසෙනස්ස න එවං හොති: අහං චක්ඛුන්ති වා මම චක්ඛුන්ති වා -පෙ- අහං ජිව්හාති වා මම ජිව්හාති වා -පෙ- අහං මනොති මම මනොති වාති.

අථ ඛො තෙ භික්ඛූ ආයස්මතො උපසෙනස්ස කායං මඤ්චකං ආරොපෙත්වා බහිද්ධා නීහරිංසු අථ ඛො ආයස්මතො උපසෙනස්ස කායො තත්ථෙව විකිරි සෙය්‍යථාපි භුසමුට්ඨීති.

## 1. 7. 8

### උපවාණසුත්තං

70. අථ ඛො ආයස්මා උපවාණො යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො ආයස්මා උපවාණො භගවන්තං එතදවොච: සන්දිට්ඨිකො ධම්මො සන්දිට්ඨිකො ධම්මොති භන්තෙ වුච්චති කිත්තාවතා නු ඛො භන්තෙ සන්දිට්ඨිකො ධම්මො හොති අකාලිකො එහි පස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති?

ඉධූපවාණ[2] භික්ඛු චක්ඛුනා රූපං දිස්වා රූපපටිසංවෙදී ච හොති රූපරාගපටිසංවෙදී ච. සන්තඤ්ච අජ්ඣත්තං රූපෙසු රාගං අත්ථි මෙ අජ්ඣත්තං රූපෙසු රාගොති පජානාති, යන්තං උපවාණ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා රූපපටිසංවෙදී[3] ච හොති, රූපරාග-පටිසංවෙදී[4] ච සන්තඤ්ච අජ්ඣත්තං රූපෙසු රාගං අත්ථි මෙ අජ්ඣත්තං රූපෙසු රාගොති පජානාති. එවම්පි ඛො උපවාණ, සන්දිට්ඨිකො ධම්මො හොති අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහි -පෙ-

පුන ච පරං උපවාණ භික්ඛු ජිව්හාය රසං සායිත්වා රසපටිසංවෙදී ච හොති රසරාගපටිසංවෙදී ච සන්තඤ්ච අජ්ඣත්තං රසෙසු රාගං අත්ථි මෙ අජ්ඣත්තං රසෙසු රාගොති පජානාති. යන්තං උපවාණ භික්ඛු ජිව්හාය රසං සායිත්වා රසපටිසංවෙදී ච හොති රසරාගපටිසංවෙදී ච. සන්තඤ්ච අජ්ඣත්තං රසෙසු රාගං අත්ථි මෙ අජ්ඣත්තං රසෙසු රාගොති පජානාති, එවම්පි ඛො උපවාණ සන්දිට්ඨිකො ධම්මො හොති අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහි -පෙ-

1. මානානුසයො සුසමූහතො - මජසං.
2. ඉධ පන උපවාණ - මජසං, ස්‍යා
3. රූපප්පටිසංවෙදි - මජසං.
4. රූපරාගප්පටිසංවෙදී - මජසං.

ඒ එසේ මැ යි. ආයුෂ්මත් උපසේනයන් විසින් දිගුකලක සිට අහංකාර දෘෂ්ටිය මමීකාර තෘෂ්ණාව හා මානානුසයයෝ මැනවින් නසන ලදහ. එහෙයින් ආයුෂ්මත් උපසේනයන්ට "ඇස මම යැ කියා හෝ ඇස මාගේ යැ කියා හෝ ... දිව මම යැ කියා හෝ දිව මාගේ යැ කියා හෝ ... සිත මම යැ කියා හෝ සිත මාගේ යැ කියා හෝ මෙබඳු සිතෙක් නො වේ.

ඉක්බිති ඒ භික්ෂූහු ආයුෂ්මත් උපසේන තෙරුන්ගේ කය ඇඳක නඟා බැහැර ගෙන ගියහ. එකල්හි ආයුෂ්මත් උපසේන තෙරුන්ගේ කය බොල්මිටක් මෙන් එතැන ම විසිර ගියේ යි.

## 1. 7. 8

## උපවාණ සූත්‍රය

70. එකල්හි ආයුෂ්මත් **උපවාණ** තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. ... එකත්පස් වැ හුන් ආයුෂ්මත් උපවාණ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ: වහන්ස, ධර්මය සන්දිට්ඨික (තමා විසින් දක්ක යුතු) යැ, ධර්මය සන්දිට්ඨික යැ යි කියනු ලැබේ. වහන්ස, ධර්මය කෙතෙකින් සන්දිට්ඨිකත් අකාලිකත් (කල් නො යවා විපාක දෙන්නේත්) එහිපස්සිකත් (එව බලව යි කීමට සුදුසුත්) ඔපනයිකත් (සිත්හි ලා දැරීමට සුදුසුත්) නුවණැත්තන් විසින් තමතමන් කෙරෙහි ලා දතයුතුත් වේ ද? යි,

උපවාණ, මෙසස්නෙහි මහණ ඇසින් රූ දැක රූපය දන්නේත් රූපරාගය දන්නේත් වෙයි. තම සන්තානයෙහි ඇති රූපයන්හි රාගය මාගේ සන්තානයෙහි රූපයන්හි රාගය ඇතැ යි දනියි. උපවාණ, මහණ ඇසින් යම් ඒ රූ දැක රූපය දන්නේත් රූපරාගය දන්නේත් වේ ද, තම සන්තානයෙහි ඇති රූපයන්හි රාගය මාගේ සන්තානයෙහි රූපයන්හි රාගය ඇතැ යි දනී ද, උපවාණ, මෙසේත් ධර්මය සන්දිට්ඨිකත් අකාලිකත් එහිපස්සිකත් ඔපනයිකත් නුවණැත්තන් විසින් තමතමන් කෙරෙහි ලා දතයුතුත් වෙයි ...

උපවාණ, නැවත අනෙකක් ද කියමි: මහණ දිවෙන් රස විඳ රස දන්නේත් රසරාග දන්නේත් වෙයි. තම සන්තානයෙහි ඇති රසයන්හි රාගය තමාගේ සතන්හි රසයන්හි රාගය ඇතැ යි දනියි. උපවාණ, මහණ දිවෙන් යම් ඒ රසයක් ආස්වාදනය කොට රස දන්නේත් රසරාග දන්නේත් වේ ද, තම සතන්හි ඇති රසයන්හි රාගය මාගේ සතන්හි රසරාගය ඇතැයි දනී යි. උපවාණ, මෙසේත් ධර්මය සන්දිට්ඨිකත් අකාලිකත් එහිපස්සිකත් ඔපනයිකත් නුවණැත්තන් විසින් තම තමන් කෙරෙහි ලා දතයුතුත් වේ....

පුන ච පරං උපවාණ භික්ඛු මනසා ධම්මං විඤ්ඤාය ධම්මපටිසංවෙදී ච හොති ධම්මරාගපටිසංවෙදී ච, සන්තඤ්ච අජ්ඣත්තං ධම්මෙසු රාගං අත්ථි මෙ අජ්ඣත්තං ධම්මෙසු රාගොති පජානාති. යන්තං උපවාණ භික්ඛු මනසා ධම්මං විඤ්ඤාය ධම්මපටිසංවෙදී ච හොති ධම්මරාගපටිසංවෙදී ච, සන්තඤ්ච අජ්ඣත්තං ධම්මෙසු රාගං: අත්ථි මෙ අජ්ඣත්තං ධම්මෙසු රාගොති පජානාති, එවම්පි ඛො උපවාණ සන්දිට්ඨිකො ධම්මො හොති අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහි.

ඉධූපවාණ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා රූපපටිසංවෙදී හි ඛො හොති නො ච රූපරාගපටිසංවෙදී, අසන්තඤ්ච අජ්ඣත්තං රූපෙසු රාගං නත්ථි මෙ අජ්ඣත්තං රූපෙසු රාගොති පජානාති. යන්තං උපවාණ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා රූපපටිසංවෙදී හි ඛො හොති නො ච රූපරාගපටිසංවෙදී,[1] අසන්තඤ්ච අජ්ඣත්තං රූපෙසු රාගං නත්ථි මෙ අජ්ඣත්තං රූපෙසු රාගොති පජානාති. එවම්පි ඛො උපවාණ සන්දිට්ඨිකො ධම්මො හොති අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහි. -පෙ-

පුන ච පරං උපවාණ භික්ඛු ජිව්හාය රසං සායිත්වා රසපටිසංවෙදී හි ඛො හොති නො ච රසරාගපටිසංවෙදී, අසන්තඤ්ච අජ්ඣත්තං රසෙසු රාගං: නත්ථි මෙ අජ්ඣත්තං රසෙසු රාගොති පජානාති යන්තං උපවාණ භික්ඛු ජිව්හාය රසං සායිත්වා රසපටිසංවෙදී හි ඛො හොති නො ච රසරාගපටිසංවෙදී, අසන්තඤ්ච අජ්ඣත්තං රසෙසු රාගං: නත්ථි මෙ අජ්ඣත්තං රසෙසු රාගොති පජානාති. එවම්පි ඛො උපවාණ සන්දිට්ඨිකො ධම්මො හොති අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහි -පෙ-

පුන ච පරං උපවාණ භික්ඛු මනසා ධම්මං විඤ්ඤාය ධම්මපටිසංවෙදී හි ඛො හොති නො ච ධම්මරාගපටිසංවෙදී, අසන්තඤ්ච අජ්ඣත්තං ධම්මෙසු රාගං: නත්ථි මෙ අජ්ඣත්තං ධම්මෙසු රාගොති පජානාති. යන්තං උපවාණ භික්ඛු මනසා ධම්මං විඤ්ඤාය ධම්මපටිසංවෙදී හි ඛො හොති නො ච ධම්මරාගපටිසංවෙදී, අසන්තඤ්ච අජ්ඣත්තං ධම්මෙසු රාගං: නත්ථි මෙ අජ්ඣත්තං ධම්මෙසු රාගොති පජානාති, එවම්පි ඛො උපවාණ සන්දිට්ඨිකො ධම්මො හොති අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී ති.

## 1. 7. 9

## පඨම ඡඵස්සායතනසුත්තං

71. යො හි කොචි භික්ඛවෙ භික්ඛු ඡන්නං ඵස්සායතනානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං නප්පජානාති; අවුසිතං තෙන බ්‍රහ්මචරියං, ආරකා සො ඉමම්හා ධම්මවිනයා ති.

---

1. පටිසංවෙදී හි - සිමු.

උපවාණ, නැවත අනෙකක් ද කියමි: මහණ සිතින් ධර්මය දැන ධර්මය දන්නේත් ධර්මරාගය දන්නේත් වේ. තමන් තුළ ඇති ධර්මයන්හි රාගය මාගේ සතන්හි ධර්මයන්හි රාගය ඇතැ යි දනි යි. උපවාණ, මහණ තෙමේ සිතින් යම් ඒ දහමක් දැන ධර්මය දන්නේත් ධර්මරාගය දන්නේත් වේ ද, සිය සතන්හි ඇති ධර්මයන්හි රාගය මාගේ සතන්හි ධර්මයන්හි රාගය ඇතැ යි දනී ද, උපවාණ, මෙසේත් ධර්මය සන්දිට්ඨිකත් අකාලිකත් එහිපස්සිකත් ඔපනයිකත් නුවණැත්තන් විසින් තමතමන් කෙරෙහි ලා දතයුතුත් වෙයි.

උපවාණ, මෙසස්නෙහි මහණ ඇසින් රූ දැක රූ දන්නේත් නො ද රූපරාග දන්නේත් වේ. සිය සතන්හි නැති රූපයන්හි රාගය මා සතන්හි රූපයන්හි රාගය නැතැ යි දැනගනී, උපවාණ, මහණ ඇසින් යම් රූපයක් දැක රූ දන්නේත් නො ද රූපරාග දන්නේත් වේ ද, සියසතන්හි නැති රූපයන්හි රාගය මා සතන්හි රූපයන්හි රාගය නැතැ යි දැනගනී ද, උපවාණ, මෙසේත් ධර්මය සන්දිට්ඨිකත් අකාලිකත් එහිපස්සිකත් ඔපනයිකත් නුවණැත්තන් විසින් තමතමන් කෙරෙහි ලා දතයුතුත් වෙයි.

උපවාණ, නැවත අනෙකක් ද කියමි: මහණ දිවෙන් රස විඳ රස දන්නේත් නො ද රසරාග දන්නේත් වෙයි. සියසතන්හි නැති රසයන්හි රාගය මා සතන්හි රසයන්හි රාගය නැතැයි දැනගනී. උපවාණ, මහණ දිවෙන් යම් රසයක් විඳ රස දන්නේත් නො ද රසරාග දන්නේත් වේද, සියසතන්හි නැති රසයන්හි රාගය: මා සතන්හි රසයන්හි රාගය නැතැ යි දැනගනී ද. උපවාණ, මෙසේත් ධර්මය සන්දිට්ඨිකත් අකාලිකත් එහිපස්සිකත් ඔපනයිකත් නුවණැත්තන් විසින් තමතමන් කෙරෙහි ලා දතයුතුත් වෙයි. ...

උපවාණ, නැවත අනෙකක් ද කියමි: මහණ සිතින් දහම් දැන දහම් දන්නේත් නො ද දහම්රාගය දන්නේත් වෙයි. සිය සතන්හි නැති දහම්හි රාගය මා සතන්හි දහම්හි රාගය නැතැ යි දනියි. උපවාණ, මහණ සිතින් යම් දහමක් දැන දහම් දන්නේත් නො ද දහම්රාගය දන්නේත් වේ ද, සියසතන්හි නැති දහම්හි රාගය: මා සතන්හි දහම්හි රාගය නැතැ යි දැන-ගනී ද, උපවාණ, මෙසේත් ධර්මය සන්දිට්ඨිකත් අකාලිකත් එහිපස්සි-කත් ඔපනයිකත් නුවණැත්තන් විසින් තමතමන් කෙරෙහි ලා දතයුතුත් වෙ යි.

## 1. 7. 9

## පඨම ඡඵස්සායතන සූත්‍රය

71. මහණෙනි, යම් කිසි මහණෙක් සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ හටගැන්මත් විනාශයත් විඳගැන්මත් දෙෂයත් නික්මයැමත් තතු සේ නො දනී ද, ඔහු විසින් මහබඹසර නො වසන ලදී. හේ මෙසස්නෙන් දුරු වෙයි.

එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු භගවන්තං එතදවොච: එත්ථාහං භන්තෙ, අනස්සාසිං,[1] අහඤ්හි භන්තෙ ඡන්නං ආයතනානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං නප්පජානාමීති.

තං කිම්මඤ්ඤසි භික්ඛු චක්ඛුං: "එතං මම එසො'හමස්මි එසො මෙ අත්තා"ති සමනුපස්සසීති? නොහෙතං භන්තෙ, සාධු භික්ඛු එත්ථ ච තෙ භික්ඛු චක්ඛුං: "නෙතං මම නෙසොහමස්මි න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨං භවිස්සති, එසෙවන්තො දුක්ඛස්ස -පෙ-

ජිව්හං:[2] "එතං මම එසො'හමස්මි එසො මෙ අත්තා"ති සමනුපස්සසීති? නො හෙතං භන්තෙ, සාධු භික්ඛු එත්ථ ච තෙ භික්ඛු ජිව්හා: "නෙතං මම නෙසොහමස්මි න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨා භවිස්සති, එසෙවන්තො දුක්ඛස්ස -පෙ-

මනං: "එතං මම එසො'හමස්මි එසො මෙ අත්තාති සමනුපස්සසී"ති නොහෙතං භන්තෙ, සාධු භික්ඛු එත්ථ ච තෙ භික්ඛු මනො "නෙතං මම නෙසො'හමස්මි න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨො[3] භවිස්සති, එසෙවන්තො දුක්ඛස්සාති.

## 1. 7. 10

## දුතිය ඡඵස්සායතනසුත්තං

72. යො හි කොචි භික්ඛවෙ භික්ඛු ඡන්නං ඵස්සායතනානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං නප්පජානාති, අවුසිතං තෙන බ්‍රහ්මචරියං, ආරකාව සො ඉමස්මා ධම්මවිනයාති.

එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු භගවන්තං එතදවොච: එත්ථාහං භන්තෙ අනස්සාසිං, අහඤ්හි භන්තෙ ඡන්නං ඵස්සායතනානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරඤ්ච යථාභූතං නප්පජානාමීති.

1. අනස්සසං - මජසං. අනස්සාසං - සයා
2. ජිව්හා - සිමු
3. සුදිට්ඨං - සිමු

මෙසේ වදළ කල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: වහන්ස, මෙහි ලා මම නටුයෙමි වෙමි. වහන්ස, මම සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ සමුදයත් අස්ථගමයත් ආදීනවයත් නිස්සරණයත් තතු සේ නො දනිමි යි.

මහණ, ඒ කුමැ යි හඟිහි ද? ඇස: "මෙය මාගේ ය, මේ මම වෙමි, මේ මාගේ ආත්ම ය"යි දකිහි දැ? යි. වහන්ස, එය නො වේ ම ය. මහණ, මැනවි. මහණ, මෙහි ලා තා විසින් ඇස: "මෙය මාගේ නො වෙයි, මේ මම නො වෙමි, මේ මාගේ ආත්මය නො වේ ය"යි මෙසේ මෙය තතු සේ මනානුවණින් මොනවට දක්නා ලද්දේ වන්නේ නම් දුක්හි කෙළවර (නිවන) මෙය මැ යි...

දිව: "මෙය මා ගේ ය, මේ මම වෙමි, මේ මාගේ ආත්මය"යි දකිහි දැ? යි. වහන්ස මෙය නො වේ ම ය. මහණ, මැනවි. මහණ, මෙහි ලා තා විසින් දිව: "මෙය මාගේ නො වෙයි, මේ මම නො වෙමි, මේ මාගේ ආත්මය නො වේ" ය යි මෙසේ මෙය තතු සේ මනානුවණින් මොනවට දක්නා ලද්දී වන්නේ නම් දුක්හි කෙළවර මෙය මැ යි...

සිත: "මෙය මාගේ ය, මේ මම වෙමි, මේ මාගේ ආත්මය"යි දකිහි දැ? යි. වහන්ස, මෙය නො වේ ම ය. මහණ, මැනවි. මහණ, මෙහි ලා තා විසින් සිත: "මෙය මාගේ නො වෙයි, මේ මම නො වෙමි, මේ මාගේ ආත්මය නො වේ" ය යි මෙසේ මෙය තතු සේ මනානුවණින් මොනවට දක්නා ලද්දේ වන්නේ නම් දුක්හි කෙළවර මෙය මැ යි.

## 1. 7. 10

## දුතිය ඡඵස්සායතන සූත්‍රය

72. මහණෙනි, යම් කිසි මහණෙක් සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ සමුදයයත් අස්ථගමයත් ආදීනවයත් නිස්සරණයත් තතු සේ නො දනී ද, ඔහු විසින් බඹසර නොවසන ලද, හේ මෙසස්නෙන් දුරු මැ වෙයි.

මෙසේ වදළ කල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: වහන්ස, මෙහි ලා මම නටුයෙමි වෙමි. වහන්ස, "මම සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ සමුදයයත් අස්ථගමයත් ආදීනවයත් නිස්සරණයත් තතු සේ නො දනිමි"යි.

තං කිම්මඤ්ඤසි භික්ඛු, චක්ඛුං "නෙතං මම නෙසො'හමස්මි න මෙසො අත්තා"ති සමනුපස්සසීති? එවං භන්තෙ. සාධු භික්ඛු, එත්ථ ච තෙ භික්ඛු චක්ඛුං "නෙතං මම නෙසො හමස්මි න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨං භවිස්සති, එවන්තෙ එතං පඨමං ඵස්සායතනං පහීනං භවිස්සති ආයතිං[1] අපුනබ්භවාය -පෙ-

ජිව්හං "නෙතං මම නෙසො'හමස්මි න මෙසො අත්තා"ති සමනුපස්සසීති? එවං භන්තෙ. සාධු භික්ඛු, එත්ථ ච තෙ භික්ඛු, ජිව්හා "නෙතං මම නෙසො'හමස්මි න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨා භවිස්සති, එවන්තෙ එතං චතුත්ථං ඵස්සායතනං පහීනං භවිස්සති ආයතිං[1] අපුනබ්භවාය -පෙ-

මනං "නෙතං මම නෙසො'හමස්මි න මෙසො අත්තා"ති සමනුපස්සසීති? එවං භන්තෙ. සාධු භික්ඛු, එත්ථ ච තෙ භික්ඛු මනො[2] "නෙතං මම නෙසො'හමස්මි න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨො භවිස්සති, එවන්තෙ එතං ඡට්ඨං ඵස්සායතනං පහීනං භවිස්සති ආයතිං[1] අපුනබ්භවායාති.

## 1. 7. 11

## තතිය ඡඵස්සායතනසුත්තං

73. යො හි කොචි භික්ඛවෙ, භික්ඛු ඡන්නං ඵස්සායතනානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං නප්පජානාති, අවුසිතං තෙන බ්‍රහ්මචරියං ආරකාව සො ඉමම්හා ධම්මවිනයාති.

එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු භගවන්තං එතදවොච: එත්ථාහං භන්තෙ, පනස්සසං, අහඤ්හි භන්තෙ ඡන්නං ඵස්සායතනානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං නප්පජානාමීති.

1. ආයති - සිමු.
2. මනං - සිමු.
3. අනස්සසං පනස්සයං - මජසං.

මහණ, ඒ කුමැ, යි හඟිහි ද? ඇස "මෙය මාගේ නො වෙයි, මේ මම නො වෙමි, මේ මාගේ ආත්මය නො වේ ය''යි දක්හි දූ? යි. වහන්ස, එසේ ය. මහණ, මැනවි. මහණ, මෙහි ලා තා විසින් ඇස: "මෙය මාගේ නො වෙයි, මේ මම නො වෙමි, මේ මාගේ ආත්මය නො වේ''යයි මෙසේ මෙය තතු සේ මනා නුවණින් මොනවට දක්නා ලද්දේ වන්නේ ද, මෙසේ තාගේ මේ පළමුවන ස්පර්ශායතනය මතු නූපදනා (නිවන) පිණිස ප්‍රහීණ වූයේ වන්නේ ය ...

දිව මෙය මාගේ නො වෙයි, මේ මම නො වෙමි, මේ මාගේ ආත්මය නො වේ''යයි දක්හි දූ? යි. වහන්ස, එසේය. මහණ, මැනවි. මහණ, මෙහි ලා තා විසින් දිව "මෙය මාගේ නො වෙයි, මේ මම නො වෙමි, මේ මාගේ ආත්මය නො වේ'' යි මෙසේ මෙය තතු සේ මනා නුවණින් මැනවින් දක්නා ලද්දේ වන්නේ ද, මෙසේ තාගේ මේ සිවුවැනි ඵස්සායතනය මතු නූපදනා පිණිස ප්‍රහීණ වූයේ වන්නේ ය ...

සිත "මෙය මාගේ නො වෙයි, මේ මම නො වෙමි, මේ මාගේ ආත්මය නො වේ''යයි දක්හි දූ? යි. වහන්ස එසේ ය. මහණ මැනවි. මහණ මෙහි තා විසින් සිත "මෙය මාගේ නො වෙයි, මේ මම නො වෙමි, මේ මාගේ ආත්මය නො වේ''යයි මෙසේ මෙය තතු සේ මනා නුවණින් මැනවින් දක්නා ලද්දේ වන්නේ ය. මෙසේ තාගේ මේ සවැනි ඵස්සායතනය මත්තෙහි නූපදනා පිණිස ප්‍රහීණ වූයේ වන්නේ යි.

## 1. 7. 11

## තතිය ඡඵස්සායතන සූත්‍රය

73. මහණෙනි, යම් කිසි මහණෙක් සවැදෑරුම් ඵස්සායතන යන්ගේ සමුදයත් අත්ථගමයත් අස්සාදයත් ආදීනවයත් නිස්සරණයත් තතු සේ නො දනී ද, ඔහු විසින් බඹසර නො වසන ලදි. හේ මෙසස්නෙන් බැහැර වූයේ ම වෙයි.

මෙසේ වදළ කල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: වහන්ස, "මෙහි ලා මම දූඩි සේ නටුයෙමි වෙමි. වහන්ස, මම සවැදෑරුම් ඵස්සායතනයන්ගේ සමුදයත් අත්ථගමයත් අස්සාදයත් ආදීනවයත් නිස්සරණයත් තතු සේ නො දනිමි''යි.

තං කිම්මඤ්ඤසි භික්ඛු, "චක්ඛුං නිච්චං වා අනිච්චං වා"ති. අනිච්චං භන්තෙ. යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති. දුක්ඛං භන්තෙ, යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං "එතං මම එසො'හමස්මි එසො මෙ අත්තා"ති. නො හෙතං භන්තෙ -පෙ-

ජිව්හා "නිච්චා වා අනිච්චා වා"ති. අනිච්චා භන්තෙ. -පෙ- මනො නිච්චො වා අනිච්චො වාති. අනිච්චො භන්තෙ. යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති. දුක්ඛං භන්තෙ. යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං "එතං මම එසො'හමස්මි එසො මෙ අත්තා"ති. නො හෙතං භන්තෙ,

එවං පස්සං භික්ඛු සුතවා අරියසාවකො චක්ඛුස්මිම්පි නිබ්බින්දති, සොතස්මිම්පි නිබ්බින්දති, ඝානස්මිම්පි නිබ්බින්දති, ජිව්හායපි නිබ්බින්දති කායස්මිම්පි නිබ්බින්දති මනස්මිම්පි නිබ්බින්දති.

නිබ්බින්දං විරජ්ජති විරාගා විමුච්චති විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති, ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

මිගජාලවග්ගො සත්තමො.

තස්සුද්දානං:

මිගජාලෙන ද්වෙ වුත්තා චන්නාරො ච සමිද්ධිනා
උපසෙනො උපවාණො ච ඡඵස්සායතනිකා තයො.

මහණෙ, ඒ කිමැ යි හඟිහි ද? ඇස නිත්‍ය වේ ද? නො හොත් අනිත්‍ය හෝ වේ ද? වහන්ස, අනිත්‍ය ය. යමක් අනිත්‍ය නම් එය දුක් වේ ද? නොහොත් සුව හෝ වේ ද යි. වහන්ස, දුක් ය. යමක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වනසුලු නම් "මෙය මාගේ ය, මේ මම වෙමි, මේ මාගේ ආත්ම ය"යි දක්නට නිසි වේ ද? යි. වහන්ස, මෙය නො වේ ම ය. ...

දිව නිත්‍ය වේ ද? නොහොත් අනිත්‍ය හෝ වේ ද යි. වහන්ස, අනිත්‍ය ය. ... සිත නිත්‍ය වේ ද? නොහොත් අනිත්‍ය හෝ වේ ද යි. වහන්ස, අනිත්‍ය ය. යමක් අනිත්‍ය නම් එය දුක් වේ ද? නොහොත් සුව හෝ වේ ද යි. වහන්ස, දුක් ය. යමක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වනසුලු නම් "මෙය මාගේ ය, මේ මම වෙමි, මේ මාගේ ආත්මය"යි දක්නට නිසි වේ ද? යි. වහන්ස, මෙය නො වේ ම ය.

මහණෙ, මෙසේ දක්නාසුලු ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවක ඇසෙහි ද කලකිරෙයි. කනෙහි ද කලකිරෙයි. නැහැයෙහි ද කලකිරෙයි. දිවෙහි ද කලකිරෙයි. කයෙහි ද කලකිරෙයි. සිතෙහි ද කලකිරෙයි.

කලකිරෙනුයේ නො ඇලෙයි. නො ඇලුම් හෙයින් මිදෙයි. මිදුණු කල්හි මිදුනේ යයි දැනීම වෙයි. ජාතිය ක්‍ෂය වූවා ය. බඹසර විසු නිමවන ලදි. රහත් බව පිණිස කළ යුතු දැ කරන ලදි. මේ (රහත්) බව පිණිස (කළයුතු) අනෙකක් නැතැ යි දැනගනී යි.

**සත්වැනි මිගජාලවර්ග යි.**

**එහි සූත්‍රනාමාවලිය :**

මිගජාල නමින් දෙකෙක් ද සමිද්ධි නමින් සතරෙක් ද උපසෙන උපවාණ යයි දෙකෙක් ද ඵස්සායතනික සූත්‍ර තුනෙක් ද කියන ලදහ.

## 8. ගිලානවග්ගො

## 1. 8. 1

## ගිලානසුත්තං

74. සාවත්ථියං —

අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසංකමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච:

අමුකස්මිං[1] භන්තෙ, විහාරෙ අඤ්ඤතරො භික්ඛු නවො අප්පඤ්ඤාතො ආබාධිකො දුක්ඛිතො බාළ්හගිලානො, සාධු භන්තෙ, භගවා යෙන සො භික්ඛු තෙනුපසඞ්කමතු අනුකම්පං උපාදායාති.

අථ ඛො භගවා නවවාදඤ්ච සුත්වා ගිලානවාදඤ්ච[2] අප්පඤ්ඤාතො භික්ඛූති ඉති විදිත්වා යෙන සො භික්ඛු තෙනුපසඞ්කමි. අද්දසා ඛො සො භික්ඛු භගවන්තං දූරතොව ආගච්ඡන්තං, දිස්වාන මඤ්චකෙ සමඤ්චොසි. අථඛො භගවා තං භික්ඛුං එතදවොච: අලං භික්ඛු මා ත්වං මඤ්චකෙ සමඤ්චොසි. සන්තිමානි ආසනානි පඤ්ඤත්තානි. තත්ථාහං නිසීදිස්සාමීති. නිසීදි භගවා පඤ්ඤත්තෙ ආසනෙ. නිසජ්ජ ඛො භගවා තං භික්ඛුං එතදවොච:

කච්චි තෙ භික්ඛු ඛමනීයං, කච්චි යාපනීයං, කච්චි දුක්ඛා වෙදනා පටික්කමන්ති නො අභික්කමන්ති, පටික්කමොසානං පඤ්ඤායති නො අභික්කමොති?

න මෙ භන්තෙ ඛමනීයං, න යාපනීයං, බාළ්හා මෙ දුක්ඛා වෙදනා අභික්කමන්ති නො පටික්කමන්ති, අභික්කමොසානං පඤ්ඤායති නො පටික්කමොති.

කච්චි තෙ භික්ඛු න කිඤ්චි කුක්කුච්චං, න කොචි විප්පටි-සාරොති? තග්ඝ මෙ භන්තෙ, අනප්පකං කුක්කුච්චං අනප්පකො විප්පටිසාරොති.

කච්චි පන ත්වං භික්ඛු අත්තා සීලතො න උපවදතීති, න ඛො මෙ භන්තෙ අත්තා සීලතො උපවදතීති.

1. අමොකස්මිං සී.මු.
2. ගිලානවාදඤ්ච සුත්වා - සී 2.

# 8. ගිලාන වර්ගය

## 1. 8. 1

## ගිලාන සූත්‍රය

**74. සැවැත් නුවර**

එකල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය:

වහන්ස, "අසෝ වෙහෙරෙහි අප්‍රසිද්ධ වූ එක්තරා නවක මහණෙක් හටගත් රෝග ඇති ව දුකට පැමිණ දැඩිගිලන් ව වෙසෙයි. වහන්ස, අයදිමි, භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා කොට ඒ මහණ වෙත එළඹෙන සේක්වා" යි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ නවකයෙක යන වචනයත් ගිලනෙක යන වචනයත් අසා නාඳුනන මහණෙකැයි මෙසේ දැන ඒ මහණ වෙත එළඹි සේක. ඒ මහණ එළඹෙන භාග්‍යවතුන් වහන්සේ දුර දීම දුක්කේ ය. දැක ඇඳෙන් නැඟිටිනා අයුරක් දැක්වී. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඒ මහණහට මෙය වදාළ සේක: මහණ "කම් නැත. තෙපි ඇඳෙන් නැගිටිනා අයුරක් නහමක් කරහු. පනවන ලද මේ අසුන් ඇත. එහි මම හිඳින්නෙමි"යි. භාග්‍යවතුන් වහන්සේ පනවන ලද අස්නෙහි වැඩහුන් සේක. භාග්‍යවතුන් වහන්සේ වැඩහිඳ ඒ මහණහට මෙය වදාළ සේක:

මහණ තට කිම ඉවසිය හැකි ද? කිම යැපිය හැකි ද? දුක්ඛ වේදනාවෝ කිම අඩු වෙද්ද? වැඩි නොවෙද්ද? මේ වේදනාවන්ගේ අඩුවීමෙක් මිස වැඩිවීමෙක් නො පැ නේ ද යි.

වහන්ස, මට නොඉවසිය හැකි ය. නොයැපිය හැකි ය. මාගේ දැඩි දුක්ඛ වේදනාවෝ වැඩිවෙත්. නොඅඩුවෙත්. මොවුන්ගේ වැඩිවීම මිස අඩුවීමෙක් නො පැනේ යි.

මහණ, "තට කිසියම් කුකුසෙක් නො වේ ද? කිසියම් විපිළිසරෙක් නො වේ ද? යි. වහන්ස, මට ඒකාන්තයෙන් මහත් කුකුසෙක් වේ. මහත් විපිළිසරෙක් වේ.

මහණ, කිම තෙමේ තට ශීලයෙන් උපවාද නො කෙරේ ද යි. වහන්ස, මට තෙමේ ශීලයෙන් උපවාද නො කෙරේ මැයි.

නො චෙ කිර ත්වං භික්ඛු අත්තා සීලතො උපවදති, අථ-කිස්මිඤ්ච තෙ කුක්කුච්චං? කො ච විප්පටිසාරොති? න ඛො අහං භන්තෙ, සීලවිසුද්ධත්ථං භගවතා ධම්මං දෙසිතං ආජානාමීති.

නො චෙ කිර ත්වං භික්ඛු සීලවිසුද්ධත්ථං මයා ධම්මං දෙසිතං ආජානාසි, අථ කිමත්ථං චරහි ත්වං භික්ඛු මයා ධම්මං දෙසිතං ආජානාසීති? රාගවිරාගත්ථඤ්ච ඛ්වාහං භන්තෙ භගවතා ධම්මං දෙසිතං ආජානාමීති.

සාධු සාධු භික්ඛු, සාධු ඛො ත්වං භික්ඛු රාගවිරාගත්ථං මයා ධම්මං දෙසිතං ආජානාසි, රාගවිරාගත්ථො හි භික්ඛු මයා ධම්මො දෙසිතො.

තං කිම්මඤ්ඤසි භික්ඛු චක්ඛුං ‘‘නිච්චං වා අනිච්චං වා’’ති? අනිච්චං භන්තෙ. යං පනානිච්චං ‘‘දුක්ඛං වා තං සුඛං වාති? දුක්ඛං භන්තෙ. යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං එතං මම, එසො‘හමස්මි, එසො මෙ අත්තාති? නො හෙතං භන්තෙ -පෙ- ජිව්හා නිච්චා වා අනිච්චාවා ති? අනිච්චා භන්තෙ -පෙ- මනො නිච්චො වා අනිච්චො වාති? අනිච්චො භන්තෙ. යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? දුක්ඛං භන්තෙ. යං පනානිච්චං දුක්ඛං විපරිණාම ධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තාති? නො හෙතං භන්තෙ,

එවං පස්සං භික්ඛු සුතවා අරියසාවකො චක්ඛුස්මිම්පි නිබ්බින්දති සොතස්මිම්පි නිබ්බින්දති ඝානස්මිම්පි නිබ්බින්දති ජිව්හායපි නිබ්බින්දති කායස්මිම්පි නිබ්බින්දති මනස්මිම්පි නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති, විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති, ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං. කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

ඉදමවොච භගවා. අත්තමනො සො භික්ඛු භගවතො භාසිතං අභිනන්දි. ඉමස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ තස්ස භික්ඛුනො විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි ‘‘යං කිඤ්චි සමුදයධම්මං සබ්බන්තං නිරොධධම්මන්ති.

මහණ, ඉදින් තට තෙමේ ශීලයෙන් උපවාද නො කෙරේ නම් එකල්හි තාගේ කුකුස කොහි ද විපිළිසර කිමෙක් දැ යි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් ශීලවිශුද්ධිය පිණිස දහම් දෙසන ලදැ යි නො ම දනිමි යි.

මහණ, ඉදින් තෙපි ශීලවිශුද්ධිය පිණිස මා විසින් දහම් දෙසන ලදැ යි නො ම දනිහු නම් එකල්හි කුමක් පිණිස මා විසින් දහම් දෙසන ලදැ යි දනිහු දැ යි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් රාගවිරාගය පිණිස දහම් දෙසන ලදැ යි මම දනිමි යි.

මහණ, මැනවි මැනවි. මහණ තෙපි රාගවිරාගය පිණිස මා විසින් දහම් දෙසන ලදැ යි දනිවු. මැනවි. මහණ මා විසින් දහම් දෙසන ලද්දේ රාගවිරාගය පිණිස මැ යි.

මහණ, ඒ කිමැ යි හඟිහි ද? ඇස නිත්‍ය ද නොහොත් අනිත්‍ය දැ යි. වහන්ස, අනිත්‍ය ය. යමක් අනිත්‍ය නම් එය දුක් ද නැතහොත් සුව දැ යි. වහන්ස. දුක් ය. යමක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වනසුලු නම්: ''මෙය මාගේ ය, මේ මම වෙමි, මේ මාගේ ආත්ම ය''යි දක්නට සුදුසු දැ යි. වහන්ස මෙය නො වේ ම ය.... දිව නිත්‍ය ද, නැතහොත් අනිත්‍ය දැ යි. වහන්ස, අනිත්‍ය ය ... සිත නිත්‍ය ද, නැතහොත් අනිත්‍ය දැ යි. වහන්ස, අනිත්‍ය ය. යමක් අනිත්‍ය නම් එය දුක් ද, නැතහොත් සුව දැ යි. වහන්ස, දුක් ය. යමක් අනිත්‍ය නම් දුක් නම් පෙරලෙනසුලු නම් ''මෙය මාගේ ය, මේ මම වෙමි. මේ මාගේ ආත්ම ය'' යි එය දක්නට සුදුසු දැ යි. වහන්ස, නො වේම ය.

මහණ, මෙසේ දක්නා ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ ඇසෙහි දු කලකිරෙයි. කනෙහි දු කලකිරෙයි. නැහැයෙහි දු කලකිරෙයි. දිවෙහි දු කලකිරෙයි. කයෙහි දු කලකිරෙයි. සිතෙහි දු කලකිරෙයි. කලකිරෙනුයේ නො ඇලෙයි. නොඇලුම් හෙයින් මිදෙයි. මිදුණුකල්හි මිදුනේ යයි දැනීම වෙයි. ජාතිය ක්ෂීණ විය. මගබඹසර වැස නිමවන ලදි. කටයුතු දැ කරන ලදි. මේ (රහත්) බව පිණිස අනෙකක් නැතැ යි දැනගනියි.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සතුටු සිතැති ඒ මහණ භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව පිළිගත්තේ ය. මේ අගාථක සූත්‍රය දෙසනු ලබන කල්හි ඒ මහණහට ''යමක් හටගැනීම ස්වභාව කොට ඇත්තේ නම් ඒ සියල්ල නැසෙන සුලුය'' යි පහ වූ රජස් (කෙලෙස්) ඇති පහ වූ (කෙලෙස්) මල ඇති දහම් ඇස පහළ වූයේ යි.

## 1. 8. 2

## දුතියගිලානසුත්තං

75. අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: අමුකස්මිං භන්තෙ විහාරෙ අඤ්ඤතරො භික්ඛු නවො අප්පඤ්ඤාතො ආබාධිකො දුක්ඛිතො බාළ්හගිලානො, සාධු භන්තෙ, භගවා යෙන සො භික්ඛු තෙනුපසඞ්කමතු අනුකම්පං උපාදායාති.

අථ ඛො භගවා නවවාදඤ්ච සුත්වා ගිලානවාදඤ්ච අප්පඤ්ඤාතො භික්ඛූති ඉති විදිත්වා යෙන සො භික්ඛු තෙනුපසඞ්කමි. අද්දසා ඛො සො භික්ඛු භගවන්තං දූරතොව ආගච්ඡන්තං, දිස්වාන මඤ්චකෙ සමධොසි, අථ ඛො භගවා තං භික්ඛුං එතදවොච "අලං භික්ඛු මා ත්වං මඤ්චකෙ සමධොසි, සන්තිමානි ආසනානි පඤ්ඤත්තානි, තත්ථාහං නිසීදිස්සාමීති. නිසීදි භගවා පඤ්ඤත්තෙ ආසනෙ. නිසජ්ජ ඛො භගවා තං භික්ඛුං එතදවොච,

කච්චි තෙ භික්ඛු ඛමනීයං, කච්චි යාපනීයං කච්චි දුක්ඛා වෙදනා, පටික්කමන්ති නො අභික්කමන්ති පටික්කමොසානං පඤ්ඤායති නො අභික්කමොති?

න මෙ භන්තෙ, ඛමනීයං, න යාපනීයං, බාළ්හා මෙ දුක්ඛා වෙදනා අභික්කමන්ති නො පටික්කමන්ති, අභික්කමොසානං පඤ්ඤායති නො පටික්කමොති.

කච්චි තෙ භික්ඛු න කිඤ්චි කුක්කුච්චං, න කොචි විප්පටිසාරොති. තග්ඝ මෙ භන්තෙ, අනප්පකං කුක්කුච්චං, අනප්පකො විප්පටිසාරොති.

කච්චි පන ත්වං භික්ඛු අත්තා සීලතො න උපවදතීති. න ඛො මෙ භන්තෙ අත්තා සීලතො උපවදතීති.

නො චෙ කිර ත්වං භික්ඛු අත්තා සීලතො උපවදති, අථ කිස්මිඤ්ච තෙ කුක්කුච්චං, කො ච විප්පටිසාරොති. න ඛ්වාහං භන්තෙ සීලවිසුද්ධත්ථං භගවතා ධම්මං දෙසිතං ආජානාමීති.

නො චෙ කිර ත්වං භික්ඛු සීලවිසුද්ධත්ථං මයා ධම්මං දෙසිතං ආජානාසි, අථ කිමත්ථං චරහි ත්වං භික්ඛු මයා ධම්මං දෙසිතං ආජානාසීති. අනුපාද පරිනිබ්බානත්ථං ඛ්වාහං භන්තෙ භගවතා ධම්මං දෙසිතං ආජානාමීති.

සාධු සාධු භික්ඛු, සාධු ඛො පන ත්වං භික්ඛු අනුපාදපරිනිබ්බානත්ථාය මයා ධම්මං දෙසිතං ආජානාසි, අනුපාද පරිනිබ්බානත්ථො හි භික්ඛු මයා ධම්මො දෙසිතො.

## 1. 8. 2

## දුතිය ගිලාන සූත්‍රය

75. එකල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. ... එකත්පසෙක හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: වහන්ස, අසෝ වෙහෙරෙහි එක්තරා අප්‍රසිද්ධ නවක මහණෙක් වැළඳුණු ලෙඩ ඇති ව දුකට පැමිණ දැඩි ගිලන් ව වෙසෙයි. අයදිමි වහන්ස, භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා කොට ඒ මහණහු වෙත එළඹෙන සේක්වා යි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ නවකයෙක යන කතාවත් ගිලනෙක යන කතාවත් අසා නාඳුනන මහණෙකැ යි මෙසේ දැන ඒ මහණ වෙත එළඹි සේක. ඒ මහණ තෙමේ එළඹෙන භාග්‍යවතුන් වහන්සේ දුර දී ම දුටුයේ ය. දැක ඇඳෙන් නැගිටිනා අයුරක් දැක්විය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඒ මහණට මෙය වදාළ සේක: මහණ, "කම් නැති, තෙපි ඇඳෙන් නැගිටින අයුරක් නහමක් කරහු පනවන ලද මේ අසුන් ඇත. එහි මම හිඳගන්නෙමි" යි. භාග්‍යවතුන් වහන්සේ පනවන ලද අස්නෙහි වැඩහුන් සේක. භාග්‍යවතුන් වහන්සේ වැඩහිඳ ඒ මහණහට මෙය වදාළ සේක:

මහණ "තට ඉවසිය හැකි ද යැපිය හැකි ද කිම දුක් වේදනාවෝ අඩුවෙත් ද වැඩි නොවෙද් ද වේදනාවන්ගේ අඩුවීමෙක් මිස වැඩිවීමෙක් නො පැනේ දැ" යි.

වහන්ස, මට නොඉවසිය හැකි ය. නොයැපිය හැකි ය. මාගේ දැඩි දුක් වේදනාවෝ වැඩිවෙත්. නො අඩු වෙත්. ඔවුන්ගේ වැඩිවීමෙක් මිස අඩුවීමෙක් නො පැනේ යි.

මහණ, කිම තට කිසියම් කුකුසෙක් නො වේ ද කිසියම් විපිළිසරෙක් නො වේ දැ යි. වහන්ස, මට ඒකාන්තයෙන් මහත් කුකුසෙක් වේ. මහත් විපිළිසරෙක් වේ යි.

මහණ, කිම තට තෙමේ ශීලයෙන් උපවාද කෙරේ දැ යි. වහන්ස, මට තෙමේ ශීලයෙන් නහමක් උපවාද කෙරේ යි.

මහණ ඉදින් තට තෙමේ ශීලයෙන් උපවාද නොකෙරේ නම් එකල්හි තාගේ කුකුස කොහි ද තාගේ විපිළිසර කිමෙක් දැ යි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් ශීලවිශුද්ධිය පිණිස දහම් දෙසන ලදැ යි මම නො ම දනිමියි.

මහණ, ඉදින් තෙපි මා විසින් ශීලවිශුද්ධිය පිණිස දහම් දෙසන ලදැ යි නොදනිවු නම්, මහණ තෙපි එසේ ඇති කල්හි මා විසින් කුමක් පිණිස දහම් දෙසන ලදැ යි දනිවු දැ යි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් අනුපාදපරිනිර්වාණය පිණිස දහම් දෙසන ලදැයි මම දනිමි යි.

මහණ මැනවි මැනවි. මහණ තෙපි මා විසින් අනුපාදපරිනිර්වාණය පිණිස දහම් දෙසන ලදැ යි දනිහු යනු මනාමය. මහණ මා විසින් උපාදානය නො කොට පිරිනිවීම පිණිස ම දහම් දෙසන ලදි.

තං කිං මඤ්ඤසි ත්වං භික්ඛු චක්ඛුං නිච්චං වා අනිච්චං වාති. අනිච්චං භන්තෙ. යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති. දුක්ඛං භන්තෙ. යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලං නු තං සමනුපස්සිතුං "එතං මම, එසො හමස්මි, එසො මෙ අත්තා"ති. නොහෙතං භන්තෙ. රූපා නිච්චා වා අනිච්චා වාති. අනිච්චා භන්තෙ -පෙ- චක්ඛු විඤ්ඤාණං -පෙ- චක්ඛුසම්ඵස්සො -පෙ- යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි -පෙ- යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තම්පි නිච්චං වා අනිච්චං වාති. අනිච්චං භන්තෙ. යම්පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති. දුක්ඛං භන්තෙ. යම්පනා නිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලං නු තං සමනුපස්සිතුං. "එතං මම, එසො 'හමස්මි, එසො මෙ අත්තා"ති. නොහෙතං භන්තෙ.

එවං පස්සං භික්ඛු සුතවා අරියසාවකො චක්ඛුස්මිම්පි නිබ්බින්දති, රූපෙසුපි නිබ්බින්දති, චක්ඛුවිඤ්ඤාණෙපි නිබ්බින්දති, චක්ඛුසම්ඵස්සෙපි නිබ්බින්දති, යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තස්මිම්පි නිබ්බින්දති -පෙ- යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තස්මිම්පි නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති, විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති, ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

ඉදමවොච භගවා. අත්තමනො සො භික්ඛු භගවතො භාසිතං අභිනන්දි. ඉමස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ තස්ස භික්ඛුස්ස අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චීති.

## 1. 8. 3

## අනිච්චසුත්තං

76. අථ ඛො ආයස්මා රාධො යෙන භගවා තෙනුපසංකමි -පෙ- එකමන්තං නිසින්නො ඛො ආයස්මා රාධො භගවන්තං එතදවොච: සාධු මෙ භන්තෙ, භගවා සංඛිත්තෙන ධම්මං දෙසෙතු, යමහං භගවතො ධම්මං සුත්වා එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරෙය්‍යන්ති.

මහණ, තෙපි ඒ කිමැ යි හඟිහු ද? ඇස නිත්‍ය ද නැතහොත් අනිත්‍ය දැ යි. වහන්ස, අනිත්‍ය ය. යමක් අනිත්‍ය නම් එය දුක් වේද නැතහොත් සුව වේ දැයි. වහන්ස, දුක් ය. යමක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වනසුලු නම් එය "මෙය මාගේ ය, මේ මම වෙමි, මේ මාගේ ආත්ම ය"යි දක්නට සුදුසු දැ යි. වහන්ස, මෙය නො වේ ම ය. රූ නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ දැයි. වහන්ස, අනිත්‍ය ය ... චක්ඛුවිඤ්ඤාණය ... ඇස් පහස ... ඇස්පහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් එ ද ... මනපහස නිසා දුක් වූ හෝ සුව වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් එ ද නිත්‍ය ද නැතහොත් අනිත්‍ය ද? වහන්ස, අනිත්‍ය ය. යමක් අනිත්‍ය නම් එය දුක් ද නැතහොත් සුව දැ යි. වහන්ස, දුක් ය. යමක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වනසුලු නම් එය "මෙය මාගේ ය, මේ මම වෙමි. මේ මාගේ ආත්ම ය"යි දක්නට සුදුසු දැ යි. වහන්ස, මෙය නො වේ ම ය.

මහණ මෙසේ දක්නාසුලු ශ්‍රැතවත් ආය්‍ර්‍යශ්‍රාවක ඇසෙහි දු කලකිරේ, රූහි දු කලකිරේ, චක්ඛුවිඤ්ඤාණයෙහි දු කලකිරේ, ඇස්-පහස්හි දු කලකිරේ. ඇස්පහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් එහි දු කලකිරේ. ... මනපහස නිසා සුව වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් එහි දු කලකිරෙයි. කලකිරෙනුයේ නො ඇලෙයි. නොඇලුම් හෙයින් මිදෙයි. මිදුණු කල්හි මිදුනේ යයි දැනීම වෙයි. ජාතිය ක්ෂීණ විය. බඹසර වැස නිමවන ලදි. කටයුතු කරන ලදි. මේ (රහත්) බව පිණිස අනෙකක් නැතැ යි දැනගනී යි.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සතුටුසිතැති ඒ මහණ භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව පිළිගත්තේ ය. මේ අගාථකසූත්‍රය බණනු ලබන කල්හි ඒ මහණහුගේ සිත උපාදන රහිත ව කෙලෙසුන්ගෙන් මිදුනේ යි.

## 1. 8. 3

## අනිච්ච සූත්‍රය

76. එකල්හි ආයුෂ්මත් රාධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ ... එකත්පසෙක හුන් ආයුෂ්මත් රාධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. වහන්ස,අයදිමි "භාග්‍යවතුන් වහන්සේගේ යම් ධර්‍මයක් අසා එකලා ව ගණයා කෙරෙන් වෙන් ව නොපමා ව කෙලෙස් තවන වැර ඇති ව කායජීවිත දෙක්හි නිරපේක්ෂ ව වසන්නෙම් නම් (එබඳු) දහමක් මට සැකෙවින් දෙසන සේක්වා"යි.

යං ඛො රාධ, අනිච්චං තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, කිඤ්ච රාධ, අනිච්චං? චක්ඛුං ඛො රාධ, අනිච්චං, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො. රූපා අනිච්චා, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො; චක්ඛුවිඤ්ඤාණං අනිච්චං, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො; චක්ඛුසම්ඵස්සො අනිච්චො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො; යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චං, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො; -පෙ-

ජිව්හා අනිච්චා, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො: රසා අනිච්චා, -පෙ- ජිව්හාවිඤ්ඤාණං අනිච්චං -පෙ- ජිව්හාසම්ඵස්සො අනිච්චො -පෙ- යම්පිදං ජිව්හාසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චං, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො -පෙ-

මනො අනිච්චො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො; ධම්මා අනිච්චා -පෙ- මනොවිඤ්ඤාණං අනිච්චං -පෙ- මනොසම්ඵස්සො අනිච්චො -පෙ- යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චං, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො. යං ඛො රාධ අනිච්චං, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බොති.

## 1. 8. 4

### දුක්ඛසුත්තං

77. යං ඛො රාධ, දුක්ඛං තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො. කිඤ්ච රාධ දුක්ඛං: චක්ඛුං ඛො රාධ දුක්ඛං, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො. රූපා දුක්ඛා, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො. චක්ඛුවිඤ්ඤාණං දුක්ඛං, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, චක්ඛුසම්ඵස්සො දුක්ඛො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො. යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි දුක්ඛං, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො -පෙ- යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පිදුක්ඛං, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො. යං ඛො රාධ, දුක්ඛං තත්‍ර තෙ ඡන්දො පහාතබ්බොති.

## 1. 8. 5

### අනත්තසුත්තං

78. අථ ඛො ආයස්මා රාධො යෙන භගවා තෙනුපසංකමි -පෙ- "යො ඛො රාධ, අනත්තා තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො. කො ච රාධ, අනත්තා: චක්ඛුං ඛො රාධ අනත්තා, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො. රූපා අනත්තා, තත්‍ර තෙ ඡන්දො, පහාතබ්බො. චක්ඛුවිඤ්ඤාණං අනත්තා, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො. චක්ඛුසම්ඵස්සො අනත්තා, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො.

රාධ, යමක් අනිස නම් එහි තාගේ ඡන්දය (කැමැත්ත) පහකටයුතු ය. රාධ කුමක් අනිස ද යත්: රාධය, ඇස අනිස ය. එහිලා තාගේ ඡන්දය පහකටයුතු ය. රූ අනිස ය. එහිලා තාගේ ඡන්දය පහකට-යුතු ය. චක්ඛුවිඤ්ඤාණය අනිස ය. එහිලා තාගේ ඡන්දය පහකටයුතු ය. ඇස්පහස අනිස ය. එහිලා තාගේ ඡන්දය පහකටයුතු ය. ඇස්පහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් එ ද අනිස ය. එහිලා තාගේ ඡන්දය පහකටයුතු ය.

දිව අනිස ය. එහිලා තාගේ ඡන්දය පහකටයුතු ය. රස අනිස ය ... ජිව්හාවිඤ්ඤාණය අනිස ය. ... දිවිපහස අනිස ය. ... දිවිපහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් එ ද අනිස ය. එහිලා තාගේ ඡන්දය පහකටයුතු ය.

සිත අනිස ය. එහිලා තාගේ ඡන්දය පහකට යුතු ය. දහම් අනිස ය. ... මනොවිඤ්ඤාණය අනිස ය. ... මනපහස අනිස ය. ... මනපහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් එහිලා තාගේ ඡන්දය පහකටයුතු ය. රාධය, යමක් අනිස නම් එහිලා තාගේ ඡන්දය පහකටයුතු යි.

## 1. 8. 4

## දුක්ඛ සූත්‍රය

77. රාධය, යමක් දුක් නම් එහි ලා තාගේ ඡන්දය (කැමැත්ත) පහකළ යුතු ය. රාධය, කුමක් දුක් ද යත්: රාධ, ඇස දුක් ය. එහි ලා තාගේ ඡන්දය පහකළ යුතු ය. රූ දුක් ය. එහි ලා තාගේ ඡන්දය පහකළ යුතු ය. චක්ඛුවිඤ්ඤාණය දුක් ය. එහි ලා තාගේ ඡන්දය පහකළ යුතු ය. ඇස්පහස දුක් ය. එහි ලා තාගේ ඡන්දය පහකළ යුතු ය. ඇස්පහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් එ ද දුක් ය. එහි ලා තාගේ ඡන්දය පහකළ යුතු ය.... මනපහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් එ ද දුක් ය. එහිලා තාගේ ඡන්දය පහකළ යුතු ය. රාධ, යමක් දුක් නම් එහි ලා තාගේ ඡන්දය පහකළ යුතු යි.

## 1. 8. 5

## අනත්ත සූත්‍රය

78. එකල්හි ආයුෂ්මත් රාධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. ... රාධ යමක් අනත් නම් එහි ලා තාගේ ඡන්දය පහකළ යුතු ය. රාධ කුමක් අනත්ද යත්: රාධ, ඇස අනත් ය. එහි ලා තාගේ ඡන්දය පහකළ යුතු ය. රූ අනත් ය. එහි ලා තාගේ ඡන්දය පහකළ යුතු ය. චක්ඛුවිඤ්ඤාණය අනත් ය. එහි ලා තාගේ ඡන්දය පහකළ යුතු ය. ඇස්පහස අනත් ය. එහි ලා තාගේ ඡන්දය පහකළ යුතු ය.

යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනත්තා, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො -පෙ-

ජිව්හා අනත්තා, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො. රසා -පෙ- ජිව්හාවිඤ්ඤාණං -පෙ- ජිව්හාසම්ඵස්සො -පෙ- යම්පිදං ජිව්හාසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තම්පි -පෙ- මනො අනත්තා, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො. ධම්මා -පෙ- මනොවිඤ්ඤාණං -පෙ- මනොසම්ඵස්සො -පෙ- යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තම්පි අනත්තා තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො. යො ඛො රාධ අනත්තා තත්‍ර තෙ ඡන්දො පහාතබ්බොති.

## 1. 8. 6

## අවිජ්ජාසුත්තං

79. අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: අත්ථි නු ඛො භන්තෙ, එකො ධම්මො යස්ස පහාණා භික්ඛුනො අවිජ්ජා පහීයති විජ්ජා උප්පජ්ජතීති. අත්ථි ඛො භික්ඛු එකො ධම්මො යස්ස පහාණා භික්ඛුනො අවිජ්ජා පහීයති විජ්ජා උප්පජ්ජතීති. කතමො පන භන්තෙ, එකො ධම්මො යස්ස පහාණා භික්ඛුනො අවිජ්ජා පහීයති විජ්ජා උප්පජ්ජතීති? අවිජ්ජා ඛො භික්ඛු එකො ධම්මො යස්ස පහාණා භික්ඛුනො අවිජ්ජා පහීයති විජ්ජා උප්පජ්ජතීති.

කථම්පන භන්තෙ, ජානතො කථම්පස්සතො භික්ඛුනො අවිජ්ජා පහීයති විජ්ජා උප්පජ්ජතීති? චක්ඛුං ඛො භික්ඛු අනිච්චතො ජානතො පස්සතො භික්ඛුනො අවිජ්ජා පහීයති, විජ්ජා උප්පජ්ජති. රූපෙ අනිච්චතො ජානතො පස්සතො භික්ඛුනො අවිජ්ජා පහීයති, විජ්ජා උප්පජ්ජති. චක්ඛුවිඤ්ඤාණං අනිච්චතො ජානතො පස්සතො භික්ඛුනො අවිජ්ජා පහීයති විජ්ජා උප්පජ්ජති. චක්ඛුසම්ඵස්සං අනිච්චතො ජානතො පස්සතො භික්ඛුනො අවිජ්ජා පහීයති, විජ්ජා උප්පජ්ජති. යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චතො ජානතො පස්සතො භික්ඛුනො අවිජ්ජා පහීයති විජ්ජා උප්පජ්ජති -පෙ-

ජිව්හං අනිච්චතො ජානතො පස්සතො භික්ඛුනො අවිජ්ජා පහීයති, විජ්ජා උප්පජ්ජති. රසෙ -පෙ- ජිව්හාවිඤ්ඤාණං -පෙ- ජිව්හාසම්ඵස්සං -පෙ- යම්පිදං ජිව්හාසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තම්පි අනිච්චතො ජානතො පස්සතො භික්ඛුනො අවිජ්ජා පහීයති විජ්ජා උප්පජ්ජති -පෙ-

මනං අනිච්චතො ජානතො පස්සතො භික්ඛුනො අවිජ්ජා පහීයති, විජ්ජා උප්පජ්ජති. ධම්මෙ -පෙ- මනොවිඤ්ඤාණං -පෙ- මනොසම්ඵස්සං -පෙ- යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චතො ජානතො පස්සතො භික්ඛුනො අවිජ්ජා පහීයති විජ්ජා උප්පජ්ජති. එවං ඛො භික්ඛු ජානතො එවං පස්සතො භික්ඛුනො අවිජ්ජා පහීයති විජ්ජා උප්පජ්ජතීති.

ඇස්පහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් එ ද අනත් ය. එහි ලා තාගේ ඡන්දය පහකළ යුතු ය.

දිව අනත් ය. එහි ලා තාගේ ඡන්දය පහකළ යුතු ය. රස ... ජිව්හාවිඤ්ඤාණය ... දිව්පහස ... දිව්පහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් එ ද අනත් ය. හෙ ද ... සිත අනත් ය. එහි ලා තාගේ ඡන්දය පහකළ යුතු ය. දහම් ... මනෝවිඤ්ඤාණය ... මනපහස ... මනපහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් එ ද අනත් ය. එහි ලා තාගේ ඡන්දය පහකළ යුතු ය. රාධ, යමක් අනත් නම් එහි ලා තාගේ ඡන්දය පහකළ යුතු යි.

## 1. 8. 6

## අවිජ්ජා සූත්‍රය

79. එකල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. ... එකත්පස් ව හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළේ ය: වහන්ස, යමක් ප්‍රහාණයෙන් මහණහුගේ අවිද්‍යාව ප්‍රහීණ වේ නම් විද්‍යාව උපදී නම් එබඳු එක්දහමෙක් ඇද්ද යි. මහණ, යමක් ප්‍රහාණයෙන් මහණහුගේ අවිද්‍යාව ප්‍රහීණ වේ නම් විද්‍යාව උපදී නම් එබඳු එක් දහමෙක් ඇත් ම ය. වහන්ස, යමක් ප්‍රහාණයෙන් මහණහුගේ අවිද්‍යාව ප්‍රහීණ වේ නම් විද්‍යාව උපදී නම් එබඳු එක්දහම කවරේ ද යි. මහණ, යමක් ප්‍රහාණයෙන් මහණහු ගේ අවිද්‍යාව ප්‍රහීණ වේ නම් විද්‍යාව උපදී නම් එබඳු එක් දහම අවිද්‍යාව ය.

වහන්ස, කෙසේ දන්නා කෙසේ දක්නා මහණහුගේ අවිදු පැහේ ද? විදු උපදී ද? යි. මහණ, ඇස අනිස විසින් දන්නා දක්නා මහණහුගේ අවිදු පැහෙයි. විදු උපදි යි. රූ අනිස විසින් දන්නා දක්නා මහණහුගේ අවිදු පැහෙයි. විදු උපදියි. චක්‍ඛුවිඤ්ඤාණය අනිස විසින් දන්නා දක්නා මහණහුගේ අවිදු පැහෙයි. විදු උපදියි. ඇස්පහස අනිස විසින් දන්නා දක්නා මහණහුගේ අවිදු පැහෙයි. විදු උපදියි. ඇස්පහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් එ ද අනිස විසින් දන්නා දක්නා මහණහුගේ අවිදු පැහෙයි විදු උපදියි ...

දිව අනිස විසින් දන්නා දක්නා මහණහුගේ අවිදු පැහෙයි. විදු උපදියි. රස ... ජිව්හාවිඤ්ඤාණය ... දිව්පහස ... දිව්පහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් හෙ ද අනිස විසින් දන්නා දක්නා මහණහුගේ අවිදු පහවෙයි. විදු උපදියි. ...

සිත අනිස විසින් දන්නා දක්නා මහණහුගේ අවිදු පැහෙයි විදු උපදියි. දහම් ... මනෝවිඤ්ඤාණය ... මනපහස ... මනපහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් එ ද අනිස විසින් දන්නා දක්නා මහණහුගේ අවිදු පැහෙයි. විදු උපදී. මහණ, මෙසේ දන්නා මෙසේ දක්නා මහණහුගේ අවිදු පැහෙයි විදු උපදි යි.

## 1. 8. 7

## දුතිය අවිජ්ජාසුත්තං

80. අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: අත්ථි නු ඛො භන්තෙ, එකො ධම්මො යස්ස පහාණා භික්ඛුනො අවිජ්ජා පහීයති විජ්ජා උප්පජ්ජතීති. අත්ථි ඛො භික්ඛු එකො ධම්මො යස්ස පහාණා භික්ඛුනො අවිජ්ජා පහීයති විජ්ජා උප්පජ්ජතීති. කතමො පන භන්තෙ, එකො ධම්මො යස්ස පහාණා භික්ඛුනො අවිජ්ජා පහීයති විජ්ජා උප්පජ්ජතීති. අවිජ්ජා ඛො භික්ඛු එකො ධම්මො යස්ස පහාණා භික්ඛුනො අවිජ්ජා පහීයති විජ්ජා උප්පජ්ජතීති.

කථම්පන භන්තෙ, ජානතො කථං පස්සතො භික්ඛුනො අවිජ්ජා පහීයති විජ්ජා උප්පජ්ජතීති? ඉධ භික්ඛු, භික්ඛුනො සුතං හොති සබ්බෙ ධම්මා නාලං අභිනිවෙසායාති, එවඤ්චෙතං භික්ඛු, භික්ඛුනො සුතං හොති සබ්බෙ ධම්මා නාලං අභිනිවෙසායාති; සො සබ්බං ධම්මං[1] අභිජානාති, සබ්බං ධම්මං අභිඤ්ඤාය සබ්බං ධම්මං පරිජානාති සබ්බං ධම්මං පරිඤ්ඤාය සබ්බනිමිත්තානි අඤ්ඤතො පස්සති, චක්ඛුං අඤ්ඤතො පස්සති, රූපෙ අඤ්ඤතො පස්සති, චක්ඛුවිඤ්ඤාණං අඤ්ඤතො පස්සති, චක්ඛුසම්ඵස්සං අඤ්ඤතො පස්සති, යම්පිදං චක්ඛු-සම්ඵස්සපච්චයා උප්පජ්ජති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අඤ්ඤතො පස්සති -පෙ-

යම්පිදං මනො සම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තම්පි අඤ්ඤතො පස්සති. එවං ඛො භික්ඛු ජානතො එවං පස්සතො භික්ඛුනො අවිජ්ජා පහීයති විජ්ජා උප්පජ්ජතීති.

## 1. 8. 8

## සම්බහුලභික්ඛුසුත්තං

81. අථ ඛො සම්බහුලා භික්ඛූ යෙන භගවා තෙනුපසංකමිංසු -පෙ- එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: ඉධ නො භන්තෙ, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා අම්හෙ එවං පුච්ඡන්ති: කිමත්ථියං ආවුසො සමණෙ ගොතමෙ බ්‍රහ්මචරියං වුස්සතීති? එවං පුට්ඨා මයං භන්තෙ, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං බ්‍යාකරොම: දුක්ඛස්ස ඛො ආවුසො පරිඤ්ඤත්ථං භගවති බ්‍රහ්මචරියං වුස්සතීති. කච්චි මයං භන්තෙ, එවං පුට්ඨා එවං බ්‍යාකරමානා වුත්ත-වාදිනො චෙව භගවතො හොම න ච භගවන්තං අභූතෙන අබ්භා-චික්ඛාම, ධම්මස්ස චානුධම්මං ව්‍යාකරොම, න ච කොචි සහධම්මිකො වාදානුවාදො ගාරය්හං ඨානං ආගච්ඡතීති.

1. සබ්බධම්මං - සී 2

## 1. 8. 7

## දුතිය අවිජ්ජා සූත්‍රය

80. එකල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. ... එකත්පස් ව හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළේ ය: වහන්ස, යමක් ප්‍රහාණයෙන් මහණහුගේ අවිද්‍යාව ප්‍රහීණ වේ ද, විද්‍යාව උපදී ද, එබඳු එක්දහමෙක් ඇද් දැ යි. මහණ, යමක් ප්‍රහාණයෙන් මහණහුගේ අවිද්‍යාව ප්‍රහීණ වේ නම් විද්‍යාව උපදී නම් එබඳු එක්දහමෙක් ඇත් මැ යි. වහන්ස, යමක් ප්‍රහාණයෙන් අවිද්‍යාව ප්‍රහීණ වේ නම් විද්‍යාව උපදී නම් එබඳු එක්දහම කවරේ දැ යි. මහණ, යමක් ප්‍රහාණයෙන් අවිද්‍යාව ප්‍රහීණ වේ නම් විද්‍යාව උපදී නම් එබඳු එක් දහම අවිද්‍යාව ය.

වහන්ස, කෙසේ දන්නා කෙසේ දක්නා මහණහුගේ අවිදු පැහේ ද විදු උපදී දැ යි. මහණ, මෙහි මහණහු විසින් සියලු (ත්‍රෛභූමක) ධර්ම (තෘෂ්ණා දෘෂ්ටි වශයෙන්) ගන්නට සුදුසු නො වෙතැයි අසන ලද්දේ වෙයි. මහණ, ඉදින් මහණහු විසින් සියලු (ත්‍රෛභූමක) ධර්ම (තෘෂ්ණාදෘෂ්ටි වශයෙන්) ගන්නට සුදුසු නො වෙතැයි මෙය අසන ලද්දේ වේ නම් හෙතෙමේ සියලු දහම් වෙසෙසින් දනී. සියලු දහම් වෙසෙසින් දැන සියලු දහම් පිරිසිඳ දනී. සියලු දහම් පිරිසිඳ දැන සියලු නිමිති අනත් විසින් දකී. ඇස අනත් විසින් දකී. රූ අනත් විසින් දකී. චක්ඛුවිඤ්ඤාණය අනත් විසින් දකී. ඇස්පහස අනත් විසින් දකී. ඇස්පහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් එ ද අනත් විසින් දකී...

මනපහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් එ ද අනත් විසින් දකී. මහණ, මෙසේ දන්නා මෙසේ දක්නා මහණහු ගේ අවිදු පැහේ. විදු උපදී.

## 1. 8. 8

## සම්බහුලභික්ඛු සූත්‍රය

81. එකල්හි බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ... එකපස් ව හුන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. වහන්ස, මෙහි අන්තොටු පිරිවැජ්ජෝ "ඇවැත්නි, කුමක් පිණිස මහණ ගොයුම්හු කෙරෙහි බඹසර වෙසේ දැ?" යි මෙසේ අප පුළුවුසිති. වහන්ස, එසේ පුළුවුස්නා ලද අපි ඒ අන්තොටු පිරිවැජ්ජනට "ඇවැත්නි, දුක පිරිසිඳ දැනගනු පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර වැසේ ය"යි මෙසේ පවසමු. වහන්ස, කිමෙක් ද? එසේ පුළුවුස්නා ලද අපි මෙඅයුරින් පවසන්නමෝ භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද්දක් කියන්නමෝ වමු ද? භාග්‍යවතුන් වහන්සේට අභූතයෙන් නො ද චෝදනා කෙරෙමු ද? දහමට ද අනුදහමක් පවසමු ද? කරුණු සහිත වූ කිසියම් වාදනුවාදයෙක් ගැරහිය යුතුබවට නො පැමිණේ දැ? යි.

තඤ්ච තුම්හෙ භික්ඛවෙ, එවං පුට්ඨා එවං බ්‍යාකරමානා වුත්තවාදිනො චෙව මෙ හොථ න ච මං අභූතෙන අබ්භාචික්ඛථ, ධම්මස්ස චානුධම්මං ව්‍යාකරොථ, න ච කොචි සහධම්මිකො වාදනුවාදො[1] ගාරය්හං ඨානං ආගච්ඡති, දුක්ඛස්ස හි භික්ඛවෙ, පරිඤ්ඤත්ථං මයි බ්‍රහ්මචරියං වුස්සති. සචෙ වො භික්ඛවෙ, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං පුච්ඡෙය්‍යුං "කතමං පන තං ආවුසො දුක්ඛං යස්ස පරිඤ්ඤාය සමණෙ ගොතමෙ බ්‍රහ්මචරියං වුස්සතී"ති. එවං පුට්ඨා තුම්හෙ භික්ඛවෙ, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං ව්‍යාකරෙය්‍යාථ:

චක්ඛුං ඛො ආවුසො දුක්ඛං තස්ස පරිඤ්ඤාය භගවති බ්‍රහ්මචරියං වුස්සති, රූපා -පෙ- චක්ඛුසම්ඵස්සො දුක්ඛො, තස්ස පරිඤ්ඤාය භගවති බ්‍රහ්මචරියං වුස්සති, යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි දුක්ඛං, තස්ස පරිඤ්ඤාය භගවති බ්‍රහ්මචරියං වුස්සති -පෙ-

ජිව්හා දුක්ඛා, තස්සා පරිඤ්ඤාය භගවති බ්‍රහ්මචරියං වුස්සති, රසා දුක්ඛා, තෙසං පරිඤ්ඤාය -පෙ- ජිව්හාවිඤ්ඤාණං දුක්ඛං -පෙ- ජිව්හාසම්ඵස්සො දුක්ඛො -පෙ- යම්පිදං ජිව්හාසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තම්පි දුක්ඛං, තස්ස පරිඤ්ඤාය භගවති බ්‍රහ්මචරියං වුස්සති -පෙ-

මනො දුක්ඛො, තස්ස පරිඤ්ඤාය භගවති බ්‍රහ්මචරියං වුස්සති, ධම්මා දුක්ඛා, තෙසං පරිඤ්ඤාය -පෙ- මනොවිඤ්ඤාණං දුක්ඛං -පෙ- මනොසම්ඵස්සො දුක්ඛො -පෙ- යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි දුක්ඛං තස්ස පරිඤ්ඤාය භගවති බ්‍රහ්මචරියං වුස්සති. එවං පුට්ඨා තුම්හෙ භික්ඛවෙ, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං ව්‍යාකරෙය්‍යාථාති.

## 1. 8. 9

## ලොකසුත්තං

82. අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච, ලොකො ලොකොති භන්තෙ වුච්චති, කිත්තාවතා නු ඛො භන්තෙ, ලොකොති වුච්චතීති.

---

1. වාදනුපාතො - සී 2.

මහණෙනි, එසේ පුළුවුස්නා ලද තෙපි මෙඅයුරින් පවසන්නහු ඒකාන්තයෙන් මා විසින් කියන ලද්දක් කියන්නෝ වවු. මට අභූතයෙන් නො ද චෝදනා කරවු. දහමට ද අනු දහමක් පවසවු, කරුණු සහිත කිසියම් වාදනුවාදයෙක් ගැරහිය යුතු බවට නො ද පැමිණෙයි. මහණෙනි, දුක පිරිසිඳ දැනීම පිණිස ම මා කෙරෙහි බඹසර වසනු ලැබේ.

මහණෙනි, ඉදින් අන්තොටු පිරිවැජ්ජෝ "ඇවැත්නි, යමක් පිරිසිඳ දැනීම පිණිස මහණ ගොයුම්හු කෙරෙහි බඹසර වසනු ලැබේ නම් ඒ දුක කවරේ දැ" යි මෙසේ තොප පුළුවුස්නාහු නම් මහණෙනි, එසේ පුළුවුස්නා ලද තෙපි ඒ අන්තොටු පිරිවැජ්ජනට මෙඅයුරින් පවසන්නහු ය. ඇවැත්නි, ඇස දුක් ය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර වසනු ලැබෙ යි. රූ ... ඇස්පහස දුක් ය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර වසනු ලැබේ. ඇස්පහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් එ ද දුක් ය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර වසනු ලැබේ.

දිව දුක් ය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර වසනු ලැබේ. රස දුක් ය. එය පිරිසිඳ දැනීම පිණිස ... ජිව්හාවිඤ්ඤාණය දුක් ය ... දිව්පහස දුක් ය. දිව් පහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් එ ද දුක් ය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර වසනු ලැබේ.

සිත දුක් ය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර වසනු ලැබේ. දහම් දුක් ය. එය පිරිසිඳ දැනීම පිණිස ... මනෝවිඤ්ඤාණය දුක් ය ... මනපහස දුක් ය. ... මනපහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් එ ද දුක් ය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර වසනු ලැබේ. මහණෙනි, එසේ පුළුවුස්නා ලද තෙපි ඒ අන්තොටු පිරිවැජ්ජනට මෙඅයුරින් පවසන්නහු ය.

## 1. 8. 9

## ලෝක සූත්‍රය

82. එකල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය ... එකත්පස් ව හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළේ ය. වහන්ස, "ලෝක ය ලෝකය යි කියනු ලැබේ. වහන්ස, කොතෙකින් ලෝකය යි කියනු ලැබේ දැ" යි.

ලුජ්ජතීති ඛො භික්ඛු තස්මා ලොකොති වුච්චති. කිඤ්ච ලුජ්ජති? චක්ඛුං ඛො භික්ඛු ලුජ්ජති, රූපා ලුජ්ජන්ති, චක්ඛුවිඤ්ඤාණං ලුජ්ජති, චක්ඛුසම්ඵස්සො ලුජ්ජති, යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි ලුජ්ජති -පෙ- ලුජ්ජතීති ඛො භික්ඛු තස්මා ලොකොති වුච්චතීති.

## 1. 8. 10

### ඵග්ගුනසුත්තං

83. අථ ඛො ආයස්මා ඵග්ගුනො යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො ආයස්මා ඵග්ගුනො භගවන්තං එතදවොච.

අත්ථි නු ඛො භන්තෙ, තං චක්ඛු[1] යෙන චක්ඛුනා අතීතෙ බුද්ධෙ පරිනිබ්බුතෙ ඡින්නපපඤ්චෙ ඡින්නවටුමෙ පරියාදින්නවට්ටෙ සබ්බදුක්ඛවීතිවත්තෙ පඤ්ඤාපයමානො පඤ්ඤාපෙය්‍ය -පෙ- අත්ථි නු ඛො සා භන්තෙ, ජිව්හා යාය ජිව්හාය අතීතෙ බුද්ධෙ පරිනිබ්බුතෙ -පෙ- අත්ථි නු ඛො සො භන්තෙ, මනො යෙන මනෙන අතීතෙ බුද්ධෙ පරිනිබ්බුතෙ ඡින්නපපඤ්චෙ ඡින්නවටුමෙ පරියාදින්නවට්ටෙ සබ්බදුක්ඛවීතිවත්තෙ පඤ්ඤාපයමානො පඤ්ඤාපෙය්‍යාති.

නත්ථි ඛො තං ඵග්ගුන, චක්ඛුං යෙන චක්ඛුනා අතීතෙ බුද්ධෙ පරිනිබ්බුතෙ ඡින්නපපඤ්චෙ ඡින්නවටුමෙ පරියාදින්නවට්ටෙ සබ්බදුක්ඛවීතිවත්තෙ පඤ්ඤාපයමානො පඤ්ඤාපෙය්‍ය -පෙ- නත්ථි ඛො සා ඵග්ගුන, ජිව්හා යාය ජිව්හාය අතීතෙ බුද්ධෙ පරිනිබ්බුතෙ -පෙ- පඤ්ඤාපෙය්‍ය, නත්ථි ඛො සො ඵග්ගුන, මනො යෙන මනෙන අතීතෙ බුද්ධෙ පරිනිබ්බුතෙ ඡින්නපපඤ්චෙ ඡින්නවටුමෙ පරියාදින්නවට්ටෙ සබ්බදුක්ඛවීතිවත්තෙ පඤ්ඤාපයමානො පඤ්ඤාපෙය්‍යාති.

**ගිලානවග්ගො අට්ඨමො.**

**තස්සුද්දානං**

ගිලානෙන ද්වෙ වුත්තා රාධෙන අපරෙ තයො
අවිජ්ජාය ච ද්වෙ වුත්තා භික්ඛු ලොකො ච ඵග්ගුනො.

---

1. තං භන්තෙ චක්ඛු - සීමු.
භන්තෙ තං චක්ඛු - මජසං.

මහණ, (පලුදු වේ) නැසේ නු යි එහෙයින් ලෝකය යි කියනු ලැබේ. කිමෙක් පලුදු වේ ද යත්: මහණ, ඇස පලුදු වේ. රූ පලුදු වේ. චක්ඛුවිඤ්ඤාණය පලුදු වේ. ඇස්පහස පලුදු වේ. ඇස්පහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් ඒ ද පලුදු වෙයි. ... මහණ, පලුදු වේ නු යි (නැසේ) එහෙයින් ලෝකය යි කියනු ලැබේ යි.

## 1. 8. 10

## එගගුන සූත්‍රය

83. එකල්හි ආයුෂ්මත් එග්ගුණ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ ... එකත්පස් ව හුන් ආයුෂ්මත් එග්ගුන තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ:

වහන්ස, නැසූ තෘෂ්ණා ප්‍රපඤ්ච ඇති නැසූ තෘෂ්ණාමාර්ග ඇති කෙළවර කළ සසරවට ඇති සියලු දුක් ඉක්ම වූ ඉකුත් බුදුවරයන් පිරිනිවි යම් ඇසෙකින් පනවන්නෙක් පනවා නම් එබඳු ඇසෙක් ඇද්ද යි ... වහන්ස, පිරිනිවි ඉකුත් බුදුවරයන් යම් දිවකින් පනවා නම් එබඳු දිවෙක් ඇද්ද යි. ... නැසූ තෘෂ්ණාප්‍රපඤ්ච ඇති නැසූ තෘෂ්ණාමාර්ග ඇති කෙළවර කළ සසරවට ඇති සියලු දුක් ඉක්ම වූ පිරිනිවි ඉකුත් බුදුවරයන් යම් සිතකින් පනවන්නෙක් පනවා නම් එබඳු සිතෙක් ඇද්ද යි.

එග්ගුණ, නැසූ තෘෂ්ණාප්‍රපඤ්ච ඇති නැසූ තෘෂ්ණාමාර්ග ඇති කෙළවර කළ සසරවට ඇති සියලු දුක් ඉක්ම වූ පිරිනිවි ඉකුත් බුදුවරයන් යම් ඇසකින් පනවන්නෙක් පනවා නම් එබඳු ඇසෙක් නැත් ම ය. ... එග්ගුණ, පිරිනිවි ඉකුත් බුදුවරයන් යම් දිවෙකින් පනවා නම් එබඳු දිවෙක් නැත් ම ය. ... එග්ගුණ, නැසූ තෘෂ්ණාප්‍රපඤ්ච ඇති නැසූ තෘෂ්ණාමාර්ග ඇති කෙළවර කළ සසරවට ඇති සියලු දුක් ඉක්ම වූ පිරිනිවි ඉකුත් බුදුවරයන් යම් සිතකින් පනවන්නෙක් පනවා නම් එබඳු සිතෙක් නැත් මැ යි.

**අටවැනි ගිලාන වර්ග යි.**

**එහි සූත්‍රනාමාවලිය :**

ගිලාන නමින් සූත්‍ර දෙකෙක් ද රාධ නමින් අනෙක් තුනෙක් ද කියන ලදහ. අවිජ්ජා නමින් දෙකෙක් ද භික්ඛු ලොක එග්ගුණ යයි සූත්‍ර තුනෙක් ද කියන ලදහ.

# 9. ඡන්නවග්ගො

## 1. 9. 1

### පලොකධම්මසුත්තං

84. **සාවත්ථියං** —

අථ ඛො ආයස්මා **ආනන්දො** යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: ලොකො ලොකොති භන්තෙ වුච්චති, කිත්තාවතා නු ඛො භන්තෙ ලොකොති වුච්චතීති.

යං ඛො ආනන්ද පලොකධම්මං අයං වුච්චති අරියස්ස විනයෙ ලොකො. කිඤ්ච ආනන්ද පලොකධම්මං? චක්ඛුං ඛො ආනන්ද පලොකධම්මං, රූපා පලොකධම්මා, චක්ඛුවිඤ්ඤාණං පලොකධම්මං, චක්ඛුසම්ඵස්සො පලොකධම්මො, යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි පලොකධම්මං -පෙ-

ජිව්හා පලොකධම්මා, රසා පලොකධම්මා, ජිව්හාවිඤ්ඤාණං පලොකධම්මං ජිව්හාසම්ඵස්සො පලොකධම්මො, යම්පිදං ජිව්හාසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තම්පි පලොකධම්මං -පෙ-

මනො පලොකධම්මො, ධම්මා පලොකධම්මා, මනොවිඤ්ඤාණං පලොකධම්මං, මනොසම්ඵස්සො පලොකධම්මො, යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තම්පි පලොකධම්මං, යං ඛො ආනන්ද, පලොකධම්මං අයං වුච්චති අරියස්ස විනයෙ ලොකොති.

## 1. 9. 2

### සුඤ්ඤලොකසුත්තං

85. එකමන්තං නිසින්නො ඛො ආයස්මා **ආනන්දො** භගවන්තං එතදවොච: සුඤ්ඤො ලොකො සුඤ්ඤො ලොකොති භන්තෙ වුච්චති, කිත්තාවතා නුඛො භන්තෙ සුඤ්ඤො ලොකොති වුච්චතීති? යස්මා ච ඛො ආනන්ද, සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා, තස්මා සුඤ්ඤො ලොකොති වුච්චති.

# 9. ඡන්න වර්ගය

## 1. 9. 1

## පලොකධම්ම සූත්‍රය

84. එසඳ ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ ... එකත්පස් වැ හුන් ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙතල කරුණ සැලකළහ: වහන්ස, ලෝක යැ ලෝක යැ යි කියනුලැබෙයි. වහන්ස, කෙතෙකින් ලෝක යැ යි කියනුලැබේ ද යි.

ආනන්දයෙනි, යමෙක් බිඳෙනසැහැවි ඇත් ද, ආයඞ්විනයෙහි මෙ ලෝක යැ යි කියනු ලැබේ. ආනන්දයෙනි, කිමෙක් බිඳෙනසුලු වේ යැ යත්: ආනන්දයෙනි, චක්ෂුස බිඳෙනසුලු යැ රූපයෝ බිඳෙනසුලු යැ චක්ෂුර්විඥානය බිඳෙනසුලු යැ චක්ෂුස්සංස්පර්ශය බිඳෙනසුලු යැ චක්ෂුස්සංස්පර්ශප්‍රත්‍යයෙන් උපදනා සුව වේවයි දුක් වේවයි නොදුක් නොසුව වේවයි යම් වේදයිතයෙක් ඇත් ද එ ද බිඳෙනසුලු යැ ...

ජිහ්වා බිඳෙනසුලු යැ රසයෝ බිඳෙනසුලු යැ ජිහ්වාවිඥානය බිඳෙනසුලු යැ ජිහ්වාසංස්පර්ශය බිඳෙනසුලු යැ ජිහ්වාසංස්පර්ශ ප්‍රත්‍යයෙන් උපදනා සුව වේවයි දුක් වේවයි නොදුක් නොසුව වේවයි යම් වෙදයිතයෙක් ඇද්ද එ ද බිඳෙනසුලු යැ ...

මනස බිඳෙනසුලු යැ ධර්මයෝ බිඳෙනසුලු යැ මනෝවිඥානය බිඳෙනසුලු යැ මනස්සංස්පර්ශය බිඳෙනසුලු යැ මනස්සංස්පර්ශ ප්‍රත්‍යයෙන් උපදනා සුව වේවයි දුක් වේවයි නොදුක් නොසුව වේවයි යම් වෙදයිතයෙක් ඇද්ද එ ද බිඳෙනසුලු යි. ආනන්දයෙනි, යමෙක් බිඳෙනසුලු වේ ද ආයඞ්විනයෙහි මෙ ලෝක යයි කියනුලැබේ.

## 1. 9. 2

## සුඤ්ඤලොක සූත්‍රය

85. එකත්පස් වැ හුන් ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙතල කරුණ සැලකළහ: වහන්ස, ලෝකය ශූන්‍ය යැ ලෝකය ශූන්‍ය යැ යි කියනුලැබෙයි. වහන්ස, කෙතෙකින් ලෝකය ශූන්‍ය යැ යි කියනුලැබේ දයි. යම් හෙයකින් ආනන්දයෙනි, ආත්මයෙන් හෝ ආත්මය අයත් දැයින් හෝ ශූන්‍ය වේ ද, එහෙයින් ලෝකය ශූන්‍ය යැ යි කියනුලැබේ.

කිඤ්ච ආනන්ද, සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා: චක්ඛුං ඛො ආනන්ද, සුඤ්ඤං අත්තෙනවා අත්තනියෙන වා, රූපා සුඤ්ඤා අත්තෙන වා අත්තනියෙන වා, චක්ඛුවිඤ්ඤාණං සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා, චක්ඛුසම්ඵස්සො සුඤ්ඤො අත්තෙන වා අත්තනියෙන වා යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා -පෙ- යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා. යස්මා ච ඛො ආනන්ද, සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා, තස්මා සුඤ්ඤො ලොකොති වුච්චතීති.

## 1. 9. 3

## සඞ්ඛිත්තධම්මසුත්තං

86. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච, සාධු මෙ භන්තෙ, භගවා සඞ්ඛිත්තෙන ධම්මං දෙසෙතු යමහං භගවතො ධම්මං සුත්වා එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරෙය්‍යන්ති.

තං කිම්මඤ්ඤසි ආනන්ද, චක්ඛුං නිච්චං වා අනිච්චං වාති? අනිච්චං භන්තෙ. යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? දුක්ඛං භන්තෙ. යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං: 'එතං මම, එසො හමස්මි, එසො මෙ අත්තා''ති? නොහෙතං භන්තෙ. රූපා නිච්චා වා අනිච්චා වාති? අනිච්චා භන්තෙ -පෙ- චක්ඛුවිඤ්ඤාණං -පෙ- චක්ඛුසම්ඵස්සො -පෙ- යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි නිච්චං වා අනිච්චං වාති? අනිච්චං භන්තෙ. යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? දුක්ඛං භන්තෙ, යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං. "එතං මම එසො හමස්මි, එසො මෙ අත්තා''ති. නොහෙතං භන්තෙ, -පෙ-

ආනන්දයෙනි, කිමෙක් ආත්මයෙන් හෝ ආත්මය අයත් දෑයින් හෝ ශූන්‍ය වේ යැ යත්: ආනන්දයෙනි, චක්‍ෂුස ආත්මයෙන් හෝ ආත්මය අයත් දෑයින් ශූන්‍ය යැ. රූපයෝ ආත්මයෙන් හෝ ආත්මය අයත් දෑයින් ශූන්‍යයහ. චක්ඛුවිඤ්ඤාණය ආත්මයෙන් හෝ ආත්මය අයත් දෑයින් ශූන්‍ය යැ චක්ඛුසම්ඵස්සය ආත්මයෙන් හෝ ආත්මය අයත් දෑයින් ශූන්‍ය යැ චක්ඛුසම්ඵස්සප්‍රත්‍යයෙන් උපදනා සුව වේවයි දුක් වේවයි නොදුක් නොසුව වේවයි යම් මැ වෙදයිතයෙක් ඇද්ද එ ද ආත්මයෙන් හෝ ආත්මය අයත් දෑයින් ශූන්‍ය යි ... මනෝසම්ඵස්ස ප්‍රත්‍යයෙන් උපදනා සුව වේවයි දුක් වේවයි නොදුක් නොසුව වේවයි යම් මැ වෙදයිතයෙක් ඇත් නම් එ ද ආත්මයෙන් හෝ ආත්මය අයත් දෑයින් ශූන්‍ය යි. යම් හෙයෙකින් ආනන්දයෙනි, ආත්මයෙන් හෝ ආත්මය අයත් දෑයින් හෝ ශූන්‍ය වේ ද එහෙයින් 'ලෝකය ශූන්‍ය' යැ යි කියනුලැබේ.

## 1. 9. 3

## සඞ්ඛිත්තධම්ම සූත්‍රය

86. එකත්පස් වැ හුන් ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙල කරුණ සැලකළහ. වහන්ස, ආරාධනා කෙරෙමි මම භාග්‍යවතුන් වහන්සේගේ යම් දහමක් අසා එකවිහාරී වැ ගණයා කෙරෙන් වෙන් වැ සිහි ඇති වැ කෙලෙස් තවන වීර්‍ය්‍ය-යෙන් යුතු වැ අරමුණට මෙහෙයූ සිත් ඇති වැ වාස කරන්නෙම් නම් එවන් දහමක් භාග්‍යවතුන් වහන්සේ මට සැකෙවින් දෙශනා කරන සේක්වා' යි.

ආනන්දයෙනි, ඒ කිමැ යි හඟිහි? චක්‍ෂුස නිත්‍ය හෝ වේ ද අනිත්‍ය හෝ වේ දැ යි. අනිත්‍ය යැ වහන්ස. යළි යමෙක් අනිත්‍ය වේ නම් ඒ දුක් හෝ වේ ද සුව හෝ වේ දැ යි. දුක් යැ වහන්ස. යළි යමෙක් අනිත්‍ය දුඃඛ විපරිණාම සභාව වේ නම් එය මෙල මාගේ යැ මෙලෙ මම වෙමි, මෙලෙ මාගේ ආත්ම යැ යි දක්නට නිසි වේ දැ යි. වහන්ස, මෙල නිසි නො වේ මැ යි රූපයෝ නිත්‍ය හෝ වෙත් ද අනිත්‍ය හෝ වෙත් දැ යි. අනිත්‍යයහ වහන්ස ... චක්ඛුවිඤ්ඤාණය ... චක්ඛුසම්ඵස්සය ... චක්ඛුසම්ඵස්සප්‍රත්‍යයෙන් උපදනා සුව වේවයි දුක් වේවයි නොදුක් නොසුව වේවයි යම් මැ වෙදයිතයෙක් ඇත් නම් එ ද නිත්‍ය හෝ වේ ද අනිත්‍ය හෝ වේ දැ යි. අනිත්‍ය යැ වහන්ස. යළි යමෙක් අනිත්‍ය වේ නම් ඒ දුක් හෝ වේ ද සුව හෝ වේ දැ යි. දුක් යැ වහන්ස. යළි යමෙක් අනිත්‍ය දුඃඛ විපරිණාම සභාව වේ නම් එය 'මෙල මාගේ යැ, මෙලෙ මම වෙමි, මෙල මාගේ ආත්ම යැ'යි දක්නට නිසි වේ ද? වහන්ස, මෙලෙ නිසි නො වේ මැ යි ...

ජිව්හා නිච්චා වා අනිච්චා වාති -පෙ- රසා -පෙ- ජිව්හාවිඤ්ඤාණං -පෙ- ජිව්හාසම්ඵස්සො -පෙ- යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි නිච්චං වා අනිච්චං වාති? අනිච්චං භන්තෙ, යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති. දුක්ඛං භන්තෙ, යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං "එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තාති? නොහෙතං භන්තෙ.

එවං පස්සං ආනන්ද, සුතවා අරියසාවකො චක්ඛුස්මිම්පි නිබ්බින්දති, රූපෙසුපි නිබ්බින්දති, චක්ඛුවිඤ්ඤාණෙපි නිබ්බින්දති, චක්ඛුසම්ඵස්සෙපි නිබ්බින්දති -පෙ- යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තස්මිම්පි නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති, විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 9. 4

## ඡන්නසුත්තං

87. එකං සමයං භගවා **රාජගහෙ** විහරති **වෙළුවනෙ කලන්දකනිවාපෙ**, තෙන ඛො පන සමයෙන ආයස්මා ච **සාරිපුත්තො** ආයස්මා ච **මහාචුන්දො** ආයස්මා ච **ඡන්නො ගිජ්ඣකූටෙ** පබ්බතෙ විහරන්ති, තෙන ඛො පන සමයෙන ආයස්මා ඡන්නො ආබාධිකො හොති දුක්ඛිතො බාළ්හගිලානො. අථ ඛො ආයස්මා සාරිපුත්තො සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙනායස්මා මහාචුන්දො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාචුන්දං එතදවොච: "ආයාමාවුසො චුන්ද, යෙනායස්මා ඡන්නො තෙනුපසඞ්කමිස්සාම ගිලානපුච්ඡකා"ති. එවමාවුසොති ඛො ආයස්මා මහාචුන්දො ආයස්මතො සාරිපුත්තස්ස පච්චස්සොසි.

අථ ඛො ආයස්මා ච සාරිපුත්තො ආයස්මා ච මහාචුන්දො යෙනායස්මා ඡන්නො තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදිංසු, නිසජ්ජ ඛො ආයස්මා සාරිපුත්තො ආයස්මන්තං ඡන්නං එතදවොච:

ජිව්හා නිත්‍ය හෝ වේ ද අනිත්‍ය හෝ වේ දැ යි. ... රසයෝ ... ජිව්හාවිඤ්ඤාණ ... ජිව්හාසම්ඵස්ස... මනෝසම්ඵස්ස ප්‍රත්‍යයෙන් උපදනා සුව වේවයි දුක් වේවයි නොදුක් නොසුව වේවයි යම් මැ වෙදයිතයෙක් ඇත් නම් එ ද නිත්‍ය හෝ වේ ද අනිත්‍ය හෝ වේ දැයි. අනිත්‍ය යැ වහන්ස. යළි යමෙක් අනිත්‍ය වේ නම් ඒ දුක් හෝ වේ ද සුව හෝ වේ දැ යි. දුකැ වහන්ස. යළි යමෙක් අනිත්‍ය දුඃඛ විපරිණාමස්වභාව වේ නම් එය 'තෙල මාගේ යැ, තෙලෙ මම වෙමි, තෙලෙ මාගේ ආත්ම යැ'යි දක්නට නිසි වේ දැ යි. වහන්ස, තෙලෙ නිසි නො වේ මැ යි.

ආනන්දයෙනි, මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක චක්‍ෂුසෙහි ද කලකිරෙයි. රූපයන්හි දු කලකිරෙයි. චක්‍ෂුර්විඥානයෙහි දු කලකිරෙයි. චක්‍ෂුස්සංස්පර්ශයෙහි දු කලකිරෙයි ... මනස්සංස්පර්ශ ප්‍රත්‍යයෙන් උපදනා සුව වේවයි දුක් වේවයි නොදුක් නොසුව වේවයි යම් මැ වේදයිතයෙක් ඇද්ද එහි දු කලකිරෙයි. කලකිරෙනුයේ විරක්ත වෙයි, විරාග හෙතුවින් විමුක්ත වෙයි. විමුක්ත කල්හි 'විමුක්ත' යැ යි ඥානය වෙයි. 'ජාති ක්‍ෂය වූ යැ, මඟබඹසර වැස නිමවන ලද යැ. කරණී කරනලද, මෙ රහත්බව පිණිස කළයුතු අන් කිසෙක් නැතැ යි දැනගනී යයි.

## 1. 9. 4

## ඡන්න සූත්‍රය

87. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීපයෙහි කලන්දකනිවාප නම් වූ වේළුවන අරම්හි වැඩවසනසේක. එසමයෙහි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ද ආයුෂ්මත් මහාචුන්ද තෙරණුවෝ ද ආයුෂ්මත් ඡන්න තෙරණුවෝ ද ගිජුකුළු පව්වෙහි වාස කෙරෙති. එසමයෙහි ආයුෂ්මත් ඡන්න තෙරණුවෝ හටගත් ආබාධ ඇත්තාහු දුකට පැමිණියාහු දැඩි ගිලන් වෙති. එසමයෙහි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ සවස් වේලෙහි පලසමවතින් නැඟී ආයුෂ්මත් මහාචුන්ද තෙරණුවන් කරා එළැඹියහ. එළැඹ ආයුෂ්මත් මහාචුන්ද ස්ථවිරයන් වහන්සේට තෙල කරුණ වදළහ: 'යම්හ ඇවැත්නි චුන්දයෙනි, ආයුෂ්මත් ඡන්න තෙරුන් කරා ගිලන්උවටන් පුළුවුස්නමෝ එළැඹෙම්හ'යි. 'එසේ යැ ඇවැත්නි'යි ආයුෂ්මත් මහාචුන්ද ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට පිළිවදන් ඇස්වූහ,

එසඳ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ද ආයුෂ්මත් මහාචුන්ද ස්ථවිරයන් වහන්සේ ද ආයුෂ්මත් ඡන්න ස්ථවිරයන් වහන්සේ කරා එළැඹියහ. එළැඹැ පනවනලද අස්නෙහි වැඩහුන්හ. වැඩහිඳ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් ඡන්න තෙරණුවන්ට තෙල කරුණ වදළහ:

"කච්චි තෙ ආවුසො ඛමනීයං, කච්චි යාපනීයං, කච්චි දුක්ඛා වෙදනා පටික්කමන්ති, නො අභික්කමන්ති, පටික්කමොසානං පඤ්ඤායති නො අභික්කමොති.

න මෙ ආවුසො සාරිපුත්ත ඛමනීයං, න යාපනීයං, බාළ්හා මෙ දුක්ඛා වෙදනා අභික්කමන්ති නො පටික්කමන්ති, අභික්කමොසානං පඤ්ඤායති නො පටික්කමො[1]. සෙය්‍යථාපි ආවුසො බලවා පුරිසො තිණ්හෙන සිඛරෙන මුද්ධානං[2] අභිමත්ථෙය්‍ය[3], එවමෙව ඛො ආවුසො අධිමත්තා වාතා මුද්ධානං[2] උහනන්ති[4].

න මෙ ආවුසො ඛමනීයං, න යාපනීයං -පෙ- නො පටික්කමො[1] සෙය්‍යථාපි ආවුසො බලවාපුරිසො දළ්හෙන වරත්තබන්ධනෙන[5] සීසෙ සීසවෙඨං දදෙය්‍ය, එවමෙව ඛො ආවුසො අධිමත්තා මෙ සීසෙ වෙදනා[6].

න මෙ ආවුසො ඛමනීයං, න යාපනීයං -පෙ- නො පටික්කමො[1]. සෙය්‍යථාපි ආවුසො දක්ඛො ගොඝාතකො වා ගොඝාතකන්තෙවාසී වා තිණ්හෙන ගොවිකන්තනෙන කුච්ඡිං පරිකන්තෙය්‍ය, එවමෙව ඛො ආවුසො අධිමත්තා වාතා කුච්ඡිං පරිකන්තන්ති.

න මෙ ආවුසො ඛමනීයං, න යාපනීයං, -පෙ- නො පටික්කමො[1]. සෙය්‍යථාපි ආවුසො ද්වෙ බලවන්තො පුරිසා දුබ්බලතරං පුරිසං නානාබාහාසු ගහෙත්වා අඞ්ගාරකාසුයා සන්තාපෙය්‍යුං, සම්පරිතාපෙය්‍යුං, එවමෙව ඛො ආවුසො අධිමත්තො කායස්මිං ඩාහො.

න මෙ ආවුසො ඛමනීයං. න යාපනීයං, බාළ්හා මෙ දුක්ඛා වෙදනා. අභික්කමන්ති නො පටික්කමන්ති, අභික්කමොසානං පඤ්ඤායති නො පටික්කමො[1]. සත්ථං ආවුසො සාරිපුත්ත ආහරිස්සාමි නාවකඞ්ඛාමි ජීවිතන්ති.

මා ආයස්මා ඡන්නො සත්ථං ආහරෙසි. යාපෙතායස්මා ඡන්නො, යාපෙන්තං මයං ආයස්මන්තං ඡන්නං ඉච්ඡාම, සචෙ ආයස්මතො ඡන්නස්ස නත්ථි සප්පායානි භොජනානි, අහං ආයස්මතො ඡන්නස්ස සප්පායානි භොජනානි පරියෙසිස්සාමි, සචෙ ආයස්මතො ඡන්නස්ස නත්ථි සප්පායානි භෙසජ්ජානි, අහං ආයස්මතො ඡන්නස්ස සප්පායානි භෙසජ්ජානි පරියෙසිස්සාමි, සචෙ ආයස්මතො ඡන්නස්ස නත්ථි පතිරූපා උපට්ඨාකා, අහං ආයස්මන්තං ඡන්නං උපට්ඨහිස්සාමි, මායස්මා[7] ඡන්නො සත්ථං ආහරෙසි, යාපෙතායස්මා ඡන්නො, යාපෙන්තං මයං ආයස්මන්තං ඡන්නං ඉච්ඡාමාති,

---

1. පටික්කමොති -ස්‍යා, සිමු
2. මුද්ධනි - මජ්‍ඣං, ස්‍යා,
3. අභිමත්ථෙය්‍ය - මජ්‍ඣං,
4. උහනති - මජ්‍ඣං,
5. බන්ධෙන - ස්‍යා.
6. අධිමත්තවාතා සීසෙ සීසවෙදනා - ස්‍යා. අධිමත්තා සීසෙ සීසවෙදනා - මජ්‍ඣං
7. මාව ආයස්මා - ස්‍යා.

කිම ඇවැත්නි, තොපට ඉවැසියහැකි ද, කිම යැපියහැකි ද, කිම දුක් වේදනාවෝ බැසයෙත් ද, නො වැඩෙත් ද, බැස යැමේ අවසානය පැනේ ද, වැඩීමෙක් නො පැනේ ද?යි.

ඇවැත්නි ශාරීපුත්‍රයෙනි, මට ඉවැසිය නො හෙයි, යැපිය නො හෙයි, මාගේ දැඩි දුක් වේදනාවෝ වැඩෙති, නො බැසයෙති, වඩනා අවසන පැනෙයි, බැසීමෙක් නො පැනේ. යම්සේ ඇවැත්නි, බලවත් පුරුෂයෙක් තියුණු සැතෙකින් මුදුන පෙළා ද එපරිද්දෙන් මැ ඇවැත්නි අධිමාත්‍ර වාතයෝ මුදුන පෙළති.

ඇවැත්නි, මට ඉවැසිය නො හෙයි යැපිය නො හෙයි ... බැසීමක් නො පැනේ. යම්සේ ඇවැත්නි, බලවත් පුරුෂයෙක් දැඩි වරපටෙකින් හිසෙහි හිස්වෙළුම් දෙන්නේ ද, එපරිද්දෙන්ම ඇවැත්නි, මාගේ ශීර්ෂවෙදනා අධිමාත්‍ර වෙයි.

ඇවැත්නි, මට ඉවැසිය නොහෙයි. යැපිය නො හෙයි ... බැසීමෙක් නො පැනේ. යම්සේ ඇවැත්නි, දක්ෂ ගෝඝාතකයෙක් හෝ ගෝඝාතක අතැවැසියෙක් හෝ තියුණු වූ ගෙරිකපන කැත්තෙකින් කුස කපන්නේ ද, එපරිද්දෙන් මැ ඇවැත්නි, අධිමාත්‍ර වාතයෝ කුස කපති.

ඇවැත්නි, මට ඉවැසිය නො හෙයි, යැපිය නො හෙයි ... බැසීමෙක් නො පැනේ. යම්සේ ඇවැත්නි, බලවත් පුරුෂයෝ දෙදෙනෙක් දුර්වලතර පුරුෂයක්හු වෙන වෙන අත්හි ගෙන සහළහුරු වළෙකලා තවන්නාහුද හාත්පසින් තවන්නාහූ ද එපරිද්දෙන් මැ ඇවැත්නි; කයෙහි අධිමාත්‍ර දහ වෙයි.

ඇවැත්නි, මට ඉවැසිය නො හෙයි. යැපිය නො හෙයි. මාගේ දැඩි දුක් වේදනාවෝ වැඩෙති. නො බැස යෙති. වඩනා අවසන පැනෙයි, බැසීමෙක් නො පැනෙයි. ඇවැත්නි ශාරීපුත්‍රයෙනි, ශස්ත්‍රයක් එළවන්නෙමි, ජීවිතය නො කැමැත්තෙමි'යි.

ආයුෂ්මත් ජන්න තෙරණුවෝ නහමක් ශස්ත්‍රාහරණ කෙරෙත්වා. ආයුෂ්මත් ජන්න තෙරණුවෝ යැපෙත්වා. ඇපි ආයුෂ්මත් ජන්න තෙරණුවන් යැපෙනුවන් (දක්නා) කැමැත්තම්හ. ඉදින් ආයුෂ්මත් ජන්න තෙරණුවනට සත්ප්‍රාය භෝජන නැත් නම් මම ආයුෂ්මත් ජන්න තෙරණුවනට සත්ප්‍රාය භෝජන සොයන්නෙමි. ඉදින් ආයුෂ්මත් ජනග තෙරණුවනට සත්ප්‍රාය බෙහෙසත් නැත් නම් මම සත්ප්‍රාය බෙහෙසත් සොයන්නෙමි. ඉදින් ආයුෂ්මත් ජන්න තෙරණුවනට ප්‍රතිරූප උපස්ථායකයෝ නැත් නම් මම ආයුෂ්මත් ජන්න තෙරණුවනට උපස්ථාන කරන්නෙමි. ආයුෂ්මත් ජන්න තෙරණුවෝ සැතක් නො එළවත්වා. ආයුෂ්මත් ජන්න තෙරණුවෝ යැපෙත්වා. ඇපි ආයුෂ්මත් ජන්න තෙරණුවන් යැපෙනුවන් (දක්නා) කැමැත්තම්හ'යි.

න මෙ ආවුසො සාරිපුත්ත නත්ථි සප්පායානි භොජනානි, අත්ථි මෙ සප්පායානි භොජනානි, නපි මෙ නත්ථි සප්පායානි භෙසජ්ජානි, අත්ථි මෙ සප්පායානි භෙසජ්ජානි, නපි මෙ නත්ථි පතිරූපා උපට්ඨාකා, අත්ථි මෙ පතිරූපා උපට්ඨාකා. අපි ච මෙ ආවුසො සත්ථා පරිචිණ්ණො දීඝරත්තං මනාපෙනෙව නො අමනාපෙන, එතං හි ආවුසො සාවකස්ස පතිරූපං යං සත්ථාරං පරිචරෙය්‍ය මනාපෙනෙව නො අමනාපෙන, තං අනුපවජ්ජං ඡන්නො භික්ඛු සත්ථං ආහරිස්සතීති, එවමෙතං ආවුසො සාරිපුත්ත ධාරෙහීති.

පුච්ඡෙය්‍යාම මයං ආයස්මන්තං ඡන්නං කඤ්චි[1]දෙව දෙසං, සචෙ ආයස්මා ඡන්නො ඔකාසං කරොති පඤ්හස්ස වෙය්‍යාකරණායාති.

පුච්ඡාවුසො සාරිපුත්ත සුත්වා වෙදිස්සාමාති.

චක්ඛුං ආවුසො ඡන්න, චක්ඛුවිඤ්ඤාණං චක්ඛුවිඤ්ඤාණවිඤ්ඤාතබ්බෙ ධම්මෙ "එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා"ති සමනුපස්සසි. සොතං ආවුසො ඡන්න, -පෙ- ඝානං ආවුසො ඡන්න -පෙ- ජිව්හං ආවුසො ඡන්න -පෙ- ජිව්හාවිඤ්ඤාණංජිව්හාවිඤ්ඤාණ විඤ්ඤාතබ්බෙ ධම්මෙ: "එතං මම, එසො'හමස්මි එසො මෙ අත්තා"ති සමනුපස්සසි කායං ආවුසො ඡන්න -පෙ- මනං ආවුසො ඡන්න, මනොවිඤ්ඤාණං මනොවිඤ්ඤාණවිඤ්ඤාතබ්බෙ ධම්මෙ "එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා"ති සමනුපස්සසීති.

චක්ඛුං ආවුසො සාරිපුත්ත, චක්ඛුවිඤ්ඤාණං චක්ඛුවිඤ්ඤාණවිඤ්ඤාතබ්බෙ ධම්මෙ: "නෙතං මම, නෙසො'හමස්මි, න මෙසො අත්තා"ති සමනුපස්සාමි, සොතං ආවුසො සාරිපුත්ත - පෙ - ඝානං ආවුසො සාරිපුත්ත - පෙ - ජිව්හං ආවුසො සාරිපුත්ත, ජිව්හාවිඤ්ඤාණං ජිව්හාවිඤ්ඤාණවිඤ්ඤාතබ්බෙ ධම්මෙ "නෙතං මම නෙසො'හමස්මි න මෙසො අත්තා"ති සමනුපස්සාමි, කායං ආවුසො සාරිපුත්ත -පෙ- මනං ආවුසො සාරිපුත්ත, මනොවිඤ්ඤාණං මනොවිඤ්ඤාණවිඤ්ඤාතබ්බෙ ධම්මෙ "නෙතං මම නෙසො'හමස්මි, න මෙසො අත්තා"ති සමනුපස්සාමීති.

---

1. කිඤ්චි - සත්‍යා. PTS

ආයුෂ්මත් ශාරීපුත්‍රයෙනි, මට නිසි බොජුන් නැත්තේ නො වෙයි, මට නිසි බොජුන් ඇත. මට නිසි බෙහෙත් නැත්තේ ද නො වෙයි. මට නිසි බෙහෙත් ඇත. මට ප්‍රතිරූප උපස්ථායකයෝ නැත්තාහු ද නො වෙති, මට ප්‍රතිරූප උපස්ථායකයෝ ඇත. එතෙකුදුවත් ඇවැත්නි, මා විසින් දිගුකලක් මුළුල්ලෙහි අමනාප කායකර්මාදියෙන් නො වැ මනාප වූ කායකර්මාදියෙන් මැ ශාස්තෲන් වහන්සේ ඇසුරුකරන ලදහ. ඇවැත්නි, අමනාප වූ කායකර්මාදියෙන් නො ව මනාප වූ මැ කායකර්මාදියෙන් ශාස්තෲන් වහන්සේ ඇසුරු කරන්නේ යැ යන යමෙක් ඇද්ද, තෙල කරුණ මැ ශ්‍රාවකයක්හට නිසි වෙයි. එහෙයින් ඡන්න මහණ (අප්‍රතිසන්ධික වැ) ශස්ත්‍රාහරණ කරන්නේ යයි යන තෙල කරුණ ඇවැත්නි ශාරීපුත්‍රයෙනි, ධරනසේක්ව යි.

ඉදින් ආයුෂ්මත් ඡන්න තෙරණුවෝ ප්‍රශ්නව්‍යාකරණයට අවකාශ කෙරෙත් නම් ඇපි ආයුෂ්මත් ඡන්න තෙරුන් අතින් කිසි කරුණක් පුළුවුසුම්හ'යි.

ඇවැත්නි ශාරීපුත්‍රයෙනි, පුළුවුස්නා මැනැවැ, අසා දන්නමෝ වෙ දූ යි.

ඇවැත්නි ඡන්නයෙනි චක්ෂුස, චක්ෂුර්විඥානය, චක්ෂුර්විඥානයෙන් දතයුතු දහම් "තෙල මාගේ යැ තෙලෙ මම වෙමි. තෙලෙ මාගේ ආත්ම යැ''යි දක්නවු ද? ඇවැත්නි ඡන්නයෙනි ශ්‍රොත්‍රය ... ඇවැත්නි ඡන්නයෙනි ඝ්‍රාණය ... ඇවැත්නි, ඡන්නයෙනි ජිහ්වාව, ජිහ්වාවිඥානය, ජිහ්වාවිඥානයෙන් දතයුතු දහම් "තෙල මාගේ යැ, තෙලෙ මම වෙමි, තෙලෙ මාගේ ආත්ම යැ''යි දක්නවු ද? ඇවැත්නි ඡන්නයෙනි කය ... ඇවැත්නි ඡන්නයෙනි මනස, මනෝවිඥානයෙන් දතයුතු දහම් "තෙල මාගේ යැ, තෙලෙ මම වෙමි, තෙලෙ මාගේ ආත්ම යැ''යි දක්නවු දූ යි.

ඇවැත්නි ශාරීපුත්‍රයෙනි චක්ෂුස, චක්ෂුර්විඥානය, චක්ෂුර්විඥානයෙන් දතයුතු දහම් "තෙල මාගේ නො වෙයි, තෙලෙ මම නොවෙමි, තෙලෙ මාගේ ආත්ම නොවේ ය'යි දක්මි. ඇවැත්නි, ශාරීපුත්‍රයෙනි ශ්‍රොත්‍රය ... ඇවැත්නි ශාරීපුත්‍රයෙනි ඝ්‍රාණය ... ඇවැත්නි ශාරීපුත්‍රයෙනි ජිහ්වාව, ජිහ්වාවිඥානය, ජිහ්වාවිඥානයෙන් දතයුතු දහම් "තෙල මාගේ නොවෙයි, තෙලෙ මම නොවෙමි තෙලෙ මාගේ ආත්ම නො වේ ය යි දක්මි. ඇවැත්නි ශාරීපුත්‍රයෙනි කය ... ඇවැත්නි ශාරීපුත්‍රයෙනි මනස, මනොවිඥානය, මනොවිඥානයෙන් දතයුතු දහම් "තෙල මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙලෙ මාගේ ආත්ම නො වේ'' යයි දක්මි'යි.

චක්ඛුස්මිං ආවුසො ඡන්න, චක්ඛුවිඤ්ඤාණෙ, චක්ඛුවිඤ්ඤාණවිඤ්ඤාතබ්බෙසු ධම්මෙසු කිං දිස්වා කිං අභිඤ්ඤාය චක්ඛුං චක්ඛුවිඤ්ඤාණං චක්ඛුවිඤ්ඤාණවිඤ්ඤාතබ්බෙ ධම්මෙ "නෙතං මම, නෙසො'හමස්මි, න මෙසො අත්තා"ති සමනුපස්සසි? සොතස්මිං ආවුසො ඡන්න -පෙ- ඝානස්මිං ආවුසො ඡන්න -පෙ- ජිව්හාය ආවුසො ඡන්න ජිව්හාවිඤ්ඤාණෙ ජිව්හාවිඤ්ඤාණවිඤ්ඤාතබ්බෙසු ධම්මෙසු කිං දිස්වා කිං අභිඤ්ඤාය ජිව්හං ජිව්හාවිඤ්ඤාණං ජිව්හාවිඤ්ඤාණවිඤ්ඤාතබ්බෙ ධම්මෙ "නෙතං මම නෙසො'හමස්මි, න මෙසො අත්තා"ති සමනුපස්සසි? කායස්මිං ආවුසො ඡන්න -පෙ- මනස්මිං ආවුසො ඡන්න, මනොවිඤ්ඤාණෙ මනොවිඤ්ඤාණවිඤ්ඤාතබ්බෙසු ධම්මෙසු කිං දිස්වා කිං අභිඤ්ඤාය මනං මනොවිඤ්ඤාණං මනොවිඤ්ඤාණවිඤ්ඤාතබ්බෙ ධම්මෙ "නෙතං මම, නෙසො'හමස්මි, න මෙසො අත්තා"ති සමනුපස්සසි?

චක්ඛුස්මිං ආවුසො සාරිපුත්ත, චක්ඛුවිඤ්ඤාණෙ චක්ඛුවිඤ්ඤාණවිඤ්ඤාතබ්බෙසු ධම්මෙසු නිරොධං දිස්වා නිරොධං අභිඤ්ඤාය චක්ඛුං චක්ඛුවිඤ්ඤාණං චක්ඛුවිඤ්ඤාණවිඤ්ඤාතබ්බෙ ධම්මෙ "නෙතං මම, නෙසො'හමස්මි, න මෙසො අත්තා"ති සමනුපස්සාමි. සොතස්මිං ආවුසො සාරිපුත්ත -පෙ- ඝානස්මිං ආවුසො සාරිපුත්ත -පෙ- ජිව්හාය ආවුසො සාරිපුත්ත, ජිව්හාවිඤ්ඤාණෙ ජිව්හාවිඤ්ඤාණවිඤ්ඤාතබ්බෙසු ධම්මෙසු නිරොධං දිස්වා නිරොධං අභිඤ්ඤාය ජිව්හං ජිව්හාවිඤ්ඤාණං ජිව්හා-විඤ්ඤාණවිඤ්ඤාතබ්බෙ ධම්මෙ "නෙතං මම නෙසො'හමස්මි, න මෙසො අත්තා"ති සමනුපස්සාමි, කායස්මිං ආවුසො සාරිපුත්ත -පෙ- මනස්මිං ආවුසො සාරිපුත්ත, මනොවිඤ්ඤාණෙ මනොවිඤ්ඤාණවිඤ්ඤාතබ්බෙසු ධම්මෙසු නිරොධං දිස්වා නිරොධං අභිඤ්ඤාය මනං මනොවිඤ්ඤාණං මනොවිඤ්ඤාණවිඤ්ඤාතබ්බෙ ධම්මෙ "නෙතං මම, නෙසො'හමස්මි, න මෙසො අත්තාති සමනුපස්සාමීති.

එවං වුත්තෙ ආයස්මා මහාචුන්දො ආයස්මන්තං ඡන්නං එතදවොච: "තස්මාතිහ ආවුසො ඡන්න, ඉදම්පි තස්ස භගවතො සාසනං නිච්ච-කප්පං සාධුකං මනසිකාතබ්බං: "නිස්සිතස්ස චලිතං, අනිස්සිතස්ස චලිතං නත්ථි, චලිතෙ අසති පස්සද්ධි හොති, පස්සද්ධියා සති නති[1] න හොති, නතියා අසති ආගතිගති න හොති, ආගතිගතියා අසති චුතූපපාතො න හොති, චුතූපපාතෙ අසති නෙවිධ න හුරං න උභයමන්තරෙන එසෙවන්තො දුක්ඛස්සාති.

---

1. නන්දි - සන්‍යා

ඇවැත්නි ජන්නයෙනි චක්‍ෂුසෙහි චක්‍ෂුර්විඥානයෙහි චක්‍ෂුර්විඥානයෙන් දතයුතු දහම්හි කුමක් දැක කුමක් වෙසෙසින් දැන චක්‍ෂුස චක්‍ෂුර්විඥානය චක්‍ෂුර්විඥානයෙන් දතයුතු දහම් 'තෙල මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙල මාගේ ආත්මය නො වේ ය යි දකිවු ද? ඇවැත්නි ජන්නයෙනි ශ්‍රොත්‍රයෙහි ... ඇවැත්නි ජන්නයෙනි ඝ්‍රාණයෙහි ... ඇවැත්නි ජන්නයෙනි ජිහ්වායෙහි ජිහ්වාවිඥානයෙහි ජිහ්වාවිඥානයෙන් දතයුතු දහම්හි කුමක් දැක කුමක් වෙසෙසින් දැන ජිහ්වා ජිහ්වාවිඥාන ජිහ්වාවිඥානයෙන් දතයුතු දහම් "තෙල මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙල මාගේ ආත්ම නො වේ යයි දකිවු ද? ඇවැත්නි ජන්නයෙනි කයෙහි ... ඇවැත්නි, ජන්නයෙනි මනසෙහි මනෝවිඥානයෙහි මනෝවිඥානයෙන් දතයුතු දහම්හි කුමක් දැක කුමක් වෙසෙසින් දැන මනස, මනෝවිඥානය, මනෝවිඥානයෙන් දතයුතු දහම් "තෙල මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙල මාගේ ආත්ම නො වේ ය යි දකිවු ද යි.

ඇවැත්නි ශාරීපුත්‍රයෙනි චක්‍ෂුසෙහි චක්‍ෂුර්විඥානයෙහි චක්‍ෂුර්විඥානයෙන් දතයුතු දහම්හි නිරෝධය දැක නිරෝධය වෙසෙසින් දැන චක්‍ෂුස චක්‍ෂුර්විඥානය චක්‍ෂුර්විඥානයෙන් දතයුතු දහම් 'තෙල මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙල මාගේ ආත්ම නො වේ' ය යි දකිමි. ඇවැත්නි ශාරීපුත්‍රයෙනි ශ්‍රොත්‍රයෙහි ... ඇවැත්නි ශාරීපුත්‍රයෙනි ඝ්‍රාණයෙහි ... ඇවැත්නි ශාරීපුත්‍රයෙනි ජිහ්වායෙහි, ජිහ්වාවිඥානයෙහි ජිහ්වාවිඥානයෙන් දතයුතු දහම්හි නිරෝධය දැක නිරෝධය වෙසෙසින් දැන ජිහ්වාව ජිහ්වාවිඥානය ජිහ්වාවිඥානයෙන් දතයුතු දහම් "තෙලෙ මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙලෙ මාගේ ආත්ම නො වේ ය යි දකිමි. ඇවැත්නි ශාරීපුත්‍රයෙනි කයෙහි ... ඇවැත්නි ශාරීපුත්‍රයෙනි මනසෙහි මනෝවිඥානයෙහි මනෝවිඥානයෙන් දතයුතු දහම්හි නිරෝධය දැක නිරෝධය වෙසෙසින් දැන මනස, මනෝවිඥානය, මනෝවිඥානයෙන් දතයුතු දහම් "තෙලෙ මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙල මාගේ ආත්ම නො වේ යයි දක්මි'යි.

මෙසේ කී කල්හි ආයුෂ්මත් මහාචුන්ද තෙරණුවෝ ආයුෂ්මත් ජන්න තෙරණුවනට තෙල කරුණ කීහ: "ඇවැත්නි ජන්නයෙනි (යම් හෙයෙකින් මාරණාන්තික වේදනා සිහිය නොහී ශස්ත්‍රාහරණ කෙරෙමි කියහි ද) එහෙයින් මෙ කරුණෙහි ලා ඒ භාග්‍යවතුන් වහන්සේගේ මේ අනුශාසනය ද නිරතුරු මැනැවින් මෙනෙහි කළයුතු යැ. (තෘෂ්ණා මාන දෘෂ්ටි) නිශ්‍රිතයහට චලන වෙයි. අනිශ්‍රිතයහට චලන නැති. චලන නැති වත් මැ (කාය චිත්ත) ප්‍රශ්‍රබ්ධි (සන්හිඳීම) වෙයි. ප්‍රශ්‍රබ්ධිය ඇති කල්හි භවනිකන්ති නො වෙයි, භවනිකන්තිය නැති කල්හි (ප්‍රතිසන්ධි විසින්) ආගමන ද (ච්‍යුති විසින්) ගමන ද නො වෙයි. ආගති ගති නැති කල්හි චුති-උප්පත්ති නො වෙයි, චුති-උපපත්ති නැති කල්හි මෙලොවිහි නො වෙයි, පරලොවිහි නො වෙයි. දෙලොවිහි නො වෙයි, මෙ මැ දුඃඛයාගේ අන්තය වේ" යයි.

අථ ඛො ආයස්මා ච සාරිපුත්තො ආයස්මා ච මහාචුන්දො ආයස්මන්තං ඡන්නං ඉමිනා ඔවාදෙන ඔවදිත්වා උට්ඨායාසනා පක්කමිංසු. අථ ඛො ආයස්මා ඡන්නො අචිරපක්කන්තෙසු තෙසු ආයස්මන්තෙසු සත්ථං ආහරෙසි.

අථ ඛො ආයස්මා සාරිපුත්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සාරිපුත්තො භගවන්තං එතදවොච "ආයස්මතා භන්තෙ, ඡන්නෙන සත්ථං ආහරිතං, තස්ස කා ගති කො අභිසම්පරායොති? නනු තෙ සාරිපුත්ත, ඡන්නෙන භික්ඛුනා සම්මුඛායෙව අනුපවජ්ජතා බ්‍යාකතාති.

අත්ථි භන්තෙ, පුබ්බවිරං[1] නාම වජ්ජිගාමො, තත්ථායස්මතො ඡන්නස්ස මිත්තකුලානි සුහජ්ජකුලානි උපවජ්ජකුලානීති.

හොන්ති හෙතෙ සාරිපුත්ත, ඡන්නස්ස භික්ඛුනො මිත්තකුලානි සුහජ්ජකුලානි උපවජ්ජකුලානි, න ඛො පනාහං සාරිපුත්ත, එත්තාවතා සඋපවජ්ජොති[2] වදමි, යො ඛො සාරිපුත්ත ඉමඤ්ච[3] කායං නික්ඛිපති, අඤ්ඤඤ්ච කායං උපාදියති, තමහං සඋපවජ්ජොති වදමි, තං ඡන්නස්ස භික්ඛුනො නත්ථි, අනුපවජ්ජං ඡන්නෙන භික්ඛුනා සත්ථං ආහරිතන්ති එවමෙතං සාරිපුත්ත, ධාරෙහීති.

## 1. 9. 5

### පුණ්ණසුත්තං

88. අථ ඛො ආයස්මා පුණ්ණො යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො ආයස්මා පුණ්ණො භගවන්තං එතදවොච "සාධු මෙ භන්තෙ, භගවා සංඛිත්තෙන ධම්මං දෙසෙතු යමහං භගවතො ධම්මං සුත්වා එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරෙය්‍යන්ති.

සන්ති ඛො පුණ්ණ චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, තඤ්චෙ භික්ඛු අභිනන්දති, අභිවදති, අජ්ඣොසාය තිට්ඨති, තස්ස තං අභිනන්දතො අභිවදතො අජ්ඣොසාය තිට්ඨතො උප්පජ්ජති නන්දී, නන්දිසමුදයා දුක්ඛසමුදයො පුණ්ණාති වදමි.

1. පුබ්බවිජ්ජනං - මජසං, ස්‍යා. පුබ්බවිජ්ඣනං - PTS, පුබ්බවිචිරං - සී 2.
2. සා උපවජ්ජාති - සීමු
3. තඤ්ච - මජසං

ඉක්බිති ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ද ආයුෂ්මත් මහාචුන්ද තෙරණුවෝ ද ආයුෂ්මත් ඡන්න තෙරණුවනට මේ ඕවායෙන් ඕවා දී හුනස්නෙන් නැඟී වැඩියහ. එසඳ ආයුෂ්මත් ඡන්න තෙරණුවෝ ඒ ආයුෂ්මතුන් නැඟී වැඩි නොබෝ වේලායෙහි ශස්ත්‍රාහරණ කළහ.

එසඳ ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹ භාග්‍යවතුන් වැඳ එකත්පස් වැ හුන්හ. එකත්පස් වැ හුන් ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට තෙල කරුණ සැලකළහ: වහන්ස, ආයුෂ්මත් ඡන්න තෙරුන් විසින් ශස්ත්‍රාහරණ කරන ලද. උන්ගේ ගති කවර? පරලෝ කවරෙ? යයි. ශාරීපුත්‍රයෙනි ඡන්න මහණහු විසින් තොප හමුයෙහි මැ අනුපවද්‍ය (අප්‍රතිසන්ධික) බව ප්‍රකාශ කරන ලද නො වේ දැයි.

වහන්ස 'පුබ්බවිර' නම් වැදැගමෙක් ඇත. එහි ආයුෂ්මත් ඡන්න තෙරුන්ගේ මිත්‍රකුලයෝ සුහදකුලයෝ උපවද්‍ය (එළැඹියයුතු) කුලයෝ ඇතැයි.

ශාරීපුත්‍රයෙනි ඡන්න මහණහට තෙල මිත්‍රකුලයෝ සුහද කුලයෝ උපවද්‍ය (එළැඹියයුතු) කුලයෝ ඇත් මැ යි. ශාරීපුත්‍රයෙනි මම මෙතෙකින් 'සඋපවජ්ජ' යයි නො කියමි. ශාරීපුත්‍රයෙනි වැලිදු යමෙක් මෙ කයත් (ච්‍යුති වශයෙන්) බහාතබා ද අන් කයකුත් (ප්‍රතිසන්ධි වශයෙන්) උපාදන කෙරේ ද මම ඔහු 'සඋපවජ්ජ' යයි කියමි. එය ඡන්න මහණහට නැත. ශාරීපුත්‍රයෙනි ඡන්න මහණහු විසින් අප්‍රතිසන්ධික කොට ශස්ත්‍රාහරණ කරන ලදැ'යි තෙල කරුණ මෙසේ ධරව'යි.

## 1. 9. 5

## පුණ්ණ සූත්‍රය

88. එකල්හි ආයුෂ්මත් පුණ්ණ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියහ. ... එකත්පස් ව හුන් ආයුෂ්මත් පුණ්ණ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ: වහන්ස, "මම භාග්‍යවතුන් වහන්සේගේ යම් දහමක් අසා එකලා ව ගණයා කෙරෙන් වෙන් ව නො පමා ව කෙලෙස් තවන වෙර ඇති ව නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති ව වාසය කරන්නෙම් නම් භාග්‍යවතුන් වහන්සේ (එබඳු) දහමක් සැකෙවින් මට දේශනා කරන සේක්වා" යි.

පුණ්ණ චක්ඛුවිඤ්ඤෙය්‍යයෙන් දතයුතු ඉටු වූ කමනීය වූ මනවඩන ප්‍රියස්වභාව ඇති කාමයෙන් යුක්ත වූ ඇලුම් කටයුතු වූ රූ ඇත් ම ය. ඉදින් මහණ එය පතා ද, ප්‍රියමනාප යයි කියා ද, ගැලී සිටී ද, එය පතන ප්‍රියමනාප යයි කියන ගැලී සිටින ඔහුට සප්‍රීතික තෘෂ්ණාව උපදී. පුණ්ණ, සප්‍රීතික තෘෂ්ණාවේ ඉපැද්මෙන් දුකේ ඉපැද්ම වේ යයි කියමි.

සන්ති ඛො පුණ්ණ, සොතවිඤ්ඤෙය්‍යා සද්ද -පෙ- ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා -පෙ- සන්ති ඛො පුණ්ණ, මනොවිඤ්ඤෙය්‍යා ධම්මා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, තඤ්චෙ භික්ඛු අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨති, තස්ස තං අභිනන්දතො අභිවදතො අජ්ඣොසාය තිට්ඨතො උප්පජ්ජති නන්දි, නන්දිසමුදයා දුක්ඛසමුදයො පුණ්ණාති වදාමි.

සන්ති ච ඛො පුණ්ණ, චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, තඤ්චෙ භික්ඛු නාභිනන්දති නාභිවදති නාජ්ඣොසාය තිට්ඨති, තස්ස තං අනභිනන්දතො අනභිවදතො අනජ්ඣොසාය තිට්ඨතො නන්දි නිරුජ්ඣති, නන්දිනිරොධා දුක්ඛනිරොධො පුණ්ණාති වදාමි.

සන්ති ච ඛො පුණ්ණ, සොතවිඤ්ඤෙය්‍යා සද්ද -පෙ- ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා පෙ- සන්ති ච ඛො පුණ්ණ, මනොවිඤ්ඤෙය්‍යා ධම්මා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, තඤ්චෙ භික්ඛු නාභිනන්දති නාභිවදති නාජ්ඣොසාය තිට්ඨති, තස්ස තං අනභිනන්දතො අනභිවදතො අනජ්ඣොසාය තිට්ඨතො නන්දි නිරුජ්ඣති, නන්දිනිරොධා දුක්ඛනිරොධො පුණ්ණාති වදාමි.

ඉමිනා ත්වං පුණ්ණ, මයා සඞ්ඛිත්තෙන ඔවාදෙන ඔවදිතො කතමස්මිං ජනපදෙ විහරිස්සසීති? අත්ථි භන්තෙ, සුනාපරන්තො නාම ජනපදෙ, තත්ථාහං විහරිස්සාමීති.

චණ්ඩා ඛො පුණ්ණ, සුනාපරන්තකා මනුස්සා, ඵරුසා ඛො පුණ්ණ සුනාපරන්තකා මනුස්සා, සචෙ ඛො ත්වං පුණ්ණ සුනාපරන්තකා මනුස්සා අක්කොසිස්සන්ති පරිභාසිස්සන්ති, තත්‍ර තෙ පුණ්ණ, කින්ති භවිස්සතීති? සචෙ මං භන්තෙ, සුනාපරන්තකා මනුස්සා අක්කොසිස්සන්ති, පරිභාසිස්සන්ති, තත්‍ර මෙ එවං භවිස්සති, භද්දකා වතිමෙ සුනාපරන්තකා මනුස්සා, සුභද්දකා වතිමෙ සුනාපරන්තකා මනුස්සා, යං මෙ නයිමෙ පාණිනා පහාරං දෙන්තීති, එවමෙත්ථ භගවා භවිස්සති එවමෙත්ථ සුගත භවිස්සතීති.

සචෙ පන තෙ පුණ්ණ සුනාපරන්තකා මනුස්සා පාණිනා පහාරං දස්සන්ති, තත්‍ර පන තෙ පුණ්ණ කින්ති භවිස්සතීති? සචෙ මෙ භන්තෙ, සුනාපරන්තකා මනුස්සා පාණිනා පහාරං දස්සන්ති තත්‍ර මෙ එවං භවිස්සති:

පුණ්ණ, සෝතවිඤ්ඤාණයෙන් දතයුතු ශබ්ද ඇත් ම ය. ඝානවිඤ්ඤාණයෙන් දතයුතු ගන්ධ ... ජිව්හාවිඤ්ඤාණයෙන් දතයුතු රස ... කායවිඤ්ඤාණයෙන් දතයුතු පහස ... පුණ්ණ, මනෝවිඤ්ඤාණයෙන් දතයුතු ඉටු වූ කමනීය වූ මනවඩන ප්‍රියස්වභාව ඇති කාමයෙන් යුක්ත වූ ඇලුම් කටයුතු වූ දහම් ඇත් ම ය. ඉදින් මහණ එය පතා ද, ප්‍රියමනාප යයි කියා ද, ගැලී සිටී ද, පුණ්ණ, එය පතන ප්‍රියමනාප යයි කියන ගැලී සිටින ඔහුට සප්‍රීතික තෘෂ්ණාව උපදී. සප්‍රීතික තෘෂ්ණාව ඉපැද්මෙන් දුක් ඉපැද්ම වේ යයි කියමි.

පුණ්ණ, චක්ඛුවිඤ්ඤාණයෙන් දතයුතු ඉටු වූ කමනීය වූ මනවඩන ප්‍රියදෑ වූ කාමයෙන් යුතු ඇලුම් කටයුතු රූ ඇත් ම ය. ඉදින් මහණ එය නො පතා ද, ප්‍රියමනාප යයි නො කියා ද, ගැලී නො සිටී ද, පුණ්ණ, එය නො පතන ප්‍රියමනාප යයි නො කියන ගැලී නො සිටින ඔහුට සප්‍රීතික තෘෂ්ණාව නිරුද්ධ වෙයි. සප්‍රීතික තෘෂ්ණාව නිරෝධයෙන් දුඃඛ නිරෝධය වේ යයි කියමි.

පුණ්ණ, සෝතවිඤ්ඤාණයෙන් දතයුතු ශබ්ද ඇත් ම ය ... ඝානවිඤ්ඤාණයෙන් දතයුතු ගන්ධ ... ජිව්හාවිඤ්ඤාණයෙන් දතයුතු රස ... කායවිඤ්ඤාණයෙන් දතයුතු පහස් ... පුණ්ණ, මනොවිඤ්ඤාණයෙන් දතයුතු ඉටු වූ කමනීය වූ මනවඩන පියදෑ වූ කාමයෙන් යුතු ඇලුම් කටයුතු දහම් ඇත් ම ය. ඉදින් මහණ එය නො පතා ද, ප්‍රියමනාප යයි නො කියා ද, ගැලී නො සිටී ද පුණ්ණ, එය නො පතන ප්‍රියමනාප යයි නො කියන ගැලී නො සිටින ඔහුගේ තෘෂ්ණාව නිරුද්ධ වේ. තෘෂ්ණා නිරොධයෙන් දුක්ඛනිරොධය වේ යයි කියමි.

පුණ්ණ, මා විසින් මේ අවවාදයෙන් සැකෙවින් අවවාද කරන ලද තෙපි කවර දනව්වෙක වසන්නහු ද යි. වහන්ස, **සුනාපරන්ත** නම් දනව්වෙක් ඇත එහි මම වෙසෙන්නෙමි යි.

පුණ්ණ, සුනාපරන්ත දනව්වැසි මිනිස්සු චණ්ඩයහ. පුණ්ණ, සුනාපරන්ත දනව්වැසි මිනිස්සු පරුෂයහ. පුණ්ණ, ඉදින් තොපට සුනාපරන්තක මිනිස්සු ආක්‍රොශ කරන්නාහු නම් පරිභව කරන්නාහු නම් පුණ්ණ, එහි ලා තොපට කවර නම් සිතෙක් වන්නේ ද යි. වහන්ස, ඉදින් මට සුනාපරන්තක මිනිස්සු ආක්‍රොශ කරන්නාහු නම් පරිභව කරන්නාහු නම් එහි ලා මට මෙබඳු සිතෙක් වන්නේය: මේ සුනාපරන්තක මිනිස්සු ඒකාන්තයෙන් යහපත්හ. මේ සුනාපරන්තක මිනිස්සු ඒකාන්තයෙන් ඉතා යහපත්හ. යම්හෙයකින් මොහු මට අතින් පහර නො දෙද්ද, (එහෙයිනි) යි. භාග්‍යවතුන් වහන්ස, එහි ලා මට මෙබඳු සිතෙක් වන්නේ ය. සුගතයන් වහන්ස, එහි ලා මට මෙබඳු අදහසෙක් වන්නේ යි.

පුණ්ණ, ඉදින් සුනාපරන්තක මිනිස්සු තොපට අතින් පහර දෙන්නාහු නම් පුණ්ණ, එහි ලා තොපට කවර නම් සිතෙක් වන්නේ ද යි. වහන්ස, ඉදින් සුනාපරන්තක මිනිස්සු අතින් මට පහර දෙන්නාහු නම් එහි ලා මට මෙබඳු සිතෙක් වන්නේ ය:

"භද්දකා වතිමෙ සුනාපරන්තකා මනුස්සා, සුභද්දකා වතිමෙ සුනාපරන්තකා මනුස්සා යං මෙ නයිමෙ ලෙඩ්ඩුනා පහාරං දෙන්ති"ති එවමෙත්ථ භගවා භවිස්සති, එවමෙත්ථ සුගත භවිස්සතීති.

සචෙ පන තෙ පුණ්ණ, සුනාපරන්තකා මනුස්සා ලෙඩ්ඩුනා පහාරං දස්සන්ති, තත්‍ර පන තෙ පුණ්ණ, කින්ති භවිස්සතීති? සචෙ මෙ භන්තෙ සුනාපරන්තකා මනුස්සා ලෙඩ්ඩුනා පහාරං දස්සන්ති, තත්‍ර මෙ එවං භවිස්සති: "භද්දකා වතිමෙ සුනාපරන්තකා මනුස්සා සුභද්දකා වතිමෙ සුනාපරන්තකා මනුස්සා, යං මෙ නයිමෙ දණ්ඩෙන පහාරං දෙන්ති"ති. එවමෙත්ථ භගවා භවිස්සති එවමෙත්ථ සුගත භවිස්සතීති.

සචෙ පන තෙ පුණ්ණ සුනාපරන්තකා මනුස්සා දණ්ඩෙන පහාරං දස්සන්ති,[1] තත්‍ර පන තෙ පුණ්ණ කින්ති භවිස්සතීති? සචෙ මෙ භන්තෙ, සුනාපරන්තකා මනුස්සා දණ්ඩෙන පහාරං දස්සන්ති,[1] තත්‍ර මෙ එවං භවිස්සති: "භද්දකා වතිමෙ සුනාපරන්තකා මනුස්සා, සුභද්දකා වතිමෙ සුනාපරන්තකා මනුස්සා, යං මෙ නයිමෙ සත්ථෙන පහාරං දෙන්ති"ති. එවමෙත්ථ භගවා භවිස්සති, එවමෙත්ථ සුගත භවිස්සතීති.

සචෙ පන තෙ පුණ්ණ, සුනාපරන්තකා මනුස්සා සත්ථෙන පහාරං දස්සන්ති[1] තත්‍ර පන තෙ පුණ්ණ කින්ති භවිස්සතීති? සචෙ මෙ භන්තෙ සුනාපරන්තකා මනුස්සා සත්ථෙන පහාරං දස්සන්ති[1] තත්‍ර මෙ එවං භවිස්සති: "භද්දකා වතිමෙ සුනාපරන්තකා මනුස්සා සුභද්දකා වතිමෙ සුනාපරන්තකා මනුස්සා යං මං නයිමෙ තිණ්හෙන සත්ථෙන ජීවිතා වොරොපෙන්තීති. එවමෙත්ථ භගවා භවිස්සති, එවමෙත්ථ සුගත භවිස්සතීති.

---

1. දස්සෙන්ති - සිමු

මේ සුනාපරන්තක මිනිස්සු ඒකාන්තයෙන් යහපත්හ. මේ සුනාපරන්තක මිනිස්සු ඒකාන්තයෙන් ඉතා යහපත්හ. යම් හෙයකින් මොහු මට කැටගලින් පහර නො දෙද්ද, (එහෙයිනි) යි. භාග්‍යවතුන් වහන්ස, එහි ලා මට මෙබඳු සිතෙක් වන්නේ ය: සුගතයන් වහන්ස, එහි ලා මට මෙබඳු අදහසෙක් වන්නේ යි.

පුණ්ණ, ඉදින් සුනාපරන්තක මිනිස්සු තොපට කැටගලින් පහර දෙන්නාහු නම් එහි ලා තොපට කවර නම් සිතෙක් වන්නේ ද යි. වහන්ස, ඉදින් සුනාපරන්තක මිනිස්සු මට කැටගලින් පහර දෙන්නාහු නම් එහි ලා මට මෙබඳු සිතෙක් වන්නේ ය, මේ සුනාපරන්තක මිනිස්සු ඒකාන්තයෙන් යහපත්හ. මේ සුනාපරන්තක මිනිස්සු ඒකාන්තයෙන් ඉතා යහපත්හ. යම්-හෙයකින් මොහු මට දඬින් පහර නො දෙද්ද (එහෙයිනි) යි. භාග්‍යවතුන් වහන්ස එහි ලා මට මෙබඳු සිතෙක් වන්නේ ය. සුගතයන් වහන්ස, එහි ලා මට මෙබඳු අදහසෙක් වන්නේ යි.

පුණ්ණ, ඉදින් සුනාපරන්තක මිනිස්සු තොපට දඬින් පහර දෙන්නාහු නම් පුණ්ණ, එහි ලා තොපට කවර නම් සිතෙක් වන්නේ ද යි. වහන්ස, ඉදින් සුනාපරන්තක මිනිස්සු මට දඬින් පහර දෙන්නාහු නම් එහි ලා මට මෙබඳු සිතෙක් වන්නේ ය: මේ සුනාපරන්තක මිනිස්සු ඒකාන්තයෙන් යහපත්හ. මේ සුනා-පරන්තක මිනිස්සු ඒකාන්තයෙන් ඉතා යහපත්හ. යම් හෙයකින් මොහු මට සැතින් පහර නො දෙද්ද (එහෙයිනි) යි. භාග්‍යවතුන් වහන්ස, එහි ලා මට මෙබඳු සිතෙක් වන්නේ ය. සුගතයන් වහන්ස, එහි ලා මට මෙබඳු අදහසෙක් වන්නේ යි.

පුණ්ණ, ඉදින් සුනාපරන්තක මිනිස්සු තොපට සැතින් පහර දෙන්නාහු නම් පුණ්ණ, එහි ලා තොපට කවර නම් සිතෙක් වන්නේ ද යි. වහන්ස, ඉදින් සුනාපරන්තක මිනිස්සු මට සැතින් පහර දෙන්නාහු නම් එහි ලා මට මෙබඳු සිතෙක් වන්නේ ය. මේ සුනාපරන්තක මිනිස්සු ඒකාන්තයෙන් යහපත්හ. මේ සුනාපරන්තක මිනිස්සු ඒකාන්තයෙන් ඉතා යහපත්හ. යම් හෙයකින් මොහු තියුණු සැතින් මා දිවියෙන් තොර නො කෙරෙද් ද, (එහෙයිනි) යි. භාග්‍යවතුන් වහන්ස, එහි ලා මට මෙබඳු සිතෙක් වන්නේ ය. සුගතයන් වහන්ස, එහි ලා මට මෙබඳු අදහසෙක් වන්නේ යි.

සචෙ පන තං[1] පුණ්ණ සුනාපරන්තකා මනුස්සා තිණ්හෙන සත්ථෙන ජීවිතා වොරොපෙස්සන්ති, තත්‍ර පන තෙ පුණ්ණ කින්ති භවිස්සතීති? සචෙ මං භන්තෙ සුනාපරන්තකා මනුස්සා තිණ්හෙන සත්ථෙන ජීවිතා වොරොපෙස්සන්ති, තත්‍ර මෙ එවං භවිස්සති: ''සන්ති ඛො තස්ස භගවතො සාවකා කායෙන ච ජීවිතෙන ච අට්ටීයමානා හරායමානා ජිගුච්ඡමානා සත්ථහාරකං පරියෙසන්ති, තමෙව ඉදං අපරයිට්ඨංමෙව[3] සත්ථහාරකං ලද්ධන්ති'', එවමෙත්ථ භගවා භවිස්සති, එවමෙත්ථ සුගත භවිස්සතීති.

සාධු සාධු පුණ්ණ සක්ඛිස්සසි ඛො ත්වං පුණ්ණ ඉමිනා දමූපසමෙන සමන්නාගතො සුනාපරන්තස්මිං ජනපදෙ වත්ථුං, යස්සදානි ත්වං පුණ්ණ කාලං මඤ්ඤසීති.

අථ ඛො ආයස්මා පුණ්ණො භගවතො භාසිතං[4] අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා සෙනාසනං සංසාමෙත්වා පත්තචීවරං ආදාය යෙන සුනාපරන්තො ජනපදො තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන සුනාපරන්තො ජනපදො තදවසරි. තත්‍ර සුදං ආයස්මා පුණ්ණො සුනාපරන්තස්මිං ජනපදෙ විහරති.

අථ ඛො ආයස්මා පුණ්ණො තෙනෙවන්තරවස්සෙන පඤ්චමත්තානි උපාසකසතානි පටිවෙදෙසි, ''තෙනෙව අන්තරවස්සෙන පඤ්චමත්තානි උපාසිකාසතානි පටිවෙදෙසි[5] '' තෙනෙවන්තරවස්සෙන තිස්සො විජ්ජා සච්ඡාකාසි, තෙනෙවන්තරවස්සෙන පරිනිබ්බායි.

අථ ඛො සම්බහුලා භික්ඛූ යෙන භගවා තෙනුපසඞ්කමිංසු -පෙ- එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං ''යො සො භන්තෙ පුණ්ණො නාම කුලපුත්තො භගවතා සඞ්ඛිත්තෙන ඔවාදෙන ඔවදිතො සො කාලකතො තස්ස කා ගති? කො අභිසම්පරායොති? පණ්ඩිතො භික්ඛවෙ, පුණ්ණො, කුලපුත්තො අහොසි පච්චපාදි[6] ධම්මස්සානුධම්මං, න ච මං ධම්මාධිකරණං විහෙසෙසි[7], පරිනිබ්බුතො භික්ඛවෙ පුණ්ණො කුලපුත්තොති.

## 1. 9. 6

### බාහියසුත්තං

89. අථ ඛො ආයස්මා **බාහියො** යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො ආයස්මා බාහියො භගවන්තං එතදවොච, සාධු මෙ භන්තෙ, භගවා සඞ්ඛිත්තෙන ධම්මං දෙසෙතු යමහං භගවතො ධම්මං සුත්වා එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරෙය්‍යන්ති.

1. තෙ - සයා, මජසං
2. මෙ - සයා, මජසං
3. අපරියිට්ඨංයෙසුඤ්ඤව - මජසං පරියිට්ඨංයෙසුඤ්ඤව - සයා
4. වචනං - මජසං
5. පටිපාදෙසි - සී 1, 2, පටිදෙසෙසි - සයා
6. සච්චවාදී - සයා, කුලපුත්තො පච්චපාද - මජසං
7. විහෙඨෙසි - මජසං

පුණ්ණ, ඉදින් සුනාපරන්තක මිනිස්සු තියුණු සැතින් තොප දිවියෙන් තොර කරන්නාහු නම් පුණ්ණ, එහි ලා තොපට කවර නම් සිතෙක් වන්නේ ද යි. වහන්ස, ඉදින් සුනාපරන්තක මිනිස්සු තියුණු සැතින් මා දිවියෙන් තොර කරන්නාහු නම් එහි ලා මට මෙබඳු සිතෙක් වන්නේ ය: ඒ භාග්‍යවතුන් වහන්සේගේ සව්වෝ කයින් ද දිවියෙන් ද පෙළෙන්නාහු ලජ්ජිත වන්නාහු පිළිකුල් කරන්නාහු ඇත්තාහ. (ඔහු) සැත් එළවාගැන්මක් සොයත්. ඒ මේ සැත්එළවා ගැන්ම මා විසින් නොසොයන ලදුව ම ලද යි, භාග්‍යවතුන් වහන්ස, එහි ලා මට මෙබඳු සිතෙක් වන්නේ ය. සුගතයන් වහන්ස, එහි ලා මට මෙබඳු අදහසෙක් වන්නේ යි.

පුණ්ණ, මැනවි, මැනවි. පුණ්ණ, මේ ඉන්ද්‍රියදමනයෙන් හා සංහිඳීමෙන් යුක්ත වූ තෙපි සුනාපරන්ත දනව්වෙහි වසන්නට හැකිවවු. පුණ්ණ, තෙපි දැන් එයට කල් දනිවු යි.

ඉක්බිති ආයුෂ්මත් පුණ්ණ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව පිළිගෙන අනුමෝදන් ව හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට සෙනසුන සකසා තබා පාසිවුරු ගෙන සුනාපරන්ත දනව්ව වෙත චාරිකාවට නික්ම ගියහ. පිළිවෙළින් චාරිකාව කරන්නේ සුනාපරන්තදනව්වට එළැඹියේ ය. ආයුෂ්මත් පුණ්ණ තෙරණුවෝ එහි සුනාපරන්තදනව්වෙහි වැඩ-වෙසෙති.

එකල්හි ආයුෂ්මත් පුණ්ණ තෙරණුවෝ ඒ ඇතුළුවස ම පන්සියක් පමණ උවසුවන්ට ධර්මාවබෝධය කරවූහ. ඒ ඇතුළුවස ම පන්සියක් පමණ උවැසියන්ට ධර්මාවබෝධය කරවූහ. ඒ ඇතුළුවස ම ත්‍රිවිද්‍යා පසක්කළහ. ඒ ඇතුළුවස ම පිරිනිවියහ.

එකල්හි බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ ... එකත්පස් ව හුන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ: වහන්ස, "පුණ්ණ නම් යම් ඒ කුලපුතෙක් භාග්‍යවතුන් වහන්සේ විසින් ලුහුඩු අවවාදයකින් අවවාද කරන ලද්දේ ද හේ කලුරිය කෙළේ ය. ඔහුගේ ගති කවර ? පරලොව කිමෙක් ද" යි. මහණෙනි, පුණ්ණ කුලපුත් පණ්ඩිත විය. නවලොවුතුරුදහමට අනු ව පිළිපන්නේ ය. ධර්මාවබෝධය නිමිති කොට මට වෙහෙස ද නො කෙළේ ය. මහණෙනි පුණ්ණ කුලපුත් පිරිනිවියේ යි.

## 1. 9. 6

## බාහිය සූත්‍රය

89. එකල්හි ආයුෂ්මත් බාහිය තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. ... එකත්පස් ව හුන් ආයුෂ්මත් බාහිය තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ: වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේගේ යම් දහමක් අසා එකලා ව ගණයා කෙරෙන් වෙන් වූයෙම් නො පමාව කෙලෙස් තවන වෙර ඇතියෙම් නිවන් පිණිස මෙහෙයූ සිත් ඇතියෙම් වෙසෙන්නෙම් නම් භාග්‍යවතුන් වහන්සේ එබඳු දහමක් සැකෙවින් මට දේශනා කරන සේක්වා යි.

තං කිම්මඤ්ඤසි බාහිය, "චක්ඛුං නිච්චං වා අනිච්චං වාති. අනිච්චං භන්තෙ. යම්පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති. දුක්ඛං භන්තෙ. යම්පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලන්නුතං සමනුපස්සිතුං "එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා"ති. නො හෙතං භන්තෙ.

රූපා නිච්චා වා අනිච්චා වාති. අනිච්චා භන්තෙ -පෙ- චක්ඛුවිඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති. අනිච්චං භන්තෙ -පෙ- චක්ඛුසම්ඵස්සො නිච්චො වා අනිච්චො වාති. අනිච්චො භන්තෙ -පෙ- යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තම්පි නිච්චං වා අනිච්චං වාති. අනිච්චං භන්තෙ. යම්පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති. දුක්ඛං භන්තෙ. යම්පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං "එතං මම එසො'හමස්මි එසො මෙ අත්තා"ති. නො හෙතං භන්තෙ.

එවං පස්සං බාහිය, සුතවා අරියසාවකො චක්ඛුස්මිම්පි නිබ්බින්දති, රූපෙසුපි නිබ්බින්දති, චක්ඛුවිඤ්ඤාණෙපි නිබ්බින්දති, චක්ඛුසම්ඵස්සෙපි -පෙ- යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තස්මිම්පි නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති, විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති, ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

අථ ඛො ආයස්මා බාහියො භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි. අථ ඛො ආයස්මා බාහියො එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො[1] න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති තදනුත්තරං බ්‍රහ්මචරිය පරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි.

ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසි, අඤ්ඤතරො ච පනායස්මා බාහියො අරහතං අහොසීති.

---

1. විහරති - සතා

බාහිය, ඒ කිමැයි හඟිහි ද, ඇස නිත්‍ය හෝ වේ ද, අනිත්‍ය හෝ වේ දැ යි. වහන්ස, අනිත්‍ය ය. යමක් අනිත්‍ය නම් එය දුක් හෝ වේ ද සුව හෝ වේ දැ යි. වහන්ස, දුක් ය. යමක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වනසුලු නම් එය ''මේ මාගේ ය, මේ මම වෙමි, මේ මාගේ ආත්ම යයි දක්නට සුදුසු දැ යි. වහන්ස, මෙය නො වේ ම ය.

රූප නිත්‍ය හෝ වේ ද අනිත්‍ය හෝ වේ දැ යි. වහන්ස, අනිත්‍ය ය. .. චක්ඛුවිඤ්ඤාණය නිත්‍ය හෝ වේ ද අනිත්‍ය හෝ වේ දැ යි. වහන්ස, අනිත්‍ය ය. ... චක්ඛුසම්ඵස්සය නිත්‍ය හෝ වේ ද අනිත්‍ය හෝ වේ දැ යි. වහන්ස, අනිත්‍ය ය. ... මනොසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් හෙ ද නිත්‍ය හෝ වේ ද අනිත්‍ය හෝ වේ දැ යි. වහන්ස, අනිත්‍ය ය. යමක් අනිත්‍ය නම් එය දුක් හෝ වේ ද සුව හෝ වේ දැ යි. වහන්ස, දුක් ය. යමක් අනිස නම් දුක් නම් වෙනස් වනසුලු නම් එය ''මේ මාගේ ය, මේ මම වෙමි, මේ මාගේ ආත්ම ය''යි දක්නට සුදුසු දැ යි. වහන්ස, මෙය නො වේ ම ය.

බාහිය, මෙසේ දක්නා ශ්‍රුතවත් ආය්‍යීශ්‍රාවක ඇසෙහිත් කලකිරෙයි. රූපයෙහිත් කලකිරෙයි. චක්ඛුවිඤ්ඤණයෙහිත් කලකිරෙයි. චක්ඛුසම්ඵස්සයෙහිත් ... චක්ඛුසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් එහිත් කලකිරෙයි. කලකිරෙන්නේ නො ඇලෙයි. නො ඇලුම් හෙයින් මිදෙයි. මිදුන කල්හි මිදුනේ යයි දැනීම වෙයි. ජාතිය ගෙවිණ. බඹසර වැස නිමවන ලදී. රහත්බව පිණිස කළයුතු දැ කරන ලදී. මේ (රහත්බව) පිණිස අනෙකක් නැතැ යි දැනගනී යි.

ඉක්බිති ආයුෂ්මත් බාහිය තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව පිළිගෙන අනුමෝදන් ව හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට ගියේ ය. ඒකල්හි ආයුෂ්මත් බාහිය තෙරණුවෝ එකලා ව ගණයා කෙරෙන් වෙන් ව නො පමා ව කෙලෙස් තවන වෙර ඇති ව නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති ව වෙසෙන්නාහු කුලපුත්‍රයෝ යමක් පිණිස මැනවින් ම ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වෙත් නම් මගබඹසර කෙළවර වූ අනුත්‍යර වූ ඒ අර්හත්ත්වය නො බෝ කලකින් ම තුමූ වෙසෙසින් දැන පසක් කොට ඊට එළඹ විසූහ.

ජාතිය ගෙවිණ. බඹසර වැස නිමවන ලදී. රහත්බව පිණිස කළ යුතු කරන ලදී. මේ (රහත්) බව පිණිස අනෙකක් නැතැ යි දැනගත්හ. ආයුෂ්මත් බාහිය තෙරණුවෝ රහතුන් අතුරෙන් එක්තරා කෙනෙක් ද වූහ යි.

## 1. 9. 7

## එජාසුත්තං

90. එජා භික්ඛවෙ රොගො, එජා ගණ්ඩො, එජා සල්ලං, තස්මාතිහ භික්ඛවෙ, තථාගතො අනෙජො විහරති වීතසල්ලො. තස්මාතිහ භික්ඛවෙ, භික්ඛු චෙපි ආකඞ්ඛෙය්‍ය අනෙජො විහරෙය්‍යං වීතසල්ලොති: චක්ඛුං න මඤ්ඤෙය්‍ය, චක්ඛුස්මිං න මඤ්ඤෙය්‍ය, චක්ඛුතො න මඤ්ඤෙය්‍ය, චක්ඛුං මෙති න මඤ්ඤෙය්‍ය. රූපෙ න මඤ්ඤෙය්‍ය රූපෙසු න මඤ්ඤෙය්‍ය, රූපතො න මඤ්ඤෙය්‍ය, රූපා මෙති න මඤ්ඤෙය්‍ය. චක්ඛුවිඤ්ඤාණං න මඤ්ඤෙය්‍ය, චක්ඛුවිඤ්ඤාණස්මිං න මඤ්ඤෙය්‍ය, චක්ඛුවිඤ්ඤාණතො න මඤ්ඤෙය්‍ය, චක්ඛුවිඤ්ඤාණ මෙති න මඤ්ඤෙය්‍ය. චක්ඛුසම්ඵස්සං න මඤ්ඤෙය්‍ය, චක්ඛුසම්ඵස්සස්මිං න මඤ්ඤෙය්‍ය, චක්ඛුසම්ඵස්සතො න මඤ්ඤෙය්‍ය චක්ඛුසම්ඵස්සො මෙති න මඤ්ඤෙය්‍ය. යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි න මඤ්ඤෙය්‍ය තස්මිම්පි න මඤ්ඤෙය්‍ය, තතොපි න මඤ්ඤෙය්‍ය, තං මෙති න මඤ්ඤෙය්‍ය.

සොතං න මඤ්ඤෙය්‍ය, සොතස්මිං න මඤ්ඤෙය්‍ය -පෙ- ඝානං න මඤ්ඤෙය්‍ය, ඝානස්මිං න මඤ්ඤෙය්‍ය -පෙ- ජිව්හං න මඤ්ඤෙය්‍ය, ජිව්හාය න මඤ්ඤෙය්‍ය, ජිව්හාතො න මඤ්ඤෙය්‍ය, ජිව්හා මෙති න මඤ්ඤෙය්‍ය. රසෙ න මඤ්ඤෙය්‍ය -පෙ- ජිව්හාවිඤ්ඤාණං න මඤ්ඤෙය්‍ය -පෙ- ජිව්හාසම්ඵස්සං න මඤ්ඤෙය්‍ය -පෙ- යම්පිදං ජිව්හාසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි න මඤ්ඤෙය්‍ය, තස්මිම්පි න මඤ්ඤෙය්‍ය, තතොපි න මඤ්ඤෙය්‍ය, තම්මෙති න මඤ්ඤෙය්‍ය.

කායං න මඤ්ඤෙය්‍ය -පෙ- මනං න මඤ්ඤෙය්‍ය මනස්මිං න මඤ්ඤෙය්‍ය, මනතො න මඤ්ඤෙය්‍ය, මනො මෙති න මඤ්ඤෙය්‍ය. ධම්මෙ න මඤ්ඤෙය්‍ය -පෙ- මනොවිඤ්ඤාණං න මඤ්ඤෙය්‍ය -පෙ- මනොසම්ඵස්සං න මඤ්ඤෙය්‍ය -පෙ- යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි න මඤ්ඤෙය්‍ය තස්මිම්පි න මඤ්ඤෙය්‍ය තතොපි න මඤ්ඤෙය්‍ය තම්මෙති න මඤ්ඤෙය්‍ය. සබ්බං න මඤ්ඤෙය්‍ය, සබ්බස්මිං න මඤ්ඤෙය්‍ය සබ්බතො න මඤ්ඤෙය්‍ය, සබ්බං මෙති න මඤ්ඤෙය්‍ය.

## 1. 9. 7

## එජා සූත්‍රය

90. මහණෙනි, තෘෂ්ණාව රෝගයෙකි. තෘෂ්ණාව ගඩෙකි. තෘෂ්ණාව හුලෙකි. මහණෙනි, එහෙයින් මෙහිලා තථාගත තෙමේ තෘෂ්ණා රහිත ව පහ වූ හුල් ඇති ව වෙසේ. මහණෙනි, ඉදින් මෙහි මහණ ද තෘෂ්ණා රහිත ව හුල් නැති ව වෙසෙන්නෙමි යි කැමති වන්නේ නම්, චක්ෂුස ආත්මය යි නො හඟනේ යැ. චක්ෂුසෙහි ආත්මය ඇතැයි නො හඟනේ යැ. චක්ෂුසින් බැහැර ආත්මය ඇතැයි නො හඟනේ යැ. චක්ෂුස මාගේ යයි නො හඟනේ යැ. රූපයන් ආත්මය යි නො හඟනේ යැ. රූපයන්හි ආත්මය ඇතැයි නො හඟනේ යැ. රූපයෙන් බැහැර ආත්මය ඇතැයි නො හඟනේ යැ. රූපයෝ ආත්මය අයත් යයි නො හඟනේ යැ. චක්ෂුර්විඥානය ආත්මය යි නො හඟනේ යැ. චක්ෂුර්විඥානයෙහි ආත්මය ඇතැයි නො හඟනේ යැ. චක්ෂුර්විඥානයෙන් බැහැර ආත්මය ඇතැයි නො හඟනේ යැ. චක්ෂුර්විඥානය ආත්මය අයත් යයි නො හඟනේ යැ. චක්ෂුස්සංස්පර්ශය ආත්මය යි නො හඟනේ යැ. චක්ෂුස්සංස්පර්ශයෙහි ආත්මය ඇතැයි නො හඟනේ යැ. චක්ෂුස්සංස්පර්ශයෙන් බැහැර ආත්මය ඇතැයි නො හඟනේ යැ. චක්ෂුස්සංස්පර්ශය ආත්මය අයත් යයි නො හඟනේ යැ. චක්ෂුස්පර්ශය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් විඳුමෙක් උපදී නම් එය ආත්මය යි ද නො හඟනේ යැ. එහි ආත්මය ඇතැයි ද නො හඟනේ යැ. එයින් බැහැර ආත්මය ඇතැයි ද නො හඟනේ යැ. එය මාගේ යයි ද නො හඟනේ යි.

ශ්‍රෝත්‍රය ආත්මය යි නො හඟනේ යැ. ශ්‍රෝත්‍රයෙහි ආත්මය ඇතැ යි නො හඟනේ යැ ... ඝ්‍රාණය ආත්මය යි නො හඟනේ යැ. ඝ්‍රාණයෙහි ආත්මය ඇතැයි නො හඟනේ යැ.... ජිහ්වාව ආත්මය යි නො හඟනේ යැ. ජිහ්වායෙහි ආත්මය ඇතැ යි නො හඟනේ යැ. ජිහ්වායෙන් බැහැර ආත්මය ඇතැ යි නො හඟනේ යැ ජිහ්වාව මාගේ යයි නො හඟනේ යැ. රසය ආත්මය යි නො හඟනේ යැ. ... ජිහ්වාවිඥානය ... ජිහ්වාසංස්පර්ශය ... නො හඟනේ යැ ... ජිහ්වා–සංස්පර්ශය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වෙදයිතයෙක් උපදනේ නම් එ ද ආත්මය යි නො හඟනේ යැ. එහිදු ආත්මය ඇතැ යි නො හඟනේ යැ. ඉන් බැහැර දු ආත්මය ඇතැයි නො හඟනේ යැ. එය මාගේ යයි ද නො හඟනේ යි.

කය ආත්මය යි නො හඟනේ ය ... සිත ආත්මය යි නො හඟනේ ය· සිතෙහි නො හඟනේ ය. සිතින් නො හඟනේ ය. සිත මාගේ යයි නො හඟනේ ය. දහම් නො හඟනේ ය. මනෝවිඥාණය නො හඟනේ ය ... මනෝසංස්පර්ශය නො හඟනේ ය ... මනෝසංස්පර්ශය නිසා සුව වූ හෝ දුක්වූ හෝ නො දුක් නොසුව වූ හෝ යම් වෙදයිතයෙක් උපදී නම් එයත් නො හඟනේ ය. එහිත් නො හඟනේ ය. එයිනුත් නො හඟනේ ය. එයත් මාගේ යයි නො හඟනේ යි.

සො එවං න මඤ්ඤමානො න ච කිඤ්චි[1] ලොකෙ උපාදියති අනුපාදියං න පරිතස්සති, අපරිතස්සං පච්චත්තඤ්ඤෙව පරිනිබ්බායති, ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 9. 8

### දුතියඑජාසුත්තං

91. එජා භික්ඛවෙ රොගො එජා ගණ්ඩො එජා සල්ලං, තස්මාතිහ භික්ඛවෙ, තථාගතො අනෙජො විහරති වීතසල්ලො, තස්මාතිහ භික්ඛවෙ, භික්ඛු චෙපි ආකඞ්ඛෙය්‍ය අනෙජො විහරෙය්‍යං වීත-සල්ලොති. චක්ඛුං න මඤ්ඤෙය්‍ය, චක්ඛුස්මිං න මඤ්ඤෙය්‍ය, චක්ඛුතො න මඤ්ඤෙය්‍ය, චක්ඛුං මෙති න මඤ්ඤෙය්‍ය. රූපෙ න මඤ්ඤෙය්‍ය -පෙ- චක්ඛුවිඤ්ඤාණං න මඤ්ඤෙය්‍ය -පෙ- චක්ඛුසම්ඵස්සං න මඤ්ඤෙය්‍ය -පෙ- යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි න මඤ්ඤෙය්‍ය, තස්මිම්පි න මඤ්ඤෙය්‍ය තතොපි න මඤ්ඤෙය්‍ය, තං මෙති න මඤ්ඤෙය්‍ය. යං හි භික්ඛවෙ[2] මඤ්ඤති, යස්මිං මඤ්ඤති, යතො මඤ්ඤති, යං මෙති මඤ්ඤති, තතො තං හොති අඤ්ඤථා. අඤ්ඤථාභාවී භවසත්තො ලොකො භවමෙවාභිනන්දති.

සොතං න මඤ්ඤෙය්‍ය -පෙ- ඝානං න මඤ්ඤෙය්‍ය -පෙ- ජිව්හං න මඤ්ඤෙය්‍ය, ජිව්හාය න මඤ්ඤෙය්‍ය, ජිව්හාතො න මඤ්ඤෙය්‍ය, ජිව්හා මෙති න මඤ්ඤෙය්‍ය. රසෙ න මඤ්ඤෙය්‍ය -පෙ- ජිව්හාවිඤ්ඤාණං -පෙ- ජිව්හාසම්ඵස්සං -පෙ- යම්පිදං ජිව්හාසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි න මඤ්ඤෙය්‍ය, තස්මිම්පි න මඤ්ඤෙය්‍ය, තතොපි න මඤ්ඤෙය්‍ය තම්මෙති න මඤ්ඤෙය්‍ය. යං හි[2] භික්ඛවෙ මඤ්ඤති යස්මිං මඤ්ඤති යතො මඤ්ඤති යං මෙති මඤ්ඤති, තතො තං හොති අඤ්ඤථා අඤ්ඤථාභාවී භවසත්තො ලොකො භවමෙවාභිනන්දති.

කායං න මඤ්ඤෙය්‍ය -පෙ- මනං න මඤ්ඤෙය්‍ය, මනස්මිං න මඤ්ඤෙය්‍ය, මනතො න මඤ්ඤෙය්‍ය, මනො මෙති න මඤ්ඤෙය්‍ය.

1. න කිඤ්චිපි - මජසං.
2. යං භික්ඛවෙ - සීමු.

සියල්ල නො හඟනේ ය. සියල්ලෙහි නො හඟනේ ය. සියල්ලෙන් නො හඟනේ ය. සියල්ල මාගේ යයි නො හඟනේ ය. හෙ මෙසේ නො හඟනේ ලොව කිසිවක් (තෘෂ්ණා දෘෂ්ටිවශයෙන්) නො ගනී. නො ගන්නේ නො තැතිගනී. නො තැතිගන්නේ තෙමේ ම පිරිනිවෙයි. ඉපැද්ම ගෙවිණ. බඹසර වැස නිමවන ලදී. කටයුතු කරන ලදී. මේ රහත්බව පිණිස අනෙකක් නැතැ යි දනගනි යි.

## 1. 9. 8

## දුතිය එජා සූත්‍රය

91. මහණෙනි, තෘෂ්ණාව රෝගයෙකි. තෘෂ්ණාව ගඩෙකි. තෘෂ්ණාව හුලෙකි. මහණෙනි, එහෙයින් මෙහි ලා තථාගත තෙමේ තෘෂ්ණා රහිත ව පහ වූ හුල් ඇති ව වෙසේ. මහණෙනි, එහෙයින් ඉදින් මෙසස්නෙහි මහණ තෘෂ්ණා රහිත ව පහ වූ හුල් ඇති ව වෙසෙන්නෙමි යි කැමති වන්නේ නම් ඇස තෘෂ්ණාවශයෙන් නො හඟනේ ය. ඇසෙහි නො හඟනේ ය. ඇසින් නො හඟනේ ය. චක්‍ෂුස මාගේ යයි නො හඟනේ ය. රූප නො හඟනේ ය ... චක්‍ෂුර්විඥානය නො හඟනේ ය ... චක්‍ඛුසම්ඵස්සය නො හඟනේ ය ... චක්‍ඛුසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නො සුව වූ හෝ යම් වෙදයිතයෙක් උපදී නම් එයත් නො හඟනේ ය. එහිත් නො හඟනේ ය. එයිනුත් නො හඟනේ ය. එයත් මාගේ යයි නො හඟනේ ය. මහණෙනි, යමක් තෘෂ්ණාවශයෙන් හඟී ද, යමෙක්හි හඟී ද යමකින් හඟී ද, යමක් මාගේ යයි හඟී ද එයින් එය අන් පරිදි වේ. අන් පරිදි වනසුලු වූ භවයෙහි ඇලුනු ලෝවැසි තෙමේ භවය ම පතයි.

ශොත්‍රය නො හඟනේ ය ... ඝ්‍රාණය නො හඟනේ ය. ජිහ්වාව ආත්මය යි නො හඟනේ ය. ජිව්හායෙහි ආත්මය ඇතැ යි නො හඟනේ ය. ජිව්හායෙන් බැහැර ආත්මය ඇතැ යි නො හඟනේ ය. ජිව්හා මාගේ යයි නො හඟනේ ය. රස ආත්මය යි නො හඟනේ ය... ජිව්හාවිඤ්ඤාණය ආත්මය යි නො හඟනේ ය ... ජිව්හාසම්ඵස්සය ආත්මය යි නො හඟනේ ය ... ජිව්හාසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් එයත් ආත්මය යි නො හඟනේ ය. එහිත් ආත්මය ඇතැ යි නො හඟනේ ය. එයින් බැහැර ද ආත්මය ඇතැ යි නො හඟනේ ය. එයත් මාගේ යයි නො හඟනේ ය. මහණෙනි, යමක් තෘෂ්ණා වශයෙන් හඟී ද යමෙක්හි හඟී ද යමකින් හඟී ද යමක් මාගේ යයි හඟී ද එයින් එය අන් පරිදි වේ. අන් පරිදි වනසුලු වූ භවයෙහි ඇලුනු ලෝවැසි තෙමේ භවය ම පතයි.

කය ආත්මය යි නො හඟනේ ය ... සිත ආත්මය යි නො හඟනේ ය. සිතෙහි ආත්මය ඇතැ යි නො හඟනේ ය. සිතින් බැහැර ආත්මය ඇතැයි නො හඟනේ ය. සිත මාගේ යයි නො හඟනේ ය.

ධම්මෙ න මඤ්ඤෙය්‍ය -පෙ- මනොවිඤ්ඤාණං -පෙ- මනොසම්ඵස්සං -පෙ- යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි න මඤ්ඤෙය්‍ය, තස්මිම්පි න මඤ්ඤෙය්‍ය, තතොපි න මඤ්ඤෙය්‍ය, තං මෙති න මඤ්ඤෙය්‍ය. යං හි[1] භික්ඛවෙ, මඤ්ඤති, යස්මිං මඤ්ඤති, යතො මඤ්ඤති, යං මෙති මඤ්ඤති තතො තං හොති අඤ්ඤථා. අඤ්ඤථාභාවී භවසත්තො ලොකො භවමෙවාභිනන්දති.

යාවතා භික්ඛවෙ, ඛන්ධධාතුආයතනා තම්පි න මඤ්ඤෙය්‍ය, තස්මිම්පි න මඤ්ඤෙය්‍ය, තතොපි න මඤ්ඤෙය්‍ය, තං මෙති න මඤ්ඤෙය්‍ය. සො එවං අමඤ්ඤමානො න ච කිඤ්චි[2] ලොකෙ උපාදියති අනුපාදියං න පරිතස්සති, අපරිතස්සං පච්චත්තඤ්ඤෙව පරිනිබ්බායති, ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 9. 9

### ද්වයසුත්තං

92. ද්වයං වො භික්ඛවෙ දෙසිස්සාමි, තං සුණාථ. කිඤ්ච භික්ඛවෙ ද්වයං? චක්ඛුඤ්චෙව රූපා ච, සොතඤ්චෙව සද්දා ච, ඝානඤ්චෙව ගන්ධා ච, ජිව්හාචෙව රසා ච, කායො චෙව ඵොට්ඨබ්බා ච, මනො චෙව ධම්මා ච, ඉදං වුච්චති භික්ඛවෙ ද්වයං.

යො භික්ඛවෙ එවං වදෙය්‍ය: "අහමෙතං ද්වයං පච්චක්ඛාය අඤ්ඤං ද්වයං පඤ්ඤපෙස්සාමී"ති. තස්ස වාචාවත්ථුරෙවස්ස, පුට්ඨො ච න සම්පායෙය්‍ය, උත්තරිඤ්ච විඝාතං ආපජ්ජෙය්‍ය, තං කිස්ස හෙතු? යථා තං භික්ඛවෙ අවිසයස්මින්ති.

1. යම්හි - සීමු
2. න කිඤ්චි - සීමු මජ්සං.

දහම් (අරමුණු) ආත්මය යි නො හඟනේ ය ... මනෝවිඤ්ඤාණය මනෝසම්ඵස්සය ... මනෝසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වේදයිතයෙක් උපදී නම් එයත් ආත්මය යි නො හඟනේ ය. එහිත් ආත්මය ඇතැ යි නො හඟනේ ය. එයින් බැහැර ද ආත්මය ඇතැ යි නො හඟනේ ය. එයත් මාගේ යයි නො හඟනේ ය. මහණෙනි, යමක් හඟී ද, යමෙක්හි හඟී ද, යමෙකින් හඟී ද, යමක් මාගේ යයි හඟී ද, එයින් එය අන් පරිදි වේ. අන් පරිදි වනසුලු වූ භවයෙහි ඇලුණු ලෝවැසි තෙමේ භවය ම පතයි.

මහණෙනි, යම්තාක් ස්කන්ධ ධාතු ආයතනයෝ වෙත් නම් එයත් ආත්මය යි නො හඟනේ ය. එහිත් ආත්මය ඇතැ යි නො හඟනේ ය. එයින් බැහැර ද ආත්මය ඇතැ යි නො හඟනේ ය. එයත් මාගේ යුයි නො හඟනේ ය. හෙ මෙසේ නො හඟනේ ලොව කිසිවක් දැඩි සේ නො ගනී. නො ගන්නේ නො තැති ගනී. නො තැති ගන්නේ තෙමේ ම පිරිනිවෙයි. ඉපැද්ම ගෙවිණ. බඹසර වැස නිමවන ලදී. රහත්බව පිණිස කළ යුතු දෑ කරන ලදී. මේ රහත්බව පිණිස අනෙකක් නැතැ යි දැනගනී යි.

## 1. 9. 9

## ද්වය සූත්‍රය

92. මහණෙනි, තොපට දෙකක් (දෙ කොටසක් පිළිබඳ ධර්‍මයක්) දේශනා කරන්නෙමි. එය අසවු. මහණෙනි, දෙක කිමෙක් ද යත්: ඇස ද රූ ද, කන ද සද ද, නැහැය ද ගඳ ද, දිව ද රස ද, කය ද පහස් ද, සිත ද දහම් අරමුණ දැයි මහණෙනි මේ දෙක යයි කියනු ලැබේ.

මහණෙනි, යමෙක් මෙසේ කියන්නේ ද මම මේ (දහම්) දෙක පිළිකෙව් කොට අනෙක් දෙකක් පනවන්නෙමි යි. (ඒ) ඔහු ගේ වචනමාත්‍රයෙක් ම වන්නේ ය. පුළුවුස්නා ලද්දේ ද සපයා කියන්නට නොහැකි වන්නේ ය. මතු ද වෙහෙසට පැමිණෙන්නේ ය. ඒ කවර හෙයින යත්: මහණෙනි, අවිෂය කරුණෙහි යම් සේ නම් එමෙනි යි.

## 1. 9. 10

## දුතියද්වයසුත්තං

93. ද්වයං භික්ඛවෙ, පටිච්ච විඤ්ඤාණං සම්භොති. කථඤ්ච භික්ඛවෙ, ද්වයං පටිච්ච විඤ්ඤාණං සම්භොති? චක්ඛුඤ්ච පටිච්ච රූපෙ උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං, චක්ඛුං[1] අනිච්චං විපරිණාමි අඤ්ඤථාභාවි. රූපා අනිච්චා විපරිණාමිනො අඤ්ඤථාභාවිනො, ඉත්ථෙතං ද්වයං චලඤ්චෙව ව්‍යයඤ්ච[2] අනිච්චං විපරිණාමි අඤ්ඤථාභාවි. චක්ඛුවිඤ්ඤාණං අනිච්චං විපරිණාමි අඤ්ඤථාභාවි, යොපි හෙතු යොපි පච්චයො චක්ඛුවිඤ්ඤාණස්ස අඤ්ඤථාභාවි උප්පාදය, සොපි හෙතු සොපි පච්චයො අනිච්චො විපරිණාමී අඤ්ඤථාභාවි. අනිච්චං ඛො පන භික්ඛවෙ පච්චයං පටිච්ච සමුප්පන්නං චක්ඛුවිඤ්ඤාණං කුතො නිච්චං භවිස්සති.

යා ඛො භික්ඛවෙ, ඉමෙසං තිණ්ණං ධම්මානං සඞ්ගති සන්නිපාතො සමවායො අයං වුච්චති භික්ඛවෙ චක්ඛුසම්ඵස්සො[3]. චක්ඛුසම්ඵස්සොපි අනිච්චො විපරිණාමී අඤ්ඤථාභාවී, යොපි හෙතු යොපි පච්චයො චක්ඛුසම්ඵස්සස්ස උප්පාදය, සොපි හෙතු සොපි පච්චයො අනිච්චො විපරිණාමී අඤ්ඤථාභාවී, අනිච්චං ඛො පන භික්ඛවෙ පච්චයං පටිච්ච උප්පන්නො චක්ඛුසම්ඵස්සො කුතො නිච්චො භවිස්සති. ඵුට්ඨො භික්ඛවෙ වෙදෙති, ඵුට්ඨො සඤ්ජානාති, ඵුට්ඨො චෙතෙති, ඉත්ථෙතෙපි ධම්මා චලා චෙව ව්‍යයා ච අනිච්චා විපරිණාමිනො අඤ්ඤථාභාවිනො.

සොතඤ්ච පටිච්ච සද්දෙ උප්පජ්ජති සොතවිඤ්ඤාණං -පෙ- ඝානඤ්ච පටිච්ච ගන්ධෙ උප්පජ්ජති ඝානවිඤ්ඤාණං -පෙ- ජිව්හඤ්ච පටිච්ච රසෙ උප්පජ්ජති ජිව්හාවිඤ්ඤාණං, ජිව්හා අනිච්චා විපරිණාමී[4] අඤ්ඤථාභාවී[5], රසා අනිච්චා විපරිණාමිනො අඤ්ඤථාභාවිනො, ඉත්ථෙතං ද්වයං චලඤ්චෙව ව්‍යයඤ්ච අනිච්චං විපරිණාමී අඤ්ඤථාභාවී, ජිව්හාවිඤ්ඤාණං අනිච්චං විපරිණාමි අඤ්ඤථාභාවි, යොපි හෙතු යොපි පච්චයො ජිව්හාවිඤ්ඤාණස්ස උප්පාදය, සොපි හෙතු සොපි පච්චයො අනිච්චො විපරිණාමී අඤ්ඤථාභාවී, අනිච්චං ඛො පන භික්ඛවෙ පච්චයං පටිච්ච උප්පන්නං ජිව්හාවිඤ්ඤාණං කුතො නිච්චං භවිස්සති.

---

1. චක්ඛු - සීමු. මජසං.
2. බ්‍යයඤ්ච - මජසං. ස්‍යා.
3. අයං වුච්චති චක්ඛුසම්ඵස්සො - මජසං, සී2.
4. විපරිණාමිනී?
5. අඤ්ඤථාභාවිනී?

# 1. 9. 10

## දුතිය ද්වය සූත්‍රය

93. මහණෙනි (හේතුය - ප්‍රත්‍යය යන ධර්‍ම) දෙකක් නිසා **විඤ්ඤාණය** හටගනී. මහණෙනි කෙසේ නම් දෙකක් නිසා විඤ්ඤාණය හටගනී ද යත්: ඇසත් රූත් නිසා **චක්ඛුවිඤ්ඤාණය** උපදී. ඇස අනිසය. පෙරලෙනසුලු ය. වෙනස් වනසුලු ය. රූ අනිසයහ. පෙරලෙන සුල්ලහ. වෙනස් වනසුල්ලහ. මෙසේ මේ දෙක සැලෙන්නේත් වැය වන්නේත් වෙයි. අනිසය පෙරලෙන සුලුය වෙනස් වනසුලු ය. ඇස් විනැණ අනිසය. පෙරලෙනසුලුය. වෙනස් වනසුලුය. ඇස්විනැණ ඉපදීම පිණිස යම් හෙතුවකුත් යම් ප්‍රත්‍යයකුත් වේ නම් ඒ හෙතුවත් ඒ ප්‍රත්‍යයත් අනිස ය. පෙරලෙනසුලු ය. වෙනස් වනසුලුය. මහණෙනි, අනිත්‍ය වූ ප්‍රත්‍යය නිසා හටගත් **චක්ඛුවිඤ්ඤාණය** කොයින් නිත්‍ය වන්නේ ද.

මහණෙනි, මේ තුන්දහමුන්ගේ යම් එක්වීමෙක් රැස්වීමෙක් සමාගමයෙක් වේ නම් මහණෙනි මේ **චක්ඛුසම්ඵස්ස** යයි කියනු ලැබේ. **චක්ඛුසම්ඵස්සය** ද අනිත්‍යය. පෙරලෙනසුලුය. වෙනස් වන සුලුය. **චක්ඛුසම්ඵස්සයේ** ඉපදීමට යම් හේතුවකුත් යම් ප්‍රත්‍යයකුත් වේ නම් ඒ හේතුවත් ඒ ප්‍රත්‍යයත් අනිත්‍ය ය. පෙරලෙනසුලු ය. වෙනස් වනසුලුය. මහණෙනි අනිත්‍ය වූ ප්‍රත්‍යය නිසා උපන් **චක්ඛු-සම්ඵස්සය** කොයින් නිත්‍ය වන්නේ ද. මහණෙනි පහස්නා ලද්දේ විඳි යි. පහස්නා ලද්දේ හඳුනයි. පහස්නා ලද්දේ සිතයි. මෙසේ මේ දහම්හු ද සැලෙන්නෝත් වැය වන්නෝත් වෙති. අනිත්‍යයහ. පෙරලෙන සුල්ලහ. වෙනස් වනසුල්ලහ.

කනත් ශබ්දයනුත් නිසා සෝතවිඤ්ඤාණය උපදියි ... නැහැයත් ගඳත් නිසා ඝානවිඤ්ඤාණය උපදියි ... දිවත් රසත් නිසා **ජිව්හා-විඤ්ඤාණය** උපදියි ... දිව අනිත්‍ය ය. පෙරලෙනසුලු ය. වෙනස් වනසුලු ය. රස අනිත්‍ය ය. පෙරලෙනසුලු ය. වෙනස් වනසුලු ය. මෙසේ මේ දෙක සැලෙන්නේත් වැය වන්නේත් වේ. අනිත්‍ය ය. පෙරලෙනසුලු ය. වෙනස් වනසුලු ය. **ජිව්හාවිඤ්ඤාණය** අනිත්‍ය ය. පෙරලෙනසුලු ය. වෙනස් වනසුලු ය. **ජිව්හාවිඤ්ඤාණයේ** ඉපැද්මට යම් හේතුවකුත් යම් ප්‍රත්‍යයකුත් වේ නම් ඒ හේතුවත් ඒ ප්‍රත්‍යයත් අනිත්‍ය ය. පෙරලෙනසුලු ය. වෙනස් වනසුලුය. මහණෙනි අනිත්‍ය වූ ප්‍රත්‍යය නිසා උපන් **ජිව්හාවිඤ්ඤාණය** කොයින් නිත්‍ය වන්නේ ද.

යා ඛො භික්ඛවෙ ඉමෙසං තිණ්ණං ධම්මානං සඞ්ගති සන්නිපාතො සමවායො, අයං වුච්චති භික්ඛවෙ ජිව්හාසම්ඵස්සො. ජිව්හාසම්ඵස්සොපි අනිච්චො විපරිණාමී අඤ්ඤථාභාවී. යොපි හෙතු යොපි පච්චයො ජිව්හාසම්ඵස්සස්ස උප්පාදය සොපි හෙතු සොපි පච්චයො අනිච්චො විපරිණාමී අඤ්ඤථාභාවී. අනිච්චං ඛො පන භික්ඛවෙ පච්චයං පටිච්ච උප්පන්නො ජිව්හාසම්ඵස්සො කුතො නිච්චො භවිස්සති. ඵුට්ඨො භික්ඛවෙ වෙදෙති. ඵුට්ඨො සඤ්ජානාති. ඵුට්ඨො චෙතෙති. ඉත්ථෙතෙපි ධම්මා චලා චෙව ව්‍යයා ච, අනිච්චා විපරිණාමිනො අඤ්ඤථාභාවිනො.

කායඤ්ච පටිච්ච ඵොට්ඨබ්බෙ උප්පජ්ජති කායවිඤ්ඤාණං -පෙ- මනඤ්ච පටිච්ච ධම්මෙ උප්පජ්ජති මනොවිඤ්ඤාණං, මනො අනිච්චො විපරිණාමී අඤ්ඤථාභාවී. ධම්මා අනිච්චා විපරිණාමිනො අඤ්ඤථා-භාවිනො. ඉත්ථං ද්වයං චලඤ්චෙව ව්‍යයඤ්ච, අනිච්චං විපරිණාමී අඤ්ඤථාභාවී. මනොවිඤ්ඤාණං අනිච්චං විපරිණාමි අඤ්ඤථාභාවී. යොපි හෙතු යොපි පච්චයො මනොවිඤ්ඤාණස්ස උප්පාදය, සොපි හෙතු සොපි පච්චයො අනිච්චො විපරිණාමී අඤ්ඤථාභාවී. අනිච්චං ඛො පන භික්ඛවෙ පච්චයං පටිච්ච උප්පන්නං මනොවිඤ්ඤාණං කුතො නිච්චං භවිස්සති.

යා ඛො භික්ඛවෙ ඉමෙසං තිණ්ණං ධම්මානං සඞ්ගති සන්නිපාතො සමවායො අයං වුච්චති භික්ඛවෙ මනොසම්ඵස්සො, මනොසම්ඵස්සොපි අනිච්චො විපරිණාමී අඤ්ඤථාභාවී.

යොපි හෙතු යොපි පච්චයො මනොසම්ඵස්සස්ස උප්පාදය, සොපි හෙතු සොපි පච්චයො අනිච්චො විපරිණාමී අඤ්ඤථාභාවී. අනිච්චං ඛො පන භික්ඛවෙ පච්චයං පටිච්ච උප්පන්නො මනොසම්ඵස්සො කුතො නිච්චො භවිස්සති. ඵුට්ඨො භික්ඛවෙ වෙදෙති, ඵුට්ඨො සඤ්ජානාති, ඵුට්ඨො චෙතෙති, ඉත්ථෙතෙපි ධම්මා චලා චෙව ව්‍යයා ච, අනිච්චා විපරිණාමිනො අඤ්ඤථාභාවිනො. එවං ඛො භික්ඛවෙ ද්වයං පටිච්ච විඤ්ඤාණං සම්භොතීති.

## ඡන්නවග්ගො නවමො

**තත්‍රුද්දානං:**

පලොක සුඤ්ඤ සඞ්ඛිත්තං[1] - ඡන්නො පුණ්ණො ච බාහියො
එජෙන ච ද්වෙ වුත්තා - ද්වයෙහි අපරෙ ද්වෙති.

1. පලොකසුඤ්ඤා සඞ්ඛිත්තෙන - සීමු.

මහණෙනි මේ තුන්දහමුන්ගේ යම් එක්වීමෙක් රැස් වීමෙක් සමාගමයෙක් වේ නම්, මහණෙනි මේ ජිව්හාසම්ඵස්ස යයි කියනු ලැබේ. ජිව්හාසම්ඵස්සයත් අනිත්‍ය ය. පෙරලෙනසුලුය. වෙනස් වනසුලුය. ජිව්හාසම්ඵස්සයේ ඉපැද්මට යම් හේතුවකුත් යම් ප්‍රත්‍යයකුත් වේ නම් ඒ හේතුවත් ඒ ප්‍රත්‍යයත් අනිත්‍ය ය. පෙරලෙනසුලු ය. වෙනස් වනසුලු ය. මහණෙනි අනිත්‍ය වූ ප්‍රත්‍යය නිසා උපන් ජිව්හාසම්ඵස්සය කොයින් නිත්‍ය වන්නේ ද. මහණෙනි, පහස්නා ලද්දේ විඳියි. පහස්නා ලද්දේ හඳුනයි. පහස්නා ලද්දේ සිතයි. මෙසේ මේ දහම්හු ද සැලෙන්නෝත් වැය වන්නෝත් වෙති. අනිත්‍යයහ. පෙරලෙනසුල්ලහ. වෙනස් වනසුල්ලහ.

කයත් පහසත් නිසා කායවිඤ්ඤාණය උපදී ... සිතත් දහමුත් නිසා මනෝවිඤ්ඤාණය උපදී. සිත අනිත්‍ය ය. පෙරලෙනසුලු ය. වෙනස් වනසුලු ය. දහම් අනිත්‍ය ය. පෙරලෙනසුලු ය. වෙනස් වනසුලු ය. මෙසේ මේ දෙක සැලෙන්නේත් නැසෙන්නේත් වෙයි. අනිත්‍යය. පෙරලෙනසුලු ය. වෙනස් වනසුලු ය. මනෝවිඤ්ඤාණය අනිත්‍යය. පෙරලෙනසුලු ය. වෙනස් වනසුලුය. මනෝවිඤ්ඤාණයේ. ඉපද්මට යම් හේතුවකුත් යම් ප්‍රත්‍යයකුත් වේ නම් ඒ හේතුවත් ඒ ප්‍රත්‍යයත් අනිත්‍ය ය. පෙරලෙනසුලු ය. වෙනස් වනසුලු ය. මහණෙනි, අනිත්‍ය වූ ප්‍රත්‍යය නිසා උපන් මනෝවිඤ්ඤාණය කොයින් නිත්‍ය වන්නේ ද.

මහණෙනි, මේ තුන් දහමුන්ගේ යම් එක්වීමෙක් රැස්වීමෙක් සමාගමයෙක් වේ නම්, මහණෙනි මේ මනෝසම්ඵස්ස යයි කියනු ලැබේ. මනොසම්ඵස්සය ද අනිත්‍ය ය. පෙරලෙනසුලු ය. වෙනස් වන සුලු ය.

මනෝසම්ඵස්සයේ ඉපද්මට යමකුත් හේතු වේ නම් යමකුත් ප්‍රත්‍යය වේ නම් ඒ හේතුවත් ඒ ප්‍රත්‍යයත් අනිත්‍ය ය. පෙරලෙනසුලු ය. වෙනස් වනසුලු ය. මහණෙනි අනිත්‍ය වූ ප්‍රත්‍යය නිසා උපන් මනොසම්ඵස්සය කොයින් නිත්‍ය වන්නේ ද. මහණෙනි, පහස්නා ලද්දේ විඳියි. පහස්නා ලද්දේ හඳුනයි. පහස්නා ලද්දේ සිතයි. මෙසේ මේ දහම්හු ද සැලෙන්නෝත් නැසෙන්නෝත් වෙති. අනිත්‍යයහ. පෙරලෙනසුල්ලහ. වෙනස් වනසුල්ලහ. මහණෙනි මෙසේ දෙකක් නිසා විඤ්ඤාණය හටගනී යි.

**නවවැනි ඡන්න වර්ග යි.**

**එහි සූත්‍ර නාමාවලිය:**

පලොක, සුඤ්ඤ, සඞ්ඛිත්ත, ඡන්න, පූණ්ණ, බාහිය යන සූත්‍ර සයෙක් ද එජා නමින් දෙකෙක් ද, ද්වය නමින් අනෙක් දෙකෙක් දැයි සූත්‍ර දශයෙක් වදරන ලදී.

# 10. ඡළවග්ගො

## 1. 10. 1

### ඡඵස්සායතනසුත්තං

94. ඡයිමෙ[1] භික්ඛවෙ ඵස්සායතනා අදන්තා අගුත්තා අරක්ඛිතා අසංවුතා දුක්ඛාධිවාහා හොන්ති. කතමෙ ඡ?

චක්ඛුං භික්ඛවෙ ඵස්සායතනං අදන්තං අගුත්තං අරක්ඛිතං අසංවුතං දුක්ඛාධිවාහං හොති. සොතං භික්ඛවෙ ඵස්සායතනං -පෙ- ඝානං භික්ඛවෙ ඵස්සායතනං -පෙ- ජිව්හා භික්ඛවෙ ඵස්සායතනං අදන්තං අගුත්තං අරක්ඛිතං අසංවුතං දුක්ඛාධිවාහං හොති. කායො භික්ඛවෙ ඵස්සායතනං -පෙ- මනො භික්ඛවෙ ඵස්සායතනං අදන්තං අගුත්තං අරක්ඛිතං අසංවුතං දුක්ඛාධිවාහං හොති. ඉමෙ ඛො භික්ඛවෙ ඡ ඵස්සායතනා අදන්තා අගුත්තා අරක්ඛිතා අසංවුතා දුක්ඛාධිවාහා හොන්ති.

ඡයිමෙ භික්ඛවෙ ඵස්සායතනා සුදන්තා සුගුත්තා සුරක්ඛිතා සුසංවුතා සුඛාධිවාහා හොන්ති. කතමෙ ඡ?

චක්ඛුං භික්ඛවෙ ඵස්සායතනං සුදන්තං සුගුත්තං සුරක්ඛිතං සුසංවුතං සුඛාධිවාහං හොති. සොතං භික්ඛවෙ ඵස්සායතනං -පෙ- ඝානං භික්ඛවෙ ඵස්සායතනං -පෙ- ජිව්හා භික්ඛවෙ ඵස්සායතනං සුදන්තං සුගුත්තං සුරක්ඛිතං සුසංවුතං සුඛාධිවාහං හොති. කායො භික්ඛවෙ ඵස්සායතනං -පෙ- මනො භික්ඛවෙ ඵස්සායතනං සුදන්තං සුගුත්තං සුරක්ඛිතං සුසංවුතං සුඛාධිවාහං හොති. ඉමෙ ඛො භික්ඛවෙ ඡ ඵස්සායතනා සුදන්තා සුගුත්තා සුරක්ඛිතා සුසංවුතා සුඛාධිවාහා හොන්තීති.

ඉදමවොච භගවා. ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:

---

1. ඡ ඉමෙ - සීමු.

# 10. ජල වර්ගය

## 1. 10. 1

### ඡ ඵස්සායතන සූත්‍රය

94. මහණෙනි මේ ස්පර්ශායතනයෝ සදෙන දමනය නොකරන ලද්දාහු ගෝපනය නොකරන ලද්දාහු නොරක්නා ලද්දාහු සංවර නොකරන ලද්දාහු දුක් එළවන්නෝ වෙති. කවර සදෙනෙක් ද යත්:

මහණෙනි ඇස නමැති ස්පර්ශායතනය දමනය නොකරන ලද්දේ ගෝපනය නොකරන ලද්දේ නොරක්නා ලද්දේ සංවර නොකරන ලද්දේ දුක් එළවන්නේ වෙයි. මහණෙනි කන නමැති ස්පර්ශායතනය ... මහණෙනි නැහැය නමැති ස්පර්ශායතනය ... මහණෙනි දිව නමැති ස්පර්ශායතනය දමනය නොකරන ලද්දේ ගෝපනය නොකරන ලද්දේ නොරක්නා ලද්දේ සංවර නොකරන ලද්දේ දුක් එළවන්නේ වේ. මහණෙනි කය නමැති ස්පර්ශායතනය ... මහණෙනි සිත නමැති ස්පර්ශායතනය දමනය නොකරන ලද්දේ ගෝපනය නොකරන ලද්දේ නො රක්නා ලද්දේ සංවර නොකරන ලද්දේ දුක් එළවන්නේ වේ. මහණෙනි මේ ස්පර්ශායතනයෝ සදෙන දමනය නොකරන ලද්දාහු ගෝපනය නොකරන ලද්දාහු නොරක්නා ලද්දාහු සංවර නොකරන ලද්දාහු දුක් එළවන්නෝ වෙති.

මහණෙනි මේ ස්පර්ශායතනයෝ සදෙන මැනවින් දමනය කරන ලද්දාහු මැනවින් ගෝපනය කරන ලද්දාහු මැනවින් රක්නා ලද්දාහු මැනවින් සංවර කරන ලද්දාහු සැප එළවන්නෝ වෙති. කවර සදෙනෙක් ද යත්:

මහණෙනි ඇස නමැති ස්පර්ශායතනය මැනවින් දමනය කරන ලද්දේ මැනවින් ගෝපනය කරන ලද්දේ මැනවින් රක්නා ලද්දේ මැනවින් සංවර කරන ලද්දේ සුව එළවන්නේ වේ. මහණෙනි කන නමැති ස්පර්ශායතනය ... මහණෙනි නැහැය නමැති ස්පර්ශායතනය ... මහණෙනි, දිව නමැති ස්පර්ශායතනය මැනවින් දමනය කරන ලද්දේ මැනවින් ගෝපනය කරන ලද්දේ මැනවින් රක්නා ලද්දේ මැනවින් සංවර කරන ලද්දේ සුව එළවන්නේ වේ. මහණෙනි, කය නමැති ස්පර්ශායතනය ... මහණෙනි සිත නමැති ස්පර්ශායතනය මැනවින් දමනය කරන ලද්දේ මැනවින් ගෝපනය කරන ලද්දේ මැනවින් රක්නා ලද්දේ මැනවින් සංවර කරන ලද්දේ සුව එළවන්නේ වේ. මහණෙනි මේ ස්පර්ශායතනයෝ සදෙන මැනවින් දමනය කරන ලද්දාහු මැනවින් ගෝපනය කරන ලද්දාහු මැනවින් රක්නා ලද්දාහු මැනවින් සංවර කරන ලද්දාහු සුව එළවන්නෝ වෙති යි.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සුගත වූ ශාස්තෘන් වහන්සේ මෙය වදරා යළි මතු ද මෙල වදාළ සේක:

ඡළෙව ඵස්සායතනානි භික්ඛවො
අසංවුතො යත්ථ දුක්ඛං නිගච්ඡති,
තෙසඤ්ච යෙ සංවරණං අවෙදිසුං
සද්ධාදුතියා විහරන්තානවස්සුතා.

දිස්වාන රූපානි මනොරමානි
අථොපි දිස්වා අමනොරමානි
මනොරමෙ රාගපථං විනොදයෙ
න චප්පියං[1] මෙති මනං පදොසයෙ

සද්දඤ්ච සුත්වා දුභයං පියාප්පියං
පියම්හි සද්දෙ න සමුච්ඡිතො සියා
අථොප්පියෙ[2] දොසගතං විනොදයෙ
න චප්පියං මෙති මනං පදොසයෙ

ගන්ධඤ්ච ඝාත්වා සුරභිං මනොරමං
අථොපි ඝාත්වා අසුචිං අකන්තියං
අකන්තියස්මිං පටිඝං විනොදයෙ
ඡන්දානුනීතො න ච කන්තියෙ[3] සියා

රසඤ්ච භොත්වා සාදිතඤ්ච සාදුං[4]
අථොපි භොත්වාන අසාදුමෙකදා
සාදුං රසං නාජ්ඣොසාය භුඤ්ජෙ
විරොධමාසාදුසු නොපදංසයෙ

ඵස්සෙන ඵුට්ඨො න සුඛෙන මජ්ජෙ[5]
දුක්ඛෙන ඵුට්ඨොපි න සම්පවෙධෙ
ඵස්සද්වයං සුඛදුක්ඛෙ[6] උපෙක්ඛෙ[7]
අනානුරුද්ධො අවිරුද්ධකෙනචි

පපඤ්චසඤ්ඤා ඉතරීතරා නරා
පපඤ්චයන්තා උපයන්ති සඤ්ඤිනො
මනොමයං ගෙහසිතඤ්ච සබ්බං
පනුජ්ජ නෙක්ඛම්මසිතං ඉරීයති

එවං මනො ඡස්සු යද සුභාවිතො
ඵුට්ඨස්ස චිත්තං න විකම්පතෙ කවචි
තෙ රාගදොසෙ[8] අභිභුය්‍ය භික්ඛවො
භවාථ[9] ජාතිමරණස්ස පාරගාති.

1. න වාප්පියං - ස්‍යා, මජසං
2. අථප්පියං - සී 2.
3. කන්තියො - සීමු.
4. පරිතඤ්ච සාදු - ස්‍යා; සාදිතඤ්චසාදුං - සී 2. අසාදිතඤ්චසාදුං - මජසං, සාදිතඤ්චසාදුඤ්ච සීමු.
5. මජ්ඣෙ - ස්‍යා, සී2.
6. සුඛදුක්ඛං - ස්‍යා.
7. උපෙක්ඛො - සීමු.
8. රාගදොසං - සීමු.
9. භවත්ථ - මජසං.

මහණෙනි, යම් ස්පර්ශායතනයක සංවරණය නො වූයේ දුකට පැමිණේ නම් එබඳු ස්පර්ශායතන සයෙක්ම ය. යම් කෙනෙක් ඔවුන්ගේ සංවරණය ලැබුවාහු නම් (ඔහු) ශ්‍රද්ධාව දෙවැන්න කොට ඇත්තාහු කෙලෙසුන්ගෙන් තෙත් නො වූවාහු වෙසෙත්.

මනහර රූ දක යලි නොමනහර රූ ද දක මනාහර රූහි රාගය දුරු කරන්නේ ය. (නොමනහර රූහි) මට අප්‍රිය යයි සිත නො කෙලෙසන්නේ ය.

ප්‍රිය වූ ද අප්‍රිය වූ ද දෙවැදෑරුම් ශබ්දයත් අසා ප්‍රිය වූ ශබ්දයෙහි මුසපත් වූයේ නො වන්නේ ය. නැවත අප්‍රිය ශබ්දයෙහි ද්වෙෂය දුරු කරන්නේ ය. මට අප්‍රිය යයි සිත නො ද කෙලෙසන්නේ ය.

මනහර මිහිරි සුවඳ ආඝ්‍රාණය කොට යලි දු අප්‍රිය වූ දුගඳ ද ආඝ්‍රාණය කොට අප්‍රිය වූ දුගඳෙහි ද්වේෂය දුරු කරන්නේ ය. කැමති වූ සුවඳෙහි ඇල්මට පමුණුවන ලද්දෙක් නොවන්නේ ය.

රස විඳිය යුතු මිහිරි රසත් අනුභව කොට වැලි දු ඇතැම් අනෙක් අමිහිරි රස ද අනුභව කොට මිහිරි රස ගැලී නො වළඳන්නේ ය. අමිහිරි රසෙහි විරෝධයක් නො දක්වන්නේ ය.

සුවපහසින් පහස්නා ලද්දේ මත් නො වන්නේ ය. දුකින් පහස්නා ලද්දේ ද නො සැලෙන්නේ ය. කිසිවකු හා විරුද්ධ නොවන්නේ නො ඇලෙන්නේ සුවදුක් දෙක්හි වූ පහස් දෙක මැදිහත් ව දක්නේ ය.

ක්ලේශසංඥා ඇති හෙයින් ප්‍රපඤ්ච සංඥ වූ ඉතා ලාමක සත්ත්වයෝ පමා වන්නාහු සසරට පැමිණෙත්. (නුවණැති මහණ තෙමේ) පඤ්චකාමනිශ්‍රිත සියලු මනෝමය විතර්කයන් දුරු කොට නෛෂ්ක්‍රම්‍යය ඇසුරු කොට පවතී මැ යි.

මෙසේ යම් කලෙක සාරමුණෙහි සිත මැනවින් වඩනා ලද්දේ වේ ද, සුව පහසෙකින් හෝ දුක් පහසෙකින් පහස්නා ලද ඔහුගේ සිත කොහිවත් නොසැලෙයි. මහණෙනි, ඒ තෙපි රාගද්වේෂයන් මැඩ ජාති-මරණයන්ගේ පරතෙර වූ නිවනට යන්නාහු වවයි.

## 1. 10. 2

## මාලුඞ්ක්‍යපුත්තසුත්තං

95. අථ ඛො ආයස්මා මාලුඞ්ක්‍යපුත්තො[1] යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො ආයස්මා මාලුඞ්ක්‍යපුත්තො භගවන්තං එතදවොච: සාධු මෙ භන්තෙ, භගවා සඞ්ඛිත්තෙන ධම්මං දෙසෙතු යමහං භගවතො ධම්මං සුත්වා එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරෙය්‍යන්ති.

එත්ථදානි මාලුඞ්ක්‍යපුත්ත කිං දහරෙ භික්ඛූ වක්ඛාම, යත්‍ර හි නාම ත්වං භික්ඛු ජිණ්ණො වුද්ධො මහල්ලකො අද්ධගතො වයොඅනුප්පත්තො සඞ්ඛිත්තෙන ඔවාදං යාචසීති. කිඤ්චාපාහං භන්තෙ ජිණ්ණො වුද්ධො මහල්ලකො අද්ධගතො වයොඅනුප්පත්තො, දෙසෙතු මෙ භන්තෙ භගවා සඞ්ඛිත්තෙන ධම්මං, දෙසෙතු මෙ සුගතො සඞ්ඛිත්තෙන ධම්මං, අප්පෙවනාමාහං භගවතො භාසිතස්ස අත්ථං ආජානෙය්‍යං, අප්පෙවනාමාහං භගවතො භාසිතස්ස දයාදෙ අස්සන්ති.

තං කිම්මඤ්ඤසි මාලුඞ්ක්‍යපුත්ත යෙ තෙ චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා අදිට්ඨා අදිට්ඨපුබ්බා, න ච පස්සසි, න ච තෙ හොති, පස්සෙය්‍යන්ති, අත්ථි තෙ තත්ථ ඡන්දො වා රාගො වා පෙමං වාති. නො හෙතං භන්තෙ.

යෙ තෙ සොතවිඤ්ඤෙය්‍යා සද්දා අස්සුතා අස්සුතපුබ්බා, න ච සුණාසි, න ච තෙ හොති සුණෙය්‍යන්ති, අත්ථි තෙ තත්ථ ඡන්දො වා රාගො වා පෙමං වාති. නො හෙතං භන්තෙ. යෙ තෙ ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා අඝායිතා අඝායිතපුබ්බා. න ච ඝායසි න ච තෙ හොති. ඝායෙය්‍යන්ති? අත්ථි තෙ තත්ථ ඡන්දො වා රාගො වා පෙමං වාති. නො හෙතං භන්තෙ.

යෙ තෙ ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා අසායිතා අසායිතපුබ්බා, න ච සායසි, න ච තෙ හොති සායෙය්‍යන්ති, අත්ථි තෙ තත්ථ ඡන්දො වා රාගො වා පෙමං වාති. නො හෙතං භන්තෙ. යෙ තෙ

1. මාලුක්‍යක්‍ය - මජසං, සයා.

## 1. 10. 2

## මාලුඞ්ක්‍යපුත්ත සූත්‍රය

95. එකල්හි ආයුෂ්මත් මාලුඞ්ක්‍යපුත්ත තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. ... එකත්පස් ව හුන් ආයුෂ්මත් මාලුඞ්ක්‍ය-පුත්ත තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ: වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේගේ යම් දහමක් අසා එකලා ව ගණයා කෙරෙන් වෙන් වූයෙම් නො පමා ව කෙලෙස් තවන වෙර ඇතියෙම් නිවන් පිණිස මෙහෙයූ සිත් ඇතියෙම් වෙසෙන්නෙම් නම් භාග්‍යවතුන් වහන්සේ එබඳු දහමක් මට සැකෙවින් දේශනා කරන සේක්වා යි.

මාලුඞ්ක්‍යපුත්ත, දිරාගිය වැඩිසිටි මහලු වූ තුන්කල් ගත වූ පිළිවෙළින් පැසුට වියට පැමිණි මහණකු වූ යම්බඳු තෙපි සැකෙවින් අවවාද යදින්නහු නම් මෙහි ලා දුන් තරුණ භික්ෂූන්ට කුමක් කියන්නෙම් ද යි. වහන්ස, මම දිරුයෙම් වැඩිසිටියෙම් මහලු වූයෙම් තුන්කල් ගත වූයෙම් පිළිවෙළින් පැසුළු වයසට පැමිණියෙම් නමුදු, වහන්ස භාග්‍යවතුන් වහන්සේ සැකෙවින් මට දහම් දෙසන සේක්වා. සුගතයන් වහන්සේ සැකෙවින් මට දහම් දෙසන සේක්වා. මම භාග්‍යවතුන් වහන්සේගේ දේශනාවෙහි අරුත් දැනගන්නෙම් නම් මැනවි. මම භාග්‍යවතුන් වහන්සේගේ දේශනාවට හිමිකරුවෙක් වන්නෙම් නම් මැනවැ යි.

මාලුඞ්ක්‍යපුත්ත, ඒ කිමැයි හඟිවු ද, චක්ඛුවිඤ්ඤාණයෙන් දත යුතු වූ නුදුටු නුදුටුවිරූ යම් ඒ රූපයෝ වෙද්ද, (ඔවුන්) නො ද දකිවු නම් ඔවුන් දකින්නෙමි යි. තොපට නො ද සිතෙක් වේ නම් තොපට එහි ඡන්දයෙක් හෝ රාගයෙක් හෝ ප්‍රේමයෙක් හෝ ඇද්ද යි. වහන්ස මෙය නො වේ ම ය.

නො ඇසූ නො ඇසූවිරූ සෝතවිඤ්ඤාණයෙන් දතයුතු යම් ඒ ශබ්දයෝ වෙද්ද (ඔවුන්) නො ද අසවු නම් අසන්නට තොපට සිතෙක් නො ද වේ නම් එහි තොපට ඡන්දයෙක් හෝ රාගයෙක් හෝ ප්‍රේමයෙක් හෝ ඇද්ද යි. වහන්ස මෙය නො වේ ම ය. ආඝ්‍රාණය නොකළ ආඝ්‍රාණය නොකළ විරූ යම් ඒ ගන්ධයෝ වෙද්ද, (ඔවුන්) නො ද ආඝ්‍රාණය කරවු නම් ආඝ්‍රාණය කරන්නෙමි යි සිතෙක් නො ද වේ නම් එහි තොපට ඡන්දයෙක් හෝ රාගයෙක් හෝ ප්‍රේමයෙක් හෝ ඇද්ද යි. වහන්ස මෙය නො වේ ම ය.

ආස්වාදනය නොකළ ආස්වාදනය නොකළවිරූ ජිව්හාවිඤ්ඤාණ-යෙන් දතයුතු යම් ඒ රසයෝ වෙද්ද (ඔවුන්) නො ද ආස්වාදනය කරවු නම් ආස්වාදනය කරන්නෙමි යි සිතෙක් නො ද වේ නම් එහි තොපට ඡන්දයෙක් හෝ රාගයෙක් හෝ ප්‍රේමයෙක් හෝ ඇද්ද යි. වහන්ස මෙය

කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා අසම්ඵුට්ඨා අසම්ඵුට්ඨපුබ්බා න ච ඵුසසි, න ච තෙ හොති ඵුසෙය්‍යන්ති, අත්ථි තෙ තත්ථ ඡන්දො වා රාගො වා පෙමං වාති. නො හෙතං භන්තෙ. යෙ තෙ මනොවිඤ්ඤෙය්‍යා ධම්මා අවිඤ්ඤාතා අවිඤ්ඤාතපුබ්බා න ච විජානාසි, න ච තෙ හොති විජානෙය්‍යන්ති, අත්ථි තෙ තත්ථ ඡන්දො වා රාගො වා පෙමං වාති. නොහෙතං භන්තෙ.

එත්ථ ච තෙ මාලුඞ්ක්‍යපුත්ත දිට්ඨසුතමුතවිඤ්ඤාතබ්බෙසු ධම්මෙසු දිට්ඨෙ දිට්ඨමත්තං භවිස්සති, සුතෙ සුතමත්තං භවිස්සති, මුතෙ මුතමත්තං භවිස්සති, විඤ්ඤාතෙ විඤ්ඤාතමත්තං භවිස්සති. යතො ඛො තෙ මාලුඞ්ක්‍යපුත්ත දිට්ඨසුතමුතවිඤ්ඤාතබ්බෙසු ධම්මෙසු දිට්ඨෙ දිට්ඨමත්තං භවිස්සති, සුතෙ සුතමත්තං භවිස්සති, මුතෙ මුතමත්තං භවිස්සති, විඤ්ඤාතෙ විඤ්ඤාතමත්තං භවිස්සති, තතො ත්වං මාලුඞ්ක්‍යපුත්ත න තෙන, යතො ත්වං මාලුඞ්ක්‍යපුත්ත න තෙන, තතො ත්වං මාලුඞ්ක්‍යපුත්ත න තත්ථ; යතො ත්වං මාලුඞ්ක්‍යපුත්ත න තත්ථ, තතො ත්වං මාලුඞ්ක්‍යපුත්ත නෙවිධ න හුරං න උභයමන්තරෙන. එසෙවන්තො දුක්ඛස්සාති.

ඉමස්ස ඛ්වාහං භන්තෙ භගවතා සඞ්ඛිත්තෙන භාසිතස්ස එවං-විත්ථාරෙන[1] අත්ථං ආජානාමි.

රූපං දිස්වා සති මුට්ඨා පියනිමිත්තං[2] මනසි කරොතො
සාරත්තචිත්තො වෙදෙති තඤ්ච අජ්ඣොසාය[3] තිට්ඨති.
තස්ස වඩ්ඪන්ති වෙදනා අනෙකා රූපසම්භවා
අභිජ්ඣා ච විහෙසා ච චිත්තමස්සූපහඤ්ඤති
එවං ආචිනතො දුක්ඛං ආරා නිබ්බාණං[4] වුච්චති.

සද්දං සුත්වා සති මුට්ඨා පියං නිමිත්තං මනසි කරොතො
සාරත්තචිත්තො වෙදෙති තඤ්ච අජ්ඣොසාය තිට්ඨති
තස්ස වඩ්ඪන්ති වෙදනා අනෙකා සද්දසම්භවා
අභිජ්ඣා ච විහෙසා ච චිත්තමස්සූපහඤ්ඤති
එවං ආචිනතො දුක්ඛං ආරා නිබ්බාණං වුච්චති.

ගන්ධං ඝාත්වා සති මුට්ඨා පියං නිමිත්තං මනසි කරොතො
සාරත්තචිත්තො වෙදෙති තඤ්ච අජ්ඣොසාය තිට්ඨති.
තස්ස වඩ්ඪන්ති වෙදනා අනෙකා ගන්ධසම්භවා
අභිජ්ඣා ච විහෙසා ච චිත්තමස්සූපහඤ්ඤති
එවං ආචිනතො දුක්ඛං ආරා නිබ්බාණං වුච්චති

1. භාසිතස්ස විත්ථාරෙන – මජ්ඣං., ස්‍යා, සීමු.
2. පියනිමිත්තං – සීමු, සී 2.
3. අජ්ඣොසාය – මජ්ඣං, අජ්ඣොසා – ස්‍යා.
4. නිබ්බානං – මජ්ඣං. ස්‍යා.

නො වේ ම ය. නොපැහැසි නොපැහැසිවිරු කායවිඤ්ඤාණයෙන් දතයුතු යම් ඒ පහස්හු වෙත් නම් ඔවුන් නො ද පුසින්නහු නම් පුසින්නෙමියි සිතෙක් නො ද වේ නම් එහි තොපට ඡන්දයෙක් හෝ රාගයෙක් හෝ ප්‍රේමයෙක් හෝ ඇද්ද යි. වහන්ස, මෙය නො වේ ම ය. නොදත් නොදත්විරු මනෝවිඤ්ඤාණයෙන් දතයුතු යම් ඒ දහම්හු වෙද්ද, (ඔවුන්) නො ද දන්නහු නම් දැනගන්නෙමියි සිතෙක් නො ද වේ නම් එහි තොපට ඡන්දයෙක් හෝ රාගයෙක් හෝ ප්‍රේමයෙක් හෝ ඇද්ද යි. වහන්ස, මෙය නො වේ ම ය.

මාලුඞ්ක්‍යපුත්ත, මෙහි තොපට දුටු ඇසූ ගත් දතයුතු දහම් අතුරෙන් දක්නා ලද්දෙහි දුටු පමණෙක් වන්නේ ය. අසන ලද්දෙහි ඇසූ පමණෙක් වන්නේ ය. ගන්නා ලද්දෙහි ගත්පමණෙක් වන්නේ ය. දන්නා ලද්දෙහි දත්පමණෙක් වන්නේ ය. මාලුඞ්ක්‍යපුත්ත, යම් කලෙක තොපට දුටු ඇසූ ගත් දතයුතු දහම් අතුරෙන් දක්නා ලද්දෙහි දුටු පමණෙක් වන්නේ ද, අසන ලද්දෙහි ඇසූ පමණෙක් වන්නේ ද, ගන්නා ලද්දෙහි ගත්පමණෙක් වන්නේ ද, දන්නා ලද්දෙහි දත්පමණෙක් වන්නේ ද, මාලුඞ්ක්‍යපුත්ත එකල්හි තෙපි එයින් (රාගරක්තයෙක් දෙසදුසිතයෙක් මොහමුළ්හයෙක්) නොවන්නහු ය. යම්කලෙක තෙපි එයින් (රාගරක්තාදියෙක්) නොවන්නහු නම් මාලුඞ්ක්‍යපුත්ත, එකල්හි තෙපි එහි නොපිහිටි වන්නහු ය. මාලුඞ්ක්‍යපුත්ත යම් කලෙක තෙපි එහි නොපිහිටි වන්නහු නම් මාලුඞ්ක්‍යපුත්ත එකල්හි තෙපි මෙලොවත් නොවන්හු ය. පරලොවත් නොවන්නහු ය. දෙලොව ම නොවන්නහු ය. මෙය ම දුකේ කෙළවර යි.

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් වදළ මේ දේශනාවේ අරුත විතර විසින් මම මෙසේ දනිමි.

රූපය දැක ප්‍රිය අරමුණෙකැ යි මෙනෙහි කරන්නහුගේ සිහිය නටුයේ වෙසෙසින් ඇලුණු සිත් ඇත්තේ විඳියි. එය ගිලගෙන ද සිටියි.

ඔහුට රූපය නිසා හටගන්නා නොයෙක් වේදනාවෝ වැඩෙත්, දැඩිලෝභය ද වෙහෙස ද වැඩෙත්. නොහොත් දැඩිලෝභයෙන් හා වෙහෙසින් ඔහුගේ සිත පෙළෙයි. මෙසේ දුක් රැස්කරන්නහුට නිවන ඇත යයි කියනු ලැබේ.

ශබ්දය අසා ප්‍රිය අරමුණෙකැයි මෙනෙහි කරන්නහුගේ සිහිය නටුයේ වෙසෙසින් ඇලුණු සිත් ඇත්තේ විඳියි. එය ගිලගෙන ද සිටියි. ඔහුට ශබ්දය නිසා හටගන්නා නොයෙක් වේදනාවෝ වැඩෙත්. දැඩිලෝභය ද වෙහෙස ද වැඩෙත්. නොහොත් දැඩිලෝභයෙන් හා වෙහෙසින් ඔහුගේ සිත පෙළෙයි. මෙසේ දුක් රැස්කරන්නහුට නිවන ඇත යයි කියනු ලැබේ.

ගන්ධය ආඝ්‍රාණය කොට ප්‍රිය අරමුණෙකැ යි මෙනෙහි කරන්නහුගේ සිහිය නටුයේ වෙසෙසින් ඇලුණු සිත් ඇත්තේ විඳියි. එය ගිලගෙන ද සිටියි. ඔහුට ගන්ධය නිසා හටගන්නා නොයෙක් වේදනාවෝ වැඩෙත්. දැඩිලෝභය ද වෙහෙස ද වැඩෙත්. නොහොත් දැඩිලෝභයෙන් හා වෙහෙසින් ඔහුගේ සිත පෙළෙයි. මෙසේ දුක් රැස්කරන්නහුට නිවන ඇත යයි කියනු ලැබේ.

රසං භොත්වා සති මුට්ඨා පියං නිමිත්තං මනසි කරොතො
සාරත්තචිත්තො වෙදෙති තඤ්ච අජ්ඣොසාය තිට්ඨති
තස්ස වඩ්ඪන්ති වෙදනා අනෙකා රසසම්භවා
අභිජ්ඣා ච විහෙසා ච චිත්තමස්සූපහඤ්ඤති
එවං ආචිනතො දුක්ඛං ආරා නිබ්බානං වුච්චති.

ඵස්සං[1] ඵුස්ස සති මුට්ඨා පියං නිමිත්තං මනසි කරොතො
සාරත්තචිත්තො වෙදෙති තඤ්ච අජ්ඣොසාය තිට්ඨති
තස්ස වඩ්ඪන්ති වෙදනා අනෙකා ඵස්ස සම්භවා
අභිජ්ඣා ච විහෙසා ච චිත්තමස්සූපහඤ්ඤති
එවං ආචිනතො දුක්ඛං ආරා නිබ්බානං වුච්චති.

ධම්මං ඤත්වා සති මුට්ඨා පියං නිමිත්තං මනසි කරොතො
සාරත්තචිත්තො වෙදෙති තඤ්ච අජ්ඣොසාය තිට්ඨති
තස්ස වඩ්ඪන්ති වෙදනා අනෙකා ධම්මසම්භවා
අභිජ්ඣා ච විහෙසා ච චිත්තමස්සූපහඤ්ඤති
එවං ආචිනතො දුක්ඛං ආරා නිබ්බානං වුච්චති.

න සො රජ්ජති රූපෙසු රූපං දිස්වා පතිස්සතො[2]
විරත්තචිත්තො වෙදෙති තඤ්ච නාජ්ඣොසාය තිට්ඨති
යථාස්ස පස්සතො රූපං සෙවතො චාපි වෙදනං
ඛීයති නොපචීයති එවං සො චරතී සතො
එවං අපචිනතො දුක්ඛං සන්තිකෙ නිබ්බානං වුච්චති.

න සො රජ්ජති සද්දෙසු සද්දං සුත්වා පතිස්සතො
විරත්තචිත්තො වෙදෙති තඤ්ච නාජ්ඣොසාය තිට්ඨති
යථාස්ස සුණතො සද්දං සෙවතොචාපි වෙදනං
ඛීයති නො පචීයති එවං සො චරතී සතො
එවං අපචිනතො දුක්ඛං සන්තිකෙ නිබ්බානං වුච්චති.

න සො රජ්ජති ගන්ධෙසු ගන්ධං ඝාත්වා පතිස්සතො
විරත්තචිත්තො වෙදෙති තඤ්ච නාජ්ඣොසාය තිට්ඨති
යථාස්ස ඝායතො ගන්ධං සෙවතොචාපි වෙදනං
ඛීයති නොපචීයති එවං සො චරතී සතො
එවං අපචිනතො දුක්ඛං සන්තිකෙ නිබ්බානං වුච්චති.

න සො රජ්ජති රසෙසු රසං භොත්වා පතිස්සතො
විරත්තචිත්තො වෙදෙති තඤ්ච නාජ්ඣොසාය තිට්ඨති
යථාස්ස සායතො රසං සෙවතො චාපි වෙදනං
ඛීයති නො පචීයති එවං සො චරතී සතො
එවං අපචිනතො දුක්ඛං සන්තිකෙ නිබ්බානං වුච්චති.

1. ඵොට්ඨබ්බං - ස්‍යා.
2. පටිස්සතො - මජසං.

රස අනුභව කොට ප්‍රිය අරමුණෙකැ යි මෙනෙහි කරන්නහුගේ සිහිය නටුයේ වෙසෙසින් ඇලුණු සිත් ඇත්තේ විදියි. එස ගිලගෙන ද සිටියි. ඔහුට රස නිසා හටගන්නා වේදනාවෝ වැඩෙත්. දෘඪිලෝභය ද වෙහෙස ද වැඩෙත්. නොහොත් දෘඪිලෝභයෙන් හා වෙහෙසින් ඔහුගේ සිත පෙළෙයි. මෙසේ දුක් රැස්කරන්නහුට තිවන ඈත යයි කියනු ලැබේ.

පහස පැහැස ප්‍රිය අරමුණෙකැ යි මෙනෙහි කරන්නහුගේ සිහිය නටුයේ වෙසෙසින් ඇලුණු සිත් ඇත්තේ විදියි. එය ගිලගෙන ද සිටියි. ඔහුට පහස නිසා හටගන්නා නොයෙක් වේදනාවෝ වැඩෙත්. දෘඪි ලෝභය ද වෙහෙස ද වැඩෙත්. නොහොත් දෘඪිලෝභයෙන් හා වෙහෙසින් ඔහුගේ සිත පෙළෙයි. මෙසේ දුක් රැස්කරන්නහුට නිවන ඈත යයි කියනු ලැබේ.

දහම දැන ප්‍රිය අරමුණෙකැ යි මෙනෙහි කරන්නහුගේ සිහිය නටුයේ වෙසෙසින් ඇලුණු සිතැත්තේ විදියි. එය ගිලගෙන ද සිටියි. ඔහුට අරමුණු දහම නිසා හටගන්නා නොයෙක් වේදනාවෝ වැඩෙත්. දෘඪිලෝභය ද වෙහෙස ද වැඩෙත්. නොහොත් දෘඪිලෝභයෙන් හා වෙහෙසින් ඔහුගේ සිත පෙළෙයි. මෙසේ දුක් රැස්කරන්නහුට නිවන ඈත යයි කියනු ලැබේ.

සිහියෙන් යුත් හෙතෙමේ රූපය දැක රූපයන්හි නො ඇලෙයි. නොඇලුණු සිත් ඇත්තේ විදියි. එය ගිලගෙන ද නොසිටී යි. රූපය දක්නා වූ ද වේදනාව සෙවුනා වූ ද ඔහුගේ (දුක හා කෙලෙස්) යම්සේ ගෙවේ ද, රැස් නො වේ ද, හෙතෙමේ සිහි ඇත්තේ එසේ හැසිරෙයි. මෙසේ දුක් බැහැර ලන්නහුට නිවන ළඟ යයි කියනු ලැබේ.

සිහියෙන් යුත් හෙතෙමේ ශබ්දය අසා ශබ්දයන්හි නො ඇලෙයි. නොඇලුණු සිත් ඇත්තේ විදියි. එය ගිලගෙන ද නොසිටියි. ශබ්දය අසන්නා වූ ද, වේදනාව සෙවුනා වූ ද ඔහුගේ (දුක හා කෙලෙස්) යම්සේ ගෙවේ ද, නො රැස් වේ ද, හෙතෙමේ සිහි ඇත්තේ එසේ හැසිරෙයි. මෙසේ දුක බැහැර ලන්නහුට නිවන ළඟ යයි කියනු ලැබේ.

සිහියෙන් යුත් හෙතෙමේ ගන්ධය ආඝ්‍රාණය කොට ගන්ධයන්හි නො ඇලෙයි. නොඇලුණු සිත් ඇත්තේ විදියි. එය ගිලගෙන ද නො සිටියි. ගන්ධය ආඝ්‍රාණය කරන්නා වූ ද වේදනාව සෙවුනා වූ ද ඔහුගේ (දුක හා කෙලෙස්) යම් සේ ගෙවේ ද, නො රැස් වේ ද, හෙතෙමේ සිහි ඇත්තේ එසේ හැසිරෙයි. මේ අයුරින් දුක බැහැර ලන්නහුට නිවන ළඟ යයි කියනු ලැබේ.

සිහියෙන් යුත් හෙතෙමේ රස අනුභව කොට රසයන්හි නො ඇලෙයි. නොඇලුණු සිත් ඇත්තේ විදියි. එය ගිලගෙනද නො සිටියි. රස විඳුනා වූ ද වේදනාව සෙවුනා වූද ඔහුගේ (දුක හා කෙලෙස්) යම් සේ ගෙවේ ද, නො රැස් වේ ද, හෙතෙමේ සිහි ඇත්තේ එසේ හැසිරෙයි. මේ අයුරින් දුක බැහැර ලන්නහුට නිවනළඟයයි කියනු ලැබේ.

න සො රජ්ජති ඵස්සෙසු ඵස්සං ඵුස්ස පතිස්සතො
විරත්තචිත්තො වෙදෙති තඤ්ච නාජ්ඣොසාය තිට්ඨති
යථාස්ස ඵුසතො ඵස්සං සෙවතො චාපි වෙදනං
ඛීයති නොපචීයති එවං සො චරතී සතො
එවං අපචිනතො දුක්ඛං සන්තිකෙ නිබ්බානං වුච්චති

න සො රජ්ජති ධම්මෙසු ධම්මං ඤත්වා පතිස්සතො
විරත්තචිත්තො වෙදෙති තඤ්ච නාජ්ඣොසාය තිට්ඨති
යථාස්ස විජානතො[1] ධම්මං සෙවතොචාපි වෙදනං
ඛීයති නොපචීයති එවං සො චරතී සතො
එවං අපචිනතො දුක්ඛං සන්තිකෙ නිබ්බානං වුච්චතී ති.

ඉමස්ස ඛොහං භන්තෙ භගවතා සඞ්ඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානාමීති. සාධු සාධු මාලුඞ්ක්‍යපුත්ත, සාධු ඛො ත්වං මාලුඞ්ක්‍යපුත්ත මයා සඞ්ඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං ආජානාසි.

රූපං දිස්වා සති මුට්ඨා පියං නිමිත්තං මනසි කරොතො
සාරත්තචිත්තො වෙදෙති තඤ්ච අජ්ඣොසාය තිට්ඨති
තස්ස වඩ්ඪන්ති වෙදනා අනෙකා රූපසම්භවා
අභිජ්ඣා ච විහෙසා ච චිත්තමස්සූපහඤ්ඤති
එවං ආචිනතො දුක්ඛං ආරා නිබ්බානං වුච්චති -පෙ-

න සො රජ්ජති ධම්මෙසු ධම්මං ඤත්වා පතිස්සතො
විරත්තචිත්තො වෙදෙති තඤ්ච නාජ්ඣොසාය තිට්ඨති
යථාස්ස විජානතො ධම්මං සෙවතො චාපි වෙදනං
ඛීයති නො පචීයති එවං සො චරතී සතො
එවං අපචිනතො දුක්ඛං සන්තිකෙ නිබ්බානං වුච්චතී ති.

ඉමස්ස ඛො මාලුඞ්ක්‍යපුත්ත මයා සඞ්ඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථො දට්ඨබ්බොති. අථ ඛො ආයස්මා මාලුඞ්ක්‍යපුත්තො භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

අථ ඛො ආයස්මා මාලුඞ්ක්‍යපුත්තො එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසි. අඤ්ඤතරො ච පනායස්මා මාලුඞ්ක්‍යපුත්තො අරහතං අහොසීති.

1. ජානතො - මජසං, සයා

සිහියෙන් යුත් හෙතෙමේ පහස පැහැස පහස්හි නොඇලෙයි. නොඇලුණු සිත් ඇත්තේ විඳියි. එය ගිලගෙන ද නො සිටියි. පහස පුසින්නා වූ ද, වේදනාව සෙවුනා වූ ද, ඔහුගේ (දුක හා කෙලෙස්) යම් සේ ගෙවේ ද, නො රැස් වේ ද, හෙතෙමේ සිහි ඇත්තේ එසේ හැසිරෙයි. මේ අයුරින් දුක බැහැර ලන්නහුට නිවන ළඟ යයි කියනු ලැබේ.

සිහියෙන් යුත් හෙතෙමේ අරමුණු දහම දැන දහම්හි නො ඇලෙයි. නො ඇලුණු සිත් ඇත්තේ විඳියි. එය ගිලගෙන ද නොසිටියි. දහම් දන්නා වූ ද වේදනාව සෙවුනා වූ ද ඔහුගේ (දුක හා කෙලෙස්) යම් සේ ගෙවේ ද නොරැස් වේ ද, හෙතෙමේ සිහි ඇත්තේ එසේ හැසිරෙයි. මෙසේ දුක බැහැර ලන්නහුට නිවන ළඟ යයි කියනු ලැබේ.

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් වදරන ලද දෙසුම්හි අරුත විතරවිසින් මම මෙසේ දනිමි යි. මාලුඞක්‍යපුත්ත මැනවි, මැනවි, මාලුඞක්‍යපුත්ත මා විසින් සැකෙවින් වදහළ මේ දෙසුම්හි අරුත විතර විසින් තෙපි මෙසේ දනිවු.

රූපය දැක ප්‍රිය අරමුණෙකැයි මෙනෙහි කරන්නහුගේ සිහිය නටුයේ වෙසෙසින් ඇලුණු සිත් ඇත්තේ විඳියි. එය ගිල ගෙන ද සිටියි. ඔහුට රූපය නිසා හටගන්නා නොයෙක් වේදනාවෝ වැඩෙත්. දැඩිලෝභය ද වෙහෙස ද වැඩෙත්, නොහොත් දැඩිලෝභයෙන් ද වෙහෙසින් ද ඔහුගේ සිත පෙළෙයි. මෙසේ දුක රැස්කරන්නහුට නිවන ඈත ය යි කියනු ලැබේ ...

සිහියෙන් යුත් හෙතෙමේ දහම දැන අරමුණු දහම්හි නොඇලෙයි. නො ඇලුණු සිත් ඇත්තේ විඳියි. එය ගිලගෙන ද නො සිටියි. දහම දන්නා වූ ද වේදනාව සෙවුනා වූ ද ඔහුගේ (දුක හා කෙලෙස්) යම් සේ ගෙවේ ද, නො රැස් වේ ද, හෙතෙමේ සිහි ඇත්තේ එසේ හැසිරෙයි. මෙසේ දුක බැහැර ලන්නහුට නිවන ළඟ ය යි කියනු ලැබේ.

මාලුඞක්‍යපුත්ත මා විසින් සැකෙවින් වදහළ මේ දෙසුමෙහි අරුත විතර විසින් මෙසේ දතයුත්තේ යි. ඉක්බිති ආයුෂ්මත් මාලුඞක්‍යපුත්ත තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව පිළිගෙන අනුමෝදන්ව හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට ගියහ.

ඉක්බිති ආයුෂ්මත් මාලුඞක්‍යපුත්ත තෙරණුවෝ එකලා ව ගණයා කෙරෙන් වෙන් වූවාහු නොපමා ව කෙලෙස් තවන වෙර ඇත්තාහු නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති ව වෙසෙන්නාහු කුලපුත්තු යමක් පිණිස මැනවින් ම ගිහිගෙන් නික්ම සස්නට පැමිනෙද්ද, මගබඹසර කෙළවර වූ අනුත්තර ඒ අර්හත් ඵලය නො බෝ කලෙකින් ම මේ අත්බැව්හි ම තුමූ වෙසෙසින් දැන පසක් කොට එයට එළඹ විසූහ. ඉපැද්ම ගෙවිණ. බඹසර වැස නිමවන ලදි. කටයුතු කරන ලදි. මේ රහත්බව පිණිස අනෙකක් නැතැයි දැන ගත්හ. ආයුෂ්මත් මාලුඞක්‍යපුත්ත තෙරණුවෝ රහතුන් අතරෙන් එක්තරා කෙනෙක් ද වූහ යි.

## 1. 10. 3

## පරිහානධම්මසුත්තං

96. පරිහානධම්මඤ්ච වො භික්ඛවෙ, දෙසිස්සාමි අපරිහාන ධම්මඤ්ච ඡ ච අභිභායතනානි. තං සුණාථ. කථඤ්ච භික්ඛවෙ පරිහානධම්මො හොති. ඉධ භික්ඛවෙ භික්ඛුනො චක්ඛුනා රූපං දිස්වා උප්පජ්ජන්ති පාපකා අකුසලා සරසඞ්කප්පා[1] සංයොජනීයා තඤ්චෙ[2] භික්ඛු අධිවාසෙති නප්පජහති න විනොදෙති න ව්‍යන්තී කරොති න අනභාවං ගමෙති. වෙදිතබ්බමෙතං භික්ඛවෙ භික්ඛුනා, පරිහායාමි කුසලෙහි ධම්මෙහි, පරිහානං හෙතං වුත්තං භගවතාති.

පුනචපරං භික්ඛවෙ, භික්ඛුනො සොතෙන සද්දං සුත්වා උප්පජ්ජන්ති -පෙ- පුනචපරං භික්ඛවෙ, භික්ඛුනො ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- පුනචපරං භික්ඛවෙ, භික්ඛුනො ජිව්හාය රසං සායිත්වා -පෙ- පුනචපරං භික්ඛවෙ, භික්ඛුනො කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- පුනචපරං භික්ඛවෙ, භික්ඛුනො මනසා ධම්මං විඤ්ඤාය උප්පජ්ජන්ති පාපකා අකුසලා සරසඞ්කප්පා සංයොජනීයා, තඤ්චෙ භික්ඛු අධිවාසෙති නප්පජහති න විනොදෙති න ව්‍යන්තීකරොති න අනභාවං ගමෙති. වෙදිතබ්බමෙතං භික්ඛවෙ භික්ඛුනා, පරිහායාමි කුසලෙහි ධම්මෙහි, පරිහානං හෙතං වුත්තං භගවතාති. එවං ඛො භික්ඛවෙ පරිහානධම්මො හොති.

කථඤ්ච භික්ඛවෙ අපරිහානධම්මො හොති. ඉධ භික්ඛවෙ භික්ඛුනො චක්ඛුනා රූපං දිස්වා උප්පජ්ජන්ති පාපකා අකුසලා සරසඞ්කප්පා සඤ්ඤොජනීයා, තඤ්චෙ භික්ඛු නාධිවාසෙති පජහති විනොදෙති ව්‍යන්තීකරොති අනභාවං ගමෙති. වෙදිතබ්බමෙතං භික්ඛවෙ භික්ඛුනා, න පරිහායාමි කුසලෙහි ධම්මෙහි, අපරිහානං හෙතං වුත්තං භගවතාති.

පුනචපරං භික්ඛවෙ භික්ඛුනො සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- පුනචපරං භික්ඛවෙ භික්ඛුනො මනසා ධම්මං විඤ්ඤාය උප්පජ්ජන්ති පාපකා අකුසලා සරසඞ්කප්පා සංයොජනීයා, තඤ්චෙ භික්ඛු නාධිවාසෙති පජහති විනොදෙති ව්‍යන්තීකරොති අනභාවං ගමෙති. වෙදිතබ්බමෙතං භික්ඛවෙ භික්ඛුනා, න පරිහායාමි කුසලෙහි ධම්මෙහි, අපරිහානං හෙතං වුත්තං භගවතාති. එවං ඛො භික්ඛවෙ අපරිහාන ධම්මො හොති.

1. අකුසලා ධම්මා සරසඞ්කප්පා - සයා, PTS.
2. තඤ්ච - සයා.

# 1. 10. 3

## පරිහානධම්ම සූත්‍රය

96. මහණෙනි තොපට පරිහාන ධර්මයත්, අපරිහාන ධර්මයත් අභිභා-යතන සයත් දේශනා කරන්නෙමි. එය අසවු, මහණෙනි කෙසේ නම් පරිහානධර්මය වේ ද යත්: මහණෙනි මෙහි මහණහට ඇසින් රූපයක් දැක ලාමක වූ අකුසල් වූ බන්ධනයට කරුණු වූ (ධාවන) සරසඞ්කප්පයෝ (වෙගවත් සිතිවිලි) උපදිත්. ඉදින් මහණ තෙමේ එය ඉවසා නම් දුරු නො කෙරේ නම්, බැහැර නො කෙරේ නම්, කෙළවර නො කෙරේ නම්, නැවත නො හටගන්නා බවට නො පමුණුවා නම්, මහණෙනි ඒ මහණහු විසින් ''කුසල් දහමින් පිරිහෙමි; මෙය පරිහාන ය යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලදැ''යි මෙය දත යුතු ය.

මහණෙනි නැවත අනෙකක් ද කියමි. කනින් ශබ්දයක් අසා මහණහට උපදිත් ... මහණෙනි නැවත අනෙකක් ද කියමි. නැහැයෙන් ගන්ධයක් ආඝ්‍රාණය කොට මහණහට ... මහණෙනි නැවත අනෙකක් ද කියමි. දිවෙන් රසයක් විඳ මහණහට ... මහණෙනි නැවත අනෙකක් ද කියමි, කයින් පහසක් පැහැස මහණහට ... මහණෙනි නැවත අනෙකක් ද කියමි. සිතින් දහමක් දැන මහණහට ලාමක වූ අකුසල් වූ බැඳුමට කරුණු වූ සරසඞ්කප්පයෝ (වෙගවත් සිතිවිලි) උපදිත්. ඉදින් මහණ තෙමේ එය ඉවසා නම්, දුරු නොකෙරේ නම්, බැහැර නො කෙරේ නම් කෙළවර නො කෙරේ නම්, නැවත නූපදනා බවට නො පමුණුවා නම්, මහණෙනි ඒ මහණහු විසින් ''කුසල දහමින් පිරිහෙමි. මෙය පරිහාන ය යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලදැ'' යි මෙය දත යුතු ය. මහණෙනි මෙසේ පරිහානධර්මය වේ.

මහණෙනි කෙසේ නම් අපරිහානධර්මය වේ ද යත්: මහණෙනි මෙහි මහණහට ඇසින් රූපයක් දැක ලාමක වූ අකුසල් වූ බැඳුමට කරුණුවූ ධාවන සඞ්කප්පයෝ උපදිත්, ඉදින් මහණ තෙමේ එය නො ඉවසා නම්, දුරු කෙරේ නම්, බැහැර කෙරේ නම්, කෙළවර කෙරේ නම්, නැවත නො හටගන්නා බවට පමුණුවා නම්, මහණෙනි ඒ මහණහු විසින් ''කුසල් දහමින් නො පිරිහෙමි. මෙය අපරිහාන ය යි භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලදැ'' යි මෙය දත යුතු ය.

මහණෙනි නැවත අනෙකක් ද කියමි, කනින් ශබ්දයක් අසා මහණහට ... නැහැයෙන් ගන්ධයක් ආඝ්‍රාණය කොට ... දිවෙන් රසයක් විඳ ... කයින් පහසක් පැහැස ... මහණෙනි, නැවත අනෙකක් ද කියමි. සිතින් දහමක් දැන මහණහට ලාමක වූ අකුසල් වූ බැඳුමට කරුණු වූ ධාවන සඞ්කප්පයෝ උපදිත්. ඉදින් මහණ තෙමේ එය නො ඉවසා නම්, දුරු කෙරේ නම්, බැහැර කෙරේ නම්, කෙළවර කෙරේ නම්, නැවත නූපදනා බවට පමුණුවා නම්, මහණෙනි ඒ මහණහු විසින් ''කුසල් දහමින් නො පිරිහෙමි. මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් අපරිහාන ය යි වදරන ලදැ'' යි මෙය දත යුතු ය. මහණෙනි මෙසේ අපරිහාන ධර්මය වේ.

කතමානි ච භික්ඛවෙ ඡ අභිභායතනානි. ඉධ භික්ඛවෙ භික්ඛුනො චක්ඛුනා රූපං දිස්වා නුප්පජ්ජන්ති[1] පාපකා අකුසලා සරසඞ්කප්පා සඤ්ඤොජනීයා. වෙදිතබ්බමෙතං භික්ඛවෙ භික්ඛුනා අභිභූතමෙතං ආයතනං[2], අභිභායතනං හෙතං වුත්තං භගවතාති.

පුනචපරං භික්ඛවෙ භික්ඛුනො සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- පුනචපරං භික්ඛවෙ භික්ඛුනො මනසා ධම්මං විඤ්ඤාය නුප්පජ්ජන්ති පාපකා අකුසලා සරසඞ්කප්පා සංයොජනීයා. වෙදිතබ්බමෙතං භික්ඛවෙ භික්ඛුනා අභිභූතමෙතං ආයතනං, අභිභායතනං හෙතං වුත්තං භගවතාති. ඉමානි වුච්චන්ති භික්ඛවෙ ඡ අභිභායතනානී ති

## 1. 10. 4

## පමාදවිහාරිසුත්තං

97. පමාදවිහාරිඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි අප්පමාදවිහාරිඤ්ච. තං සුණාථ. කථඤ්ච භික්ඛවෙ පමාදවිහාරී හොති? චක්ඛුන්ද්‍රියා සංවුතස්ස[3] භික්ඛවෙ විහරතො චිත්තං බ්‍යාසිච්චති[4] චක්ඛුවිඤ්ඤෙය්‍යෙසු රූපෙසු, තස්ස ව්‍යාසිත්තචිත්තස්ස පාමුජ්ජං න හොති, පාමුජ්ජෙ අසති පීති න හොති, පීතියා අසති පස්සද්ධි න හොති, පස්සද්ධියා අසති දුක්ඛං විහරති[5], දුක්ඛිනො චිත්තං න සමාධියති, අසමාහිතෙ චිත්තෙ ධම්මා න පාතුභවන්ති, ධම්මානං අපාතුභාවා පමාදවිහාරීත්වෙව සඞ්ඛං ගච්ඡති.

සොතින්ද්‍රියා අසංවුතස්ස භික්ඛවෙ විහරතො -පෙ- ඝානින්ද්‍රියා සංවුතස්ස භික්ඛවෙ විහරතො -පෙ- ජිව්හින්ද්‍රියා අසංවුතස්ස භික්ඛවෙ විහරතො චිත්තං ව්‍යාසිච්චති ජිව්හාවිඤ්ඤෙය්‍යෙසු රසෙසු, තස්ස ව්‍යාසිත්තචිත්තස්ස පාමුජ්ජං න හොති -පෙ- කායින්ද්‍රියා සංවුතස්ස භික්ඛවෙ විහරතො -පෙ- මනින්ද්‍රියා සංවුතස්ස භික්ඛවෙ විහරතො චිත්තං ව්‍යාසිච්චති මනොවිඤ්ඤෙය්‍යෙසු ධම්මෙසු, තස්ස ව්‍යාසිත්තචිත්තස්ස පාමුජ්ජං න හොති. පාමුජ්ජෙ අසති පීති න හොති. පීතියා අසති පස්සද්ධි න හොති. පස්සද්ධියා අසති දුක්ඛං විහරති. දුක්ඛිනො චිත්තං න සමාධියති. අසමාහිතෙ චිත්තෙ ධම්මා න පාතුභවන්ති. ධම්මානං අපාතුභාවා පමාදවිහාරීත්වෙව සඞ්ඛං ගච්ඡති. එවං ඛො භික්ඛවෙ පමාදවිහාරී හොති.

1. අනුප්පජ්ජන්ති - සීමු.
2. ආයතනානං - සී2.
3. චක්ඛුන්ද්‍රියං අසංවුතස්ස - මජ්ඣං, ස්‍යා.
4. ව්‍යාසිඤ්චති - මජ්ඣං, සීමු.
5. හොති - මජ්ඣං.

මහණෙනි අභිභායතන සය කවරේ ද යත්: මහණෙනි මෙහි මහණහට ඇසින් රූපයක් දැක ලාමක වූ අකුසල් වූ බැඳුමට කරුණු වූ සරසඞ්කප්පයෝ (වේගවත් සිතිවිලි) නූපදිත් නම්, මහණෙනි ඒ මහණහු විසින් "මේ ආයතනය වඩනා ලදී. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය අභිභායතනයෙකැ යි වදරන ලද" යි මෙය දත යුතු ය.

මහණෙනි නැවත අනෙකක් ද කියමි. කනින් ශබ්දයක් අසා මහණහට ... නැහැයෙන් ගන්ධයක් ආඝ්‍රාණය කොට ... දිවින් රසයක් විඳ ... කයින් පහසක් පැහැස ... මහණෙනි නැවත අනෙකක් ද කියමි. සිතින් දහමක් දැන මහණට ලාමක වූ අකුසල් වූ බැඳුමට කරුණු වූ ධාවනසඞ්කප්පයෝ නූපදිත් නම්, මහණෙනි ඒ මහණහු විසින් "මේ ආයතනය වඩනා ලදී. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය අභිභායතනයකැ යි වදරන ලද" යි මෙය දතයුතු ය. මහණෙනි මේ අභිභායතන සය යයි කියනු ලැබෙ යි.

## 1. 10. 4

## පමාදවිහාරි සූත්‍රය

97. මහණෙනි, තොපට ප්‍රමාද විහරණ ඇත්තහු ද අප්‍රමාද විහරණ ඇත්තහු ද දෙශනා කරන්නෙමි. එය අසවු. මහණෙනි කෙසේ නම් ප්‍රමාද විහරණ ඇත්තේ වේ ද යත්: මහණෙනි චක්ඛුන්ද්‍රියයෙහි සංවර රහිතව වෙසෙන්නහුගේ සිත චක්ඛුවිඤ්ඤාණයෙන් දතයුතු රූපයන්හි (කෙලෙසුන්ගෙන්) තෙත් කරනු ලැබේ. කෙලෙසුන් ගෙන් තෙත් වූ සිත් ඇති ඔහුට ප්‍රමොදය (දුර්වලප්‍රීතිය) නො වේ. ප්‍රමොදය නැති කල්හි ප්‍රීතිය නො වේ. ප්‍රීතිය නැති කල්හි පස්සද්ධිය නොවේ. පස්සද්ධිය නැති කල්හි දුකසේ වෙසෙයි. දුක් ඇත්තහුගේ සිත එකඟ නො වේ. සිත එකඟ නො වූ කල්හි (සමථ විදර්ශනා) දහම් පහළ නො වේ. දහම් පහළ නො වීමෙන් පමා විහරණ ඇත්තේ ය යි ගැනීමට යේ.

මහණෙනි සොතින්ද්‍රියයෙහි සංවර රහිත ව වෙසෙන්නහුගේ ... මහණෙනි ඝානින්ද්‍රියයෙහි සංවර රහිත ව වෙසෙන්නහුගේ ... මහණෙනි ජිව්හින්ද්‍රියයෙහි සංවර රහිත ව වෙසෙන්නහුගේ සිත ජිව්හාවිඤ්ඤාණයෙන් දතයුතු රසයන්හි (කෙලෙසුන්ගෙන්) තෙත් කරනු ලැබේ. තෙත් කරන ලද සිත් ඇති ඔහුට ප්‍රමොදය නො වේ ... මහණෙනි කායින්ද්‍රියයෙහි සංවර රහිත ව වෙසෙන්නහුගේ ... මහණෙනි මනින්ද්‍රියයෙහි සංවර රහිත ව වෙසෙන්නහුගේ සිත මනෝවිඤ්ඤාණයෙන් දතයුතු දහම්හි (කෙලෙසුන්ගෙන්) තෙත් කරනු ලැබේ. තෙත් කරන ලද සිත් ඇති ඔහුට ප්‍රමොදය නො වේ. ප්‍රමෝදය නැති කල්හි ප්‍රීතිය නො වේ. ප්‍රීතිය නැති කල්හි පස්සද්ධිය නො වේ. පස්සද්ධිය නැති කල්හි දුකසේ වෙසේ. දුක් ඇත්තහුගේ සිත එකඟ නො වේ. සිත එකඟ නො වූ කල්හි දහම් පහළ නො වේ. දහම් පහළ නො වීමෙන් පමාවිහරණ ඇත්තේම ය යි ගිනීමට යේ. මහණෙනි මෙසේ පමාවිහරණ ඇත්තේ වේ.

කථඤ්ච භික්ඛවෙ අප්පමාදවිහාරී හොති? චක්ඛුන්ද්‍රියසංවුතස්ස භික්ඛවෙ විහරතො චිත්තං න ව්‍යාසිච්චති චක්ඛුවිඤ්ඤෙය්‍යෙසු රූපෙසු, තස්ස අබ්‍යාසිත්තචිත්තස්ස පාමුජ්ජං ජායති. පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදියති, සුඛිනො චිත්තං සමාධියති, සමාහිතෙ චිත්තෙ ධම්මා පාතුභවන්ති, ධම්මානං පාතුභාවා අප්පමාදවිහාරීත්වෙව සඞ්ඛං ගච්ඡති.

සොතින්ද්‍රියසංවුතස්ස භික්ඛවෙ විහරතො -පෙ- ඝානින්ද්‍රියසංවුතස්ස භික්ඛවෙ විහරතො -පෙ- ජිව්හින්ද්‍රියසංවුතස්ස භික්ඛවෙ විහරතො -පෙ- කායින්ද්‍රියසංවුතස්ස භික්ඛවෙ විහරතො -පෙ- මනින්ද්‍රියසංවුතස්ස භික්ඛවෙ විහරතො චිත්තං නබ්‍යාසිච්චති මනොවිඤ්ඤෙය්‍යෙසු ධම්මෙසු, තස්ස අබ්‍යාසිත්තචිත්තස්ස පාමුජ්ජං ජායති, පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති පස්සද්ධකායො සුඛං වෙදියති, සුඛිනො චිත්තං සමාධියති, සමාහිතෙ චිත්තෙ ධම්මා පාතුභවන්ති, ධම්මානං පාතුභාවා අප්පමාදවිහාරීත්වෙව සඞ්ඛං ගච්ඡති. එවං ඛො භික්ඛවෙ අප්පමාදවිහාරී හොතී ති.

## 1. 10. 5

### සංවරසුත්තං

98. සංවරඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි අසංවරඤ්ච තං සුණාථ. කථඤ්ච භික්ඛවෙ අසංවරො හොති? සන්ති භික්ඛවෙ චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. තඤ්චෙ භික්ඛු අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨති. වෙදිතබ්බමෙතං භික්ඛවෙ භික්ඛුනා පරිහායාමි කුසලෙහි ධම්මෙහි, පරිහානං හෙතං වුත්තං භගවතාති.

සන්ති භික්ඛවෙ සොතවිඤ්ඤෙය්‍යා සද්ද -පෙ- ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හා විඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා -පෙ- සන්ති භික්ඛවෙ මනොවිඤ්ඤෙය්‍යා ධම්මා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. තඤ්චෙ භික්ඛු අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨති, වෙදිතබ්බමෙතං භික්ඛවෙ භික්ඛුනා, පරිහායාමි කුසලෙහි ධම්මෙහි, පරිහානං හෙතං වුත්තං භගවතාති. එවං ඛො භික්ඛවෙ අසංවරො හොති.

මහණෙනි කෙසේ නම් නො පමාවිහරණ ඇත්තේ වේ ද යත්: මහණෙනි චක්ඛුන්ද්‍රියයෙහි සංවර සහිත ව වෙසෙන්නහුගේ සිත චක්ඛුවිඤ්ඤාණයෙන් දතයුතු රූපයන්හි (කෙලෙසුන්ගෙන්) නො තෙත් කරනු ලැබේ. නො තෙත් කරනු ලැබූ සිත් ඇති ඔහුට ප්‍රමෝදය උපදී. ප්‍රමෝදය ඇත්තහුට ප්‍රීතිය උපදී. ප්‍රීති සිත් ඇත්තහුගේ කය සැහැල්ලු වෙයි. සැහැල්ලු කය ඇත්තේ සුව විඳියි. සුව ඇත්තහුගේ සිත එකඟවෙයි. සිත එකඟ වූ කල්හි (සමථ විදර්ශනා) දහම් පහළ වේ. දහම් පහළවීමෙන් නොපමා විහරණ ඇත්තේ ම ය යි ගිණීමට යේ.

මහණෙනි සෝතින්ද්‍රියයෙහි සංවර සහිත ව වෙසෙන්නහුගේ ... මහණෙනි ඝානින්ද්‍රියයෙහි සංවර සහිත ව වෙසෙන්නහුගේ ... මහණෙනි ජිව්හින්ද්‍රියයෙහි සංවර සහිත ව වෙසෙන්නහුගේ ... මහණෙනි කායින්ද්‍රියයෙහි සංවර සහිත ව වෙසෙන්නහුගේ ... මහණෙනි මනින්ද්‍රියයෙහි සංවර සහිත ව වෙසෙන්නහුගේ සිත මනෝවිඤ්ඤාණයෙන් දතයුතු දහම්හි කෙලෙසුන්ගෙන් නො තෙත් කරනු ලැබේ. නො තෙත් කරන ලද සිත් ඇති ඔහුට ප්‍රමෝදය උපදී. ප්‍රමෝදය ඇත්තහුට ප්‍රීතිය උපදී. ප්‍රීතිසිත් ඇත්තහුගේ කය සැහැල්ලු වේ. සැහැල්ලු කය ඇත්තේ සුව විඳියි. සුව ඇත්තහුගේ සිත එකඟ වෙයි. සිත එකඟ වූ කල්හි දහම් පහළ වේ. දහම් පහළවීමෙන් නොපමා විහරණ ඇත්තේ ම යයි ගිණුමට යේ. මහණෙනි මෙසේ නොපමා විහරණ ඇත්තේ වෙ යි.

## 1. 10. 5

## සංවර සූත්‍රය

98. මහණෙනි තොපට සංවරයත් අසංවරයත් දේශනා කරන්නෙමි. එය අසවු. මහණෙනි කෙසේ නම් අසංවර වේ ද යත්: මහණෙනි ඉටු වූ කමනීය වූ මනවඩන ප්‍රියස්වභාවය ඇති කාමයෙන් යුත් ඇලුම් කටයුතු ඇස්විනැණින් දතයුතු රූ ඇති. ඉදින් මහණ තෙමේ එය පතා නම් ගුණ කියා නම් ගැලී සිටී නම්, මහණෙනි ඒ මහණහු විසින් "කුසල් දහමින් පිරිහෙමි. මේ පරිහාන යයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද" යි මෙය දතයුතු ය.

මහණෙනි සෝතවිඤ්ඤාණයෙන් (කනවිනැණින්) දත යුතු සද ඇත ... ඝානවිඤ්ඤාණයෙන් (නැහැවිනැණින්) දතයුතු ගඳ ... ජිව්හාවිඤ්ඤාණයෙන් (දිවවිනැණින්) දතයුතු රස ... කායවිඤ්ඤානයෙන් දත යුතු පහස් ... මහණෙනි ඉටු කමනීය මනවඩන ප්‍රිය දෑ වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු මනෝවිඤ්ඤාණයෙන් දත යුතු දහම් ඇත. ඉදින් මහණ තෙමේ එය පතා නම් ගුණ කියා නම් ගැලී සිටී නම්, මහණෙනි ඒ මහණහු විසින් "කුසල්දහමින් පිරිහෙමි. මෙය පරිහාන ය යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද" යි මෙය දත යුතු ය. මහණෙනි මෙසේ අසංවර වේ.

කථඤ්ච භික්ඛවෙ සංවරො හොති? සන්ති භික්ඛවෙ චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. තඤ්චෙ භික්ඛු නාභිනන්දති නාභිවදති නාජ්ඣොසාය තිට්ඨති. වෙදිතබ්බමෙතං භික්ඛවෙ භික්ඛුනා, න පරිහායාමි කුසලෙහි ධම්මෙහි, අපරිහානං හෙතං වුත්තං භගවතා ති.

සන්ති භික්ඛවෙ සොතවිඤ්ඤෙය්‍යා සද්දා -පෙ- ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා -පෙ- සන්ති භික්ඛවෙ මනොවිඤ්ඤෙය්‍යා ධම්මා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. තඤ්චෙ භික්ඛු නාභිනන්දති නාභිවදති නාජ්ඣොසාය තිට්ඨති. වෙදිතබ්බමෙතං භික්ඛවෙ භික්ඛුනා, න පරිහායාමි කුසලෙහි ධම්මෙහි අපරිහානං හෙතං වුත්තං භගවතා ති. එවං ඛො භික්ඛවෙ සංවරො හොතී ති.

## 1. 10. 6

### සමාධිසුත්තං

99. සමාධිං භික්ඛවෙ භාවෙථ, සමාහිතො භික්ඛවෙ භික්ඛු යථාභූතං පජානාති. කිඤ්ච යථාභූතං පජානාති? චක්ඛුං අනිච්චන්ති යථාභූතං පජානාති, රූපා අනිච්චාති යථාභූතං පජානාති, චක්ඛුවිඤ්ඤාණං අනිච්චන්ති යථාභූතං පජානාති, චක්ඛුසම්ඵස්සො අනිච්චොති යථාභූතං පජානාති, යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චන්ති යථාභූතං පජානාති.

සොතං අනිච්චන්ති -පෙ- ඝානං අනිච්චන්ති -පෙ- ජිව්හා අනිච්චාති යථාභූතං පජානාති, රසා අනිච්චාති යථාභූතං පජානාති. ජිව්හාවිඤ්ඤාණං අනිච්චන්ති යථාභූතං පජානාති, ජිව්හාසම්ඵස්සො අනිච්චොති යථාභූතං පජානාති, යම්පිදං ජිව්හාසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චන්ති යථාභූතං පජානාති.

කායො අනිච්චොති -පෙ- මනො අනිච්චොති[1] යථාභූතං පජානාති, ධම්මා අනිච්චාති යථාභූතං පජානාති, මනොවිඤ්ඤාණං අනිච්චන්ති යථාභූතං පජානාති, මනොසම්ඵස්සො අනිච්චොති යථාභූතං පජානාති. යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා. තම්පි අනිච්චන්ති යථාභූතං පජානාති. සමාධිං භික්ඛවෙ භාවෙථ, සමාහිතො භික්ඛවෙ භික්ඛු යථාභූතං පජානාතී ති.

---

1. අනිච්චන්ති - මජසං.

මහණෙනි කෙසේ නම් සංවරය වේ ද යත්: මහණෙනි ඉටු කමනීය මනවඩන පියදෑ වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු ඇස්-විනැණින් දත යුතු රූ ඇත. ඉදින් මහණ තෙමේ එය නො පතා නම් ගුණ නො කියා නම් ගැලී නො සිටී නම්, මහණෙනි ඒ මහණහු විසින් "කුසල්දහමින් නො පිරිහෙමි. මෙය අපරිහාන යයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදරනලද්" යි මෙය දත යුතු ය.

මහණෙනි ශ්‍රෝත්‍රවිඥානයෙන් දතයුතු සද ඇත ... ඝ්‍රාණවිඥාන-යෙන් (නැහැවිනැණින්) දත යුතු ගඳ ... ජිහ්වාවිඥානයෙන් දත යුතු රස ... කාවිනැණින් දත යුතු පහස් ... මහණෙනි ඉටු කමනීය මනවඩන පියදෑ වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු මනවිනැණින් දත යුතු දහම් ඇත. ඉදින් මහණ තෙමේ එය නො පතා නම් ගුණ නො කියා නම් ගැලී නො සිටී නම්, මහණෙනි ඒ මහණහු විසින් "කුසල්දහමින් නො පිරිහෙමි. මෙය අපරිහාන යයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද්"යි මෙය දත යුතු ය. මහණෙනි මෙසේ සංවර වේ යි.

## 1. 10. 6

## සමාධි සූත්‍රය

99. මහණෙනි සමාධිය වඩවු. මහණෙනි සමාධිගත මහණ තෙමේ තතු සේ දනී. කුමක් තතු සේ දනී ද යත්: ඇස අනිසැ යි තතු සේ දනී. රූ අනිසැ යි තතු සේ දනී. ඇස්විණැන අනිසැ යි තතු සේ දනී. ඇස්පහස අනිසැ යි තතු සේ දනී. ඇස්පහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නො දුක් නො සුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් හෙ ද අනිසැ යි තතු සේ දනී.

කන අනිසැ යි ... නැහැය අනිසැ යි ... දිව අනිසැ යි තතු සේ දනී. රස අනිසැ යි තතු සේ දනී. දිව්විනැණ අනිසැ යි තතු සේ දනී. දිව්පහස අනිසැයි තතු සේ දනී. දිව්පහසින් උපදනා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් විඳුමෙක් වේ නම් හෙද අනිසැ යි තතු සේ දනී.

කය අනිසැ යි ... සිත අනිසැ යි තතු සේ දනී, දහම් අනිසැ යි තතු සේ දනී. මනවිනැණ අනිසැයි තතු සේ දනී. මනපහස අනිසැ යි තතු සේ දනී. මනපහසින් උපදනා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් විඳුමෙක් වේ නම් හෙ ද අනිසැ යි තතු සේ දනී. මහණෙනි සමාධිය වඩවු. මහණෙනි සමාධිගත මහණ තෙමේ තතු සේ දනී යි.

## 1. 10. 7

## පටිසල්ලානසුත්තං

100. පටිසල්ලානං[1] භික්ඛවෙ යොගමාපජ්ජථ. පතිසල්ලීනො භික්ඛවෙ භික්ඛු යථාභූතං පජානාති. කිඤ්ච යථාභූතං පජානාති?

චක්ඛුං අනිච්චන්ති යථාභූතං පජානාති, රූපා අනිච්චාති යථාභූතං පජානාති, චක්ඛුවිඤ්ඤාණං අනිච්චන්ති යථාභූතං පජානාති, චක්ඛු සම්ඵස්සො අනිච්චොති යථාභූතං පජානාති, යම්පිදං චක්ඛු සම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චන්ති යථාභූතං පජානාති, සොතං -පෙ- ඝාණං -පෙ- ජිව්හා -පෙ- කායො -පෙ- මනො -පෙ- යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චන්ති යථාභූතං පජානාති. පටිසල්ලානං භික්ඛවෙ යොගමාපජ්ජථ. පතිසල්ලීනො භික්ඛවෙ භික්ඛු යථාභූතං පජානාතීති.

## 1. 10. 8

## නතුම්හාකසුත්තං

101. යං[2] භික්ඛවෙ න තුම්හාකං තං පජහථ, තං වො පහීනං හිතාය සුඛාය භවිස්සති. කිඤ්ච භික්ඛවෙ න තුම්හාකං? චක්ඛුං භික්ඛවෙ න තුම්හාකං. තං පජහථ. තං වො පහීනං හිතාය සුඛාය භවිස්සති. රූපා න තුම්හාකං, තෙ පජහථ, තෙ වො පහීනා හිතාය සුඛාය භවිස්සන්ති.

චක්ඛුවිඤ්ඤාණං න තුම්හාකං, තං පජහථ. තං වො පහීනං හිතාය සුඛාය භවිස්සති. චක්ඛුසම්ඵස්සො න තුම්හාකං, තං පජහථ. සො වො පහීනො හිතාය සුඛාය භවිස්සති. යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි න තුම්හාකං, තං පජහථ. තං වො පහීනං හිතාය සුඛාය භවිස්සති.

සොතං න තුම්හාකං -පෙ- ඝානං න තුම්හාකං -පෙ- ජිව්හා න තුම්හාකං තං පජහථ. සා වො පහීනා හිතාය සුඛාය භවිස්සති. රසා න තුම්හාකං තෙ පජහථ. තෙ වො පහීනා හිතාය සුඛාය

1. පටිසල්ලානෙ - මජසං - පටිසල්ලානො - සී 2
පටිසල්ලීනා -ස්‍යා
2. යම්පි - P T S.

## 1. 10. 7

## පටිසල්ලාන සූත්‍රය

100. මහණෙනි කායවිවේකයෙහි යෙදීමට පැමිණෙවු. මහණෙනි කායවිවේකයෙන් යුත් මහණ තෙමේ තතු සේ දනී. කුමක් තතු සේ දනී ද යත්:

ඇස අනිසැ යි තතු සේ දනී. රූ අනිසැ යි තතු සේ දනී. ඇස්විනැණ අනිසැයි තතු සේ දනී. ඇස්පහස අනිසැ යි තතු සේ දනී. ඇස්පහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් හෙ ද අනිසැ යි තතු සේ දනී. කන ... නැහැය ... දිව ... කය ... සිත ... මනපහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් හෙ ද අනිසැ යි තතු සේ දනී. මහණෙනි කායවිවේකයෙහි යෙදීමට පැමිණෙවු. මහණෙනි කායවිවේකයෙන් යුත් මහණ තෙමේ තතු සේ දනී යි.

## 1. 10. 8

## න තුම්හාක සූත්‍රය

101. මහණෙනි යමෙක් තොපගේ නො වේ නම් එය දුරු කරවු. එය දුරුකරන ලද්දේ තොපට හිත පිණිස සුව පිණිස වන්නේ ය. මහණෙනි කිමෙක් තොපගේ නො වේ ද යත්: මහණෙනි ඇස තොපගේ නො වෙයි. එය දුරු කරවු. එය දුරු කරන ලද්දේ තොපට හිත පිණිස සුව පිණිස වන්නේ ය. රූ තොපගේ නො වෙයි. එය දුරු කරවු. එය දුරු කරන ලද්දේ තොපට හිත පිණිස සුව පිණිස වන්නේ ය.

ඇස්විනැණ තොපගේ නො වෙයි. එය දුරු කරවු. එය දුරු කරන ලද්දේ තොපට හිත පිණිස සුව පිණිස වන්නේ ය. ඇස්පහස තොපගේ නො වෙයි. එය දුරු කරවු. එය දුරු කරන ලද්දේ තොපට හිත පිණිස සුව පිණිස වන්නේ ය. ඇස්පහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් එ ද තොපගේ නො වෙයි. එය දුරු කරවු. එය දුරු කරන ලද්දේ තොපට හිත පිණිස සුව පිණිස වන්නේ ය.

කන තොපගේ නො වෙයි ... නැහැය තොපගේ නො වෙයි ... දිව තොපගේ නො වෙයි. එය දුරු කරවු. එය දුරු කරන ලද්දේ තොපට හිත පිණිස සුව පිණිස වන්නේ ය. රස තොපගේ නො වෙයි. එය දුරු කරවු. එය දුරු කරන ලද්දේ තොපට හිත පිණිස

හවිස්සන්ති: ජිව්හාවිඤ්ඤාණං න තුම්හාකං, තං පජහථ. තං වො පහීනං හිතාය සුඛාය හවිස්සති. ජිව්හාසම්ඵස්සො න තුම්හාකං තං පජහථ. සො වො පහීනො හිතාය සුඛාය හවිස්සති. යම්පිදං ජිව්හාසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා. තම්පි න තුම්හාකං, තං පජහථ. තං වො පහීනං හිතාය සුඛාය හවිස්සති.

කායො න තුම්හාකං -පෙ- මනො න තුම්හාකං, තං පජහථ. සො වො පහීනො හිතාය සුඛාය හවිස්සති. ධම්මා න තුම්හාකං තෙ පජහථ. තෙ වො පහීනා හිතාය සුඛාය හවිස්සන්ති. මනොවිඤ්ඤාණං න තුම්හාකං තං පජහථ. තං වො පහීනං හිතාය සුඛාය හවිස්සති. මනොසම්ඵස්සො න තුම්හාකං තං පජහථ. සො වො පහීනො හිතාය සුඛාය හවිස්සති. යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි න තුම්හාකං, තං පජහථ. තං වො පහීනං හිතාය සුඛාය හවිස්සති.

සෙය්‍යථාපි භික්ඛවෙ යං ඉමස්මිං ජෙතවනෙ තිණකට්ඨසාඛාපලාසං, තං ජනො හරෙය්‍ය වා ඩහෙය්‍ය වා යථාපච්චයං වා කරෙය්‍ය. අපිනු තුම්හාකං එවමස්ස: අම්හෙ ජනො හරති වා ඩහති වා යථාපච්චයං වා කරොතීති? නොහෙතං භන්තෙ. තං කිස්ස හෙතු? න හි නො හෙතං භන්තෙ අත්තා වා අත්තනියං වාති.

එවමෙව ඛො භික්ඛවෙ චක්ඛුං[1] න තුම්හාකං තං පජහථ, තං වො පහීනං හිතාය සුඛාය හවිස්සති. රූපා න තුම්හාකං -පෙ- චක්ඛුවිඤ්ඤාණං න තුම්හාකං තං පජහථ -පෙ- චක්ඛුසම්ඵස්සො න තුම්හාකං -පෙ- යම්පිදං මනො සම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි න තුම්හාකං තං පජහථ. තං වො පහීනං හිතාය සුඛාය හවිස්සතීති,

## 1. 10. 9

## දුතියනතුම්හාකසුත්තං

102. යං භික්ඛවෙ න තුම්හාකං තං පජහථ, තං වො පහීනං හිතාය සුඛාය හවිස්සති. කිඤ්ච භික්ඛවෙ න තුම්හාකං?

1. චක්ඛු - සිමු මජසං, සී 2

සුව පිණිස වන්නේ ය. දිව්විඤ්ඤාණ තොපගේ නො වෙයි. එය දුරු කරවු. එය දුරු කරන ලද්දේ තොපට හිත පිණිස සුව පිණිස වන්නේ ය. දිව්පහස තොපගේ නො වෙයි. එය දුරු කරවු. එය දුරු කරන ලද්දේ තොපට හිත පිණිස සුව පිණිස වන්නේ ය. දිව්පහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් එ ද තොපගේ නො වෙයි. එය දුරු කරවු. එය දුරු කරන ලද්දේ තොපට හිත පිණිස සුව පිණිස වන්නේ ය.

කය තොපගේ නො වෙයි ... සිත තොපගේ නො වෙයි. එය දුරු කරවු. එය දුරු කරන ලද්දේ තොපට හිත පිණිස සුව පිණිස වන්නේ ය. දහම් තොපගේ නො වෙයි. එය දුරු කරවු. එය දුරු කරන ලද්දේ තොපට හිත පිණිස සුව පිණිස වන්නේ ය. මනවිඤ්ඤාණ තොපගේ නො වෙයි. එය දුරු කරවු. එය දුරු කරන ලද්දේ තොපට හිත පිණිස සුව පිණිස වන්නේ ය. මනපහස තොපගේ නො වෙයි. එය දුරු කරවු. එය දුරු කරන ලද්දේ තොපට හිත පිණිස සුව පිණිස වන්නේ ය. මනපහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් එ ද තොපගේ නො වෙයි. එය දුරු කරවු. එය දුරු කරන ලද්දේ තොපට හිත පිණිස සුව පිණිස වන්නේ ය.

මහණෙනි යම් සේ මේ ජේතවනයෙහි යම් තණ දර අතු කොල වේ ද, ජන තෙමේ එය හැරගෙන යන්නේ හෝ දවන්නේ හෝ යම් කැමති පරිද්දක් කරන්නේ හෝ වේ නම් (එකල්හි) තොපට මෙබඳු අදහසෙක් වන්නේ ද, ජන තෙමේ අප හැරගෙන යන්නේ යයි කියා හෝ දවන්නේ යයි කියා හෝ යම් කැමති පරිද්දක් කරන්නේ යයි කියා හෝ මෙබඳු සිතෙක් වන්නේ ද, වහන්ස මෙය නො වේ ම ය. ඒ කවර හෙයින යත්: වහන්ස මෙය තෙමේ හෝ තමාගේ හෝ නො වේ මැ යි (එහෙයිනි).

මහණෙනි එසෙයින් ම ඇස තොපගේ නො වෙයි. එය (ඇස කෙරෙහි තෘෂ්ණාව) දුරු කරවු. එය දුරු කරන ලද්දේ තොපට හිත පිණිස සුව පිණිස වන්නේ ය. රූ තොපගේ නො වෙයි ... ඇස්විඤ්ඤාණ තොපගේ නො වෙයි. එය දුරු කරවු. ඇස්පහස තොපගේ නො වෙයි ... මනපහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් හෙ ද තොපගේ නො වෙයි. එය දුරු කරවු. එය දුරු කරන ලද්දේ තොපට හිත පිණිස සුව පිණිස වන්නේ යි.

## 1. 10. 9

## දුතිය නතුම්හාක සූත්‍රය

102. මහණෙනි යමෙක් තොපගේ නො වේ නම් එය දුරු කරවු. එය දුරු කරන ලද්දේ තොපට හිත පිණිස සුව පිණිස වන්නේ ය. මහණෙනි කිමෙක් තොපගේ නො වේ ද යත්:

චක්ඛුං භික්ඛවෙ න තුම්හාකං තං පජහථ, තං ඛො පහීනං හිතාය සුඛාය භවිස්සති. රූපා න තුම්හාකං තෙ පජහථ. තෙ වො පහීනා හිතාය සුඛාය භවිස්සන්ති. චක්ඛුවිඤ්ඤාණං න තුම්හාකං තං පජහථ. තං වො පහීනං හිතාය සුඛාය භවිස්සති. චක්ඛුසම්ඵස්සො න තුම්හාකං තං පජහථ. සො වො පහීනො හිතාය සුඛාය භවිස්සති.

යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි න තුම්හාකං තං පජහථ, තං වො පහීනං හිතාය සුඛාය භවිස්සති -පෙ- යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා. තම්පි න තුම්හාකං තං පජහථ. තං වො පහීනං හිතාය සුඛාය භවිස්සති. යම්පි භික්ඛවෙ න තුම්හාකං තං පජහථ. තං වො පහීනං හිතාය සුඛාය භවිස්සතී ති.

## 1. 10. 10

## උද්දකසුත්තං

103. උද්දකො[1] සුදං භික්ඛවෙ රාමපුත්තො එවං වාචං භාසති.

ඉදං ජාතු වෙදගූ ඉදං ජාතු සබ්බජී[2]
ඉදං ජාතු අපලිඛතං[3] ගණ්ඩමූලං පලිඛණින්ති.''

තං ඛො පනෙතං භික්ඛවෙ උද්දකො රාමපුත්තො අවෙදගූයෙව සමානො වෙදගූ'ස්මීති භාසති, අසබ්බජීයෙව සමානො සබ්බජී'ස්මීති භාසති, අපලිඛතං යෙව[4] ගණ්ඩමූලං පලිඛතංයෙව ගණ්ඩමූලන්ති භාසති.

ඉධ ඛො තං භික්ඛවෙ භික්ඛු සම්මාවදමානො වදෙය්‍ය.

''ඉදං ජාතු වෙදගූ ඉදං ජාතු සබ්බජී
ඉදං ජාතු අපලිඛතං ගණ්ඩමූලං පලිඛණින්ති.''

කථඤ්ච භික්ඛවෙ භික්ඛු වෙදගූ හොති? යතො ඛො භික්ඛවෙ භික්ඛු ඡන්නං ඵස්සායතනානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානාති, එවං ඛො භික්ඛවෙ භික්ඛු වෙදගූ හොති.

---

1. උදකො - මජසං, ස්‍යා.
2. පබ්බජී - ස්‍යා,
3. අපලිඛාතං - සී 2.
4. අථ - ස්‍යා.

මහණෙනි ඇස තොපගේ නො වෙයි. එහි වූ තෘෂ්ණාව දුරු කරවු. එය දුරු කරන ලද්දේ තොපට හිත පිණිස සුව පිණිස වන්නේ ය. රූ තොපගේ නො වෙයි. එය දුරු කරවු (එහි තෘෂ්ණාව) එය දුරු කරන ලද්දේ තොපට හිත පිණිස සුව පිණිස වන්නේ ය. ඇස්විඤාණ තොපගේ නො වෙයි. එය දුරු කරවු. එය දුරු කරන ලද්දේ තොපට හිත පිණිස සුව පිණිස වන්නේ ය. ඇස් පහස තොපගේ නො වෙයි. එය දුරු කරවු. එය දුරු කරන ලද්දේ තොපට හිත පිණිස සුව පිණිස වන්නෙ ය.

ඇස්පහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් එ ද තොපගේ නො වෙයි. එය දුරු කරවු. එය දුරු කරන ලද්දේ තොපට හිත පිණිස සුව පිණිස වන්නේ ය ... මනපහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් හෙ ද තොපගේ නො වෙයි. එය දුරු කරවු. එය දුරු කරන ලද්දේ තොපට හිත පිණිස සුව පිණිස වන්නේ ය. මහණෙනි යමෙක් තොපගේ නො වේ නම් එය දුරු කරවු. එය දුරු කරන ලද්දේ තොපට හිත පිණිස සුව පිණිස වන්නේ යි.

## 1. 10. 10

## උද්දක සූත්‍රය

103. මහණෙනි. **රාමපුත්‍ර උද්දක** තෙමේ මෙබඳු වචනයක් කියයි:

"මාගේ මේ වචනය අසවු, මම ඒකාන්තයෙන් සියලු සසරවට දන සිටියෙම් වෙමි. ඒකාන්තයෙන් සියල්ල දිනුයෙම් වෙමි. සාරා නොදමන ලද තෘෂ්ණා සඞ්ඛ්‍යාත දුක්ඛමූලය සාරා දමා සිටියෙම් වෙමි'' යි.

මහණෙනි, රාමපුත්‍ර උද්දක තෙමේ සියල්ල නො දත්තේ ම සියල්ල දත්තෙම් වෙමි යි ඒ මේ වචනය කිය යි. සියල්ල නොදිනුයේ ම සියල්ල දිනුයෙම් වෙමි යි කියයි. දුක්මුල නොසාරා දමන ලද්දේ ම දුක්මූල සාරා දමන ලද්දේ යයි කිය යි.

**මහණෙනි** මෙහි මහණ තෙමේ මැනවින් කියන්නේ,

මාගේ **මේ** වචනය අසවු. මම ඒකාන්තයෙන් සියලු සසරවට **දන සිටියෙම් වෙමි.** ඒකාන්තයෙන් සියල්ල දිනුයෙම් වෙමි. සාරා **නො දමන ලද තෘෂ්ණා** සඞ්ඛ්‍යාත දුක්ඛමූලය සාරා දමා සිටියෙම් **වෙමි''යි කියන්නේ ය.**

**මහණෙනි මහණ** තෙමේ කෙසේ නම් වෙදගූ (සසරවට දන සිටියේ) **වේ ද යත්:** මහණෙනි මහණ තෙමේ යම් හෙයකින් සවැදෑරුම් **ඵස්සායතනයන්ගේ** සමුදයත් ආස්වාදයත් **අස්තගමයත් ආදීනවයත් නිස්සරණයත්** තතු සේ දනී ද, මහණෙනි මෙසේ මහණ තෙමේ වෙදගූ නම් වෙයි.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු සබ්බජී හොති? යතො ඛො භික්ඛවෙ භික්ඛු ඡන්නං ඵස්සායතනානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං විදිත්වා අනුපාදය විමුත්තො හොති. එවං ඛො භික්ඛවෙ භික්ඛු සබ්බජී හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු නො අපලිඛතං ගණ්ඩමූලං පලිඛතං හොති? ගණ්ඩාති ඛො භික්ඛවෙ ඉමස්සෙතං චාතුම්මහාභූතිකස්ස කායස්ස අධිවචනං මාතාපෙත්තිකසම්භවස්ස ඔදනකුම්මාසූපචයස්ස අනිච්චුච්ඡාදන පරිමද්දන භෙදන විද්ධංසනධම්මස්ස. ගණ්ඩමූලන්ති ඛො භික්ඛවෙ තණ්හායෙතං අධිවචනං. යතො ඛො භික්ඛවෙ, භික්ඛුනො තණ්හා පහීනා හොති[1] උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා[2] ආයතිං අනුප්පාදධම්මා. එවං ඛො භික්ඛවෙ භික්ඛුනො අපලිඛතං ගණ්ඩමූලං පලිඛතං හොති.

උද්දකො සුදං භික්ඛවෙ, රාමපුත්තො එවං වාචං භාසති:

ඉදං ජාතු වෙදගූ ඉදං ජාතු සබ්බජී
ඉදං ජාතු අපලිඛතං ගණ්ඩමූලං පලිඛණින්ති.

තං ඛො පනෙතං භික්ඛවෙ, උද්දකො රාමපුත්තො අවෙදගූයෙව සමානො වෙදගූ'ස්මීති භාසති. අසබ්බජියෙව සමානො සබ්බජිස්මීති භාසති. අපලිඛතංයෙව ගණ්ඩමූලං පලිඛතංයෙව ගණ්ඩමූලන්ති භාසති.

ඉධ ඛො තං භික්ඛවෙ, භික්ඛු සම්මාවදමානො වදෙය්‍ය:
ඉදං ජාතු වෙදගූ ඉදං ජාතු සබ්බජී
ඉදං ජාතු අපලිඛතං ගණ්ඩමූලං පලිඛණින්ති.

## ඡළාවග්ගො[3] දසමො.

තස්සුද්දානං:

දෙව සඞ්ඛා පරිහානං පමාදවිහාරී ච සංවරො
සමාධි පටිසල්ලානං[4] දෙව නතුම්හාකෙන උද්දකො ති.

## දුතියො පණ්ණාසකො.

තස්ස වග්ගුද්දානං:

අවිජ්ජා මිගජාලඤ්ච ගිලානං ඡන්නං චතුත්ථකං
ඡළවග්ගෙන පඤ්ඤාසං දුතියො පඤ්ඤාසකො අයං.

1. හොන්ති - ම.
2. අනභාවංකතා - මජසං, ස්‍යා.
3. සළ - මජසං.
4. පටිසල්ලීනං - ස්‍යා

මහණෙනි මහණ තෙමේ කෙසේ නම් සබ්බජී (සියල්ල දිනුයේ) වේ ද යත්: මහණෙනි මහණ තෙමේ යම් හෙයකින් සවැදෑරුම් ඵස්සායතනයන්ගේ සමුදයත් ආස්වාදයත් අස්තගමයත් ආදීන යත් නිස්සරණයත් තතු සේ දැන උපාදනය නො කොට කෙලෙසුන්ගෙන් මිදුණේ වේ ද. මහණෙනි මහණ තෙමේ මෙසේ සබ්බජී නම් වෙයි.

මහණෙනි මහණ තෙමේ කෙසේ නම් නොසාරා දැමූ ගඬ (දුක්) මුල සාරා දමන ලද්දේ වේ ද යත්: මහණෙනි ''ගඬ'' යයි මවුපියන්ගේ ලේඅශුචියෙන් උපන් බතින් හා කොමුයෙන් වැඩුණු අනිස බව හා ඉලීම් පිරිමැදීම් (කරතුදු) බිඳෙන වැනසෙන ස්වභාව ඇති සතර මහා භූතයන්ගෙන් හටගත් මේ කයට නමෙකි. මහණෙනි, ''ගඬමුල'' යයි මේ තෘෂ්ණාවට නමෙකි. මහණෙනි යම් කලෙක මහණහුගේ තෘෂ්ණාව ප්‍රහීණ වූවා උසුන් මුල් ඇත්තී හිස්සුන් තල්ගසක් මෙන් කරන ලද්දී නැවත නො හටගන්නාබව කරන ලද්දී මතු නූපදනා ස්වභාව ඇත්තී වේ ද, මහණෙනි මෙසේ මහණහුගේ නොසාරා දැමූ ගඬමුල සාරාදමන ලද්දේ වෙයි.

මහණෙනි රාමපුත්‍ර උද්දක තෙමේ මෙබඳු වචනයක් කියයි: ''මාගේ මේ වචනය අසවු. මම ඒකාන්තයෙන් සසරවට දැන සිටියෙම් වෙමි. ඒකාන්තයෙන් සියල්ල දිනුයෙම් වෙමි. සාරා නොදැමූ ගඬමුල සාරාදමා සිටියෙම් වෙමි.

මහණෙනි රාමපුත්‍ර උද්දක තෙමේ ''වෙදගූ'' නොවූයේම වෙදගූ වෙමි යි මේ වචනය කිය යි. සබ්බජී නො වූයේ ම ''සබ්බජී'' වෙමි යි කිය යි. ගඬමුල නො සාරා දැමූයේ ම ගඬමුල සාරා දමා සිටියෙම් වෙමි යි කියයි.

මහණෙනි, මෙහි මහණ තෙමේ මැනවින් කියන්නේ: ''මාගේ මේ වචනය අසවු. මම ඒකාන්තයෙන් වෙදගූ (සසරවට දැන සිටියෙම්) වෙමි. ඒකාන්තයෙන් සබ්බජී (සියල්ල දිනුයෙම්) වෙමි. නො සාරා දැමූ ගඬමුල සාරා දමා සිටියෙම් වෙමි''යි කියන්නේ යි.

දසවැනි ජළවර්ගයි.

**එහි සූත්‍රනාමාවලිය:**

සඞගය්හ සූත්‍ර දෙක ය, පරිහාන, පමාදවිහාරී, සංවර, සමාධි, පටිසල්ලාන යන සූත්‍ර පස ය, නතුම්හාක සූත්‍ර දෙක ය, උද්දක සූත්‍රය ද යි සූත්‍ර දශයෙකි.

**ද්වතිය පණ්ණාසකය යි.**

**එහි වර්ගනාමාවලිය:**

අවිජ්ජා, මිගජාල, ගිලාන යන වර්ග තුන ය, සිවුවැනි ඡන්න වර්ගය, ජළවර්ගය යන මෙයින් සූත්‍ර පනසෙකි. මේ ද්වතියපණ්ණාසකය යි.

# තතියො පණ්ණාසකො

## 11. යොගක්ඛෙමිවග්ගො

### 1. 11. 1

### යොගක්ඛෙමිසුත්තං

104. සාවත්ථියං —

යොගක්ඛෙමිපරියායං වො භික්ඛවෙ ධම්මපරියායං දෙසිස්සාමි තං සුණාථ. කතමො ච භික්ඛවෙ යොගක්ඛෙමිපරියායො ධම්මපරියායො?

සන්ති භික්ඛවෙ චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, තෙ තථාගතස්ස පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා, තෙසඤ්ච පහානාය අක්ඛාසි යොගං, තස්මා තථාගතො යොගක්ඛෙමීති වුච්චති.

සන්ති භික්ඛවෙ සොතවිඤ්ඤෙය්‍යා සද්ද -පෙ- ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- සන්ති භික්ඛවෙ ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා -පෙ- සන්ති භික්ඛවෙ මනොවිඤ්ඤෙය්‍යා ධම්මා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, තෙ තථාගතස්ස පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා. තෙසඤ්ච පහානාය අක්ඛාසි යොගං, තස්මා තථාගතො යොගක්ඛෙමීති වුච්චති. අයං ඛො භික්ඛවෙ, යොගක්ඛෙමි පරියායො ධම්මපරියායොති.

### 1. 11. 2

### උපාදයසුත්තං

105. කිස්මිං නු ඛො භික්ඛවෙ සති කිං උපාදය උප්පජ්ජති අජ්ඣත්තං සුඛ[1]දුක්ඛන්ති.

භගවම්මූලකා නො භන්තෙ ධම්මා, භගවන්නෙත්තිකා භගවම්පටිසරණා, සාධු වත භන්තෙ, භගවන්තං යෙව පටිභාතු එතස්ස භාසිතස්ස අත්ථො, භගවතො සුත්වා භික්ඛූ ධාරෙස්සන්තීති. තෙන හි භික්ඛවෙ සුණාථ, සාධුකං මනසි කරොථ, භාසිස්සාමීති. එවම්භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච:

---

1. සුඛං - මජසං

# තතිය පණ්ණාසකය

## 11. යොගක්ඛෙම වර්ගය

### 1. 11. 1

### යොගක්ඛෙම සූත්‍රය

104. සැවැත් නුවර —

මහණෙනි, යොගක්ඛෙම පරියාය නම් වූ ධර්මකාරණය තොපට දේශනා කරන්නෙමි. එය අසවු. මහණෙනි, යොගක්ඛෙම පරියාය නම් වූ ධර්මකාරණය කවරේ ද යත්:

මහණෙනි, ඉටු කැමති මනවඩන පියදැ වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු රූ ඇත. ඔහු තථාගතයන් විසින් ප්‍රහීණයහ. උසුන්මුල් ඇතියහ. හිස්සුන් තල්ගසක් මෙන් කරන ලදහ. නැවත නො හටගන්නා බව කරන ලදහ. මතු නූපදනා ස්වභාව ඇතියහ. ඔවුන් ප්‍රහීණ කිරීමට යෝග මාර්ගය ද පැවසී ය. එහෙයින් තථාගත තෙමේ යොගක්ඛෙම යයි කියනු ලැබේ.

මහණෙනි කනින් දත යුතු සද ඇත.... නැහැයෙන් දත යුතු ගඳ ... මහණෙනි දිවෙන් දතයුතු රස ඇත ... කයින් දත යුතු පහස් ... මහණෙනි ඉටු කැමති මනවඩන පියදැ වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු සිතින් දත යුතු දහම් ඇත. ඔහු තථාගතයන් විසින් ප්‍රහීණයහ. උසුන් මුල් ඇතියහ. හිස්සුන් තල්ගසක් මෙන් කරන ලදහ. නැවත නො හටගන්නාබව කරන ලදහ මතු නූපදනා ස්වභාව ඇතියහ. ඔවුන් ප්‍රහීණ කිරීමට යෝගය ද පැවසී ය. එහෙයින් තථාගත තෙමේ යොගක්ඛෙම යයි කියනු ලැබේ. මහණෙනි, මේ යොගක්ඛෙම පරියාය නම් වූ ධර්මකාරණ ය යි.

### 1. 11. 2

### උපාදය සූත්‍රය

105. මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් නිසා තමා තුළ සුවදුක් උපදී ද යි.

වහන්ස, අපගේ දහම්හු භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇතියහ. භාග්‍යවතුන් වහන්සේ නේත්‍ර කොට ඇතියහ. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණ කොට ඇතියහ. වහන්ස, මේ දේශනාවේ අරුත භාග්‍යවතුන් වහන්සේට ම වැටහේවා. මැනවි භාග්‍යවතුන් වහන්සේගෙන් අසා භික්ෂූහු දරන්නාහ යි. මහණෙනි, එසේ නම් අසවු, මැනවින් මෙනෙහි කරවු, කියන්නෙමි යි. වහන්ස එසේ යයි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

චක්ඛුස්මිං ඛො භික්ඛවෙ සති චක්ඛුං උපාදාය උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං, සොතස්මිං සති සොතං උපාදාය උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං. ඝානස්මිං සති ඝානං උපාදාය උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං, ජිව්හාය සති ජිව්හං උපාදාය උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං, කායස්මිං සති කායං උපාදාය උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං, මනස්මිං සති මනං උපාදාය උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං.

තං කිම්මඤ්ඤථ භික්ඛවෙ, "චක්ඛුං නිච්චං වා අනිච්චං වා"ති? අනිච්චං භන්තෙ. "යම්පනානිච්චං දුක්ඛං වා තං සුඛං වා"ති. දුක්ඛං භන්තෙ. "යම්පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං අපිනු තං අනුපාදාය උප්පජ්ජෙය්‍ය අජ්ඣත්තං සුඛදුක්ඛන්ති". නො හෙතං භන්තෙ.

"සොතං නිච්චං වා අනිච්චං වා"ති. අනිච්චං භන්තෙ -පෙ- "ඝානං නිච්චං වා අනිච්චං වා"ති. අනිච්චං භන්තෙ -පෙ- "ජිව්හා නිච්චා වා අනිච්චා වා"ති. අනිච්චා භන්තෙ -පෙ- "කායො නිච්චො වා අනිච්චො වා"ති. අනිච්චො භන්තෙ -පෙ- "මනො නිච්චො වා අනිච්චො වා"ති. අනිච්චො භන්තෙ. "යම්පනානිච්චං දුක්ඛං වා තං සුඛං වා"ති. දුක්ඛං භන්තෙ. යම්පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං අපිනු තං අනුපාදාය උප්පජ්ජෙය්‍ය අජ්ඣත්තං සුඛදුක්ඛන්ති. නො හෙතං භන්තෙ.

එවම්පස්සං භික්ඛවෙ, සුතවා අරියසාවකො චක්ඛුස්මිම්පි නිබ්බින්දති, සොතස්මිම්පි නිබ්බින්දති, ඝානස්මිම්පි නිබ්බින්දති, ජිව්හායපි නිබ්බින්දති, කායස්මිම්පි නිබ්බින්දති, මනස්මිම්පි නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති, විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති, ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 11. 3

### දුක්ඛසමුදයසුත්තං

106. දුක්ඛස්ස භික්ඛවෙ, සමුදයඤ්ච අත්ථගමඤ්ච දෙසිස්සාමි. තං සුණාථ. කතමො ච භික්ඛවෙ, දුක්ඛස්ස සමුදයො:

චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං, තිණ්ණං සඞ්ගති ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනා පච්චයා තණ්හා, අයං දුක්ඛස්ස සමුදයො. සොතඤ්ච පටිච්ච -පෙ- ඝානඤ්ච පටිච්ච -පෙ- ජිව්හඤ්ච පටිච්ච -පෙ- කායඤ්ච පටිච්ච -පෙ- මනඤ්ච පටිච්ච ධම්මෙ ච උප්පජ්ජති මනොවිඤ්ඤාණං, තිණ්ණං සඞ්ගති ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනා පච්චයා තණ්හා, අයං ඛො භික්ඛවෙ දුක්ඛස්ස සමුදයො.

මහණෙනි, ඇස ඇති කල්හි ඇස නිසා තමා කෙරෙහි සුවදුක් උපදී. කන ඇති කල්හි කන නිසා තමා තුළ සුවදුක් උපදී. නැහැය ඇති කල්හි නැහැය නිසා තමා තුළ සුවදුක් උපදී. දිව ඇති කල්හි දිව නිසා තමා තුළ සුවදුක් උපදී. කය ඇති කල්හි කය නිසා තමා තුළ සුවදුක් උපදී. සිත ඇති කල්හි සිත නිසා තමා තුළ සුවදුක් උපදී.

මහණෙනි ඒ කිමැයි හඟිවු ද, ඇස නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේද යි. වහන්ස අනිත්‍ය ය. යමක් අනිත්‍ය නම් එය දුක් හෝ සුව හෝ වේද යි. වහන්ස දුක් ය. යමක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වන සුලු නම් එය දැඩි සේ නො ගෙන තමා තුළ සුවදුක් උපදනේ ද යි. වහන්ස, මෙය නො වේ මැයි.

කන නිත්‍ය ද නොහොත් අනිත්‍ය ද? යි. වහන්ස, අනිත්‍යය ... නැහැය නිත්‍ය හෝ අනිත්‍ය ද? යි. වහන්ස අනිත්‍යය ... දිව නිත්‍ය හෝ අනිත්‍ය ද යි. වහන්ස අනිත්‍ය ය ... කය නිත්‍ය හෝ අනිත්‍ය ද? යි. වහන්ස අනිත්‍ය ය ... සිත නිත්‍ය හෝ අනිත්‍ය ද? යි. වහන්ස අනිත්‍යය. යමක් අනිත්‍ය නම් එය දුක් හෝ සුව හෝ වේද? යි. වහන්ස, දුක් ය. යමක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වන සුලු නම් එය දැඩි සේ නො ගෙන තමා තුළ සුවදුක් උපදනේ ද? යි. වහන්ස මෙය නො වේ ම ය.

මහණෙනි, මෙසේ දක්නා ඇසූපිරූ තැන් ඇති අරිසවු තෙමේ ඇසෙහිත් කලකිරෙයි. කනෙහිත් කලකිරෙයි. නැහැයෙහිත් කලකිරෙයි. දිවෙහිත් කලකිරෙයි. කයෙහිත් කලකිරෙයි. සිතෙහිත් කලකිරෙයි. කලකිරෙන්නේ නො ඇලෙයි. නො ඇලුම් හෙයින් මිදෙයි. මිදුණු කල්හි මිදුණේ යයි දැනීම වෙයි. ඉපැත්ම ගෙවිනි. බඹසර වැස නිමවන ලදි. කළයුතු දැ කරන ලදි. මේ රහත් බව පිණිස (කළයුතු) අනෙකක් නැතැයි දැනගනී යි.

## 1. 11. 3

## දුක්ඛසමුදය සූත්‍රය

106. මහණෙනි, දුකෙහි සමුදයත් අස්තඞ්ගමයත් දේශනා කරන්නෙමි. එය අසවු. මහණෙනි, දුකෙහි සමුදය කවරේ ද යත්:

ඇසත් රූත් නිසා චක්ඛුවිඤ්ඤාණය උපදී. තිදෙනාගේ එක්වීම පහස යි. පහස නිසා වේදනාව වෙයි. වේදනාව නිසා තණ්හාව වෙයි. මේ දුකෙහි සමුදය යි. කනත් නිසා ... නැහැයත් නිසා ... දිවත් නිසා ... කයත් නිසා ... සිතත් දහමුත් නිසා මනෝවිඤ්ඤාණය උපදී. තිදෙනාගේ එක්වීම පහස යි. පහස නිසා වේදනාව වෙයි. වේදනාව නිසා තණ්හාව වෙයි. මහණෙනි මේ දුකේ සමුදය යි.

කතමො ච භික්ඛවෙ, දුක්ඛස්ස අත්ථඞ්ගමො? චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං, තිණ්ණං සඞ්ගති ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා තණ්හා, තස්සා යෙව තණ්හාය අසෙස-විරාගනිරොධා උපාදානනිරොධො, උපාදානනිරොධා භවනිරොධො, භවනිරොධා ජාතිනිරොධො, ජාතිනිරොධා ජරාමරණං සොකපරිදෙව-දුක්ඛදොමනස්සුපායාසා නිරුජ්ඣන්ති, එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති, අයං දුක්ඛස්ස අත්ථඞ්ගමො.

සොතඤ්ච පටිච්ච -පෙ- ඝානඤ්ච පටිච්ච -පෙ- ජිව්හඤ්ච පටිච්ච රසෙ ච උප්පජ්ජති ජිව්හාවිඤ්ඤාණං -පෙ- කායඤ්ච පටිච්ච -පෙ- මනඤ්ච පටිච්ච ධම්මෙ ච උප්පජ්ජති මනොවිඤ්ඤාණං, තිණ්ණං සඞ්ගති ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනා පච්චයා තණ්හා. තස්සා යෙව තණ්හාය අසෙසවිරාගනිරොධා උපාදානනිරොධො, උපාදානනිරොධා භවනිරොධො, භවනිරොධා ජාතිනිරොධො, ජාතිනිරොධා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති, අයං ඛො භික්ඛවෙ දුක්ඛස්ස අත්ථඞ්ගමොති.

## 1. 11. 4

## ලොකසමුදයසුත්තං

107. ලොකස්ස භික්ඛවෙ, සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච දෙසිස්සාමි, තං සුණාථ. කතමො ච භික්ඛවෙ ලොකස්ස සමුදයො? චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං, තිණ්ණං සඞ්ගති ඵස්සො, ඵස්සපච්චයා වෙදනා. වෙදනාපච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදානං, උපාදානපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති, අයං ඛො භික්ඛවෙ ලොකස්ස සමුදයො.

සොතඤ්ච පටිච්ච -පෙ- ඝානඤ්ච පටිච්ච -පෙ- ජිව්හඤ්ච පටිච්ච -පෙ- කායඤ්ච පටිච්ච -පෙ- මනඤ්ච පටිච්ච ධම්මෙ ච උප්පජ්ජති මනොවිඤ්ඤාණං. තිණ්ණං සඞ්ගති ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදානං, උපාදානපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සු-පායාසා සම්භවන්ති. අයං ඛො භික්ඛවෙ ලොකස්ස සමුදයො.

කතමො ච භික්ඛවෙ, ලොකස්ස අත්ථඞ්ගමො? චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං, තිණ්ණං සඞ්ගති ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා තණ්හා, තස්සායෙව තණ්හාය අසෙසවිරාග නිරොධා උපාදානනිරොධො -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති. අයං ඛො භික්ඛවෙ ලොකස්ස අත්ථඞ්ගමො.

මහණෙනි, දුකෙහි අස්තඞ්ගමය කවරේ ද යත්: ඇසත් රූත් නිසා චක්ඛුවිඤ්ඤාණය උපදී. තිදෙනාගේ එක්වීම පහස යි. පහස නිසා වේදනාව වේ. වෙදනාව නිසා තණ්හාව වේ. ඒ තණ්හාවේ ම නිරවශෙෂවිරාගනිරෝධයෙන් උපාදාන නිරෝධය වේ. උපාදාන නිරොධයෙන් භවනිරොධය වේ. භවනිරොධයෙන් ජාතිනිරොධය වේ. ජාතිනිරොධයෙන් ජරාමරණ සෝක පරිදේව දුක්ඛ – දෙමනස්ස උපායාසයෝ නිරුද්ධ වෙත්. මෙසේ මේ හුදු දුක්රැසේ නිරෝධය වේ. මේ දුකේ අස්තඞ්ගමය යි.

කනත් නිසා... නැහැයත් නිසා...දිවත් රසත් නිසා ජිව්හාවිඤ්ඤාණය උපදී ... කයත් නිසා ... සිතත් දහමුත් නිසා මනොවිඤ්ඤාණය උපදී. තිදෙනාගේ එක්වීම පහස යි. පහස නිසා වේදනාව උපදී. වේදනාව නිසා තණ්හාව උපදී. ඒ තණ්හාවේ ම නිරවශේෂවිරාගනිරොධයෙන් උපාදානනිරොධය වේ. උපාදානනිරෝධයෙන් භවනිරෝධය වේ. භවනිරෝධයෙන් ජාතිනිරෝධය වේ. ජාතිනිරෝධයෙන් ජරාමරණ සෝක පරිදේව දුක්ඛ දෙමනස්ස උපායාසයෝ නිරුද්ධ වෙත්. මෙසේ මේ හුදු දුක්රැසේ නිරෝධය වේ. මහණෙනි මේ දුකේ අස්තඞ්ගම ය යි.

## 1. 11. 4

## ලෝකසමුදය සූත්‍රය

107. මහණෙනි, ලෝකයේ සමුදයත් අස්තඞ්ගමයත් දේශනා කරන්නෙමි. එය අසවු. මහණෙනි ලෝකයේ සමුදය කවරේ ද යත්: ඇසත් රූත් නිසා චක්ඛුවිඤ්ඤාණය උපදී. තිදෙනාගේ එක්වීම පහස යි. පහස නිසා වේදනාව වේ. වේදනාව නිසා තණ්හාව වේ. තණ්හාව නිසා උපාදාන වේ. උපාදාන නිසා භවය වේ. භවය නිසා ජාතිය වේ. ජාතිය නිසා ජරාමරණ සෝක පරිදේව දුක්ඛ දෙමනස්ස උපායාසයෝ හටගනිත්. මහණෙනි මේ ලෝකයේ සමුදය යි.

කනත් නිසා... නැහැයත් නිසා... දිවත් නිසා ... කයත් නිසා... සිතත් දහමුත් නිසා මනෝවිඤ්ඤාණය උපදී. තිදෙනාගේ එක්වීම පහස යි. පහස නිසා වේදනාව වේ. වේදනාව නිසා තණ්හාව වේ. තණ්හාව නිසා උපාදාන වේ. උපාදාන නිසා භවය වේ. භවය නිසා ජාතිය වේ. ජාතිය නිසා ජරාමරණ සෝක පරිදේව දුක්ඛ දෙමනස්ස උපායාසයෝ හටගනිත්. මහණෙනි මෙ ලෝකයේ සමුදය යි.

මහණෙනි, ලොකයේ අස්තඞ්ගමය කවරේ ද යත්: ඇසත් රූත් නිසා චක්ඛුවිඤ්ඤාණය උපදී. තිදෙනාගේ එක්වීම පහස යි. පහස නිසා වේදනාව වේ. වේදනාව නිසා තණ්හාව වේ. ඒ තණ්හාවේ ම නිරවශේෂවිරාගනිරෝධයෙන් උපාදානනිරෝධය වේ.... මෙසේ මේ හුදු දුක්රැසේ නිරෝධය වේ. මහණෙනි මේ ලෝකයේ අස්තඞ්ගමය යි.

සොතඤ්ච -පෙ- ඝානඤ්ච -පෙ- ජිව්හඤ්ච -පෙ- කායඤ්ච -පෙ- මනඤ්ච පටිච්ච ධම්මෙ ච උප්පජ්ජති මනොවිඤ්ඤාණං, තිණ්ණං සඞ්ගති ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා තණ්හා. තස්සායෙව තණ්හාය අසෙසවිරාගනිරොධා උපාදානනිරොධො -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති. අයං ඛො භික්ඛවෙ ලොකස්ස අත්ථගමොති.

## 1. 11. 5

### සෙය්‍යසුත්තං

108. කිස්මිං නු ඛො භික්ඛවෙ සති කිං උපාදාය කිං අභිනිවිස්ස ''සෙය්‍යො'හමස්මීති වා හොති, සදිසො'හමස්මීති වා හොති, හීනො'හමස්මීති වා හොතී''ති.

භගවම්මූලකා නො භන්තෙ ධම්මා, භගවංනෙත්තිකා, භගවම්පටිසරණා; සාධු වත භන්තෙ භගවන්තංයෙව පටිභාතු එතස්ස භාසිතස්ස අත්ථො, භගවතො සුත්වා භික්ඛූ ධාරෙස්සන්තීති.

චක්ඛුස්මිං ඛො භික්ඛවෙ සති චක්ඛුං උපාදාය චක්ඛුං අභිනිවිස්ස 'සෙය්‍යො'හමස්මීති වා හොති. සදිසො'හමස්මීති වා හොති, හීනො'හමස්මීති වා හොති. සොතස්මිං සති -පෙ- ඝානස්මිං සති -පෙ- ජිව්හාය සති -පෙ- කායස්මිං සති -පෙ- මනස්මිං සති මනං උපාදාය මනං අභිනිවිස්ස ''සෙය්‍යො'හමස්මීති වා හොති. සදිසො'හමස්මීති වා හොති, හීනො'හමස්මීති වා හොති.

තං කිම්මඤ්ඤථ භික්ඛවෙ ''චක්ඛුං නිච්චං වා අනිච්චං වා''ති. අනිච්චං භන්තෙ. ''යම්පනානිච්චං දුක්ඛං වා තං සුඛං වා''ති. දුක්ඛං භන්තෙ. ''යම්පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය සෙය්‍යො'හමස්මීති වා අස්ස සදිසො'හමස්මීති වා අස්ස හීනො'හමස්මීති වා අස්සා''ති. නො හෙතං භන්තෙ.

සොතං නිච්චං වා අනිච්චං වාති. අනිච්චං භන්තෙ -පෙ- ඝානං නිච්චං වා අනිච්චං වාති. අනිච්චං භන්තෙ -පෙ- ජිව්හා නිච්චා වා අනිච්චා වාති. අනිච්චා භන්තෙ -පෙ- කායො නිච්චො වා අනිච්චො වාති. අනිච්චො භන්තෙ -පෙ- මනො නිච්චො වා අනිච්චො වාති. අනිච්චො භන්තෙ. යම්පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති. දුක්ඛං භන්තෙ. යම්පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය ''සෙය්‍යො'හමස්මීති වා අස්ස, සදිසොහමස්මීති වා අස්ස, හීනො'හමස්මීති වා අස්සාති. නො හෙතං භන්තෙ.

එවම්පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො චක්ඛුස්මිම්පි නිබ්බින්දති, සොතස්මිම්පි නිබ්බින්දති, ඝානස්මිම්පි නිබ්බින්දති, ජිව්හායපි නිබ්බින්දති, කායස්මිම්පි නිබ්බින්දති, මනස්මිම්පි නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති විරාගා විමුච්චති -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

කනත් ... නැහැයත් ... දිවත් ... කයත් ... සිතත් දහමුත් නිසා මනෝවිඤ්ඤාණය උපදී. තිදෙනාගේ එක්වීම් පහස යි. පහස නිසා වේදනාව වේ. වේදනාව නිසා තණ්හාව වේ. ඒ තණ්හාවේ ම නිරවශේෂවිරාග-නිරෝධයෙන් උපාදානනිරෝධය වේ.... මෙසේ මේ හුදු දුක්රැසේ නිරෝධය වේ. මහණෙනි, මේ ලෝකයේ අස්තඞ්ගමය යි.

## 1. 11. 5

### සෙය්‍ය සූත්‍රය

108. මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් නිසා කුමකට පිවිස මම ශ්‍රේෂ්ඨයෙමි යි හෝ (අදහස්) වේ ද, මම සදෘශයෙමි යි හෝ වේ ද? මම හීනයෙමි යි හෝ වේ දැ යි.

වහන්ස, අපගේ දහම්හු භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇතියහ. භාග්‍යවතුන් වහන්සේ නේත්‍ර කොට ඇතියහ. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණ කොට ඇතියහ. වහන්ස, යාඥා කරම්හ. මේ දේශනාවේ අරුත භාග්‍යවතුන් වහන්සේට ම වැටහේවා, භාග්‍යවතුන් වහන්සේ ගෙන් අසා භික්ෂූහු දරන්නාහ යි.

මහණෙනි, ඇස ඇති කල්හි ඇස නිසා ඇසට පිවිස මම ශ්‍රේෂ්ඨයෙමි යි හෝ වෙයි. මම සදෘශයෙමි යි හෝ වෙයි. මම හීනයෙමි යි හෝ වෙයි. කන ඇති කල්හි ... නැහැය ඇති කල්හි ... දිව ඇති කල්හි ... කය ඇති කල්හි ... සිත ඇති කල්හි සිත නිසා සිතට පිවිස මම ශ්‍රේෂ්ඨයෙමි යි හෝ වෙයි. මම සදෘශයෙමි යි හෝ වෙයි. මම හීනයෙමි යි හෝ වෙයි.

මහණෙනි, ඒ කිමැ යි හඟිවු ද, ඇස නිත්‍ය ද හෝ අනිත්‍ය ද හෝ යි. වහන්ස අනිත්‍ය ය. යමක් අනිත්‍ය නම් එය දුක් හෝ වේ ද සුව හෝ වේ ද යි. වහන්ස, දුක් ය. යමක් අනිස නම් දුක් නම් වෙනස් වන සුලු නම් එය දැඩි සේ නො ගෙන මම ශ්‍රේෂ්ඨයෙමි යි හෝ වන්නේ ද? මම සදෘශයෙමි යි හෝ වන්නේ ද? මම හීනයෙමි හෝ වන්නේ දැ? යි. වහන්ස, මෙය නො වේ ම ය.

කන නිත්‍ය හෝ වේ ද අනිත්‍ය හෝ වේදැයි. වහන්ස, අනිත්‍ය ය ... නැහැය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේදැ යි. වහන්ස, අනිත්‍ය ය ... දිව නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේදැ යි. වහන්ස, අනිත්‍ය ය ... කය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේදැ යි. වහන්ස, අනිත්‍ය ය ... සිත නිත්‍ය හෝ වේ ද අනිත්‍ය හෝ වේදැ යි. වහන්ස, අනිත්‍ය ය. යමක් අනිත්‍ය නම් එය දුක් හෝ වේ ද සුව හෝ වේදැ යි. වහන්ස දුක් ය. යමක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වනසුලු නම් එය දැඩි සේ නො ගෙන මම ශ්‍රේෂ්ඨයෙමි යි හෝ වන්නේ ද, මම සදෘශයෙමි යි හෝ වන්නේ ද, මම හීනයෙමි යි හෝ වන්නේ දැ යි. වහන්ස මෙය නො වේ ම ය.

මහණෙනි, මෙසේ දක්නා ඇසූපිරූ තැන් ඇති අරිසවු තෙමේ ඇසෙහිත් කලකිරෙයි. කනෙහිත් කලකිරෙයි. නැහැයෙහිත් කල-කිරෙයි. දිවෙහිත් කලකිරෙයි. කයෙහිත් කලකිරෙයි. සිතෙහිත් කලකිරෙයි. කලකිරෙන්නේ නො ඇලෙයි. නො ඇලුම් හෙයින් මිදෙයි ... මේ රහත්බව පිණිස අනෙකක් නැතැ යි දැනගනී යි.

## 1. 11. 6

### සඤ්ඤොජනසුත්තං

109. සඤ්ඤොජනීයෙ ච භික්ඛවෙ ධම්මෙ දෙසිස්සාමි සඤ්ඤොජනඤ්ච තං සුණාථ. කතමෙ ච භික්ඛවෙ සඤ්ඤොජනීයා ධම්මා? කතමඤ්ච සඤ්ඤොජනං?

චක්ඛුං භික්ඛවෙ සඤ්ඤොජනීයො ධම්මො, යො තත්ථ ඡන්දරාගො තං තත්ථ සඤ්ඤොජනං, සොතං -පෙ- ඝානං -පෙ- ජිව්හා සඤ්ඤොජනීයො ධම්මො, යො තත්ථ ඡන්දරාගො තං තත්ථ සඤ්ඤොජනං කායො -පෙ- මනො සඤ්ඤොජනීයො ධම්මො, යො තත්ථ ඡන්දරාගො තං තත්ථ සඤ්ඤොජනං. ඉමෙ වුච්චන්ති භික්ඛවෙ සඤ්ඤොජනීයා ධම්මා, ඉදං සඤ්ඤොජනන්ති.

## 1. 11. 7

### උපාදනසුත්තං

110. උපාදනියෙ ච භික්ඛවෙ ධම්මෙ දෙසිස්සාමි උපාදනඤ්ච. තං සුණාථ. කතමෙ ච භික්ඛවෙ උපාදනියා ධම්මා? කතමඤ්ච උපාදනං?

චක්ඛුං භික්ඛවෙ උපාදනියො ධම්මො, යො තත්ථ ඡන්දරාගො තං තත්ථ උපාදනං, සොතං -පෙ- ඝානං -පෙ- ජිව්හා උපාදනියො ධම්මො, යො තත්ථ ඡන්දරාගො තං තත්ථ උපාදනං. කායො -පෙ- මනො උපාදනියො ධම්මො, යො තත්ථ ඡන්දරාගො තං තත්ථ උපාදනං. ඉමෙ වුච්චන්ති භික්ඛවෙ උපාදනියා ධම්මා, ඉදං උපාදනන්ති.

## 1. 11. 8

### පරිජානනසුත්තං

111. චක්ඛුං භික්ඛවෙ අනභිජානං අපරිජානං අවිරාජයං අප්පජහං අභබ්බො දුක්ඛක්ඛයාය. සොතං -පෙ- ඝානං -පෙ- ජිව්හං -පෙ- කායං -පෙ- මනං අනභිජානං අපරිජානං අවිරාජයං අප්පජහං අභබ්බො දුක්ඛක්ඛයාය. චක්ඛුඤ්ච ඛො භික්ඛවෙ අභිජානං පරිජානං විරාජයං පජහං භබ්බො දුක්ඛක්ඛයාය. සොතං -පෙ- ඝානං -පෙ- ජිව්හං -පෙ- කායං -පෙ- මනං අභිජානං පරිජානං විරාජයං පජහං භබ්බො දුක්ඛක්ඛයායාති.

## 1. 11. 6

## සඤ්ඤොජන සූත්‍රය

109. මහණෙනි, සංයෝජනයන්ට හිත වූ දහම් ද සංයෝජන ද දේශනා කරන්නෙමි. එය අසවු. මහණෙනි, සංයෝජනයන්ට හිත වූ දහම් කවරේ ද සංයෝජන කවරේ ද යත්:

මහණෙනි, ඇස සංයෝජනයන්ට හිත දහමෙකි. එහි යම් ඡන්දරාගයෙක් වේ නම් එය එහි සංයෝජන යි. කන ... නැහැය ... දිව සංයෝජනයන්ට හිත දහමෙකි, එහි යම් ඡන්දරාගයෙක් වේ නම් එය එහි සංයෝජන යි. කය ... සිත සංයෝජනයන්ට හිත දහමෙකි. එහි යම් ඡන්දරාගයෙක් වේ නම් එය එහි සංයෝජන යි. මහණෙනි, මොහු සංයෝජනයන්ට හිත දහම්හු ය යි ද මෙය සංයෝජන යි ද කියනු ලැබෙත්.

## 1. 11. 7

## උපාදාන සූත්‍රය

110. මහණෙනි, උපාදානයන්ට හිත දහම් ද උපාදාන ද දේශනා කරන්නෙමි. එය අසවු. මහණෙනි, උපාදානයන්ට හිත දහම් කවරේ ද උපාදාන කවරේ ද යත්:

මහණෙනි; ඇස උපාදානයන්ට හිත දහමෙකි. එහි යම් ඡන්ද-රාගයෙක් වේ නම් එය එහි උපාදාන යි. කන ... නැහැය ... දිව උපාදානයන්ට හිත දහමෙකි. එහි යම් ඡන්දරාගයෙක් වේ නම් එය එහි උපාදාන යි. කය ... සිත උපාදානයන්ට හිත දහමෙකි. එහි යම් ඡන්දරාගයෙක් වේ නම් එය එහි උපාදාන යි. මහණෙනි, මොහු උපාදානයන්ට හිත දහම්හු ය යි ද මෙය උපාදාන යි ද කියනු ලැබෙති යි.

## 1. 11. 8

## පරිජානන සූත්‍රය

111. මහණෙනි, ඇස වෙසෙසින් නො දන්නේ පිරිසිඳ නො දන්නේ දුරු නො කරන්නේ පහ නො කරන්නේ දුක් නැසීමට නුසුදුසු (නොසමත්) වේ. කන ... නැහැය ... දිව ... කය... සිත වෙසෙසින් නොදන්නේ පිරිසිඳ නොදන්නේ දුරු නො කරන්නේ පහ නො කරන්නේ දුක් ගෙවීමට නුසුදුසු වේ. මහණෙනි, ඇස වෙසෙසින් දන්නේ පිරිසිඳ දන්නේ දුරු කරන්නේ පහ කරන්නේ දුක් නැසීමට සුදුසු (සමත්) වේ. කන ... නැහැය ... දිව ... කය ... සිත වෙසෙසින් දන්නේ පිරිසිඳ දන්නේ දුරු කරන්නේ පහ කරන්නේ දුක් නැසීමට සුදුසු (සමත්) වේ යි.

## 1. 11. 9

## දුතියපරිජානනසුත්තං

112. රූපෙ ඛො භික්ඛවෙ අනභිජානං අපරිජානං අවිරාජයං අප්පජහං අභබ්බො දුක්ඛක්ඛයාය. සද්දෙ -පෙ- ගන්ධෙ -පෙ- රසෙ -පෙ- ඵොට්ඨබ්බෙ -පෙ- ධම්මෙ අනභිජානං අපරිජානං අවිරාජයං අප්පජහං අභබ්බො දුක්ඛක්ඛයාය.

රූපෙ ච ඛො භික්ඛවෙ අභිජානං පරිජානං විරාජයං පජහං භබ්බො දුක්ඛක්ඛයාය. සද්දෙ -පෙ- ගන්ධෙ -පෙ- රසෙ -පෙ- ඵොට්ඨබ්බෙ -පෙ- ධම්මෙ අභිජානං පරිජානං විරාජයං පජහං භබ්බො දුක්ඛක්ඛයායාති.

## 1. 11. 10

## උපස්සුතිසුත්තං

113. එකං සමයං භගවා නාදිකෙ[1] විහරති ගිඤ්ජකාවසථෙ. අථ ඛො භගවා රහොගතො පටිසල්ලීනො[2] ඉමං ධම්මපරියායං අභාසි.

චක්ඛුං පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං තිණ්ණං සඞ්ගති ඵස්සො, ඵස්සපච්චයා වේදනා, වෙදනාපච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදානං -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

සොතඤ්ච පටිච්ච -පෙ- ඝානඤ්ච පටිච්ච -පෙ- ජිව්හඤ්ච පටිච්ච -පෙ- කායඤ්ච පටිච්ච -පෙ- මනඤ්ච පටිච්ච ධම්මෙ ච උප්පජ්ජති මනොවිඤ්ඤාණං. තිණ්ණං සඞ්ගති ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදානං -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං, තිණ්ණං සඞ්ගති ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා තණ්හා, තස්සා යෙව තණ්හාය අසෙසවිරාගනිරොධා උපාදානනිරොධො, උපාදානනිරොධා -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති.

සොතඤ්ච පටිච්ච -පෙ- ඝානඤ්ච පටිච්ච -පෙ- ජිව්හඤ්ච පටිච්ච -පෙ- කායඤ්ච පටිච්ච -පෙ- මනඤ්ච පටිච්ච ධම්මෙ ච උප්පජ්ජති මනොවිඤ්ඤාණං, තිණ්ණං සඞ්ගති ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා තණ්හා. තස්සා යෙව තණ්හාය අසෙසවිරාගනිරොධා උපාදානනිරොධො, උපාදානනිරොධා -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතීති.

---

1. ඤාතිකෙ - ස්‍යා, සිමු
නාතිකෙ - මජසං
2. පතිසල්ලීනො - සිමු.

## 1. 11. 9

## දුතිය පරිජානන සූත්‍රය

112. මහණෙනි, රූපයන් වෙසෙසින් නො දන්නේ පිරිසිඳ නො දන්නේ නො දුරු කරන්නේ නො පහ කරන්නේ දුක් නැසීමට නුසුදුසු වේ. සද ... ගඳ ... රස ... පහස් ... දහම් වෙසෙසින් නො දන්නේ පිරිසිඳ නො දන්නේ නො දුරු කරන්නේ නො පහ කරන්නේ දුක් ගෙවීමට නුසුදුසු (නො සමත්) වේ.

මහණෙනි, රූපයන් වෙසෙසින් දන්නේ පිරිසිඳ දන්නේ දුරු කරන්නේ පහ කරන්නේ දුක් ගෙවීමට සුදුසු (සමත්) වේ. සද ... ගඳ ... රස ... පහස් ... දහම් වෙසෙසින් දන්නේ පිරිසිඳ දන්නේ දුරු කරන්නේ පහ කරන්නේ දුක් නැසීමට සුදුසු (සමත්) වේ යි.

## 1. 11. 10

## උපස්සුති සූත්‍රය

113. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ නාදික ගම්හි ගඩොළු පහයෙහි වැඩවසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ රහසිගත ව විවේකී ව මේ දහම්නය වදළ සේක:

ඇසත් රූත් නිසා චක්ඛුවිඤ්ඤාණය උපදී. තිදෙනාගේ එක්වීම පහස යි. පහස නිසා වේදනාව වේ. වේදනාව නිසා තණ්හාව වේ. තණ්හාව නිසා උපාදන වේ ... මෙසේ මේ හුදු දුක්රැසේ හටගැනීම වේ.

කනත් නිසා ... නැහැයත් නිසා ... දිවත් නිසා ... කයත් නිසා ... සිතත් දහමුත් නිසා ... මනෝවිඤ්ඤාණය උපදී. තිදෙනාගේ එක්වීම පහස යි. පහස නිසා වේදනාව වේ. වේදනාව නිසා තණ්හාව වේ. තණ්හාව නිසා උපාදන වේ ... මෙසේ මේ හුදු දුක්රැසේ හටගැනීම වේ.

ඇසත් රූත් නිසා චක්ඛුවිඤ්ඤාණය උපදී. තිදෙනාගේ එක්වීම පහස යි. පහස නිසා වේදනාව වේ. වේදනාව නිසා තණ්හාව වේ. ඒ තණ්හාවේ ම නිරවශේෂවිරාගනිරෝධයෙන් උපාදන නිරෝධය වේ. උපාදනනිරෝධයෙන් ... මෙසේ මේ හුදු දුක්රැසේ නිරෝධය වේ.

කනත් නිසා ... නැහැයත් නිසා ... දිවත් නිසා ... කයත් නිසා ... සිතත් දහමුත් නිසා මනෝවිඤ්ඤාණය උපදී. තිදෙනාගේ එක්වීම පහස යි. පහස නිසා වේදනාව වේ. වේදනාව නිසා තණ්හාව වේ. ඒ තණ්හාවේ ම නිරවශේෂවිරාගනිරෝධයෙන් ... මෙසේ මේ හුදු දුක්රැසේ නිරෝධය වේ යි.

තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු භගවතො උපස්සුතිං[1] ඨිතො හොති. අද්දසා ඛො භගවා තං භික්ඛුං උපස්සුතිං[1] ඨිතං. දිස්වාන තං භික්ඛුං එතදවොච; අස්සොසි නො ත්වං භික්ඛු ඉමං ධම්මපරියායන්ති? එවං භන්තෙ. උග්ගණ්හාහි ත්වං භික්ඛු ඉමං ධම්මපරියායං, පරියාපුණාහි ත්වං භික්ඛු ඉමං ධම්මපරියායං, ධාරෙහි ත්වං භික්ඛු ඉමං ධම්මපරියායං, අත්ථසංහිතො'යං භික්ඛු ධම්මපරියායො, ආදිබ්‍රහ්මචරියකොති.

## යොගක්ඛෙමිවග්ගො එකාදසමො.

**තත්‍රුද්දානං:**

යොගක්ඛෙමි උපාදය දුක්ඛං ලොකො ච සෙය්‍යො ච
සංයොජනං උපාදානං ද්වෙ පරිජානං උපස්සුතීති.

1. උපසසුති - මජසං සයා.

එකල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේගේ හඬසනෙහි සිටියේ වෙයි. භාග්‍යවතුන් වහන්සේ හඬසනෙහි සිටි ඒ මහණහු දුටු සේක. දක ඒ මහණහට මෙය වදළ සේක: මහණ තෙපි මේ දහම්නය ඇසුවහු ද යි. වහන්ස එසේ ය. මහණ තෙපි මේ දහම්නය උගනිවු. මහණ තෙපි මේ දහම්නය පිරිවහවු. මහණ තෙපි මේ දහම්නය දරවු. මහණ මේ දහම්නය වැඩ සහිත ය. මගබඹසරට මුල් යයි.

**එකොළොස්වැනි යෝගකෙඛම් වර්ග යි.**

**එහි සූත්‍රනාමාවලිය:**

යෝගකෙඛම්, උපාදය, දුක්ඛ, ලෝක, සෙය්‍ය, සංයෝජන, උපාදන යන සූත්‍ර සත ය. පරිජානන සූත්‍ර දෙක ය. උපස්සුති සූත්‍ර ය යි දශයෙකි.

# 12. ලොකකාමගුණවග්ගො

## 1. 12. 1

### මාරපාසසුත්තං

114. සන්ති භික්ඛවෙ චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, තඤ්චෙ භික්ඛු අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨති, අයං වුච්චති භික්ඛවෙ භික්ඛු ආවාසගතො මාරස්ස, මාරස්ස වසඞ්ගතො, පටිමුක්කස්ස මාරපාසො, බද්ධො සො මාරබන්ධනෙන යථාකාමකරණීයො පාපිමතො.

සන්ති භික්ඛවෙ සොතවිඤ්ඤෙය්‍යා සද්ද -පෙ- ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා -පෙ- සන්ති භික්ඛවෙ මනොවිඤ්ඤෙය්‍යා ධම්මා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, තඤ්චෙ භික්ඛු අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨති, අයං වුච්චති භික්ඛවෙ භික්ඛු ආවාසගතො මාරස්ස, මාරස්ස වසඞ්ගතො, පටිමුක්කස්ස මාරපාසො, බද්ධො සො මාරබන්ධනෙන යථාකාමකරණීයො පාපිමතො.

සන්ති ච ඛො භික්ඛවෙ චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, තඤ්චෙ භික්ඛු නාභිනන්දති නාභිවදති නාජ්ඣොසාය තිට්ඨති. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු න ආවාසගතො මාරස්ස, න මාරස්ස වසඞ්ගතො, උම්මුක්කස්ස මාරපාසො; මුත්තො සො මාරබන්ධනෙන න යථාකාමකරණීයො පාපිමතො.

සන්ති භික්ඛවෙ සොතවිඤ්ඤෙය්‍යා සද්දා -පෙ- ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා -පෙ- සන්ති භික්ඛවෙ මනොවිඤ්ඤෙය්‍යා ධම්මා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, තඤ්චෙ භික්ඛු නාභිනන්දති නාභිවදති නාජ්ඣොසාය තිට්ඨති, අයං වුච්චති භික්ඛවෙ භික්ඛු න ආවාසගතො මාරස්ස, න මාරස්ස වසඞ්ගතො, උම්මුක්කස්ස මාරපාසො මුත්තො සො මාරබන්ධනෙන, න යථාකාමකරණීයො පාපිමතොති.

# 12. ලොකකාමගුණ වර්ගය

## 1. 12. 1

### මාරපාස සූත්‍රය

114. මහණෙනි, ඉටු කැමති මනවඩන පියදෑ වූ කාමයෙන් යුත් ඇලුම් කට යුතු ඇසින් දත යුතු රූ ඇත. ඉදින් මහණ තෙමේ එය පිළිගන්නේ ද, ගුණ කියන්නේ ද, ගැලී සිටින්නේ ද, මහණෙනි, මේ මහණ තෙමේ මරුවසන තැනට ගියේ මරුවසයට ගියේ මළපුඩුව ඔහු ගෙල වැළඳුණේ ය යි කියනු ලැබේ. හෙතෙමේ මාරබන්ධනයෙන් බැඳුණේ මරහු විසින් කැමති පරිදි කළ හැක්කේ වෙයි.

මහණෙනි, කනින් දත යුතු සද ඇත ... නැහැයෙන් දත යුතු ගඳ ... දිවෙන් දත යුතු රස ... කයින් දත යුතු පහස් . මහණෙනි, ඉටු කැමති, මනවඩන, පියදෑ වූ කාමයෙන් යුත්, සිත් අලවන සිතින් දත යුතු දහම් ඇත. ඉදින් මහණ තෙමේ එය පිළිගන්නේ ද එහි ගුණ කියන්නේ ද, එහි ගැලී සිටින්නේ ද, මහණෙනි, මේ මහණ තෙමේ මරුවසන තැනට ගියේ මරුවසයට ගියේ මරුගේ මළපුඩුව ඔහු ගෙල වැළඳුණේ යයි කියනු ලැබේ. හෙතෙමේ මරබැඳුමෙන් බැඳුණේ මරහු විසින් කැමති පරිදි කළ හැක්කේ වෙයි.

තවද මහණෙනි, ඉටු කැමති මනවඩන පියදෑ වූ කාමයෙන් යුත් ඇලුම් කට යුතු ඇසින් දත යුතු රූ ඇත. ඉදින් මහණ තෙමේ එය නො පතා ද, ගුණ නො කියා ද, ගැලී නො සිටී ද. මහණෙනි, මේ මහණ තෙමේ මරුවසන තැනට නො ගියේ මරුවසයට නො ගියේ මරුගේ මළපුඩුව ඔහු ගෙලින් ගිලිහුණේ ය යි කියනු ලැබේ. හෙතෙමේ මරබැඳුමෙන් මිදුණේ මරහු විසින් කැමති පරිදි නො කළ හැක්කේ වෙයි.

මහණෙනි, කනින් දත යුතු සද ඇත ... නැහැයෙන් දත යුතු ගඳ ... දිවෙන් දත යුතු රස ... කයින් දත යුතු පහස් ... ඉටු කැමති මනවඩන පියදෑ වූ කාමයෙන් යුත් සිත් අලවන සිතින් දත යුතු දහම් ඇත. ඉදින් මහණ තෙමේ එය නො පිළිගන්නේ ද, ගුණ නො කියන්නේ ද, ගැලී නො සිටින්නේ ද, මහණෙනි, මේ මහණ තෙමේ මරුවසන තැනට නො ගියේ මරුවසයට නො ගියේ මරුගේ මළපුඩුව ඔහු ගෙලින් ගිලිහුණේ යයි කියනු ලැබේ. හෙතෙමේ මරබැඳුමෙන් මිදුණේ මරහු විසින් කැමති පරිදි නො කළහැක්කේ වේ යි.

## 1. 12 .2

## දුතියමාරපාසසුත්තං

115. සන්ති භික්ඛවෙ චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, තඤ්චෙ භික්ඛු අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨති. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු බද්ධො චක්ඛුවිඤ්ඤෙය්‍යෙසු රූපෙසු, ආවාසගතො මාරස්ස, මාරස්ස වසඞ්ගතො යථාකාමකරණීයො පාපිමතො.

සන්ති භික්ඛවෙ සොතවිඤ්ඤෙය්‍යා සද්දා -පෙ- ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා -පෙ- සන්ති භික්ඛවෙ මනොවිඤ්ඤෙය්‍යා ධම්මා -පෙ- තඤ්චෙ භික්ඛු අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨති. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු බද්ධො මනොවිඤ්ඤෙය්‍යෙසු ධම්මෙසු ආවාසගතො මාරස්ස, මාරස්ස වසඞ්ගතො, යථාකාමකරණීයො පාපිමතො.

සන්ති ච ඛො භික්ඛවෙ චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, තඤ්චෙ භික්ඛු නාභිනන්දති නාභිවදති නාජ්ඣොසාය තිට්ඨති. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු, මුත්තො චක්ඛුවිඤ්ඤෙය්‍යෙහි රූපෙහි, න ආවාසගතො මාරස්ස, න මාරස්ස වසඞ්ගතො, න යථාකාමකරණීයො පාපිමතො.

සන්ති භික්ඛවෙ සොතවිඤ්ඤෙය්‍යා සද්දා -පෙ- ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා -පෙ- සන්ති භික්ඛවෙ මනොවිඤ්ඤෙය්‍යා ධම්මා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, තඤ්චෙ භික්ඛු නාභිනන්දති නාභිවදති නාජ්ඣොසාය තිට්ඨති. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු මුත්තො මනොවිඤ්ඤෙය්‍යෙහි ධම්මෙහි, න ආවාසගතො මාරස්ස, න මාරස්ස වසඞ්ගතො, න යථාකාමකරණීයො පාපිමතොති.

## 1. 12. 3

## ලොකන්තගමනසුත්තං

116. නාහං භික්ඛවෙ ගමනෙන ලොකස්ස අන්තං ඤාතෙය්‍යං[1] දට්ඨෙය්‍යං[2] පත්තෙය්‍යන්ති වදාමි. න ච පනාහං භික්ඛවෙ අප්පත්වා ලොකස්ස අන්තං දුක්ඛස්ස අන්තකිරියං වදාමීති. ඉදං වත්වා භගවා උට්ඨායාසනා විහාරං පාවිසි.

---

1. ඤාතයං සී 2.
2. දිට්ඨෙය්‍යං ස්‍යා.

## 1. 12. 2

## දුතිය මාරපාස සූත්‍රය

115. මහණෙනි, ඉටු කැමති මනවඩන පියදෑ වූ කාමයෙන් යුත් සිත් අලවන ඇසින් දත යුතු රූ ඇත. ඉදින් මහණ තෙමේ එය පිළිගන්නේ ද (එහි) ගුණ කියන්නේ ද, ගැලී සිටින්නේ ද, මහණෙනි, මේ මහණ තෙමේ ඇසින් දත යුතු රූහි බැඳුණේ මරුවසන තැනට ගියේ මරුවසයට ගියේ මරහු විසින් කැමති පරිදි කළ හැක්කේ ය යි කියනු ලැබේ.

මහණෙනි, කනින් දත යුතු සද ඇත ... නැහැයෙන් දත යුතු ගඳ ... දිවෙන් දත යුතු රස ... කයින් දත යුතු පහස් ... මහණෙනි, සිතින් දත යුතු දහම් ඇත ... ඉදින් මහණ තෙමේ එය පිළිගන්නේ ද, එහි ගුණ කියන්නේ ද, එහි ගැලී සිටිනේ ද, මහණෙනි මේ මහණ තෙමේ සිතින් දත යුතු දහම්හි බැඳුණේ මරුවසන තැනට ගියේ මරුවසයට ගියේ මරහු විසින් කැමති පරිදි කළ හැක්කේ ය යි කියනු ලැබේ.

තවද මහණෙනි, ඉටු කැමති මනවඩන පියදෑ වූ කාමයෙන් යුත් සිත් අලවන ඇසින් දත යුතු රූ ඇත. ඉදින් මහණ තෙමේ එය නො පිළිගන්නේ ද, එහි ගුණ නො කියන්නේ ද, එහි ගැලී නො සිටිනේ ද, මහණෙනි මේ මහණ තෙමේ ඇසින් දත යුතු රූපයන්ගෙන් මිදුණේ මරුවසන තැනට නො ගියේ මරුවසයට නො ගියේ මරහු විසින් කැමති පරිදි නො කළ හැක්කේ ය යි කියනු ලැබේ.

මහණෙනි කනින් දත යුතු සද ඇත ... නැහැයෙන් දත යුතු ගඳ ... දිවෙන් දත යුතු රස ... කයින් දත යුතු පහස් ... මහණෙනි ඉටු කැමති මනවඩන පියදෑ වූ කාමයෙන් යුත් සිත් අලවන සිතින් දතයුතු දහම් ඇත. ඉදින් මහණ තෙමේ එය නො පිළිගන්නේ ද, එහි ගුණ නො කියන්නේ ද, එහි ගැලී නො සිටිනේ ද, මහණෙනි මේ මහණ තෙමේ සිතින් දත යුතු දහමින් මිදුණේ මරුවසන තැනට නො ගියේ මරුවසයට නො ගියේ මරහු විසින් කැමති පරිදි නො කළ හැක්කේ ය යි කියනු ලැබේ යි.

## 1. 12. 3

## ලෝකන්තගමන සූත්‍රය

116. මහණෙනි, ගමනින් ලොව කෙළවර දත හැකි යැ යි, දක්ක හැකි යැයි, පැමිණිය හැකි යැයි මම නො කියමි. මහණෙනි, ලොව කෙළවරට නො පැමිණ දුකෙහි කෙළවර කිරීමකු දු මම නො කියමි යි මෙය වදරා භාග්‍යවතුන් වහන්සේ හුනස්නෙන් නැඟී වෙහෙරට පිවිසි සේක.

අථ ඛො තෙසං භික්ඛූනං අචිරපක්කන්තස්ස භගවතො එතදහොසි: ඉදං ඛො නො[1] ආවුසො භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො "නාහං භික්ඛවෙ ගමනෙන ලොකස්ස අන්තං ඤාතෙය්‍යං දට්ඨෙය්‍යං පත්තෙය්‍යන්ති වදමි, න ච පනාහං භික්ඛවෙ අප්පත්වා ලොකස්ස අන්තං දුක්ඛස්ස අන්තකිරියං වදමී"ති. කො නු ඛො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජෙය්‍යාති.

අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි, අයං ඛො ආයස්මා ආනන්දො සත්ථු චෙව සංවණ්ණිතො, සම්භාවිතො ච විඤ්ඤූනං සබ්‍රහ්මචාරීනං. පහොති චායස්මා ආනන්දො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජිතුං. යන්නූන මයං යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමෙය්‍යාම, උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං එතමත්ථං පටිපුච්ඡෙය්‍යාමාති.

අථ ඛො තෙ භික්ඛූ යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ආයස්මතා ආනන්දෙන සද්ධිං සම්මොදිංසු. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ ආයස්මන්තං ආනන්දං එතදවොචුං: ඉදං ඛො නො ආවුසො ආනන්ද භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො, "නාහං භික්ඛවෙ ගමනෙන ලොකස්ස අන්තං ඤාතෙය්‍යං දට්ඨෙය්‍යං පත්තෙය්‍යන්ති වදමි, න ච පනාහං භික්ඛවෙ, අප්පත්වා ලොකස්ස අන්තං දුක්ඛස්ස අන්තකිරියං වදමී"ති. තෙසං නො ආවුසො අම්හාකං අචිරපක්කන්තස්ස භගවතො එතදහොසි:

ඉදං ඛො නො ආවුසො භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො: "නාහං භික්ඛවෙ ගමනෙන ලොකස්ස අන්තං ඤාතෙය්‍යං දට්ඨෙය්‍යං පත්තෙය්‍යන්ති වදමි. න ච පනාහං භික්ඛවෙ අප්පත්වා ලොකස්ස අන්තං දුක්ඛස්ස අන්තකිරියං වදමී"ති. කො නු ඛො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජෙය්‍යාති. තෙසං නො ආවුසො අම්හාකං එතදහොසි: අයං ඛො ආවුසො ආයස්මා ආනන්දො සත්ථු චෙව සංවණ්ණිතො, සම්භාවිතො ච විඤ්ඤූනං සබ්‍රහ්මචාරීනං, පහොති චායස්මා ආනන්දො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජිතුං. යන්නූන මයං යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමෙය්‍යාම, උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං එතමත්ථං පටිපුච්ඡෙය්‍යාමාති, විභජතායස්මා ආනන්දොති.

---

1. ඉදං ඛො නු - සී2,

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වැඩමකළ නොබෝ වේලාවකින් ඒ භික්ෂූන්ට මෙබඳු සිතෙක් වී ය: ඇවැත්නි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, ගමනින් ලොව කෙළවර දත හැකි යැයි දක්ක හැකි යැ යි පැමිණිය හැකි යයි මම නො කියමි. මහණෙනි ලොව කෙළවරට නො පැමිණ දුකෙහි කෙළවර කිරීමකු දු මම නො කියමි" යි. මේ උද්දෙසය අපට සැකෙවින් උදෙසා විතර විසින් අරුත නො බෙද හුනස්නෙන් නැඟී වෙහෙරට පිවිසි සේක. භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විතර විසින් අරුත නො බෙදන ලද මේ උද්දෙසයාගේ අරුත කවරෙක් නම් විතර විසින් බෙදන්නේ දෝ යි.

එකල්හි ඒ භික්ෂූන්ට මෙබඳු සිතෙක් විය. මේ ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ ශාස්තෘන් වහන්සේ විසින් ද සංවර්ණිතයහ. නුවණැති සබ්‍රම්සරුන් විසින් ද බුහුමන් කරන ලදහ. ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විතර විසින් අරුත නො බෙදන ලද මේ උද්දේසයාගේ අරුත විතර විසින් බෙදන්නට පොහොනාහු ද වෙති. අපි ආයුෂ්මත් ආනන්ද තෙරණුවන් වෙත එළඹෙන්නමෝ නම් එළඹ ආයුෂ්මත් ආනන්ද තෙරණුවන්ගෙන් මේ අරුත පුළුවුස්නමෝ නම් මැනවැ යි.

ඉක්බිති ඒ භික්ෂූහු ආයුෂ්මත් ආනන්ද තෙරණුවන් වෙත එළඹියහ. එළඹ ආයුෂ්මත් ආනන්ද තෙරණුවන් සමග සතුටු වූහ. සතුටු විය යුතු සිහි කට යුතු කතාව කොට නිමවා එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් ඒ භික්ෂූහු ආයුෂ්මත් ආනන්ද තෙරණුවන්ට මෙය කීහ: ඇවැත්නි ආනන්දයෙනි, භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි ගමනින් ලොව කෙළවර දත හැකියැ යි දක්ක හැකි ය යි පැමිණිය හැකි ය යි මම නො කියමි. මහණෙනි ලොව කෙළවරට නො පැමිණ දුකෙහි කෙළවර කිරීමකුදු මම නො කියමි''යි. මේ උද්දෙසය සැකෙවින් අපට උදෙසා විතර විසින් අරුත නො බෙද හුනස්නෙන් නැඟී වෙහෙරට පිවිසි සේක. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ වැඩමකළ නොබෝ වේලාවකින් ඒ අපට මෙබඳු සිතෙක් විය.

ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි ගමනින් ලොව-කෙළවර දත හැකි යැයි දක්ක හැකි යැයි පැමිණිය හැකි යැයි මම නො කියමි. මහණෙනි ලොව කෙළවරට නො පැමිණ දුකෙහි කෙළවර කිරීමකු දු මම නො කියමි" යි මේ උද්දේසය අපට සැකෙවින් උදෙසා විතර විසින් අරුත නො බෙද හුනස්නෙන් නැඟී වෙහෙරට පිවිසි සේක. භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විතර විසින් අරුත නො බෙදන ලද මේ උද්දෙසයෙහි අරුත කවරෙක් නම් විතර විසින් බෙදන්නේ දෝ යි. ඇවැත්නි ඒ අපට මෙබඳු සිතෙක් විය: ඇවැත්නි, මේ ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ ශාස්තෘන් වහන්සේ විසින් ද පසස්නා ලදහ. නුවණැති සබ්‍රම්සරුන් විසින් ද බුහුමන් කරන ලදහ. ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විතර විසින් අරුත නො බෙදන ලද මේ උද්දෙසයෙහි අරුත විතර විසින් බෙදන්නට පොහොනාහු ද වෙති. අපි ආයුෂ්මත් ආනන්ද තෙරණුවන් වෙත එළඹෙන්නමෝ නම් එළඹ ආයුෂ්මත් ආනන්ද තෙරණුවන්ගෙන් මේ අරුත පුළුවුස්නමෝ නම් මැනවැ" යි. ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ බෙදත්වා යි.

සෙය්‍යථාපි ආවුසො පුරිසො සාරත්ථිකො සාරගවෙසී සාරපරියෙසනං චරමානො මහතො රුක්ඛස්ස තිට්ඨතො සාරවතො අතික්කම්මෙව මූලං අතික්කම්ම[1] ඛන්ධං සාඛාපලාසෙ සාරං පරියෙසිතබ්බං මඤ්ඤෙය්‍ය එවං සම්පදමිදං. ආයස්මන්තානං සත්ථරි සම්මුඛීභූතෙ[2] තං භගවන්තං අතිසිත්වා අම්හෙ[3] එතමත්ථං පටිපුච්ඡිතබ්බං මඤ්ඤථ[4], සොහාවුසො භගවා ජානං ජානාති පස්සං පස්සති, චක්ඛුභූතො ඤාණභූතො ධම්මභූතො බ්‍රහ්මභූතො වත්තා පවත්තා අත්ථස්ස නින්නෙතා අමතස්ස දාතා ධම්මස්සාමී තථාගතො. සොචෙව පනෙතස්ස කාලො අහොසි, යං භගවන්තංයෙව එතමත්ථං පටිපුච්ඡෙය්‍යාථ. යථා වො භගවා ව්‍යාකරෙය්‍ය තථා නං[5] ධාරෙය්‍යාථාති.

අද්ධාවුසො ආනන්ද භගවා ජානං ජානාති පස්සං පස්සති චක්ඛුභූතො ඤාණභූතො ධම්මභූතො බ්‍රහ්මභූතො වත්තා පවත්තා අත්ථස්ස නින්නෙතා අමතස්ස දාතා ධම්මස්සාමී තථාගතො.

සො චෙව පනෙතස්ස කාලො අහොසි යං භගවන්තංයෙව එතමත්ථං පටිපුච්ඡෙය්‍යාම, යථා නො භගවා ව්‍යාකරෙය්‍ය තථා නං ධාරෙය්‍යාම. අපිචායස්මා ආනන්දො සත්ථු චෙව සංවණ්ණිතො සම්භාවිතො ච විඤ්ඤූනං සබ්‍රහ්මචාරීනං, පහොති චායස්මා ආනන්දො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජිතුං, විභජතායස්මා ආනන්දො අගරුං කරිත්වාති.

තෙනහාවුසො සුණාථ, සාධුකං මනසිකරොථ, භාසිස්සාමීති. එවමාවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො ආනන්දස්ස පච්චස්සොසුං. ආයස්මා ආනන්දො එතදවොච: යං ඛො වො ආවුසො භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො: "නාහං භික්ඛවෙ ගමනෙන ලොකස්ස අන්තං ඤාතෙය්‍යං දට්ඨෙය්‍යං පත්තෙය්‍යන්ති වදමි, න ච පනාහං භික්ඛවෙ අප්පත්වා ලොකස්ස අන්තං දුක්ඛස්ස අන්තකිරියං වදමී"ති. ඉමස්ස ඛ්වාහං ආවුසො භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස එවං විත්ථාරෙන[6] අත්ථං ආජානාමි:

යෙන ඛො ආවුසො ලොකස්මිං ලොකසඤ්ඤී හොති ලොකමානී, අයං වුච්චති අරියස්ස විනයෙ ලොකො. කෙන චාවුසො ලොකස්මිං ලොකසඤ්ඤී හොති ලොකමානී?

---

1. අතික්කම්මෙව මජසං.
2. භූතං - සයා.
3. තුම්හෙ - සයා.
4. මඤ්ඤෙථ සී2. PTS.
5. වො මජසං.
6. අවිභත්තස්ස විත්ථාරෙන - මජසං, සයා.

ඇවැත්නි, යම්සේ හර කැමති හර සොයන හර සෙවුම කරන පුරුෂයෙක් පවත්නා හර ඇති මහත් රුකෙක මුල ඉක්මැ කඳ ඉක්මැ අතු කොළවල හර සෙවිය යුතු යයි හඟතේ නම් මෙ ද එබඳු ය. ආයුෂ්මතුන්ට ශාස්තෲන් වහන්සේ හමු වූ කල්හි ඒ භාග්‍යවතුන් වහන්සේ ඉක්මැ අපගෙන් මේ අරුත පිළිවිසිය යුතු යයි හඟනහු ය. ඇවැත්නි, ඒ භාග්‍යවතුන් වහන්සේ දත යුත්ත දනිති. දැක්ක යුත්ත දකිති. (ලොවට) ඇසක් ම වූහ. ලොවට ඥානය ම වූහ. ලොවට ධර්මය ම වූහ. ලොවට බ්‍රහ්මන් ම වූහ. වක්තෘ ම ය. ප්‍රවක්තෘ ම ය. අර්ථ නිර්නෙතෘ ය. අමෘත දයක ය. ධර්මස්වාමී ය. තථාගත ය. යම් හෙයකින් භාග්‍යවතුන් වහන්සේගෙන් ම මේ අරුත පුළුවුස්නාහු නම් එය ම මීට කාලය වී ය. යම්සේ භාග්‍යවතුන් වහන්සේ වදරන සේක් නම් එසෙයින් එය දරන්නහු යයි.

ඇවැත්නි ආනන්දයෙනි, ඒකාන්තයෙන් ම භාග්‍යවතුන් වහන්සේ දත යුත්ත දනිති. දැක්ක යුත්ත දකිති. චක්ෂුර්භූතයහ. ඥානභූතයහ. ධර්මභූතයහ. බ්‍රහ්මභූතයහ. වක්තෘයහ. ප්‍රවක්තෘයහ. අමාව දෙනුවහ. අර්ථයාගේ නිර්නෙතෘයහ. ධර්මස්වාමීහ. තථාගතහ.

යම් හෙයෙකින් භාග්‍යවතුන් වහන්සේගෙන් ම මේ අරුත පුළුවුස්නමෝ නම් එය ම මීට කාලය වී ය. යම්සේ භාග්‍යවතුන් වහන්සේ වදරන සේක් නම් එසෙයින් එය දරන්නෙමු. එහෙත් ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ ශාස්තෲන් වහන්සේ විසින් ද පසස්නා ලදහ. නුවණැති සබ්‍රම්සරුන් විසින් ද බුහුමන් කරන ලදහ. ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විතර විසින් අරුත නො බෙදන ලද මේ උද්දේසයේ අරුත විතර විසින් බෙදන්නට පොහෝනාහු ද වෙති. ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ නො බර කොට බෙදන සේක්වා යි.

ඇවැත්නි එසේ නම් අසවු. මැනැවින් මෙනෙහි කරවු. කියන්නෙමි යි. එසේ ය ඇවැත්නි යි ඒ භික්ෂූහු ආයුෂ්මත් ආනන්ද තෙරණුවන්ට පිළිවදන් ඇස්වූහ. ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ මෙය වදළහ: ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි ගමනින් ලොව කෙළවර දත හැකි යැයි දැක්ක හැකි යයි පැමිණිය හැකි යැයි මම නො කියමි. මහණෙනි ලොව කෙළවරට නො පැමිණ දුකෙහි කෙළවර කිරීමකු දු මම නො කියමි'' යි යම් උද්දේසයක් තොපට සැකෙවින් උදෙසා විතර විසින් අරුත නො බෙදු හුනස්නෙන් නැඟී වෙහෙරට පිවිසි සේක් ද, ඇවැත්නි භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විතර විසින් අරුත නො බෙදන ලද මේ උද්දෙසයේ අරුත විතර විසින් මම මෙසේ දනිමි:

ඇවැත්නි, යමක් නිසා ලෝකයෙහි ලෝකය යන දැනීම ඇත්තේ ලෝකය යන හැඟීම ඇත්තේ වේ නම් ශාසනයෙහි මේ ලෝක ය යි කියනු ලැබේ. ඇවැත්නි කුමක් නිසා ලෝකයෙහි ලෝකය යන දැනීම ඇත්තේ ලෝකය යන හැඟීම ඇත්තේ වේ ද යත්:

චක්ඛුනා ඛො ආවුසො ලොකස්මිං ලොකසඤ්ඤී හොති ලොකමානී, සොතෙන ඛො ආවුසො ලොකස්මිං ලොකසඤ්ඤී හොති ලොකමානී, ඝානෙන ඛො ආවුසො ලොකස්මිං ලොකසඤ්ඤී හොති ලොකමානී, ජිව්හාය ඛො ආවුසො ලොකස්මිං ලොකසඤ්ඤී හොති ලොකමානී, කායෙන ඛො ආවුසො ලොකස්මිං ලොකසඤ්ඤී හොති ලොකමානී, මනෙන ඛො ආවුසො ලොකස්මිං ලොකසඤ්ඤී හොති ලොකමානී, යෙන ඛො ආවුසො ලොකස්මිං ලොකසඤ්ඤී හොති ලොකමානී අයං වුච්චති අරියස්ස විනයෙ ලොකො.

යං ඛො වො ආවුසො භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො, ''නාහං භික්ඛවෙ ගමනෙන ලොකස්ස අන්තං ඤාතෙය්‍යං දට්ඨෙය්‍යං පත්තෙය්‍යන්ති වදාමි, න ච පනාහං භික්ඛවෙ අප්පත්වා ලොකස්ස අන්තං දුක්ඛස්ස අන්තකිරියං වදාමී''ති. ඉමස්ස ඛ්වාහං ආවුසො භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානාමි. ආකඞ්ඛමානා ච පන තුම්හෙ ආයස්මන්තො, භගවන්තංයෙව උපසඞ්කමිත්වා එතමත්ථං පටිපුච්ඡෙය්‍යාථ. යථා වො භගවා ව්‍යාකරොති තථා නං ධාරෙය්‍යාථාති.

එවමාවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො ආනන්දස්ස පටිස්සුත්වා උට්ඨායාසනා යෙන භගවා තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු, එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: යං ඛො නො භන්තෙ, භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො '''නාහං භික්ඛවෙ ගමනෙන ලොකස්ස අන්තං ඤාතෙය්‍යං දට්ඨෙය්‍යං පත්තෙය්‍යන්ති වදාමි, න ච පනාහං භික්ඛවෙ, අප්පත්වා ලොකස්ස අන්තං දුක්ඛස්ස අන්තකිරියං වදාමී''ති. තෙසං නො භන්තෙ අම්හාකං අචිරපක්කන්තස්ස භගවතො එතදහොසි:

ඉදං ඛො නො ආවුසො, භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො, ''නාහං භික්ඛවෙ, ගමනෙන ලොකස්ස අන්තං ඤාතෙය්‍යං දට්ඨෙය්‍යං පත්තෙය්‍යන්ති වදාමි, න ච පනාහං භික්ඛවෙ, අප්පත්වා ලොකස්ස අන්තං දුක්ඛස්ස අන්තකිරියං වදාමී''ති. කො නු ඛො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජෙය්‍යාති.

ඇවැත්නි, ඇස නිසා ලෝකයෙහි ලෝකය යන දැනීම ඇත්තේ ලෝකය යන හැඟීම ඇත්තේ වෙයි. ඇවැත්නි කන නිසා ලෝකයෙහි ලෝකය යන දැනීම ඇත්තේ ලෝකය යන හැඟීම ඇත්තේ වෙයි. ඇවැත්නි නැහැය නිසා ලෝකයෙහි ලෝකය යන දැනීම ඇත්තේ ලෝකය යන හැඟීම ඇත්තේ වෙයි. ඇවැත්නි දිව නිසා ලෝකයෙහි ලෝකය යන දැනීම ඇත්තේ ලෝකය යන හැඟීම ඇත්තේ වෙයි. ඇවැත්නි කය නිසා ලෝකයෙහි ලෝකය යන දැනීම ඇත්තේ ලෝකය යන හැඟීම ඇත්තේ වෙයි. ඇවැත්නි සිත නිසා ලෝකයෙහි ලෝකය යන දැනීම ඇත්තේ ලෝකය යන හැඟීම ඇත්තේ වෙයි. ඇවැත්නි යමක් නිසා ලෝකයෙහි ලෝකය යන දැනීම ඇත්තේ ලෝකය යන හැඟීම ඇත්තේ වේ නම් ශාසනයෙහි මේ ලෝකය යි කියනු ලැබේ.

ඇවැත්නි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි ගමනින් ලොව කෙළවර දත හැකි යැයි දක්ක හැකියැයි පැමිණිය හැකි ය යි මම නො කියමි. මහණෙනි ලොව කෙළවරට නො පැමිණ දුකෙහි කෙළවර කිරීමකු දු මම නො කියමි" යි යම් උද්දේසයක් තොපට සැකෙවින් උදෙසා විතර විසින් අරුත නො බෙද හුනස්නෙන් නැඟී වෙහෙරට පිවිසි සේක් ද, ඇවැත්නි භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විතර විසින් අරුත නො බෙදන ලද මේ උද්දේසයේ අරුත විතර විසින් මම මෙසේ දනිමි. තවද ඇවැත්නි තෙපි කැමැත්තහු නම් භාග්‍යවතුන් වහන්සේ වෙත ම එළඹ මේ අරුත පුළුවුස්නවුය. භාග්‍යවතුන් වහන්සේ යම්සේ තොපට වදරන සේක් නම් එසෙයින් මෙය දරවු ය යි.

"එසේ ය ඇවැත්නි" යි ඒ භික්ෂූහු ආයුෂ්මත් ආනන්ද තෙරණුවන්ට පිළිතුරු දී හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ වෙත් එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් ව හුන්හ. එකත්පසෙක හුන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. වහන්ස භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි ගමනින් ලොව කෙළවර දත හැකි යැයි දක්ක හැකි යැයි පැමිණිය හැකි ය යි මම නො කියමි. මහණෙනි ලොව කෙළවරට නො පැමිණ දුකෙහි කෙළවර කිරීමකුදු මම නො කියමි"යි යම් උද්දේසයක් සැකෙවින් අපට උදෙසා විතර විසින් අරුත නො බෙද හුනස්නෙන් නැඟී වෙහෙරට පිවිසි සේක් ද; වහන්ස ඒ අපට භාග්‍යවතුන් වහන්සේ වැඩමකළ නොබෝ වේලාවකින් මෙබඳු සිතෙක් විය.

ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, ගමනින් ලොව කෙළවර දත හැකි යැ යි දක්ක හැකියැ යි පැමිණිය හැකි ය යි මම නො කියමි. මහණෙනි, ලොව කෙළවරට නො පැමිණ දුකෙහි කෙළවර කිරීමකුදු මම නො කියමි" යි මේ උද්දේසය අපට සැකෙවින් උදෙසා විතර විසින් අරුත නො බෙද හුනස්නෙන් නැඟී වෙහෙරට පිවිසි සේක. භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විතර විසින් අරුත නො බෙදන ලද මේ උද්දෙසයේ අරුත කවරෙක් නම් විතර විසින් බෙදන්නේ දෝයි.

තෙසං නො භන්තෙ අම්හාකං එතදහොසි: අයං ඛො ආයස්මා ආනන්දො සත්ථු චෙව සංවණ්ණිතො සම්භාවිතො ච විඤ්ඤූනං සබ්‍රහ්මචාරීනං, පහොති චායස්මා ආනන්දො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජිතුං. යන්නූන මයං යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමෙය්‍යාම, උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං එතමත්ථං පටිපුච්ඡෙය්‍යාමාති.

අථ ඛො මයං භන්තෙ යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමිම්හ[1] උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං එතමත්ථං පටිපුච්ඡිම්හ. තෙසං නො භන්තං භන්තෙ, ආයස්මතා ආනන්දෙන ඉමෙහි ආකාරෙහි ඉමෙහි පදෙහි ඉමෙහි ව්‍යඤ්ජනෙහි අත්ථො විභත්තොති. පණ්ඩිතො භික්ඛවෙ ආනන්දො, මහාපඤ්ඤො භික්ඛවෙ ආනන්දො, මඤ්චෙපි තුම්හෙ භික්ඛවෙ එතමත්ථං පටිපුච්ඡෙය්‍යාථ, අහම්පි ච තං[2] එවමෙව ව්‍යාකරෙය්‍යං, යථා තං ආනන්දෙන ව්‍යාකතං, එසො ඛො චෙවෙතස්ස අත්ථො, එවඤ්ච තං ධාරෙය්‍යාථාති.

## 1. 12. 4

## කාමගුණසුත්තං

117. පුබ්බෙව මෙ භික්ඛවෙ සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො එතදහොසි. යෙ මෙ[3] පඤ්චකාමගුණා චෙතසො සම්ඵුට්ඨපුබ්බා අතීතා නිරුද්ධා විපරිණතා, තත්ථ මෙ චිත්තං බහුලං ගච්ඡමානං ගච්ඡෙය්‍ය, පච්චුප්පන්නෙසු වා, අප්පං වා අනාගතෙසු.

තස්ස මය්හං භික්ඛවෙ එතදහොසි: යෙමෙ පඤ්චකාමගුණා චෙතසො සම්ඵුට්ඨපුබ්බා අතීතා නිරුද්ධා විපරිණතා, තත්‍ර මෙ අත්තරූපෙන අප්පමාදෙ සති චෙතසො ආරක්ඛො කරණීයො.

තස්මාතිහ භික්ඛවෙ තුම්හාකම්පි යෙ වො පඤ්චකාමගුණා චෙතසො සම්ඵුට්ඨපුබ්බා අතීතා නිරුද්ධා විපරිණතා, තත්‍ර වො චිත්තං බහුලං ගච්ඡමානං ගච්ඡෙය්‍ය පච්චුප්පන්නෙසු වා අප්පං වා අනාගතෙසු. තස්මාතිහ භික්ඛවෙ තුම්හාකම්පි යෙ වො පඤ්චකාමගුණා චෙතසො සම්ඵුට්ඨපුබ්බා අතීතා නිරුද්ධා විපරිණතා තත්‍ර වො අත්තරූපෙහි අප්පමාදෙ සති චෙතසො ආරක්ඛො කරණීයො.

1. මහා සයා.
2. අහම්පිතං - මජ්සං, සයා.
3. මය්හං - සයා.

වහන්ස, ඒ අපට මෙබඳු සිතෙක් විය: "මේ ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ ශාස්තෘන් වහන්සේ විසින් ද පසස්නා ලදහ. නුවණැති සබ්‍රහ්මචාරීන් විසින් ද බුහුමන් කරන ලදහ. ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විතර විසින් අරුත නො බෙදන ලද මේ උද්දේසයේ අරුත විතර විසින් බෙදන්නට පොහොනාහු ද වෙති. අපි ආයුෂ්මත් ආනන්ද තෙරණුවන් වෙත එළඹෙන්නමෝ නම් එළඹ ආයුෂ්මත් ආනන්ද තෙරණුවන්ගෙන් මේ අරුත පුළුවුස්නමෝ නම් මැනවැ'' යි.

වහන්ස, ඉක්බිති අපි ආනන්ද ආයුෂ්මතුන් වෙත එළඹුනෙමු. එළඹ ආනන්ද ආයුෂ්මතුන්ගෙන් මේ අරුත පුළුවුසුම්හ. වහන්ස, ඒ අපට ආනන්ද ආයුෂ්මතුන් විසින් මේ අයුරින් මේ පදවලින් මේ අකුරුවලින් අරුත බෙදන ලද්දේ ය යි. මහණෙනි, ආනන්දයෝ පණ්ඩිතයහ. මහණෙනි ආනන්දයෝ මහපැනැත්තෝහ. මහණෙනි තෙපි මගෙනුදු මේ අරුත පුළුවුස්නහු නම් මම ද එය මෙසේ ම පවසන්නෙම් වෙමි. ආනන්දයන් විසින් එය යම්සේ පවසන ලද්දේ නම් මෙය ම මෙහි අරුත ය. මෙසේ ම එය දරවු ය යි.

## 1. 12. 4

## කාමගුණ සූත්‍රය

117. මහණෙනි, සම්බෝධියෙන් පෙර ම බුදු නො වූ බෝසත් වූ ම මට මෙබඳු සිතෙක් විය: මාගේ යම් පස්කම්ගුණ කෙනෙක් සිතින් පහස්නා ලද විරූ ද, ඉකුත් වූවාහු ද, නිරුද්ධ වූවාහු ද, වෙනස් වූවාහු ද, එහි මා සිත පවත්නේ බහුල වශයෙන් පවත්නේ ය. වර්තමාන පඤ්චකාමගුණයන්හි ද (එසේ ය.) අනාගත පඤ්චකාමගුණයන්හි ද මද වශයෙන් (පවත්නේ ය.)

මහණෙනි, ඒ මට මෙබඳු සිතෙක් විය: මාගේ යම් පඤ්චකාමගුණ කෙනෙක් සිතින් පහස්නා ලද විරූ ද, ඉකුත් වූවාහු ද, නිරුද්ධ වූවාහු ද, වෙනස් වූවාහු ද තමහට වැඩ කැමති මා විසින් එහි අප්‍රමාදය හා සිහිය යන සිතේ ආරක්ෂාව කටයුතුය කියා යි.

මහණෙනි, එහෙයින් මෙහි ලා තොපට ද තොපගේ යම් පඤ්චකාමගුණ කෙනෙක් සිතින් පහස්නා ලද විරූ ද, ඉකුත් වූවාහු ද, නිරුද්ධ වූවාහු ද, වෙනස් වූවාහු ද එහි තොපගේ සිත පවත්නේ බහුල කොට පවත්නේ ය. වර්තමාන පඤ්චකාමගුණයන්හි ද (එසේ ය) අනාගත පඤ්චකාමගුණයන්හි ද මද කොට (පවත්නේ ය). මහණෙනි, එහෙයින් මෙහි ලා තොප විසිනුදු තොපගේ යම් පඤ්චකාමගුණ කෙනෙක් සිතින් පහස්නා ලද විරූ ද ඉකුත් වූවාහු ද නිරුද්ධ වූවාහු ද, වෙනස් වූවාහු ද එහි ලා තමහට වැඩකැමැති තොප විසින් අප්‍රමාදය හා සිහිය යන සිතේ ආරක්ෂාව කට යුතු යැ.

තස්මාතිහ භික්ඛවෙ, සෙ[1] ආයතනෙ වෙදිතබ්බෙ, යත්ථ චක්ඛුඤ්ච[2] නිරුජ්ඣති රූපසඤ්ඤා ච විරජ්ජති,[3] සෙ ආයතනෙ වෙදිතබ්බෙ, යත්ථ සොතඤ්ච නිරුජ්ඣති සද්දසඤ්ඤා ච විරජ්ජති සෙ ආයතනෙ වෙදිතබ්බෙ, යත්ථ ඝානඤ්ච නිරුජ්ඣති ගන්ධසඤ්ඤා ච විරජ්ජති[3] සෙ ආයතනෙ වෙදිතබ්බෙ, යත්ථ ජිව්හා ච නිරුජ්ඣති රසසඤ්ඤා ච විරජ්ජති[3] සෙ ආයතනෙ වෙදිතබ්බෙ, යත්ථ කායො ච නිරුජ්ඣති ඵොට්ඨබ්බසඤ්ඤා ච විරජ්ජති[3] සෙ ආයතනෙ වෙදිතබ්බෙ, යත්ථ මනො ච නිරුජ්ඣති ධම්මසඤ්ඤා ච විරජ්ජති[3] සෙ ආයතනෙ වෙදිතබ්බෙති ඉදං වත්වා භගවා උට්ඨායාසනා විහාරං පාවිසි.

අථ ඛො තෙසං භික්ඛූනං අචිරපක්කන්තස්ස භගවතො එතද-හොසි: ඉදං ඛො නො ආවුසො භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො. "තස්මාතිහ භික්ඛවෙ, සෙ ආයතනෙ වෙදිතබ්බෙ යත්ථ චක්ඛුඤ්ච නිරුජ්ඣති රූපසඤ්ඤා ච විරජ්ජති සෙ ආයතනෙ වෙදිතබ්බෙ -පෙ- යත්ථ මනො ච නිරුජ්ඣති ධම්මසඤ්ඤා ච විරජ්ජති සෙ ආයතනෙ වෙදිතබ්බෙති. කො නු ඛො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං විභජෙය්‍යාති.

අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි, අයං ඛො ආයස්මා ආනන්දො සත්ථු චෙව සංවණ්ණිතො සම්භාවිතො ච විඤ්ඤූනං සබ්‍රහ්මචාරීනං, පහොති චායස්මා ආනන්දො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජිතුං. යන්නූන මයං යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්ක-මෙය්‍යාම, උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං එතමත්ථං පටිපුච්ඡෙ-ය්‍යාමාති.

අථ ඛො තෙ භික්ඛූ යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමිංසු උපසඞ්කමිත්වා ආයස්මතා ආනන්දෙන සද්ධිං සම්මොදිංසු, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ ආයස්මන්තං ආනන්දං එතදවොචුං: ඉදං ඛො නො ආවුසො ආනන්ද භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො "තස්මාතිහ භික්ඛවෙ සෙ ආයතනෙ වෙදිතබ්බෙ. යත්ථ චක්ඛුඤ්ච නිරුජ්ඣති රූපසඤ්ඤා ච විරජ්ජති සෙ ආයතනෙ වෙදිතබ්බෙ -පෙ- යත්ථ මනො ච නිරුජ්ඣති ධම්මසඤ්ඤා ච විරජ්ජති සෙ ආයතනෙ වෙදිතබ්බෙති.

1. යෙ - සීමු. යෙ තෙ - මජසං. සයා,
2. චක්ඛු සීමු, සී2.
3. නිරුජ්ඣති - මජසං.

මහණෙනි, එහෙයින් මෙහි ලා ඒ ආයතනය දතයුතු ය. යම් තැනෙක ඇසත් නිරුද්ධ වේ නම් රූපසංඥාත් නැති වේ නම් ඒ ආයතනය දතයුතු ය. යම් තැනෙක කනත් නිරුද්ධ වේ නම් ශබ්දසංඥාත් නැති වේ නම් ඒ ආයතනය දතයුතු ය. යම්තැනෙක නැහැයත් නිරුද්ධ වේ නම් ගන්ධසංඥාත් නැති වේ නම් ඒ ආයතනය දතයුතු ය. යම් තැනෙක දිවත් නිරුද්ධ වේ නම් රසත් නැති වේ නම් ඒ ආයතනය දත යුතු ය. යම් තැනෙක කයත් නිරුද්ධ වේ නම් ස්ප්‍රෂ්ටව්‍යසංඥාත් නැති වේ නම් ඒ ආයතනය දතයුතු ය. යම් තැනෙක සිතත් නිරුද්ධ වේ නම් ධර්මසංඥාත් නැති වේ නම් ඒ ආයතනය දතයුතු ය යි භාග්‍යවතුන් වහන්සේ මෙය වදරා හුනස්නෙන් නැඟී වෙහෙරට පිවිසි සේක.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වැඩමකළ නොබෝ වේලාවකින් ඒ භික්ෂූන්ට මෙබඳු සිතෙක් විය: ඇවැත්නි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි එහෙයින් මෙහි ලා යම් තැනෙක ඇසත් නිරුද්ධ වේ නම් රූපසංඥාත් නැති වේ නම් ඒ ආයතනය දතයුතු ය .. යම් තැනෙක සිතත් නිරුද්ධ වේ නම් ධර්මසංඥාත් නැති වේ නම් ඒ ආයතනය දතයුතු ය යි මේ උද්දේසය සැකෙවින් අපට උදෙසා විතර විසින් අරුත නො බෙද හුනස්නෙන් නැඟී වෙහෙරට පිවිසි සේක. භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විතර විසින් අරුත නො බෙදන ලද මේ උද්දෙසයේ අරුත කවරෙක් නම් විතර විසින් බෙදන්නේ දෑ යි.

එකල්හි ඒ භික්ෂූන්ට මෙබඳු සිතෙක් වි ය: මේ ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ ශාස්තෲන් වහන්සේ විසින් පසස්නා ලදහ. නුවණැති සබ්‍රම්සරුන් විසින් ද බුහුමන් කරන ලදහ. ආනන්ද ආයුෂ්මත්හු භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විතර විසින් අරුත නො බෙදන ලද මේ උද්දෙසයාගේ අරුත විතර විසින් බෙදන්නට පොහොනාහු ද වෙති. අපි ආනන්ද ආයුෂ්මතුන් වෙත එළඹෙන්නමෝ නම් එළඹ ආනන්ද ආයුෂ්මතුන්ගෙන් මේ අරුත පුළුවුස්නමෝ නම් මැනවැ යි.

ඉක්බිති ඒ භික්ෂූහු ආයුෂ්මත් ආනන්ද තෙරණුවන් වෙත එළඹියහ. එළඹ ආයුෂ්මත් ආනන්ද තෙරණුවන් සමග සතුටු වූහ. සතුටු වියයුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකතපස් ව හුන්හ. එකත්පස් ව හුන් ඒ භික්ෂූහු ආයුෂ්මත් ආනන්ද තෙරණුවන්ට මෙය කීහ. ඇවැත්නි ආනන්දයෙනි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි එහෙයින් මෙහි ලා ඒ ආයතනය දතයුතු ය. යම් තැනෙක ඇසත් නිරුද්ධ වේ නම් රූපසංඥාත් නැති වේ නම් ඒ ආයතනය දතයුතු ය ... යම් තැනෙක සිතත් නිරුද්ධ වේ නම් ධර්මසංඥාත් නැති වේ නම් ඒ ආයතනය දතයුතු යයි මේ උද්දෙසය අපට සැකෙවින් උදෙසා විතර විසින් අරුත නො බෙද හුනස්නෙන් නැඟී වෙහෙරට පිවිසි සේක.

තෙසං නො ආවුසො අම්හාකං අචිරපක්කන්තස්ස භගවතො එතදහොසි: ඉදං ඛො නො[1] ආවුසො භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො, තස්මාතිහ භික්ඛවෙ සෙ ආයතනෙ වෙදිතබ්බෙ, යත්ථ චක්ඛුඤ්ච නිරුජ්ඣති රූපසඤ්ඤා ච විරජ්ජති සෙ ආයතනෙ වෙදිතබ්බෙ -පෙ- යත්ථ මනො ච නිරුජ්ඣති ධම්මසඤ්ඤා ච විරජ්ජති සෙ ආයතනෙ වෙදිතබ්බෙ''ති. කො නු ඛො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජෙය්‍යාති.

තෙසං නො ආවුසො අම්හාකං එතදහොසි: අයං ඛො ආයස්මා ආනන්දො සත්ථු චෙව සංවණ්ණිතො, සම්භාවිතො ච විඤ්ඤූනං සබ්‍රහ්මචාරීනං, පහොති චායස්මා ආනන්දො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජිතුං. යන්නූන මයං යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමෙය්‍යාම උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං එතමත්ථං පටිපුච්ඡෙය්‍යාමාති. විභජතායස්මා ආනන්දොති.

සෙය්‍යථාපි ආවුසො පුරිසො සාරත්ථිකො සාරගවෙසී සාරපරියෙසනං චරමානො මහතො රුක්ඛස්ස තිට්ඨතො සාරවතො අතික්කම්මෙව මූලං අතික්කම්ම ඛන්ධං සාඛාපලාසෙ සාරං පරියෙසිතබ්බං මඤ්ඤෙය්‍ය. එවං සම්පදමිදං. ආයස්මන්තානං සත්ථරි සම්මුඛීභූතෙ තං භගවන්තං අතිසිත්වා අම්හෙ එතමත්ථං පටිපුච්ඡිතබ්බං මඤ්ඤථ. සොහාවුසො භගවා ජානං ජානාති පස්සං පස්සති චක්ඛුභූතො ඤාණභූතො ධම්මභූතො බ්‍රහ්මභූතො වත්තා පවත්තා අත්ථස්ස නින්නෙතා අමතස්ස දතා ධම්මස්සාමී තථාගතො. සො චෙව පනෙතස්ස කාලො අහොසි, යං භගවන්තඤ්ඤෙව එතමත්ථං පටිපුච්ඡෙය්‍යාථ. යථා වො භගවා ව්‍යාකරෙය්‍ය තථා නං ධාරෙය්‍යාථාති.

අද්ධා ආවුසො ආනන්ද භගවා ජානං ජානාති පස්සං පස්සති චක්ඛුභූතො ඤාණභූතො ධම්මභූතො බ්‍රහ්මභූතො වත්තා පවත්තා අත්ථස්ස නින්නෙතා අමතස්ස දතා ධම්මස්සාමී තථාගතො, සො චෙව පනෙතස්ස කාලො අහොසි, යං භගවන්තඤ්ඤෙව එතමත්ථං පටිපුච්ඡෙය්‍යාම යථා නො භගවා ව්‍යාකරෙය්‍ය තථා නං ධාරෙය්‍යාම. අපි චායස්මා ආනන්දො සත්ථුචෙව සංවණ්ණිතො, සම්භාවිතො ච විඤ්ඤූනං සබ්‍රහ්මචාරීනං, පහොති චායස්මා ආනන්දො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජිතුං, විභජතායස්මා ආනන්දො අගරුං කරිත්වාති.

---

1. ඉදං ඛො නො – සයා සී.

ඇවැත්නි ඒ අපට භාග්‍යවතුන් වහන්සේ වැඩමකළ නොබෝ වේලාවකින් මෙබඳු සිතෙක් විය: ඇවැත්නි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි එහෙයින් මෙහි ලා ඒ ආයතනය දතයුතු ය. යම් තැනෙක ඇසත් නිරුද්ධ වේ නම් රූපසංඥාත් නැති වේ නම් ඒ ආයතනය දත යුතුය ... යම් තැනෙක සිතත් නිරුද්ධ වේ නම් ධර්මසංඥාත් නැති වේ නම් ඒ ආයතනය දතයුතු යයි මේ උද්දේසය අපට සැකෙවින් උදෙසා විතර විසින් අරුත නො බෙද හුනස්නෙන් නැඟී වෙහෙරට පිවිසි සේක. භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විතර විසින් අරුත නො බෙදන ලද මේ උද්දෙසයෙහි අරුත කවරෙක් නම් විතර විසින් බෙදන්නේ දෝ" යි.

ඇවැත්නි, ඒ අපට මෙබඳු සිතෙක් විය: "මේ ආනන්ද ආයුෂ්මත්හු ශාස්තෲන් වහන්සේ විසින් ද පසස්නා ලදහ. නුවණැති සබ්‍රම්සරුන් විසින් ද බුහුමන් කරන ලදහ. ආයුෂ්මත් ආනන්ද තෙමේ භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විතර විසින් අරුත නො බෙදන ලද මේ උද්දේසයෙහි අරුත විතර විසින් බෙදන්නට පොහොනාහු ද වෙති. අපි ආයුෂ්මත් ආනන්ද තෙරුන් වෙත එළඹෙන්නමෝ නම් එළඹ ආයුෂ්මත් ආනන්ද තෙරුන්ගෙන් මේ අරුත් පුළුවුස්නමෝ නම් මැනවැයි. ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ බෙද විස්තර කෙරෙත්වා" යි.

ඇවැත්නි යම්සේ හර කැමැති හර සොයන හර සෙවුම කරන පුරුෂයෙක් පවත්නා හර ඇති මහරුකෙක මුලත් ඉක්ම කඳත් ඉක්ම අතුකොළවල හර සෙවියයුතු යයි හඟනේ නම් මෙ ද එබඳු ය. ආයුෂ්මතුන්ට ශාස්තෲන් වහන්සේ හමු වූ කල්හි ඒ භාග්‍යවතුන් වහන්සේ ඉක්මැ මේ අරුත අපගෙන් පිළිවිසිය යුතු යයි හඟිවු ද. ඇවැත්නි ඒ භාග්‍යවතුන් වහන්සේ දන්නෝම දනිති. දක්නාහුම දකිති. චක්ෂුර්භූතයහ. ඥානභූතයහ. ධර්මභූතයහ. බ්‍රහ්මභූතයහ. වක්තෲහ. ප්‍රවක්තෲහ. අර්ථය පිළිබඳ නිර්නෙතෲහ. අමෘතදායකයහ. ධර්ම ස්වාමීහ. තථාගතයහ. යම් හෙයෙකින් භාග්‍යවතුන් වහන්සේගෙන් ම මේ අරුත පුළුවුස්නහු නම් එයට මෙය ම කාලය විය. යම්සේ භාග්‍යවතුන් වහන්සේ තොපට වදරන සේක් නම් එපරිද්දෙන් එය දරව යි.

ඇවැත්නි ආනන්දයෙනි ඒකාන්තයෙන් ම භාග්‍යවතුන් වහන්සේ දන්නාහුම දනිති, දක්නාහුම දකිති. චක්ෂුර්භූතයහ. ඥානභූතයහ. ධර්මභූතයහ. බ්‍රහ්මභූතයහ. වක්තෲහ. ප්‍රවක්තෲහ. අර්ථය පිළිබඳ නිර්නෙතෲහ. අමෘත දායකයහ. ධර්මස්වාමීහ. තථාගතයහ. යම් හෙයෙකින් භාග්‍යවතුන් වහන්සේගෙන් ම මේ අරුත පුළුවුස්නහු නම් එය ම මීට කල් වී ය. යම්සේ භාග්‍යවතුන් වහන්සේ අපට වදරන සේක් නම් එසෙයින් එය දරන්නෙමු. එහෙත් ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ විසින් ද පසස්නා ලදහ. නුවණැති සබ්‍රහ්මසරුන් විසින් ද බුහුමන් කරන ලදහ. ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විතර විසින් අරුත නො බෙදන ලද මේ උදෙසුම්හි අරුත විතර විසින් බෙදන්නට පොහොනාහු ද වෙති. ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ නොබර කොට විතර විසින් අරුත බෙදන සේක්වා යි.

තෙනහාවුසො සුණාථ සාධුකං මනසිකරොථ භාසිස්සාමීති. එවමාවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො ආනන්දස්ස පච්චස්සොසුං. ආයස්මා ආනන්දො එතදවොච: යං ඛො වො ආවුසො භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො: තස්මාතිහ භික්ඛවෙ සෙ ආයතනෙ වෙදිතබ්බෙ, යත්ථ චක්ඛුඤ්ච නිරුජ්ඣති රූපසඤ්ඤා ච විරජ්ජති සෙ ආයතනෙ වෙදිතබ්බෙ -පෙ- යත්ථ මනො ච නිරුජ්ඣති ධම්මසඤ්ඤා ච විරජ්ජති සෙ ආයතනෙ වෙදිතබ්බෙති. ඉමස්ස ඛ්වාහං ආවුසො භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං ආජානාමි. සළායතනනිරොධං ඛො එතං ආවුසො භගවතා සන්ධාය භාසිතං; "තස්මාතිහ භික්ඛවෙ, සෙ ආයතනෙ වෙදිතබ්බෙ. යත්ථ චක්ඛුඤ්ච නිරුජ්ඣති රූපසඤ්ඤා ච විරජ්ජති සෙ ආයතනෙ වෙදිතබ්බෙ -පෙ- යත්ථ මනො ච නිරුජ්ඣති ධම්මසඤ්ඤා ච විරජ්ජති සෙ ආයතනෙ වෙදිතබ්බෙ"ති.

යං ඛො ආවුසො භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො; "තස්මාතිහ භික්ඛවෙ සෙ ආයතනෙ වෙදිතබ්බෙ, යත්ථ චක්ඛුඤ්ච නිරුජ්ඣති රූපසඤ්ඤා ච විරජ්ජති සෙ ආයතනෙ වෙදිතබ්බෙ -පෙ- යත්ථ මනො ච නිරුජ්ඣති, ධම්මසඤ්ඤා ච විරජ්ජති සෙ ආයතනෙ වෙදිතබ්බෙති ඉමස්ස ඛ්වාහං ආවුසො භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානාමි. ආකඞ්ඛමානා ච පන තුම්හෙ ආයස්මන්තො භගවන්තංයෙව උපසඞ්කමථ, උපසඞ්කමිත්වා එතමත්ථං පටිපුච්ඡෙය්‍යාථ, යථා වො භගවා ව්‍යාකරොති, තථා නං ධාරෙය්‍යාථාති.

එවමාවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො ආනන්දස්ස පටිස්සුත්වා උට්ඨායාසනා යෙන භගවා තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු, එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං:

යං ඛො නො භන්තෙ භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො: "තස්මාතිහ භික්ඛවෙ සෙ ආයතනෙ වෙදිතබ්බෙ, යත්ථ චක්ඛුඤ්ච නිරුජ්ඣති රූපසඤ්ඤා ච විරජ්ජති සෙ ආයතනෙ වෙදිතබ්බෙ -පෙ- යත්ථ මනො ච නිරුජ්ඣති ධම්මසඤ්ඤා ච විරජ්ජති සෙ ආයතනෙ වෙදිතබ්බෙ"ති තෙසං නො භන්තෙ අම්හාකං අචිරපක්කන්තස්ස භගවතො එතදහොසි:

ඇවැත්නි එසේ නම් අසවු. මැනවින් මෙනෙහි කරවු. කියන්නෙමි යි. එසේ ය ඇවැත්නි යි ඒ මහණහු ආයුෂ්මත් ආනන්ද තෙරුන්ට පිළිවදන් ඇස්වූහ. ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ මෙය කීහ: ඇවැත්නි භාග්‍යවතුන් වහන්සේ මහණෙනි, එහෙයින් මෙහි ලා ඒ ආයතනය දතයුතු ය. යම් තැනෙක ඇසත් නිරුද්ධ වේ ද රූපසංඥාත් නැති වේ ද ඒ ආයතනය දතයුතු ය ... යම්තැනෙක සිතත් නිරුද්ධ වේ ද ධර්මසංඥාත් නැති වේ ද ඒ ආයතනය දතයුතු ය යන මේ උදෙසුම සැකෙවින් උදෙසා විතර විසින් අරුත නො බෙද හුනස්නෙන් නැඟිට විහාරයට වැඩි සේක් ද, ඇවැත්නි භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විතර විසින් අරුත නො බෙදන ලද මේ උදෙසුම්හි අරුත විතර විසින් මම මෙසේ දනිමි. ඇවැත්නි "මහණෙනි එහෙයින් මෙහි ලා ඒ ආයතනය දතයුතු ය. යම්තැනෙක ඇසත් නිරුද්ධ වේ ද, රූපසංඥාත් නැති වේ ද, ඒ ආයතනය දතයුතු ය. ... යම් තැනෙක සිතත් නිරුද්ධ වේ ද, ධර්මසංඥාත් නැති වේ ද, ඒ ආයතනය දතයුතු ය" යි මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් සළායතන නිරොධය සඳහා වදරන ලදී.

ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි එහෙයින් මෙහි ලා ඒ ආයතනය දතයුතු ය. යම්තැනෙක ඇසත් නිරුද්ධ වේ ද, රූපසංඥාත් නැති වේ ද, ඒ ආයතනය දතයුතු ය ... යම්තැනෙක සිතත් නිරුද්ධ වේ ද, ධර්මසංඥාත් නැති වේ ද, ඒ ආයතනය දතයුතු ය" යි යම් උදෙසුමක් සැකෙවින් උදෙසා විතර විසින් අරුත නො බෙද හුනස්නෙන් නැඟී වෙහෙරට පිවිසි සේක් ද, ඇවැත්නි භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විතර විසින් අරුත නොබෙදන ලද මේ උදෙසුම්හි අරුත විතර විසින් මම මෙසේ දනිමි. ඇවැත්නි, තෙපි කැමැත්තහු නම් භාග්‍යවතුන් වහන්සේ වෙතම එළඹෙවු. එළඹ මේ අරුත පිළිවිසිවු. යම් සේ භාග්‍යවතුන් වහන්සේ තොපට වදරන සේක් නම් එසෙයින් එය දරව යි.

එසේ ය ඇවැත්නි යි ඒ භික්ෂූහු ආයුෂ්මත් ආනන්ද තෙරණුවන්ට පිළිතුරු දී, හුනස්නෙන් නැඟී භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ:

වහන්ස භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි එහෙයින් මෙහි ලා ඒ ආයතනය දතයුතු ය. යම් තැනක ඇසත් නිරුද්ධ වේ ද, රූපසංඥාත් නැති වේ ද, ඒ ආයතනය දතයුතු ය. ... යම් තැනක සිතත් නිරුද්ධ වේ ද, ධර්මසංඥාත් නැති වේ ද ඒ ආයතනය දතයුතු ය යි යම් උදෙසුමක් සැකෙවින් උදෙසා විතර විසින් අරුත නො බෙද හුනස්නෙන් නැඟී වෙහෙරට පිවිසි සේක් ද වහන්ස, ඒ අපට භාග්‍යවතුන් වහන්සේ වැඩම කළ නොබෝ වේලාවකින් මෙබඳු සිතෙක් වීය.

ඉදං ඛො නො ආවුසො, භගවා සඞ්ඛිත්තෙන උද්දෙසං උද්දිසිත්වා විත්ථාරෙන අත්ථං අවිභජිත්වා උට්ඨායාසනා විහාරං පවිට්ඨො: "තස්මාතිහ භික්ඛවෙ සෙ ආයතනෙ වෙදිතබ්බෙ යත්ථ චක්ඛුඤ්ච නිරුජ්ඣති රූපසඤ්ඤා ච විරජ්ජති සෙ ආයතනෙ වෙදිතබ්බෙ -පෙ- යත්ථ මනො ච නිරුජ්ඣති ධම්මසඤ්ඤා ච විරජ්ජති සෙ ආයතනෙ වෙදිතබ්බෙ"ති. කො නු ඛො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජෙය්‍යාති.

තෙසං නො භන්තෙ, අම්හාකං එතදහොසි: අයං ඛො ආයස්මා ආනන්දො සත්ථු චෙව සංවණ්ණිතො, සම්භාවිතො ච විඤ්ඤූනං සබ්‍රහ්මචාරීනං, පහොති චායස්මා ආනන්දො ඉමස්ස භගවතා සඞ්ඛිත්තෙන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජිතුං. යන්නූන මයං යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමෙය්‍යාම, උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං එතමත්ථං පටිපුච්ඡෙය්‍යාමාති.

අථ ඛො මයං භන්තෙ, යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමිම්හ උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං එතමත්ථං පටිපුච්ඡිම්හ. තෙසං නො භන්තෙ ආයස්මතා ආනන්දෙන ඉමෙහි ආකාරෙහි ඉමෙහි පදෙහි ඉමෙහි ව්‍යඤ්ජනෙහි අත්ථො විභත්තොති. පණ්ඩිතො භික්ඛවෙ ආනන්දො, මහාපඤ්ඤො භික්ඛවෙ ආනන්දො, මං චෙපි තුම්හෙ භික්ඛවෙ එතමත්ථං පටිපුච්ඡෙය්‍යාථ, අහම්පි තං එවමෙව ව්‍යාකරෙය්‍යං යථා තං ආනන්දෙන ව්‍යාකතං. එසො ඛො චෙවෙතස්ස[1] අත්ථො එවඤ්ච නං ධාරෙය්‍යාථාති.

## 1. 12. 5

### සක්කපඤ්හසුත්තං

118. එකං සමයං භගවා රාජගහෙ විහරති ගිජ්ඣකූටෙ පබ්බතෙ, අථ ඛො සක්කො දෙවානමින්දො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො සක්කො දෙවානමින්දො භගවන්තං එතදවොච: කො නු ඛො භන්තෙ හෙතු කො පච්චයො යෙනමිධෙකච්චෙ සත්තා දිට්ඨෙව ධම්මෙ නො පරිනිබ්බායන්ති? කො පන භන්තෙ හෙතු කො පච්චයො යෙනමිධෙකච්චෙ සත්තා දිට්ඨෙව ධම්මෙ පරිනිබ්බායන්ති?

---
1. එසො චෙවෙතස්ස - මජසං.

ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ ''මහණෙනි, එහෙයින් මෙහි ලා ඒ ආයතනය දතයුතු ය. යම් තැනෙක ඇසත් නිරුද්ධ වේ ද, රූපසංඥාත් නැති වේ ද, ඒ ආයතනය දත යුතු ය .... යම් තැනෙක සිතත් නිරුද්ධ වේ ද, ධර්මසංඥාත් නැති වේ ද, ඒ ආයතනය දතයුතු ය''යි මේ උදෙසුම සැකෙවින් උදෙසා විතර විසින් අරුත නො බෙද හුනස්නෙන් නැඟී වෙහෙරට පිවිසි සේක. භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විතර විසින් අරුත නො බෙදන ලද මේ උදෙසුම්හි අරුත කවරෙක් නම් විතර විසින් බෙදන්නේ දැ යි.

වහන්ස, ඒ අපට මෙබඳු සිතෙක් විය. මේ ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ විසින් ද පසස්නා ලදහ. නුවණැති සබ්‍රම්සරුන් විසින් ද බුහුමන් කරන ලදහ. ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් උදෙසන ලද විතර විසින් අරුත නො බෙදන ලද මේ උදෙසුම්හි අරුත විතර විසින් බෙදන්නට පොහොනාහු ද වෙති. අපි ආයුෂ්මත් ආනන්ද තෙරණුවන් වෙත එළඹෙන්නමෝ නම් එළඹ ආයුෂ්මත් ආනන්ද තෙරණුවන්ගෙන් මේ අරුත පුළුවුස්නමෝ නම් මැනවැ යි.

වහන්ස, එකල්හි අපි ආයුෂ්මත් ආනන්ද තෙරණුවන් වෙත එළඹුණෙමු. එළඹ ආයුෂ්මත් ආනන්ද තෙරණුවන්ගෙන් මේ අරුත පුළුවුසුම්හ. වහන්ස, ඒ අපට ආයුෂ්මත් ආනන්ද තෙරණුවන් විසින් මේ අයුරින් මේ පදවලින් මේ අකුරුවලින් අරුත බෙදන ලද්දේ යි. මහණෙනි, ආනන්දයෝ පණ්ඩිතයහ. මහණෙනි, ආනන්දයෝ මහපැනැත්තෝ යැ මහණෙනි, තෙපි මේ අරුත මගෙනුදු පුළුවුස්නහු නම් ''යම්සේ එය ආනන්දයන් විසින් පවසන ලද්දේ ද මමත් එය එසේ ම පවසන්නෙමි. මෙය ම මෙහි අරුත යි. මෙසේ ම එය දරව යි.

## 1. 12. 5

## සක්කපඤ්හ සූත්‍රය

118. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර සමීපයෙහි ගිජ්ඣකූළපව්වෙහි වැඩවසන සේක. එකල්හි සක්දෙවිඳු භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේ ය. එකත්පසෙක සිටි සක්දෙවිඳු භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: වහන්ස, යම්හෙයෙකින් මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් දිටුදැමියෙහි ම නො පිරිනිවෙත් නම් එයට හේතු කිම, ප්‍රත්‍යය කිමැ යි. වහන්ස, යම්හෙයෙකින් මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් දිටුදැමියෙහි ම පිරිනිවෙත් නම් එයට හේතු කිම, ප්‍රත්‍යය කිමැ යි.

සන්ති ඛො දෙවානමින්ද, චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, තඤ්චෙ භික්ඛු අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨති, තස්ස තං අභිනන්දතො අභිවදතො අජ්ඣොසාය තිට්ඨතො තන්නිස්සිතං විඤ්ඤාණං හොති තදුපාදානං. සඋපාදානො දෙවානමින්ද, භික්ඛු නො පරිනිබ්බායති. සන්ති ඛො දෙවානමින්ද, සොතවිඤ්ඤෙය්‍යා සද්ද -පෙ- ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා -පෙ- සන්ති ඛො දෙවානමින්ද, මනොවිඤ්ඤෙය්‍යා ධම්මා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. තඤ්චෙ භික්ඛු අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨති, තස්ස තං අභිනන්දතො අභිවදතො අජ්ඣොසාය තිට්ඨතො තන්නිස්සිතං විඤ්ඤාණං හොති තදුපාදානං. සඋපාදානො දෙවානමින්ද, භික්ඛු නො පරිනිබ්බායති. අයං ඛො දෙවානමින්ද, හෙතු අයං පච්චයො යෙනමිධෙකච්චෙ සත්තා දිට්ඨෙව ධම්මෙ නො පරිනිබ්බායන්ති.

සන්ති ච ඛො දෙවානමින්ද, චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, තඤ්චෙ භික්ඛු නාභිනන්දති නාභිවදති නාජ්ඣොසාය තිට්ඨති, තස්ස තං අනභිනන්දතො අනභිවදතො අනජ්ඣොසාය තිට්ඨතො න තන්නිස්සිතං විඤ්ඤාණං හොති න තදුපාදානං. අනුපාදානො දෙවානමින්ද, භික්ඛු පරිනිබ්බායති. සන්ති ඛො දෙවානමින්ද, සොතවිඤ්ඤෙය්‍යා සද්ද -පෙ- ඝාන-විඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා -පෙ- සන්ති ඛො දෙවානමින්ද, මනොවිඤ්ඤෙය්‍යා ධම්මා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. තඤ්චෙ භික්ඛු නාභිනන්දති නාභිවදති නාජ්ඣොසාය තිට්ඨති. තස්ස තං අනභිනන්දතො අනභිවදතො අනජ්ඣොසාය තිට්ඨතො න තන්නිස්සිතං විඤ්ඤාණං හොති න තදුපාදානං. අනුපාදානො දෙවානමින්ද භික්ඛු පරිනිබ්බායති. අයං ඛො දෙවානමින්ද, හෙතු අයං පච්චයො යෙනමිධෙකච්චෙ සත්තා දිට්ඨෙව ධම්මෙ පරිනිබ්බායන්තී'ති.

## 1. 12. 6

## පඤ්චසිඛපඤ්හසුත්තං

119. එකං සමයං භගවා රාජගහෙ විහරති ගිජ්ඣකූටෙ පබ්බතෙ. අථ ඛො පඤ්චසිඛො ගන්ධබ්බපුත්තො[1] යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො පඤ්චසිඛො ගන්ධබ්බපුත්තො භගවන්තං එතදවොච: කො නු ඛො භන්තෙ හෙතු කො පච්චයො යෙනමිධෙකච්චෙ සත්තා දිට්ඨෙව ධම්මෙ නො පරිනිබ්බායන්ති? කො පන භන්තෙ[2] හෙතු කො පච්චයො යෙනමිධෙකච්චෙ සත්තා දිට්ඨෙව ධම්මෙ පරිනිබ්බායන්තී'ති.

---

1. ගන්ධබ්බදෙවපුත්තො - මජසං.
2. කො නු ඛො භන්තෙ - සිමු.

දෙවිඳ, ඉටු කැමති මනවඩන පියදෑ වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු ඇසින් දතයුතු රූ ඇත. ඉදින් මහණ එය පතා ද, ගුණ කියා ද, ගැලී සිටී ද, එය පතන ගුණ කියන ගැලී සිටින ඔහුගේ විඤ්ඤාණය එය ඇසුරු කෙළේ එය උපාදන කොට ඇත්තේ වෙයි. දෙවිඳ, උපාදන සහිත මහණ නො පිරිනිවෙයි. දෙවිඳ, කනින් දතයුතු සද ඇත ... නැහැයෙන් දතයුතු ගඳ ... දිවෙන් දතයුතු රස ... කයින් දතයුතු පහස .. දෙවිඳ, ඉටු කැමති මනවඩන පියදෑ වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු සිතින් දතයුතු දහම් ඇත. ඉදින් මහණ එය පතා ද, ගුණ කියා ද, ගැලී සිටී ද, එය පතන ගුණ කියන ගැලී සිටින ඔහුගේ විඤ්ඤාණය එය ඇසුරු කෙළේ එය උපාදන කොට ඇත්තේ වේ. දෙවිඳ, උපාදන සහිත මහණ නො පිරිනිවෙයි. දෙවිඳ, යම් හෙයෙකින් මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් දිටුදැටියෙහි ම නො පිරිනිවෙත් නම් එයට මේ හේතු යි මේ ප්‍රත්‍යය යි.

දෙවිඳ, ඉටු කැමැති මනවඩන පියදෑ වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු ඇසින් දතයුතු රූ ඇත. ඉදින් මහණ එය නො පතා ද, ගුණ නො කියා ද, ගැලී නො සිටී ද, එය නො පතන ගුණ නොකියන ගැලී නොසිටින ඔහුගේ විඤ්ඤාණය එය නො ඇසුරු කෙළේ එය උපාදන කොට නැත්තේ වෙයි. දෙවිඳ, උපාදන රහිත මහණ පිරිනිවෙයි. දෙවිඳ, කනින් දත යුතු සද ඇත .. නැහැයෙන් දතයුතු ගඳ ... දිවෙන් දතයුතු රස ... කයින් දතයුතු පහස ... දෙවිඳ, ඉටු කැමති මනවඩන පියදෑ වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු සිතින් දතයුතු දහම් ඇත. ඉදින් මහණ එය නො පතා ද, ගුණ නො කියා ද ගැලී නො සිටී ද, එය නො පතන ගුණ නොකියන ගැලී නොසිටින ඔහුගේ විඤ්ඤාණය එය නොඇසුරු කෙළේ එය උපාදන කොට නැත්තේ වේ. දෙවිඳ, උපාදන රහිත මහණ පිරිනිවෙයි. දෙවිඳ, යම් හෙයෙකින් මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් දිටුදැමියෙහි ම පිරිනිවෙත් නම් එයට මේ හේතු යි මේ ප්‍රත්‍යය යි.

## 1. 12. 6

## පඤ්චසිඛපඤ්හ සූත්‍රය

119. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර සමීපයෙහි ගිජුකුළු පව්වෙහි වැඩවසන සේක. එකල්හි පන්සිළුගදෙව්පුත් භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් ව සිටියේ ය. එකත්පස් ව සිටි පන්සිළුගදෙව්පුත් භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය. වහන්ස, යම් හෙයෙකින් මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් දිටුදැමියෙහි ම නොපිරිනිවෙත් නම් එයට හේතු කිම? ප්‍රත්‍යය කිම? වහන්ස, යම් හෙයෙකින් මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් දිටුදැමියෙහි ම පිරිනිවෙත් නම් එයට හේතු කිම? ප්‍රත්‍යය කිමැ යි.

සන්ති ඛො පඤ්චසිඛ, චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා -පෙ- (යථා පුරිමකං සුත්තන්තං විත්ථාරෙතබ්බං) සන්ති ඛො පඤ්චසිඛ මනොවිඤ්ඤෙය්‍යා ධම්මා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, තඤ්චෙ භික්ඛු අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨති, තස්ස තං අභිනන්දතො අභිවදතො අජ්ඣොසාය තිට්ඨතො තන්නිස්සිතං විඤ්ඤාණං හොති තදුපාදානං, සඋපාදානො පඤ්චසිඛ භික්ඛු නො පරිනිබ්බායති. අයං ඛො පඤ්චසිඛ හෙතු අයං පච්චයො යෙනමිධෙකච්චෙ සත්තා දිට්ඨෙව ධම්මෙ නො පරිනිබ්බායන්ති.

සන්ති ච ඛො පඤ්චසිඛ චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා -පෙ- සන්ති ච ඛො පඤ්චසිඛ මනොවිඤ්ඤෙය්‍යා ධම්මා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, තඤ්චෙ භික්ඛු නාභිනන්දති නාභිවදති නාජ්ඣොසාය තිට්ඨති. තස්ස තං අනභිනන්දතො අනභිවදතො අනජ්ඣොසාය තිට්ඨතො න තන්නිස්සිතං විඤ්ඤාණං හොති න තදුපාදානං. අනුපාදානො පඤ්චසිඛ භික්ඛු පරිනිබ්බායති. අයං ඛො පඤ්චසිඛ හෙතු අයං පච්චයො යෙනමිධෙකච්චෙ සත්තා දිට්ඨෙව ධම්මෙ පරිනිබ්බායන්තීති.

## 1. 12. 7

## සාරිපුත්තසද්ධිවිහාරිකසුත්තං

120. එකං සමයං ආයස්මා සාරිපුත්තො සාවත්ථියං විහරති ජෙතවනෙ **අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙනායස්මා සාරිපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා සාරිපුත්තෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං[1] වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු ආයස්මන්තං සාරිපුත්තං එතදවොච: සද්ධිවිහාරිකො ආවුසො සාරිපුත්ත භික්ඛු සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තොති.

එවංහෙතං[2] ආවුසො හොති ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරස්ස භොජනෙ අමත්තඤ්ඤුනො ජාගරියං අනනුයුත්තස්ස.

සො වතාවුසො භික්ඛු ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරො භොජනෙ අමත්තඤ්ඤූ ජාගරියං අනනුයුත්තො යාවජීවං පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං සන්තානෙස්සතීති නෙතං ඨානං විජ්ජති. සො වතාවුසො භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො භොජනෙ මත්තඤ්ඤූ ජාගරියං අනුයුත්තො යාවජීවං පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං සන්තානෙස්සතීති ඨානමෙතං විජ්ජති.

1. සාරණීයං, මජ්සං.
2. එවමෙතං - සීමු.

පඤ්චසිඛ, ඇසින් දතයුතු රූ ඇත ... (පළමු සූත්‍රය මෙන් විතර කටයුතු යි) පඤ්චසිඛ, ඉටු කැමති මනවඩන පියදෑ වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු සිතින් දතයුතු දහම් ඇත. ඉදින් මහණ එය පතා ද ගුණ කියා ද ගැලී සිටී ද එය පතන ගුණ කියන ගැලී සිටින ඔහුගේ විඤ්ඤාණය එය ඇසුරු කෙළේ එය උපාදන කොට ඇත්තේ වෙයි. පඤ්චසිඛ, උපාදන සහිත මහණ නො පිරිනිවෙයි. පඤ්චසිඛ, යම් හෙයෙකින් මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් දිටුදැමියෙහි ම නො පිරිනිවෙත් නම් එයට මේ හෙතු යි. මේ ප්‍රත්‍යය යි.

පඤ්චසිඛ, ඇසින් දතයුතු රූ ඇත ... පඤ්චසිඛ ඉටු කැමති මනවඩන පියදෑ වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු සිතින් දත යුතු දහම් ඇත. ඉදින් මහණ එය නො පතා ද, ගුණ නො කියා ද, ගැලී නො සිටී ද, එය නො පතන ගුණ නො කියන ගැලී නො සිටින ඔහුගේ විඤ්ඤණය එය ඇසුරු නො කෙළේ එය උපාදන කොට නැත්තේ වෙයි. පඤ්චසිඛ, උපාදන රහිත මහණ පිරිනිවෙයි. පඤ්චසිඛ, යම් හෙයෙකින් මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් දිටුදැමියෙහි ම පිරිනිවෙත් නම් එයට මේ හේතු යි. මේ ප්‍රත්‍යය යි.

## 1. 12. 7

## සාරිපුත්තසද්ධිවිහාරික සූත්‍රය

120. එක්කලෙක ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ සැවැත් නුවර සමීපයෙහි ජේතවන නම් අනේපිඩු සිටුහුගේ අරම්හි වැඩවෙසෙති. එකල්හි එක්තරා මහණෙක් ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් සමග සතුටු විය. සතුටු වියයුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත් පස් ව හුන්නේ ය. එකත්පස් ව හුන් ඒ මහණ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට මෙය කීයේ ය. ඇවැත්නි ශාරිපුත්‍රයෙනි, සද්ධිවිහාරික මහණ සික පිළිකෙව් කොට ගිහිබවට පෙරළුණේ යි.

ඇවැත්නි, ඉඳුරන්හි නොවැසූ දෙර ඇති බොජුනෙහි පමණ නො දන්නා නිදි වැරීමෙහි නොයෙදුණු (මහණ)හට මෙය මෙසේම වෙයි.

ඇවැත්නි, ඉඳුරන්හි නොවැසූ දෙර ඇති බොජුනෙහි පමණ නො දන්නා නිදි වැරීමෙහි නො යෙදුණු ඒ මහණ පිරිපුන් පිරිසුදු බඹසර දිවිහිමියෙන් නො සිඳ රක්නේ ය යන මෙකරුණ ඒකාන්තයෙන් නො ලැබේ. ඇවැත්නි, ඉඳුරන්හි වැසූ දෙර ඇති බොජුනෙහි පමණ දන්නා නිදිවැරීමෙහි යෙදුණු ඒ මහණ පිරිපුන් පිරිසිදු බඹසර දිවිහිමියෙන් නො සිඳ රක්නේ ය යන මෙකරුණ ඒකාන්තයෙන් ලැබෙයි.

කථඤ්චාවුසො ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති. ඉධාවුසො, භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී, යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දෙමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති, රක්ඛති චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී, යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දෙමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං' තස්ස සංවරාය පටිපජ්ජති. රක්ඛති මනින්ද්‍රියං, මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති. එවං ඛො ආවුසො ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති.

කථඤ්චාවුසො භොජනෙ මත්තඤ්ඤූ හොති. ඉධාවුසො භික්ඛු පටිසඞ්ඛායොනිසො ආහාරං ආහාරෙති, නෙව දවාය න මදාය න මණ්ඩනාය න විභූසනාය යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය විහිංසූපරතියා බ්‍රහ්මචරියානුග්ගහාය, ඉති පුරාණඤ්ච වෙදනං පටිහඞ්ඛාමි නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි යාත්‍රා ච මෙ භවිස්සති. අනවජ්ජතා ච ඵාසුවිහාරො චාති. එවං ඛො ආවුසො භොජනෙ මත්තඤ්ඤූ හොති.

කථඤ්චාවුසො ජාගරියං අනුයුත්තො හොති. ඉධාවුසො භික්ඛු දිවසං චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙති, රත්තියා පඨමං යාමං චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙති, රත්තියා මජ්ඣිමං යාමං දක්ඛිණෙන පස්සෙන සීහසෙය්‍යං කප්පෙති පාදෙ පාදං[1] අච්චාධාය සතො සම්පජානො උට්ඨානසඤ්ඤං මනසිකරිත්වා. රත්තියා පච්ඡිමං යාමං පච්චුට්ඨාය චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙති. එවං ඛො ආවුසො ජාගරියං අනුයුත්තො හොති.

තස්මාතිහාවුසො එවං සික්ඛිතබ්බං: ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරා භවිස්සාම භොජනෙ මත්තඤ්ඤුනො ජාගරියං අනුයුත්තාති. එවං හි වො ආවුසො සික්ඛිතබ්බන්ති.

1. පාදෙන පාදං - සත

ඇවැත්නි, කෙසේ නම් ඉඳුරන්හි වැසූ දෙර ඇත්තේ ද යත්: ඇවැත්නි, මෙසස්නෙහි මහණ ඇසින් රුවක් දැක නිමිතිවශයෙන් නොගන්නාසුලු වූයේ අනුව්‍යඤ්ජනවශයෙන් නොගන්නාසුලු වූයේ වෙයි. යම් හෙයෙකින් චක්ඛුන්‍ද්‍රිය අසංවෘත ව වෙසෙන මොහු අභිජ්ඣා දෙමනස්ස (දැඩිලොබ, නොසතුට) යන ලාමක අකුසල් දහම්හු ලුහුබඳනාහු ද. එහි සංවරය පිණිස පිළිපදී. චක්ඛුන්‍ද්‍රියය රකී. චක්ඛුන්‍ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි. කනින් සදක් අසා ... නැහැයෙන් ගඳක් ගෙන ... දිවෙන් රසක් විඳ ... කයින් පහසක් පැහැස...සිතින් දහමක් දැන නිමිතිවශයෙන් නොගන්නාසුලු වූයේ අනුව්‍යඤ්ජනවශයෙන් නොගන්නාසුලු වූයේ වෙයි. යම් හෙයෙකින් මනින්ද්‍රිය අසංවෘත ව වෙසෙන මොහු අභිජ්ඣා දෙමනස්ස යන ලාමක අකුසලදහම්හු ලුහුබඳනාහු ද, එහි සංවරය පිණිස පිළිපදියි. මනින්ද්‍රිය රකියි. මනින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි. ඇවැත්නි, මෙසේ ඉඳුරන්හි වසන ලද දෙර ඇත්තේ වෙයි.

ඇවැත්නි, කෙසේ නම් බොජුනෙහි පමණ දන්නේ වේ ද යත්: ඇවැත්නි, මෙසස්නෙහි මහණ ''කෙළි පිණිස නො වේ, මදය පිණිස නො වේ, අඩුතැන් පිරිම පිණිස නො වේ, සැරසුම පිණිස නො වේ, යම්තාක් මේ කය පැවැත්ම පිණිස යැපීම පිණිස සාදුක් වේදනා නැසීම පිණිස බඹසරට අනුග්‍රහ පිණිස (වළඳමි). මෙසේ පැරණි වේදනාව ද නසන්නෙමි. අලුත් වේදනා ද නූපදවන්නෙමි. මාගේ ඉරියව් පැවැත්ම ද නිවරද බව ද පහසුවිහරණය ද වන්නේ ය''යි නුවණින් සලකා අහර ගනී. ඇවැත්නි, මෙසේ බොජුනෙහි පමණ දන්නේ වෙයි.

ඇවැත්නි, කෙසේ නම් නිදිවැරීමෙහි යෙදුණේ වේ ද යත්: ඇවැත්නි, මෙසස්නෙහි මහණ දහවල සක්මනින් ද හිඳීමෙන් ද නීවරණ දහමින් සිත පිරිසිදු කෙරෙයි. රෑ පළමුයම සක්මනින් ද හිඳීමෙන් ද නීවරණදහමින් සිත පිරිසිදු කෙරෙයි. රෑ මැදුම්යම දකුණු පයෙහි වම් පය මඳක් මැත් කොට තබා සිහි ඇත්තේ මනානුවණ ඇත්තේ නැගිටිම් යන හැඟීම මෙනෙහි කොට දකුණුපසින් සිංහශය්‍යාව කෙරෙයි. රෑ පැසුළුයම පෙරළා නැගිට සක්මනින් ද හිඳීමෙන් ද නීවරණදහමින් සිත් පිරිසුදු කෙරෙයි. ඇවැත්නි, මෙසේ නිදිවැරීමෙහි යෙදුණේ වෙයි.

ඇවැත්නි, එහෙයින් මෙහිලා මෙසේ හික්මිය යුතු යි. ඉඳුරන්හි වැසූ දෙර ඇත්තමෝ බොජුනෙහි පමණ දන්නමෝ නිදිවැරීමෙහි යෙදුණමෝ වන්නෙමු යි. ඇවැත්නි, තොප විසින් මෙසේ හික්මිය යුතු යි.

## 1. 12. 8

## රාහුලොවාදසුත්තං

121. එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො භගවතො රහොගතස්ස පතිසල්ලීනස්ස[1] එවං චෙතසො පරිවිතක්කො උදපාදි:

"පරිපක්කා[2] ඛො රාහුලස්ස විමුත්තිපරිපාචනීයා ධම්මා. යන්නූනාහං රාහුලං උත්තරිං ආසවානං ඛයෙ විනෙය්‍යන්"ති.

අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සාවත්ථිං පිණ්ඩාය පාවිසි. සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො ආයස්මන්තං රාහුලං ආමන්තෙසි: "ගණ්හාහි රාහුල නිසීදනං, යෙනන්ධවනං තෙනුපසඞ්කමිස්සාම දිවාවිහාරායා"ති, 'එවම්භන්තෙ'ති ඛො ආයස්මා රාහුලො භගවතො පටිස්සුත්වා නිසීදනං ආදාය භගවන්තං පිට්ඨිතො පිට්ඨිතො අනුබන්ධි.

තෙන ඛො පන සමයෙන අනෙකානි දෙවතාසහස්සානි භගවන්තං අනුබන්ධානි හොන්ති,[3] "අජ්ජ භගවා ආයස්මන්තං රාහුලං උත්තරිං ආසවානං ඛයෙ විනෙස්සතී"ති. අථ ඛො භගවා අන්ධවනං අජ්ඣොගහෙත්වා[4] අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. ආයස්මාපි ඛො රාහුලො භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං රාහුලං භගවා එතදවොච:

"තං කිම්මඤ්ඤසි රාහුල චක්ඛුං නිච්චං වා අනිච්චං වා"ති. අනිච්චං භන්තෙ. "යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වා"ති. දුක්ඛං භන්තෙ. "යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං: "එතං මම එසො'හමස්මි එසො මෙ අත්තා"ති. නොහෙතං භන්තෙ.

"රූපා නිච්චා වා අනිච්චා වා"ති. අනිච්චා භන්තෙ -පෙ- චක්ඛුවිඤ්ඤාණං නිච්චං වා අනිච්චං වා"ති. අනිච්චං භන්තෙ -පෙ- චක්ඛුසම්ඵස්සො නිච්චො වා අනිච්චො වා"ති. අනිච්චො භන්තෙ -පෙ- යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදනාගතං සඤ්ඤාගතං සඞ්ඛාරගතං විඤ්ඤාණගතං තම්පි නිච්චං වා අනිච්චං වා"ති. අනිච්චං භන්තෙ. "යම්පනානිච්චං දුක්ඛං වා තං සුඛං වා"ති. දුක්ඛං භන්තෙ. "යම්පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා"ති නො හෙතං භන්තෙ.

1. පටිසල්ලීනස්ස - මජසං, සයා.
2. පක්කානු - සීමු.
3. හොන්ති - මජසං
4. ගාහෙත්වා - මජසං, සයා.

## 1. 12. 8

## රාහුලෝවාද සූත්‍රය

121. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්** නුවර සමීපයෙහි අනේපිඩු සිටුහුගේ **ජේතවන** නම් අරමහි වැඩවසන සේක. එසඳ එකලා වූ විවේකයෙන් යුත් භාග්‍යවතුන් වහන්සේට මෙබඳු චිත්තවිතර්කයක් පහළවිය;

**රාහුලගේ** රහත්බව මුහුකුරුවනදහම්හු මුහුකුරා ගියහ. මම රාහුල මහරහත්බැව්හි හික්මවන්නෙම් නම් මැනවැ යි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරු හැඳපෙරව පාසිවුරු ගෙන සැවැත්නුවරට පිඩු පිණිස වන්හ. සැවැත්නුවර පිඩු පිණිස හැසිර පසුබත පිණ්ඩපාතයෙන් වැළැකුණුසේක් ආයුෂ්මත් රාහුල තෙරුන් ඇමතූසේක: රාහුලය, නිසීදනය ගනුව. දිවාවිහරණය පිණිස **අන්ධවනය** වෙත එළඹෙන්නෙමු යි. එසේය වහන්සැ යි ආයුෂ්මත් රාහුල තෙමේ භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දී නිසීදනය ගෙන භාග්‍යවතුන් වහන්සේ පසුපස ගමන් කෙළේ ය.

එකල්හි නොයෙක් දහස්ගණන් දෙවියෝ ''අද භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් රාහුල තෙරුන් මතුරහත්බැව්හි හික්මවන්නාහ''යි භාග්‍යවතුන් වහන්සේ අනුගමන් කළාහු වෙති. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අන්ධවනයට පිවිස එක්තරා රුකක්මුල පැන වූ අස්නෙහි වැඩහුන් සේක. ආයුෂ්මත් රාහුල තෙමේ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් වැ හුන්නේ ය; එකත්පස් ව හුන් ආයුෂ්මත් රාහුලහට භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක:

රාහුලය, ඒ කිමැයි හඟිහි, චක්ෂුස නිත්‍ය වේ ද, නොහොත් අනිත්‍ය වේ ද? වහන්ස අනිත්‍ය යැ. යමෙක් අනිත්‍ය වේ නම් එය දුඃඛ වේ ද නොහොත් සුඛ වේ ද? වහන්ස, දුඃඛ යැ. යමෙක් අනිත්‍ය දුඃඛ විපරිණාමසවභාව වේ නම් එය ''තෙලෙ මාගේ ය. තෙලෙ මම වෙමි. තෙලෙ මාගේ ආත්ම ය යි දක්නට නිසි වේ ද''යි. වහන්ස, තෙලෙ නිසි නො වේ මැ යි.

රූපයෝ නිත්‍ය වෙත් ද නොහොත් අනිත්‍ය වෙත් ද? වහන්ස, අනිත්‍ය යැ...චක්ඛුවිඤ්ඤාණය නිත්‍ය වේ ද නොහොත් අනිත්‍ය වේ ද? වහන්ස. අනිත්‍ය යැ. චක්ඛුසමඵස්සය නිත්‍ය වේ ද නොහොත් අනිත්‍ය වේ ද? වහන්ස, අනිත්‍ය ය...චක්ඛුසමඵස්සය නිසා යම් වේදනාවක් සංඥාවෙක් සංස්කාරයෙක් විඥානයෙක් උපදී නම් හෙ ද නිත්‍ය වේ ද නොහොත් අනිත්‍ය වේ ද? වහන්ස. අනිත්‍ය ය. යමෙක් අනිත්‍ය නම් එය දුඃඛ වේ ද නොහොත් සුඛ වේ ද? වහන්ස, දුක් ය. යමෙක් අනිය නම් දුක් නම් වෙනස්වනසුලු නම් එය මේ මාගේය. මේ මම වෙමි. මේ මාගේ ආත්ම ය යි දක්නට සුදුසු ද යි. වහන්ස, මෙය නො වේ ම ය.

''සොතං -පෙ- ඝානං -පෙ- ජිව්හා නිච්චා වා අනිච්චා වා''ති. අනිච්චා භන්තෙ -පෙ- රසා -පෙ- ජිව්හාවිඤ්ඤාණං -පෙ- ජිව්හාසම්ඵස්සො -පෙ- යම්පිදං ජිව්හාසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදනාගතං සඤ්ඤාගතං සඞ්ඛාරගතං විඤ්ඤාණගතං, තම්පි නිච්චං වා අනිච්චං වා''ති. අනිච්චං භන්තෙ. ''යම්පනානිච්චං දුක්ඛං වා තං සුඛං වා''ති. දුක්ඛං භන්තෙ. යම්පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං: ''එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා''ති. නො හෙතං භන්තෙ.

''කායො -පෙ- මනො නිච්චො වා අනිච්චො වා''ති. අනිච්චො භන්තෙ, ''යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වා''ති. දුක්ඛං භන්තෙ. ''යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං: ''එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා''ති. නො හෙතං භන්තෙ.

''ධම්මා නිච්චා වා අනිච්චා වා''ති. අනිච්චා භන්තෙ -පෙ- මනො විඤ්ඤාණං -පෙ- මනොසම්ඵස්සො -පෙ- ''යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදනාගතං සඤ්ඤාගතං සඞ්ඛාරගතං විඤ්ඤාණගතං, තම්පි නිච්චං වා අනිච්චං වා''ති. අනිච්චං භන්තෙ. යම්පනානිච්චං දුක්ඛං වා තං සුඛං වා''ති. දුක්ඛං භන්තෙ. යම්පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං ''එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා''ති. නො හෙතං භන්තෙ.

එවං පස්සං රාහුල සුතවා අරියසාවකො චක්ඛුස්මිම්පි නිබ්බින්දති, රූපෙසුපි නිබ්බින්දති, චක්ඛුවිඤ්ඤාණෙපි නිබ්බින්දති, චක්ඛුසම්ඵස්සෙපි නිබ්බින්දති, යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදනාගතං සඤ්ඤාගතං සඞ්ඛාරගතං විඤ්ඤාණගතං තස්මිම්පි නිබ්බින්දති. සොතස්මිම්පි නිබ්බින්දති -පෙ- ඝානස්මිම්පි නිබ්බින්දති -පෙ- ජිව්හායම්පි නිබ්බින්දති, රසෙසුපි නිබ්බින්දති, ජිව්හාවිඤ්ඤාණෙපි නිබ්බින්දති, ජිව්හාසම්ඵස්සෙපි නිබ්බින්දති, යම්පිදං ජිව්හාසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදනාගතං සඤ්ඤාගතං සඞ්ඛාරගතං විඤ්ඤාණගතං තස්මිම්පි නිබ්බින්දති. කායස්මිම්පි නිබ්බින්දති -පෙ- මනස්මිම්පි නිබ්බින්දති, ධම්මෙසුපි නිබ්බින්දති, මනොවිඤ්ඤාණෙපි නිබ්බින්දති, මනොසම්ඵස්සෙපි නිබ්බින්දති, යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදනාගතං සඤ්ඤාගතං සඞ්ඛාරගතං විඤ්ඤාණගතං තස්මිම්පි නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති, විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති, ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

ඉදමවොච භගවා, අත්තමනො ආයස්මා රාහුලො භගවතො භාසිතං අභිනන්දි. ඉමස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ ආයස්මතො රාහුලස්ස අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චි.

අනෙකානඤ්ච දෙවතාසහස්සානං විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි ''යං කිඤ්චි සමුදයධම්මං, සබ්බන්තං නිරොධධම්ම''න්ති.

කන...නැහැය...දිව නිත්‍ය වේ ද නොහොත් අනිත්‍ය වේ ද? වහන්ස, අනිත්‍ය ය ... රස ... ජිහ්වාවිඥානය ... ජිහ්වාසංස්පර්ශය ... ජිහ්වාසංස්පර්ශය නිසා යම් වේදනාවෙක් සංඥාවෙක් සංස්කාරයෙක් විඥානයෙක් උපදී නම් හෙද නිත්‍ය වේ ද නොහොත් අනිත්‍ය වේ ද? වහන්ස, අනිත්‍ය ය. යමෙක් අනිත්‍ය නම් එය දුක් වේ ද නොහොත් සුව වේ ද? වහන්ස, දුක් ය. යමෙක් අනිත්‍ය නම් දුක් නම් වෙනස්වනසුලු නම් එය "මෙය මාගේ ය මේ මම වෙමි. මේ මාගේ ආත්ම ය" යි දක්නට සුදුසු ද යි. වහන්ස, මෙය නො වේ ම ය.

කය ... සිත නිත්‍ය වේ ද නොහොත් අනිත්‍ය වේ ද? වහන්ස, අනිත්‍ය ය. යමෙක් අනිත්‍ය නම් එය දුක් වේ ද නොහොත් සුව වේ ද? වහන්ස දුක් ය. යමක් අනිත්‍ය නම් දුක් නම් වෙනස්වනසුලු නම් එය "මෙය මාගේ ය. මේ මම වෙමි. මේ මාගේ ආත්ම ය" යි දක්නට සුදුසු ද යි. වහන්ස, මෙය නො වේ ම ය.

දහම් නිත්‍ය වේ ද නොහොත් අනිත්‍ය වේ ද? වහන්ස, අනිත්‍ය ය... මනෝවිඤ්ඤාණය ... මනෝසම්ඵස්සය ... මනෝසම්ඵස්සය නිසා යම් වේදනාවෙක් සඥාවෙක් සංස්කාරයෙක් විඥානයෙක් උපදී නම් හෙද නිත්‍ය වේ ද නොහොත් අනිත්‍ය වේ ද යි. වහන්ස, අනිත්‍ය ය. යමෙක් අනිත්‍ය නම් එය දුක් වේ ද නොහොත් සුව වේද? වහන්ස, දුක් ය. යමක් අනිත්‍ය නම් දුක් නම් වෙනස්වනසුලු නම් එය "මෙය මාගේය. මේ මම් වෙමි. මේ මාගේ ආත්ම ය"යි දක්නට සුදුසු ද යි. වහන්ස, මෙය නො වේ ම ය.

රාහුළ මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක ඇසෙහිත් කලකිරෙයි. රූපයෙහිත් කලකිරෙයි. ඇස්විනැණෙහිත් කලකිරෙයි. ඇස් පහසෙහිත් කලකිරෙයි. ඇස්පහස නිසා යම් මේ වේදනාවෙක් සංඥාවෙක් සංස්කාරයෙක් විඥානයෙක් උපදී නම් එහිත් කලකිරෙයි. කනෙහිත් කලකිරෙයි...නැහැයෙහිත් කලකිරෙයි...දිවෙහිත් කලකිරෙයි. රසෙහිත් කලකිරෙයි. දිව්විනැණෙහිත් කලකිරෙයි. දිව්පහසෙහිත් කලකිරෙයි. දිව්පහස නිසා යම් මේ වේදනාවෙක් සංඥාවෙක් සංස්කාරයෙක් විඥානයෙක් උපදී නම් එහිත් කලකිරෙයි. කයෙහිත් කලකිරෙයි... සිතෙහිත් කලකිරෙයි. දහම්හිත් කලකිරෙයි. මනවිනැණෙහිත් කලකිරෙයි. මනපහසෙහිත් කලකිරෙයි. මනපහස නිසා යම් මේ වේදනාවෙක් සංඥාවෙක් සංස්කාරයෙක් විඥානයෙක් උපදී නම් එහිත් කලකිරෙයි. කලකිරෙන්නේ නො ඇලෙයි. නො ඇල්මෙන් මිදෙයි. මිදුනු කල්හි මිදුණු ය යි දැනීම වෙයි. ඉපැද්ම ගෙවිණ. බඹසර වැස නිමවන ලදී. කරණී කරනලද. මේ බැව් පිණිස අනෙකක් නැතැ යි දැනගනී යි.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක. සතුටු සිත් ඇති ආයුෂ්මත් රාහුළ තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව පිළිගත්තේ ය. මේ සුතුර බණන කල්හි ආයුෂ්මත් රාහුළ තෙරුන්ගේ සිත උපාදන රහිත ව කෙලෙසුන්ගෙන් මිදුණේය.

නොයෙක් දහස්ගණන් දෙවියන්ට ද "යම් කිසිවක් හටගන්නාසුලු නම් ඒ සියල්ල නැසෙනසුලු ය" යි කෙලෙස්රජස් නැති පහ වූ කෙලෙස්මල ඇති දහම්ඇස පහළවී.

## 1. 12. 9

### සඤ්ඤොජනසුත්තං

122. සඤ්ඤොජනියෙ ච භික්ඛවෙ ධම්මෙ දෙසිස්සාමි සඤ්ඤොජනඤ්ච, තං සුණාථ. කතමෙ ච භික්ඛවෙ, සඤ්ඤොජනියා ධම්මා, කතමඤ්ච සඤ්ඤොජනං:

සන්ති භික්ඛවෙ චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, ඉමෙ වුච්චන්ති භික්ඛවෙ, සඤ්ඤොජනියා ධම්මා. යො තත්‍ථ ඡන්දරාගො තං තත්‍ථ සඤ්ඤොජනං. සන්ති භික්ඛවෙ සොතවිඤ්ඤෙය්‍යා සද්ද -පෙ- ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා -පෙ- සන්ති භික්ඛවෙ මනොවිඤ්ඤෙය්‍යා ධම්මා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, ඉමෙ වුච්චන්ති භික්ඛවෙ සඤ්ඤොජනියා ධම්මා, යො තත්‍ථ ඡන්දරාගො තං තත්‍ථ සඤ්ඤොජනන්ති.

## 1. 12 10

### උපාදානසුත්තං

123. උපාදානියෙ ච භික්ඛවෙ ධම්මෙ දෙසිස්සාමි උපාදානඤ්ච, තං සුණාථ. කතමෙ ච භික්ඛවෙ උපාදානියා ධම්මා, කතමඤ්ච උපාදානං:

සන්ති භික්ඛවෙ චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, ඉමෙ වුච්චන්ති භික්ඛවෙ, උපාදානියා ධම්මා. යො තත්‍ථ ඡන්දරාගො තං තත්‍ථ උපාදානං. සන්ති භික්ඛවෙ සොතවිඤ්ඤෙය්‍යා සද්ද -පෙ- ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා -පෙ- සන්ති භික්ඛවෙ, මනොවිඤ්ඤෙය්‍යා ධම්මා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, ඉමෙ වුච්චන්ති භික්ඛවෙ උපාදානියා ධම්මා. යො තත්‍ථ ඡන්දරාගො තං තත්‍ථ උපාදානන්ති.

### ලොකකාමගුණවග්ගො ද්වාදසමො.

**තත්‍රුද්දානං:**

මාරපාසෙන ද්වෙ වුත්තා ලොකකාමගුණෙන ච
සක්කො පඤ්චසිඛො චෙව සාරිපුත්තො ච රාහුලො
සඤ්ඤොජනං උපාදානං වග්ගො තෙන පවුච්චතීති

## 1. 12. 9

## සංයෝජන සූත්‍රය

122. මහණෙනි, සංයෝජනයන්ට හිතදහම් ද සංයෝජන ද දේශනා කරන්නෙමි. එය අසවු. මහණෙනි, සංයෝජනයන්ට හිත දහම්හු කවරහු ද සංයෝජන කවරේ ද යත්:

මහණෙනි, ඉටු කැමති මනවඩන් පියදෑ වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු රූ ඇත. මහණෙනි, මොහු සංයෝජනයන්ට හිත දහම්හු යයි කියනු ලැබෙත්. එහි යම් ඡන්දරාගයෙක් වේ නම් එය එහි සංයොජන යි. මහණෙනි, කනින් දතයුතු සද ඇත ... නැහැයෙන් දතයුතු ගඳ ... දිවෙන් දතයුතු රස ... කයින් දතයුතු පහස් ... මහණෙනි, ඉටු කැමති මනවඩන පියදෑ වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු සිතින් දතයුතු දහම් ඇත. මහණෙනි, මොහු සංයෝජනයන්ට හිත දහම්හු යයි කියනු ලැබෙත්. එහි යම් ඡන්දරාගයෙක් වේ නම් එය එහි සංයෝජන යි.

## 1. 12. 10

## උපාදන සූත්‍රය

123. මහණෙනි, උපාදනයන්ට හිත දහම් ද උපාදන ද දේශනා කරන්නෙමි. එය අසවු. මහණෙනි, උපාදනයන්ට හිත වූ දහම්හු කවරහු ද? උපාදන කවරේ ද යත්:

මහණෙනි, ඉටු කැමති මනවඩන පියදෑ වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු ඇසින් දතයුතු රූ ඇත. මහණෙනි, මොහු උපාදනයන්ට හිත දහම්හු යයි කියනු ලැබෙත්. එහි යම් ඡන්දරාගයෙක් වේ නම් එය එහි උපාදන යි. මහණෙනි, කනින් දතයුතු සද ඇත ... නැහැයෙන් දතයුතු ගඳ ... දිවෙන් දත යුතු රස ... කයින් දතයුතු පහස් ... මහණෙනි ඉටු කැමති මනවඩන පියදෑ වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු සිතින් දතයුතු දහම් ඇත. මහණෙනි, මොහු උපාදනයන්ට හිත දහම් යයි කියනු ලැබෙත්. එහි යම් ඡන්දරාගයෙක් වේ නම එය එහි උපාදන යි.

## දෙළොස්වැනි ලෝකකාමගුණ වර්ග යි.

**එහි සූත්‍රනාමාවලිය:**

මාරපාස නමින් දෙකෙක් ද, ලෝකන්තගමන, කාමගුණ නමින් දෙකෙක් ද, සක්කපඤ්හ, පඤ්චසිඛපඤ්හ, සාරිපුත්තසද්ධිවිහාරික, රාහුලොවාද, සංයෝජන උපාදන යයි සයෙක් ද කියන ලදහ. එයින් වර්ගය යි කියනු ලැබෙ.

# 13. ගහපතිවග්ගො

## 1. 13. 1

### වෙසාලිසුත්තං

124. එකං සමයං භගවා **වෙසාලියං** විහරති මහාවනෙ **කූටාගාර සාලායං**. අථ ඛො **උග්ගො ගහපති** වෙසාලිකො යෙන භගවා තෙනුප-සඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො උග්ගො ගහපති වෙසාලිකො භගවන්තං එතදවොච: කො නු ඛො භන්තෙ හෙතු කො පච්චයො යෙනමිධෙකච්චෙ සත්තා දිට්ඨෙව ධම්මෙ නො පරිනිබ්බායන්ති, කො පන භන්තෙ හෙතු කො පච්චයො යෙනමිධෙකච්චෙ සත්තා දිට්ඨෙව ධම්මෙ පරිනිබ්බායන්තීති.

සන්ති ඛො ගහපති චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, තඤ්චෙ භික්ඛු අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨති, තස්ස තං අභිනන්දතො අභිවදතො අජ්ඣොසාය තිට්ඨතො තන්නිස්සිතං විඤ්ඤාණං හොති තදුපාදානං, සඋපාදානො ගහපති භික්ඛු නො පරිනිබ්බායති.

සන්ති ඛො ගහපති, සොතවිඤ්ඤෙය්‍යා සද්ද -පෙ- ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා -පෙ- සන්ති ඛො ගහපති මනොවිඤ්ඤෙය්‍යා ධම්මා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, තඤ්චෙ භික්ඛු අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨති, තස්ස තං අභිනන්දතො අභිවදතො අජ්ඣොසාය තිට්ඨතො තන්නිස්සිතං විඤ්ඤාණං හොති තදුපාදානං සඋපාදානො ගහපති, භික්ඛු නො පරිනිබ්බායති. අයං ඛො ගහපති හෙතු අයං පච්චයො යෙනමිධෙකච්චෙ සත්තා දිට්ඨෙව ධම්මෙ නො පරිනිබ්බායන්ති.

සන්ති ච ඛො ගහපති චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, තඤ්චෙ භික්ඛු නාභිනන්දති නාභිවදති නාජ්ඣොසාය තිට්ඨති තස්ස තං අනභිනන්දතො අනභිවදතො අනජ්ඣොසාය තිට්ඨතො න තන්නිස්සිතං විඤ්ඤාණං හොති න තදුපාදානං, අනුපාදනො ගහපති භික්ඛු පරිනිබ්බායති.

සන්ති ඛො ගහපති සොතවිඤ්ඤෙය්‍යා සද්දා -පෙ- ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා -පෙ- සන්ති ඛො ගහපති මනොවිඤ්ඤෙය්‍යා ධම්මා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, තඤ්චෙ භික්ඛු නාභිනන්දති නාභිවදති නාජ්ඣොසාය තිට්ඨති, තස්ස තං අනභිනන්දතො අනභිවදතො අනජ්ඣොසාය තිට්ඨතො න තන්නිස්සිතං විඤ්ඤාණං හොති, න තදුපාදානං. අනුපාදනො ගහපති භික්ඛු පරිනිබ්බායති. අයං ඛො ගහපති හෙතු අයං පච්චයො යෙනමිධෙකච්චෙ සත්තා දිට්ඨෙව ධම්මෙ පරිනිබ්බායන්තීති.

# 13. ගෘහපති වර්ගය

## 1. 13. 1

## වෙසාලි සූත්‍රය

124. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ විසල්පුර සමීපයෙහි මහවෙනෙහි කූටාගාරශාලාවෙහි වැඩවසන සේක. එකල්හි විසල්පුර වැසි **උග්ග** ගැහැවි භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය ... එකත් පස් ව හුන් විසල්පුර වැසි උග්ග ගැහැවි භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේ ය: වහන්ස, යම් හෙයෙකින් මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් දිටුදැමියෙහි ම නො පිරිනිවෙත් නම් එයට හෙතු කිම? ප්‍රත්‍යය කිම? වහන්ස, යම් හෙයෙකින් මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් දිටුදැමියෙහි ම පිරිනිවෙත් නම් එයට හෙතු කිම? ප්‍රත්‍යය කිමැ යි.

ගැහැවි, ඉටු කැමති මන වඩන පියදැ වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු ඇසින් දතයුතු රූ ඇත. ඉදින් මහණ එය පතා ද, ගුණ කියා ද, ගැලී සිටී ද එය පතන ගුණ කියන ගැලී සිටින ඔහුගේ විඤ්ඤාණය එය ඇසුරු කෙළේ එය උපාදන කොට ඇත්තේ වෙයි. ගැහැවි, උපාදන සහිත මහණ නො පිරිනිවෙයි.

ගැහැවි, කනින් දතයුතු සද ඇත ... නැහැයෙන් දත යුතු ගඳ ... දිවෙන් දතයුතු රස ... කයින් දතයුතු පහස් ... ගැහැවි, ඉටු කැමති මනවඩන පියදැ වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු සිතින් දත යුතු දහම් ඇත. ඉදින් මහණ තෙමේ එය පතා ද, ගුණ කියා ද, ගැලී සිටී ද, එය පතන ගුණ කියන ගැලී සිටින ඔහුගේ විඤ්ඤාණය එය ඇසුරු කෙළේ එය උපාදන කොට ඇත්තේ වෙයි. ගැහැවි, උපාදන සහිත මහණ නො පිරිනිවෙයි. ගැහැවි, යම් හෙයෙකින් මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් දිටුදැමියෙහි ම නො පිරිනිවෙත් නම් එයට මේ හෙතු යි. මේ ප්‍රත්‍යයයි.

ගැහැවි, ඉටු කැමති මනවඩන පියදැ වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු ඇසින් දතයුතු රූ ඇත. ඉදින් මහණ එය නො පතා ද, ගුණ නො කියා ද, ගැලී නො සිටී ද, එය නො පතන, ගුණ නො කියන, ගැලී නො සිටින ඔහුගේ විඤ්ඤාණය එය ඇසුරු නො කෙළේ එය උපාදන කොට නැත්තේ වෙයි. ගැහැවි, උපාදන රහිත මහණ පිරිනිවෙයි.

ගැහැවි, කනින් දතයුතු සද ඇත ... නැහැයෙන් දතයුතු ගඳ ... දිවෙන් දතයුතු රස ... කයින් දතයුතු පහස් ... ගැහැවි, ඉටු කැමති මනවඩන පියදැ වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු සිතින් දතයුතු දහම් ඇත. ඉදින් මහණ එය නො පතා ද, ගුණ නො කියා ද, ගැලී නො සිටී ද එය නො පතන ගුණ නො කියන ගැලී නො සිටින ඔහුගේ විඤ්ඤාණය එය ඇසුරු නො කෙළේ එය උපාදන කොට නැත්තේ වෙයි. ගැහැවි, උපාදන රහිත මහණ පිරිනිවෙයි. ගැහැවි, යම් හෙයෙකින් මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් දිටුදැමියෙහි ම පිරිනිවෙත් නම් එයට මේ හේතු යි, මේ ප්‍රත්‍යය යි.

## 1. 13. 2

### වජ්ජිසුත්තං

125. එකං සමයං භගවා **වජ්ජීසු** විහරති **හත්ථිගාමෙ**. අථ ඛො **උග්ගො ගහපති** හත්ථිගාමකො යෙන භගවා තෙනුපසඞ්කමි-පෙ-එකමන්තං නිසින්නො ඛො උග්ගො ගහපති හත්ථිගාමකො භගවන්තං එතදවොච: කො නු ඛො භන්තෙ, හෙතු කො පච්චයො යෙනමිධෙකච්චෙ සත්තා දිට්ඨෙව ධම්මෙ නො පරිනිබ්බායන්ති. කො පන භන්තෙ හෙතු කො පච්චයො යෙනමිධෙකච්චෙ සත්තා දිට්ඨෙව ධම්මෙ පරිනිබ්බායන්තීති. (යථා පුරිමකසුත්තන්තං එවං විත්ථාරෙතබ්බං)-පෙ- අයං ඛො ගහපති හෙතු අයං පච්චයො යෙනමිධෙකච්චෙ සත්තා දිට්ඨෙව ධම්මෙ පරිනිබ්බායන්තීති.

## 1. 13. 3

### නාලන්දසුත්තං

126. එකං සමයං භගවා **නාලන්දායං** විහරති **පාවාරිකම්බවනෙ,** අථ ඛො **උපාලි** ගහපති යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො **උපාලි** ගහපති භගවන්තං එතදවොච: කො නු ඛො භන්තෙ හෙතු කො පච්චයො යෙනමිධෙකච්චෙ සත්තා දිට්ඨෙව ධම්මෙ නො පරිනිබ්බායන්ති? කො පන භන්තෙ හෙතු කො පච්චයො යෙනමිධෙකච්චෙ සත්තා දිට්ඨෙව ධම්මෙ පරිනිබ්බායන්තීති. (විත්ථාරෙතබ්බං) -පෙ- අයං ඛො ගහපති හෙතු අයං පච්චයො යෙනමිධෙකච්චෙ සත්තා දිට්ඨෙව ධම්මෙ පරිනිබ්බායන්තීති.

## 1. 13. 4

### භාරද්වාජසුත්තං

127. එකං සමයං ආයස්මා **පිණ්ඩොලභාරද්වාජො කොසම්බියං** විහරති **ඝොසිතාරාමෙ,** අථ ඛො රාජා **උදෙනො** යෙනායස්මා පිණ්ඩොල-භාරද්වාජො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මතා පිණ්ඩොලභාරද්වා-ජෙන සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරාණියං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො රාජා උදෙනො ආයස්මන්තං පිණ්ඩොලභාරද්වාජං එතදවොච:

කො නු ඛො භො[1] භාරද්වාජ හෙතු කො පච්චයො යෙනිමෙ දහරා භික්ඛූ සුසුකාළකෙසා භද්‍රෙන යොබ්බනෙන සමන්නාගතා පඨමෙන වයසා අනික්කීළිතාවිනො කාමෙසු, යාවජීවං පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරන්ති, අද්ධානඤ්ච ආපාදෙන්තීති?

1. කොනුඛො-සීමු 2.

## 1. 13. 2

## වජ්ජී සූත්‍රය

125. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **වජ්ජී** දනව්වෙහි **හත්ථි ගම්හි** වැඩවසන සේක. එකල්හි හත්ථිගම්වැසි **උග්ග** ගැහැවි භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය... එකත්පස් ව හුන් හත්ථි ගම් වැසි උග්ග ගැහැවි භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළේ ය: වහන්ස, යම් හෙයෙකින් මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් දිටුදැමියෙහි ම නො පිරිනිවෙත් නම් එයට හෙතු කිම? ප්‍රත්‍යය කිම? වහන්ස, යම් හෙයෙකින් මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් දිටුදැමියෙහි ම පිරිනිවෙත් නම් එයට හෙතු කිම? ප්‍රත්‍යය කිම? (පළමු සූතුර මෙන් විතර කට යුතු)... ගැහැවි, යම් හෙයකින් මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් දිටුදැමි-යෙහි ම පිරිනිවෙත් නම් එයට මේ හෙතු යි මේ ප්‍රත්‍යය යි.

## 1. 13. 3

## නාලන්දා සූත්‍රය

126. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **නාලන්දා** නුවර **පාවාරික අඹ**වෙනෙහි වැඩවසන සේක. එකල්හි **උපාලි** ගැහැවි භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේය... එකත්පස් ව හුන් උපාලි ගැහැවි භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: වහන්ස, යම් හෙයෙකින් මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් දිටුදැමියෙහි ම නො පිරිනිවෙත් නම් එයට හේතු කිම? ප්‍රත්‍යය කිම? වහන්ස, යම් හෙයෙකින් මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් දිටුදැමියෙහි ම පිරිනිවෙත් නම් එයට හේතු කිම? ප්‍රත්‍යය කිමැ යි. (විතර කට යුතු) ... ගැහැවි යම් හෙයෙකින් මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් දිටුදැමියෙහි ම පිරිනිවෙත් නම් එයට මේ හේතු යි මේ ප්‍රත්‍යය යි.

## 1. 13. 4

## භාරද්වාජ සූත්‍රය

127. එක්කලෙක ආයුෂ්මත් **පිණ්ඩොලභාරද්වාජ** තෙරණුවෝ **කොසඹෑ** නුවර සමීපයෙහි **ඝෝසිතාරාමයෙහි** වැඩවෙසෙති. එකල්හි **උදේන** රජ ආයුෂ්මත් පිණ්ඩොලභාරද්වාජ තෙරණුවන් වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් පිණ්ඩොලභාරද්වාජ තෙරණුවන් සමග සතුටු වීය. සතුටු විය යුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පස් ව හුන්නේ ය. එකත්පස් ව හුන් උදේන රජ ආයුෂ්මත් පිණ්ඩොලභාරද්වාජ තෙරණුවන්ට මෙය සැලකෙළේ ය:

හවද් භාරද්වාජයෙනි, තරුණ වූ මනාකළුකෙහෙ ඇති සොඳුරු යොවුනෙන් හා පළමුවන වයසින් යුතු කම්සැප අනුභව නොකළ විරූ මේ තරුණ භික්ෂූහු යම්හෙයෙකින් දිවිහිමියෙන් පිරිපුන් පිරිසුදු බඹසර වෙසෙත් නම් දිගුකලක් නො සිඳ පවත්වත් නම් එයට කිමෙක් හේතු ද, කිමෙක් ප්‍රත්‍යය ද යි.

වුත්තං ඛො එතං මහාරාජ තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන "එථ තුම්හෙ භික්ඛවෙ මාතුමත්තීසු මාතුචිත්තං උපට්ඨපෙථ, භගිනිමත්තීසු භගිනිචිත්තං උපට්ඨපෙථ, ධීතුමත්තීසු ධීතුචිත්තං උපට්ඨපෙථා"ති. අයං ඛො මහාරාජ හෙතු අයං පච්චයො යෙනිමෙ දහරා භික්ඛූ සුසුකාළකෙසා භද්‍රෙන යොබ්බනෙන සමන්නාගතා පඨමෙන වයසා අනිකීළිතාවිනො කාමෙසු යාවජීවං පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරන්ති අද්ධානඤ්ච ආපාදෙන්තීති.

ලොලං ඛො හො[1] භාරද්වාජ චිත්තං, අප්පෙකදා මාතුමත්තීසුපි ලොභධම්මා උප්පජ්ජන්ති භගිනිමත්තීසුපි ලොභධම්මා උප්පජ්ජන්ති, ධීතුමත්තීසුපි ලොභධම්මා උප්පජ්ජන්ති. අත්ථි නු ඛො හො භාරද්වාජ අඤ්ඤො ච හෙතු අඤ්ඤො ච පච්චයො යෙනිමෙ දහරා භික්ඛූ සුසුකාළකෙසා -පෙ- බ්‍රහ්මචරියං චරන්ති, අද්ධානඤ්ච ආපාදෙන්තීති.

වුත්තං ඛො එතං මහාරාජ තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන "එථ තුම්හෙ භික්ඛවෙ ඉමමෙව කායං උද්ධං පාදතලා අධො කෙසමත්ථකා තචපරියන්තං පූරං නානප්පකාරස්ස අසුචිනො පච්චවෙක්ඛථ. අත්ථි ඉමස්මිං කායෙ කෙසා ලොමා නඛා දන්තා තචො මංසං නහාරු අට්ඨී අට්ඨිමිඤ්ජා වක්කං හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං අන්තං අන්තගුණං උදරියං කරීසං පිත්තං සෙම්හං පුබ්බො ලොහිතං සෙදො මෙදො අස්සු වසා ඛෙළො සිඞ්ඝාණිකා ලසිකා මුත්තන්ති. අයම්පි ඛො මහාරාජ හෙතු අයං පච්චයො යෙනිමෙ දහරා භික්ඛූ සුසුකාළකෙසා -පෙ- බ්‍රහ්මචරියං චරන්ති, අද්ධානඤ්ච ආපාදෙන්තීති.

යෙ තෙ හො භාරද්වාජ භික්ඛූ භාවිතකායා භාවිතසීලා භාවිතචිත්තා භාවිතපඤ්ඤා තෙසං තං න දුක්කරං[2] හොති, යෙ ච ඛො තෙ හො භාරද්වාජ[3] භික්ඛූ අභාවිතකායා අභාවිතසීලා අභාවිතචිත්තා අභාවිතපඤ්ඤා තෙසං තං දුක්කරං හොති. අප්පෙකදා හො භාරද්වාජ අසුභතො මනසිකරිස්සාමීති සුභතො වා ආගච්ඡති, අත්ථි නු ඛො හො භාරද්වාජ[4] අඤ්ඤො ච[5] හෙතු අඤ්ඤො ච පච්චයො යෙනිමෙ දහරා භික්ඛූ සුසුකාළකෙසා -පෙ- බ්‍රහ්මචරියං චරන්ති, අද්ධානඤ්ච ආපාදෙන්තීති.

වුත්තං ඛො එතං මහාරාජ තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන 'එථ තුම්හෙ භික්ඛවෙ ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරා විහරථ. චක්ඛුනා රූපං දිස්වා මා නිමිත්තග්ගාහිනො අහුවත්ථ, මානුබ්‍යඤ්ජනග්ගාහිනො, යත්වාධිකරණමෙනං[6] චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං තස්ස සංවරාය පටිපජ්ජථ, රක්ඛථ චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජථ. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ-

---

1. ලොලං හො — සීමු: සී2
2. දුක්කරං—මජසං
3. යෙ ච ඛො තෙ භාරද්වාජ—සීමු
4. ච—මජසං, ච — ස්‍යා
5. ච ඛො—මජසං.
6. යත්වාධිකරණමෙනං. — සීමු

මහරජ, සියල්ල දන්නා සියල්ල දක්නා අර්හත් සම්මාසම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරන ලදී: මහණෙනි, තෙපි එවු. මවු වැනනවුන් කෙරෙහි මව යන සිත එළව. බුහුන වැන්නවුන් කෙරෙහි බුහුන යන සිත එළව. දූ වැන්නවුන් කෙරෙහි දුව යන සිත එළව යි. මහරජ, තරුණ මනාකළුකෙහෙ ඇති සොඳුරු යොවුනෙන් හා පළමු වයසින් යුතු කම්සැප අනුභව නො කළ ඒ‍රූ මේ තරුණ භික්ෂූහු පිරිපුන් පිරිසිදු බඹසර යම් හෙයෙකින් දිවිහිමියෙන් වෙසෙත් නම් දිගු කලක් නො සිඳ පවත්වත් නම් එයට මේ හේතු යි, මෙ ප්‍රත්‍යය යි.

භවද් භාරද්වාජයෙනි, මේ සිත ලොල් ය. මවු වැන්නවුන් කෙරෙහි දු ඇතැම් දිනෙක ලෝබසිත් උපදී. බුහුන වැන්නවුන් කෙරෙහි දු ලෝබසිත් උපදී. දූ වැන්නවුන් කෙරෙහි දු ලෝබසිත් උපදී. භවද් භාරද්වාජයෙනි, තරුණ මනාකළු කෙහෙ ඇති ... මේ තරුණ භික්ෂූහු යම්හෙයෙකින් බඹසර කෙරෙත් නම් දිගු කලක් නො සිඳ පවත්වත් නම් එයට අනෙක් හේතුවකුත් අනෙක් ප්‍රත්‍යයෙකුත් ඇද්ද යි.

මහරජ, සියල්ල දන්නා සියල්ල දක්නා අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරන ලදී. මහණෙනි, තෙපි එවු. පතුලෙන් උඩ කෙසගින් යට (අවටින්) සම කෙළවර කොට ඇති නන් වැදෑරුම් අසුචියෙන් පිරුණු මේ සිරුර ම පස්විකවු. (කෙසේද යත්:) මේ සිරුරෙහි කෙහෙ ලොම් නිය දත් සිවිය මස නහර ඇට ඇටමිදුලු වකුගඩුව හෘදයමාංසය අක්මාව දලබුව බඩදිව පපුමස අතුනු අතුනුබහන් නො පැසුණු අහර පැසුණු අහර පිත සෙම පූයා ලේ ඩහ මේදස් කඳුළු වුරුණුතෙල කෙළ සොටු සඳමිදුලු මුත්‍ර ඇතැ යි කියා යි. මහරජ, තරුණ මනාකළුකෙහෙ ඇති මේ තරුණ භික්ෂූහු ... යම් හෙයෙකින් බඹසර වෙසෙත් නම් දිගුකලක් නොසිඳ පවත්වත් නම් එයට මෙ ද හේතුවෙකි, මෙ ද ප්‍රත්‍යයෙකි.

භවද් භාරද්වාජයෙනි, වැඩූ කය (කා ගියා සිහි) ඇති වැඩූ සිල් ඇති වැඩූ සිත්ඇති වැඩූ නුවණ ඇති යම් ඒ භික්ෂූහු වෙත් නම් ඔවුන්ට එය දුෂ්කර නො වේ. භවද් භාරද්වාජයෙනි, නො වැඩූ කය ඇති නො වැඩූ සිල් ඇති නො වැඩූ සිත් ඇති නො වැඩූ නුවණැති යම් ඒ භික්ෂූහු වෙත් නම් ඔවුන්ට එය දුෂ්කර වේ. භවද් භාරද්වාජයෙනි, ඇතැම් දිනෙක අශුභවශයෙන් මෙනෙහි කරන්නෙමු යි ශුභවශයෙන් ද මෙනෙහි කිරීමට පැමිණේ. භවද් භාරද්වාජයෙනි, තරුණ මනාකළුකෙහෙ ඇති මේ තරුණ භික්ෂූහු ... යම් හෙයෙකින් බඹසර වෙසෙත් නම් දිගුකලක් නො සිඳ පවත්වත් නම් එයට අනෙක් හේතුවෙකුත් අනෙක් ප්‍රත්‍යයෙකුත් ඇද්ද යි.

මහරජ, සියල්ල දන්නා සියල්ල දක්නා අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරන ලදී: මහණෙනි, තෙපි එවු. ඉඳුරන්හි වැසූ දොර ඇති ව වෙසෙවු. ඇසින් රූ දැක නහමක් නිමිති ගන්නෝ නහමක් අනුව්‍යඤ්ජන වශයෙන් ගන්නෝ වවු. යම් හෙයෙකින් චක්ඛුන්ද්‍රිය අසංවෘත ව වෙසෙන මොහු අභිජ්ඣා දෞර්මනස්‍ය යන ලාමක අකුසල් දහම්හු ලුහුබඳනාහු නම් එහි සංවරය පිණිස පිළිපදිවු. චක්ඛුන්ද්‍රිය රකිවු, චක්ඛුන්ද්‍රියේ සංවරයට පැමිණෙවු. කනින් සද අසා... නැහැයෙන් ගඳ ගෙන... දිවෙන් රස විඳ... කයින් පහස පැහැස ...

මනසා ධම්මං විඤ්ඤාය මා නිමිත්තග්ගාහිනො අහුවත්ථ, මානුබ්‍යඤ්ජනග්ගාහිනො. යත්වාධිකරණමෙතං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දෙමනස්සා පාපකා අකුසලා ධම්මා අනවාස්සවෙය්‍යුං තස්ස සංවරාය පටිපජ්ජථ, රක්ඛථ මනින්ද්‍රියං, මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජථා''ති. අයම්පි ඛො මහාරාජ හෙතු අයං පච්චයො යෙනිමෙ දහරා භික්ඛූ සුසු කාළකෙසා -පෙ- බ්‍රහ්මචරියං චරන්ති, අද්ධානඤ්ච ආපාදෙන්තීති.

අච්ඡරියං භො භාරද්වාජ, අබ්භුතං භො භාරද්වාජ. යාව සුභාසිතමිදං[1] භො භාරද්වාජ තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන. එසො ච[2] ඛො භො භාරද්වාජ හෙතු එසපච්චයො යෙනිමෙ දහරා භික්ඛූ සුසුකාළකෙසා භද්‍රෙන යොබ්බනෙන සමන්නාගතා පඨමෙන වයසා අනික්කීළිතාවිනො කාමෙසු යාවජීවං පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරන්ති අද්ධානඤ්ච ආපාදෙන්තීති.

අහම්පි ඛො භො[3] භාරද්වාජ, යස්මිං සමයෙ අරක්ඛිතෙනෙව කායෙන අරක්ඛිතාය වාචාය අරක්ඛිතෙන චිත්තෙන අනුපට්ඨිතාය සතියා අසංවුතෙහි ඉන්ද්‍රියෙහි අන්තෙපුරං පවිසාමි. අතිවිය මං තස්මිං සමයෙ ලොභධම්මා පරිසහන්ති. යස්මිඤ්ච ඛ්වාහං භො භාරද්වාජ සමයෙ රක්ඛිතෙනෙව කායෙන රක්ඛිතාය වාචාය රක්ඛිතෙන චිත්තෙන උපට්ඨිතාය සතියා සංවුතෙහි ඉන්ද්‍රියෙහි අන්තෙපුරං පවිසාමි න මං තථා[4] තස්මිං සමයෙ ලොභධම්මා පරිසහන්ති.

අභික්කන්තං භො භාරද්වාජ, අභික්කන්තං භො භාරද්වාජ, සෙය්‍යථාපි භො භාරද්වාජ නික්කුජ්ජිතං[5] වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති. එවමෙවං[6] භොතා භාරද්වාජෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො, එසාහං භො භාරද්වාජ තං භගවන්තං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච, උපාසකං මං භවං භාරද්වාජො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

## 1. 13. 5

### සොණසුත්තං

128. එකං සමයං භගවා **රාජගහෙ** විහරති **වෙළුවනෙ කලන්දකනිවාපෙ.** අථ ඛො **සොණො** ගහපතිපුත්තො යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො **සොණො** ගහපතිපුත්තො භගවන්තං එතදවොච: ''කො නු ඛො භන්තෙ හෙතු කො පච්චයො යෙනමිධෙකච්චෙ සත්තා දිට්ඨෙව ධම්මෙ නො පරිනිබ්බායන්ති? කො පන භන්තෙ හෙතු කො පච්චයො යෙන මිධෙකච්චෙ සත්තා දිට්ඨෙව ධම්මෙ පරිනිබ්බායන්තී''ති.

1. සුභාසිතඤ්චිදං--මජසං.
2. එසවෙච--සිමු
3. අහම්පි අහො--සිමු, PTS.
4. තථා--මජසං.
5. නිකුජ්ජිතං--PTS
6. එවමෙතං--සි2

සිතින් දහම දැන නහමක් නිමිති වශයෙන් ගන්නෝ නහමක් අනුව්‍යඤ්ජන වශයෙන් ගන්නෝ වවු. යම් හෙයෙකින් මනින්ද්‍රිය අසංවෘත ව වෙසෙන මොහු අභිජ්ඣා දෙමනස්ස යන ලාමක අකුසල් දහම්හු ලුහුබඳනාහු නම් එහි සංවරය පිණිස පිළිපදිවු, මනින්ද්‍රිය රකිවු, මනින්ද්‍රියේ සංවරයට පැමිණෙව යි. මහරජ, තරුණ මනාකළුකෙහෙ ඇති මේ තරුණ භික්ෂූහු ... යම් හෙයෙකින් බඹසර වෙසෙත් නම් දිගුකලක් නො සිඳ පවත්වත් නම් එයට මෙ ද හේතුවෙකි මෙ ද ප්‍රත්‍යයෙකි.

භවද් භාරද්වාජයෙනි ආශ්චර්යයෙකි, භවද් භාරද්වාජයෙනි අද්භූතයෙකි, භවද් භාරද්වාජයෙනි සියල්ල දන්නා සියල්ල දක්නා අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය කෙතරම් මැනවින් වදාරන ලද ද? භවද් භාරද්වාජයෙනි, තරුණ මනාකළුකෙහෙ ඇති සොඳුරු යොවුනෙන් හා පළමු වයසින් යුතු කම්සැප අනුභව නො කළ විරූ මේ තරුණ භික්ෂූහු පිරිපුන් පිරිසුදු බඹසර යම් හෙයෙකින් දිවිහිමියෙන් වෙසෙත් නම් දිගුකලෙකුත් නො සිඳ පවත්වත් නම් එයට මෙය ම හේතු යි මෙය ම ප්‍රත්‍යය යි.

භවද් භාරද්වාජයෙනි, යම් කලෙක මම ද නො රක්නා ලද කයින් නො රක්නා ලද වදනින් නො රක්නා ලද සිතින් නො එළඹ සිටි සිහියෙන් අසංවෘත වූ ඉඳුරන්ගෙන් යුතු ව ම ඇතොවුරට පිවිසෙම් නම් එකල්හි ලොබසිත් මා බෙහෙවින් මැඩලයි. භවද් භාරද්වාජයෙනි, යම් කලෙකත් මා රක්නා ලද කයින් රක්නා ලද වදනින් රක්නා ලද සිතින් එළඹ සිටි සිහියෙන් සංවෘත ඉඳුරන්ගෙන් යුතු ව ම ඇතොවුරට පිවිසෙම් නම් එකල්හි එහි ලොබසිත් මා නහමක් මැඩල යි.

භවද් භාරද්වාජයෙනි, ඉතා මැනව. භවද් භාරද්වාජයෙනි, ඉතා මැනව. භවද් භාරද්වාජයෙනි, යටිකුරු කරන ලද්දක් යම් සේ උඩුකුරු කරන්නේ ද, වසන ලද්දක් යම් සේ වැසුම් හරින්නේ ද මංමුළාවූවකුට මග හෝ කියන්නේ ද ඇස් ඇත්තෝ රූ දකිත්ව යි අඳුරෙහි තෙල් පහනක් හෝ දරන්නේ ද එසෙයින් ම භවද් භාරද්වාජයන් විසින් නන් අයුරින් දහම් පවසන ලදී. භවද් භාරද්වාජයෙනි, මේ මම ඒ භාග්‍යවතුන් වහන්සේ ද දහම ද භික්සඟන ද සරණ කොට යෙමි. භවද් භාරද්වාජ තෙරණුවෝ මා අද පටන් දිවිහිමියෙන් සරණ ගිය උපාසකයකු කොට දරන සේක්වා යි.

## 1. 13. 5

## සොණ සූත්‍රය

128. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර සමීපයෙහි කලන්දකනිවාප නම් වූ වේළුවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි සොණ ගැහැවිපුත් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය ... එකත්පස්ව හුන් ගැහැවිපුත් භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේ ය: වහන්ස, යම් හෙයෙකින් ඇතැම් සත්ව කෙනෙක් දිටුදැම්යෙහි ම නො පිරිනිවෙත් නම් එයට හෙතු කිම? ප්‍රත්‍යය කිම? වහන්ස, යම් හෙයෙකින් මෙහි ඇතැම් සත්ව කෙනෙක් දිටුදැම්යෙහි ම පිරිනිවෙත් නම් එයට හේතු කිම ප්‍රත්‍යය කිමැ යි.

**සන්ති** ඛො සොණ **චක්ඛුවිඤ්ඤෙය්‍යා** රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. තඤ්චෙ **භික්ඛු** අභිනන්දති අභිවදති **අජ්ඣොසාය** තිට්ඨති. තස්ස තං අභිනන්දතො අභිවදතො අජ්ඣොසාය තිට්ඨතො තන්නිස්සිතං විඤ්ඤාණං හොති, තදුපාදානං. සඋපාදානො සොණ, භික්ඛු නො පරිනිබ්බායති.

**සන්ති** ඛො සොණ සොතවිඤ්ඤෙය්‍යා සද්ද -පෙ- ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා -පෙ- **සන්ති** ඛො සොණ මනොවිඤ්ඤෙය්‍යා ධම්මා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, තඤ්චෙ භික්ඛු අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨති. තස්ස තං අභිනන්දතො අභිවදතො අජ්ඣොසාය තිට්ඨතො තන්නිස්සිතං විඤ්ඤාණං හොති, තදුපාදානං. සඋපාදානො සොණ භික්ඛු නො පරිනිබ්බායති. අයං ඛො පන සොණ හෙතු අයං පච්චයො යෙන මිධෙකච්චෙ සත්තා දිට්ඨෙව ධම්මෙ නො පරිනිබ්බායන්තීති.

**සන්ති** ච ඛො සොණ චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා තඤ්චෙ භික්ඛු නාභිනන්දති නාභිවදති නාජ්ඣොසාය තිට්ඨති, තස්ස තං අනභිනන්දතො අනභිවදතො අනජ්ඣොසාය තිට්ඨතො න තන්නිස්සිතං විඤ්ඤාණං හොති, න තදුපාදානං. අනුපාදානො සොණ භික්ඛු පරිනිබ්බායති.

**සන්ති** ඛො සොණ සොතවිඤ්ඤෙය්‍යා සද්ද -පෙ- ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා -පෙ- **සන්ති** ඛො සොණ මනොවිඤ්ඤෙය්‍යා ධම්මා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. තඤ්චෙ භික්ඛු නාභිනන්දති නාභිවදති නාජ්ඣොසාය තිට්ඨති, තස්ස තං අනභිනන්දතො අනභිවදතො අනජ්ඣොසාය තිට්ඨතො න තන්නිස්සිතං විඤ්ඤාණං හොති, න තදුපාදානං. අනුපාදානො සොණ භික්ඛු පරිනිබ්බායති. අයං ඛො සොණ හෙතු අයං පච්චයො යෙනමිධෙකච්චෙ සත්තා පරිනිබ්බායන්තීති.

## 1. 13. 6

## ඝොසිතසුත්තං

129. එකං සමයං ආයස්මා **ආනන්දො** **කොසම්බියං** විහරති **ඝොසිතාරාමෙ,** අථ ඛො **ඝොසිතො** ගහපති යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො ඝොසිතො ගහපති ආයස්මන්තං ආනන්දං එතදවොච: "ධාතුනානත්තං ධාතුනානත්තන්ති භන්තෙ ආනන්ද වුච්චති, කිත්තාවතා නු ඛො භන්තෙ ධාතුනානත්තං වුත්තං භගවතා"ති.

සෝණ, ඉටු කැමති මනවඩන පියදෑ වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු ඇසින් දතයුතු රූ ඇත. ඉදින් මහණ එය පතා ද, ගුණ කියා ද ගැලී සිටී ද, එය පතන ගුණ කියන ගැලී සිටින ඔහුගේ විඤ්ඤාණය එය ඇසුරු කෙළේ එය උපාදන කොට ඇත්තේ වේ. සොණ, උපාදන සහිත මහණ නො පිරිනිවෙයි.

සොණ, කනින් දතයුතු සද ඇත... නැහැයෙන් දතයුතු ගඳ ... දිවෙන් දතයුතු රස ... කයින් දතයුතු පහස් ... සෝණ, ඉටු කැමති මනවඩන පියදෑ වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු සිතින් දතයුතු දහම් ඇත. ඉදින් මහණ එය පතා ද, ගුණ කියා ද, ගැලී සිටී ද එය පතන, ගුණ කියන, ගැලී සිටින ඔහුගේ විඤ්ඤාණය එය ඇසුරු කෙළේ එය උපාදන කොට ඇත්තේ වේ. සෝණ, උපාදන සහිත මහණ නො පිරිනිවෙයි. සොණ, යම් හෙයෙකින් මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් දිටුදැම්යෙහි ම නො පිරිනිවෙත් නම් එයට මේ හෙතු යි, මේ ප්‍රත්‍යය යි.

සෝණ, ඉටු කැමති මනවඩන පියදෑ වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු ඇසින් දතයුතු රූ ඇත. ඉදින් මහණ එය නො පතා ද, ගුණ නො කියා ද, ගැලී නො සිටී ද, එය නො පතන, ගුණ නො කියන ගැලී නො සිටින ඔහුගේ විඤ්ඤාණය එය ඇසුරු නො කෙළේ එය උපාදන කොට නැත්තේ වෙයි. සෝණ, උපාදන රහිත මහණ පිරිනිවෙයි

සෝණ, කනින් දතයුතු සද ඇත ... නැහැයෙන් දතයුතු ගඳ... දිවෙන් දතයුතු රස ... කයින් දතයුතු පහස් ... සෝණ, ඉටු කැමති මනවඩන පියදෑ වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු සිතින් දතයුතු දහම් ඇත. ඉදින් මහණ එය නො පතා ද, ගුණ නො කියා ද ගැලී නො සිටී ද එය නො පතන ගුණ නො කියන ගැලී නො සිටින ඔහුගේ විඤ්ඤාණය එය ඇසුරු නො කෙළේ. එය උපාදන කොට නැත්තේ වේ. සෝණ, උපාදන රහිත මහණ පිරිනිවෙයි. සෝණ, යම් හේතුවකින් මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් දිටුදැම්යෙහි ම පිරිනිවෙත් නම් එයට මේ හේතු යි, මේ ප්‍රත්‍යය යි.

## 1. 13. 6

## සෝසිත සූත්‍රය

129. එක්කලෙක ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ කොසඹෑ නුවර සමීපයෙහි සෝසිතාරාමයෙහි වැඩවෙසෙති. එකල්හි සෝසිත ගැහැවි ආයුෂ්මත් ආනන්ද තෙරණුවන් වෙත එළඹියේ ය ... එකත්පස්ව හුන් සෝසිත ගැහැවි ආයුෂ්මත් ආනන්ද තෙරණුවන්ට මෙය සැල-කෙළේ ය. වහන්ස, ආනන්දයෙනි, ''ධාතුනානාත්වය ධාතුනානාත්වය''යි කියනු ලැබේ. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් කොපමණෙකින් 'ධාතුනානාත්වය' වදරන ලද්දේ දැ යි.

සංවිජ්ජති ඛො ගහපති චක්ඛුධාතු, රූපා ච මනාපා, චක්ඛුවිඤ්ඤාණඤ්ච, සුඛවෙදනීයං ඵස්සං පටිච්ච උප්පජ්ජති සුඛාවෙදනා. සංවිජ්ජති ඛො ගහපති චක්ඛුධාතු, රූපා ච අමනාපා, චක්ඛුවිඤ්ඤාණඤ්ච, දුක්ඛවෙදනීයං ඵස්සං පටිච්ච උප්පජ්ජති දුක්ඛා වෙදනා. සංවිජ්ජති ඛො ගහපති චක්ඛුධාතු, රූපා ච උපෙක්ඛාට්ඨානියා[1], චක්ඛුවිඤ්ඤාණඤ්ච, අදුක්ඛමසුඛවෙදනීයං ඵස්සං පටිච්ච උප්පජ්ජති අදුක්ඛමසුඛා වෙදනා.

සංවිජ්ජති ඛො ගහපති සොතධාතු -පෙ- සංවිජ්ජති ඛො ගහපති ඝානධාතු -පෙ- සංවිජ්ජති ඛො ගහපති ජිව්හාධාතු, රසා ච මනාපා, ජිව්හාවිඤ්ඤාණඤ්ච, සුඛවෙදනීයං ඵස්සං පටිච්ච උප්පජ්ජති සුඛා වෙදනා. සංවිජ්ජති ඛො ගහපති ජිව්හාධාතු, රසා ච අමනාපා, ජිව්හාවිඤ්ඤාණඤ්ච, දුක්ඛවෙදනීයං ඵස්සං පටිච්ච උප්පජ්ජති දුක්ඛා වෙදනා. සංවිජ්ජති ඛො ගහපති ජිව්හාධාතු, රසා ච උපෙක්ඛාට්ඨානියා, ජිව්හාවිඤ්ඤාණඤ්ච, අදුක්ඛමසුඛවෙදනීයං ඵස්සං පටිච්ච උප්පජ්ජති අදුක්ඛමසුඛා වෙදනා.

සංවිජ්ජති ඛො ගහපති කායධාතු -පෙ- සංවිජ්ජති ඛො ගහපති මනොධාතු, ධම්මා ච මනාපා, මනොවිඤ්ඤාණඤ්ච, සුඛවෙදනීයං ඵස්සං පටිච්ච උප්පජ්ජති සුඛා වෙදනා. සංවිජ්ජති ඛො ගහපති මනොධාතු, ධම්මා ච අමනාපා, මනොවිඤ්ඤාණඤ්ච, දුක්ඛවෙදනීයං ඵස්සං පටිච්ච උප්පජ්ජති දුක්ඛා වෙදනා. සංවිජ්ජති ඛො ගහපති මනොධාතු, ධම්මා ච උපෙක්ඛාට්ඨානීයා, මනොවිඤ්ඤාණඤ්ච, අදුක්ඛමසුඛවෙදනීයං ඵස්සං පටිච්ච උප්පජ්ජති අදුක්ඛමසුඛා වෙදනා. එත්තාවතා ඛො ගහපති ධාතුනානත්තං වුත්තං භගවතාති.

## 1. 13 .7

## හාලිද්දකානිසුත්තං

130. එකං සමයං ආයස්මා මහාකච්චානො අවන්තීසු විහරති කුරරඝරෙ පවත්තෙ[2] පබ්බතෙ, අථ ඛො හාලිද්දකානි[3] ගහපති යෙනායස්මා මහාකච්චානො තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො හාලිද්දකානි ගහපති ආයස්මන්තං මහාකච්චානං එතදවොච: වුත්තමිදං භන්තෙ භගවතා "ධාතුනානත්තං පටිච්ච උප්පජ්ජති ඵස්සනානත්තං, ඵස්සනානත්තං පටිච්ච උප්පජ්ජති වෙදනානානත්ත"න්ති. කථන්නු ඛො භන්තෙ ධාතුනානත්තං පටිච්ච උප්පජ්ජති ඵස්සනානත්තං, ඵස්සනානත්තං පටිච්ච උප්පජ්ජති වෙදනානානත්තන්ති.

ඉධ ගහපති, භික්ඛු චක්ඛුනා රූපං දිස්වා මනාපං ඉත්ථෙතන්ති පජානාති. චක්ඛුවිඤ්ඤාණං සුඛවෙදනීයඤ්ච[4] ඵස්සං පටිච්ච උප්පජ්ජති සුඛා වෙදනා. චක්ඛුනා ඛො පනෙව[5] රූපං දිස්වා අමනාපං ඉත්ථෙතන්ති පජානාති, චක්ඛුවිඤ්ඤාණං දුක්ඛවෙදනීයඤ්ච ඵස්සං පටිච්ච උප්පජ්ජති දුක්ඛා වෙදනා. චක්ඛුනා පනෙව රූපං දිස්වා

1. උපෙක්ඛට්ඨානිය --ස්‍යා. මනාපා උපෙක්ඛාවෙදනිය‍ා--මජසං.
2. කුලඝරෙ සම්පවත්තො--ස්‍යා, කුලඝරෙ පපාතෙ--මජසං.
3. හාලිද්දිකානි--මජසං, සී2.
4. සුඛවෙදනීයං, සුඛවෙදනීයං ඵස්සං--සීමු.
5. පනෙවං -- ස්‍යා,

ගැහැවිය, චක්ඛුධාතුව ද මනවඩන රූප ද චක්ඛුවිඤ්ඤාණය ද ඇත. සුවවේදනාවට කරුණු වූ පහස නිසා සුවවේදනාව උපදී. ගැහැවිය, චක්ඛුධාතුව ද මනවඩන රූප ද චක්ඛුවිඤ්ඤාණය ද ඇත. දුක්වේදනාවට කරුණු වූ පහස නිසා දුක්වේදනාව උපදී. ගැහැවිය, චක්ඛුධාතුව ද උපේක්ෂාවට කරුණු වූ රූප ද චක්ඛුවිඤ්ඤාණය ද ඇත. නොදුක්නොසුව වේදනාවට කරුණු වූ පහස නිසා නොදුක්නොසුව වේදනාව උපදී.

ගැහැවිය, සෝතධාතුව ඇත ... ගැහැවිය, ඝානධාතුව ඇත... ගැහැවිය, ජිව්හාධාතුව ද මනවඩන රස ද ජිව්හාවිඤ්ඤාණය ද ඇත. සුවවෙදනාවට කරුණු වූ පහස නිසා සුවවෙදනාව උපදී. ගැහැවිය, ජිව්හාධාතුව ද මන නොවඩන රස ද ජිව්හාවිඤ්ඤාණය ද ඇත. දුක්වේදනාවට කරුණු වූ පහස නිසා දුක්වේදනාව උපදී. ගැහැවිය, ජිව්හාධාතුව ද මැදහත්බවට කරුණු වූ රස ද ජිව්හාවිඤ්ඤාණය ද ඇත. නොදුක්නොසුව වේදනාවට කරුණු වූ පහස නිසා නොදුක්නොසුව වේදනාව උපදී.

ගැහැවිය, කායධාතුව ඇත... ගැහැවිය, මනෝධාතුව ද මනවඩන දහම් ද මනෝවිඤ්ඤාණය ද ඇත. සුවවේදනාවට කරුණු වූ පහස නිසා සුවවේදනාව උපදී. ගැහැවිය, මනෝධාතුවත් මනනොවඩන දහමුත් මනෝවිඤ්ඤාණයත් ඇත. දුක්වේදනාවට කරුණු වූ පහස නිසා දුක්වේදනාව උපදී. ගැහැවිය, මනෝධාතුවත් මැදහත් බවට කරුණු වූ දහමුත් මනෝවිඤ්ඤාණයත් ඇත. නොදුක්නොසුව වෙදනාවට කරුණු වූ පහස නිසා නොදුක්නොසුව වේදනාව උපදී. ගැහැවිය, මෙතෙකින් භාග්‍යවතුන් වහන්සේ විසින් ධාතුනානාත්වය වදාරන ලදී යි.

## 1. 13. 7

## හාලිද්දකානි සූත්‍රය

130. එක්කලෙක ආයුෂ්මත් මහාකච්චාන තෙරණුවෝ අවන්ති දනව්වෙහි කුරරඝරයෙහි පවත්ත පව්වෙහි වැඩවෙසෙති. එකල්හි හාලිද්දකානි ගැහැවි ආයුෂ්මත් මහාකච්චාන තෙරණුවන් වෙත එළඹියේ ය... එකත්පස්ව හුන් හාලිද්දකානි ගැහැවි ආයුෂ්මත් මහාකච්චාන තෙරණුවන්ට මෙය සැලකෙළේ ය: වහන්ස, "ධාතුනානාත්වය නිසා ස්පර්ශනානාත්වය උපදී, ස්පර්ශනානාත්වය නිසා වෙදනානානාත්වය උපදීය" යි මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලදී. වහන්ස, කෙසේ නම් ධාතුනානාත්වය නිසා ස්පර්ශනානාත්වය උපදීද? ස්පර්ශනානාත්වය නිසා වේදනානානාත්වය උපදී ද යි.

ගැහැවිය, මෙහි මහණ ඇසින් රූවක් දැක මෙසේ මෙය මනවඩන්නේ ය යි දැනගනී. චක්ඛුවිඤ්ඤාණය ද සුවවේදනාවට කරුණු වූ ස්පර්ශය ද නිසා සුවවේදනාව උපදී. යළි ඇසින් රූපයක් දැක මෙසේ මෙය මන නො වඩනේය යි දැනගනී. චක්ඛුවිඤ්ඤාණය ද දුක්වේදනාවට කරුණු වූ ස්පර්ශය ද නිසා දුක්වේදනාව උපදී. යළි ඇසින් රූපයක් දැක

උපෙක්ඛාට්ඨානීයං ඉත්ථෙතන්ති පජානාති. චක්ඛුවිඤ්ඤාණං අදුක්ඛමසුඛ වෙදනීයඤ්ච ඵස්සං පටිච්ච උප්පජ්ජති අදුක්ඛමසුඛා වෙදනා.

පුන චපරං ගහපති භික්ඛු[1] සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය මනාපං ඉත්ථෙතන්ති පජානාති, මනොවිඤ්ඤාණං සුඛවෙදනියඤ්ච ඵස්සං පටිච්ච උප්පජ්ජති සුඛා වෙදනා. මනසා ඛො පනෙව ධම්මං විඤ්ඤාය අමනාපං ඉත්ථෙතන්ති පජානාති, මනොවිඤ්ඤාණං දුක්ඛවෙදනියඤ්ච ඵස්සං පටිච්ච උප්පජ්ජති දුක්ඛා වෙදනා. මනසා ඛො පනෙව ධම්මං විඤ්ඤාය උපෙක්ඛාට්ඨානීයං ඉත්ථෙතන්ති පජානාති. මනොවිඤ්ඤාණං අදුක්ඛමසුඛවෙදනීයඤ්ච ඵස්සං පටිච්ච උප්පජ්ජති අදුක්ඛමසුඛා වෙදනා. එවං ඛො ගහපති ධාතුනානත්තං පටිච්ච උප්පජ්ජති ඵස්සනානත්තං, ඵස්සනානත්තං පටිච්ච උප්පජ්ජති වෙදනානානත්තන්ති.

## 1. 13. 8

## නකුලපිතුසුත්තං

131. එකං සමයං භගවා භග්ගෙසු විහරති සුංසුමාරගිරෙ භෙසකලාවනෙ මිගදායෙ. අථ ඛො නකුලපිතා ගහපති යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො නකුලපිතා ගහපති භගවන්තං එතදවොච: කො නු ඛො භන්තෙ හෙතු කො පච්චයො යෙනමිධෙකච්චෙ සත්තා දිට්ඨෙව ධම්මෙ නො පරිනිබ්බායන්ති. කො පන භන්තෙ හෙතු කො පච්චයො යෙනමිධෙකච්චෙ සත්තා දිට්ඨෙව ධම්මෙ පරිනිබ්බායන්තීති.

සන්ති ඛො ගහපති චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. තඤ්චෙ භික්ඛු අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨති, තස්ස තං අභිනන්දතො අභිවදතො අජ්ඣොසාය තිට්ඨතො තන්නිස්සිතං විඤ්ඤාණං හොති තදුපාදානං, සඋපාදනො ගහපති භික්ඛු නො පරිනිබ්බායති.

සන්ති ඛො ගහපති සොතවිඤ්ඤෙය්‍යා සද්දා -පෙ-ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා -පෙ- සන්ති ඛො ගහපති මනොවිඤ්ඤෙය්‍යා ධම්මා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. තඤ්චෙ භික්ඛු අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨති. තස්ස තං අභිනන්දතො අභිවදතො අජ්ඣොසාය තිට්ඨතො තන්නිස්සිතං විඤ්ඤාණං හොති තදුපාදානං. සඋපාදනො ගහපති භික්ඛු නො පරිනිබ්බායති. අයං ඛො ගහපති හෙතු අයං පච්චයො යෙනමිධෙකච්චෙ සත්තා දිට්ඨෙව ධම්මෙ නො පරිනිබ්බායන්ති.

1. පුනචපරං ගහපති - සීමු

මෙසේ මේ මැදහත්බවට කරුණු ය යි දැනගනී. චක්ඛුවිඤ්ඤාණය ද නොදුක්නොසුව වේදනාවට කරුණු වූ ස්පර්ශය ද නිසා නොදුක්නොසුව වේදනාව උපදී.

ගැහැවිය නැවත අනෙකක් ද කියමි. මහණ කනින් සදක් අසා... නැහැයෙන් ගඳක් ගෙන... දිවෙන් රසක් විඳ... කයින් පහසක් පැහැස... සිතින් දහමක් දැන මෙසේ මෙය මන වඩනේ ය යි දනගනී. මනෝවිඤ්ඤාණයත් සුවවේදනාවට කරුණු වූ ස්පර්ශයත් නිසා සුවවේදනාව උපදී. යළි සිතින් දහමක් දැන මෙසේ මෙය මන නොවඩනේ ය යි දැනගනී. මනෝවිඤ්ඤාණයත් දුක්වේදනාවට කරුණු වූ ස්පර්ශයත් නිසා දුක්වේදනාව උපදී. යළි සිතින් දහමක් දැන මෙසේ මෙය මැදහත්බවට කරුණු ය යි දැනගනී. මනෝවිඤ්ඤාණයත් නොදුක්නොසුව වේදනාවට කරුණු වූ ස්පර්ශයත් නිසා නොදුක්නොසුව වෙදනාව උපදී. ගැහැවිය මෙසේ ධාතුනානාත්වය නිසා ස්පර්ශනානාත්වය උපදී. ස්පර්ශනානාත්වය නිසා වේදනානානාත්වය උපදී යි.

## 1. 13. 8

## නකුලපිතු සූත්‍රය

131. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **භග්ග** දනව්වෙහි **සුංසුමාරගිර** නුවර **මිගදය** වූ **භේසකලා** වනයෙහි වැඩවසන සේක. එකල්හි **නකුලපිය** ගැහැවි භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය... එකත්පස් ව හුන් නකුලපිය ගැහැවි භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය. වහන්ස, යම් හෙයෙකින් මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් දිටුදැමියෙහිම නො පිරිනිවෙත් නම් එයට හේතු කිම ප්‍රත්‍යය කිම? වහන්ස, යම් හෙයෙකින් මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් දිටුදැමියෙහි ම පිරිනිවෙත් නම් එයට හේතු කිම ප්‍රත්‍යය කිමැ යි.

ගැහැවිය ඉටු කැමති මනවඩන පියදැ වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු ඇසින් දතයුතු රූ ඇත. ඉදින් මහණ එය පතා ද, ගුණ කියා ද, ගැලී සිටී ද, එය පතන ගුණ කියන ගැලී සිටින ඔහුගේ විඤ්ඤාණය එය ඇසුරු කෙළේ එය උපාදන කොට ඇත්තේ වෙයි. ගැහැවිය උපාදන සහිත මහණ නො පිරිනිවෙයි.

ගැහැවිය කනින් දතයුතු සද ඇත ... නැහැයෙන් දතයුතු ගඳ ... දිවෙන් දතයුතු රස ... කයින් දතයුතු පහස් ... ගැහැවිය ඉටු කැමති මනවඩන පියදැ වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු සිතින් දතයුතු දහම් ඇත. ඉදින් මහණ එය පතා ද, ගුණ කියා ද, ගැලී සිටී ද, එය පතන ගුණ කියන ගැලී සිටින ඔහුගේ විඤ්ඤාණය එය ඇසුරු කෙළේ එය උපාදන කොට ඇත්තේ වෙයි. ගැහැවිය උපාදන සහිත මහණ නො පිරිනිවෙයි. ගැහැවිය යම් හෙයෙකින් මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් දිටුදැමියෙහි ම නො පිරිනිවෙත් නම් එයට මේ හේතු යි මේ ප්‍රත්‍යය යි.

සන්ති ච ඛො ගහපති චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. තඤ්ච භික්ඛු නාභිනන්දති නාභිවදති නාජ්ඣොසාය තිට්ඨති. තස්ස තං අනභිනන්දතො අනභිවදතො අනජ්ඣොසාය තිට්ඨතො න තන්නිස්සිතං විඤ්ඤාණං හොති න තදුපාදානං. අනුපාදනො ගහපති භික්ඛු පරිනිබ්බායති.

සන්ති ඛො ගහපති සොතවිඤ්ඤෙය්‍යා සද්දා -පෙ- ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා -පෙ- සන්ති ඛො ගහපති මනොවිඤ්ඤෙය්‍යා ධම්මා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. තඤ්ච භික්ඛු නාභිනන්දති නාභිවදති නාජ්ඣොසාය තිට්ඨති. තස්ස තං අනභිනන්දතො අනභිවදතො අනජ්ඣොසාය තිට්ඨතො න තන්නිස්සිතං විඤ්ඤාණං හොති න තදුපාදානං. අනුපාදනො ගහපති භික්ඛු පරිනිබ්බායති. අයං ඛො ගහපති හෙතු අයං පච්චයො යෙනමිධෙකච්චෙ සත්තා දිට්ඨෙව ධම්මෙ පරිනිබ්බායන්තීති.

## 1. 13. 9

## ලොහිච්චසුත්තං.

132. එකං සමයං ආයස්මා මහාකච්චානො අවන්තීසු විහරති මක්කරකටෙ අරඤ්ඤකුටිකායං. අථ ඛො ලොහිච්චස්ස බ්‍රාහ්මණස්ස සම්බහුලා අන්තෙවාසිකා කට්ඨහාරකා මානවකා යෙනායස්මතො මහාකච්චානස්ස අරඤ්ඤකුටිකා තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා පරිතො පරිතො කුටිකාය අනුචඞ්කමන්ති අනුවිචරන්ති උච්චාසද්දා මහාසද්දා කානිචි කානිචි සෙලිස්සකානි[1] කරොන්තා[2] ඉමෙ පන මුණ්ඩකා සමණකා ඉබ්භාකිණ්හා[3] බන්ධුපාදපච්චා, ඉමෙසං භරතකානං සක්කතා ගරුකතා මානිතා පූජිතා අපචිතානි.

අථ ඛො ආයස්මා මහාකච්චානො විහාරා නික්ඛමිත්වා තෙ මාණවකෙ එතදවොච: මා වො මාණවකා[4] සද්දමකත්ථ, ධම්මං වො භාසිස්සාමීති. එවං වුත්තෙ තෙ මාණවකා තුණ්හී අහෙසුං. අථ ඛො ආයස්මා මහාකච්චානො තෙ මාණවකෙ ගාථාහි අජ්ඣභාසි.

සීලුත්තමා[5] පුබ්බතරා අහෙසුං
තෙ බ්‍රාහ්මණා යෙ පුරාණං සරන්ති
ගුත්තානි ද්වාරානි සුරක්ඛිතානි
අහෙසුං තෙසං අභිභුය්‍ය කොධං.

1. සෙලෙය්‍යකානි-මජසං, ස්‍යා. සෙලොකස්සකානි. අට්ඨකථා.
2. කරොන්ති – මජසං
3. කණ්හා – මජසං, ස්‍යා,
4. මා මානවකා -- මජසං, ස්‍යා.
5. සීලුත්තරා – සී2.

ගැහැවිය ඉටු කැමති මනවඩන පියදෑ වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු ඇසින් දතයුතු රූ ඇත. ඉදින් මහණ එය නො පතා ද, ගුණ නො කියා ද, ගැලී නො සිටී ද එය නො පතන ගුණ නො කියන ගැලී නො සිටින ඔහුගේ විඤ්ඤාණය එය ඇසුරු නො කෙළේ එය උපාදන කොට නැත්තේ වේ. ගැහැවිය උපාදන රහිත මහණ පිරිනිවෙයි.

ගැහැවිය කනින් දතයුතු සද ඇත ... නැහැයෙන් දතයුතු ගඳ ... දිවෙන් දතයුතු රස ... කයින් දතයුතු පහස ... ගැහැවිය ඉටු කැමති මනවඩන පියදෑ වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු සිතින් දතයුතු දහම් ඇත. ඉදින් මහණ එය නො පතා ද, ගුණ නො කියා ද, ගැලී නො සිටී ද, එය නො පතන ගුණ නො කියන ගැලී නො සිටින ඔහුගේ සිත එය ඇසුරු නො කෙළේ එය උපාදන කොට නැත්තේ වේ. ගැහැවිය උපාදන රහිත මහණ පිරිනිවෙයි. ගැහැවිය යම් හෙයෙකින් මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් දිටුදැම්යෙහි ම පිරිනිවෙත් නම් එයට මේ හේතු යි, මේ ප්‍රත්‍යය යි.

## 1. 13. 9

## ලොහිච්ච සූත්‍රය

132. එක්කලෙක ආයුෂ්මත් මහාකච්චාන තෙරණුවෝ අවන්ති දනව්වෙහි මක්කරකට නුවර වනකිළියෙක වැඩවෙසෙති. එකල්හි ලොහිච්ච බමුණාගේ අතැවැසි වූ දර ගෙන යන බොහෝ වූ මාණවකයෝ ආයුෂ්මත් මහාකච්චාන තෙරණුවන්ගේ වනකිළිය වෙත එළඹියහ. එළඹ කිසියම් කිසියම් ක්‍රීඩා කරන්නාහු "මොහු මුඩුවෝය. නින්දිත මහණෝය. ගැහැවියෝ ය, කෘෂණයෝ ය, බඹහු පිටිපත්ලෙන් උපන්නෝ ය, මේ භරතකයන් හෙවත් කෙළෙඹියන් විසින් සත්කාර කරන ලද්දහු ගරු කරන ලද්දහු බුහුමන් කරන ලද්දහු පුදන ලද්දහු යටත් පහත් පැවතුම් දක්වන ලද්දහු ය"යි උස්හඬ මහහඬ ඇත්තාහු කිළිය අවට නැවත නැවත සක්මන් කෙරෙත්, සිසාරා යෙත්.

එකල්හි ආයුෂ්මත් මහාකච්චාන තෙරණුවෝ වෙහෙරින් නික්ම ඒ මාණවකයන්ට මෙය වදළහ: මාණවකයෙනි, "තෙපි නහමක් ශබ්ද කරවූ. තොපට දහම් දෙසන්නෙමි" යි. මෙසේ වදළ කල්හි ඒ මාණවෝ නිහඬ වූහ. එකල්හි ආයුෂ්මත් මහාකච්චාන තෙරණුවෝ ඒ මාණවවන්ට ගාථායෙන් වදළහ:

යම් කෙනෙක් පැරණි බමුණු දහම සිහි කෙරෙද්ද, ඉතා පැරණි ඒ බමුණෝ ශීලය උතුම් කොට ඇත්තෝ වූහ. ක්‍රෝධය මැඩලා සිටි ඔවුන්ගේ (චක්ෂුරාදි) ද්වාරයෝ ගෝපනය කරන ලද්දහු මැනැවින් රක්නා ලද්දහු වූහ.

ධම්මෙ ච ඣානෙ ච රතා අහෙසුං
තෙ බ්‍රාහ්මණා යෙ පුරාණං සරන්ති
ඉමෙ ච[1] වොක්කම්ම ජපාමසෙති[2]
ගොත්තෙන මත්තා විසමං චරන්ති
කොධාභිභූතා පුථු අත්තදණ්ඩා[3]
විරජ්ඣමානා තසථාවරෙසු[4]

අගුත්තද්වාරස්ස භවන්ති මොඝා
සුපිනොව[5] ලද්ධං පුරිසස්ස විත්තං
අනාසකා ථණ්ඩිලසායිකා ච
පාතො සිනානඤ්ච තයො ච වෙද.
ඛරාජිනං ජටා පඞ්කො මන්තා සීලබ්බතං තපො
කුහකා වඞ්කදණ්ඩා ච උදකාචමනානි ච
වණ්ණා එතෙ බ්‍රාහ්මණානං කතකිඤ්චික්ඛභාවනා[6].

චිත්තඤ්ච සුසමාහිතං විප්පසන්නමනාවිලං
අඛිලං සබ්බභූතෙසු සො මග්ගො බ්‍රහ්මපත්තියා ති.

අථ ඛො තෙ මාණවකා කුපිතා අනත්තමනා යෙන ලොහිච්චො බ්‍රාහ්මණො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ලොහිච්චං බ්‍රාහ්මණං එතදවොචුං: යග්ඝෙ භවං ජානෙය්‍ය සමණො මහාකච්චානො බ්‍රාහ්මණානං මන්තෙ එකංසෙන අපවදති[7] පටික්කොසතීති.

එවං වුත්තෙ ලොහිච්චො බ්‍රාහ්මණො කුපිතො අහොසි අනත්තමනො. අථ ඛො ලොහිච්චස්ස බ්‍රාහ්මණස්ස එතදහොසි: න ඛො පන මෙතං පතිරූපං යොහං අඤ්ඤදත්ථු මාණවකානං යෙවසුත්වා සමණං මහාකච්චානං අක්කොසෙය්‍යං පරිභාසෙය්‍යං[8], යන්නූනාහං උපසඞ්කමිත්වා පුච්ඡෙය්‍යන්ති.

අථ ඛො ලොහිච්චො බ්‍රාහ්මණො තෙහි මාණවකෙහි සද්ධිං යෙනායස්මා මහාකච්චානො තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා ආයස්මතා මහාකච්චානෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ලොහිච්චො බ්‍රාහ්මණො ආයස්මන්තං මහාකච්චානං එතදවොච.

ආගමංසු නු ඛ්විධ භො කච්චාන, අම්හාකං සම්බහුලා අන්තෙවාසිකා කට්ඨහාරකා මාණවකාති? ආගමංසු ඛ්විධ තෙ බ්‍රාහ්මණ සම්බහුලා අන්තෙවාසිකා කට්ඨහාරකා මාණවකාති. අහු පන භොතො කච්චානස්ස තෙහි මාණවකෙහි සද්ධිං කොචි දෙව කථාසල්ලාපොති? අහු ඛො මෙ බ්‍රාහ්මණ තෙහි මාණවකෙහි සද්ධිං කොචිදෙව කථාසල්ලාපොති. යථා කථම්පන භොතො කච්චානස්ස තෙහි මාණවකෙහි සද්ධිං අහොසි කථාසල්ලාපොති? එවං ඛො මෙ බ්‍රාහ්මණ තෙහි මාණවකෙහි සද්ධිං අහොසි කථා සල්ලාපො.

---

1. ඉමෙ ච -- සයා.
2. ජහාමහසෙති -- සයා.
3. පුථුත්තදණ්ඩා -- සයා.
4. සත්ථහා තණ්හෙසු -- මජසං.
5. සුපිනෙන – සීමු සී2.
6. කතාකිඤ්චික්ඛභාවනා -- මජසං.
7. අසංවදති -- සයා.
8. අක්කොසෙය්‍යං විරුජ්ඣෙය්‍යං පරිභාසෙය්‍යං -සයා

යම් කෙනෙක් පැරණි බමුණු දහම සිහි කෙරෙද්ද එබමුණෝ (දසකුශලකර්මපථ) දහම්හි ද (අටසමවත්) දහම්හි ද ඇලුණෝ වූහ. මොහු වූකලි ඒ ගුණවලින් ඉවත්ව (අපි) ජප කෙරෙමු යි කුලයෙන් මත් වූවෝ ක්‍රෝධයෙන් මඩනා ලද්දෝ ගන්නා ලද නොයෙක් දඬු ඇත්තෝ තැතිගන්නා (රහත්) නොතැතිගන්නා (නොරහත්) සත්ත්වයන් කෙරෙහි වරද කරන්නෝ විෂම වූ කායකර්මාදිය කෙරෙත්.

නොරක්නා ලද ඉඳුරන් ඇත්තහුගේ (ව්‍රතසමාදනයෝ) පුරිස්හට සිහිනෙන් ලත් ධනයක් මෙන් සිස් වෙත්. (දූන් බමුණෝ) එක් දින දෙදින උපවාස කරන්නාහු නිල්කුසතණ අතුළ බිම හෝනාහු උදෑසන දියට බැස නහන්නාහු (වෙති) වේදත්‍රය ද රළු අඳුන් දිවිසම ද දළමඬුලු ද දත්මල ද තපොමන්ත්‍ර ද අජව්‍රත ගොව්‍රතාදී ශීලව්‍රත ද (මේ මෙ කල බමුණන්ගේ තපසි) කොහොන්බව ද වක්දඬු ද දියෙන් මුව පිරිමැදුම ද යන මොහු බමුණන් විසින් කිසියම් ආමිසයක් වැඩීම පිණිස කරන ලද ආකල්පයෝ වෙත්.

(පැරණි බමුණන්ගේ) සිත උපචාර අර්පණ වශයෙන් මැනවින් සමාධිගත ය. වෙසෙසින් පහන් ය. නොකැලඹුණේ ය. සියලු සතුන් කෙරෙහි මොළොක් ය. සෙටබවට පැමිණීමේ මග ය. (කිම තෙපි බමුණු වහුද යි)

ඉක්බිති ඒ මණෙව්වෝ කිපියාහු නොසතුටු සිත් ඇත්තාහු ලොහිච්ච බමුණු වෙත එළඹියාහු ය. එළඹ ලොහිච්ච බමුණාට මෙය කීහ; කිම භවත් දන්නේ ද? මහාකච්චාන මහණ බමුණන්ගේ මන්ත්‍රයනට ඒකාන්තයෙන් නිඥ කෙරෙයි, දෙස් පහළ කෙරෙයි.

මෙසේ කී කල්හි ලොහිච්ච බමුණු කිපියේ නො සතුටු සිත් ඇත්තේ වි ය. එකල්හි ලොහිච්ච බමුණුහට මෙබඳු සිතෙක් වි ය: යම්බඳු මම මණෙව්වන්ගෙන් පමණක් අසා මහාකච්චාන මහණහට දෙස් නගන්නෙම් නම් පරිභව කරන්නෙම් නම් මෙය මට ඒකාන්ත-යෙන් සුදුසු නො වේ. මම එළඹ පුළුවුස්නෙම් නම් මැනවැ යි.

ඉක්බිති ලොහිච්ච බමුණු ඒ මණෙව්වන් සමග ආයුෂ්මත් මහාකච්චාන තෙරණුවන් වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් මහාකච්චාන තෙරණුවන් සමග සතුටු විය. සතුටු වියයුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පස් ව හුන්නේ ය. එකත්පස් ව හුන් ලොහිච්ච බමුණු ආයුෂ්මත් මහාකච්චාන තෙරණුවන්ට මෙය කී ය:

භවත් කච්චානයෙනි, අපගේ අතවැසි වූ දර ගෙන යන බොහෝ වූ මණෙව්වෝ මෙහි ආවාහු ද යි. බමුණ, තොපගේ අතවැසි වූ දර ගෙන යන බොහෝ වූ මණෙව්වෝ මෙහි ආවාහු ය යි. ඒ මණෙව්වන් සමග භවත් කච්චානයන්ගේ කිසියම් කථාසල්ලාපයෙක් වී ද? යි. බමුණ ඒ මණෙව්වන් සමග මාගේ කිසියම් කථාසල්ලාපයෙක් වී ය යි. ඒ කෙසේ නම් ඒ මණෙව්වන් සමග භවත් කච්චානයන්ගේ කථාසල්ලාපය වී දැයි. බමුණ, ඒ මණෙව්වන් සමග මාගේ කථාසල්ලාපය මෙසේ වී ය;

සීලුත්තමා පුබ්බතරා අහෙසුං
තෙ බ්‍රාහ්මණා, යෙ පුරාණං සරන්ති. -පෙ-
අඛිලං සබ්බභූතෙසු සො මග්ගො බ්‍රහ්මපත්තියා ති,

එවං ඛො මෙ බ්‍රාහ්මණ තෙහි මාණවකෙහි සද්ධිං අහොසි කථා සල්ලාපොති:

අගුත්තද්වාරොති භවං කච්චානො ආහ, කිත්තාවතා නු ඛො හො කච්චාන[1], අගුත්තද්වාරො හොතීති? ඉධ බ්‍රාහ්මණ එකච්චො චක්ඛුනා රූපං දිස්වා පියරූපෙ රූපෙ අධිමුච්චති, අප්පියරූපෙ රූපෙ ව්‍යාපජ්ජති, අනුපට්ඨිතකායසති ච[2] විහරති පරිත්තචෙතසො, තඤ්ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං නප්පජානාති යත්‍ථස්ස[3] තෙ උප්පන්නා පාපකා අකුසලා ධම්මා අපරිසෙසා න නිරුජ්ඣන්ති.

සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය පියරූපෙ ධම්මෙ අධිමුච්චති, අප්පියරූපෙ ධම්මෙ ව්‍යාපජ්ජති අනුපට්ඨිතකායසති ච විහරති පරිත්තචෙතසො, තඤ්ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං නප්පජානාති යත්‍ථස්ස තෙ උප්පන්නා පාපකා අකුසලා ධම්මා අපරිසෙසා න නිරුජ්ඣන්ති, එවං ඛො බ්‍රාහ්මණ, අගුත්තද්වාරො හොතීති.

අච්ඡරියං හො කච්චාන, අබ්භුතං හො කච්චාන, යාවඤ්චිදං හොතා කච්චානෙන අගුත්තද්වාරොව සමානො අගුත්තද්වාරොති අක්ඛාතො ගුත්තද්වාරොති භවං කච්චානො ආහ. කිත්තාවතා නු ඛො හො කච්චාන, ගුත්තද්වාරො හොතීති?

ඉධ බ්‍රාහ්මණ, භික්ඛු චක්ඛුනා රූපං දිස්වා පියරූපෙ රූපෙ නාධිමුච්චති, අප්පියරූපෙ රූපෙ න ව්‍යාපජ්ජති උපට්ඨිතකායසති ච විහරති අප්පමාණචෙතසො, තඤ්ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං පජානාති යත්‍ථස්ස තෙ උප්පන්නා පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති, සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය පියරූපෙ ධම්මෙ නාධිමුච්චති, අප්පියරූපෙ ධම්මෙ න ව්‍යාපජ්ජති උපට්ඨිතකායසති ච විහරති අප්පමාණචෙතසො, තඤ්ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං. යථාභූතං පජානාති, යත්‍ථස්ස තෙ උප්පන්නා පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති, එවං ඛො බ්‍රාහ්මණ ගුත්තද්වාරො හොතීති.

අච්ඡරියං හො කච්චාන, අබ්භුතං හො කච්චාන, යාවඤ්චිදං හොතා කච්චානෙන ගුත්තද්වාරොව සමානො ගුත්තද්වාරොති අක්ඛාතො. අභික්කන්තං හො කච්චාන අභික්කන්තං හො කච්චාන, සෙය්‍යථාපි හො කච්චාන, නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති: එවමෙව හොතා කච්චානෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො.

1. නු ඛො කච්චාන -- සිමු සී2.
2. අනුපට්ඨිතායසතියා--සයා. කායසතියා -- සිමු.
3. සථාස්ස. -- සයා.

යම් කෙනෙක් පැරණි බමුණු දහම් සිහි කෙරෙත් නම් ඉතා පැරණි වූ ඔහු ශීලය උතුම් කොට ඇත්තෝ වූහ... සියලු සතුන් කෙරෙහි මොළොක් නම් එය සෙට බවට පැමිණීමේ මඟ යි.

බමුණ, ඒ මණෙව්වන් සමග මාගේ කථාසල්ලාපය මෙසේ වී ය යි.

භවත් කච්චානයෝ අගුත්තද්වාර ය යි කියති. භවත් කච්චානයෙනි, කෙතෙකින් අගුත්තද්වාර වේ ද? යි. බමුණ, මෙහි කිසිවෙක් ඇසින් රූ දැක පියදෑ වූ රූහි ගිජු වෙයි, නොපියදෑ වූ රූහි කිපෙයි නො එළඹ සිටි කය පිළිබඳ 'සිහි ඇත්තේ පරිත්ත (සකිලිටි) සිත් ඇත්තේත් වෙසෙ යි. යම් අරමුණෙක උපන් ඔහුගේ පවිටු අකුසල් දහම්හු නිරවශේෂයෙන් නිරුද්ධ නො වෙත් නම් ඒ පිළිබඳ චිත්තසමාධියත් චිත්තප්‍රඥාවත් තතු සේ නො දනී.

කනින් සද අසා ... නැහැයෙන් ගඳ ගෙන ... දිවෙන් රස විඳ ... කයින් පහස් පැහැස ... සිතින් දහම් දැන පියදෑ වූ දහම්හි ගිජු වූයේ වෙයි. නො පියදෑ වූ දහම්හි කිපෙයි. නො එළඹ සිටි කය පිළිබඳ සිහි ඇත්තේ සකිලිටි සිත් ඇත්තේත් වෙසෙයි. යම් අරමුණෙක උපන් ඔහුගේ පවිටු අකුසල් දහම්හු නිරවශේෂයෙන් නිරුද්ධ නො වෙත් නම් ඒ පිළිබඳ චිත්තසමාධියත් චිත්තප්‍රඥාවත් තතු සේ නො දනී. බමුණ, මෙසේ අගුත්තද්වාර වෙ යි.

භවත් කච්චානයෙනි, ආශ්චර්ය යැ, භවත් කච්චානයෙනි, අද්භූත යැ. භවත් කච්චානයන් විසින් යම්තාක් අගුත්තද්වාර වූයෙක් ම අගුත්තද්වාර ය යි පවසන ලද්දේ ය. භවත් කච්චානයෝ ගුත්තද්වාරය යි කියති. භවත් කච්චානයෙනි, කොතෙකින් ගුත්තද්වාර වේ ද? යි.

බමුණ, මෙහි මහණ ඇසින් රූ දැක පිය දෑ වූ රූහි නො ගිජු වූයේ වෙයි. නො පිය දෑ වූ රූහි නො කිපෙයි. එළඹ සිටි කය පිළිබඳ සිහි ඇත්තේ අප්‍රමාණ (නිකෙලෙස්) සිතැත්තේත් වෙසෙ යි. යම් අරමුණෙක උපන් ඔහුගේ පවිටු අකුසල් දහම්හු නිරවශේෂයෙන් නිරුද්ධ වෙත් නම් ඒ පිළිබඳ චිත්තසමාධියත් චිත්තප්‍රඥාවත් තතුසේ දනියි. කනින් සද අසා ... නැහැයෙන් ගඳ ගෙන ... දිවෙන් රස විඳ ... කයින් පහස් පැහැස ... සිතින් දහම් දැන පියදෑ වූ දහම්හි නො ගිජු වූයේ වෙයි. නො පියදෑ වූ දහම්හි නො කිපෙයි. එළඹ සිටි කය පිළිබඳ සිහි ඇත්තේ නිකෙලෙස් සිතැත්තේත් වෙසෙයි. යම් අරමුණෙක උපන් ඔහුගේ පවිටු අකුසල් දහම්හු නිරවශේෂයෙන් නිරුද්ධ වෙත් නම් ඒ පිළිබඳ චිත්තසමාධියත් චිත්තප්‍රඥාවත් තතු සේ දනී. බමුණ, මෙසේ ගුත්තද්වාර වේ යි.

භවත් කච්චානයෙනි, ආශ්චර්ය යැ. භවත් කච්චානයෙනි, අද්භූත යැ. භවත් කච්චානයන් විසින් යම්තාක් ගුත්තද්වාර වූයෙක් ම ගුත්තද්වාරය යි පවසන ලද්දේ ය. භවත් කච්චානයෙනි, ඉතා මැනවි. භවත් කච්චානයෙනි, ඉතා මැනවි. භවත් කච්චානයෙනි, යම්සේ යටිකුරු වූවක් හෝ උඩුකුරු කරන්නේ ද, වසන ලද්දක් හෝ වැසුම් හරින්නේ ද මංමුළා වූවකුට මඟ හෝ කියන්නේ ද, ඇස් ඇත්තෝ රූ දක්නාහ යි අඳුරෙහි තෙල්පහනක් හෝ දරන්නේ ද, එසෙයින් ම භවත් කච්චානයන් විසින් නන් අයුරින් දහම් පවසන ලදී.

එසාහං භො කච්චාන, තං භගවන්තං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච, උපාසකං මං භවං කච්චානො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතං. යථා ච භවං කච්චානො මක්කරකටෙ[1] උපාසකකුලානි උපසඞ්කමති, එවමෙව ලොහිච්චකුලං උපසඞ්කමතු. තත්‍ථ යෙ මාණවකා වා මාණවිකා වා භවන්තං කච්චානං අභිවාදෙස්සන්ති පච්චුපට්ඨිස්සන්ති ආසනං වා උදකං වා දස්සන්ති තෙසං තං භවිස්සති දීඝරත්තං හිතාය සුඛායාති.

## 1. 13. 10

## වෙරහච්චානිසුත්තං

133, එකං සමයං ආයස්මා උදයි කාමණ්ඩායං විහරති තොදෙය්‍යස්ස බ්‍රාහ්මණස්ස අම්බවනෙ. අථ ඛො වෙරහච්චානිගොත්තාය බ්‍රාහ්මණියා අන්තෙවාසී මාණවකො යෙනායස්මා උදයි තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා උදයිනා සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො තං මාණවකං ආයස්මා උදයි ධම්මියා කථාය සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි.

අථ ඛො සො මාණවකො ආයස්මතා උදයිනා ධම්මියා කථාය සන්දස්සිතො සමාදපිතො සමුත්තෙජිතො සම්පහංසිතො උට්ඨායාසනා යෙන වෙරහච්චානිගොත්තා බ්‍රාහ්මණී තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා වෙරහච්චානිගොත්තං බ්‍රාහ්මණිං එතදවොච; යග්ඝෙ භොති ජානෙය්‍යාසි[2]; සමණො උදයී ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්‍ථං සව්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙතීති.

තෙන හි ත්වං මාණවක, මම වචනෙන සමණං උදයිං නිමන්තෙහි ස්වාතනාය භත්තෙනාති. එවං භොතීති ඛො සො මාණවකො වෙරහච්චානිගොත්තාය බ්‍රාහ්මණියා පටිස්සුත්වා යෙනායස්මා උදයී තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මන්තං උදයිං එතදවොච: අධිවාසෙතු කිර භවං උදයී අම්හාකං ආචරියභරියාය වෙරහච්චානිගොත්තාය බ්‍රාහ්මණියා ස්වාතනාය භත්තන්ති. අධිවාසෙසි ඛො ආයස්මා උදයී තුණ්හීභාවෙන.

1. මක්කරකතෙ -- මජසං
2. ජානෙය්‍ය -- සිමු, ස්‍යා, PTS සී2.

භවත් කච්චානයෙනි, මේ මම ඒ භාග්‍යවතුන් වහන්සේත් දහමත් භික්සඝනත් සරණ යෙමි. භවත් කච්චානයෝ, අද පටන් දිවිහිමියෙන් සරණ ගිය මා උපාසකයකු කොට දරත්වා. භවත් කච්චානයෝ මක්‍ෂරකට නුවර උපාසක කුලයන් කරා යම්සේ එළඹෙත් නම් එසෙයින් ම ලොහිච්ච කුලයට ද එළඹෙත්වා. එහි යම් මණෙව්වෝ හෝ මෙණෙවියෝ හෝ භවත් කච්චානයන් වඳින්නාහු නම් උවටැන් කරන්නාහු නම් අසුන් හෝ දිය හෝ දෙන්නාහු නම් ඔවුන්ට එය දිගුකලක් මුළුල්ලෙහි හිත පිණිස සුව පිණිස වන්නේ ය යි.

## 1. 13. 10

## වෙරහච්චානි සූත්‍රය

133. එක්කලෙක ආයුෂ්මත් උදයි තෙරණුවෝ **කාමණ්ඩා** නුවර **තොදෙය්‍ය** බමුණුගේ අඹවෙනෙහි වැඩවෙසෙති. එකල්හි **වෙරහච්චානි ගොත්** ඇති බැමිණියගේ අතවැසි මණෙවු ආයුෂ්මත් උදයි තෙරණුවන් වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් උදයි තෙරණුවන් සමග සතුටු විය. සතුටු වියයුතු සිහි කටයුතු කතාව කොට නිමවා එකත්පස් ව හුන්නේ ය. එකත්පස්ව හුන් ඒ මණෙව්වාට ආයුෂ්මත් උදයි තෙරණුවෝ දැහැමි කතාවෙන් කරුණු දක්වූහ. සමාදන් කරවූහ. තෙද ගැන්වූහ. සතුටු කරවූහ.

ඉක්බිති ඒ මණෙවු ආයුෂ්මත් උදයි තෙරුන් විසින් දැහැමි කතාවෙන් කරුණු දක්වන ලද්දේ සමාදන්කරවනලද්දේ තෙද ගන්වන ලද්දේ සතුටු කරවන ලද්දේ හුනස්නෙන් නැගිට වෙරහච්චානිගොත් බැමිණිය වෙත එළඹියේ ය. එළඹ වෙරහච්චානිගොත් බැමිණියට මෙය කී ය. පින්වතිය කිම දන්නෙහි ද? ''උදයි ශ්‍රමණයෝ මුල කලණ වූ මැද කලණ වූ අග කලණ වූ අරුත් සහිත ව්‍යඤ්ජන සහිත සියල්ල පිරිපුන් පිරිසුදු බඹසර පවසති'' යි.

මණෙව්ව, එසේ වී නම් තෙපි මාගේ වචනයෙන් උදයි මහණුහු සෙට පිණිස බතින් පවරවු යි. එසේ ය පින්වතිය යි ඒ මණෙවු තෙමේ වෙරහච්චානිගොත් බැමිණියට පිළිවදන් දී ආයුෂ්මත් උදයි තෙරුන් වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් උදයි තෙරුන්ට මෙය සැලකෙළේ ය; ''භවත් උදයි තෙරණුවෝ අප ඇදුරු බිරිය වූ වෙරහච්චානිගොත් බැමිණියගේ සෙට පිණිස වූ බත ඉවසත්වා යි. ආයුෂ්මත් උදයි තෙරණුවෝ මුවෙන් නො බැණ ඉවසූහ.

අථ ඛො ආයස්මා උදයී තස්සා රත්තියා අච්චයෙන පුබ්බන්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදය යෙන වෙරහච්චානිගොත්තාය බ්‍රාහ්මණියා නිවෙසනං තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො වෙරහච්චානිගොත්තා බ්‍රාහ්මණී ආයස්මන්තං උදයිං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙසි සම්පවාරෙසි. අථ ඛො වෙරහච්චානිගොත්තා බ්‍රාහ්මණී ආයස්මන්තං උදයිං භුත්තාවිං ඔනීතපත්තපාණිං පාදුකා ආරොහිත්වා උච්චෙ ආසනෙ නිසීදිත්වා සීසං ඔගුණ්ඨිත්වා[1] ආයස්මන්තං උදයිං එතදවොච: භණ සමණ, ධම්මන්ති. භවිස්සති භගිනි සමයොති වත්වා උට්ඨායාසනා පක්කමි[2].

දුතියම්පි ඛො සො මාණවකො යෙනායස්මා උදයී තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මතා උදයිනා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි.

එකමන්තං නිසින්නං ඛො තං මාණවකං ආයස්මා උදයී ධම්මියා කථාය සන්දස්සෙසි, සමාදපෙසි, සමුත්තෙජෙසි, සම්පහංසෙසි. දුතියම්පි ඛො සො මාණවකො ආයස්මතා උදයිනා ධම්මියා කථාය සන්දස්සිතො සමාදපිතො සමුත්තෙජිතො සම්පහංසිතො උට්ඨායාසනා යෙන වෙරහච්චානිගොත්තා බ්‍රාහ්මණී තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා වෙරහච්චානිගොත්තං බ්‍රාහ්මණිං එතදවොච: යග්ඝෙ භොති ජානෙය්‍යාසි, සමණො උදයී ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සව්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙතීති. එවමෙවං පන ත්වං මාණවක සමණස්ස උදයිස්ස වණ්ණං භාසසි, සමණො පනුදයී[3] භණ සමණ ධම්මන්ති වුත්තො සමානො භවිස්සති භගිනි සමයොති වත්වා උට්ඨායාසනා විහාරං පක්කන්තොති.

තථා හි පන ත්වං භොති පාදුකා ආරොහිත්වා උච්චෙ ආසනෙ නිසීදිත්වා සීසං ඔගුණ්ඨිත්වා එතදවොච: භණ සමණ ධම්මන්ති, ධම්මගරුනො හි තෙ භවන්තො ධම්මගාරවාති. තෙන හි ත්වං මාණවක, මම වචනෙන සමණං උදයිං නිමන්තෙහි ස්වාතනාය භත්තෙනාති. එවං භොතීති ඛො සො මාණවකො වෙරහච්චානිගොත්තාය බ්‍රාහ්මණියා පටිස්සුත්වා යෙනායස්මා උදයී තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මන්තං උදයිං එතදවොච:

අධිවාසෙසි කිර භවං උදයී අම්හාකං ආචරියභරියාය වෙරහච්චානිගොත්තාය බ්‍රාහ්මණියා ස්වාතනාය භත්තන්ති. අධිවාසෙසි ඛො ආයස්මා උදයී තුණ්හීභාවෙන. අථ ඛො ආයස්මා උදයී තස්සා රත්තියා අච්චයෙන පුබ්බන්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදය යෙන වෙරහච්චානිගොත්තාය බ්‍රාහ්මණියා නිවෙසනං තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො වෙරහච්චානිගොත්තා බ්‍රාහ්මණී ආයස්මන්තං උදයිං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙසි, සම්පවාරෙසි, අථ ඛො වෙරහච්චානිගොත්තා බ්‍රාහ්මණී ආයස්මන්තං උදයිං භුත්තාවිං ඔනීතපත්තපාණිං පාදුකා ඔරුහිත්වා නීචෙ ආසනෙ නිසීදිත්වා සීසං විවරිත්වා ආයස්මන්තං උදයිං එතදවොච:

1. ඔගුණ්ඨිත්වා - සයා.
2. පක්කාමි -- සයා.
3. උදයිං -- සයා.

ඉක්බිති ආයුෂ්මත් උදයි තෙරණුවෝ ඒ රැය අවෑමෙන් පෙරවරු හැඳ පෙරව පාසිවුරු ගෙන වෙරහච්චානිගොත් බැමිණියගේ නිවෙස වෙත එළඹියහ. එළඹ පැන වූ අස්නෙහි වැඩහුන්හ. එකල්හි වෙරහච්චානි ගොත් බැමිණිය ආයුෂ්මත් උදයි තෙරණුවන් ප්‍රණීත වූ කැයුතු බිදිය යුතු දයින් සියතින් සැතැප්වූ. මැනවින් පැවරවූ, ඉක්බිති වෙරහච්චානි ගොත් බැමිණිය ආයුෂ්මත් උදයි තෙරණුවන් වළඳා නිම වූවන් පාත්‍රයෙන් ඉවත් කළ අත් ඇත්තවුන් (දුන) වහන් නැඟී උස්අස්නෙක හිඳ හිස වසා පෙරෙව ගත්ති ආයුෂ්මත් උදයි තෙරුන්ට මහණ "බණ කියනු මැනව"යි මෙය කිවු ය. නැගණියෙනි, "(මතු එයට) කාලයෙක් වන්නේ ය" යි වදරා හුනස්නෙන් නැගිට වැඩියහ.

දෙවන වට දු ඒ මණෙවු තෙමේ ආයුෂ්මත් උදයි තෙරණුවන් වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් උදයි තෙරණුවන් සමග සතුටු විය. සතුටු වියයුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පස් ව හුන්නේ ය.

එකත්පස් ව හුන් ඒ මණෙවුහට ආයුෂ්මත් උදයි තෙරණුවෝ දැහැමිකතාවෙන් කරුණු දක්වූහ. සමාදන් කරවූහ. තෙදගැන්වූහ. සතුටු කරවූහ. දෙවනවම දු ඒ මණෙවු ආයුෂ්මත් උදයි තෙරණුවන් විසින් දැහැමිකතාවෙන් කරුණු දක්වන ලද්දේ සමාදන් කරවන ලද්දේ තෙද ගන්වන ලද්දේ සතුටු කරවන ලද්දේ හුනස්නෙන් නැඟිට වෙරහච්චානි ගොත් බැමිණිය වෙත එළඹියේ ය. එළඹ වෙරහච්චානිගොත් බැමිණියට මෙය කී ය: පින්වතිය, කිම දන්නෙහි ද? උදයි මහණහු මුල කලණ වූ මැද කලණ වූ අග කළණ වූ අරුත් සහිත ව්‍යඤ්ජන සහිත සියල්ල පිරිපුන් පිරිසිදු බඹසර පවසති යි. මණෙව්ව, තෙපි මෙසේ ම උදයි මහණහුගේ ගුණ කියව. උදයි මහණ වනාහි මහණ, බණ කියනු මැනව යි කියන ලදුයේ ම නැගණියෙනි, (එයට) "කලෙක් වන්නේ ය"යි කියා හුනස්නෙන් නැඟිට වෙහෙරට ගියේ යි.

ඒ එසේම ය. පින්වතිය, තෙපි වහන් නැඟී උස් අස්නෙක හිඳ හිස වසා පෙරෙව මහණ "බණ කියනු මැනවැ"යි මෙය කීහු. ඒ භවත්හු ධර්මය ගුරු කොට ඇත්තෝ ධර්මයට ගෞරව කරන්නෝ යි. මණෙව්ව එසේ නම් තෙපි මාගේ වචනයෙන් උදයි මහණහු සෙට පිණිස බතින් පවරවු යි. "එසේය පින්වතිය"යි ඒ මණෙවු තෙමේ වෙරහච්චානිගොත් බැමිණියට පිළිතුරු දී ආයුෂ්මත් උදයි තෙරණුවන් වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් උදයි තෙරණුවන්ට මෙය සැලකෙළේ ය:

භවත් උදයි තෙරණුවෝ අප ඇදුරුබිරිය වූ වෙරහච්චානිගොත් බැමිණියගේ සෙට පිණිස වූ බත ඉවසත්වා යි ආයුෂ්මත් උදයි තෙරණුවෝ මුවෙන් නො බැණ ඉවසූහ. ඉක්බිති ආයුෂ්මත් උදයි තෙරණුවෝ ඒ රැය ඇවෑමෙන් පෙරවරු හැඳ පෙරෙව පාසිවුරු ගෙන වෙරහච්චානිගොත් බැමිණියගේ නිවස වෙත එළඹියහ. එළඹ පැන වූ අස්නෙහි වැඩහුන්හ. එකල්හි වෙරහච්චානිගොත් බැමිණිය ආයුෂ්මත් උදයි තෙරහු ප්‍රණීතවූ කැයුතු බිදියයුතු දයින් සියතින් සැතැප්වූ. මැනවින් පැවරවූ. ඉක්බිති වෙරහච්චානිගොත් බැමිණිය ආයුෂ්මත් උදයි තෙරණුවන් වළඳා නිම වූවන් පාත්‍රයෙන් ඉවත් කළ අත් ඇත්තවුන් (දුන) වහනින් බැස මිටි අස්නෙක හිඳ හිස විවර කොට ආයුෂ්මත් උදයි තෙරුන්ට මෙය කිවු ය.

කිස්මිං නු ඛො භන්තෙ, සති අරහන්තො සුඛදුක්ඛං පඤ්ඤපෙන්ති? කිස්මිං අසති අරහන්තො සුඛදුක්ඛං න පඤ්ඤාපෙන්තීති? චක්ඛුස්මිං ඛො භගිනි සති අරහන්තො සුඛදුක්ඛං පඤ්ඤපෙන්ති, චක්ඛුස්මිං අසති අරහන්තො සුඛදුක්ඛං න පඤ්ඤපෙන්ති -පෙ- ජිව්හාය අසති අරහන්තො සුඛදුක්ඛං න පඤ්ඤපෙන්ති, කායස්මිං -පෙ- මනස්මිං සති අරහන්තො සුඛදුක්ඛං පඤ්ඤපෙන්ති, මනස්මිං අසති අරහන්තො සුඛදුක්ඛං න පඤ්ඤපෙන්තීති.

එවං වුත්තෙ වෙරහච්චානිගොත්තා බ්‍රාහ්මණී ආයස්මන්තං උදයිං එතදවොච: අභික්කන්තං භන්තෙ, අභික්කන්තං භන්තෙ සෙය්‍යථාපි භන්තෙ නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය; මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති. එවමෙවං අය්‍යෙන උදයිනා අනෙකපරියායෙන ධම්මො පකාසිතො, එසාහං අය්‍ය උදයි[1] තං භගවන්තං[2] සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච, උපාසිකං මං අය්‍යො උදයි ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

**ගහපතිවග්ගො තෙරසමො.**

**තත්‍රුද්දානං:**

වෙසාලි වජ්ජී නාලන්ද භාරද්වාජ සොණ ඝොසිතා
හාලිද්දකො නකුලපිතා ලොහිච්චො වෙරහච්චානීති.

1. භන්තෙ, උදයි -- සයා.
2. භවන්තං -- සයා.

වහන්ස, කුමක් ඇති කල්හි රහත්හු සුවදුක් පනවද්ද? කුමක් නැති කල්හි රහත්හු සුවදුක් නො පනවත් ද? යි. නැගණියෙනි, ඇස ඇති කල්හි රහත්හු සුවදුක් පනවත් ඇස නැති කල්හි රහත්හු සුවදුක් නො පනවත් ... දිව නැති කල්හි රහත්හු සුවදුක් නො පනවත්. කය ... සිත ඇති කල්හි රහත්හු සුවදුක් පනවත් සිත නැති කල්හි රහත්හු සුවදුක් නො පනවති යි.

මෙසේ වදළ කල්හි වෙරහච්චානිගොත් බැමිණිය ආයුෂ්මත් උදයි තෙරුන්ට මේ කිවු ය. වහන්ස, ඉතා මැනවි. වහන්ස, ඉතා මැනවි. වහන්ස, යම් සේ යටිකුරු වූවක් හෝ උඩුකුරු කරන්නේ ද, වසන ලද්දක් හෝ විවර කරන්නේ ද, මංමුළා වූවකුට හෝ මඟ කියන්නේ ද, ඇස් ඇත්තන් රූ දකිති යි අඳුරෙහි තෙල්පහනක් හෝ දරන්නේ ද එසෙයින් ම උදයි ආර්යයන් විසින් නන්අයුරින් දහම් පවසන ලදී උදයි, ආර්යයෙනි, මේ මම ඒ භාග්‍යවතුන් වහන්සේත් දහමත් බික්සඟනත් සරණ යෙමි. උදයි ආර්යයෝ අද පටන් මා දිවිහිමියෙන් සරණ ගිය උවැසියක කොට දරත්වා යි.

**තෙළෙස් වැනි ගහපති වර්ග යි.**

**එහි සූත්‍රනාමාවලිය:**

වෙසාලි, වජ්ජි, නාලන්‍ද, භාරද්වාජ, සොණ, සොසිත, හාලිද්දක, නකුලපිතු, ලොහිච්ච, වෙරහච්චානි ය යි සූත්‍ර දශයෙකි.

# 14. දෙවදහවග්ගො

## 1. 14. 1

### දෙවදහසුත්තං

134. එකං සමයං භගවා සක්කෙසු විහරති දෙවදහං නාම සක්‍යානං නිගමො. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: නාහං භික්ඛවෙ සබ්බෙසඤ්ඤෙව භික්ඛූනං ඡසු ඵස්සායතනෙසු අප්පමාදෙන කරණීයන්ති වදමි. න ච පනාහං භික්ඛවෙ සබ්බෙසඤ්ඤෙව භික්ඛූනං ඡසු ඵස්සායතනෙසු නාප්පමාදෙන කරණීයන්ති වදමි.

යෙ තෙ භික්ඛවෙ භික්ඛූ අරහන්තො ඛීණාසවා වුසිතවන්තො කතකරණීයා ඔහිතභාරා අනුප්පත්තසදත්ථා පරික්ඛීණභවසඤ්ඤොජනා සම්මදඤ්ඤා විමුත්තා, තෙසාහං භික්ඛවෙ භික්ඛූනං ඡසු ඵස්සායතනෙසු නාප්පමාදෙන කරණීයන්ති වදමි. තං කිස්ස හෙතු, කතං තෙසං අප්පමාදෙන, අභබ්බා තෙ පමජ්ජිතුං.

යෙ ච ඛො තෙහි භික්ඛවෙ භික්ඛූ සෙඛා අප්පත්තමානසා අනුත්තරං යොගක්ඛෙමං පත්ථයමානා විහරන්ති, තෙසාහං භික්ඛවෙ භික්ඛූනං ඡසු ඵස්සායතනෙසු අප්පමාදෙන කරණීයන්ති වදමි. තං කිස්ස හෙතු, සන්ති භික්ඛවෙ චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා මනොරමාපි අමනොරමාපි, ත්‍යාස්ස ඵුස්ස ඵුස්ස චිත්තං න පරියාදය තිට්ඨන්ති. චෙතසො අපරියාදනා ආරද්ධං හොති විරියං අසල්ලීනං, උපට්ඨිතා සති අපම්මුට්ඨා[1], පස්සද්ධො කායො අසාරද්ධො, සමාහිතං චිත්තං එකග්ගං, ඉමං ඛ්වාහං භික්ඛවෙ අප්පමාදඵලං සම්පස්සමානො තෙසං භික්ඛූනං ඡසු ඵස්සායතනෙසු අප්පමාදෙන කරණීයන්ති වදමි.

සන්ති භික්ඛවෙ සොතවිඤ්ඤෙය්‍යා සද්ද මනොරමාපි අමනොරමාපි -පෙ- සන්ති භික්ඛවෙ ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා මනොරමාපි අමනොරමාපි -පෙ- සන්ති භික්ඛවෙ ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා මනොරමාපි අමනොරමාපි -පෙ- සන්ති භික්ඛවෙ කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා මනොරමාපි අමනොරමාපි -පෙ- සන්ති භික්ඛවෙ මනොවිඤ්ඤෙය්‍යා ධම්මා මනොරමාපි අමනොරමාපි ත්‍යාස්ස ඵුස්ස ඵුස්ස චිත්තං න පරියාදය තිට්ඨන්ති, චෙතසො අපරියාදනා ආරද්ධං හොති විරියං අසල්ලීනං, උපට්ඨිතා සති අපම්මුට්ඨා, පස්සද්ධො කායො අසාරද්ධො, සමාහිතං චිත්තං එකග්ගං. ඉමං ඛ්වාහං භික්ඛවෙ අප්පමාදඵලං සම්පස්සමානො තෙසං භික්ඛූනං ඡසු ඵස්සායතනෙසු අප්පමාදෙන කරණීයන්ති වදමීති.

---

1. අප්පමුට්ඨා -සී 2, ස්‍යා. අසම්මුට්ඨා මජසං

# 14. දෙවදහ වර්ගය

## 1. 14. 1

## දේවදහ සූත්‍රය

134. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය දනව්වෙහි ශාක්‍යයන්ගේ දේවදහ නම් නියම්ගමෙහි වැඩවසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක. මහණෙනි, මම සියලු භික්ෂූන් විසින් ම ස්පර්ශායතන සයෙහි නොපමාව කටයුතු ය යි නො කියමි. මහණෙනි, මම සියලු භික්ෂූන් විසින් ම ස්පර්ශායතන සයෙහි නො පමාව නො කට යුතු ය යි ද නො කියමි.

මහණෙනි, රහත් වූ ක්ෂය කළ ආස්‍රව ඇති වැස නිම වූ බඹසර ඇති කළ කටයුතු ඇති බහා තැබූ බර ඇති පිළිවෙළින් පැමිණි ස්වාර්ථ (රහත්ඵල)ය ඇති ක්ෂය කළ බවබැඳුම් ඇති, මැනවින් දැන මිදුණු යම් ඒ භික්ෂූහු වෙත් නම් මහණෙනි, මම ඒ භික්ෂූන් විසින් ස්පර්ශායතන සයෙහි නො පමාව කටයුතු ය යි නො කියමි. ඒ කවර හෙයින යත්: ඔවුන් විසින් නො පමාව කරන ලදි. ඔහු පමා වන්නට නුසුදුස්සෝ ය.

මහණෙනි, යම් ඒ භික්ෂූහු ශෛක්‍ෂ වූවාහු නො පැමිණි රහත් බැව් ඇත්තාහු අනුත්තර වූ නිවන පතමින් වෙසෙද්ද, මහණෙනි, මම ඒ භික්ෂූන් විසින් ස්පර්ශායතන සයෙහි නො පමාව කටයුතු ය යි කියමි. ඒ කවර හෙයින යත්: මහණෙනි, මනාප වූ ද අමනාප වූ ද ඇසින් දතයුතු රූපයෝ ඇතියහ. ඔහු ඔහුගේ සිත පැහැස පැහැස හාත්පසින් අල්ලා ගෙන නො සිටිත්. සිත හාත්පසින් අල්ලා නොගැනීමෙන් වෙර අරඹන ලද්දේ නො හැකුළුණේ වෙයි. සිහිය එළඹ සිටියා ය. නො මුළා වූවා ය. කය සන්හිඳුණේ ය. දහ රහිත ය, සිත සමාධිගත ය. එකඟ ය. මහණෙනි, මම මේ අප්‍රමාද ඵලය දක්නෙමි ඒ භික්ෂූන් විසින් ස්පර්ශායතන සයෙහි නො පමාව කටයුතු යයි කියමි.

මහණෙනි, මනාප වූ ද අමනාප වූ ද කනින් දතයුතු ශබ්දයෝ ඇතියහ ... මහණෙනි, මනාප වූ ද අමනාප වූ ද නැහැයෙන් දතයුතු ගන්ධයෝ ඇතියහ ... මහණෙනි. මනාප වූ ද අමනාප වූ ද දිවෙන් දතයුතු රසයෝ ඇතියහ ... මහණෙනි, මනාප වූ ද අමනාප වූ ද කයින් දතයුතු පහස්හු ඇතියහ ... මහණෙනි, මනාප වූ ද අමනාප වූ ද සිතින් දතයුතු දහම්හු ඇතියහ. ඔහු ඔහුගේ සිත පැහැස පැහැස හාත්පසින් අල්ලාගෙන නො සිටිත්. සිත හාත්පසින් අල්ලා නොගැනීමෙන් වෙර අරඹන ලද්දේ නො හැකුළුණේ වෙයි. සිහිය එළඹ සිටියා ය. නො මුළා වූවා ය. කය සන්හිඳුණේ ය. දහ රහිත ය. සිත සමාධිගත ය. එකඟ ය. මහණෙනි, මම මේ අප්‍රමාද ඵලය දක්නෙමි ඒ භික්ෂූන් විසින් ස්පර්ශායතන සයෙහි නො පමාව කටයුතු ය යි කියමි යි.

## 1. 14. 2

### ඛණසුත්තං

135. ලාභා වො භික්ඛවෙ, සුලද්ධං වො භික්ඛවෙ, ඛණො වො පටිලද්ධො බ්‍රහ්මචරියවාසාය. දිට්ඨා මයා භික්ඛවෙ ඡ ඵස්සායතනිකා නාම නිරයා. තත්‍ථ යං කිඤ්චි චක්ඛුනා රූපං පස්සති අනිට්ඨරූපං යෙව පස්සති නො ඉට්ඨරූපං අකන්තරූපඤ්ඤෙව පස්සති නො කන්තරූපං අමනාපරූපඤ්ඤෙව පස්සති නො මනාපරූපං. යං කිඤ්චි සොතෙන සද්දං සුණාති -පෙ- යං කිඤ්චි ඝානෙන ගන්ධං ඝායති -පෙ- යං කිඤ්චි ජිව්හාය රසං සායති -පෙ- යං කිඤ්චි කායෙන ඵොට්ඨබ්බං ඵුසති -පෙ- යං කිඤ්චි මනසා ධම්මං විජානාති අනිට්ඨරූපඤ්ඤෙව විජානාති නො ඉට්ඨරූපං අකන්තරූපඤ්ඤෙව විජානාති නො කන්තරූපං අමනාපරූපඤ්ඤෙව විජානාති නො මනාපරූපං.

ලාභා වො භික්ඛවෙ, සුලද්ධං වො භික්ඛවෙ, ඛණො වො පටිලද්ධො බ්‍රහ්මචරියවාසාය. දිට්ඨා මයා භික්ඛවෙ ඡ ඵස්සායතනිකා නාම සග්ගා. තත්‍ථ යං කිඤ්චි චක්ඛුනා රූපං පස්සති ඉට්ඨරූපං යෙව පස්සති නො අනිට්ඨරූපං, කන්තරූපඤ්ඤෙව පස්සති නො අකන්තරූපං, මනාපරූපඤ්ඤෙව පස්සති නො අමනාපරූපං.

යං කිඤ්චි සොතෙන සද්දං සුණාති -පෙ- යං කිඤ්චි ඝානෙන ගන්ධං ඝායති -පෙ- යං කිඤ්චි ජිව්හාය රසං සායති -පෙ- යං කිඤ්චි කායෙන ඵොට්ඨබ්බං ඵුසති -පෙ- යං කිඤ්චි මනසා ධම්මං විජානාති ඉට්ඨරූපඤ්ඤෙව විජානාති නො අනිට්ඨරූපං, කන්තරූපඤ්ඤෙව විජානාති නො අකන්තරූපං, මනාපරූපඤ්ඤෙව විජානාති නො අමනාපරූපං. ලාභා වො භික්ඛවෙ, සුලද්ධං වො භික්ඛවෙ, ඛණො වො පටිලද්ධො බ්‍රහ්මචරියවාසායාති.

## 1. 14. 3

### සගය්හසුත්තං

136. රූපාරාමා භික්ඛවෙ දෙවමනුස්සා රූපරතා රූපසම්මුදිතා[1]. රූපවිපරිණාමවිරාගනිරොධා දුක්ඛා භික්ඛවෙ දෙවමනුස්සා විහරන්ති. සද්දාරාමා -පෙ- ගන්ධාරාමා -පෙ- රසාරාමා -පෙ- ඵොට්ඨබ්බාරාමා -පෙ- ධම්මාරාමා භික්ඛවෙ. දෙවමනුස්සා ධම්මරතා ධම්මසම්මුදිතා.[1] ධම්මවිපරිණාමවිරාගනිරොධා දුක්ඛා භික්ඛවෙ දෙවමනුස්සා විහරන්ති.

---

1. රූපසමුදිතා-සීමු සයා, සී 1, 2.

## 1. 14. 2

## ඛණ සූත්‍රය

135. මහණෙනි තොපට ලාභයෙකි, මහණෙනි තොපට යහපත් ලැබීමෙකි, බඹසර විසුමට සුදුසු අවස්ථාව තොප විසින් ලබන ලද්දේ ය. මහණෙනි, මවිසින් ඡඵස්සායතනික නම් නිරයයෝ දක්නා ලදහ. එහි ඇසින් යම් කිසි රුවක් දකී නම් අනිටු සැහැවි (ස්වභාව) ඇත්තක් ම දකී. ඉටු සැහැවි ඇත්තක් නො දකී. නො කැමති සැහැවි ඇත්තක් ම දකී. කැමති සැහැවි ඇත්තක් නො දකී. නො මනා සැහැවි ඇත්තක් දකී. කනින් යම්කිසි සදක් අසා නම් ... නැහැයෙන් යම්කිසි ගඳක් ගනී නම් ... දිවෙන් යම්කිසි රසක් විඳී නම් ... කයින් යම්කිසි පහසක් පුසී නම් ... සිතින් යම්කිසි දහමක් දනී නම් අනිටු සැහැවි ඇත්තක් ම දනී. ඉටු සැහැවි ඇත්තක් නො දනී. නො කැමති සැහැවි ඇත්තක් ම දනී. කැමති සැහැවි ඇත්තක් නො දනී. නො මනා සැහැවි ඇත්තක් ම දනී. මනා සැහැවි ඇත්තක් නො දනී.

මහණෙනි තොපට ලාභයකි, මහණෙනි තොපට යහපත් ලැබීමෙකි. බඹසර විසුමට තොප විසින් සුදුසු අවස්ථාව ලබන ලද්දේ ය. මහණෙනි, මා විසින් ඡඵස්සායතනික නම් ස්වර්ගයෝ දක්නා ලදහ. එහි ඇසින් යම්කිසි රුවක් දකී නම් ඉටු සැහැවි ඇත්තක් ම දකී. අනිටු සැහැවි ඇත්තක් නො දකී. කැමති සැහැවි ඇත්තක් ම දකී. නො කැමති සැහැවි ඇත්තක් නො දකී. මනා සැහැවි ඇත්තක් ම දකී. නො මනා සැහැවි ඇත්තක් නො දකී.

කනින් යම්කිසි සදක් අසා නම් ... නැහැයෙන් යම්කිසි ගඳක් ගනී නම් ... දිවෙන් යම්කිසි රසක් විඳී නම් ... කයින් යම්කිසි පහසක් ඵුසී නම් ... සිතින් යම්කිසි දහමක් දනී නම් ඉටු සැහැවි ඇත්තක් ම දනී. අනිටු සැහැවි ඇත්තක් නොදනී. කැමති සැහැවි ඇත්තක් ම දනී. නො කැමැති සැහැවි ඇත්තක් නො දනී. මනා සැහැවි ඇත්තක්ම නොදනී. නො මනා සැහැවි ඇත්තක් නොදනී, මහණෙනි, තොපට ලාභයෙකි. මහණෙනි, තොපට යහපත් ලැබීමෙකි. බඹසර විසුමට සුදුසු අවස්ථාව තොප විසින් ලබන ලද්දේ ය යි.

## 1. 14. 3

## සගය්හ සූත්‍රය

136. මහණෙනි, දෙව්මිනිස්සු රූපයෙහි ඇලුම් ඇත්තාහු රූපයෙහි ඇලුණාහු රූපයෙහි සතුටු වූවාහු වෙති. මහණෙනි, දෙව්–මිනිස්සු රූපයෙහි වෙනස් වීමෙන් විරාගයෙන් නිරොධයෙන් දුක් ඇති ව වෙසෙත්. සදෙහි ඇලුම් ඇත්තාහු... ගඳෙහි ඇලුම් ඇත්තාහු... රසෙහි ඇලුම් ඇත්තාහු... පහස්හි ඇලුම් ඇත්තාහු... මහණෙනි, දෙව්මිනිස්සු දහම් අරමුණෙහි ඇලුම් ඇත්තාහු දහම්හි ඇලුණාහු දහම්හි සතුටු වූවාහු වෙත්. මහණෙනි, දෙව්මිනිස්සු දහම්හි වෙනස් වීමෙන් විරාගයෙන් නිරොධයෙන් දුක් ඇති ව වෙසෙත්.

තථාගතො ච ඛො භික්ඛවෙ අරහං සම්මාසම්බුද්ධො රූපානං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං විදිත්වා න රූපාරාමො න රූපරතො න රූපසම්මුදිතො, රූපවිපරිණාමවිරාගනිරොධා සුඛො[1] භික්ඛවෙ තථාගතො විහරති. සද්දානං -පෙ- ගන්ධානං -පෙ- රසානං -පෙ- ඵොට්ඨබ්බානං -පෙ- ධම්මානං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං විදිත්වා න ධම්මාරාමො න ධම්මරතො න ධම්මසම්මුදිතො ධම්මවිපරිණාමවිරාගනිරොධා සුඛො භික්ඛවෙ තථාගතො විහරතීති. ඉදමවොච භගවා, ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:

රූපා සද්ද රසා ගන්ධා ඵස්සා ධම්මා ච කෙවලා
ඉට්ඨා කන්තා මනාපා ච යාවතත්ථීති වුච්චති,

සදෙවකස්ස ලොකස්ස එතෙ වො සුඛසම්මතා
යත්ථ චෙතෙ නිරුජ්ඣන්ති තං තෙසං දුක්ඛසම්මතං.

සුඛන්ති[2] දිට්ඨමරියෙහි සක්කායස්සුපරොධනං[3]
පච්චනීකමිදං හොති සබ්බලොකෙන පස්සතං[4]

යං පරෙ සුඛතො ආහු තදරියා ආහු දුක්ඛතො
යං පරෙ දුක්ඛතො ආහු තදරියා සුඛතො විදූ.

පස්ස ධම්මං දුරාජානං සම්මූළ්හෙත්ථ අවිද්දසූ
නිවුතානං තමො හොති අන්ධකාරො අපස්සතං,

සතඤ්ච විවටං හොති ආලොකො පස්සතාමිව
සන්තිකෙ න විජානන්ති මගා[5] ධම්මස්ස අකොවිදා

භවරාගපරෙතෙහි භවසොතානුසාරිහි[6]
මාරධෙය්‍යානුපන්නෙහි නායං ධම්මො සුසම්බුධො.

කො නු අඤ්ඤත්‍ර මරියෙහි පදං සම්බුද්ධමරහති.
යම්පදං සම්මදඤ්ඤාය පරිනිබ්බන්ති අනාසවාති.

1. සුඛං - සීමු
2. සුඛං - මජසං, සුඛඤ්ච - ස්‍යා
3. සක්කායස්සනිරොධනං - මජසං
4. දස්සනං - සී, 1, 2
5 මග්ගා - ස්‍යා
6. භවරාගානුසාරිහි - සී 1, 2

මහණෙනි අර්හත් සම්මාසම්බුද්ධ වූ තථාගත තෙමේ රූපයන්ගේ සමුදයත් අස්තඞ්ගමයත් ආස්වාදයත් ආදීනවයත් නිස්සරණයත් තතු සේ දැන රූපයෙහි ඇලුම් නැත්තේ රූපයෙහි නො ඇලුණේ රූපයෙහි සතුටු නුවූයේ වෙයි. මහණෙනි තථාගත තෙමේ රූපයන්ගේ වෙනස් වීමෙන් විරාගයෙන් නිරොධයෙන් සුව ඇති ව වෙසෙයි. ශබ්දයන්ගේ.... ගන්ධයන්ගේ.... රසයන්ගේ.... ස්ප්‍රෂ්ටව්‍යයන්ගේ... ධර්මයන්ගේ සමුදයත් අස්තඞ්ගමයත් ආස්වාදයත් ආදීනවයත් නිස්සරණයත් තතු සේ දැන දහම් අරමුණෙහි ඇලුම් නැත්තේ දහම්හි නො ඇලුණේ දහම්හි සතුටු නුවූයේ වෙයි. මහණෙනි තථාගත තෙමේ ධර්මයන්ගේ වෙනස් වීමෙන් විරාගයෙන් නිරොධයෙන් සුව ඇති ව වෙසෙ යි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සුගත වූ ශාස්තෘන් වහන්සේ මෙසේ පවසා යළි මතු ද මෙය වදාළ සේක:

ඉටු කැමති මනවඩන සියලු රූ සද ගඳ පහස් දහම්හු යම් තාක් ඇතැ යි කියනු ලැබේ ද,

දෙවියන් සහිත ලෝවැස්සා විසින් මොහු සුව යයි සම්මතයහ. යම් තැනෙක මොහු නිරුද්ධ වෙද්ද එය ඔවුන් විසින් දුක් යයි සම්මත ය.

සක්කායයාගේ වැලැක්ම සුව යයි ආර්‍ය්‍යයන් විසින් දක්නා ලදි. දක්නවුන්ගේ මෙය (නුවණැත්තන්ගේ මේ දර්ශනය) මුළුලෝකයා හා විරුද්ධ වේ.

අන්හු යමක් සුව විසින් කියද්ද ආර්‍ය්‍යයෝ එය දුක් විසින් කියත්. අන්හු යමක් දුක් විසින් කියද්ද ආර්‍ය්‍යයෝ එය සුව විසින් දනිත්.

දැනීමට දුෂ්කර වූ දහම දකිවු. මෙහි ලා නුවණ නැත්තේ මුළා වූයේ වෙයි. කෙලෙසුන්ගෙන් වැසුණු නොදක්නවුන්ට (ඒ දහම) ගනඳුරෙක් වෙයි.

දක්නා සත්පුරුෂයන්ට එළියක් මෙන් විවර වූයේ වෙයි. දහම්හි අදක්ෂ වූ (ඒ) මෘගයෝ ළඟ වූ ද (ඒ දහම) නො දනිත්.

භවරාගයෙන් මැඩුණු භවස්‍රොතස අනු ව යන මාරධෙය යි කියන ලද සසරවට පැමිණියවුන් විසින් මේ දහම සුවසේ අවබෝධ කට හැක්කේ නො වෙයි.

යම් නිර්වාණ පදයක් මනානුවණින් දැන කෙලෙස් රහිත ව පිරිනිවෙද්ද ඒ නිවන්පදය අවබෝධ කරන්නට රහතුන් හැර අන් කවරෙක් සුදුසු වේ ද යි.

## 1. 14. 4

### ගය්හසුත්තං

137. රූපාරාමා භික්ඛවෙ දෙවමනුස්සා රූපරතා රූපසම්මුදිතා, රූපවිපරිණාමවිරාගනිරොධා දුක්ඛා භික්ඛවෙ දෙවමනුස්සා විහරන්ති, සද්දාරාමා –පෙ– ගන්ධාරාමා –පෙ– රසාරාමා –පෙ– ඵොට්ඨබ්බාරාමා –පෙ– ධම්මාරාමා භික්ඛවෙ දෙවමනුස්සා ධම්මරතා ධම්මසම්මුදිතා, ධම්මවිපරිණාම විරාගනිරොධා දුක්ඛා භික්ඛවෙ දෙවමනුස්සා විහරන්ති.

තථාගතො භික්ඛවෙ අරහං සම්මාසම්බුද්ධො රූපානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං විදිත්වා න රූපාරාමො න රූපරතො න රූපසම්මුදිතො, රූපවිපරිණාමවිරාගනිරොධා සුඛො භික්ඛවෙ තථාගතො විහරති –පෙ– සද්දානං –පෙ– ගන්ධානං –පෙ– රසානං –පෙ– ඵොට්ඨබ්බානං –පෙ– ධම්මානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං විදිත්වා න ධම්මාරාමො න ධම්මරතො න ධම්මසම්මුදිතො. ධම්මවිපරිණාමවිරාගනිරොධා සුඛො භික්ඛවෙ තථාගතො විහරතීති.

## 1. 14. 5

### පලාසසුත්තං

138. යං භික්ඛවෙ න තුම්හාකං, තං පජහථ. තං වො පහීනං හිතාය සුඛාය භවිස්සති. කිඤ්ච භික්ඛවෙ න තුම්හාකං? චක්ඛුං භික්ඛවෙ න තුම්හාකං, තං පජහථ. තං වො පහීනං හිතාය සුඛාය භවිස්සති. සොතං –පෙ– ඝානං –පෙ– ජිව්හා න තුම්හාකං තං පජහථ. සා වො පහීනා හිතාය සුඛාය භවිස්සති. කායො න තුම්හාකං –පෙ– මනො න තුම්හාකං, තං පජහථ සො වො පහීනො හිතාය සුඛාය භවිස්සති.

සෙය්‍යථාපි භික්ඛවෙ යං ඉමස්මිං ජෙතවනෙ තිණකට්ඨසාඛාපලාසං, තං ජනො හරෙය්‍ය වා ඩහෙය්‍ය වා යථාපච්චයං වා කරෙය්‍ය. අපි නු තුම්හාකං එවමස්ස, අම්හෙ ජනො හරති වා ඩහති වා යථාපච්චයං වා කරොතීති. නො හෙතං භන්තෙ. තං කිස්ස හෙතු? න හි නො එතං භන්තෙ අත්තා වා අත්තනියං වාති. එවමෙව ඛො භික්ඛවෙ චක්ඛු න තුම්හාකං, තං පජහථ. තං වො පහීනං හිතාය සුඛාය භවිස්සති. සොතං –පෙ– ඝානං –පෙ– ජිව්හා –පෙ– කායො –පෙ– මනො න තුම්හාකං, තං පජහථ, සො වො පහීනො හිතාය සුඛාය භවිස්සතීති.

## 1. 14. 4

## ගයහ සූත්‍රය

137 මහණෙනි, දෙවිමිනිස්සු රූපයෙහි ඇලුම් ඇත්තාහු රූපයෙහි ඇලුණාහු රූපයෙහි සතුටු වූවාහු වෙති. මහණෙනි, දෙවිමිනිස්සු රූපයාගේ වෙනස් වීමෙන් නො ඇල්මෙන් නිරෝධයෙන් දුක් ඇති ව වෙසෙත්. ශබ්දයෙහි ඇලුම් ඇත්තාහු ... ගන්ධයෙහි ඇලුම් ඇත්තාහු.... රසයෙහි ඇලුම් ඇත්තාහු.... ස්ප්‍රෂ්ටව්‍යයෙහි ඇලුම් ඇත්තාහු.... මහණෙනි දෙවිමිනිස්සු ධර්මයෙහි ඇලුම් ඇත්තාහු ධර්මයෙහි ඇලුණාහු ධර්මයෙහි සතුටු වූවාහු වෙති. මහණෙනි, දෙවිමිනිස්සු ආරම්මණ ධර්මයන්ගේ වෙනස් වීමෙන් නොඇල්මෙන් නිරොධයෙන් දුක් ඇති ව වෙසෙත්.

මහණෙනි, අර්හත් සම්මාසම්බුද්ධ වූ තථාගත තෙමේ රූපයන්ගේ සමුදයයත් අස්තඞ්ගමයත් ආස්වාදයත් ආදීනවයත් නිස්සරණයත් තතු සේ දැන රූපයෙහි ඇලුම් නැත්තේ රූපයෙහි නො ඇලුණේ රූපයෙහි සතුටු නුවූයේ වෙයි. මහණෙනි තථාගත තෙමේ රූපයන්ගේ වෙනස් වීමෙන් නො ඇල්මෙන් නිරොධයෙන් සුව ඇති ව වෙසෙයි... ශබ්දයන්ගේ... ගන්ධයන්ගේ... රසයන්ගේ... ස්ප්‍රෂ්ටව්‍යයන්ගේ... ධර්මයන්ගේ සමුදයයත් අස්තඞ්ගමයත් ආස්වාදයයත් ආදීනවයත් නිස්සරණයත් තතු සේ දැන ධර්මයෙහි ඇලුම් නැත්තේ ධර්මයෙහි නො ඇලුණේ ධර්මයෙහි සතුටු නුවූයේ වෙයි. මහණෙනි, තථාගත තෙමේ ධර්මයන්ගේ වෙනස් වීමෙන් විරාගයෙන් නිරොධයෙන් සුව ඇති ව වෙසේ යි.

## 1. 14. 5

## පලාස සූත්‍රය

138. මහණෙනි යමක් තොපගේ නො වේ නම් එය පහකරවු. එය පහකරන ලද්දේ තොපට හිත පිණිස සුව පිණිස වන්නේ ය. මහණෙනි, කිමෙක් තොපගේ නො වේ ද යත්: මහණෙනි ඇස තොපගේ නො වෙයි. එය පහකරවු. එය පහකරන ලද්දේ තොපට හිත පිණිස සුව පිණිස වන්නේ ය. කන ... නැහැය ... දිව තොපගේ නො වෙයි. එය පහකරවු. එය පහකරන ලද්දේ තොපට හිත පිණිස සුව පිණිස වන්නේ ය. කය තොපගේ නො වෙයි ... සිත තොපගේ නො වෙයි. එය පහකරවු. එය පහකරන ලද්දේ තොපට හිත පිණිස සුව පිණිස වන්නේ ය.

මහණෙනි, යම්සේ මේ ජේතවනයෙහි යම් තණ දුව අතු කොළ වේ ද, ජන තෙමේ එය හරනේ හෝ දවන්නේ හෝ යම් කැමති පරිද්දක් කරන්නේ හෝ වේද, ජන තෙමේ අප ගෙන යයි හෝ දවයි හෝ යම් කැමති පරිද්දක් කරයි හෝ යි තොපට මෙබඳු සිතෙක් වන්නේ ද යි. වහන්ස මෙය නො වේ ම ය. ඒ කවර හෙයින් ද? වහන්ස, මෙය අපගේ ආත්මය (තමා) හෝ ආත්මීය (තම පිළිබඳ දෑයෙක්) හෝ නො වේ (එහෙයිනි) යි, මහණෙනි එසෙයින්ම ඇස තොපගේ නො වේ. එය පහකරවු. එය පහකරන ලද්දේ තොපට හිත පිණිස සුව පිණිස වන්නේ ය. කන ... නැහැය ... දිව ... කය ... සිත තොපගේ නො වෙයි. එය පහකරවු. එය පහකරන ලද්දේ තොපට හිත පිණිස සුව පිණිස වන්නේ යි.

## 1. 14. 6

## දුතියපලාසසුත්තං

139. යං භික්ඛවෙ න තුම්හාකං, තං පජහථ. තං වො පහීනං හිතාය සුඛාය භවිස්සති. කිඤ්ච භික්ඛවෙ න තුම්හාකං? රූපා භික්ඛවෙ න තුම්හාකං, තෙ පජහථ. තෙ වො පහීනා හිතාය සුඛාය භවිස්සන්ති. සද්ද -පෙ- ගන්ධා -පෙ- රසා -පෙ- ඵොට්ඨබ්බා -පෙ- ධම්මා න තුම්හාකං, තෙ පජහථ. තෙ වො පහීනා හිතාය සුඛාය භවිස්සන්තීති.

සෙය්‍යථාපි භික්ඛවෙ යං ඉමස්මිං ජෙතවනෙ තිණකට්ඨසාඛාපලාසං, තං ජනො හරෙය්‍ය වා ඩහෙය්‍ය වා යථාපච්චයං වා කරෙය්‍ය. අපි නු තුම්හාකං එවමස්ස: අම්හෙ ජනො හරති වා ඩහති වා යථාපච්චයං වා කරොතීති. නො හෙතං භන්තෙ. තං කිස්ස හෙතු? න හි නො එතං භන්තෙ අත්තා වා අත්තනියං වාති. එවමෙව ඛො භික්ඛවෙ රූපා න තුම්හාකං, තෙ පජහථ, තෙ වො පහීනා හිතාය සුඛාය භවිස්සන්ති. සද්ද -පෙ- ගන්ධා -පෙ- රසා -පෙ- ඵොට්ඨබ්බා පෙ- ධම්මා න තුම්හාකං තෙ පජහථ. තෙ වො පහීනා හිතාය සුඛාය භවිස්සන්තීති.

## 1. 14. 7

## අජ්ඣත්තඅනිච්චසුත්තං

140. චක්ඛුං භික්ඛවෙ අනිච්චං, යොපි හෙතු යොපි පච්චයො චක්ඛුස්ස උප්පාදාය සොපි අනිච්චො. අනිච්චසම්භූතං භික්ඛවෙ චක්ඛුං කුතො නිච්චං භවිස්සති. සොතං -පෙ- ඝානං -පෙ- ජිව්හා අනිච්චා, යොපි හෙතු යොපි පච්චයො ජිව්හාය උප්පාදාය සොපි අනිච්චො. අනිච්චසම්භූතා භික්ඛවෙ ජිව්හා කුතො නිච්චා භවිස්සති. කායො -පෙ- මනො අනිච්චො යොපි[1] හෙතු යොපි පච්චයො මනස්ස උප්පාදාය සොපි අනිච්චො. අනිච්චසම්භූතො භික්ඛවෙ මනො කුතො නිච්චො භවිස්සති[2].

එවං භික්ඛවෙ සුතවා අරියසාවකො චක්ඛුස්මිම්පි නිබ්බින්දති, සොතස්මිම්පි -පෙ- ඝානස්මිම්පි -පෙ- ජිව්හායපි -පෙ- කායස්මිම්පි- -පෙ- මනස්මිම්පි නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති, විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති, ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

1. යොපි භික්ඛවෙ – ම
2. භවිස්සතීති – සයා

## 1. 14. 6

## ද්‍රුතිය පලාස සූත්‍රය

139. මහණෙනි යමක් තොපගේ නො වේ නම් එය පහකරවු එය පහකරන ලද්දේ තොපට හිත පිණිස සුව පිණිස වන්නේ ය. මහණෙනි කිමෙක් තොපගේ නො වේ ද යත්: මහණෙනි රූ තොපගේ නො වෙයි. එය පහකරන ලද්දේ තොපට හිත පිණිස සුව පිණිස වන්නේ ය. සද ... ගඳ ... රස ... පහස් ... දහම් තොපගේ නො වෙයි. එය පහකරන ලද්දේ තොපට හිත පිණිස සුව පිණිස වන්නේ ය.

මහණෙනි යම්සේ මේ ජේතවනයෙහි යම් තණ දර අතු කොළ වේ ද ජනයා එය හරනේ හෝ දවන්නේ හෝ යම් කැමති පරිද්දක් කරන්නේ හෝ වේද, ජනයා අප ගෙන යයි හෝ දවයි හෝ යම් කැමති පරිද්දක් කරයි හෝ යි තොපට මෙබඳු සිතෙක් වන්නේ දැ යි. වහන්ස මෙය නො වේ ම ය. ඒ කවර හෙයින් ද? වහන්ස, මෙය අපට ආත්ම (තමා) හෝ ආත්මීය (තමා ගේ දෑයෙක්) හෝ නො වේ (එහෙයිනි) යි. මහණෙනි එසෙයින් ම රූ තොපගේ නො වෙයි. එය පහ කරවු. එය පහකරන ලද්දේ තොපට හිත පිණිස සුව පිණිස වන්නේ ය. සද... ගඳ... රස... පහස්... දහම් තොපගේ නො වෙයි. එය පහකරවු. එය පහකරන ලද්දේ තොපට හිත පිණිස සුව පිණිස වන්නේ ය.

## 1. 14. 7

## අජ්ඣත්ත අනිච්ච සූත්‍රය

140. මහණෙනි ඇස අනිත්‍ය ය. ඇස හටගැනීමට යමකුත් හේතු වේ නම් යමකුත් ප්‍රත්‍යය වේ නම් එද අනිත්‍ය ය. මහණෙනි අනිත්‍ය හේතුවෙන් හටගත් ඇස කවර හෙයින් නිත්‍ය වන්නේ ද? කන ... නැහැය ... දිව අනිත්‍ය ය. දිව හටගැන්මට යමකුත් හේතු වේ නම් යමකුත් ප්‍රත්‍යය වේ නම් හෙ ද අනිත්‍ය ය. මහණෙනි අනිත්‍ය හෙයින් හටගත් දිව කවර හෙයින් නිත්‍ය වන්නේ ද? කය... සිත අනිත්‍ය ය. සිත හටගැන්මට යමකුත් හේතු වේ නම් යමකුත් ප්‍රත්‍යය වේ නම් හෙ ද අනිත්‍ය ය. මහණෙනි අනිත්‍ය හේතුවෙන් හටගත් සිත කවර හෙයින් නිත්‍ය වන්නේ ද?

මහණෙනි මෙසේ දක්නා උගත් අරිසවු තෙමේ ඇසෙහිත් කලකිරෙයි. කනෙහිත් ... නැහැයෙහිත් ... දිවෙහිත් ... කයෙහිත් ... සිතෙහිත් කලකිරෙයි. කලකිරෙන්නේ නො ඇලෙයි. නො ඇලුම්-හෙයින් මිදෙයි. මිදුණු කල්හි මිදුණේ යයි දැනීම වෙයි. ඉපැද්ම ගෙව්ණ. බඹසර වැස නිමවන ලදි. කට යුතු කරන ලදි. මේ රහත්බව පිණිස අනෙකක් නැතැ යි දැනගනී යි.

## 1. 14. 8

## අජ්ඣත්තදුක්ඛසුත්තං

141. චක්ඛුං භික්ඛවෙ දුක්ඛං, යොපි හෙතු යොපි පච්චයො චක්ඛුස්ස උප්පාදය සොපි දුක්ඛො. දුක්ඛසම්භූතං භික්ඛවෙ චක්ඛුං කුතො සුඛං භවිස්සති. සොතං –පෙ– ඝානං –පෙ– ජිව්හා දුක්ඛා, යොපි හෙතු යොපි පච්චයො ජිව්හාය උප්පාදය සොපි දුක්ඛො, දුක්ඛසම්භූතා භික්ඛවෙ ජිව්හා කුතො සුඛා භවිස්සති. කායො –පෙ– මනො දුක්ඛො, යොපි හෙතු යොපි පච්චයො මනස්ස උප්පාදය සොපි දුක්ඛො, දුක්ඛසම්භූතො භික්ඛවෙ මනො කුතො සුඛො භවිස්සති.

එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො –පෙ– නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 14. 9

## අජ්ඣත්තඅනත්තසුත්තං

චක්ඛුං භික්ඛවෙ අනත්තා යොපි හෙතු යොපි පච්චයො චක්ඛුස්ස උප්පාදය සොපි අනත්තා. අනත්තසම්භූතං භික්ඛවෙ චක්ඛුං කුතො අත්තා භවිස්සති සොතං අනත්තා –පෙ– ඝානං අනත්තා –පෙ– ජිව්හා අනත්තා, යොපි හෙතු යොපි පච්චයො ජිව්හාය උප්පාදය සොපි අනත්තා. අනත්තසම්භූතා භික්ඛවෙ ජිව්හා කුතො අත්තා භවිස්සති? කායො අනත්තා –පෙ– මනො අනත්තා, යොපි හෙතු යොපි පච්චයො මනස්ස උප්පාදය සොපි අනත්තා, අනත්තසම්භූතො භික්ඛවෙ මනො කුතො අත්තා භවිස්සති.

එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො –පෙ– නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 14. 10

## බාහිරඅනිච්චසුත්තං

143. රූපා භික්ඛවෙ අනිච්චා, යොපි හෙතු යොපි පච්චයො රූපානං උප්පාදය සොපි අනිච්චො, අනිච්චසම්භූතා භික්ඛවෙ රූපා කුතො නිච්චා භවිස්සන්ති සද්ද –පෙ– ගන්ධා –පෙ– රසා –පෙ– ඵොට්ඨබ්බා –පෙ– ධම්මා අනිච්චා. යොපි හෙතු යොපි පච්චයො ධම්මානං උප්පාදය සොපි අනිච්චො. අනිච්චසම්භූතා භික්ඛවෙ ධම්මා කුතො නිච්චා භවිස්සන්ති.

## 1. 14. 8

## අජ්ඣත්ත දුක්ඛ සූත්‍රය

141. මහණෙනි ඇස දුක් ය. ඇසේ ඉපැද්මට යමෙකුත් හේතු වේ නම් යමෙකුත් ප්‍රත්‍යය වේ නම් හෙ ද දුක් ය. මහණෙනි දුක් හේතුවෙන් හටගත් ඇස කවර හෙයින් සුව වන්නේ ද. කන...නැහැය ... දිව දුක් ය. දිවේ ඉපැද්මට යමකුත් හේතු වේ නම් යමෙකුත් ප්‍රත්‍යය වේ නම් හෙ ද දුක් ය. මහණෙනි දුක් හේතුවෙන් හටගත් දිව කවර හෙයින් සුව වන්නේ ද. කය... සිත දුක් ය. සිතේ ඉපැද්මට යමෙකුත් හේතු වේ නම් යමෙකුත් ප්‍රත්‍යය වේ නම් හෙ ද දුක් ය. මහණෙනි, දුක් හෙයින් හටගත් සිත කවර හෙයින් සුව වන්නේ ද.

මහණෙනි, මෙසේ දක්නා උගත් අරිසවු තෙමේ... මේ රහත්බව පිණිස අනෙකක් නැතැ යි දැනගනී යි.

## 1. 14. 9

## අජ්ඣත්ත අනත්ත සූත්‍රය

142. මහණෙනි ඇස ආත්ම නො වේ. ඇසේ ඉපැද්මට යමෙකුත් හේතු වේ නම් යමෙකුත් ප්‍රත්‍යය වේ නම් හෙ ද ආත්ම නො වේ. මහණෙනි, ආත්ම නොවන හේතුවෙන් හටගත් ඇස කවර හෙයින් ආත්ම වන්නේ ද. කන ආත්ම නො වේ ... නැහැය ආත්ම නො වේ .. දිව ආත්ම නො වේ. දිවේ හටගැන්මට යමෙකුත් හේතු වේ නම් යමෙකුත් ප්‍රත්‍යය වේ නම් හෙ ද ආත්ම නො වේ. මහණෙනි, ආත්ම නොවන හේතුවෙන් හටගත් දිව කවර හෙයින් ආත්ම වන්නේ ද. කය අනත් ය ... සිත ආත්ම නො වේ. සිතේ ඉපැද්මට යමෙකුත් හේතු වේ නම් යමෙකුත් ප්‍රත්‍යය වේ නම් හෙ ද ආත්ම නො වේ. මහණෙනි, ආත්ම නොවන හේතුවෙන් හටගත් සිත කවර හෙයින් ආත්ම වන්නේ ද.

මහණෙනි මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක මේ රහත්බව පිණිස අනෙකක් නැතැ යි දැනගනී යි.

## 1. 14. 10

## බාහිර අනිච්ච සූත්‍රය

143. මහණෙනි රූපය අනිත්‍ය ය. රූපයන්ගේ ඉපැද්මට යමෙකුත් හේතු වේ නම් යමෙකුත් ප්‍රත්‍යය වේ නම් හෙ ද අනිත්‍ය ය. මහණෙනි, අනිත්‍ය දැයින් හටගත් රූපය කවර හෙයින් නිත්‍ය වන්නේ ද. සද... ගඳ... රස... පහස්... දහම් අනිත්‍ය ය. දහම්හි ඉපැද්මට යමෙකුත් හේතු වේ නම් යමෙකුත් ප්‍රත්‍යය වේ නම් හෙ ද අනිත්‍ය ය. මහණෙනි අනිත්‍ය දැයින් හටගත් දහම් කවර හෙයින් නිත්‍ය වන්නේ ද.

එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො රූපෙසුපි නිබ්බින්දති, සද්දෙසුපි නිබ්බින්දති, ගන්ධෙසුපි නිබ්බින්දති, රසෙසුපි නිබ්බින්දති, ඵොට්ඨබ්බෙසුපි නිබ්බින්දති ධම්මෙසුපි නිබ්බින්දති නිබ්බින්දං විරජ්ජති -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 14. 11

## බාහිරදුක්ඛසුත්තං

144. රූපා භික්ඛවෙ දුක්ඛා, යොපි හෙතු යොපි පච්චයො රූපානං උප්පාදය සොපි දුක්ඛො. දුක්ඛසම්භූතා භික්ඛවෙ රූපා කුතො සුඛා භවිස්සන්ති සද්දා -පෙ- ගන්ධා -පෙ- රසා -පෙ- ඵොට්ඨබ්බා -පෙ- ධම්මා දුක්ඛා, යොපි හෙතු යොපි පච්චයො ධම්මානං උප්පාදය සොපි දුක්ඛො, දුක්ඛසම්භූතා භික්ඛවෙ ධම්මා කුතො සුඛා භවිස්සන්ති.

එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1.14.12

## බාහිරඅනත්තසුත්තං

145. රූපා භික්ඛවෙ අනත්තා, යොපි හෙතු යොපි පච්චයො රූපානං උප්පාදය සොපි අනත්තා, අනත්තසම්භූතා භික්ඛවෙ රූපා කුතො අත්තා භවිස්සන්ති. සද්ද -පෙ- ගන්ධා -පෙ- රසා -පෙ- ඵොට්ඨබ්බා -පෙ- ධම්මා අනත්තා, යොපි හෙතු යොපි පච්චයො ධම්මානං උප්පාදය සොපි අනත්තා, අනත්තසම්භූතා භික්ඛවෙ ධම්මා කුතො අත්තා භවිස්සන්ති.

එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## දෙවදහවග්ගො චුද්දසමො

**තත්‍රුද්දානං:**

දෙවදහ ඛණො[1] සඞ්ගය්හ ගය්හ[2] ද්වෙ හොන්ති පලාසිනා[3]
හෙතුනා'පි තයො වුත්තා තෙ ඛො අජ්ඣත්ත බාහිරා[4]ති.

---

1. දෙවදහො ඛණෙ. මජසං.
2. පගය්හ. අගය්හ සයා.
3. ද්වෙ න තුම්හාකමෙව ච. මජසං.
4. ද්වෙ අජ්ඣත්තබාහිරා මජසං, සයා.

මහණෙනි මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක රූපයෙහිත් කලකිරෙයි. සදෙහිත් කලකිරෙයි. ගඳෙහිත් කලකිරෙයි. රසෙහිත් කලකිරෙයි. පහස්හිත් කලකිරෙයි. දහම්හිත් කලකිරෙයි. කලකිරෙන්නේ නො ඇලෙ යි ... මේ රහත්බව පිණිස අනෙකක් නැතැ යි දැනගනී යි.

## 1. 14. 11

## බාහිර දුක්ඛ සූත්‍රය

144. මහණෙනි රූපයෝ දුක්හ. රූපයන්ගේ ඉපැද්මට යමෙකුත් හේතු වේ නම් යමෙකුත් ප්‍රත්‍යය වේ නම් හෙ ද දුක් ය. මහණෙනි දුක් හේතුවෙන් හටගත් රූප කවර හෙයින් සුව වන්නේ ද. සද ... ගඳ... රස ... පහස් ... දහම් දුක් ය. දහම්හි ඉපැද්මට යමෙකුත් හේතු වේ නම් යමෙකුත් ප්‍රත්‍යය වේ නම් හෙ ද දුක් ය. මහණෙනි දුකින් හටගත් දහම් කොයින් සැප වන්නේ ද.

මහණෙනි මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක මේ රහත්බව පිණිස අනෙකක් නැතැ යි දැනගනී යි.

## 1. 14. 12

## බාහිර අනත්ත සූත්‍රය

145. මහණෙනි රූපයෝ අනාත්මයහ. රූපයන්ගේ ඉපැද්මට යමෙකුත් හේතු වේ නම් යමෙකුත් ප්‍රත්‍යය වේ නම් හෙ ද අනාත්ම ය. මහණෙනි අනාත්මදැයින් හටගත් රූපයෝ කොයින් ආත්ම වන්නෝ ද. සද ... ගඳ ... රස ... පහස් ... දහම් අනාත්මයහ. දහම්හි ඉපැද්මට යමෙකුත් හේතු වේ නම් යමෙකුත් ප්‍රත්‍යය වේ නම් හෙ ද අනාත්ම ය. මහණෙනි අනාත්ම දැයින් හටගත් දහම් කොයින් ආත්ම වන්නේ ද.

මහණෙනි මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ... මේ රහත්බව පිණිස අනෙකක් නැතැ යි දැනගනී යි.

**තුදුස්වැනි දේවදහවර්ගය යි.**

**එහි සූත්‍රනාමාවලිය:**

දෙවදහ, ඛණ, සගය්හ, ගය්හ යයි සතරෙක් ද, පලාස නමින් දෙකෙක් ද වෙත්, හේතු නමින් ද තුනෙක් කියන ලදි. ඔහු අජ්ඣත්ත බාහිර ය යි සයෙකි. මුළුල්ල දෙළසෙකි.

# 15. නවපුරාණවග්ගො

## 1. 15. 1

### කම්මසුත්තං

146. නවපුරාණානි භික්ඛවෙ, කම්මානි දෙසිස්සාමි, කම්මනිරොධ- ඤ්ච, කම්මනිරොධගාමිනිඤ්ච පටිපදං. තං සුණාථ, සාධුකං මනසිකරොථ, භාසිස්සාමීති.

කතමඤ්ච භික්ඛවෙ පුරාණං කම්මං[1]: චක්ඛුං භික්ඛවෙ පුරාණං කම්මං අභිසඞ්ඛතං අභිසඤ්චෙතයිතං වෙදනීයං දට්ඨබ්බං. සොතං පුරාණං කම්මං අභිසඞ්ඛතං අභිසඤ්චෙතයිතං වෙදනීයං දට්ඨබ්බං. ඝානං පුරාණං කම්මං අභිසඞ්ඛතං අභිසඤ්චෙතයිතං වෙදනීයං දට්ඨබ්බං. ජිව්හා පුරාණං කම්මං අභිසඞ්ඛතා අභිසඤ්චෙතයිතා වෙදනීයා දට්ඨබ්බා. කායො පුරාණං කම්මං අභිසඞ්ඛතො අභිසඤ්චෙතයිතො වෙදනීයො දට්ඨබ්බො. මනො පුරාණං කම්මං අභිසඞ්ඛතො අභිසඤ්චෙතයිතො වෙදනීයො දට්ඨබ්බො, ඉදං වුච්චති භික්ඛවෙ, පුරාණං කම්මං.

කතමඤ්ච භික්ඛවෙ නවං කම්මං: යං ඛො භික්ඛවෙ එතරහි කම්මං කරොති කායෙන වාචාය මනසා. ඉදං වුච්චති භික්ඛවෙ නවං කම්මං.

කතමො ච භික්ඛවෙ කම්මනිරොධො: යො ඛො භික්ඛවෙ කායකම්මවචීකම්මමනොකම්මස්ස[1] නිරොධා විමුත්තිං ඵුසති. අයං වුච්චති භික්ඛවෙ, කම්මනිරොධො.

කතමා ච භික්ඛවෙ කම්මනිරොධගාමිනී පටිපදා: අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි. අයං වුච්චති භික්ඛවෙ කම්මනිරොධගාමිනී පටිපදා.

ඉති ඛො භික්ඛවෙ දෙසිතං වො මයා පුරාණං කම්මං දෙසිතං නවං කම්මං, දෙසිතො කම්මනිරොධො, දෙසිතා කම්මනිරොධගාමිනී පටිපදා. යං වො භික්ඛවෙ, සත්ථාරා කරණීයං සාවකානං හිතෙසිනා අනුකම්පකෙන අනුකම්පං උපාදාය, කතං වො තං මයා.[2] එතානි භික්ඛවෙ රුක්ඛමූලානි, එතානි සුඤ්ඤාගාරානි, ඣායථ භික්ඛවෙ, මා පමාදත්ථ, මා පච්ඡා විප්පටිසාරිනො අහුවත්ථ, අයං වො අම්හාකං අනුසාසනීති.

3. කායකම්මං වාචාකම්මං මනොකම්මං - සිමු, සී 2.

4. කතං ඛො මයා - සභ්‍යා.

# 15. නවපුරාණ වර්ගය

## 1. 15. 1

### කම්ම සූත්‍රය

146. මහණෙනි, අලුත් කම් හා පැරණි කම් ද කර්මනිරෝධය ද කර්මනිරෝධගාමිනී ප්‍රතිපදව ද දේශනා කරන්නෙමි. එය අසවු. මැනවින් මෙනෙහි කරවු, කියන්නෙමි යි.

මහණෙනි, පැරණි කර්මය කවරේ ද යත්: මහණෙනි, ඇස ප්‍රත්‍යයන් විසින් එක් ව කරන ලද චේතනාව විසින් පිළියෙළ කරන ලද වේදනාවට වස්තු යයි දක්ක යුතු පැරණි කම්යෙකි. කන ප්‍රත්‍යයන් විසින් එක් ව කරන ලද චේතනාව විසින් පිළියෙළ කරන ලද වේදනාවට වස්තු යයි දක්ක යුතු පැරණි කම්යෙකි. නැහැය ප්‍රත්‍යයන් විසින් එක් ව කරන ලද චේතනාව විසින් පිළියෙළ කරන ලද වේදනාවට වස්තු යයි දක්ක යුතු පැරණි කම්යෙකි. දිව ප්‍රත්‍යයන් විසින් එක් ව කරන ලද චේතනාව විසින් පිළියෙළ කරන ලද වේදනාවට වස්තු යයි දක්ක යුතු පැරණි කම්යෙකි. කය ප්‍රත්‍යයන් විසින් එක් ව කරන ලද චේතනාව විසින් පිළියෙළ කරන ලද වේදනාවට වස්තු යයි දක්ක යුතු පැරණි කම්යෙකි. සිත ප්‍රත්‍යයන් විසින් එක් ව කරන ලද චේතනාව විසින් පිළියෙළ කරන ලද වේදනාවට වස්තු යයි දක්ක යුතු පැරණි කම්යෙකි. මහණෙනි, මේ පැරණි කම් යයි කියනු ලැබේ.

මහණෙනි, අලුත් කම්ය කවරේ ද යත්: දැන් කයින් වදනින් සිතින් යම් කම්යක් කෙරේ නම් මහණෙනි මේ අලුත් කම් යයි කියනු ලැබේ.

මහණෙනි, කම්නිරෝධය කවරේ ද යත්: මහණෙනි, යමෙක් කායකම් වාක්කම් මනඃකම්යන්ගේ නිරෝධයෙන් විමුක්තිය ස්පර්ශ කෙරේ නම් මහණෙනි, මේ කම්නිරොධ යයි කියනු ලැබේ.

මහණෙනි, කම්නිරෝධගාමිනීප්‍රතිපදව කවරයැ යත්: මේ ආය්‍ය්‍යාෂ්ටාඞ්ගික මාර්ගය මැ යි: එනම් සම්මාදිට්ඨි, සම්මාසඞ්කප්ප, සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මාආජීව, සම්මාවායාම, සම්මාසති, සම්මාසමාධි යි. මහණෙනි, මේ කම්නිරොධගාමිනීප්‍රතිපදව යි කියනු ලැබේ.

මහණෙනි. මෙසේ මා විසින් තොපට පැරණිකර්මය දේශනා කරන ලදී. අලුත්කර්මය දේශනා කරන ලදී. කර්මනිරෝධය දෙශනා කරන ලදි. කර්මනිරෝධගාමිනීප්‍රතිපදව දේශනා කරන ලදී. මහණෙනි, ශ්‍රාවකයන්ට හිතෛෂී වූ අනුකම්පා කරන ශාස්තෘවරයකු විසින් අනුකම්පාව නිසා යමක් තොපට කටයුතු නම් මා විසින් එය තොපට කරන ලදී. මහණෙනි, තෙල රුක්මුල් ඇත. තෙල ශූන්‍යාගාර ඇත. මහණෙනි, ධ්‍යාන කරවු, නහමක් පමාවවු. පසු ව නහමක් විපිළිසර ඇත්තෝ වවු. මේ තොපට අපගේ අනුශාසනාව යි.

## 1. 15. 2

### සප්පායසුත්තං

නිබ්බානසප්පායං වො භික්ඛවෙ පටිපදං දෙසිස්සාමි. තං සුණාථ, සාධුකං මනසි කරොථ, භාසිස්සාමීති. කතමා ච සා භික්ඛවෙ නිබ්බානසප්පායා පටිපදා:

ඉධ භික්ඛවෙ භික්ඛු චක්ඛුං අනිච්චන්ති පස්සති, රූපා අනිච්චාති පස්සති, චක්ඛුවිඤ්ඤාණං අනිච්චන්ති පස්සති, චක්ඛුසම්ඵස්සො අනිච්චොති පස්සති, යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චන්ති පස්සති.

සොතං –පෙ– ඝානං –පෙ– ජිව්හා අනිච්චාති පස්සති, රසා අනිච්චාති පස්සති, ජිව්හාවිඤ්ඤාණං අනිච්චන්ති පස්සති, ජිව්හාසම්ඵස්සො අනිච්චොති පස්සති, යම්පිදං ජිව්හාසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චන්ති පස්සති.

කායො –පෙ– මනො අනිච්චොති පස්සති, ධම්මා අනිච්චාති පස්සති, මනොවිඤ්ඤාණං අනිච්චන්ති පස්සති, මනොසම්ඵස්සො අනිච්චොති පස්සති, යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චන්ති පස්සති. අයං ඛො සා භික්ඛවෙ නිබ්බානසප්පායා පටිපදාති.

## 1. 15. 3

### දුතියසප්පායසුත්තං

148. නිබ්බානසප්පායං වො භික්ඛවෙ පටිපදං දෙසිස්සාමි. තං සුණාථ සාධුකං මනසි කරොථ, භාසිස්සාමීති. කතමා ච සා භික්ඛවෙ නිබ්බානසප්පායා පටිපදා:

ඉධ භික්ඛවෙ භික්ඛු චක්ඛුං දුක්ඛන්ති පස්සති, රූපා දුක්ඛන්ති පස්සති, චක්ඛුවිඤ්ඤාණං දුක්ඛන්ති පස්සති, චක්ඛුසම්ඵස්සො දුක්ඛොති පස්සති, යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි දුක්ඛන්ති පස්සති.

සොතං –පෙ– ඝානං –පෙ– ජිව්හා දුක්ඛාති පස්සති, රසා දුක්ඛාති පස්සති, ජිව්හාවිඤ්ඤාණං දුක්ඛන්ති පස්සති, ජිව්හාසම්ඵස්සො දුක්ඛොති පස්සති, යම්පිදං ජිව්හාසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි දුක්ඛන්ති පස්සති.

කායො –පෙ– මනො දුක්ඛොති පස්සති, ධම්මා දුක්ඛාති පස්සති, මනොවිඤ්ඤාණං දුක්ඛන්ති පස්සති, මනොසම්ඵස්සො දුක්ඛොති පස්සති, යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති. වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි දුක්ඛන්ති පස්සති. අයං ඛො සා භික්ඛවෙ නිබ්බානසප්පායා පටිපදාති.

## 1. 15. 2

### සප්පාය සූත්‍රය

147. මහණෙනි නිවනට පිටිවහල් වූ පිළිවෙත තොපට දේශනා කරන්නෙමි, එය අසවු, මැනවින් මෙනෙහි කරවු, කියන්නෙමි යි. මහණෙනි නිවනට පිටිවහල් වූ ඒ පිළිවෙත කවර යැ යත්:

මහණෙනි මෙහි මහණ ඇස අනිත්‍ය යි දකී. රූ අනිත්‍ය යි දකී. චක්ෂුර්විඥානය අනිත්‍ය යි දකී. ඇස්පහස අනිත්‍ය යි දකී. ඇස්පහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් එ ද අනිසැ යි දකී.

කන ... නැහැය ... දිව අනිසැ යි දකී. රස අනිසැ යි දකී. ජිව්හාවිඥානය අනිසැ යි දකී. දිවුපහස අනිසැ යි දකී. දිවුපහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් හෙ ද අනිසැ යි දකී.

කය ... සිත අනිසැ යි දකී. (අරමුණු) දහම් අනිසැ යි දකී. මනෝවිඥානය අනිසැ යි දකී. මනපහස අනිසැ යි දකී. මනපහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් හෙ ද අනිසැ යි දකී. මහණෙනි මේ නිවනට පිටිවහල් වූ ඒ පිළිවෙත යි.

## 1. 15. 3

### දුතිය සප්පාය සූත්‍රය

148. මහණෙනි නිවනට පිටිවහල් වූ පිළිවෙත තොපට දේශනා කරන්නෙමි. එය අසවු, මැනවින් මෙනෙහි කරවු, කියන්නෙමි යි. මහණෙනි නිවනට පිටිවහල් වූ ඒ පිළිවෙත කවර යැ යත්:

මහණෙනි මෙ සස්නෙහි මහණ ඇස දුකැ යි දකී. රූ දුකැ යි දකී. චක්ෂුර්විඥානය දුකැ යි දකී. ඇස්පහස දුකැ යි දකී. ඇස්පහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් හෙ ද දුකැ යි දකී.

කන ... නැහැය ... දිව දුකැ යි දකී, රස දුකැ යි දකී, ජිව්හාවිඥානය දුකැ යි දකී, දිව්පහස දුකැ යි දකී, දිව්පහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් හෙ ද දුකැ යි දකී.

කය ... සිත දුකැ යි දකී, දහම් දුකැ යි දකී, මනවිනැණ දුකැ යි දකී, මනපහස දුකැ යි දකී, මනපහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් හෙ ද දුකැ යි දකී. මහණෙනි, මේ නිවනට පිටිවහල් වූ ඒ ළිවෙත යි.

## 1. 15. 4

### තතියසප්පායසුත්තං

149. නිබ්බානසප්පායං වො භික්ඛවෙ පටිපදං දෙසිස්සාමි. තං සුණාථ, සාධුකං මනසිකරොථ භාසිස්සාමීති. කතමා ච සා භික්ඛවෙ, නිබ්බානසප්පායා පටිපද:

ඉධ භික්ඛවෙ, භික්ඛු චක්ඛුං අනත්තාති පස්සති, රූපා අනත්තාති පස්සති, චක්ඛුවිඤ්ඤාණං අනත්තාති පස්සති, චක්ඛුසම්ඵස්සො අනත්තාති පස්සති, යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනත්තාති පස්සති.

සොතං -පෙ- ඝානං -පෙ- ජිව්හා අනත්තාති පස්සති, රසා අනත්තාති පස්සති. ජිව්හාවිඤ්ඤාණං අනත්තාති පස්සති, ජිව්හාසම්ඵස්සො අනත්තාති පස්සති යම්පිදං ජිව්හාසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනත්තාති පස්සති.

කායො -පෙ- මනො අනත්තාති පස්සති, ධම්මා අනත්තාති පස්සති, මනොවිඤ්ඤාණං අනත්තාති පස්සති, මනොසම්ඵස්සො අනත්තාති පස්සති, යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනත්තාති පස්සති. අයං ඛො සා භික්ඛවෙ, නිබ්බානසප්පායා පටිපදාති.

## 1. 15. 5

### චතුත්ථසප්පායසුත්තං

150. නිබ්බානසප්පායං වො භික්ඛවෙ, පටිපදං දෙසිස්සාමි, තං සුණාථ, සාධුකං මනසිකරොථ, භාසිස්සාමීති. කතමා ච සා භික්ඛවෙ, නිබ්බානසප්පායා පටිපද;

තං කිම්මඤ්ඤථ භික්ඛවෙ, චක්ඛුං නිච්චං වා අනිච්චං වාති? අනිච්චං භන්තෙ, යම්පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති ? දුක්ඛං භන්තෙ, යම්පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං "එතං මම එසො'හමස්මි, එසො මෙ අත්තා"ති? නො හෙතං භන්තෙ,

රූපා නිච්චා වා අනිච්චා වාති ? අනිච්චා භන්තෙ -පෙ- චක්ඛුවිඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති ? අනිච්චං භන්තෙ -පෙ- චක්ඛුසම්ඵස්සො නිච්චො වා අනිච්චො වාති ? අනිච්චො භන්තෙ -පෙ- යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි නිච්චං වා අනිච්චං වාති ? අනිච්චං භන්තෙ, යම්පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති ? දුක්ඛං භන්තෙ, යම්පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං "එතං මම එසො'හමස්මි, එසො මෙ අත්තා"ති ? නො හෙතං භන්තෙ,

## 1. 15. 4

## තතිය සප්පාය සූත්‍රය

149. මහණෙනි, නිවනට පිටිවහල් වූ පිළිවෙත තොපට දේශනා කරන්නෙමි. එය අසවු, මැනවින් මෙනෙහි කරවු, කියන්නෙමි යි. මහණෙනි, නිවනට පිටිවහල් වූ ඒ පිළිවෙත කවර යැ යත්:

මහණෙනි, මෙ සස්නෙහි මහණ ඇස අනාත්මය යයිදකී රූ අනත් යයි දකී. ඇස්විනැණ අනත් යයි දකී. ඇස්පහස අනත් යයි දකී. ඇස්පහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් හෙ ද අනත් යයි දකී.

කන ... නැහැය ... දිව අනත් යයි දකී. රස අනත් යයි දකී. දිවවිනැණ අනත් යයි දකී. දිවපහස අනත් යයි දකී. දිවපහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී හෙ ද අනත් යයි දකී.

කය ... සිත අනත් යයි දකී. දහම් අනත් යයි දකී. මනවිඤැන අනත් යයි දකී. මනපහස අනත් යයි දකී. මනපහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් එ ද අනත් යයි දකී. මහණෙනි, මේ නිවනට පිටිවහල් වූ ඒ පිළිවෙත යි.

## 1. 15. 5

## චතුත්ථ සප්පාය සූත්‍රය

150. මහණෙනි, නිවනට පිටිවහල් වූ පිළිවෙත තොපට දේශනා කරන්නෙමි. එය අසවු, මැනවින් මෙනෙහි කරවු, කියන්නෙමි යි. මහණෙනි, නිවනට පිටිවහල් වූ ඒ පිළිවෙත කවර යැ යත්:

මහණෙනි, ඒ කිමැ යි හඟි වු ද? ඇස නිත්‍ය හෝ අනිත්‍ය හෝ යැ. වහන්ස, අනිත්‍ය ය. යමක් අනිත්‍ය නම් එය දුක් හෝ සුව හෝ යැ. වහන්ස, දුක් ය. යමක් අනිත්‍ය නම් දුක් නම් වෙනස්වනසුලු නම් එය "මෙය මාගේ ය. මේ මම වෙමි. මේ මාගේ ආත්ම යයි දක්නට සුදුසු දැ? යි. වහන්ස, මෙය නො වේ ම ය.

රූපය නිත්‍ය හෝ අනිත්‍ය හෝ යැ? වහන්ස, අනිත්‍ය ය ... ඇස්විනැණ නිත්‍ය හෝ අනිත්‍ය හෝ යැ? වහන්ස, අනිත්‍යය ... ඇස්පහස නිත්‍ය හෝ අනිත්‍ය හෝ යි. වහන්ස, අනිත්‍ය ය. ... ඇස්පහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක්නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් හෙ ද නිත්‍ය හෝ අනිත්‍ය හෝ යැ. වහන්ස, අනිත්‍ය ය; යමක් අනිත්‍ය නම් හේ දුක් හෝ සුව හෝ යැ? වහන්ස, දුක් ය. යමක් අනිත්‍ය නම් දුක් නම් වෙනස්වනසුලු නම් එය "මෙය මාගේ ය. මේ මම වෙමි" මේ මාගේ ආත්ම යයි දක්නට සුදුසු දැ? යි. වහන්ස, මෙය නො වේ ම ය.

සොතං -පෙ- ඝානං -පෙ- ජිව්හා -පෙ- කායො -පෙ- මනො නිච්චො වා අනිච්චො වාති? අනිච්චො භන්තෙ. -පෙ- ධම්මා -පෙ- මනොවිඤ්ඤාණං -පෙ- මනොසම්ඵස්සො -පෙ- යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි නිච්චං වා අනිච්චං වාති? අනිච්චං භන්තෙ, යම්පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? දුක්ඛං භන්තෙ, යම්පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලං නු තං සමනුපස්සිතුං: "එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා"ති? නො හෙතං භන්තෙ.

එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො චක්ඛුස්මිම්පි නිබ්බින්දති, රූපෙසුපි නිබ්බින්දති, චක්ඛුවිඤ්ඤාණෙපි නිබ්බින්දති, චක්ඛුසම්ඵස්සෙපි නිබ්බින්දති, යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා, අදුක්ඛමසුඛං වා තස්මිම්පි නිබ්බින්දති -පෙ- යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තස්මිම්පි නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාති.[1] අයං ඛො සා භික්ඛවෙ නිබ්බානසප්පායපටිපදාති.

## 1. 15. 6

## අන්තෙවාසිකසුත්තං

151. අනන්තෙවාසිකමිදං භික්ඛවෙ බ්‍රහ්මචරියං වුස්සති අනාචරියකං, සාන්තෙවාසිකො[2] භික්ඛවෙ භික්ඛු සාචරියකො දුක්ඛං න ඵාසු විහරති. අනන්තෙවාසිකො භික්ඛවෙ භික්ඛු අනාචරියකො සුඛං ඵාසුං විහරති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු සාන්තෙවාසිකො සාචරියකො දුක්ඛං න ඵාසු විහරති: ඉධ භික්ඛවෙ භික්ඛුනො චක්ඛුනා රූපං දිස්වා උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා සරසඞ්කප්පා සඤ්ඤොජනියා, ත්‍යාස්ස අන්තො වසන්ති, අන්තස්ස වසන්ති පාපකා අකුසලා ධම්මාති, තස්මා සාන්තෙවාසිකොති වුච්චති, තෙ නං සමුදාචරන්ති, සමුදාචරන්ති නං පාපකා අකුසලා ධම්මාති, තස්මා සාචරියකොති වුච්චති.

පුනචපරං භික්ඛවෙ භික්ඛුනො සොතෙන සද්දං සුත්වා -පෙ- පුනචපරං භික්ඛවෙ භික්ඛුනො ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- පුනචපරං භික්ඛවෙ භික්ඛුනො ජිව්හාය රසං සායිත්වා උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා සරසඞ්කප්පා සඤ්ඤොජනියා -පෙ- පුනචපරං භික්ඛවෙ, භික්ඛුනො කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ-

1. පජානාතීති - සීමු.
2. සන්තෙවාසිකො - සයා

කන ... නැහැය ... දිව ... කය ... සිත නිත්‍ය හෝ අනිත්‍ය හෝ යැ? වහන්ස, අනිත්‍යය ... දහම් ... මනවිනැණ ... මනපහස ... මනපහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක්නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් හෙ ද නිත්‍ය හෝ අනිත්‍ය හෝ යැ? වහන්ස, අනිත්‍ය ය. යමක් අනිත්‍ය නම් එය දුක් හෝ සුව හෝ යැ? වහන්ස, දුක් ය. යමක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වනසුලු නම් එය මෙය මාගේ ය, මේ මම වෙමි, මේ මාගේ ආත්ම යයි දක්නට සුදුසු දැ? යි. වහන්ස, මෙය නො වේ ම ය.

මහණෙනි, මෙසේ දක්නා ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවක ඇසෙහිත් කලකිරෙයි. රූපයෙහිත් කලකිරෙයි. ඇස්විනැණෙහිත් කලකිරෙයි. ඇස්පහසෙහිත් කලකිරෙයි. ඇස්පහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක්නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් එහිත් කලකිරෙයි. ... මනපහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක්නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් එහිත් කලකිරෙයි. කලකිරෙන්නේ නො ඇලෙයි. ... මේ රහත්බව පිණිස අනෙකක් නැතැ යි දැනගනී යි. මහණෙනි, මේ නිවනට පිවිවහල් වූ ඒ පිළිවෙත යි.

## 1. 15. 6

## අන්තෙවාසික සූත්‍රය

151. මහණෙනි, අත වැස්සන් නැති ඇදුරන් නැති හෙවත් ඇතුළත කෙලෙස් නැති කෙලෙසුන් විසින් ශික්ෂණ නැති මහණ මේ බඹසර වෙසෙයි. මහණෙනි, අතැවැසි කෙලෙසුන් සහිත ඇදුරු කෙලෙසුන් සහිත මහණ නො පහසුව දුකසේ වෙසෙයි. මහණෙනි, අනන්තෙවාසික අනාචරියක මහණ සුවසේ පහසු ලෙස වෙසෙයි.

මහණෙනි, සාන්තෙවාසික සාචරියක මහණ කෙසේ නම් දුකසේ නො පහසු ලෙස වෙසේ ද යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණහට ඇසින් රූපයක් දැකීමෙන් සරසඞ්කප්ප නම් වූ සංයෝජනයන්ට හිත වූ ලාමක අකුසල් දහම්හු උපදිද් ද, ඔහු ඔහුගේ ඇතුළත වෙසෙත්. ලාමක අකුසල් දහම්හු ඔහුගේ ඇතුළත වෙසෙත් යන මෙකරුණෙන් සාන්තෙවාසික යයි කියනු ලැබේ. ඒ කෙලෙස්හු ඔහු ශික්ෂණ කෙරෙති. ලාමක අකුසල් දහම්හු ඔහු ශික්ෂණ කෙරෙති යි මෙකරුණින් හේ සාචරියක යයි කියනු ලැබේ.

මහණෙනි, නැවත අනෙකක් ද කියමි. කනින් සද අසා මහණහට ... මහණෙනි, නැවත අනෙකක් ද කියමි: නැහැයෙන් ගඳ ගෙන මහණහට ... මහණෙනි, නැවත අනෙකක් ද කියමි: දිවෙන් රස විඳ මහණහට සරසඞ්කප්ප නම් වූ සංයෝජනයන්ට හිතවූ ලාමක අකුසල් දහම්හු උපදිද්ද...මහණෙනි, නැවත අනෙකක් ද කියමි: කයින් පහස පැහැස්මෙන් මහණහට...

පුනචපරං භික්ඛවෙ, භික්ඛුනො මනසා ධම්මං විඤ්ඤාය උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා සරසඞ්කප්පා සඤ්ඤොජනියා, ත්‍යාස්ස අන්තො වසන්ති, අන්තස්ස වසන්ති පාපකා අකුසලා ධම්මාති, තස්මා සාන්තෙවාසිකොති වුච්චති, තෙ නං සමුදාචරන්ති. සමුදාචරන්ති නං පාපකා අකුසලා ධම්මාති, තස්මා සාචරියකොති වුච්චති. එවං ඛො භික්ඛවෙ, භික්ඛු සාන්තෙවාසිකො සාචරිකො දුක්ඛං න ඵාසු විහරති.

කථං ච භික්ඛවෙ, භික්ඛු අනන්තෙවාසිකො අනාචරියකො සුඛං ඵාසු විහරති: ඉධ භික්ඛවෙ, භික්ඛුනො චක්ඛුනා රූපං දිස්වා නුප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා සරසඞ්කප්පා සඤ්ඤොජනියා, ත්‍යාස්ස න අන්තො වසන්ති, නාස්ස අන්තො වසන්ති පාපකා අකුසලා ධම්මාති තස්මා අනන්තෙවාසිකොති වුච්චති. තෙ න නං[1] සමුදාචරන්ති. න සමුදාචරන්ති නං පාපකා අකුසලා ධම්මාති, තස්මා අනාචරියකොති වුච්චති.

පුනචපරං භික්ඛවෙ, භික්ඛුනො සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- පුනචපරං භික්ඛවෙ, භික්ඛුනො මනසා ධම්මං විඤ්ඤාය නුප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා සරසඞ්කප්පා සඤ්ඤොජනියා, ත්‍යාස්ස න අන්තො වසන්ති, නාස්ස අන්තො වසන්ති පාපකා අකුසලා ධම්මාති, තස්මා අනන්තෙවාසිකොති වුච්චති. තෙ න නං සමුදාචරන්ති, න සමුදාචරන්ති නං පාපකා අකුසලා ධම්මාති තස්මා අනාචරියකොති වුච්චති.

එවං ඛො භික්ඛවෙ, භික්ඛු අනන්තෙවාසිකො අනාචරියකො සුඛං ඵාසු විහරති. අනන්තෙවාසිකමිදං භික්ඛවෙ, බ්‍රහ්මචරියං වුස්සති අනාචරියකං. සාන්තෙවාසිකො භික්ඛවෙ, භික්ඛු සාචරියකො දුක්ඛං න ඵාසු විහරති. අනන්තෙවාසිකො භික්ඛවෙ, භික්ඛු අනාචරියකො සුඛං ඵාසු විහරතීති.

## 1. 15. 7

## කිමත්ථියසුත්තං

152. සචෙ වො භික්ඛවෙ, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං පුච්ඡෙය්‍යුං: "කිමත්ථියං ආවුසො සමණෙ ගොතමෙ බ්‍රහ්මචරියං වුස්සතී"ති ? එවං පුට්ඨා තුම්හෙ භික්ඛවෙ, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං ව්‍යාකරෙය්‍යාථ: දුක්ඛස්ස ඛො ආවුසො පරිඤ්ඤාය භගවති බ්‍රහ්මචරියං වුස්සතීති. සචෙ පන වො භික්ඛවෙ, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං පුච්ඡෙය්‍යුං: කතමං පන තං ආවුසො දුක්ඛං යස්ස පරිඤ්ඤාය සමණෙ ගොතමෙ බ්‍රහ්මචරියං වුස්සතීති ? එවං පුට්ඨා තුම්හෙ භික්ඛවෙ, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං ව්‍යාකරෙය්‍යාථ:

1. තෙනං - සයා, තෙ නං න - මජ්සං.

මහණෙනි, නැවත අනෙකක් ද කියමි. සිතින් දහම් දැන මහණහට සරසඞ්කප්ප නම් වූ සංයෝජනයන්ට හිත වූ ලාමක අකුසල්දහම්හු උපදිත්ද ඒ අකුසල්හු ඔහුගේ ඇතුළත වෙසෙත්. ලාමක අකුසල්දහම්හු ඔහුගේ ඇතුළත වෙසෙත්නු යි මෙකරුණින් සානෙතවාසික යයි කියනු ලැබේ. ඒ කෙලෙස්හු ඔහු ශික්ෂණ කෙරෙති. ලාමක අකුසල්දහම්හු ඔහු ශික්ෂණ කෙරෙත් නු යි මෙකරුණින් සාචරියක යයි කියනු ලැබේ. මහණෙනි, මෙසේ සානෙතවාසික සාචරියක මහණ දුකසේ නො පහසු ලෙස වෙසෙ යි.

මහණෙනි, අනනෙතවාසික අනාචරියක මහණ කෙසේ නම් සුවසේ පහසු ලෙස වෙසේ ද යත්: මහණෙනි, මෙහි ඇසින් රූ දැක ඔහුට සරසඞ්කප්ප නම් වූ සංයෝජනයන්ට හිත වූ ලාමක අකුසල්දහම්හු නූපදිත්ද, ඒ කෙලෙස්හු ඔහු අතැවැසි නො වෙත්, ලාමක අකුසල්දහම්හු ඔහු අතැවැසි නො වෙත් නු යි එහෙයින් අනනෙතවාසික යයි කියනු ලැබේ. ඒ කෙලෙස්හු ඔහු ශික්ෂණ නො කෙරෙති. ලාමක අකුසල්දහම්හු ඔහු ශික්ෂණ නො කෙරෙත් නු යි මෙසේ අනාචරියක යයි කියනු ලැබේ.

මහණෙනි, නැවත අනෙකක් ද කියමි: කනින් සද අසා මහණහට ... නැහැයෙන් ගඳ ගෙන ... දිවෙන් රස විඳ ... කයින් පහස් පැහැසැ ... මහණෙනි, නැවත අනෙකක් ද (කියමි:) සිතින් දහම් දැන මහණහට සරසඞ්කප්ප නම් වූ සංයෝජනයන්ට හිත වූ ලාමක අකුසල්දහම්හු නූපදිත්ද ඒ අකුසල්හු ඔහු අතැවැසි නො වෙත්. ලාමක අකුසල්දහම්හු ඔහු අතැවැසි නො වෙත් නු යි මෙසේ අනනෙතවාසික යයි කියනු ලැබේ. ඒ කෙලෙස්හු ඔහු නො මඩිත් ලාමක අකුසල්-දහම්හු ඔහු නො මඩිත් නු යි. එසේ අනාචරියක යයි කියනු ලැබේ.

මහණෙනි, මෙසේ අනනෙතවාසික අනාචරියක මහණ සුවසේ පහසු ලෙස වෙසෙයි. මහණෙනි, අනනෙතවාසික අනාචරියකවැ මේ බඹසර වෙසේ. මහණෙනි, සානෙතවාසික සාචරියක මහණ දුකසේ නො පහසු ලෙස වෙසේ. මහණෙනි, අනනෙතවාසික අනාචරියක මහණ සුවසේ පහසු ලෙස වෙසේ යි.

## 1. 15. 7

## කිමත්ථිය සූත්‍රය

152. මහණෙනි, ඉදින් අන්තොටු පිරිවැජ්ජෝ "ඇවැත්නි, කුමක් පිණිස මහණගොයුම්හු කෙරෙහි බඹසර වසනු ලැබේ ද?"යි මෙසේ තොප පුළුවුස්නාහු නම් මහණෙනි, එසේ පුළුවුස්නා ලද තෙපි ඒ අන්තොටු පිරිවැජ්ජන්ට "ඇවැත්නි, දුක පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර වසනු ලැබේ ය"යි මෙසේ පවසවු. මහණෙනි, ඉදින් ඒ අන්තොටුපිරිවැජ්ජෝ ඇවැත්නි, යමක් පිරිසිඳ දැනීම පිණිස මහණගොයුම්හු කෙරෙහි බඹසර වෙසේ නම් ඒ දුක කවරේ ද? යි මෙසේ තොප පුළුවුස්නාහු නම් මහණෙනි, එසේ පුළුවුස්නා ලද තෙපි ඒ අන්තොටු පිරිවැජ්-ජන්ට මෙසේ හෙළිකරවු.

චක්ඛුං ඛො ආවුසො දුක්ඛං, තස්ස පරිඤ්ඤාය භගවති බ්‍රහ්මචරියං වුස්සති. රූපා දුක්ඛා, තෙසං පරිඤ්ඤාය භගවති බ්‍රහ්මචරියං වුස්සති. චක්ඛුවිඤ්ඤාණං දුක්ඛං, තස්ස පරිඤ්ඤාය භගවති බ්‍රහ්මචරියං වුස්සති චක්ඛුසම්ඵස්සො දුක්ඛො, තස්ස පරිඤ්ඤාය භගවති බ්‍රහ්මචරියං වුස්සති. යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තම්පි දුක්ඛං තස්ස පරිඤ්ඤාය භගවති බ්‍රහ්මචරියං වුස්සති.

සොතං දුක්ඛං -පෙ- ඝානං දුක්ඛං -පෙ- ජිව්හා දුක්ඛා -පෙ- කායො දුක්ඛො -පෙ- මනො දුක්ඛො, තස්ස පරිඤ්ඤාය භගවති බ්‍රහ්මචරියං වුස්සති -පෙ- යම්පිදං මනොසම්ඵස්ස පච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි දුක්ඛං, තස්ස පරිඤ්ඤාය භගවති බ්‍රහ්මචරියං වුස්සති. ඉදං ඛො ආවුසො දුක්ඛං යස්ස පරිඤ්ඤාය භගවති බ්‍රහ්මචරියං වුස්සතීති. එවං පුට්ඨා තුම්හෙ භික්ඛවෙ, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං ව්‍යාකරෙය්‍යාථාති.

## 1. 15. 8

## අත්ථිනුඛොපරියායසුත්තං

153. **සාවත්ථියං —**

අත්ථි නු ඛො භික්ඛවෙ, පරියායො යං පරියායං ආගම්ම භික්ඛු අඤ්ඤත්‍රෙව සද්ධාය අඤ්ඤත්‍ර[1] රුචියා අඤ්ඤත්‍ර අනුස්සවා අඤ්ඤත්‍ර ආකාරපරිවිතක්කා අඤ්ඤත්‍ර දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා අඤ්ඤං ව්‍යාකරෙය්‍ය: "ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාමී"ති?

භගවම්මූලකා නො භන්තෙ, ධම්මා භගවන්නෙත්තිකා භගවම්පටිසරණා සාධු වත භන්තෙ, භගවන්තංයෙව පටිභාතු එතස්ස භාසිතස්ස අත්ථො, භගවතො සුත්වා භික්ඛූ ධාරෙස්සන්තීති. තෙන හි භික්ඛවෙ සුණාථ, සාධුකං මනසිකරොථ, භාසිස්සාමීති. එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

අත්ථි භික්ඛවෙ, පරියායො යං පරියායං ආගම්ම භික්ඛු අඤ්ඤත්‍රෙව සද්ධාය -පෙ- අඤ්ඤත්‍ර දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා අඤ්ඤං ව්‍යාකරෙය්‍ය: "ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාමී"ති. කතමො ච භික්ඛවෙ, පරියායො යං පරියායං ආගම්ම භික්ඛු අඤ්ඤත්‍රෙව සද්ධාය -පෙ- අඤ්ඤත්‍ර දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා අඤ්ඤං ව්‍යාකරොති: "ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාමී"ති:

1. අඤ්ඤත්ථ - සී 2

ඇවැත්නි, ඇස දුක් ය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර වැසේ. රූ දුක් ය. ඔවුන් පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර වැසේ. ඇස්විඤාණ දුක් ය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර වැසෙයි. ඇස්පහස දුක් ය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර වැසෙයි. ඇස්පහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක්නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් හෙ ද දුක් ය. එය පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර වෙසෙයි.

කන දුක් ය ... නැහැය දුක් ය ... දිව දුක් ය . කය දුක් ය...සිත දුක් ය. එය පිරිසිඳ දැනීම පිණිස භගවත්හු කෙරෙහි බඹසර වෙසෙයි ... මනපහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක්නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් හෙද දුක් ය. එය පිරිසිඳ දැනීම පිණිස භගවත්හු කෙරෙහි බඹසර වෙසෙයි. ඇවැත්නි, යමක් පිරිසිඳ දැනීම පිණිස භගවත්හු කෙරෙහි බඹසර වැසේ නම් මේ ඒ දුක යයි. මහණෙනි, එසේ පුළුවුස්නා ලද තෙපි ඒ අන්තොටු පිරිවැජ්ජන්ට මෙසේ පවසවු යි.

## 1. 15. 8

## අත්ථිනුඛොපරියාය සූත්‍රය

153. **සැවැත්නුවර —**

මහණෙනි, මහණ තෙමේ යම් කරුණකට පැමිණ ඇදහීමෙන් තොර ව ම රුචියෙන් තොර ව ම ඇසීමෙන් තොර ව ම අයුරු සැලකීමෙන් තොර ව ම ලබ්ධි විසින් ගැනීමෙන් තොර ව ම ''ඉපැද්ම ගෙවිණ, බඹසර වැස නිමවන ලදී, කටයුතු කරන ලදී, මේ රහත්බව පිණිස අනෙකක් නැතැ යි දැනගනී''යි. රහත්බව පළ කරන්නේ නම් එබඳු කරුණෙක් ඇද්ද? යි.

වහන්ස, අපගේ දහම්හු භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇතියහ. භාග්‍යවතුන් වහන්සේ නේත්‍ර කොට ඇතියහ. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණ කොට ඇතියහ. වහන්ස, මේ දේශනාවේ අරුත භාග්‍යවතුන් වහන්සේට ම වැටහේවා. අයැදිමි, භාග්‍යවතුන් වහන්සේගෙන් අසා භික්ෂූහු දරන්නාහ යි. මහණෙනි, එසේ නම් අසවු, මැනවින් මෙනෙහි කරවු, කියන්නෙමි යි. එසේ ය වහන්සැ යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක:

මහණෙනි, මහණ තෙමේ ඇදහීමෙන් තොර ව ම ... ලබ්ධි විසින් ගැනීමෙන් තොර ව ම ''ඉපැද්ම ගෙවිණ. බඹසර වැස නිමවන ලදී. කටයුතු කරන ලදී. මේ රහත්බව පිණිස අනෙකක් නැතැ යි දැනගනී''යි රහත්බව පළ කරන්නේ නම් එබඳු කරුණෙක් ඇත. මහණෙනි, යම් කරුණකට පැමිණ මහණ තෙමේ ඇදහීමෙන් තොර ව ම ... ලබ්ධි විසින් ගැනීමෙන් තොර ව ම ''ඉපැද්ම ගෙවිණ. බඹසර වැස නිමවන ලදී. කටයුතු කරන ලදී. මේ රහත් බව පිණිස අනෙකක් නැතැ යි දැනගනී'' යි රහත්බව පළ කෙරේ නම් එබඳු කරුණ කවරේ ද යත්:

ඉධ භික්ඛවෙ, භික්ඛු චක්ඛුනා රූපං දිස්වා සන්තං වා අජ්ඣත්තං රාගදෙසමොහං අත්ථි මෙ අජ්ඣත්තං රාගදෙසමොහොති පජානාති, අසන්තං වා අජ්ඣත්තං රාගදෙසමොහං නත්ථි මෙ අජ්ඣත්තං රාගදෙසමොහොති පජානාති: යන්තං භික්ඛවෙ, භික්ඛු චක්ඛුනා රූපං දිස්වා සන්තං වා අජ්ඣත්තං රාගදෙසමොහං අත්ථි මෙ අජ්ඣත්තං රාගදෙසමොහොති පජානාති, අසන්තං වා අජ්ඣත්තං රාගදෙසමොහං නත්ථි මෙ අජ්ඣත්තං රාගදෙසමොහොති පජානාති: අපි නු මෙ භික්ඛවෙ, ධම්මා සද්ධාය වා වෙදිතබ්බා, රුචියා වා වෙදිතබ්බා, අනුස්සවෙන වා වෙදිතබ්බා, ආකාරපරිවිතක්කෙන වා වෙදිතබ්බා, දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා වා වෙදිතබ්බා ? නොහෙතං භන්තෙ, නනු මෙ භික්ඛවෙ, ධම්මා පඤ්ඤාය දිස්වා වෙදිතබ්බාති? එවම්භන්තෙ.

අයං[1] බො භික්ඛවෙ, පරියායො යං පරියායං ආගම්ම භික්ඛු අඤ්ඤත්‍රෙව සද්ධාය -පෙ- අඤ්ඤත්‍ර දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා අඤ්ඤං ව්‍යාකරොති: "ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාමී"ති.

පුනචපරං භික්ඛවෙ, භික්ඛු සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- පුනචපරං භික්ඛවෙ, භික්ඛු මනසා ධම්මං විඤ්ඤාය සන්තං වා අජ්ඣත්තං රාගදෙසමොහං අත්ථි මෙ අජ්ඣත්තං රාගදෙසමොහොති පජානාති, අසන්තං වා අජ්ඣත්තං රාගදෙසමොහං නත්ථි මෙ අජ්ඣත්තං රාගදෙසමොහොති පජානාති. යන්තං භික්ඛවෙ, භික්ඛු මනසා ධම්මං විඤ්ඤාය සන්තං වා අජ්ඣත්තං රාගදෙසමොහං අත්ථි මෙ අජ්ඣත්තං රාගදෙසමොහොති පජානාති, අසන්තං වා අජ්ඣත්තං රාගදෙසමොහං නත්ථි මෙ අජ්ඣත්තං රාගදෙසමොහොති පජානාති, අපි නු බො මෙ[2] භික්ඛවෙ, ධම්මා සද්ධාය වා වෙදිතබ්බා -පෙ- දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා වා වෙදිතබ්බාති ? නොහෙතං භන්තෙ, නනු මෙ භික්ඛවෙ, ධම්මා පඤ්ඤාය දිස්වා වෙදිතබ්බාති? එවම්භන්තෙ.

අයම්පි බො භික්ඛවෙ, පරියායො යං පරියායං ආගම්ම භික්ඛු අඤ්ඤත්‍රෙව සද්ධාය අඤ්ඤත්‍ර රුචියා අඤ්ඤත්‍ර අනුස්සවා අඤ්ඤත්‍ර ආකාරපරිවිතක්කා අඤ්ඤත්‍ර දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා අඤ්ඤං ව්‍යාකරොති : "ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, ාපරං ඉත්ථත්තායාති පජානාමී"ති.

## 1. 15. 9

## ඉන්ද්‍රියසම්පන්නසුත්තං

154. **සාවත්ථියං** —

අථ බො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො බො සො භික්ඛු භගවන්තං එතදවොච : ඉන්ද්‍රියසම්පන්නො ඉන්ද්‍රියසම්පන්නොති භන්තෙ, වුච්චති, කිත්තාවතා නු බො භන්තෙ, ඉන්ද්‍රියසම්පන්නො හොතීති ?

1. අයම්පි - සීමු, ස්‍යා.
2. අපිනුමෙ - මජසං.

මහණෙනි, මෙහි මහණ තෙමේ ඇසින් රූ දැක තමා තුළ ඇති රාග දෙස මෝහ මා තුළ රාග දෙස මෝහ ඇතැ යි දැනගනී ද, තමා තුළ නැති රාග දෙස මොහ මා තුළ රාග දෙස මෝහ නැතැ යි දැනගනී ද; මහණෙනි, මහණ තෙමේ ඇසින් රූ දැක තමා තුළ ඇත්තාවූ හෝ රාග දෙස මෝහ මා තුළ රාග දෙස මෝහ ඇතැ යි දැනගනී. තමා තුළ නැත්තාවූ හෝ රාග දෙස මොහ මා තුළ රාග දෙස මොහ නැතැ යි දැනගනී යන ඒ යමක් වේ නම් මහණෙනි, මේ දහම්හු ඇදහීමෙන් හෝ දතයුත්තාහු ද, රිසියෙන් හෝ දතයුත්තාහු ද ඇසීමෙන් හෝ දතයුත්තාහු ද, අයුරු සැලකීමෙන් හෝ දතයුත්තාහු ද, ලබ්ධි විසින් ගැනුමෙන් හෝ දතයුත්තාහු ද යි. වහන්ස, මෙය නො වේ ම ය. මහණෙනි, මේ දහම්හු නුවණින් දැක දත යුත්තාහු නො වෙද්ද? යි. වහන්ස, එසේය.

මහණෙනි, යම් කරුණකට පැමිණ මහණ තෙමේ ඇදහීමෙන් තොර ව ම ... ලබ්ධි විසින් ගැනීමෙන් තොර ව ම "ඉපැද්ම ගෙවිණ, බඹසර වැස නිමවන ලදි, කටයුතු කරන ලදි, මේ රහත්බව පිණිස අනෙකක් නැතැ යි දැනගනී" යි රහත්බව පළ කෙරේ නම් මේ ඒ කරුණ යි.

මහණෙනි, නැවත අනෙකක් ද කියමි: මහණ තෙමේ කනින් හඬ අසා ... නැහැයෙන් ගඳ ගෙන ... දිවෙන් රස විඳ ... කයින් පැහැසිය පැහැස ... මහණෙනි, නැවත අනෙකක් ද කියමි: මහණ තෙමේ සිතින් දහම් දැන තමා තුළ ඇති රාග දෙස මොහ මා තුළ රාග දෙස මොහ ඇතැ යි දැනගනී ද, තමා තුළ නැති රාග දෙස මෝහ මා තුළ රාග දෙස මෝහ නැතැ යි දැනගනී ද, මහණෙනි, මහණ තෙමේ සිතින් දහම් දැන තමා තුළ ඇත්තා වූ හෝ රාග දෙස මෝහ මා තුළ රාග දෙස මෝහ ඇතැ යි දැනගනී. තමා තුළ නැත්තා වූ හෝ රාග දෙස මෝහ මා තුළ රාග දෙස මෝහ නැතැ යි දැනගනී යන ඒ යමක් වේ නම් මහණෙනි, මේ දහම්හු ඇදහීමෙන් හෝ දත යුත්තාහු ද ... ලබ්ධි විසින් ගැනීමෙන් හෝ දත යුත්තාහු ද? යි. වහන්ස, මෙය නො වේ ම ය. මහණෙනි, මේ දහම්හු නුවණින් දැක දත යුත්තාහු නො වෙද්ද? යි. වහන්ස, එසේ ය.

මහණෙනි, යම් කරුණකට පැමිණ මහණ තෙමේ ඇදහීමෙන් තොර ව ම රිසියෙන් තොර ව ම ඇසීමෙන් තොර ව ම අයුරු සැලකීමෙන් තොර ව ම ලබ්ධි විසින් ගැනීමෙන් තොර ව ම "ඉපැද්ම ගෙවිණ, බඹසර වැස නිමවන ලදි, කටයුතු කරන ලදි, මේ රහත්බව පිණිස අනෙකක් නැතැ යි දැනගනී" යි රහත්බව පළ කෙරේ නම් මෙ ද ඒ කරුණ යි.

## 1. 15. 9

## ඉන්ද්‍රියසම්පන්න සූත්‍රය

**154. සැවැත්නුවර—**

එකල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. ... එකත්පස් ව හුන් ඒ මහණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: වහන්ස, ඉන්ද්‍රියසම්පන්න ය, ඉන්ද්‍රියසම්පන්න ය යි කියනු ලැබේ. වහන්ස, කෙතෙකින් ඉන්ද්‍රියසම්පන්න වේ ද? යි.

චක්ඛුන්ද්‍රියෙ චෙ භික්ඛු උදයබ්බයානුපස්සී[1] විහරන්තො චක්ඛුන්ද්‍රියෙ නිබ්බින්දති -පෙ- සොතින්ද්‍රියෙ -පෙ- ඝානින්ද්‍රියෙ -පෙ- ජිව්හින්ද්‍රියෙ -පෙ- කායින්ද්‍රියෙ -පෙ- මනින්ද්‍රියෙ චෙ භික්ඛු උදයව්‍යයානුපස්සී විහරන්තො මනින්ද්‍රියෙ නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති, විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති. එත්තාවතා ඛො භික්ඛු ඉන්ද්‍රියසම්පන්නො හොතීති.

## 1. 15. 10

## ධම්මකථිකසුත්තං

155. **සාවත්ථියං —**

අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච : ධම්මකථිකො ධම්මකථිකොති භන්තෙ වුච්චති, කිත්තාවතා නු ඛො භන්තෙ, ධම්මකථිකො හොතීති ?

චක්ඛුස්ස චෙ භික්ඛු නිබ්බිදාය විරාගාය නිරොධාය ධම්මං දෙසෙති, ධම්මකථිකො භික්ඛූති අලං වචනාය ; චක්ඛුස්ස චෙ භික්ඛු නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොති, ධම්මානුධම්මපටිපන්නො භික්ඛූති අලං වචනාය ; චක්ඛුස්ස චෙ භික්ඛු නිබ්බිදා විරාගා නිරොධා අනුපාද විමුත්තො හොති, දිට්ඨධම්මනිබ්බානප්පත්තො භික්ඛූති අලං වචනාය ;

සොතස්ස -පෙ- ඝානස්ස -පෙ- ජිව්හාය -පෙ- කායස්ස -පෙ- මනස්ස චෙ භික්ඛු නිබ්බිදාය විරාගාය නිරොධාය ධම්මං දෙසෙති, ධම්මකථිකො භික්ඛූති අලං වචනාය ; මනස්ස චෙ භික්ඛු නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොති, ධම්මානුධම්මපටිපන්නො භික්ඛූති අලං වචනාය ; මනස්ස චෙ භික්ඛු නිබ්බිදා විරාගා නිරොධා අනුපාදවිමුත්තො හොති, දිට්ඨධම්මනිබ්බානප්පත්තො භික්ඛූති අලං වචනායාති.

**නවපුරාණවග්ගො පඤ්චදසමො.**

**තත්‍රුද්දානං :**

කම්මං චත්තාරි සප්පායා අනන්තෙවාසිකිමත්ථියා
අත්ථි නු ඛො පරියායො ඉන්ද්‍රියකථිකෙන චාති

**තත්‍ර වග්ගුද්දානං :**

යොගක්ඛෙමඤ්ච ලොකඤ්ච ගහපති දෙවදහෙන ච
නවපුරාණෙන පඤ්ඤාසං තතියං තෙන වුච්චතීති.

**තතියො පණ්ණාසකො.**

---

1. උදයව්‍යයානුපස්සි - මජසං. සීමු

මහණ, ඉදින් චක්ඛුන්ද්‍රියයෙහි උදයව්‍යය අනු ව දකිමින් වෙසෙන්නේ චක්ඛුන්ද්‍රියයෙහි කලකිරේ ද ...සොතින්ද්‍රියයෙහි...ඝානින්ද්‍රියයෙහි...ජිව්හින්ද්‍රියයෙහි...කායින්ද්‍රියයෙහි...මහණ, ඉදින් මනින්ද්‍රියයෙහි උදයව්‍යය අනුව දකිමින් වෙසෙන්නේ මනින්ද්‍රියයෙහි කලකිරේ ද, කලකිරෙන්නේ නො ඇලෙයි. නො ඇලුම් හෙයින් මිදෙයි. මිදුණු කල්හි මිදුණේ යයි දැනීම වෙයි. ඉපැද්ම ගෙවිණ. බඹසර වැස නිමවන ලදි. කටයුතු කරන ලදි. මේ රහත්බව පිණිස අනෙකක් නැතැ යි දැනගනී. මහණ, මෙතෙකින් ඉන්ද්‍රියසම්පන්න වේ යි.

## 1. 15. 10

## ධම්මකථික සූත්‍රය

155. **සැවැත්නුවර —**

එකල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. ... එකත්පස් ව හුන් ඒ මහණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: වහන්ස ධම්මකථික ය, ධම්මකථික ය යි කියනු ලැබේ. වහන්ස, කෙතෙකින් ධම්මකථික වේ ද? යි.

මහණ, ඉදින් ඇසෙහි නිර්වෙදය පිණිස විරාගය පිණිස, නිරොධය පිණිස දහම් දෙසන්නේ නම් මහණ තෙමේ ධම්මකථික ය''යි කියන්නට සුදුසු ය. මහණ, ඉදින් ඇසෙහි නිර්වෙදය පිණිස විරාගය පිණිස නිරොධය පිණිස පිළිපන්නේ වේ නම් මහණ තෙමේ දහමට අනුලොම් පිළිවෙතෙහි පිළිපන්නේ යයි කියන්නට සුදුසු ය. මහණ, ඉදින් ඇසෙහි නිර්වෙදයෙන් විරාගයෙන් නිරොධයෙන් උපාදාන රහිත ව මිදුණේ වේ නම් මහණ තෙමේ දිටුදැමියෙහි නිවනට පැමිණියේ යයි කියන්නට සුදුසු ය.

කනෙහි... නැහැයෙහි ... දිවෙහි ... කයෙහි... මහණ, ඉදින් සිතෙහි නිර්වේදය පිණිස විරාගය පිණිස නිරෝධය පිණිස දහම් දෙසන්නේ නම් මහණ තෙමේ ධම්මකථික ය යි කියන්නට සුදුසු ය. මහණ, ඉදින් සිතෙහි නිර්වේදය පිණිස විරාගය පිණිස නිරෝධය පිණිස පිළිපන්නේ වේ නම් මහණ තෙමේ දහමට අනුලොම් පිළිවෙතෙහි පිළිපන්නේ යයි කියන්නට සුදුසු ය. මහණ, ඉදින් සිතෙහි නිර්වේදයෙන් විරාගයෙන් නිරෝධයෙන් උපාදාන රහිත ව මිදුණේ වේ නම් මහණ තෙමේ දිටුදැමියෙහි නිවන් පැමිණියේ යයි කියන්නට සුදුසු යයි.

**පසළොස් වැනි නවපුරාණ වර්ග යි.**

**එහි සූත්‍රනාමාවලිය:**

කම්ම සූත්‍රය, සප්පාය සූත්‍ර සතර ය, අන්තෙවාසි කිමත්ථිය සූත්‍ර දෙක ය, අත්ථිනුබොපරියාය සූත්‍රය, ඉන්ද්‍රියසම්පන්න ධම්මකථික සූත්‍ර දෙක ය යි සූත්‍ර දශයෙකි.

**එහි වර්ගනාමාවලිය:**

යොගක්ඛෙම, ලෝක වර්ග දෙකෙන් ද, ගහපති, දේවදහ වර්ග දෙකෙන් ද, ඒ නවපුරාණ වර්ගයෙන් ද තෙවන පණ්ණාසකය කියනු ලැබේ යි.

**තෙවන පණ්ණාසකය නිමි.**

# 16. නන්දික්ඛයවග්ගො

## 1. 16. 1

### අජ්ඣත්තනන්දික්ඛයඅනිච්චසුත්තං

156. **සාවත්ථියං—**

අනිච්චං යෙව භික්ඛවෙ භික්ඛු චක්ඛුං අනිච්චන්ති පස්සති. සාස්ස[1] හොති සම්මාදිට්ඨි, සම්මා පස්සං නිබ්බින්දති, නන්දික්ඛයා රාගක්ඛයො රාගක්ඛයා නන්දික්ඛයො නන්දිරාගක්ඛයා චිත්තං 'සුවිමුත්තන්ති' වුච්චති. අනිච්චං යෙව භික්ඛවෙ, භික්ඛු සොතං අනිච්චන්ති පස්සති -පෙ- ඝානං අනිච්චන්ති පස්සති -පෙ- ජිව්හං අනිච්චන්ති පස්සති -පෙ- කායං අනිච්චන්ති පස්සති -පෙ- අනිච්චං යෙව භික්ඛවෙ භික්ඛු මනං අනිච්චන්ති පස්සති සාස්ස හොති සම්මාදිට්ඨි, සම්මා පස්සං නිබ්බින්දති, නන්දික්ඛයා රාගක්ඛයො රාගක්ඛයා නන්දික්ඛයො නන්දිරාගක්ඛයා චිත්තං සුවිමුත්තන්ති වුච්චතීති.

## 1. 16. 2

### බහිද්ධානන්දික්ඛයඅනිච්චසුත්තං

157. අනිච්චෙයෙව භික්ඛවෙ භික්ඛු රූපෙ අනිච්චාති පස්සති, සාස්ස හොති සම්මාදිට්ඨි, සම්මා පස්සං නිබ්බින්දති, නන්දික්ඛයා රාගක්ඛයො රාගක්ඛයා නන්දික්ඛයො නන්දිරාගක්ඛයා චිත්තං සුවිමුත්තන්ති වුච්චති. අනිච්චෙයෙව භික්ඛවෙ භික්ඛු සද්දෙ -පෙ- ගන්ධෙ -පෙ- රසෙ -පෙ- ඵොට්ඨබ්බෙ -පෙ- ධම්මෙ අනිච්චාති පස්සති, සාස්ස හොති සම්මාදිට්ඨි, සම්මා පස්සං නිබ්බින්දති, නන්දික්ඛයා රාගක්ඛයො, රාගක්ඛයා නන්දික්ඛයො, නන්දිරාගක්ඛයා චිත්තං සුවිමුත්තන්ති වුච්චතීති.

## 1. 16. 3

### අජ්ඣත්තනන්දික්ඛයයොනිසොසුත්තං

158. චක්ඛුං භික්ඛවෙ යොනිසො මනසිකරොථ, චක්ඛුඅනිච්චතඤ්ච යථාභූතං සමනුපස්සථ, චක්ඛුං භික්ඛවෙ භික්ඛු යොනිසො මනසිකරොන්තො චක්ඛුඅනිච්චතඤ්ච යථාභූතං සමනුපස්සන්තො චක්ඛුස්මිම්පි නිබ්බින්දති, නන්දික්ඛයා රාගක්ඛයො, රාගක්ඛයා නන්දික්ඛයො නන්දිරාගක්ඛයා චිත්තං සුවිමුත්තන්ති වුච්චති.

---
1. සායං – මජසං PTS

# නන්දික්ඛය වර්ගය

## 1. 16. 1

## අජ්ඣත්තනන්දික්ඛය අනිච්ච සූත්‍රය

156. **සැවැත්නුවර —**

මහණෙනි, මහණ තෙමේ අනිත්‍යවූ ම ඇස අනිත්‍ය යැ යි දකී ද, ඒ ඔහුට සම්‍යග්දෘෂ්ටි වෙයි. මොනොවට දක්නේ කලකිරෙයි. නන්දිය ක්ෂය වීමෙන් රාගය ක්ෂය වෙයි. රාගය ක්ෂය වීමෙන් නන්දිය ක්ෂය වෙයි. නන්දිරාගය ක්ෂය වීමෙන් සිත මැනැවින් මිදුණේ යැ යි කියනු ලැබේ. මහණෙනි, මහණ තෙමේ අනිත්‍ය වූ ම ශ්‍රෝත්‍රය අනිත්‍ය යැ යි දකී ද ඝ්‍රාණය අනිත්‍ය යැ යි දකී ද දිව අනිත්‍ය යැ යි දකී ද කය අනිත්‍ය යැ යි දකී ද මහණෙනි, මහණ තෙමේ අනිත්‍ය වූ ම මනස අනිත්‍යයැ යි දකී ද ඒ ඔහුට සම්‍යග්දෘෂ්ටි වෙයි. මොනවට දක්නේ කලකිරෙයි. නන්දිය ක්ෂය වීමෙන් රාගය ක්ෂය වෙයි. රාගය ක්ෂය වීමෙන් නන්දිය ක්ෂය වෙයි. නන්දිරාගය ක්ෂය වීමෙන් සිත මැනැවින් මිදුණේ යැ යි කියනු ලැබේ.

## බහිද්ධානන්දික්ඛය අනිච්ච සූත්‍රය

## 1. 16. 2

157. මහණෙනි, මහණ අනිස වූ ම රූපයන් අනිස යැ යි දකියි. ඒ ඔහුට සම්‍යග්දෘෂ්ටි වෙයි. මැනැවින් දක්නේ කලකිරෙයි. නන්දිය ක්ෂය වීමෙන් රාගය ක්ෂය වෙයි. රාගය ක්ෂය වීමෙන් නන්දිය ක්ෂය වෙයි. නන්දිරාග දෙක ක්ෂය වීමෙන් සිත මැනැවින් මිදුණේ යැ යි කියනු ලැබේ. මහණෙනි, මහණ අනිස වූ ම සද ... ගඳ ... රස ... පහස් ... දහම් අනිසහ යි දකී නම් එය ඔහුගේ සම්මාදිට්ඨි වෙයි. මැනැවින් දක්නේ කලකිරෙයි. නන්දිය ක්ෂය වීමෙන් රාගය ක්ෂය වේ. රාගය ක්ෂය වීමෙන් නන්දිය ක්ෂය වේ. නන්දිරාග දෙක ක්ෂය වීමෙන් සිත මැනවින් මිදුණේ යයි කියනු ලැබේ.

## 1. 16. 3

## අජ්ඣත්ත නන්දික්ඛයයොනිසො සූත්‍රය

158. මහණෙනි, ඇස නුවණින් මෙනෙහි කරවූ, ඇස්හි අනිස් බව ද තතු සේ නුවණින් දකිවූ. මහණෙනි, මහණ ඇස නුවණින් මෙනෙහි කරන්නේ ඇස්හි අනිස් බව ද තතු සේ නුවණින් දක්නේ ඇසෙහිත් කලකිරෙයි. නන්දිය ක්ෂය වීමෙන් රාගය ක්ෂය වේ. රාගය ක්ෂය වීමෙන් නන්දිය ක්ෂය වේ. නන්දිරාගය ක්ෂය වීමෙන් සිත මැනැවින් මිදුණේ යයි කියනු ලැබේ.

සොතං භික්ඛවෙ යොනිසො මනසිකරොථ -පෙ- ඝානං භික්ඛවෙ යොනිසො මනසිකරොථ -පෙ- ජිව්හං භික්ඛවෙ යොනිසො මනසි කරොථ ජිව්හානිච්චතඤ්ච යථාභූතං සමනුපස්සථ, ජිව්හං භික්ඛවෙ භික්ඛු යොනිසො මනසිකරොන්තො ජිව්හානිච්චතඤ්ච යථාභූතං සමනුපස්සන්තො ජිව්හායපි නිබ්බින්දති -පෙ- චිත්තං සුවිමුත්තන්ති වුච්චති.

කායං භික්ඛවෙ යොනිසො මනසි කරොථ, -පෙ- මනං භික්ඛවෙ යොනිසො මනසි කරොථ, මනානිච්චතඤ්ච යථාභූතං සමනුපස්සථ, මනං භික්ඛවෙ භික්ඛු යොනිසො මනසිකරොන්තො මනානිච්චතඤ්ච යථාභූතං සමනුපස්සන්තො මනස්මිම්පි නිබ්බින්දති, නන්දික්ඛයා රාගක්ඛයො රාගක්ඛයා නන්දික්ඛයො නන්දිරාගක්ඛයා චිත්තං සුවිමුත්තන්ති වුච්චතීති.

## 1. 16. 4

## බහිද්ධා නන්දික්ඛයයොනිසොසුත්තං

159. සාවත්ථියං —

රූපෙ භික්ඛවෙ යොනිසො මනසිකරොථ, රූපානිච්චතඤ්ච යථාභූතං සමනුපස්සථ, රූපෙ භික්ඛවෙ භික්ඛු යොනිසො මනසිකරොන්තො රූපානිච්චතඤ්ච යථාභූතං සමනුපස්සන්තො රූපෙසු නිබ්බින්දති, නන්දික්ඛයා රාගක්ඛයො, රාගක්ඛයා නන්දික්ඛයො, නන්දිරාගක්ඛයා චිත්තං සුවිමුත්තන්ති වුච්චති.

සද්දෙ භික්ඛවෙ -පෙ- ගන්ධෙ භික්ඛවෙ -පෙ- රසෙ භික්ඛවෙ -පෙ- ඵොට්ඨබ්බෙ භික්ඛවෙ -පෙ- ධම්මෙ භික්ඛවෙ යොනිසො මනසි කරොථ, ධම්මානිච්චතඤ්ච යථාභූතං සමනුපස්සථ, ධම්මෙ භික්ඛවෙ භික්ඛු යොනිසො මනසිකරොන්තො ධම්මානිච්චතඤ්ච යථාභූතං සමනුපස්සන්තො ධම්මෙසු නිබ්බින්දති, නන්දික්ඛයා රාගක්ඛයො, රාගක්ඛයා නන්දික්ඛයො, නන්දිරාගක්ඛයා චිත්තං සුවිමුත්තන්ති වුච්චතීති.

## 1. 16. 5

## සමාධිසුත්තං

160. එකං සමයං භගවා **රාජගහෙ** විහරති **ජීවකම්බවනෙ**. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි 'භික්ඛවො'ති; භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං, භගවා එතදවොච: සමාධිං භික්ඛවෙ භාවෙථ, සමාහිතස්ස භික්ඛවෙ භික්ඛුනො යථාභූතං ඔක්ඛායති.[1] කිඤ්ච යථාභූතං ඔක්ඛායති:

1. ඔක්කායති - සයා.

මහණෙනි, කන නුවණින් මෙනෙහි කරවු ... මහණෙනි, නැහැය නුවණින් මෙනෙහි කරවු ... මහණෙනි, දිව නුවණින් මෙනෙහි කරවු. දිවහි අනිස්බව ද තතු සේ නුවණින් දකිවු. මහණෙනි, මහණ දිව නුවණින් මෙනෙහි කරන්නේ දිවහි අනිස්බව ද තතු සේ නුවණින් දක්නේ දිවහිත් කලකිරෙයි ... සිත මැනැවින් මිදුණේ ය යි කියනු ලැබේ.

මහණෙනි, කය නුවණින් මෙනෙහි කරවු ... මහණෙනි, සිත නුවණින් මෙනෙහි කරවු. සිත්හි අනිස බව ද තතු සේ නුවණින් දකිවු. මහණෙනි, මහණ සිත නුවණින් මෙනෙහි කරන්නේ සිත්හි අනිස්බව ද තතු සේ නුවණින් දක්නේ සිතෙහිත් කලකිරෙයි. නන්දිය ක්ෂය වීමෙන් රාගය ක්ෂය වේ. රාගය ක්ෂය වීමෙන් නන්දිය ක්ෂය වේ නන්දිරාගය ක්ෂය වීමෙන් සිත මැනැවින් මිදුණේ ය යි කියනු ලැබේ.

## 1. 16. 4

## බාහිර නන්දික්ඛයයොනිසො සූත්‍රය

159. **සැවැත්නුවර** —

මහණෙනි, රූපය නුවණින් මෙනෙහි කරවු. රූපයෙහි අනිස්බව ද තතු සේ නුවණින් දකිවු. මහණෙනි, මහණ රූපය නුවණින් මෙනෙහි කරන්නේ රූපයෙහි අනිස්බව ද තතුසේ නුවණින් දක්නේ රූපයෙහි කලකිරෙයි. නන්දිය ක්ෂය වීමෙන් රාගය ක්ෂය වේ. රාගය ක්ෂය වීමෙන් නන්දිය ක්ෂය වේ. නන්දිරාගය ක්ෂය වීමෙන් සිත මැනැවින් මිදුණේ ය යි කියනු ලැබේ.

මහණෙනි, සද ... මහණෙනි, ගඳ ... මහණෙනි රස ... මහණෙනි, පහස්... මහණෙනි, දහම් නුවණින් මෙනෙහි කරවු. දහම්හි අනිස්-බව ද තතු සේ නුවණින් දකිවු. මහණෙනි, මහණ දහම් නුවණින් මෙනෙහි කරන්නේ දහම්හි අනිස්බව ද තතු සේ නුවණින් දක්නේ දහම්හි කලකිරෙයි. නන්දිය ක්ෂය වීමෙන් රාගය ක්ෂය වේ. රාගය ක්ෂය වීමෙන් නන්දිය ක්ෂය වේ. නන්දිරාගය ක්ෂය වීමෙන් සිත මැනැවින් මිදුණේ ය යි කියනු ලැබේ.

## 1. 16. 5

## සමාධි සූත්‍රය

160. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **රජගහ** නුවර සමීපයෙහි **ජීවක** අඹවෙනෙහි වැඩවසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ මහණෙනි යි භික්ෂූන් ඇමතූ සේක. වහන්සැ යි ඒ භික්ෂූහු භාග්‍ය-වතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළ සේක: මහණෙනි, සමාධිය වඩවු. මහණෙනි, සමාහිත මහණහට තතු සේ වැටහෙයි. කිමෙක් තතු සේ වැටහේ ද යත්:

චක්ඛුං අනිච්චන්ති යථාභූතං ඔක්ඛායති, රූපා අනිච්චාති යථාභූතං ඔක්ඛායති, චක්ඛුවිඤ්ඤාණං අනිච්චන්ති යථාභූතං ඔක්ඛායති, චක්ඛු-සම්ඵස්සො අනිච්චොති යථාභූතං ඔක්ඛායති, යම්පිදං චක්ඛුසම්ඵස්ස-පච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චන්ති යථාභූතං ඔක්ඛායති; සොතං -පෙ- ඝානං -පෙ- ජිව්හා -පෙ- කායො -පෙ- මනො අනිච්චොති යථාභූතං ඔක්ඛායති, ධම්මා අනිච්චාති යථාභූතං ඔක්ඛායති, මනොවිඤ්ඤාණං අනිච්චන්ති යථාභූතං ඔක්ඛායති, මනොසම්ඵස්සො අනිච්චොති යථාභූතං ඔක්ඛායති, යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චන්ති යථාභූතං ඔක්ඛායති. සමාධිං භික්ඛවෙ භාවෙථ, සමාහිතස්ස භික්ඛවෙ භික්ඛුනො යථාභූතං ඔක්ඛායතීති.

## 1. 16. 6

## පටිසල්ලානසුත්තං

161. එකං සමයං භගවා **රාජගහෙ** විහරති **ජීවකම්බවනෙ**, තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි 'භික්ඛවො'ති -පෙ- පටිසල්ලානෙ භික්ඛවෙ යොගමාපජ්ජථ පතිසල්ලීනස්ස භික්ඛවෙ භික්ඛුනො යථාභූතං ඔක්ඛායති[1] කිඤ්ච යථාභූතං ඔක්ඛායති:

චක්ඛුං අනිච්චන්ති යථාභූතං ඔක්ඛායති, රූපා අනිච්චාති යථාභූතං ඔක්ඛායති, චක්ඛුවිඤ්ඤාණං අනිච්චන්ති යථාභූතං ඔක්ඛායති, චක්ඛු-සම්ඵස්සො අනිච්චොති යථාභූතං ඔක්ඛායති, යම්පිදං චක්ඛුසම්ඵස්ස-පච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චන්ති යථාභූතං ඔක්ඛායති.

සොතං -පෙ- ඝානං -පෙ- ජිව්හා -පෙ- කායො -පෙ- මනො අනිච්චොති යථාභූතං ඔක්ඛායති, ධම්මා අනිච්චාති යථාභූතං ඔක්ඛායති, මනොවිඤ්ඤාණං අනිච්චන්ති යථාභූතං ඔක්ඛායති, මනොසම්ඵස්සො අනිච්චොති යථාභූතං ඔක්ඛායති, යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චන්ති යථාභූතං ඔක්ඛායති, පටිසල්ලානෙ භික්ඛවෙ යොගමාපජ්ජථ, පටිසල්ලීනස්ස භික්ඛවෙ භික්ඛුනො යථාභූතං ඔක්ඛායතීති.

## 1. 16. 7

## කොට්ඨිතඅනිච්චසුත්තං

162. අථ ඛො ආයස්මා **මහාකොට්ඨිතො** යෙන භගවා තෙනුප-සඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො ආයස්මා මහාකොට්ඨිතො භගවන්තං එතදවොච: සාධු මෙ භන්තෙ, භගවා සඞ්ඛිත්තෙන ධම්මං දෙසෙතු යමහං භගවතො ධම්මං සුත්වා එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරෙය්‍යන්ති.

---

1. පක්ඛායති - සී 1. පච්චක්ඛායති - සී 2

ඇස අනිසැ යි තතු සේ වැටහෙයි. රූ අනිසහ යි තතු සේ වැටහෙයි. චක්ෂුර්විඥානය අනිසැ යි තතු සේ වැටහෙයි. ඇස්පහස අනිසැ යි තතු සේ වැටහේ. ඇස්පහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී ද, හෙ ද අනිසැ යි තතු සේ වැටහේ. කන ... නැහැය ... දිව ... කය ... සිත අනිසැ යි තතු සේ වැටහේ. දහම් අනිසහ යි තතු සේ වැටහේ. මනෝවිඤ්ඤාණය අනිසැ යි තතු සේ වැටහේ. මනපහස අනිසැ යි තතු සේ වැටහේ. මනපහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් හෙ ද, අනිසැ යි තතු සේ වැටහේ. මහණෙනි, සමාධිය වඩවු. මහණෙනි සමාහිත මහණහට තතු සේ වැටහේ යි.

## 1. 16. 6

## පටිසල්ලාන සූත්‍රය

161. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර සමීපයෙහි ජීවක අඹවෙනෙහි වැඩවසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ මහණෙනි යි භික්ෂූන් ඇමතූ සේක ... මහණෙනි, විවේකයෙහි යෙදීමට පැමිණෙවු. මහණෙනි, විවේකයෙන් යුත් මහණහට තතු සේ පෙනෙයි. කිමෙක් තතු සේ පෙනේ ද යත්:

ඇස අනිසැ යි තතු සේ පෙනෙයි. රූප අනිසහ යි තතු සේ පෙනෙයි. චක්ෂුර්විඥානය අනිසැ යි තතු සේ පෙනෙයි. ඇස්පහස අනිසැ යි තතු සේ පෙනෙයි. ඇස්පහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් හෙ ද අනිසැ යි තතු සේ පෙනෙයි.

කන ... නැහැය ... දිව ... කය ... සිත අනිසැ යි තතුසේ පෙනේ. දහම් අනිසහ යි තතුසේ පෙනෙයි. මනෝවිඤ්ඤාණය අනිසැ යි තතුසේ පෙනෙයි. මනපහස අනිසැ යි තතුසේ පෙනෙයි. මනපහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් හෙ ද අනිසැ යි තතුසේ පෙනෙයි. මහණෙනි, විවේකයෙහි යෙදීමට පැමිණෙවු. මහණෙනි, විවේකයෙන් යුත් මහණහට තත්වූ පරිද්දෙන් පෙනේ යි.

## 1. 16. 7

## කොට්ඨිත අනිච්ච සූත්‍රය

162. එකල්හි ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ: වහන්ස, ආයාචනා කරමි. මම භාග්‍යවතුන් වහන්සේගේ යම් දහමක් අසා එකලා ව ගණයා කෙරෙන් වෙන් වූයෙම් නො පමා ව කෙලෙස් තවන වැර ඇතියෙම් නිවන් පිණිස මෙහෙයූ සිත් ඇතියෙම් වෙසෙම් නම් භාග්‍යවතුන් වහන්සේ එබඳු දහමක් මට සැකෙවින් දේසනා කරන සේක්වා යි.

යං ඛො කොට්ඨිත අනිච්චං, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො; කිඤ්ච කොට්ඨිත අනිච්චං, චක්ඛුං ඛො කොට්ඨිත අනිච්චං, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො. රූපා අනිච්චා, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො. චක්ඛුවිඤ්ඤාණං අනිච්චං තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො. චක්ඛුසම්ඵස්සො අනිච්චො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො. යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චං, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො.

සොතං -පෙ- ඝානං -පෙ- ජිව්හා අනිච්චා, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො. රසා අනිච්චා -පෙ- ජිව්හාවිඤ්ඤාණං -පෙ- ජිව්හාසම්ඵස්සො -පෙ- යම්පිදං ජිව්හාසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චං, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො.

කායො -පෙ- මනො අනිච්චො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො; ධම්මා අනිච්චා -පෙ- මනොවිඤ්ඤාණං අනිච්චං -පෙ- මනොසම්ඵස්සො අනිච්චො -පෙ- යම්පිදං මනොසම්ඵස්ස පච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චං, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො. යං ඛො කොට්ඨිත, අනිච්චං, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බොති.

## 1. 16. 8.

## කොට්ඨිත දුක්ඛ සුත්තං

163. සාවත්ථියං —

එකමන්තං නිසින්නො ඛො ආයස්මා මහාකොට්ඨිතො භගවන්තං එතදවොච: සාධු මෙ භන්තෙ භගවා සංඛිත්තෙන ධම්මං දෙසෙතු යමහං භගවතො ධම්මං සුත්වා -පෙ- විහරෙය්‍යන්ති. යං ඛො කොට්ඨිත දුක්ඛං, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො. කිඤ්ච කොට්ඨිත, දුක්ඛං: චක්ඛුං ඛො කොට්ඨිත දුක්ඛං. තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො. රූපා දුක්ඛා, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො; චක්ඛුවිඤ්ඤාණං දුක්ඛං තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො. චක්ඛුසම්ඵස්සො දුක්ඛො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො. යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි දුක්ඛං, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො;

කොට්ඨිතයෙනි, යමෙක් අනිස වේ නම් එහි ලා තොපගේ ඡන්දය පහකටයුත්තේ ය. කොට්ඨිතයෙනි, කිමෙක් අනිස වේ ද යත්: කොට්ඨිතයෙනි, ඇස අනිස ය, එහි ලා තොපගේ ඡන්දය පහකටයුත්තේ ය. රූප අනිස ය, එහි ලා තොපගේ ඡන්දය පහකටයුත්තේ ය. චක්ෂුර්විඥානය අනිස ය, එහි ලා තොපගේ ඡන්දය පහකටයුත්තේ ය. ඇස්පහස අනිස ය, එහි ලා තොපගේ ඡන්දය පහකටයුත්තේ ය. ඇස්පහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ වෙදනායෙක් උපදී නම් හෙ ද අනිස ය, එහි ලා තොපගේ ඡන්දය පහකටයුත්තේ ය.

කන ... නැහැය ... දිව අනිස ය, එහි ලා තොපගේ ඡන්‍දය පහකටයුත්තේ ය. රස අනිස ය ... ජිහ්වාවිඥානය ... ජිහ්වාසංස්පර්ශය ... දිව්පහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ වේදනායෙක් උපදී නම් හෙ ද අනිස ය, එහි ලා තොපගේ ඡන්දය පහකටයුත්තේ ය.

කය... සිත අනිස ය, එහි ලා තොපගේ ඡන්දය පහකට-යුත්තේ ය. දහම් අනිස ය ... මනෝවිඤ්ඤාණය අනිස ය ... මනපහස අනිස ය... මනපහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ වේදනායෙක් උපදී නම් හෙ ද අනිස ය, එහිලා තොපගේ ඡන්දය පහකටයුත්තේ ය. කොට්ඨිතයෙනි, යමෙක් අනිස වේ නම් එහි ලා තොපගේ ඡන්‍දය පහකටයුත්තේ ය.

## 1. 16. 8

## කොට්ඨිතදුක්ඛ සූත්‍රය

163. **සැවැත්නුවර —**

එකත්පස් ව හුන් ආයුෂ්මත් **මහාකොට්ඨිත** තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකළහ: වහන්ස, ආයාචනා කරමි. ‘‘මම භාග්‍යවතුන් වහන්සේගේ යම් දහමක් අසා... වෙසෙන්නෙම් නම් භාග්‍යවතුන් වහන්සේ එබඳු දහමක් මට සැකෙවින් දේශනා කරන සේක්වා’’ යි. කොට්ඨිතයෙනි, යමෙක් දුක් වේ නම් එහි ලා තොපගේ ඡන්දය පහකටයුත්තේ ය. කොට්ඨිත, කිමෙක් දුක් වේ ද යත්: කොට්ඨිතයෙනි, ඇස දුක් ය. එහි ලා තොපගේ ඡන්‍දය පහ කටයුත්තේ ය. රූපයෝ දුක්ය, එහි ලා තොපගේ ඡන්දය පහ කටයුත්තේ ය. චක්ෂුර්විඥානය දුක් ය, එහි ලා තොපගේ ඡන්දය පහකටයුත්තේ ය. ඇස්පහස දුක් ය, එහි ලා තොපගේ ඡන්දය පහකටයුත්තේ ය. ඇස්පහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ වේදනායෙක් උපදී නම් හෙ ද දුක් ය, එහි ලා තොපගේ ඡන්දය පහකටයුත්තේ ය.

සොතං දුක්ඛං –පෙ– ඝානං දුක්ඛං –පෙ– ජිව්හා දුක්ඛා –පෙ– කායො දුක්ඛො –පෙ– මනො දුක්ඛො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො. ධම්මා දුක්ඛා –පෙ– මනොවිඤ්ඤාණං දුක්ඛං –පෙ– මනොසම්ඵස්සො දුක්ඛො –පෙ– යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි දුක්ඛං, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො. යං ඛො කොට්ඨිත දුක්ඛං, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බොති.

## 1. 16. 9

## කොට්ඨිතඅනත්තසුත්තං

164. **සාවත්ථියං** —

එකමන්තං නිසින්නො ඛො ආයස්මා මහාකොට්ඨිතො භගවන්තං එතදවොච: සාධු මෙ භන්තෙ භගවා සංඛිත්තෙන ධම්මං දෙසෙතු යමහං භගවතො ධම්මං සුත්වා –පෙ– විහරෙය්‍යන්ති. යො ඛො කොට්ඨිත අනත්තා, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො. කො ච කොට්ඨිත අනත්තා: චක්ඛුං ඛො කොට්ඨිත අනත්තා, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො. රූපා අනත්තා, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො. චක්ඛුවිඤ්ඤාණං අනත්තා, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො. චක්ඛුසම්ඵස්සො අනත්තා, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො. යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනත්තා, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො.

සොතං –පෙ– ඝානං –පෙ– ජිව්හා –පෙ– කායො –පෙ– මනො අනත්තා, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො. ධම්මා අනත්තා –පෙ– මනොවිඤ්ඤාණං අනත්තා –පෙ– මනොසම්ඵස්සො අනත්තා –පෙ– යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනත්තා, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො. යො ඛො කොට්ඨිත අනත්තා, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බොති.

## 1. 16. 10

## මිච්ඡාදිට්ඨිපහානසුත්තං

165. අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: කථන්නු ඛො භන්තෙ ජානතො කථං පස්සතො මිච්ඡාදිට්ඨි පහීයතීති?

කන දුක් ය... නැහැය දුක් ය... දිව දුක් ය... කය දුක් ය... සිත දුක් ය එහි ලා තොපගේ ඡන්දය පහකටයුත්තේ ය. දහම් දුක් ය... මනෝවිඥානය දුක් ය... මනපහස දුක් ය.... මනපහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් හෙ ද දුක් ය. එහි ලා තොපගේ ඡන්දය පහකට යුත්තේ ය. කොට්ඨිතයෙනි, යමෙක් දුක් වේ නම් එහි ලා තොපගේ ඡන්දය පහකටයුත්තේ ය.

## 1. 16. 9

## කොට්ඨිත අනත්ත සූත්‍රය

164. **සැවැත්නුවර —**

එකත්පස් ව හුන් ආයුෂ්මත් **මහාකොට්ඨිත** තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙල සැලකළහ: වහන්ස, ආයාචනා කරමි. ''මම භාග්‍යවතුන් වහන්සේගේ යම් දහමක් අසා... වෙසෙම් නම් භාග්‍යවතුන් වහන්සේ එබඳු දහමක් මට සැකෙවින් දේශනා කරන සේක්වා'' යි. කොට්ඨීතයෙනි, යමෙක් අනත් වේ නම් එහි ලා තොපගේ ඡන්දය පහකට යුත්තේ ය. කොට්ඨීතයෙනි, කිමෙක් අනත් වේ ද යත්: කොට්ඨීතයෙනි, ඇස අනත් ය. එහි ලා තොපගේ ඡන්දය පහකට යුත්තේ ය. රූප අනත් ය. එහි ලා තොපගේ ඡන්දය පහකට යුත්තේ ය. චක්ඛුර්විඥානය අනත් ය. එහි ලා තොපගේ ඡන්දය පහකටයුත්තේ ය, ඇස්පහස අනත් ය. එහි ලා තොපගේ ඡන්දය පහකටයුත්තේ ය. ඇස්පහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ වේදනායෙක් උපදී නම් හෙ ද අනත් ස. එහි ලා තොපගේ ඡන්දය පහකටයුත්තේ ය.

කන ... නැහැය ... දිව ... කය ... සිත අනත් ය. එහි ලා තොපගේ ඡන්දය පහකටයුත්තේ ය. දහම් අනත් ය ... මනෝවිඥානය අනත් ය ... මනපහස අනත් ය. ... මනපහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මෙ වේදනායෙක් උපදී නම් හෙ ද අනත් ය. එහි ලා තොපගේ ඡන්දය පහකටයුත්තේ ය. කොට්ඨිතයෙනි, යමෙක් අනත් වේ නම් එහි ලා තොපගේ ඡන්දය පහකට යුත්තේ යි.

## 1. 16 10

## මිච්ඡාදිට්ඨිප්පහාන සූත්‍රය

165. එකල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ එකත්පස් ව හුන්නේ ය. එකත්පස් ව හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙල සැලකෙළේ ය: වහන්ස, කෙසේ දන්නහුගේ කෙසේ දක්නහුගේ මිසදිටු ප්‍රහීණ වේ ද යි.

චක්ඛුං ඛො භික්ඛු අනිච්චතො ජානතො පස්සතො මිච්ඡාදිට්ඨි පහීයති, රූපෙ අනිච්චතො ජානතො පස්සතො මිච්ඡාදිට්ඨි පහීයති, චක්ඛුවිඤ්ඤාණං අනිච්චතො ජානතො පස්සතො මිච්ඡාදිට්ඨි පහීයති, චක්ඛුසම්ඵස්සං අනිච්චතො ජානතො පස්සතො මිච්ඡාදිට්ඨි පහීයති, යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චතො ජානතො පස්සතො මිච්ඡාදිට්ඨි පහීයති,

සොතං අනිච්චතො -පෙ- ඝානං -පෙ- ජිව්හං -පෙ- කායං -පෙ- මනං අනිච්චතො ජානතො පස්සතො මිච්ඡාදිට්ඨි පහීයති, ධම්මෙ අනිච්චතො -පෙ- මනොවිඤ්ඤාණං -පෙ- මනොසම්ඵස්සං -පෙ- යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තම්පි අනිච්චතො ජානතො පස්සතො මිච්ඡාදිට්ඨි පහීයති. එවං ඛො භික්ඛු ජානතො එවං පස්සතො මිච්ඡාදිට්ඨි පහීයතීති.

## 1. 16. 11

## සක්කායදිට්ඨිපහානසුත්තං

166. සාවත්ථියං —

එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: කථන්නු ඛො භන්තෙ ජානතො කථං පස්සතො සක්කායදිට්ඨි පහීයතීති?

චක්ඛුං ඛො භික්ඛු දුක්ඛතො ජානතො පස්සතො සක්කායදිට්ඨි පහීයති, රූපෙ දුක්ඛතො ජානතො පස්සතො සක්කායදිට්ඨි පහීයති, චක්ඛුවිඤ්ඤාණං දුක්ඛතො ජානතො පස්සතො සක්කායදිට්ඨි පහීයති, චක්ඛුසම්ඵස්සං දුක්ඛතො ජානතො පස්සතො සක්කායදිට්ඨි පහීයති, යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි දුක්ඛතො ජානතො පස්සතො සක්කායදිට්ඨි පහීයති.

සොතං -පෙ- ඝානං -පෙ- ජිව්හං -පෙ- කායං -පෙ- මනං දුක්ඛතො ජානතො පස්සතො සක්කායදිට්ඨි පහීයති, ධම්මෙ දුක්ඛතො ජානතො පස්සතො සක්කායදිට්ඨි පහීයති. මනොවිඤ්ඤාණං දුක්ඛතො ජානතො පස්සතො සක්කායදිට්ඨි පහීයති, මනොසම්ඵස්සං දුක්ඛතො ජානතො පස්සතො සක්කායදිට්ඨි පහීයති, යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි දුක්ඛතො ජානතො පස්සතො සක්කායදිට්ඨි පහීයති. එවං ඛො භික්ඛු ජානතො එවං පස්සතො සක්කායදිට්ඨි පහීයති.

මහණ, ඇස අනිස විසින් දන්නහුගේ දක්නහුගේ මිසදිටුව ප්‍රහීණ වේ. රූප අනිස විසින් දන්නහුගේ දක්නහුගේ මිසදිටුව ප්‍රහීණ වේ. චක්ෂුර්විඥානය අනිස විසින් දන්නහුගේ දක්නහුගේ මිසදිටුව ප්‍රහීණ වේ. ඇස්පහස අනිස විසින් දන්නහුගේ දක්නහුගේ මිසදිටුව ප්‍රහීණ වේ. ඇස්පහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ වේදනායෙක් උපදී නම් හෙ ද අනිස විසින් දන්නහුගේ දක්නහුගේ මිසදිටුව ප්‍රහීණ වේ.

කන අනිස විසින්... නැහැය... දිව... කය... සිත අනිස විසින් දන්නහුගේ දක්නහුගේ මිසදිටුව ප්‍රහීණ වේ. දහම් අනිස විසින්... මනොවිඤ්ඤාණය... මනපහස... මනපහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ වේදනායෙක් උපදී නම් හෙ ද අනිස විසින් දන්නහුගේ දක්නහුගේ මිසදිටුව ප්‍රහීණ වේ. මහණ මෙසේ දන්නහුගේ මෙසේ දක්නහුගේ මිසදිටුව ප්‍රහීණ වේ ය යි.

## 1. 16. 11

## සක්කායදිට්ඨිප්පහාන සූත්‍රය

166. **සැවැත්නුවර—**

එකක්පස් ව හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙල සැලකළේ ය: වහන්ස, කෙසේ දන්නහුගේ කෙසේ දක්නහුගේ සත්කායදෘෂ්ටිය ප්‍රහීණ වේ ද? යි.

මහණ. ඇස දුක් විසින් දන්නහුගේ දක්නහුගේ සත්කායදෘෂ්ටිය ප්‍රහීණ වේ. රූ දුක් විසින් දන්නහුගේ දක්නහුගේ සත්කායදෘෂ්ටිය ප්‍රහීණ වේ. චක්ෂුර්විඥානය දුක් විසින් දන්නහුගේ දක්නහුගේ සත්කායදෘෂ්ටිය ප්‍රහීණ වේ. ඇස්පහස දුක් විසින් දන්නහුගේ දක්නහුගේ සත්කායදෘෂ්ටිය ප්‍රහීණ වේ. ඇස්පහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ වේදනායෙක් උපදී නම් හෙ ද දුක් විසින් දන්නහුගේ දක්නහුගේ සත්කායදෘෂ්ටිය ප්‍රහීණ වේ.

කන ... නැහැය ... දිව ... කය ... සිත දුක් විසින් දන්නහුගේ දක්නහුගේ සත්කායදෘෂ්ටිය ප්‍රහීණ වේ. දහම් දුක් විසින් දන්නහුගේ දක්නහුගේ සත්කායදෘෂ්ටිය ප්‍රහීණ වේ. මනොවිඥානය දුක් විසින් දන්නහුගේ දක්නහුගේ සත්කායදෘෂ්ටිය ප්‍රහීණ වේ. මනොසම්ඵස්සය දුක් විසින් දන්නහුගේ දක්නහුගේ සත්කායදෘෂ්ටිය ප්‍රහීණ වේ. මනොසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හො නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් හෙ ද දුක් විසින් දන්නහුගේ දක්නහුගේ සත්කායදෘෂ්ටිය ප්‍රහීණ වේ. මහණ, මෙසේ දන්නහුගේ මෙසේ දක්නහුගේ සත්කායදෘෂ්ටිය ප්‍රහීණ වේ යි.

## 1. 16. 12

## අත්තානුදිට්ඨිප්පහානසුත්තං

167. **සාවත්ථියං —**

එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතද වොච: කථන්නුඛො භන්තෙ ජානතො කථං පස්සතො අත්තානුදිට්ඨි පහීයතීති?

චක්ඛුං ඛො භික්ඛු අනත්තතො ජානතො පස්සතො අත්තානුදිට්ඨි පහීයති, රූපෙ අනත්තතො ජානතො පස්සතො අත්තානුදිට්ඨි පහීයති, චක්ඛුවිඤ්ඤාණං අනත්තතො ජානතො පස්සතො අත්තානුදිට්ඨි පහීයති, චක්ඛුසම්ඵස්සං අනත්තතො ජානතො පස්සතො අත්තානුදිට්ඨි පහීයති, යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තම්පි අනත්තතො ජානතො පස්සතො අත්තානුදිට්ඨි පහීයති.

සොතං -පෙ- ඝානං - පෙ - ජිව්හං -පෙ- කායං -පෙ- මනං අනත්තතො ජානතො පස්සතො අත්තානුදිට්ඨි පහීයති, ධම්මෙ අනත්තතො -පෙ- මනොවිඤ්ඤාණං අනත්තතො -පෙ- මනොසම්ඵස්සං අනත්තතො -පෙ- යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනත්තතො ජානතො පස්සතො අත්තානුදිට්ඨි පහීයති. එවං ඛො භික්ඛු ජානතො එවං පස්සතො අත්තානුදිට්ඨි පහීයතීති.

**නන්දික්ඛය වග්ගො සොළසමො.**

**තත්‍රුද්දානං:**

නන්දික්ඛයෙන චත්තාරො - ජීවකම්බවනෙ දුවෙ
කොට්ඨිතෙන තයො වුත්තා - මිච්ඡාසක්කාය අත්තනොති.

## 1. 16. 12

## අත්තානුදිට්ඨිප්පහාන සූත්‍රය

167 සැවැත්නුවර —

එකත්පස් ව හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: වහන්ස, කෙසේ දන්නහුගේ කෙසේ දක්නහුගේ ආත්මානුදෘෂ්ටිය ප්‍රහීණ වේ ද? යත්:

මහණ, ඇස අනාත්ම විසින් දන්නහුගේ දක්නහුගේ ආත්මානුදෘෂ්ටිය ප්‍රහීණ වේ. රූපයන් අනාත්ම විසින් දන්නහුගේ දක්නහුගේ ආත්මානුදෘෂ්ටිය ප්‍රහීණ වේ. චක්ෂුර්විඥානය අනාත්ම විසින් දන්නහුගේ දක්නහුගේ ආත්මානුදෘෂ්ටිය ප්‍රහීණ වේ. චක්ඛුසම්ඵස්සය අනාත්ම විසින් දන්නහුගේ දක්නහුගේ ආත්මානුදෘෂ්ටිය ප්‍රහීණ වේ. චක්ඛුසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ යම් මේ විඳුමෙක් වේදනායෙක් උපදී නම් එද අනාත්ම විසින් දන්නහුගේ දක්නහුගේ ආත්මානුදෘෂ්ටිය ප්‍රහීණ වේ.

කන ... නැහැය ... දිව ... කය ... සිත අනාත්ම විසින් දන්නහුගේ දක්නහුගේ ආත්මානුදෘෂ්ටිය ප්‍රහීණ වේ. දහම් අනාත්ම විසින් ... මනෝවිඥානය අනාත්ම විසින් ... මනෝසම්ඵස්සය අනත් විසින් ... මනෝසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ වේදනායෙක් උපදී නම් එද අනාත්ම විසින් දන්නහුගේ දක්නහුගේ ආත්මානුදෘෂ්ටිය ප්‍රහීණ වේ. මහණ, මෙසේ දන්නහුගේ මෙසේ දක්නහුගේ ආත්මානුදෘෂ්ටිය ප්‍රහීණ වේ යි.

**සොළොස්වැනි නන්දික්ඛය වර්ග යි.**

**එහි සූත්‍ර නාමාවලිය:**

නන්දික්ඛය නමින් සතරෙක් ද, ජීවකම්බවනයෙහි දෙකෙක් ද, කොට්ඨිත නමින් තුනෙක් ද, මිච්ඡාදිට්ඨිප්පහාන, සක්කායදිට්ඨිප්පහාන, අත්තානුදිට්ඨිප්පහාන යි තුනෙක් ද යි මෙසේ සූත්‍ර දෙළොසෙක් වදරන ලදි.

# 17. සට්ඨිපෙය්‍යාලො

## 1. 17. 1

### අනිච්චඡන්දසුත්තං

168. සාවත්ථියං —

යං භික්ඛවෙ අනිච්චං, තත්‍ර වො ඡන්දො පහාතබ්බො. කිඤ්ච භික්ඛවෙ අනිච්චං: චක්ඛුං භික්ඛවෙ අනිච්චං, තත්‍ර වො[1] ඡන්දො පහාතබ්බො. සොතං අනිච්චං -පෙ- ඝානං අනිච්චං -පෙ- ජිව්හා අනිච්චා -පෙ- කායො අනිච්චො -පෙ- මනො අනිච්චො, තත්‍ර වො ඡන්දො පහාතබ්බො. යං භික්ඛවෙ අනිච්චං, තත්‍ර වො ඡන්දො පහාතබ්බොති.

## 1. 17. 2

### අනිච්චරාගසුත්තං

169. යං භික්ඛවෙ අනිච්චං, තත්‍ර වො රාගො පහාතබ්බො. කිඤ්ච භික්ඛවෙ අනිච්චං චක්ඛුං භික්ඛවෙ අනිච්චං, තත්‍ර වො රාගො පහාතබ්බො. සොතං අනිච්චං -පෙ- ඝානං අනිච්චං -පෙ- ජිව්හා අනිච්චා -පෙ- කායො අනිච්චො -පෙ- මනො අනිච්චො, තත්‍ර වො රාගො පහාකබ්බො. යං භික්ඛවෙ අනිච්චං, තත්‍ර වො රාගො පහාතබ්බොති.

## 1. 17. 3

### අනිච්ච ඡන්දරාගසුත්තං

170. යං භික්ඛවෙ අනිච්චං, තත්‍ර වො ඡන්දරාගො පහාතබ්බො. කිඤ්ච භික්ඛවෙ අනිච්චං: චක්ඛුං භික්ඛවෙ අනිච්චං, තත්‍ර වො ඡන්දරාගො පහාතබ්බො. සොතං අනිච්චං -පෙ- ඝානං අනිච්චං -පෙ- ජිව්හා අනිච්චා -පෙ- කායො අනිච්චො -පෙ- මනො අනිච්චො, තත්‍ර වො ඡන්දරාගො පහාතබ්බො. යං භික්ඛවෙ අනිච්චං, තත්‍ර වො ඡන්දරාගො පහාතබ්බොති.

## 1. 17. 4 – 6

### දුක්ඛඡන්ද-දුක්ඛරාග-දුක්ඛඡන්දරාගසුත්තානි

171-173. යං භික්ඛවෙ දුක්ඛං, තත්‍ර වො ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. කිඤ්ච භික්ඛවෙ දුක්ඛං: චක්ඛුං භික්ඛවෙ දුක්ඛං තත්‍ර වො ඡන්දො පහාතබ්බො රාගො පහාතබ්බො ඡන්දරාගො පහාතබ්බො. සොතං දුක්ඛං -පෙ- ඝානං දුක්ඛං -පෙ- ජිව්හා දුක්ඛා -පෙ- කායො දුක්ඛො -පෙ- මනො දුක්ඛො, තත්‍ර වො ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. යං භික්ඛවෙ දුක්ඛං තත්‍ර වො ඡන්දො පහාතබ්බො, රාගොපහා තබ්බො, ඡන්දරාගො පහාතබ්බොති.

---

1. තෙ-සී.

# 17. සට්ඨිපෙය්‍යාලය

## 1. 17. 1

## අනිච්ච ඡන්‍ද සූත්‍රය

168. සැවැත්නුවර —

මහණෙනි යමක් අනිත්‍ය නම් එහි ලා තොපගේ ඡන්‍දය පහකටයුතු ය. මහණෙනි කිමෙක් අනිත්‍ය ද යත්: මහණෙනි චක්ෂුස අනිත්‍ය ය. එහි ලා තොපගේ ඡන්‍දය පහකටයුතු ය. ශ්‍රොත්‍රය අනිත්‍ය ය ... ඝ්‍රාණය අනිත්‍ය ය ... ජිහ්වා අනිත්‍ය ය ... කය අනිත්‍ය ය ... මනස අනිත්‍ය ය. එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු ය. මහණෙනි යමක් අනිත්‍ය නම් එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු යි.

## 1. 17. 2

## අනිච්චරාග සූත්‍රය

169. මහණෙනි යමක් අනිත්‍ය නම් එහි ලා තොපගේ රාගය පහකටයුතු ය. මහණෙනි කිමෙක් අනිත්‍ය ද යත්: මහණෙනි චක්ෂුස අනිත්‍ය ය. එහි ලා තොපගේ රාගය පහකටයුතු ය. ශ්‍රොත්‍රය අනිත්‍ය ය... ඝ්‍රාණය අනිත්‍ය ය... ජිහ්වාව අනිත්‍ය ය... කය අනිත්‍ය ය... මනස අනිත්‍ය ය. එහි ලා තොපගේ රාගය පහකට යුතු ය. මහණෙනි යමක් අනිත්‍ය නම් එහි ලා තොපගේ රාගය පහකටයුතු යි.

## 1. 17. 3

## අනිච්ච ඡන්‍දරාග සූත්‍රය

170. මහණෙනි යමක් අනිත්‍ය නම් එහි ලා තොපගේ ඡන්‍දරාගය පහකටයුතු ය. මහණෙනි කිමෙක් අනිත්‍ය ද යත්: මහණෙනි චක්ෂුස අනිත්‍ය ය එහි ලා තොපගේ ඡන්දරාගය පහකටයුතු ය. ශ්‍රොත්‍රය අනිත්‍ය ය... ඝ්‍රාණය අනිත්‍ය ය... ජිහ්වාව අනිත්‍ය ය.... කය අනිත්‍ය ය... මනස අනිත්‍ය ය. එහි ලා තොපගේ ඡන්දරාගය පහ කටයුතු ය. මහණෙනි යමක් අනිත්‍ය නම් එහි ලා තොපගේ ඡන්‍දරාගය පහකටයුතු යි.

## 1. 17. 4 – 6

## දුක්ඛ ඡන්ද දුක්ඛරාග දුක්ඛඡන්දරාග සූත්‍ර

171 – 173 මහණෙනි යමක් දුක් නම් එහි ලා තොපගේ ඡන්‍දය පහකටයුතු ය, රාගය පහකටයුතු ය, ඡන්දරාගය පහකටයුතු ය. මහණෙනි කිමෙක් දුක් ද යත්: මහණෙනි චක්ෂුස දුක් ය, එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු ය, රාගය පහකටයුතු ය, ඡන්දරාගය පහකටයුතු ය. ශ්‍රොත්‍රය දුක් ය... ඝ්‍රාණය දුක් ය.... ජිව්හාව දුක් ය.... කය දුක් ය... මනස දුක් ය. එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු ය, රාගය පහකටයුතු ය, ඡන්දරාගය පහකටයුතු ය. මහණෙනි යමක් දුක් නම් එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු ය, රාගය පහකට යුතු ය, ඡන්‍දාරගය පහකටයුතු යි.

## 1. 17. 7 – 9

## අනත්තඡන්ද, අනත්තරාග, අනත්තඡන්දරාගසුත්තානි

174–176. යො භික්ඛවෙ අනත්තා, තත්‍ර වො ඡන්දො පහාතබ්බො. රාගො පහාතබ්බො–ඡන්දරාගො පහාතබ්බො. කො ච භික්ඛවෙ අනත්තා: චක්ඛුං භික්ඛවෙ අනත්තා, තත්‍ර වො ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. සොතං –පෙ– ඝානං –පෙ– ජිව්හා –පෙ– කායො –පෙ– මනො අනත්තා, තත්‍ර වො ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. යො භික්ඛවෙ අනත්තා, තත්‍ර වො ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බොති.

## 1. 17. 10 – 12

## බාහිරානිච්චඡන්ද, බාහිරානිච්චරාග, බාහිරානිච්ච ඡන්දරාගසුත්තානි

177–179. යං භික්ඛවෙ අනිච්චං, තත්‍ර වො ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. කිඤ්ච භික්ඛවෙ අනිච්චං: රූපා භික්ඛවෙ අනිච්චා, තත්‍ර වො ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. සද්දා –පෙ– ගන්ධා –පෙ– රසා –පෙ– ඵොට්ඨබ්බා –පෙ– ධම්මා අනිච්චා, තත්‍ර වො ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. යං භික්ඛවෙ අනිච්චං තත්‍ර වො ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බොති.

## 1. 17. 13 – 15

## බාහිර දුක්ඛඡන්ද, බාහිර දුක්ඛරාග, බාහිරදුක්ඛ ඡන්දරාගසුත්තානි

180–182. යං භික්ඛවෙ දුක්ඛං, තත්‍ර වො ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. කිඤ්ච භික්ඛවෙ දුක්ඛං: රූපා භික්ඛවෙ දුක්ඛා, තත්‍ර වො ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. සද්දා –පෙ– ගන්ධා –පෙ– රසා –පෙ– ඵොට්ඨබ්බා –පෙ– ධම්මා දුක්ඛා, තත්‍ර වො ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. යං භික්ඛවෙ දුක්ඛං, තත්‍ර වො ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බොති.

## 1. 17. 7 - 9

## අනත්තඡන්ද, අනත්තරාග, අනත්ත ඡන්දරාගසූත්‍ර

174 - 176 මහණෙනි, යමක් අනාත්ම නම් එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු ය, රාගය පහකටයුතු ය, ඡන්දරාගය පහකට යුතු ය. මහණෙනි, කිමෙක් අනත් ද යත්: මහණෙනි, චක්ෂුස අනාත්ම ය, එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු ය, රාගය පහ කටයුතු ය, ඡන්දරාගය පහකටයුතු ය. ශ්‍රෝත්‍රය... ඝ්‍රාණය... ජිහ්වාව... කය... මනස අනාත්ම ය, එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු ය, රාගය පහකටයුතු ය, ඡන්දරාගය පහකටයුතු ය. මහණෙනි, යමක් අනාත්ම නම් එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු ය, රාගය පහකටයුතු ය, ඡන්දරාගය පහකටයුතු යි.

## 1. 17. 10 - 12

## බාහිර අනිච්චඡන්ද, බාහිර අනිච්චරාග, බාහිර අනිච්චඡන්දරාග සූත්‍ර

177 - 179. මහණෙනි, යමක් අනිත්‍ය නම් එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු ය, රාගය පහකටයුතු ය, ඡන්දරාගය පහකටයුතු ය. මහණෙනි, කිමෙක් අනිත්‍ය ද යත්: මහණෙනි, රූපයෝ අනිත්‍යය හ, එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු ය, රාගය පහකටයුතු ය, ඡන්දරාගය පහකටයුතු ය. ශබ්දයෝ... ගන්ධයෝ... රසයෝ... ස්ප්‍රෂ්ටව්‍යයෝ... දහම්හු අනිත්‍යයහ, එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු ය, රාගය පහකටයුතු ය, ඡන්දරාගය පහකටයුතු ය. මහණෙනි, යමක් අනිත්‍ය නම් එහි ලා තොපගේ ඡන්දය පහකට යුතු ය, රාගය පහකටයුතුය, ඡන්දරාගය පහකටයුතු යි.

## 1. 17. 13 - 15

## බාහිර දුක්ඛඡන්ද, බාහිර දුක්ඛරාග, බාහිරදුක්ඛඡන්දරාග සූත්‍ර

180 - 182 මහණෙනි, යමක් දුක් නම් එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු ය, රාගය පහකටයුතු ය, ඡන්දරාගය පහකටයුතු ය. මහණෙනි, කිමෙක් දුක් ද යත්: මහණෙනි, රූපයෝ දුක්හ, එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු ය, රාගය පහකටයුතු ය, ඡන්දරාගය පහකටයුතු ය. ශබ්දයෝ... ගන්ධයෝ... රසයෝ... ස්ප්‍රෂ්ටව්‍යයෝ... දහම්හු දුක්හ, එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු ය, රාගය පහකටයුතු ය, ඡන්දරාගය පහකටයුතු ය. මහණෙනි, යමක් දුක් නම් එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු ය, රාගය පහකටයුතුය, ඡන්දරාගය පහකටයුතු යි.

## 1. 17. 16 – 18

## බාහිරානත්තඡන්ද – බාහිරානත්තරාග – බාහිරානත්ත ඡන්දරාගසුත්තානි.

183–185. යො භික්ඛවෙ අනත්තා, තත්‍ර වො ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. කො ච භික්ඛවෙ අනත්තා: රූපා භික්ඛවෙ අනත්තා, තත්‍ර වො ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. සද්දා –පෙ– ගන්ධා –පෙ– රසා –පෙ– ඵොට්ඨබ්බා –පෙ– ධම්මා අනත්තා, තත්‍ර වො ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. යො භික්ඛවෙ අනත්තා, තත්‍ර වො ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බොති.

## 1. 17. 19

## අතීතානිච්චසුත්තං

186. චක්ඛුං භික්ඛවෙ අනිච්චං අතීතං, සොතං අනිච්චං අතීතං, ඝානං අනිච්චං අතීතං, ජිව්හා අනිච්චා අතීතා, කායො අනිච්චො අතීතො, මනො අනිච්චො අතීතො. එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො චක්ඛුස්මිම්පි නිබ්බින්දති, සොතස්මිම්පි නිබ්බින්දති, ඝානස්මිම්පි නිබ්බින්දති, ජිව්හායපි නිබ්බින්දති, කායස්මිම්පි නිබ්බින්දති, මනස්මිම්පි නිබ්බින්දති. නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 17. 20

## අනාගතානිච්චසුත්තං

187. චක්ඛුං භික්ඛවෙ අනිච්චං අනාගතං, සොතං –පෙ– ඝානං –පෙ– ජිව්හා අනිච්චා අනාගතා, කායො –පෙ– මනො අනිච්චො අනාගතො. එවං පස්සං භික්ඛවෙ සුතවා, අරියසාවකො චක්ඛුස්මිම්පි නිබ්බින්දති –පෙ– නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 17. 21

## පච්චුප්පන්නානිච්චසුත්තං

188. චක්ඛුං භික්ඛවෙ අනිච්චං පච්චුප්පන්නං, සොතං –පෙ– ඝානං–පෙ– ජිව්හා අනිච්චා පච්චුප්පන්නා, කායො–පෙ–මනො අනිච්චො පච්චුප්පන්නො. එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො චක්ඛුස්මිම්පි නිබ්බින්දති –පෙ– නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 17. 16 – 18

## බාහිරානත්තඡන්ද – බාහිරානත්තරාග – බාහිරානත්තඡන්දරාගසූත්‍ර

183 – 185. මහණෙනි යමක් අනාත්ම නම් එහි ලා තොපගේ ඡන්දය දුරු කටයුතු ය, රාගය දුරු කටයුතු ය, ඡන්දරාගය දුරු කටයුතු ය. මහණෙනි කිමෙක් අනාත්ම ද යත්: මහණෙනි රූපයෝ අනාත්මහ, එහි ලා තොපගේ ඡන්දය දුරු කටයුතු ය, රාගය දුරුකට යුතු ය, ඡන්දරාගය දුරු කටයුතු ය. ශබ්දයෝ ... ගන්ධයෝ ... රසයෝ ... ස්ප්‍රෂ්ටව්‍යයෝ ... දහම්හු අනාත්මහ, එහි ලා තොපගේ ඡන්දය දුරු කටයුතු ය, රාගය දුරු කටයුතු ය, ඡන්දරාගය දුරු කටයුතු ය. මහණෙනි යමක් අනාත්ම නම් එහි ලා තොපගේ ඡන්දය දුරු කට යුතු ය, රාගය දුරු කටයුතු ය, ඡන්දරාගය දුරු කටයුතු යි.

## 1. 17. 19

## අතීතානිච්ච සූත්‍රය

186. මහණෙනි අතීත වූ චක්ෂුස අනිත්‍ය ය, අතීත වූ ශ්‍රොත්‍රය අනිත්‍ය ය, අතීත වූ ඝ්‍රාණය අනිත්‍ය ය, අතීත වූ ජිහ්වාව අනිත්‍ය ය, අතීත වූ කය අනිත්‍ය ය, අතීත වූ මනස අනිත්‍ය ය. මහණෙනි මෙසේ දක්නා ශ්‍රුතවත් අරිසවු (ආර්යශ්‍රාවක) චක්ෂුස කෙරෙහිත් කලකිරෙයි, ශ්‍රොත්‍රය කෙරෙහිත් කලකිරෙයි, ඝ්‍රාණය කෙරෙහිත් කලකිරෙයි, ජිහ්වාව කෙරෙහිත් කලකිරෙයි, කයෙහිත් කලකිරෙයි, මනස කෙරෙහිත් කලකිරෙයි. කලකිරෙන්නේ නො ඇලෙයි, නො ඇලුම් හෙයින් මිදෙයි, මිදුණු කල්හි මිදුණේ ය යි දැනීම වෙයි. ඉපැද්ම අවසන් විය, බඹසර වැස නිමැවිණ, කටයුතු කරන ලදි, මේ රහත්බව පිණිස කටයුතු අනෙකක් නැතැයි දැනගනී.

## 1. 17. 20

## අනාගතානිච්ච සූත්‍රය

187. මහණෙනි අනාගත චක්ෂුස අනිත්‍ය ය, අනාගත ශ්‍රොත්‍රය... ඝ්‍රාණය... ජිහ්වාව අනිත්‍ය ය, අනාගත කය... මනස අනිත්‍ය ය මහණෙනි මෙසේ දක්නා ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවක චක්ෂුසෙහි කලකිරෙයි... මෙ රහත්බව පිණිස අනෙකක් නැතැ යි දැනගනී.

## 1. 17. 21

## පච්චුප්පන්නානිච්ච සූත්‍රය

188. මහණෙනි වර්තමාන චක්ෂුස අනිත්‍ය ය, වර්තමාන ශ්‍රොත්‍රය... ඝ්‍රාණය ... ජිහ්වාව අනිත්‍ය ය, වර්තමාන කය ... සිත අනිත්‍ය ය. මහණෙනි මෙසේ දක්නා ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවක චක්ෂුස කෙරෙහිත් කලකිරෙයි... මේ රහත්බව පිණිස අනෙකක් නැතැ යි දැනගනී.

## 1. 17. 22 – 24

### අතීත දුක්ඛ, අනාගත දුක්ඛ, පච්චුප්පන්න දුක්ඛසුත්තානි

189–191. චක්ඛුං භික්ඛවෙ දුක්ඛං අතීතං අනාගතං පච්චුප්පන්නං, සොතං –පෙ– ඝානං –පෙ– ජිව්හා දුක්ඛා අතීතා අනාගතා පච්චුප්පන්නා, කායො –පෙ– මනො දුක්ඛො අතීතො අනාගතො[1] පච්චුප්පන්නො. එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො චක්ඛුස්මිම්පි නිබ්බින්දති –පෙ– නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 17. 25 – 27

### අතීතානත්ත, අනාගතානත්ත, පච්චුප්පන්නානත්තසුත්තානි

192–194. චක්ඛුං භික්ඛවෙ අනත්තා අතීතං අනාගතං පච්චුප්පන්නං, සොතං –පෙ– ඝානං –පෙ– ජිව්හා අනත්තා අතීතා අනාගතා පච්චුප්පන්නා, කායො –පෙ– මනො අනත්තා අතීතො අනාගතො පච්චුප්පන්නො. එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො චක්ඛුස්මිම්පි නිබ්බින්දති –පෙ– නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 17. 28 – 30

### බාහිර අතීතානිච්ච, බාහිර අනාගතානිච්ච, බාහිර පච්චුප්පන්නානිච්චසුත්තානි

195–197. රූපා භික්ඛවෙ අනිච්චා අතීතා අනාගතා පච්චුප්පන්නා, සද්දා –පෙ– ගන්ධා –පෙ– රසා –පෙ– ඵොට්ඨබ්බා –පෙ– ධම්මා අනිච්චා අතීතා අනාගතා පච්චුප්පන්නා. එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො රූපෙසුපි නිබ්බින්දති, සද්දෙසුපි නිබ්බින්දති, ගන්ධෙසුපි නිබ්බින්දති, රසෙසුපි නිබ්බින්දති, ඵොට්ඨබ්බෙසුපි නිබ්බින්දති, ධම්මෙසුපි නිබ්බින්දති. නිබ්බින්දං විරජ්ජති විරාගා විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 17. 31 – 33

### බාහිරාතීත දුක්ඛ, බාහිරානාගත දුක්ඛ, බාහිර පච්චුප්පන්නදුක්ඛසුත්තානි

198–200. රූපා භික්ඛවෙ දුක්ඛා අතීතා අනාගතා පච්චුප්පන්නා, සද්දා –පෙ– ගන්ධා –පෙ– රසා –පෙ– ඵොට්ඨබ්බා –පෙ– ධම්මා දුක්ඛා අතීතා අනාගතා පච්චුප්පන්නා. එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො රූපෙසුපි නිබ්බින්දති –පෙ– නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 17. 34 – 36

### බාහිර අතීතානත්ත, බාහිර අනාගතානත්ත, බාහිර පච්චුප්පන්නානත්තසුත්තානි

201–203. රූපා භික්ඛවෙ අනත්තා අතීතා අනාගතා[2] පච්චුප්පන්නා, සද්දා –පෙ– ගන්ධා –පෙ– රසා –පෙ– ඵොට්ඨබ්බා –පෙ– ධම්මා අනත්තා අතීතා අනාගතා පච්චුප්පන්නා. එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො රූපෙසුපි නිබ්බින්දති –පෙ– නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

---

1. අතීතානාගතො-සී
2. අතීතානාගතා - සීමු.

## 1. 17. 22 – 24

### අතීත දුක්ඛ, අනාගත දුක්ඛ, පච්චුප්පන්න දුක්ඛ සූත්‍ර

189 – 191. මහණෙනි, අයු අනා වත්මන් චක්ෂුස දුක් ය, ශ්‍රෝත්‍රය... ඝ්‍රාණය... අයු අනා වත්මන් ජිහ්වාව අනාත්ම ය. අයු අනා වත්මන් කය... මනස දුක් ය. මහණෙනි, මෙසේ දක්නා ශ්‍රැතවත් අරිසවු තෙමේ ඇසෙහිත් කලකිරෙයි... මේ රහත්බව පිණිස අනෙකක් නැතැ යි දැනගනී.

## 1. 17. 25 – 27

### අතීතානත්ත, අනාගතානත්ත, පච්චුප්පන්නානත්ත සූත්‍ර

192 – 194. මහණෙනි, අයු අනා වත්මන් චක්ෂුස අනත් ය, ශ්‍රෝත්‍රය... ඝ්‍රාණය... අයු අනා වත්මන් ජිහ්වාව අනාත්ම ය. මහණෙනි, අයු අනා වත්මන් කය... මනස අනාත්ම ය. මහණෙනි, මෙසේ දක්නා ශ්‍රැතවත් අරිසවු තෙමේ ඇසෙහිත් කලකිරෙයි... මේ රහත්බව පිණිස අනෙකක් නැතැ යි දැනගනී.

## 1. 17. 28 – 30

### බාහිර අතීතානිච්ච, බාහිර අනාගතානිච්ච, බාහිර පච්චුප්පන්නානිච්ච සූත්‍ර

195 – 197. මහණෙනි, අයු අනා වත්මන් රූප අනිත්‍යහ, අයු අනා වත්මන් සද... ගඳ... රස... පහස්... දහම්හු අනිත්‍යහ. මහණෙනි, මෙසේ දක්නා ශ්‍රැතවත් අරිසවු තෙමේ රූහිත් කලකිරෙයි, සදෙහිත් කලකිරෙයි, ගඳෙහිත් කලකිරෙයි, රසෙහිත් කලකිරෙයි, පහස්හිත් කලකිරෙයි, දහම්හිත් කලකිරෙයි. කලකිරෙන්නේ නො ඇලෙයි, නො ඇල්මෙන් මිදෙයි. මිදුණු කල්හි මිදුණේ ය යි දැනීම වෙයි. ඉපැද්ම අවසන් විය, බඹසර වැස නිමවන ලදි, කටයුතු කරන ලදි, මේ රහත් බැව් පිණිස අනෙකක් නැතැ යි දැනගනී.

## 1. 17. 31 – 33

### බාහිරාතීත දුක්ඛ, බාහිරානාගත දුක්ඛ, බාහිර පච්චුප්පන්න දුක්ඛ සූත්‍ර

198 – 200. මහණෙනි, අයු අනා වත්මන් රූ දුක් ය, අයු අනා වත්මන් සද... ගඳ... රස... පහස්... දහම් දුක් ය. මහණෙනි, මෙසේ දක්නා ශ්‍රැතවත් අරිසවු තෙමේ රූහිත් කලකිරෙයි... මේ රහත් බව පිණිස අනෙකක් නැතැ යි දැනගනී.

## 1. 17. 34 – 36

### බාහිර අතීතානත්ත, බාහිර අනාගතානත්ත, බාහිර පච්චුප්පන්නානත්ත සූත්‍ර

201 - 203. මහණෙනි, අයු අනා වත්මන් රූ අනත් ය, අයු අනා වත්මන් සද... ගඳ... රස.... පහස්... දහම් අනත් ය. මහණෙනි, මෙසේ දක්නා ශ්‍රැතවත් අරිසවු තෙමේ රූහිත් කලකිරෙයි... මේ රහත් බව පිණිස අනෙකක් නැතැ යි දැනගනී.

## 1. 17. 37

## අතීතයදනිච්චසුත්තං

204. **සාවත්ථියං —**

චක්ඛුං භික්ඛවෙ අනිච්චං අතීතං, යදනිච්චං තං දුක්ඛං, යං දුක්ඛං තදනත්තා, යදනත්තා තං 'නෙතං මම, නෙසො'හමස්මි, න මෙසො අත්තා'ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. සොතං අනිච්චං -පෙ- ඝානං අනිච්චං -පෙ- ජිව්හා අනිච්චා -පෙ- කායො අනිච්චො -පෙ- මනො අනිච්චො අතීතො, යදනිච්චං තං දුක්ඛං, යං දුක්ඛං තදනත්තා, යදනත්තා තං 'නෙතං මම, නෙසො'-හමස්මි, න මෙසො අත්තා'ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

එවං පස්සං භික්ඛවෙ අරියසාවකො චක්ඛුස්මිම්පි නිබ්බින්දති -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 17. 38

## අනාගතයදනිච්චසුත්තං

205. චක්ඛුං භික්ඛවෙ අනිච්චං අනාගතං, යදනිච්චං තං දුක්ඛං, යං දුක්ඛං තදනත්තා, යදනත්තා තං 'නෙතං මම නෙසො'හමස්මි, න මෙසො අත්තා'ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. සොතං අනිච්චං -පෙ- ඝානං අනිච්චං -පෙ- ජිව්හා අනිච්චා -පෙ- කායො අනිච්චො -පෙ- මනො අනිච්චො අනාගතො, යදනිච්චං තං දුක්ඛං, යං දුක්ඛං තදනත්තා, යදනත්තා තං 'නෙතං මම, නෙසො'හමස්මි, න මෙසො අත්තා'ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො චක්ඛුස්මිම්පි නිබ්බින්දති -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 17. 39

## පච්චුප්පන්නයදනිච්චසුත්තං

206. චක්ඛුං භික්ඛවෙ අනිච්චං පච්චුප්පන්නං, යදනිච්චං තං දුක්ඛං, යං දුක්ඛං තදනත්තා, යදනත්තා තං 'නෙතං මම නෙසො'හමස්මි න මෙසො අත්තා'ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. සොතං -පෙ- ඝානං -පෙ- ජිව්හා -පෙ- කායො -පෙ- මනො[1] අනිච්චො පච්චුප්පන්නො, යදනිච්චං තං දුක්ඛං, යං දුක්ඛං තදනත්තා, යදනත්තා තං 'නෙතං මම නෙසො'හමස්මි න මෙසො අත්තා'ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො චක්ඛුස්මිම්පි නිබ්බින්දති -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 17. 37

## අතීත යදනිච්ච සූත්‍රය

204. සැවැත්නුවර—

මහණෙනි, අතීත චක්ෂුස අනිස ය, යමක් අනිස නම් එය දුක් ය, යමක් දුක් නම් එය අනත් ය, යමක් අනත් නම් එය ''මෙය මාගේ නො වෙයි, මේ මම නො වෙමි, මේ මාගේ ආත්මය නො වේ ය''යි මෙසේ මෙය තතුසේ මනානුවණින් දක්ක යුතු යි. ඉකුත් කන අනිස ය. ... නැහැය අනිස ය ... දිව අනිස ය ... කය අනිස ය ... සිත අනිස ය. යමක් අනිස නම් එය දුක් ය යමක් දුක් නම් එය අනත් ය. යමක් අනත් නම් එය ''මෙය මාගේ නො වෙයි, මේ මම නො වෙමි, මේ මාගේ ආත්මය නො වේ ය''යි මෙසේ මෙය තතුසේ මනානුවණින් දක්ක යුතු යි.

මහණෙනි, මෙසේ දක්නා ශ්‍රුතවත් ආර්යශ්‍රාවක තෙමේ ඇසෙහිත් කලකිරෙයි... මේ රහත් බව පිණිස අනෙකක් නැතැ යි දැනගනි යි.

## 1. 17. 38

## අනාගත යදනිච්ච සූත්‍රය

205. මහණෙනි, අනා ඇස අනිස ය, යමක් අනිස නම් එය දුක් ය, යමක් දුක් නම් එය අනත් ය, යමක් අනත් නම් එය ''මෙය මාගේ නො වෙයි, මේ මම නො වෙමි මේ මාගේ ආත්මය නො වේ ය''යි මෙසේ මෙය තතුසේ මනානුවණින් දක්ක යුතු යි. අනා කන අනිස ය... නැහැය අනිස ය... දිව අනිස ය... කය අනිස ය ... සිත අනිස ය, යමක් අනිස නම් එය දුක් ය, යමක් දුක් නම් එය අනත් ය. යමක් අනත් නම් එය ''මෙය මාගේ නො වෙයි, මේ මම නො වෙමි, මේ මාගේ ආත්මය නො වේ ය''යි මෙසේ මෙය තතුසේ මනානුවණින් දක්ක යුතු යි.

මහණෙනි, මෙසේ දක්නා ශ්‍රුතවත් ආර්යශ්‍රාවක ඇසෙහිත් කලකිරෙයි ... මේ රහත් බව පිණිස අනෙකක් නැතැ යි දැනගනි යි.

## 1. 17. 39

## පච්චුප්පන්න යදනිච්ච සූත්‍රය

206. මහණෙනි, ප්‍රත්‍යුත්පන්න චක්ෂුස අනිත්‍ය ය, යමක් අනිත්‍ය නම් එය දුක් ය, යමක් දුක් නම් එය අනාත්ම ය, යමක් අනාත්ම නම් එය ''මෙය මාගේ නො වෙයි, මේ මම නො වෙමි, මේ මාගේ ආත්මය නො වේ ය''යි මෙසේ මෙය තතුසේ මනානුවණින් දක්ක යුතු යි. වත්මන් කන ... නැහැය ... දිව ... කය ... සිත අනිස ය, යමක් අනිස නම් එය දුක් ය, යමක් දුක් නම් එය අනත් ය. යමක් අනත් නම් එය ''මෙය මාගේ නො වෙ යි, මේ මම නො වෙමි, මේ මාගේ ආත්මය නො වේ ය''යි මෙසේ මෙය තතුසේ මනානුවණින් දක්ක යුතු යි.

මහණෙනි, මෙසේ දක්නා ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවක ඇසෙහිත් කලකිරෙයි ... මේ බැව් පිණිස අනෙකක් නැතැ යි දැනගනි යි.

## 1. 17. 40 – 42

## අතීත යං දුක්ඛ, අනාගත යං දුක්ඛ, පච්චුප්පන්න යං දුක්ඛසුත්තානි

207–209. චක්ඛුං භික්ඛවෙ දුක්ඛං අතීතං අනාගතං පච්චුප්පන්නං, යං දුක්ඛං තදනත්තා, යදනත්තා තං "නෙතං මම නෙසො'හමස්මි න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. සොතං –පෙ– ඝානං –පෙ– ජිව්හා –පෙ– කායො –පෙ– මනො දුක්ඛො අතීතො අනාගතො පච්චුප්පන්නො. යං දුක්ඛං තදනත්තා, යදනත්තා තං "නෙතං මම, නෙසො'හමස්මි, න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො චක්ඛුස්මිම්පි නිබ්බින්දති –පෙ– නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 17. 43 – 45

## අතීත යදනත්ත, අනාගත යදනත්ත, පච්චුප්පන්න යදනත්තසුත්තානි

210–212. චක්ඛුං භික්ඛවෙ අනත්තා අතීතං අනාගතං පච්චුප්පන්නං, යදනත්තා තං "නෙතං මම නෙසො'හමස්මි න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. සොතං –පෙ– ඝානං –පෙ– ජිව්හා –පෙ– කායො –පෙ– මනො අනත්තා අතීතො අනාගතො පච්චුප්පන්නො, යදනත්තා තං "නෙතං මම නෙසො'හමස්මි න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො චක්ඛුස්මිම්පි නිබ්බින්දති –පෙ– නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 17. 46 – 48

## බාහිරාතීත යදනිච්ච, බාහිරානාගත යදනිච්ච, බාහිර පච්චුප්පන්න යදනිච්චසුත්තානි

213–215. රූපා භික්ඛවෙ අනිච්චා අතීතා අනාගතා පච්චුප්පන්නා, යදනිච්චං තං දුක්ඛං, යං දුක්ඛං තදනත්තා, යදනත්තා තං "නෙතං මම නෙසො'හමස්මි න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. සද්දා –පෙ– ගන්ධා –පෙ– රසා –පෙ– ඵොට්ඨබ්බා –පෙ– ධම්මා අනිච්චා අතීතා අනාගතා පච්චුප්පන්නා, යදනිච්චං තං දුක්ඛං, යං දුක්ඛං තදනත්තා, යදනත්තා තං "නෙතං මම, නෙසො'හමස්මි, න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො රූපෙසුපි නිබ්බින්දති –පෙ– නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 17. 40 – 42

## අතීත යංදුක්ඛ, අනාගත යංදුක්ඛ, පච්චුප්පන්න යංදුක්ඛ සූත්‍ර

207–209. මහණෙනි, ඉකුත් අනා වත්මන් ඇස දුක් ය. යමක් දුක් නම් එය අනත් ය. යමක් අනත් නම් එය ''මෙය මාගේ නො වෙයි, මේ මම නො වෙමි, මේ මාගේ ආත්මය නො වේ ය''යි මෙසේ මෙය තතුසේ මනානුවණින් දක්ක යුතු යි. ඉකුත් අනා වත්මන් කන ... නැහැය ... දිව ... කය ... සිත දුක් ය. යමක් දුක් නම් එය අනත් ය. යමක් අනත් නම් එය මෙය මාගේ නො වෙයි, මේ මම නො වෙමි, මේ මාගේ ආත්මය නො වේ ය''යි මෙසේ මෙය තතුසේ මනානුවණින් දක්ක යුතු යි.

මහණෙනි, මෙසේ දක්නා ශ්‍රුතවත් අරිසවු තෙමේ ඇසෙහිත් කලකිරෙයි ... මේ බැවි පිණිස අනෙකක් නැතැ යි දනගනි යි.

## 1. 17. 43 – 45

## අතීත යදනත්ත, අනාගත යදනත්ත, පච්චුප්පන්න යදනත්ත සූත්‍ර

210–212. මහණෙනි, ඉකුත් අනා වත්මන් ඇස අනත් ය. යමක් අනත් නම් එය ''මෙය මාගේ නො වෙයි, මේ මම නො වෙමි, මේ මාගේ ආත්මය නො වේ ය''යි මෙසේ මෙය තතුසේ මනානුවණින් දක්ක යුතු යි. කන ... නැහැය ... ඉකුත් අනා වත්මන් දිව ... කය ... සිත අනත් ය. යමක් අනත් නම් එය ''මෙය මාගේ නො වෙයි, මේ මම නො වෙමි, මේ මාගේ ආත්මය නො වේ ය''යි මෙසේ මෙය තතුසේ මනානුවණින් දක්ක යුතු යි.

මහණෙනි, මෙසේ දක්නා ශ්‍රුතවත් අරිසවු තෙමේ ඇසෙහිත් කලකිරෙයි... මේ බැවි පිණිස අනෙකක් නැතැ යි දනගනි යි.

## 1. 17. 46 – 48

## බාහිරාතීත යදනිච්ච, බාහිරානාගත යදනිච්ච, බාහිරපච්චුප්පන්න යදනිච්ච සූත්‍ර

213–215. මහණෙනි, ඉකුත් අනා වත්මන් රූ අනිසහ, යමක් අනිස නම් එය දුක් ය, යමක් දුක් නම් එය අනත් ය, යමක් අනත් නම් එය ''මෙය මාගේ නො වෙයි, මේ මම නො වෙමි, මේ මාගේ ආත්මය නො වේ ය''යි මෙසේ මෙය තතුසේ මනානුවණින් දක්ක යුතු යි. ඉකුත් අනා වත්මන් සද ... ගඳ ... රස ... පහස් ... දහම් අනිසහ, යමක් අනිස නම් එය දුක් ය, යමක් දුක් නම් එය අනත් ය, යමක් අනත් නම් එය ''මෙය මාගේ නො වෙයි, මේ මම නො වෙමි, මේ මාගේ ආත්මය නො වේ ය''යි මෙසේ මෙය තතුසේ මනානුවණින් දක්ක යුතු යි.

මෙසේ දක්නා ශ්‍රුතවත් අරිසවු තෙමේ රූහිත් කලකිරෙයි ... මේ බැවි පිණිස අනෙකක් නැතැ යි දනගනි යි.

## 1. 17. 49 – 51

### බාහිරාතීත යංදුක්ඛ-බාහිරානාගත යංදුක්ඛ-බාහිරපච්චුප්පන්න යංදුක්ඛ සුත්තානි

216-218. රූපා භික්ඛවෙ දුක්ඛා අතීතා, අනාගතා, පච්චුප්පන්නා. යං දුක්ඛං තදනත්තා. යදනත්තා තං ''නෙතං මම, නෙසො'හමස්මි, න මෙසො අත්තා''ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. සද්දා -පෙ- ගන්ධා -පෙ- රසා -පෙ- ඵොට්ඨබ්බා -පෙ- ධම්මා දුක්ඛා අතීතා අනාගතා පච්චුප්පන්නා, යං දුක්ඛං තදනත්තා, යදනත්තා තං ''නෙතං මම, නෙසො'හමස්මි, න මෙසො අත්තා''ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො රූපෙසු පි නිබ්බින්දති -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 17. 52 – 54

### බාහිරාතීත යදනත්ත-බාහිරානාගත යදනත්ත-බාහිරපච්චුප්පන්න යදනත්ත සුත්තානි

219-221. රූපා භික්ඛවෙ අනත්තා අතීතා අනාගතා පච්චුප්පන්නා යදනත්තා තං ''නෙතං මම, නෙසො'හමස්මි, න මෙසො අත්තා''ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. සද්දා -පෙ- ගන්ධා -පෙ- රසා -පෙ- ඵොට්ඨබ්බා -පෙ- ධම්මා අනත්තා අතීතා අනාගතා පච්චුප්පන්නා යදනත්තා තං ''නෙතං මම, නෙසො'හමස්මි, න මෙසො අත්තා''ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො රූපෙසුපි නිබ්බින්දති -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 17. 55

### අජ්ඣත්තායතන අනිච්චසුත්තං

222. චක්ඛුං භික්ඛවෙ අනිච්චං, සොතං -පෙ- ඝානං -පෙ- ජිව්හා -පෙ- කායො -පෙ- මනො අනිච්චො. එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො චක්ඛුස්මිංපි නිබ්බින්දති -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 17. 56

### අජ්ඣත්තායතන දුක්ඛසුත්තං

223. චක්ඛුං භික්ඛවෙ දුක්ඛං, සොතං -පෙ- ඝානං -පෙ- ජිව්හා -පෙ- කායො -පෙ- මනො දුක්ඛො. එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො චක්ඛුස්මිංපි නිබ්බින්දති -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

3. අතීතානාගතා - සී

## 1. 17. 49–51

### බාහිරාතීත යංදුක්ඛ-බාහිරානාගත යංදුක්ඛ-බාහිරපච්චුප්පන්න යංදුක්ඛ සූත්‍ර

216–218. මහණෙනි ඉකුත්, අනා, වත්මන් රූ දුක්හ. යමක් දුක් නම් එය අනත් ය. යමක් අනත් නම් එය "මෙය මාගේ නො වෙයි. මේ මම නො වෙමි මේ මාගේ ආත්මය නො වේ "යි මෙසේ මෙය තතුසේ මනානුවණින් දක්ක යුතු යි. සද ... ගඳ ... රස ... පහස් ... ඉකුත්, අනා, වත්මන් දහම් දුක්හ. යමක් දුක් නම් එය අනත් ය. යමක් අනත් නම් එය "මෙය මාගේ නො වෙයි. මේ මම නො වෙමි. මේ මාගේ ආත්මය නො වේ "යි මෙසේ මෙය තතුසේ මනානුවණින් දක්ක යුතු යි.

මහණෙනි මෙසේ දක්නා ශ්‍රුතවත් අරිසවු තෙමේ රූහිත් කලකිරෙයි ... මේ බැව් පිණිස අනෙකක් නැතැ යි දැනගනී යි.

## 1. 17. 52–54

### බාහිරාතීත යදනත්ත-බාහිරානාගත යදනත්ත-බාහිරපච්චුප්පන්න යදනත්ත සූත්‍ර

219–221, මහණෙනි අයු, අනා, වත්මන් රූ අනත්හ. යමක් අනත් නම් එය "මෙය මාගේ නො වෙයි. මේ මම නො වෙමි. මේ මාගේ ආත්මය නො වේ "යි මෙසේ මෙය තතුසේ මනානුවණින් දක්ක යුතු යි. සද ... ගඳ ... රස ... පහස් ... අයු, අනා, වත්මන් දහම් අනත්හ. යමක් අනත් නම් එය "මෙය මාගේ නො වෙයි. මේ මම නො වෙමි. මේ මාගේ ආත්මය නො වේ "යි මෙසේ මෙය තතුසේ මනානුවණින් දක්ක යුතු යි.

මහණෙනි මෙසේ දක්නා ශ්‍රුතවත් අරිසවු තෙමේ රූහිත් කලකිරෙයි ... මේ බැව් පිණිස අනෙකක් නැතැ යි දැනගනී යි.

## 1. 17. 55

### අජ්ඣත්තායතන අනිච්ච සූත්‍රය

222. මහණෙනි ඇස අනිස ය. කන ... නැහැය ... දිව ... කය ... සිත අනිස ය. මහණෙනි, මෙසේ දක්නා ශ්‍රුතවත් අරිසවු තෙමේ ඇසෙහිත් කලකිරෙයි ... මේ බැව් පිණිස අනෙකක් නැතැ යි දැනගනී යි.

## 1. 17. 56

### අජ්ඣත්තායතන දුක්ඛ සූත්‍රය

223. මහණෙනි ඇස දුක් ය. කන ... නැහැය ... දිව ... කය ... සිත දුක් ය. මහණෙනි මෙසේ දක්නා ශ්‍රුතවත් අරිසවු තෙමේ ඇසෙහිත් කලකිරෙයි ... මේබැව් පිණිස අනෙකක් නැතැ යි දැනගනී යි.

## 1. 17. 57

### අජ්ඣත්තායතන අනත්තසුත්තං

224. චක්ඛුං භික්ඛවෙ අනත්තා, සොතං -පෙ- ඝානං -පෙ- ජිව්හා -පෙ- කායො -පෙ- මනො අනත්තා. එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො චක්ඛුස්මිම්පි නිබ්බින්දති -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 17. 58

### බාහිරායතන අනිච්චසුත්තං

225. රූපා භික්ඛවෙ අනිච්චා, සද්දා -පෙ- ගන්ධා -පෙ- රසා -පෙ- ඵොට්ඨබ්බා -පෙ- ධම්මා අනිච්චා. එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො රූපෙසුපි නිබ්බින්දති -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 17. 59

### බාහිරායතන දුක්ඛසුත්තං

226. රූපා භික්ඛවෙ දුක්ඛා, සද්දා -පෙ- ගන්ධා -පෙ- රසා -පෙ- ඵොට්ඨබ්බා -පෙ- ධම්මා දුක්ඛා. එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො රූපෙසුපි නිබ්බින්දති -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 17. 60

### බාහිරායතන අනත්තසුත්තං

227. රූපා භික්ඛවෙ අනත්තා, සද්දා -පෙ- ගන්ධා -පෙ- රසා -පෙ- ඵොට්ඨබ්බා -පෙ- ධම්මා අනත්තා. එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො රූපෙසුපි නිබ්බින්දති -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

**සට්ඨිපෙය්‍යාලො සමත්තො.**

**තත්‍රුද්දානං:**

ඡන්දෙනට්ඨාරස හොන්ති අතීතෙන ච දෙව නව
යදනිච්චාට්ඨාරස වුත්තා තයො අජ්ඣත්තබාහිරා
පෙය්‍යාලො සට්ඨිකො වුත්තො බුද්ධෙනාදිච්චබන්ධුනාති.

## 1. 17. 57

### අජ්ඣත්තායතන අනත්ත සූත්‍රය

224. මහණෙනි ඇස අනත් ය. කන ... නැහැය ... දිව ... කය ... සිත අනත් ය. මහණෙනි මෙසේ දක්නා ශ්‍රුතවත් අරිසවූ තෙමේ ඇසෙහිත් කලකිරෙයි ... මේ බැව් පිණිස අනෙකක් නැතැයි දැනගනී යි.

## 1. 17. 58

### බාහිරායතන අනිච්ච සූත්‍රය

225. මහණෙනි රූ අනිස ය. සද ... ගඳ ... රස .. පහස් ... දහම් අනිස ය. මහණෙනි, මෙසේ දක්නා ශ්‍රුතවත් අරිසවූ තෙමේ රූහිත් කලකිරෙයි ... මේ බැව් පිණිස අනෙකක් නැතැයි දැනගනී යි.

## 1. 17. 59

### බාහිරායතන දුක්ඛ සූත්‍රය

226. මහණෙනි රූපයෝ දුක්හ. සද ...ගඳ ... රස ... පහස් ...දහම්හු දුක්හ. මහණෙනි මෙසේ දක්නා ශ්‍රුතවත් අරිසවූ තෙමේ රූහිත් කලකිරෙයි ... මේ බැව් පිණිස අනෙකක් නැතැ යි දැනගනී යි.

## 1. 17. 60

### බාහිරායතන අනත්ත සූත්‍රය

227. මහණෙනි, රූපයෝ අනත්හ. සද ... ගඳ ... රස ...පහස් ... දහම්හු අනත්හ. මහණෙනි, මෙසේ දක්නා ශ්‍රුතවත් අරිසවූ තෙමේ රූහිත් කලකිරෙයි ... මේ බැව් පිණිස අනෙකක් නැතැ යි දැනගනී යි.

**සට්ඨිපෙය්‍යාලයවර්ගයනිමියේ ය.**

**එහි සූත්‍රනාමාවලිය:**

ඡන්දනමින් අටළොසෙක් වේ. අතීත නමින් ද නවක දෙකෙකි. (අට ළොසෙකි) යදනිච්ච නමින් අටළොසෙක් කියන ලදි. අජ්ඣත්ත බාහිර තික දෙකෙකි. මෙසේ ආදිච්චබන්ධු වූ සර්වඥයන් වහන්සේ විසින් සට්ඨිපෙය්‍යාලය වදරන ලද්දේ ය යි.

# 18. සමුද්දවග්ගො

## 1. 18. 1

### සමුද්දසුත්තං

228. සමුද්දො සමුද්දොති භික්ඛවෙ අස්සුතවා පුථුජ්ජනො භාසති නෙසො භික්ඛවෙ අරියස්ස විනයෙ සමුද්දො, මහා එසො භික්ඛවෙ උදකරාසි, මහා උදකණ්ණවො. චක්ඛු භික්ඛවෙ පුරිසස්ස සමුද්දො, තස්ස රූපමයො වෙගො. යො තං රූපමයං වෙගං සහති, අයං වුච්චති භික්ඛවෙ අතරි චක්ඛු සමුද්දං සඌමිං[1] සාවට්ටං සගාහං සරක්ඛසං තිණ්ණො පාරගතො[2] ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො.

සොතං -පෙ- ඝානං -පෙ- ජිව්හා භික්ඛවෙ පුරිසස්ස සමුද්දො, තස්ස රසමයො වෙගො, යො තං රසමයං වෙගං සහති, අයං වුච්චති භික්ඛවෙ අතරි ජිව්හාසමුද්දං සඌමිං සාවට්ටං සගාහං සරක්ඛසං තිණ්ණො පාරගතො[2] ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො. කායං -පෙ- මනො භික්ඛවෙ පුරිසස්ස සමුද්දො, තස්ස ධම්මමයො වෙගො, යො තං ධම්මමයං වෙගං සහති, අයං වුච්චති භික්ඛවෙ අතරි මනොසමුද්දං සඌමිං සාවට්ටං සගාහං සරක්ඛසං තිණ්ණො පාරගතො ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො.

යො ඉමං සමුද්දං සගාහං
සරක්ඛසං සඌමිභයං[3] දුත්තරං අච්චතරි
ස වෙදගූ වුසිතබ්‍රහ්මචරියො
ලොකන්තගූ පාරගතොති වුච්චතීති.

## 1. 18. 2

### දුතියසමුද්දසුත්තං

229. සමුද්දො සමුද්දොති භික්ඛවෙ අස්සුතවා පුථුජ්ජනො භාසති, නෙසො භික්ඛවෙ අරියස්ස විනයෙ සමුද්දො. මහා එසො භික්ඛවෙ උදකරාසි, මහා උදකණ්ණවො. සන්ති භික්ඛවෙ චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, අයං වුච්චති භික්ඛවෙ අරියස්ස විනයෙ සමුද්දො.

---

1. සඋම්මිං - ස්‍යා.
2. පාරංගතො - මජසං.
3. සඋම්මිභයං - ස්‍යා.

# 18. සමුද්ද වර්ගය

## 1. 18. 1

## සමුද්ද සූත්‍රය

228. මහණෙනි අශ්‍රැතවත් පුහුදුන් තෙමේ මුහුද මුහුද යි කියයි. මහණෙනි මෙය බුදුසස්නෙහි මුහුද නො වේ. මහණෙනි මෙය මහ දියරැසෙකි, මහ දියකඳෙකි. මහණෙනි මිනිසාගේ ඇස මුහුදෙකි, එහි රූමුවා වේගය වේ. යමෙක් ඒ රූමුවා වේගය ඉවසා නම් මහණෙනි මේ තෙමේ රළ සහිත සුළි සහිත සැඩමසුන් සහිත රකුසන් සහිත ඇස නමැති මුහුද තරණය කෙළේ ය යි කියනු ලැබේ. (චතුරොඝය) තරණය කළ පරතෙරට පැමිණි ඒ බමුණු තෙමේ (නිවන් නමැති) ගොඩබිම සිටියි.

කන ... නැහැය ... මහණෙනි මිනිසාගේ දිව මුහුදෙකි. එහි රසමුවා වෙගය වේ. යමෙක් ඒ රසමුවා වෙගය ඉවසා නම් මහණෙනි මේ තෙමේ රළ සහිත සුළි සහිත සැඩමසුන් සහිත රකුසන් සහිත දිව නමැති මුහුද තරණය කෙළේ ය යි කියනු ලැබේ. (චතුරොඝය) තරණය කළ පරතෙරට පැමිණි ඒ බමුණු තෙමේ (නිවන් නමැති) ගොඩබිම සිටී. කය ... මහණෙනි මිනිසාගේ සිත මුහුදෙකි. එහි දහම්මුවා වේගය වේ. යමෙක් ඒ දහම්මුවා වෙගය ඉවසා නම්, මහණෙනි මේ තෙමේ රළ සහිත සුළි සහිත සැඩමසුන් සහිත රකුසන් සහිත සිත නමැති මුහුද තරණය කෙළේ ය යි කියනු ලැබේ. (චතුරොඝය) තරණය කළ පරතෙරට පැමිණි ඒ බමුණු තෙමේ (නිවන් නමැති) ගොඩබිම සිටියි.

යමෙක් සැඩමසුන් සහිත රකුසන් සහිත රළබිය සහිත තරණය කිරීමට අපහසු මේ මුහුද තරණය කෙළේ නම් හෙතෙමේ මගනැණින් නිවන් අවබෝධ කෙළේ වැස නිම වූ බඹසර ඇතියේ ලොව කෙළවරට ගියේ නිවන් නමැති පරතෙරට පැමිණියේ ය යි කියනු ලැබේ යි.

## 1. 18. 2

## දුතිය සමුද්ද සූත්‍රය

229. මහණෙනි අශ්‍රැතවත් පුහුදුන් තෙමේ මුහුද මුහුද යි කිය යි. මහණෙනි මෙය බුදුසස්නෙහි මුහුද නො වේ. මහණෙනි මේ මහ දියරැසෙකි. මහදියකඳෙකි. මහණෙනි, ඉටු කැමති මනවඩන පියදෑ වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු ඇසින් දතයුතු රූ ඇත. මහණෙනි මෙය බුදුසස්නෙහි මුහුද යි කියනු ලැබේ.

එත්ථායං සදෙවකො ලොකො සමාරකො සබ්‍රහ්මකො සස්සමණ බ්‍රාහ්මණී පජා සදෙවමනුස්සා යෙභුය්‍යෙන සමුන්නා[1] තන්තා[2]කුලකජාතා ගුළාගුණ්ඨිකජාතා[3] මුඤ්ජබබ්බජභූතා අපායං දුග්ගතිං විනිපාතං සංසාරං නාතිවත්තන්තීති.

සන්ති භික්ඛවෙ සොතවිඤ්ඤෙය්‍යා සද්දා -පෙ- සන්ති භික්ඛවෙ ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- සන්ති භික්ඛවෙ ජිව්හා විඤ්ඤෙය්‍යා රසා -පෙ- සන්ති භික්ඛවෙ කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා -පෙ- සන්ති භික්ඛවෙ මනොවිඤ්ඤෙය්‍යා ධම්මා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූප සංහිතා රජනීයා. අයං වුච්චති භික්ඛවෙ අරියස්ස විනයෙ සමුද්දො එත්ථායං සදෙවකො ලොකො සමාරකො සබ්‍රහ්මකො සස්සමණ බ්‍රාහ්මණීපජා සදෙවමනුස්සා යෙභුය්‍යෙන සමුන්නා තන්තාකුලකජාතා ගුළාගුණ්ඨිකජාතා මුඤ්ජබබ්බජභූතා අපායං දුග්ගතිං විනිපාතං සංසාරං නාතිවත්තන්ති.

යස්ස රාගො ච දොසො ච අවිජ්ජා ච විරාජිතා සො ඉමං සමුද්දං සගාහං සරක්ඛසං සඌම්භයං දුත්තරං[4] අච්චතරි.

සඞ්ගාතිගො මච්චුජහො නිරූපධි
පහාසි දුක්ඛං අපුනබ්භවාය
අත්ථංගතො සො න පමාණමෙති[5]
අමොහයී මච්චුරාජන්ති බ්‍රූමීති.

## 1. 18. 3

### බාළිසිකොපමසුත්තං

230. සෙය්‍යථාපි භික්ඛවෙ බාළිසිකො ආමිසගතං බළිසං ගම්භීරෙ උදකරහදෙ පක්ඛිපෙය්‍ය, තමෙනං අඤ්ඤතරො ආමිසචක්ඛු මච්ඡො ගිලෙය්‍ය; එවං හි සො භික්ඛවෙ මච්ඡො ගිලිතබළිසො[6] බාළිසිකස්ස අනයං ආපන්නො ව්‍යසනං ආපන්නො යථාකාමකරණීයො බාළිසිකස්ස. එවමෙව ඛො භික්ඛවෙ ඡයිමෙ බළිසා ලොකස්මිං අනයාය සත්තානං, ව්‍යාබාධාය[7] පාණීනං. කතමෙ ඡ;

සන්ති භික්ඛවෙ චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, තඤ්චෙ භික්ඛු අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨති, අයං වුච්චති භික්ඛවෙ භික්ඛු ගිලිතබළිසො මාරස්ස අනයං ආපන්නො ව්‍යසනං ආපන්නො යථාකාමකරණීයො පාපිමතො. සන්ති භික්ඛවෙ සොතවිඤ්ඤෙය්‍යා සද්දා -පෙ- සන්ති භික්ඛවෙ ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- සන්ති භික්ඛවෙ ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා

1. සමුද්දා – ස්‍යා.
2. කන්තා – ස්‍යා:
3. කුලගණ්ඨිකජාතා – මජ්ඣං.
4. ස උම්මිභයං සුදුත්තරං – ස්‍යා
5. නප්පුනෙති – මජ්ඣං
6. ගිලිබළිසො – ස්‍යා.
7. වධාය – මජ්ඣං, ස්‍යා:

මෙහි දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත මේ ලෝ වැසියා මහණබමුණන් සහිත ! දෙව්මිනිසුන් සහිත ප්‍රජාව බොහෝ සෙයින් ගිලුණි අවුල් වූ හුවටක් වැනි වූවා කුරුලු කැදැල්ලක් වැනි වූවා මුදුතණ බබුස්තණ වැනි සැපයෙන් තොර නපුරු ගති ඇති විවස ව පතිතවන සසර නො ඉක්මවයි.

මහණෙනි කනින් දතයුතු සද ... ඇත .. මහණෙනි නැහැයෙන් දතයුතු ගඳ ඇත ... මහණෙනි දිවෙන් දත යුතු රස ඇත ... මහණෙනි කයින් දතයුතු පහස් ඇත ... මහණෙනි ඉටු කැමති මනවඩන පියදැ වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු සිතින් දත යුතු දහම් ඇත. මහණෙනි බුදුසස්නෙහි මේ මුහුද යි කියනු ලැබේ. මෙහි දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත මේ ලෝ වැසියා මහණබමුණන් සහිත දෙව්මිනිසුන් සහිත ප්‍රජාව බෙහෙවින් ගිලුණි අවුල් වූ හුවටක් වැනි වූවා කුරුලු කැදැල්ලක් වැනි වූවා මුදු තණ බබුස්තණ වැනි වූවා සැපයෙන් තොර නපුරු ගති ඇති විවස ව පතිතවන සසර නො ඉක්මව යි.

යමකු විසින් රාගයත් ද්වේෂයත් මෝහයත් දුරු කරන ලද්දහු නම් හෙතෙමේ සැඩමසුන් සහිත රකුසන් සහිත රළබිය සහිත තරණය කිරීමට අපහසු මේ මුහුද මැනවින් තරණය කෙළේ ය.

ඇලුම් ඉක්ම වූ මරුන් දුරු කළ උපධි රහිත හෙතෙමේ නැවත නො ඉපැද්ම පිණිස දුක දුරු කෙළේ ය. අස්තයට ගියේ ප්‍රමාණත්වයට නො එයි. මරුරජ මුළා කෙළේ ය යි කියම් යි.

## 1. 18. 3

## බාලිසිකොපම සූත්‍රය

230. මහණෙනි යම් සේ බිලී වැද්දෙක් ඇම සහිත බිලිය ගැඹුරු දියවිලක බහාලන්නේ ද, ඒ මේ බිලිය ඇමට යොමු වූ ඇස් ඇති එක්තරා මසෙක් ගිලින්නේ ය. මහණෙනි මෙසේ ඒ මසු බිලී වැද්දගේ ගිලි බිලිය ඇත්තේ දුකට පැමිණියේ විපතට පැමිණියේ බිලී වැද්ද විසින් කැමති පරිදි කළහැක්කෙක් වන්නේ ය. මහණෙනි එසෙයින් ම ලොව සතුන්ට දුක් පිණිස ප්‍රාණීන්ට පීඩා පිණිස මේ බිලී සයෙක් වේ. කවර සයෙක් ද යත්;

මහණෙනි ඉෂ්ට වූ කාන්ත වූ මනවඩන ප්‍රිය ස්වරූප වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු ඇසින් දතයුතු රූ ඇත. ඉදින් මහණ තෙමේ එය පතා ද, ගුණ කියා ද, ගැලී සිටී ද, මහණෙනි මේ මහණ තෙමේ මරුහුගේ ගිලි බිලිය ඇත්තේ ය යි කියනු ලැබේ. මහණෙනි කනින් දතයුතු සද ඇත. ... මහණෙනි නැහැයෙන් දතයුතු ගඳ ඇත ... මහණෙනි දිවෙන් දතයුතු රස ඇත.

-පෙ- සන්ති භික්ඛවෙ කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා -පෙ- සන්ති භික්ඛවෙ මනොවිඤ්ඤෙය්‍යා ධම්මා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, තඤ්චෙ භික්ඛු අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨති අයං වුච්චති භික්ඛවෙ භික්ඛු ගිලිතබළිසො මාරස්ස අනයං ආපන්නො ව්‍යසනං ආපන්නො යථාකාමකරණීයො පාපිමතො.

සන්ති ච භික්ඛවෙ[1] චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, තඤ්චෙ භික්ඛු නාභිනන්දති නාභිවදති නාජ්ඣොසාය තිට්ඨති, අයං වුච්චති භික්ඛවෙ භික්ඛු න ගිලිතබළිසො මාරස්ස, අභෙදි බළිසං; න අනයං ආපන්නො, න ව්‍යසනං ආපන්නො, න යථාකාමකරණීයො පාපිමතො.

සන්ති භික්ඛවෙ සොතවිඤ්ඤෙය්‍යා සද්දා -පෙ- සන්ති භික්ඛවෙ ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- සන්ති භික්ඛවෙ ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- සන්ති භික්ඛවෙ කාය විඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා -පෙ- සන්ති භික්ඛවෙ මනොවිඤ්ඤෙය්‍යා ධම්මා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, තඤ්චෙ භික්ඛු නාභිනන්දති නාභිවදති නාජ්ඣොසාය තිට්ඨති, අයං වුච්චති භික්ඛවෙ භික්ඛු න ගිලිතබළිසො මාරස්ස, අභෙදි බළිසං, න අනයං ආපන්නො, න ව්‍යසනං ආපන්නො, න යථාකාමකරණීයො පාපිමතොති.

## 1. 18. 4

## ඛීරරුක්ඛොපමසුත්තං

231. යස්ස කස්සචි භික්ඛවෙ භික්ඛුස්ස වා භික්ඛුනියා වා චක්ඛුවිඤ්ඤෙය්‍යෙසු රූපෙසු යො රාගො සො අත්ථි, යො දොසො සො අත්ථි, යො මොහො සො අත්ථි, යො රාගො සො අප්පහීනො, යො දොසො සො අප්පහීනො, යො මොහො සො අප්පහීනො; තස්ස පරිත්තා චෙපි චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා චක්ඛුස්ස ආපාථං ආගච්ඡන්ති, පරියාදියන්තෙවස්ස චිත්තං, කො පන වාදො අධිමත්තානං. තං කිස්ස හෙතු? යො භික්ඛවෙ රාගො සො අත්ථි, යො දොසො සො අත්ථි, යො මොහො සො අත්ථි; යො රාගො සො අප්පහීනො, යො දොසො සො අප්පහීනො, යො මොහො සො අප්පහීනො; -පෙ-

1. සන්ති භික්ඛවෙ - සී 1, ස්‍යා.

... මහණෙනි කයින් දතයුතු පහස් ඇත ... මහණෙනි ඉටු කැමති මනවඩන ප්‍රිය ස්වරූප වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු සිතින් දතයුතු දහම් ඇත. ඉදින් මහණ එය පතා ද ගුණ කියා ද ගැලී සිටී ද, මහණෙනි මේ මහණ මරුගේ ගිලි බිලිය ඇත්තේ දුකට පැමිණියේ විපතට පැමිණියේ මරහු විසින් කැමති පරිදි කළහැක්කේ ය යි කියනු ලැබේ.

මහණෙනි ඉෂ්ට වූ කාන්ත වූ මනවඩන ප්‍රිය ස්වරූප වූ කාම-යෙන් යුත් ඇලුම් කටයුතු ඇසින් දතයුතු රූ ඇත. ඉදින් මහණ තෙමේ එය නො පතා ද ගුණ නො කියා ද ගැලී නො සිටී ද, මහණෙනි මේ මහණ තෙමේ මරහුගේ නොගිලි බිලිය ඇත්තේ බිලිය බින්දේ ය. දුකට නො පැමිණියේ විපතට නො පැමිණියේ මරහු විසින් කැමති පරිදි නොකට හැක්කේ ය යි කියනු ලැබේ.

මහණෙනි කනින් දතයුතු සද ඇත ... මහණෙනි නැහැයෙන් දතයුතු ගඳ ඇත ... මහණෙනි, දිවෙන් දතයුතු රස ඇත ... මහණෙනි කයින් දතයුතු පහස් ඇත. ... මහණෙනි ඉෂ්ට වූ කාන්ත වූ මනවඩන ප්‍රිය ස්වරූප වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු සිතින් දතයුතු දහම් ඇත. ඉදින් මහණ තෙමේ එය නො පතා ද ගුණ නො කියා ද ගැලී නො සිටී ද, මහණෙනි මේ මහණ මරුගේ නො ගිලි බිලිය ඇත්තේ බිලිය බින්දේ ය. දුකට නො පැමිණියේ විපතට නො පැමිණියේ මරහු විසින් කැමති පරිදි නොකළ හැක්කේ ය යි කියනු ලැබේ යි.

## 1. 18. 4

## ඛීරරුක්ඛොපම සූත්‍රය

231. මහණෙනි යම්කිසි මහණකුට හෝ මෙහෙණකට හෝ ඇසින් දතයුතු රූහි යම් රාගයෙක් වේ නම් එය ඇද්ද, යම් ද්වේෂයෙක් වේ නම් එය ඇද්ද, යම් මෝහයෙක් වේ නම් එය ඇද්ද, යම් රාගයෙක් වේ නම් එය පහ නොවූයේ ද, යම් ද්වේෂයෙක් වේ නම් එය පහ නොවූයේ ද, යම් මෝහයෙක් වේ නම් එය පහ නොවූයේ ද, ඉදින් මද (අනිටු) වූ ද ඇසින් දතයුතු රූ ඔහුගේ ඇස් හමුවට පැමිණේ නම් ඔහුගේ සිත හාත්පසින් මැඩගනී ම ය. ඉතා මහත් (ඉටු) රූ ගැන කවර කථා ද. ඒ කවර හෙයින යත්: මහණෙනි යම් රාගයෙක් වේ නම් එය ඇත. යම් ද්වේෂයෙක් වේ නම් එය ඇත. යම් මෝහයෙක් වේ නම් එය ඇත. යම් රාගයෙක් වේ නම් එය අප්‍රහීණය. යම් ද්වේෂයෙක් වේ නම් එය අප්‍රහීණ ය. යම් මෝහයෙක් වේ නම් එය අප්‍රහීණ වේ.

යස්ස කස්සචි භික්ඛවෙ භික්ඛුස්ස වා භික්ඛුනියා වා මනොවිඤ්ඤෙය්‍යෙසු ධම්මෙසු යො රාගො සො අත්ථි, යො දොසො සො අත්ථි, යො මොහො සො අත්ථි; යො රාගො සො අප්පහීනො, යො දොසො සො අප්පහීනො, යො මොහො සො අප්පහීනො; තස්ස පරිත්තා චෙපි මනො විඤ්ඤෙය්‍යා ධම්මා මනස්ස ආපාථං ආගච්ඡන්ති පරියාදියන්තෙවාස්ස චිත්තං, කො පන වාදො අධිමත්තානං. තං කිස්ස හෙතු? යො භික්ඛවෙ රාගො සො අත්ථි, යො දොසො සො අත්ථි, යො මොහො සො අත්ථි; යො රාගො සො අප්පහීනො, යො දොසො සො අප්පහීනො, යො මොහො සො අප්පහීනො.

සෙය්‍යථාපි භික්ඛවෙ ඛීරරුක්ඛො, අස්සත්ථො වා නිග්‍රොධො වා පිලක්ඛො[1] වා උදුම්බරො වා දහරො තරුණො කොමාරකො, තමෙනං පුරිසො තිණ්හාය කුඨාරියා යතො යතො[2] ආභින්දෙය්‍ය,[3] ආගච්ඡෙය්‍ය ඛීරන්ති. එවම්භන්තෙ. තං කිස්ස හෙතු: යං හි භන්තෙ ඛීරං තං අත්ථීති. එවමෙව ඛො භික්ඛවෙ යස්ස කස්සචි භික්ඛුස්ස වා භික්ඛුනියා වා චක්ඛුවිඤ්ඤෙය්‍යෙසු රූපෙසු යො රාගො සො අත්ථි, යො දොසො සො අත්ථි, යො මොහො සො අත්ථි; යො රාගො සො අප්පහීනො යො දොසො සො අප්පහීනො, යො මොහො සො අප්පහීනො; තස්ස පරිත්තා චෙපි චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා චක්ඛුස්ස ආපාථං ආගච්ඡන්ති, පරියාදියන්තෙවාස්ස චිත්තං. කො පන වාදො අධිමත්තානං තං කිස්ස හෙතු: යො රාගො සො අත්ථි, යො දොසො සො අත්ථි, යො මොහො සො අත්ථි, යො රාගො සො අප්පහීනො, යො දොසො සො අප්පහීනො, යො මොහො සො අප්පහීනො -පෙ-

යස්ස කස්සචි භික්ඛවෙ භික්ඛුස්ස වා භික්ඛුනියා වා ජිව්හා විඤ්ඤෙය්‍යෙසු රසෙසු යො රාගො සො අත්ථි -පෙ- යස්ස කස්සචි භික්ඛවෙ භික්ඛුස්ස වා භික්ඛුනියා වා මනො විඤ්ඤෙය්‍යෙසු ධම්මෙසු යො රාගො සො අත්ථි, යො දොසො සො අත්ථි, යො මොහො සො අත්ථි; යො රාගො සො අප්පහීනො, යො දොසො සො අප්පහීනො යො මොහො සො අප්පහීනො, තස්ස පරිත්තා චෙපි මනො විඤ්ඤෙය්‍යා ධම්මා මනස්ස ආපාථං ආගච්ඡන්ති, පරියාදියන්තෙවාස්සචිත්තං. කො පන වාදො අධිමත්තානං. තං කිස්ස හෙතු: යො රාගො සො අත්ථි, යො දොසො සො අත්ථි, යො මොහො සො අත්ථි; යො රාගො සො අප්පහීනො, යො දොසො සො අප්පහීනො යො මොහො සො අප්පහීනො.

1. පිලක්ඛු - ස්‍යා.
2. අතො යතො - සීමු
3. භින්දෙය්‍ය (අට්ඨකථා)

මහණෙනි, යම් කිසි මහණකුට හෝ මෙහෙණකට හෝ සිතින් දතයුතු දහම්හි යම් රාගයෙක් වේ නම් එය ඇද් ද, යම් දෙසයෙක් වේ නම් එය ඇද් ද, යම් මෝහයෙක් වේ නම් එය ඇද් ද, යම් රාගයෙක් වේ නම් එය අප්‍රහීණ ද, යම් දෙසයෙක් වේ නම් එය අප්‍රහීණ ද, යම් මෝහයෙක් වේ නම් එය අප්‍රහීණ ද; ඉදින් මඳ වූ ද සිතින් දත යුතු දහම් ඔහුගේ සිත හමුවට පැමිණේ නම් ඔහුගේ සිත හාත්පසින් මැඩගනීම ය. ඉතා මහත් දහම් ගැන කවර කතා ද? ඒ කවර හෙයින යත්: මහණෙනි යම් රාගයෙක් වේ නම් එය ඇත. යම් දේසයෙක් වේ නම් එය ඇත. යම් මෝහයෙක් වේ නම් එය ඇත. යම් රාගයෙක් වේ නම් එය අප්‍රහීණය. යම් දේසයෙක් වේ නම් එය අප්‍රහීණය, යම් මෝහයෙක් වේ නම් එය අප්‍රහීණ ය.

මහණෙනි, යම් සේ ළපටි තරුණ කුඩා ඇසතු හෝ නුග හෝ පුලිල හෝ දිඹුල් හෝ කිරිගසෙක් වේ ද, පුරුෂයෙක් ඒ මේ ගස තියුණු කෙටේරියකින් යම් යම් තැනකින් සිඳින්නේ නම් කිරි වැගිරෙන්නේ වේ ද යි. වහන්ස එසේ ය. ඒ කවර හෙයින් ද? වහන්ස යම් කිරක් වේ නම් එය ඇතැ යි. මහණෙනි එසෙයින් ම යම් කිසි මහණකුට හෝ මෙහෙණකට හෝ ඇසින් දත යුතු රූහි යම් රාගයෙක් වේ නම් එය ඇද්ද, යම් දෙසයෙක් වේ නම් එය ඇද්ද, යම් මෝහයෙක් වේ නම් එය ඇද්ද, යම් රාගයෙක් වේ නම් එය අප්‍රහීණ ද, යම් දේසයෙක් වේ නම් එය අප්‍රහීණ ද, යම් මෝහයෙක් වේ නම් එය අප්‍රහීණ ද ඉදින් මඳ වූ ද ඇසින් දත යුතු රූ ඔහුගේ ඇස් හමුවට පැමිණේ නම් ඔහුගේ සිත හාත්පසින් මැඩගනී මැ යි. ඉතා මහත් රූ ගැන කවර කතා ද? ඒ කවර හෙයින යත්: යම් රාගයෙක් වේ නම් එය ඇත. යම් දේසයෙක් වේ නම් එය ඇත. යම් මෝහයෙක් වේ නම් එය ඇත. යම් රාගයෙක් වේ නම් එය අප්‍රහීණ ය. යම් දේසයෙක් වේ නම් එය අප්‍රහීණ ය. යම් මෝහයෙක් වේ නම් එය අප්‍රහීණ ය ...

මහණෙනි, යම්කිසි මහණකුට හෝ මෙහෙණකට හෝ දිවින් දතයුතු රසයන්හි යම් රාගයෙක් වේ නම් එය ඇද්ද .. මහණෙනි යම් කිසි මහණකුට හෝ මෙහෙණකට හෝ සිතින් දතයුතු දහම්හි යම් රාගයෙක් වේ නම් එය ඇද්ද, යම් දෙසයෙක් වේ නම් එය ඇද්ද, යම් මෝහයෙක් වේ නම් එය ඇද්ද, යම් රාගයෙක් වේ නම් එය අප්‍රහීණ ද, යම් දේසයෙක් වේ නම් එය අප්‍රහීණ ද, යම් මෝහයෙක් වේ නම් එය අප්‍රහීණ ද, ඉදින් මඳ වූ ද සිතින් දතයුතු දහම් ඔහුගේ සිත්හමුවට පැමිණේ නම් ඔහුගේ සිත හාත් පසින් මැඩගනී මැ යි. ඉතාමහත් දහම් ගැන කවර කථා ද? ඒ කවර හෙයින යත්: යම් රාගයෙක් වේ නම් එය ඇත. යම් දේසයෙක් වේ නම් එය ඇත. යම් මෝහයෙක් වේ නම් එය ඇත. යම් රාගයෙක් වේ නම් එය අප්‍රහීණ ය. යම් දේසයෙක් වේ නම් එය අප්‍රහීණ ය. යම් මෝහයෙක් වේ නම් එය අප්‍රහීණ ය.

යස්ස කස්සචි භික්ඛවෙ භික්ඛුස්ස වා භික්ඛුනියා වා චක්ඛුවිඤ්ඤෙය්‍යෙසු රූපෙසු යො රාගො සො නත්ථි, යො දොසො සො නත්ථි, යො මොහො සො නත්ථි; යො රාගො සො පහීනො යො දොසො සො පහීනො, යො මොහො සො පහීනො, තස්ස අධිමත්තා චෙපි චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා චක්ඛුස්ස ආපාථං ආගච්ඡන්ති, නෙවස්ස චිත්තං පරියාදියන්ති, කො පන වාදෙ පරිත්තානං. තං කිස්ස හෙතු: යො භික්ඛවෙ රාගො සො නත්ථි. යො දොසො සො නත්ථි, යො මොහො සො නත්ථි; යො රාගො සො පහීනො, යො දොසො සො පහීනො, යො මොහො සො පහීනො -පෙ-

යස්ස කස්සචි භික්ඛවෙ භික්ඛුස්ස වා භික්ඛුනියා වා ජිව්හාවිඤ්ඤෙය්‍යෙසු රසෙසු -පෙ- යස්ස කස්සචි භික්ඛවෙ භික්ඛුස්ස වා භික්ඛුනියා වා මනොවිඤ්ඤෙය්‍යෙසු ධම්මෙසු යො රාගො සො නත්ථි, යො දොසො සො නත්ථි, යො මොහො සො නත්ථි, යො රාගො සො පහීනො යො දොසො සො පහීනො, යො මොහො සො පහීනො; තස්ස අධිමත්තා චෙපි මනොවිඤ්ඤෙය්‍යා ධම්මා මනස්ස ආපාථං ආගච්ඡන්ති, නෙවස්ස චිත්තං පරියාදියන්ති, කො පන වාදෙ පරිත්තානං. තං කිස්ස හෙතු: යො භික්ඛවෙ රාගො සො නත්ථි, යො දොසො සො නත්ථි සො මොහො සො නත්ථි යො රාගො සො පහීනො, යො දොසො සො පහීනො, යො මොහො සො පහීනො.

සෙය්‍යථාපි භික්ඛවෙ ඛීරරුක්ඛො අස්සත්ථො වා නිග්‍රොධො වා පිලක්ඛො වා උදුම්බරො වා සුක්ඛො කොලාපො තෙරොවස්සිකො, තමෙනං පුරිසො තිණ්හාය කුඨාරියා යතො යතො ආභින්දෙය්‍ය, ආගච්ඡෙය්‍ය ඛීරන්ති. නො හෙතං භන්තෙ. තං කිස්ස හෙතු: යං හි භන්තෙ ඛීරං තං නත්ථීති. එවමෙව ඛො භික්ඛවෙ යස්ස කස්සචි භික්ඛුස්ස වා භික්ඛුනියා වා චක්ඛුවිඤ්ඤෙය්‍යෙසු රූපෙසු යො රාගො සො නත්ථි, යො දොසො සො නත්ථි, යො මොහො සො නත්ථි; යො රාගො සො පහීනො, යො දොසො සො පහීනො යො මොහො සො පහීනො; තස්ස අධිමත්තා චෙපි චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා චක්ඛුස්ස ආපාථං ආගච්ඡන්ති, නෙවස්ස චිත්තං පරියාදියන්ති, කො පන වාදෙ පරිත්තානං. තං කිස්ස හෙතු: යො රාගො සො නත්ථි, යො දොසො සො නත්ථි, යො මොහො සො නත්ථි, යො රාගො සො පහීනො, යො දොසො සො පහීනො යො මොහො සො පහීනො -පෙ-

මහණෙනි යම් කිසි මහණකුට හෝ මෙහෙණකට හෝ ඇසින් දතයුතු රූහි යම් රාගයෙක් වී නම් එය නැද්ද, යම් ද්වේසයෙක් වී නම් එය නැද්ද, යම් මෝහයෙක් වී නම් එය නැද්ද, යම් රාගයෙක් වී නම් එය ප්‍රහීණ ද, යම් ද්වේසයෙක් වී නම් එය ප්‍රහීණ ද, යම් මෝහයෙක් වී නම් එය ප්‍රහීණ ද, ඉදින් ඉතාමහත් වූ ද ඇසින් දතයුතු රූ ඔහුගේ ඇස් හමුවට පැමිණේ නම් ඔහුගේ සිත නො ම හාත්පසින් මැඩගනී මඳ රූ ගැන කවර කථා ද. ඒ කවර හෙයින යත්: මහණෙනි යම් රාගයෙක් වී නම් එය නැත. යම් දෙසයෙක් වී නම් එය නැත. යම් මෝහයෙක් වී නම් එය නැත. යම් රාගයෙක් වී නම් එය ප්‍රහීණ ය. යම් දෙසයෙක් වී නම් එය ප්‍රහීණ ය. යම් මෝහයෙක් වී නම් එය ප්‍රහීණ ය ... මහණෙනි යම් කිසි මහණකුට හෝ මෙහෙණකට හෝ දිවින් දතයුතු රසයන්හි ...

මහණෙනි යම් කිසි මහණකුට හෝ මෙහෙණකට හෝ සිතින් දතයුතු දහම්හි යම් රාගයෙක් වී නම් එය නැද්ද, යම් දෙසයෙක් වී නම් එය නැද්ද, යම් මෝහයෙක් වී නම් එය නැද්ද, යම් රාගයෙක් වී නම් එය ප්‍රහීණ ද, යම් දෙසයෙක් වී නම් එය ප්‍රහීණ ද, යම් මෝහයෙක් වී නම් එය ප්‍රහීණ ද, ඉදින් ඉතා මහත් වූ ද සිතින් දතයුතු දහම් ඔහුගේ සිත්හමුවට පැමිණේ නම් ඔහුගේ සිත නො ම හාත්පසින් මැඩගනී. මඳ දහම් ගැන කවර කථා ද. ඒ කවර හෙයින යත්: මහණෙනි යම් රාගයෙක් වී නම් එය නැත. යම් දෙසයෙක් වී නම් එය නැත. යම් මෝහයෙක් වී නම් එය නැත. යම් රාගයෙක් වී නම් එය ප්‍රහීණ ය. යම් දෙසයෙක් වී නම් එය ප්‍රහීණ ය. යම් මෝහයෙක් වී නම් එය ප්‍රහීණ ය.

මහණෙනි යම් සේ වියලුණු කොළ හැලුණු බොහෝ වස් ගණනක් ඉක්මුණු ඇසතු හෝ නුග හෝ පුලිල හෝ දිඹුල් හෝ කිරිරුකෙක් වේ ද, පුරුෂයෙක් ඒ මේ රුක තියුණු කෙටේරියකින් යම් යම් තැනෙකින් සිඳින්නේ නම් කිරිවැගිරෙන්නේ දැ යි. වහන්ස, මෙය නො වේ මය. ඒ කවර හෙයින් ද? වහන්ස, යම් කිරෙක් වී නම් එය නැතැ යි. මහණෙනි එසෙයින් ම යම් කිසි මහණකුට හෝ මෙහෙණකට හෝ ඇසින් දතයුතු රූහි යම් රාගයෙක් වී නම් එය නැද්ද, යම් දෙසයෙක් වී නම් එය නැද්ද, යම් මොහයෙක් වී නම් එය නැද්ද, යම් රාගයෙක් වී නම් එය ප්‍රහීණ ද, යම් ද්වේසයෙක් වී නම් එය ප්‍රහීණ ද, යම් මෝහයෙක් වී නම් එය ප්‍රහීණ ද, ඉදින් ඉතාමහත් වූ ද ඇසින් දත යුතු රූ ඔහුගේ ඇස්හමුවට පැමිණේ නම් ඔහුගේ සිත නො ම හාත්පසින් මැඩගනී. මඳ රූ ගැන කවර කථා ද. ඒ කවර හෙයින යත්: යම් රාගයෙක් වී නම් එය නැත. යම් ද්වේසයෙක් වී නම් එය නැත. යම් මෝහයෙක් වී නම් එය නැත. යම් රාගයෙක් වී නම් එය ප්‍රහීණ ය. යම් ද්වේසයෙක් වී නම් එය ප්‍රහීණ ය. යම් මෝහයෙක් වී නම් එය ප්‍රහීණ ය ...

යස්ස කස්සචි භික්ඛවෙ භික්ඛුස්ස වා භික්ඛුනියා වා ජිව්හා විඤ්ඤෙය්‍යෙසු රසෙසු -පෙ- යස්ස කස්සචි භික්ඛවෙ භික්ඛුස්ස වා භික්ඛුනියා වා මනො විඤ්ඤෙය්‍යෙසු ධම්මෙසු යො රාගො සො නත්ථි, යො දොසො සො නත්ථි, යො මොහො සො නත්ථි, යො රාගො සො පහීනො, යො දොසො සො පහීනො, යො මොහො සො පහීනො, තස්ස අධිමත්තා චෙපි මනොවිඤ්ඤෙය්‍යා ධම්මා මනස්ස ආපාථං ආගච්ඡන්ති, නෙවස්ස චිත්තං පරියාදියන්ති, කො පන වාදො පරිත්තානං. තං කිස්ස හෙතු: යො රාගො සො නත්ථි, යො දොසො සො නත්ථි, යො මොහො සො නත්ථි, යො රාගො සො පහීනො, යො දොසො සො පහීනො, යො මොහො සො පහීනොති.

## 1. 18. 5

## කොට්ඨිතසුත්තං

232. එකං සමයං ආයස්මා **සාරිපුත්තො** ආයස්මා ච **මහාකොට්ඨිතො බාරාණසියං** විහරන්ති **ඉසිපතනෙ මිගදායෙ**. අථ ඛො ආයස්මා මහාකොට්ඨිතො සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙනායස්මා සාරිපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා සාරිපුත්තෙන සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරාණීයං වීති-සාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා මහාකොට්ඨිතො ආයස්මන්තං සාරිපුත්තං එතදවොච:

කින්නු ඛො ආවුසො සාරිපුත්ත චක්ඛු රූපානං සඤ්ඤොජනං රූපා චක්ඛුස්ස සඤ්ඤොජනං, සොතං සද්දානං සඤ්ඤොජනං සද්දා සොතස්ස සඤ්ඤොජනං, ඝානං ගන්ධානං සඤ්ඤොජනං ගන්ධා ඝානස්ස සඤ්ඤොජනං, ජිව්හා රසානං සඤ්ඤොජනං රසා ජිව්හාය සඤ්ඤොජනං, කායො ඵොට්ඨබ්බානං සඤ්ඤොජනං ඵොට්ඨබ්බා කායස්ස සඤ්ඤොජනං, මනො ධම්මානං සඤ්ඤොජනං, ධම්මා මනස්ස සඤ්ඤොජනන්ති?

න ඛො ආවුසො කොට්ඨිත, චක්ඛු රූපානං සඤ්ඤොජනං, න රූපා චක්ඛුස්ස සඤ්ඤොජනං. යඤ්ච තත්ථ තදුභයං පටිච්ච උප්පජ්ජති ඡන්දරාගො තං තත්ථ සඤ්ඤොජනං -පෙ- න ජිව්හා රසානං සඤ්ඤොජනං, න රසා ජිව්හාය සඤ්ඤොජනං. යඤ්ච තත්ථ තදුභයං පටිච්ච උප්පජ්ජති ඡන්දරාගො තං තත්ථ සඤ්ඤොජනං -පෙ- න මනො ධම්මානං සඤ්ඤොජනං, න ධම්මා මනස්ස සඤ්ඤොජනං. යඤ්ච තත්ථ තදුභයං පටිච්ච උප්පජ්ජති ඡන්දරාගො තං තත්ථ සඤ්ඤොජනං.

මහණෙනි යම් කිසි මහණකුට හෝ මෙහෙණකට හෝ දිවින් දතයුතු රසයන්හි ... මහණෙනි යම් කිසි මහණකුට හෝ මෙහෙණකට හෝ සිතින් දතයුතු දහම්හි යම් රාගයෙක් වී නම් එය නැද්ද, යම් ද්වේෂයෙක් වී නම් එය නැද්ද, යම් මෝහයෙක් වී නම් එය නැද්ද, යම් රාගයෙක් වී නම් එය ප්‍රහීණ ද, යම් ද්වේෂයෙක් වී නම් එය ප්‍රහීණ ද, යම් මෝහයෙක් වී නම් එය ප්‍රහීණ ද, ඉදින් ඉතාමහත් වූ ද සිතින් දතයුතු දහම් ඔහුගේ සිත් හමුවට පැමිණේ නම් ඔහුගේ සිත නො ම හාත්පසින් මැඩගනී. මදදහම් ගැන කවර කථා ද. ඒ කවර හෙයින යත්: යම් රාගයෙක් වී නම් එය නැත. යම් ද්වේෂයෙක් වී නම් එය නැත. යම් මෝහයෙක් වී නම් එය නැත. යම් රාගයෙක් වී නම් එය ප්‍රහීණ ය. යම් ද්වේෂයෙක් වී නම් එය ප්‍රහීණ ය. යම් මෝහයෙක් වී නම් එය ප්‍රහීණ ය යි.

## 1. 18. 5

## කොට්ඨිත සූත්‍රය

232. එක්කලෙක ආයුෂ්මත් **ශාරිපුත්‍ර** තෙරණුවෝත් ආයුෂ්මත් **මහාකොට්ඨිත** තෙරණුවෝත් **බරණැස** සමීපයෙහි **මිගදය** නම් වූ **ඉසිපතනාරාමයෙහි** වැඩවෙසෙති. එකල්හි ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවෝ සවස්කල විවේකයෙන් නැගී සිටී සේක් ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් වෙත එළඹියහ. එළඹ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් සමග සතුටු වූහ. සතුටු විය යුතු සිහි කටයුතු කතාව කොට නිමවා එකත්පස් ව වැඩහුන්හ. එකත්පස්ව වැඩහුන් ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවෝ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට මෙය කීහ:

ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, කිමෙක් ද, ඇස රූනට සංයෝජන ද, රූ ඇසට සංයෝජන ද? කන සදනට සංයෝජන ද සදහු කනට සංයෝජන ද? නැහැය ගඳනට සංයෝජන ද? ගඳහු නැහැයට සංයෝජන ද? දිව රසයනට සංයෝජන ද, රස දිවට සංයෝජන ද? කය පහස්නට සංයෝජන ද, පහස්හු කයට සංයෝජන ද? සිත දහමුන්ට සංයෝජන ද, දහම් සිතට සංයෝජන දැ යි.

ඇවැත්නි කොට්ඨිතයෙනි, ඇස රූනට සංයෝජන නො වේ. රූ ඇසට සංයෝජන නො වේ. එහි එදෙක නිසා යම් ඡන්දරාගයෙක් උපදී නම් එය එහි සංයෝජන යි ... දිව රසයනට සංයෝජන නො වේ. රස දිවට සංයෝජන නො වේ. එහි එදෙක නිසා යම් ඡන්දරාගයෙක් උපදී නම් එය එහි සංයෝජන යි ... සිත දහමුන්ට සංයෝජන නො වේ. දහම් සිතට සංයොජන නො වේ. එහි එදෙක නිසා යම් ඡන්දරාගයෙක් උපදී නම් එය එහි සංයෝජන යි.

සෙය්‍යථාපි ආවුසො කාළො ච බලිවද්දො[1] ඔදාතො ච බලිවද්දො එකෙන දාමෙන වා යොත්තෙන වා සංයුත්තා අස්සු, යො නු ඛො එවං වදෙය්‍ය: කාළො බලිවද්දො ඔදාතස්ස බලිවද්දස්ස සඤ්ඤොජනං, ඔදාතො බලිවද්දො කාළස්ස බලිවද්දස්ස සඤ්ඤොජනන්ති. සම්මා නු ඛො සො වදමානො වදෙය්‍යාති. නො හෙතං ආවුසො. න ඛො ආවුසො කාළො බලිවද්දො ඔදාතස්ස බලිවද්දස්ස සඤ්ඤොජනං, නපි ඔදාතො බලිවද්දො කාළස්ස බලිවද්දස්ස සඤ්ඤොජනං, යෙන ච ඛො තෙ එකෙන දාමෙන වා යොත්තෙන වා සංයුත්තා, තං තත්‍ථ සඤ්ඤොජනං.

එවමෙව ඛො ආවුසො න චක්ඛු රූපානං සඤ්ඤොජනං, න රූපා චක්ඛුස්ස සඤ්ඤොජනං. යඤ්ච තත්‍ථ තදුභයං පටිච්ච උප්පජ්ජති ඡන්දරාගො තං තත්‍ථ සඤ්ඤොජනං -පෙ- න ජිව්හා රසානං සඤ්ඤොජනං -පෙ- න මනො ධම්මානං සඤ්ඤොජනං, න ධම්මා මනස්ස සඤ්ඤොජනං, යඤ්ච තත්‍ථ තදුභයං පටිච්ච උප්පජ්ජති ඡන්දරාගො තං තත්‍ථ සඤ්ඤොජනං.

චක්ඛුං වා ආවුසො රූපානං සඤ්ඤොජනං අභවිස්ස, රූපා වා චක්ඛුස්ස සඤ්ඤොජනං අභවිස්ස, න ඉදං බ්‍රහ්මචරියවාසො පඤ්ඤායෙථ සම්මා දුක්ඛක්ඛයාය, යස්මා ච ඛො ආවුසො න චක්ඛු රූපානං සඤ්ඤොජනං න රූපා චක්ඛුස්ස සඤ්ඤොජනං, යඤ්ච තත්‍ථ තදුභයං පටිච්ච උප්පජ්ජති ඡන්දරාගො තං තත්‍ථ සඤ්ඤොජනං, තස්මා බ්‍රහ්මචරියවාසො පඤ්ඤායති සම්මාදුක්ඛක්ඛයාය -පෙ-

ජිව්හා වා ආවුසො රසානං සඤ්ඤොජනං අභවිස්ස, රසා වා ජිව්හාය සඤ්ඤොජනං, න ඉදං බ්‍රහ්මචරියවාසො පඤ්ඤායෙථ සම්මා දුක්ඛක්ඛයාය, යස්මා ච ඛො ආවුසො න ජිව්හා රසානං සඤ්ඤොජනං න රසා ජිව්හාය සඤ්ඤොජනං, යඤ්ච තත්‍ථ තදුභයං පටිච්ච උප්පජ්ජති ඡන්දරාගො තං තත්‍ථ සඤ්ඤොජනං, තස්මා බ්‍රහ්මචරියවාසො පඤ්ඤායති සම්මා දුක්ඛක්ඛයාය -පෙ-

මනො වා ආවුසො ධම්මානං සඤ්ඤොජනං අභවිස්ස, ධම්මා වා මනස්ස සඤ්ඤොජනං, නයිදං බ්‍රහ්මචරියවාසො පඤ්ඤායෙථ සම්මා දුක්ඛක්ඛයාය. යස්මා ච ඛො ආවුසො න මනො ධම්මානං සඤ්ඤොජනං, න ධම්මා මනස්ස සඤ්ඤොජනං, යඤ්ච තත්‍ථ තදුභයං පටිච්ච උප්පජ්ජති ඡන්දරාගො තං තත්‍ථ සඤ්ඤොජනං, තස්මා බ්‍රහ්මචරියවාසො පඤ්ඤායති සම්මා දුක්ඛක්ඛයාය.

තදමිනාපෙතං ආවුසො පරියායෙන වෙදිතබ්බං: යථා න චක්ඛු රූපානං සඤ්ඤොජනං, න රූපා චක්ඛුස්ස සඤ්ඤොජනං, යඤ්ච තත්‍ථ තදුභයං පටිච්ච උප්පජ්ජති ඡන්දරාගො තං තත්‍ථ සඤ්ඤොජනං -පෙ- න ජිව්හා රසානං සඤ්ඤොජනං -පෙ- න මනො ධම්මානං සඤ්ඤොජනං, න ධම්මා මනස්ස සඤ්ඤොජනං, යඤ්ච තත්‍ථ තදුභයං පටිච්ච උප්පජ්ජති ඡන්දරාගො තං තත්‍ථ සඤ්ඤොජනං.

---

1. බලිබද්දෙ - මජසං.

ඇවැත්නි යම්සේ කළු ගොනෙකුත් සුදුගොනෙකුත් එක් දමෙකින් හෝ යොතෙකින් හෝ ඇඳන ලද්දහු වේද්ද, කළුගොනා සුදු ගොනාගේ බන්ධනය යි ද සුදුගොනා කළුගොනාගේ බන්ධනය යි ද යමෙක් මෙසේ කියන්නේ නම් ඒ කියන්නා මැනවින් කියන්නේ දැ යි. ඇවැත්නි මෙය නො වේ ම ය. ඇවැත්නි කළුගොනා සුදුගොනාගේ බන්ධන නො වේ. සුදුගොනා කළුගොනාගේ බන්ධන නො ද වේ. යම් එක් දමෙකින් හෝ යොතෙකින් හෝ ඔහු ඇඳන ලද්දහු නම් එය එහි බන්ධන යි.

ඇවැත්නි එසෙයින් ම ඇස රූපයනට සංයොජන නො වේ. රූපය ඇසට සංයෝජන නො වේ. එහි එදෙක නිසා යම් ඡන්දරාගයෙක් උපදී නම් එය එහි සංයෝජන යි ... දිව රසයනට සංයෝජන නො වේ. සිත දහමුන්ට සංයෝජන නො වේ. දහම් සිතට සංයෝජන නො වේ. එහි එදෙක නිසා යම් ඡන්දරාගයෙක් උපදී නම් එය එහි සංයොජන යි.

ඇවැත්නි ඇස හෝ රූපයනට සංයොජන වී නම් රූපය හෝ ඇසට සංයෝජන වී නම් මැනවින් දුක් ගෙවීම පිණිස මේ බඹසරවිසුම නො පැනෙන්නේ ය. ඇවැත්නි යම් හෙයෙකින් ඇස රූපයනට සංයෝජන නො වේ ද, රූපය ඇසට සංයෝජන නො වේ ද, එහි එදෙක නිසා යම් ඡන්දරාගයෙක් උපදී නම් එය එහි සංයොජන වේ ද, එහෙයින් මැනවින් දුක් ගෙවීම පිණිස බඹසරවිසුම පැනේ...

ඇවැත්නි දිව හෝ රසයනට සංයොජන වී නම් රස හෝ දිවට සංයොජන වී නම් මැනවින් දුක් ගෙවීම පිණිස මේ බඹසර විසුම නො පැනේ. යම් හෙයෙකින් දිව රසයනට සංයෝජන නො වේ ද, රස දිවට සංයෝජන නො වේ ද, එහි එදෙක නිසා යම් ඡන්දරාගයෙක් උපදී නම් එය එහි සංයෝජන වේ ද, එහෙයින් මැනවින් දුක් ගෙවීම පිණිස බඹසර විසුම පැනෙයි. ...

ඇවැත්නි සිත හෝ දහමුන්ට සංයෝජන වී නම් දහම් හෝ සිතට සංයෝජන වී නම් මැනවින් දුක් ගෙවීම පිණිස මේ බඹසර විසුම නො පැනේ. ඇවැත්නි යම් හෙයෙකින් සිත දහමුන්ට සංයෝජන නො වේ ද, දහම් සිතට සංයෝජන නො වේ ද, එහි එදෙක නිසා යම් ඡන්දරාගයෙක් උපදී නම් එය එහි සංයෝජන වේ ද, එහෙයින් මැනවින් දුක් ගෙවීම පිණිස බඹසරවිසුම පැනේ.

ඇවැත්නි යම්සේ ඇස රූපයනට සංයෝජන නො වේ ද, රූපය ඇසට සංයෝජන නො වේ ද, එහි එදෙක නිසා යම් ඡන්දරාගයෙක් උපදී නම් එය එහි සංයොජන වේ ද ... දිව රසයනට සංයොජන නො වේ ද ... සිත දහමුන්ට සංයෝජන නො වේ ද, දහම් සිතට සංයොජන නො වේ ද එහි එදෙක නිසා යම් ඡන්දරාගයෙක් උපදී නම් එය එහි සංයෝජන වේ ද, ඒ මෙය මේ නයෙනුදු දත යුතු යි.

සංවිජ්ජති ඛො ආවුසො භගවතො චක්ඛු, පස්සති භගවා චක්ඛුනා රූපං, ඡන්දරාගො භගවතො නත්ථි, සුවිමුත්තචිත්තො භගවා -පෙ- සංවිජ්ජති ඛො ආවුසො භගවතො ජිව්හා, සායති භගවා ජිව්හාය රසං, ඡන්දරාගො භගවතො නත්ථි, සුවිමුත්තචිත්තො භගවා -පෙ- සංවිජ්ජති ඛො ආවුසො භගවතො මනො, ජානාති භගවා මනසා ධම්මං, ඡන්දරාගො භගවතො නත්ථි, සුවිමුත්තචිත්තො භගවා.

ඉමිනා ඛො එතං ආවුසො පරියායෙන වෙදිතබ්බං: යථා න චක්ඛු රූපානං සඤ්ඤොජනං, න රූපා චක්ඛුස්ස සඤ්ඤොජනං, යඤ්ච තත්ථ තදුභයං පටිච්ච උප්පජ්ජති ඡන්දරාගො තං තත්ථ සඤ්ඤොජනං -පෙ- න ජිව්හා රසානං සඤ්ඤොජනං න රසා ජිව්හාය සඤ්ඤොජනං, යඤ්ච තත්ථ තදුභයං පටිච්ච උප්පජ්ජති ඡන්දරාගො තං තත්ථ සඤ්ඤොජනං -පෙ- න මනො ධම්මානං සඤ්ඤොජනං, න ධම්මා මනස්ස සඤ්ඤොජනං, යඤ්ච තත්ථ තදුභයං පටිච්ච උප්පජ්ජති ඡන්දරාගො තං තත්ථ සඤ්ඤොජනන්ති.

## 1. 18. 6

## කාමභූසුත්තං

233. එකං සමයං ආයස්මා ච ආනන්දො ආයස්මා ච කාමභූ කොසම්බියං විහරන්ති ඝොසිතාරාමෙ. අථ ඛො ආයස්මා කාමභූ සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා ආනන්දෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා කාමභූ ආයස්මන්තං ආනන්දං එතදවොච:

කින්නු ඛො ආවුසො ආනන්ද, චක්ඛු රූපානං සඤ්ඤොජනං, රූපා චක්ඛුස්ස සඤ්ඤොජනං, -පෙ- ජිව්හා රසානං සඤ්ඤොජනං, රසා ජිව්හාය සඤ්ඤොජනං, -පෙ- මනො ධම්මානං සඤ්ඤොජනං, ධම්මා මනස්ස සඤ්ඤොජනන්ති.

න ඛො ආවුසො කාමභූ, චක්ඛු රූපානං සඤ්ඤොජනං, න රූපා චක්ඛුස්ස සඤ්ඤොජනං, යඤ්ච තත්ථ තදුභයං පටිච්ච උප්පජ්ජති ඡන්දරාගො තං තත්ථ සඤ්ඤොජනං -පෙ- න ජිව්හා රසානං සඤ්ඤොජනං න රසා ජිව්හාය සඤ්ඤොජනං -පෙ- න මනො ධම්මානං සඤ්ඤොජනං න ධම්මා මනස්ස සඤ්ඤොජනං, යඤ්ච තත්ථ තදුභයං පටිච්ච උප්පජ්ජති ඡන්දරාගො තං තත්ථ සඤ්ඤොජනං.

ඇවැත්නි භාග්‍යවතුන් වහන්සේට ඇස ඇත් ම ය. භාග්‍යවතුන් වහන්සේ ඇසින් රූ දකිති. භාග්‍යවතුන් වහන්සේට ඡන්දරාගයෙක් නැත. භාග්‍යවතුන් වහන්සේ මැනවින් මිදුණු සිත් ඇති සේක ... ඇවැත්නි භාග්‍යවතුන් වහන්සේට දිව ඇත්ම ය. භාග්‍යවතුන් වහන්සේ දිවින් රස විඳිති. භාග්‍යවතුන් වහන්සේට ඡන්දරාගයෙක් නැත. භාග්‍යවතුන් වහන්සේ මැනවින් මිදුණු සිත් ඇති සේක ... ඇවැත්නි භාග්‍යවතුන් වහන්සේට සිත ඇත් ම ය. භාග්‍යවතුන් වහන්සේ සිතින් දහම් දනිති. භාග්‍යවතුන් වහන්සේට ඡන්දරාගයෙක් නැත. භාග්‍යවතුන් වහන්සේ මැනවින් මිදුණු සිත් ඇති සේක.

ඇවැත්නි යම් සේ ඇස රූපයනට සංයෝජන නො වේ ද, රූපය ඇසට සංයෝජන නො වේ ද, එහි එදෙක නිසා යම් ඡන්දරාගයෙක් උපදී නම් එය එහි සංයෝජන වේ ද ... දිව රසයනට සංයොජන නො වේ ද, රස දිවට සංයොජන නො වේ ද, එහි එදෙක නිසා යම් ඡන්දරායෙක් උපදී නම් එය එහි සංයොජන වේ ද ... සිත දහමුන්ට සංයොජන නො වේ ද, දහම් සිතට සංයොජන නො වේ ද, එහි එදෙක නිසා යම් ඡන්දරාගයෙක් උපදී නම් එය එහි සංයොජන වේ ද, ඒ මෙය මේ නයෙනුදු දතයුතු යි.

## 1. 18. 6

## කාමභූ සූත්‍රය

**233.** **එක්කලෙක ආයුෂ්මත් ආනන්ද** තෙරණුවෝ ද ආයුෂ්මත් **කාමභූ** තෙරණුවෝ ද **කොසඹෑ** නුවර සමීපයෙහි ඝෝසිතාරාමයෙහි වැඩවෙසෙති. එකල්හි ආයුෂ්මත් කාමභූ තෙරණුවෝ සවස්වේලෙහි විවේකයෙන් නැඟී සිටියාහු ආයුෂ්මත් ආනන්ද තෙරණුවන් වෙත එළඹියහ. එළඹ ආයුෂ්මත් ආනන්ද තෙරණුවන් සමග සතුටුවූහ. සතුටු වියයුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් ආයුෂ්මත් කාමභූ තෙරණුවෝ ආයුෂ්මත් ආනන්ද තෙරණුවන්ට මෙය කීහ:

ඇවැත්නි ආනන්දයෙනි, කිමෙක් ද ඇස රූපයනට සංයෝජන ද, රූපය ඇසට සංයෝජන ද, ... දිව රසයනට සංයෝජන ද, රස දිවට සංයෝජන ද, ... සිත දහමුන්ට සංයෝජන ද දහම් සිතට සංයෝජන දැ යි.

ඇවැත්නි කාමභූවෙනි, ඇස රූපයනට සංයෝජන නො වේ. රූපය ඇසට සංයෝජන නො වේ. එහි එදෙක නිසා යම් ඡන්ද-රාගයෙක් උපදී නම් එය එහි සංයෝජන යි ... දිව රසයනට සංයෝජන නො වේ. රස දිවට සංයෝජන නො වේ ... සිත දහමුන්ට සංයෝජන නො වේ. දහම් සිතට සංයෝජන නො වේ. එහි එදෙක නිසා යම් ඡන්දරාගයෙක් උපදී නම් එය එහි සංයෝජන යි.

සෙය්‍යථාපි ආවුසො කාළො ච බලිවද්දො ඔදාතො ච බලිවද්දො එකෙන දාමෙන වා යොත්තෙන වා සංයුත්තා අස්සු, යො නු ඛො එවං වදෙය්‍ය: කාළො බලිවද්දො ඔදාතස්ස බලිවද්දස්ස සංයොජනං, ඔදාතො බලිවද්දො කාළස්ස බලිවද්දස්ස සංයොජනන්ති සම්මා නු ඛො සො වදමානො වදෙය්‍යාති. නොහෙතං ආවුසො. න ඛො ආවුසො කාළො බලිවද්දො ඔදාතස්ස බලිවද්දස්ස සංයොජනං, නපි ඔදාතො බලිවද්දො කාළස්ස බලිවද්දස්ස සංයොජනං, යෙන ච ඛො තෙ එකෙන දාමෙන වා යොත්තෙන වා සංයුත්තා තං තත්ථ සංයොජනං.

එවමෙව ඛො ආවුසො න චක්ඛු රූපානං සංයොජනං, න රූපා චක්ඛුස්ස සංයොජනං, යඤ්ච තත්ථ තදුභයං පටිච්ච උප්පජ්ජති ඡන්දරාගො තං තත්ථ සංයොජනං -පෙ- න ජිව්හා රසානං සංයොජනං -පෙ- න මනො ධම්මානං සංයොජනං, න ධම්මා මනස්ස සංයොජනං, යඤ්ච තත්ථ තදුභයං පටිච්ච උප්පජ්ජති ඡන්දරාගො තං තත්ථ සංයොජනන්ති.

## 1. 18. 7

## උදායිසුත්තං

234. එකං සමයං ආයස්මා ච ආනන්දො, ආයස්මා ච උදායී කොසම්බියං විහරන්ති ඝොසිතාරාමෙ. අථ ඛො ආයස්මා උදායී සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා ආනන්දෙන සද්ධිං සම්මොදි සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා උදායී ආයස්මන්තං ආනන්දං එතදවොච:

යථෙව නු ඛො[1] ආවුසො ආනන්ද අයං කායො භගවතා අනෙකපරියායෙන අක්ඛාතො විවටො පකාසිතො, ඉතිපායං[2] කායො අනත්තාති. සක්කා එවමෙවං විඤ්ඤාණම්පිදං[3] ආචික්ඛිතුං දෙසෙතුං පඤ්ඤාපෙතුං පට්ඨපෙතුං විවරිතුං විභජිතුං උත්තානීකාතුං ඉතිපිදං විඤ්ඤාණං අනත්තාති.

යථෙව ඛො ආවුසො උදායී අයං කායො භගවතා අනෙකපරියායෙන අක්ඛාතො විවටො පකාසිතො, ඉතිපායං කායො අනත්තාති, සක්කා එවමෙව විඤ්ඤාණම්පිදං ආචික්ඛිතුං දෙසෙතුං පඤ්ඤාපෙතුං පට්ඨපෙතුං විවරිතුං විභජිතුං උත්තානීකාතුං ඉතිපිදං විඤ්ඤාණං අනත්තාති.

---

1. යථෙවනනුඛො - සී 1,2.
2. ඉතිපි අයං - සී 1,2,
3. විඤ්ඤාණම්පි - සී 1,2.

ඇවැත්නි කළුගොනෙකුත් සුදුගොනෙකුත් එක්දමකින් හෝ යොතෙකින් හෝ යම්සේ ඇඳන ලද්දහු වෙද්ද, කළුගොනා සුදුගොනුගේ බැඳුම ය, සුදුගොන් කළුගොනුගේ බැඳුම යයි යමෙක් මෙසේ කියන්නේ නම් ඒ කියන්නා මැනැවින් කියන්නේ දැ යි. ඇවැත්නි මෙය නො වේ ම ය. ඇවැත්නි කළුගොන් සුදුගොනුගේ බැඳුම නො වේ. සුදුගොන් කළුගොනුගේ බැඳුම නො ද වේ. යම් එක් දමකින් හෝ යොතකින් හෝ ඔහු ඇඳන ලද්දහු නම් එය එහි බැඳුම යි.

ඇවැත්නි එසෙයින් ම ඇස රූපයනට සංයෝජන නො වේ. රූ ඇසට සංයෝජන නො වේ. එහි එදෙක නිසා යම් ඡන්ද-රාගයෙක් උපදී නම් එය එහි සංයෝජන යි ... දිව රසයනට සංයෝජන නො වේ .... සිත දහමුන්ට සංයෝජන නො වේ. දහම් සිතට සංයෝජන නො වේ. එහි එදෙක නිසා යම් ඡන්දරාගයෙක් උපදී නම් එය එහි සංයෝජන යි.

## 1. 18. 7

## උදයී සූත්‍රය

234. **එක්කලෙක** ආයුෂ්මත් **ආනන්ද** තෙරණුවෝ ද ආයුෂ්මත් **උදයී** තෙරණුවෝ ද **කොසඹෑ** නුවර සමීපයෙහි **ඝෝසිතාරාමයෙහි** වැඩවෙසෙති. එකල්හි ආයුෂ්මත් උදයී තෙරණුවෝ සවස්කල විවේකයෙන් නැගී සිටියාහු ආයුෂ්මත් ආනන්ද තෙරණුවන් වෙත එළඹියහ. එළඹ ආයුෂ්මත් ආනන්ද තෙරණුවන් සමග සතුටු වූහ. සතුටු වියයුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්-පස් ව හුන්හ. එකත්පස් ව හුන් ආයුෂ්මත් උදයී තෙරණුවෝ ආයුෂ්මත් ආනන්ද තෙරණුවන්ට මෙය කීහ:

ඇවැත්නි ආනන්දයෙනි, ‘‘මෙ කරුණෙනිදු මේ කය අනත් ය යි භාග්‍යවතුන් වහන්සේ විසින් මේ කය යම්සේ නන්අයුරින් වදරන ලද ද විතර කරන ලද ද පවසන ලද ද, එපරිද්දෙන් ම මෙකරුණෙනුදු මේ විඥානය අනත් ය යි මේ විඥානය ද කියන්නට දෙසන්නට පනවන්නට පිහිටුවන්නට විතර කරන්නට බෙදන්නට පැහැදිලි කරන්නට හැක්කේ දැ’’ යි.

ඇවැත්නි උදයීනි, ‘‘මෙකරුණෙනුදු මේ කය අනත් යයි භාග්‍යවතුන් වහන්සේ විසින් මේ කය යම්සේ නන් අයුරින් වදරන ලද ද, විතර කරන ලද ද, පවසන ලද ද, එපරිද්දෙන් ම මෙ කරුණෙනුදු මේ විනැණත් අනත් ය යි මේ විනැණ ද කියන්නට දෙසන්නට පනවන්නට පිහිටුවන්නට විතර කරන්නට බෙදන්නට පැහැදිලි කරන්නට හැක්කේ ය’’යි.

චක්ඛුඤ්චාවුසො පටිච්ච රූපෙ චුප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණන්ති, එවමාවුසොති. යො චාවුසො හෙතු යො ච පච්චයො චක්ඛුවිඤ්ඤාණස්ස උප්පාදාය[1] සො ච හෙතු සො ච පච්චයො සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං අපරිසෙසා[2] නිරුජ්ඣෙය්‍ය, අපි නු ඛො චක්ඛු විඤ්ඤාණං පඤ්ඤායෙථාති. නො හෙතං ආවුසො. ඉමිනාපි ඛො එතං ආවුසො පරියායෙන භගවතා අක්ඛාතං විවටං පකාසිතං: ඉතිපිදං විඤ්ඤාණං අනත්තාති. -පෙ-

ජිව්හඤ්චාවුසො පටිච්ච රසෙ චුප්පජ්ජති ජිව්හාවිඤ්ඤාණන්ති. එවමාවුසොති. යො චාවුසො හෙතු යො ච පච්චයො ජිව්හා විඤ්ඤාණස්ස උප්පාදාය, සො ච හෙතු සො ච පච්චයො සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං අපරිසෙසා නිරුජ්ඣෙය්‍ය, අපිනු ඛො ජිව්හාවිඤ්ඤාණං පඤ්ඤායෙථාති. නො හෙතං ආවුසො. ඉමිනාපි ඛො එතං ආවුසො පරියායෙන භගවතා අක්ඛාතං විවටං පකාසිතං ඉතිපිදං විඤ්ඤාණං අනත්තාති -පෙ-

මනඤ්චාවුසො පටිච්ච ධම්මෙ චුප්පජ්ජති මනොවිඤ්ඤාණන්ති. එවමාවුසොති. යො චාවුසො හෙතු යො ච පච්චයො මනොවිඤ්ඤාණස්ස උප්පාදාය, සො ච හෙතු සො ච පච්චයො සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං අපරිසෙසා නිරුජ්ඣෙය්‍ය. අපි නු ඛො මනොවිඤ්ඤාණං පඤ්ඤායෙථාති. නො හෙතං ආවුසො. ඉමිනාපි ඛො එතං ආවුසො පරියායෙන භගවතා අක්ඛාතං විවටං පකාසිතං ඉතිපිදං විඤ්ඤාණං අනත්තාති.

සෙය්‍යථාපි ආවුසො පුරිසො සාරත්ථිකො සාරගවෙසී සාරපරියෙසනං චරමානො තිණ්හං කුඨාරිං ආදාය වනං පවිසෙය්‍ය, සො තත්ථ පස්සෙය්‍ය මහන්තං කදලික්ඛන්ධං උජුකං නවං අකුක්කුකජාතං[3]. තමෙනං මූලෙ ඡින්දෙය්‍ය මූලෙ ඡෙත්වා අග්ගෙ ඡින්දෙය්‍ය අග්ගෙ ඡෙත්වා පත්තං වට්ටිං විනිබ්භුජෙය්‍ය[4], සො තත්ථ ඵෙග්ගුම්පි නාධිගච්ඡෙය්‍ය, කුතො සාරං.

එවමෙව ඛො ආවුසො භික්ඛු ඡසු ඵස්සායතනෙසු නෙව අත්තානං නාත්තනියං සමනුපස්සති, සො එවං අසමනුපස්සන්තො න කිඤ්චි ලොකෙ උපාදියති, අනුපාදියං න පරිතස්සති, අපරිතස්සං පච්චත්තඤ්ඤෙව පරිනිබ්බායති. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

1. උප්පාදය – ස්‍යා
2. අපරිසෙසො - සී 1,2
3. අකුක්කුටකජාතං - ස්‍යා
4. විනිබ්භුජෙය්‍ය - සී, 1,2
විනිබ්භජෙය්‍ය - ස්‍යා

ඇවැත්නි ඇසත් රූපයනුත් නිසා චක්ඛුවිඤ්ඤාණය උපදී ද යි. ඇවැත්නි එසේ යයි. ඇවැත්නි චක්ඛුවිඤ්ඤාණයාගේ ඉපැදීම පිණිස යම් හේතුවකුත් යම් ප්‍රත්‍යයකුත් වේ නම් ඒ හේතුවත් ඒ ප්‍රත්‍යයත් සියල්ලෙන් සියල්ල සියලු අයුරින් සියල්ල නිරවශේෂයෙන් නිරුද්ධ වන්නේ නම් එකල්හි චක්ඛුවිඤ්ඤාණයෙක් පැනෙන්නේ ද යි. ඇවැත්නි මෙය නො වේ මැ යි. ඇවැත්නි "මේ නයෙනුදු භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේත් මේ විඤ්ඤාණය අනාත්ම ය"යි මෙය වදාරන ලද්දේ ය. විවරණය කරන ලද්දේ ය. පවසන ලද්දේ ය ...

ඇවැත්නි දිවත් රසත් නිසා ජිව්හාවිඤ්ඤාණය උපදී ද යි. එසේ ය ඇවැත්නි යි. ඇවැත්නි ජිව්හාවිඤ්ඤාණයාගේ ඉපැදීම පිණිස යම් හේතුවකුත් යම් ප්‍රත්‍යයකුත් වේ නම් ඒ හේතුවත් ඒ ප්‍රත්‍යයත් සියල්ලෙන් සියල්ල සියලු අයුරින් සියල්ල නිරවශේෂයෙන් නිරුද්ධ වන්නේ නම් එකල්හි ජිව්හාවිඤ්ඤාණයෙක් පැනෙන්නේ ද යි. ඇවැත්නි මෙය නො වේ ම ය. ඇවැත්නි මේ නයෙනුදු භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේත් මේ විඤ්ඤාණය අනාත්ම යයි මෙය වදාරන ලද්දේ ය. විවරණය කරන ලද්දේ ය. පවසන ලද්දේ ය ...

ඇවැත්නි "සිතත් දහමුත් නිසා මනෝවිඤ්ඤාණය උපදී ද" යි. එසේ ය ඇවැත්නි යි. ඇවැත්නි මනෝවිඤ්ඤාණයාගේ ඉපැදීම පිණිස යම් හේතුවකුත් යම් ප්‍රත්‍යයකුත් වේ නම් ඒ හේතුවත් ඒ ප්‍රත්‍යයත් සියල්ලෙන් සියල්ල සියලු අයුරින් සියල්ල නිරවශේෂයෙන් නිරුද්ධ වන්නේ නම් එකල්හි මනෝවිඤ්ඤාණයෙක් පැනෙන්නේ ද යි. ඇවැත්නි මෙය නො වේ ම ය. ඇවැත්නි මේ නයෙනුදු භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේත් මේ විඤ්ඤාණය අනාත්ම ය යි මෙය වදාරන ලද්දේ ය. විවරණය කරන ලද්දේ ය. පවසන ලද්දේ ය.

ඇවැත්නි යම්සේ හර කැමති හර සොයන හර සෙවුම කරන පුරුෂයෙක් තියුණු කෙටේරියක් ගෙන වනයට පිවිසෙන්නේ ද, හේ එහි ඇද නැති අලුත් නොපීදුණු මහත් කෙසෙල් කඳක් දක්නේ ය. ඒ මෙය මුල සිඳින්නේ ය. මුල සිඳ අග සිඳින්නේ ය. අග සිඳ පත්වැටි ගලවන්නේ ය. හෙතෙමේ එහි එලය වත් නො ලබන්නේ ය. හර කොයින් ද?

ඇවැත්නි එසෙයින් ම මහණ ස්පර්ශායතන සයෙහි තමා නො ම දකී. තමා අයත් දෑයක් නො ම දකී. හේ මෙසේ නො ම දක්නේ ලොව කිසිවක් නො ගනී. නො ගන්නේ නො තැතිගනී. නො තැතිගන්නේ තෙමේ ම පිරිනිවෙයි. ජාති ක්ෂය විය. බඹසර වැස නිමවන ලදි. කටයුතු කරන ලදි. මේ බැව පිණිස අනෙකක් නැතැ යි දැනගනී යි.

## 1. 18. 8

## ආදිත්තපරියායසුත්තං

235. **ආදිත්තපරියායං** වො භික්ඛවෙ ධම්මපරියායං දෙසිස්සාමි. තං සුණාථ. කතමො ච භික්ඛවෙ ආදිත්තාපරියායො ධම්මපරියායො? වරං භික්ඛවෙ තත්තාය අයොසලාකාය ආදිත්තාය සම්පජ්ජලිතාය සජොතිභූතාය චක්ඛුන්ද්‍රියං සම්පලිමට්ඨං, න ත්වෙව චක්ඛුවිඤ්ඤෙය්‍යෙසු රූපෙසු අනුබ්‍යඤ්ජනසො නිමිත්තග්ගාහො. නිමිත්තස්සාදගථිතං[1] වා භික්ඛවෙ විඤ්ඤාණං තිට්ඨමානං තිට්ඨෙය්‍ය අනුබ්‍යඤ්ජනස්සාදගථිතං වා, තස්මිං චෙ සමයෙ කාලං කරෙය්‍ය, ඨානමෙතං විජ්ජති යං ද්වින්නං ගතීනං අඤ්ඤතරං ගතිං ගච්ඡෙය්‍ය නිරයං වා තිරච්ඡානයොනිං වා. ඉමං ඛ්වාහං භික්ඛවෙ ආදීනවං දිස්වා එවං වදාමි.

වරං භික්ඛවෙ තිණ්හෙන අයොසඞ්කුනා ආදිත්තෙන සම්පජ්ජලිතෙන සජොතිභූතෙන සොතින්ද්‍රියං සම්පලිමට්ඨං, න ත්වෙව සොතවිඤ්ඤෙය්‍යෙසු සද්දෙසු අනුබ්‍යඤ්ජනසො නිමිත්තග්ගාහො. නිමිත්තස්සාදගථිතං වා භික්ඛවෙ විඤ්ඤාණං තිට්ඨමානං තිට්ඨෙය්‍ය අනුබ්‍යඤ්ජනස්සාද ගථිතං වා. තස්මිං චෙ සමයෙ කාලං කරෙය්‍ය ඨානමෙතං විජ්ජති යං ද්වින්නං ගතීනං අඤ්ඤතරං ගතිං ගච්ඡෙය්‍ය නිරයං වා තිරච්ඡානයොනිං වා. ඉමං ඛ්වාහං භික්ඛවෙ ආදීනවං දිස්වා එවං වදාමි.

වරං භික්ඛවෙ තිණ්හෙන නඛච්ඡෙදනෙන ආදිත්තෙන සම්පජ්ජලිතෙන සජොතිභූතෙන ඝානින්ද්‍රියං සම්පලිමට්ඨං, න ත්වෙව ඝානවිඤ්ඤෙය්‍යෙසු ගන්ධෙසු අනුබ්‍යඤ්ජනසො නිමිත්තග්ගාහො, නිමිත්තස්සාදගථිතං වා භික්ඛවෙ විඤ්ඤාණං තිට්ඨමානං තිට්ඨෙය්‍ය අනුබ්‍යඤ්ජනස්සාදගථිතං වා. තස්මිං චෙ සමයෙ කාලං කරෙය්‍ය, ඨානමෙතං විජ්ජති යං ද්වින්නං ගතීනං අඤ්ඤතරං ගතිං ගච්ඡෙය්‍ය නිරයං වා තිරච්ඡානයොනිං වා. ඉමං ඛ්වාහං භික්ඛවෙ ආදීනවං දිස්වා එවං වදාමි.

වරං භික්ඛවෙ තිණ්හෙන ඛුරෙන ආදිත්තෙන සම්පජ්ජලිතෙන සජොතිභූතෙන ජිව්හින්ද්‍රියං සම්පලිමට්ඨං. නත්වෙව ජිව්හාවිඤ්ඤෙය්‍යෙසු රසෙසු අනුබ්‍යඤ්ජනසො නිමිත්තග්ගාහො. නිමිත්තස්සාදගථිතං වා භික්ඛවෙ විඤ්ඤාණං තිට්ඨමානං තිට්ඨෙය්‍ය අනුබ්‍යඤ්ජනස්සාදගථිතං වා. තස්මිං චෙ සමයෙ කාලං කරෙය්‍ය ඨානමෙතං විජ්ජති යං ද්වින්නං ගතීනං අඤ්ඤතරං ගතිං ගච්ඡෙය්‍ය නිරයං වා තිරච්ඡාන යොනිං වා. ඉමං ඛ්වාහං භික්ඛවෙ ආදීනවං දිස්වා එවං වදාමි.

1. ගධිතං - ස්‍යා.

## 1. 18. 8

## ආදිත්තපරියාසූත්‍රය

235. මහණෙනි තොපට **ආදිත්තපරියාය** නම් වූ දහම්නය දේශනා කරන්නෙමි. එය අසවු. මහණෙනි ආදිත්තපරියාය නම් වූ දහම්නය කවරේ ද යත්: මහණෙනි ඇවිලගත් හාත්පසින් දිලියෙන ගිනිදැල් සහිත රත් වූ අයශ්ශලාකායෙකින් චක්ඛුන්ද්‍රියය පිරිමදනා ලද්දේ මැනැවි. ඇස්විනැණින් දතයුතු රූහි අනුව්‍යඤ්ජන විසින් නිමිති ගැනීම නො ම මැනැවි. නිමිත්තාසවාදයෙන් බැඳුනා වූ හෝ අනුව්‍යඤ්ජනාස්වාදයෙන් බැඳුණා වූ හෝ කම්විඥානය සිටුනේ සිටිනේ ය. ඉදින් එසමයෙහි කලුරිය කරන්නේ නම් නිරයත් තිරිසන් යෝනියත් යන ගතිදෙකින් එක්තරා ගතියකට පැමිණෙන්නේ ය යන යමක් වේ නම් මෙ කාරුණ ඇත. මහණෙනි මේ දෙෂය දක මම මෙසේ කියමි.

මහණෙනි ඇවිලගත් හාත්පසින් දිලියෙන ගිනිදැල් සහිත තියුණු යහුලකින් සොතිඤ්‍රියය පිරිමදනා ලද්දේ මැනැවි. කනින් දතයුතු ශබ්දයන්හි අනුව්‍යඤ්ජන විසින් නිමිතිගැනීම නො ම මැනවි. මහණෙනි නිමිත්තාසවාදයෙන් බැඳුණා වූ හෝ අනුව්‍යඤ්ජනාසවාදයෙන් බැඳුණා වූ හෝ කම්විඥානය සිටුනේ සිටිනේ ය. ඉදින් එසමයෙහි කලුරිය කරන්නේ නම් නිරයත් තිරිසන්යෝනියත් යන ගති දෙකින් එක්තරා ගතියකට පැමිණෙන්නේ ය යන යමක් වේ නම් මේ කරුණ ඇත. මහණෙනි මේ දෙෂය දක මම මෙසේ කියමි.

මහණෙනි ඇවිලගත් හාත්පසින් දිලියෙන ගිනිදැල් සහිත තියුණු නියනෙකින් ඝානිඤ්‍රියය පහස්නා (නැහැය ගලවා දමන) ලද්දේ මැනැවි. නැහැයෙන් දතයුතු ගන්ධයන්හි අනුව්‍යඤ්ජන විසින් නිමිති ගැනීම නො ම මැනැවි. මහණෙනි නිමිත්තාස්වාදයෙන් බැඳුණා වූ හෝ අනුව්‍යඤ්ජනාස්වාදයෙන් බැඳුණා වූ හෝ කම්විඥානය සිටුනේ සිටිනේ ය. එසමයෙහි කලුරිය කරන්නේ නම් නිරයත් තිරිසන් යෝනියත් යන ගති දෙකින් එක්තරා ගතියකට පැමිණෙන්නේ ය යන යමක් වේ නම් මේ කරුණ ඇත. මහණෙනි මේ දේෂය දක මම මෙසේ කියමි.

මහණෙනි ඇවිලගත් හාත්පසින් දිලියෙන ගිනිදැල් සහිත තියුණු කරෙකින් ජිව්හින්ද්‍රියය පහස්නා (දිව කපන) ලද්දේ මැනැවි. දිවින් දතයුතු රසයන්හි අනුව්‍යඤ්ජන විසින් නිමිති ගැනීම නො ම මැනවි. මහණෙනි නිමිත්තාස්වාදයෙන් බැඳුණා වූ හෝ අනුව්‍යඤ්ජනාස්වාදයෙන් බැඳුණා වූ හෝ කම්විඥානය සිටුනේ සිටිනේ ය. එසමයෙහි කලුරිය කරන්නේ නම් නිරයත් තිරිසන්යෝනියත් යන ගතිදෙකින් එක්තරා ගතියකට පැමිණෙන්නේ ය යන යමෙක් වේ නම් මේ කරුණ ඇත. මහණෙනි මේ දෙෂය දක මම මෙසේ කියමි.

වරං භික්ඛවෙ තිණ්හාය සත්තියා ආදිත්තාය සම්පජ්ජලිතාය සජොතිභූතාය කායින්ද්‍රියං සමලිමට්ඨං න ත්වෙව කායවිඤ්ඤෙය්‍යෙසු ඵොට්ඨබ්බෙසු අනුබ්‍යඤ්ජනසො නිමිත්තග්ගාහො. නිමිත්තස්සාදගථිතං වා භික්ඛවෙ විඤ්ඤාණං තිට්ඨමානං තිට්ඨෙය්‍ය අනුබ්‍යඤ්ජනස්සාදගථිතං වා, තස්මිං චෙ සමයෙ කාලං කරෙය්‍ය ඨානමෙතං විජ්ජති යං ද්වින්නං ගතීනං අඤ්ඤතරං ගතිං ගච්ඡෙය්‍ය නිරයං වා තිරච්ඡානයොනිං වා. ඉමං ඛ්වාහං භික්ඛවෙ ආදීනවං දිස්වා එවං වදාමි.

වරං භික්ඛවෙ සොත්තං[1], සොත්තං ඛො පනාහං භික්ඛවෙ වඤ්ඣං[2] ජීවිතානං වදාමි, අඵලං ජීවිතානං වදාමි, මොමූහං ජීවිතානං වදාමි. න ත්වෙව තථාරූපෙ විතක්කෙ විතක්කෙය්‍ය යථාරූපානං විතක්කානං වසංගතො සඞ්ඝං භින්දෙය්‍ය. ඉමං ඛ්වාහං භික්ඛවෙ ආදීනවං දිස්වා එවං වදාමි.

තත්‍ර භික්ඛවෙ සුතවා අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: තිට්ඨතු තාව තත්තාය අයොසලාකාය ආදිත්තාය සම්පජ්ජලිතාය සජොතිභූතාය චක්ඛුන්ද්‍රියං සම්පලිමට්ඨං, හන්දාහං ඉදමෙව මනසිකරොමි, 'ඉති චක්ඛුං අනිච්චං, රූපා අනිච්චා, චක්ඛුවිඤ්ඤාණං අනිච්චං, චක්ඛුසම්ඵස්සො අනිච්චො, යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චං.'

තිට්ඨතු තාව තිණ්හෙන අයොසඞ්කුනා ආදිත්තෙන සම්පජ්ජලිතෙන සජොතිභූතෙන සොතින්ද්‍රියං සමලිමට්ඨං. හන්දාහං ඉදමෙව මනසිකරොමි: 'ඉති සොතං අනිච්චං සද්දා අනිච්චා. සොතවිඤ්ඤාණං අනිච්චං සොතසම්ඵස්සො අනිච්චො, යම්පිදං සොතසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චං'.

තිට්ඨතු තාව තිණ්හෙන නඛච්ඡෙදනෙන ආදිත්තෙන සම්පජ්ජලිතෙන සජොතිභූතෙන ඝානින්ද්‍රියං සමලිමට්ඨං. හන්දාහං ඉදමෙව මනසිකරොමි: 'ඉති ඝානං අනිච්චං, ගන්ධා අනිච්චා, ඝානවිඤ්ඤාණං අනිච්චං ඝානසම්ඵස්සො අනිච්චො, යම්පිදං ඝානසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චං.'

තිට්ඨතු තාව තිණ්හෙන ඛුරෙන ආදිත්තෙන සම්පජ්ජලිතෙන සජොතිභූතෙන ජිව්හින්ද්‍රියං සමලිමට්ඨං. හන්දාහං ඉදමෙව මනසිකරොමි: 'ඉති ජිව්හා අනිච්චා රසා අනිච්චා ජිව්හාවිඤ්ඤාණං අනිච්චං ජිව්හාසම්ඵස්සො අනිච්චො, යම්පිදං ජිව්හාසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චං.'

1. සුත්තං - සී 1, 2
2. වජ්ජං -ස්‍යා.

මහණෙනි ඇවිලගත් හාත්පසින් දිලියෙන ගිනිදැල් සහිත තියුණු සැතෙකින් කායින්ද්‍රියය පහස්නා (කයසැසදමන) ලද්දේ මැනවි. කයින් දතයුතු පහස්හි අනුව්‍යඤ්ජන විසින් නිමිති ගැනීම නො ම මැනවි. මහණෙනි නිමිත්තාස්වාදයෙන් බැඳුණා වූ හෝ අනුව්‍යඤ්ජනාස්වාදයෙන් බැඳුණා වූ හෝ කම්විඤ්ඤානය සිටුනේ සිටිනේ ය. ඉදින් එසමයෙහි කලුරිය කරන්නේ නම් නිරයත් තිරිසන්යෝනියත් යන ගති දෙකින් එක්තරා ගතියකට පැමිණෙන්නේ ය යන මේ කරුණ ඇත. මහණෙනි මේ දෙෂය දැක මම මෙසේ කියමි.

මහණෙනි නින්දට බැසගැනීම මැනවි. මහණෙනි නින්දට බැසගැනීම ජීවිතයන්ගේ වඳබව යයි මම කියමි. ජීවිතයන්ගේ විඵලබව යයි කියමි. ජීවිතයන්ගේ මුළාබව යයි කියමි. යම්බඳු විතර්කයන්ගේ වසයට පැමිණියේ සඞ්ඝයා බිඳින්නේ නම් එබඳු විතර්කයන් නො ම විතර්කනය කරන්නේ ය. මහණෙනි මේ දෙෂය දැක මම මෙසේ කියමි.

මහණෙනි එහි ලා ශ්‍රුතවත් ආර්‍යශ්‍රාවක මෙසේ නුවණින් සලකයි. ඇවිලගත් හාත්පසින් දිලියෙන ගිනිදැල් සහිත රත් වූ යලාකයෙකින් ඇස පහස්නා ලැබීම තිබේවා. ඒකාන්තයෙන් මම මෙසේ ඇස අනිස ය. රූ අනිස ය. ඇස්විනැණ අනිස ය. ඇස්පහස අනිස ය. ඇස්පහස නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක්නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් හෙ ද අනිසැ යි මෙය ම මෙනෙහි කරමි.

ඇවිලගත් හාත්පසින් දිලියෙන ගිනිදැල් සහිත තියුණු යහුලකින් කන පහස්නා ලැබීම තිබේවා. එකත්තෙන් මම මෙසේ ශ්‍රොත්‍රය අනිත්‍ය ය, ශබ්දයෝ අනිත්‍යයහ, සොතවිඤ්ඤාණය අනිත්‍ය ය, සෝතසම්ඵස්සය අනිත්‍ය ය, සෝතසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් හෙ ද අනිත්‍ය යැ යි මෙය ම මෙනෙහි කරමි.

ඇවිලගත් හාත්පසින් දිලියෙන ගිනිදැල් සහිත තියුණු නියනෙකින් නැහැය පහස්නා ලැබීම තිබේවා. එකත්තෙන් මම මෙසේ නැහැය අනිස ය. ගඳ අනිස ය. ඝානවිඤ්ඤාණය අනිත්‍ය ය. ඝානසම්ඵස්සය අනිත්‍ය ය, ඝානසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් එද අනිසැයි මෙය ම මෙනෙහි කරමි.

ඇවිලගත් හාත්පසින් දිලිසෙන ගිනිදැල් සහිත තියුණු කරෙකින් දිව පහස්නා ලැබීම තිබේවා. එකැත්තෙන් මම "මෙසේ දිව අනිස ය. ඇස අනිස ය. ජිව්හාවිඤ්ඤාණය අනිත්‍ය ය. ජිව්හාසම්ඵස්සය අනිත්‍ය ය. ජිව්හාසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක්නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් හෙ ද අනිසැ"යි මෙය ම මෙනෙහි කරමි.

තිට්ඨතු තාව තිණ්හාය සත්තියා ආදිත්තාය සම්පජ්ජලිතාය සජොතිභූතාය කායින්ද්‍රියං සම්පලිමට්ඨං, හන්දාහං ඉදමෙව මනසිකරොමි. "ඉති කායො අනිච්චො, ඵොට්ඨබ්බා අනිච්චා, කායවිඤ්ඤාණං අනිච්චං, කායසම්ඵස්සො අනිච්චො, යම්පිදං කායසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චං."

තිට්ඨතු තාව සොත්තං, හන්දාහං ඉදමෙව මනසිකරොමි, "ඉති මනො අනිච්චො, ධම්මා අනිච්චා, මනොවිඤ්ඤාණං අනිච්චං, මනොසම්ඵස්සො අනිච්චො, යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චං."

එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො චක්ඛුස්මිම්පි නිබ්බින්දති, රූපෙසුපි නිබ්බින්දති, චක්ඛුවිඤ්ඤාණෙපි නිබ්බින්දති, චක්ඛුසම්ඵස්සෙපි නිබ්බින්දති. යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තස්මිම්පි නිබ්බින්දති, -පෙ- යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තස්මිම්පි නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති, විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති, ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති. අයං ඛො භික්ඛවෙ ආදිත්තපරියායො ධම්මපරියායොති.

## 1. 18. 9

## හත්ථපාදූපමසුත්තං

236. හත්ථෙසු භික්ඛවෙ සති ආදානනික්ඛෙපනං පඤ්ඤායති. පාදෙසු සති අභික්කමපටික්කමො පඤ්ඤායති. පබ්බෙසු සති සම්මිඤ්ජන[1] පසාරණං පඤ්ඤායති. කුච්ඡිස්මිං සති ජිඝච්ඡා පිපාසා පඤ්ඤායති. එවමෙව ඛො භික්ඛවෙ චක්ඛුස්මිං සති චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති අජ්ඣත්තං සුඛං දුක්ඛං[2]. සොතස්මිං සති සොතසම්ඵස්සපච්චයා උප්පජ්ජති අජ්ඣත්තං සුඛං දුක්ඛං. ඝානස්මිං සති ඝානසම්ඵස්සපච්චයා උප්පජ්ජති අජ්ඣත්තං සුඛං දුක්ඛං. ජිව්හාය සති ජිව්හාසම්ඵස්සපච්චයා උප්පජ්ජති අජ්ඣත්තං සුඛං දුක්ඛං. කායස්මිං සති කායසම්ඵස්සපච්චයා උප්පජ්ජති අජ්ඣත්තං සුඛං දුක්ඛං. මනස්මිං සති මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති අජ්ඣත්තං සුඛං දුක්ඛං.

හත්ථෙසු භික්ඛවෙ අසති ආදානනික්ඛෙපනං න පඤ්ඤායති, පාදෙසු අසති අභික්කමපටික්කමො න පඤ්ඤායති, පබ්බෙසු අසති සම්මිඤ්ජන පසාරණං න පඤ්ඤායති, කුච්ඡිස්මිං අසති ජිඝච්ඡා පිපාසා න පඤ්ඤායති. එවමෙව ඛො භික්ඛවෙ චක්ඛුස්මිං අසති චක්ඛුසම්ඵස්ස-පච්චයා නුප්පජ්ජති අජ්ඣත්තං සුඛං දුක්ඛං. සොතස්මිං අසති -පෙ- ඝානස්මිං අසති -පෙ- ජිව්හාය අසති ජිව්හාසම්ඵස්සපච්චයා නුප්පජ්ජති අජ්ඣත්තං සුඛං දුක්ඛං. කායස්මිං අසති -පෙ- මනස්මිං අසති මනොසම්ඵස්සපච්චයා නුප්පජ්ජති අජ්ඣත්තං සුඛං දුක්ඛන්ති.

---

1. සම්මිඤ්ජන - මජසං
2. සුඛදුක්ඛං - සයා

ඇවිලගත් හාත්පසින් දිලියෙන ගිනිදැල් සහිත තියුණු සැතෙකින් කය පහස්නා ලැබීම තිබෙවා. එකැත්තෙන් මම මෙසේ කය අනිස ය. පහස් අනිස ය කායවිඤ්ඤාණය අනිත්‍ය ය කායසම්ඵස්සය අනිත්‍ය ය. කායසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් හෙ ද අනිසැ යි මෙය ම මෙනෙහි කරමි.

නින්දට බැසගැන්ම තිබෙවා. "එකැත්තෙන් මම මෙසේ මන අනිස ය, දහම් අනිස ය මනෝවිඤ්ඤාණය අනිත්‍ය ය මනෝසම්ඵස්සය අනිත්‍ය ය මනෝසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් හෙ ද අනිසැ යි මෙය ම මෙනෙහි කරමි.

මහණෙනි, මෙසේ දක්නා ශ්‍රුතවත් ආර්යශ්‍රාවක ඇසෙහිත් කලකිරෙයි. රූපයෙහිත් කලකිරෙයි. චක්ඛුවිඤ්ඤාණයෙහිත් කලකිරෙයි. චක්ඛුසම්ඵස්සයෙහිත් කලකිරෙයි .. චක්ඛුසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් එහිත් කලකිරෙයි... මනෝසම්ඵස්සය නිසා සුව වූ හෝ දුක් වූ හෝ නොදුක්නොසුව වූ හෝ යම් මේ විඳුමෙක් උපදී නම් එහිත් කලකිරෙයි. කලකිරෙන්නේ නො ඇලෙයි. නොඇල්මෙන් මිදෙයි. මිදුණු කල්හි මිදුණේ යයි දැනීම වෙයි. ජාතිය ක්ෂය විය. බඹසර වැස නිමවන ලදි. කටයුතු කරන ලදී. මේ බැව් පිණිස අනෙකක් නැතැ යි දැනගනි යි. මහණෙනි මේ වනාහි ආදිත්තපරියාය නම් වූ දහම්නය යි.

## 1. 18. 9

## හත්ථපාදූපම සූත්‍රය

236. මහණෙනි අත් ඇති කල්හි ගැනීම බහා තැබීම පැනෙයි. පා ඇති කල්හි ඉදිරි ගමන ආපසු ගමන පැනෙයි. පුරුක් ඇති කල්හි හැකිලීම දිග හැරීම පැනෙයි. කුස ඇති කල්හි සාපවස පැනෙයි. මහණෙනි එසෙයින් ම ඇස ඇති කල්හි ඇස්පහස නිසා තමා තුළ සුවදුක් උපදී. කන ඇති කල්හි සෝපහස නිසා තමා තුළ සුවදුක් උපදී. නැහැය ඇති කල්හි නැහැපහස නිසා තමා තුළ සුවදුක් උපදී. දිව ඇති කල්හි දිව්පහස නිසා තමා තුළ සුවදුක් උපදී. කය ඇති කල්හි කාපහස නිසා තමාතුළ සුවදුක් උපදී. මන ඇති කල්හි මනපහස නිසා තමා තුළ සුවදුක් උපදී.

මහණෙනි, අත් නැති කල්හි ගැනීම බහා තැබීම නො පැනෙයි. පා නැති කල්හි ඉදිරි ගමන ආපසු ගමන නො පැනෙයි. පුරුක් නැති කල්හි හැකිලීම දිගහැරීම නො පැනෙයි. කුස නැති කල්හි සාපවස නො පැනෙයි. මහණෙනි, එසෙයින් ම ඇස නැති කල්හි ඇස්පහස නිසා තමා තුළ සුවදුක් නූපදී. කන නැති කල්හි ... නැහැය නැති කල්හි ... දිව නැති කල්හි දිව් පහස නිසා තමා තුළ සුවදුක් නූපදී. කය නැති කල්හි ... සිත නැති කල්හි ... මනපහස නිසා තමා තුළ සුවදුක් නූපදී යි.

## 1. 18. 10

## දුතියහත්ථපාදූපමසුත්තං

237. හත්ථෙසු භික්ඛවෙ සති ආදානනික්ඛෙපනං හොති, පාදෙසු සති අභික්කමපටික්කමො හොති. පබ්බෙසු සති සමිඤ්ජනපසාරණං හොති. කුච්ඡිස්මිං සති ජිඝච්ඡා පිපාසා හොති. එවමෙව ඛො භික්ඛවෙ චක්ඛුස්මිං සති චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති අජ්ඣත්තං සුඛං දුක්ඛං. සොතස්මිං -පෙ- ඝානස්මිං -පෙ- ජිව්හාය -පෙ- කායස්මිං -පෙ- මනස්මිං සති මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති අජ්ඣත්තං සුඛං දුක්ඛං.

හත්ථෙසු භික්ඛවෙ අසති ආදානනික්ඛෙපනං න හොති, පාදෙසු අසති අභික්කමපටික්කමො න හොති. පබ්බෙසු අසති සමිඤ්ජනපසාරණං න හොති, කුච්ඡිස්මිං අසති ජිඝච්ඡා පිපාසා න හොති. එවමෙව ඛො භික්ඛවෙ චක්ඛුස්මිං අසති චක්ඛුසම්ඵස්සපච්චයා නුප්පජ්ජති අජ්ඣත්තං සුඛං දුක්ඛං. සොතස්මිං අසති -පෙ- ඝානස්මිං අසති -පෙ- ජිව්හාය අසති -පෙ- කායස්මිං අසති -පෙ- මනස්මිං අසති මනොසම්ඵස්සපච්චයා නුප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛන්ති.

සමුද්දවග්ගො අට්ඨාරසමො[1]

**තස්සුද්දානං:**

ද්වෙ සමුද්දා බාළිසිකො ඛීරරුක්ඛෙන කොට්ඨිතො
කාමභූ උදයී චෙව ආදිත්තෙන ච අට්ඨමං
හත්ථපාදූපමා ද්වෙති වග්ගො තෙන පවුච්චති.

1. සමත්තො - සී 1,2

## 1. 18. 10

## ද්වීතිය හත්ථපාදූපම සූත්‍රය

237. මහණෙනි, අත් ඇති කල්හි ගැනීම බහා තැබීම වෙයි. පා ඇති කල්හි ඉදිරි ගමන ආපසුගමන වෙයි. පුරුක් ඇති කල්හි හැකිලීම දිගහැරීම වෙයි. කුස ඇති කල්හි සාපවස වෙයි. මහණෙනි, එසෙයින් ම ඇස ඇති කල්හි ඇසපහස නිසා තමා තුළ සුවදුක් උපදී. කන... නැහැය.... දිව.... කය...සිත ඇති කල්හි මනපහස නිසා තමා තුළ සුවදුක් උපදී.

මහණෙනි, අත් නැති කල්හි ගැනීම බහා තැබීම නො වෙයි. පා නැති කල්හි ඉදිරි ගමන ආපසු ගමන නො වෙයි. පව් (පුරුක්) නැති කල්හි හැකිලීම දිග හැරීම නො වෙයි. කුස නැති කල්හි සාපවස නො වෙයි. මහණෙනි, එසෙයින් ම ඇස නැති කල්හි ඇස්පහස නිසා තමා තුළ සුවදුක් නූපදී. කන නැති කල්හි... නැහැය නැති කල්හි... දිව නැති කල්හි... කය නැති කල්හි... සිත නැති කල්හි මනපහස නිසා තමා තුළ සුවදුක් නූපදී යි.

**අටළොස්වැනි සමුද්ද වර්ග යි.**

**එහි සූත්‍රනාමාවලිය:**

සමුද්ද සූත්‍ර දෙකෙකි. බාළිසික, ඛීරරුක්ඛොපම, කොට්ඨිත, කාමභූ උදයී, ආදිත්ත යයි සයෙකි. හත්ථපාදූපම සූත්‍ර දෙකෙකැ යි. එයින් වර්ගය යි කියනු ලැබෙ.

# 19. ආසිවිසවග්ගො

## 1. 19. 1

### ආසිවිසොපමසුත්තං

238. එවං මෙ සුතං එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති භදන්තෙති. තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

සෙය්‍යථාපි භික්ඛවෙ චත්තාරො ආසිවිසා[1] උග්ගතෙජා ඝොරවිසා. අථ පුරිසො ආගච්ඡෙය්‍ය ජීවිතුකාමො අමරිතුකාමො සුඛකාමො දුක්ඛ-පටික්කූලො[2], තමෙනං එවං වදෙය්‍යුං: "ඉමෙ තෙ අම්භො පුරිස, චත්තාරො ආසිවිසා උග්ගතෙජා ඝොරවිසා කාලෙනකාලං වුට්ඨාපෙතබ්බා, කාලෙන කාලං නහාපෙතබ්බා,[3] කාලෙන කාලං භොජෙතබ්බා, කාලෙන කාලං සංවෙසෙතබ්බා[4]; යදා ච ඛො තෙ අම්භො පුරිස, ඉමෙසං චතුන්නං ආසිවිසානං උග්ගතෙජානං ඝොරවිසානං අඤ්ඤතරො වා අඤ්ඤතරො වා කුප්පිස්සති: තතො ත්වං අම්භො පුරිස මරණං වා නිගච්ඡසි[5] මරණමත්තං වා දුක්ඛං: යන්තෙ අම්භො, පුරිස කරණීයං තං කරොහී''ති,

අථ ඛො සො භික්ඛවෙ පුරිසො භීතො චතුන්නං ආසිවිසානං උග්ගතෙජානං ඝොරවිසානං යෙන වා තෙන වා පලායෙථ, තමෙනං එවං වදෙය්‍යුං: ඉමෙ තෙ[6] අම්භො පුරිස, පඤ්චවධකා පච්චත්ථිකා පිට්ඨිතො පිට්ඨිතො අනුබද්ධා[7] යත්ථෙව නං පස්සිස්සාම තත්ථෙව ජීවිතා වොරොපෙස්සාමාති; යන්තෙ අම්භො පුරිස කරණීයං තං කරොහීති. අථ ඛො සො භික්ඛවෙ පුරිසො භීතො චතුන්නං ආසිවිසානං උග්ගතෙජානං ඝොරවිසානං, භීතො පඤ්චන්නං වධකානං පච්චත්ථිකානං යෙන වා තෙන වා පලායෙථ.

තමෙනං එවං වදෙය්‍යුං: අයං තෙ අම්භො පුරිස ඡට්ඨො අන්තරචරො වධකො උක්ඛිත්තාසිකො පිට්ඨිතො පිට්ඨිතො අනුබද්ධො යත්ථෙව නං පස්සිස්සාමි තත්ථෙව සිරො පාතෙස්සාමීති[8] යන්තෙ අම්භො පුරිස කරණීයං තං කරොහීති. අථ ඛො සො භික්ඛවෙ පුරිසො භීතො චතුන්නං ආසිවිසානං උග්ගතෙජානං ඝොරවිසානං, භීතො පඤ්චන්නං වධකානං පච්චත්ථිකානං භීතො, ඡට්ඨස්ස අන්තරචරස්ස වධකස්ස උක්ඛිත්තාසිකස්ස යෙන වා තෙන වා පලායෙථ.

---

1. ආසීවිසා – සයා
2. දුක්ඛපපටිකූලො – මජසං, දුක්ඛපටිකූලො – සයා.
3. නහාපෙතබ්බා – මජසං සයා, සී2.
4. පවෙසෙතබ්බා – සයා, PTS
5. නිගච්ඡිස්සති – සී 1, 2.
6. ඉමෙ ඛො – මජසං.
7. අනුබන්ධා – සීමු, මජසං.
8. පාතිස්සාමි – සී 1, 2.

# 19. ආසිවිස වර්ගය

## 1. 19. 1

## ආසිවිසොපම සූත්‍රය

238. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි ජේතවන නම් අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ මහණෙනි යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු වහන්සැ යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

මහණෙනි, යම් සේ බලවත් තෙද ඇති දරුණු විෂ ඇති සර්පයෝ සිවුදෙනෙක් වෙද්ද, එකල්හි ජීවත්වනු කැමති නො මැරෙනු කැමති සුව කැමති දුක් පිළිකුල් කරන පුරුෂයෙක් එන්නේ ය. ඒ මොහුට මෙසේ කියන්නාහු ය. එම්බල පුරුෂය, බලවත් තෙද ඇති දරුණු විෂ ඇති මේ සතර ආසීවිසයෝ සිවුදෙන තා විසින් කලින් කල නැගිසිටුවිය යුතුහ. කලින් කල නැහැවිය යුතුහ. කලින් කල වැළඳවිය යුතුහ. කලින් කල හොවවිය යුතුහ. එම්බල පුරුෂය, බලවත් තෙද ඇති දරුණු විෂ ඇති මේ සුසපුන්ගෙන් එක්තරා එක්තරා එකෙක් හෝ කිපෙන්නේ නම් එම්බල පුරුෂය, ඒ හෙතුවෙන් තෙපි මරණයට හෝ මරණශු පමණ දුකකට හෝ පැමිණෙන්නහු ය. එම්බල පුරුෂය, තොප විසින් යමක් කට යුතු නම් එය කරවු යි.

මහණෙනි, එකල්හි ඒ පුරුෂ තෙමෙ බලවත් තෙද ඇති දරුණු විෂ ඇති සුසපුන්ට බිය වූයේ යම් ඒ තැනකට හෝ පලා යන්නේ ය. ඒ මොහුට මෙසේ කියන්නාහු ය. එම්බල පුරුෂය, සතුරු වූ මේ වධකයෝ පස්දෙනෙක් 'යම් තැනෙක දී ම ඔහු දක්නමෝ නම් එහිදී ම දිවියෙන් තොර කරන්නෙමු' යි තා පසුපස ලුහුබඳනාහ. එම්බල පුරුෂය, තා විසින් යමක් කට හැකි නම් එය කරව'යි මහණෙනි, එකල්හි ඒ පුරිස් තෙමේ බලවත් තෙද ඇති දරුණු විෂ ඇති ඒ සුසපුන්ට බිය වූයේ සතුරු වූ වධකයන් පස්දෙනාට බිය වූයේ යම් ඒ තැනෙක හෝ පලා යන්නේ ය.

ඒ මොහුට මෙසේ කියන්නාහු ය. එම්බල පුරුෂය, ඇතුළත හැසිරෙන මේ සවැනි වධකයෙක් 'යම් තැනෙක දී ම ඔහු දක්නෙම් නම් එහිදී ම හිස සිඳ හෙළන්නෙමි යි ඔසවා ගත් කඩුවක් ඇත්තේ තා පසුපස ලුහුබඳනේ ය. එම්බල පුරුෂය, තොප විසින් යමක් කට හැකි නම් එය කරව'යි. මහණෙනි, එකල්හි ඒ පුරිස් තෙමෙ බලවත් තෙද ඇති දරුණු විෂ ඇති සතර ආශිර්විෂයන්ට බිය වූයේ සතුරු වූ පස් වධකයන්ට බිය වූයේ ඇතුළත හැසිරෙන ඔසවා ගත් කඩු ඇති සවන වධකයාට බිය වූයේ යම් ඒ තැනෙක හෝ පලා යන්නේ ය.

සො පස්සෙය්‍ය සුඤ්ඤං ගාමං: යඤ්ඤදෙව ඝරං පවිසෙය්‍ය රිත්තකඤ්ඤෙව පවිසෙය්‍ය, තුච්ඡකඤ්ඤෙව පවිසෙය්‍ය, සුඤ්ඤකඤ්ඤෙව පවිසෙය්‍ය, යඤ්ඤදෙව භාජනං පරිමසෙය්‍ය, රිත්තකඤ්ඤෙව පරිමසෙය්‍ය තුච්ඡකඤ්ඤෙව පරිමසෙය්‍ය, සුඤ්ඤකඤ්ඤෙව පරිමසෙය්‍ය. තමෙනං එවං වදෙය්‍යුං: ඉදානම්භො පුරිස, ඉමං සුඤ්ඤං ගාමං චොරා ගාමඝාතකා වධිස්සන්ති,[1] යන්තෙ අම්භො පුරිස, කරණීයං තං කරොහීති.

අථ ඛො සො භික්ඛවෙ පුරිසො භීතො චතුන්නං ආසිවිසානං උග්ගතෙජානං ඝොරවිසානං, භීතො පඤ්චන්නං වධකානං පච්චත්ථිකානං, භීතො ඡට්ඨස්ස අන්තරචරස්ස වධකස්ස උක්ඛිත්තාසිකස්ස, භීතො චොරානං ගාමඝාතකානං යෙන වා තෙන වා පලායෙථ. සො පස්සෙය්‍ය මහන්තං උදකණ්ණවං, ඔරිමංතීරං සාසඞ්කං සප්පටිභයං පාරිමංතීරං ඛෙමං අප්පටිභයං, නත්ථස්ස[2] නාවා සන්තාරණී උත්තරසෙතු වා අපරාපරං[3] ගමනාය.

අථ ඛො භික්ඛවෙ තස්ස පුරිසස්ස එවමස්ස: 'අයං ඛො මහාඋදකණ්ණවො, ඔරිමඤ්ච තීරං සාසඞ්කං සප්පටිභයං, පාරිමං තීරං ඛෙමං අප්පටිභයං; නත්ථි ච නාවා සන්තාරණී උත්තරසෙතු වා අපරාපරං ගමනාය, යන්නූනාහං තිණකට්ඨසාඛාපලාසං සංකඩ්ඪිත්වා කුල්ලං බන්ධිත්වා තං කුල්ලං නිස්සාය හත්ථෙහි ච පාදෙහි ච වායමමානො සොත්ථිනා පාරං ගච්ඡෙය්‍යන්ති.' අථ ඛො සො භික්ඛවෙ පුරිසො තිණකට්ඨසාඛාපලාසං සංකඩ්ඪිත්වා කුල්ලං බන්ධිත්වා තං කුල්ලං නිස්සාය හත්ථෙහි ච පාදෙහි ච වායමමානො සොත්ථිනා පාරං ගච්ඡෙය්‍ය, තිණ්ණො පාරගතො ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො.

උපමා ඛො ම්‍යායං භික්ඛවෙ, කතා අත්ථස්ස විඤ්ඤාපනාය, අයඤ්චෙත්ථ අත්ථො: චත්තාරො ආසිවිසා උග්ගතෙජා ඝොරවිසාති ඛො භික්ඛවෙ, චතුන්නෙතං[4] මහාභූතානං අධිවචනං, පඨවිධාතුයා ආපොධාතුයා තෙජොධාතුයා වායොධාතුයා.

පඤ්ච වධකා පච්චත්ථිකාති ඛො භික්ඛවෙ, පඤ්චන්නෙතං[5] උපාදානක්ඛන්ධානං අධිවචනං, සෙය්‍යථීදං- රූපූපාදානක්ඛන්ධස්ස, වෙදනූපාදානක්ඛන්ධස්ස, සඤ්ඤූපාදානක්ඛන්ධස්ස, සඞ්ඛාරූපාදානක්ඛන්ධස්ස විඤ්ඤාණූපාදානක්ඛන්ධස්ස. ඡට්ඨො අන්තරචරො වධකො උක්ඛිත්තාසිකොති ඛො භික්ඛවෙ, නන්දිරාගස්සෙතං අධිවචනං. සුඤ්ඤො ගාමොති ඛො භික්ඛවෙ, ඡන්නෙතං[6] අජ්ඣත්තිකානං ආයතනානං අධිවචනං.

---

1. පවිසන්ති -- මජසං.
2. න චස්ස සී - 1, 2. මජසං
3. අපාරාපාරං -- මජසං. අපාරපාරං සී2.
4. චතුන්නං - සී2
5. පඤ්චන්නං -- සී2.
6. ඡන්නං -- සී2.

හෙතෙමේ හිස් ගමක් දක්නේ ය. යම් යම් ගෙයකට පිවිසෙන්නේ නම් කිසිවක් නැති ගෙයකට ම පිවිසෙන්නේ ය. හිස් ගෙයකට ම පිවිසෙන්නේ ය. ශූන්‍ය ගෙයකට ම පිවිසෙන්නේ ය. යම් යම් බඳුනක් (ආහාරපාන ඇතැයි) අල්ලන්නේ නම් කිසිවක් නැත්තක් ම අල්ලන්නේය. හිස් වූවක් ම අල්ලන්නේ ය. ශූන්‍ය වූවක් ම අල්ලන්නේ ය. ඒ මොහුට මෙසේ කියන්නාහු ය: එම්බල පුරුෂය, ගම් පහරන හොරු දැන් මේ ගම නසන්නාහ. තා විසින් යමක් කළ හැකි නම් එය කරව යි.

මහණෙනි, එකල්හි ඒ පුරිස් තෙමේ බලවත් තෙද ඇති දරුණු විෂ ඇති සතර ආශීර්විෂයන්ට බිය වූයේ සතුරු වූ පස්වධකයන්ට බිය වූයේ ඇතුළත හැසිරෙන ඔසවා ගත් කඩු ඇති සවන වධකයාට බිය වූයේ ගම්පහරන සොරුන්ට බිය වූයේ යම් ඒ තැනක හෝ පලා යන්නේ ය. හෙතෙමේ මහත් ජලාසයක් දක්නේ ය. මෙතෙර සැක සහිත ය. බිය සහිත ය. පරතෙර උවදුරු රහිත ය. බිය රහිත ය. එහි එතෙර මෙතෙර කරන නැවක් හෝ ඔබමොබ යෑමට හෙයක් හෝ නැත.

මහණෙනි, එකල්හි ඒ පුරිස්හට මෙබඳු සිතෙක් වන්නේ ය: 'මෙය මහාජලාසයෙකි. මෙතෙර සැක සහිත ය. බිය සහිත ය. පරතෙර උවදුරු රහිත ය. බිය රහිත ය. එතෙර මෙතෙර කරන නැවක් හෝ ඔබමොබ යෑමට හෙයක් හෝ නැත. මම තණ දර අතු කොළ රැස් කොට පහුරක් බැඳ ඒ පහුර නිසා අතින් ද පයින් ද වෑයම් කරමින් සුවසේ පරතෙරට යන්නෙම් නම් මැනවැ'යි. මහණෙනි, එකල්හි ඒ පුරිස් තෙමේ තණ දර අතු කොල රැස් කොට පහුරක් බැඳ ඒ පහුර නිසා අතින් ද පයින් ද වෑයම් කරමින් සුවසේ පරතෙරට යන්නේ ය. තරණය කළ පරතෙරට පැමිණි බමුණු තෙමේ (නිවන් නමැති) ගොඩබිම සිටී.

මහණෙනි, මා විසින් අරුත් ඇඟවීම පිණිස මේ උපමාව කරන ලදී. මේ මෙහි අර්ථ යයි: මහණෙනි, බලවත් තෙද ඇති දරුණු විෂ ඇති සතර ආශීර්විෂයෝ යනු පඨවි ධාතුවට ද ආපො ධාතුවට ද තෙජො ධාතුවට ද වායො ධාතුවට ද යන සතර මහාභූතයන්ට මේ නමෙකි.

මහණෙනි. 'සතුරු වූ පස්වධකයෝ' ය යනු උපාදනස්කන්ධ පසට–එනම් රූපොපාදනස්කන්ධයට ද වෙදනොපාදනස්කන්ධයට ද සංඥොපාදනස්කන්ධයට ද සංස්කාරොපාදනස්කන්ධයට ද විඥානොපාදනස්කන්ධයට ද මේ නමෙකි. මහණෙනි, ඇතුළත හැසිරෙන ඔසවා ගත් කඩු ඇති සවන වධකයා ය යනු නන්දිරාගයට මේ නමෙකි. මහණෙනි, 'හිස්ගම'ය යනු ආධ්‍යාත්මික ෂඩායතනයට මේ නමෙකි.

චක්ඛුතො චෙපි නං භික්ඛවෙ පණ්ඩිතො ව්‍යත්තො මෙධාවී උපපරික්ඛති, රිත්තකඤ්ඤෙව ඛායති, තුච්ඡකඤ්ඤෙව ඛායති, සුඤ්ඤකඤ්ඤෙව ඛායති. සොතතො චෙපි නං භික්ඛවෙ -පෙ- ඝානතො චෙපි නං භික්ඛවෙ -පෙ- ජිව්හාතො චෙපි නං භික්ඛවෙ -පෙ- කායතො චෙපි නං භික්ඛවෙ -පෙ- මනතො චෙපි නං භික්ඛවෙ පණ්ඩිතො ව්‍යත්තො මෙධාවී උපපරික්ඛති; රිත්තකඤ්ඤෙව ඛායති, තුච්ඡකඤ්ඤෙව ඛායති, සුඤ්ඤකඤ්ඤෙව ඛායති.

චොරා ගාමඝාතකාති ඛො භික්ඛවෙ, ඡන්නෙතං බාහිරානං ආයතනානං අධිවචනං. චක්ඛු භික්ඛවෙ හඤ්ඤති මනාපාමනාපෙසු රූපෙසු, සොතං හඤ්ඤති මනාපාමනාපෙසු සද්දෙසු, ඝානං හඤ්ඤති මනාපාමනාපෙසු ගන්ධෙසු, ජිව්හා හඤ්ඤති මනාපාමනාපෙසු රසෙසු, කායො හඤ්ඤති මනාපාමනාපෙසු ඵොට්ඨබ්බෙසු. මනො හඤ්ඤති මනාපාමනාපෙසු ධම්මෙසු.

මහාඋදකණ්ණවොති ඛො භික්ඛවෙ, චතුන්නෙතං ඔඝානං අධිවචනං: කාමොඝස්ස, භවොඝස්ස, දිට්ඨොඝස්ස, අවිජ්ජොඝස්ස. ඔරිමං තීරං සාසඞ්කං සප්පටිභයන්ති ඛො භික්ඛවෙ සක්කායස්සෙතං අධිවචනං. පාරිමං තීරං ඛෙමං අප්පටිභයන්ති ඛො භික්ඛවෙ, නිබ්බානස්සෙතං අධිවචනං. කුල්ලන්ති ඛො භික්ඛවෙ, අරියස්සෙතං අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස අධිවචනං, සෙය්‍යථීදං: සම්මාදිට්ඨියා සම්මාසඞ්කප්පස්ස සම්මාවාචාය සම්මාකම්මන්තස්ස, සම්මාආජීවස්ස, සම්මාවායාමස්ස, සම්මාසතියා, සම්මාසමාධිස්ස. හත්ථෙහි ච පාදෙහි ච වායමමානොති ඛො භික්ඛවෙ විරියාරම්භස්සෙතං අධිවචනං. තිණ්ණො පාරගතො ථලෙ තිට්ඨති බ්‍රාහ්මණොති ඛො භික්ඛවෙ, අරහතො එතං අධිවචනන්ති.

## 1. 19. 2

## රථූපමසුත්තං

239. තීහි භික්ඛවෙ, ධම්මෙහි සමන්නාගතො භික්ඛු දිට්ඨෙව ධම්මෙ සුඛසොමනස්සබහුලො විහරති, යොනි චස්ස ආරද්ධා හොති ආසවානං ඛයාය. කතමෙහි තීහි: ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති, භොජනෙ මත්තඤ්ඤූ, ජාගරියං අනුයුත්තො.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති: ඉධ භික්ඛවෙ, භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී, යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති, රක්ඛති චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති;

මහණෙනි, ව්‍යක්ත වූ නුවණැති පණ්ඩිත තෙමේ ඉදින් ඇසිනුත් එය පිරික්සා නම් කිසිවක් නැත්තක් ව ම වැටහේ. සිස් වූවක් ව ම වැටහේ. ශූන්‍ය වූවක් ව ම වැටහේ. මහණෙනි, ඉදින් කනිනුත් එය ... මහණෙනි, ඉදින් නැහැයෙනුත් එය ... මහණෙනි, ඉදින් දිවෙනුත් එය...මහණෙනි, ඉදින් කයෙනුත් එය...මහණෙනි, ව්‍යක්ත වූ නුවණැති පණ්ඩිත තෙමේ ඉදින් සිතිනුත් එය පිරික්සා නම් කිසිත් නැත්තක් ව ම වැටහේ. සිස් වූවක් ව ම වැටහේ. ශූන්‍ය වූවක් ව ම වැටහේ,

මහණෙනි, 'ගම් පහරන සොරු' ය යනු බාහිර ෂඩායතනයන්ට මේ නමෙකි. මහණෙනි, ඇස ඉටුඅනිටු රූහි ගැටෙයි, කන ඉටු අනිටු සදෙහි ගැටෙයි. නැහැය ඉටු අනිටු ගඳෙහි ගැටෙයි, දිව ඉටු අනිටු රසෙහි ගැටෙයි. කය ඉටු අනිටු පහස්හි ගැටෙයි. සිත ඉටු අනිටු දහම් හි ගැටේ.

මහණෙනි, 'මහාජලාසය' ය යනු කාමොසයට ද භවොසයට ද දිට්ඨොසයට ද අවිජ්ජොසයට ද යන චතුරොසයට මේ නමෙකි. මහණෙනි, 'සැක සහිත බිය සහිත මෙතෙර'ය යනු සක්කාය (ත්‍රෛභූමක පඤ්චස්කන්ධ) යට මේ නමෙකි. මහණෙනි, 'උවදුරු රහිත බිය රහිත පරතෙරය' යනු නිවනට මේ නමෙකි. මහණෙනි, 'පහුරය' යනු අරිඅටඟිමඟට එනම් – සම්මාදිට්ඨියට ද සම්මාසඞ්කප්පයට ද සම්මාවාචාවට ද සම්මාකම්මන්තයට ද සම්මාආජීවයට ද සම්මාවායාමයට ද සම්මාසතියට ද සම්මාසමාධියට ද මේ නමෙකි. මහණෙනි, 'අතින් ද පයින් ද වැයම් කරන්නේ ය'' යනු විරියාරම්භයට මේ නමෙකි. මහණෙනි, තරණය කළ පරතෙරට පැමිණි බමුණු තෙමේ ගොඩබිම සිටී' යනු රහතුන් වහන්සේට මේ නමෙකි යි.

## 1. 19. 2

## රථූපම සූත්‍රය

239. මහණෙනි, දහම් තුනකින් සමන්විත වූ මහණ දිටුදැමියෙහි ම සුවසොම්නස් බහුල ව වෙසෙයි, කෙලෙසුන් නැසීම පිණිස කරුණු ද ඕහුට පිරිපුන් වෙයි. කවරතුනකින් ද යත්: ඉඳුරන්හි වසන ලද දොර ඇත්තේ බොජුනෙහි පමණ දන්නේ නිදිවැරීමෙහි යෙදුනේ වෙයි.

මහණෙනි, කෙසේ නම් මහණ ඉඳුරන්හි වසන ලද දොර ඇත්තේ වේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ ඇසින් රූ දැක නිමිති වශයෙන් නො ගන්නේ අනුව්‍යඤ්ජන වශයෙන් නො ගන්නේ වෙයි. යම් හේතුවකින් චක්ඛුන්ද්‍රියය සංවෘත නො කොට වෙසෙන මොහු අභිජ්ඣා දෝමනස්ස යන ලාමක අකුසල් දහම්හු අනුබඳනාහු ද, එහි සංවරය පිණිස පිළිපදියි. ඇස රකියි. ඇසෙහි සංවරයට පැමිණෙයි.

සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති, රක්ඛති මනින්ද්‍රියං, මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති.

සෙය්‍යථාපි භික්ඛවෙ, සුභූමියං චාතුම්මහාපථෙ ආජඤ්ඤරථො යුත්තො අස්ස[1] ඔධස්තපතොදො:[2] තමෙනං දක්ඛො යොග්ගාචරියො අස්සදම්මසාරථී අභිරූහිත්වා වාමෙන හත්ථෙන රස්මියො ගහෙත්වා දක්ඛිණෙන හත්ථෙන පතොදං ගහෙත්වා යෙනිච්ඡකං යදිච්ඡකං සාරෙය්‍යාපි පච්චාසාරෙය්‍යාපි එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු ඉමෙසං ඡන්නං ඉන්ද්‍රියානං ආරක්ඛාය සික්ඛති. සඤ්ඤමාය සික්ඛති, දමාය සික්ඛති, උපසමාය සික්ඛති, එවං ඛො භික්ඛවෙ, භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති.

කථඤ්ච භික්ඛවෙ, භික්ඛු භොජනෙ මත්තඤ්ඤූ හොති: ඉධ භික්ඛවෙ භික්ඛු පටිසඞ්ඛායොනිසො ආහාරං ආහාරෙති: 'නෙව දවාය න මදය න මණ්ඩනාය න විභූසනාය, යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය විහිංසූපරතියා බ්‍රහ්මචරියානුග්ගහාය, ඉති පුරාණඤ්ච වෙදනං පටිහඞ්ඛාමි, නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි, යාත්‍රා ච මෙ භවිස්සති අනවජ්ජතා ච ඵාසුවිහාරො චා'ති. සෙය්‍යථාපි භික්ඛවෙ, පුරිසො වණං[3] ආලිම්පෙය්‍ය. යාවදෙව රොපනත්ථාය[4] සෙය්‍යථා වා පන අක්ඛං අබ්භඤ්ජෙය්‍ය යාවදෙව භාරස්ස නිත්ථරණත්ථාය; එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු පටිසඞ්ඛායොනිසො ආහාරං ආහාරෙති. නෙව දවාය න මදය න මණ්ඩනාය, න විභූසනාය, යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය විහිංසූපරතියා බ්‍රහ්මචරියානුග්ගහාය, ඉති පුරාණඤ්ච වෙදනං පටිහඞ්ඛාමි, නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි, යාත්‍රා ච මෙ භවිස්සති අනවජ්ජතා ච ඵාසුවිහාරො චාති. එවං ඛො භික්ඛවෙ, භික්ඛු භොජනෙ මත්තඤ්ඤූ හොති.

කථඤ්ච භික්ඛවෙ, භික්ඛු ජාගරියං අනුයුත්තො හොති: ඉධ භික්ඛවෙ, භික්ඛු දිවසං චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙති,

1. අස්ස ඨිතො -- ස්‍යා, මජ්සං
2. ඔධතපතොදෙ -- ස්‍යා.
3. ණණං — ස්‍යා.
4. රොපනත්ථාය -- සී 1, 2. සෙවනත්ථාය — ස්‍යා.

කනින් සද අසා ... නැහැයෙන් ගඳ ගෙන ... දිවෙන් රස විඳ... කයින් පහස් පැහැස...සිතින් දහම් දැන නිමිති විසින් නො ගන්නේ අනුව්‍යඤ්ජන විසින් නො ගන්නේ වෙයි. යම් හේතුවකින් මනින්ද්‍රියය සංවෘත නො කොට වෙසෙන මොහු අභිජ්ඣා, දෞමනස්‍ය යන ලාමක අකුසල් දහම්හු අනුබඳනාහු ද එහි සංවරය පිණිස පිළිපදියි. සිත රකියි. සිතෙහි සංවරයට පැමිණෙයි.

මහණෙනි, යම්සේ මනාබිමෙක සිවුමංසලක සරසට වූ කෙවිටි ඇති ආජානීය අසුන් යෙදූ රථයක් තබන ලද්දේ වේ ද, අසුන් හික්මවීමෙහි සමත් දක්ෂ රියැදුරෙක් ඒ මේ රියට නැගී වමතින් රැහැන් ගෙන දකුණතින් කෙවිට ගෙන යම් කැමති දිගකින් යම් කැමති දිගකට හසුරුවන්නේත් පෙරලා හසුරුවන්නේත් වෙයි. මහණෙනි, එසෙයින් ම මහණ මේ සයිඳුරන් රැකීම පිණිස හික්මෙයි. සංයමය පිණිස හික්මෙයි. දමනය පිණිස හික්මෙයි. උපසමය පිණිස හික්මෙයි. මහණෙනි, මෙසේ මහණ ඉඳුරන්හි වසන ලද දොර ඇත්තේ වෙයි.

මහණෙනි, කෙසේ නම් මහණ භෝජනයෙහි පමණ දන්නේ වේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ තෙමේ නුවණින් සලකා අහර වළඳයි. (කෙසේ ද යත්:) කෙළි පිණිස නො වෙයි. මද පිණිස නො වෙයි. අඟපසඟ වඩනු පිණිස නො වෙයි. සැරසුම් පිණිස නො වෙයි. මේ කයෙහි පැවැත්ම පිණිස ම ය. යැපීම පිණිස ම ය. සාගිනි වේදනා වැළැක්ම පිණිස ම ය. බඹසරට අනුග්‍රහ පිණිස ම ය. මෙසේ පැරණි වෙදනාව ද නසමි. අලුත් වෙදනා ද නූපදවන්නෙමි. මාගේ ඉරියවු පැවැත්ම ද නිවරද බව ද පහසු විහරණය ද වන්නේ යයි. මහණෙනි, යම්සේ පුරුෂයෙක් මස් වැඩීම පිණිස ම වණයක බෙහෙත් ගල්වන්නේ ද යම්සේ හෝ බර ගෙන යනු පිණිස ම අකුරෙහි තෙල් ගල්වන්නේ ද මහණෙනි, එසෙයින් ම මහණ නුවණින් සලකා අහර වළඳයි. (කෙසේ ද යත්:) කෙළි පිණිස නො වෙයි. මද පිණිස නො වෙයි. අඟපසඟ වඩනු පිණිස නො වෙයි. සැරසුම පිණිස නො වෙයි. මේ කයෙහි පැවැත්ම පිණිස ම ය. යැපීම පිණිස ම ය. වෙදනා නැසීම පිණිස ම ය. බඹසරට අනුග්‍රහ පිණිස ම ය. මෙසේ පැරණි වේදනාත් නසමි. අලුත් වේදනාත් නූපදවන්නෙමි. මාගේ ඉරියවු පැවැත්ම ද නිවරදබව ද පහසු විහරණය ද වන්නේ යයි. මහණෙනි, මෙසේ මහණ භෝජනයෙහි පමණ දන්නේ වෙයි.

මහණෙනි, කෙසේ නම් මහණ නිදි වැරීමෙහි යෙදුනේ වේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ දහවල මුළුල්ලෙහි සක්මනින් ද හිඳීමෙන් ද නීවරණදහමුන්ගෙන් සිත පිරිසිදු කෙරෙයි.

රත්තියා පඨමං යාමං චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙති, රත්තියා මජ්ඣිමං යාමං දක්ඛිණෙන පස්සෙන සීහසෙය්‍යං කප්පෙති පාදෙ පාදං අච්චාධාය සතො සම්පජානො උට්ඨානසඤ්ඤං මනසිකරිත්වා. රත්තියා පච්ඡිමං යාමං පච්චුට්ඨාය චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙති. එවං ඛො භික්ඛවෙ, භික්ඛු ජාගරියං අනුයුත්තො හොති. ඉමෙහි ඛො භික්ඛවෙ, තීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු දිට්ඨෙව ධම්මෙ සුඛසොමනස්සබහුලො විහරති; යොනි චස්ස ආරද්ධා හොති ආසවානං ඛයායාති.

## 1. 19. 3

## කුම්මොපමසුත්තං

240. භූතපුබ්බං භික්ඛවෙ, කුම්මො කච්ඡපො සායන්හසමයං අනුනදීතීරෙ ගොචරපසුතො අහොසි; සිගාලොපි ඛො භික්ඛවෙ සායන්හසමයං අනුනදීතීරෙ ගොචරපසුතො හොති. අද්දසා ඛො භික්ඛවෙ කුම්මො කච්ඡපො සිගාලං දූරතොව ගොචරපසුතං, දිස්වාන සොණ්ඩිපඤ්චමානි අඞ්ගානි සකෙ කපාලෙ සමොදහිත්වා අප්පොස්සුක්කො තුණ්හීභූතො සංකසායති[1]. සිගාලොපි ඛො භික්ඛවෙ අද්දස කුම්මං කච්ඡපං දූරතොව,[2] දිස්වාන යෙන කුම්මො කච්ඡපො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා කුම්මං කච්ඡපං පච්චුපට්ඨිතො අහොසි; යදයං කුම්මො කච්ඡපො සොණ්ඩිපඤ්චමානං අඞ්ගානං අඤ්ඤතරං වා අඤ්ඤතරං වා අඞ්ගං අභිනින්නාමෙස්සති, තත්ථෙව නං ගහෙත්වා උද්දාලිත්වා ඛාදිස්සාමීති. යදා ඛො භික්ඛවෙ කුම්මො කච්ඡපො සොණ්ඩිපඤ්චමානං අඞ්ගානං අඤ්ඤතරං වා අඤ්ඤතරං වා අඞ්ගං න අභිනින්නාමෙසි, අථ සිගාලො කුම්මම්හා නිබ්බිජ්ජ පක්කාමි. ඔතාරං අලභමානො.

එවමෙව ඛො භික්ඛවෙ තුම්හෙපි මාරො පාපිමා සතතං සමිතං පච්චුපට්ඨිතො; 'අප්පෙවනාමාහං ඉමෙසං චක්ඛුතො වා ඔතාරං ලභෙය්‍යං, සොතතො වා ඔතාරං ලභෙය්‍යං, ඝානතො වා ඔතාරං ලභෙය්‍යං, ජිව්හාතො වා ඔතාරං ලභෙය්‍යං, කායතො වා ඔතාරං ලභෙය්‍යං, මනතො වා ඔතාරං ලභෙය්‍ය''න්ති.

තස්මාතිහ භික්ඛවෙ ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරා විහරථ, චක්ඛුනා රූපං දිස්වා මා නිමිත්තග්ගාහිනො අහුවත්ථ, මානුබ්‍යඤ්ජනග්ගාහිනො; යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුත- විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජථ, රක්ඛථ චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජථ.

1. සංකලායති — අට්ඨකථා.
2. දූරතොව ගොචරපසුතං — මජසං., සයා.

ඩ පෙරයම සක්මනින් හා හිඳීමෙන් ද නීවරණදහමුන්ගෙන් සිත පිරිසිදු කෙරෙයි. ඩ මැදියම දකුණු පයෙහි වම් පය මදක් මැත් කොට තබා සිහි ඇති ව මනා නුවණැති ව (මෙතෙක් කලෙකින්) නැගිටිමි යන හැඟීම මෙනෙහි කොට දකුණැලයෙන් සිංහශයයාව කෙරෙයි. ඩ පැසුලුයම නැගිට සක්මනින් හා හිඳීමෙන් ද නීවරණදහමුන්ගෙන් සිත පිරිසිදු කෙරෙයි. මහණෙනි, මහණ මෙසේ නිදිවැරීමෙහි යෙදුනේ වෙයි. මහණෙනි, මේ තුන්දහමුන්-ගෙන් යුත් මහණ දිටුදැමියෙහි ම සුවසොම්නස් බහුල කොට ඇත්තේ වෙසෙයි. කෙලෙසුන් නැසීම පිණිස කරුණු ද පිරිපුන් වූයේ වේ යි.

## 1. 19. 3

### කුම්මොපම සූත්‍රය

240. මහණෙනි, පෙර වූවක් කියමි: ඉදිබුවෙක් සවස් වේලෙහි ගංඉවුර අසබඩ ගොදුරු සෙවීමෙහි යෙදුනේ විය. මහණෙනි, සිවලෙක් ද සවස් වේලෙහි ගංඉවුර අසබඩ ගොදුරු සෙවීමෙහි යෙදුනේ වෙයි. මහණෙනි, ඉදිබුවා ගොදුරු සෙවීමෙහි යෙදුණු සිවලා දුර දී ම දුටුයේ ය. දැක හිස පස්වැනි කොට ඇති අවයව සිය කබලෙහි බහා ගෙන නිරුත්සුකව නිහඬ ව හිඳී. මහණෙනි, සිවලා ද ඉදිබුවා දුර දී ම දුටු යේ ය. දැක ඉදිබුවා වෙත එළඹීයේ ය. එළඹ ''යම් කලෙක මේ ඉදිබුවා හිසපස්වැනි කොට ඇති අවයවයන්ගෙන් එක්තරා හෝ එක්තරා හෝ අවයව යක් පිටතට නිකුත් කරන්නේ නම් එහි ම එය ඩැහැ ගෙන කඩා කන්නෙමි'' යි ඉදිබුවාට ළං ව සිටියේ ය. මහණෙනි, යම් කලෙක ඉදිබුවා හිසපස්වැනි කොට ඇති අවයවයන්ගෙන් එක්තරා හෝ එක්තරා හෝ අවයවයක් පිටතට නිකුත් නො කෙළේ ද එකල්හි සිවලා ඉඩක් නො ලබනුයේ ඉදිබුවාගෙන් ඉවත් ව ගියේ ය.

මහණෙනි, එසෙයින් ම තොප වෙත ද පවිටු මරු තෙමේ ''මම මොවුන්ගේ ඇසින් හෝ ඉඩක් ලබන්නෙම් නම් කනින් හෝ ඉඩක් ලබන්නෙම් නම් නැහැයෙන් හෝ ඉඩක් ලබන්නෙම් නම් දිවෙන් හෝ ඉඩක් ලබන්නෙම් නම් කයින් හෝ ඉඩක් ලබන්නෙම් නම් සිතින් හෝ ඉඩක් ලබන්නෙම් නම් මැනවැ යි නිතර එළඹ සිටියේ වෙයි.

මහණෙනි, එහෙයින් මෙහි ලා ඉඳුරන්හි වැසූ දොර ඇති ව වසවු. ඇසින් රූ දැක නිමිති විසින් ගන්නෝ නොවවු. අනුව්‍යඤ්ජන විසින් ගන්නෝ නොවවු. යමක් හේතු කොට ගෙන චක්ඛුන්ද්‍රිය සංවෘත නො කොට වෙසෙන මොහු අභිජ්ඣා දෞමනස්‍ය යන ලාමක අකුසල් දහම්හු අනුබඳනාහු නම් එහි සංවරය පිණිස පිළිපදිවු. චක්ඛුන්ද්‍රිය රකිවු. චක්ඛුන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙවු.

සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ-කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය මා නිමිත්තග්ගාහිනො අහුවත්ථ, මානුබ්‍යඤ්ජනග්ගාහිනො, යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජථ, රක්ඛථ මනින්ද්‍රියං, මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජථ. යතො ඛො තුම්හෙ භික්ඛවෙ, ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරා විහරිස්සථ, අථ තුම්හෙහිපි මාරො පාපිමා නිබ්බිජ්ජ පක්කමිස්සති ඔතාරං අලභමානො කුම්මම්හාව සිගාලොති.

කුම්මොව අඞ්ගානි සකෙ කපාලෙ
සමොදහං භික්ඛු මනො විතක්කෙ
අනිස්සිතො අඤ්ඤමහෙඨයානො
පරිනිබ්බුතො න උපවදෙය්‍ය කඤ්චීති.

## 1. 19. 4

## දරුක්ඛන්ධොපමසුත්තං

241. එකං සමයං භගවා අයොජ්ඣායං[1] විහරති ගඞ්ගාය නදියා තීරෙ, අද්දසා ඛො භගවා මහන්තං දරුක්ඛන්ධං ගඞ්ගාය නදියා සොතෙන වුය්හමානං, දිස්වාන භික්ඛූ ආමන්තෙසි, පස්සථ නො තුම්හෙ භික්ඛවෙ අමුං මහන්තං දරුක්ඛන්ධං ගඞ්ගාය නදියා සොතෙන වුය්හමානන්ති? එවම්භන්තෙ.

සචෙ ඛො භික්ඛවෙ දරුක්ඛන්ධො න ඔරිමං තීරං උපගච්ඡති, න පාරිමං තීරං උපගච්ඡති, න මජ්ඣෙ සංසීදිස්සති, න ථලෙ උස්සීදිස්සති න මනුස්සග්ගාහො භවිස්සති, න අමනුස්සග්ගාහො භවිස්සති, න ආවට්ටග්ගාහො භවිස්සති, න අන්තොපූති භවිස්සති: එවං හි සො භික්ඛවෙ දරුක්ඛන්ධො සමුද්දනින්නො භවිස්සති, සමුද්දපොණො සමුද්දපබ්භාරො. තං කිස්ස හෙතු, සමුද්දනින්නො භික්ඛවෙ, ගඞ්ගාය නදියා සොතො, සමුද්දපොණො, සමුද්දපබ්භාරො.

එවමෙව ඛො භික්ඛවෙ සචෙ තුම්හෙපි න ඔරිමං තීරං උපගච්ඡථ[2] න පාරිමං තීරං උපගච්ඡථ න මජ්ඣෙ සංසීදිස්සථ, න ථලෙ උස්සීදිස්සථ, න මනුස්සග්ගාහා හෙස්සථ[3] න අමනුස්සග්ගාහා හෙස්සථ, න ආවට්ටග්ගාහා හෙස්සථ, න අන්තොපූති භවිස්සථ. එවං තුම්හෙ භික්ඛවෙ නිබ්බානනින්නා භවිස්සථ, නිබ්බානපොණා නිබ්බානපබ්භාරා. තං කිස්ස හෙතු: නිබ්බානනින්නා භික්ඛවෙ සම්මාදිට්ඨි, නිබ්බානපොණා, නිබ්බාණපබ්භාරාති.

1. කොසම්බියං — මජ්සං
2. උපගච්ඡිත්ථ - සී1.
3. ගහෙස්සති - මජ්සං.

කනින් සද අසා ... නැහැයින් ගඳ ගෙන ... දිවින් රස විඳ... කයින් පහස් පැහැස...සිතින් දහම් දැන නිමිති විසින් ගන්නෝ නොවවු. අනුව්‍යඤ්ජන විසින් ගන්නෝ නොවවු. යමක් හේතුකොට ගෙන මනින්ද්‍රියය සංවෘත නො කොට වසන මොහු අභිජ්ඣා දෙමනස්ස යන ලාමක අකුසල් දහම්හු අනුබඳනාහු නම් එහි සංවරය පිණිස පිළිපදිවු. මනින්ද්‍රියය රකිවු. මනින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙවු. මහණෙනි, යම් කලෙක තෙපි ඉඳුරන්හි වැසූ දොර ඇති ව වසන්නහු නම් එකල්හි පවිටු මරු තෙමේ ඉඩක් නො ලබනුයේ කලකිරී ඉදිබුවා කෙරෙන් සිවලා මෙන් තොප කෙරෙනුදු ඉවත් ව යන්නේ ය.

සිය කබලෙහි අවයව බහා ගන්නා ඉදිබුවා මෙන් මහණ සිතිවිලි බහා තබන්නේ (තෘෂ්ණා දෘෂ්ටීන් විසින්) නොඇසුරු-කරන ලදුයේ මෙරමා නො පෙළනුයේ පිරිනිවියේ කිසිවකුට උපවාද නො කරන්නේ යයි,

## 1. 19. 4

## දරුක්ඛන්ධොපම සූත්‍රය

241. **එක්සමයෙක භාග්‍යවතුන් වහන්සේ අයෝධ්‍යා** නුවර **සමීපයෙහි ගඞ්ගා ගංඉවුරෙහි** වැඩවසන සේක. භාග්‍යවතුන් වහන්සේ ගඞ්ගා නදියෙහි සැඩපහරින් ගසා ගෙන යන මහත් දරකඳක් දුටු සේක. දැක භික්ෂූන් ඇමතූ සේක. මහණෙනි, තෙපි ගඞ්ගා නදියෙහි සැඩපහරින් ගෙන යනු ලබන තෙල මහදරකඳ දකිවු දැ? යි. වහන්ස, එසේ ය.

මහණෙනි, ඉදින් දරකඳ මෙතෙරට නො පැමිණේ නම් එතෙරට නො පැමිණේ නම් මැද නො කිඳා නම් ගොඩට නො ගැසෙන්නේ නම් මිනිසුන්ගේ ගැනීමෙක් නො වන්නේ නම් නොමිනිසුන්ගේ ගැනීමෙක් නො වන්නේ නම් සුළියකට හසුවීමෙක් නො වන්නේ නම් ඇතුළත කුණුවූයේ (ගහ තුළ ම දිරාගියේ) නො වන්නේ නම් මහණෙනි, මෙසේ ඒ දරකඳ මුහුදට නැමුණේ මුහුදට නැඹුරු වූයේ මුහුදට බර වූයේ වන්නේ ය. ඒ කවර හෙයින යත්: මහණෙනි, ගඞ්ගා නදියෙහි සැඩපහර මුහුදට නැමුනේ ය. මුහුදට නැඹුරු වූයේ ය. මුහුදට බර වූයේ ය. (එහෙයිනි)

මහණෙනි, එසෙයින් ම තෙපි දු ඉදින් මෙතරට නො පැමිණෙවු නම් පරතෙරට නො පැමිණෙවු නම් මැද නො කිඳෙන්නහු නම් ගොඩට නො ගැසෙන්නහු නම් මිනිසුන් විසින් ගන්නා ලද්දෝ නො වන්නහු නම් නොමිනිසුන් විසින් ගන්නා ලද්දෝ නො වන්නහු නම් සුළියකින් ගන්නා ලද්දෝ නො වන්නහු නම් ඇතුළත කුණු වූවෝ නො වන්නහු නම් මහණෙනි, මෙසේ තෙපි නිවනට නැමුණාහු නිවනට නැඹුරු වූවාහු නිවනට බර වූවාහු වන්නහු ය ඒ කවර හෙයින යත්: මහණෙනි, සම්‍යග්දෘෂ්ටිය නිවනට නැමුණේ ය. නිවනට නැඹුරු වූයේ ය. නිවනට බර වූයේ ය. (එහෙයිනි) යි.

එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු භගවන්තං එතදවොච: කින්නු ඛො භන්තෙ ඔරිමංතීරං? කිං පාරිමංතීරං? කො මජ්ඣෙ සංසාදො[1]? කො ථලෙ උස්සාදො? කො මනුස්සග්ගාහො? කො අමනුස්සග්ගාහො? කො ආවට්ටග්ගාහො? කො අන්තොපූතිභාවොති?

ඔරිමංතීරන්ති ඛො භික්ඛු, ඡන්නෙතං අජ්ඣත්තිකානං ආයතනානං අධිවචනං, පාරිමංතීරන්ති ඛො භික්ඛු ඡන්නෙතං බාහිරානං ආයතනානං අධිවචනං. මජ්ඣෙ සංසාදොති ඛො භික්ඛු, නන්දිරාගස්සෙතං අධිවචනං. ථලෙ උස්සාදොති ඛො භික්ඛු අස්මිමානස්සෙතං අධිවචනං. කතමො ච භික්ඛු මනුස්සග්ගාහො, ඉධ භික්ඛු ගිහීහි සංසට්ඨො විහරති සහනන්දී සහසොකී සුඛිතෙසු සුඛිතො දුක්ඛිතෙසු දුක්ඛිතො උප්පන්නෙසු කිච්චකරණීයෙසු අත්තනා වොයොගං ආපජ්ජති, අයං වුච්චති භික්ඛු, මනුස්සග්ගාහො. කතමො ච භික්ඛු, අමනුස්සග්ගාහො: ඉධ භික්ඛු එකච්චො අඤ්ඤතරං දෙවනිකායං පණිධාය බ්‍රහ්මචරියං චරති: 'ඉමිනාහං සීලෙන වා වතෙන වා තපෙන වා බ්‍රහ්මචරියෙන වා දෙවො වා භවිස්සාමී දෙවඤ්ඤතරො වා'ති. අයං වුච්චති භික්ඛු, අමනුස්සග්ගාහො. ආවට්ටග්ගාහොති ඛො භික්ඛු, පඤ්චන්නෙතං කාමගුණානං අධිවචනං, කතමො ච භික්ඛු අන්තොපූතිභාවො: ඉධ භික්ඛු එකච්චො දුස්සීලො හොති පාපධම්මො. අසුචි සඞ්කස්සරසමාචාරො පටිච්ඡන්නකම්මන්තො අස්සමණො සමණපටිඤ්ඤො අබ්‍රහ්මචාරී බ්‍රහ්මචාරිපටිඤ්ඤො අන්තොපූති අවස්සුතො කසම්බුජාතො,[2] අයං වුච්චති භික්ඛු, අන්තොපූතිභාවොති.

තෙන ඛො පන සමයෙන නන්දො ගොපාලකො භගවතො අවිදූරෙ ඨිතො හොති; අථ ඛො නන්දො ගොපාලකො භගවන්තං එතදවොච; අහං ඛො භන්තෙ න ඔරිමංතීරං උපගච්ඡාමි, න පාරිමංතීරං උපගච්ඡාමි, න මජ්ඣෙ සංසීදිස්සාමි, න ථලෙ උස්සිදිස්සාමි, න මනුස්සග්ගාහො ගහිස්සති[3] න අමනුස්සග්ගාහො ගහිස්සති, න ආවට්ටග්ගාහො ගහිස්සති. න අන්තොපූති භවිස්සාමි; ලභෙය්‍යාහං භන්තෙ භගවතො සන්තිකෙ පබ්බජ්ජං ලභෙය්‍යං උපසම්පදන්ති.

තෙන හි ත්වං නන්ද, සාමිකානං ගාවො නිය්‍යාදෙහීති[4] ගමිස්සන්ති භන්තෙ ගාවො වච්ඡගිද්ධිනියොති, නිය්‍යාදෙහෙව ත්වං නන්ද, සාමිකානං ගාවොති. අථ ඛො නන්දො ගොපාලකො සාමිකානං ගාවො නිය්‍යාදෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං එතදවොච; නිය්‍යාදිතා භන්තෙ සාමිකානං ගාවො, ලභෙය්‍යාහං භන්තෙ භගවතො සන්තිකෙ පබ්බජ්ජං ලභෙය්‍යං උපසම්පදන්ති.

1. සංසීදෙ . මජසං, ස්‍යා, සී1.
2. කසම්බුකජාතො - ස්‍යා.
3. ගහෙස්සති - මජසං, අට්ඨකථා
4. නිය්‍යාතෙහීති - මජසං.

මෙසේ වදළ කල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: වහන්ස, මෙතෙර කිමෙක් ද? එතෙර කිමෙක් ද? මැද කිඳීම කිමෙක් ද? ගොඩට ගැසීම කිමෙක් ද? මිනිසුන්ගේ ගැනීම කිමෙක් ද? නොමිනිසුන්ගේ ගැනීම කිමෙක් ද? සුළියක ගැනීම කිමෙක් ද? ඇතුළත කුණුවීම කිමෙක් දැ? යි.

මහණ, 'මෙතෙර' යනු ආධ්‍යාත්මික ෂඩායතනයට මේ නමෙකි, මහණ; 'පරතෙර' ය යනු බාහිර ෂඩායතනයට මේ නමෙකි. මහණ, 'මැද කිඳීම' යනු නන්‍දිරාගයට මේ නමෙකි. මහණ, 'ගොඩට ගැසීම' යනු අස්මිමානයට මේ නමෙකි. මහණ, මිනිසුන්ගේ ගැනීම කවරේ ද යත්: මෙහි මහණ ගිහියන් හා මිශ්‍ර වූයේ සමග සතුටු වන්නේ සමග ශෝක කරන්නේ සුවපත් වූවන් අතර සුවපත් වූයේ දුකට පැමිණියන් අතර දුකට පැමිණියේ වෙසෙයි. වැඩ කටයුතු උපන් කල්හි තමා එහි යෙදිය යුතුබවට පැමිණෙයි. මහණ, මේ මිනිසුන්ගේ ගැනීම යයි කියනු ලැබේ. මහණ, නො මිනිසුන්ගේ ගැනීම කවරේ ද යත්: මහණ, මෙහි ඇතමෙක් ''මම මේ ශීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපසින් හෝ බඹසරින් හෝ දෙවියෙක් හෝ එක්තරා දෙවියෙක් හෝ වන්නෙමි' යි එක්තරා දෙවනිකායක් පතා බඹසර කෙරෙයි. මහණ, මේ නොමිනිසුන්ගේ ගැනීම යයි කියනු ලැබේ. මහණ, සුළියක ගැනීම යනු පස්කම්ගුණයන්ට මේ නමෙකි. මහණ, ඇතුළත කුණුවීම කවරේ ද යත්: මහණ, මෙසස්නෙහි ඇතමෙක් දුසිල් වූයේ ලාමක ස්වභාව ඇත්තේ අපවිත්‍ර වූයේ සැකයෙන් සිහිකට යුතු හැසුරුම් ඇත්තේ සැඟවුණු ක්‍රියා ඇත්තේ නො මහණෙක් ව මහණෙක්මි යි පිළිත ඇත්තේ බඹසර නැති ව බඹසර කරමියි පිළිත ඇත්තේ ඇතුළත කුණු වූයේ වැගිරෙන කෙලෙස් ඇත්තේ හටගත් කෙලෙස් කසට ඇත්තේ වෙයි. මහණ, මේ ඇතුළත කුණුවීම යයි කියනු ලැබේ.

එසමයෙහි නන්ද නම් ගොපලු තෙමේ භාග්‍යවතුන් වහන්සේට නුදුරෙහි සිටියේ වෙයි. එකල්හි නන්‍ද ගොපලු තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේය: වහන්ස, මම මෙතෙරට නො පැමිණෙමි. එතෙරට නො පැමිණෙමි. මැද නො කිඳෙන්නෙමි. ගොඩට නො ගැසෙන්නෙමි. මිනිසුන්ගේ ගැනීමෙක් නොවන්නේ ය. නොමිනිසුන්ගේ ගැනීමෙක් නො වන්නේ ය. සුළියක ගැනීමෙක් නො වන්නේ ය. ඇතුළත කුණු වූයෙම් නො වන්නෙමි, වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි පැවිද්ද ලබන්නෙමි. උපසපුව ලබන්නෙමි''යි.

නන්‍ද, එසේ වී නම් තෙපි හිමියන්ට ගෙරින් පාවාදෙවු යි. වහන්ස, වසුපැටවුන් කෙරෙහි ගිජු වූ දෙන්නු (තුමූ ම) යන්නාහ යි. නන්‍ද, තෙපි ම හිමියන්ට ගෙරින් පාවා දෙවු යි. එකල්හි නන්‍ද ගොපලු තෙමේ හිමියන්ට ගෙරින් පාවා දී භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේය. එළඹ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය. වහන්ස, හිමියන්ට ගෙරිහු පාවා දෙන ලදහ. වහන්ස භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි පැවිද්ද ලබන්නෙමි. උපසපුව ලබන්නෙමි යි.

අලත්ථ ඛො නන්දො ගොපාලකො භගවතො සන්තිකෙ පබ්බජ්ජං, අලත්ථූපසම්පදං; අචිරූපසම්පන්නො ච පනායස්මා නන්දො එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි, ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසි, අඤ්ඤතරො ච පනායස්මා නන්දො අරහතං අහොසීති.

## 1. 19. 5

## දුතිය දරුක්ඛන්ධොපමසුත්තං.

242. එවං මෙ සුතං එකං සමයං භගවා කිම්බිලායං[1] විහරති ගඞ්ගාය නදියා තීරෙ. අද්දසා ඛො භගවා මහන්තං දරුක්ඛන්ධං ගඞ්ගාය නදියා සොතෙන වුය්හමානං, දිස්වාන භික්ඛූ ආමන්තෙසි: පස්සථ නො තුම්හෙ භික්ඛවෙ අමුං මහන්තං දරුක්ඛන්ධං ගඞ්ගාය නදියා සොතෙන වුය්හමානන්ති? එවං භන්තෙ. -පෙ- [විත්ථාරෙතබ්බං]

එවං වුත්තෙ ආයස්මා කිම්බිලො[2] භගවන්තං එතදවොච: කින්නු ඛො භන්තෙ ඔරිමංතීරං? -පෙ- [විත්ථාරෙතබ්බං] කතමො ච කිම්බිල, අන්තොපූතිභාවො: ඉධ කිම්බිල භික්ඛු අඤ්ඤතරං සඞ්කිලිට්ඨං ආපත්තිං ආපන්නො හොති යථාරූපාය ආපත්තියා වුට්ඨානං[3] පඤ්ඤායති, අයං වුච්චති කිම්බිල, අන්තොපූතිභාවොති.

## 1. 19. 6

## අවස්සුතපරියායසුත්තං

243. එකං සමයං භගවා සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං නිග්‍රොධාරාමෙ. තෙන ඛො පන සමයෙන කාපිලවත්ථවානං[4] සක්‍යානං නවං සන්ථාගාරං අචිරකාරිතං හොති, අනජ්ඣාවුත්ථං සමණෙන වා බ්‍රාහ්මණෙන වා කෙනචි වා මනුස්සභූතෙන. අථ ඛො කාපිලවත්ථවා සක්‍යා යෙන භගවා තෙනුපසඞ්කමිංසු උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු, එකමන්තං නිසින්නා ඛො කාපිලවත්ථවා සක්‍යා භගවන්තං එතදවොචුං;

---

1. කිමිලායං - මජසං.
2. කිමිලො - මජසං
3. න වුට්ඨානං, - මජසං. සයා
4. කපිලවත්ථුවාසීනං - සයා

නන්‍ද ගොපලු තෙමේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි පැවිද්ද ලද්දේ ය. උපසපුව ලද්දේ ය. උපසපන් වූ නොබෝකල් ඇති ආයුෂ්මත් නන්‍ද තෙමේ එකලා ව ගණයා කෙරෙන් වෙන් වූයේ නො පමාව කෙලෙස් තවන වෙර ඇති ව නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති ව වෙසෙන්නේ නොබෝකලකින් ම යමක් පිණිස කුලපුත්තු මැනවින් ම ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වෙත් නම් අනුත්තර වූ මගබඹසර කෙළවර වූ ඒ රහත් ඵලය දිටුදැමී-යෙහි ම තෙමේ ම වෙසෙසින් දැන පසක් කොට එයට එළඹ විසී ය. ඉපැද්ම ගෙවිණ. බඹසර වැස නිමවන ලද, කටයුතු කරන ලදි. මේ බැව් පිණිස අනෙකක් නැතැ යි දැන ගත්තේ ය. නන්‍ද ආයුෂ්මත්හු රහතුන් අතුරෙන් එක්තරා කෙනෙක් ද වූහ යි.

## 1. 19. 5

## දුතිය දරුක්ඛන්‍ධොපම සූත්‍රය

242. මා විසින් මෙසේ අසන ලදි. එක්සමයෙක භාග්‍යවතුන් වහන්සේ කිම්බිලාව සමීපයෙහි ගඞ්ගා ගංඉවුරෙහි වැඩවසන සේක. භාග්‍යවතුන් වහන්සේ ගඞ්ගානදියෙහි සැඩපහරින් ගසා ගෙන යන මහත් දරකඳක් දුටු සේක. දැක භික්ෂූන් ඇමතූ සේක: මහණෙනි, තෙපි ගඞ්ගා නදියෙහි සැඩපහරින් ගසා ගෙන යන තෙල මහදර-කඳ දකිවු ද? යි. වහන්ස, එසේ ය...(විතර කට යුතු යි)

මෙසේ වදළ කල්හි ආයුෂ්මත් කිම්බිල තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ: වහන්ස, මෙතෙර කිමෙක් ද? ... (විතර කට යුතු යි) කිම්බිල් ඇතුළත කුණු වීම කවරේ ද යත්: කිම්බිල, මෙසස්නෙහි මහණ යම් බඳු ඇවතකින් නැඟී සිටීමෙක් පැනේ නම් (එබඳු) එක්තරා යකිලිටි ඇවැතකට පැමිණියේ වෙයි. කිම්බිල, මේ ඇතුළත කුණුවීම යයි කියනු ලැබේ යි.

## 1. 19. 6

## අවස්සුතපරියාය සූත්‍රය

243. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය දනව්වෙහි කිඹුල්වත් නුවර සමීපයෙහි නිග්‍රොධාරාමයෙහි වැඩවසන සේක. එසමයෙහි කිඹුල්වත් නුවර වැසි ශාක්‍යයන් විසින් අභිනව සණ්ඨාගාරයක් අලුත කරවන ලද්දේ වෙයි. මහණකු විසින් හෝ බමුණකු විසින් හෝ මිනිස් වූ කිසිවකු විසින් හෝ නො වෙසෙන ලද්දේ ය. එකල්හි කිඹුල්වත්පුර වැසි ශාක්‍යයෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් කිඹුල්වත් පුර ශාක්‍යයෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ:

ඉධ භන්තෙ කාපිලවත්ථවානං සක්‍යානං නවං සන්ථාගාරං අචිරකාරිතං හොති, අනජ්ඣාවුත්ථං සමණෙන වා බ්‍රාහ්මණෙන වා කෙනචි වා මනුස්සභූතෙ , තං භන්තෙ භගවා පඨමං පරිභුඤ්ජතු, භගවතා පඨමං පරිභුත්තං පච්ඡා කාපිලවත්ථවා සක්‍යා පරිභුඤ්ජිස්සන්ති; තදස්ස කාපිලවත්ථවානං සක්‍යානං දීඝරත්තං හිතාය සුඛායාති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන.

අථ ඛො කාපිලවත්ථවා සක්‍යා භගවතො අධිවාසනං විදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා යෙන නවං සන්ථාගාරං තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා සබ්බසන්ථරිං සන්ථාගාරං සන්ථරාපෙත්වා[1] ආසනානි පඤ්ඤාපෙත්වා උදකමණිකං පතිට්ඨාපෙත්වා තෙලප්පදීපං ආරොපෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා භගවන්තං එතදවොචුං: සබ්බසන්ථරිසන්ථතං භන්තෙ සන්ථාගාරං, ආසනානි පඤ්ඤත්තානි උදකමණිකො පතිට්ඨාපිතො, තෙලප්පදීපො ආරොපිතො යස්සදානි භගවා කාලං මඤ්ඤතීති.[2]

අථ ඛො භගවා නිවාසෙත්වා පත්තචීවරං ආදාය සද්ධිං භික්ඛුසඞ්ඝෙන යෙන නවං සන්ථාගාරං තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා පාදෙ පක්ඛාලෙත්වා සන්ථාගාරං පවිසිත්වා මජ්ඣිමත්ථම්භං නිස්සාය පුරත්ථාභිමුඛො නිසීදි. භික්ඛුසඞ්ඝොපි ඛො පාදෙ පක්ඛාලෙත්වා සන්ථාගාරං පවිසිත්වා පච්ඡිමං භිත්තිං නිස්සාය පුරත්ථාභිමුඛො නිසීදි භගවන්තංයෙව පුරක්ඛත්වා. කාපිලවත්ථවාපි ඛො සක්‍යා පාදෙ පක්ඛාලෙත්වා සන්ථාගාරං පවිසිත්වා පුරත්ථිමං භිත්තිං නිස්සාය පච්ඡිමාභිමුඛා[3] නිසීදිංසු භගවන්තංයෙව පුරක්ඛත්වා.

අථ ඛො භගවා කාපිලවත්ථවෙ සක්‍යෙ බහුදෙව රත්තිං ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා උය්‍යොජෙසි: 'අභික්කන්තා ඛො ගොතමා[4] රත්ති යස්සදානි කාලං මඤ්ඤථා'ති. 'එවම්භන්තෙ'ති ඛො කාපිලවත්ථවා සක්‍යා භගවතො පටිස්සුත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කමිංසු.

අථ ඛො භගවා අචිරපක්කන්තෙසු කාපිලවත්ථවෙසු සක්‍යෙසු ආයස්මන්තං මහාමොග්ගල්ලානං ආමන්තෙසි: විගතථීනමිද්ධො ඛො මොග්ගල්ලාන, භික්ඛුසඞ්ඝො, පටිභාතු තං මොග්ගල්ලාන භික්ඛූනං ධම්මිකථා, පිට්ඨි මෙ ආගිලායති[5] තමහං ආයමිස්සාමීති. එවම්භන්තෙති ඛො ආයස්මා මහාමොග්ගල්ලානො භගවතො පච්චස්සොසි. අථ ඛො භගවා චතුග්ගුණං සඞ්ඝාටිං පඤ්ඤාපෙත්වා දක්ඛිණෙන පස්සෙන සීහසෙය්‍යං කප්පෙසි පාදෙ පාදං අච්චාධාය සතො සම්පජානො උට්ඨානසඤ්ඤං මනසි කරිත්වා.

---

1. සන්ථරිත්වා - මජසං.
2. මඤ්ඤසීති - මජසං.
3. පච්ඡාමුඛා - සතා, සී 2.
4. ගොතම - සී 2.
5. පිට්ඨිමෙම ආගිලායති - සී 1, 2.

වහන්ස, මෙහි කිඹුල්වත්පුර ශාක්‍යයන් විසින් අභිනව සන්ථාගාරයක් අලුත කරවන ලද්දේ වෙයි. මහණකු විසින් හෝ බමුණකු විසින් හෝ මිනිස් වූ කිසිවකු විසින් හෝ නො වෙසෙන ලද්දේ ය. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ එය පළමු කොට පරිභෝග කරන සේක්වා. භාග්‍යවතුන් වහන්සේ විසින් පළමු කොට පරිභෝග කරන ලද්දේ පසු ව කිඹුල්වත්පුර ශාක්‍යයෝ පරිභෝග කරන්නාහ. එය කිඹුල්වත්පුර ශාක්‍යයන්ට දිගුකලක් මුළුල්ලෙහි හිත පිණිස සුව පිණිස වන්නේ යයි. භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්ද භාවයෙන් ඉවසූ සේක.

එකල්හි කිඹුල්වත්පුර ශාක්‍යයෝ භාග්‍යවතුන් වහන්සේගේ ඉවසීම දැන හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට අලුත් සන්ථාගාරය වෙත එළඹියහ. එළඹ සන්ථාගාරය සියලු ඇතිරිම් අතුරවා අසුන් පනවා මහදියසැළියක් පිහිටුවා තෙල්පහන් නගා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ: වහන්ස, සන්ථාගාරය සියලු ඇතිරිම් අතුරන ලදී. අසුන් පනවන ලදී. මහදියසැළියක් තබවන ලද්දේ ය. තෙල්පහනත් දල්වන ලද්දේ ය. භාග්‍යවතුන් වහන්සේ දැන් යමකට කල් දන්නා සේක් නම් මැනවැ යි.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ හැඳ පෙරව පාසිවුරු ගෙන බික්සඟන සමඟ අලුත් සන්ථාගාරය වෙත එළඹුණු සේක. එළඹ පා සෝද සන්ථාගාරයට පිවිස මැදුම් ටැඹ නිසා පෙරදිගට අභිමුඛ ව වැඩහුන් සේක. බික්සඟන ද පා සෝද සන්ථාගාරයට පිවිස පැසුළුබිත නිසා පෙරදිගට අභිමුඛ ව භාග්‍යවතුන් වහන්සේ ම පෙරටු කොට වැඩහුන්හ. කිඹුල්වත්පුර ශාක්‍යයෝ ද පා සෝද සන්ථාගාරයට පිවිස පෙරදිග බිත නිසා පැසුළුදිගට අභිමුඛ ව භාග්‍යවතුන් වහන්සේ ම පෙරටු කොට හුන්හ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වත්පූර ශාක්‍යයන් රෑ-බොහෝ වේලාවක් මුළුල්ලෙහි දැහැමිකථාවෙන් කරුණු දක්වා සමාදන් කරවා තෙදගන්වා සතුටු කරවා 'ගෞතමයෙනි, රෑපෙරයම ඉක්ම ගියේ ය. යමකට දැන් කල් දනිවූ නම් මැනවැ යි පිටත් කළ සේක. කිඹුල්වත්පුර ශාක්‍යයෝ එසේ ය වහන්සැ'යි භාග්‍ය-වතුන් වහන්සේට පිළිවදන් අස්වා හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට ගියහ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වත්පූර ශාක්‍යයන් ගිය නොබෝ වේලාවකින් ආයුෂ්මත් මහමුගලන් තෙරුන් ඇමතූ සේක. මොග්ගල්ලාන, බික්සඟන පහ වූ ථිනමිද්ධ ඇත්තේ ය. මොග්ගල්ලාන, භික්ෂූන්ට දැහැමි කතාවක් පොපට වැටහේවා. මාගේ පිට මදක් රිදෙයි, එහෙයින් මම එය සන්සිඳුවාගන්නෙමි යි වහන්ස, එසේ යයි ආයුෂ්මත් මහාමොග්ගල්ලාන තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ සඟළ සිවුගුණු කොට පනවා පියෙහි පිය මදක් හයා තබා සිහි ඇති ව මනානුවණ ඇති ව නැගී සිටිමි යන හැඟීම මෙනෙහි කොට දකුණැලයෙන් සිංහශය්‍යාව කළ සේක.

තත්‍ර ඛො ආයස්මා මහාමොග්ගල්ලානො භික්ඛූ ආමන්තෙසි 'ආවුසො භික්ඛවො'ති, ආවුසො ති ඛො තෙ භික්ඛූ ආයස්මතො මහාමොග්ගල්ලානස්ස පච්චස්සොසුං, ආයස්මා මහාමොග්ගල්ලානො එතදවොච:

අවස්සුතපරියායඤ්ච වො ආවුසො දෙසිස්සාමි, අනවස්සුතපරියා-යඤ්ච, තං සුණාථ. කථඤ්චාවුසො අවස්සුතො හොති: ඉධාවුසො භික්ඛු චක්ඛුනා රූපං දිස්වා පියරූපෙ රූපෙ අධිමුච්චති, අප්පියරූපෙ රූපෙ බ්‍යාපජ්ජති, අනුපට්ඨිතකායසති ච විහරති පරිත්තචෙතසො, තඤ්ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං නප්පජානාති යත්ථස්ස තෙ උප්පන්නා පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති.

සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය පියරූපෙ ධම්මෙ අධිමුච්චති, අප්පිය රූපෙ ධම්මෙ බ්‍යාපජ්ජති, අනුපට්ඨිතකායසති ච විහරති පරිත්තචෙතසො, තඤ්ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං නප්පජානාති යත්ථස්ස තෙ උප්පන්නා පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති; අයං වුච්චතාවුසො භික්ඛු අවස්සුතො චක්ඛුවිඤ්ඤෙය්‍යෙසු රූපෙසු අවස්සුතො සොතවිඤ්ඤෙය්‍යෙසු සද්දෙසු, අවස්සුතො ඝානවිඤ්ඤෙය්‍යෙසු ගන්ධෙසු, අවස්සුතො ජිව්හාවිඤ්ඤෙය්‍යෙසු රසෙසු, අවස්සුතො කායවිඤ්ඤෙය්‍යෙසු ඵොට්ඨබ්බෙසු, අවස්සුතො මනොවිඤ්ඤෙය්‍යෙසු ධම්මෙසු.

එවං විහාරිං චාවුසො භික්ඛුං චක්ඛුතො චෙපි නං මාරො උප සඞ්කමති, ලභතෙව මාරො ඔතාරං ලභති මාරො ආරම්මණං; සොතතො චෙපි නං -පෙ- ඝානතො චෙපි නං -පෙ- ජිව්හාතො චෙපි නං -පෙ- කායතො චෙපි නං -පෙ- මනතො චෙපි නං මාරො උපසඞ්කමති, ලභතෙව මාරො ඔතාරං ලභති මාරො ආරම්මණං.

සෙය්‍යථාපි ආවුසො නළාගාරං වා තිණාගාරං වා සුක්ඛං කොලාපං තෙරොවස්සිකං පුරත්ථිමාය චෙපි නං දිසාය පුරිසො ආදිත්තාය තිණුක්කාය උපසඞ්කමෙය්‍ය; ලභෙථෙව අග්ගි ඔතාරං, ලභෙථ අග්ගි ආරම්මණං. පච්ඡිමාය චෙපි නං දිසාය පුරිසො ආදිත්තාය තිණුක්කාය උපසඞ්කමෙය්‍ය -පෙ- උත්තරාය චෙපි නං දිසාය -පෙ- දක්ඛිණාය චෙපි නං දිසාය -පෙ- හෙට්ඨතො චෙපි නං -පෙ- උපරිතො චෙපි නං -පෙ- යතො කුතො චෙපි නං පුරිසො, ආදිත්තාය තිණුක්කාය උපසඞ්කමෙය්‍ය; ලභෙථෙව අග්ගි ඔතාරං, ලභෙථ අග්ගි ආරම්මණං.

එහිදී ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ ඇවැත්නි, මහණෙනි යි භික්ෂූන් ඇමතූහ. ඇවැත්නි යි ඒ භික්ෂූහු ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන්ට පිළිවදන් ඇස්වූහ. ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ මෙය වදළහ:

ඇවැත්නි, කෙලෙස් වැගිරෙන්නහුගේ හේතුවත් කෙලෙස් නොවැගිරෙන්නහුගේ හේතුවත් තොපට දේශනා කරන්නෙමි. එය අසවු. ඇවැත්නි, කෙසේ නම් කෙලෙස් වැගිරෙන්නේ වේ ද යත්: ඇවැත්නි, මෙසස්නෙහි මහණ ඇසින් රූ දැක ප්‍රියස්වරූප වූ රූපයෙහි ඇලෙයි ප්‍රියස්වරූප නො වූ රූපයෙහි කිපෙයි, නො එළඹ සිටි කායිගයා සිහි ඇති ව මද සිත් ඇති ව වෙසෙයි. යම් තැනෙක ඔහුට උපන් ඒ ලාමක අකුසල්දහම්හු නිරවශේෂයෙන් නිරුද්ධ වෙත් නම් ඒ එලසමාධියත් එලප්‍රඥාවත් තතුසේ නො දනී.

කනින් සද අසා...නැහැයෙන් ගඳ ගෙන...දිවෙන් රස විඳ... කයින් පහස් පැහැස ... සිතින් දහම් දැන ප්‍රියස්වරූප වූ දහම්හි ඇලෙයි. ප්‍රියස්වරූප නො වූ දහම්හි කිපෙයි. නො එළඹ සිටි කායිගයා සිහි ඇත්තේ මද සිත් ඇත්තේ වෙසෙයි. යම් තැනෙක ඔහුට උපන් ඒ ලාමක අකුසල්දහම්හු නිරවශෙෂයෙන් නිරුද්ධ වෙත් නම් ඒ එලසමාධියත් එලප්‍රඥාවත් තතුසේ නො දනියි. ඇවැත්නි, මේ මහණ ඇසින් දත යුතු රූපයෙහි කෙලෙස් වැගිරෙන්නේ කනින් දත යුතු සදෙහි කෙලෙස් වැගිරෙන්නේ නැහැයෙන් දත යුතු ගඳෙහි කෙලෙස් වැගිරෙන්නේ දිවෙන් දත යුතු රසයෙහි කෙලෙස් වැගිරෙන්නේ කයින් දත යුතු පහස්හි කෙලෙස් වැගිරෙන්නේ සිතින් දත යුතු දහම්හි කෙලෙස් වැගිරෙන්නේ යයි කියනු ලැබේ.

ඇවැත්නි, මෙසේ වසන ඒ මහණහු කරා ඉදින් ඇසිනුදු මරු එළඹෙන්නේ නම් මරු ඉඩක් ලබා ම ය, මරු අරමුණක් ලබා ම ය. ඉදින් කනිනුදු ඔහු වෙත ... ඉදින් නැහැයෙනුදු ඔහු වෙත ... ඉදින් දිවෙනුදු ඔහු වෙත ... ඉදින් කයෙනුදු ඔහු වෙත ... ඉදින් සිතෙනුදු ඔහු වෙත මරු එළඹේ නම් මරු ඉඩක් ලබා ම ය, මරු අරමුණක් ලබා ම ය.

ඇවැත්නි, යම්සේ වියලුණු තෙත රහිත බොහෝ වස් ගණන් ගත වූ බට ගෙයක් හෝ තණ ගෙයක් හෝ වේ ද, ඉදින් පුරුෂයෙක් ඇවිළගත් තණසුලකින් යුතු ව පෙරදිගිනුදු එය වෙත එළඹෙන්නේ නම්, ගින්න ඉඩක් ලබන්නේ ම ය. ගින්න අරමුණක් ලබන්නේ ම ය. ඉදින් පුරුෂයෙක් ඇවිළගත් තණසුලකින් යුතු ව පැසුළු දිගිනුදු එය වෙත එළඹෙන්නේ නම්... ඉදින් උතුරු දිගිනුදු එය වෙත... ඉදින් දකුණු දිගිනුදු එය වෙත... ඉදින් යටිනුදු එය වෙත... ඉදින් උඩිනුදු එය වෙත ... ඉදින් පුරුෂයෙක් ඇවිළගත් තණසුලකින් යුතු ව යම් කොයිනුදු එය වෙත එළඹෙන්නේ නම් ගින්න ඉඩක් ලබන්නේ ම ය. ගින්න අරමුණක් ලබන්නේ ම ය.

එවමෙව ඛො ආවුසො එවං විහාරිං භික්ඛුං චක්ඛුතො චෙපි නං මාරො උපසඞ්කමති; ලභෙතෙව මාරො ඔතාරං, ලභති මාරො ආරම්මණං. සොතතො චෙපි නං -පෙ- ඝානතො චෙපි නං -පෙ- ජිව්හාතො චෙපි නං -පෙ- කායතො චෙපි නං -පෙ- මනතො චෙපි නං මාරො උපසඞ්කමති ලභෙතෙව මාරො ඔතාරං, ලභති මාරො ආරම්මණං. එවං විහාරිං චාවුසො භික්ඛුං රූපා අධිභංසු, න භික්ඛු රූපෙ අධිභොසි; සද්දා භික්ඛුං අධිභංසු න භික්ඛු සද්දෙ අධිභොසි; ගන්ධා භික්ඛුං අධිභංසු, න භික්ඛුං ගන්ධෙ අධිභොසි; රසා භික්ඛුං අධිභංසු, න භික්ඛු රසෙ අධිභොසි; ඵොට්ඨබ්බා භික්ඛුං අධිභංසු, න භික්ඛු ඵොට්ඨබ්බෙ අධිභොසි; ධම්මා භික්ඛුං අධිභංසු, න භික්ඛු ධම්මෙ අධිභොසි;

අයං වුච්චතාවුසො භික්ඛු රූපාධිභූතො[1] සද්දාධිභූතො ගන්ධාධිභූතො රසාධිභූතො ඵොට්ඨබ්බාධිභූතො ධම්මාධිභූතො, අධිභූතො අනධිභූ අධිභංසු නං පාපකා අකුසලා ධම්මා සඞ්කිලෙසිකා පොනොභවිකා[2] සදරා දුක්ඛවිපාකා ආයතිං[3] ජාති ජරාමරණීයා. එවං ඛො ආවුසො අවස්සුතො හොති.

කථඤ්චාවුසො අනවස්සුතො හොති: ඉධාවුසො භික්ඛු චක්ඛුනා රූපං දිස්වා පියරූපෙ රූපෙ නාධිමුච්චති, අප්පියරූපෙ රූපෙ න ව්‍යාපජ්ජති, උපට්ඨිතකායසති ච විහරති අප්පමාණචෙතසො, තඤ්ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං පජානාති යත්ථස්ස තෙ උප්පන්නා පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති;

සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය පියරූපෙ ධම්මෙ නාධිමුච්චති, අප්පියරූපෙ ධම්මෙ න ව්‍යාපජ්ජති, උපට්ඨිතකායසති ච විහරති අප්පමාණ චෙතසො, තඤ්ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං පජානාති යත්ථස්ස තෙ උප්පන්නා පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති. අයං වුච්චතාවුසො භික්ඛු අනවස්සුතො චක්ඛුවිඤ්ඤෙය්‍යෙසු රූපෙසු -පෙ- අනවස්සුතො ජිව්හාවිඤ්ඤෙය්‍යෙසු රසෙසු -පෙ- අනවස්සුතො මනොවිඤ්ඤෙය්‍යෙසු ධම්මෙසු.

එවං විහාරිං චාවුසො භික්ඛුං චක්ඛුතො චෙපි නං මාරො උපසඞ්කමති, නෙව ලභති මාරො ඔතාරං න ලභති මාරො ආරම්මණං; සොතතො චෙපි නං -පෙ- ඝානතො චෙපි නං -පෙ- ජිව්හාතො චෙපි නං -පෙ- කායතො චෙපි නං -පෙ- මනතො චෙපි නං මාරො උපසඞ්කමති, නෙව ලභති මාරො ඔතාරං, න ලභති මාරො ආරම්මණං.

---

1. භිභූතො - සීමු. සී 1, 2.
2. පොනොබ්භවිකා - සයා.
3. ආයති - සී 2.

ඇවැත්නි, එසෙයින් ම මෙසේ වසන ඒ මහණහු වෙත ඉදින් ඇසිනුදු මරු එළඹේ නම් මරු ඉඩක් ලබා ම ය. මරු අරමුණක් ලබා ම ය. ඉදින් කනිනුදු ඔහු වෙත... ඉදින් නැහැයෙනුදු ඔහු වෙත... ඉදින් දිවෙනුදු ඔහු වෙත... ඉදින් කයිනුදු ඔහු වෙත ... ඉදින් සිතිනුදු ඔහු වෙත මරු එළඹේ නම් මරු ඉඩක් ලබා ම ය. මරු අරමුණක් ලබා ම ය. ඇවැත්නි, රූපයෝ මෙසේ වසන මහණ මැඩලූහ. මහණ රූ නො මැඩලී ය. සදහු මහණ මැඩලූහ. මහණ සද නො මැඩලූහ. ගඳහු මහණ මැඩලූහ, මහණ ගඳ නො මැඩලී ය. රසහු මහණ මැඩලූහ. මහණ රස නො මැඩලී ය. පහස්හු මහණ මැඩලූහ. මහණ පහස් නො මැඩලී ය. දහම්හු මහණ මැඩලූහ. මහණ දහම් නො මැඩලී ය.

ඇවැත්නි, මේ මහණ රුවින් මඩනා ලද්දේ සදින් මඩනා ලද්දේ ගඳින් මඩනා ලද්දේ රසින් මඩනා ලද්දේ පහසින් මඩනා ලද්දේ දහමින් මඩනා ලද්දේ යටපත් කරන ලද්දේ තෙමේ යටපත් නො කෙළේ ය යි කියනු ලැබේ. කෙලෙසුම් සහිත පුනර්භවය ඇති-කරන දැවිලි සහිත දුක් විපාක ඇති මතු ජාතිජරාමරණ උපදවන ලාමක අකුසල් දහම්හු ඔහු මැඩලූහ. ඇවැත්නි, මෙසේ කෙලෙස් වැගිරෙන් නේ වේ.

ඇවැත්නි, කෙසේ නම් කෙලෙස් නො වැගිරෙන්නේ වේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ ඇසින් රූ දැක ප්‍රියස්වරූප වූ රූපයෙහි නො ඇලෙයි. නො අප්‍රිය ස්වරූප වූ රූපයෙහි නො කිපෙයි. එළඹසිටි කාගියාසිහි ඇත්තේ අප්‍රමාණ (මග) සිත් ඇත්තේ වෙසෙයි. ඔහුට උපන් අකුසල් දහම්හු යම් තැනක නිරවශේෂයෙන් නිරුද්ධ වෙත් නම් ඒ චෙලසමාධියත් චලප්‍රඥාවත් තතු සේ දනී.

කනින් සද අසා ... නැහැයෙන් ගඳගෙන ... දිවෙන් රස විඳ ... කයින් පහස් පැහැස... සිතින් දහම් දැන ප්‍රිය ස්වරූප වූ දහම්හි නො ඇලෙයි. ප්‍රිය ස්වරූප නොවූ දහම්හී නො කිපෙයි, එළඹසිටි කාගියා සිහි ඇත්තේ අප්‍රමාණ සිත් ඇත්තේ වෙසෙයි. ඔහුට උපන් ලාමක අකුසල් දහම්හු යම් තැනක නිරවශේෂයෙන් නිරුද්ධ වෙත් නම් ඒ චෙලසමාධියත් චලප්‍රඥාවත් තතුසේ දනී. මහණෙනි, මේ මහණ ඇසින් දතයුතු රූපයෙහි කෙලෙස් නො වැගිරෙන්නේ... දිවෙන් දත යුතු රසෙහි කෙලෙස් නො වැගිරෙන්නේ... සිතින් දත යුතු දහම්හි කෙලෙස් නො වැගිරෙන්නේ ය යි කියනු ලැබේ.

ඇවැත්නි, මෙසේ වසන ඒ මහණහු වෙත ඉදින් ඇසිනුදු මරු එළඹේ නම් මරු ඉඩක් නො ම ලබයි. මරු අරමුණක් නො ම ලබයි. ඉදින් කනිනුදු ඔහු වෙත... ඉදින් නැහැයෙනුදු ඔහුවෙත... ඉදින් දිවෙනුදු ඔහු වෙත... ඉදින් කයෙනුදු ඔහු වෙත ... ඉදින් සිතිනුදු ඔහු වෙත මරු එළඹේ නම් මරු ඉඩක් නො ම ලබයි මරු අරමුණක් නො ම ලබයි.

සෙය්‍යථාපි ආවුසො කූටාගාරකා වා කූටාගාරසාලා වා[1] බහලමත්තිකා අද්දවලිම්පනා,[2] පුරත්ථිමාය චෙපි නං දිසාය පුරිසො ආදිත්තාය තිණුක්කාය උපසඞ්කමෙය්‍ය, නෙව ලභෙථ අග්ගි ඔතාරං න ලභෙථ අග්ගි ආරම්මණං; පච්ඡිමාය චෙපි නං දිසාය -පෙ- උත්තරාය චෙපි නං දිසාය -පෙ- දක්ඛිණාය චෙපි නං දිසාය -පෙ- හෙට්ඨතො චෙපි නං -පෙ- උපරිතො චෙපි නං -පෙ- යතො කුතො චෙපි නං පුරිසො ආදිත්තාය තිණුක්කාය උපසඞ්කමෙය්‍ය, නෙව ලභෙථ අග්ගි ඔතාරං, න ලභෙථ අග්ගි ආරම්මණං.

එවමෙව ඛො ආවුසො එවං විහාරිං භික්ඛුං චක්ඛුතො චෙපි නං මාරො උපසඞ්කමති, නෙව ලභති මාරො ඔතාරං, න ලභති මාරො ආරම්මණං -පෙ- මනතො චෙපි නං මාරො උපසඞ්කමති නෙව ලභති මාරො ඔතාරං න ලභති මාරො ආරම්මණං. එවං විහාරී චාවුසො භික්ඛු රූපෙ අධිභොසි, න රූපා භික්ඛුං අධිභංසු; සද්දෙ භික්ඛු අධිභොසි, න සද්ද භික්ඛුං අධිභංසු; ගන්ධෙ භික්ඛු අධිභොසි, න ගන්ධා භික්ඛුං අධිභංසු; රසෙ භික්ඛු අධිභොසි, න රසා භික්ඛුං අධිභංසු. ඵොට්ඨබ්බෙ භික්ඛු අධිභොසි, න ඵොට්ඨබ්බා භික්ඛුං අධිභංසු; ධම්මෙ භික්ඛු අධිභොසි, න ධම්මා භික්ඛුං අධිභංසු;

අයං වුච්චතාවුසො භික්ඛු රූපාධිභූ සද්දාධිභූ ගන්ධාධිභූ රසාධිභූ ඵොට්ඨබ්බාධිභූ ධම්මාධිභූ; අධිභූ අනධිභූතො, අධිභොසි තෙ පාපකෙ අකුසලෙ ධම්මෙ සංකිලෙසිකෙ පොනොභවිකෙ සදරෙ දුක්ඛවිපාකෙ ආයතිං ජාතිජරාමරණිකෙ. එවං ඛො ආවුසො අනවස්සුතො හොතීති.

අථ ඛො භගවා උට්ඨහිත්වා ආයස්මන්තං මහාමොග්ගල්ලානං ආමන්තෙසි: සාධු සාධු මොග්ගල්ලාන, සාධු[3] ඛො ත්වං මොග්ගල්ලාන භික්ඛූනං අවස්සුතපරියායඤ්ච අනවස්සුතපරියායඤ්ච අභාසීති. ඉදමවොච ආයස්මා මහාමොග්ගල්ලානො, සමනුඤ්ඤො සත්ථා අහොසි, අත්තමනා තෙ භික්ඛූ ආයස්මතො මහාමොග්ගල්ලානස්ස භාසිතං අභිනන්දිංසූති.[4]

## 1. 19. 7

## දුක්ඛධම්මසුත්තං

244. යතො ඛො භික්ඛවෙ භික්ඛු සබ්බසං යෙව දුක්ඛධම්මානං සමුදයඤ්ච[5] අත්ථඞ්ගමඤ්ච යථාභූතං පජානාති, තථා ඛො පනස්ස කාමා දිට්ඨා හොන්ති, යථාස්ස කාමෙ පස්සතො යො කාමෙසු කාමච්ඡන්දො කාමස්නෙහො කාමමුච්ඡා කාමපරිළාහො සො නානුසෙති, තථා ඛො පනස්ස චාරො ච විහාරො ච අනුබුද්ධො හොති, යථා චරන්තං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා නානුස්සවන්ති.

1. කූටාගාරං වා සාලා වා – මජසං
2. මද්දවලෙපනා – සයා.
   අද්දවලෙපනා – මජසං
3. සාධුසාධු ඛො – සයා.
4. අභිනන්දුන්ති – මජසං සයා.
5. අස්සාදඤ්ච ආදීනවඤ්ච – සී 1; 2
6. අනුබන්ධො – සයා

ඇවැත්නි, යම්සේ ඝන මැටි ඇති තෙත් මැටියෙන් ආලේප කළ කුළුගෙයක් හෝ කුළුගේ හලක් හෝ වේ ද ඉදින් පුරුෂයෙක් ඇවිළගත් තණහුලකින් යුතු ව පෙරදිගිනුදු එය වෙත එළඹෙන්නේ නම් ගින්න ඉඩක් නො ම ලබන්නේ ය. ගින්න අරමුණක් නො ම ලබන්නේ ය, ඉදින් පැසුළු දිගිනුදු එය වෙත... ඉදින් උතුරු දිගිනුදු එය වෙත... ඉදින් දකුණු දිගිනුදු එය වෙත... ඉදින් යටිනුදු එය වෙත... ඉදින් උඩිනුදු එය වෙත... ඉදින් පුරුෂයෙක් ඇවිළගත් තණසුලකින් යුතු ව යම් කොයිනුදු එය වෙත එළඹෙන්නේ නම් ගින්න ඉඩක් නො ම ලබන්නේය, ගින්න අරමුණක් නො ම ලබන්නේ ය.

ඇවැත්නි, එසෙයින් ම මෙසේ වසන ඒ මහණහු වෙත ඉදින් ඇසිනුදු මරු එළඹේ නම් මරු ඉඩක් නො ම ලබයි. මරු අරමුණක් නො ම ලබයි... ඉදින් සිතිනුදු මරු එළඹේ නම් මරු ඉඩක් නො ම ලබයි. මරු අරමුණක් නො ම ලබයි. ඇවැත්නි, මෙසේ වසන ඒ මහණ රූ මැඩලී ය. රූහු මහණ නො මැඩලූහ. මහණ සද මැඩලී ය. සදහු මහණ නො මැඩලූහ. මහණ ගඳ මැඩලී ය. ගඳහු මහණ නො මැඩලූහ. මහණ රස මැඩලී ය. රසයෝ මහණ නො මැඩලූහ. මහණ පහස් මැඩලී ය. පහස්හු මහණ නොමැඩලූහ. මහණ දහම් මැඩලී ය. දහම්හු මහණ නො මැඩලූහ.

ඇවැත්නි, මේ මහණ රූ මැඩලූයේ සද මැඩලූයේ ගඳ මැඩලූයේ රස මැඩලූයේ පහස් මැඩලූයේ දහම් මැඩලූයේ (සියල්ල) මැඩලූයේ නො මඩනා ලද්දේ කෙලෙසුන් සහිත පුනර්භවය ඇති කරන දැවිලි සහිත දුක්විපාක ඇති මතු ජාති ජරා මරණ උපදවන ඒ ලාමක අකුසල් දහම් මැඩලී ය යි කියනු ලැබේ. ඇවැත්නි, මෙසේ කෙලෙස් නො වැගිරෙන්නේ වේ යි.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ නැගිට ආයුෂ්මත් මහාමොග්ගල්ලාන තෙරුන් ඇමතූ සේක. මොග්ගල්ලාන, මැනවි, මැනවි. මොග්ගල්ලාන, තෙපි මහණුන්ට කෙලෙස් වැගිරෙන්නහුගේ හේතුවත් කෙලෙස් නො වැගිරෙන්නහුගේ හේතුවත් කීහු මැනවි යි. ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ මෙය වදළහ. ශාස්තෘන් වහන්සේ අනුදත් සේක. සතුටු සිත් ඇති ඒ භික්ෂූහු ආයුෂ්මත් මහාමොග්ගල්ලාන තෙරණු-වන්ගේ දෙශනාව පිළිගත්හ යි.

## 1. 19. 7

## දුක්ඛධම්ම සූත්‍රය

244. මහණෙනි, මහණ යම් කලෙක සියලු ම දුක්දහමුන්ගේ සමුදයයත් අස්තඞ්ගමයත් තතුසේ දනී ද, යම් පරිද්දකින් කාමයන් දක්නා ඔහුට කාමයන්හි ආශාවෙක් කාමයන්හි සතුටු වීමෙක් කාමයන්හි මුසපත් වීමෙක් කාමයන්හි දැවිල්ලෙක් වේ නම් එය නො නැසී පවතී ද, එපරිද්දෙන් ඔහු විසින් කාමයෝ දක්නා ලද්දහු වෙති. අභිජ්ඣා දෙමනස්ස යන ලාමක අකුසල්දහම්හු යම්පරිද්දකින් හැසිරෙන්නහු වෙසෙන්නහු අනුව වැගිරෙත් නම් එපරිද්දෙන් හැසිරීමත් විසීමත් ඔහු විසින් අවබෝධ කරන ලද්දේ වෙයි.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු සබ්බසංයෙව දුක්ඛධම්මානං සමුදයඤ්ච අත්ථගමඤ්ච යථාභූතං පජානාති ඉති රූපං, ඉතිරූපස්ස සමුදයො, ඉති රූපස්ස අත්ථගමො ඉති වෙදනා, ඉති වෙදනාය සමුදයො, ඉති වෙදනාය අත්ථගමො; ඉති සඤ්ඤා, -පෙ- ඉති සඤ්ඤාය අත්ථගමො ඉති සඞ්ඛාරා, ඉති සඞ්ඛාරානං සමුදයො, ඉති සඞ්ඛාරානං අත්ථගමො; ඉති විඤ්ඤාණං, ඉති විඤ්ඤාණස්ස සමුදයො, ඉති විඤ්ඤාණස්ස අත්ථගමොති. එවං ඛො භික්ඛවෙ භික්ඛු සබ්බසංයෙව දුක්ඛධම්මානං සමුදයඤ්ච අත්ථගමඤ්ච යථාභූතං පජානාති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛුනො කාමා දිට්ඨා හොන්ති යථාස්ස කාමෙ පස්සතො යො කාමෙසු කාමච්ඡන්දො කාමස්නෙහො කාමමුච්ඡා කාමපරිළාහො සො නානුසෙති, සෙය්‍යථාපි භික්ඛවෙ අඞ්ගාරකාසු සාධිකපොරිසා පුණ්ණා අඞ්ගාරානං වීතච්චිකානං වීතධූමානං, අථ පුරිසො ආගච්ඡෙය්‍ය ජීවිතුකාමො අමරිතුකාමො සුඛකාමො දුක්ඛපටික්කූලො, තමෙනං ද්වෙ බලවන්තො පුරිසා නානාබාහාසු ගහෙත්වා තං අඞ්ගාරකාසුං උපකඩ්ඪෙය්‍යුං, සො ඉති විති චෙව[1] කායං සන්නාමෙය්‍ය, තං කිස්ස හෙතු ඤාතං හි[2] භික්ඛවෙ තස්ස පුරිසස්ස හොති: 'ඉමඤ්චාහං අඞ්ගාරකාසුං පපතිස්සාමි,[3] තතොනිදානං මරණං වා නිගච්ඡාමි[4] මරණමත්තං වා දුක්ඛ'න්ති. එවමෙව ඛො භික්ඛවෙ භික්ඛුනො අඞ්ගාරකාසූපමා කාමා දිට්ඨා හොන්ති, යථාස්ස කාමෙ පස්සතො යො කාමෙසු කාමච්ඡන්දො කාමස්නෙහො කාමමුච්ඡා කාමපරිළාහො සො නානුසෙති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛුනො චාරො ච විහාරො ච අනුබුද්ධො හොති යථා චරන්තං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා නානුස්සවන්ති, සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො බහුකණ්ටකං දයං පවිසෙය්‍ය; තස්සස්ස පුරතොපි[5] කණ්ටකො, පච්ඡතො පි කණ්ටකො, උත්තරතොපි කණ්ටකො, දක්ඛිණතොපි කණ්ටකො, හෙට්ඨතොපි කණ්ටකො, උපරිතොපි කණ්ටකො. සො සතො ච[6] අභික්කමෙය්‍ය සතො පටික්කමෙය්‍ය; මා මං කණ්ටකොති, එවං ඛො භික්ඛවෙ යං ලොකෙ පියරූපං සාතරූපං අයං වුච්චති අරියස්ස විනයෙ කණ්ටකො; තං කණ්ටකොති ඉති විදිත්වා සංවරො ච අසංවරො ච වෙදිතබ්බො.

කථඤ්ච භික්ඛවෙ අසංවරො හොති ඉධ භික්ඛවෙ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා පියරූපෙ රූපෙ අධිමුච්චති, අප්පියරූපෙ රූපෙ ව්‍යාපජ්ජති, අනුපට්ඨිතකායසති ච විහරති පරිත්තචෙතසො, තඤ්ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං නප්පජානාති [යත්ථස්ස තෙ උප්පන්නා පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති; සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ-

---

1. ඉති ඉමමෙව - ස්‍යා.
2. අඤ්ඤාණඤ්හි ස්‍යා.
3. ච පස්සාමි - ස්‍යා
4. ගච්ඡාමි - ස්‍යා.
   නිගච්ඡ සාමි - මජසං.
5. තස්සපුරතොපි - මජසං, ස්‍යා
6. සතො අභික්කමෙය්‍ය - සීමු. සී 2

මහණෙනි, කෙසේ නම් මහණ සියලු ම දුක් දහමුන්ගේ සමුදයයත් අස්තඞ්ගමයත් තතුසේ දනි ද යත්: රූපය මෙසේ ය. රූපයේ හටගැන්ම මෙසේ ය රූපයේ අස්තඞ්ගමය මෙසේ ය. වේදනාව මෙසේ ය. වේදනාවේ හටගැන්ම මෙසේ ය. වේදනාවේ අස්තඞ්ගමය මෙසේ ය. සඤ්ඤාව මෙසේ ය. සඤ්ඤාවේ හටගැන්ම මෙසේ ය. සඤ්ඤාවේ අස්තඞ්ගමය මෙසේ ය. සඞ්ඛාර මෙසේ ය. සඞ්ඛාරයන්ගේ හටගැන්ම මෙසේ ය. සඞ්ඛාරයන්ගේ අස්තඞ්ගමය මෙසේ ය. විඤ්ඤාණය මෙසේ ය. විඤ්ඤාණයේ හටගැන්ම මෙසේ ය. විඤ්ඤාණයේ අස්තඞ්ගමය මෙසේ ය යි. මහණෙනි, මෙසේ මහණ සියලු ම දුක්දහමුන්ගේ සමුදයයත් අස්තඞ්ගමයත් තතුසේ දනී.

මහණෙනි, යම් පරිද්දකින් කාමයන් දක්නා ඔහුට කාමයන්හි යම් කාමච්ඡන්දයෙක් කාමස්නෙහයෙක් කාමමූර්ඡායෙක් කාමපරිදහයෙක් වේ නම් එය නො නැඟී පවතී ද (එපරිද්දෙන්) කෙසේ නම් මහණහු විසින් කාමයෝ දක්නා ලද්දහු වෙත් ද යත්: මහණෙනි, යම් සේ පහ වූ ගිනිසිළු ඇති පහ වූ දුම් ඇති අඟුරුවලින් පිරුණු පුරිස් පමණින් වැඩි අඟුරු වළෙක් වේ ද, එකල්හි ජීවත්වනු කැමති නො මැරෙනු කැමති සුව කැමති දුක් පිළිකුල් කරන පුරුෂයෙක් එන්නේ ය. බලවත් පුරුෂයෝ දෙදෙනෙක් ඒ මොහු වෙන් වෙන්ව අත්හි ගෙන ඒ අඟුරුවළ කරා අදනාහු ය. හෙතෙමේ මෙසේත් මෙසේත් කය නමන්නේ ය. ඒ කවර හෙයින යත්: මහණෙනි, ඒ පුරුෂයා විසින් “මම මේ අඟුරුවළට වැටෙන්නෙම් නම් ඒ හේතු කොට ගෙන මරණයට හෝ මරණය පමණ දුකට හෝ පැමිණෙමි යි දන්නා ලද්දේ ම වෙයි. (එහෙයින්) මහණෙනි, එසෙයින් ම යම් පරිද්දකින් කාමයන් දක්නා වූ ඔහුට කාමයන්හි යම් කාමච්ඡන්දයෙක් කාමස්නෙහයෙක් කාමමූර්ඡායෙක් කාමපරිදහයෙක් වේ නම් එය නො සිඳී පවතී ද, (එපරිද්දෙන් ම) මහණහු විසින් අඟුරුවළ උපමා කොට ඇති කාමයෝ දක්නා ලද්දහු වෙති.

මහණෙනි, අභිජ්ඣා දෙමනස්ස යන ලාමක අකුසල් දහම්හු යම් පරිදකින් හැසිරෙන්නහු වෙසෙන්නහු අනුව වැගිරෙත් නම් (එපරිද්දෙන්) මහණහු විසින් කෙසේ නම් හැසිරීමත් විසීමත් අවබෝධ කරන ලද්දේ වේ ද යත්: මහණෙනි, යම්සේ පුරුෂයෙක් බොහෝ කටු ඇති වනයකට පිවිසෙන්නේ ද, ඔහු ඉදිරියෙනු දු කටු වන්නේ ය. පිටුපසිනු දු කටු වන්නේ ය. උතුරෙනු දු කටු වන්නේ ය. දකුණෙනු දු කටු වන්නේ ය. යටිනු දු කටු වන්නේ ය. උඩිනු දු කටු වන්නේ ය. හෙතෙමේ කටු මා නහමක් පෙළාවා යි සිහි ඇත්තේ ම ඉදිරියට යන්නේ ය. සිහි ඇත්තේ ම පෙරළා එන්නේ ය. මහණෙනි, මෙසේ ලොව යමක් පියදෑ නම් මිහිරිදෑ නම් මෙය සස්නෙහි කටු යයි කියනු ලැබේ. එය කටු යයී මෙසේ දැන සංවරයත් අසංවරයත් දත යුත්තේ ය.

මහණෙනි, කෙසේ නම් අසංවර වේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ ඇසින් රූ දැක ප්‍රියස්වරූප වූ රූපයෙහි ඇලේ ප්‍රියස්වරූප නො වූ රූපයෙහි කිපෙයි. නො එළඹ සිටි කායිගයා සිහි ඇත්තේත් මඳ සිත් ඇත්තේත් වෙසෙයි. ඔහුට උපන් ඒ ලාමක අකුසල් දහම්හු යම් තැනෙක නිරවශෙෂයෙන් නිරුද්ධ වෙත් නම් ඒ චෙතොවිමුක්තියත් ප්‍රඥාවිමුක්තියත් තතුසේ නො දනී. කනින් සද අසා ... නැහැයෙන් ගඳ ගෙන... දිවින් රස විඳ... කයින් පහස පැහැස...

මනසා ධම්මං විඤ්ඤාය පියරූපෙ ධම්මෙ අධිමුච්චති, අප්පිය රූපෙ ධම්මෙ ව්‍යාපජ්ජති, අනුපට්ඨිතකායසති ච විහරති පරිත්ත-චෙතසො, තඤ්ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං න-ප්පජානාති යත්ථස්ස තෙ උප්පන්නා පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති; එවං ඛො භික්ඛවෙ අසංවරො හොති.

කථඤ්ච භික්ඛවෙ සංවරො හොති: ඉධ භික්ඛවෙ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා පියරූපෙ රූපෙ නාධිමුච්චති, අප්පියරූපෙ රූපෙ න ව්‍යාපජ්ජති, උපට්ඨිතකායසති ච විහරති අප්පමාණ චෙතසො, තඤ්ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං පජානාති යත්ථස්ස තෙ උප්පන්නා පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති; සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය පියරූපෙ ධම්මෙ නාධිමුච්චති, අප්පියරූපෙ ධම්මෙ න ව්‍යාපජ්ජති, උපට්ඨිතකායසති ච විහරති අප්පමාණ චෙතසො, තඤ්ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං පජානාති යත්ථස්ස තෙ උප්පන්නා පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති; එවං ඛො භික්ඛවෙ සංවරො හොති.

තස්ස චෙ භික්ඛවෙ, භික්ඛුනො එවං චරතො එවං විහරතො කදාචි කරහචි සතිසම්මොසා උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා සරසඞ්කප්පා සඤ්ඤොජනියා, දන්ධො භික්ඛවෙ, සතුප්පාදො, අථ ඛො නං[1] ඛිප්පමෙව පජහති විනොදෙති, බ්‍යන්තීකරොති, අනභාවං ගමෙති.

සෙය්‍යථාපි භික්ඛවෙ, පුරිසො දිවසසන්තත්තෙ අයොකටාහෙ ද්වෙ වා තීණි වා උදකඵුසිතානි නිපාතෙය්‍ය; දන්ධො භික්ඛවෙ උදකඵුසිතානං නිපාතො, අථ ඛො නං ඛිප්පමෙව පරික්ඛයං පරියාදානං ගච්ඡෙය්‍ය. එවමෙව ඛො භික්ඛවෙ, තස්ස චෙ භික්ඛුනො එවං චරතො එවං විහරතො කදාචි කරහචි සතිසම්මොසා උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා සරසඞ්කප්පා සඤ්ඤොජනියා; දන්ධො භික්ඛවෙ, සතුප්පාදො අථ ඛො නං ඛිප්පමෙව පජහති විනොදෙති බ්‍යන්තී කරොති අනභාවං ගමෙති. එවං ඛො භික්ඛවෙ භික්ඛුනො චාරො ච විහාරො ච අනුබුද්ධො හොති යථා චරන්තං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා නාන්වාස්සවන්ති.

තඤ්චෙ භික්ඛවෙ භික්ඛුං එවං චරන්තං එවං විහරන්තං රාජානො වා රාජමහාමත්තා වා මිත්තා වා අමච්චා වා ඤාතී වා සාලොහිතා වා භොගෙහි අභිහට්ඨුං පවාරෙය්‍යුං: එහම්භො පුරිස, කිං තෙ ඉමෙ කාසාවා අනුදහන්ති?[2] කිං මුණ්ඩො කපාලමනුචරසි? එහි හීනායාවත්තිත්වා භොගෙ ච භුඤ්ජස්සු, පුඤ්ඤානි ච කරොහීති.

සො වත භික්ඛවෙ භික්ඛු එවං චරන්තො එවං විහරන්තො සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිස්සතීති නෙතං ඨානං විජ්ජති.

---

1. නං - සී 1, 2.
2. ඩය්හන්ති සී 1, 2.
දය්හන්ති - ස්‍යා.

සිතින් දහම් දැන ප්‍රිය ස්වරූප වූ දහම්හි ඇලෙයි. ප්‍රිය ස්වරූප නො වූ දහම්හි කිපෙයි. නො එළඹ සිටි කායිගයාසිහි ඇත්තේත් මඳසිත් ඇත්තේත් වෙසෙයි. ඔහුට උපන් ඒ ලාමක අකුසල් දහම්හු යම් තැනෙක නිරවශෙෂයෙන් නිරුද්ධ වෙත් නම් ඒ චිත්තසමාධියත් ප්‍රඥාවත් තතුසේ නො දනී. මහණෙනි, මෙසේ අසංවර වේ.

මහණෙනි, කෙසේ නම් සංවර වේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ තෙමේ ඇසින් රූ දැක ප්‍රියස්වරූප වූ රූහි නො ඇලෙයි. ප්‍රියස්වරූප නො වූ රූපයෙහි නො කිපෙයි. එළඹ සිටි කායිගයා සිහි ඇත්තේත් නො පමණ සිත් ඇත්තේත් වෙසෙයි. ඔහුට උපන් ඒ ලාමක අකුසල් දහම්හු යම් තැනෙක නිරවශෙෂයෙන් නිරුද්ධ වෙත් නම් ඒ චිත්තසමාධියත් ප්‍රඥාවත් තතුසේ දනී. කනින් සද අසා ... නැහැයෙන් ගඳ ගෙන ... දිවින් රසවිඳ ... කයින් පහස් පැහැස ... සිතින් දහම් දැන පියදෑ වූ දහම්හි නො ඇලෙයි. නො පිය වූ දහම්හි නො කිපෙයි. එළඹ සිටි කායිගයා සිහි ඇත්තේත් නො පමණ සිහි ඇත්තේත් වෙසෙයි. ඔහුට උපන් ඒ ලාමක අකුසල් දහම්හු යම් තැනෙක නිරවශෙෂයෙන් නිරුද්ධ වෙත් නම් ඒ චිත්තසමාධියත් ප්‍රඥාවත් තතුසේ දනී. මහණෙනි, මෙසේ සංවර වේ.

මහණෙනි, මෙසේ හැසිරෙන මෙසේ වසන ඒ මහණහට ඉදින් කිසියම් කලෙක සිහිමුළා වීමෙකින් සරසඞ්කප්ප නම් වූ සංයොජනයන්ට හිත වූ ලාමක අකුසල්දහම්හු උපදිත් නම් මහණෙනි, සිහිය ඉපදීම ලස් ය. වැලි දු එය වහා ම දුරු කෙරෙයි. බැහැර කෙරෙයි. කෙළවර කෙරෙයි. නැවත නො හටගන්නාබවට පමුණුවයි.

මහණෙනි, යම්සේ පුරුෂයෙක් දහවල මුළුල්ලෙහි රත් වූ යකඩ කටාරමක දියබිඳු දෙකක් හෝ තුනක් හෝ හෙලන්නේ ද මහණෙනි, දියබිඳු වැටීම ලස් ය. වැලි දු එය වහා ම ගෙවීමට නැසීමට පැමිණෙන්නේ ය. මහණෙනි, එසෙයින් ම මෙසේ හැසිරෙන මෙසේ වසන ඒ මහණහට ඉදින් කිසියම් කලෙක සිහිමුළාවෙකින් සරසඞ්කප්ප නම් වූ සංයොජනයන්ට හිත වූ ලාමක අකුසල්දහම්හු උපදිත් නම් මහණෙනි, සිහිය ඉපදීම ලස් ය. වැලි දු එය වහා ම දුරු කෙරෙයි. බැහැර කෙරෙයි. කෙළවර කෙරෙයි. නැවත නො හටගන්නා බවට පමුණුවයි. මහණෙනි, අභිජ්ඣා දෙමනස්ස යන ලාමක අකුසල්දහම්හු යම් පරිද්දෙකින් හැසිරෙන්නහු වෙසෙන්නහු අනුව නො වැගිරෙත් නම් (එපරිද්දෙන්) මහණහු විසින් හැසිරීමත් විසීමත් මෙසේ අවබොධ කරන ලද්දේ වෙයි.

මහණෙනි, මෙසේ හැසිරෙන මෙසේ වසන ඒ මහණහු ඉදින් රජහු හෝ රාජමහාමාත්‍යයෝ හෝ මිතුරෝ හෝ ඇමතියෝ හෝ නෑයෝ හෝ සහලේ නෑයෝ හෝ ''එම්බල පුරුෂය, එව කුමක් හෙයින් මේ කහවත් තාගේ සිරුර දවද් ද? කුමක් හෙයින් මුඩුව කබලක් ගෙන හැසිරෙහි ද? එව ගිහිබවට පෙරළී සම්පත් ද අනුභව කර ව පින් ද කරව යි. සම්පත් එළවා පවරන්නාහු ද, මහණෙනි, මෙසේ හැසිරෙන මෙසේ වසන ඒ මහණ සික පිළිකෙව් කොට ගිහිබවට පෙරළෙන්නේ ය යන මේ කරුණ නැත.

සෙය්‍යථාපි භික්ඛවෙ ගඞ්ගානදී පාචීනනින්නා පාචීන පොණා පාචීනපබ්භාරා, අථ මහාජනකායො ආගච්ඡෙය්‍ය කුද්දාලපිටකං ආදාය: මයං ඉමං ගඞ්ගානදිං පච්ඡානින්නං කරිස්සාම පච්ඡාපොණං පච්ඡාපබ්භාරන්ති; තං කිම්මඤ්ඤථ භික්ඛවෙ, අපි නු සො මහාජනකායො ගඞ්ගානදිං පච්ඡානින්නං කරෙය්‍ය පච්ඡාපොණං පච්ඡාපබ්භාරන්ති? නො හෙතං භන්තෙ. තං කිස්ස හෙතු: ගඞ්ගානදී භන්තෙ පාචීන නින්නා පාචීන පොණා පාචීන පබ්භාරා, සා න සුකරා පච්ඡානින්නා කාතුං පච්ඡාපොණං පච්ඡාපබ්භාරං, යාවදෙව ච පන සො මහාජනකායො කිලමථස්ස විඝාතස්ස භාගී අස්සාති.

එවමෙව ඛො භික්ඛවෙ තඤ්චෙ[1] භික්ඛුං එවං චරන්තං එවං විහරන්තං රාජානො වා රාජමහාමත්තා වා මිත්තා වා අමච්චා වා ඤාතී වා සාලොහිතා වා භොගෙහි අභිහට්ඨුං පවාරෙය්‍යුං: "එහම්භො පුරිස, කිං තෙ ඉමෙ කාසාවා අනුදහන්ති? කිං මුණ්ඩො කපාල-මනුචරසි? එහි හීනායාවත්තිත්වා භොගෙ ච භුඤ්ජස්සු, පුඤ්ඤානි ච කරොහී"ති. සො පන භික්ඛවෙ භික්ඛු එවං චරන්තො එවං විහරන්තො සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිස්සතීති නෙතං ඨානං විජ්ජති, තං කිස්ස හෙතු: යං හි තං භික්ඛවෙ චිත්තං දීඝරත්තං විවෙකනින්නං විවෙකපොණං විවෙකපබ්භාරං. තථ[2] හීනායාවත්තිස්සතීති නෙතං ඨානං විජ්ජතීති.

## 1. 19. 8

### කිංසුකොපමසුත්තං

245. අථ[3] ඛො අඤ්ඤතරො භික්ඛු යෙනඤ්ඤතරො භික්ඛු තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා තං භික්ඛුං එතදවොච; "කිත්තාවතා නු ඛො ආවුසො භික්ඛුනො දස්සනං සුවිසුද්ධං හොතී"ති? යතො ඛො ආවුසො භික්ඛු ඡන්නං ඵස්සායතනානං සමුදයඤ්ච අත්ථගමඤ්ච යථාභූතං පජානාති, එත්තාවතා ඛො ආවුසො භික්ඛුනො දස්සනං සුවිසුද්ධං හොතීති.

අථ ඛො සො භික්ඛු අසන්තුට්ඨො තස්ස භික්ඛුස්ස පඤ්හ-වෙය්‍යාකරණෙන[4] යෙනඤ්ඤතරො භික්ඛු තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා තං භික්ඛුං එතදවොච: "කිත්තාවතා නු ඛො ආවුසො භික්ඛුනො දස්සනං සුවිසුද්ධං හොතී"ති? යතො ඛො ආවුසො භික්ඛු පඤ්චන්නං උපාදානක්ඛන්ධානං සමුදයඤ්ච අත්ථගමඤ්ච යථාභූතං පජානාති, එත්තාවතා ඛො ආවුසො භික්ඛුනො දස්සනං සුවිසුද්ධං හොතීති.

---

1. තඤ්ච - සී 1
2. තථා - මජසං. සී 1, 2.
3. යතො - සී 2.
4. පඤ්හ වෙය්‍යාකරණෙන - මජසං

මහණෙනි, යම්සේ ගඞ්ගානදිය පෙරදිගට නැමුණී පෙරදිගට නැඹුරු වූවා පෙරදිගට බර වූවා වේ ද, එකල්හි මහාජනසමූහයක් "අපි මේ ගඞ්ගානදිය පැසුළුදිගට නැමුණක පැසුළුදිගට නැඹුරු වූවක පැසුළුදිගට බරවූවක කරන්නෙමු යි උදලු පැසි ගෙන එන්නේ ය. මහණෙනි, ඒ කිමැයි හඟිවු ද? ඒ මහජන සමූහයා ගඞ්ගා නදිය පැළදිගට නැමුණක පැළදිගට නැඹුරු වූවක පැළදිගට බර වූවක කරන්නේ ද? යි. වහන්ස, මෙය නො වේ මැ යි. ඒ කවර හෙයින් ද: වහන්ස, ගඞ්ගානදිය පෙරදිගට නැමුණී ය. පෙරදිගට නැඹුරු වූවා ය. පෙරදිගට බර වූවා ය. එය පැළදිගට නැමුණක පැළදිගට නැඹුරු වූවක පැළදිගට බර වූවක කරන්නට සුකර නො වේ. හුදෙක් ඒ මහජන සමූහයා වෙහෙසට දුකට හිමි වන්නේ ය (එහෙයිනි යි).

මහණෙනි, එසෙයින් ම මෙසේ හැසිරෙන මෙසේ වසන ඒ මහණහු ඉදින් රජහු හෝ රජ මහඇමතියෝ හෝ මිතුරෝ හෝ ඇමතියෝ හෝ නෑයෝ හෝ සහලේ නෑයෝ හෝ 'එම්බල පුරුෂය, එව කුමක් හෙයින් මේ කසාවත් තොපගේ සිරුර දවා ද? කුමක් හෙයින් මුඩු ව කබලක් ගෙන හැසිරෙහි ද? එව ගිහිබවට පෙරළී සම්පත් ද අනුභව කරව පින් ද කරව' යි සම්පත් එළවා පවරන්නාහු ද? මහණෙනි, මෙසේ හැසිරෙන මෙසේ වසන ඒ මහණ තෙමේ සික පිළිකෙව් කොට ගිහිබවට පෙරළෙන්නේ ය යන මේ කරුණ නැත. ඒ කවර හෙයින යත්: මහණෙනි, යම් හෙයකින් ඒ හිත දිගුකලක් මුළුල්ලෙහි විවෙකයට නැමුණේ ය. විවෙකයට නැඹුරු වූයේ ය. විවෙකයට බර වූයේ ය, හෙ ද ගිහිබවට පෙරළෙන්නේ ය යන මේ කරුණ නැත යි.

## 1. 19. 8

## කිංසුකොපම සූත්‍රය

245. එකල්හි එක්තරා මහණෙක් එක්තරා මහණකු වෙත එළඹියේ ය. එළඹ ඒ මහණහට "ඇවැත්නි, මහණහුගේ දර්ශනය කෙතෙකින් සුවිශුද්ධ වේ ද?" යි මෙය කී ය. ඇවැත්නි, යම් කලෙක මහණ ස්පර්ශායතන සයෙහි සමුදයයත් අස්තඞ්ගමයත් තතුසේ දනී ද, ඇවැත්නි, එපමණෙකින් මහණහුගේ දර්ශනය සුවිශුද්ධ වේ යයි.

එකල්හි ඒ මහණ ඒ මහණහුගේ පැන විසදීමෙන් සතුටු නො වූයේ එක්තරා මහණකු වෙත එළඹියේ ය. එළඹ ඒ මහණහට "ඇවැත්නි, මහණහුගේ දර්ශනය කෙතෙකින් සුවිශුද්ධ වේ ද?" යි මෙය කීය. ඇවැත්නි, මහණ යම් කලෙක පඤ්චොපාදනස්කන්ධයන්ගේ සමුදයයත් අස්තඞ්ගමයත් තතුසේ දනී ද, ඇවැත්නි, එපමණෙකින් මහණහුගේ දර්ශනය සුවිශුද්ධ වේ යයි.

අථ ඛො සො භික්ඛු අසන්තුට්ඨො තස්ස භික්ඛුස්ස පඤ්හ-ව්‍යාකරණෙන යෙනඤ්ඤතරො භික්ඛු තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා තං භික්ඛුං එතදවොච: "කිත්තාවතා නු ඛො ආවුසො භික්ඛුනො දස්සනං සුවිසුද්ධං හොතී"ති? යතො ඛො ආවුසො භික්ඛු චතුන්නං මහාභූතානං සමුදයඤ්ච අත්ථගමඤ්ච යථාභූතං පජානාති. එත්තාවතා ඛො ආවුසො භික්ඛුනො දස්සනං සුවිසුද්ධං හොතීති.

අථ ඛො සො භික්ඛු අසන්තුට්ඨො තස්ස භික්ඛුස්ස පඤ්හ-ව්‍යාකරණෙන යෙනඤ්ඤතරො භික්ඛු තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා තං භික්ඛුං එතදවොච: "කිත්තාවතානු ඛො ආවුසො භික්ඛුනො දස්සනං සුවිසුද්ධං හොතී"ති? යතො ඛො ආවුසො භික්ඛු "යං කිඤ්චි සමුදයධම්මං සබ්බන්තං නිරොධධම්මන්ති" යථාභූතං පජානාති, එත්තාවතා ඛො ආවුසො භික්ඛුනො දස්සනං සුවිසුද්ධං හොතීති.

අථ ඛො සො භික්ඛු අසන්තුට්ඨො තස්ස භික්ඛුනො පඤ්හ-ව්‍යාකරණෙන යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: ඉධාහං භන්තෙ යෙනඤ්ඤතරො භික්ඛු තෙනුපසඞ්කමිං, උපසඞ්කමිත්වා තං භික්ඛුං එතදවොචං: "කිත්තාවතා නු ඛො ආවුසො භික්ඛුනො දස්සනං සුවිසුද්ධං හොතී"ති? එවං වුත්තෙ භන්තෙ සො භික්ඛු මං එතදවොච: යතො ඛො ආවුසො භික්ඛු ඡන්නං ඵස්සායතනානං සමුදයඤ්ච අත්ථගමඤ්ච යථාභූතං පජානාති එත්තාවතා ඛො ආවුසො භික්ඛුනො දස්සනං සුවිසුද්ධං හොතීති.

අථ ඛ්වාහං භන්තෙ අසන්තුට්ඨො තස්ස භික්ඛුස්ස පඤ්හ-ව්‍යාකරණෙන යෙනඤ්ඤතරො භික්ඛු තෙනුපසඞ්කමිං, උපසඞ්කමිත්වා තං භික්ඛුං එතදවොචං: "කිත්තාවතා නු ඛො ආවුසො භික්ඛුනො දස්සනං සුවිසුද්ධං හොතී"ති? එවං වුත්තෙ භන්තෙ සො භික්ඛු මං එතදවොච: යතො ච ඛො ආවුසො භික්ඛු පඤ්චන්නං උපාදාන-ක්ඛන්ධානං සමුදයඤ්ච අත්ථගමඤ්ච යථාභූතං පජානාති -පෙ- චතුන්නං මහාභූතානං සමුදයඤ්ච අත්ථගමඤ්ච යථාභූතං පජානාති -පෙ- යං කිඤ්චි සමුදයධම්මං සබ්බන්තං නිරොධධම්මන්ති යථාභූතං පජානාති, එත්තාවතා ඛො ආවුසො භික්ඛුනො දස්සනං සුවිසුද්ධං හොතීති

අථ ඛ්වාහං භන්තෙ අසන්තුට්ඨො තස්ස භික්ඛුනො පඤ්හ-ව්‍යාකරණෙන යෙන භගවා තෙනුපසඞ්කමිං. කිත්තාවතා නු ඛො භන්තෙ භික්ඛුනො දස්සනං සුවිසුද්ධං හොතීති?

සෙය්‍යථාපි භික්ඛු පුරිසස්ස කිංසුකො අදිට්ඨපුබ්බො අස්ස, සො යෙනඤ්ඤතරො පුරිසො කිංසුකස්ස දස්සාවී තෙනුපසඞ්කමෙය්‍ය, උපසඞ්කමිත්වා තං පුරිසං එවං වදෙය්‍ය: "කීදිසො භො පුරිස, කිංසුකො"ති. සො එවං වදෙය්‍ය "කාළකො ඛො අම්භො පුරිස, කිංසුකො, සෙය්‍යථාපි ඣාමඛාණූති? තෙන ඛො පන භික්ඛු, සමයෙන තාදිසො වස්ස කිංසුකො යථා තස්ස පුරිසස්ස දස්සනං.

එකල්හි ඒ මහණ ඒ මහණහුගේ පැන විසඳීමෙන් සතුටු නො වූයේ එක්තරා මහණකු වෙත එළඹියේ ය. එළඹ ඒ මහණ හට "ඇවැත්නි, මහණහුගේ දර්ශනය කෙතෙකින් සුවිශුද්ධ වේ දැ?"යි මෙය කී ය. ඇවැත්නි, යම් කලෙක මහණ සතරමහාභූතයන්ගේ සමුදයයත් අස්තඞ්ගමයත් තතුසේ දනී ද, ඇවැත්නි, එපමණෙකින් මහණහුගේ දර්ශනය සුවිශුද්ධ වේ යයි.

එකල්හි ඒ මහණ ඒ මහණහුගේ පැන විසඳීමෙන් සතුටු නො වූයේ එක්තරා මහණකු වෙත එළඹියේ ය. එළඹ ඒ මහණහට "ඇවැත්නි, කෙතෙකින් මහණහුගේ දර්ශනය සුවිශුද්ධ වේ දැ?"යි මෙය කී ය. ඇවැත්නි, යම් කලෙක මහණ යම් කිසිවක් හටගැනීම සවභාව කොට ඇත්තේ නම් ඒ සියල්ල නැසීම සවභාව කොට ඇත්තේ යයි තතුසේ දනී ද, ඇවැත්නි, එපමණෙකින් මහණහුගේ දර්ශනය සුවිශුද්ධ වේ යයි.

එකල්හි ඒ මහණ ඒ මහණහුගේ පැන විසඳීමෙන් සතුටු නො වූයේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පස්ව හුන්නේ ය. එකත්පස්ව හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: වහන්ස, මෙහි මම එක්තරා මහණකු වෙත එළඹුනෙමි. එළඹ ඒ මහණහට "ඇවැත්නි, කෙතෙකින් මහණහුගේ දර්ශනය සුවිශුද්ධ වේ දැ?" යි මෙය කීමි. වහන්ස, මෙසේ කී කල්හි ඒ මහණ මට මෙය කීය: "ඇවැත්නි, යම් කලෙක මහණ ස්පර්ශායතන සයෙහි සමුදයයත් අස්තඞ්ගමයත් තතුසේ දනී ද ඇවැත්නි, මෙපමණෙකින් මහණහුගේ දර්ශනය සුවිශුද්ධ වේ ය"යි.

වහන්ස, එකල්හි මම ඒ මහණහුගේ පැන විසඳීමෙන් සතුටු නො වූයෙම් එක්තරා මහණකු වෙත එළඹුනෙමි. එළඹ ඒ මහණහට "ඇවැත්නි, කෙතෙකින් මහණහුගේ දර්ශනය සුවිශුද්ධ වේ දැ" යි මෙය කීමි. වහන්ස, මෙසේ කී කල්හි ඒ මහණ මට මෙය කීය: "ඇවැත්නි, යම් කලෙක මහණ පඤ්චොපාදනස්කන්ධයන්ගේ සමුදයයත් අස්තඞ්ගමයත් තතුසේ දනී ද ... සතර මහාභූතයන්ගේ සමුදයයත් අස්තඞ්ගමයත් තතුසේ දනී ද... යම් කිසිවක් හටගැනීම සවභාව කොට ඇත්තේ නම් ඒ සියල්ල නැසීම සවභාව කොට ඇත්තේ ය"යි තතුසේ දනී ද, ඇවැත්නි, මෙපමණෙකින් මහණහුගේ දර්ශනය සුවිශුද්ධ වේ යයි.

වහන්ස, එකල්හි මම ඒ මහණහුගේ පැන විසඳීමෙන් සතුටු නො වූයෙම් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියෙමි. වහන්ස, කෙතෙකින් මහණහුගේ දර්ශනය සුවිශුද්ධ වේ දැ? යි.

මහණ, යම්සේ පුරුෂයකු විසින් කැලගස නුදුටුවිරූ වන්නේ ද, හෙතෙමේ කැලගසක් දුටු එක්තරා පුරුෂයකු වෙත එළඹෙන්නේ ය. එළඹ ඒ පුරුෂයාට "පින්වත් පුරුෂය, කැලගස කෙබඳු දැ?" යි මෙසේ කියන්නේ ය. හෙතෙමේ එම්බල පුරුෂය, "කැලගස දගිය කණුවක් මෙන් කළු ය" යි මෙසේ කියන්නේ ය. මහණ, ඒ පුරුෂයාගේ දැකීම යම්බඳු නම් එසමයෙහි කැලගස එබඳු ම වන්නේ ය.

අථ ඛො සො භික්ඛු පුරිසො අසන්තුට්ඨො තස්ස පුරිසස්ස පඤ්හවෙය්‍යාකරණෙන යෙනඤ්ඤතරො පුරිසො කිංසුකස්ස දස්සාවී තෙනුපසඞ්කමෙය්‍ය, උපසඞ්කමිත්වා තං පුරිසං එවං වදෙය්‍ය: "කීදිසො භො පුරිස, කිංසුකො"ති? සො එවං වදෙය්‍ය: "ලොහිතකො අම්භො පුරිස, කිංසුකො සෙය්‍යථාපි මංසපෙසී"ති. තෙන ඛො පන භික්ඛු සමයෙන තාදිසො වස්ස කිංසුකො යථා තස්ස පුරිසස්ස දස්සනං.

අථ ඛො සො භික්ඛු පුරිසො අසන්තුට්ඨො තස්ස පුරිසස්ස පඤ්හවෙය්‍යාකරණෙන යෙනඤ්ඤතරො පුරිසො කිංසුකස්ස දස්සාවී තෙනුපසඞ්කමෙය්‍ය, උපසඞ්කමිත්වා තං පුරිසං එවං වදෙය්‍ය: කීදිසො භො පුරිස, කිංසුකොති? සො එවං වදෙය්‍ය: ඔචීරකජාතො[1] ඛො අම්භො පුරිස, කිංසුකො ආදින්නසිපාටිකො, සෙය්‍යථාපි සිරීසොති. තෙන ඛො පන භික්ඛු සමයෙන තාදිසොවස්ස කිංසුකො යථා තස්ස පුරිසස්ස දස්සනං.

අථ ඛො සො භික්ඛු පුරිසො අසන්තුට්ඨො තස්ස පුරිසස්ස පඤ්හවෙය්‍යාකරණෙන යෙනඤ්ඤතරො පුරිසො කිංසුකස්ස දස්සාවී තෙනුපසඞ්කමෙය්‍ය, උපසඞ්කමිත්වා තං පුරිසං එවං වදෙය්‍ය: කීදිසො භො පුරිස, කිංසුකොති? සො එවං වදෙය්‍ය බහලපත්තපලාසො ඛො අම්භො පුරිස, කිංසුකො සන්දච්ඡායො සෙය්‍යථාපි නිග්‍රොධොති. තෙන ඛො පන භික්ඛු සමයෙන තාදිසොවස්ස කිංසුකො යථා තස්ස පුරිසස්ස දස්සනං. එවමෙව ඛො භික්ඛු යථා යථා අධිමුත්තානං තෙසං සප්පුරිසානං දස්සනං සුවිසුද්ධං[2], තථා තථා තෙහි තෙහි සප්පුරිසෙහි[3] බ්‍යාකතං.

සෙය්‍යථාපි භික්ඛු රඤ්ඤො පච්චන්තිමං නගරං දළ්හුද්දාපං[4] දළ්හපාකාරතොරණං ඡද්වාරං, තත්‍රස්ස දොවාරිකො පණ්ඩිතො ව්‍යත්තො මෙධාවී අඤ්ඤාතානං නිවාරෙතා ඤාතානං පවෙසෙතා, පුරත්ථිමාය දිසාය ආගන්ත්වා සීඝං දූතයුගං තං දොවාරිකං එවං වදෙය්‍ය: "කත්ථම්භො පුරිස, ඉමස්ස නගරස්ස නගරසාමී"ති?[5] සො එවං වදෙය්‍ය: එසො භන්තෙ මජ්ඣෙ සිංඝාටකෙ නිසින්නොති.

අථ ඛො තං සීඝං දූතයුගං නගරසාමිස්ස[6] යථාභූතං වචනං නිය්‍යාතෙත්වා යථාගතමග්ගං පටිපජ්ජෙය්‍ය. පච්ඡිමාය දිසාය ආගන්ත්වා සීඝං දූතයුගං -පෙ- උත්තරාය දිසාය ආගන්ත්වා සීඝං දූතයුගං -පෙ- දක්ඛිණාය දිසාය ආගන්ත්වා සීඝං දූතයුගං තං දොවාරිකං එවං වදෙය්‍ය: "කත්ථම්භො පුරිස ඉමස්ස නගරස්ස නගරසාමීති? සො එවං වදෙය්‍ය: "එසො භන්තෙ මජ්ඣෙ සිංඝාටකෙ නිසින්නො"ති. අථ ඛො තං සීඝං දූතයුගං නගරසාමිස්ස[6] යථාභූතං වචනං නිය්‍යාතෙත්වා යථාගතමග්ගං පටිපජ්ජෙය්‍ය.

---

1. ඔජීරකජාතො - සී 2, PTS.
2. සුවිසුද්ධං හොති - මජසං, සයා.
3. තථා තථා ඛොතෙහි සප්පුරිසෙහි - මජසං.
   ඡෙකෙහි සප්පුරිසෙහි - සයා.
4. දළ්හුද්ධාපං - මජසං.
5. නගරස්සසාමී - සීමු, සයා.
   ඉමස්ස නගරස්සාමී - මජසං.

මහණ, එකල්හි ඒ පුරුෂ තෙමේ ඒ පුරුෂයාගේ පැන විසඳීමෙන් සතුටු නො වූයේ කැලගසක් දුටු එක්තරා පුරුෂයකු වෙත එළඹෙන්නේ ය. එළඹ ඒ පුරුෂයාට පින්වත් පුරුෂය, 'කැලගස කෙබඳු ද?' යි මෙසේ කියන්නේ ය. හෙතෙමේ එම්බල පුරුෂය, කැලගස මස්වැදල්ලක් මෙන් ලෙහෙවන්ය යි මෙසේ කියන්නේ ය. මහණ, ඒ පුරුෂයාගේ දැකුම යම්බඳු නම් එසමයෙහි කැලගස එබඳු ම වන්නේ ය.

මහණ, එකල්හි ඒ පුරුෂ තෙමේ එ පුරුෂයාගේ පැනවිසඳීමෙන් නො සතුටු වූයේ කැලගසක් දුටු එක්තරා පුරුෂයකු වෙත එළඹෙන්නේ ය. එළඹ ඒ පුරුෂයාට 'පින්වත් පුරුෂය, කැලගස කෙබඳු ද?' යි මෙසේ කියන්නේ ය. හෙතෙමේ 'එම්බල පුරුෂය, කැලගස මහරී ගසක් මෙන් පැලුණු කරල් ඇත්තේ ගැලවුණු පොතු ඇත්තේ ය' යි මෙසේ කියන්නේ ය. මහණ, ඒ පුරුෂයාගේ දැකුම යම්බඳු නම් එසමයෙහි කැලගස එබඳු ම වන්නේ ය.

මහණ, එකල්හි ඒ පුරුෂ තෙමේ ඒ පුරුෂයාගේ පැන විසඳීමෙන් නො සතුටු වූයේ කැලගසක් දුටු එක්තරා පුරුෂයකු වෙත එළඹෙන්නේ ය. එළඹ ඒ පුරුෂයාහට පින්වත් පුරුෂය, කැලගස කෙබඳු ද? යි මෙසේ කියන්නේ ය. හෙතෙමේ 'එම්බල පුරුෂය, කැලගස නුගරුකක් මෙන් ගනසෙවණ ඇත්තේ ය' යි මෙසේ කියන්නේ ය. මහණ, ඒ පුරුෂයාගේ දක්ම යම්බඳු නම් එසමයෙහි කැලගස එබඳු ම වන්නේ ය. මහණ, එසෙයින් ම යම් යම් පරිදි අවබෝධ කරන ලද ඒ සත්පුරුෂයන්ගේ දක්ම සුපිරිසිදු වී නම් ඒ ඒ සත්පුරුෂයන් විසින් ඒ ඒ පරිද්දෙන් පවසන ලද්දේ ය.

මහණ, යම්සේ රජකුගේ දැඩි පවුරුපදනම් ඇති දැඩි උපකාරිකා ඇති දැඩි පවුරුතොරන් ඇති සදෙරක් ඇති පසල් නුවරෙක් වේ ද, එහි පණ්ඩිත වූ ව්‍යක්ත වූ නුවණැති නො හඳුනන්නවුන් වලක්වන හඳුනන්නවුන් පිවිසවන දෙරටුපල්ලෙක් වන්නේ ය. ශීඝ්‍රගමන් ඇති දූත යුවළක් පෙරදිගින් අවුත් ඒ දෙරටුපල්ලාට ''එම්බල පුරුෂය, මේ නුවර නුවරහිමියා කොහි ද?'' යි මෙසේ කියන්නේ ය. හෙතෙමේ ස්වාමීනි, මෙතෙමේ මැද සිවුමංසලෙහි හුන්නේ යයි මෙසේ කියන්නේ ය.

එකල්හි ඒ ශීඝ්‍රදූත යුවළ නුවරහිමියාට වූපරිදි වචනය පවරා දී ආ මගට පිළිපදනේ ය. ශීඝ්‍රදූතයුවළක් පැළදිගින් අවුත් ... ශීඝ්‍රදූතයුවළක් උතුරුදිගින් අවුත් ... ශීඝ්‍රදූතයුවළක් දකුණුදිගින් අවුත් ඒ දෙරටුපල්ලාට ''එම්බා පුරුෂය, මෙනුවර නුවරහිමියා කොහි ද?'' යි මෙසේ කියන්නේ ය. හෙතෙමේ ස්වාමීනි, මේ තෙමේ මැද සිවුමංසලෙහි හුන්නේ යයි මෙසේ කියන්නේ ය. එකල්හි ඒ ශීඝ්‍රදූතයුවළ නුවරහිමියාට වූපරිදි වචනය පවරා දී ආ මගට පිළිපදනේ ය.

උපමා ඛො ම්‍යායං භික්ඛු කතා අත්ථස්ස විඤ්ඤාපනාය, අයඤ්චෙත්ථ අත්ථො: නගරන්ති ඛො භික්ඛු ඉමස්සෙතං චාතුම්මහාභූතිකස්ස කායස්ස අධිවචනං. මාතාපෙත්තිකසම්භවස්ස ඔදනකුම්මාසූපචයස්ස අනිච්චුච්ඡාදන පරිමද්දන භෙදන විද්ධංසන ධම්මස්ස. ඡද්වාරන්ති ඛො භික්ඛු, ඡන්නෙතං අජ්ඣත්තිකානං ආයතනානං අධිවචනං. දොවාරිකොති ඛො භික්ඛු සතියා එතං අධිවචනං. සීඝං දූතයුගන්ති ඛො භික්ඛු සමථවිපස්සනානෙතං අධිවචනං. නගරසාමීති ඛො භික්ඛු විඤ්ඤාණස්සෙතං අධිවචනං. මජ්ඣෙ සිඞ්ඝාටකොති ඛො භික්ඛු චතුන්නෙතං මහාභූතානං අධිවචනං: පඨවිධාතුයා ආපොධාතුයා තෙජොධාතුයා වායොධාතුයා. යථාභූතවචනන්ති ඛො භික්ඛු නිබ්බානස්සෙතං අධිවචනං. යථාගතමග්ගොති ඛො භික්ඛු අරියස්සෙතං අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස අධිවචනං සෙය්‍යථීදං: සම්මාදිට්ඨියා -පෙ- සම්මාසමාධිස්සාති.

## 1. 19. 9

## වීණොපමසුත්තං

246. යස්ස කස්ස චි භික්ඛවෙ භික්ඛුස්ස වා භික්ඛුනියා වා චක්ඛුවිඤ්ඤෙය්‍යෙසු රූපෙසු උප්පජ්ජෙය්‍ය ඡන්දො වා රාගො වා දොසො වා මොහො වා පටිඝං[1] වා චෙතසො, තතො චිත්තං නිවාරයෙ,[2] සභයො චෙසො මග්ගො සප්පටිභයො ච සකණ්ටකො ච සගහනො ච උම්මග්ගො ච කුම්මග්ගො ච දුහිතිකො ච, අසප්පුරිසසෙවිතො චෙසො මග්ගො න චෙසො මග්ගො සප්පුරිසසෙවිතො, න ත්වං අරහසීති තතො චිත්තං නිවාරයෙ චක්ඛුවිඤ්ඤෙය්‍යෙහි රූපෙහි.

යස්ස කස්සචි භික්ඛවෙ භික්ඛුස්ස වා භික්ඛුනියා වා සොතවිඤ්ඤෙය්‍යෙසු සද්දෙසු -පෙ- ඝානවිඤ්ඤෙය්‍යෙසු ගන්ධෙසු -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යෙසු රසෙසු -පෙ- කායවිඤ්ඤෙය්‍යෙසු ඵොට්ඨබ්බෙසු -පෙ- මනොවිඤ්ඤෙය්‍යෙසු ධම්මෙසු උප්පජ්ජෙය්‍ය ඡන්දො වා රාගො වා දොසො වා මොහො වා පටිඝං වා චෙතසො, තතො චිත්තං නිවාරයෙ, සභයො චෙසො මග්ගො සප්පටිභයො ච සකණ්ටකො ච සගහනො ච උම්මග්ගො ච කුම්මග්ගො ච දුහිතිකො ච, අසප්පුරිසසෙවිතො චෙසො මග්ගො, න චෙසො මග්ගො සප්පුරිසසෙවිතො, න ත්වං එතං අරහසීති තතො චිත්තං නිවාරයෙ මනොවිඤ්ඤෙය්‍යෙහි ධම්මෙහි.

---

1. සප්පටිඝං වාපි – ස්‍යා.
2. නිවාරෙය්‍ය, සීමු.

මහණ, අරුත ඇඟවීම පිණිස මා විසින් මේ උපමාවක් කරන ලදී. මේ මෙහි අරුත යි. මහණ, නුවරය යනු මවුපියන්ගෙන් හටගත් බතින් හා කොමුපිඩුයෙන් වැඩුණු අනිස වූ ඉලීම පිරිමැදීම බිඳීම වැනසීම සවභාව කොට ඇති සතර මහාභූතමය වූ මේ සිරුරට තෙල නමෙකි. මහණ, සදොර ය යනු ආධ්‍යාත්මික ෂඩායතනයට මේ නමෙකි. මහණ, දොරටුපල්ලා ය යනු සිහියට මේ නමෙකි. මහණ, ශීඝ්‍රදූත යුවළය යනු සමථවිදර්ශනාවන්ට මේ නමෙකි. මහණ, නුවරහිමියා යනු විඤ්ඤාණයට මේ නමෙකි. මහණ, මැද සිවුමංසලය යනු පඨවිධාතුවට ද ආපොධාතුවට ද තෙජොධාතුවට ද වායොධාතුවට ද යන සතර මහාභූතයන්ට මේ නමෙකි. මහණ, වූපරිදි වචනය යනු නිවනට මේ නමෙකි. මහණ, ආ මග ය යනු අරිඅටඟිමගට එනම් සම්මාදිට්ඨියට ද ... සම්මාසමාධියට ද මේ නමෙකි යි.

## 1. 19. 9

## වීණොපම සූත්‍රය

246. මහණෙනි, යම්කිසි මහණකුට හෝ මෙහෙණකට හෝ ඇසින් දත යුතු රූහි සිතේ ඡන්දයෙක් හෝ රාගයෙක් හෝ දෙසයෙක් හෝ මොහයෙක් හෝ පටිඝයෙක් හෝ උපදනේ නම් එයින් සිත වළක්වන්නේ ය. මේ මඟ බිය සහිත ද ප්‍රතිභය සහිත ද කටු සහිත ද ගහන සහිත ද නොමගෙක් ද නපුරු මඟෙක් ද දුක්පැවැතුම් ඇත්තෙක් ද වෙයි. මේ මඟ අසත්පුරුෂයන් විසින් සෙවුනා ලද්දේ ය. මේ මඟ සත්පුරුෂයන් විසින් නො ද සෙවුනා ලද්දේ ය. තෙපි මෙයට නුසුදුස්සහු යයි ඒ ඇසින් දත යුතු රූපයන්ගෙන් සිත වළක්වන්නේ ය.

මහණෙනි, යම්කිසි මහණකුට හෝ මෙහෙණකට හෝ කනින් දත යුතු සදෙහි ... නැහැයෙන් දත යුතු ගඳෙහි ... දිවින් දත යුතු රසෙහි ... කයින් දත යුතු පහස්හි ... සිතින් දත යුතු දහම්හි සිතේ ඡන්දයෙක් හෝ රාගයෙක් හෝ දෙසයෙක් හෝ මෝහයෙක් හෝ පටිඝයෙක් හෝ උපදනේ නම් එයින් සිත වළක්වන්නේ ය. මේ මඟ බිය සහිත ද පටිභය සහිත ද කටු සහිත ද ගහන සහිත ද නොමඟෙක් ද නපුරුමඟෙක් ද දුක් පැවතුම් ඇත්තෙක් ද වේ. මේ මඟ අසත්පුරුෂයන් විසින් සෙවුනා ලද්දේ ය. මේ මඟ සත්පුරුෂයන් විසින් නො ද සෙවුනා ලද්දේ ය. තෙපි මෙයට නුසුදුසු වහු යයි ඒ සිතින් දත යුතු දහමින් සිත වළහන්නේ ය.

සෙය්‍යථාපි භික්ඛවෙ කිට්ඨං සම්පන්නං, කිට්ඨාරක්ඛකො[1]ච පමත්තො ගොණො ච කිට්ඨාදො අදුං කිට්ඨං ඔතරිත්වා[2] යාවදත්ථං මදං ආපජ්ජෙය්‍ය, එවමෙව ඛො භික්ඛවෙ අස්සුතවා පුථුජ්ජනො ඡසු ඵස්සායතනෙසු අසංවුතකාරී පඤ්චසු කාමගුණෙසු යාවදත්ථං මදං ආපජ්ජති. සෙය්‍යථාපි භික්ඛවෙ කිට්ඨං සම්පන්නං කිට්ඨාරක්ඛකො ච අප්පමත්තො ගොණො ච කිට්ඨාදො අදුං කිට්ඨං ඔතරෙය්‍ය[3] තමෙනං කිට්ඨාරක්ඛකො නාසාය සුග්ගහීතං ගණ්හෙය්‍ය, නාසාය සුග්ගහීතං ගහෙත්වා උපරිඝටායං සුනිග්ගහිතං නිග්ගණ්හෙය්‍ය, උපරිඝටායං සුනිග්ගහිතං නිග්ගහෙත්වා දණ්ඩෙන සුතාළිතං තාළෙය්‍ය, දණ්ඩෙන සුතාළිතං තාළෙත්වා ඔස්සජෙය්‍ය,[4]

දුතියම්පි ඛො භික්ඛවෙ -පෙ- තතියම්පි ඛො භික්ඛවෙ ගොණො කිට්ඨාදො අදුං කිට්ඨං ඔතරෙය්‍ය, තමෙනං කිට්ඨාරක්ඛකො නාසාය සුග්ගහීතං ගණ්හෙය්‍ය, නාසාය සුග්ගහීතං ගහෙත්වා උපරිඝටායං සුනිග්ගහිතං නිග්ගණ්හෙය්‍ය, උපරිඝටායං සුනිග්ගහිතං නිග්ගහෙත්වා දණ්ඩෙන සුතාළිතං තාළෙය්‍ය, දණ්ඩෙන සුතාළිතං තාළෙත්වා ඔස්සජෙය්‍ය. එවං හි සො භික්ඛවෙ ගොණො කිට්ඨාදො ගාමගතො වා අරඤ්ඤගතො වා ඨාන බහුලො අස්ස නිසජ්ජබහුලො, න තං කිට්ඨං පුන ඔතරෙය්‍ය. තමෙව පුරිමං දණ්ඩසමඵස්සං සමනුස්සරන්තො. එවමෙව ඛො භික්ඛවෙ යතො භික්ඛුනො ඡසු ඵස්සායතනෙසු චිත්තං උදුජ්ජිතං[5] හොති සුදුජ්ජිතං[6] අජ්ඣත්තං සන්තිට්ඨති සන්නිසීදති එකොදි හොති සමාධියති.

සෙය්‍යථාපි භික්ඛවෙ රඤ්ඤො වා රාජමහාමත්තස්ස වා වීණාය සද්දො අස්සුතපුබ්බො අස්ස, සො වීණාසද්දං සුණෙය්‍ය, සො එවං වදෙය්‍ය: "අම්භො කිස්ස[7]නුඛො එසො සද්දො එවං රජනීයො එවං කමනීයො එවං මදනීයො එවං මුච්ඡනීයො එවං බන්ධනීයො"ති? තමෙනං එවං වදෙය්‍යුං: "එසා ඛො භන්තෙ වීණා නාම යස්සා එසො සද්දො එවං රජනීයො එවං කමනීයො එවං මදනීයො එවං මුච්ඡනීයො එවං බන්ධනීයො"ති.

සො එවං වදෙය්‍ය: "ගච්ඡථ මෙ භො තං වීණං ආහරථා"ති. තස්ස තං වීණං ආහරෙය්‍යුං, තමෙනං එවං වදෙය්‍යුං: "අයං ඛො සා භන්තෙ වීණා යස්සා එසො සද්දො එවං රජනීයො එවං කමනීයො එවං මදනීයො එවං මුච්ඡනීයො එවං බන්ධනීයො"ති. සො එවං වදෙය්‍ය: "අලං මෙ භො තාය වීණාය, තමෙව මෙ සද්දං ආහරථා"ති.

1. කිට්ඨාරක්ඛො – මජසං.
2. ඔතාරිත්වා – සී 1, 2
3. ඔතාරෙය්‍ය – සී 2.
4. ඔසජ්ජෙය්‍ය – මජසං, සයා.
5. උජ්ජුජාතං – සී 1, 2. උදුජිතං - මජසං.
6. සමුජ්ජුජාතං - සී 1, 2, සුදුජිතං - මජසං.
7. කස්ස - මජසං, සයා.

මහණෙනි, යම්සේ සරු ගොයමෙක් වේ ද ගොයම රක්නාත් පමා වූයේ වේ ද, ගොයම් කන ගොණෙක් ඒ ගොයමට බැස ඇතිතාක් මදයට පැමිණෙන්නේ ය. මහණෙනි, එසෙයින් ම අශ්‍රුතවත් පෘථජ්ජන තෙමේ ස්පර්ශායතන සයෙහි සංවර රහිත වූයේ පඤ්චකාමගුණයන් හි ඇතිතාක් මදයට පැමිණෙයි. මහණෙනි, යම්සේ සරුගොයමෙක් වේ ද, ගොයම රක්නාත් නො පමා වූයේ ද, ගොයම් කන ගොණෙක් ඒ ගොයමට බස්නේ ය. ගොයම රක්නා තෙල ගොනු නැහැයෙහි දැඩි කොට ගන්නේ ය. නැහැයෙහි දැඩිකොට ගෙන දෙ අං අතරෙහි දැඩිපෙළුම් කොට පෙළන්නේ ය. දෙ අං අතරෙහි දැඩිපෙළුම් කොට පෙළා දණ්ඩෙකින් දැඩිතැළු-මෙන් තළන්නේ ය. දණ්ඩෙකින් දැඩිතැළුමෙන් තළා හැර දමන්නේ ය.

මහණෙනි, දෙවන වට දු ... මහණෙනි, තෙවනවට දු ගොයම් කන ගොණා ඒ ගොයමට බස්නේ ය. ගොයම රක්නා තෙල ගොනු නැහැයෙහි දැඩිකොට ගන්නේ ය. නැහැයෙහි දැඩි කොට ගෙන දෙඅං අතරෙහි දැඩි පෙළුම් කොට පෙළන්නේ ය. දෙඅං අතරෙහි දැඩිපෙළුම් කොට පෙළා දණ්ඩෙකින් දැඩිතැළුමෙන් තළන්නේ ය. දණ්ඩෙකින් දැඩිතැළුම් කොට තළා හැර දමන්නේ ය. මහණෙනි, මෙසේ ඒ ගොයම් කන ගොණා ගමකට ගියේ හෝ අරණකට ගියේ හෝ සිටුම් බහුල කොට ඇත්තේ හිඳුම් බහුල කොට ඇත්තේ වන්නේ ය. ඒ පළමු දඬුපහස ම සිහි කරනුයේ ඒ ගොයමට නැවත නො බස්නේ ය. මහණෙනි, එසෙයින් ම යම්කලෙක මහණහුගේ සිත ස්පර්ශායතන සයෙහි තර්ජනය කරන ලද්දේ දැඩිසේ තර්ජනය කරන ලද්දේ වේ ද, (එකල්හි) ඇතුළත සිටියි, හිඳියි, එකඟවෙයි, සමාධිගත වෙයි.

මහණෙනි, යම්සේ රජකු විසින් හෝ රාජමහාමාත්‍යයකු විසින් හෝ වීණාවෙහි හඬ නො ඇසූවිරූ වන්නේ ද හෙතෙමේ වීණා-හඬක් අසන්නේ ය. හෙතෙමේ පින්වත්නි, මෙසේ ඇලුම් කට යුතු මෙසේ කැමති වියයුතු මෙසේ මදයට කරුණු වූ මෙසේ මුළාවට කරුණු වූ මෙසේ බැඳීමට කරුණු වූ මේ හඬ කුමක් ද? යි මෙසේ කියන්නේ ය. ඒ මොහුට ස්වාමීනි, යමෙක වූ මේ හඬ මෙසේ ඇලුම් කටයුතු මෙසේ කැමති වියයුතු මෙසේ මදයට කරුණු මෙසේ මුළාවට කරුණු මෙසේ බැඳීමට කරුණු වේ නම් මෙය වීණා නමැ යි.

හෙතෙමේ පින්වත්නි, යවු ඒ වීණාව මට ගෙනෙවූ යයි මෙසේ කියන්නේ ය. ඔහුට ඒ වීණාව ගෙන එන්නාහු ය. ඒ මොහුට ස්වාමීනි, මෙසේ ඇලුම් කටයුතු මෙසේ කැමති විය යුතු මෙසේ මදයට කරුණු වූ මෙසේ මුළාවට කරුණු වූ මෙසේ බැඳීමට කරුණු වූ මේ හඬ යමක නම් මේ ඒ වීණාව යයි මෙසේ කියන්නාහු ය. හෙතෙමේ භවත්නි, ඒ වීණාවෙන් මට කම් නැත ඒ හඬ ම මට ගෙන එවු යයි මෙසේ කියන්නේ ය.

තමෙනං එවං වදෙය්‍යුං: "අයං ඛො භන්තෙ වීණා නාම අනෙකසම්භාරා මහාසම්භාරා, අනෙකෙහි සම්භාරෙහි සමාරද්ධා වදති[1] සෙය්‍යථීදං? දොණිඤ්ච පටිච්ච චම්මඤ්ච[2] පටිච්ච දණ්ඩඤ්ච පටිච්ච උපවෙණඤ්ච[3] පටිච්ච තන්තියො ච පටිච්ච කොණඤ්ච පටිච්ච පුරිසස්ස ච තජ්ජං වායාමං පටිච්ච එවායං භන්තෙ වීණා නාම අනෙකසම්භාරා මහාසම්භාරා, අනෙකෙහි සම්භාරෙහි සමාරද්ධා වදතීති.

සො තං වීණං දසධා වා සතධා[4] වා ඵාලෙය්‍ය, දසධා වා සතධා වා තං ඵාලෙත්වා සකලිකං සකලිකං කරෙය්‍ය සකලිකං සකලිකං කරිත්වා අග්ගිනා ඩහෙය්‍ය, අග්ගිනා ඩහෙත්වා මසිං කරෙය්‍ය, මසිං කරිත්වා මහාවාතෙ වා ඔපුනෙය්‍ය, නදියා වා සීඝසොතාය පවාහෙය්‍ය.

සො එවං වදෙය්‍ය: අසතී[5] කිරායං භො වීණා නාම, යථෙවං යං කිඤ්චි වීණා නාම, එත්ථ ච පනායං ජනො අතිවෙලං පමත්තො පලාළිතො[6]ති. එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු රූපං සමන්නෙසති යාවතා රූපස්ස ගති. වෙදනං සමන්නෙසති යාවතා වෙදනාය ගති, සඤ්ඤං සමන්නෙසති යාවතා සඤ්ඤාය ගති සඞ්ඛාරෙ සමන්නෙසති යාවතා සඞ්ඛාරානං ගති. විඤ්ඤාණං සමන්නෙසති යාවතා විඤ්ඤාණස්ස ගති. තස්ස රූපං සමන්නෙසතො යාවතා රූපස්ස ගති. වෙදනං –පෙ– සඤ්ඤං –පෙ– සඞ්ඛාරෙ –පෙ– විඤ්ඤාණං සමන්නෙසතො යාවතා විඤ්ඤාණස්ස ගති. යම්පස්ස තං හොති අහන්ති වා මමන්ති වා අස්මීති වා තම්පි තස්ස න හොතීති.

## 1. 19. 10

### ඡප්පාණකසුත්තං

247. සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො අරුගත්තො පක්කගත්තො සරවනං පවිසෙය්‍ය, තස්ස කුසකණ්ටකා චෙව පාදෙ විජ්ඣෙය්‍යුං, සරපත්තානි ච ගත්තානි විලිඛෙය්‍යුං[7] එවං හි සො භික්ඛවෙ පුරිසො භිය්‍යො සොමත්තාය තතො නිදානං දුක්ඛං දොමනස්සං පටිසංවෙදියෙථ. එවමෙව ඛො භික්ඛවෙ ඉධෙකච්චො භික්ඛු ගාමගතො වා අරඤ්ඤගතො වා ලභති වත්තාරං: අයඤ්ච සො[8] ආයස්මා එවංකාරී එවංසමාචාරො අසුචි ගාමකණ්ටකොති, තං කණ්ටකොති ඉති විදිත්වා සංවරො ච අසංවරො ච වෙදිතබ්බො.

කථඤ්ච භික්ඛවෙ අසංවරො හොති: ඉධ භික්ඛවෙ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා පියරූපෙ රූපෙ අධිමුච්චති, අප්පියරූපෙ රූපෙ ව්‍යාපජ්ජති, අනුපට්ඨිතකායසති ච විහරති පරිත්තචෙතසො, තඤ්ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං නප්පජානාති යත්ථස්ස තෙ උප්පන්නා පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති.

---

1. චරති – ස්‍යා.
2. මඤ්චං – ස්‍යා
3. උපධාරණඤ්ච – මජසං, ස්‍යා.
4. සතත ධා – සී 1.
5. අසක්කිරායං – සී 1, 2.
6. පලළිතො – මජසං.
7. විලෙඛෙය්‍යුං – මජසං. විලාඛෙය්‍යුං – ස්‍යා.
8. අයඤ්ච ඛො PTS.

ඒ මොහුට මෙසේ කියන්නාහු ය: ස්වාමීනි, මේ වීණාව නම් නොයෙක් උපකරණ ඇත්තකි. බොහෝ උපකරණ ඇත්තකි. නොයෙක් උපකරණවලින් අරඹන ලද්දේ හඬ නගයි. එනම්: දෙණත් නිසා සමත් නිසා දණ්ඩත් නිසා උපවීණයත් නිසා තතුත් නිසා කඩිප්පුත් නිසා පුරුෂයාගේ ඊට සුදුසු වෑයමත් නිසා ය. ස්වාමීනි, මෙසේ මේ වීණාව නම් නොයෙක් උපකරණ ඇත්තකි. බොහෝ උපකරණ ඇත්තකි. නොයෙක් උපකරණවලින් අරඹන ලද්දේ හඬ නගා යි.

හෙතෙමේ ඒ වීණාව දසකඩක් කොට හෝ සියක් කඩක් කොට හෝ පළන්නේ ය. දසකඩක් කොට හෝ සියක් කඩක් කොට හෝ එය පළා කැබලි කැබලි කරන්නේ ය. කැබලි කැබලි කොට ගින්නෙන් දවන්නේ ය. ගින්නෙන් දවා හළු කරන්නේ ය. හළු කොට මහසුළඟෙහි හෝ පිඹ හරින්නේ ය. සැඩදියපහර ඇති ගඟක හෝ පාකොට හරින්නේ ය.

හෙතෙමේ මෙසේ කියන්නේ ය. පින්වත්නි, මේ වීණාව නම් ලාමක ය. වීණා නම් වෙනත් යම් කිසිවකුත් වේ නම් එයත් මෙබඳු ය. මෙහිදු මේ ජන තෙමේ වේලාව ඉක්මවා පමා වූයේ ඇලුනේ යයි. මහණෙනි, එසෙයින් ම මහණ තෙමේ රූපයේ ගති යම්තාක් ද ඒ තාක් රූපය සොයයි. වේදනාවේ ගති යම් තාක් ද ඒතාක් වේදනාව සොයයි. සංඥාවේ ගති යම්තාක් ද ඒතාක් සංඥාව සොයයි. සංස්කාරයන්ගේ ගති යම්තාක් ද ඒතාක් සංස්කාර සොයයි. විඥානයාගේ ගති යම්තාක් ද ඒ තාක් විඥානය සොයයි. රූපයේ ගති ඇති තාක් රූපය සොයන ඔහුට වේදනාව ... සංඥාව ... සංස්කාර ... විඥානයේ ගති ඇති තාක් විඥානය සොයන ඔහුට "මම ය" යි හෝ "මාගේ ය" යි හෝ "වෙමි"යි හෝ ඒ යමකුත් වේ නම් එය ද ඔහුට නො වේ යි.

## 1. 19. 10

### ඡප්පාණක සූත්‍රය

247. මහණෙනි, යම්සේ වණසහිත සිරුරු ඇති පැස වූ සිරුරු ඇති පුරුෂයෙක් කටුවනයකට පිවිසෙන්නේ ද කුසකටු ද ඔහුගේ පා විදුනේ ය. කටු සහිත පත් ද සිරුරු සූරන්නේ ය. මහණෙනි, මෙසේ ඒ පුරුෂ තෙමේ ඒ හේතු කොට ගෙන දුක් දොම්නස් විඳුණේ ය. මහණෙනි, එසෙයින් ම මෙහි ඇතැම් මහණෙක් ගමකට ගියේ හෝ අරණ්‍යකට ගියේ හෝ "ඒ මේ ආයුෂ්මත් තෙමේත් මෙසේ කරන්නේ මෙබඳු හැසුරුම් ඇත්තේ අපිරිසිදු ගම්කටුවකැ"යි නුගුණ කියන්නකු ලබයි. ඔහු කටුවකැ යි මෙසේ දැන සංවරය ද අසංවරය ද දත යුත්තේ ය.

මහණෙනි, කෙසේ නම් අසංවර වේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ තෙමේ ඇසින් රූ දැක ප්‍රියස්වරූප වූ රූප-යෙහි ඇලෙයි. ප්‍රියස්වරූප නො වූ රූපයෙහි කිපෙයි. නො එළඹ සිටි කායියා සිහි ඇත්තේත් මඳ සිත් ඇත්තේත් වෙසෙයි. ඔහුට උපන් ලාමක අකුසල් දහම්හු යම් තැනෙක නිරවශේෂයෙන් නිරුද්ධ වෙත් නම් ඒ චේතෝවිමුක්තිය ප්‍රඥාවිමුක්තිය තතුසේ නො දනී.

සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය පියරූපෙ ධම්මෙ අධිමුච්චති, අප්පියරූපෙ ධම්මෙ ව්‍යාපජ්ජති, අනුපට්ඨිතකායසති ච විහරති පරිත්තචෙතසො තඤ්ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං නප්පජානාති යත්ථස්ස තෙ උප්පන්නා පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති.

සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො ඡප්පාණකෙ ගහෙත්වා නානාවිසයෙ නානාගොචරෙ දළ්හාය රජ්ජුයා බන්ධෙය්‍ය: අහිං ගහෙත්වා දළ්හාය රජ්ජුයා බන්ධෙය්‍ය, සුංසුමාරං ගහෙත්වා දළ්හාය රජ්ජුයා බන්ධෙය්‍ය, පක්ඛිං ගහෙත්වා දළ්හාය රජ්ජුයා බන්ධෙය්‍ය, කුක්කුරං ගහෙත්වා දළ්හාය රජ්ජුයා බන්ධෙය්‍ය, සිගාලං ගහෙත්වා දළ්හාය රජ්ජුයා බන්ධෙය්‍ය, මක්කටං ගහෙත්වා දළ්හාය රජ්ජුයා බන්ධෙය්‍ය; දළ්හාය රජ්ජුයා බන්ධිත්වා මජ්ඣෙ ගණ්ඨිං කරිත්වා ඔස්සජ්ජෙය්‍ය, අථ ඛො තෙ භික්ඛවෙ ඡප්පාණකා නානාවිසයා නානාගොචරා සකං සකං ගොචරවිසයං ආවිඤ්ඡෙය්‍යුං,

අහි ආවිඤ්ඡෙය්‍ය වම්මිකං පවෙක්ඛාමීති, සුංසුමාරො ආවිඤ්ඡෙය්‍ය උදකං පවෙක්ඛාමීති, පක්ඛී ආවිඤ්ඡෙය්‍ය ආකාසං ඩෙස්සාමීති, කුක්කුරො ආවිඤ්ඡෙය්‍ය ගාමං පවෙක්ඛාමීති, සිගාලො ආවිඤ්ඡෙය්‍ය සීවථිකං පවෙක්ඛාමීති, මක්කටො ආවිඤ්ඡෙය්‍ය වනං පවෙක්ඛාමීති. යදා ඛො තෙ භික්ඛවෙ ඡප්පාණකා ඣත්තා අස්සු කිලන්තා, අථ යො නෙසං පාණකො[1] බලවතරො අස්ස, තස්ස තෙ අනුපරිවත්තෙය්‍යුං, අනුවිධායෙය්‍යුං,[2] වසං ගච්ඡෙය්‍යුං.

එවමෙව ඛො භික්ඛවෙ යස්ස කස්සචි භික්ඛුනො කායගතා සති අභාවිතා අබහුලීකතා, තං චක්ඛු ආවිඤ්ඡති මනාපිකෙසු රූපෙසු, අමනාපිකස්ස රූපා පටික්කූලා හොන්ති, සොතං ආවිඤ්ඡති මනාපිකෙසු සද්දෙසු, අමනාපිකස්ස සද්දා පටික්කූලා හොන්ති, ඝානං ආවිඤ්ඡති මනාපිකෙසු ගන්ධෙසු අමනාපිකස්ස ගන්ධා පටික්කූලා හොන්ති, ජිව්හා ආවිඤ්ඡති මනාපිකෙසු රසෙසු අමනාපිකස්ස රසා පටික්කූලා හොන්ති, කායො ආවිඤ්ඡති මනාපිකෙසු ඵොට්ඨබ්බෙසු, අමනාපිකස්ස ඵොට්ඨබ්බා පටික්කූලා හොන්ති, මනො ආවිඤ්ඡති මනාපිකෙසු ධම්මෙසු, අමනාපිකස්ස ධම්මා පටික්කූලා හොන්ති.

එවං ඛො භික්ඛවෙ අසංවරො හොති. කථඤ්ච භික්ඛවෙ සංවරො හොති: ඉධ භික්ඛවෙ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා පියරූපෙ රූපෙ නාධිමුච්චති, අප්පියරූපෙ න ව්‍යාපජ්ජති, උපට්ඨිතකායසති ච විහරති අප්පමාණචෙතසො, තඤ්ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං පජානාති යත්ථස්ස තෙ උප්පන්නා පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති.

---

1. පාණකානං - මජ්ඣං.
   පාණකා - ස්‍යා.
2. අනුවිධියෙය්‍යුං - සී 1, 2.

කනින් සද අසා ... නැහැයෙන් ගඳ ගෙන ... දිවෙන් රස විඳ ... කයින් පහස් පැහැස ... සිතින් දහම් දැන පියදෑ වූ දහම්හි ඇලෙයි. ප්‍රියස්වරූප නො වූ දහම්හි කිපෙයි. නො එළඹ සිටි කාගියා සිහි ඇත්තේත් මඳ සිත් ඇත්තේත් වෙසෙයි, ඔහුට උපන් ලාමක අකුසල් දහම්හු යම් තැනෙක නිරවශෙෂයෙන් නිරුද්ධ වෙත් නම් ඒ චලසමාධි-යත් චලප්‍රඥාවත් තතුසේ නො දනී.

මහණෙනි, යම්සේ පුරුෂයෙක් වෙනස් වෙනස් තැන්හි වෙසෙන වෙනස් වෙනස් ගොදුරු ගන්නා සතුන් සදෙනකුන් ගෙන දැඩි රැහැනකින් බඳනේ ද; නයකු ගෙන දැඩි රැහැනකින් බඳනේ ය. කිඹුලකු ගෙන දැඩි රැහැනකින් බඳනේ ය. පක්ෂියකු ගෙන දැඩි රැහැනකින් බඳනේ ය. ශුනකයකු ගෙන දැඩි රැහැනකින් බඳනේ ය. සිවලකු ගෙන දැඩි රැහැනකින් බඳනේ ය. වඳුරකු ගෙන දැඩි රැහැනකින් බඳනේ ය. දැඩි රැහැනකින් බැඳ මැද ගැටයක් කොට අත්හරනේ ය. මහණෙනි, එකල්හි වෙනස් වෙනස් තැන්හි වෙසෙන වෙනස් වෙනස් ගොදුරු ගන්නා ඒ සත්තු සදෙන සිය සිය ගොදුරුබිම් හා වෙසෙන තැන් කරා අදනාහ.

තුඹසට පිවිසෙන්නෙමි යි නයා අදනේ ය. දියට පිවිසෙන්-නෙමි යි කිඹුලා අදනේ ය. අහසට නගින්නෙමි යි පක්ෂියා අදනේ ය. ගමට පිවිසෙන්නෙමි යි ශුනකයා අදනේ ය. සොහොනට පිවිසෙන්නෙමි යි සිවලා අදනේ ය. වනයට පිවිසෙන්නෙමි යි වඳුරා අදනේ ය. මහණෙනි, යම් කලෙක ඒ සත්තු සදෙන වෙහෙසට පත් වූවෝ ක්ලාන්ත වූවෝ වන්නාහු ද, එකල්හි ඔවුනතුරෙන් යමෙක් ඉතා බලවත් වන්නේ නම් ඔහු ඔහුට අනුව පවත්නාහු ය. අනුව යන්නාහු ය. වසයට පැමිණෙන්නාහු ය.

මහණෙනි, එසෙයින් ම යම්කිසි මහණකු විසින් කාගියාසිහිය නො වඩනා ලද නම් පුනපුනා නොවඩනා ලද නම් ඇස ඔහු මනවඩනා රූහි අදියි. නො මනවඩනා රූ ඔහුට පිළිකුල් වේ. කන මනවඩනා සදෙහි අදී. නො මනවඩනා සද ඔහුට පිළිකුල් වේ. නැහැය මනවඩනා ගඳෙහි අදී. නො මනවඩනා ගඳ ඔහුට පිළිකුල් වේ. දිව මනවඩනා රසෙහි අදී. නො මනවඩනා රස ඔහුට පිළිකුල් වේ. කය මනවඩනා පහස්හි අදී. නො මනවඩනා පහස් ඔහුට පිළිකුල් වේ. සිත මනවඩනා දහම්හි අදියි. නො මනවඩනා දහම් ඔහුට පිළිකුල් වේ. මහණෙනි, මෙසේ අසංවර වේ.

මහණෙනි, කෙසේ නම් සංවර වේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ තෙමේ ඇසින් රූ දැක ප්‍රියස්වරූප වූ රූපයෙහි නො ඇලෙයි. ප්‍රියස්වරූප නො වූ රූපයෙහි නො කිපෙයි. එළඹසිටි කාගියා සිහි ඇත්තේත් නො පමණ සිත් ඇත්තේත් වෙසෙයි. ඔහුට උපන් ලාමක අකුසල් දහම්හු යම් තැනෙක නිරවශෙෂයෙන් නිරුද්ධ වෙත් නම් ඒ චලසමාධියත් චලප්‍රඥාවත් තතුසේ දනී.

සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය පියරූපෙ ධම්මෙ නාධිමුච්චති, අප්පියරූපෙ ධම්මෙ න ව්‍යාපජ්ජති, උපට්ඨිතකායසති ච විහරති අප්පමාණචෙතසො තඤ්ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං පජානාති යත්ථස්ස තෙ උප්පන්නා පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති.

සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො ඡප්පාණකෙ ගහෙත්වා නානා විසයෙ නානා ගොචරෙ දළ්හාය රජ්ජුයා බන්ධෙය්‍ය, අහිං ගහෙත්වා දළ්හාය රජ්ජුයා බන්ධෙය්‍ය සුංසුමාරං ගහෙත්වා -පෙ- පක්ඛිං ගහෙත්වා -පෙ- කුක්කුරං ගහෙත්වා -පෙ- සිගාලං ගහෙත්වා -පෙ- මක්කටං ගහෙත්වා දළ්හාය රජ්ජුයා බන්ධෙය්‍ය, දළ්හාය රජ්ජුයා බන්ධිත්වා දළ්හෙ ඛීලෙ වා ථම්භෙ වා උපනිබන්ධෙය්‍ය.

අථ ඛො තෙ භික්ඛවෙ ඡප්පාණකා නානා විසයා නානා ගොචරා සකං සකං ගොචරවිසයං ආවිඤ්ඡෙය්‍යුං; අහි ආවිඤ්ඡෙය්‍ය වම්මිකං පවෙක්ඛාමීති, සුංසුමාරො ආවිඤ්ඡෙය්‍ය උදකං පවෙක්ඛාමීති, පක්ඛී ආවිඤ්ඡෙය්‍ය ආකාසං ඩෙස්සාමීති, කුක්කුරො ආවිඤ්ඡෙය්‍ය ගාමං පවෙක්ඛාමීති සිගාලො ආවිඤ්ඡෙය්‍ය සීවථිකං පවෙක්ඛාමීති. මක්කටො ආවිඤ්ඡෙය්‍ය වනං පවෙක්ඛාමීති. යදා ඛො පන තෙ භික්ඛවෙ ඡප්පාණකා ඣත්තා අස්සු කිලන්තා, අථ තමෙව ඛීලං වා ථම්භං වා උපතිට්ඨෙය්‍යුං, උපනිසීදෙය්‍යුං, උපනිපජ්ජෙය්‍යුං, වසං ගච්ඡෙය්‍යුං.

එවමෙව ඛො භික්ඛවෙ යස්ස කස්සචි භික්ඛුනො කායගතාසති භාවිතා බහුලීකතා තං චක්ඛු නාවිඤ්ඡති මනාපිකෙසු රූපෙසු, අමනාපිකස්ස රූපානි නප්පටිකකූලානි හොන්ති; සොතං නාවිඤ්ඡති -පෙ- ඝානං නාවිඤ්ඡති -පෙ- ජිව්හා නාවිඤ්ඡති -පෙ- කායො නාවිඤ්ඡති -පෙ- මනො නාවිඤ්ඡති මනාපිකෙසු ධම්මෙසු, අමනාපිස්ස ධම්මා නප්පටිකකූලා හොන්ති. එවං ඛො භික්ඛවෙ සංවරො හොති.

දළ්හෙ ඛීලෙ වා ථම්භෙ වා. ති ඛො භික්ඛවෙ කායගතා සතියා එතං අධිවචනං, තස්මාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං: "කායගතා නො සති භාවිතා භවිස්සති බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා"ති, එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.

කනින් සද අසා ... නැහැයෙන් ගඳ ගෙන ... දිවෙන් රස විඳ ...කයින් පහස් පැහැස සිතින් දහම් දැන ප්‍රියස්වරූප වූ දහම්හි නො ඇලෙයි. ප්‍රියස්වරූප නො වූ දහම්හි නො කිපෙයි. එළඹ සිටි කායියා සිහි ඇත්තේත් නො පමණ සිත් ඇත්තේත් වෙසෙයි. ඔහුට උපන් ලාමක අකුසල් දහම්හු යම් තැනෙක නිරවශේෂයෙන් නිරුද්ධ වෙත් නම් ඒ චිත්ත සමාධියත් ප්‍රඥාවත් තතුසේ දනී.

මහණෙනි, යම්සේ පුරුෂයෙක් වෙනස් වෙනස් තැන්හි වෙසෙන වෙනස් වෙනස් ගොදුරු ගන්නා සතුන් සදෙනකුන් ගෙන දැඩි රැහැනින් බඳනේ ද, නයකු ගෙන දැඩි රැහැනින් බඳනේ ය. කිඹුලකු ගෙන ... පක්ෂියකු ගෙන ... ශුනකයකු ගෙන ... සිවලකු ගෙන ... වඳුරකු ගෙන දැඩි රැහැනින් බඳනේ ය. දැඩිරැහැනින් බැඳ දැඩි හුලක හෝ ටැඹෙක හෝ බැඳ තබන්නේ ය.

මහණෙනි, එකල්හි වෙනස් වෙනස් තැන්හි වෙසෙන වෙනස් වෙනස් ගොදුරු ගන්නා ඒ සත්තු සදෙන සිය සිය ගොදුරුබිම් හා වෙසෙන තැන් කරා අදනාහු ය. තුඹසට පිවිසෙන්නෙමි යි නයා අදනේ ය. දියට පිවිසෙන්නෙමි යි කිඹුලා අදනේ ය. අහසට නගින්නෙමි යි පක්ෂියා අදනේ ය. ගමට පිවිසෙන්නෙමි යි ශුනකයා අදනේ ය, සොහොනට පිවිසෙන්නෙමි යි සිවලා අදනේ ය. වනයට පිවිසෙන්නෙමි යි වඳුරා අදනේ ය. මහණෙනි, යම් කලෙක ඒ සත්තු සදෙන වෙහෙසට පත් වූවෝ ක්ලාන්ත වූවෝ වන්නාහු ද එකල්හි ඒ උල ම හෝ ටැඹ ම වෙත සිටිනාහ, හිඳිනාහ, හෝනාහ, වසයට යන්නාහ.

මහණෙනි, එසෙයින් ම යම්කිසි මහණකු විසින් කායියා සිහිය වඩන ලද්දේ පුනපුනා වඩන ලද්දේ වේ නම් ඇස ඔහු මනවඩන රූහි නො අදී. නො මනවඩනා රූ ඔහුට පිළිකුල් නො වේ. කන නො අදී ... නැහැය නො අදී ... දිව නො අදී ... කය නො අදී ... සිත මනවඩනා දහම්හි නො අදී. නො මනවඩනා දහම් ඔහුට පිළිකුල් නො වේ. මහණෙනි, මෙසේ සංවර වේ.

මහණෙනි, දැඩි හුලෙහි හෝ ටැඹෙහි හෝ යනු කායියා සිහියට මේ නමෙකි. මහණෙනි, එහෙයින් මෙහි ලා මෙසේ හික්මිය යුතු යි: ''අප විසින් කායියා සිහිය වඩන ලද්දේ පුනපුනා වඩන ලද්දේ යානාවක් මෙන් කරන ලද්දේ වාස්තුවක් මෙන් කරන ලද්දේ එළඹසිටියක් කරන ලද්දේ පුරුදු කරන ලද්දේ මැනවින් අරඹන ලද්දේ වන්නේ ය'' යි. මහණෙනි තොප විසින් මෙසේ ම හික්මිය යුතු යි.

## 1. 19. 11

## යවකලාපිසුත්තං

සෙය්‍යථාපි භික්ඛවෙ යවකලාපී චාතුම්මහාපථෙ නික්ඛිත්තා අස්ස, අථ ඡ පුරිසා ආගච්ඡෙය්‍යුං ව්‍යාභඞ්ගිහත්ථා, තෙ තං යවකලාපිං ඡහි ව්‍යාභඞ්ගීහි හනෙය්‍යුං, එවං හි සා භික්ඛවෙ යවකලාපී සුහතා අස්ස ඡහි ව්‍යාභඞ්ගීහි හඤ්ඤමානා, අථ සත්තමො පුරිසො ආගච්ඡෙය්‍ය ව්‍යාභඞ්ගිහත්ථො, සො තං යවකලාපිං සත්තමාය ව්‍යාභඞ්ගියා හනෙය්‍ය, එවං හි සා භික්ඛවෙ යවකලාපි සුහතතරා අස්ස සත්තමාය ව්‍යාභඞ්ගියා හඤ්ඤමානා.

එවමෙව ඛො භික්ඛවෙ අස්සුතවා පුථුජ්ජනො චක්ඛුස්මිං හඤ්ඤති මනාපාමනාපෙහි රූපෙහි, සොතස්මිං හඤ්ඤති මනාපාමනාපෙහි සද්දෙහි, ඝානස්මිං හඤ්ඤති මනාපාමනාපෙහි ගන්ධෙහි, ජිව්හාය හඤ්ඤති මනාපාමනාපෙහි රසෙහි, කායස්මිං හඤ්ඤති මනාපාමනාපෙහි ඵොට්ඨබ්බෙහි, මනස්මිං හඤ්ඤති මනාපාමනාපෙහි ධම්මෙහි,

සචෙ සො භික්ඛවෙ අස්සුතවා පුථුජ්ජනො ආයතිං පුනබ්භවාය චෙතෙති එවං හි සො භික්ඛවෙ මොඝපුරිසො සුහතතරො හොති, සෙය්‍යථාපි භික්ඛවෙ සා යවකලාපී සත්තමාය ව්‍යාභඞ්ගියා හඤ්ඤමානා,

භූතපුබ්බං භික්ඛවෙ, දෙවාසුරසඞ්ගාමො සමුපබ්බූළ්හො අහොසි, අථ ඛො භික්ඛවෙ වෙපචිත්ති අසුරින්දො අසුරෙ ආමන්තෙසි: ''සචෙ මාරිසා, දෙවාසුරසඞ්ගාමෙ සමුපබ්බූළ්හෙ, අසුරා ජිනෙය්‍යුං දෙවා පරාජිනෙය්‍යුං, යෙන නං[1] සක්කං දෙවානමින්දං කණ්ඨපඤ්චමෙහි බන්ධනෙහි බන්ධිත්වා මම සන්තිකෙ ආනෙය්‍යාථ අසුරපුරන්ති'', සක්කොපි ඛො භික්ඛවෙ දෙවානමින්දො දෙවෙ තාවතිංසෙ ආමන්තෙසි: ''සචෙ මාරිසා දෙවාසුරසඞ්ගාමෙ සමුපබ්බූළ්හෙ දෙවා ජිනෙය්‍යුං අසුරා පරාජිනෙය්‍යුං යෙන නං වෙපචිත්තිං[2] අසුරින්දං කණ්ඨපඤ්චමෙහි බන්ධනෙහි බන්ධිත්වා මම සන්තිකෙ ආනෙය්‍යාථ සුධම්ම දෙවසභන්ති''[3]. තස්මිං ඛො පන භික්ඛවෙ සඞ්ගාමෙ දෙවා ජිනිංසු අසුරා පරාජිනිංසු, අථ ඛො භික්ඛවෙ දෙවා තාවතිංසා වෙපචිත්තිං අසුරින්දං කණ්ඨපඤ්චමෙහි බන්ධනෙහි බන්ධිත්වා සක්කස්ස දෙවානමින්දස්ස සන්තිකෙ ආනෙසුං සුධම්මං දෙවසභං. තත්‍ර සුදං භික්ඛවෙ වෙපචිත්ති අසුරින්දො කණ්ඨපඤ්චමෙහි බන්ධනෙහි බද්ධො[4] හොති යද ඛො භික්ඛවෙ වෙපචිත්තිස්ස අසුරින්දස්ස එවං හොති; ''ධම්මිකා ඛො දෙවා අධම්මිකා අසුරා, ඉධෙවදානාහං[5] දෙවපුරං[6] ගච්ඡාමී''ති. අථ කණ්ඨපඤ්චමෙහි බන්ධනෙහි මුත්තං අත්තානං සමනුපස්සති. දිබ්බෙහි පඤ්චකාමගුණෙහි සමප්පිතො සමඞ්ගීභූතො පරිචාරෙති.

1. නං – සී 1, 2.
2. වෙපචිත්ති – සී 1, 2
3. සුධම්මං සභං – සී 1, 2.
4. බන්ධො – සී 1, 2, ස්‍යා.
5. ඉදනාහං – ස්‍යා.
6. දෙවපුරෙ – සී 1.

# 1. 19. 11

## යවකලාපි සූත්‍රය

248. මහණෙනි, යම්සේ යවමිටියක් සිවුමංසලක දමන ලද්දේ වන්නේ ද එකල්හි පුරුෂයෝ සදෙනෙක් කත්ලී ගත් අත් ඇති ව පැමිණෙන්නාහ. ඔහු ඒ යවමිටිය කත්ලී සයෙන් තළන්නාහ. මහණෙනි, මෙසේ ඒ යවමිටිය කත්ලී සයෙන් තළනු ලබන්නේ මැනවින් තළන ලද්දේ වන්නේ ය. එකල්හි කත්ලියක් ගත් අත් ඇති සත්වන පුරුෂයෙක් එන්නේ ය. හෙතෙමේ ඒ යවමිටිය සත්වන කත්ලියෙන් තළන්නේ ය. මහණෙනි, මෙසේ ඒ යවමිටිය සත්වන කත්ලියෙන් තළනු ලබන්නේ අතිශයින් ම මැනවින් තළන ලද්දේ වන්නේ ය.

මහණෙනි, එසෙයින් ම අශ්‍රුතවත් පුහුදුන් තෙමේ මනවඩන නො වඩන රූ විසින් ඇසෙහි පෙළේ. මනවඩන නො වඩන සද විසින් කනෙහි පෙළේ. මනවඩන නො වඩන ගඳ විසින් නැහැයෙහි පෙළේ. මනවඩන නො වඩන රස විසින් දිවෙහි පෙළේ. මනවඩන නො වඩන පහස් විසින් කයෙහි පෙළේ. මනවඩන නො වඩන දහම් විසින් සිතෙහි පෙළේ.

මහණෙනි, ඉදින් ඒ අශ්‍රුතවත් පුහුදුන් තෙමේ මතු පුනර්භවය පිණිස සිතා නම් මහණෙනි, මෙසේ ඒ හිස් පුරුෂ තෙමේ අතිශයින් ම මැනවින් පෙළන ලද්දේ වේ. මහණෙනි, ඒ යවමිටිය සත්වන කත්ලියෙන් තළනු ලබන්නේ යම්සේ නම් එමෙනි.

මහණෙනි, පෙර වූවක් කියමි. දෙවියන් හා අසුරයන්ගේ යුද්ධයෙක් එළඹසිටියේ විය. මහණෙනි, එකල්හි වේපචිත්ති අසුර රජ අසුරයන් ඇමතී ය: "නිදුකාණෙනි, දෙවියන් හා අසුරයන් අතර යුද්ධයක් එළඹ සිටි කල්හි ඉදින් අසුරයෝ දිනන්නාහු නම් දෙවියෝ පරදින්නාහු නම් ඒ සක්දෙව් රජ ගෙලපස්වන කොට ඇති බැඳුමෙන් බැඳ අසුරපුරයෙහි මා වෙත ගෙන එන්නාහු ය"යි. මහණෙනි, සක්දෙව්රජ ද තව්තිසා දෙවියන් ඇමතී ය: "නිදුකාණෙනි, දෙවියන් හා අසුරයන් අතර යුද්ධයක් එළඹ සිටි කල්හි ඉදින් දෙවියෝ දිනන්නාහු නම් අසුරයෝ පරදින්නාහු නම් ඒ වේපචිත්ති අසුර රජ ගෙලපස්වන කොට ඇති බැඳුමෙන් බැඳ සුදම්දෙව්සෙබෙහි මා වෙත ගෙන එන්නහු ය" යි. මහණෙනි, ඒ යුද්ධයෙහි දී දෙවියෝ දිනූහ. අසුරයෝ පැරදුනහ. මහණෙනි, එකල්හි තව්තිසා වැසි දෙවියෝ වේපචිත්ති අසුර රජ ගෙලපස්වන කොට ඇති බැඳුමෙන් බැඳ සුදම් දෙව්සෙබෙහි සක්දෙව් රජු වෙත ගෙන ආහ. මහණෙනි, එහි වෙපචිත්ති අසුර රජ ගෙලපස්වන කොට ඇති බැඳුමෙන් බඳනා ලද්දේ වෙයි. මහණෙනි, යම්කලෙක වෙපචිත්ති අසුර රජහට "දෙවියෝ දැහැමියහ. අසුරයෝ නො දැහැමියහ. මම දැන් මෙහි දී ම දෙව්පුරයට යෙමි" යි මෙබඳු සිතෙක් වේ ද, එකල්හි ගෙලපස්වන කොට ඇති බැඳුමෙන් මිදුණු තමා දකී. දෙව්මුවා වූ පස්කම් ගුණයෙන් පිණාගියේ යුතු වූයේ ඉඳුරන් පිණවයි.

යදා ච ඛො භික්ඛවෙ වෙපචිත්තිස්ස අසුරින්දස්ස එවං හොති: ධම්මිකා ඛො අසුරා, අධම්මිකා දෙවා, තත්ථෙව දනාහං අසුරපුරං ගමිස්සාමීති, අථ කණ්ඨපඤ්චමෙහි බන්ධනෙහි බද්ධං[1] අත්තානං සමනුපස්සති; දිබ්බෙහි පඤ්චකාමගුණෙහි පරිහායති, එවං සුඛුමං ඛො භික්ඛවෙ වෙපචිත්තිබන්ධනං, තතො සුඛුමතරං මාරබන්ධනං, මඤ්ඤමානො භික්ඛවෙ බද්ධො[2] මාරස්ස, අමඤ්ඤමානො මුත්තො පාපිමතො.

අස්මීති භික්ඛවෙ මඤ්ඤිතමෙතං, අයමහමස්මීති මඤ්ඤිතමෙතං, භවිස්සන්ති මඤ්ඤිතමෙතං, න භවිස්සන්ති මඤ්ඤිතමෙතං, රූපී භවිස්සන්ති මඤ්ඤිතමෙතං, අරූපී භවිස්සන්ති මඤ්ඤිතමෙතං, සඤ්ඤී භවිස්සන්ති මඤ්ඤිතමෙතං, අසඤ්ඤී භවිස්සන්ති මඤ්ඤිතමෙතං, නෙවසඤ්ඤීනාසඤ්ඤී භවිස්සන්ති මඤ්ඤිතමෙතං; මඤ්ඤිතං භික්ඛවෙ රොගො, මඤ්ඤිතං ගණ්ඩො, මඤ්ඤිතං සල්ලං, තස්මාතිහ භික්ඛවෙ අමඤ්ඤමානෙන චෙතසා විහරිස්සාමාති, එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බං.

අස්මීති භික්ඛවෙ ඉඤ්ජිතමෙතං, අයමහමස්මීති ඉඤ්ජිතමෙතං භවිස්සන්ති ඉඤ්ජිතමෙතං, න භවිස්සන්ති ඉඤ්ජිතමෙතං රූපී භවිස්සන්ති ඉඤ්ජිතමෙතං, අරූපී භවිස්සන්ති ඉඤ්ජිතමෙතං, සඤ්ඤී භවිස්සන්ති ඉඤ්ජිතමෙතං, අසඤ්ඤී භවිස්සන්ති ඉඤ්ජිතමෙතං, නෙවසඤ්ඤීනාසඤ්ඤී භවිස්සන්ති ඉඤ්ජිතමෙතං, ඉඤ්ජිතං භික්ඛවෙ රොගො, ඉඤ්ජිතං ගණ්ඩො, ඉඤ්ජිතං සල්ලං තස්මාතිහ භික්ඛවෙ අනිඤ්ජමානෙන චෙතසා විහරිස්සාමාති, එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බං.

අස්මීති භික්ඛවෙ ඵන්දිතමෙතං, අයමහමස්මීති ඵන්දිතමෙතං, භවිස්සන්ති ඵන්දිතමෙතං, න භවිස්සන්ති ඵන්දිතමෙතං, රූපී භවිස්සන්ති ඵන්දිතමෙතං, අරූපී භවිස්සන්ති ඵන්දිතමෙතං, සඤ්ඤී භවිස්සන්ති ඵන්දිතමෙතං, අසඤ්ඤී භවිස්සන්ති ඵන්දිතමෙතං, නෙවසඤ්ඤීනාසඤ්ඤී භවිස්සන්ති ඵන්දිතමෙතං; ඵන්දිතං භික්ඛවෙ රොගො, ඵන්දිතං ගණ්ඩො, ඵන්දිතං සල්ලං. තස්මාතිහ භික්ඛවෙ අඵන්දමානෙන චෙතසා විහරිස්සාමාති එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බං.

---

1. බන්ධං - සී 1, 2 ස්‍යා.
1. බන්ධො - ස්‍යා.

මහණෙනි, යම්කලෙක වේපචිත්ති අසුර රජහට ''අසුරයෝ දැහැමියහ, දෙවියෝ නො දැහැමියහ, දැන් මම එහි ම අසුරපුරයට යන්නෙමි''යි මෙබඳු සිතෙක් වේ ද එකල්හි ගෙලපස්වන කොට ඇති බැඳුමෙන් බඳනා ලද තමා දකී. දෙව්මුවා පස්කම් ගුණෙන් පිරිහෙයි. මහණෙනි, වේපචිත්ති බැඳුම මෙසේ සියුම් ය. මරබැඳුම එයින් අතිශයින් සියුම් ය. මහණෙනි, (තෘෂ්ණා දෘෂ්ටි මාන වශයෙන්) හඟනේ මරු විසින් බඳනා ලද්දේ ය. නො හඟනේ මරුගෙන් මිදුණේ ය.

මහණෙනි, 'වෙමි' යි යන මෙය මඤ්ඤනාවෙකි. 'මේ මම වෙමි' යි යන මෙය මඤ්ඤනාවෙකි. 'වන්නෙමි' යි යන මෙය මඤ්ඤනාවෙකි. 'නොවන්නෙමි' යි යන මෙය මඤ්ඤනාවෙකි. 'රූප ඇත්තෙක් වන්නෙමි' යි යන මෙය මඤ්ඤනාවෙකි. 'රූප නැත්තෙක් වන්නෙමි' යි යන මෙය මඤ්ඤනාවෙකි. 'සංඥා ඇත්තෙක් වන්නෙමි' යි යන මෙය මඤ්ඤනාවෙකි. 'සංඥා නැත්තෙක් වන්නෙමි' යි යන මෙය මඤ්ඤනාවෙකි. 'නො ම සංඥා ඇත්තෙකුත් සංඥා නැත්තෙකුත් වන්නෙමි' යි යන මෙය මඤ්ඤනාවෙකි. මහණෙනි, මඤ්ඤනාව රෝගයෙකි. මඤ්ඤනාව ගඬෙකි. මඤ්ඤනාව හුලෙකි. මහණෙනි, එහෙයින් මෙහි ලා මඤ්ඤනා රහිත සිතින් යුතු ව වෙසෙන්නෙමු යි මහණෙනි, මෙසේ ම තොප විසින් හික්මිය යුතු යි.

මහණෙනි, 'වෙමි' යි යන මෙය ඉඤ්ජිත (කම්පන) යෙකි. 'මේ මම වෙමි' යි යන මෙය ඉඤ්ජිතයෙකි. 'වන්නෙමි' යන මෙය ඉඤ්ජිතයෙකි. 'නො වන්නෙමි' යන මෙය ඉඤ්ජිතයෙකි. 'රූප ඇත්තෙක් වන්නෙමි' යන මෙය ඉඤ්ජිතයෙකි. 'රූප නැත්තෙක් වන්නෙමි' යන මෙය ඉඤ්ජිතයෙකි. සංඥා ඇත්තෙක් වන්නෙමි' යන මෙය ඉඤ්ජිතයෙකි. 'සංඥා නැත්තෙක් වන්නෙමි' යන මෙය ඉඤ්ජිතයෙකි. නො මැ සංඥා ඇත්තෙකුත් සංඥා නැත්තෙකුත් වන්නෙමි' යන මෙය ඉඤ්ජිතයෙකි. මහණෙනි, ඉඤ්ජිතය රෝගයෙකි. ඉඤ්ජිතය ගඬෙකි. ඉඤ්ජිතය හුලෙකි. මහණෙනි, එහෙයින් මෙහි ලා ඉඤ්ජිතය රහිත සිතින් යුතු ව වෙසෙන්නෙමු යි, මහණෙනි, මෙසේ ම තොප විසින් හික්මිය යුතු යි.

මහණෙනි, 'වෙමි' යි යන මෙය ඵන්දිතයෙ (සැලීමෙ) කි. 'මේ මම වෙමි' යන මෙය ඵන්දිතයෙකි. 'වන්නෙමි' යන මෙය ඵන්දිතයෙකි. 'නො වන්නෙමි' යන මෙය ඵන්දිතයෙකි. 'රූ ඇත්තෙක් වන්නෙමි' යන මෙය ඵන්දිතයෙකි. 'රූ නැත්තෙක් වන්නෙමි' යන මෙය ඵන්දිතයෙකි. 'සංඥා ඇත්තෙක් වන්නෙමි' යන මෙය ඵන්දිතයෙකි. 'සංඥා නැත්තෙක් වන්නෙමි' යන මෙය ඵන්දිතයෙකි. 'නො ම සංඥා ඇත්තෙකුත් සංඥා නැත්තෙකුත් වන්නෙමි' යන මෙ ඵන්දිතයෙකි. මහණෙනි, ඵන්දිතය ලෙඩකි. ඵන්දිතය ගඬෙකි. ඵන්දිතය හුලෙකි. මහණෙනි, එහෙයින් මෙහි ලා නො සැලෙන සිතින් යුතු ව වෙසෙන්නෙමු යි මහණෙනි, තොප විසින් මෙසේ මැ හික්මිය යුතු යි.

අස්මීති[1] භික්ඛවෙ පපඤ්චිතමෙතං, අයමහමස්මීති පපඤ්චිතමෙතං, භවිස්සන්ති පපඤ්චිතමෙතං, න භවිස්සන්ති පපඤ්චිතමෙතං, රූපී භවිස්සන්ති පපඤ්චිතමෙතං, අරූපී භවිස්සන්ති පපඤ්චිතමෙතං, සඤ්ඤී භවිස්සන්ති පපඤ්චිතමෙතං, අසඤ්ඤී භවිස්සන්ති පපඤ්චිතමෙතං, නෙවසඤ්ඤීනාසඤ්ඤී භවිස්සන්ති පපඤ්චිතමෙතං. පපඤ්චිතං භික්ඛවෙ රොගො, පපඤ්චිතං ගණ්ඩො, පපඤ්චිතං සල්ලං. තස්මාතිහ භික්ඛවෙ නිප්පපඤ්චාරාමෙන චෙතසා විහරිස්සාමාති, එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බං,

අස්මීති[1] භික්ඛවෙ මානගතමෙතං, අයමහමස්මීති මානගතමෙතං, භවිස්සන්ති මානගතමෙතං, න භවිස්සන්ති මානගතමෙතං, රූපී භවිස්සන්ති මානගතමෙතං, අරූපී භවිස්සන්ති මානගතමෙතං, සඤ්ඤී භවිස්සන්ති මානගතමෙතං, අසඤ්ඤී භවිස්සන්ති මානගතමෙතං, නෙවසඤ්ඤී නාසඤ්ඤී භවිස්සන්ති මානගතමෙතං, මානගතමෙතං භික්ඛවෙ රොගො, මානගතමෙතං ගණ්ඩො, මානගතමෙතං සල්ලං, තස්මාතිහ භික්ඛවෙ නිහතමානෙන චෙතසා විහරිස්සාමාති එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.

ආසීවිසවග්ගො එකූනවීසතිමො.

තත්‍රුද්දානං:

ආසිවිසො රථො කුම්මො දෙව දාරුක්ඛන්ධෙන අවස්සුතා
දුක්ඛධම්මො කිංසුකා වීණා ඡප්පාණකා[2] යවකලාපෙන චාති

චතුත්ථො පණ්ණාසකො.

තත්‍ර වග්ගුද්දානං:

නන්දික්ඛයා සට්ඨිනයා සමුද්දෙ උරගෙන ච
චතුත්ථපණ්ණාසකා එතෙ නිපාතෙසු පකාසිතාති.

---

1. අස්මීතිහ - සී 1, 2.
2. වීණා ඡප්පාණක. - සී
3. ඉදං පොත්ථකෙසු න දිස්සතෙ

මහණෙනි, 'වෙමි' යි යන මෙය පපඤ්චිතයෙ (පමාවෙ) කි. 'මේ මම වෙමි' යන මෙය පපඤ්චිතයෙකි. 'වන්නෙමි' යන මෙය පපඤ්චිතයෙකි. ''නො වන්නෙමි'' යන මෙය පපඤ්චිතයෙකි. 'රූ ඇත්තෙක් වන්නෙමි' යන මෙය පපඤ්චිතයෙකි. 'රූ නැත්තෙක් වන්නෙමි' යන මෙය පපඤ්චිතයෙකි. 'සංඥා ඇත්තෙක් වන්නෙමි' යන මෙය පපඤ්චිතයෙකි. 'සංඥා නැත්තෙක් වන්නෙමි' යන මෙය පපඤ්චිතයෙකි, 'නො මැ සංඥා ඇත්තෙකුත් සංඥා නැත්තෙකුත් වන්නෙමි'' යන මෙය පපඤ්චිතයෙකි. මහණෙනි, පපඤ්චිතය ලෙඩකි. පපඤ්චිතය ගඩෙකි. පපඤ්චිතය හුලෙකි. මහණෙනි, එහෙයින් මෙහි ලා නො පමාවෙහි ඇලුණු සිතින් යුතු ව වසන්නෙමු යි. මහණෙනි, තොප විසින් මෙසේ ම හික්මිය යුතු යි.

මහණෙනි, 'වෙමි' යි යන මෙය මානයෙකි. 'මේ මම වෙමි' යන මෙය මානයෙකි. 'වන්නෙමි' යි යන මෙය මානයෙකි. 'නොවන්නෙමි' යන මෙය මානයෙකි. 'රූ ඇත්තෙක් වන්නෙමි' යන මෙය මානයෙකි. 'රූ නැත්තෙක් වන්නෙමි' යි යන මෙය මානයෙකි. ''සංඥා ඇත්තෙක් වන්නෙමි'' යන මෙය මානයෙකි. 'සංඥා නැත්තෙක් වන්නෙමි' යන මෙය මානයෙකි. 'නො ම සංඥා ඇත්තෙකුත් සංඥා නැත්තෙකුත් වන්නෙමි' යන මෙය මානයෙකි. මහණෙනි, මේ මානය ලෙඩකි. තෙල මානය ගඩෙකි. මේ මානය හුලෙකි. මහණෙනි, එහෙයින් මෙහි ලා පහ වූ මාන ඇති සිතින් යුතු ව වසන්නෙමු යි. මහණෙනි, තොප විසින් මෙසේ ම හික්මිය යුතු යි.

**ආසිවිස වර්ගය නවවැනියි**

**එහි සූත්‍රනාමාවලිය:**

ආසිවිසෝපම ය, රථූපමය, කුම්මොපමය, දරුක්ඛන්ධොපම සූත්‍ර දෙක ය, අවස්සුතපරියාය ය, දුක්ඛධම්ම ය, කිංසුකොපම ය, වීණොපම ය, ඡප්පාණක ය යවකලාපි සූත්‍රය ද යන මෙයින් වර්ගය වේ.

## සිවුවැනි පණ්ණාසකය නිමියේය.

එහි වර්ගනාමාවලිය:

නන්දික්ඛය ය, සට්ඨිනය ය, සමුද්දය, ආසිවිස වර්ගයෙන් ද යි මොහු නිපාතයන්හි චතුත්‍ථපණ්ණාසකයෙහි වර්ගයෝ යයි ප්‍රකාශ කරන ලදහ.

# 1. සගාථාවග්ගො

## 1. 20. 1

### සමාධිසුත්තං

249. තිස්සො ඉමා භික්ඛවෙ වෙදනා, කතමා තිස්සො: සුඛා වෙදනා දුක්ඛා වෙදනා අදුක්ඛමසුඛා වෙදනා. ඉමා ඛො භික්ඛවෙ තිස්සො වෙදනාති.

සමාහිතො සම්පජානො සතො බුද්ධස්ස සාවකො
වෙදනා ච පජානාති වෙදනානඤ්ච සම්භවං
යත්ථ චෙතා නිරුජ්ඣන්ති මග්ගඤ්ච ඛයගාමිනං
වෙදනානං ඛයා භික්ඛු නිච්ඡාතො පරිනිබ්බුතො ති.

## 1. 20. 2

### සුඛසුත්තං

250. තිස්සො ඉමා භික්ඛවෙ වෙදනා, කතමා තිස්සො: සුඛා වෙදනා දුක්ඛා වෙදනා අදුක්ඛමසුඛා වෙදනා; ඉමා ඛො භික්ඛවෙ තිස්සො වෙදනාති.

සුඛං වා යදි වා දුක්ඛං අදුක්ඛමසුඛං සහ
අජ්ඣත්තඤ්ච බහිද්ධා ච යං කිඤ්චි අත්ථි වෙදිතං
එතං දුක්ඛන්ති ඤත්වාන මොසධම්මං පලොකිතං[1]
ඵුස්ස ඵුස්ස වයම්පස්සං[2] එවං තත්ථ විරජ්ජතී ති.

## 1. 20. 3

### පහානසුත්තං

251. තිස්සො ඉමා භික්ඛවෙ වෙදනා. කතමා තිස්සො: සුඛා වෙදනා දුක්ඛා වෙදනා අදුක්ඛමසුඛාවෙදනා. සුඛාය භික්ඛවෙ වෙදනාය රාගානුසයො පහාතබ්බො, දුක්ඛාය වෙදනාය පටිඝානුසයො පහාතබ්බො, අදුක්ඛමසුඛාය, වෙදනාය අවිජ්ජානුසයො පහාතබ්බො. යතො ඛො භික්ඛවෙ භික්ඛුනො සුඛාය වෙදනාය රාගානුසයො පහීනො හොති දුක්ඛාය වෙදනාය පටිඝානුසයො පහීනො හොති, අදුක්ඛමසුඛාය වෙදනාය අවිජ්ජානුසයො පහීනො හොති, අයං වුච්චති භික්ඛවෙ භික්ඛු[3] පහීනරාගානුසයො[4] අච්ඡෙච්ඡි තණ්හං, වාවත්තයී[5] සඤ්ඤොජනං සම්මාමානාභිසමයා අන්තමකාසි දුක්ඛස්සාති.

---

1. පලොකින- මජසං, අට්ඨකථා
2. වයං ඵුසං - සයා, අට්ඨකථා
   එස්සං - සී 1. 2.
3. භික්ඛුනො - සී 1. 2.
4. නිරනුසයො සම්මද්දසො - මජසං.
   නිරාගානුසයො - සයා.
5. විවත්තයී - සයා,

# 1. සගාථා වර්ගය

## 1. 20. 1

## සමාධි සූත්‍රය

249. මහණෙනි, මේ වේදනා තුනෙකි. කවර තුනෙක් ද යත්: සුව වේදනා ය, දුක් වේදනා ය, නොදුක්නොසුව වේදනා යි. මහණෙනි, මේ වේදනා තුන යි.

සමාධිගත වූ මනා නුවණැති බුද්ධශ්‍රාවක තෙමේ වේදනාවත් දනී. වේදනාවන්ගේ සමුදයයත් දනී.

මේ වේදනාවෝ යම් තැනෙක නිරුද්ධ වෙත් ද ඒ නිවනත් ඒ වේදනා නැසීමට යන මගත් (දනී) මහණ තෙමේ වේදනාවන් ක්ෂය වීමෙන් තෘෂ්ණා නැත්තේ පිරිනිවියේ යි.

## 1. 20. 2

## සුඛ සූත්‍රය

250. මහණෙනි, මේ වේදනා තුනෙකි. කවර තුනෙක් ද යත්: සුව වේදනා ය, දුක් වේදනා ය, නොදුක්නොසුව වේදනා යි. මහණෙනි, මේ වේදනා තුන යි.

සුව වූ ද ඉදින් දුක් වූ ද නොදුක්නොසුව වූ ද තමා කෙරෙහි වූ ද පිටත්හි වූ ද, යම්කිසි වේදනාවක් වේ නම්

නැසෙන සුලු බිඳෙන සුලු මෙය දුක යයි දැන නුවණින් පැහැස පැහැස වැය දක්නේ මෙසේ එහි නො ඇලේ යි.

## 1: 20. 3

## පහාන සූත්‍රය

251. මහණෙනි, මේ වේදනා තුනෙකි. කවර තුනෙක් ද යත්: සුව වේදනා ය, දුක් වේදනා ය, නොදුක්නොසුව වේදනා යි. මහණෙනි, සුවවේදනාවෙන් රාගානුසයය පහකටයුතු ය. දුක්වේදනාවෙන් පටිඝානුසයය පහකටයුතු ය. නොදුක් නොසුව වේදනාවෙන් අවිජ්ජානුසයය පහකටයුතු යි. මහණෙනි, යම් කලෙක මහණහට සුවවේදනාවෙන් රාගානුසයය ප්‍රහීණ වූයේ වේ ද දුක්වේදනාවෙන් පටිඝානුසයය ප්‍රහීණ වූයේ වේ ද නොදුක් නොසුව වේදනාවෙන් අවිජ්ජානුසයය ප්‍රහීණ වූයේ වේ ද මහණෙනි, පහ වූ රාගානුසයය ඇති මේ මහණ තෘෂ්ණාව සිඳදැම්මේ ය. සංයොජන මුලිනුපුටා හළේ ය. මැනවින් මානාවබොධයෙන් දුක් කෙළවර කෙළේ යයි කියනු ලැබේ.

සුඛං වෙදියමානස්ස වෙදනං අප්පජානතො
සො රාගානුසයො හොති අනිස්සරණදස්සිනො.

දුක්ඛං වෙදියමානස්ස වෙදනං අප්පජානතො
පටිඝානුසයො හොති අනිස්සරණදස්සිනො.

අදුක්ඛමසුඛං සන්තං භූරිපඤ්ඤෙන දෙසිතං
තං චාපි අභිනන්දන්තො[1] නෙව දුක්ඛා පමුච්චති.

යතො වා[2] භික්ඛු ආතාපී සම්පජඤ්ඤං න රිඤ්චති
තතො සො වෙදනා සබ්බා පරිජානාති පණ්ඩිතො.

සො වෙදනා පරිඤ්ඤාය දිට්ඨධම්මෙ අනාසවො
කායස්ස භෙද ධම්මට්ඨො සඞ්ඛං නොපෙති[3] වෙදගූති.

## 1. 20. 4

## පාතාලසුත්තං

252. අස්සුතවා භික්ඛවෙ පුථුජ්ජනො එවං වාචං භාසති: 'අත්ථි මහාසමුද්දෙ පාතාලො'ති. තං ඛො පනෙතං භික්ඛවෙ අස්සුතවා පුථුජ්ජනො අසන්තං අවිජ්ජමානං එවං වාචං භාසති: 'අත්ථි මහාසමුද්දෙ පාතාලො'ති. සාරීරිකානං ඛො එතං භික්ඛවෙ දුක්ඛානං වෙදනානං අධිවචනං යදිදං පාතාලොති. අස්සුතවා භික්ඛවෙ පුථුජ්ජනො සාරීරිකාය දුක්ඛාය වෙදනාය ඵුට්ඨො සමානො සොචති කිලමති පරිදෙවති උරත්තාළිං[4] කන්දති. සම්මොහං ආපජ්ජති. අයං වුච්චති භික්ඛවෙ අස්සුතවා පුථුජ්ජනො පාතාලෙ න පච්චුට්ඨාසි, ගාධඤ්ච නාජ්ඣගා. සුතවා භික්ඛවෙ ආරියසාවකො සාරීරිකාය දුක්ඛාය වෙදනාය ඵුට්ඨො සමානො න සොචති න කිලමති න පරිදෙවති න උරත්තාළිං[4] කන්දති න සම්මොහං ආපජ්ජති. අයං වුච්චති භික්ඛවෙ සුතවා අරියසාවකො පාතාලෙ පච්චුට්ඨාසි, ගාධඤ්ච අජ්ඣගාති.

යො එතා නාධිවාසෙති උප්පන්නා වෙදනා දුඛා[5]
සාරීරිකා පාණහරා යාහි ඵුට්ඨො පවෙධති.

අක්කන්දති පරොදති දුබ්බලො අප්පථාමකො
න සො පාතාලෙ පච්චුට්ඨාසි අථො ගාධම්පි නාජ්ඣගා.

යො චෙතා අධිවාසෙති උප්පන්නා වෙදනා දුඛා[7]
සාරීරිකා පාණහරා යාහි ඵුට්ඨො න වෙධති
ස වෙ පාතාලෙ පච්චුට්ඨාසි අථො ගාධම්පි අජ්ඣගා ති.

---

1. අභිනන්දති - සීමු ii
2. යතො වා ඛො - සී 1. 2.
3. සංඛ්‍යං නොපෙති - මජ්සං.
   නූපෙති - ස්‍යා.
   න උපෙති - සී. මු.
4. උරත්තාලිං - සී 1. 2.
5. දුක්ඛා, - සී. මු.

වේදනාව නොදන්නා (වෙදනා) නිස්සරණය නොදක්නා සුව වේදනාව විඳින්නහුට ඒ රාගානුසයය වේ.

වේදනාව නොදන්නා (වෙදනා) නිස්සරණය නොදක්නා දුක් වේදනාව විඳින්නහුට පටිඝානුසයය වේ.

මහාප්‍රාඥතථාගතයන් වහන්සේ විසින් ශාන්තය යි වදළ නොදුක් නොසුව වේදනාව ද පතන්නේ දුකෙන් නොමැ මිදෙයි.

යම් හෙයකින් කෙලෙස් තවන වෙර ඇති මහණ මනා නුවණ නො හරී ද එහෙයින් ඒ පණ්ඩිත තෙමේ සියලු වේදනා පිරිසිඳ දනී.

හෙතෙමේ වේදනා පිරිසිඳ දැන දිටුදැමියෙහි කෙලෙස් රහිත වූයේ නිවනට පැමිණියේ දහම්හි පිහිටියේ කාබුන් (මරණින් මතු) පැනවීමකට නො පැමිණේ.

## 1. 20. 4

## පාතාල සූත්‍රය

252. මහණෙනි, ඇසූ පිරූ තැන් නැති පුහුදුන් තෙමේ මහමුහුදෙහි පාතාලයෙක් ඇතැ යි මෙබඳු වචනයක් කියයි. මහණෙනි, ඇස පිරූ තැන් නැති පුහුදුන් තෙමේ නැති නො පෙනෙන (තැනක් ගැන) මහමුහුදෙහි පාතාලයෙක් ඇතැ යි මෙසේ මේ වචනය කියයි. මහණෙනි, පාතාල යන මෙය ශරීරයෙහි හටගන්නා දුක්වේදනාවන්ට නමෙකි. මහණෙනි, නුගත් පුහුදුන් තෙමේ ශරීරයෙහි හටගත් දුක් වේදනාවෙන් පහස්නා ලද්දේ ම ශෝක කෙරෙයි. ක්ලාන්ත වෙයි. හඬයි ළෙහි පහරමින් හඬයි. මුළාවට පැමිණෙයි. මහණෙනි, මේ නුගත් පුහුදුන් තෙමේ පාතාලයෙහි නො පිහිටියේ ය. පිහිට ද නො ලැබුවේ යයි කියනු ලැබේ. මහණෙනි, උගත් අරිසවු තෙමේ ශරීරයෙහි හටගත් දුක්වේදනාවෙන් පහස්නා ලද්දේ ම ශෝක නොකෙරෙයි. ක්ලාන්ත නො වෙයි. නො හඬයි. ළෙහි පහරමින් නො හඬයි. මුළාවට නො පැමිණෙයි. මහණෙනි, මේ ශ්‍රුතවත් ආර්‍යශ්‍රාවක පාතාලයෙහි පිහිටියේ ය. පිහිට ද ලැබුයේ යි කියනු ලැබේ.

යමෙක් යමකින් පහස්නා ලද්දේ සැලේ ද ශරීරයෙහි වූ දිවි තොර කරන ඒ උපන් දුක් වේදනා නො ඉවසා ද.

දුබල වූ නුවණ ඇති මඳ වූ ඥානශක්ති ඇති හෙතෙමේ හඬයි වැලපෙයි. පාතාලයෙහි නො පිහිටයි යළි පිහිටකුදු නො ලැබුයේ ය.

යමෙක් යමකින් පහස්නා ලද්දේ නො සැලේ ද, ශරීරයෙහි වූ දිවි තොර කරන ඒ උපන් දුක් වේදනා ඉවසා ද, හෙතෙමේ පාතාලයෙහි පිහිටයි. යළි පිහිට ද ලැබුයේ යි.

## 1. 20. 5

### දට්ඨබ්බසුත්තං

253. තිස්සො ඉමා භික්ඛවෙ වෙදනා. කතමා තිස්සො: සුඛා වෙදනා දුක්ඛා වෙදනා අදුක්ඛමසුඛා වෙදනා. සුඛා භික්ඛවෙ වෙදනා දුක්ඛතො දට්ඨබ්බා, දුක්ඛා වෙදනා සල්ලතො දට්ඨබ්බා, අදුක්ඛමසුඛා වෙදනා අනිච්චතො දට්ඨබ්බා.

යතො ඛො භික්ඛවෙ භික්ඛුනො සුඛා වෙදනා දුක්ඛතො දිට්ඨා හොති, දුක්ඛා වෙදනා සල්ලතො දිට්ඨා හොති, අදුක්ඛමසුඛා වෙදනා අනිච්චතො දිට්ඨා හොති, අයං වුච්චති භික්ඛවෙ භික්ඛු සම්මද්දසො අච්ඡෙච්ඡි තණ්හං, වාවත්තයි සඤ්ඤොජනං, සම්මාමානාභිසමයා අන්තමකාසි දුක්ඛස්සාති.

යො සුඛං දුක්ඛතො අද්ද දුක්ඛමද්දක්ඛි සල්ලතො
අදුක්ඛමසුඛං සන්තං අද්දක්ඛි නං අනිච්චතො.

ස වෙ සම්මද්දසො භික්ඛු පරිජානාති වෙදනා
සො වෙදනා පරිඤ්ඤාය දිට්ඨධම්මෙ අනාසවො
කායස්ස භෙද ධම්මට්ඨො සඞ්ඛං නොපෙති වෙදගූති.

## 1. 20. 6

### සල්ලසුත්තං

254 අස්සුතවා භික්ඛවෙ පුථුජ්ජනො සුඛම්පි වෙදනං වෙදියති, දුක්ඛම්පි වෙදනං වෙදියති, අදුක්ඛමසුඛම්පි වෙදනං වෙදියති, සුතවා භික්ඛවෙ අරියසාවකො සුඛම්පි වෙදනං වෙදියති, දුක්ඛම්පි වෙදනං වෙදියති, අදුක්ඛමසුඛම්පි වෙදනං වෙදියති, තත්‍ර භික්ඛවෙ කො විසෙසො, කො අධිප්පායො, කිං නානාකරණං සුතවතො අරියසාවකස්ස අස්සුතවතා පුථුජ්ජනෙනාති?

භගවම්මූලකා නො භන්තෙ ධම්මා භගවංනෙත්තිකා භගවම්පටි-සරණා, සාධු වත භන්තෙ භගවන්තංයෙව පටිභාතු එතස්ස භාසිතස්ස අත්ථො භගවතො සුත්වා භික්ඛූ ධාරෙස්සන්තීති. තෙන හි භික්ඛවෙ සුණාථ, සාධුකං මනසිකරොථ, භාසිස්සාමීති. එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං, භගවා එතදවොච:

## 1. 20. 5

## දට්ඨබ්බ සූත්‍රය

253. මහණෙනි, මේ වේදනා තුනෙකි. කවර තුනෙක් ද යත්: සුවවේදනා ය, දුක්වේදනා ය, නොදුක්නොසුව වේදනා යි. මහණෙනි, සුවවේදනාව දුක් විසින් දක්ක යුතු ය. දුක්වේදනාව හුල් විසින් දක්ක යුතු ය. නොදුක්නොසුව වේදනාව අනිස විසින් දක්ක යුතු ය.

මහණෙනි, යම් කලෙක මහණහු විසින් සුවවේදනාව දුක් විසින් දක්නාලද වේ ද, දුක්වේදනාව හුල් විසින් දක්නා ලද වේ ද, නොදුක්නොසුව වේදනාව අනිස විසින් දක්නා ලද වේ ද, මහණෙනි, මැනවින් දක්නා මේ මහණ තෘෂ්ණාව සිඳලූයේ ය. සංයෝජන මුලිනුපුටා හළේ ය. මනා කොට මානාවබෝධය කිරීමෙන් දුක කෙළවර කෙළේ යයි කියනු ලැබේ.

යමෙක් සුවවේදනාව දුක් විසින් දිටි ද, දුක්වේදනාව හුල් විසින් දිටි ද, ශාන්ත වූ ඒ නොදුක්නොසුව වේදනාව අනිස විසින් දිටි ද.

මැනවින් දක්නා ඒ මහණ වේදනා පිරිසිඳ දනී. වේදනා පිරිසිඳ දැන දිටුදැමියෙහි කෙලෙස් රහිත වූයේ නිවනට පැමිණියේ දහම්හි පිහිටියේ කාබුන් මරණින් මතු පැනවීමට නො පැමිණේ යි.

## 1. 20. 6

## සල්ල සූත්‍රය

254. මහණෙනි, ඇසූ පිරූ තැන් නැති පුහුදුන් තෙමේ සුවවේදනාවත් විඳියි. දුක්වේදනාවත් විඳියි. නොදුක්නොසුව වේදනාවත් විඳියි. මහණෙනි, ඇසූ පිරූ තැන් ඇති අරිසවු ද සුවවේදනාවත් විඳියි. දුක්වේදනාවත් විඳියි. නොදුක්නොසුව වේදනාවත් විඳියි. මහණෙනි, එහි ලා ඇසූ පිරූ තැන් නැති පුහුදුන්හු හා ඇසූ පිරූ තැන් ඇති අරිසවුහුගේ වෙසෙස කිමෙක් ද? අදහස කවරේ ද? වෙනස කිමෙක්ද ?යි

වහන්ස, අපගේ දහම්හු භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇතියහ. භාග්‍යවතුන් වහන්සේ නේත්‍ර කොට ඇතියහ. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණ කොට ඇතියහ. වහන්ස, මේ දේශනාවේ අරුත භාග්‍යවතුන් වහන්සේට ම වැටහේවා. භාග්‍යවතුන් වහන්සේගෙන් අසා භික්ෂූහු දරන්නාහ යි. මහණෙනි, එසේ නම් අසවු. මැනවින් මෙනෙහි කරවු. කියන්නෙමි යි. 'එසේ ය වහන්සැ'යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

අස්සුතවා භික්ඛවෙ පුථුජ්ජනො දුක්ඛාය වෙදනාය ඵුට්ඨො සමානො සොචති කිලමති පරිදෙවති උරත්තාළිං කන්දති සම්මොහං ආපජ්ජති සො ද්වෙ වෙදනා වෙදියති කායිකඤ්ච චෙතසිකඤ්ච සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසං සල්ලෙන විජ්ඣෙය්‍යුං, තමෙනං දුතියෙන සල්ලෙන අනුවෙධං විජ්ඣෙය්‍යුං, එවං හි සො භික්ඛවෙ පුරිසො ද්වෙ සල්ලෙන වෙදනා වෙදියෙථ.

එවමෙව ඛො භික්ඛවෙ අස්සුතවා පුථුජ්ජනො දුක්ඛාය වෙදනාය ඵුට්ඨො සමානො සොචති. කිලමති. පරිදෙවති උරත්තාළිං කන්දති, සම්මොහං ආපජ්ජති, සො ද්වෙ වෙදනා වෙදියති කායිකඤ්ච චෙතසිකඤ්ච. තස්සායෙව ඛො පන දුක්ඛාය වෙදනාය ඵුට්ඨො සමානො පටිඝවා හොති. තමෙනං දුක්ඛාය වෙදනාය පටිඝවන්තං යො දුක්ඛාය වෙදනාය පටිඝානුසයො සො අනුසෙති, සො දුක්ඛාය වෙදනාය ඵුට්ඨො සමානො කාමසුඛං අභිනන්දති. තං කිස්ස හෙතු, න භික්ඛවෙ පජානාති අස්සුතවා පුථුජ්ජනො අඤ්ඤත්‍ර කාමසුඛා දුක්ඛාය වෙදනාය නිස්සරණං, තස්ස කාමසුඛං අභිනන්දතො යො සුඛාය වෙදනාය රාගානුසයො සො අනුසෙති. සො තාසං වෙදනානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං නප්පජානාති.

තස්ස තාසං වෙදනානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං අප්පජානතො යො අදුක්ඛමසුඛාය වෙදනාය අවිජ්ජානුසයො සො අනුසෙති. සො සුඛඤ්චෙ[1] වෙදනං වෙදියති සඤ්ඤුත්තො නං වෙදියති, දුක්ඛඤ්චෙ වෙදනං වෙදියති සඤ්ඤුත්තො නං වෙදියති, අදුක්ඛමසුඛඤ්චෙ වෙදනං වෙදියති සඤ්ඤුත්තො නං වෙදියති, අයං වුච්චති භික්ඛවෙ අස්සුතවා පුථුජ්ජනො සඤ්ඤුත්තො ජාතියා ජරාමරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි සඤ්ඤුත්තො දුක්ඛස්මාති වදාමි.

සුතවා ච ඛො භික්ඛවෙ අරියසාවකො දුක්ඛාය වෙදනාය ඵුට්ඨො සමානො න සොචති න කිලමති න පරිදෙවති න උරත්තාළිං කන්දති න සම්මොහං ආපජ්ජති: සො එකං වෙදනං වෙදියති කායිකං, න චෙතසිකං. සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසං සල්ලෙන විජ්ඣෙය්‍යුං, තමෙනං දුතියෙන සල්ලෙන අනුවෙධං න විජ්ඣෙය්‍යුං;[2] එවං හි සො භික්ඛවෙ පුරිසො එකං[3] සල්ලෙන[3] වෙදනං වෙදියෙථ[4] එවමෙව ඛො භික්ඛවෙ සුතවා අරියසාවකො දුක්ඛාය වෙදනාය ඵුට්ඨො සමානො න සොචති න කිලමති න පරිදෙවති, න උරත්තාළිං කන්දති, න සම්මොහං ආපජ්ජති; සො එකං වෙදනං වෙදියති කායිකං, න චෙතසිකං. තස්සායෙව ඛො පන දුක්ඛාය වෙදනාය පටිඝවා න හොති, තමෙනං දුක්ඛාය වෙදනාය අපටිඝවන්තං යො දුක්ඛාය වෙදනාය පටිඝානුසයො සො නානුසෙති; සො දුක්ඛාය වෙදනාය ඵුට්ඨො සමානො කාමසුඛං නාභිනන්දති. තං කිස්ස හෙතු, පජානාති හි භික්ඛවෙ සුතවා අරියසාවකො අඤ්ඤත්‍ර කාමසුඛා දුක්ඛාය වෙදනාය නිස්සරණං.

---

1. සුඛං - සී 2.
2. න අනුවිජ්ඣෙය්‍යුං - සී. 1. 2.
   අනුරොධං න විජ්ඣෙය්‍යුං - සභා.
3. එකසල්ලෙන - මජසං,
4. වෙදයති - මජසං.

මහණෙනි, ඇසූ පිරූ තැන් නැති පුහුදුන් තෙමේ දුක් වේදනාවෙන් පහස්නා ලද්දේ ම ශෝක කෙරෙයි. ක්ලාන්ත වෙයි. වැලපෙයි. ළෙහි පැහැර හඬයි. මුළාවට පැමිණෙයි. හෙතෙමේ කායික වේදනාව ද චෙතසික වේදනාව ද යන වේදනා දෙකක් විඳී. මහණෙනි, යම්සේ පුරුෂයකු හුලකින් විදිනාහු ද ඒ මොහු දෙවෙනි හුලකිනුදු සමීපයෙහි විදුනාහු ද, මහණෙනි, මෙසේ වනාහි ඒ පුරුෂ තෙමේ හුල කරණකොටගෙන වේදනා දෙකක් විඳී.

මහණෙනි, එසෙයින් ම ඇසූ පිරූ තැන් නැති පුහුදුන් තෙමේ දුක්වේදනාවෙන් පහස්නා ලද්දේ ම ශෝක කෙරෙයි. ක්ලාන්ත වෙයි. වැලපෙයි. ළෙහි පැහැර හඬයි. මුළාවට පැමිණෙයි. හෙතෙමේ කායික වේදනාව ද චෙතසික වේදනාව ද යන වේදනා දෙකක් විඳියි. ඒ දුක් වේදනාවෙන් ම පහස්නා ලද්දේ ක්‍රෝධ ඇත්තේ වෙයි. දුක් වේදනාවෙන් වූ ක්‍රෝධ ඇති ඒ මොහුට දුක්වේදනා වෙන් යම් පටිඝානුසයයෙක් වේ නම් එය උපදී. හෙතෙමේ දුක්වේදනාවෙන් පහස්නා ලද්දේ කම්සුව පිළිගනී. ඒ කවර හෙයින යත්: මහණෙනි, ඇසූ පිරූ තැන් නැති පුහුදුන් තෙමේ කම්සුවය හැර දුක්වේදනාවේ දුරුකිරීමක් නො දනී. කම්සුව පිළිගන්නා ඔහුට සුවවේදනාවෙන් වූ යම් රාගානුසයයෙක් වේ නම් එය උපදී. හෙතෙමේ ඒ වේදනාවන්ගේ සමුදයයත් අත්ථඞ්ගමයත් අස්සාදයත් ආදීනවයත් නිස්සරණයත් තතුසේ නො දනී.

ඒ වේදනාවන්ගේ සමුදයයත් අත්ථඞ්ගමයත් අස්සාදයත් ආදීනවයත් නිස්සරණයත් තතුසේ නො දන්නා ඔහුට නොදුක්නොසුව වේදනාවෙන් වූ යම් අවිජ්ජානුසයයෙක් වේ නම් එය උපදී. හෙතෙමේ ඉදින් සුව වේදනාවක් විඳී නම් (කෙලෙසුන්ගෙන්) යුතුව එය විඳී. ඉදින් දුක් වේදනාවක් විඳී නම් යුතු ව එය විඳී. ඉදින් නොදුක් නොසුව වේදනාවක් විඳී නම් සංයුක්ත ව එය විඳී. මහණෙනි, මේ නූගත් පුහුදුන් තෙමේ ජාතියෙන් ජරාමරණයෙන් ශෝකයෙන් පරිදේවයෙන් දුක්ඛයෙන් දෙමනස්සයෙන් උපායාසයෙන් යුතු වූයේ යයි කියනු ලැබේ සියලු දුකින් යුතු වූයේ යයි කියමි.

මහණෙනි, ශ්‍රුතවත් අරිසවු තෙමේ දුක්වේදනාවෙන් පහස්නා ලද්දේ ම ශෝක නො කරයි. ක්ලාන්ත නො වෙයි. නො වැල පෙයි. ළෙහි පැහැර නො හඬයි. මුළාවට නො පැමිණෙයි. හේ කායික වූ එක් වේදනාවක් විඳියි. චෙතසික වේදනාව නො විඳියි. මහණෙනි, යම්සේ පුරුෂයකු හුලකින් විදිනාහු ද ඒ මොහු දෙවෙනි හුලකින් පළමු විදුම සමීපයෙහි නො විදුනාහු ද මහණෙනි, මෙසේ ඒ පුරුෂ තෙමේ එක් හුලකින් වූ වේදනාව විඳින්නේ ය. මහණෙනි, එසෙයින් ම උගත් අරිසවු දුක් වේදනාවෙන් පහස්නා ලද්දේ ම ශෝක නො කෙරෙයි. ක්ලාන්ත නො වෙයි. නො වැලපෙයි. ළෙහි පැහැර නො හඬයි මුළාවට නො පැමිණෙයි. හෙතෙමේ කායික වූ එක් වේදනාවක් විඳියි. චෙතසික වේදනාව නො විඳියි. ඒ දුක් වේදනාවේ ම ක්‍රෝධ ඇත්තේ නො වෙයි. දුක්වේදනාවෙන් වූ ක්‍රෝධ නැති ඒ මොහුට දුක්වේදනාවෙහි වූ යම් පටිඝානුසයයෙක් වේ නම් එය නූපදී. හෙතෙමේ දුක්වේදනාවෙන් පහස්නා ලද්දේ ම කම්සුව නො පිළිගනී. ඒ කවර හෙයින යත්: මහණෙනි, උගත් අරිසවු තෙමේ කම්සුවෙන් වෙන් ව දුක්වේදනාවේ නිස්සරණය දනී මැ යි, එහෙයිනි.

තස්ස කාමසුඛං අනභිනන්දතො යො සුඛාය වෙදනාය රාගානුසයො සො නානුසෙති. සො තාසං වෙදනානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානාති, තස්ස තාසං වෙදනානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානතො යො අදුක්ඛමසුඛාය වෙදනාය අවිජ්ජානුසයො සො නානුසෙති, සො සුඛඤ්චෙ වෙදනං වෙදියති විසඤ්ඤුත්තො නං වෙදියති, දුක්ඛඤ්චෙ වෙදනං වෙදියති විසඤ්ඤුත්තො නං වෙදියති, අදුක්ඛමසුඛඤ්චෙ වෙදනං වෙදියති විසඤ්ඤුත්තො නං වෙදියති. අයං වුච්චති භික්ඛවෙ සුතවා අරියසාවකො විසඤ්ඤුත්තො ජාතියා ජරාමරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි, විසඤ්ඤුත්තො දුක්ඛස්මාති වදාමි. අයං ඛො භික්ඛවෙ විසෙසො, අයං අධිප්පායො, ඉදං නානාකරණං සුතවතො අරියසාවකස්ස අස්සුතවතා පුථුජ්ජනෙනාති.

න[1] වෙදනං වෙදියති සපඤ්ඤො[2]
සුඛම්පි දුක්ඛම්පි බහුස්සුතොපි
අයඤ්ච ධීරස්ස පුථුජ්ජනෙන
මහා[3]විසෙසො කුසලස්ස හොති.

සඞ්ඛාතධම්මස්ස බහුස්සුතස්ස
සම්පස්සතො ලොකමිමං පරඤ්ච
ඉට්ඨස්ස ධම්මා න මථෙන්ති චිත්තං
අනිට්ඨතො නො පටිඝාතමෙති.

තස්සානුරොධා අථවා විරොධා
විධූපිතා[4] අත්ථඞ්ගතා න සන්ති
පදඤ්ච ඤත්වා විරජං අසොකං
සම්මා පජානාති භවස්ස පාරගූති.

## 1. 20. 7

## ගෙලඤ්ඤසුත්තං

255. එකං සමයං භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං. අථ ඛො භගවා සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙන ගිලානසාලා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි, නිසජ්ජ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: සතො භික්ඛවෙ භික්ඛු සම්පජානො කාලං ආගමෙය්‍ය, අයං වො අම්හාකං අනුසාසනී.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු සතො හොති: ඉධ භික්ඛවෙ භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දොමනස්සං; වෙදනාසු වෙදනානුපස්සී -පෙ- චිත්තෙ චිත්තානුපස්සී -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දොමනස්සං; එවං ඛො භික්ඛවෙ භික්ඛු සතො හොති.

1. න සො - සයා.
2. සප්පඤ්ඤො - සී 1. 2.
3. අයං - සයා
4. විධමිතා - සයා

කම්සුව නො පිළිගන්නා ඔහුට සුවවේදනාවෙන් වූ යම් රාගානු-සයයෙක් වේ නම් එය නූපදී. හෙ ඒ වේදනාවන්ගේ සමුදයයත් අත්‍ථගමයත් අස්සාදයත් ආදීනවයත් නිස්සරණයත් තතුසේ දනී. ඒ වේදනාවන්ගේ සමුදයයත් අත්‍ථගමයත් අස්සාදයත් ආදීනවයත් නිස්සරණයත් තතුසේ දන්නා ඔහුට නොදුක්නොසුව වේදනාවෙන් වූ යම් අවිජ්ජානුසයෙක් වේ නම් එය නූපදී. හේ ඉදින් සුවවේදනා-වක් විඳී නම් (කෙලෙසුන්ගෙන්) වෙන් ව එය විඳී. ඉදින් දුක් වේදනාවක් විඳී නම් වෙන් ව එය විඳී. ඉදින් නොදුක්නොසුව වේදනාවක් විඳී නම් වෙන් ව එය විඳී. මහණෙනි, මේ උගත් අරිසවු ජාතියෙන් ජරාමරණයෙන් සෝකයෙන් පරිදේවයෙන් දුක්‍ඛයෙන් දෝමනස්සයෙන් උපායාසයෙන් වෙන් වූයේ යයි කියනු ලැබේ. සියලු දුකින් වෙන් වූයේ යයි කියනු ලැබේ. මහණෙනි, ඇසූ පිරූ තැන් නැති පුහුදුන්හු හා ඇසූ පිරූ තැන් ඇති අරිසවුහුගේ මේ වෙසෙසයි. මේ අදහස යි. මේ වෙනස යි.

බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තා වූ ද නුවණැත්තේ සුව වූත් දුක් වූත් වේදනාව (කෙලෙසුන්ගෙන්) යුතුව නො විඳියි. දක්‍ෂ වූ නුවණැත්තාගේ පුහුදුන්හු හා මහත් වෙසෙස මෙය වෙයි.

දන්නා ලද දහම් ඇති බොහෝ ඇසූ පිරූ තැන් ඇති මේ ලොවත් පරලොවත් මැනවින් දක්නා මොහුගේ සිත ඉටුදහම්හු නො මඩිත්. අනිටු දහමින් කිපීමට නො පැමිණෙයි.

රාගයෝ ද යළිත් ද්වෙෂයෝ ද ඔහු එයින් නසන ලදහ. අස්තයට ගියහ. එහෙයින් ම නැතියහ. ඇලුම් රහිත සෝක රහිත නිවන් පදය දැන භවයේ කෙළවරට පැමිණියේ මැනවින් දනී යි.

## 1. 20. 7

## ගෙලඤ්ඤ සූත්‍රය

255. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ විසල්පුරසමීපයෙහි මහවෙනෙහි කූඑගේහල්හි වැඩවසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ සවස්කල පලසමවතින් නැඟී සිටි සේක් ගිලන්හල වෙත එළඹිසේක. එළඹ පැන වූ අස්නෙහි වැඩහුන් සේක. වැඩ හිඳ භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක: මහණෙනි, මහණ තෙමේ සිහි ඇත්තේ මනා දැනුම් ඇත්තේ (ස්කන්‍ධපරිනිර්වාණ) කාලය අපේක්ෂා කරන්නේ ය. මේ තොපට අපගේ අනුශාසනා යි.

මහණෙනි, මහණ කෙසේ නම් සිහි ඇත්තේ වේ ද යත්: මහණෙනි, මෙහි මහණ රූ කයෙහි කය අනුව බලමින් කෙලෙස් තවන වෙර ඇති ව මනා නුවණ ඇති ව සිහි ඇති ව (කා) ලෙව්හි දූඩී ලෝබ හා දෙම්නස දුරු කොට වෙසේ ද, වේදනාවන්හි වේදනා අනුව බලමින්.... සිතෙහි සිත අනුව බලමින්.... දහම්හි දහම් අනු ව බලමින් කෙලෙස් තවන වෙර ඇති ව මනා නුවණ ඇති ව සිහි ඇති ව (දහම්) ලෙව්හි දූඩීලොබ හා දෙම්නස දුරු කොට වෙසේ ද මහණෙනි, මහණ මෙසේ සිහි ඇත්තේ වේ.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු සම්පජානො හොති; ඉධ භික්ඛවෙ භික්ඛු අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති, ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති, සම්මිඤ්ජිතෙ පසාරිතෙ සම්පජානකාරී හොති, සඞ්ඝාටිපත්තචීවරධාරණෙ සම්පජානකාරී හොති, අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ සම්පජානකාරී හොති, උච්චාරපස්සාවකම්මෙ සම්පජානකාරී හොති, ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජානකාරී හොති; එවං ඛො භික්ඛවෙ භික්ඛු සම්පජානො[1] හොති. සතො භික්ඛවෙ භික්ඛු සම්පජානො කාලං ආගමෙය්‍ය, අයං වො අම්හාකං අනුසාසනී.

තස්ස චෙ භික්ඛවෙ භික්ඛුනො එවං සතස්ස සම්පජානස්ස අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො උප්පජ්ජති සුඛා වෙදනා; සො එවං පජානාති; උප්පන්නා ඛො ම්‍යායං[2] සුඛා වෙදනා, සා ච ඛො පටිච්ච නො අප්පටිච්ච, කිං පටිච්ච: ඉමමෙව කායං පටිච්ච, අයං ඛො පන කායො අනිච්චො සඞ්ඛතො පටිච්චසමුප්පන්නො, අනිච්චං ඛො පන සඞ්ඛතං පටිච්චසමුප්පන්නං කායං පටිච්ච උප්පන්නා සුඛා වෙදනා කුතො නිච්චා භවිස්සතී ති.

සො කායෙ ච සුඛාය ච වෙදනාය අනිච්චානුපස්සී විහරති වයානුපස්සී විහරති විරාගානුපස්සී විහරති, නිරොධානුපස්සී විහරති, පටිනිස්සග්ගානුපස්සී විහරති, තස්ස කායෙ ච සුඛාය ච වෙදනාය අනිච්චානුපස්සිනො විහරතො වයානුපස්සිනො විහරතො පටිනිස්සග්ගානුපස්සිනො විහරතො යො කායෙ ච සුඛාය ච වෙදනාය රාගානුසයො සො පහීයති.

තස්ස චෙ භික්ඛවෙ භික්ඛුනො එවං සතස්ස සම්පජානස්ස අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො උප්පජ්ජති දුක්ඛා වෙදනා, සො එවං පජානාති: උප්පන්නා ඛො ම්‍යායං[2] දුක්ඛා වෙදනා, සා ච ඛො පටිච්ච නො අප්පටිච්ච, කිං පටිච්ච, ඉමමෙව කායං පටිච්ච, අයං ඛො පන කායො අනිච්චො සඞ්ඛතො පටිච්චසමුප්පන්නො, අනිච්චං ඛො පන සඞ්ඛතං පටිච්චසමුප්පන්නං කායං පටිච්ච උප්පන්නා දුක්ඛා වෙදනා කුතො නිච්චා භවිස්සතීති.

---

1. සම්පජානකාරී - මජසං සතා
2. මෙ අයං - සී 2, ස්‍යා.

මහණෙනි, මහණ කෙසේ නම් දනුම් ඇත්තේ වේ ද යත්: මහණෙනි, මෙහි මහණ ඉදිරිගමන්හි හා ආපසු ගමන්හි මනා නුවණින් දන කරනසුලු වේ ද ඉදිරිබැලීමෙහි අවට බැලීමෙහි මනානුවණින් කරනසුලු වේ ද (අත්පා) හැකිළීමෙහි හා දිගහැරීමෙහි මනානුවණින් දන කරනසුලු වේ ද, සඟළ හා පාසිවුරු දරීමෙහි මනානුවණින් දන කරනසුලු වේ ද, බීදීමෙහි පීමෙහි කෑමෙහි හා රසවිඳීමෙහි මනානුවණින් දන කරනසුලු වේ ද, මලමූ කිසෙහි මනානුවණින් දන කරනසුලු වේ ද, යෑමෙහි සිටීමෙහි හිඳීමෙහි නිදීමෙහි නිදිවැරීමෙහි බිණීමෙහි හා නො බිණීමෙහි මනානුවණින් දන කරනසුලු වේ ද, මහණෙනි, මහණ මෙසේ මනානුවණ ඇත්තේ වේ. මහණෙනි, මහණ සිහි ඇත්තේ මනාදනුම් ඇත්තේ කාලය අපේක්ෂා කරන්නේ ය. මේ තොපට අපගේ අනුශාසනා යි.

මහණෙනි, ඉදින් මෙසේ සිහි ඇති ව මනාදනුම් ඇති ව නො පමාව කෙලෙස් තවන වෙර ඇති ව කා දිවි දෙක්හි ආශා රහිත ව වෙසෙන මහණහට සුවවේදනාවක් උපදී ද හෙතෙමෙ ''මට මේ සුවවේදනාවක් උපන. එ ද නිසා ය, නොනිසා නො වේ. කුමක් නිසා ද යත්: මේ කය ම නිසා ය. මේ කය වනාහි අනිස ය. හේතූන් විසින් කරන ලද්දේ ය. ප්‍රත්‍යය නිසා උපන්නේ ය. අනිස වූ සඞ්ඛත වූ පටිච්චසමුප්පන්න වූ කය නිසා උපන් සුව වේදනාව කොයින් නිත්‍ය වන්නේ දැ'යි මෙසේ දනියි.

හෙතෙමේ කයෙහිත් සුවවේදනාවෙහිත් අනිස අනු ව බලන සුලු ව වෙසේ. වැය අනු ව බලනසුලු ව වෙසේ. විරාගය අනු ව බලනසුලු ව වෙසේ. නිරොධය අනු ව බලනසුලු ව වෙසේ පටිනිස්සග්ගය අනු ව බලනසුලු ව වෙසේ. කයෙහිත් සුවවේදනාවෙහිත් අනිස අනු ව බලන සුලු ව වෙසෙන වැය අනු ව බලනසුලු ව වෙසෙන විරාගය අනු ව බලනසුලු ව වෙසෙන නිරෝධය අනු ව බලනසුලු ව වෙසෙන පටිනිස්සග්ගය අනු ව බලනසුලු ව වෙසෙන ඔහුගේ කයෙහිත් සුවවේදනාවෙහිත් යම් රාගානුසයයෙක් වේ නම් එය ප්‍රහීණ වේ.

මහණෙනි, මෙසේ සිහි ඇති ව මනා දනුම් ඇති ව නො පමා ව කෙලෙස් තවන වෙර ඇති ව නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති ව වෙසෙන ඒ මහණහට ඉදින් දුක්වේදනාවක් උපදී නම් හෙතෙමේ මෙසේ දනී: ''මට මේ දුක්වේදනාවක් උපන. හෙ ද නිසා ය. නොනිසා නො වේ. කුමක් නිසා ද යත්: මේ කය ම නිසා ය. මේ කය වනාහි අනිත්‍ය ය. සඞ්ඛත ය. පටිච්චසමුප්පන්න ය. අනිත්‍ය වූ සඞ්ඛත වූ පටිච්චසමුප්පන්න වූ කය නිසා උපන් දුක්වේදනාව කොයින් නිත්‍ය වන්නී දැ'යි.

හෙතෙමේ කයෙහිත් දුක්වේදනාවෙහිත් අනිස අනුව බලන සුලු ව වෙසේ. වැය අනු ව බලනසුලු ව වෙසේ. විරාගය අනු ව බලනසුලු ව වෙසේ. නිරෝධය අනුව බලනසුලු ව වෙසේ. පටිනිස්සග්ගය අනුව බලනසුලු ව වෙසේ. කයෙහිත් දුක්වේදනා වෙහිත් අනිස අනුව බලනසුලු ව වෙසෙන වැය අනුව බලන-සුලු ව වෙසෙන විරාගය අනු ව බලනසුලු ව වෙසෙන නිරෝධය අනුව බලනසුලු ව වෙසෙන පටිනිස්සග්ගය අනුව බලනසුලු ව වෙසෙන ඔහුගේ කයෙහිත් දුක්වේදනාවෙහිත් යම් පටිඝානුසයයෙක් වේ නම් එය ප්‍රහීණ වේ.

සො කායෙ ච දුක්ඛාය ච වෙදනාය අනිච්චානුපස්සී විහරති වයානුපස්සී විහරති විරාගානුපස්සී විහරති, නිරොධානුපස්සී විහරති, පටිනිස්සග්ගානුපස්සී විහරති, තස්ස කායෙ ච දුක්ඛාය ච වෙදනාය අනිච්චානුපස්සිනො විහරතො වයානුපස්සිනො විහරතො විරාගානුපස්සිනො විහරතො නිරොධානුපස්සිනො විහරතො පටිනිස්සග්ගානුපස්සිනො විහරතො යො කායෙ ච දුක්ඛාය ච වෙදනාය පටිඝානුසයො සො පහීයති.

තස්ස චෙ භික්ඛවෙ භික්ඛුනො එවං සතස්ස සම්පජානස්ස අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො උප්පජ්ජති අදුක්ඛමසුඛා වෙදනා සො එවං පජානාති: උප්පන්නා ඛො මයායං අදුක්ඛමසුඛා වෙදනා, සා ච ඛො පටිච්ච, නො අපටිච්ච, කිං පටිච්ච, ඉමමෙව කායං පටිච්ච, අයං ඛො පන කායො අනිච්චො සඞ්ඛතො පටිච්චසමුප්පන්නො අනිච්චං ඛො පන සඞ්ඛතං පටිච්චසමුප්පන්නං කායං පටිච්ච උප්පන්නා අදුක්ඛමසුඛා වෙදනා කුතො නිච්චා භවිස්සතීති. සො කායෙ ච අදුක්ඛමසුඛාය ච වෙදනාය අනිච්චානුපස්සී විහරති වයානුපස්සී විහරති, විරාගානුපස්සී විහරති, නිරොධානුපස්සී විහරති. පටිනිස්සග්ගානුපස්සී විහරති. තස්ස කායෙ ච අදුක්ඛමසුඛාය ච වෙදනාය අනිච්චානුපස්සිනො විහරතො වයානුපස්සිනො විහරතො විරාගානුපස්සිනො විහරතො නිරොධානුපස්සිනො විහරතො පටිනිස්සග්ගානු පස්සිනො විහරතො යො කායෙ ච අදුක්ඛමසුඛාය ච වෙදනාය අවිජ්ජානුසයො සො පහීයති.

සො සුඛඤ්චෙ වෙදනං වෙදියති සා අනිච්චාති පජානාති. අනජ්ඣොසිතාති පජානාති, අනභිනන්දිතාති පජානාති; දුක්ඛඤ්චෙ වෙදනං වෙදියති සා අනිච්චාති පජානාති, අනජ්ඣොසිතාති පජානාති අනභිනන්දිතාති පජානාති; අදුක්ඛමසුඛඤ්චෙ වෙදනං වෙදියති සා අනිච්චාති පජානාති, අනජ්ඣොසිතාති පජානාති අනභිනන්දිතාති පජානාති; සො සුඛඤ්චෙ වෙදනං වෙදියති විසඤ්ඤුත්තො නං වෙදියති දුක්ඛඤ්චෙ වෙදනං වෙදියති විසඤ්ඤුත්තො නං වෙදියති, අදුක්ඛමසුඛඤ්චෙ වෙදනං වෙදියති විසඤ්ඤුත්තො නං වෙදියති; සො කායපරියන්තිකං වෙදනං වෙදියමානො කායපරියන්තිකං වෙදනං වෙදියාමීති පජානාති, ජීවිතපරියන්තිකං වෙදනං වෙදියමානො ජීවිතපරියන්තිකං වෙදනං වෙදියාමීති පජානාති; කායස්ස භෙදා උද්ධං ජීවිතපරියාදනා ඉධෙව සබ්බවෙදයිතානි අනභිනන්දිතානි සීතිභවිස්සන්තීති පජානාති.

සෙය්‍යථාපි භික්ඛවෙ තෙලඤ්ච පටිච්ච වට්ටිඤ්ච පටිච්ච තෙලප්පදීපො ඣායෙය්‍ය,[1] තස්සෙව තෙලස්ස ච වට්ටියා ච පරියාදනා අනාහාරො නිබ්බායෙය්‍ය; එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු කායපරියන්තිකං වෙදනං වෙදියමානො කායපරියන්තිකං වෙදනං වෙදියාමීති පජානාති, ජීවිතපරියන්තිකං[2] වෙදනං වෙදියමානො ජීවිතපරියන්තිකං වෙදනං වෙදියාමීති පජානාති, කායස්ස භෙදා උද්ධං ජීවිතපරියාදනා ඉධෙව සබ්බවෙදයිතානි අනභිනන්දිතානි සීතිභවිස්සන්තීති පජානාතී'ති.

1. ඣාපෙය්‍ය - සී 1. 2.
2. ජීවිතස්ස පරියන්තිකං - සී 1.

මහණෙනි, මෙසේ සිහි ඇති ව මනානුවණ ඇති ව නො පමා වූ කෙලෙස් තවන වෙර ඇති ව නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති ව වෙසෙන ඒ මහණහට ඉදින් නොදුක්නොසුව වේදනාවක් උපදී නම් හේ මෙසේ දැනගනී: "මට මේ නොදුක්නොසුව වේදනාවක් උපන. හෙ ද නිසා ය. නොනිසා නො වේ. කුමක් නිසා ද, මේ කය ම නිසා ය. මේ කය අනිත්‍ය ය. සඞ්ඛත ය. පටිච්චසමුප්පන්න ය. අනිත්‍ය වූ සඞ්ඛත වූ පටිච්චසමුප්පන්න වූ කය නිසා උපන් නොදුක්නොසුව වේදනාව කොයින් නිත්‍ය වන්නේ ද, යි. හේ කයෙහිත් නොදුක්නොසුව වේදනාවෙහිත් අනිස අනුව බලනසුලු ව වෙසෙයි. වැය අනුව බලනසුලු ව වෙසෙයි. විරාගය අනුව බලනසුලු ව වෙසෙයි. නිරෝධය අනුව බලනසුලු ව වෙසෙයි. පටිනිස්සග්ගය අනුව බලනසුලු ව වෙසෙයි. කයෙහිත් නොදුක්නොසුව වේදනාවෙහිත් අනිස අනුව බලනසුලු ව වෙසෙන වැය අනුව බලනසුලු ව වෙසෙන විරාගය අනුව බලනසුලු ව වෙසෙන නිරෝධය අනුව බලනසුලු ව වෙසෙන පටිනිස්සග්ගය අනුව බලනසුලු ව වෙසෙන ඔහුට කයෙහිත් නොදුක්නොසුව වේදනාවෙහිත් යම් අවිද්‍යානුසයයෙක් වේ නම් එය ප්‍රහීණ වේ.

හෙ ඉදින් සුවවේදනාවක් විඳී නම් එය අනිස යයි දැනගනී. නො බැසගන්නා ලද යි දැනගනී. නො පිළිගන්නා ලද යි දැනගනී. ඉදින් දුක් වේදනාවක් විඳී නම් එය අනිසැ යි දැනගනී. නොබැසගන්නා ලද යි දැනගනී. නො පිළිගන්නා ලද යි දැනගනී. ඉදින් නොදුක්නොසුව වේදනාවක් විඳී නම් එය අනිසැ යි දැනගනී. නො බැසගන්නා ලද යි දැනගනී. නො පිළිගන්නා ලද යි දැනගනී. හෙතෙමේ ඉදින් සුව වේදනාවක් විඳී නම් කෙලෙසුන්ගෙන් වෙන් ව එය විඳී. ඉදින් දුක් වේදනාවක් විඳී නම් වෙන් ව එය විඳී. ඉදින් නොදුක්නොසුව වේදනාවක් විඳී නම් වෙන් ව එය විඳී. හේ කය කෙළවර කොට ඇති වේදනාවක් විඳුනේ කය කෙළවර කොට ඇති වේදනාවක් විඳිමි යි දැනගනී. දිවි කෙළවර කොට ඇති වේදනාවක් විඳුනේ දිවි කෙළවර කොට ඇති වේදනාවක් විඳිමි යි දැනගනී. කය බිඳීමෙන් දිවි කෙළවර වීමෙන් මතු මෙහි ම සියලු වේදනාවෝ නො පිළිගන්නා ලද්දහු සිහිල් වන්නාහ යි දැනගනී.

මහණෙනි, යම්සේ තෙලත් වැටියත් නිසා තෙල්පහනක් දැල් වෙන්නේ ද, ඒ තෙලත් වැටියත් කෙළවර වීමෙන් ම ප්‍රත්‍යය නැති ව නිවෙන්නේ ද, මහණෙනි, එසෙයින් ම මහණ කය කෙළවර කොට ඇති වේදනාවක් විඳුනේ කය කෙළවර කොට ඇති වේදනාවක් විඳිමි යි දැනගනී. දිවි කෙළවර කොට ඇති වේදනාවක් විඳුනේ දිවි කෙළවර කොට ඇති වේදනාවක් විඳිමි යි දැනගනී. කය බිඳීමෙන් දිවි කෙළවර වීමෙන් මතු මෙහි ම සියලු වේදනාවෝ නො පිළිගන්නා ලද්දහු සිහිල් වන්නාහ යි දැනගනී යි.

## 1. 20. 8

## දුතිය ගෙලඤ්ඤසුත්තං

256. එකං සමයං භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං අථ ඛො භගවා සායන්හසමයං පටිසල්ලාණා[1] වුට්ඨිතො යෙන ගිලානසාලා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි, නිසජ්ජ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: සතො භික්ඛවෙ භික්ඛු සම්පජානො කාලං ආගමෙය්‍ය, අයං වො අම්හාකං අනුසාසනී.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු සතො හොති; ඉධ භික්ඛවෙ භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං; වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං, එවං ඛො භික්ඛවෙ භික්ඛු සතො හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු සම්පජානො හොති: ඉධ භික්ඛවෙ භික්ඛු අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති, ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති, සම්මිඤ්ජිතෙ පසාරිතෙ සම්පජානකාරී හොති, සඞ්ඝාටිපත්තචීවරධාරණෙ සම්පජානකාරී හොති, අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ සම්පජානකාරී හොති, උච්චාරපස්සාවකම්මෙ සම්පජානකාරී හොති, ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජානකාරී හොති; එවං ඛො භික්ඛවෙ භික්ඛු සම්පජානො හොති. සතො භික්ඛවෙ භික්ඛු සම්පජානො කාලං ආගමෙය්‍ය, අයං වො අම්හාකං අනුසාසනී.

තස්ස චෙ භික්ඛවෙ භික්ඛුනො එවං සතස්ස සම්පජානස්ස අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො උප්පජ්ජති සුඛා වෙදනා, සො එවං පජානාති. උප්පන්නා ඛො ම්‍යායං සුඛා වෙදනා සා ච ඛො පටිච්ච, නො අපටිච්ච, කිං පටිච්ච, ඉමමෙව ඵස්සං පටිච්ච, අයං ඛො පන ඵස්සො අනිච්චො සඞ්ඛතො පටිච්චසමුප්පන්නො, අනිච්චං ඛො පන සඞ්ඛතං පටිච්චසමුප්පන්නං ඵස්සං පටිච්ච උප්පන්නා සුඛා වෙදනා කුතො නිච්චා භවිස්සතීති.

---

1. පටිසල්ලානා - සී 2.

## 1. 20. 8

## දුතිය ගෙලඤ්ඤ සූත්‍රය

256. **එක්සමයෙක්හි** භාග්‍යවතුන් වහන්සේ **විසල්පුර** සමීපයෙහි මහවෙනෙහි **කුළුගෙහල්හි** වැඩවසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ **සවස්කල පලසමවතින්** නැඟී **සිටි** සේක් ගිලන්හල වෙත **එළඹී** සේක. **එළඹ** පැන වූ අස්නෙහි වැඩහුන් සේක. වැඩහිඳ භාග්‍යවතුන් වහන්සේ **භික්ෂූන්** ඇමතූ සේක. මහණෙනි, මහණ සිහි ඇත්තේ මනා දැනුම් ඇත්තේ (පරිනිර්වාණ) කාලය අපේක්‍ෂා කරන්නේ ය. මහණෙනි, මේ තොපට අපගේ අනුශාසනාව යි.

මහණෙනි, මහණ කෙසේ නම් සිහි ඇත්තේ වේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ කයෙහි කය අනු ව බලනසුලු ව කෙලෙස් තවන වෙර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව කායලෙව්හි අභිජ්ඣාව හා දෙමනස්සය දුරු කොට වෙසෙයි. වේදනාවන්හි ...සිතෙහි...දහම්හි දහම් අනු ව බලනසුලු ව කෙලෙස් තවන වෙර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව දහම් ලෙව්හි අභිජ්ඣාව හා දෝමනස්සය දුරු කොට වෙසේ. මහණෙනි, මෙසේ මහණ සිහි ඇත්තේ වේ.

මහණෙනි, මහණ කෙසේ නම් මනාදැනුම් ඇත්තේ වේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ ඉදිරි ගමන්හි පෙරළා ගමන්හි මනාදැනුම් ඇති ව කරනසුලු වෙයි. ඉදිරි බැලුම්හි අවට බැලුම්හි මනාදැනුම් ඇති ව කරනසුලු වෙයි. අත් පා හැකිළුම්හි දිගහැරීම්හි මනාදැනුම් ඇති ව කරනසුලු වෙයි. සඟළ පාසිවුරු දැරුම්හි මනාදැනුම් ඇති ව කරනසුලු වෙයි. කෑමෙහි පීමෙහි කඩා කෑමෙහි රස විඳීමෙහි මනාදැනුම් ඇති ව කරනසුලු වෙයි. මලමු කිසෙහි මනාදැනුම් ඇති ව කරනසුලු වෙයි. ගමන්හි සිටුම්හි හිඳුම්හි නිදීම්හි නිදිවැරුම්හි කියුම්හි නිහඬබැව්හි මනාදැනුම් ඇති ව කරනසුලු වෙයි. මහණෙනි, මෙසේ මහණ මනාදැනුම් ඇත්තේ වෙයි. මහණෙනි, මහණ සිහි ඇත්තේ මනාදැනුම් ඇත්තේ කාලය අපේක්‍ෂා කරන්නේ ය. මේ අපගේ අනුශාසනා යි.

මහණෙනි, මෙසේ සිහි ඇති ව මනාදැනුම් ඇති ව නො පමා ව කෙලෙස් තවන වෙර ඇති ව නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති ව වෙසෙන ඒ මහණහුට ඉදින් සුවවේදනාවක් උපදී නම් හේ මෙසේ දැනගනී. මට මේ සුවවෙදනාවක් උපන. එ ද නිසා ය. නො නිසා නො වේ. කුමක් නිසා ද, මේ ස්පර්ශය ම නිසා ය. මේ ස්පර්ශය අනිස ය, සඞ්ඛත ය, පටිච්චසමුප්පන්න ය. අනිස වූ සඞ්ඛත වූ පටිච්චසමුප්පන්න වූ ස්පර්ශය නිසා උපන් සුවවේදනාව කොයින් නිත්‍ය වන්නේ දැ?යි.

සො ඵස්සෙ ච සුඛාය ච වෙදනාය අනිච්චානුපස්සී විහරති, වයානුපස්සී විහරති, විරාගානුපස්සී විහරති, නිරොධානුපස්සී විහරති, පටිනිස්සග්ගානුපස්සී විහරති; තස්ස ඵස්සෙ ච සුඛාය ච වෙදනාය අනිච්චානුපස්සිනො විහරතො වයානුපස්සිනො විහරතො විරාගානුපස්සිනො විහරතො නිරොධානුපස්සිනො විහරතො පටිනිස්සග්ගානුපස්සිනො විහරතො යො ඵස්සෙ ච සුඛාය ච වෙදනාය රාගානුසයො සො පහීයති.

තස්ස චෙ භික්ඛවෙ භික්ඛුනො එවං සතස්ස එවං සම්පජානස්ස අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො උප්පජ්ජති දුක්ඛා වෙදනා, සො එවං පජානාති: උප්පන්නා ඛො ම්‍යායං දුක්ඛා වෙදනා, සා ච ඛො පටිච්ච, නො අපටිච්ච. කිං පටිච්ච, ඉමමෙව ඵස්සං පටිච්ච, අයං ඛො පන ඵස්සො අනිච්චො සඞ්ඛතො පටිච්චසමුප්පන්නො, අනිච්චං ඛො පන සඞ්ඛතං පටිච්චසමුප්පන්නං ඵස්සං පටිච්ච උප්පන්නා දුක්ඛා වෙදනා කුතො නිච්චා භවිස්සතීති.

සො ඵස්සෙ ච දුක්ඛාය ච වෙදනාය අනිච්චානුපස්සී විහරති, වයානුපස්සී විහරති, විරාගානුපස්සී විහරති, නිරොධානුපස්සී විහරති, පටිනිස්සග්ගානුපස්සී විහරති: තස්ස ඵස්සෙ ච දුක්ඛාය ච වෙදනාය අනිච්චානුපස්සිනො විහරතො වයානුපස්සිනො විහරතො විරාගානුපස්සිනො විහරතො නිරොධානුපස්සිනො විහරතො පටිනිස්සග්ගයානුපස්සිනො විහරතො යො ඵස්සෙ ච දුක්ඛාය ච වෙදනාය පටිඝානුසයො සො පහීයති.

තස්ස චෙ භික්ඛවෙ භික්ඛුනො එවං සතස්ස සම්පජානස්ස අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො උප්පජ්ජති අදුක්ඛමසුඛා වෙදනා, සො එවං පජානාති: උප්පන්නා ඛො ම්‍යායං අදුක්ඛමසුඛා වෙදනා: සා ච ඛො පටිච්ච, නො අපටිච්ච. කිඤ්ච පටිච්ච, ඉමමෙව ඵස්සං පටිච්ච අයං ඛො පන ඵස්සො අනිච්චො සඞ්ඛතො පටිච්චසමුප්පන්නො, අනිච්චං ඛො පන සඞ්ඛතං පටිච්චසමුප්පන්නං ඵස්සං පටිච්ච උප්පන්නා අදුක්ඛමසුඛා වෙදනා කුතො නිච්චා භවිස්සතීති.

හේ ස්පර්ශයෙහිත් සුවවේදනාවෙහිත් අනිස අනුව බලනසුලු ව වෙසෙයි. වැය අනුව බලනසුලු ව වෙසෙයි. විරාගය අනුව බලනසුලු ව වෙසෙයි. නිරෝධය අනුව බලනසුලු ව වෙසෙයි. පටිනිස්සග්ගය අනුව බලනසුලු ව වෙසෙයි. ස්පර්ශයෙහිත් සුවවේදනාවෙහිත් අනිස අනුව බලනසුලු ව වෙසෙන වැය අනුව බලනසුලු ව වෙසෙන විරාගය අනුව බලනසුලු ව වෙසෙන නිරෝධය අනුව බලනසුලු ව වෙසෙන පටිනිස්සග්ගය අනුව බලනසුලු ව වෙසෙන ඔහුට ස්පර්ශයෙහිත් සුවවේදනාවෙහිත් යම් රාගානුසයයෙක් වේ නම් එය ප්‍රහීණ වෙයි.

මහණෙනි, මෙසේ සිහි ඇති ව මනාදැනුම් ඇති ව නොපමා ව කෙලෙස් තවන වෙර ඇති ව නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති ව වෙසෙන ඒ මහණහුට ඉදින් දුක්වේදනාවක් උපදී නම් හේ මෙසේ දැනගනී. මට මේ දුක්වේදනාවක් උපන. එ ද නිසා ය, නොනිසා නො වෙයි. කුමක් නිසා ද, මේ ස්පර්ශයම නිසා ය. මේ ස්පර්ශය අනිස ය. සඞ්ඛත ය, පටිච්චසමුප්පන්න ය අනිස වූ සඞ්ඛත වූ පටිච්චසමුප්පන්න වූ ස්පර්ශය නිසා උපන් දුක්වේදනාව කොයින් නිත්‍ය වන්නේ දැ' යි.

හෙතෙමේ ස්පර්ශයෙහිත් දුක්වේදනාවෙහිත් අනිස අනුව බලනසුලු ව වෙසෙයි. වැය අනුව බලනසුලු ව වෙසෙයි. විරාගය අනුව බලනසුලු ව වෙසෙයි. නිරෝධය අනුව බලනසුලු ව වෙසෙයි. පටිනිස්සග්ගය අනුව බලනසුලු ව වෙසෙයි. ස්පර්ශයෙහිත් දුක්වේදනාවෙහිත් අනිස අනුව බලනසුලු ව වෙසෙන වැය අනුව බලනසුලු ව වෙසෙන විරාගය අනුව බලනසුලු ව වෙසෙන නිරොධය අනුව බලනසුලු ව වෙසෙන පටිනිස්සග්ගය අනුව බලනසුලු ව වෙසෙන ඒ මහණහුට ස්පර්ශයෙහිත් දුක්වේදනාවෙහිත් යම් පටිසානුසයයෙක් වේ නම් එය ප්‍රහීණ වෙයි.

මහණෙනි, මෙසේ සිහි ඇති ව මනාදැනුම් ඇති ව නොපමා ව කෙලෙස් තවන වෙර ඇති ව නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති ව වෙසෙන ඒ මහණහට ඉදින් නොදුක්නොසුව වේදනාවක් උපදී නම් හේ මෙසේ දැනගනී:

මට මේ නොදුක්නොසුව වේදනාවක් උපන. එ ද නිසා ය. නොනිසා නො වෙයි. කුමක් නිසා ද, මේ ස්පර්ශය ම නිසා ය. මේ ස්පර්ශය අනිස ය, සඞ්ඛත ය, පටිච්චසමුප්පන්න ය. අනිස වූ සඞ්ඛත වූ පටිච්චසමුප්පන්න වූ ස්පර්ශය නිසා උපන් මැදහත් වේදනාව කොයින් නිත්‍ය වන්නේ දැ' යි.

සො එසෙ ච අදුක්ඛමසුඛාය ච වෙදනාය අනිච්චානුපස්සී විහරති, වයානුපස්සී විහරති, විරාගානුපස්සී විහරති, නිරොධානුපස්සී විහරති, පටිනිස්සග්ගානුපස්සී විහරති, තස්ස එසෙ ච අදුක්ඛමසුඛායච වෙදනාය අනිච්චානුපස්සිනො විහරතො වයානුපස්සිනො විහරතො විරාගානුපස්සිනො විහරතො නිරොධානුපස්සිනො විහරතො පටිනිස්සග්ගානුපස්සිනො විහරතො යො එසෙ ච අදුක්ඛමසුඛාය ච වෙදනාය අවිජ්ජානුසයො සො පහීයති.

සො සුඛඤ්චෙ වෙදනං වෙදියති: සා අනිච්චාති පජානාති, අනජ්ඣොසිතාති පජානාති, අනභිනන්දිතාති පජානාති, දුක්ඛඤ්චෙ වෙදනං වෙදියති -පෙ- අදුක්ඛමසුඛඤ්චෙ වෙදනං වෙදියති; සා අනිච්චාති පජානාති අනජ්ඣොසිතාති පජානාති, අනභිනන්දිතාති පජානාති. සො සුඛඤ්චෙ වෙදනං වෙදියති විසඤ්ඤුත්තො නං වෙදියති දුක්ඛඤ්චෙ වෙදනං වෙදියති -පෙ- අදුක්ඛමසුඛඤ්චෙ වෙදනං වෙදියති විසඤ්ඤුත්තො නං වෙදියති. සො කායපරියන්තිකං වෙදනං වෙදියමානො කායපරියන්තිකං වෙදනං වෙදියාමීති පජානාති, ජීවිතපරියන්තිකං වෙදනං වෙදියමානො ජීවිතපරියන්තිකං වෙදනං වෙදියාමීති පජානාති. කායස්ස භෙදා උද්ධං ජීවිතපරියාදනා ඉධෙව සබ්බවෙදයිතානි අනභිනන්දිතානි සීතිභවිස්සන්තීති පජානාති.

සෙය්‍යථාපි භික්ඛවෙ තෙලඤ්ච පටිච්ච වට්ටිඤ්ච පටිච්ච තෙලප්පදීපො ඣායෙය්‍ය තස්සෙව තෙලස්ස ච වට්ටියා ච පරියාදනා අනාහාරො නිබ්බායෙය්‍ය, එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු කායපරියන්තිකං වෙදනං වෙදියමානො කායපරියන්තිකං වෙදනං වෙදියාමීති පජානාති, ජීවිතපරියන්තිකං වෙදනං වෙදියමානො ජීවිතපරියන්තිකං වෙදනං වෙදියාමීති පජානාති. කායස්ස භෙදා උද්ධං ජීවිතපරියාදනා ඉධෙව සබ්බවෙදයිතානි අනභිනන්දිතානි සීතිභවිස්සන්තීති පජානාතීති.

## 1. 20. 9

## අනිච්චසුත්තං

257. තිස්සො ඉමා භික්ඛවෙ වෙදනා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධධම්මා කතමා තිස්සො: සුඛා වෙදනා දුක්ඛා වෙදනා අදුක්ඛමසුඛා වෙදනා ඉමා ඛො භික්ඛවෙ තිස්සො වෙදනා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධධම්මාති.

හෙතෙමේ ස්පර්ශයෙහිත් මැදහත් වේදනාවෙහිත් අනිස අනුව බලනසුලු ව වෙසෙයි. වැය අනුව බලනසුලු ව වෙසෙයි. විරාගය අනුව බලනසුලු ව වෙසෙයි. නිරෝධය අනුව බලනසුලු ව වෙසෙයි. පටිනිස්සග්ගය අනුව බලනසුලු ව වෙසෙයි. ස්පර්ශයෙහිත් මැදහත් වේදනාවෙහිත් අනිස අනුව බලනසුලු ව වෙසෙන වැය අනුව බලනසුලු ව වෙසෙන විරාගය අනුව බලනසුලු ව වෙසෙන නිරොධය අනුව බලනසුලු ව වෙසෙන පටිනිස්සග්ගය අනුව බලනසුලු ව වෙසෙන ඔහුට ස්පර්ශයෙහිත් මැදහත් වේදනාවෙහිත් යම් අවිජ්ජානුසයයෙක් වේ නම් එය ප්‍රහීණ වෙයි.

ඉදින් හේ සුවවේදනාවක් විඳී නම් එය අනිසැ යි දැනගනී. නො බැසගන්නා ලදැ යි දැනගනී. නො පිළිගන්නා ලදැ යි දැනගනී. ඉදින් දුක්වේදනාවක් විඳී නම් .. ඉදින් මැදහත් වේදනාවක් විඳී නම් එය අනිසැ යි දැනගනී. නො බැසගන්නා ලදැ යි දැනගනී. නො පිළිගන්නා ලදැ යි දැනගනී. ඉදින් හෙ සුවවේදනාවක් විඳී නම (කෙලෙසුන්ගෙන්) වෙන් ව එය විඳී. ඉදින් දුක් වේදනාවක් විඳී නම් ... ඉදින් මැදහත් වේදනාවක් විඳී නම් වෙන් ව එය විඳී. හෙතෙමේ කය කෙළවර කොට ඇති වේදනාවක් විඳුනේ කය කෙළවර කොට ඇති වේදනාවක් විඳිමි යි දැනගනී. දිවි කෙළවර කොට ඇති වේදනාවක් විඳුනේ දිවි කෙළවර කොට ඇති වේදනාවක් විඳිමි යි දැනගනී. කය බිඳීමෙන් දිවි කෙළවර වීමෙන් මතු මෙහි ම සියලු වේදනාවෝ නො පිළිගන්නා ලද්දහු සිහිල් වන්නාහ යි දැනගනී.

මහණෙනි, යම්සේ තෙලත් නිසා වැටියත් නිසා තෙල්පහන දැල්වෙන්නේ ද ඒ තෙලත් වැටියත් කෙළවර වීමෙන් ප්‍රත්‍යය රහිත ව නිවෙන්නේද, මහණෙනි, එසෙයින්ම කය කෙළවර කොට ඇති වේදනාවක් විඳුනේ කය කෙළවර කොට ඇති වේදනාවක් විඳිමි යි දැනගනී. දිවි කෙළවර කොට ඇති වේදනාවක් විඳුනේ දිවි කෙළවර කොට ඇති වේදනාවක් විඳිමි යි දැනගනී. කය බිඳීමෙන් දිවි කෙළවර වීමෙන් මතු මෙහි ම සියලු වේදනාවෝ නො පිළිගන්නා ලද්දහු සිහිල් වන්නාහ යි දැනගනී යි.

## 1. 20. 9

## අනිච්ච සූත්‍රය

257 මහණෙනි, අනිච්ච වූ සඞ්ඛත වූ පටිච්චසමුප්පන්න වූ ඛයධම්ම වූ වයධම්ම වූ විරාගධම්ම වූ නිරොධධම්ම වූ මේ වේදනා තුනෙකි. කවර තුනෙක් ද යත්: සුවවේදනාව ය දුක් වෙදනාව ය නොදුක්නොසුව වෙදනාව යයි. මහණෙනි, මේ වෙදනා තුන අනිච්ච ය. සඞ්ඛත ය. පටිච්චසමුප්පන්න ය. ඛයධම්ම ය. වයධම්ම ය. විරාගධම්ම ය. නිරොධධම්ම යි.

## 1. 20. 10

## ඵස්සමූලකසුත්තං

258. තිස්සො ඉමා භික්ඛවෙ වෙදනා ඵස්සජා ඵස්සමූලකා ඵස්සනිදානා ඵස්සපච්චයා. කතමා තිස්සො: සුඛා වෙදනා දුක්ඛා වෙදනා අදුක්ඛමසුඛා වෙදනා. සුඛවෙදනියං භික්ඛවෙ ඵස්සං පටිච්ච උප්පජ්ජති සුඛා වෙදනා. තස්සෙව සුඛවෙදනියස්ස ඵස්සස්ස නිරොධා යං තජ්ජං වෙදයිතං, සුඛවෙදනියං ඵස්සං පටිච්ච උප්පන්නා සුඛා වෙදනා සා නිරුජ්ඣති, සා වූපසම්මති;

දුක්ඛවෙදනියං භික්ඛවෙ ඵස්සං පටිච්ච උප්පජ්ජති දුක්ඛා වෙදනා තස්සෙව දුක්ඛවෙදනියස්ස ඵස්සස්ස නිරොධා යං තජ්ජං වෙදයිතං දුක්ඛවෙදනියං ඵස්සං පටිච්ච උප්පන්නා දුක්ඛා වෙදනා සා නිරුජ්ඣති, සා වූපසම්මති. අදුක්ඛමසුඛවෙදනියං භික්ඛවෙ ඵස්සං පටිච්ච උප්පජ්ජති අදුක්ඛමසුඛා වෙදනා. තස්සෙව අදුක්ඛමසුඛවෙදනියස්ස ඵස්සස්ස නිරොධා යං තජ්ජං වෙදයිතං අදුක්ඛමසුඛවෙදනියං ඵස්සං පටිච්ච උප්පන්නා අදුක්ඛමසුඛා වෙදනා සා නිරුජ්ඣති, සා වූපසම්මති.

සෙය්‍යථාපි භික්ඛවෙ ද්වින්නං කට්ඨානං සඞ්ඝට්ටනසමොධානා උස්මා ජායති තෙජො අභිනිබ්බත්තති, තෙසං යෙව කට්ඨානං නානාභාවා විනික්ඛෙපා යා තජ්ජා උස්මා සා නිරුජ්ඣති, සා වූපසම්මති,[1] එවමෙව ඛො භික්ඛවෙ ඉමා තිස්සො වෙදනා ඵස්සජා ඵස්සමූලකා ඵස්සනිදානා ඵස්සපච්චයා තජ්ජං තජ්ජං ඵස්සං පටිච්ච තජ්ජා තජ්ජා වෙදනා උප්පජ්ජන්ති. තජ්ජස්ස තජ්ජස්ස ඵස්සස්ස නිරොධා තජ්ජා තජ්ජා වෙදනා නිරුජ්ඣන්තීති.[2]

### සගාථාවග්ගො පඨමො.

තත්‍රුද්දානං:

සමාධි සුඛ පහානෙන පාතාලං දට්ඨබ්බෙන ච
සල්ලෙන ච ගෙලඤ්ඤෙහි අනිච්ච ඵස්සමූලකාති.

1. වූපසමති - සයා.
2. තජ්ජං ඵස්සං පටිච්ච තජ්ජා වෙදනා උප්පජ්ජති තජ්ජස්ස ඵස්සස්ස නිරොධා තජ්ජා වෙදනා නිරුජ්ඣති - මජසං, සයා.

# 1. 20. 10

## ඵස්සමූලක සූත්‍රය

258. මහණෙනි, ස්පර්ශයෙන් හටගත් ස්පර්ශය මුල් කොට ඇති ස්පර්ශය නිදාන කොට ඇති ස්පර්ශය ප්‍රත්‍යය කොට ඇති මේ වේදනා තුනකි. කවර තුනෙක් ද යත්: සුවවේදනාව ය දුක් වේදනාව ය නොදුක්නොසුව වේදනාව යි. මහණෙනි, සුවවේදනාවට කරුණු වූ ස්පර්ශය නිසා සුවවේදනාව උපදී. සුව වේදනාවට කරුණු වූ ඒ ස්පර්ශයේ ම නිරෝධයෙන් එයින් හටගත් යම් වේදනාවක් වේ ද සුවවේදනාවට කරුණු වූ පහස නිසා උපන් ඒ සුව වේදනාව නිරුද්ධ වේ. එය සන්හිඳේ.

මහණෙනි, දුක්වේදනාවට කරුණු වූ පහස නිසා දුක්වේදනාව උපදී. දුක්වේදනාවට කරුණු වූ ඒ පහස්හි ම නිරෝධයෙන් එයින් හටගත් යම් වේදනාවක් වේ ද, දුක්වේදනාවට කරුණු වූ පහස නිසා උපන් ඒ දුක්වේදනාව නිරුද්ධ වේ. එය සන්හිඳේ. මහණෙනි, මැදහත් වේදනාවට කරුණු වූ පහස නිසා මැදහත් වේදනාව උපදී. මැදහත් වේදනාවට කරුණු වූ ඒ පහස්හි ම නිරොධයෙන් එයින් හටගත් යම් වේදනාවක් වේ ද මැදහත් වේදනාවට කරුණු වූ පහස නිසා උපන් ඒ මැදහත් වේදනාව නිරුද්ධ වේ. එය සන්හිඳේ.

මහණෙනි, යම්සේ දඬු දෙකක ගැටීමෙන් එකතුවීමෙන් උණුසුම උපදී ද, ගින්න හටගනී ද, ඒ දඬු දෙකෙහි ම වෙන් වීමෙන් ඈත් වීමෙන් එයින් හටගත් යම් උණුසුමක් වේ නම් එය නිරුද්ධ වේ ද, එය සන්හිඳේ ද, මහණෙනි, එසෙයින් ම මේ වේදනා තුන ඵස්සයෙන් හටගත්තේ ය. ඵස්සය මුල් කොට ඇත්තේ ය. ඵස්සය නිදාන කොට ඇත්තේ ය. ඵස්සය ප්‍රත්‍යය කොට ඇත්තේ ය. එයින් එයින් හටගත් ඵස්සය නිසා එයින් එයින් හටගත් වෙදනාව උපදී. එයින් එයින් හටගත් ඵස්සයේ නිරොධයෙන් එයින් එයින් හටගත් වෙදනා නිරුද්ධ වේ යි.

## පළමුවැනි සගාථාවර්ග යි.

**එහි සූත්‍රනාමාවලිය:**

සමාධි, සුඛ, පහාන, පාතාල, දට්ඨබ්බ, සල්ල යන සූත්‍ර සයය. ගෙලඤ්ඤසූත්‍ර දෙකය අනිච්චඵස්සමූලක සූත්‍ර දෙක යයි සූත්‍ර දශයෙකි.

# 2. රහොගතවග්ගො

## 2. 2. 1

### රහොගතසුත්තං

259. අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: ඉධ මය්හං භන්තෙ රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: තිස්සො වෙදනා වුත්තා භගවතා, සුඛා වෙදනා, දුක්ඛා වෙදනා, අදුක්ඛමසුඛා වෙදනා. ඉමා තිස්සො වෙදනා වුත්තා භගවතා. වුත්තං ඛො පනෙතං භගවතා: යං කිඤ්චි වෙදයිතං තං දුක්ඛස්මින්ති. කින්නු ඛො එතං ච භගවතා සන්ධාය භාසිතං; යං කිඤ්චි වෙදයිතං තං දුක්ඛස්මින්ති.

සාධු සාධු භික්ඛු, තිස්සො ඉමා භික්ඛු වෙදනා වුත්තා මයා, සුඛා වෙදනා, දුක්ඛා වෙදනා, අදුක්ඛමසුඛා වෙදනා, ඉමා තිස්සො වෙදනා වුත්තා මයා. වුත්තං ඛො පනෙතං භික්ඛු මයා යං කිඤ්චි වෙදයිතං තං[1] දුක්ඛස්මින්ති. තං ඛො පනෙතං භික්ඛු මයා සඞ්ඛාරානඤ්ඤෙව අනිච්චතං සන්ධාය භාසිතං: යං කිඤ්චි වෙදයිතං තං දුක්ඛස්මින්ති. තං ඛො පනෙතං භික්ඛු මයා සඞ්ඛාරානඤ්ඤෙව[2] ඛයධම්මතං සන්ධාය භාසිතං: යං කිඤ්චි වෙදයිතං තං දුක්ඛස්මින්ති. තං ඛො පනෙතං භික්ඛු මයා සඞ්ඛාරානඤ්ඤෙව[2] වයධම්මතං සන්ධාය භාසිතං: යං කිඤ්චි වෙදයිතං තං දුක්ඛස්මින්ති. තං ඛො පනෙතං භික්ඛු මයා සඞ්ඛාරානඤ්ඤෙව විරාගධම්මතං සන්ධාය භාසිතං: යං කිඤ්චි වෙදයිතං තං දුක්ඛස්මින්ති. තං ඛො පනෙතං භික්ඛු මයා සඞ්ඛාරානඤ්ඤෙව නිරොධධම්මතං සන්ධාය භාසිතං: යං කිඤ්චි වෙදයිතං තං දුක්ඛස්මින්ති. තං ඛො පනෙතං භික්ඛු මයා සඞ්ඛාරානඤ්ඤෙව විපරිණාමධම්මතං සන්ධාය භාසිතං: යං කිඤ්චි වෙදයිතං තං දුක්ඛස්මින්ති.

අථ ඛො පන භික්ඛු මයා අනුපුබ්බ[3]සඞ්ඛාරානං නිරොධො අක්ඛාතො, පඨමං ඣානං සමාපන්නස්ස වාචා නිරුද්ධා හොති, දුතියං ඣානං සමාපන්නස්ස විතක්කවිචාරා නිරුද්ධා හොන්ති, තතියං ඣානං සමාපන්නස්ස පීති නිරුද්ධා හොති, චතුත්ථං ඣානං සමාපන්නස්ස අස්සාසපස්සාසා නිරුද්ධා හොන්ති, ආකාසානඤ්චායතනං සමාපන්නස්ස රූපසඤ්ඤා නිරුද්ධා හොති, විඤ්ඤාණඤ්චායතනං සමාපන්නස්ස ආකාසානඤ්චායතනසඤ්ඤා නිරුද්ධා හොති, ආකිඤ්චඤ්ඤායතනං සමාපන්නස්ස විඤ්ඤාණඤ්චායතනසඤ්ඤා නිරුද්ධා හොති, නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමාපන්නස්ස ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤා නිරුද්ධා හොති, සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නස්ස සඤ්ඤා ච වෙදනා ච නිරුද්ධා හොන්ති, ඛීණාසවස්ස භික්ඛුනො රාගො නිරුද්ධො හොති දොසො නිරුද්ධො හොති, මොහො නිරුද්ධො හොති.

1. සබ්බන්තං - සී 1.
2. සඞ්ඛාරානං - යෙව - සී 1, 2.
3. අනුපුබ්බං - සී 1, 2.

# 2. රහොගත වර්ගය

## 2. 2. 1

## රහෝගත සූත්‍රය

259. එකල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. ... එකත්පස් ව හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේය: වහන්ස, "මෙහි එකලා වූ විවේකයෙන් යුත් මට මෙබඳු චිත්තවිතර්කයෙක් පහළ විය. වේදනා තුනක් භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද, සුවවේදනාවය, දුක්වේදනාවය, මැදහත්වේදනාවය"යි. මේ වේදනා තුන භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලදී. "යම්කිසි වේදනාවක් වේ නම් එය දුකැ"යි මෙ ද භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලදී. යම් කිසි වේදනාවක් වේ නම් එය දුකැ'යි යන මෙය කුමක් සඳහා භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද ද යි.

මහණ, මැනව. මැනව මහණ, මේ වේදනා තුනක් මවිසින් දෙසන ලදි. සුවවේදනාය, දුක්වේදනාය, මැදහත්වේදනාය යි. මේ වේදනා තුන මා විසින් දෙසන ලදී. මහණ, යම් කිසි වේදනාවක් වේ නම් එය දුකැ යි මෙ ද මා විසින් දෙසන ලදි. මහණ, යම්කිසි වේදනාවක් වේ නම් එය දුකැ යි ඒ මෙය මා විසින් සංස්කාරයන්ගේ ම අනිස බව සඳහා දෙසන ලදි. මහණ, යම් කිසි වේදනාවක් වේ නම් ඒ මෙය මා විසින් සංස්කාරයන්ගේ ම ක්‍ෂය ස්වභාවය සඳහා දෙසන ලදි. මහණ, යම් කිසි වේදනාවක් වේ නම් එය දුකැ යි ඒ මෙය මා විසින් සංස්කාරයන්ගේ ම ව්‍යය ස්වභාවය සඳහා දෙසන ලදි. මහණ, යම්කිසි වේදනාවක් වේ නම් එය දුකැ යි ඒ මෙය මා විසින් සංස්කාරයන්ගේ ම විරාගස්වභාවය සඳහා දෙසන ලදි. මහණ, යම්කිසි වේදනාවක් වේ නම් එය දුකැ යි ඒ මෙය මා විසින් සංස්කාරයන්ගේ ම නිරෝධස්වභාවය සඳහා දෙසන ලදි. මහණ, යම්කිසි වේදනාවක් වේ නම් එය දුකැ යි ඒ මෙය මා විසින් සංස්කාරයන්ගේ ම විපරිණාමස්වභාවය සඳහා දෙසන ලදි.

එතෙකුදුවත් මහණ, මා විසින් සංස්කාරයන්ගේ අනුපූර්ව නිරෝධය පවසන ලද්දේ ය. පළමු ධ්‍යානයට සමවන්නහුට වචනය නිරුද්ධ වූයේ වේ. දෙවන ධ්‍යානයට සමවන්නහුට විතර්ක විචාරයෝ නිරුද්ධ වෙති. තුන් වන ධ්‍යානයට සමවන්නහුට ප්‍රීතිය නිරුද්ධ වූවා වෙයි. සිවුවන ධ්‍යානයට සමවන්නහුට ආශ්වාසප්‍රශ්වාසයෝ නිරුද්ධ වූවාහු වෙති. ආකාසානඤ්චායතනයට සමවන්නහුට රූපසංඥා නිරුද්ධ වූවා වෙයි. විඤ්ඤාණඤ්චායතනයට සමවන්නහුට ආකාසානඤ්චායතන සංඥා නිරුද්ධ වූවා වෙයි. ආකිඤ්චඤ්ඤායතනයට සමවන්නහුට විඤ්ඤාණඤ්චායතන සංඥා නිරුද්ධ වූවා වෙයි. නේවසඤ්ඤානාසඤ්ඤායතනයට සමවන්නහුට ආකිඤ්චඤ්ඤායතන සංඥා නිරුද්ධ වූවා වෙයි. සඤ්ඤාවෙදයිත නිරෝධයට සමවන්නහුට සංඥාත් වේදනාත් නිරුද්ධ වූවා වෙත්. රහත් මහණහුට රාගය නිරුද්ධ වූයේ වෙයි. ද්වෙසය නිරුද්ධ වූයේ වෙයි. මෝහය නිරුද්ධ වූයේ වෙයි.

අථ ඛො පන භික්ඛු මයා අනුපුබ්බසඞ්ඛාරානං වූපසමො අක්ඛාතො, පඨමං ඣානං සමාපන්නස්ස වාචා වූපසන්තා හොති, දුතියං ඣානං සමාපන්නස්ස විතක්කවිචාරා වූපසන්තා හොන්ති, තතියං ඣානං සමාපන්නස්ස පීති වූපසන්තා හොති, චතුත්ථං ඣානං සමාපන්නස්ස අස්සාසපස්සාසා වූපසන්තා හොන්ති, ආකාසානඤ්චායතනං සමාපන්නස්ස රූපසඤ්ඤා වූපසන්තා හොති, විඤ්ඤාණඤ්චායතනං සමාපන්නස්ස ආකාසානඤ්චායතනසඤ්ඤා වූපසන්තා හොති, ආකිඤ්චඤ්ඤායතනං සමාපන්නස්ස විඤ්ඤාණඤ්චායතනසඤ්ඤා වූපසන්තා හොති, නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමාපන්නස්ස ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤා වූපසන්තා හොති, සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නස්ස සඤ්ඤා ච වෙදනා ච වූපසන්තා හොන්ති, ඛීණාසවස්ස භික්ඛුනො රාගො වූපසන්තො හොති, දොසො වූපසන්තො හොති, මොහො වූපසන්තො හොති.

ඡයිමා භික්ඛු පස්සද්ධියො: පඨමං ඣානං සමාපන්නස්ස වාචා පටිප්පස්සද්ධා හොති, දුතියං ඣානං සමාපන්නස්ස විතක්කවිචාරා පටිප්පස්සද්ධා හොන්ති, තතියං ඣානං සමාපන්නස්ස පීති පටිප්පස්සද්ධා හොති, චතුත්ථං ඣානං සමාපන්නස්ස අස්සාසපස්සාසා පටිප්පස්සද්ධා හොන්ති, සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නස්ස සඤ්ඤා ච වෙදනා ච පටිප්පස්සද්ධා හොන්ති, ඛීණාසවස්ස භික්ඛුනො රාගො පටිප්පස්සද්ධො හොති, දොසො පටිප්පස්සද්ධො හොති, මොහො පටිප්පස්සද්ධො හොතීති.

## 2. 2. 2

## ආකාසසුත්තං

260. සෙය්‍යථාපි භික්ඛවෙ ආකාසෙ විවිධා වාතා වායන්ති: පුරත්ථිමාපි වාතා වායන්ති, පච්ඡිමාපි වාතා වායන්ති, උත්තරාපි වාතා වායන්ති, දක්ඛිණාපි වාතා වායන්ති, සරජාපි වාතා වායන්ති, අරජාපි වාතා වායන්ති, සීතාපි වාතා වායන්ති, උණ්හාපි වාතා වායන්ති, පරිත්තාපි වාතා වායන්ති, අධිමත්තාපි වාතා වායන්ති. එවමෙව ඛො භික්ඛවෙ ඉමස්මිං කායස්මිං විවිධා වෙදනා උප්පජ්ජන්ති: සුඛාපි වෙදනා උප්පජ්ජන්ති, දුක්ඛාපි වෙදනා උප්පජ්ජන්ති, අදුක්ඛමසුඛාපි වෙදනා උප්පජ්ජන්ති''ති.

යථාපි වාතා ආකාසෙ වායන්ති විවිධා පුථූ
පුරත්ථිමා පච්ඡිමා වාපි උත්තරා අථ දක්ඛිණා,
සරජා අරජා වාපි සීතා උණ්හා ච එකදා
අධිමත්තා පරිත්තා ච පුථූ වායන්ති මාලුතා,

තථෙවිමස්මිං කායස්මිං සමුප්පජ්ජන්ති[1] වෙදනා
සුඛදුක්ඛසමුප්පත්ති අදුක්ඛමසුඛා ච යා

යතො ච භික්ඛු ආතාපි සම්පජඤ්ඤං න රිඤ්චති[2]
තතො සො[3] වෙදනා සබ්බා පරිජානාති පණ්ඩිතො.

සො වෙදනා පරිඤ්ඤාය දිට්ඨධම්මෙ අනාසවො
කායස්ස භෙදා ධම්මට්ඨො සඞ්ඛං නොපෙති[4] වෙදගූ.

1. සමුප්පජ්ජති - සී 1, 2
2. සම්පජානො නිරුජ්ඣති - ස්‍යා.
3. තතො ච - සීමු.
4. නූපෙති - ස්‍යා.

වැළිදු මහණ, මා විසින් අනුපිළිවෙළින් සංස්කාරයන්ගේ සන්හිඳීම පවසන ලද්දේ වේ. පළමුවන දැහැනට සමවන්නහුට වචනය සන්හිඳුනේ වේ. දෙවන දැහැනට සමවන්නහුට විතර්කවිචාර සන්සිඳුනේ වේ. තෙවන දැහැනට සමවන්නහුට ප්‍රීතිය සන්හිඳුනේ වේ. සිවුවන දැහැනට සමවන්නහුට ආශ්වාසප්‍රශ්වාස සන්හිඳුනේ වේ. ආකාසානඤ්චායතනයට සමවන්නහුට රූපසංඥා සන්හිඳුනේ වේ. විඤ්ඤාණඤ්චායතනයට සමවන්නහුට ආකාසානඤ්චායතනසංඥා සන්හිඳුනේ වේ. ආකිඤ්චඤ්ඤායතනයට සමවන්නහුට විඤ්ඤාණඤ්චායතනසංඥා සන්හිඳුනේ වේ. නේවසඤ්ඤානාසඤ්ඤායතනයට සමවන්නහුට ආකිඤ්චඤ්ඤායතනසංඥා සන්හිඳුනේ වේ. සඤ්ඤාවෙදයිත නිරොධයට සමවන්නහුට සංඥාත් වෙදනාත් සන්හිඳුනාහු වෙත්. රහත් මහණහුට රාගය සන්හිඳුනේ වේ. දෙසය සන්හිඳුනේ වේ. මොහය සන්හිඳුනේ වේ.

මහණ, මේ සන්හිඳුම් සයෙකි. පළමුදැහැනට සමවන්නහුට වචනය සන්හිඳුනේ වේ. දෙවනදැහැනට සමවන්නහුට විතර්කවිචාර සන්හිඳුනේ වේ. තෙවන දැහැනට සමවන්නහුට ප්‍රීතිය සන්හිඳුනේ වෙයි. සිවුවන දැහැනට සමවන්නහුට ආශ්වාසප්‍රශ්වාස සන්හිඳුනේ වේ. සඤ්ඤා වේදයිත නිරෝධයට සමවන්නහුට සංඥාත් වේදනාත් සන්හුන්නාහු වෙති. රහත් මහණහුට රාගය සන්හුන්නේ වේ. දෙසය සන්හුන්නේ වේ. මෝහය සන්හුන්නේ වේ යි.

## 2. 2. 2

## ආකාස සූත්‍රය

260. මහණෙනි, යම්සේ අහසෙහි නන්වැදෑරුම් සුළං හමා ද, පෙරදිග සුළං ද හමයි. පැළදිග සුළං ද හමයි. උතුරුදිග සුළං ද හමයි. දකුණුදිග සුළං ද හමයි. දූලි සහිත සුළං ද හමයි. දූලි රහිත සුළං ද හමයි. සිහිල් සුළං ද හමයි. උණුසුම් සුළං ද හමයි. මඳ සුළං ද හමයි. අධික සුළං ද හමයි. මහණෙනි, එසෙයින් ම මේ සිරුරෙහි නන්වැදෑරුම් වේදනා උපදිත්. සුව වේදනාත් උපදිත්. දුක්වේදනාත් උපදිත්. මැදහත් වේදනාත් උපදිත්.

යම්සේ අහසෙහි නන්වැදෑරුම් වූ බොහෝ සුළං හමා ද පෙරදිගින් හමන්නා වූ ද පැළදිගින් හමන්නා වූ ද උතුරුදිගින් හමන්නා වූ ද යළි දකුණුදිගින් හමන්නා වූ ද,

දූලි සහිත වූ ද දූලි රහිත වූ ද සිහිල් වූ ද උණුසුම් වූ ද ඇතැම් දිනෙක අධික වූ ද මඳ වූ ද බොහෝ සුළං හමයි.

එසෙයින් ම මේ කයෙහි සුවදුක් උපදවන්නා වූ ද මැදහත් වූ ද යම් වේදනාවක් වේ නම් ඒ වේදනාවෝ උපදිත්.

මහණ, යම් කලෙක කෙලෙස් තවන වෙර ඇත්තේ මනා දැනීම නො හරි ද, එකල්හි පණ්ඩිත වූ හෙතෙමෙ සියලු වේදනා පිරිසිඳ දනී.

හේ වේදනා පිරිසිඳ දැන දිටුදැමියෙහි කෙලෙස් රහිත වූයේ දහම්හි පිහිටියේ නිවනට පැමිණියේ කාබුන් මරණින් මතු (සත්ත්ව) සඞ්ඛ්‍යාවට නො පැමිණේ යි.

## 2. 2. 3

## දුතිය ආකාසසුත්තං

261. සෙය්‍යථාපි භික්ඛවෙ ආකාසෙ විවිධා වාතා වායන්ති: පුරත්ථිමාපි වාතා වායන්ති -පෙ- අධිමත්තාපි වාතා වායන්ති, එවමෙව ඛො භික්ඛවෙ ඉමස්මිං කායස්මිං විවිධා වෙදනා උප්පජ්ජන්ති, සුඛාපි වෙදනා උප්පජ්ජන්ති,[1] දුක්ඛාපි වෙදනා උප්පජ්ජන්ති,[1] අදුක්ඛමසුඛාපි වෙදනා උප්පජ්ජන්ති''ති.

## 2. 2. 4

## අගාරසුත්තං

262. සෙය්‍යථාපි භික්ඛවෙ ආගන්තුකාගාරං, තත්‍ථ පුරත්ථිමායපි දිසාය ආගන්ත්වා වාසං කප්පෙන්ති පච්ඡිමාය පි දිසාය ආගන්ත්වා වාසං කප්පෙන්ති, උත්තරායපි දිසාය ආගන්ත්වා වාසං කප්පෙන්ති, දක්ඛිණායපි දිසාය ආගන්ත්වා වාසං කප්පෙන්ති, ඛත්තියාපි ආගන්ත්වා වාසං කප්පෙන්ති, බ්‍රාහ්මණාපි ආගන්ත්වා වාසං කප්පෙන්ති, වෙස්සාපි ආගන්ත්වා වාසං කප්පෙන්ති, සුද්දාපි ආගන්ත්වා වාසං කප්පෙන්ති.

එවමෙව ඛො භික්ඛවෙ ඉමස්මිං කායස්මිං විවිධා වෙදනා උප්පජ්ජන්ති: සුඛාපි වෙදනා උප්පජ්ජන්ති, දුක්ඛාපි වෙදනා උප්පජ්ජන්ති, අදුක්ඛමසුඛාපි වෙදනා උප්පජ්ජන්ති, සාමිසාපි සුඛා වෙදනා උප්පජ්ජන්ති, නිරාමිසාපි සුඛා වෙදනා උප්පජ්ජන්ති සාමිසාපි දුක්ඛා වෙදනා උප්පජ්ජන්ති, නිරාමිසාපි දුක්ඛා වෙදනා උප්පජ්ජන්ති, සාමිසාපි අදුක්ඛමසුඛා වෙදනා උප්පජ්ජන්ති, නිරාමිසාපි අදුක්ඛමසුඛා වෙදනා උප්පජ්ජන්තීති.

## 2. 2. 5

## සන්තකසුත්තං

263. අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: කතමා නු ඛො භන්තෙ වෙදනා? කතමො වෙදනා[2] සමුදයො? කතමො වෙදනා නිරොධො? කතමා වෙදනානිරොධගාමිනී පටිපදා? කො වෙදනාය අස්සාදො? කො[3] ආදීනවො? කිං[4] නිස්සරණන්ති?

තිස්සො ඉමා ආනන්ද වෙදනා: සුඛා වෙදනා, දුක්ඛා වෙදනා අදුක්ඛමසුඛා වෙදනා. ඉමා වුච්චන්ති ආනන්ද වෙදනා. ඵස්සසමුදයා වෙදනාසමුදයො ඵස්සනිරොධා වෙදනානිරොධො. අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො වෙදනානිරොධගාමිනී පටිපදා. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. යං වෙදනං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, අයං වෙදනාය අස්සාදො, යා වෙදනා අනිච්චා දුක්ඛා විපරිණාමධම්මා, අයං වෙදනාය ආදීනවො. යො වෙදනාය ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහානං, ඉදං වෙදනාය නිස්සරණං.

1. උප්පජ්ජති - සයා.
2. වෙදනාය සී 1, 2.
3. කො වෙදනාය - සයා.
4. කිං වෙදනාය - සයා.

## 2. 2. 3

## දුතිය ආකාස සූත්‍රය

261. මහණෙනි, යම්සේ අහසෙහි නන්වැදැරුම් හුළං හමා ද, පෙරදිග හුළං ද හමයි ... අධික හුළං ද හමයි මහණෙනි, එසෙයින් ම මේ සිරුරෙහි නන්වැදැරුම් වේදනා උපදිත්. සුවවේදනාත් උපදිත්. දුක්වේදනාත් උපදිත්. මැදහත්වේදනාත් උපදිත් යි.

## 2. 2. 4

## අගාර සූත්‍රය

262. මහණෙනි, යම්සේ ආගන්තුක ගෙයක් වේ ද, එහි පෙරදිගින් ද අවුත් වාසය කෙරෙති. පැළදිගින් ද අවුත් වාසය කෙරෙති. උතුරුදිගින් ද අවුත් වාසය කෙරෙති. දකුණුදිගින් ද අවුත් වාසය කෙරෙති. ක්‍ෂත්‍රියයෝත් අවුත් වාසය කෙරෙති. බ්‍රාහ්මණයෝත් අවුත් වාසය කෙරෙති. වෛශ්‍යයෝත් අවුත් වාසය කෙරෙති. ශූද්‍රයෝත් අවුත් වාසය කෙරෙති.

මහණෙනි, එසෙයින් ම මේ කයෙහි විවිධ වේදනාවෝ උපදිති: සුවවේදනාත් උපදිති. දුක්වේදනාත් උපදිති. මැදහත් වේදනාත් උපදිති. සාමිස සුවවේදනාත් උපදිති. නිරාමිස සුවවේදනාත් උපදිති. සාමිස දුක්වේදනාත් උපදිති. නිරාමිස දුක්වේදනාත් උපදිති. සාමිස මැදහත්වේදනාත් උපදිති. නිරාමිස මැදහත්වේදනාත් උපදිත් යි.

## 2. 2. 5

## සන්තක සූත්‍රය

263. එකල්හි ආයුෂ්මත් **ආනන්ද** තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ ... එකත්පසෙක හුන් ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ: වහන්ස, වේදනාව කවරක් ද? වේදනාසමුදය කවරේ ද? වේදනානිරොධය කවරේ ද? වේදනානිරොධගාමිනී පටිපදව කවරී ද? වේදනාවෙහි ආස්වාදය කවරේ ද? ආදීනවය කවරේ ද? නිස්සරණය කවරේ දැ? යි.

ආනන්ද, මේ වේදනා තුනෙකි: සුවවේදනා ය, දුක්වේදනා ය, මැදහත්වේදනා යි. ආනන්ද, මොහු වේදනා යයි කියනු ලැබෙත්. ඵස්සසමුදයෙන් වේදනාසමුදයය වේ. ඵස්සනිරොධයෙන් වේදනා-නිරොධය වේ. මේ අරිඅටඟිමග ම වේදනානිරොධගාමිනී පටිපදව යි. එනම් – සම්මාදිට්ඨි ය ... සම්මාසමාධි යි. වේදනාව නිසා යම් සුවයෙක් සොම්නසෙක් උපදී නම් මේ වේදනාවේ ආස්වාද යි. යම් වේදනාවක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වනසුලු නම් මේ වේදනාවේ ආදීනව යි. වෙදනාවෙහි යම් ඡන්දරාගය දුරුකිරීමෙක් ඡන්දරාගය පැහීමෙක් වේ නම් මේ වේදනාවේ නිස්සරණ යි.

අථ ඛො පඤ්චකඞ්ග, මයා අනුපුබ්බසඞ්ඛාරානං නිරොධො අක්ඛාතො, පඨමං ඣානං සමාපන්නස්ස වාචා නිරුද්ධා හොති -පෙ- සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නස්ස සඤ්ඤා ච වෙදනා ච නිරුද්ධා හොන්ති, ඛීණාසවස්ස භික්ඛුනො රාගො නිරුද්ධො හොති, දොසො නිරුද්ධො හොති, මොහො නිරුද්ධො හොති. අථ ඛො පඤ්චකඞ්ග මයා අනුපුබ්බසඞ්ඛාරානං වූපසමො අක්ඛාතො පඨමං ඣානං සමාපන්නස්ස වාචා වූපසන්තා හොති -පෙ- සඤ්ඤා වෙදයිතනිරොධං සමාපන්නස්ස සඤ්ඤා ච වෙදනා ච වූපසන්තා හොන්ති, ඛීණාසවස්ස භික්ඛුනො රාගො වූපසන්තො හොති, දොසො වූපසන්තො හොති, මොහො වූපසන්තො හොති.

අථ ඛො පඤ්චකඞ්ග මයා අනුපුබ්බසඞ්ඛාරානං පස්සද්ධි[1] අක්ඛාතා, පඨමං ඣානං සමාපන්නස්ස වාචා පටිප්පස්සද්ධා හොති, දුතියං ඣානං සමාපන්නස්ස විතක්කවිචාරා පටිප්පස්සද්ධා හොන්ති, තතියං ඣානං සමාපන්නස්ස පීතිපටිප්පස්සද්ධා හොති. චතුත්ථං ඣානං සමාපන්නස්ස අස්සාසපස්සාසා පටිප්පස්සද්ධා හොන්ති, ආකාසානඤ්චායතනං සමාපන්නස්ස රූපසඤ්ඤා පටිප්පස්සද්ධා හොති, විඤ්ඤාණඤ්චායතනං සමාපන්නස්ස ආකාසානඤ්චායතනසඤ්ඤා පටිප්පස්සද්ධා හොති, ආකිඤ්චඤ්ඤායතනං සමාපන්නස්ස විඤ්ඤාණඤ්චායතනසඤ්ඤා පටිප්පස්සද්ධා හොති, නෙවසඤ්ඤා නාසඤ්ඤායතනං සමාපන්නස්ස ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤා පටිප්පස්සද්ධා හොති, සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නස්ස සඤ්ඤා ච වෙදනා ච පටිප්පස්සද්ධා හොන්ති, ඛීණාසවස්ස භික්ඛුනො රාගො පටිප්පස්සද්ධො හොති, දොසො පටිප්පස්සද්ධො හොති, මොහො පටිප්පස්සද්ධො හොතීති.

## 2. 2. 6

## දුතියසන්තකසුත්තං

264. අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං ආනන්දං භගවා එතදවොච: කතමා නු ඛො ආනන්ද වෙදනා? කතමො වෙදනා සමුදයො? කතමො වෙදනානිරොධො? කතමා වෙදනානිරොධගාමිනී පටිපදා? කො වෙදනාය අස්සාදො? කො ආදීනවො? කිං නිස්සරණන්ති?

භගවම්මූලකා නො භන්තෙ ධම්මා භගවන්නෙත්තිකා භගවම්පටිසරණා, සාධු වත භන්තෙ භගවන්තංයෙව පටිභාතු එතස්ස භාසිතස්ස අත්ථො, භගවතො සුත්වා භික්ඛූ ධාරෙස්සන්තීති. තෙනහානන්ද සුණොහි සාධුකං මනසිකරොහි භාසිස්සාමීති. එවං භන්තෙති ඛො ආයස්මා ආනන්දො භගවතො පච්චස්සොසි, භගවා එතදවොච:

1. පටිප්පස්සද්ධි - මජසං, සයා.

ආනන්ද, වැලිදු මා විසින් අනුපිළිවෙළින් සංස්කාරයන්ගේ නිරෝධය පවසන ලද්දේ ය. පළමු දහැනට සමවන්නහුට වචනය නිරුද්ධ වූයේ වේ ... සඤ්ඤාවෙදයිතනිරෝධයට සමවන්නහුට සංඥාත් වේදනාත් නිරුද්ධ වූවාහු වෙත්. රහත් මහණහුට රාගය නිරුද්ධ වූයේ වෙයි. දෙසය නිරුද්ධ වූයේ වෙයි. මෝහය නිරුද්ධ වූයේ වෙයි. ආනන්ද, යලිදු මා විසින් අනුපිළිවෙළින් සංස්කාරයන්ගේ සන්හිඳීම පවසන ලද්දේ ය. පළමු දහැනට සමවන්නහුට වචනය සන්හුන්නේ වෙයි ... සඤ්ඤාවේදයිතනිරොධයට සමවන්නහුට සංඥාත් වේදනාත් සන්හුන්නාහු වෙති. රහත් මහණහුට රාගය සන්හුන්නේ වෙයි. දෙසය සන්හුන්නේ වෙයි. මෝහය සන්හුන්නේ වෙයි.

ආනන්ද, වැලිදු මා විසින් අනුපිළිවෙළින් සංස්කාරයන්ගේ පස්සද්ධිය පවසන ලද්දේ ය. පළමු දහැනට සමවන්නහුට වචනය සන්හුන්නේ වෙයි. දෙවන දහැනට සමවන්නහුට විතර්කවිචාර සන්හුන්නේ වෙයි. තෙවන දහැනට සමවන්නහුට ප්‍රීතිය සන්හුන්නේ වෙයි. සිවුවන දහැනට සමවන්නහුට ආශ්වාසප්‍රශ්වාස සන්හුන්නේ වෙයි. ආකාසානඤ්චායතනයට සමවන්නහුට රූපසංඥා සන්හුන්නී වෙයි. විඤ්ඤාණඤ්චායතනයට සමවන්නහුට ආකාසානඤ්චායතනසංඥා සන්හුන්නී වෙයි. ආකිඤ්චඤ්ඤායතනයට සමවන්නහුට විඤ්ඤාණඤ්චායතනසංඥා සන්හුන්නී වෙයි. නේවසඤ්ඤානාසඤ්ඤායතනයට සමවන්නහුට ආකිඤ්චඤ්ඤායතනසංඥා සන්හුන්නී වෙයි. සඤ්ඤාවෙදයිතනිරොධයට සමවන්නහුට සංඥාත් වෙදනාත් සන්හුන්නාහු වෙති. රහත් මහණහුට රාගය සන්හුන්නේ වේ. දෙසය සන්හුන්නේ වේ. මෝහය සන්හුන්නේ වේ යි.

## 2. 2. 6

## දුතිය සන්තක සූත්‍රය

264. එකල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. ... එකත්පසෙක හුන් ආයුෂ්මත් ආනන්ද තෙරුන්ට භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක: ආනන්ද, වේදනාව කවරී ද? වේදනාසමුදයය කවරේ ද? වේදනානිරොධය කවරේ ද? වේදනානිරොධගාමිනී පටිපදව කවරී ද? වේදනාවේ ආස්වාදය කවරේ ද? ආදීනවය කවරේ ද? නිස්සරණය කවරේ ද?යි.

වහන්ස, අපගේ දහම්හු භගවත්හු මුල් කොට ඇතියහ. භගවත්හු නේත්‍ර කොට ඇතියහ. භගවත්හු පිළිසරණ කොට ඇතියහ. වහන්ස, මැනවි. මේ දේශනාවේ අරුත භාග්‍යවතුන් වහන්සේට ම වැටහේවා. භාග්‍යවතුන් වහන්සේගෙන් අසා භික්ෂූහු දරන්නාහ යි. ආනන්ද, එසේ වී නම් අසව. මැනවින් මෙනෙහි කරව. කියන්නෙමි යි. 'එසේ ය වහන්සැ'යි. ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක:

තිස්සො ඉමා ආනන්ද වෙදනා: සුඛා වෙදනා දුක්ඛා වෙදනා අදුක්ඛමසුඛා වෙදනා. ඉමා වුච්චන්ති ආනන්ද වෙදනා. ඵස්සසමුදයා වෙදනාසමුදයො ඵස්සනිරොධා වෙදනානිරොධො. අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො වෙදනානිරොධගාමිනී පටිපද සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි, යං වෙදනං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, අයං වෙදනාය අස්සාදෙ, යා වෙදනා අනිච්චා දුක්ඛා විපරිණාමධම්මා, අයං වෙදනාය ආදීනවො, යො වෙදනාය ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහානං ඉදං වෙදනාය නිස්සරණං.

අථ ඛො පනානන්ද මයා අනුපුබ්බසඞ්ඛාරානං නිරොධො අක්ඛාතො, පඨමං ඣානං සමාපන්නස්ස වාචා නිරුද්ධා හොති -පෙ- සඤ්ඤා-වෙදයිතනිරොධං සමාපන්නස්ස සඤ්ඤා ච වෙදනා ච නිරුද්ධා හොන්ති: ඛීණාසවස්ස භික්ඛුනො රාගො නිරුද්ධො හොති, දෙසො නිරුද්ධො හොති, මොහො නිරුද්ධො හොති.

අථ ඛො පනානන්ද, මයා අනුපුබ්බසඞ්ඛාරානං වූපසමො අක්ඛාතො, පඨමං ඣානං සමාපන්නස්ස වාචා වූපසන්තා හොති -පෙ- සඤ්ඤා වෙදයිතනිරොධං සමාපන්නස්ස සඤ්ඤා ච වෙදනා ච වූපසන්තා හොන්ති, ඛීණාසවස්ස භික්ඛුනො රාගො වූපසන්තො හොති. දෙසො වූපසන්තො හොති. මොහො වූපසන්තො හොති.

අථ ඛො පනානන්ද, මයා අනුපුබ්බසඞ්ඛාරානං පස්සද්ධි අක්ඛාතා, පඨමං ඣානං සමාපන්නස්ස වාචා පටිප්පස්සද්ධා හොති, -පෙ- සඤ්ඤා වෙදයිතනිරොධං සමාපන්නස්ස සඤ්ඤා ච වෙදනා ච පටිප්පස්සද්ධා හොන්ති, ඛීණාසවස්ස භික්ඛුනො රාගො පටිප්පස්සද්ධො හොති, දෙසො පටිප්පස්සද්ධො හොති, මොහො පටිප්පස්සද්ධො හොතීති.

## අට්ඨකසුත්තං

## 2. 2. 7

265. අථ ඛො සම්බහුලා භික්ඛූ යෙන භගවා තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: කතමා නු ඛො භන්තෙ වෙදනා? කතමො වෙදනා සමුදයො? කතමො වෙදනා නිරොධො? කතමා වෙදනානිරොධගාමිනී පටිපද? කො වෙදනාය අස්සාදෙ? කො ආදීනවො? කිං නිස්සරණන්ති?

ආනන්‍ද, මේ වේදනා තුනෙකි: සුඛවේදනා ය, දුක්වේදනා ය, නොදුක්නොසුවවේදනා යි. ආනන්‍ද, මොහු වේදනා යයි කියනු ලැබෙත්. ඵස්සසමුදයයෙන් වෙදනාසමුදය වේ. ඵස්සනිරොධයෙන් වෙදනානිරොධය වේ. මේ අරිඅටඟිමග ම වෙදනානිරොධගාමිනී පටිපදව යි. එනම්: සම්මාදිට්ඨි ය ... සම්මාසමාධි යි. වේදනාව නිසා යම් සුවයෙක් සොම්නසෙක් උපදී නම් මේ වේදනාවේ ආස්වාදය යි. යම් වේදනාවක් අනිය නම් දුක් නම් වෙනස් වනසුලු නම් මේ වේදනාවේ ආදීනව යි. වේදනාවෙහි යම් ඡන්‍දරාගය දුරුකිරීමෙක් ඡන්‍දරාගය පැහීමෙක් වේ නම් මේ වේදනාවේ නිස්සරණ යි.

ආනන්‍ද, වැලි දු මා විසින් අනුපිළිවෙළින් සංස්කාරයන්ගේ නිරොධය පවසන ලද්දේ ය. පළමු දහැනට සමවන්නහුට වචනය නිරුද්ධ වූයේ වේ ... සඤ්ඤාවේදයිතනිරොධයට සමවන්නහුට සංඥාත් වෙදනාත් නිරුද්ධ වූවාහු වෙති. රහත් මහණහුගේ රාගය නිරුද්ධ වූයේ වෙයි. දෙසය නිරුද්ධ වූයේ වෙයි. මෝහය නිරුද්ධ වූයේ වෙයි.

ආනන්‍ද, යළිදු මා විසින් අනුපිළිවෙළින් වූ සංස්කාරයන්ගේ සන්හිඳීම පවසන ලද්දේ ය. පළමු දහැනට සමවන්නහුට වචනය සන්හිඳුනේ වෙයි ... සඤ්ඤාවේදයිතනිරොධයට සමවන්නහුට සංඥාත් වේදනාත් සන්හුන්නාහු වෙති. රහත් මහණහුට රාගය සන්හුන්නේ වෙයි. දෙසය සන්හුන්නේ වෙයි. මෝහය සන්හුන්නේ වේ.

ආනන්‍ද, යළිදු මා විසින් අනුපිළිවෙළින් වූ සංස්කාරයන්ගේ පස්සද්ධිය පවසන ලදි. පළමු දහැනට සමවන්නහුට වචනය සන්හිඳුනේ වෙයි ... සඤ්ඤාවේදයිතනිරොධයට සමවන්නහුට සංඥාත් වේදනාත් සන්හුන්නාහු වෙති. රහත් මහණහුට රාගය සන්හුන්නේ වෙයි. දෙසය සන්හුන්නේ වෙයි. මෝහය සන්හුන්නේ වේ යි.

## 2. 2. 7

## අට්ඨක සූත්‍රය

265. එකල්හි බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ: වහන්ස, ‘වේදනාව කවරී ද? වේදනාසමුදයය කවරේ ද? වේදනානිරොධය කවරේ ද? වෙදනානිරොධගාමිනී පටිපදව කවරී ද? වේදනාවෙහි ආස්වාද කිමෙක් ද? ආදීනව කිමෙක් ද? නිස්සරණ කිමෙක් ද?යි.

තිස්සො ඉමා භික්ඛවෙ වෙදනා: සුඛා වෙදනා දුක්ඛා වෙදනා අදුක්ඛමසුඛා වෙදනා. ඉමා වුච්චන්ති භික්ඛවෙ වෙදනා. ඵස්සසමුදයා වෙදනා සමුදයො ඵස්සනිරොධා වෙදනා නිරොධො. අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො වෙදනානිරොධගාමිනී පටිපදා. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. යං වෙදනං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, අයං වෙදනාය අස්සාදො, යා වෙදනා අනිච්චා දුක්ඛා විපරිණාමධම්මා, අයං වෙදනාය ආදීනවො. යො වෙදනාය ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහානං, ඉදං වෙදනාය නිස්සරණං.

අථ ඛො පන භික්ඛවෙ මයා අනුපුබ්බසඞ්ඛාරානං නිරොධො අක්ඛාතො: පඨමං ඣානං සමාපන්නස්ස වාචා නිරුද්ධා හොති -පෙ- සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නස්ස සඤ්ඤා ච වෙදනා ච නිරුද්ධා හොන්ති, ඛීණාසවස්ස භික්ඛුනො රාගො නිරුද්ධො හොති දොසො නිරුද්ධො හොති මොහො නිරුද්ධො හොති.

අථ ඛො පන භික්ඛවෙ මයා අනුපුබ්බසඞ්ඛාරානං වූපසමො අක්ඛාතො, පඨමං ඣානං සමාපන්නස්ස වාචා වූපසන්තා හොති, -පෙ- සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නස්ස සඤ්ඤා ච වෙදනා ච වූපසන්තා හොන්ති, ඛීණාසවස්ස භික්ඛුනො රාගො වූපසන්තො හොති දොසො වූපසන්තො හොති මොහො වූපසන්තො හොති.

ඡයිමා භික්ඛවෙ පස්සද්ධියො, පඨමං ඣානං සමාපන්නස්ස වාචා පටිප්පස්සද්ධා හොති, දුතියං ඣානං සමාපන්නස්ස විතක්කවිචාරා පටිප්පස්සද්ධා හොන්ති, තතියං ඣානං සමාපන්නස්ස පීති පටිප්පස්සද්ධා හොති, චතුත්ථං ඣානං සමාපන්නස්ස අස්සාසපස්සාසා පටිප්පස්සද්ධා හොන්ති සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නස්ස සඤ්ඤා ච වෙදනා ච පටිප්පස්සද්ධා හොන්ති. ඛීණාසවස්ස භික්ඛුනො රාගො පටිප්පස්සද්ධො හොති, දොසො පටිප්පස්සද්ධො හොති. මොහො පටිප්පස්සද්ධො හොතීති.

## 2. 2. 8

## දුතියඅට්ඨකසුත්තං

266. අථ ඛො සම්බහුලා භික්ඛූ යෙන භගවා තෙනුපසඞ්කමිංසු -පෙ- එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවා එතදවොචු: කතමා නු ඛො භික්ඛවෙ වෙදනා? කතමො වෙදනාසමුදයො? කතමො වෙදනානිරොධො? කතමා වෙදනානිරොධගාමිනීපටිපදා? කො වෙදනාය අස්සාදො? කො ආදීනවො? කිං නිස්සරණන්ති?

භගවම්මූලකා නො භන්තෙ ධම්මා -පෙ- තිස්සො ඉමා භික්ඛවෙ වෙදනා: සුඛා වෙදනා, දුක්ඛා වෙදනා, අදුක්ඛමසුඛා වෙදනා. ඉමා වුච්චන්ති භික්ඛවෙ වෙදනා. ඵස්සසමුදයා වෙදනාසමුදයො -පෙ- (යථා පුරිමසුත්තන්තං එවං විත්ථාරෙතබ්බං.)

මහණෙනි, මේ වේදනා තුනෙකි: සුවවේදනා ය දුක්වෙදනා ය මැදහත්වේදනා යි. මහණෙනි, මොහු වේදනා යයි කියනු ලැබෙත්. ඵස්සසමුදයයෙන් වෙදනාසමුදයය වේ. ඵස්සනිරොධයෙන් වෙදනා-නිරොධය වේ. මේ අරිඅටඟිමග ම වේදනානිරොධගාමිනීපටිපදව යි. එනම්: සම්මාදිට්ඨි ය ... සම්මාසමාධි යි. වේදනාව නිසා යම් සුවයෙක් සොම්නසෙක් උපදී නම් මේ වෙදනාවේ ආස්වාද යි. යම් වෙදනාවක් අනිස නම් දුක් නම් වෙනස් වනසුලු නම් මේ වෙදනාවේ ආදීනව යි. වෙදනාවෙහි යම් ඡන්‍දරාගය දුරලීමෙක් ඡන්‍දරාගය පැහීමෙක් වේ නම් මේ වෙදනාවේ නිස්සරණ යි.

වැලිදු මහණෙනි, මා විසින් අනුපිළිවෙළින් වූ සංස්කාරයන්ගේ නිරොධය පවසන ලද්දේ ය. පළමු දහැනට සමවන්නහුට වචනය නිරුද්ධ වූයේ වෙයි ... සඤ්ඤාවෙදයිතනිරොධයට සමවන්නහුට සංඥාත් වෙදනාත් නිරුද්ධ වූවාහු වෙත්. රහත් මහණහුට රාගය නිරුද්ධ වූයේ වෙයි. දෙසය නිරුද්ධ වූයේ වෙයි. මොහය නිරුද්ධ වූයේ වේ.

වැලිදු මහණෙනි, මා විසින් අනුපිළිවෙළින් වූ සංස්කාරයන්ගේ සන්හිඳීම පවසන ලද්දේ ය, පළමු දහැනට සමවන්නහුට වචනය සන්හුන්නේ වෙයි ... සඤ්ඤාවෙදයිතනිරොධයට සමවන්නහුට සංඥාත් වෙදනාත් සන්හුන්නාහු වෙති. රහත් මහණහුට රාගය සන්හුන්නේ වෙයි. දෙසය සන්හුන්නේ වෙයි. මොහය සන්හුන්නේ වේ.

මහණෙනි, මේ සන්හිඳුම් සයෙකි: 'පළමු දහැනට සමවන්නහුට වචනය සන්හුන්නේ වෙයි. දෙවන දහැනට සමවන්නහුට විතක්කවිචාර සන්හුන්නේ වෙයි. තෙවන දහැනට සමවන්නහුට ප්‍රීතිය සන්හුන්නී වෙයි, සිවුවන දහැනට සමවන්නහුට ආශ්වාසප්‍රශ්වාස සන්හුන්නේ වෙයි. සඤ්ඤාවෙදයිතනිරොධයට සමවන්නහුට සංඥාත් වෙදනාත් සන්හුන්නාහු වෙත්. රහත් මහණහුට රාගය සන්හුන්නේ වෙයි. දෙසය සන්හුන්නේ වෙයි. මොහය සන්හුන්නේ වේ යි.

## 2. 2. 8

## දුතිය අට්ඨක සූත්‍රය

266. එකල්හි බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ ... එකත්පස්ව හුන් ඒ භික්ෂූන්ට භාග්‍යවතුන් වහන්සේ මෙය වදළසේක: මහණෙනි, වෙදනාව කවරී ද? වෙදනා සමුදය කවරේ ද? වෙදනා නිරොධය කවරේ ද? වෙදනා නිරොධ-ගාමිනීපටිපදව කවරී ද? වෙදනාවෙහි ආස්වාදය කිමෙක් ද? ආදීනවය කිමෙක් ද? නිස්සරණය කිමෙක් ද යි.

වහන්ස, අපගේ දහම්හු භගවත්හු මුල් කොට ඇතියහ ... මහණෙනි, මේ වෙදනා තුනෙකි. සුවවෙදනා ය දුක්වෙදනා ය මැදහත්වෙදනා යි. මහණෙනි, මොහු වෙදනා යි කියනු ලැබෙත්. ඵස්සසමුදයෙන් වෙදනාසමුදය වේ, .. (පළමු සූතුර යම් සේ නම් එසේ විතර කටයුතු යි.)

## 2. 2. 9

## පඤ්චකඞ්ගසුත්තං

267. අථ ඛො පඤ්චකඞ්ගො[1] ථපති යෙනායස්මා උදායී තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං උදායිං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො පඤ්චකඞ්ගො ථපති ආයස්මන්තං උදායිං එතදවොච: කති නු ඛො භන්තෙ උදායි වෙදනා වුත්තා භගවතාති?

තිස්සො ඛො ගහපති වෙදනා වුත්තා භගවතා: සුඛා වෙදනා, දුක්ඛා වෙදනා, අදුක්ඛමසුඛා වෙදනා. ඉමා ඛො ගහපති තිස්සො වෙදනා වුත්තා භගවතාති.

එවං වුත්තෙ පඤ්චකඞ්ගො ථපති ආයස්මන්තං උදායිං එතදවොච: න ඛො භන්තෙ උදායි තිස්සො වෙදනා වුත්තා භගවතා, ද්වෙ භන්තෙ වෙදනා වුත්තා භගවතා සුඛා වෙදනා දුක්ඛාවෙදනා. යායං භන්තෙ අදුක්ඛමසුඛා වෙදනා, සන්තස්මිං එසා පණීතෙ සුඛෙ වුත්තා භගවතාති.

දුතියම්පි ඛො ආයස්මා උදායී පඤ්චකඞ්ගං ථපතිං එතදවොච: න ඛො ගහපති ද්වෙ වෙදනා වුත්තා භගවතා, තිස්සො වෙදනා වුත්තා භගවතා: සුඛා වෙදනා, දුක්ඛා වෙදනා, අදුක්ඛමසුඛා වෙදනා. ඉමා තිස්සො වෙදනා වුත්තා භගවතාති.

දුතියම්පි ඛො පඤ්චකඞ්ගො ථපති ආයස්මන්තං උදායිං එතදවොච: න ඛො භන්තෙ උදායි තිස්සො වෙදනා වුත්තා භගවතා, ද්වෙ වෙදනා වුත්තා භගවතා: සුඛා වෙදනා, දුක්ඛා වෙදනා. යායං භන්තෙ අදුක්ඛමසුඛා වෙදනා සන්තස්මිං එසා පණීතෙ සුඛෙ වුත්තා භගවතාති.

තතියම්පි ඛො ආයස්මා උදායී පඤ්චකඞ්ගං ථපති එතදවොච: න ඛො ගහපති ද්වෙ වෙදනා වුත්තා භගවතා, තිස්සො වෙදනා වුත්තා භගවතා: සුඛා වෙදනා, දුක්ඛා වෙදනා, අදුක්ඛමසුඛා වෙදනා. ඉමා තිස්සො වෙදනා වුත්තා භගවතාති.

තතියම්පි ඛො පඤ්චකඞ්ගො ථපති ආයස්මන්තං උදායිං එතදවොච: න ඛො භන්තෙ උදායි තිස්සො වෙදනා වුත්තා භගවතා, ද්වෙ වෙදනා වුත්තා භගවතා: සුඛා වෙදනා, දුක්ඛා වෙදනා. යායං භන්තෙ අදුක්ඛමසුඛා වෙදනා, සන්තස්මිං එසා පණීතෙ සුඛෙ වුත්තා භගවතාති. නෙව ඛො අසක්ඛි ආයස්මා උදායී පඤ්චකඞ්ගං ථපතිං සඤ්ඤාපෙතුං, න පන අසක්ඛි පඤ්චකඞ්ගො ථපති ආයස්මන්තං උදායිං සඤ්ඤාපෙතුං.

1. පඤ්චඞ්ගො b අට්ඨකථා.

## 2. 2. 9

## පඤ්චකඞ්ග සූත්‍රය

267. එකල්හි පඤ්චකඞ්ගවඩුවා ආයුෂ්මත් උදයී තෙරුන් වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් උදයි තෙරුන් වැඳ එකත්පස්ව හුන්නේ ය. එකත්පස්ව හුන් පඤ්චකඞ්ගවඩුවා ආයුෂ්මත් උදයි තෙරුන්ට මෙය කීය: "වහන්ස, උදයි තෙරණුවනි, කෙතෙක් වේදනාවෝ භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද්දහු ද?"යි.

ගැහැවිය, භාග්‍යවතුන් වහන්සේ විසින් වේදනා තුනක් වදරන ලදී. සුවවේදනා ය දුක්වෙදනා ය මැදහත්වේදනා යි ගැහැවිය මේ වේදනා තුන භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද යි.

මෙසේ කී කල්හි පඤ්චකඞ්ගවඩුවා ආයුෂ්මත් උදයි තෙරුන්ට මෙය කීය. වහන්ස,උදයි තෙරණුවනි, භාග්‍යවතුන් වහන්සේ විසින් වේදනා තුනක් නො වදරන ලද, සුව වේදනා ය දුක්වේදනා යි වේදනා දෙකක් භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලදී. වහන්ස, යම් මේ නොදුක් නොසුව වේදනාවෙක් වේ නම් මෙය ශාන්ත වූ ප්‍රණීත වූ සුවයෙහි ලා භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද යි.

දෙවනවට ද ආයුෂ්මත් උදයී තෙරණුවෝ පඤ්චකඞ්ගවඩුවාට මෙය කීහ: 'ගැහැවිය භාග්‍යවතුන් වහන්සේ විසින් වේදනා දෙකක් නො වදරන ලදී. වේදනා තුනක් භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලදී. සුව වේදනා ය දුක්වේදනා ය නොදුක් නො සුවවෙදනා'යි. මේ වේදනා තුන භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලදයි.

දෙවනවට ද පඤ්චකඞ්ගවඩුවා ආයුෂ්මත් උදයී තෙරුනට මෙය කීය: "වහන්ස, උදයි තෙරණුවනි, භාග්‍යවතුන් වහන්සේ විසින් වේදනා තුනක් නොම වදරන ලදී, සුවවේදනා ය දුක්වේදනා යි වෙදනා දෙකක් භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලදී. වහන්ස, යම් මේ නොදුක් නොසුව වේදනාවක් වේ නම් මෙය ශාන්ත වූ ප්‍රණීත වූ සුවයෙහි ලා භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද"යි.

තෙවනවට ද ආයුෂ්මත් උදයී තෙරණුවෝ පඤ්චකඞ්ගවඩුවාට මෙය කීය. ගැහැවිය භාග්‍යවතුන් වහන්සේ විසින් වෙදනා දෙකක් නොම වදරන ලදී. භාග්‍යවතුන් වහන්සේ විසින් වෙදනා තුනක් වදරන ලදී. සුවවෙදනා ය දුක්වෙදනා ය මැදහත්වෙදනා යි. මේ වෙදනා තුන භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද යි.

තෙවන වට ද පඤ්චකඞ්ගවඩුවා ආයුෂ්මත් උදයී තෙරුන්ට මෙය කීය. වහන්ස උදයී තෙරණුවනි, භාග්‍යවතුන් වහන්සේ විසින් වෙදනා තුනක් නොම වදරන ලදී. සුවවෙදනා ය දුක්වෙදනා යි වෙදනා දෙකක් භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලදී. වහන්ස, යම් මේ මැදහත් වෙදනාවක් වේ නම් මෙය ශාන්ත වූ ප්‍රණීත වූ සුවයෙහි ලා භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද යි. ආයුෂ්මත් උදයී තෙරණුවෝ පඤ්චකඞ්ගවඩුවනට හඟවන්නට නොම හැකි වූහ. පඤ්චකඞ්ග වඩුවා ද ආයුෂ්මත් උදයි තෙරුන්ට හඟවන්නට නො ද හැකි විය

අස්සොසි ඛො ආයස්මා ආනන්දො ආයස්මතො උදායිස්ස පඤ්චකඞ්ගෙන ථපතිනා සද්ධිං ඉමං කථාසල්ලාපං. අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො යාවතකො ආයස්මතො උදායිස්ස පඤ්චකඞ්ගෙන ථපතිනා සද්ධිං අහොසි කථාසල්ලාපො තං සබ්බං භගවතො ආරොචෙසි.

සන්තං යෙව ඛො ආනන්ද පරියායං පඤ්චකඞ්ගො ථපති උදායිස්ස භික්ඛුනො නාබ්භනුමොදි, සන්තඤ්ච පනානන්ද පරියායං උදායි භික්ඛු පඤ්චකඞ්ගස්ස ථපතිනො නාබ්භනුමොදි. ද්වෙපි මයා ආනන්ද වෙදනා වුත්තා පරියායෙන, තිස්සොපි මයා වෙදනා වුත්තා පරියායෙන, පඤ්චපි මයා වෙදනා වුත්තා පරියායෙන, ඡපි මයා වෙදනා වුත්තා පරියායෙන, අට්ඨාරසාපි මයා වෙදනා වුත්තා පරියායෙන, ඡත්තිංසාපි මයා වෙදනා වුත්තා පරියායෙන, අට්ඨසතම්පි මයා වෙදනා වුත්තා පරියායෙන.

එවං පරියායදෙසිතො[1] ඛො ආනන්ද මයා ධම්මො. එවං පරියාය දෙසිතෙ ඛො ආනන්ද මයා ධම්මෙ යෙ අඤ්ඤමඤ්ඤස්ස සුභාසිතං සුලපිතං න සමනුමඤ්ඤිස්සන්ති න සමනුජානිස්සන්ති න සමනුමොදිස්සන්ති; තෙසං[2] එතං පාටිකඞ්ඛං භණ්ඩනජාතා කලහජාතා විවාදපන්නා අඤ්ඤමඤ්ඤං මුඛසත්තීහි විතුදන්තා විහරිස්සන්තීති.

එවං පරියායදෙසිතො ඛො ආනන්ද මයා ධම්මො, එවං පරියාය දෙසිතෙ ඛො ආනන්ද මයා ධම්මෙ යෙ අඤ්ඤමඤ්ඤස්ස සුභාසිතං සුලපිතං සමනුමඤ්ඤිස්සන්ති සමනුජානිස්සන්ති, සමනුමොදිස්සන්ති, තෙසං එතං පාටිකඞ්ඛං, සමග්ගා සම්මොදමානා අවිවදමානා ඛීරොදකීභූතා අඤ්ඤමඤ්ඤං පියචක්ඛූහි සම්පස්සන්තා විහරිස්සන්තීති.

පඤ්චිමෙ ආනන්ද කාමගුණා. කතමෙ පඤ්ච: චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, සොතවිඤ්ඤෙය්‍යා සද්දා -පෙ- ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා; ඉමෙ ඛො ආනන්ද පඤ්ච කාමගුණා. යං ඛො ආනන්ද ඉමෙ පඤ්ච කාමගුණෙ පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, ඉදං වුච්චති කාමසුඛං. යෙ ඛො ආනන්ද එවං වදෙය්‍යුං: එතං පරමං සන්තං සුඛං සොමනස්සං පටිසංවෙදෙන්තීති, ඉදං නෙසාහං නානුජානාමි. තං කිස්ස හෙතු; අත්ථානන්ද එතම්හා සුඛා අඤ්ඤං සුඛං අභික්කන්තතරං ච පණීතතරඤ්ච.

1. පරියායෙන - සී 1, 2. 2. තෙසං - සී 1, 2.

ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ පඤ්චකඞ්ගවඩුවා සමග වූ ආයුෂ්මත් උදයි තෙරුන්ගේ මේ කථාසල්ලාපය ඇසූහ. එකල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ... එකත්පස්ව හුන් ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ පඤ්චකඞ්ගවඩුවා සමග ආයුෂ්මත් උදයි තෙරුන්ගේ කථාසල්ලාපය යම්තාක් වී ද, ඒ සියල්ල භාග්‍යවතුන් වහන්සේට සැලකළහ.

ආනන්ද, පඤ්චකඞ්ගවඩුවා උදයි මහණහුගේ ඇත්තා වූ ම දහම්නය නො පිළිගත්තේ ය. ආනන්ද, උදයි මහණ ද පඤ්චකඞ්ගවඩුවාගේ ඇත්තා වූ ම දහම්නය නො පිළිගත්තේ ය. ආනන්ද, මා විසින් නය වශයෙන් වෙදනා දෙකකුදු කියන ලදී. මා විසින් නය වශයෙන් වෙදනා තුනකුදු කියන ලදී. මා විසින් නය වශයෙන් වෙදනා පසකුදු කියන ලදී. මා විසින් නය වශයෙන් වෙදනා සයකුදු කියන ලදී. මා විසින් නය වශයෙන් වෙදනා අටළොසකුදු කියන ලදී. මා විසින් නය වශයෙන් වෙදනා සතිසකුදු කියන ලදී. මා විසින් නයවශයෙන් වෙදනා අටෝරාසියකුදු කියන ලදී.

ආනන්ද, මෙසේ මා විසින් දහම නය වශයෙන් දේශනා කරන ලදී. ආනන්ද, මෙසේ මා විසින් නය වශයෙන් දෙසන ලද දහම් ඇති කල්හි යම් කෙනෙක් ඔවුනොවුන්ගේ සුභාසිතය සුලපිතය එක්ව නො හඟනාහු නම් නො අනුදන්නාහු නම් නො පිළිගන්නාහු නම් ඔවුන් විසින් "හටගත් ඩබර ඇත්තාහු හටගත් කලහ ඇත්තාහු විවාදයට පැමිණියාහු ඔවුනොවුන් මුවසැත්වලින් විදගනිමින් වෙසෙන්නාහ"යි මෙය කැමති විය යුතුයි.

ආනන්ද මෙසේ මා විසින් ධර්මය නය වශයෙන් දේශනා කරන ලදී. ආනන්ද, මෙසේ මා විසින් නය වශයෙන් දේශනා කරන ලද දහම ඇති කල්හි යම් කෙනෙක් ඔවුනොවුන්ගේ සුභාෂිතය සුලපිතය හඟනාහු නම් අනුදන්නාහු නම් පිළිගන්නාහු නම් ඔවුන් විසින් "සමග වූවාහු සතුටු වන්නාහු විවාද නො කරන්නාහු කිරි හා දිය මෙන් එක් වූවාහු ඔවුනොවුන් ප්‍රියඇසින් බලමින් වෙසෙන්නාහ"යි මෙය කැමති විය යුතු ය.

ආනන්ද, මේ කාමගුණ පසෙකි. කවර පසෙක් ද යත්: ඉටු කැමති මනවඩන ප්‍රියස්වරූප වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු ඇසින් දතයුතු රූපයෝ ය ... කනින් දතයුතු සදහු ය ... නැහැයෙන් දතයුතු ගඳහු ය ... දිවෙන් දතයුතු රස ය. ඉටු කැමති මන වඩන පියස්වරූප වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු කයින් දතයුතු පහස් ය යි. ආනන්ද, මොහු පස්කම් ගුණයෝ ය. ආනන්ද, මේ පස්කම්ගුණ නිසා යම් සුවයෙක් සොම්නසෙක් උපදී නම් මේ කම්සුවය යි කියනු ලැබේ. ආනන්ද, යම් කෙනෙක් "පරමශාන්ත සුවය වූ මේ සොම්නස විඳිති"යි මෙසේ කියන්නාහු නම් ඔවුන්ගේ මේ වචනය මම නො අනුදනිමි. ඒ කවර හෙයින යත්: ආනන්ද, මේ සුවයට වඩා ඉතා කැමති වූත් ඉතා පිණී වූත් අන් සුවයෙක් ඇත.

කතමඤ්චානන්ද එතම්හා සුඛා අඤ්ඤං සුඛං අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච: ඉධානන්ද භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති, ඉදං ඛො ආනන්ද එතම්හා සුඛා අඤ්ඤං සුඛං අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

යෙ ඛො ආනන්ද එවං වදෙය්‍යුං: “එතං පරමං සන්තං සුඛංසොමනස්සං පටිසංවෙදෙන්තී”ති, ඉදං නෙසාහං නානුජානාමි, තං කිස්ස හෙතු: අත්ථානන්ද එතම්හා සුඛා අඤ්ඤං සුඛං අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච කතමඤ්චානන්ද එතම්හා සුඛා අඤ්ඤං සුඛං අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච: ඉධානන්ද භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. ඉදං ඛො ආනන්ද එතම්හා සුඛා අඤ්ඤං සුඛං අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

යෙ ඛො ආනන්ද එවං වදෙය්‍යුං: එතං පරමං සන්තං සුඛං සොමනස්සං පටිසංවෙදෙන්තීති, ඉදං නෙසාහං නානුජානාමි. තං කිස්ස හෙතු: අත්ථානන්ද එතම්හා සුඛා අඤ්ඤං සුඛං අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච. කතමඤ්චානන්ද එතම්හා සුඛා අඤ්ඤං සුඛං අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච: ඉධානන්ද භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො ච සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති, යන්තං අරියා ආචික්ඛන්ති, උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති, තං තතියං ඣානං උපසම්පජ්ජ විහරති. ඉදං ඛො ආනන්ද එතම්හා සුඛා අඤ්ඤං සුඛං අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

යෙ ඛො ආනන්ද එවං වදෙය්‍යුං: එතං පරමං සන්තං සුඛං සොමනස්සං පටිසංවෙදෙන්තීති, ඉදං නෙසාහං නානුජානාමි, තං කිස්ස හෙතු: අත්ථානන්ද එතම්හා සුඛා අඤ්ඤං සුඛං අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච. කතමඤ්චානන්ද එතම්හා සුඛා අඤ්ඤං සුඛං අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච: ඉධානන්ද භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථගමා අදුක්ඛමසුඛං උපෙක්ඛාසති පාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති, ඉදං ඛො ආනන්ද එතම්හා සුඛා අඤ්ඤං සුඛං අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

යෙ ඛො ආනන්ද එවං වදෙය්‍යුං: එතං පරමං සන්තං සුඛං සොමනස්සං පටිසංවෙදෙන්තීති, ඉදං නෙසාහං නානුජානාමි, තං කිස්ස හෙතු: අත්ථානන්ද එතම්හා සුඛා අඤ්ඤං සුඛං අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච. කතමඤ්චානන්ද එතම්හා සුඛා අඤ්ඤං සුඛං අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච: ඉධානන්ද භික්ඛු සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති, ඉදං ඛො ආනන්ද, එතම්හා සුඛා –පෙ–

ආනන්ද. මේ සුවයට වඩා ඉතා කැමති වූත් ඉතා පිණී වූත් ඒ සුවය කවරේ ද: ආනන්ද, මෙසස්නෙහි මහණ කාමයෙන් වෙන් ව ම අකුසල් දහමින් වෙන් ව විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සුවය ඇති පළමුවන දැහැනට එළඹ වෙසේ. ආනන්ද, මේ වනාහි ඒ සුවයට වඩා ඉතා කැමති වූත් ඉතා පිණී වූත් අනෙක් සුවය යි.

ආනන්ද, යම් කෙනෙක් පරමශාන්ත සුවය වූ මේ සොම්නස විඳිති යි මෙසේ කියන්නාහු නම් ඔවුන්ගේ මේ කියමන මම නො අනුදනිමි. ඒ කවර හෙයිනයත්; ආනන්ද, මේ සුවයට වඩා ඉතා කැමති වූත් ඉතා පිණී වූත් අන් සුවයෙක් ඇත. ආනන්ද, මේ සුවයට වඩා ඉතා කැමති වූත් ඉතා පිණී වූත් අන් සුවය කවරේ ද: ආනන්ද, මෙ සස්නෙහි මහණ විතර්කවිචාරයන්ගේ සන්හිඳීමෙන් ඇතුළත පැහැදීම ඇති සිතේ එකඟකම ඇති විතර්ක රහිත විචාර රහිත සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සුවය ඇති දෙවන දැහැනට එළඹ වෙසේ. ආනන්ද, මේ වනාහි ඒ සුවයට වඩා ඉතා කැමති වූත් ඉතා පිණී වූත් අනෙක් සුවය යි.

ආනන්ද, 'යම් කෙනෙක් පරමශාන්ත සුවය වූ මේ සොම්නස විඳිති'යි මෙසේ කියන්නාහු නම් ඔවුන්ගේ මේ කියමන මම නො අනුදනිමි. ඒ කවර හෙයින යත්; ආනන්ද, මේ සුවයට වඩා ඉතා කැමති වූත් ඉතා පිණී වූත් අන් සුවයෙක් ඇත. ආනන්ද, මේ සුවයට වඩා ඉතා කැමති වූත් ඉතා පිණී වූත් අන් සුවය කවරේ ද: ආනන්ද, මෙ සස්නෙහි මහණ ප්‍රීතියත් දුරු කිරීමෙන් උපෙක්ෂා ඇත්තේත් වෙසෙයි. සිහි ඇත්තේත් මනාදැනුම් ඇත්තේත් කයින් සුවත් විඳියි. උපේක්ෂා ඇත්තේ ය. සිහි ඇත්තේ ය, සුවවිහරණ ඇත්තේ ය යි ආර්‍ය්‍යයෝ ඒ යමක් සඳහා කියත් නම් ඒ තුන්වන දැහැනට එළඹ වෙසේ. ආනන්ද, මේ වනාහි ඒ සුවයට වඩා ඉතා කැමති වූත් ඉතා පිණී වූත් අන් සුවය යි.

ආනන්ද, යම් කෙනෙක් පරමශාන්තසුවය වූ මේ සොම්නස විඳිතියි මෙසේ කියන්නාහු නම් ඔවුන්ගේ මේ වචනය මම නො අනුදනිමි. ඒ කවර හෙයින යත්: ආනන්ද, මේ සුවයට වඩා ඉතා කැමති වූත් ඉතා පිණී වූත් අන් සුවයෙක් ඇත. ආනන්ද, මේ සුවයට වඩා ඉතා කැමති වූත් ඉතා පිණී වූත් අන් සුවය කවරේ ද: ආනන්ද, මෙ සස්නෙහි මහණ සුවයත් දුරු කිරීමෙන් දුකත් දුරු කිරීමෙන් පළමු ම සොම්නස්දොම්නසුන් දුරු කිරීමෙන් නොදුක් වූ නොසුව වූ උපේක්ෂාවෙන් හා සිහියෙන් හටගත් පිරිසිදුබැව් ඇති සිවුවන දැහැනට එළඹ වෙසේ. ආනන්ද, මේ වනාහි ඒ සුවයට වඩා ඉතා කැමති වූත් ඉතා පිණී වූත් අන් සුවය යි.

ආනන්ද, යම් කෙනෙක් පරමශාන්ත සුවය වූ මේ සොම්නස විඳිතියි මෙසේ කියන්නාහු නම් ඔවුන්ගේ මේ කියමන මම නො අනුදනිමි. ඒ කවර හෙයින යත්: ආනන්ද, මේ සුවයට වඩා ඉතා කැමති වූත් ඉතා පිණී වූත් අන් සුවයෙක් ඇත. ආනන්ද, මේ සුවයට වඩා ඉතා කැමති වූත් ඉතා පිණී වූත් අන් සුවය කවරේ ද: ආනන්ද, මෙසස්නෙහි මහණ සර්වප්‍රකාරයෙන් රූපසංඥාවන් ඉක්ම වීමෙන් පටිඝසංඥාවන්ගේ අභාවයෙන් නානාත්ව සංඥාවන් නො මෙනෙහි කිරීමෙන් ආකාශය අනන්ත ය යි ආකාසානඤ්චායතනයට එළඹ වෙසෙයි. ආනන්ද, මේ වනාහි ඒ සුවයට වඩා ...

යෙ ඛො ආනන්ද එවං වදෙය්‍යුං: ‘එතං පරමං සන්තං සුඛං සොමනස්සං පටිසංවෙදෙන්තී’ති, ඉදං නෙසාහං නානුජානාමි. තං කිස්ස හෙතු: අත්ථානන්ද එතම්හා සුඛා -පෙ- කතමඤ්චානන්ද එතම්හා සුඛා අඤ්ඤං සුඛං -පෙ- ඉධානන්ද භික්ඛු සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චා-යතනං උපසම්පජ්ජ විහරති ඉදං ඛො ආනන්ද එතම්හා සුඛා -පෙ-

යෙ ඛො ආනන්ද එවං වදෙය්‍යුං: එතං පරමං සන්තං සුඛං සොමනස්සං පටිසංවෙදෙන්තීති, ඉදං නෙසාහං නානුජානාමි. තං කිස්ස හෙතු: අත්ථානන්ද එතම්හා සුඛා -පෙ- කතමඤ්චානන්ද එතම්හා සුඛා අඤ්ඤං සුඛං -පෙ- ඉධානන්ද භික්ඛු සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති, ඉදං ඛො ආනන්ද එතම්හා සුඛා -පෙ-

යෙ ඛො ආනන්ද එවං වදෙය්‍යුං: ‘එතං පරමං සන්තං සුඛං සොමනස්සං පටිසංවෙදෙන්තී’ති, ඉදං නෙසාහං නානුජානාමි. තං කිස්ස හෙතු: අත්ථානන්ද එතම්හා සුඛා අඤ්ඤං සුඛං අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච. කතමඤ්චානන්ද එතම්හා සුඛා අඤ්ඤං සුඛං අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච: ඉධානන්ද භික්ඛු සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති, ඉදං ඛො ආනන්ද එතම්හා සුඛා අඤ්ඤං සුඛං අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

යෙ ච ඛො ආනන්ද එවං වදෙය්‍යුං: ‘එතං පරමං සන්තං සුඛං සොමනස්සං පටිසංවෙදෙන්තී’ති ඉදං නෙසාහං නානුජානාමි. තං කිස්ස හෙතු: අත්ථානන්ද එතම්හා සුඛා අඤ්ඤං සුඛං අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච. කතමඤ්චානන්ද එතම්හා සුඛා අඤ්ඤං සුඛං අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච: ඉධානන්ද භික්ඛු සබ්බසො නෙවසඤ්ඤා-නාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති, ඉදං ඛො ආනන්ද එතම්හා සුඛා අඤ්ඤං සුඛං අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

ඨානං ඛො පනෙතං ආනන්ද විජ්ජති යං අඤ්ඤතිත්ථියා පරිබ්බා-ජකා එවං වදෙය්‍යුං: “සඤ්ඤාවෙදයිතනිරොධං සමණො ගොතමො ආහ, තඤ්ච සුඛස්මිං පඤ්ඤපෙති, තයිදං කිංසු තයිදං කථංසූ”ති? එවංවාදිනො ආනන්ද අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවමස්සු වචනීයා: න ඛො ආවුසො භගවා සුඛං යෙව වෙදනං සන්ධාය සුඛස්මිං පඤ්ඤපෙති, යත්ථ යත්ථාවුසො සුඛං උපලබ්භති, යං හි යං හි සුඛං තං තං තථාගතො සුඛස්මිං පඤ්ඤපෙතී”ති.

ආනන්ද, යම් කෙනෙක් පරමශාන්ත සුවය වූ මේ සොම්නස විඳිති යි මෙසේ කියන්නාහු නම් මොවුන්ගේ මේ වචනය මම නො අනුදනිමි. ඒ කවර හෙයින යත්: ආනන්ද, මේ සුවයට වඩා ... ඇත. ආනන්ද, මේ සුවයට වඩා ... අන්සුවය කවරේ ද: ආනන්ද, මෙ සස්නෙහි මහණ සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණය අනන්ත ය යි විඤ්ඤාණඤ්චායතනයට එළඹ වෙසෙයි. ආනන්ද, මෙය වනාහි මේ සුවයට වඩා ...

ආනන්ද, 'යම් කෙනෙක් පරමශාන්ත සුවය වූ මේ සොම්නස විඳිති'යි මෙසේ කියන්නාහු නම් ඔවුන්ගේ මේ කියමන මම නො අනුදනිමි. ඒ කවර හෙයින යත්: ආනන්ද, මේ සුවයට වඩා ... ඇත. ආනන්ද, මේ සුවයට වඩා ... අන් සුවය කවරේ ද: ආනන්ද, මෙසස්නෙහි මහණ සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැ යි ආකිඤ්චඤ්ඤායතනයට එළඹ වෙසෙයි. ආනන්ද, මේ වනාහි ඒ සුවයට වඩා ...

ආනන්ද, යම් කෙනෙක් පරමශාන්ත සුවය වූ මේ සොම්නස විඳිති යි මෙසේ කියන්නාහු නම් ඔවුන්ගේ මේ වචනය මම නො අනුදනිමි. ඒ කවර හෙයින යත්; ආනන්ද, මේ සුවයට වඩා ඉතා කැමති වූත් ඉතා පිණී වූත් අන් සුවයෙක් ඇත. ආනන්ද, මේ සුවයට වඩා ඉතා කැමති වූත් ඉතා පිණී වූත් අන් සුවය කවරේ ද: ආනන්ද, මේ මහණ සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නේවසඤ්ඤානාසඤ්ඤායතනයට එළඹ වෙසෙයි. ආනන්ද, මේ වනාහි ඒ සුවයට වඩා ඉතා කැමති වූත් ඉතා පිණී වූත් අන්සුවය යි.

ආනන්ද, යම් කෙනෙක් පරම ශාන්ත සුවය වූ මේ සොම්නස විඳිති යි මෙසේ කියන්නාහු නම් ඔවුන්ගේ මේ වචනය මම නො අනුදනිමි. ඒ කවර හෙයින යත්: ආනන්ද, මේ සුවයට වඩා ඉතා කැමති වූත් ඉතා පිණී වූත් අන් සුවයෙක් ඇත. ආනන්ද, මේ සුවයට වඩා ඉතා කැමති වූත් ඉතා පිණී වූත් අන් සුවය කවරේ ද: ආනන්ද, මේ මහණ සර්වප්‍රකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවෙදයිතනිරොධයට එළඹ වෙසේ. ආනන්ද, මේ වනාහි ඒ සුවයට වඩා ඉතා කැමති වූත් ඉතා පිණී වූත් අන් සුවය යි.

ආනන්ද, යම් හෙයකින් අන්තොටු පිරිවැජියෝ 'මහණ ගොයුම් තෙමේ සඤ්ඤාවේදයිතනිරෝධයක් කියයි එ ද සුවය යි පනවයි ඒ මෙය කිමෙක් ද? ඒ මෙය කෙසේ ද'යි මෙසේ කියන්නාහු නම් මේ කරුණ ඇත. ආනන්ද, මෙසේ කියන අන්තොටු පිරිවැජියෝ මෙසේ කියයුතු වන්නාහ. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ සුවවෙදනාව ම සඳහා සුව යයි නො පනවති, ඇවැත්නි, යම් යම් තැනෙක සුවය ලැබේ ද, යමක් යමක් සුව ද, එය එය තථාගතයන් වහන්සේ සුව ය යි පනවන සේකැ යි.

## 2. 2. 10

## භික්ඛුසුත්තං

268. ද්වෙපි මයා[1] භික්ඛවෙ වෙදනා වුත්තා පරියායෙන, තිස්සොපි මයා වෙදනා වුත්තා පරියායෙන, පඤ්චපි මයා වෙදනා වුත්තා පරියායෙන, ඡපි[2] මයා වෙදනා වුත්තා පරියායෙන, අට්ඨාරසපි[3] මයා වෙදනා වුත්තා පරියායෙන, ඡත්තිංසාපි මයා වෙදනා වුත්තා පරියායෙන, අට්ඨසතම්පි මයා වෙදනා වුත්තා පරියායෙන.

එවං පරියායදෙසිතො භික්ඛවෙ මයා ධම්මො. එවං පරියාය දෙසිතෙ ඛො පන භික්ඛවෙ මයා ධම්මෙ යෙ අඤ්ඤමඤ්ඤස්ස සුභාසිතං සුලපිතං න සමනුමඤ්ඤිස්සන්ති, න සමනුජානිස්සන්ති, න සමනුමොදිස්සන්ති, තෙසං එතං පාටිකඞ්ඛං: 'භණ්ඩනජාතා කලහජාතා විවාදාපන්නා අඤ්ඤමඤ්ඤං[4] මුඛසත්තීහි විතුදන්තා විහරිස්සන්තී'ති.

එවං පරියායදෙසිතො භික්ඛවෙ මයා ධම්මො. එවං පරියාය-දෙසිතෙ ඛො පන භික්ඛවෙ මයා ධම්මෙ යෙ අඤ්ඤමඤ්ඤස්ස සුභාසිතං සුලපිතං සමනුමඤ්ඤිස්සන්ති, සමනුජානිස්සන්ති, සමනු-මොදිස්සන්ති; තෙසං එතං පාටිකඞ්ඛං: සමග්ගා සම්මොදමානා අවිවදමානා ඛීරොදකීභූතා අඤ්ඤමඤ්ඤං පියචක්ඛූහි සම්පස්සමානා විහරිස්සන්තී'ති.

පඤ්චිමෙ භික්ඛවෙ කාමගුණා. කතමෙ පඤ්ච: චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා ඉට්ඨා කන්තාමනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච කාමගුණා.

යං ඛො භික්ඛවෙ ඉමෙ පඤ්චකාමගුණෙ පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, ඉදං වුච්චති කාමසුඛං. යෙ ඛො භික්ඛවෙ එවං වදෙය්‍යුං: එතං පරමං සත්තා සුඛං සොමනස්සං පටිසංවෙදෙන්තීති, ඉදං තෙසාහං නානුජානාමි. තං කිස්ස හෙතු: අත්ථි භික්ඛවෙ එතම්හා සුඛා අඤ්ඤං සුඛං අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච: කතමඤ්ච භික්ඛවෙ එතම්හා සුඛා අඤ්ඤං සුඛං අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච: ඉධ භික්ඛවෙ භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. ඉදං ඛො භික්ඛවෙ එතම්හා සුඛා අඤ්ඤං සුඛං අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

---

1. ද්වෙ මයා - සී 1, 2.
2. ඡාපි - සී 1, ස්‍යා.
3. අට්ඨාරසාපි - සී 1, ස්‍යා.
4. අඤ්ඤමඤ්ඤස්ස - සී 1, ස්‍යා.

## 2. 2. 10

## භික්ඛු සූත්‍රය

268. මහණෙනි, මවිසින් නය වශයෙන් වෙදනා දෙකකුදු කියන ලදී. මා විසින් නය වශයෙන් වෙදනා තුනකුදු කියන ලදී. මා විසින් නය වශයෙන් වෙදනා පසකුදු කියන ලදී. මා විසින් නය වශයෙන් වෙදනා සයකුදු කියන ලදී. මා විසින් නය වශයෙන් වෙදනා අටළොසකුදු කියන ලදී. මා විසින් නය වශයෙන් වෙදනා සතිසකුදු කියන ලදී. මා විසින් නය වශයෙන් වෙදනා අටෝරාසියකුදු කියන ලදී.

මහණෙනි, මෙසේ මා විසින් නය වශයෙන් දහම දේශනා කරන ලදී. මහණෙනි, මෙසේ මා විසින් නය වශයෙන් දේශනා කරන ලද දහම ඇති කල්හි යම් කෙනෙක් ඔවුනොවුන්ගේ සුභාෂිතය සුලපිතය මැනවින් නො හඟනාහු නම් නො අනුදන්නාහු නම් නො පිළිගන්නාහු නම් ඔවුන් විසින් 'හටගත් ඩබර ඇත්තාහු හටගත් කලහ ඇත්තාහු විවාදයට පැමිණියාහු ඔවුනොවුන් මුව සැත්වලින් පෙළමින් වෙසෙන්නාහු ය යි මෙය කැමති වියයුතු යි.

මහණෙනි, මෙසේ මා විසින් නය වශයෙන් දහම් දෙසන ලදී. මහණෙනි, මෙසේ මා විසින් නය වශයෙන් දෙසන ලද දහම ඇති කල්හි යම් කෙනෙක් ඔවුනොවුන්ගේ සුභාෂිතය සුලපිතය මැනවින් හඟනාහු නම් අනුදන්නාහු නම් පිළිගන්නාහු නම් ඔවුන් විසින් 'සමග වූවාහු සතුටු වන්නාහු විවාද නො කරන්නාහු කිරි හා දිය මෙන් එක් වූවාහු ඔවුනොවුන් ප්‍රිය ඇසින් බලමින් වෙසෙන්නාහ'යි මෙය කැමති වියයුතු යි.

මහණෙනි, මේ කාමගුණ පසෙකි. කවර පසෙක් ද යත්: ඉටු කැමති මනවඩන පියදෑ වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු ඇසින් දතයුතු රූ ය ... ඉටු කැමති මනවඩන පියදෑ වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු කයින් දතයුතු පහස් යයි, මහණෙනි, මොහු පස්කම් ගුණයෝ ය.

මහණෙනි, මේ පස්කම්ගුණ නිසා යම් සුවයෙක් සොම්නසෙක් උපදී නම් මේ කම්සුවය යි කියනු ලැබේ. මහණෙනි, 'යම් කෙනෙක් පරමශාන්ත සුවය වූ මේ සොම්නස විඳිති'යි මෙසේ කියන්නාහු නම් ඔවුන්ගේ මේ වචනය මම නො අනුදනිමි. ඒ කවර හෙයින යත්: මහණෙනි, මේ සුවයට වඩා ඉතා කැමති වූත් ඉතා පිණී වූත් අන් සුවයෙක් ඇත. මහණෙනි, මේ සුවයට වඩා ඉතා කැමති වූත් ඉතා පිණී වූත් අන් සුවය කවරේ ද: මහණෙනි, මෙසස්නෙහි මහණ කාමයන්ගෙන් වෙන් ව ම අකුසල් දහමින් වෙන් ව ම විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සුවය ඇති පළමුවන දූහැනට එළඹ වෙසෙයි. මහණෙනි, මෙය වනාහි ඒ සුවයට වඩා ඉතා කැමති වූත් ඉතා පිණී වූත් අන් සුවය යි.

යො ඛො භික්ඛවෙ එවං වදෙය්‍යුං: 'එතං පරමං සත්තා සුඛං සොමනස්සං පටිසංවෙදෙන්ති'ති. ඉදං නෙසාහං නානුජානාමි. තං කිස්ස හෙතු: අත්ථි භික්ඛවෙ එතම්හා සුඛා අඤ්ඤං සුඛං අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච. කතමඤ්ච භික්ඛවෙ එතම්හා සුඛා අඤ්ඤං සුඛං අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච: ඉධ භික්ඛවෙ භික්ඛු -පෙ- සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති, ඉදං ඛො භික්ඛවෙ එතම්හා සුඛා අඤ්ඤං සුඛං අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

ඨානං ඛො පනෙතං භික්ඛවෙ විජ්ජති යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං වදෙය්‍යුං: ''සඤ්ඤාවෙදයිතනිරොධං සමණො ගොතමො ආහ, තඤ්ච සුඛස්මිං පඤ්ඤපෙති. තයිදං කිංසු, තයිදං කථංසූ''ති? එවං වාදිනො භික්ඛවෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවමස්සු වචනීයා: ''න ඛො ආවුසො භගවා සුඛංයෙව වෙදනං සන්ධාය සුඛස්මිං පඤ්ඤපෙති, යත්ථ යත්ථාවුසො සුඛං උපලබ්භති, යං හි යං හි සුඛං තං තං තථාගතො සුඛස්මිං පඤ්ඤපෙති''ති.

## රහොගතවග්ගො දුතියො

**තත්‍රුද්දානං:**

රහොගතං ද්වෙ ච ආකාසා අගාරං ද්වෙ ච සන්තකා
අට්ඨකෙන ච ද්වෙ වුත්තා පඤ්චකඞ්ගොපි භික්ඛුනා.

මහණෙනි, යම් කෙනෙක් පරම ශාන්ත සුවය වූ මේ සොම්නස විඳිති යි මෙසේ කියන්නාහු නම් ඔවුන්ගේ මේ කියමන මම නො අනුදනිමි. ඒ කවර හෙයින යත්: මහණෙනි, මේ සුවයට වඩා ඉතා කැමති වූත් ඉතා පිණී වූත් අන් සුවයෙක් ඇත. මහණෙනි, මේ සුවයට වඩා ඉතා කැමති වූත් ඉතා පිණී වූත් අන් සුවය කවරේ ද: මහණෙනි, මෙසස්නෙහි මහණ සර්වප්‍රකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවේදයිතනිරොධයට එළඹ වෙසෙයි. මහණෙනි, මෙය වනාහි ඒ සුවයට වඩා ඉතා කැමති වූත් ඉතා පිණී වූත් අන් සුවය යි.

මහණෙනි, යම් හෙයෙකින් අන්තොටු පිරිවැජියෝ "මහණ ගොයුම්හු සඤ්ඤාවෙදයිතනිරොධයක් කියති, එය සුව ය යි ද පනවයි, ඒ කිමෙක් ද? ඒ කෙසේ ද?''යි. මෙසේ කියන්නාහු නම් මේ කරුණ ඇත. මහණෙනි, මෙසේ කියන අන්තොටු පිරිවැජියෝ මෙසේ කියයුතු වන්නාහ. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ සුවවෙදනාව සඳහා සුවය යි නො පනවන සේක, ඇවැත්නි, යම් යම් තැනෙක සුවය ලැබේ ද, යමක් යමක් සුව ද, එය එය තථාගතයන් වහන්සේ සුවය යි පනවන සේකැ යි.

### දෙවැනි රහොගතවර්ග යි.

**එහි සූත්‍රනාමාවලිය**:

රහොගතසූත්‍ර ය, ආකාශසූත්‍ර දෙක ය, අගාරසූත්‍ර ය, සන්තකසූත්‍ර දෙක ය, අට්ඨකසූත්‍ර දෙක ය, පඤ්චකඞ්ගසූත්‍ර ය භික්ඛුසූත්‍ර ය යි සූත්‍ර දශයෙකි.

# 3. අට්ඨසතපරියායවග්ගො

## 2. 3. 1

## මොළියසීවකසුත්තං

269. එකං සමයං **භගවා රාජගහෙ** විහරති **වෙළුවනෙ කලන්දක-නිවාපෙ.** අථ ඛො **මොළියසීවකො**[1] පරිබ්බාජකො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි, සම්මොද-නීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො මොළියසීවකො පරිබ්බාජකො භගවන්තං එතදවොච: සන්ති හි භො ගොතම එකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: ''යං කිඤ්චායං පුරිසපුග්ගලො පටිසංවෙදියති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා සබ්බන්තං පුබ්බෙකතහෙතූ''ති. ඉධ භවං ගොතමො කිමාහාති?

පිත්තසමුට්ඨානානිපි ඛො සීවක ඉධෙකච්චානි වෙදයිතානි උප්පජ්ජන්ති, සාමම්පි ඛො එතං සීවක වෙදිතබ්බං, යථා පිත්තසමු-ට්ඨානානිපි ඉධෙකච්චානි වෙදයිතානි උප්පජ්ජන්තීති, ලොකස්සපි ඛො එතං[2] සීවක සච්චසම්මතං, යථා පිත්තසමුට්ඨානානිපි ඉධෙකච්චානි වෙදයිතානි උප්පජ්ජන්ති, තත්‍ර සීවක යෙ තෙ සමණබ්‍රාහ්මණා එවං වාදිනො එවංදිට්ඨිනො: ''යං කිඤ්චායං පුරිසපුග්ගලො පටිසං-වෙදියති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා සබ්බන්තං පුබ්බෙ-කතහෙතූ''ති. යඤ්ච සාමං ඤාතං තඤ්ච අතිධාවන්ති, යඤ්ච ලොකෙ සච්චසම්මතං තඤ්ච අතිධාවන්ති, තස්මා තෙසං සමණබ්‍රාහ්මණානං මිච්ඡාති වදාමි.

සෙම්හසමුට්ඨානානිපි ඛො සීවක -පෙ- වාතසමුට්ඨානානිපි ඛො සීවක -පෙ- සන්නිපාතිකානිපි[3] ඛො සීවක -පෙ- උතුපරිණාමජානිපි ඛො සීවක -පෙ- විසමපරිහාරජානිපි ඛො සීවක -පෙ- ඔපක්කමිකානිපි ඛො සීවක -පෙ- කම්මවිපාකජානිපි ඛො සීවක ඉධෙ-කච්චානි වෙදයිතානි උප්පජ්ජන්ති, සාමම්පි ඛො එතං සීවක වෙදිතබ්බං, යථා කම්මවිපාකජානිපි ඛො සීවක ඉධෙකච්චානි වෙදයිතානි උප්පජ්ජන්ති, ලොකස්සපි ඛො එතං සීවක සච්චසම්මතං යථා කම්ම-විපාකජානිපි ඉධෙකච්චානි වෙදයිතානි උප්පජ්ජන්ති, තත්‍ර සීවක යෙ තෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: ''යං කිඤ්චායං පුරිසපුග්ගලො පටිසංවෙදියති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, සබ්බං තං පුබ්බෙකතහෙතූ''ති. යඤ්ච සාමං ඤාතං තඤ්ච අතිධාවන්ති, යඤ්ච ලොකෙ සච්චසම්මතං තඤ්ච අතිධාවන්ති, තස්මා තෙසං සමණබ්‍රාහ්මණානං මිච්ඡාති වදාමීති.

---

1. මොළිය සීවකො - සයා
2. එවං - සයා.
3. සන්නිපාතසමුට්ඨානානිපි - සයා.

# 3. අට්ඨසතපරියාය වර්ගය

## 2. 3. 1

## මොළියසීවක සූත්‍රය

269. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **රජගහනුවර** සමීපයෙහි **කලන්දකනිවාප** නම් වූ **වෙළුවනාරාමයෙහි** වැඩවසන සේක. එකල්හි **මොළියසීවක** පිරිවැජි තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටු විය යුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පස් ව හුන්නේ ය. එකත්පස් ව හුන් මොළියසීවක පිරිවැජි තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය. භවත් ගෞතමයෙනි, ''මේ පුරිස් පුහුල් තෙමේ සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් කිසි වෙදනාවක් විඳී නම් ඒ සියල්ල පෙර කළ කම් හෙතු කොටගෙන ය''යි මෙබඳු වාද ඇති මෙබඳු දිටු ඇති ඇතැම් මහණ බමුණෝ ඇත් ම ය. මෙහි ලා භවත් ගෞතමයන් වහන්සේ කුමක් කියන සේක් ද? යි.

සීවක, මෙහි පිතින් හටගන්නා වූ ද ඇතැම් වෙදනාවෝ උපදිත්, සීවක, පිතින් හටගන්නා වූ ද ඇතැම් වෙදනාවෝ යම්සේ මෙහි උපදිත් නම් මෙය තමා විසිනුදු දතයුතු ය. සීවක, පිතින් හටගන්නා වූ ද ඇතැම් වෙදනාවෝ යම්සේ මෙහි උපදිත් නම් මෙය ලෝවැසියන් විසිනුදු සැබෑ ය යි සම්මත ය. සීවක, එහි ලා යම් ඒ මහණ බමුණු කෙනෙක් ''මේ පුරිස්පුහුල් තෙමේ සුව වූ හෝ දුක් වූ හෝ මැදහත් වූ හෝ යම් කිසි වෙදනාවක් විඳී නම් ඒ සියල්ල පෙර කළ කම් හේතු කොටගෙන ය''යි මෙබඳු වාද ඇත්තාහු නම් මෙබඳු දිටු ඇත්තාහු නම් (ඔහු) යමකුත් තමා විසින් දන්නා ලද්දේ නම් එයත් ඉක්ම යෙති. යමකුත් ලොව සැබෑ ය යි සම්මත නම් එයත් ඉක්ම යෙති. එහෙයින් ඒ මහණ බමුණන්ගේ (බස) මුසා ය යි කියමි.

සීවක, සෙමින් හටගන්නා වූ ද ... සීවක, වාතයෙන් හටගන්නා වූ ද ... සීවක, සන්නිපාතයෙන් හටගන්නා වූ ද ... සීවක, ඍතුවිපර්‍ය්‍යාසයෙන් හටගන්නා වූ ද .. සීවක, විෂමපරිහරණයෙන් හටගන්නා වූ ද ... සීවක, උපක්‍රමයෙන් හටගන්නා වූ ද ... සීවක, කර්මවිපාකයෙන් හටගන්නා වූ ද, ඇතැම් වේදනාවෝ මෙහි උපදිත්. සීවක, කර්මවිපාකයෙන් හටගන්නා වූ ඇතැම් වෙදනාවෝ යම් සේ මෙහි උපදිත් නම් මෙය තමා විසිනුදු දතයුතු යි. සීවක කම්විපාකයෙන් හටගන්නා වූ ඇතැම් වෙදනාවෝ යම්සේ මෙහි උපදිත් නම් එය ලෝවැසියන් විසිනුදු සැබෑ ය යි සම්මත ය. සීවක එහි ලා යම් ඒ මහණ බමුණු කෙනෙක් ''මේ පුරිස් පුහුල් තෙමේ සුව වූ හෝ දුක් වූ හෝ නොදුක්නොසුව වූ හෝ යම් කිසි වෙදනාවක් විඳී නම් ඒ සියල්ල පෙර කළ කම් හේතු කොට ගෙන ය''යි මෙබඳු වාද ඇත්තාහු නම් මෙබඳු දිටු ඇත්තාහු නම් (ඔහු) යමකුත් තමා විසින් දන්නා ලද්දේ නම් එයත් ඉක්ම යෙති. යමකුත් ලොව සැබෑ යයි සම්මත නම් එයත් ඉක්ම යෙති, එහෙයින් ඒ මහණ බමුණන්ගේ මුසා ය යි කියමි යි.

එවං වුත්තෙ මොළියසීවකො පරිබ්බාජකො භගවන්තං එතදවොච: "අභික්කන්තං භො ගොතම -පෙ- උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගත"න්ති.

පිත්තං සෙම්හඤ්ච වාතො ච සන්නිපාතා උතූනි ච
විසමං ඔපක්කමිකො ච කම්මවිපාකෙන අට්ඨමීති.

## 2. 3. 2

## අට්ඨසතපරියායසුත්තං

270. අට්ඨසතපරියායං වො භික්ඛවෙ ධම්මපරියායං දෙසිස්සාමි. තං සුණාථ. කතමො ච භික්ඛවෙ අට්ඨසතපරියායො ධම්මපරියායො: **ද්වෙපි**[1] මයා භික්ඛවෙ වෙදනා වුත්තා පරියායෙන, තිස්සොපි මයා වෙදනා වුත්තා පරියායෙන, පඤ්චපි මයා වෙදනා වුත්තා පරියායෙන, ඡපි මයා වෙදනා වුත්තා පරියායෙන, අට්ඨාරසාපි මයා වෙදනා වුත්තා පරියායෙන, ඡත්තිංසාපි මයා වෙදනා වුත්තා පරියායෙන, අට්ඨසතම්පි මයා වෙදනා වුත්තා පරියායෙන.

කතමා ච භික්ඛවෙ ද්වෙ වෙදනා: කායිකා ච චෙතසිකා ච, ඉමා වුච්චන්ති භික්ඛවෙ ද්වෙ වෙදනා. කතමා ච භික්ඛවෙ තිස්සො වෙදනා: සුඛා වෙදනා දුක්ඛා වෙදනා අදුක්ඛමසුඛා වෙදනා, ඉමා වුච්චන්ති භික්ඛවෙ තිස්සො වෙදනා. කතමා ච භික්ඛවෙ පඤ්ච වෙදනා: සුඛින්ද්‍රියං දුක්ඛින්ද්‍රියං සොමනස්සින්ද්‍රියං දොමනස්සින්ද්‍රියං උපෙක්ඛින්ද්‍රියං, ඉමා වුච්චන්ති භික්ඛවෙ පඤ්ච වෙදනා. කතමා ච භික්ඛවෙ ඡ වෙදනා: චක්ඛුසම්ඵස්සජා වෙදනා සොත -පෙ- ඝාන -පෙ- ජිව්හා -පෙ- කාය -පෙ- මනොසම්ඵස්සජා වෙදනා, ඉමා වුච්චන්ති භික්ඛවෙ ඡ වෙදනා.

කතමා ච භික්ඛවෙ අට්ඨාරස වෙදනා: ඡ සොමනස්සූපවිචාරා ඡ දොමනස්සූපවිචාරා ඡ උපෙක්ඛූපවිචාරා, ඉමා වුච්චන්ති භික්ඛවෙ අට්ඨාරස වෙදනා. කතමා ච භික්ඛවෙ ඡත්තිංස[2] වෙදනා: ඡ ගෙහසිතානි සොමනස්සානි ඡ නෙක්ඛම්මසිතානි සොමනස්සානි ඡ ගෙහසිතානි දොමනස්සානි ඡ නෙක්ඛම්මසිතානි දොමනස්සානි ඡ ගෙහසිතා උපෙක්ඛා ඡ නෙක්ඛම්මසිතා උපෙක්ඛා, ඉමා වුච්චන්ති භික්ඛවෙ ඡත්තිංස වෙදනා. කතමා ච භික්ඛවෙ අට්ඨසත[3] වෙදනා: අතීතා ඡත්තිංස වෙදනා, අනාගතා ඡත්තිංස වෙදනා, පච්චුප්පන්නා ඡත්තිංස වෙදනා, ඉමා වුච්චන්ති භික්ඛවෙ අට්ඨසතවෙදනා. අයං භික්ඛවෙ අට්ඨසතපරියායො ධම්මපරියායොති.

---

1. ද්වෙ - සිමු.
2. ඡත්තිංසා - සී 1,
3. අට්ඨසතං - සී 1, 2

මෙසේ වදළ කල්හි මොළිය සීවක පිරිවැජි භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය. "භවත් ගෞතමයෙනි, ඉතා මැනවි ... භවත් ගෞතමයන් වහන්සේ මා අද පටන් දිවිහිමියෙන් සරණ ගිය උපාසකයකු කොට දරන සේක්වා"යි.

පිත ද සෙම ද වාතය ද සන්නිපාත ද ඍතු ද විෂම පරිහරණය ද උපක්‍රමය ද කර්මවිපාකයෙන් අටවැන්න ද වේ යි.

## 2. 3. 2

## අට්ඨසතපරියාය සූත්‍රය

270. මහණෙනි, අට්ඨසතපරියාය නම් වූ දහම්නය තොපට දේශනා කරන්නෙමි. එය අසවු, මහණෙනි, අට්ඨසත පරියාය නම් වූ දහම්නය කවරේ ද යත්: මහණෙනි, මා විසින් නයවශයෙන් වෙදනා දෙකෙකුදු කියන ලදී, මා විසින් නය වශයෙන් වෙදනා තුනෙකුදු කියන ලදී, මා විසින් නය වශයෙන් වෙදනා පසෙකුදු කියන ලදී, මා විසින් නය වශයෙන් වෙදනා සයෙකුදු කියන ලදී මා විසින් නය වශයෙන් වෙදනා අටළොසෙකුදු කියන ලදී, මා විසින් නය වශයෙන් වෙදනා සතිසෙකුදු කියන ලදී. මා විසින් නය වශයෙන් වෙදනා අටෝරාසියෙකුදු කියන ලදී.

මහණෙනි, වෙදනා දෙක කවරේ ද යත්: කායික වෙදනාව ද චෙතසික වෙදනාව ද යි. මහණෙනි, මොහු වෙදනා දෙක යයි කියනු ලැබෙත්. මහණෙනි, වෙදනා තුන කවරේ ද යත්: සුව වෙදනා ය දුක් වෙදනා ය මැදහත් වෙදනා ය යි. මහණෙනි මොහු වෙදනා තුන යයි කියනු ලැබෙත්. මහණෙනි, වෙදනා පස කවරේ ද යත්: සුඛින්ද්‍රිය ය දුක්ඛින්ද්‍රිය ය සොමනස්සින්ද්‍රිය ය දෙමනස්සින්ද්‍රිය ය උපෙක්ඛින්ද්‍රිය යි, මහණෙනි, මොහු වෙදනා පස යයි කියනු ලැබෙත්. මහණෙනි, වෙදනා සය කවරේ ද යත්: චක්ඛුසම්ඵස්සයෙන් හටගත් වෙදනා ය සොත ... ඝාන ... ජිව්හා ... කාය ... මනොසම්ඵස්සයෙන් හටගත්. වෙදනා යි. මහණෙනි, මොහු වෙදනා සය යයි කියනු ලැබෙත්.

මහණෙනි, වෙදනා අටළොස කවරේ ද යත්: සොම්නස සමග හැසිරෙන සය ය, දෙම්නස සමග හැසිරෙන සය ය, මැදහත් බව සමග හැසිරෙන සය යි. මහණෙනි, මොහු වෙදනා අටළොස යි කියනු ලැබෙත්. මහණෙනි, වෙදනා සතිස කවරේ ද යත්: පස්කම් ගුණ ඇසුරු කළ සොම්නස් සය ය, නෙක්ඛම්මය ඇසුරු කළ සොම්නස් සයය, පස්කම් ගුණ ඇසුරුකළ දෙම්නස් සය ය. නෙක්ඛම්මය ඇසුරුකළ දෙම්නස් සයය පස්කම්ගුණ ඇසුරුකළ උපෙක්ෂා සය ය නෙක්ඛම්මය ඇසුරුකළ උපෙක්ෂා සය යි. මහණෙනි, මොහු වෙදනා සතිසැ යි කියනු ලැබෙත්. මහණෙනි, වෙදනා එක්සියඅට කවරේ ද යත්: අතීත සතිස් වෙදනා ය අනාගත සතිස් වෙදනා ය පච්චුප්පන්න සතිස් වෙදනා යි. මහණෙනි, මොහු වෙදනා එක්සිය අට යයි කියනු ලැබෙත්. මහණෙනි, මේ අට්ඨසත පරියාය නම් වූ දහම් නය යි.

## 2. 3. 3

## භික්ඛුසුත්තං

271. අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: කතමා නු ඛො භන්තෙ වෙදනා? කතමො වෙදනාසමුදයො? කතමා වෙදනාසමුදයගාමිනී පටිපදා? කතමො වෙදනානිරොධො? කතමා වෙදනානිරොධගාමිනී පටිපදා? කො වෙදනාය අස්සාදො? කො ආදීනවො? කිං නිස්සරණන්ති?

තිස්සො ඉමා භික්ඛු වෙදනා, සුඛා වෙදනා දුක්ඛා වෙදනා අදුක්ඛමසුඛා වෙදනා, ඉමා වුච්චන්ති භික්ඛු වෙදනා. ඵස්සසමුදයා වෙදනාසමුදයො. තණ්හා වෙදනාසමුදයගාමිනී පටිපදා. ඵස්සනිරොධා වෙදනානිරොධො. අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො වෙදනානිරොධගාමිනී පටිපදා. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. යං වෙදනං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං අයං වෙදනාය අස්සාදො. යා වෙදනා අනිච්චා දුක්ඛා විපරිණාමධම්මා අයං වෙදනාය ආදීනවො. යො වෙදනාය ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහානං, ඉදං වෙදනාය නිස්සරණන්ති.

## 2. 3. 4

## පුබ්බෙසුත්තං

272. පුබ්බෙව මෙ භික්ඛවෙ සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො එතදහොසි: කතමා නු ඛො වෙදනා, කතමො වෙදනාසමුදයො, කතමා වෙදනාසමුදයගාමිනී පටිපදා, කතමො වෙදනානිරොධො, කතමා වෙදනානිරොධගාමිනී පටිපදා, කො වෙදනාය අස්සාදො, කො ආදීනවො, කිං නිස්සරණන්ති.

තස්ස මය්හං භික්ඛවෙ එතදහොසි: තිස්සො ඉමා වෙදනා, සුඛා වෙදනා, දුක්ඛා වෙදනා, අදුක්ඛමසුඛා වෙදනා. ඉමා වුච්චන්ති වෙදනා. ඵස්සසමුදයා වෙදනාසමුදයො. තණ්හා වෙදනාසමුදයගාමිනී පටිපදා -පෙ- යො වෙදනාය ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහානං, ඉදං වෙදනාය නිස්සරණන්ති.

## 2. 3. 3

## භික්ඛු සූත්‍රය

271. එකල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය ... එකත්පස්ව හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: වහන්ස, වේදනාවෝ කවරහු ද? වේදනා සමුදය කවරේ ද? වේදනා සමුදයගාමිනීපටිපදව කවර ද? වේදනා නිරොධය කවරේ ද? වේදනානිරොධගාමිනී පටිපදව කවර ද? වේදනාවේ අස්සාදය කවරේ ද? ආදීනවය කවරේ ද? නිස්සරණය කුමක් දැ?යි

මහණ, මේ වේදනා තුනෙකි. සුව වේදනා ය දුක්වේදනා ය මැදහත් වේදනා යි. මහණ, මොහු වේදනා යි කියනු ලැබෙත්. ඵස්සසමුදයෙන් වේදනා සමුදය වේ. තණ්හාව වේදනාසමුදය-ගාමිනීපටිපදව යි. ඵස්සනිරෝධයෙන් වේදනානිරෝධය වේ. මේ අරිඅටඟිමග ම වේදනානිරෝධගාමිනීපටිපදව යි. එනම්: සම්මාදිට්ඨි ය ... සම්මාසමාධි යි. වේදනාව නිසා යම් සුවයෙක් සොම්නසෙක් උපදී නම් මේ වේදනාවේ ආස්වාද යි. යම් වේදනාවක් අනිස නම් දුක් නම් වෙනස්වනසුලු නම් මේ වේදනාවේ ආදීනව යි. වේදනායෙහි යම් ඡන්දරාගය දුරු කිරීමෙක් ඡන්දරාගය ප්‍රහාණයෙක් වේ නම් මේ වේදනාවේ නිස්සරණ යි.

## 2. 3. 4

## පුබ්බෙ සූත්‍රය

272. මහණෙනි, සම්බෝධියෙන් පෙර ම චතුස්සත්‍යාවබොධය නො කළ බෝසත් වූ මැ මට මේ සිත විය. වේදනා කවරහු ද, වේදනා සමුදය කවරේ ද, වේදනාසමුදයගාමිනී පටිපදව කවර ද? වේදනානිරෝධය කවරේ ද, වේදනානිරෝධගාමිනී පටිපදව කවර ද, වේදනාවේ ආස්වාදය කිමෙක් ද, ආදීනවය කිමෙක් ද, නිස්සරණය කිමෙක් දැ යි.

මහණෙනි, ඒ මට මේ සිත විය: මේ වේදනා තුනෙකි: සුව වේදනා ය දුක්වේදනා ය මැදහත් වේදනා යි. මොහු වේදනා යි කියනු ලැබෙත්. ඵස්සසමුදයෙන් වේදනාසමුදය වේ. තණ්හාව වේදනාසමුදයගාමිනී පටිපදව යි ... වේදනායෙහි යම් ඡන්දරාගය දුරුකිරීමෙක් ඡන්දරාගය පැහීමෙක් වේ නම් මේ වේදනායෙහි නිස්සරණ යි.

## 2. 3. 5

### ඤාණසුත්තං

273. ඉමා වෙදනාති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි, අයං වෙදනා සමුදයොති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි, අයං වෙදනා[1]සමුදයගාමිනී පටිපදති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි, අයං වෙදනා නිරොධොති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි, අයං වෙදනා නිරොධගාමිනී පටිපදති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු -පෙ- අයං වෙදනාය අස්සාදොති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු -පෙ- අයං වෙදනාය ආදීනවොති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු -පෙ- ඉදං වෙදනාය නිස්සරණන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදීති.

## 2. 3. 6

### සම්බහුලභික්ඛුසුත්තං

274. අථ ඛො සම්බහුලා භික්ඛූ යෙන භගවා තෙනුපසඞ්කමිංසු -පෙ- එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: කතමා නු ඛො භන්තෙ වෙදනා? කතමො වෙදනාසමුදයො? කතමා වෙදනාසමුදයගාමිනීපටිපදා? කතමො වෙදනානිරොධො? කතමා වෙදනානිරොධගාමිනී පටිපදා? කො වෙදනාය අස්සාදො? කො ආදීනවො? කිං නිස්සරණන්ති?

තිස්සො ඉමා භික්ඛවෙ වෙදනා: සුඛා වෙදනා. දුක්ඛා වෙදනා, අදුක්ඛමසුඛා. වෙදනා ඉමා වුච්චන්ති භික්ඛවෙ වෙදනා. ඵස්සසමුදයා වෙදනාසමුදයො, තණ්හා වෙදනාසමුදයගාමිනී පටිපදා, ඵස්සනිරොධා වෙදනානිරොධො. -පෙ- යො වෙදනාය ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහානං, ඉදං වෙදනාය නිස්සරණන්ති.

## 2. 3. 7

### සමණබ්‍රාහ්මණසුත්තං

275. තිස්සො ඉමා භික්ඛවෙ වෙදනා, කතමා තිස්සො: සුඛා වෙදනා දුක්ඛා වෙදනා අදුක්ඛමසුඛා වෙදනා. යෙ හි කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා ඉමාසං තිස්සන්නං වෙදනානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං නප්පජානන්ති -පෙ- පජානන්ති -පෙ- සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්තීති.

---

1. වෙදනාය - සී 1. 2.

## 2. 3. 5

## ඤාණ සූත්‍රය

273. මහණෙනි, මොහු වේදනාවෝ ය යි පෙර නො ඇසූ විරූ දහම්හි මට ඇස පහළ විය. විද්‍ය පහළ විය. පැන පහළ විය. නැණ පහළ විය. එළිය පහළ විය. මහණෙනි, මේ වේදනා සමුදය ය යි පෙර නො ඇසූ විරූ දහම්හි මට ඇස පහළ විය. ... එළිය පහළ විය. මහණෙනි, මේ වෙදනාසමුදයගාමිනී පටිපදව ය යි පෙර නො ඇසූ විරූ දහම්හි මට ඇස පහළ විය. ... එළිය පහළ විය. මහණෙනි, මේ වේදනා නිරෝධ ය යි පෙර නො ඇසූවිරූ දහම්හි මට ඇස පහළ විය. ... එළිය පහළ විය. මහණෙනි, මේ වේදනානිරෝධගාමිනී පටිපදව ය යි පෙර නො ඇසූ විරූ දහම්හි මට ... මහණෙනි, මේ වේදනාවේ ආස්වාදය යි පෙර නො ඇසූ විරූ දහම්හි මට ... මහණෙනි, මේ වේදනාවේ ආදීනවය යි පෙර නො ඇසූ විරූ දහම්හි මට ... මහණෙනි, මේ වේදනාවේ නිස්සරණ ය යි පෙර නො ඇසූ විරූ දහම්හි ඇස පහළ විය. නැණ පහළ විය. පැන පහළ විය. විද්‍ය පහළ විය. එළිය පහළ වී ය යි.

## 2. 3. 6

## සම්බහුලභික්ඛු සූත්‍රය

274. එකල්හි බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ ... එකත්පසෙක හුන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ: වහන්ස, වෙදනාවෝ කවරහු ද? වෙදනාසමුදය කවරේ ද? වෙදනාසමුදයගාමිනී පටිපදව කවර ද? වෙදනානිරොධය කවරේ ද? වෙදනානිරොධගාමිනී පටිපදව කවර ද? වෙදනාවේ ආස්වාදය කිමෙක් ද? ආදිනවය කිමෙක් ද? නිස්සරණය කිමෙක් දැ?යි.

මහණෙනි, මේ වෙදනා තුනෙකි: සුවවෙදනා ය දුක්වෙදනා ය මැදහත් වෙදනා යි. මහණෙනි, මොහු වෙදනා යි කියනු ලැබෙත්, ඵස්සසමුදයයෙන් වෙදනා සමුදය ය වේ. තණ්හාව වෙදනාසමුදය-ගාමිනී පටිපදව යි. ඵස්සනිරොධයෙන් වෙදනානිරොධය වේ ... වෙදනාවෙහි යම් ඡන්දරාගය දුරලීමෙක් යම් ඡන්දරාගය ප්‍රහාණයෙක් වේ නම් මෙය වෙදනාවේ නිස්සරණ යි.

## 2. 3. 7

## සමණබ්‍රාහ්මණ සූත්‍රය

275. මහණෙනි, මේ වෙදනා තුනෙකි. කවර තුනෙක් ද යත්: සුවවෙදනා ය දුක් වෙදනා ය මැදහත් වෙදනා යි. මහණෙනි, යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් මේ තුන් වෙදනා-වන්ගේ සමුදයත් අස්තඞ්ගමයත් ආස්වාදයත් ආදීනවයත් නිස්සරණයත් තතුසේ නො දනිත් ද ... දනිත් ද, ... තෙමේ ම වෙසෙසින් දැන පසක් කොට එයට එළඹ වෙසෙති යි.

## 2. 3. 8

### දුතිය සමණබ්‍රාහ්මණසුත්තං

276. තිස්සො ඉමා භික්ඛවෙ වෙදනා. කතමා තිස්සො: සුඛා වෙදනා දුක්ඛා වෙදනා අදුක්ඛමසුඛා වෙදනා. යෙ හි කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා ඉමාසං තිස්සන්නං වෙදනානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං නප්පජානන්ති -පෙ- පජානන්ති -පෙ- සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්තීති.

## 2. 3. 9

### තතිය සමණබ්‍රාහ්මණසුත්තං

277. යෙ හි කොචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා වෙදනං නප්පජානන්ති, වෙදනාසමුදයං නප්පජානන්ති, වෙදනානිරොධං නප්පජානන්ති, වෙදනානිරොධගාමිනිං පටිපදං නප්පජානන්ති, -පෙ- පජානන්ති, -පෙ- සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්තීති.

## 2. 3. 10

### සුද්ධිකවෙදනාසුත්තං

278. තිස්සො ඉමා භික්ඛවෙ වෙදනා. කතමා තිස්සො: සුඛා වෙදනා දුක්ඛා වෙදනා අදුක්ඛමසුඛා වෙදනා. ඉමා ඛො භික්ඛවෙ තිස්සො වෙදනාති.

## 2. 3. 11

### නිරාමිසසුත්තං

279. අත්ථි භික්ඛවෙ සාමිසා පීති, අත්ථි නිරාමිසා පීති, අත්ථි නිරාමිසා නිරාමිසතරා පීති. අත්ථි සාමිසං සුඛං, අත්ථි නිරාමිසං සුඛං, අත්ථි නිරාමිසා නිරාමිසතරං සුඛං. අත්ථි සාමිසා උපෙඛා, අත්ථි නිරාමිසා උපෙඛා, අත්ථි නිරාමිසා නිරාමිසතරා උපෙඛා. අත්ථි සාමිසො විමොක්ඛො, අත්ථි නිරාමිසො විමොක්ඛො, අත්ථි නිරාමිසා නිරාමිසතරො විමොක්ඛො.

කතමා ච භික්ඛවෙ[1] සාමිසා පීති: පඤ්චිමෙ භික්ඛවෙ කාමගුණා, කතමෙ පඤ්ච: චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. ඉමෙ ඛො භික්ඛවෙ පඤ්චකාමගුණා, යං ඛො භික්ඛවෙ ඉමෙ පඤ්චකාමගුණෙ පටිච්ච උප්පජ්ජති පීති, අයං වුච්චති භික්ඛවෙ සාමිසා පීති.

1. කතමා ච සා භික්ඛවෙ - සී 1.

## 2. 3. 8

## දුතිය සමණබ්‍රාහ්මණ සූත්‍රය

276. මහණෙනි, මේ වේදනා තුනෙකි. කවර තුනෙක් ද යත්: සුව වේදනා ය දුක්වේදනා ය මැදහත්වේදනා යි. මහණෙනි, යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ මේ තුන් වේදනාවන්ගේ සමුදයයත් අස්තඞ්ගමයත් ආස්වාදයත් ආදීනවයත් නිස්සරණයත් තතුසේ නො දනිත් ද ... දනිත් ද ... තුමූ වෙසෙසින් දැන පසක් කොට එයට පැමිණ වෙසෙත් යයි.

## 2. 3. 9

## තතිය සමණබ්‍රාහ්මණ සූත්‍රය

277. මහණෙනි, යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ වේදනාව නො දනිත් ද, වේදනා සමුදය නො දනිත් ද, වේදනා නිරෝධය නො දනිත් ද, වේදනා නිරොධගාමිනී පටිපදව නො දනිත් ද, ... දනිත් ද ... තුමූ වෙසෙසින් දැන පසක් කොට එයට පැමිණ වෙසෙත් යයි.

## 2. 3. 10

## සුද්ධිකවේදනා සූත්‍රය

278. මහණෙනි, මේ වේදනා තුනෙකි. කවර තුනෙක් ද යත්: සුවවේදනා ය දුක්වේදනා ය නොදුක් නොසුව වේදනා යි. මහණෙනි, මොහු තුන් වේදනාවෝ යි.

## 2. 3. 11

## නිරාමිස සූත්‍රය

279. මහණෙනි, සාමිස ප්‍රීතියක් ඇත, නිරාමිස ප්‍රීතියක් ඇත, නිරාමිස ප්‍රීතියට වඩා වැඩි වූ නිරාමිසතර ප්‍රීතියක් ඇත. සාමිස සුවයෙක් ඇත, නිරාමිස සුවයෙක් ඇත, නිරාමිස සුවයට වඩා වැඩි වූ නිරාමිසතර සුවයෙක් ඇත, සාමිස උපේක්ෂාවක් ඇත, නිරාමිස උපේක්ෂාවක් ඇත, නිරාමිස උපේක්ෂාවට වඩා වැඩි වූ නිරාමිසතර උපේක්ෂාවක් ඇත. සාමිස විමෝක්ෂයෙක් ඇත, නිරාමිස විමෝක්ෂයෙක් ඇත, නිරාමිස විමෝක්ෂයට වඩා වැඩි වූ නිරාමිස-තර විමෝක්ෂයෙක් ඇත.

මහණෙනි, සාමිසප්‍රීතිය කවර යත්: මහණෙනි, මේ කාමගුණ පසෙකි. කවර පසෙක් ද යත්: ඉටු කැමැති මනවඩන ප්‍රියස්වරූප වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු ඇසින් දතයුතු රූපය .. ඉටු කැමති මනවඩන ප්‍රිය ස්වරූප වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු කයින් දතයුතු පහස් ය. මහණෙනි, මොහු පස්කම්ගුණයෝ ය. මහණෙනි, මේ පස්කම්ගුණ නිසා යම් ප්‍රීතියක් උපදී නම් මහණෙනි, මේ සාමිස ප්‍රීතිය යි කියනු ලැබෙ.

කතමා ච භික්ඛවෙ නිරාමිසා පීති: ඉධ භික්ඛවෙ භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති, විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං[2] පීතිසුඛං දුතියජ්ඣානං උපසම්පජ්ජ විහරති, අයං වුච්චති භික්ඛවෙ නිරාමිසා පීති.

කතමා ච භික්ඛවෙ නිරාමිසා නිරාමිසතරා පීති: යා ඛො භික්ඛවෙ ඛීණාසවස්ස භික්ඛුනො රාගා චිත්තං විමුත්තං පච්චවෙක්ඛතො දොසා චිත්තං විමුත්තං පච්චවෙක්ඛතො මොහා චිත්තං විමුත්තං පච්චවෙක්ඛතො උප්පජ්ජති පීති. අයං වුච්චති භික්ඛවෙ නිරාමිසා නිරාමිසතරා පීති.

කතමඤ්ච භික්ඛවෙ සාමිසං සුඛං: පඤ්චිමෙ භික්ඛවෙ කාමගුණා, කතමෙ පඤ්ච: චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, ඉමෙ ඛො භික්ඛවෙ පඤ්චකාමගුණා. යං ඛො භික්ඛවෙ ඉමෙ පඤ්චකාමගුණෙ පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, ඉදං වුච්චති භික්ඛවෙ සාමිසං සුඛං.

කතමඤ්ච භික්ඛවෙ නිරාමිසං සුඛං: ඉධ භික්ඛවෙ භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති, විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියජ්ඣානං උපසම්පජ්ජ විහරති, පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති, යං තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති තං තතියජ්ඣානං උපසම්පජ්ජ විහරති. ඉදං වුච්චති භික්ඛවෙ නිරාමිසං සුඛං.

කතමඤ්ච භික්ඛවෙ නිරාමිසා නිරාමිසතරං සුඛං: යං ඛො භික්ඛවෙ ඛීණාසවස්ස භික්ඛුනො රාගා චිත්තං විමුත්තං පච්චවෙක්ඛතො දොසා චිත්තං විමුත්තං පච්චවෙක්ඛතො මොහා චිත්තං විමුත්තං පච්චවෙක්ඛතො උප්පජ්ජති සුඛං සොමනස්සං, ඉදං වුච්චති භික්ඛවෙ නිරාමිසානිරාමිසතරං සුඛං.

---

2. දුතියං ඣානං - මජසං·

මහණෙනි, නිරාමිස ප්‍රීතිය කවර යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ කාමයන්ගෙන් වෙන්ව ම අකුශලධර්‍මයන්ගෙන් වෙන්ව ම විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් උපන් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමධ්‍යානයට එළඹ වෙසෙයි. විතර්කවිචාරයන්ගේ සන්හිඳී-මෙන් ඇතුළත පැහැදීම ඇති සිතේ එකහබැව් ඇති විතර්ක රහිත විචාර රහිත සමාධියෙන් උපන් ප්‍රීතිය හා සැපය ඇති ද්විතීය-ධ්‍යානයට එළඹ වෙසෙයි. මහණෙනි, මේ නිරාමිස ප්‍රීතිය යි කියනු ලැබේ.

මහණෙනි, නිරාමිස ප්‍රීතියට වඩා වැඩි වූ නිරාමිසතර ප්‍රීතිය කවර යත්: මහණෙනි, රාගයෙන් මිදුණු සිත පස්විකන දෙසයෙන් මිදුණු සිත පස්විකන මෝහයෙන් මිදුණු සිත පස්විකන රහත් මහණහට යම් ප්‍රීතියක් උපදී ද, මහණෙනි, මේ නිරාමිස ප්‍රීතියට වඩා වැඩි වූ නිරාමිසතර ප්‍රීතිය යි කියනු ලැබේ.

මහණෙනි, සාමිස සුවය කවරේ ද යත්: මහණෙනි, මේ කම්ගුණ පසෙකි. කවර පසෙක් ද යත්: ඉටු කැමති මනවඩන ප්‍රියස්වරූප වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු ඇසින් දතයුතු රූපය. ... ඉටු කැමති මනවඩන ප්‍රියස්වරූප වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු කයින් දතයුතු පහස ය. මහණෙනි, මොහු පස්කම් ගුණයෝ ය. මහණෙනි, මේ පස්කම්ගුණ නිසා යම් සුවයෙක් සොම්නසෙක් උපදී නම් මහණෙනි, මේ සාමිස සුවය යි කියනු ලැබේ.

මහණෙනි, නිරාමිස සුවය කවරේ ද යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ කාමයන්ගෙන් වෙන්ව මැ අකුසල්දහමින් වෙන් ව මැ විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සුවය ඇති පළමුවන දූහැනට එළඹ වෙසෙයි. විතර්ක විචාරයන්ගේ සන්-හිඳීමෙන් ඇතුළත පැහැදීම ඇති සිතේ එකහබැව් ඇති විතර්ක රහිත විචාර රහිත සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සුවය ඇති දෙවන දූහැනට එළඹ වෙසෙයි. ප්‍රීතියත් දුරු කිරීමෙන් උපේක්ෂා ඇත්තේත් වෙසෙයි. සිහි ඇත්තේ මනා දැනුම් ඇත්තේ කයින් සුවත් විඳියි. උපේක්ෂා ඇත්තේ ය. සිහි ඇත්තේ ය. සුවවිහරණ ඇත්තේ ය යි. ආයර්‍යයෝ ඒ යමකට කියත් නම් ඒ තෙවන දූහැනට එළඹ වෙසෙයි. මහණෙනි, මේ නිරාමිස සුවය යි කියනු ලැබේ.

මහණෙනි, නිරාමිස සුවයට වඩා වැඩි වූ නිරාමිසතර සුවය කවරේ ද යත්: මහණෙනි, රාගයෙන් මිදුණු සිත පස්විකන දෙස-යෙන් මිදුණු සිත පස්විකන මෝහයෙන් මිදුණු සිත පස්විකන රහත් මහණහුට යම් සුවයෙක් සොම්නසෙක් උපදී නම් මහණෙනි, මෙය නිරාමිස සුවයට වඩා වැඩි වූ නිරාමිසතර සුවය යි කියනු ලැබේ.

කතමා ච භික්ඛවෙ සාමිසා උපෙක්ඛා: පඤ්චිමෙ භික්ඛවෙ කාමගුණා, කතමෙ පඤ්ච: චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, ඉමෙ ඛො භික්ඛවෙ පඤ්චකාමගුණා, යා ඛො භික්ඛවෙ ඉමෙ පඤ්ච කාමගුණෙ පටිච්ච උප්පජ්ජති උපෙක්ඛා, අයං වුච්චති භික්ඛවෙ සාමිසා උපෙක්ඛා.

කතමා ච භික්ඛවෙ නිරාමිසා උපෙක්ඛා: ඉධ භික්ඛවෙ භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදෙමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති. අයං වුච්චති භික්ඛවෙ නිරාමිසා උපෙක්ඛා.

කතමා ච භික්ඛවෙ නිරාමිසා නිරාමිසතරා උපෙක්ඛා: යා ඛො භික්ඛවෙ ඛීණාසවස්ස භික්ඛුනො රාගා චිත්තං විමුත්තං පච්චවෙක්ඛතො දොසා චිත්තං විමුත්තං පච්චවෙක්ඛතො මොහා චිත්තං විමුත්තං පච්චවෙක්ඛතො උප්පජ්ජති උපෙක්ඛා, අයං වුච්චති භික්ඛවෙ නිරාමිසා නිරාමිසතරා උපෙක්ඛා.

කතමො ච භික්ඛවෙ සාමිසො විමොක්ඛො: රූපපටිසඤ්ඤුත්තො විමොක්ඛො සාමිසො විමොක්ඛො. කතමො ච භික්ඛවෙ නිරාමිසො විමොක්ඛො: අරූපපටිසඤ්ඤුත්තො විමොක්ඛො නිරාමිසො විමොක්ඛො. කතමො ච භික්ඛවෙ නිරාමිසා නිරාමිසතරො විමොක්ඛො[1]: යො ඛො භික්ඛවෙ ඛීණාසවස්ස භික්ඛුනො රාගා චිත්තං විමුත්තං පච්චවෙක්ඛතො දොසා චිත්තං විමුත්තං පච්චවෙක්ඛතො මොහා චිත්තං විමුත්තං පච්චවෙක්ඛතො උප්පජ්ජති විමොක්ඛො, අයං වුච්චති භික්ඛවෙ නිරාමිසා නිරාමිසතරො විමොක්ඛොති.

අට්ඨසතපරියායවග්ගො තතියො.

තත්‍රුද්දානං:

සීවකට්ඨසතං භික්ඛු පුබ්බෙඤාණඤ්ච භික්ඛුනා
සමණබ්‍රාහ්මණා තීණි සුද්ධිකඤ්ච නිරාමිසනති.

වෙදනාසංයුත්තං නිට්ඨිතං

1 විමොක්ඛො - සී 1.

මහණෙනි, සාමිස උපේක්ෂාව කවර ද යත්: මහණෙනි, මේ කම්ගුණ පසෙකි. කවර පසෙක් ද යත්: ඉටු කැමති මනවඩන ප්‍රියස්වරූප වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු ඇසින් දතයුතු රූපය ... ඉටු කැමති මනවඩන ප්‍රියස්වරූප වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු කයින් දතයුතු පහස් ය. මහණෙනි, මොහු පස්කම්ගුණයෝ ය. මහණෙනි, මේ පස්කම්ගුණ නිසා යම් උපේක්ෂාවක් උපදී නම් මහණෙනි, මෙය සාමිස උපේක්ෂා ය යි කියනු ලැබේ.

මහණෙනි, නිරාමිස උපේක්ෂාව කවර යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ සුවයත් පැහීමෙන් දුකත් පැහීමෙන් පළමු මැ සොම්නස් දොම්නසුන් ගේ අභාවයෙන් නොදුක් වූ නොසුව වූ උපේක්ෂාවෙන් හා සිහියෙන් හටගත් පිරිසිදු බැව් ඇති සිවුවන දැහැනට එළඹ වෙසෙයි. මහණෙනි, මේ නිරාමිස උපේක්ෂාව ය යි කියනු ලැබේ.

මහණෙනි, නිරාමිස උපේක්ෂාවට වඩා වැඩි වූ නිරාමිසතර උපේක්ෂාව කවර යත්: මහණෙනි, රාගයෙන් මිදුණු සිත පස්විකන දෙසයෙන් මිදුණු සිත පස්විකන මෝහයෙන් මිදුණු සිත පස්විකන රහත් මහණහට යම් උපේක්ෂාවක් උපදී ද, මහණෙනි, මේ නිරාමිස උපේක්ෂාවට වැඩි වූ නිරාමිසතර උපේක්ෂාව ය යි කියනු ලැබේ.

මහණෙනි, සාමිස විමොක්ෂය කවරේ ද යත්: රූපයෙන් යුත් විමොක්ෂය සාමිස විමොක්ෂ යි. මහණෙනි, නිරාමිස විමොක්ෂය කවරේ ද යත්: අරූපයෙන් යුත් විමොක්ෂය නිරාමිස විමොක්ෂ යි. මහණෙනි, නිරාමිස විමොක්‍ෂයට වඩා වැඩි වූ නිරාමිසතර විමොක්ෂය කවරේ ද යත්: මහණෙනි, රාගයෙන් මිදුණු සිත පස්විකන දෙසයෙන් මිදුණු සිත පස්විකන මෝහයෙන් මිදුණු සිත පස්විකන රහත් මහණ හට යම් විමොක්‍ෂයෙක් උපදී ද, මහණෙනි, මේ නිරාමිස විමොක්ෂයට වඩා වැඩි වූ නිරාමිසතර විමොක්ෂ යි කියනු ලැබේ.

**තෙවැනි වූ අට්ඨසතපරියායවර්ග යි.**

**එහි සූත්‍රනාමාවලිය :**

සීවක අට්ඨසත භික්ඛු පුබ්බෙඤාණ සම්බහුලභික්ඛු යන සූත්‍ර සය ද සමණබ්‍රාහමණ සූත්‍ර තුන ද ශුද්ධික නිරාමිස සූත්‍ර දෙක ද යි එකොළොසෙකි.

## වේදනා සංයුක්තය නිමි.

# 3. මාතුගාමසංයුත්තං

## 1. මාතුගාමවග්ගො

### 3. 1. 1

### මාතුගාමසුත්තං

280. පඤ්චහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො මාතුගාමො එකන්තඅමනාපො හොති පුරිසස්ස. කතමෙහි පඤ්චහි: න ච රූපවා හොති, න ච භොගවා හොති, න ච සීලවා හොති, අලසො ච හොති, පජඤ්චස්ස න ලභති. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි අඞ්ගෙහි සමන්නාගතො මාතුගාමො එකන්තඅමනාපො හොති පුරිසස්ස.

පඤ්චහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො මාතුගාමො එකන්තමනාපො හොති පුරිසස්ස. කතමෙහි පඤ්චහි: රූපවා ච හොති, භොගවා ච හොති, සීලවා ච හොති, දක්ඛො ච හොති අනලසො, පජඤ්චස්ස ලභති. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි අඞ්ගෙහි සමන්නාගතො මාතුගාමො එකන්තමනාපො හොති පුරිසස්සාති.

### 3. 1. 2

### පුරිසසුත්තං

281. පඤ්චහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො පුරිසො එකන්තා-මනාපො හොති මාතුගාමස්ස. කතමෙහි පඤ්චහි: න ච රූපවා හොති, න ච භොගවා හොති, න ච සීලවා හොති, අලසො ච හොති, පජඤ්චස්ස න ලභති. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි අඞ්ගෙහි සමන්නාගතො පුරිසො එකන්තාමනාපො හොති මාතුගාමස්ස.

පඤ්චහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො පුරිසො එකන්තමනාපො හොති මාතුගාමස්ස. කතමෙහි පඤ්චහි: රූපවා ච හොති, භොගවා ච හොති, සීලවා ච හොති, දක්ඛො ච හොති අනලසො, පජඤ්චස්ස ලභති. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි අඞ්ගෙහි සමන්නාගතො පුරිසො එකන්තමනාපො හොති මාතුගාමස්සාති.

### 3. 1. 3

### ආවෙණිකදුක්ඛසුත්තං

282. පඤ්චිමානි භික්ඛවෙ මාතුගාමස්ස ආවෙණිකානි දුක්ඛානි යානි මාතුගාමො පච්චනුහොති අඤ්ඤත්‍රෙව පුරිසෙහි. කතමානි පඤ්ච: ඉධ භික්ඛවෙ මාතුගාමො දහරොව සමානො පතිකුලං ගච්ඡති, ඤාතකෙහි විනා හොති. ඉදං භික්ඛවෙ මාතුගාමස්ස පඨමං ආවෙණිකං දුක්ඛං යං මාතුගාමො පච්චනුහොති අඤ්ඤත්‍රෙව පුරිසෙහි. පුන ච පරං භික්ඛවෙ මාතුගාමො උතුනී හොති, ඉදං භික්ඛවෙ මාතුගාමස්ස දුතියං ආවෙණිකං දුක්ඛං යං මාතුගාමො පච්චනුහොති අඤ්ඤත්‍රෙව පුරිසෙහි.

# 3. මාතෘගාම සංයුත්තය

## 1. මාතුගාම වර්ගය

### 3. 1. 1

### මාතුගාම සූත්‍රය

280. මහණෙනි, අඞ්ගපසෙකින් යුත් මාගම පුරුෂයාට ඒකාන්තයෙන් අමනාප වේ. කවර පසෙකින් ද යත්: නො ද රූමත් වේ, නො ද ධනවත් වේ, නො ද සිල්වත් වෙයි, අලසත් වේ, ඔහුට දව ප්‍රජාවත් නො ලබයි. මහණෙනි, මේ අඞ්ගපසින් යුත් මාගම පුරුෂයාට ඒකාන්තයෙන් අමනාප වේ.

මහණෙනි, අඞ්ගපසෙකින් යුත් මාගම පුරුෂයාට ඒකාන්තයෙන් මනාප වෙයි. කවර පසෙකින් ද යත්: රූමත් ද වෙයි, ධනවත් ද වෙයි, සිල්වත් ද වෙයි, අනලස් ව දක්ෂ ද වෙයි, ඔහුට දව ප්‍රජාවත් ලබයි. මහණෙනි, මේ අඞ්ග පසින් යුත් මාගම පුරුෂයාට ඒකාන්තයෙන් මනාප වේ යි.

### 3. 1. 2

### පුරිස සූත්‍රය

281. මහණෙනි, අඞ්ගපසෙකින් යුත් පුරුෂ තෙමේ මාගමට ඒකාන්තයෙන් අමනාප වේ. කවර පසෙකින් ද යත්: නො ද රූමත් වෙයි, නො ද භෝගවත් වෙයි, නො ද සිල්වත් වෙයි, අලසත් වෙයි, ඔහුට (දව) ප්‍රජාව නො ද ලැබෙයි. මහණෙනි, මේ අඞ්ග පසින් යුත් පුරුෂ තෙමේ මාගමට ඒකාන්තයෙන් අමනාප වේ.

මහණෙනි, අඞ්ගපසෙකින් යුත් පුරුෂ තෙමේ මාගමට ඒකාන්තයෙන් මනාප වේ. කවර පසෙකින් ද යත්: රූමත් ද වෙයි, භෝගවත් ද වෙයි, සිල්වත් ද වෙයි, අනලස් ව දක්ෂ ද වෙයි, ඔහුට (දව) ප්‍රජාව ද ලැබෙයි. මහණෙනි, මේ පස්අඞින් යුත් පුරුෂ තෙමේ මාගමට ඒකාන්තයෙන් මනාප වේ යි.

### 3. 1. 3

### ආවෙණිකදුක්ඛ සූත්‍රය

282. මහණෙනි, පුරුෂයන් හැර මාගම යම් දුක් අනුභව කෙරේ නම් මාගමට උරුම වූ (එබඳු) මේ දුක් පසෙකි. කවර පසෙක් ද යත්: මහණෙනි, මෙහි මාගම තුරුණු වූවා ම සැමිකුලයට යෙයි, නෑයන්ගෙන් වෙන් වෙයි. මහණෙනි, පුරුෂයන් හැර මාගම යම් දුකක් විඳී නම් මාගමට උරුම වූ මේ පළමුවන දුක යි. මහණෙනි, නැවත අනෙකක් ද කියමි. මාගම ඔසප් ඇත්තී වෙයි. මහණෙනි, පුරුෂයන් හැර මාගම යම් දුකක් විඳී නම් මාගමට උරුම වූ මේ දෙවෙනි දුක යි.

පුන ච පරං භික්ඛවෙ මාතුගාමො ගබ්භිනී හොති, ඉදං භික්ඛවෙ මාතුගාමස්ස තතියං ආවෙණිකං දුක්ඛං යං මාතුගාමො පච්චනුභොති අඤ්ඤත්‍රෙව පුරිසෙහි. පුන ච පරං භික්ඛවෙ මාතුගාමො විජායති, ඉදං භික්ඛවෙ මාතුගාමස්ස චතුත්ථං ආවෙණිකං දුක්ඛං යං මාතුගාමො පච්චනුභොති අඤ්ඤත්‍රෙව පුරිසෙහි. පුන ච පරං භික්ඛවෙ මාතුගාමො පුරිසස්ස පාරිචරියං උපෙති, ඉදං භික්ඛවෙ මාතුගාමස්ස පඤ්චමං ආවෙණිකං දුක්ඛං යං මාතුගාමො පච්චනුභොති අඤ්ඤත්‍රෙව පුරිසෙහි. ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච මාතුගාමස්ස ආවෙණිකානි දුක්ඛානි යානි මාතුගාමො පච්චනුභොති අඤ්ඤත්‍රෙව පුරිසෙහීති.

## 3. 1. 4

## තීහිධම්මෙහිසුත්තං

283. තීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො මාතුගාමො යෙභුය්‍යෙන කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. කතමෙහි තීහි: ඉධ භික්ඛවෙ මාතුගාමො පුබ්බණ්හසමයං මච්ඡෙරමලපරියුට්ඨිතෙන චෙතසා අගාරං අජ්ඣාවසති, මජ්ඣන්තිකං සමයං ඉස්සා පරියුට්ඨිතෙන චෙතසා අගාරං අජ්ඣාවසති, සායන්හසමයං කාමරාගපරියුට්ඨිතෙන චෙතසා අගාරං අජ්ඣාවසති, ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො මාතුගාමො යෙභුය්‍යෙන කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජතීති.

## 3. 1. 5

## අනුරුද්ධසුත්තං*

284. අථ ඛො අයස්මා අනුරුද්ධො යෙන භගවා තෙනුපසඞ්කමි –පෙ– එකමන්තං නිසින්නො ඛො ආයස්මා අනුරුද්ධො භගවන්තං එතදවොච :

ඉධාහං භන්තෙ මාතුගාමං පස්සාමි දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්තං[1]. කතිහි නු ඛො භන්තෙ ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජතීති?

පඤ්චහි ඛො අනුරුද්ධ ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. කතමෙහි පඤ්චහි: අස්සද්ධො ච හොති, අහිරිකො ච හොති, අනොත්තාපී ච[2] හොති, කොධනො ච හොති, දුප්පඤ්ඤො ච හොති. ඉමෙහි ඛො අනුරුද්ධ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජතීති.

*. ඉදං සුත්තං මරම්මපොත්ථකෙ න දිස්සතෙ.

1. උපපජ්ජන්තං - සී 1, 2

2. අනොත්තප්පී - මජ්ඣං, ස්‍යා.

මහණෙනි, නැවත අනෙකක් ද කියමි. මාගම ගැබ්නි වෙයි. මහණෙනි, පුරුෂයන් හැර මාගම යම් දුකක් විඳී නම් මාගමට උරුම වූ මේ තෙවන දුක යි. මහණෙනි, නැවත අනෙකක් ද කියමි. මාගම (දරුවන්) වදයි. මහණෙනි, පුරුෂයන් හැර මාගම යම් දුකක් විඳී නම් මාගමට උරුම වූ මේ සිවුවන දුක යි. මහණෙනි; නැවත අනෙකක් ද කියමි: මාගම පුරුෂයාගේ පරිචරියාවට එළඹෙයි. මහණෙනි, පුරුෂයන් හැර මාගම යම් දුකක් විඳී නම් මාගමට උරුම වූ මේ පස්වන දුක යි. මහණෙනි, පුරුෂයන් හැර මාගම යම් දුක් විඳී නම් මාගමට උරුම වූ දුක් පස මොහු යි.

## 3. 1. 4

## තීහි ධම්මෙහි සූත්‍රය

283. මහණෙනි, දහම් තුනකින් යුත් මාගම බෙහෙවින් කාබුන් මරණින් මතු සැපයෙන් පහ වූ නපුරු ගති ඇති විවස ව පතිත වන නිරයට පැමිණෙයි. කවර තුනකින් ද යත්: මහණෙනි, මෙහි මාගම පෙරවරු මසුරුමල නැග සිටි සිතින් යුතු ව ගෙහි වෙසෙයි, මද්දහන තරහ නැගි සිතින් යුතු ව ගෙහි වෙසෙයි, සවස කාම රාගය නැගි සිතින් යුතු ව ගෙහි වෙසෙයි. මහණෙනි, මේ තුන්-දහමින් යුත් මාගම බෙහෙවින් කාබුන් මරණින් මතු සැපයෙන් පහ වූ නපුරු ගති ඇති විවසව පතිත වන නිරයට පැමිණේ යි.

## 3. 1. 5

## අනුරුද්ධ සූත්‍රය

284. එකල්හි ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ ... එකත්පස් ව හුන් ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ:

වහන්ස, මෙහි මම කාබුන් මරණින් මතු සැපයෙන් පහ වූ නපුරු ගති ඇති විවස ව පතිත වන නිරයට පැමිණෙන මාගමක මිනිසැස ඉක්මවා පැවති පිරිසිදු දිවැසින් දකිමි. වහන්ස, කෙතෙක් දහමින් යුතු මාගම කාබුන් මරණින් මතු සැපයෙන් පහ වූ නපුරු ගති ඇති විවස ව පතිත වන නිරයට පැමිණේ ද?යි.

අනුරුද්ධ, දහම් පසෙකින් යුතු මාගම කාබුන් මරණින් මතු සැපයෙන් පහ වූ නපුරු ගති ඇති විවස ව පතිත වන නිරයට පැමිණෙයි. කවර පසෙකින් ද යත්: සැදැහැ රහිත වෙයි. ලජ්ජා රහිත වෙයි, බිය රහිත වෙයි, කිපෙනසුලු වෙයි, නුවණ රහිත වෙයි. අනුරුද්ධ, මේ දහම් පසින් යුතු මාගම කාබුන් මරණින් මතු සැපයෙන් පහ වූ නපුරු ගති ඇති විවස ව පතිත වන නිරයට පැමිණේ යි.

## 3. 1. 6

### කොධනසුත්තං

285. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙද පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. කතමෙහි පඤ්චහි: අස්සද්ධො ච හොති, අහිරිකො ච හොති, අනොත්තාපී ච හොති, කොධනො ච හොති, දුප්පඤ්ඤො ච හොති. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙද පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජතීති.

## 3. 1. 7

### උපනාහීසුත්තං

286. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙද පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. කතමෙහි පඤ්චහි: අස්සද්ධො ච හොති, අහිරිකො ච හොති, අනොත්තාපී ච හොති, උපනාහී ච හොති, දුප්පඤ්ඤො ච හොති; ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙද පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති.

## 3. 1. 8

### ඉස්සුකීසුත්තං

287. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙද පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. කතමෙහි පඤ්චහි: අස්සද්ධො ච හොති, අහිරිකො ච හොති, අනොත්තාපී ච හොති, ඉස්සුකී ච හොති, දුප්පඤ්ඤො ච හොති; ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙද පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජතීති.

## 3. 1. 9

### මච්ඡරීසුත්තං

288. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙද පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. කතමෙහි පඤ්චහි: අස්සද්ධො ච හොති, අහිරිකො ච හොති, අනොත්තාපී ච හොති, මච්ඡරී ච හොති, දුප්පඤ්ඤො ච හොති. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙද පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජතීති.

## 3. 1. 6

## කොධන සූත්‍රය

285. මහණෙනි, දහම්පසෙකින් යුතු මාගම කාබුන් මරණින් මතු සැපයෙන් පහ වූ නපුරු ගති ඇති විවස ව පතිත වන නිරයට පැමිණෙයි. කවර පසෙකින් ද යත්: සැදැහැ රහිත වෙයි, ලජ්ජා රහිත වෙයි, බිය රහිත වෙයි, කිපෙනසුලු වෙයි, නුවණ රහිත වෙයි. මහණෙනි, මේ පස්දහමින් යුතු මාගම කාබුන් මරණින් මතු සැපයෙන් පහ වූ නපුරු ගති ඇති විවස ව පතිත වන නිරයට පැමිණේ යි.

## 3. 1. 7

## උපනාහී සූත්‍රය

286. මහණෙනි, දහම්පසෙකින් යුතු මාගම කාබුන් මරණින් මතු සැපයෙන් පහ වූ නපුරු ගති ඇති විවස ව පතිත වන නිරයට පැමිණෙයි. කවර පසෙකින් ද යත්: සැදැහැ රහිත වෙයි, ලජ්ජා රහිත වෙයි, බිය රහිත වෙයි, බද්ධවෛර සහිත වෙයි, නුවණ රහිත වෙයි. මහණෙනි, මේ පස්දහමින් යුතු මාගම කාබුන් මරණින් මතු සැපයෙන් පහ වූ නපුරු ගති ඇති විවස ව පතිත වන නිරයට පැමිණේ යි.

## 3. 1. 8

## ඉස්සුකී සූත්‍රය

287. මහණෙනි, දහම් පසෙකින් යුතු මාගම කාබුන් මරණින් මතු සැපයෙන් පහ වූ නපුරු ගති ඇති විවස ව පතිත වන නිරයට පැමිණෙයි. කවර පසෙකින් ද යත්: සැදැහැ රහිත වෙයි, ලජ්ජා රහිත වෙයි, බිය රහිත වෙයි, ඊර්ෂ්‍යා සහිත වෙයි, නුවණ රහිත වෙයි. මහණෙනි, මේ පස්දහමින් යුතු මාගම කාබුන් මරණින් මතු සැප-යෙන් පහ වූ නපුරු ගති ඇති විවස ව පතිත වන නිරයට පැමිණේ යි.

## 3. 1. 9

## මච්ඡරී සූත්‍රය

288. මහණෙනි, දහම් පසෙකින් යුතු මාගම කාබුන් මරණින් මතු සැපයෙන් පහ වූ නපුරු ගති ඇති විවස ව පතිත වන නිරයට පැමිණෙයි. කවර පසෙකින් ද යත්: සැදැහැ රහිත වෙයි, ලජ්ජා රහිත වෙයි, බිය රහිත වෙයි, මසුරු වෙයි, නුවණ රහිත වෙයි. මහණෙනි, මේ පස්දහමින් යුතු මාගම කාබුන් මරණින් මතු සැපයෙන් පහ වූ නපුරුගති ඇති විවස ව පතිත වන නිරයට පැමිණේ යි.

## 3. 1. 10

### අතිචාරීසුත්තං

**289.** පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. කතමෙහි පඤ්චහි: අස්සද්ධො ච හොති, අහිරිකො ච හොති, අනොත්තාපී ච හොති, අතිචාරී ච හොති, දුප්පඤ්ඤො ච හොති. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජතීති.

## 3. 1. 11

### දුස්සීලසුත්තං

**290.** පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. කතමෙහි පඤ්චහි: අස්සද්ධො ච හොති, අහිරිකො ච හොති, අනොත්තාපී ච හොති, දුස්සීලො ච හොති, දුප්පඤ්ඤො ච හොති. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජතීති.

## 3. 1. 12

### අප්පස්සුතසුත්තං

**291.** පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, කතමෙහි පඤ්චහි: අස්සද්ධො ච හොති, අහිරිකො ච හොති, අනොත්තාපී ච හොති, අප්පස්සුතො ච හොති, දුප්පඤ්ඤො ච හොති. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජතීති.

## 3. 1. 13

### කුසීතසුත්තං

**292.** පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. කතමෙහි පඤ්චහි: අස්සද්ධො ච හොති, අහිරිකො ච හොති, අනොත්තාපී ච හොති, කුසීතො ච හොති, දුප්පඤ්ඤො ච හොති. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජතීති.

## 3. 1. 10

## අතිචාරී සූත්‍රය

289. මහණෙනි, දහම්පසෙකින් යුතු මාගම කාබුන් මරණින් මතු සැපයෙන් පහ වූ නපුරු ගති ඇති විවස ව පතිත වන නිරයට පැමිණෙයි. කවර පසෙකින් ද යත්: සැදැහැ රහිත වෙයි, ලජ්ජා රහිත වෙයි, බිය රහිත වෙයි, (සැමියා) ඉක්මවා හැසිරෙනසුලු වෙයි, නුවණ රහිත වෙයි. මහණෙනි, මේ දහම් පසින් යුතු මාගම කාබුන් මරණින් මතු සැපයෙන් පහ වූ නපුරු ගති ඇති විවස ව පතිත වන නිරයට පැමිණේ යි.

## 3. 1. 11

## දුස්සීල සූත්‍රය

290. මහණෙනි, දහම්පසෙකින් යුතු මාගම කාබුන් මරණින් මතු අපාය දුගති විනිපාත නිරයට පැමිණෙයි. කවර පසෙකින් ද යත්: සැදැහැ රහිත වෙයි, ලජ්ජා රහිත වෙයි, බිය රහිත වෙයි, දුසිල් වෙයි, නුවණ රහිත වෙයි. මහණෙනි, මේ පස්දහමින් යුතු මාගම කාබුන් මරණින් මතු අපාය දුගති විනිපාත නිරයට පැමිණේ යි.

## 3. 1. 12

## අප්පස්සුත සූත්‍රය

291. මහණෙනි, දහම්පසෙකින් යුතු මාගම කාබුන් මරණින් මතු අපාය දුගති විනිපාත නිරයට පැමිණෙයි. කවර පසෙකින් ද යත්: සැදැහැ රහිත වෙයි, ලජ්ජා රහිත වෙයි, බිය රහිත වෙයි, ඇසූ පිරූ තැන් රහිත වෙයි. නුවණ රහිත වෙයි. මහණෙනි, මේ පස්දහමින් යුතු මාගම කාබුන් මරණින් මතු අපාය දුගති විනිපාත නිරයට පැමිණේ යි.

## 3. 1. 13

## කුසීත සූත්‍රය

292. මහණෙනි, දහම්පසෙකින් යුතු මාගම කාබුන් මරණින් මතු අපාය දුගති විනිපාත නිරයට පැමිණෙයි. කවර පසෙකින් ද යත්: සැදැහැ රහිත වෙයි, ලජ්ජා රහිත වෙයි, බිය රහිත වෙයි, මැලි වෙයි, නුවණ රහිත වෙයි. මහණෙනි, මේ පස්දහමින් යුතු මාගම කාබුන් මරණින් මතු අපාය දුගති විනිපාත නිරයට පැමිණේ යි.

## 3. 1. 14

## මුට්ඨස්සතිසුත්තං

293. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. කතමෙහි පඤ්චහි: අස්සද්ධො ච හොති, අහිරිකො ච හොති, අනොත්තාපී ච හොති, මුට්ඨස්සති ච හොති, දුප්පඤ්ඤො ච හොති. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජතීති.

## 3. 1. 15

## පඤ්චවෙරසුත්තං

294. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. කතමෙහි පඤ්චහි: පාණාතිපාතී ච හොති, අදින්නාදායී ච හොති, කාමෙසුමිච්ඡාචාරී ච හොති, මුසාවාදී ච හොති, සුරාමෙරයමජ්ජපමාදට්ඨායී ච හොති. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජතීති.

**මාතුගාමවග්ගො පඨමො.**

**තත්‍රුද්දානං:**

මාතුගාමො පුරිසොච ආවෙණිකො තීහි ධම්මෙහි
කොධනො උපනාහී ච ඉස්සුකී මච්ඡරෙන ච,
අතිචාරී ච අනුරුද්ධො දුස්සීලො චාපස්සුතො
කුසීතො මුට්ඨස්සතිචෙති පඤ්චවෙරං පඤ්චදසාති.

## 3. 1. 14

## මුට්ඨස්සති සූත්‍රය

293. මහණෙනි, දහම් පසෙකින් යුතු මාගම කාබුන් මරණින් මතු අපාය දුගති විනිපාතවූ නිරයට පැමිණෙයි. කවර පසෙකින් ද යත්: සැදැහැ රහිත වෙයි. ලජ්ජා රහිත වෙයි. බිය රහිත වෙයි. මුළාසිහි ඇති වෙයි. නුවණ රහිත වෙයි. මහණෙනි, මේ පස්දහමින් යුතු මාගම කාබුන් මරණින් මතු අපාය දුගති විනිපාත නිරයට පැමිණේ යි.

## 3. 1. 15

## පඤ්චවෙර සූත්‍රය

294. මහණෙනි, දහම් පසෙකින් යුතු මාගම කාබුන් මරණින් මතු අපාය දුගති විනිපාතවූ නිරයට පැමිණෙයි. කවර පසෙකින් ද යත්: පණිවායෙන් යුක්ත වෙයි. අයිනාදනින් යුක්ත වෙයි. කාමයෙහි වරදවා හැසිරෙන්නී වෙයි. මුසා බණන්නී වෙයි. රහමෙර පානය කරන්නී වෙයි. මහණෙනි, මේ පස් දහමෙන් යුතු මාගම කාබුන් මරණින් මතු අපාය දුගති විනිපාතවූ නිරයට පැමිණේ යි.

**පළමුවැනි මාතුගාමවර්ග යි.**

**එහි සූත්‍ර නාමාවලිය:**

මාතුගාම, පුරිස, ආවෙණික, තීහිධම්මෙහි, කොධනඋපනාහී ඉසසුකී, මච්ඡරී, අතිචාරී, අනුරුද්ධ, දුස්සීල, අප්පස්සුත, කුසීත, මුට්ඨස්සති, පඤ්චවෙර ය යි සූත්‍ර පසළොසකි.

# 2. අනුරුද්ධවග්ගො

## 3. 2. 1

### අනුරුද්ධසුත්තං*

295. අථ ඛො ආයස්මා අනුරුද්ධො යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො ආයස්මා අනුරුද්ධො භගවන්තං එතදවොච:

ඉධාහං භන්තෙ මාතුගාමං පස්සාමි දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්තං. කතිහි නු ඛො භන්තෙ ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජතීති.

පඤ්චහි ඛො අනුරුද්ධ ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. කතමෙහි පඤ්චහි: සද්ධො ච හොති, හිරිමා ච හොති, ඔත්තාපී ච හොති, අක්කොධනො ච හොති, පඤ්ඤවා ච හොති. ඉමෙහි ඛො අනුරුද්ධ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජතීති.

## 3. 2. 2

### අක්කොධනසුත්තං

296. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. කතමෙහි පඤ්චහි: සද්ධො ච හොති, හිරිමා ච හොති, ඔත්තාපී ච හොති, අක්කොධනො ච හොති, පඤ්ඤවා ච හොති. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජතීති.

## 3. 2. 3

### අනුපනාහීසුත්තං

297. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. කතමෙහි පඤ්චහි: සද්ධො ච හොති, හිරිමා ච හොති, ඔත්තාපී ච හොති, අනුපනාහී ච හොති, පඤ්ඤවා ච හොති. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජතීති.

---

* ඉදම්පි සුත්තං මරම්ම පොත්ථකෙ න දිස්සතෙ

# 2. අනුරුද්ධ වර්ගය

## 3. 2. 1

## අනුරුද්ධ සූත්‍රය

295. එකල්හි ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. ... එකත්පස්ව හුන් ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ.

වහන්ස, මෙහි මම කාබුන් මරණින් මතු සොභන ගති ඇති සග ලොවට පැමිණෙන මාගමක මිනිසැස ඉක්මවා පැවැති පිරිසිදු දිවැසින් දකිමි. වහන්ස කෙතෙක් දහමින් යුතු මාගම කාබුන් මරණින් මතු සොභන ගති ඇති සගලොවට පැමිණේ දැ යි.

අනුරුද්ධ, දහම් පසෙකින් යුතු මාගම කාබුන් මරණින් මතු යහපත් ගති ඇති සගලොවට පැමිණෙ යි. කවර පසකින් ද යත්: සැදැහැ ඇති වෙයි. ලජ්ජා ඇති වෙයි. බිය ඇති වෙයි. නො කිපෙනසුලු වෙයි. නුවණැති වෙයි. අනුරුද්ධ, මේ පස් දහමින් යුතු මාගම කාබුන් මරණින් මතු යහපත් ගති ඇති සගලොවට පැමිණේ යි.

## 3. 2. 2

## අක්කොධන සූත්‍රය

296. මහණෙනි දහම් පසෙකින් යුතු මාගම කාබුන් මරණින් මතු සුගති වූ සගලොවට පැමිණෙයි. කවර පසෙකින් ද යත්: සැදැහැ ඇති වෙයි. ලජ්ජා ඇති වෙයි. බිය ඇති වෙයි. නො කිපෙනසුලු වෙයි. නුවණැති වෙයි. මහණෙනි මේ පස්දහමින් යුතු මාගම කාබුන් මරණින් මතු සුගති වූ සගලොවට පැමිණේ යි.

## 3. 2. 3

## අනුපනාහී සූත්‍රය

297. මහණෙනි, දහම් පසෙකින් යුතු මාගම කාබුන් මරණින් මතු සුගති වූ සගලොවට පැමිණෙ යි. කවර පසෙකින් ද යත්: සැදැහැ ඇති වෙයි. ලජ්ජා ඇති වෙයි. බිය ඇති වෙයි. බැදි වෙර නැති වෙයි. නුවණැති වෙයි. මහණෙනි මේ පස්දහමින් යුතු මාගම කාබුන් මරණින් මතු සුගති වූ සගලොවට පැමිණේ යි.

## 3. 2. 4

## අනිස්සුකීසුත්තං

298. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. කතමෙහි පඤ්චහි: සද්ධො ච හොති, හිරිමා ච හොති, ඔත්තාපී ච හොති, අනිස්සුකී ච හොති, පඤ්ඤවා ච හොති. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජතීති.

## 3. 2. 5

## අමච්ඡරීසුත්තං

299. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. කතමෙහි පඤ්චහි: සද්ධො ච හොති. හිරිමා ච හොති, ඔත්තාපී ච හොති, අමච්ඡරී ච හොති, පඤ්ඤවා ච හොති. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජතීති.

## 3. 2. 6

## අනතිචාරීසුත්තං

300. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. කතමෙහි පඤ්චහි: සද්ධො ච හොති, හිරිමා ච හොති, ඔත්තාපී ච හොති; අනතිචාරී ච හොති, පඤ්ඤවා ච හොති. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජතීති.

## 3. 2. 7

## සීලවන්තසුත්තං

301. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. කතමෙහි පඤ්චහි: සද්ධො ච හොති, හිරිමා ච හොති, ඔත්තාපී ච හොති, සීලවා ච හොති, පඤ්ඤවා ච හොති. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජතීති.

## 3. 2. 4

## අතිස්සුකී සූත්‍රය

298. මහණෙනි, දහම් පසෙකින් යුතු මාගම කාබුන් මරණින් මතු සුගති වූ සගලොවට පැමිණෙයි. කවර පසෙකින් ද යත්: සැදැහැ ඇති වෙයි. හිරි ඇති වෙයි. ඔතප් ඇති වෙයි. ඊර්ෂ්‍යා රහිත වෙයි. පැනවත් වෙයි. මහණෙනි මේ පස්දහමින් යුතු මාගම කාබුන් මරණින් මතු සුගති වූ සගලොවට පැමිණේ යි.

## 3. 2. 5

## ආමච්ඡරී සූත්‍රය

299. මහණෙනි, දහම් පසෙකින් යුතු මාගම කාබුන් මරණින් මතු සුගති වූ සගලොවට පැමිණෙ යි. කවර පසෙකින් ද යත්: සැදැහැ ඇති වෙයි. හිරි ඇති වෙයි. ඔතප් ඇති වෙයි. නො මසුරු වෙයි. පැනවත් වෙයි. මහණෙනි මේ පස්දහමින් යුතු මාගම කාබුන් මරණින් මතු සුගති වූ සගලොවට පැමිණේ යි.

## 3. 2. 6

## අනතිචාරී සූත්‍රය

300. මහණෙනි, දහම් පසෙකින් යුතු මාගම කාබුන් මරණින් මතු සුගති වූ සගලොවට පැමිණෙ යි. කවර පසෙකින් ද යත්: සැදැහැ ඇති වෙයි. හිරි ඇති වෙයි. ඔතප් ඇති වෙයි. (සැමියා) ඉක්ම නො හැසිරෙන්නී වෙයි. පැනවත් වෙයි. මහණෙනි මේ පස්දහමින් යුතු මාගම කාබුන් මරණින් මතු සුගති වූ සගලොවට පැමිණේ යි.

## 3. 2. 7

## සීලවන්ත සූත්‍රය

301. මහණෙනි, දහම් පසෙකින් යුතු මාගම කාබුන් මරණින් මතු සුගති වූ සගලොවට පැමිණෙයි. කවර පසෙකින් ද යත්: සැදැහැ ඇති වෙයි. හිරි ඇති වෙයි. ඔතප් ඇති වෙයි. සිල්වත් වෙයි. පැනවත් වෙයි. මහණෙනි, මේ පස්දහමින් යුතු මාගම කාබුන් මරණින් මතු සුගති වූ සගලොවට පැමිණේ යි.

## 3. 2. 8

### බහුස්සුතසුත්තං

302. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. කතමෙහි පඤ්චහි: සද්ධො ච හොති, හිරිමා ච හොති, ඔත්තාපී ච හොති, බහුස්සුතො ච හොති, පඤ්ඤවා ච හොති. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජතීති.

## 3. 2. 9

### ආරද්ධවිරියසුත්තං

303. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. කතමෙහි පඤ්චහි: සද්ධො ච හොති, හිරිමා ච හොති, ඔත්තාපී ච හොති, ආරද්ධවිරියො ච හොති, පඤ්ඤවා ච හොති. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජතීති.

## 3. 2. 10

### උපට්ඨිතසතිසුත්තං

304. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. කතමෙහි පඤ්චහි: සද්ධො ච හොති, හිරිමා ච හොති, ඔත්තාපී ච හොති, උපට්ඨිතසති ච හොති, පඤ්ඤවා ච හොති. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජතීති.

## 3. 2. 11

### පඤ්චසීලසුත්තං

305. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. කතමෙහි පඤ්චහි: පාණාතිපාතා පටිවිරතො ච හොති, අදින්නාදනා පටිවිරතො ච හොති, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො ච හොති, මුසාවාදා පටිවිරතො ච හොති, සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො ච හොති. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජතීති.

**අනුරුද්ධවග්ගො දුතියො.**

**තත්‍රුද්දනං :**

අනුරුද්ධො අක්කොධනො අනුපනාහී අනිස්සුකී
අමච්ඡරී අනතිචාරී සීලවා ච බහුස්සුතො
විරියං සති පඤ්චසීලො ච සුක්කපක්ඛෙ පකාසිතාති.

## 3. 2. 8

## බහුස්සුත සූත්‍රය

302. මහණෙනි, දහම් පසෙකින් යුතු මාගම කාබුත් මරණින් මතු සුගති වූ සගලොවට පැමිණෙයි. කවර පසෙකින් ද යත්: සැදැහැ ඇති වෙයි. හිරි ඇති වෙයි, ඔතප් ඇති වෙයි, බොහෝ ඇසූ පිරූ තැන් ඇති වෙයි, පැනවත් වෙයි. මහණෙනි මේ පස්දහමින් යුතු මාගම කාබුන් මරණින් මතු සුගතිවූ සගලොවට පැමිණේ යි.

## 3. 2. 9

## ආරද්ධවිරිය සූත්‍රය

303. මහණෙනි, දහම්පසෙකින් යුතු මාගම කාබුන් මරණින් මතු සුගති වූ සගලොවට පැමිණෙයි. කවර පසෙකින් ද යත්: සැදැහැ ඇති වෙයි, හිරි ඇති වෙයි, ඔතප් ඇති වෙයි. ඇරඹූ වෙර ඇති වෙයි. පැනවත් වෙයි. මහණෙනි මේ පස්දහමින් යුතු මාගම කාබුන් මරණින් මතු සුගති වූ සගලොවට පැමිණේ යි.

## 3. 2. 10

## උපට්ඨිතසති සූත්‍රය

304. මහණෙනි, දහම් පසෙකින් යුතු මාගම කාබුන් මරණින් මතු සුගති වූ සගලොවට පැමිණෙයි. කවර පසෙකින් ද යත්: සැදැහැ ඇති වෙයි. හිරි ඇති වෙයි. ඔතප් ඇති වෙයි. එළඹ සිටි සිහි ඇති වෙයි. පැනවත් වෙයි. මහණෙනි මේ පස්දහමින් යුතු මාගම කාබුන් මරණින් මතු සුගති වූ සගලොවට පැමිණේ යි.

## 3. 2. 11

## පඤ්චසීල සූත්‍රය

305. මහණෙනි, මේ දහම් පසෙකින් යුතු මාගම කාබුන් මරණින් මතු සුගති වූ සගලොවට පැමිණෙයි. කවර පසෙකින් ද යත්: පණිවායෙන් වැළකුණේ වෙයි. අයිනාදනින් වැළකුණේ වෙයි. කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකුණේ වෙයි. මුසවායෙන් වැළකුණේ වෙයි. රහමෙර පානයෙන් වැළකුනේ වෙයි. මහණෙනි, මේ පස්දහමින් යුත් මාගම කාබුන් මරණින් මතු සුගති වූ සගලොවට පැමිණේ යි.

දෙවැනි අනුරුද්ධ වර්ග යි.

**එහි සූත්‍රනාමාවලිය:**

අනුරුද්ධ, අක්කොධන, අනුපනාහී, අනිස්සුක්, අමච්ඡරී, අනතිචාරී, සීලවන්ත, බහුස්සුත, ආරද්ධවිරිය. උපට්ඨිතසති, පඤ්චසීලය යි. ශුක්ලපක්ෂයෙහි සූත්‍ර එකොළොසෙක් පවසන ලදී.

# 3. බලවග්ගො

## 3. 3. 1

### සුද්ධසුත්තං

306. පඤ්චිමානි භික්ඛවෙ මාතුගාමස්ස බලානි, කතමානි පඤ්ච: රූපබලං, භොගබලං, ඤාතිබලං, පුත්තබලං, සීලබලං. ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච මාතුගාමස්ස බලානීති.

## 3. 3. 2

### විසාරදසුත්තං

307. පඤ්චිමානි භික්ඛවෙ මාතුගාමස්ස බලානි කතමානි පඤ්ච: රූපබලං, භොගබලං, ඤාතිබලං, පුත්තබලං, සීලබලං. ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච මාතුගාමස්ස බලානි. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි බලෙහි සමන්නාගතො මාතුගාමො විසාරදෙ අගාරං අජ්ඣාවසතීති.

## 3. 3. 3

### පසය්හසුත්තං

308. පඤ්චිමානි භික්ඛවෙ මාතුගාමස්ස බලානි, කතමානි පඤ්ච: රූපබලං, භොගබලං, ඤාතිබලං, පුත්තබලං, සීලබලං. ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච මාතුගාමස්ස බලානි. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි බලෙහි සමන්නාගතො මාතුගාමො සාමිකං පසය්හ අගාරං අජ්ඣාවසතීති.

## 3. 3. 4

### අභිභුය්‍යසුත්තං

309. පඤ්චිමානි භික්ඛවෙ මාතුගාමස්ස බලානි, කතමානි පඤ්ච: රූපබලං, භොගබලං, ඤාතිබලං, පුත්තබලං, සීලබලං. ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච මාතුගාමස්ස බලානි. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි බලෙහි සමන්නාගතො මාතුගාමො සාමිකං අභිභුය්‍ය වත්තති.

එකෙන ච ඛො භික්ඛවෙ බලෙන සමන්නාගතො පුරිසො මාතුගාමං අභිභුය්‍ය වත්තති, කතමෙන එකෙන: ඉස්සරියබලෙන, ඉස්සරියබලෙන අභිභූතං භික්ඛවෙ මාතුගාමං නෙව රූපබලං තායති, න භොගබලං[1] තායති, න ඤාතිබලං තායති, න පුත්තබලං තායති, න සීලබලං තායතීති.

1 ගොත්තබලං - සී 1, 2.

# 3. බලවග්ගය

## 3. 3. 1

## සුද්ධ සූත්‍රය

306. මහණෙනි මාගමට මේ බල පසෙකි, කවර පසෙක් ද යත්: රූපබලය, භොගබලය, ඥාතිබලය, පුත්‍රබලය, සීලබලයි. මහණෙනි මේ මාගමගේ බල පස යි.

## 3. 3. 2

## විසාරද සූත්‍රය

307. මහණෙනි මාගමට මේ බල පසෙකි. කවර පසෙක් ද යත්: රූපබලය, භොගබලය, ඥාතිබලය, පුත්‍රබලය, සීලබල යි. මහණෙනි මේ මාගමගේ බල පසයි. මහණෙනි මේ බලපසින් යුතු මාගම විසාරද ව ගෙහි වෙසේ යි.

## 3. 3. 3

## පසය්හ සූත්‍රය

308. මහණෙනි මාගමට මේ බල පසෙකි. කවර පසෙක් ද යත්: රූපබලය, භොගබලය, ඥාතිබලය, පුත්‍රබල ය, සීලබල යි. මහණෙනි මේ මාගමගේ බල පස යි. මහණෙනි මේ බලපසින් යුතු මාගම සැමියා මැඩ ගෙන ගෙහි වෙසේ යි.

## 3. 3. 4

## අභිභූය්‍ය සූත්‍රය

309. මහණෙනි මාගමට මේ බල පසෙකි. කවර පසෙක් ද යත්: රූපබලය, භොගබලය, ඥාතිබලය, පුත්‍රබලය සීලබලය යි. මහණෙනි මේ මාගමගේ බල පස යි. මහණෙනි මේ බලපසින් යුතු මාගම සැමියා යටත් කොට ගෙන පවතියි.

මහණෙනි එක්බලයකිනුදු යුතු පුරුෂ තෙමේ මාගම යටත් කොට ගෙන පවතියි. කවර එකෙකින් ද යත්: ඉසුරු බෙලෙනි. මහණෙනි ඉසුරු බෙලෙන් මඩනා ලද මාගම රූපබලය නො ම රකී. භොගබලය නො ම රකී. ඥාතිබලය නො ම රකී පුත්‍රබලය නො ම රකී. සීලබලය නො ම රකී යි.

## 3. 3. 5

### අඞ්ගසුත්තං

310. පඤ්චිමානි භික්ඛවෙ මාතුගාමස්ස බලානි, කතමානි පඤ්ච: රූපබලං භොගබලං ඤාතිබලං පුත්තබලං සීලබලං. රූපබලෙන ච භික්ඛවෙ මාතුගාමො සමන්නාගතො හොති න ච භොගබලෙන, එවං සො තෙන අඞ්ගෙන අපරිපූරො හොති. යතො ච ඛො භික්ඛවෙ මාතුගාමො රූපබලෙන ච සමන්නාගතො හොති භොගබලෙන ච, එවං සො තෙන අඞ්ගෙන පරිපූරො හොති. රූපබලෙන ච භික්ඛවෙ මාතුගාමො සමන්නාගතො හොති භොගබලෙන ච, න ච ඤාතිබලෙන එවං සො තෙන අඞ්ගෙන අපරිපූරො හොති. යතො ච ඛො භික්ඛවෙ මාතුගාමො රූපබලෙන ච සමන්නාගතො හොති භොගබලෙන ච ඤාතිබලෙන ච, එවං සො තෙන අඞ්ගෙන පරිපූරො හොති.

රූපබලෙන ච භික්ඛවෙ මාතුගාමො සමන්නාගතො හොති භොගබලෙන ච ඤාතිබලෙන ච, න ච පුත්තබලෙන, එවං සො තෙන අඞ්ගෙන අපරිපූරො හොති. යතො ච ඛො භික්ඛවෙ මාතුගාමො රූපබලෙන ච සමන්නාගතො හොති භොගබලෙන ච ඤාතිබලෙන ච පුත්තබලෙන ච, එවං සො තෙන අඞ්ගෙන පරිපූරො හොති. රූපබලෙන ච භික්ඛවෙ ම.තුගාමො සමන්නාගතො හොති භොගබලෙන ච ඤාතිබලෙන ච පුත්තබලෙන ච න ච සීලබලෙන, එවං සො තෙන අඞ්ගෙන අපරිපූරො හොති. යතො ච ඛො භික්ඛවෙ මාතුගාමො රූපබලෙන ච සමන්නාගතො හොති භොගබලෙන ච ඤාතිබලෙන ච පුත්තබලෙන ච සීලබලෙන ච, එවං සො තෙන අඞ්ගෙන පරිපූරො හොති. ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච මාතුගාමස්ස බලානීති.

## 3. 3. 6

### නාසිතබ්බසුත්තං

311. පඤ්චිමානි භික්ඛවෙ මාතුගාමස්ස බලානි. කතමානි පඤ්ච: රූපබලං භොගබලං ඤාතිබලං පුත්තබලං සීලබලං. රූපබලෙන ච භික්ඛවෙ මාතුගාමො සමන්නාගතො හොති න ච සීලබලෙන, නාසෙන්තෙව නං කුලෙ න වාසෙන්ති. රූපබලෙන ච භික්ඛවෙ මාතුගාමො සමන්නාගතො හොති භොගබලෙන ච න ච සීලබලෙන, නාසෙන්තෙව නං කුලෙ න වාසෙන්ති. රූපබලෙන ච භික්ඛවෙ මාතුගාමො සමන්නාගතො හොති භොගබලෙන ච ඤාතිබලෙන ච, න ච සීලබලෙන, නාසෙන්තෙව නං කුලෙ න වාසෙන්ති. රූපබලෙන ච භික්ඛවෙ මාතුගාමො සමන්නාගතො හොති භොගබලෙන ච ඤාතිබලෙන ච පුත්තබලෙන ච, න ච සීලබලෙන, නාසෙන්තෙව නං කුලෙ න වාසෙන්ති.

## 3. 3. 5

## අඩ්ග සූත්‍රය

310. මහණෙනි, මාගමට මේ බල පසෙකි. කවර පසෙක් ද යත්: රූපබලය භොගබලය ඥාතිබලය පුත්‍රබලය සීලබලය යි. මහණෙනි, මාගම රූපබලයෙන් යුතු වූවා භොගබලයෙන් නො ද යුතු වේ ද, මෙසේ ඇය ඒ අඞ්ගයෙන් නො පිරිපුන් වෙයි. මහණෙනි, යම් හෙයෙකින් මාගම රූපබලයෙනුත් භොගබලයෙනුත් යුතු වූවා වේ ද මෙසේ ඇය ඒ අඞ්ගයෙන් පිරිපුන් වෙයි. මහණෙනි, මාගම රූපබලයෙනුත් භොග-බලයෙනුත් යුතු වූවා ඥාතිබලයෙන් නො ද යුතු වූවා වේ ද, මෙසේ ඇය ඒ අඞ්ගයෙන් නො පිරිපුන් වෙයි. මහණෙනි, යම් හෙයෙකින් මාගම රූපබලයෙනුත් භොගබලයෙනුත් ඥාතිබලයෙනුත් යුතු වූවා වේ ද මෙසේ ඇය ඒ අඞ්ගයෙන් පිරිපුන් වෙයි.

මහණෙනි, මාගම රූපබලයෙනුත් භොගබලයෙනුත් ඥාති-බලයෙනුත් යුතු වූවා පුත්‍රබලයෙන් නො ද යුතු වූවා වේ ද, මෙසේ ඇය ඒ අඞ්ගයෙන් නො පිරිපුන් වෙයි. මහණෙනි, යම් හෙයෙකින් මාගම රූපබලයෙනුත් භොගබලයෙනුත් ඥාතිබලයෙනුත් පුත්‍රබලයෙනුත් යුතු වූවා වේ ද මෙසේ ඇය ඒ අඞ්ගයෙන් පිරිපුන් වෙයි. මහණෙනි, මාගම රූපබලයෙනුත් භොගබලයෙනුත් ඥාතිබලයෙනුත් පුත්‍රබලයෙනුත් යුතු වූවා සීලබලයෙන් නො ද යුතු වූවා වේ ද, මෙසේ ඇය ඒ අඞ්ගයෙන් නො පිරිපුන් වෙයි. මහණෙනි, යම් හෙයෙකින් මාගම රූපබලයෙනුත් භොගබලයෙනුත් ඥාතිබලයෙනුත් පුත්‍රබලයෙනුත් සීලබලයෙනුත් යුතු වූවා වේ ද, මෙසේ ඇය ඒ අඞ්ගයෙන් පිරිපුන් වෙයි. මහණෙනි, මේ පස මාගමගේ බල යි.

## 3. 3. 6

## නාසිතබ්බ සූත්‍රය

311. මහණෙනි, මාගමට මේ බල පසෙකි. කවර පසෙක් ද යත්: රූපබලය භොගබලය ඥාතිබලය පුත්‍රබලය සීලබලය යි. මහණෙනි, මාගම රූපබලයෙන් යුතු වූවා සීලබලයෙන් නො ද යුතු වූවා වේ ද ඇය නසත් ම ය. කුලයෙහි නො වස්වත් ම ය. මහණෙනි, මාගම රූපබලයෙනුත් භොගබලයෙනුත් යුතු වූවා නො ද සීලබලයෙන් යුතු වූවා වේ ද, ඇය නසත් ම ය. කුලයෙහි නො වස්වත් මය. මහණෙනි, මාගම රූපබලයෙනුත් භොගබලයෙනුත් ඥාතිබලයෙනුත් යුතු වූවා සීලබලයෙන් නො ද යුතු වූවා වේ ද, ඇය නසත් ම ය. කුලයෙහි නො වස්වත් ම ය. මහණෙනි, මාගම රූපබලයෙනුත් භොගබලයෙනුත් ඥාතිබලයෙනුත් පුත්‍රබලයෙනුත් යුතු වූවා සීලබලයෙන් නො ද යුතු වූවා වේ ද, ඇය නසත් ම ය. කුලයෙහි නො වස්වත් ම ය.

යතො ච ඛො භික්ඛවෙ මාතුගාමො රූපබලෙන සමන්නාගතො හොති භොගබලෙන ච ඤාතිබලෙන ච පුත්තබලෙන ච සීලබලෙන ච. වාසෙන්තෙව නං කුලෙ න නාසෙන්ති. සීලබලෙන ච භික්ඛවෙ මාතුගාමො සමන්නාගතො හොති න ච රූපබලෙන වාසෙන්තෙව නං කුලෙ න නාසෙන්ති. සීලබලෙන ච භික්ඛවෙ මාතුගාමො සමන්නාගතො හොති න ච භොගබලෙන, වාසෙන්තෙව නං කුලෙ න නාසෙන්ති. සීලබලෙන ච භික්ඛවෙ මාතුගාමො සමන්නාගතො හොති න ච ඤාතිබලෙන වාසෙන්තෙව නං කුලෙ න නාසෙන්ති.

සීලබලෙන ච භික්ඛවෙ මාතුගාමො සමන්නාගතො හොති න ච පුත්තබලෙන, වාසෙන්තෙව නං කුලෙ න නාසෙන්ති, ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච මාතුගාමස්ස බලානීති.

## 3. 3. 7

### හෙතුසුත්තං

312. පඤ්චිමානි භික්ඛවෙ මාතුගාමස්ස බලානි, කතමානි පඤ්ච: රූපබලං භොගබලං ඤාතිබලං පුත්තබලං සීලබලං. න භික්ඛවෙ මාතුගාමො රූපබලහෙතු වා භොගබලහෙතු වා ඤාතිබලහෙතු වා පුත්තබලහෙතු වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. සීලබලහෙතු ඛො භික්ඛවෙ මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච මාතුගාමස්ස බලානීති.

## 3. 3. 8

### ඨානසුත්තං

313. පඤ්චිමානි භික්ඛවෙ ඨානානි දුල්ලභානි අකතපුඤ්ඤෙන මාතුගාමෙන. කතමානි පඤ්ච: පතිරූපකුලෙ ජායෙය්‍යන්ති ඉදං භික්ඛවෙ පඨමං ඨානං දුල්ලභං අකතපුඤ්ඤෙන මාතුගාමෙන. පතිරූපකුලෙ ජායිත්වා පතිරූපං කුලං ගච්ඡෙය්‍යන්ති ඉදං භික්ඛවෙ දුතියං ඨානං දුල්ලභං අකතපුඤ්ඤෙන මාතුගාමෙන. පතිරූපකුලෙ ජායිත්වා පතිරූපං කුලං ගන්ත්වා අසපත්ති අගාරං අජ්ඣාවසෙය්‍යන්ති ඉදං භික්ඛවෙ තතියං ඨානං දුල්ලභං අකතපුඤ්ඤෙන මාතුගාමෙන. පතිරූපකුලෙ ජායිත්වා පතිරූපං කුලං ගන්ත්වා අසපත්ති අගාරං අජ්ඣාවසන්ති පුත්තවතී අස්සන්ති ඉදං භික්ඛවෙ චතුත්ථං ඨානං දුල්ලභං අකතපුඤ්ඤෙන මාතුගාමෙන. පතිරූපකුලෙ ජායිත්වා පතිරූපං කුලං ගන්ත්වා අසපත්ති අගාරං අජ්ඣාවසන්ති පුත්තවතී සමානා සාමිකං අභිභුය්‍ය වත්තෙය්‍යන්ති ඉදං භික්ඛවෙ පඤ්චමං ඨානං දුල්ලභං අකතපුඤ්ඤෙන මාතුගාමෙන. ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච ඨානානි දුල්ලභානි අකතපුඤ්ඤෙන මාතුගාමෙන.

මහණෙනි, යම් හෙයෙකින් මාගම රූපබලයෙනුත් භොගබලයෙනුත් ඥාතිබලයෙනුත් පුත්‍රබලයෙනුත් සීලබලයෙනුත් යුතු වූවා වේ ද ,ඇය කුලයෙහි වස්වත් ම ය. නො නසත් ම ය. මහණෙනි, මාගම සීලබලයෙන් යුතු වූවා රූපබලයෙන් නො ද යුතු වූවා වේ ද ඇය කුලයෙහි වස්වත් ම ය. නො නසත් ම ය. මහණෙනි, මාගම සීලබලයෙන් යුතු වූවා භොගබලයෙන් නො ද යුතු වූවා වේ ද ඇය කුලයෙහි වස්වත් ම ය. නො නසත් ම ය. මහණෙනි, මාගම සීලබලයෙන් යුතු වූවා ඥාතිබලයෙන් නො ද යුතු වූවා වේ ද ඇය කුලයෙහි වස්වත් ම ය. නො නසත් ම ය. මහණෙනි, මාගම සීලබලයෙන් යුතු වූවා පුත්‍රබලයෙන් නො ද යුතු වූවා වේ ද, ඇය කුලයෙහි වස්වත් ම ය. නො නසත් ම ය. මහණෙනි, මේ මාගමගේ බල පස යි.

## 3. 3. 7

## හේතු සූත්‍රය

312. මහණෙනි, මාගමට මේ බල පසෙකි. කවර පසෙක් ද යත්: රූපබලය භොගබලය ඥාතිබලය පුත්‍රබලය සීලබලය යි. මහණෙනි, මාගම රූපබලය හේතු කොට හෝ භොගබලය හේතු කොට හෝ ඥාතිබලය හේතු කොට හෝ පුත්‍රබලය හෙතුකොට හෝ කාබුන් මරණින් මතු සෝභන ගති ඇති සගලොවට නො පැමිණෙයි. මහණෙනි, මාගම සීලබලය හේතු කොට කාබුන් මරණින් මතු සෝභන ගති ඇති සගලොවට පැමිණෙයි. මහණෙනි, මේ මාගමගේ බල පස යි.

## 3. 3. 8

## ඨාන සූත්‍රය

313. මහණෙනි, නො කළ පින් ඇති මාගම විසින් දුලබ වූ මේ කරුණු පසෙකි. කවර පසෙක් ද යත්: මහණෙනි, "සුදුසු කුලයක උපදින්නෙමි"යි මෙය නො කළ පින් ඇති මාගම විසින් දුලබ වූ පළමුවන කරුණ යි. මහණෙනි, "සුදුසු කුලයක ඉපිද සුදුසු කුලයකට යන්නෙමි"යි මෙය නො කළ පින් ඇති මාගම විසින් දුලබ වූ දෙවන කරුණ යි. මහණෙනි, "සුදුසු කුලයක ඉපිද සුදුසු කුලයකට ගොස් සපත්නියක නැති ගෙහි වෙසෙන්නෙමි"යි මෙය නො කළ පින් ඇති මාගම විසින් දුලබ වූ තෙවන කරුණ යි. මහණෙනි, "සුදුසු කුලයක ඉපිද සුදුසු කුලයකට ගොස් සපත්නියක නැති ගෙහි වෙසෙමින් දරුවන් ඇත්තියක් වන්නෙමි"යි මෙය නො කළ පින් ඇති මාගම විසින් දුලබ වූ සිවුවන කරුණ යි. මහණෙනි, "සුදුසු කුලයක ඉපිද සුදුසු කුලයකට ගොස් සපත්නියක නැති ගෙහි වෙසෙමින් දරුවන් ඇත්තී ම සැමියා මැඩගෙන පවත්නෙමි"යි මෙය නො කළ පින් ඇති මාගම විසින් දුලබ වූ පස්වන කරුණ යි. මහණෙනි මේ නො කළ පින් ඇති මාගම විසින් දුලබ වූ කරුණු පස යි.

පඤ්චිමානි භික්ඛවෙ ඨානානි සුලභානි කතපුඤ්ඤෙන මාතුගාමෙන. කතමානි පඤ්ච: පතිරූපකුලෙ ජායෙය්‍යන්ති ඉදං භික්ඛවෙ පඨමං ඨානං සුලභං කතපුඤ්ඤෙන මාතුගාමෙන. පතිරූපකුලෙ ජායිත්වා පතිරූපං කුලං ගච්ඡෙය්‍යන්ති ඉදං භික්ඛවෙ දුතියං ඨානං සුලභං කතපුඤ්ඤෙන මාතුගාමෙන. පතිරූපකුලෙ ජායිත්වා පතිරූපං කුලං ගන්ත්වා අසපත්ති අගාරං අජ්ඣාවසෙය්‍යන්ති ඉදං භික්ඛවෙ තතියං ඨානං සුලභං කතපුඤ්ඤෙන මාතුගාමෙන. පතිරූපකුලෙ ජායිත්වා පතිරූපං කුලං ගන්ත්වා අසපත්ති අගාරං අජ්ඣාවසන්ති පුත්තවතී අස්සන්ති ඉදං භික්ඛවෙ චතුත්ථං ඨානං සුලභං කතපුඤ්ඤෙන මාතුගාමෙන. පතිරූපකුලෙ ජායිත්වා පතිරූපං කුලං ගන්ත්වා අසපත්ති අගාරං අජ්ඣාවසන්ති පුත්තවතී සමානා සාමිකං අභිභුය්‍ය වත්තෙය්‍යන්ති ඉදං භික්ඛවෙ පඤ්චමං ඨානං සුලභං කතපුඤ්ඤෙන මාතුගාමෙන. ඉමානි ඛො භික්ඛවෙ පඤ්චට්ඨානානි සුලභානි කතපුඤ්ඤෙන මාතුගාමෙනාති.

## 3. 3. 9

## විසාරදවාසසුත්තං

314. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො මාතුගාමො විසාරදො අගාරං අජ්ඣාවසති. කතමෙහි පඤ්චහි: පාණාතිපාතා පටිවිරතො ච හොති, අදින්නාදානා පටිවිරතො ච හොති, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො ච හොති. මුසාවාදා පටිවිරතො ච හොති, සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො ච හොති; ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො මාතුගාමො විසාරදො අගාරං අජ්ඣාවසතීති.

## 3. 3. 10

## වඩ්ඪීසුත්තං

315. පඤ්චහි භික්ඛවෙ වඩ්ඪීහි වඩ්ඪමානා අරියසාවිකා අරියාය වඩ්ඪියා වඩ්ඪති, සාරාදායිනී ච හොති වරාදායිනී ච කායස්ස. කතමාහි[1] පඤ්චහි: සද්ධාය වඩ්ඪති, සීලෙන වඩ්ඪති, සුතෙන වඩ්ඪති, චාගෙන වඩ්ඪති, පඤ්ඤාය වඩ්ඪති. ඉමාහි[2] ඛො භික්ඛවෙ පඤ්චහි වඩ්ඪීහි වඩ්ඪමානා අරියසාවිකා අරියාය වඩ්ඪියා වඩ්ඪති, සාරාදායිනී ච හොති වරාදායිනී ච කායස්සාති.

සද්ධාය සීලෙන ච යාධ වඩ්ඪති
පඤ්ඤාය චාගෙන සුතෙන චූභයං
සා තාදිසී සීලවතී උපාසිකා
ආදියති[3] සාරං ඉධෙව අත්තනොති.

බලවග්ගො තතියො.

තත්‍රුද්දානං:

සුද්ධා විසාරද පසය්හ අභිභුය්‍ය අඞ්ගෙන පඤ්චමං
නාසයිතබ්බං හෙතුට්ඨානං විසාරද වඩ්ඪිනා තෙ දසාති.

මාතුගාමසංයුත්තං සමත්තං

1. කතමෙහි - මජසං, සගා.
2. ඉමෙහි - මජසං, සගා.
3. ආදියති - මජසං සගා.

මහණෙනි, කළ පින් ඇති මාගම විසින් සුලබ වූ මේ කරුණු පසෙකි. කවර පසෙක් ද යත්: මහණෙනි ''සුදුසු කුලයක උපදින්නෙමි''යි මෙය කළ පින් ඇති මාගම විසින් සුලබ වූ පළමුවන කරුණ යි. මහණෙනි, ''සුදුසු කුලයක ඉපිද සුදුසු කුලයකට යන්නෙමි''යි මෙය කළ පින් ඇති මාගම විසින් සුලබ වූ දෙවන කරුණයි. මහණෙනි ''සුදුසු කුලයක ඉපිද සුදුසු කුලයකට ගොස් සපත්නියක නැති ගෙහි වෙසෙන්නෙමි''යි මෙය කළ පින් ඇති මාගම විසින් සුලබ වූ තෙවන කරුණයි. මහණෙනි ''සුදුසු කුලයක ඉපිද සුදුසු කුලයකට ගොස් සපත්නියක නැති ගෙහි වෙසෙමින් දරුවන් ඇත්තියක් වන්නෙමි'' යි මෙය කළ පින් ඇති මාගම විසින් සුලබ වූ සිවුවන කරුණ යි. මහණෙනි, ''සුදුසු කුලයක ඉපිද සුදුසු කුලයකට ගොස් සපත්නියක් නැති ගෙහි වෙසෙමින් දරුවන් ඇත්තී ම සැමියා මැඩගෙන පවත්නෙමි''යි මෙය කළ පින් ඇති මාගම විසින් සුලබ වූ පස්වන කරුණ යි. මහණෙනි, මේ කළ පින් ඇති මාගම විසින් සුලබ වූ කරුණු පස යි.

## 3. 3. 9

## විසාරදවාස සූත්‍රය

314. මහණෙනි, දහම් පසකින් යුතු මාගම විසාරද ව ගෙහි වෙසේ. කවර පසෙකින් ද යත්: පණිවායෙන් වැළකුණී වෙයි. අයිනාදනින් වැළකුණී වෙයි. කාමයෙහි වරදවා හැසුරුමෙන් වැළකුණී වෙයි. මුසවායින් වැළකුණී වෙයි. රහමෙර පානයෙන් වැළකුණී වෙයි. මහණෙනි, මේ දහම් පසින් යුත් මාගම විසාරද ව ගෙහි වෙසේ යි.

## 3. 3. 10

## වඩ්ඪී සූත්‍රය

315. මහණෙනි, වැඩුම් පසෙකින් වැඩෙන අරිසැව් තොමෝ අරිවැඩුමෙන් වැඩේ. කයෙහි හර ගන්නී ද උතුම් දෑ ගන්නීද වේ. කවර පසෙකින් ද යත්: සැදැහැයෙන් වැඩේ. සීලයෙන් වැඩේ. ශ්‍රුතයෙන් වැඩේ. ත්‍යාගයෙන් වැඩේ. ප්‍රඥාවෙන් වැඩේ. මහණෙනි, මේ පස්වැඩුමෙන් වැඩෙන අරිසැව් තොමෝ අරිවැඩුමෙන් වැඩේ. කයෙහි හර ගන්නී ද උතුම් දෑ ගන්නී ද වෙයි.

මෙලෙව්හි යම් ස්ත්‍රියක් සැදැහැයෙනුත් සීලයෙනුත් ප්‍රඥාවෙනුත් ත්‍යාග-ශ්‍රුත දෙකිනුත් වැඩේ ද එබඳු සිල්වත් ඒ උවැසි තොමෝ මෙලෙව්හි ම තමාගේ හර ගනී යි.

**තෙවෙනි බලවර්ග යි.**

**එහි සූත්‍රනාමාවලිය:**

සුද්ධ, විසාරද, පසය්හ, අභිභුය්‍ය, පස්වන අඞ්ග, නාසිතබ්බ, හෙතු, ඨාන, විසාරදවාස, වඩ්ඪී සූත්‍ර ය යි ඔහු දශයෙකි.

**මාතුගාමසංයුත්තය නිමියේ යි.**

# 4. ජම්බුඛාදකසංයුත්තං

## 4. 1. 1

### නිබ්බානසුත්තං

316. ඒකං සමයං ආයස්මා **සාරිපුත්තො** මගධෙසු විහරති **නාලගාමකෙ**.[1] අථ ඛො **ජම්බුඛාදකො පරිබ්බාජකො** යෙනායස්මා සාරිපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා සාරිපුත්තෙන සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ජම්බුඛාදකො පරිබ්බාජකො ආයස්මන්තං සාරිපුත්තං එතදවොච: නිබ්බානං නිබ්බානන්ති ආවුසො සාරිපුත්ත වුච්චති, කතමං නු ඛො ආවුසො නිබ්බානන්ති.

යො ඛො ආවුසො රාගක්ඛයො දොසක්ඛයො මොහක්ඛයො ඉදං වුච්චති නිබ්බානන්ති. අත්ථි පනාවුසො මග්ගො අත්ථි පටිපදා එතස්ස නිබ්බානස්ස සච්ඡිකිරියායාති. අත්ථි ඛො ආවුසො මග්ගො අත්ථි පටිපදා එතස්ස නිබ්බානස්ස සච්ඡිකිරියායාති. කතමො පනාවුසො මග්ගො කතමා පටිපදා එතස්ස නිබ්බානස්ස සච්ඡිකිරියායාති. අයමෙව ඛො ආවුසො අරියො අට්ඨඞ්ගිකො මග්ගො එතස්ස නිබ්බානස්ස සච්ඡිකිරියාය, සෙය්‍යථීදං: සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි. අයං ඛො ආවුසො මග්ගො අයං පටිපදා එතස්ස නිබ්බානස්ස සච්ඡිකිරියායාති. භද්දකො ආවුසො මග්ගො භද්දිකා පටිපදා එතස්ස නිබ්බානස්ස සච්ඡිකිරියාය, අලඤ්ච පනාවුසො සාරිපුත්ත අප්පමාදායාති.

## 4. 1. 2

### අරහත්තසුත්තං

317. අරහත්තං අරහත්තන්ති ආවුසො සාරිපුත්ත වුච්චති, කතමං නු ඛො ආවුසො අරහත්තන්ති. යො ඛො ආවුසො රාගක්ඛයො දොසක්ඛයො මොහක්ඛයො ඉදං වුච්චති අරහත්තන්ති. අත්ථි පනාවුසො මග්ගො අත්ථි පටිපදා එතස්ස අරහත්තස්ස සච්ඡිකිරියායාති. අත්ථි ඛො ආවුසො මග්ගො අත්ථි පටිපදා එතස්ස අරහත්තස්ස සච්ඡිකිරියායාති. කතමො පනාවුසො මග්ගො කතමා පටිපදා එතස්ස අරහත්තස්ස සච්ඡිකිරියායාති. අයමෙව ඛො ආවුසො අරියො අට්ඨඞ්ගිකො මග්ගො එතස්ස අරහත්තස්ස සච්ඡිකිරියාය. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. අයං ඛො ආවුසො මග්ගො අයං පටිපදා එතස්ස අරහත්තස්ස සච්ඡිකිරියායාති. භද්දකො ආවුසො මග්ගො භද්දිකා පටිපදා එතස්ස අරහත්තස්ස සච්ඡිකිරියාය. අලඤ්ච පනාවුසො සාරිපුත්ත අප්පමාදායාති.

---

1. නාලකගාමකෙ-මජසං,

# 4. ජම්බුඛාදක සංයුත්තය

## 4. 1. 1

### නිබ්බාන සූත්‍රය

316. එක්කලෙක ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ මගධ දනව්වෙහි නාලගම් හි වැඩවෙසෙති. එකල්හි ජම්බුඛාදක පිරිවැජි තෙමෙ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් වෙත එළැඹියේ ය. එළඹ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් සමග සතුටු විය. සතුටු කිය යුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පස් ව හුන්නේ ය. එකත්පස්ව හුන් ජම්බුඛාදක පිරිවැජි තෙමෙ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට මෙය කීය: ඇවැත්නි, ශාරීපුත්‍රයෙනි, නිවන නිවනැ යි කියනු ලැබේ. ඇවැත්නි, නිවන කවරේ දැ යි.

ඇවැත්නි, යම් රාගය දුරලීමෙක් ද්වේෂය දුරලීමෙක් මෝහය දුරලීමෙක් වේ නම් මේ නිවනැ යි කියනු ලැබේ. ඇවැත්නි, මේ නිවන පසක් කිරීමට මඟෙක් ඇද් ද, පිළිවෙතෙක් ඇද් දැ යි. ඇවැත්නි, මේ නිවන පසක් කිරීමට මඟෙක් ඇත. පිළිවෙතෙක් ඇත. ඇවැත්නි, මේ නිවන පසක් කිරීමට මග කවරේ ද, පිළිවෙත කවරේ දැ යි. ඇවැත්නි, මේ නිවන පසක් කිරීමට මේ අරිඅටඟිමග ම ය. එනම්: සම්මාදිට්ඨිය, සම්මාසඞ්කප්පය, සම්මාවාචාය, සම්මාකම්මන්තය, සම්මා-ආජීවය, සම්මාවායාමය, සම්මාසතිය, සම්මාසමාධිය යි. ඇවැත්නි, මේ නිවන පසක් කිරීමට මේ මග යි. මේ පිළිවෙත යි. ඇවැත්නි, මේ නිවන පසක් කිරීමට සොඳුරු මඟෙකි. සොඳුරු පිළිවෙතෙකි. ඇවැත්නි, ශාරීපුත්‍රයෙනි, නොපමා වීමට සුදුසු යි.

## 1. 1. 2

### අරහත්ත සූත්‍රය

317. ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, රහත්බව රහත්බවැ යි කියනු ලැබෙ. ඇවැත්නි, රහත්බව කවරේ දැ යි. ඇවැත්නි, යම් රාගය දුරලීමෙක් ද්වේෂය දුරලීමෙක් මෝහය දුරලීමෙක් වේ නම් මේ රහත්බවැ යි කියනු ලැබේ. ඇවැත්නි, මේ රහත්බව පසක් කිරීමට මඟෙක් ඇද්ද, පිළිවෙතෙක් ඇද්දැ යි. ඇවැත්නි, මේ රහත්බව පසක්කිරීමට මඟෙක් ඇත. පිළිවෙතෙක් ඇතැ යි. ඇවැත්නි, මේ රහත්බව පසක් කිරීමට මග කවරේ ද, පිළිවෙත කවරේදැ යි. ඇවැත්නි, මේ රහත්බව පසක් කිරීමට මේ අරි අටඟි මග මැ යි. එනම්: සම්මාදිට්ඨිය ... සම්මාසමාධිය යි. ඇවැත්නි, මේ රහත්බව පසක් කිරීමට මේ මග යි. මේ පිළිවෙත යි. ඇවැත්නි, මේ රහත්බව පසක් කිරීමට සොඳුරු මඟෙකි. සොඳුරු පිළිවෙතෙකි. ඇවත්නි, ශාරිපුත්‍රයෙනි නො පමාවීමට සුදුසු යි.

## 4. 1. 3

## ධම්මවාදීසුත්තං

318. කො නු ඛො ආවුසො සාරිපුත්ත ලොකෙ ධම්මවාදිනො, කෙ ලොකෙ සුප්පටිපන්නා, කෙ ලොකෙ සුගතාති. යෙ ඛො ආවුසො රාගස්ස පහානාය[1] ධම්මං දෙසෙන්ති, දොසස්ස පහානාය ධම්මං දෙසෙන්ති, මොහස්ස පහානාය ධම්මං දෙසෙන්ති, තෙ ලොකෙ ධම්මවාදිනො. යෙ ඛො ආවුසො රාගස්ස පහානාය පටිපන්නා දොසස්ස පහානාය පටිපන්නා, මොහස්ස පහානාය පටිපන්නා, තෙ ලොකෙ සුප්පටිපන්නා. යෙසං ඛො ආවුසො රාගො පහීනො උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවකතො[2] ආයතිං අනුප්පාදධම්මො, දොසො පහීනො උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවකතො ආයතිං අනුප්පාදධම්මො, මොහො පහීනො උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවකතො ආයතිං අනුප්පාදධම්මො තෙ ලොකෙ සුගතාති.

අත්ථි පනාවුසො මග්ගො අත්ථි පටිපදා එතස්ස රාගස්ස දොසස්ස මොහස්ස පහානායාති. අත්ථි ඛො[3] ආවුසො මග්ගො අත්ථි පටිපදා එතස්ස රාගස්ස දොසස්ස මොහස්ස පහානායාති. කතමො පනාවුසො මග්ගො කතමා පටිපදා එතස්ස රාගස්ස දොසස්ස මොහස්ස පහානායාති. අයමෙව ඛො ආවුසො අරියො අට්ඨඞ්ගිකො මග්ගො එතස්ස රාගස්ස දොසස්ස මොහස්ස පහානාය. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි, අයං ඛො ආවුසො මග්ගො අයං පටිපදා එතස්ස රාගස්ස දොසස්ස මොහස්ස පහානායාති. භද්දකො ආවුසො මග්ගො භද්දිකා පටිපදා එතස්ස රාගස්ස දොසස්ස මොහස්ස පහානාය. අලඤ්ච පනාවුසො සාරිපුත්ත, අප්පමාදායාති.

## 4. 1. 4

## කිමත්ථියසුත්තං

319. කිමත්ථියං ආවුසො සාරිපුත්ත සමණෙ ගොතමෙ බ්‍රහ්මචරියං වුස්සතීති. දුක්ඛස්ස ඛො ආවුසො පරිඤ්ඤත්ථං භගවති බ්‍රහ්මචරියං වුස්සතීති. අත්ථි පනාවුසො මග්ගො අත්ථි පටිපදා එතස්ස දුක්ඛස්ස පරිඤ්ඤායාති. අත්ථි ඛො ආවුසො මග්ගො අත්ථි පටිපදා එතස්ස දුක්ඛස්ස පරිඤ්ඤායාති. කතමො පනාවුසො මග්ගො කතමා පටිපදා එතස්ස දුක්ඛස්ස පරිඤ්ඤායාති. අයමෙව ඛො ආවුසො අරියො අට්ඨඞ්ගිකො මග්ගො එතස්ස දුක්ඛස්ස පරිඤ්ඤාය, සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි, අයං ඛො ආවුසො මග්ගො අයං පටිපදා එතස්ස දුක්ඛස්ස පරිඤ්ඤායාති. භද්දකො ආවුසො මග්ගො භද්දිකා පටිපදා එතස්ස දුක්ඛස්ස පරිඤ්ඤාය. අලඤ්ච පනාවුසො සාරිපුත්ත අප්පමාදායාති.

---

1. රාගප්පහානාය-මජසං. ස්‍යා
2. අනභාවං කතො - මජසං. ස්‍යා
3. අත්ථියෙව ඛො - ස්‍යා

## 4. 1. 3

## ධම්මවාදී සූත්‍රය

318. ඇවැත්නි ශාරීපුත්‍රයෙනි, ලොව ධර්මවාදීහු කවරහු ද ලොව සුපටිපන්න කවරහු ද? ලොව සුගත කවරහු දැ යි. ඇවැත්නි, යම් කෙනෙක් රාග ප්‍රහාණය පිණිස දහම් දෙසත් ද, ද්වේෂ ප්‍රහාණය පිණිස දහම් දෙසත් ද, මෝහ ප්‍රහාණය පිණිස දහම් දෙසත් ද, ඔහු ලොව ධර්මවාදීහු ය. ඇවැත්නි, යම් කෙනෙක් රාග ප්‍රහාණය පිණිස පිළිපන්නාහු ද, ද්වේෂ ප්‍රහාණය පිණිස පිළිපන්නාහු ද, මෝහ ප්‍රහාණය පිණිස පිළිපන්නාහු ද, ඔහු ලොව සුපටිපන්නයෝ ය. ඇවැත්නි, යම් කෙනකුන්ගේ රාගය ප්‍රහීණ වී ද, උසුන්මුල් ඇත්තේ ද, මුදුන සුන් තල්රුකක් මෙන් කරන ලද්දේ ද, පුන පුනා නො වීම් කරන ලද්දේ ද, මතු නූපදනා ස්වභාව ඇත්තේ ද; ද්වේෂය ප්‍රහීණ වී ද, උසුන්මුල් ඇත්තේ ද, මුදුනසුන් තල්රුකක් මෙන් කරන ලද්දේ ද, පුන පුනා නො වීම කරන ලද්දේ ද, මතු නූපදනා ස්වභාව ඇත්තේ ද; මෝහය ප්‍රහීණ ද, උසුන් මුල් ඇත්තේ ද, මුදුනසුන් තල්රුකක් මෙන් කරන ලද්දේ ද, පුන පුනා නො වීම කරන ලද්දේ ද, මතු නූපදනා ස්වභාව ඇත්තේ ද ඔහු ලොව සුගතයෝ යි.

ඇවැත්නි, මේ රාගය ද්වේෂය මෝහය ප්‍රහාණයට මගෙක් ඇත්ද පිළිවෙතෙක් ඇත්දැ යි. ඇවැත්නි, මේ රාගය ද්වේෂය මෝහය ප්‍රහාණයට මගෙක් ඇත. පිළිවෙතෙක් ඇතැ යි. ඇවැත්නි, මේ රාගය ද්වේෂය මෝහය ප්‍රහාණයට මග කවරේ ද පිළිවෙත කවරේදැ යි. ඇවත්නි, මේ රාගය ද්වේෂය මෝහය ප්‍රහාණයට මේ අරි අටඟි මග ම ය. එනම්: සම්මාදිට්ඨිය ... සම්මාසමාධිය යි. ඇවැත්නි, මේ රාගය ද්වේෂය මෝහය ප්‍රහාණයට මේ මග යි. මේ පිළිවෙත යි. ඇවැත්නි, මේ රාගය ද්වේෂය මෝහය ප්‍රහාණයට සොඳුරු මගෙකි. සොඳුරු පිළිවෙතෙකි. ඇවැත්නි ශාරීපුත්‍රයෙනි, නො පමා වීමට සුදුසු යි.

## 4. 1. 4

## කිමත්ථිය සූත්‍රය

319. ඇවැත්නි ශාරීපුත්‍රයෙනි, කුමක් පිණිස මහණ ගොයුම්හු කෙරෙහි බඹසර වෙසේ දැ යි. ඇවැත්නි දුක පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර වෙසේ යි. ඇවැත්නි, මේ දුක පිරිසිඳ දැනීම පිණිස මගෙක් ඇත් ද පිළිවෙතෙක් ඇත් දැ යි. ඇවැත්නි, මේ දුක පිරිසිඳ දැනීම පිණිස මගෙක් ඇත, පිළිවෙතෙක් ඇතැ යි. ඇවැත්නි, මේ දුක පිරිසිඳ දැනීම පිණිස මග කවරේ ද පිළිවෙත කවරේ දැ යි. ඇවැත්නි, මේ දුක පිරිසිඳ දැනීම පිණිස මේ අරි අටඟි මග ම ය. එනම්: සම්මාදිට්ඨිය ... සම්මාසමාධිය යි. ඇවැත්නි, මේ දුක පිරිසිඳ දැනීම පිණිස මේ මග යි, මේ පිළිවෙත යි. ඇවැත්නි, මේ දුක පිරිසිඳ දැනීම පිණිස සොඳුරු මගෙකි. සොඳුරු පිළිවෙතෙකි. ඇවැත්නි ශාරීපුත්‍රයෙනි, නො පමා වීමට සුදුසු යි.

## 4. 1. 5

### අස්සාදසුත්තං

320. අස්සාදපඤ්ඤො අස්සාදපඤ්ඤොති ආවුසො සාරිපුත්ත වුච්චති. කිත්තාවතා නු ඛො ආවුසො සාරිපුත්ත අස්සාදපඤ්ඤො හොතීති. යතො ඛො ආවුසො භික්ඛු ඡන්නං ඵස්සායතනානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානාති, එත්තාවතා. ඛො ආවුසො අස්සාදපඤ්ඤො හොතීති. අත්ථි පනාවුසො මග්ගො අත්ථි පටිපදා එතස්ස අස්සාදස්ස සච්ඡිකිරියායාති. අත්ථි ඛො ආවුසො මග්ගො අත්ථි පටිපදා එතස්ස අස්සාදස්ස සච්ඡිකිරියායාති.

කතමො පනාවුසො මග්ගො කතමා පටිපදා එතස්ස අස්සාදස්ස සච්ඡිකිරියායාති. අයමෙව ඛො ආවුසො අරියො අට්ඨඞ්ගිකො මග්ගො එතස්ස අස්සාදස්ස සච්ඡිකිරියාය. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. අයං ඛො ආවුසො මග්ගො අයං පටිපදා එතස්ස අස්සාදස්ස සච්ඡිකිරියායාති. භද්දකො ආවුසො මග්ගො භද්දිකා පටිපදා එතස්ස අස්සාදස්ස සච්ඡිකිරියාය. අලඤ්ච පනාවුසො සාරිපුත්ත අප්පමාදායාති.

## 4. 1. 6

### පරමස්සාදසුත්තං

321. පරමස්සාදපඤ්ඤො පරමස්සාදපඤ්ඤොති ආවුසො සාරිපුත්ත, වුච්චති. කිත්තාවතා නු ඛො ආවුසො සාරිපුත්ත, පරමස්සාදපඤ්ඤො හොතීති. යතො ඛො ආවුසො භික්ඛු ඡන්නං ඵස්සායතනානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං විදිත්වා අනුපාදා විමුත්තො හොති, එත්තාවතා ඛො ආවුසො පරමස්සාදපඤ්ඤො හොතීති. අත්ථි පනාවුසො මග්ගො අත්ථි පටිපදා එතස්ස පරමස්සාදස්ස සච්ඡිකිරියායාති. අත්ථි ඛො ආවුසො මග්ගො අත්ථි පටිපදා එතස්ස පරමස්සාදස්ස සච්ඡිකිරියායාති.

කතමො පනාවුසො මග්ගො කතමා පටිපදා එතස්ස පරමස්සාදස්ස සච්ඡිකිරියායාති. අයමෙව ඛො ආවුසො අරියො අට්ඨඞ්ගිකො මග්ගො එතස්ස පරමස්සාදස්ස සච්ඡිකිරියාය. සෙය්‍යථී සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. අයං ඛො ආවුසො මග්ගො අයං පටිපදා එතස්ස පරමස්සාදස්ස සච්ඡිකිරියායාති. භද්දකො ආවුසො මග්ගො භද්දිකා පටිපදා එතස්ස පරමස්සාදස්ස සච්ඡිකිරියාය. අලඤ්ච පනාවුසො සාරිපුත්ත අප්පමාදායාති.

## 4. 1. 5

### අස්සාස සූත්‍රය

320. ඇවැත්නි **ශාරිපුත්‍රයෙනි,** අස්වැසුමට පැමිණියේ අස්වැසුමට පැමිණියේ යි කියනු ලැබේ ඇවැත්නි ශාරිපුත්‍රයෙනි, කෙතෙකින් අස්වැසුමට පැමිණියේ වේ ද යි. ඇවැත්නි, මහණ තෙමේ යම් කලෙක ස්පර්ශායතන සයෙහි සමුදයත් අස්තඞ්ගමයත් ආස්වාදයත් ආදීනවයත් නිශ්ශරණයත් තතු සේ දකී ද, ඇවැත්නි, මෙතෙකින් අස්වැසුමට පැමිණියේ වේ යි. ඇවත්නි, මේ අස්වැසුම පසක් කිරීමට මගෙක් ඇත් ද පිළිවෙතෙක් ඇත් ද යි. ඇවැත්නි, මේ අස්වැසුම පසක් කිරීමට මගෙක් ඇත. පිළිවෙතෙක් ඇතැ යි.

ඇවැත්නි; මේ අස්වැසුම පසක් කිරීමට මග කවරේ ද පිළිවෙත කවරේ ද යි. ඇවැත්නි, මේ අස්වැසුම පසක් කිරීමට මේ අරි අටඟි මග ම ය. එනම් සම්මාදිට්ඨිය ... සම්මාසමාධිය යි. ඇවැත්නි, මේ අස්වැසුම පසක් කිරීමට මේ මග යි. මේ පිළිවෙත යි. ඇවැත්නි, මේ අස්වැසුම පසක් කිරීමට සොඳුරු මඟෙකි, සොඳුරු පිළිවෙතෙකි. ඇවැත්නි ශාරිපුත්‍රයෙනි, නො පමා වීමට සුදුසු යි.

## 4. 1. 6

### පරමස්සාස සූත්‍රය

32[illegible]. ඇවැත්නි **ශාරිපුත්‍රයෙනි,** උතුම් අස්වැසුමට පැමිණියේ උතුම් අස්වැසුමට පැමිණියේ යි කියනු ලැබේ. ඇවැත්නි ශාරිපුත්‍රයෙනි, කෙතෙකින් උතුම් අස්වැසුමට පැමිණියේ වේ ද යි. ඇවැත්නි, මහණ තෙමේ යම් කලෙක ස්පර්ශායතන සයෙහි සමුදයයත් අස්තඞ්ගමයත් ආසවාදයත් ආදීනවයත් නිශ්ශරණයත් තතු සේ දැන උපාදාන රහිත ව මිදුනේ වේ ද, ඇවැත්නි, මෙතෙකින් උතුම් අස්වැසුමට පැමිණියේ වෙයි. ඇවැත්නි, මේ උතුම් අස්වැසුම පසක් කිරීමට මගෙක් ඇත් ද පිළිවෙතෙක් ඇද්ද යි. ඇවැත්නි, මේ උතුම් අස්වැසුම පසක් කිරීමට මගෙක් ඇත පිළිවෙතෙක් ඇතැ යි.

ඇවැත්නි, මේ උතුම් අස්වැසුම පසක් කිරීමට මග කවරේ ද පිළිවෙත කවරේ ද යි. ඇවැත්නි, මේ උතුම් අස්වැසුම පසක් කිරීමට මේ අරිඅටඟිමග ම ය. එනම්: සම්මාදිට්ඨිය ... සම්මාසමාධිය යි. ඇවැත්නි, මේ උතුම් අස්වැසුම පසක් කිරීමට මේ මග යි. මේ පිළි-වෙත යි. ඇවැත්නි, මේ උතුම් අස්වැසුම පසක් කිරීමට සොඳුරු මඟෙකි. සොඳුරු පිළිවෙතෙකි. ඇවැත්නි ශාරිපුත්‍රයෙනි, නො පමා වීමට සුදුසු යි.

## 4. 1. 7

### වෙදනාසුත්තං

322. වෙදනා වෙදනාති ආවුසො සාරිපුත්ත වුච්චති. කතමා නු ඛො ආවුසො වෙදනාති. තිස්සො ඉමා ආවුසො වෙදනා, සුඛා වෙදනා දුක්ඛා වෙදනා අදුක්ඛමසුඛා වෙදනා. ඉමා ඛො ආවුසො තිස්සො වෙදනාති. අත්ථි පනාවුසො මග්ගො අත්ථි පටිපදා එතාසං[1] වෙදනානං පරිඤ්ඤායාති. අත්ථි ඛො ආවුසො මග්ගො අත්ථි පටිපදා එතාසං වෙදනානං පරිඤ්ඤායාති.

කතමො පනාවුසො මග්ගො කතමා පටිපදා එතාසං වෙදනානං පරිඤ්ඤායාති. අයමෙව ඛො ආවුසො අරියො අට්ඨඞ්ගිකො මග්ගො එතාසං වෙදනානං පරිඤ්ඤාය. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. අයං ඛො ආවුසො මග්ගො අයං පටිපදා එතාසං වෙදනානං පරිඤ්ඤායාති. භද්දකො ආවුසො මග්ගො භද්දිකා පටිපදා එතාසං වෙදනානං පරිඤ්ඤාය. අලඤ්ච පනාවුසො සාරිපුත්ත අප්පමාදායාති.

## 4. 1. 8

### ආසවසුත්තං

323. ආසවො ආසවොති ආවුසො සාරිපුත්ත, වුච්චති. කතමො නු ඛො ආවුසො ආසවොති. තයො මෙ ආවුසො ආසවා, කාමාසවො භවාසවො අවිජ්ජාසවො. ඉමෙ ඛො ආවුසො තයො ආසවාති. අත්ථි පනාවුසො මග්ගො අත්ථි පටිපදා එතෙසං ආසවානං පහානායාති. අත්ථි ඛො ආවුසො මග්ගො අත්ථි පටිපදා එතෙසං ආසවානං පහානායාති. කතමො පනාවුසො මග්ගො කතමා පටිපදා එතෙසං ආසවානං පහානායාති. අයමෙව ඛො ආවුසො අරියො අට්ඨඞ්ගිකො මග්ගො එතෙසං ආසවානං පහානාය. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. අයං ඛො ආවුසො මග්ගො අයං පටිපදා එතෙසං ආසවානං පහානායාති. භද්දකො ආවුසො මග්ගො භද්දිකා පටිපදා එතෙසං ආසවානං පහානාය. අලඤ්ච පනාවුසො සාරිපුත්ත අප්පමාදායාති.

## 4. 1. 9

### අවිජ්ජාසුත්තං

324. අවිජ්ජා අවිජ්ජාති ආවුසො සාරිපුත්ත වුච්චති. කතමා නු ඛො ආවුසො අවිජ්ජාති. යං ඛො ආවුසො දුක්ඛෙ අඤ්ඤාණං දුක්ඛසමුදයෙ අඤ්ඤාණං දුක්ඛනිරොධෙ අඤ්ඤාණං දුක්ඛනිරොධගාමිනියා පටිපදාය අඤ්ඤාණං, අයං වුච්චතාවුසො අවිජ්ජාති. අත්ථි පනාවුසො මග්ගො අත්ථි පටිපදා එතිස්සා අවිජ්ජාය පහානායාති. අත්ථි ඛො ආවුසො මග්ගො අත්ථි පටිපදා එතිස්සා අවිජ්ජාය පහානායාති. කතමො පනාවුසො මග්ගො කතමා පටිපදා එතිස්සා අවිජ්ජාය පහානායාති. අයමෙව ඛො ආවුසො අරියො අට්ඨඞ්ගිකො මග්ගො එතිස්සා අවිජ්ජාය පහානාය. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. අයං ඛො ආවුසො මග්ගො අයං පටිපදා එතිස්සා අවිජ්ජාය පහානායාති. භද්දකො ආවුසො මග්ගො, භද්දිකා පටිපදා එතිස්සා අවිජ්ජාය පහානාය. අලඤ්ච පනාවුසො සාරිපුත්ත අප්පමාදායාති.

1. තිස්සන්නං - මජසං, සයා.

## 4. 1. 7

## වේදනා සූත්‍රය

322. ඇවැත්නි **ශාරිපුත්‍රයෙනි,** වෙදනා වෙදනා යි කියනු ලැබෙ. ඇවැත්නි, වෙදනා කවරහු ද යි. ඇවැත්නි, මේ වෙදනා තුනෙකි, සුව වෙදනා ය, දුක් වෙදනා ය, මැදහත් වෙදනා ය යි. ඇවැත්නි, මේ වෙදනා තුන යි. ඇවැත්නි, මේ වෙදනා තුන පිරිසිඳ දැනීම පිණිස මගෙක් ඇද් ද පිළිවෙතෙක් ඇද් ද යි. ඇවැත්නි, මේ වෙදනා පිරිසිඳ දැනීම පිණිස මගෙක් ඇත. පිළිවෙතෙක් ඇතැ යි.

ඇවැත්නි මේ වෙදනා, පිරිසිඳ දැනීම පිණිස මග කවරේ ද පිළිවෙත කවරේ ද යි. ඇවැත්නි, මේ වෙදනා පිරිසිඳ දැනීම පිණිස මේ අරිඅටඟිමග ම ය. එනම්: සම්මාදිට්ඨිය ... සම්මාසමාධිය යි. ඇවැත්නි, මේ වෙදනා පිරිසිඳ දැනීම පිණිස මේ මග යි, මේ පිළිවෙත යි. ඇවැත්නි, මේ වෙදනා පිරිසිඳ දැනීම පිණිස සොඳුරු මගෙකි, සොඳුරු පිළිවෙතෙකි. ඇවැත්නි ශාරිපුත්‍රයෙනි, නො පමා වීමට සුදුසු යි.

## 4. 1. 8

## ආසව සූත්‍රය

323. ඇවැත්නි **ශාරිපුත්‍රයෙනි,** ආස්‍රව ආස්‍රවැ යි කියනු ලැබෙ. ඇවැත්නි, ආස්‍රව කවරේද යි. ඇවැත්නි මේ ආස්‍රව තුනෙකි. කාමාස්‍රව ය භවාස්‍රව ය අවිද්‍යාස්‍රව ය යි. ඇවැත්නි මේ ආස්‍රව තුන යි. ඇවැත්නි මේ ආස්‍රවයන් ප්‍රහාණය පිණිස මගෙක් ඇත් ද පිළිවෙතෙක් ඇද්ද යි. ඇවැත්නි, මේ ආස්‍රවයන් ප්‍රහාණය පිණිස මගෙක් ඇත, පිළිවෙතෙක් ඇතැ යි. ඇවැත්නි මේ ආස්‍රවයන් ප්‍රහාණය පිණිස මග කවරේ ද පිළිවෙත කවරේ ද යි. ඇවැත්නි මේ ආස්‍රවයන් ප්‍රහාණය පිණිස මේ අරිඅටඟිමග ම ය. එනම් සම්මාදිට්ඨි ය ... සම්මාසමාධිය යි. ඇවැත්නි, මේ ආස්‍රවයන් ප්‍රහාණය පිණිස මේ මග යි. මේ පිළිවෙත යි. ඇවැත්නි මේ ආස්‍රවයන් ප්‍රහාණය පිණිස සොඳුරු මගෙකි. සොඳුරු පිළිවෙතෙකි. ඇවැත්නි ශාරිපුත්‍රයෙනි, නො පමා වීමට සුදුසු යි.

## 4. 1. 9

## අවිජ්ජා සූත්‍රය

324. ඇවැත්නි **ශාරිපුත්‍රයෙනි,** අවිද්‍යා අවිද්‍යා යි කියනු ලැබෙ. ඇවැත්නි අවිද්‍යාව කවර ද යි. ඇවැත්නි, දුක්ඛයෙහි යම් නො දැනීමෙක්, දුක්ඛසමුදයෙහි නො දැනීමෙක්, දුක්ඛනිරොධයෙහි නො දැනීමෙක්, දුක්ඛනිරොධගාමිනීපටිපදයෙහි නො දැනීමෙක් වේ නම්, ඇවැත්නි, මේ අවිද්‍යා යයි කියනු ලැබේ. ඇවැත්නි, මේ අවිද්‍යාව ප්‍රහාණය පිණිස මගෙක් ඇත් ද පිළිවෙතෙක් ඇත් ද යි. ඇවැත්නි, මේ අවිද්‍යාව ප්‍රහාණය පිණිස මගෙක් ඇත. පිළිවෙතෙක් ඇතැ යි. ඇවැත්නි, මේ අවිද්‍යාව ප්‍රහාණය පිණිස මග කවරේද, පිළිවෙත කවරේ ද යි. ඇවැත්නි, මේ අවිද්‍යාව ප්‍රහාණය පිණිස මේ අරිඅටඟි මග ම ය. එනම් සම්මාදිට්ඨිය ... සම්මාසමාධිය යි. ඇවැත්නි මේ අවිද්‍යාව ප්‍රහාණය පිණිස සොඳුරු මගෙකි. සොඳුරු පිළිවෙතෙකි. ඇවැත්නි ශාරිපුත්‍රයෙනි, නො පමාවීමට සුදුසු යි.

## 4. 1. 10

### තණ්හාසුත්තං

325. **තණ්හා** තණ්හාති ආවුසො **සාරිපුත්ත** වුච්චති. කතමා නු බො ආවුසො තණ්හාති. තිස්සො ඉමා ආවුසො තණ්හා: කාමතණ්හා භවතණ්හා විභවතණ්හා. ඉමා බො ආවුසො තිස්සො තණ්හාති. අත්‍ථි පනාවුසො මග්ගො අත්‍ථි පටිපදා එතාසං තණ්හානං පහානායාති. අත්‍ථි බො ආවුසො මග්ගො අත්‍ථි පටිපදා එතාසං තණ්හානං පහානායාති. කතමො පනාවුසො මග්ගො කතමා පටිපදා එතාසං තණ්හානං පහානායාති. අයමෙව බො ආවුසො අරියො අට්ඨඞ්ගිකො මග්ගො එතාසං තණ්හානං පහානාය. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. අයං බො ආවුසො මග්ගො අයං පටිපදා එතාසං තණ්හානං පහානායාති. භද්දකො ආවුසො මග්ගො භද්දිකා පටිපදා එතාසං තණ්හානං පහානාය. අලඤ්ච පනාවුසො සාරිපුත්ත අප්පමාදායාති.

## 4. 1. 11

### ඔඝසුත්තං

326. ඔඝො ඔඝොති ආවුසො **සාරිපුත්ත** වුච්චති කතමො නු බො ආවුසො ඔඝොති. චත්තාරොමෙ ආවුසො ඔඝා: කාමොඝො භවොඝො දිට්ඨොඝො අවිජ්ජොඝො. ඉමෙ බො ආවුසො චත්තාරො ඔඝාති. අත්‍ථි පනාවුසො මග්ගො අත්‍ථි පටිපදා එතෙසං ඔඝානං පහානායාති. අත්‍ථි බො ආවුසො මග්ගො අත්‍ථි පටිපදා එතෙසං ඔඝානං පහානායාති. කතමො පනාවුසො මග්ගො කතමා පටිපදා එතෙසං ඔඝානං පහානායාති. අයමෙව බො ආවුසො අරියො අට්ඨඞ්ගිකො මග්ගො එතෙසං ඔඝානං පහානාය. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. අයං බො ආවුසො මග්ගො අයං පටිපදා එතෙසං ඔඝානං පහානායාති. භද්දකො ආවුසො මග්ගො භද්දිකා පටිපදා එතෙසං ඔඝානං පහානාය. අලඤ්ච පනාවුසො සාරිපුත්ත අප්පමාදායාති.

## 4. 1. 12

### උපාදානසුත්තං

327. උපාදානං උපාදානන්ති පනාවුසො **සාරිපුත්ත** වුච්චති. කතමන්නු බො ආවුසො උපාදානන්ති. චත්තාරිමානි ආවුසො උපාදානානි: කාමුපාදානං දිට්ඨුපාදානං සීලබ්බතුපාදානං අත්තවාදුපාදානං ඉමානි බො ආවුසො චත්තාරි උපාදානානීති. අත්‍ථි පනාවුසො මග්ගො අත්‍ථි පටිපදා එතෙසං උපාදානානං පහානායාති. අත්‍ථි බො ආවුසො මග්ගො අත්‍ථි පටිපදා එතෙසං උපාදානානං පහානායාති. කතමො පනාවුසො මග්ගො කතමා පටිපදා එතෙසං උපාදානානං පහානායාති. අයමෙව බො අරියො අට්ඨඞ්ගිකො මග්ගො එතෙසං උපාදානානං පහානාය, සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. අයං බො ආවුසො මග්ගො අයං පටිපදා එතෙසං උපාදානානං පහානායාති. භද්දකො ආවුසො මග්ගො භද්දිකා පටිපදා එතෙසං උපාදානානං පහානාය. අලඤ්ච පනාවුසො සාරිපුත්ත අප්පමාදායාති.

## 4. 1. 10

## තණ්හා සූත්‍රය

325. ඇවැත්නි **ශාරිපුත්‍රයෙනි**, තණ්හා තණ්හා යි කියනු ලැබේ. ඇවැත්නි තණ්හාව කවර යි. ඇවැත්නි මේ තණ්හා තුනෙකි. කාමතණ්හා ය, භවතණ්හා ය, විභව තණ්හා ය යි. ඇවැත්නි, මේ තණ්හා තුන යි. ඇවැත්නි මේ තණ්හා ප්‍රහාණය පිණිස මඟෙක් ඇත් ද, පිළිවෙතෙක් ඇත් ද යි. ඇවැත්නි, මේ තණ්හා ප්‍රහාණය පිණිස මඟෙක් ඇත, පිළිවෙතෙක් ඇතැ යි. ඇවැත්නි, මේ තණ්හා ප්‍රහාණය පිණිස මඟ කවරේ ද පිළිවෙත කවරේ ද යි. ඇවැත්නි, මේ තණ්හා ප්‍රහාණය පිණිස මේ අරිඅටඟිමඟ ම ය. එනම්: සම්මා-දිට්ඨිය ... සම්මාසමාධිය යි. ඇවැත්නි, මේ තණ්හා ප්‍රහාණය පිණිස මේ මඟ යි. මේ පිළිවෙත යි. ඇවැත්නි, මේ තණ්හා ප්‍රහාණය පිණිස සොඳුරු මඟෙකි, සොඳුරු පිළිවෙතෙකි. ඇවැත්නි ශාරිපුත්‍ර-යෙනි, නො පමා වීමට සුදුසු යි.

## 4. 1. 11

## ඕඝ සූත්‍රය

326. ඇවැත්නි **ශාරිපුත්‍රයෙනි**, ඕඝ යැ ඕඝ යැ යි කියනු ලැබේ. ඇවැත්නි, ඕඝය කවරේ ද යි. ඇවැත්නි, ඕඝ සතරෙකි, කාමෞඝ ය භවෞඝ ය දිට්ඨෞඝ ය අවිජ්ජෞඝ ය යි. ඇවැත්නි, මේ ඕඝ සතර යි. ඇවැත්නි, මේ ඕඝ ප්‍රහාණය පිණිස මඟෙක් ඇද් ද, පිළිවෙතෙක් ඇද් ද යි. ඇවැත්නි, මේ ඕඝ ප්‍රහාණය පිණිස මඟෙක් ඇත. පිළි-වෙතෙක් ඇතැ යි. ඇවැත්නි, මේ ඕඝ ප්‍රහාණය පිණිස මඟ කවරේ ද, පිළිවෙත කවරේ ද යි. ඇවැත්නි, මේ ඕඝ ප්‍රහාණය පිණිස මේ අරිඅටඟිමඟ ම ය. එනම්: සම්මාදිට්ඨිය ... සම්මාසමාධිය යි. ඇවැත්නි, මේ ඕඝ ප්‍රහාණය පිණිස මේ මඟ යි, මේ පිළිවෙත යි. ඇවැත්නි, මේ ඕඝ ප්‍රහාණය පිණිස සොඳුරු මඟෙකි, සොඳුරු පිළිවෙතෙකි. ඇවැත්නි ශාරිපුත්‍රයෙනි, නො පමා වීමට සුදුසු යි.

## 4. 1. 12

## උපාදාන සූත්‍රය

327. ඇවැත්නි **ශාරිපුත්‍රයෙනි**, උපාදාන උපාදානැ යි කියනු ලැබේ. ඇවැත්නි, උපාදාන කවරේ ද යි. ඇවැත්නි, මේ උපාදාන සතරෙකි. කාමූපාදාන ය, දිට්ඨූපාදාන ය, සීලබ්බතූපාදානය, අත්තවාදූ-පාදාන ය යි. ඇවැත්නි, මේ උපාදාන සතර යි. ඇවැත්නි, මේ උපාදාන ප්‍රහාණය පිණිස මඟෙක් ඇත් ද, පිළිවෙතෙක් ඇත් ද යි. ඇවැත්නි, මේ උපාදාන ප්‍රහාණය පිණිස මඟෙක් ඇත, පිළිවෙතෙක් ඇතැ යි. ඇවැත්නි, මේ උපාදාන ප්‍රහාණය පිණිස මඟ කවරේ ද, පිළිවෙත කවරේ දැ යි. ඇවැත්නි, මේ උපාදාන ප්‍රහාණය පිණිස මේ අරිඅටඟිමඟ ම ය. එනම්: සම්මාදිට්ඨිය ... සම්මාසමාධිය යි. ඇවැත්නි, මේ උපාදාන ප්‍රහාණය පිණිස මේ මඟ යි, මේ පිළිවෙත යි. ඇවැත්නි, මේ උපාදාන ප්‍රහාණය පිණිස සොඳුරු මඟෙකි. සොඳුරු පිළිවෙතෙකි. ඇවැත්නි ශාරිපුත්‍රයෙනි, නො පමාවීමට සුදුසු යි.

## 4. 1. 13

### භවසුත්තං

328. භවො භවොති ආවුසො **සාරිපුත්ත** වුච්චති. කතමො නු ඛො ආවුසො භවොති, තයොමෙ ආවුසො භවා, කාමභවො රූපභවො අරූපභවො. ඉමෙ ඛො ආවුසො තයො භවාති. අත්ථි පනාවුසො මග්ගො අත්ථි පටිපදා එතෙසං භවානං පරිඤ්ඤායාති. අත්ථි ඛො ආවුසො මග්ගො අත්ථි පටිපදා එතෙසං භවානං පරිඤ්ඤායාති. කතමො පනාවුසො මග්ගො කතමා පටිපදා එතෙසං භවානං පරිඤ්ඤායාති. අයමෙව ඛො ආවුසො අරියො අට්ඨඞ්ගිකො මග්ගො එතෙසං භවානං පරිඤ්ඤාය. සෙය්‍යථීදං: **සම්මාදිට්ඨි** -පෙ- **සම්මාසමාධි**. අයං ඛො ආවුසො මග්ගො අයං පටිපදා එතෙසං භවානං පරිඤ්ඤායාති. භද්දකො පනාවුසො මග්ගො, භද්දිකා පටිපදා එතෙසං භවානං පරිඤ්ඤාය. අලඤ්ච පනාවුසො සාරිපුත්ත අප්පමාදායාති.

## 4. 1. 14

### දුක්ඛසුත්තං

329. දුක්ඛං දුක්ඛන්ති ආවුසො **සාරිපුත්ත** වුච්චති. කතමං නු ඛො ආවුසො දුක්ඛන්ති. තිස්සො ඉමා ආවුසො දුක්ඛතා, දුක්ඛදුක්ඛතා සඞ්ඛාරදුක්ඛතා විපරිණාමදුක්ඛතා. ඉමා ඛො ආවුසො තිස්සො දුක්ඛතාති. අත්ථි පනාවුසො මග්ගො අත්ථි පටිපදා එතාසං දුක්ඛතානං පරිඤ්ඤායාති. අත්ථි ඛො ආවුසො මග්ගො අත්ථි පටිපදා එතාසං දුක්ඛතානං පරිඤ්ඤායාති. කතමො පනාවුසො මග්ගො කතමා පටිපදා එතාසං දුක්ඛතානං පරිඤ්ඤායාති. අයමෙව ඛො ආවුසො අරියො අට්ඨඞ්ගිකො මග්ගො එතාසං දුක්ඛතානං පරිඤ්ඤාය, සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. අයං ඛො ආවුසො මග්ගො අයං පටිපදා එතාසං දුක්ඛතානං පරිඤ්ඤායාති. භද්දකො ආවුසො මග්ගො භද්දිකා පටිපදා එතාසං දුක්ඛතානං පරිඤ්ඤාය. අලඤ්ච පනාවුසො සාරිපුත්ත අප්පමාදායාති.

## 4. 1. 15

### සක්කායසුත්තං.

330. සක්කායො සක්කායොති ආවුසො **සාරිපුත්ත** වුච්චති. කතමො නු ඛො ආවුසො සක්කායොති. පඤ්චිමෙ ආවුසො උපාදානක්ඛන්ධා සක්කායො වුත්තො භගවතා. සෙය්‍යථීදං: රූපූපාදානක්ඛන්ධො වෙදනූපාදානක්ඛන්ධො සඤ්ඤූපාදානක්ඛන්ධො සඞ්ඛාරූපාදානක්ඛන්ධො විඤ්ඤාණූපාදානක්ඛන්ධො, ඉමෙ ඛො ආවුසො පඤ්චුපාදානක්ඛන්ධා සක්කායො වුත්තො භගවතාති. අත්ථි පනාවුසො මග්ගො අත්ථි පටිපදා එතස්ස සක්කායස්ස පරිඤ්ඤායාති.

## 4. 1. 13

## භව සූත්‍රය

328. ඇවැත්නි **ශාරිපුත්‍රයෙනි,** භව භවැ යි කියනු ලැබේ. ඇවැත්නි, භව කවරේ දැ යි. ඇවැත්නි භව තුනෙකි. කාමභව ය, රූපභව ය, අරූපභව ය යි. ඇවැත්නි, මේ භව තුන යි. ඇවැත්නි, මේ භව පිරිසිඳ දැනීම පිණිස මගෙක් ඇත් ද, පිළිවෙතෙක් ඇත් ද යි. ඇවැත්නි, මේ භව පිරිසිඳ දැනීම පිණිස මගෙක් ඇත, පිළිවෙතෙක් ඇතැ යි. ඇවැත්නි, මේ භව පිරිසිඳ දැනීම පිණිස මග කවරේ ද, පිළිවෙත කවරේ දැ යි. ඇවැත්නි, මේ භව පිරිසිඳ දැනීම පිණිස මේ අරිඅටඟිමග ම ය. එනම්: **සම්මාදිට්ඨිය ... සම්මා සමාධිය** යි. ඇවැත්නි, මේ භව පිරිසිඳ දැනීම පිණිස මේ මගම යි. මේ පිළිවෙත යි. ඇවැත්නි, මේ භව පිරිසිඳ දැනීම පිණිස සොඳුරු මගෙකි. සොඳුරු පිළිවෙතෙකි. ඇවැත්නි ශාරිපුත්‍රයෙනි, නො පමා වීමට සුදුසු යි.

## 4. 1. 14

## දුක්ඛ සූත්‍රය

329. ඇවැත්නි **ශාරිපුත්‍රයෙනි,** දුක දුකැ යි කියනු ලැබේ. ඇවැත්නි, දුක කවරේ දැ යි. ඇවැත්නි, මේ දුක්බැව් තුනෙකි. දුක්ඛදුක්ඛව ය, සඞ්ඛාරදුක්ඛව ය, විපරිණාමදුක්ඛව ය යි. ඇවැත්නි, මේ දුක් බැව් තුන යි. ඇවැත්නි, මේ දුක් බැව් පිරිසිඳ දැනීම පිණිස මගෙක් ඇත් ද, පිළිවෙතෙක් ඇත්දැ යි. ඇවැත්නි, මේ දුක් බැව් පිරිසිඳ දැනීම පිණිස මගෙක් ඇත, පිළිවෙතෙක් ඇතැ යි. ඇවැත්නි, මේ දුක්බැව් පිරිසිඳ දැනීම පිණිස මග කවරේ ද, පිළිවෙත කවරේදැ යි. ඇවැත්නි, මේ දුක්බැව් පිරිසිඳ දැනීම පිණිස මේ අරිඅටඟිමග ම ය. එනම්: **සම්මාදිට්ඨිය ... සම්මාසමාධිය** යි. ඇවැත්නි, මේ දුක්බැව් පිරිසිඳ දැනීම පිණිස මේ මඟ යි, මේ පිළිවෙත යි. ඇවැත්නි, මේ දුක්බැව් පිරිසිඳ දැනීම පිණිස සොඳුරු මගෙකි. සොඳුරු පිළිවෙතෙකි. ඇවැත්නි ශාරිපුත්‍රයෙනි, නො පමා වීමට සුදුසු යි.

## 4. 1. 15

## සක්කාය සූත්‍රය

330. ඇවැත්නි **ශාරිපුත්‍රයෙනි,** සත්කාය සත්කාය යි කියනු ලැබේ. ඇවැත්නි, සත්කාය කවරේ දැ යි. ඇවැත්නි, මේ උපාදනස්කන්ධ පස සත්කාය යයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලදී. එනම්: රූපූපාදානක්ඛන්ධය, වේදනූපාදානක්ඛන්ධය, සඤ්ඤූපාදනක්ඛන්ධය, සඞ්ඛාරූපාදනක්ඛන්ධය, විඤ්ඤාණූපාදනක්ඛන්ධයයි, ඇවැත්නි, මේ උපාදානක්ඛන්ධ පස සත්කාය යයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද්දේ යි. ඇවැත්නි, මේ සත්කාය පිරිසිඳ දැනීම පිණිස මගෙක් ඇද්ද, පිළිවෙතක් ඇද්දැ යි.

අත්ථි ඛො ආවුසො මග්ගො අත්ථි පටිපදා එතස්ස සක්කායස්ස පරිඤ්ඤායාති. කතමො පනාවුසො මග්ගො කතමා පටිපදා එතස්ස සක්කායස්ස පරිඤ්ඤායාති. අයමෙව ඛො ආවුසො අරියො අට්ඨඞ්ගිකො මග්ගො එතස්ස සක්කායස්ස පරිඤ්ඤාය, සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. අයං ඛො ආවුසො මග්ගො අයං පටිපදා එතස්ස සක්කායස්ස පරිඤ්ඤායාති. භද්දකො ආවුසො මග්ගො භද්දිකා පටිපදා එතස්ස සක්කායස්ස පරිඤ්ඤාය. අලඤ්ච පනාවුසො සාරිපුත්ත අප්පමාදායාති.

## 4. 1. 16

### දුක්කරසුත්තං

331. කින්නු ඛො ආවුසො සාරිපුත්ත ඉමස්මිං ධම්මවිනයෙ දුක්කරන්ති. පබ්බජ්ජා ඛො ආවුසො ඉමස්මිං ධම්මවිනයෙ දුක්කරාති. පබ්බජිතෙන පනාවුසො කිං දුක්කරන්ති. පබ්බජිතෙන ඛො ආවුසො අභිරති දුක්කරාති. අභිරතෙන පන ආවුසො කිං දුක්කරන්ති. අභිරතෙන ඛො ආවුසො ධම්මානුධම්මපටිපත්ති දුක්කරාති. කීව චිරං පනාවුසො ධම්මානුධම්මපටිපන්නො භික්ඛු අරහං අස්සාති. න චිරං ආවුසොති.

ජම්බුඛාදකසංයුත්තං සමත්තං.

තත්‍රුද්දානං :-

නිබ්බානං අරහත්තඤ්ච ධම්මවාදී කිමත්ථියං
අස්සාසො පරමස්සාසො වෙදනා ආසවො තථා,
අවිජ්ජා තණ්හා ඔඝොච උපාදානං භවොපිච
දුක්ඛඤ්ච සක්කායො දුක්කරඤ්චාති සොළස.

ඇවැත්නි, මේ සත්කාය පිරිසිඳ දැනීම පිණිස මගෙක් ඇත. පිළිවෙතෙක් ඇතැ යි. ඇවැත්නි, මේ සත්කාය පිරිසිඳ දැනීම පිණිස මග කවරේද, පිළිවෙත කවරේ දැ යි. ඇවැත්නි, මේ සත්කාය පිරිසිඳ දැනීම පිණිස මේ අරිඅටඟි මග ම ය. එනම්: සම්මාදිට්ඨිය ... සම්මාසමාධිය යි. ඇවැත්නි, මේ සත්කාය පිරිසිඳ දැනීම පිණිස මේ මඟ යි. මේ පිළිවෙත යි. ඇවැත්නි, මේ සත්කාය පිරිසිඳ දැනීම පිණිස සොඳුරු මගෙකි. සොඳුරු පිළිවෙතෙකි. ඇවැත්නි ශාරිපුත්‍රයෙනි, නො පමා වීමට සුදුසු යි.

## 4. 1. 16

## දුක්කර සූත්‍රය

331. ඇවැත්නි **ශාරිපුත්‍රයෙනි,** මෙ සස්නෙහි කුමක් දුෂ්කර දැ යි. ඇවැත්නි, මෙ සස්නෙහි පැවිද්ද දුෂ්කර ය. ඇවැත්නි පැවිද්ද විසින් කුමක් දුෂ්කරදැ යි. ඇවැත්නි පැවිද්ද විසින් (පැවිද්දෙහි) ඇල්ම දුෂ්කරය. ඇවැත්නි (පැවිද්දෙහි) ඇලුනහු විසින් කුමක් දුෂ්කර දැ යි. ඇවැත්නි, (පැවිද්දෙහි) ඇලුනහු විසින් ධර්මානුධර්ම ප්‍රතිපත්තිය දුෂ්කර ය. ඇවැත්නි, ධර්මානුධර්මප්‍රතිපන්න මහණ කොපමණ කලකින් රහත් වන්නේ දැ යි. ඇවැත්නි නොබෝ කලකිනි යි.

**ජම්බුඛාදක සංයුත්තය නිමියේ යි.**

**එහි සූත්‍රනාමාවලිය:-**

නිබ්බාන, අරහත්ත, ධම්මවාදී, කිමත්ථිය, අස්සාස, පරමස්සාස, වේදනා, ආසව, එසේම අවිජ්ජා තණ්හා, ඔඝ, උපාදාන, භව, දුක්ඛ, සක්කාය, දුක්කර යයි සූත්‍ර සොළසෙකි.

# 5. සාමණ්ඩකානි සංයුත්තං

## 5. 1. 1

### නිබ්බානසුත්තං

332. එකං සමයං ආයස්මා සාරිපුත්තො වජ්ජීසු විහරති උක්කවෙලායං[1] ගඞ්ගාය නදියා තීරෙ. අථ ඛො සාමණ්ඩකානි[2] පරිබ්බාජකො යෙනායස්මා සාරිපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා සාරිපුත්තෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සාමණ්ඩකානි පරිබ්බාජකො ආයස්මන්තං සාරිපුත්තං එතදවොච: නිබ්බානං නිබ්බානන්ති ආවුසො සාරිපුත්ත වුච්චති. කතමන්නු ඛො ආවුසො නිබ්බානන්ති. යො ඛො ආවුසො රාගක්ඛයො දොසක්ඛයො මොහක්ඛයො, ඉදං වුච්චති නිබ්බානන්ති.

අත්ථි පනාවුසො මග්ගො අත්ථි පටිපද එතස්ස නිබ්බානස්ස සච්ඡිකිරියායාති. අත්ථි ඛො ආවුසො මග්ගො අත්ථි පටිපද එතස්ස නිබ්බානස්ස සච්ඡිකිරියායාති. කතමො පනාවුසො මග්ගො කතමා පටිපද එතස්ස නිබ්බානස්ස සච්ඡිකිරියායාති. අයමෙව ඛො ආවුසො අරියො අට්ඨඞ්ගිකො මග්ගො එතස්ස නිබ්බානස්ස සච්ඡිකිරියාය. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි, අයං ඛො ආවුසො මග්ගො අයං පටිපද එතස්ස නිබ්බානස්ස සච්ඡිකිරියායාති. භද්දකො ආවුසො මග්ගො භද්දිකා පටිපද එතස්ස නිබ්බානස්ස සච්ඡිකිරියාය. අලඤ්ච පනාවුසො සාරිපුත්ත අප්පමාදයාති. -පෙ-

(ජම්බුඛාදකවග්ගෙ විය විත්ථාරෙතබ්බං.)

## 5. 1. 16

### දුක්කරසුත්තං

347. කින්නු ඛො ආවුසො සාරිපුත්ත ඉමස්මිං ධම්මවිනයෙ දුක්කරන්ති? පබ්බජ්ජා ඛො ආවුසො ඉමස්මිං ධම්මවිනයෙ දුක්කරාති[3] පබ්බජිතෙන පනාවුසො කිං දුක්කරන්ති? පබ්බජිතෙන ඛො ආවුසො අභිරති දුක්කරාති. අභිරතෙන පන ආවුසො කිං දුක්කරන්ති? අභිරතෙන ඛො ආවුසො ධම්මානුධම්මපටිපත්ති දුක්කරාති. කීව චිරං පනාවුසො ධම්මානුධම්මපටිපන්නො භික්ඛු අරහං අස්සාති න චිරං ආවුසොති.

**සාමණ්ඩකානි සංයුත්තං සමත්තං.**

**පුරිමකසදිසමෙව උද්දානං:**

---

1. උක්කවෙලාය - සී 1,
2. සාමණ්ඩකො - ස්‍යා, මජසං.
3. දුක්කරන්ති - සබ්බත්ථ

# 5. සාමණ්ඩකානි සංයුත්තය

## 5. 1. 1

### නිබ්බාන සූත්‍රය

332. එක් කලෙක ආයුෂ්මත් **සැරියුත්** තෙරණුවෝ වැදෑ දනව්වෙහි ගඩ්ගා ගංඉවුරෙහි **උක්කචෙලා** නුවර සමීපයෙහි වැඩ-වසති. එකල්හි **සාමණ්ඩකානි** පිරිවැජිතෙමේ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් සමග සතුටු විය. සතුටු විය යුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පස් ව හුන්නේ ය. එකත්පස් ව හුන් සාමණ්ඩකානි පිරිවැජි තෙමේ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට මෙය කීය: ඇවැත්නි ශාරිපුත්‍රයෙනි, නිවන නිවන යි කියනු ලැබේ. ඇවැත්නි නිවන කවරේ දැ යි. ඇවැත්නි යම් රාගය ක්ෂය කිරීමෙක් ද්වේෂය ක්ෂය කිරීමෙක් මෝහය ක්ෂය කිරීමෙක් වේ නම් මෙය නිවනැ යි කියනු ලැබේ.

ඇවැත්නි, මේ නිවන පසක් කිරීමට මගෙක් ඇද්ද, පිළිවෙතෙක් ඇද්දැ යි. ඇවැත්නි, මේ නිවන පසක් කිරීමට මගෙක් ඇත. පිළිවෙතෙක් ඇතැ යි. ඇවැත්නි, මේ නිවන පසක් කිරීමට මග කවරේ ද, පිළිවෙත කවරේදැ යි. ඇවැත්නි මේ නිවන පසක් කිරීමට මේ අරිඅටඟිමග ම ය. එනම්: සම්මාදිට්ඨිය ... සම්මාසමාධි ය යි. ඇවැත්නි, මේ නිවන පසක් කිරීමට මේ මග යි. මේ පිළිවෙත යි. ඇවැත්නි, මේ නිවන පසක් කිරීමට සොඳුරු මගෙකි. සොඳුරු පිළිවෙතෙකි. ඇවැත්නි ශාරිපුත්‍රයෙනි, නොපමා වීමට සුදුසු යි. ...

**(ජම්බුඛාදක වර්ගයෙහි මෙන් විස්තර කටයුතු යි.)**

## 5. 1. 16

### දුක්කර සූත්‍රය

347. ඇවැත්නි **ශාරිපුත්‍රයෙනි,** මෙ සස්නෙහි කුමක් දුෂ්කර දැ යි. ඇවැත්නි මෙ සස්නෙහි පැවිද්ද දුෂ්කර ය. ඇවැත්නි පැවිද්ද විසින් කුමක් දුෂ්කර දැ යි. ඇවැත්නි පැවිද්ද විසින් (පැවිද්දෙහි) ඇල්ම දුෂ්කර ය. ඇවැත්නි (පැවිද්දෙහි) ඇලුනහු විසින් කුමක් දුෂ්කර දැ යි. ඇවැත්නි (පැවිද්දෙහි) ඇලුනහු විසින් ධර්මානුධර්මප්‍රතිපත්තිය දුෂ්කර ය. ඇවැත්නි ධර්මානුධර්මප්‍රතිපන්න මහණ කොපමණ කලකින් රහත් වන්නේදැ යි. ඇවැත්නි නොබෝ කලකිනි යි.

**සාමණ්ඩකානි සංයුත්තය නිමියේ යි.**

සූත්‍ර නාමාවලිය: පළමුවර්ගයෙහි මෙනි.

# 6. මොග්ගල්ලානසංයුත්තං

## 6. 1. 1

### සවිතක්කසුත්තං

348. එකං සමයං ආයස්මා **මහාමොග්ගල්ලානො සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තත්‍ර ඛො ආයස්මා මහාමොග්ගල්ලානො භික්ඛූ ආමන්තෙසි "ආවුසො භික්ඛවො"ති. "ආවුසොති"ති ඛො තෙ භික්ඛූ ආයස්මතො මහාමොග්ගල්ලානස්ස පච්චස්සොසුං. ආයස්මා මහාමොග්ගල්ලානො[1] එතදවොච: ඉධ මය්හං ආවුසො රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: පඨමං ඣානං පඨමං ඣානන්ති වුච්චති, කතමන්නු ඛො පඨමං ඣානන්ති. තස්ස මය්හං ආවුසො එතදහොසි: ඉධ භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. ඉදං වුච්චති පඨමං ඣානන්ති. සො ඛ්වාහං ආවුසො විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරාමි. තස්ස මය්හං ආවුසො ඉමිනා විහාරෙන විහරතො කාමසහගතා සඤ්ඤාමනසිකාරා සමුදචරන්ති.

අථ ඛො මං ආවුසො භගවා ඉද්ධියා උපසඞ්කමිත්වා එතදවොච: මොග්ගල්ලාන, මොග්ගල්ලාන, මා බ්‍රාහ්මණ, පඨමං ඣානං පමාදො, පඨමෙ ඣානෙ චිත්තං සණ්ඨපෙහි, පඨමෙ ඣානෙ චිත්තං එකොදිං[2] කරොහි, පඨමෙ ඣානෙ චිත්තං සමාදහාති. සො ඛ්වාහං ආවුසො අපරෙන සමයෙන විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහාසිං. යං හි තං ආවුසො සම්මාවදමානො වදෙය්‍ය: "සත්ථාරානුග්ගහිතො සාවකො මහාභිඤ්ඤතං පත්තො"ති, මමන්තං සම්මාවදමානො වදෙය්‍ය, "සත්ථාරානුග්ගහිතො සාවකො මහාභිඤ්ඤතං පත්තො"ති.

---

1. මහාමොග්ගල්ලානො තෙ භික්ඛූ - සයා.
2. එකොදිං - සී 1, 2. PTS.

# 6. මොග්ගල්ලාන සංයුත්තය

## 6. 1. 1

### සවිතක්ක සූත්‍රය

348. එක්කලෙක ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් අනේපිඩුසිටුහුගේ අරම්හි වැඩවෙසෙති. එහි දී ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ "ඇවැත්නි මහණෙනි" යි භික්ෂූන් ඇමතූහ. ඇවැත්නි, යි ඒ භික්ෂූහු ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන්ට පිළිවදන් ඇස්වූහ. ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ මෙය වදළහ: ඇවැත්නි මෙහි එකලා වූ විවේකයෙන් යුත් මට මෙබඳු චිත්තවිතර්කයෙක් පහළවිය: "පළමුවන දැහැන පළමුවන දැහැනැ" යි කියනු ලැබේ. පළමුවන දැහැන කවරේ දැ යි. ඇවැත්නි, ඒ මට මෙබඳු සිතෙක් විය: මෙහි මහණ තෙමේ කාමයන්ගෙන් වෙන්ව ම අකුශලධර්මයන්ගෙන් වෙන්ව ම විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති පළමුවන දැහැනට එළඹ වෙසේ නම් මේ පළමුවන දැහැනැ යි කියනු ලැබේ යි. ඇවැත්නි, ඒ මම කාමයන්ගෙන් වෙන්ව ම අකුශලධර්මයන්ගෙන් වෙන්ව ම විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සුවය ඇති පළමුවන දැහැනට එළඹ වෙසෙමි. ඇවැත්නි මේ විහරණයෙන් වෙසෙන ඒ මට කාමය සහගිය හැඟීම් හා මෙනෙහි කිරීම් පහළ වෙත්.

ඇවැත්නි, එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඍද්ධියෙන් මා වෙත එළඹ මෙය වදළ සේක: මුගලන, මුගලන, බමුණ, පළමුවන දැහැන නහමක් වරදව. පළමුවන දැහැනෙහි සිත තබව. පළමුවන දැහැනෙහි සිත එකඟ කරව. පළමුවන දැහැනෙහි සිත පිහිටුව යි. මහණෙනි, ඒ මම පසුකාලයෙහි කාමයන්ගෙන් වෙන්ව ම අකුශලධර්මයන්ගෙන් වෙන්ව ම විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති පළමුවන දැහැනට එළඹ පසුවෙමි. ඇවැත්නි, ශාස්තෲන් වහන්සේ විසින් අනුග්‍රහ කරන ලද ශ්‍රාවකයෙක් මහාභිඥ-බවට පැමිණියේ යයි මැනවින් කියන්නෙක් ඒ යමකු සඳහා කියන්නේ නම්, මැනවින් කියන්නෙක් ශාස්තෲන් වහන්සේ විසින් අනුග්‍රහ කරන ලද ශ්‍රාවකයෙක් මහාභිඥබවට පැමිණියේ ය යි ඒ මා සඳහා කියන්නේ යි.

## 6. 1. 2

## අවිතක්කසුත්තං

349. දුතියං ඣානං දුතියං ඣානන්ති වුච්චති. කතමං නු ඛො දුතියං ඣානන්ති. තස්ස මය්හං ආවුසො එතදහොසි: ඉධ භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති, ඉදං වුච්චති දුතියං ඣානන්ති. සො ඛ්වාහං ආවුසො විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරාමි. තස්ස මය්හං ආවුසො ඉමිනා විහාරෙන විහරතො විතක්කසහගතා සඤ්ඤාමනසිකාරා සමුදචරන්ති.

අථ ඛො මං ආවුසො භගවා ඉද්ධියා උපසංකමිත්වා එතදවොච: මොග්ගල්ලාන මොග්ගල්ලාන මා බ්‍රාහ්මණ දුතියං ඣානං පමාදෙ. දුතියෙ ඣානෙ චිත්තං සණ්ඨපෙහි. දුතියෙ ඣානෙ චිත්තං එකොදිං කරොහි. දුතියෙ ඣානෙ චිත්තං සමාදහාහි. සො ඛ්වාහං ආවුසො අපරෙන සමයෙන විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහාසිං. යං හි තං ආවුසො සම්මා වදමානො වදෙය්‍ය: සත්ථාරානුග්ගහිතො සාවකො මහාභිඤ්ඤතං පත්තොති, මමං තං සම්මාවදමානො වදෙය්‍ය සත්ථාරානුග්ගහිතො සාවකො මහාභිඤ්ඤතං පත්තොති.

## 6. 1. 3

## සුඛසුත්තං

350. තතියං ඣානං තතියං ඣානන්ති වුච්චති, කතමං නු ඛො තතියං ඣානන්ති. තස්ස මය්හං ආවුසො එතදහොසි: ඉධ භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකො විහරති, සතො ච සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති, යන්තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති තං තතියං ඣානං උපසම්පජ්ජ විහරති, ඉදං වුච්චති තතියං ඣානන්ති. සො ඛ්වාහං ආවුසො පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරාමි, සතො ච සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙමි, යන්තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති තං තතියං ඣානං උපසම්පජ්ජ විහරාමි. තස්ස මය්හං ආවුසො ඉමිනා විහාරෙන විහරතො පීතිසහගතා සඤ්ඤාමනසිකාරා සමුදචරන්ති.

## 6. 1. 2

## අවිතක්ක සූත්‍රය

349. දෙවන දැහැනය දෙවන දැහැනය යි කියනු ලැබේ. දෙවන දැහැන කවරේ දැ යි. ඇවැත්නි, ඒ මට මෙබඳු සිතෙක් විය: මෙහි මහණ තෙමේ විතර්කවිචාරයන් සංසිඳීමෙන් ඇතුළත පැහැදීම ඇති සිතේ එකඟබැව් ඇති විතර්ක රහිත විචාර රහිත සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සුවය ඇති දෙවන දැහැනට එළඹ වෙසේ නම් මෙය දෙවන දැහැනය යි කියනු ලැබේ යි. ඇවැත්නි ඒ මම විතර්ක විචාර සංසිඳීමෙන් ඇතුළත පැහැදීම ඇති සිතේ එකඟබැව් ඇති විතර්ක රහිත විචාර රහිත සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සුවය ඇති දෙවන දැහැනට එළඹ වෙසෙමි. ඇවැත්නි මේ විහරණයෙන් වෙසෙන ඒ මට විතර්කය සහගිය හැඟීම් හා මෙනෙහි කිරීම් පහළවෙත්.

ඇවැත්නි, එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඍද්ධියෙන් මා වෙත එළඹ මෙය වදළ සේක: මුගලන, මුගලන, බමුණ දෙවන දැහැන නහමක් වරදව. දෙවන දැහැනෙහි සිත තබව. දෙවන දැහැනෙහි සිත එකඟ කරව. දෙවන දැහැනෙහි සිත පිහිටුව යි. ඇවැත්නි, ඒ මම පසුකාලයෙහි විතර්ක විචාර සංසිඳීමෙන් ඇතුළත පැහැදීම ඇති, සිතේ එක්ඟබැව් ඇති, විතර්ක රහිත විචාර රහිත සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සුවය ඇති දෙවන දැහැනට එළඹ විසූවෙමි. ඇවැත්නි, මැනවින් කියන්නෙක් "ශාස්තෲන් වහන්සේ විසින් අනුග්‍රහ කරන ලද ශ්‍රාවකයෙක් මහාභිඥබවට පැමිණියේ ය" යි ඒ යමකු සඳහා කියන්නේ නම්, මැනවින් කියන්නෙක් ශාස්තෲන් වහන්සේ විසින් අනුග්‍රහ කරන ලද ශ්‍රාවකයෙක් මහාභිඥබවට පැමිණියේ යයි ඒ මා සඳහා කියන්නේ යි.

## 6. 1. 3

## සුඛ සූත්‍රය

350. තෙවන දැහැනය තෙවන දැහැනය යි කියනු ලැබේ. තෙවන දැහැන කවරේ දැ යි. ඇවැත්නි, ඒ මට මෙබඳු සිතෙක් විය: මෙහි මහණ තෙමේ ප්‍රීතියත් දුරුකිරීමෙන් උපේක්ෂා ඇත්තේ වෙසෙයි. සිහි ඇත්තේ මනාදැනුම් ඇත්තේ කයින් සුවත් විඳියි. උපේක්ෂා ඇත්තේ ය, සිහි ඇත්තේ ය, සුඛවිහරණ ඇත්තේ ය යි ඒ යමකු සඳහා ආර්‍ය්‍යයෝ කියත් නම්, ඒ තෙවන දැහැනට එළඹ වෙසේ ද, මේ තෙවන දැහැනය යි කියනු ලැබේ යි. ඇවැත්නි ඒ මම ප්‍රීතියත් දුරුකිරීමෙන් උපේක්ෂා ඇත්තේ වෙසෙමි. සිහි ඇත්තේ මනාදැනුම් ඇත්තේ කයින් සුවත් විඳිමි. උපේක්ෂා ඇත්තේ ය, සිහි ඇත්තේ ය, සුවවිහරණ ඇත්තේ ය යි ආර්‍ය්‍යයෝ ඒ යමකු සඳහා කියත් නම් ඒ තෙවන දැහැනට එළඹ වෙසෙමි. ඇවැත්නි මේ විහරණයෙන් වෙසෙන ඒ මට ප්‍රීතිය සහගිය හැඟීම් හා මෙනෙහිකිරීම් පහළවෙත්.

අථ ඛො මං ආවුසො භගවා ඉද්ධියා උපසංකමිත්වා එතදවොච: මොග්ගල්ලාන, මොග්ගල්ලාන, මා බ්‍රාහ්මණ, තතියං ඣානං පමාදෙ, තතියෙ ඣානෙ චිත්තං සණ්ඨපෙහි, තතියෙ ඣානෙ චිත්තං එකොදිං කරොහි තතියෙ ඣානෙ චිත්තං සමාදහාති. සො ඛ්වාහං ආවුසො අපරෙන සමයෙන පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහාසිං[1] සතො ච සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙසිං[2]. යන්තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති තං තතියං ඣානං උපසම්පජ්ජ විහාසිං. යං හි තං ආවුසො සම්මාවදමානො වදෙය්‍ය සත්ථාරානුග්ගහිතො සාවකො මහාභිඤ්ඤතං පත්තොති, මමං තං සම්මාවදමානො වදෙය්‍ය සත්ථාරානුග්ගහිතො සාවකො මහාභිඤ්ඤතං පත්තොති.

## 6. 1. 4

## උපෙක්ඛාසුත්තං

351. චතුත්ථං ඣානං චතුත්ථං ඣානන්ති වුච්චති. කතමං නු ඛො චතුත්ථං ඣානන්ති. තස්ස මය්හං ආවුසො එතදහොසි: ඉධ භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්ස දෙමනස්සානං අත්ථගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති, ඉදං වුච්චති චතුත්ථං ඣානන්ති. සො ඛ්වාහං ආවුසො සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදෙමනස්සානං අත්ථගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරාමි. තස්ස මය්හං ආවුසො ඉමිනා විහාරෙන විහරතො උපෙක්ඛාසහගතා සඤ්ඤාමනසිකාරා සමුදචරන්ති.

අථ ඛො මං ආවුසො භගවා ඉද්ධියා උපසඞ්කමිත්වා එතදවොච: මොග්ගල්ලාන, මොග්ගල්ලාන, මා බ්‍රාහ්මණ, චතුත්ථං ඣානං පමාදෙ, චතුත්ථෙ ඣානෙ චිත්තං සණ්ඨපෙහි, චතුත්ථෙ ඣානෙ චිත්තං එකොදිං[3] කරොහි, චතුත්ථෙ ඣානෙ චිත්තං සමාදහාති. සො ඛ්වාහං ආවුසො අපරෙන සමයෙන සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදෙමනස්සානං අත්ථගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහාසිං. යං හි තං ආවුසො සම්මාවදමානො වදෙය්‍ය සත්ථාරානුග්ගහිතො සාවකො මහාභිඤ්ඤතං පත්තොති, මමං තං සම්මාවදමානො වදෙය්‍ය සත්ථාරානුග්ගහිතො සාවකො මහාභිඤ්ඤතං පත්තොති.

1. විහරාමි - සයා.
2. වෙදෙමි - සයා, මජසං
3. එකොදි - ලි

ඇවැත්නි, එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඍද්ධියෙන් මා වෙත එළඹ මෙය වදළ සේක: මුගලන, මුගලන, බමුණ, තෙවන දැහැන නහමක් වරදව. තෙවන දැහැනෙහි සිත තබව. තෙවන දැහැනෙහි සිත එකඟකරව. තෙවන දැහැනෙහි සිත පිහිටු ව යි. ඇවැත්නි, ඒ මම පසුකාලයෙහි ප්‍රීතියත් දුරලීමෙන් උපේක්ෂා ඇත්තේත් විසුවෙමි. සිහි ඇත්තේ මනා දැනුම් ඇත්තේ කයින් සුවත් වින්දෙමි. උපේක්ෂා ඇත්තේ ය, සිහි ඇත්තේ ය, සුවවිහරණ ඇත්තේ ය යි ආර්‍ය්‍යයෝ ඒ යමකු සඳහා කියත් නම් ඒ තෙවන දැහැනට එළඹ විසුවෙමි. ඇවැත්නි, මැනවින් කියන්නෙක් ''ශාස්තෘන් වහන්සේ විසින් අනුග්‍රහ කරන ලද ශ්‍රාවකයෙක් මහාභිඥබවට පැමිණියේ ය'' යි ඒ යමකු සඳහා කියන්නේ නම්, මැනවින් කියන්නෙක් ශාස්තෘන් වහන්සේ විසින් අනුග්‍රහ කරන ලද ශ්‍රාවකයෙක් මහාභිඥබවට පැමිණියේ ය යි ඒ මා සඳහා කියන්නේ යි.

## 6. 1. 4

## උපෙඛා සූත්‍රය

351. සිවුවන දැහැනය සිවුවන දැහැනය යි කියනු ලැබේ. සිවුවන දැහැන කවරේ ද යි. ඇවැත්නි, ඒ මට මෙබඳු සිතෙක් විය: මෙහි මහණ තෙමේ සුවත් දුරුකිරීමෙන් දුකත් දුරුකිරීමෙන් පළමු මැ සොම්නස් දොම්නසුන්ගේ අභාවයෙන් දුක් නැති සුව නැති උපේක්ෂා-වෙන් හා සිහියෙන් හටගත් පිරිසුදු බැව් ඇති සිවුවන දැහැනට එළඹ වෙසේ නම් මෙය සිවුවන දැහැන ය යි කියනු ලැබේ යි. ඇවැත්නි, ඒ මම සුවත් දුරුකිරීමෙන් දුකත් දුරුකිරීමෙන් පළමු ම සොම්නස් දොම්නසුන්ගේ අභාවයෙන් දුක් නැති සුව නැති උපේක්ෂාවෙන් හා සිහියෙන් හටගත් පිරිසුදු බැව් ඇති සිවුවන දැහැනට එළඹ වෙසෙමි. ඇවැත්නි, මේ විහරණයෙන් වෙසෙන ඒ මට උපේක්ෂාව සහගිය හැඟීම් හා මෙනෙහිකිරීම් පහළවෙත්.

ඇවැත්නි එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඍද්ධියෙන් මා වෙත එළඹ මෙය වදළසේක: මුගලන, මුගලන, බමුණ, සිවුවන දැහැන නහමක් වරදව. සිවුවන දැහැනෙහි සිත මැනවින් තබව. සිවුවන දැහැනෙහි සිත එකඟ කරව. සිවුවන දැහැනෙහි සිත පිහිටුව යි. ඇවැත්නි, ඒ මම පසුකාලයෙහි සුවත් දුරුකිරීමෙන් දුකත් දුරුකිරීමෙන් පළමු ම සොම්නස් දොම්නසුන්ගේ අභාවයෙන් දුක් නැති සුව නැති උපේක්ෂාවෙන් හා සිහියෙන් හටගත් පිරිසුදු බැව් ඇති සිවුවන දැහැනට එළඹ විසුවෙමි. ඇවැත්නි, මැනවින් කියන්නෙක් ''ශාස්තෘන් වහන්සේ විසින් අනුග්‍රහ කරන ලද ශ්‍රාවකයෙක් මහාභිඥබවට පැමිණියේ ය'' යි ඒ යමකු සඳහා කියන්නේ නම්, මැනවින් කියන්නෙක් ශාස්තෘන් වහන්සේ විසින් අනුග්‍රහ කරන ලද ශ්‍රාවකයෙක් මහාභිඥබවට පැමිණියේ ය යි ඒ මා සඳහා කියන්නේ යි.

## 6. 1. 5

### ආකාසානඤ්චායතනසුත්තං

352. ආකාසානඤ්චායතනං ආකාසානඤ්චායතනන්ති වුච්චති. කතමං නු ඛො ආකාසානඤ්චායතනන්ති. තස්ස මය්හං ආවුසො එතදහොසි. ඉධ භික්ඛු සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති, ඉදං වුච්චති ආකාසානඤ්චායතනන්ති. සො ඛ්වාහං ආවුසො සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරාමි. තස්ස මය්හං ආවුසො ඉමිනා විහාරෙන විහරතො රූපසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති.

අථ ඛො මං ආවුසො භගවා ඉද්ධියා උපසංකමිත්වා එතදවොච: මොග්ගල්ලාන, මොග්ගල්ලාන, මා බ්‍රාහ්මණ, ආකාසානඤ්චායතනං පමාදො, ආකාසානඤ්චායතනෙ චිත්තං සණ්ඨපෙහි, ආකාසානඤ්චායතනෙ චිත්තං එකොදිං කරොහි, ආකාසානඤ්චායතනෙ චිත්තං සමාදහා ති. සො ඛ්වාහං ආවුසො අපරෙන සමයෙන සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහාසිං. යං හි තං ආවුසො සම්මාවදමානො වදෙය්‍ය -පෙ- මහාභිඤ්ඤතං පත්තොති.

## 6. 1. 6

### විඤ්ඤාණඤ්චායතනසුත්තං

353. විඤ්ඤාණඤ්චායතනං විඤ්ඤාණඤ්චායතනන්ති වුච්චති. කතමං නු ඛො විඤ්ඤාණඤ්චායතනන්ති. තස්ස මය්හං ආවුසො එතදහොසි: ඉධ භික්ඛු සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති, ඉදං වුච්චති විඤ්ඤාණඤ්චායතනන්ති. සො ඛ්වාහං ආවුසො සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරාමි. තස්ස මය්හං ආවුසො ඉමිනා විහාරෙන විහරතො ආකාසානඤ්චායතනසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති.

අථ ඛො මං ආවුසො භගවා ඉද්ධියා උපසංකමිත්වා එතදවොච: මොග්ගල්ලාන, මොග්ගල්ලාන, මා බ්‍රාහ්මණ විඤ්ඤාණඤ්චායතනං පමාදො, විඤ්ඤාණඤ්චායතනෙ චිත්තං සණ්ඨපෙහි, විඤ්ඤාණඤ්චායතනෙ චිත්තං එකොදිං කරොහි, විඤ්ඤාණඤ්චායතනෙ චිත්තං සමාදහාති. සො ඛ්වාහං ආවුසො අපරෙන සමයෙන සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහාසිං. යං හි තං ආවුසො සම්මාවදමානො වදෙය්‍ය -පෙ- මහාභිඤ්ඤතං පත්තොති.

## 6. 1. 5

## ආකාසානඤ්චායතන සූත්‍රය

352. ආකාසානඤ්චායතනය ආකාසානඤ්චායතනය යි කියනු ලැබේ. ආකාසානඤ්චායතනය කවරේ ද යි. ඇවැත්නි, ඒ මට මෙබඳු සිතෙක් විය: මෙහි මහණ තෙමේ සර්වප්‍රකාරයෙන් රූපසංඥාවන් ඉක්මවීමෙන් ප්‍රතිඝසංඥාවන් දුරු කිරීමෙන් නානාත්වසංඥාවන් නො මෙනෙහි කිරීමෙන් ආකාශය අනන්ත ය යි ආකාසානඤ්චායතනයට එළඹ වෙසේ නම් මෙය ආකාසානඤ්චායතනය යි කියනු ලැබේ. ඇවැත්නි, ඒ මම සර්වප්‍රකාරයෙන් රූපසංඥාවන් ඉක්මවීමෙන් ප්‍රතිඝසංඥාවන් දුරු කිරීමෙන් නානාත්වසංඥාවන් නො මෙනෙහි කිරීමෙන් ආකාශය අනන්ත ය යි ආකාසානඤ්චායතනයට පැමිණ වෙසෙමි. ඇවැත්නි, මේ විහරණයෙන් වෙසෙන ඒ මට රූ සහගිය හැඟීම් හා මෙනෙහි කිරීම් පහළ වෙත්.

ඇවැත්නි, එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඍද්ධියෙන් මා වෙත එළඹ මෙය වදාළ සේක: මුගලන, මුගලන, බමුණ, ආකාසානඤ්චායතනය නො වරදව, ආකාසානඤ්චායතනයෙහි සිත මැනවින් තබව, ආකාසානඤ්චායතනයෙහි සිත එකඟ කරව, ආකාසානඤ්චායතනයෙහි සිත පිහිටුව යි. ඇවැත්නි ඒ මම පසු කාලයෙහි සර්වප්‍රකාරයෙන් රූප සංඥාවන් ඉක්මවීමෙන් ප්‍රතිඝසංඥාවන් දුරු කිරීමෙන් නානාත්වසංඥාවන් නො මෙනෙහි කිරීමෙන් ආකාසය අනන්තය යි ආකාසානඤ්චායතනයට පැමිණ විසුවෙමි. ඇවැත්නි මැනවින් කියන්නෙක් ඒ යමකු සඳහා ... මහාභිඥබවට පැමිණියේ ය යි කියන්නේ යි.

## 6. 1. 6

## විඤ්ඤාණඤ්චායතන සූත්‍රය

353. විඤ්ඤාණඤ්චායතනය විඤ්ඤාණඤ්චායතනය යි කියනු ලැබේ. විඤ්ඤාණඤ්චායතනය කවරේද යි. ඇවැත්නි, ඒ මට මෙබඳු සිතෙක් විය: මෙහි මහණ තෙමේ සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණය අනන්ත ය යි විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වෙසේ නම් මෙය විඤ්ඤාණඤ්චායතනය යි කියනු ලැබේ යි. ඇවැත්නි ඒ මම සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණය අනන්ත ය යි විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වෙසෙමි. ඇවැත්නි මේ විහරණයෙන් වෙසෙන ඒ මට ආකාසානඤ්චායතනය සහගිය හැඟීම් හා මෙනෙහි කිරීම් පහළ වෙත්.

ඇවැත්නි, එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඍද්ධියෙන් මා වෙත එළඹ මෙය වදාළ සේක: මුගලන, මුගලන, බමුණ, විඤ්ඤාණඤ්චායතනය නො වරදව, විඤ්ඤාණඤ්චායතනයෙහි සිත මැනවින් තබව, විඤ්ඤාණඤ්චායතනයෙහි සිත එකඟ කරව, විඤ්ඤාණඤ්චායතනයෙහි සිත පිහිටුව යි. ඇවැත්නි ඒ මම පසු කාලයෙහි සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණය අනන්ත ය යි විඤ්ඤාණඤ්චායතනයට පැමිණ විසුවෙමි. ඇවැත්නි මැනවින් කියන්නෙක් ඒ යමකු සඳහා ... මහාභිඥබවට පැමිණියේ ය යි කියන්නේ යි.

## 6. 1. 7

## ආකිඤ්චඤ්ඤායතනසුත්තං

354. ආකිඤ්චඤ්ඤායතනං ආකිඤ්චඤ්ඤායතනන්ති වුච්චති. කතමං නු ඛො ආකිඤ්චඤ්ඤායතනන්ති. තස්ස මය්හං ආවුසො එතදහොසි: ඉධ භික්ඛු සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති, ඉදං වුච්චති ආකිඤ්චඤ්ඤායතනන්ති සො ඛ්වාහං ආවුසො සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරාමි. තස්ස මය්හං ආවුසො ඉමිනා විහාරෙන විහරතො විඤ්ඤාණඤ්චායතනසහගතා සඤ්ඤාමනසිකාරා සමුදචරන්ති.

අථ ඛො මං ආවුසො භගවා ඉද්ධියා උපසඞ්කමිත්වා එතදවොච: මොග්ගල්ලාන, මොග්ගල්ලාන, මා බ්‍රාහ්මණ, ආකිඤ්චඤ්ඤායතනෙ පමාදො, ආකිඤ්චඤ්ඤායතනෙ චිත්තං සණ්ඨපෙහි, ආකිඤ්චඤ්ඤායතනෙ චිත්තං එකොදිං කරොහි, ආකිඤ්චඤ්ඤායතනෙ චිත්තං සමාදහාති. සො ඛ්වාහං ආවුසො අපරෙන සමයෙන සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහාසිං. යං හි තං ආවුසො සම්මාවදමානො වදෙය්‍ය -පෙ- මහාභිඤ්ඤතං පත්තොති.

## 6. 1. 8

## නෙවසඤ්ඤානාසඤ්ඤායතනසුත්තං

355. නෙවසඤ්ඤානාසඤ්ඤායතනං නෙවසඤ්ඤානාසඤ්ඤායතනන්ති වුච්චති. කතමං නු ඛො නෙවසඤ්ඤානාසඤ්ඤායතනන්ති. තස්ස මය්හං ආවුසො එතදහොසි: ඉධ භික්ඛු සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති, ඉදං වුච්චති නෙවසඤ්ඤානාසඤ්ඤායතනන්ති. සො ඛ්වාහං ආවුසො සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරාමි. තස්ස මය්හං ආවුසො ඉමිනා විහාරෙන විහරතො ආකිඤ්චඤ්ඤායතනසහගතා සඤ්ඤාමනසිකාරා සමුදචරන්ති.

අථ ඛො මං ආවුසො භගවා ඉද්ධියා උපසඞ්කමිත්වා එතදවොච: මොග්ගල්ලාන, මොග්ගල්ලාන, මා බ්‍රාහ්මණ, නෙවසඤ්ඤානාසඤ්ඤායතනං පමාදො, නෙවසඤ්ඤානාසඤ්ඤායතනෙ චිත්තං සණ්ඨපෙහි, නෙවසඤ්ඤානාසඤ්ඤායතනෙ චිත්තං එකොදිං කරොහි, නෙවසඤ්ඤානාසඤ්ඤායතනෙ චිත්තං සමාදහාති. සො ඛ්වාහං ආවුසො අපරෙන සමයෙන සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහාසිං. යං හි තං ආවුසො සම්මාවදමානො වදෙය්‍ය -පෙ- මහාභිඤ්ඤතං පත්තොති.

## 6. 1. 7

### ආකිඤ්චඤ්ඤායතන සූත්‍රය

354. ආකිඤ්චඤ්ඤායතනය ආකිඤ්චඤ්ඤායතනය යි කියනු ලැබේ. ආකිඤ්චඤ්ඤායතනය කවරේ ද යි. ඇවැත්නි, ඒ මට මෙබඳු සිතෙක් විය: මෙහි මහණ තෙමේ සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැ යි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වෙසේ නම් මෙය ආකිඤ්චඤ්ඤායතනය යි කියනු ලැබේ යි. ඇවැත්නි ඒ මම සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැ යි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වෙසෙමි. ඇවැත්නි මේ විහරණයෙන් වෙසෙන ඒ මට විඤ්ඤාණඤ්චායතනය සහගිය හැඟීම් හා මෙනෙහි කිරීම් පහළ වෙත්.

ඇවැත්නි, එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඍද්ධියෙන් මා වෙත එළඹ මෙය වදළ සේක: මුගලන, මුගලන, බමුණ, ආකිඤ්චඤ්ඤායතනය නහමක් වරදව. ආකිඤ්චඤ්ඤායතනයෙහි සිත මැනවින් තබව, ආකිඤ්චඤ්ඤායතනයෙහි සිත එකඟ කරව. ආකිඤ්චඤ්ඤායතනයෙහි සිත පිහිටුව යි. ඇවැත්නි, ඒ මම පසුකාලයෙහි සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැ යි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ විසුවෙමි. ඇවැත්නි මැනවින් කියන්නෙක් ඒ යමකු සඳහා ... මහාභිඥබවට පැමිණියේ යයි කියන්නේ යි.

## 6. 1. 8

### නෙවසඤ්ඤානාසඤ්ඤායතන සූත්‍රය

355. නෙවසඤ්ඤානාසඤ්ඤායතනය නෙවසඤ්ඤානාසඤ්ඤායතනය යි කියනු ලැබේ. නෙවසඤ්ඤානාසඤ්ඤායතනය කවරේ ද යි. ඇවැත්නි, ඒ මට මෙබඳු සිතෙක් විය: මෙහි මහණ තෙමේ සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වෙසේ නම් මෙය නෙවසඤ්ඤානාසඤ්ඤායතන ය යි කියනු ලැබේ යි. ඇවැත්නි, ඒ මම සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වෙසෙමි. ඇවැත්නි, මේ විහරණයෙන් වෙසෙන ඒ මට ආකිඤ්චඤ්ඤායතනය සහගිය හැඟීම් හා මෙනෙහි කිරීම් පහළවෙත්.

ඇවැත්නි, එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඍද්ධියෙන් මා වෙත එළඹ මෙය වදළ සේක. මුගලන, මුගලන, බමුණ, නෙවසඤ්ඤානාසඤ්ඤායතනය නහමක් වරදව. නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි සිත මැනැවින් තබව. නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි සිත එකඟ කරව. නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි සිත පිහිටුව යි. ඇවැත්නි; ඒ මම පසුකාලයෙහි සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ විසුවෙමි. ඇවැත්නි, මැනවින් කියන්නෙක් ඒ යමකු සඳහා ... මහාභිඥබවට පැමිණියේ ය යි කියන්නේ යි.

## 6. 1. 9

### අනිමිත්තසුත්තං

356. අනිමිත්තො චෙතොසමාධි අනිමිත්තො චෙතොසමාධීති වුච්චති. කතමො නු ඛො අනිමිත්තො චෙතොසමාධීති. තස්ස මය්හං ආවුසො එතදහොසි: 'ඉධ භික්ඛු සබ්බනිමිත්තානං අමනසිකාරා අනිමිත්තං චෙතොසමාධිං උපසම්පජ්ජ විහරති. අයං වුච්චති අනිමිත්තො චෙතොසමාධී'ති. සො ඛ්වාහං ආවුසො සබ්බනිමිත්තානං අමනසිකාරා අනිමිත්තං චෙතොසමාධිං උපසම්පජ්ජ විහරාමි. තස්ස මය්හං ආවුසො ඉමිනා විහාරෙන විහරතො නිමිත්තානුසාරි[1] විඤ්ඤාණං හොති.

අථ ඛො මං ආවුසො භගවා ඉද්ධියා උපසඞ්කමිත්වා එතදවොච: මොග්ගල්ලාන, මොග්ගල්ලාන, මා බ්‍රාහ්මණ, අනිමිත්තං චෙතොසමාධිං පමාදො, අනිමිත්තෙ චෙතොසමාධිස්මිං චිත්තං සණ්ඨපෙහි, අනිමිත්තෙ චෙතොසමාධිස්මිං චිත්තං එකොදිං කරොහි, අනිමිත්තෙ චෙතොසමාධිස්මිං චිත්තං සමාදහාති. සො ඛ්වාහං ආවුසො අපරෙන සමයෙන සබ්බනිමිත්තානං අමනසිකාරා අනිමිත්තං චෙතොසමාධිං උපසම්පජ්ජ විහාසිං. යං හි තං ආවුසො සම්මා වදමානො වදෙය්‍ය සත්ථාරානුග්ගහිතො සාවකො මහාභිඤ්ඤතං පත්තොති, මමං තං සම්මා වදමානො වදෙය්‍ය සත්ථාරානුග්ගහිතො සාවකො මහාභිඤ්ඤතං පත්තොති.

## 6. 1. 10

### සක්කසුත්තං

357. එකං සමයං ආයස්මා මහාමොග්ගල්ලානො සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො ආයස්මා මහාමොග්ගල්ලානො සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙව ජෙතවනෙ අන්තරහිතො දෙවෙසු තාවතිංසෙසු පාතුරහොසි. අථ ඛො සක්කො දෙවානමින්දො පඤ්චහි දෙවතාසතෙහි සද්ධිං යෙනායස්මා මහාමොග්ගල්ලානො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාමොග්ගල්ලානං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතං ඛො සක්කං දෙවානමින්දං ආයස්මා මහාමොග්ගල්ලානො එතදවොච:

සාධු ඛො දෙවානමින්ද බුද්ධං සරණගමනං හොති, බුද්ධං සරණගමනහෙතු ඛො දෙවානමින්ද එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. සාධු ඛො දෙවානමින්ද ධම්මං සරණගමනං හොති, ධම්මං සරණගමනහෙතු ඛො දෙවානමින්ද එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. සාධු ඛො දෙවානමින්ද සඞ්ඝං සරණගමනං හොති, සඞ්ඝං සරණගමනහෙතු ඛො දෙවානමින්ද එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්තීති.

1. අනිමිත්තානුසාරි - සීමු, සී, 1, 2, ස්‍යා.

## 6. 1. 9

## අනිමිත්ත සූත්‍රය

356. අනිමිත්තචෙතොසමාධිය අනිමිත්තචෙතොසමාධිය යි කියනු ලැබේ. අනිමිත්තචෙතොසමාධිය කවරේ ද යි. ඇවැත්නි ඒ මට මෙබඳු සිතෙක් විය. මෙහි මහණ තෙමේ සියලු නිමිති නො මෙනෙහි කිරීමෙන් අනිමිත්තචෙතොසමාධියට එළඹ වෙසේ නම් මෙය අනිමිත්තචෙතො-සමාධිය යි කියනු ලැබේ යි. ඇවැත්නි ඒ මම සියලු නිමිති නො මෙනෙහි කිරීමෙන් අනිමිත්තචෙතොසමාධියට එළඹ වෙසෙමි. ඇවැත්නි මේ විහරණයෙන් වෙසෙන ඒ මාගේ විඤ්ඤාණය නිමිති අනුව හැසිරෙනසුලු වෙයි.

ඇවැත්නි එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඍද්ධියෙන් මා වෙත එළඹ මෙය වදාළ සේක: මුගලන, මුගලන, බමුණ, අනිමිත්ත චෙතො සමාධිය නහමක් වරදව; අනිමිත්තචෙතොසමාධියෙහි සිත මැනවින් තබව. අනිමිත්තචෙතොසමාධියෙහි සිත එකඟ කරව. අනිමිත්තචෙතො-සමාධියෙහි සිත පිහිටුව යි. ඇවැත්නි ඒ මම පසුකාලයෙහි සියලු නිමිති නො මෙනෙහි කිරීමෙන් අනිමිත්තචෙතොසමාධියට එළඹ විසුවෙමි. ඇවැත්නි මැනවින් කියන්නෙක් ශාස්තෘන් වහන්සේ විසින් අනුග්‍රහ කරන ලද ශ්‍රාවකයෙක් මහාභිඥබවට පැමිණියේ ය යි ඒ යමකු සඳහා කියන්නේ නම් මැනවින් කියන්නෙක් ශාස්තෘන් වහන්සේ විසින් අනුග්‍රහ කරන ලද ශ්‍රාවකයෙක් මහාභිඥබවට පැමිණියේ ය යි ඒ මා සඳහා කියන්නේ යි.

## 6. 1. 10

## සක්ක සූත්‍රය

357. එක්කලෙක ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ සැවත සමීපයෙහි ජේතවන නම් අනේපිඩුසිටුහුගේ අරමෙහි වැඩවෙසෙති. එකල්හි ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ යම්සේ බලවත් පුරුෂයෙක් හැකුළු අත දිගුකරන්නේ හෝ දිගු කළ අත හකුළුවන්නේ හෝ වේ ද එසෙයින් ම දෙව්රමෙහි අතුරුදන් වූවාහු තව්තිසාදෙවියන් අතර පහළ වූහ. එකල්හි සක්දෙව්රජ පන්සියයක් දෙවියන් සමග ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන් වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන් වැඳ එකත්පස් ව සිටියේ ය. එකත්පස් ව සිටි සක්දෙව් රජුට ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ මෙය වදාළහ.

දේවානමින්ද, බුදුන් සරණ යැම මැනවි. දේවානමින්ද මෙසේ බුදුන් සරණ යැම හේතු කොට මෙහි ඇතැම් සත්ත්වකෙනෙක් කාබුන් මරණින් මතු සෝභන ගති ඇති සුගති සගලොවට පැමිණෙත්. දෙවානමින්ද දහම් සරණ යැම මැනවි. දේවානමින්ද මෙසේ දහම් සරණ යැම හේතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙත්. දෙවානමින්ද, සඟුන් සරණ යැම මැනවි. දේවානමින්ද මෙසේ සඟුන් සරණ යැම හේතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙති යි.

සාධු ඛො මාරිස මොග්ගල්ලාන බුද්ධං සරණගමනං හොති, බුද්ධං සරණගමන හෙතු ඛො මාරිස මොග්ගල්ලාන එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. සාධු ඛො මාරිස මොග්ගල්ලාන ධම්මං සරණගමනං හොති, ධම්මං සරණගමනහෙතු ඛො මාරිස මොග්ගල්ලාන එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති, සාධු ඛො මාරිස මොග්ගල්ලාන සඞ්ඝං සරණගමනං හොති, සඞ්ඝං සරණගමනහෙතු ඛො මොග්ගල්ලාන එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්තීති.

## 6. 1. 11

## දුතියසක්කසුත්තං

358. අථ ඛො සක්කො දෙවානමින්දො ඡහි දෙවතාසතෙහි සද්ධිං -පෙ- අථ ඛො සක්කො දෙවානමින්දො සත්තහි දෙවතාසතෙහි සද්ධිං -පෙ- අථ ඛො සක්කො දෙවානමින්දො අට්ඨහි දෙවතාසතෙහි සද්ධිං -පෙ- අථ ඛො සක්කො දෙවානමින්දො අසීතියා දෙවතාසහස්සෙහි සද්ධිං යෙනායස්මා මහාමොග්ගල්ලානො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාමොග්ගල්ලානං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතං ඛො සක්කං දෙවානමින්දං ආයස්මා මහාමොග්ගල්ලානො එතදවොච: සාධු ඛො දෙවානමින්ද බුද්ධං සරණගමනං හොති, බුද්ධං සරණගමනහෙතු ඛො දෙවානමින්ද එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති, සාධු ඛො දෙවානමින්ද ධම්මං සරණගමනං හොති -පෙ- සාධු ඛො දෙවානමින්ද සඞ්ඝං සරණගමනං හොති, සඞ්ඝං සරණගමනහෙතු ඛො දෙවානමින්ද එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්තීති.

සාධු ඛො මාරිස මොග්ගල්ලාන බුද්ධං සරණගමනං හොති, බුද්ධං සරණගමනහෙතු ඛො මාරිස මොග්ගල්ලාන එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. සාධු ඛො මාරිස මොග්ගල්ලාන ධම්මං සරණගමනං හොති -පෙ- සාධු ඛො මාරිස මොග්ගල්ලාන සඞ්ඝං සරණගමනං හොති. සඞ්ඝං සරණගමනහෙතු ඛො මාරිස මොග්ගල්ලාන එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්තීති.

## 6. 1. 12

## තතියසක්කසුත්තං

359. අථ ඛො සක්කො දෙවානමින්දො පඤ්චහි දෙවතාසතෙහි සද්ධිං යෙනායස්මා මහාමොග්ගල්ලානො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාමොග්ගල්ලානං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතං ඛො සක්කං දෙවානමින්දං ආයස්මා මහාමොග්ගල්ලානො එතදවොච: සාධු ඛො දෙවානමින්ද බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනං හොති 'ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා'ති. බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනහෙතු ඛො දෙවානමින්ද එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්තීති.

නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, බුදුන් සරණ යෑම මැනවි. නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, බුදුන් සරණ යෑම හේතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙත්. නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, දහම් සරණ යෑම මැනවි. නිදුකාණෙනි, මොග්ගල්ලානයෙනි, මෙසේ දහම් සරණ යෑම හේතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙත්. නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, සඟුන් සරණ යෑම මැනවි. නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, මෙසේ සඟුන් සරණ යෑම හේතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙති යි.

## 6. 1. 11

## ද්‍රතිය සකක සූත්‍රය

358. ඉක්බිති සක්දෙව්රජ සසියයක් දෙවියන් සමග ... ඉක්බිති සක්දෙව්රජ සත්සියයක් දෙවියන් සමග ... ඉක්බිති සක්දෙව්රජ අටසියයක් දෙවියන් සමග ... ඉක්බිති සක්දෙව්රජ අසූදහසක් දෙවියන් සමග ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන් වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන් වැඳ එකත්පස් ව සිටියේ ය. එකත්පස් ව සිටි සක්දෙව්රජුට ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ මෙය වදාළහ: දේවානමින්ද බුදුන් සරණ යෑම මැනවි. දෙවානමින්ද මෙසේ බුදුන්සරණ යෑම හේතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙත්. දේවානමින්ද දහම් සරණ යෑම මැනවි. ... දේවානමින්ද සඟුන් සරණ යෑම මැනවි. දේවානමින්ද මෙසේ සඟුන් සරණ යෑම හේතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙති යි.

නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, බුදුන් සරණ යෑම මැනවි. නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, මෙසේ බුදුන් සරණ යෑම හේතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙත්. නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, දහම් සරණ යෑම මැනවි ... නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, සඟුන් සරණ යෑම මැනවි. නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, මෙසේ සඟුන් සරණ යෑම හේතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙති යි.

## 6. 1. 12

## තතිය සකක සූත්‍රය

359. ඉක්බිති සක්දෙව්රජ පන්සියයක් දෙවියන් සමග ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන් වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන් වැඳ එකත්පස් ව සිටියේ ය. එකත්පස් ව සිටි සක්දෙව්රජුට ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ මෙය වදාළහ: දේවානමින්ද, බුදුන් කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වීම මැනවි. ඒ භගවත්හු මෙකරුණෙනුදු අර්හත්හ, සම්මාසම්බුද්ධයහ, විජ්ජාචරණසම්පන්නයහ, සුගතයහ, ලොකවිදූහ, අනුත්තරපුරිසදම්මසාරථිහ, දෙවිමිනිසුන්ට ශාස්තෘහ, බුද්ධයහ, භගවත්හ යි. දේවානමින්ද, මෙසේ බුදුන් කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වීම හේතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙත්.

සාධු ඛො දෙවානමින්ද ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනං හොති, 'ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී'ති, ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනහෙතු ඛො දෙවානමින්ද එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙද පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති.

සාධු ඛො දෙවානමින්ද සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනං හොති, 'සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො උජුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො ඤායපටිපන්නො භගවතො සාවකසඞ්ඝො සාමීචිපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිසපුග්ගලා, එස භගවතො සාවකසඞ්ඝො ආහුනෙය්‍යො පාහු-නෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා'ති, සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනහෙතු ඛො දෙවානමින්ද එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙද පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති.

සාධු ඛො දෙවානමින්ද අරියකන්තෙහි සීලෙහි සමන්නාගමනං හොති අඛණ්ඩෙහි අච්ඡිද්දෙහි අසබලෙහි අකම්මාසෙහි භුජිස්සෙහි විඤ්ඤුප්පසත්ථෙහි අපරාමට්ඨෙහි සමාධිසංවත්තනිකෙහි, අරියකන්තෙහි සීලෙහි සමන්නාගමනහෙතු ඛො දෙවානමින්ද එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙද පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්තීති.

සාධු ඛො මාරිස මොග්ගල්ලාන බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනං හොති, 'ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා'ති. බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනහෙතු ඛො මාරිස මොග්ගල්ලාන එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙද පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. සාධු ඛො මාරිස මොග්ගල්ලාන ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනං හොති, 'ස්වාක්ඛාතො භගවතා ධම්මො -පෙ- පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී'ති. ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනහෙතු ඛො මාරිස මොග්ගල්ලාන එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙද පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. සාධු ඛො මාරිස මොග්ගල්ලාන සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනං හොති, 'සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා'ති. සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනහෙතු ඛො මාරිස මොග්ගල්ලාන එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙද පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. සාධු ඛො මාරිස මොග්ගල්ලාන අරියකන්තෙහි සීලෙහි සමන්නාගමනං හොති අඛණ්ඩෙහි -පෙ- සමාධිසංවත්තනිකෙහි. අරියකන්තෙහි සීලෙහි සමන්නාගමනහෙතු ඛො මාරිස මොග්ගල්ලාන එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙද පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්තීති.

දේවානමින්ද, දහම්හි ගුණ දැන පැහැදීමෙන් යුතු වීම මැනවි. භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය ස්වාඛ්‍යාත ය, සාංදෘෂ්ටික ය, අකාලික ය, එහිපස්සික ය, ඔපනයික ය, නුවණැත්තන් විසින් තමතමා කෙරෙහි ලා දත යුත්තේ ය යි. දේවානමින්ද, මෙසේ දහම්හි ගුණ දැන පැහැදීමෙන් යුතු වීම හේතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙත්.

දේවානමින්ද, සඟුන් කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වීම මැනවි. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සඞ්ඝ තෙමේ සුප්‍රතිපන්න ය, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සඞ්ඝ තෙමේ ඍජුප්‍රතිපන්න ය, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සඞ්ඝ තෙමේ න්‍යායප්‍රතිපන්න ය, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සඞ්ඝ තෙමේ සාමීචිප්‍රතිපන්න ය, යම් මේ පුරුෂයුග සතරෙක් වේ නම් (එහි) පුරුෂපුද්ගලයෝ අට දෙනෙකි, භාග්‍යවතුන් වහන්සේගේ මේ ශ්‍රාවක සඞ්ඝ තෙමේ ආහවනාර්හ ය, ප්‍රාහුණාර්හ ය, දක්ෂිණාර්හ ය, අඤ්ජලිකරණාර්හ ය, ලෝකයාට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර ය යි. දේවානමින්ද, මෙසේ සඟුන් කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වීම හේතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙත්.

දේවානමින්ද, නො කඩ වූ නො සිදුරු වූ නො කැලැල් වූ නො කබර වූ නිදහස් වූ නුවණැත්තන් විසින් පසස්නා ලද තෘෂ්ණාදෘෂ්ටීන් නොපහස්නා ලද සමාධිය පිණිස පවත්නා ආර්‍ය්‍යකාන්ත (ආර්‍ය්‍යයන් විසින් කැමතිවනලද) ශීලයෙන් යුතු වීම මැනවි. දේවානමින්ද, මෙසේ ආර්‍ය්‍යකාන්ත ශීලයෙන් යුතු වීම හේතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙති යි.

නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, බුදුන් කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වීම මැනවි. ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු ... දෙවිමිනිසුන්ට ශාස්තෘහ, බුද්ධයහ, භගවත්හ යි. නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, මෙසේ බුදුන් කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වීම හේතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙත්. නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, දහම්හි ගුණ දැන පැහැදීමෙන් යුතු වීම මැනවි. භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය ස්වාඛ්‍යාත ය ... නුවණැත්තන් විසින් තමතමා කෙරෙහි ලා දතයුත්තේ ය යි. නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි. මෙසේ දහම්හි ගුණ දැන පැහැදීමෙන් යුතු වීම හේතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙත්. නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, සඟුන් කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වීම මැනවි. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සඞ්ඝ තෙමේ සුප්‍රතිපන්නය... ලෝකයාට අනුත්තරපුණ්‍යක්ෂෙත්‍ර ය යි. නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, මෙසේ සඟුන් කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වීම හේතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙත්.

නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, නොකඩ වූ... සමාධිය පිණිස පවත්නාවූ ආර්‍ය්‍යයන් විසින් කැමතිවන ලද ශීලයෙන් යුතු වීම මැනවි. නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, මෙසේ ආර්‍ය්‍යකාන්ත ශීලයෙන් යුතු වීම හේතුකොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙති යි.

## 6. 1. 13

## චතුක්කසක්කසුත්තං

360. අථ ඛො සක්කො දෙවානමින්දො ඡහි දෙවතාසතෙහි සද්ධිං -පෙ- අථ ඛො සක්කො දෙවානමින්දො සත්තහි දෙවතාසතෙහි සද්ධිං -පෙ අථ ඛො සක්කො දෙවානමින්දො අට්ඨහි දෙවතාසතෙහි සද්ධිං -පෙ- අථ ඛො සක්කො දෙවානමින්දො අසීතියා දෙවතාසහස්සෙහි සද්ධිං යෙනායස්මා මහාමොග්ගල්ලානො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාමොග්ගල්ලානං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතං ඛො සක්කං දෙවානමින්දං ආයස්මා මහාමොග්ගල්ලානො එතදවොච :

සාධු ඛො දෙවානමින්ද බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනං හොති, 'ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා'ති. බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනහෙතු ඛො දෙවානමින්ද එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. සාධු ඛො දෙවානමින්ද ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනං හොති, 'ස්වාක්ඛාතො -පෙ- පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී'ති. ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනහෙතු ඛො දෙවානමින්ද එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. සාධු ඛො දෙවානමින්ද සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනං හොති, 'සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා'ති. සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනහෙතු ඛො දෙවානමින්ද එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. සාධු ඛො දෙවානමින්ද අරියකන්තෙහි සීලෙහි සමන්නාගමනං හොති අඛණ්ඩෙහි -පෙ- සමාධිසංවත්තනිකෙහි. අරියකන්තෙහි සීලෙහි සමන්නාගමනහෙතු ඛො දෙවානමින්ද එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්තීති.

සාධු ඛො මාරිස මොග්ගල්ලාන බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනං හොති ''ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා''ති. බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනහෙතු ඛො මාරිස මොග්ගල්ලාන එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. සාධු ඛො මාරිස මොග්ගල්ලාන ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනං හොති, ''ස්වාක්ඛාතො -පෙ- පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී''ති. ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනහෙතු ඛො මාරිස මොග්ගල්ලාන එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. සාධු ඛො මාරිස මොග්ගල්ලාන සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනං හොති, ''සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා''ති, සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනහෙතු ඛො මාරිස මොග්ගල්ලාන එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. සාධු ඛො මාරිස මොග්ගල්ලාන අරියකන්තෙහි සීලෙහි සමන්නාගමනං හොති අඛණ්ඩෙහි -පෙ- සමාධිසංවත්තනිකෙහි. අරියකන්තෙහි සීලෙහි සමන්නාගමනහෙතු ඛො මාරිස මොග්ගල්ලාන එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්තීති.

## 6. 1. 13

## චතුත්‍ථ සක්ක සූත්‍රය

360. ඉක්බිති සක්දෙවරජ සසියයක් දෙවියන් සමග ... ඉක්බිති සක්දෙවරජ සත්සියයක් දෙවියන් සමග ... ඉක්බිති සක්දෙවරජ අටසියයක් දෙවියන් සමග ... ඉක්බිති සක්දෙවරජ අසූදහසක් දෙවියන් සමග ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන් වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන් වැඳ එකත්පස්ව සිටියේ ය. එකත්පස්ව සිටි සක්දෙවිඳුහට ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ මෙය වදළහ:

දේවානමින්ද, බුදුන් කෙරෙහි ගුණ දන පැහැදීමෙන් යුතු වීම මැනවි. ඒ භගවත්හු මෙකරුණෙනුදු ... දෙවිමිනිසුන්ට ශාස්තෲහ, බුද්ධයහ, භගවත්හ යි. දේවානමින්ද මෙසේ බුදුන් කෙරෙහි ගුණ දන පැහැදීමෙන් යුතු වීම හේතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙත්. දේවානමින්ද, දහම්හි ගුණ දන පැහැදීමෙන් යුතුවීම මැනවි. ස්වාඛ්‍යාත ය ... නුවණැත්තන් විසින් තමතමා කෙරෙහි ලා දත යුත්තේ ය යි. දේවානමින්ද මෙසේ දහම්හි ගුණ දන පැහැදීමෙන් යුතු වීම හේතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙත්. දේවානමින්ද සඟුන් කෙරෙහි ගුණ දන පැහැදීමෙන් යුතු වීම මැනවි. භගවත්හුගේ ශ්‍රාවක සඞ්ඝ තෙමේ සුප්‍රතිපන්න ය ... ලෝකයාට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර ය යි. දේවානමින්ද යම්සේ සඟුන් කෙරෙහි ගුණ දන පැහැදීමෙන් යුතු වීම හේතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙත්. දේවානමින්ද නො කඩ වූ ... සමාධිය පිණිස පවත්නා වූ ආර්‍යකාන්ත ශීලයෙන් යුතු වීම මැනවි. දේවානමින්ද මෙසේ ආර්‍යකාන්ත ශීලයෙන් යුතු වීම හේතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙති යි.

නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, බුදුන් කෙරෙහි ගුණ දන පැහැදීමෙන් යුතු වීම මැනවි. ඒ භගවත්හු මෙකරුණෙනුදු ... දෙවිමිනිසුන්ට ශාස්තෲහ, බුද්ධයහ, භගවත්හ යි. නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, මෙසේ බුදුන් කෙරෙහි ගුණ දන පැහැදීමෙන් යුතු වීම හේතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙත්. නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, දහම්හි ගුණ දන පැහැදීමෙන් යුතු වීම මැනවි. ස්වාඛ්‍යාත ය. ... නුවණැත්තන් විසින් තමතමා කෙරෙහි ලා දතයුත්තේ ය යි. නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, මෙසේ දහම්හි ගුණ දන පැහැදීමෙන් යුතු වීම හේතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙත්. නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, සඟුන් කෙරෙහි ගුණ දන පැහැදීමෙන් යුතු වීම මැනවි. භගවත්හුගේ ශ්‍රාවක සඞ්ඝ තෙමේ සුප්‍රතිපන්න ය ... ලෝකයාට අනුත්තරපුණ්‍යක්ෂෙත්‍ර ය යි. නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, සඟුන් කෙරෙහි ගුණ දන පැහැදීමෙන් යුතු වීම හේතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙත්. නිදුකාණෙනි, මොග්ගල්ලානයෙනි, නො කඩ වූ ... සමාධිය පිණිස පවත්නා වූ ආර්‍යකාන්ත ශීලයෙන් යුතු වීම මැනවි. නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, මෙසේ ආර්‍යකාන්ත ශීලයෙන් යුතු වීම හෙතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙති යි.

## 6. 1. 14

## පඤ්චමසක්කසුත්තං

361. අථ ඛො සක්කො දෙවානමින්දො පඤ්චහි දෙවතාසතෙහි සද්ධිං යෙනායස්මා මහාමොග්ගල්ලානො තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං ඨිතං ඛො සක්කං දෙවානමින්දං ආයස්මා මහාමොග්ගල්ලානො එතදවොච: සාධු ඛො දෙවානමින්ද බුද්ධං සරණගමනං හොති. බුද්ධං සරණගමන හෙතු ඛො දෙවානමින්ද එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති, තෙ අඤ්ඤෙ දෙවෙ දසහි ඨානෙහි අධිගණ්හන්ති: දිබ්බෙන ආයුනා දිබ්බෙන වණ්ණෙන දිබ්බෙන සුඛෙන දිබ්බෙන යසෙන දිබ්බෙන ආධිපතෙය්‍යෙන දිබ්බෙහි රූපෙහි දිබ්බෙහි සද්දෙහි දිබ්බෙහි ගන්ධෙහි දිබ්බෙහි රසෙහි දිබ්බෙහි ඵොට්ඨබ්බෙහි.

සාධු ඛො දෙවානමින්ද ධම්මං සරණගමනං හොති. ධම්මං සරණගමනහෙතු ඛො දෙවානමින්ද එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති, තෙ අඤ්ඤෙ දෙවෙ දසහි ඨානෙහි අධිගණ්හන්ති: දිබ්බෙන ආයුනා දිබ්බෙන වණ්ණෙන දිබ්බෙන සුඛෙන දිබ්බෙන යසෙන දිබ්බෙන ආධිපතෙය්‍යෙන දිබ්බෙහි රූපෙහි දිබ්බෙහි සද්දෙහි දිබ්බෙහි ගන්ධෙහි දිබ්බෙහි රසෙහි දිබ්බෙහි ඵොට්ඨබ්බෙහි.

සාධු ඛො දෙවානමින්ද සඞ්ඝං සරණගමනං හොති. සඞ්ඝං සරණගමනහෙතු ඛො දෙවානමින්ද එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති තෙ අඤ්ඤෙ දෙවෙ දසහි ඨානෙහි අධිගණ්හන්ති: දිබ්බෙන ආයුනා දිබ්බෙන වණ්ණෙන දිබ්බෙන සුඛෙන දිබ්බෙන යසෙන දිබ්බෙන ආධිපතෙය්‍යෙන දිබ්බෙහි රූපෙහි දිබ්බෙහි සද්දෙහි දිබ්බෙහි ගන්ධෙහි දිබ්බෙහි රසෙහි දිබ්බෙහි ඵොට්ඨබ්බෙහීති.

සාධු ඛො මාරිස මොග්ගල්ලාන බුද්ධං සරණගමනං හොති, බුද්ධං සරණගමනහෙතු ඛො මාරිස මොග්ගල්ලාන එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති, තෙ අඤ්ඤෙ දෙවෙ දසහි ඨානෙහි අධිගණ්හන්ති: දිබ්බෙන ආයුනා -පෙ- දිබ්බෙහි ඵොට්ඨබ්බෙහි. සාධු ඛො මාරිස මොග්ගල්ලාන ධම්මං සරණගමනං හොති -පෙ- සාධු ඛො මාරිස සඞ්ඝං සරණගමනං හොති සඞ්ඝං සරණගමනහෙතු ඛො මාරිස මොග්ගල්ලාන එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. තෙ අඤ්ඤෙ දෙවෙ දසහි ඨානෙහි අධිගණ්හන්ති: දිබ්බෙන ආයුනා දිබ්බෙන වණ්ණෙන දිබ්බෙන සුඛෙන දිබ්බෙන යසෙන දිබ්බෙන ආධිපතෙය්‍යෙන දිබ්බෙහි රූපෙහි දිබ්බෙහි සද්දෙහි දිබ්බෙහි ගන්ධෙහි දිබ්බෙහි රසෙහි දිබ්බෙහි ඵොට්ඨබ්බෙහීති.

## 6. 1. 14

## පඤ්චමසක්ක සූත්‍රය

361. ඉක්බිති සක්දෙව්රජ පන්සියයක් දෙවියන් සමග ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන් වෙත එළඹියේ ය. ... එකත්පස් ව සිටි සක්දෙව්, රජුට ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ මෙය වදළහ: දේවානමින්ද-බුදුන් සරණ යෑම මැනවි. දේවානමින්ද මෙසේ බුදුන් සරණ යෑම හේතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙත්. ඔහු දිව්‍යමය ආයුෂයෙන් ද දිව්‍යමය වර්ණයෙන් ද දිව්‍යමය සුවයෙන් ද දිව්‍යමය යසසින් ද දිව්‍යමය අධිපතිභාවයෙන් ද දිව්‍යමය රූපයෙන් ද දිව්‍යමය ශබ්දයෙන් ද දිව්‍යමය ගන්ධයෙන් ද දිව්‍යමය රසයෙන් ද දිව්‍යමය ස්ප්‍රෂ්ටව්‍යයෙන් ද යන දශ කරුණින් අන් දෙවියන් යටපත් කෙරෙත්.

දේවානමින්ද දහම් සරණ යෑම මැනවි. දේවානමින්ද මෙසේ දහම් සරණ යෑම හේතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙත්. ඔහු දිව්‍යමය ආයුෂයෙන් ද දිව්‍යමය වර්ණයෙන් ද දිව්‍යමය සුවයෙන් ද දිව්‍යමය යසසින් ද දිව්‍යමය අධිපතිභාවයෙන් ද දිව්‍යමය රූපයෙන් ද දිව්‍යමය ශබ්දයෙන් ද දිව්‍යමය ගන්ධයෙන් ද දිව්‍යමය රසයෙන් ද දිව්‍යමය ස්ප්‍රෂ්ටව්‍යයෙන් ද යන දශ කරුණින් අන් දෙවියන් යටපත් කෙරෙත්.

දේවානමින්ද සඟුන් සරණ යෑම මැනවි. දේවානමින්ද මෙසේ සඟුන් සරණ යෑම හේතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙත්. ඔහු දිව්‍යමය ආයුෂයෙන් ද දිව්‍යමය වර්ණයෙන් ද දිව්‍යමය සුවයෙන් ද දිව්‍යමය යසසින් ද දිව්‍යමය අධිපතිභාවයෙන් ද දිව්‍යමය රූපයෙන් ද දිව්‍යමය ශබ්දයෙන් ද දිව්‍යමය ගන්ධයෙන් ද දිව්‍යමය රසයෙන් ද දිව්‍යමය ස්ප්‍රෂ්ටව්‍යයෙන් ද යන දශකරුණින් අන් දෙවියන් යටපත් කෙරෙත්.

නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, බුදුන් සරණ යෑම මැනවි. නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, මෙසේ බුදුන් සරණ යෑම හේතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙත්. ඔහු දිව්‍යමය ආයුෂයෙන් ද ... දිව්‍යමය ස්ප්‍රෂ්ටව්‍යයෙන් ද යන දශකරුණින් සෙසු දෙවියන් යටපත් කෙරෙත්. නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, දහම් සරණ යෑම මැනවි. ... නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, සඟ සරණ යෑම මැනවි. නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, මෙසේ සඟ සරණ යෑම හේතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙත්. ඔහු දිව්‍යමය ආයුෂයෙන් ද දිව්‍යමය වර්ණයෙන් ද දිව්‍යමය සුවයෙන් ද දිව්‍යමය යසසින් ද දිව්‍යමය අධිපතිභාවයෙන් ද දිව්‍යමය රූපයෙන් ද දිව්‍යමය ශබ්දයෙන් ද දිව්‍යමය ගන්ධයෙන් ද දිව්‍යමය රසයෙන් ද දිව්‍යමය ස්ප්‍රෂ්ටව්‍යයෙන් ද යන දශකරුණින් අන් දෙවියන් යටපත් කෙරෙති යි.

## 6. 1. 15

## ඡට්ඨසක්කසුත්තං

362. අථ ඛො සක්කො දෙවානමින්දො ඡහි දෙවතාසතෙහි සද්ධිං –පෙ– අථ ඛො සක්කො දෙවානමින්දො සත්තහි දෙවතාසතෙහි සද්ධිං –පෙ– අථ ඛො සක්කො දෙවානමින්දො අට්ඨහි දෙවතාසතෙහි සද්ධිං –පෙ– අථ ඛො සක්කො දෙවානමින්දො අසීතියා දෙවතාසහස්සෙහි සද්ධිං යෙනායස්මා මහාමොග්ගල්ලානො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාමොග්ගල්ලානං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතං ඛො සක්කං දෙවානමින්දං ආයස්මා මහාමොග්ගල්ලානො එතදවොච:

සාධු ඛො දෙවානමින්ද බුද්ධං සරණගමනං හොති, බුද්ධං සරණගමනහෙතු ඛො දෙවානමින්ද එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති, තෙ අඤ්ඤෙ දෙවෙ දසහි ඨානෙහි අධිගණ්හන්ති: දිබ්බෙන ආයුනා –පෙ– දිබ්බෙහි ඵොට්ඨබ්බෙහි. සාධු ඛො දෙවානමින්ද ධම්මං සරණගමනං හොති –පෙ– සාධු ඛො දෙවානමින්ද සඞ්ඝං සරණගමනං හොති. සඞ්ඝං සරණගමනහෙතු ඛො දෙවානමින්ද එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. තෙ අඤ්ඤෙ දෙවෙ දසහි ඨානෙහි අධිගණ්හන්ති දිබ්බෙන ආයුනා දිබ්බෙන වණ්ණෙන දිබ්බෙන සුඛෙන දිබ්බෙන යසෙන දිබ්බෙන ආධිපතෙය්‍යෙන දිබ්බෙහි රූපෙහි දිබ්බෙහි සද්දෙහි දිබ්බෙහි ගන්ධෙහි දිබ්බෙහි රසෙහි දිබ්බෙහි ඵොට්ඨබ්බෙහීති.

සාධු ඛො මාරිස මොග්ගල්ලාන බුද්ධං සරණගමනං හොති –පෙ– සාධු ඛො මාරිස මොග්ගල්ලාන ධම්මං සරණගමනං හොති –පෙ– සාධු ඛො මාරිස මොග්ගල්ලාන සඞ්ඝං සරණගමනං හොති සඞ්ඝං සරණගමනහෙතු ඛො මාරිස මොග්ගල්ලාන එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. තෙ අඤ්ඤෙ දෙවෙ දසහි ඨානෙහි අධිගණ්හන්ති. දිබ්බෙන ආයුනා දිබ්බෙන වණ්ණෙන දිබ්බෙන සුඛෙන දිබ්බෙන යසෙන දිබ්බෙන ආධිපතෙය්‍යෙන දිබ්බෙහි රූපෙහි දිබ්බෙහි සද්දෙහි දිබ්බෙහි ගන්ධෙහි දිබ්බෙහි රසෙහි දිබ්බෙහි ඵොට්ඨබ්බෙහීති.

## 6. 1. 16

## සත්තමසක්කසුත්තං

363. අථ ඛො සක්කො දෙවානමින්දො පඤ්චහි දෙවතාසතෙහි සද්ධිං යෙනායස්මා මහාමොග්ගල්ලානො තෙනුපසංකමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාමොග්ගල්ලානං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතං ඛො සක්කං දෙවානමින්දං ආයස්මා මහාමොග්ගල්ලානො එතදවොච:

## 6. 1. 15

### ඡටය සක්ක සූත්‍රය

362. ඉක්බිති සක්දෙව්රජ සසියයක් දෙවියන් සමග ... ඉක්බිති සක්දෙව්රජ සත්සියයක් දෙවියන් සමග ... ඉක්බිති සක්දෙව්රජ අටසියයක් දෙවියන් සමග ... ඉක්බිති සක්දෙව්රජ අසූදහසක් දෙවියන් සමග ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන් වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන් වැඳ එකත්පස්ව සිටියේ ය. එකත්පස් ව සිටි සක්දෙව්රජුට ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ මෙය වදාළහ:

දේවානමින්ද, බුදුන් සරණ යෑම මැනවි. දේවානමින්ද මෙසේ බුදුන් සරණ යෑම හේතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙත්. ඔහු දිව්‍යමය ආයුෂයෙන් ද ... දිව්‍යමය ස්ප්‍රෂ්ටව්‍යයෙන් ද යන දශකරුණින් සෙසු දෙවියන් යටපත් කෙරෙත්. දේවානමින්ද දහම් සරණ යෑම මැනවි ... දේවානමින්ද සඟ සරණ යෑම මැනවි. දේවානමින්ද, මෙසේ සඟ සරණ යෑම හේතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙත්. ඔහු දිව්‍යමය ආයුෂයෙන් ද දිව්‍යමය වර්ණයෙන් ද දිව්‍යමය සුවයෙන් ද දිව්‍යමය යසසින් ද දිව්‍යමය අධිපතිභාවයෙන් ද දිව්‍යමය රූපයෙන් ද දිව්‍යමය ශබ්දයෙන් ද දිව්‍යමය ගන්ධයෙන් ද දිව්‍යමය රසයෙන් ද දිව්‍යමය ස්ප්‍රෂ්ටව්‍යයෙන් ද යන දශකරුණින් අන් දෙවියන් යටපත් කෙරෙති යි.

නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, බුදුන් සරණ යෑම මැනවි. නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, දහම් සරණ යෑම මැනවි. ... නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, සඟ සරණ යෑම මැනවි. නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, මෙසේ සඟ සරණ යෑම හේතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙත්. ඔහු දිව්‍යමය ආයුෂයෙන් ද දිව්‍යමය වර්ණයෙන් ද දිව්‍යමය සුවයෙන් ද දිව්‍යමය යසසින් ද දිව්‍යමය ආධිපත්‍යයෙන් ද දිව්‍යමය රූපයෙන් ද දිව්‍යමය ශබ්දයෙන් ද දිව්‍යමය ගන්ධයෙන් ද දිව්‍යමය රසයෙන් ද දිව්‍යමය ස්ප්‍රෂ්ටව්‍යයෙන් ද යන දශකරුණින් සෙසු දෙවියන් යටපත් කෙරෙති යි.

## 6. 1. 16

### සත්තමසක්ක සූත්‍රය

363. ඉක්බිති සක්දෙව්රජ පන්සියයක් දෙවියන් සමග ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන් වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන් වැඳ එකත්පස් ව සිටියේ ය. එකත්පස් ව සිටි සක්දෙව්රජුට ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ මෙය වදාළහ:

සාධු ඛො දෙවානමින්ද බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනං හොති "ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනහෙතු ඛො දෙවානමින්ද එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. තෙ අඤ්ඤෙ දෙවෙ දසහි ඨානෙහි අධිගණ්හන්ති, දිබ්බෙන ආයුනා -පෙ- දිබ්බෙහි ඵොට්ඨබ්බෙහි. සාධු ඛො දෙවානමින්ද ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනං හොති -පෙ- සාධු ඛො දෙවානමින්ද සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනං හොති -පෙ-

සාධු ඛො දෙවානමින්ද, අරියකන්තෙහි සීලෙහි සමන්නාගමනං හොති අඛණ්ඩෙහි -පෙ- සමාධිසංවත්තනිකෙහි. අරියකන්තෙහි සීලෙහි සමන්නාගමනහෙතු ඛො දෙවානමින්ද එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. තෙ අඤ්ඤෙ දෙවෙ දසහි ඨානෙහි අධිගණ්හන්ති දිබ්බෙන ආයුනා දිබ්බෙන වණ්ණෙන දිබ්බෙන සුඛෙන දිබ්බෙන යසෙන දිබ්බෙන ආධිපතෙය්‍යෙන දිබ්බෙහි රූපෙහි දිබ්බෙහි සද්දෙහි දිබ්බෙහි ගන්ධෙහි දිබ්බෙහි රසෙහි දිබ්බෙහි ඵොට්ඨබ්බෙහීති.

සාධු ඛො මාරිස මොග්ගල්ලාන බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනං හොති, "ඉති පි සො භගවා -පෙ- සත්ථා දෙව-මනුස්සානං බුද්ධො භගවා"ති. බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමන හෙතු ඛො මාරිස මොග්ගල්ලාන එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. තෙ අඤ්ඤෙ දෙවෙ දසහි ඨානෙහි අධිගණ්හන්ති දිබ්බෙන ආයුනා -පෙ- දිබ්බෙහි ඵොට්ඨබ්බෙහි.

සාධු ඛො මාරිස මොග්ගල්ලාන ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනං හොති "ස්වාක්ඛාතො භගවතා ධම්මො -පෙ- පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී"ති. ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමන හෙතු ඛො මාරිස මොග්ගල්ලාන එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති තෙ අඤ්ඤෙ දෙවෙ දසහි ඨානෙහි අධිගණ්හන්ති දිබ්බෙන ආයුනා -පෙ- දිබ්බෙහි ඵොට්ඨබ්බෙහි.

සාධු ඛො මාරිස මොග්ගල්ලාන සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනං හොති "සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා"ති, සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනහෙතු ඛො මාරිස මොග්ගල්ලාන, එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති, තෙ අඤ්ඤෙ දෙවෙ දසහි ඨානෙහි අධිගණ්හන්ති දිබ්බෙන ආයුනා -පෙ- දිබ්බෙහි ඵොට්ඨබ්බෙහි.

දේවානමින්ද බුදුන් කෙරෙහි නො සැලෙන පැහැදීමෙන් යුතුවීම මැනවි, ඒ භගවත්හු මෙකරුණෙනුදු ... දෙව්මිනිසුන්ට ශාස්තෘහ, බුද්ධයහ, භගවත්හ යි. දේවානමින්ද මෙසේ බුදුන් කෙරෙහි නො සැලෙන පැහැදීමෙන් යුතු වීම හේතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙත්. ඔහු දිව්‍යමය ආයුෂයෙන් ද ... දිව්‍යමය ස්ප්‍රෂ්ටව්‍යයෙන් ද යන දශකරුණින් සෙසු දෙවියන් යටපත් කෙරෙත්. දෙවානමින්ද දහම්හි නොසැලෙන පැහැදීමෙන් යුතු වීම මැනවි. ... දෙවානමින්ද සඟුන් කෙරෙහි නො සැලෙන පැහැදීමෙන් යුතු වීම මැනවි ...

දේවානමින්ද නො කඩ වූ ... සමාධිය පිණිස පවත්නා වූ ආර්‍ය්‍යකාන්ත ශීලයෙන් යුතු වීම මැනවි. දේවානමින්ද, මෙසේ ආර්‍ය්‍යකාන්ත ශීලයෙන් යුතු වීම හෙතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙත්. ඔහු දිව්‍යමය ආයුෂයෙන් ද දිව්‍යමය වර්ණයෙන් ද දිව්‍යමය සුවයෙන් ද දිව්‍යමය යසසින් ද දිව්‍යමය ආධිපත්‍යයෙන් ද දිව්‍යමය රූපයෙන් ද දිව්‍යමය ශබ්දයෙන් ද දිව්‍යමය ගන්ධයෙන් ද දිව්‍යමය රසයෙන් ද දිව්‍යමය ස්ප්‍රෂ්ටව්‍යයෙන් ද යන දශ කරුණෙන් සෙසු දෙවියන් යටපත් කෙරෙති යි.

නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, බුදුන් කෙරෙහි නො සැලෙන පැහැදීමෙන් යුතු වීම මැනවි. ඒ භගවත්හු මෙකරුණෙනුදු ... දෙව්මිනිසුන්ට ශාස්තෘහ, බුද්ධ යහ, භගවත්හ යි. නිදුකාණෙනි මොග්ගල්ලාන යෙනි, මෙසේ බුදුන් කෙරෙහි නො සැලෙන පැහැදීමෙන් යුතු වීම හේතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙත්. ඔහු දිව්‍යමය ආයුෂයෙන් ද ... දිව්‍යමය ස්ප්‍රෂ්ටව්‍යයෙන් ද යන දශකරුණෙන් සෙසු දෙවියන් යටපත් කෙරෙති.

නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, දහම්හි නො සැලෙන පැහැදීමෙන් යුතු වීම මැනවි. භගවත්හු විසින් ධර්මය ස්වාඛ්‍යාත ය ... නුවණැත්තන් විසින් තමතමා කෙරෙහි ලා දතයුත්තේ ය යි. නිදුකාණෙනි මොග්ගල්ලාන යෙනි, මෙසේ දහම්හි නො සැලෙන පැහැදීමෙන් යුතු වීම හේතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙත්. ඔහු දිව්‍යමය ආයුෂයෙන් ද ... දිව්‍යමය ස්ප්‍රෂ්ටව්‍යයෙන් ද යන දශකරුණෙන් සෙසු දෙවියන් යටපත් කෙරෙත්.

නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, සඟුන් කෙරෙහි නො සැලෙන පැහැදීමෙන් යුතු වීම මැනවි. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සඞ්ඝ තෙමේ සුප්‍රතිපන්න ය ... ලෝකයාට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර ය යි. නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, මෙසේ සඟුන් කෙරෙහි නො සැලෙන පැහැදීමෙන් යුතු වීම හෙතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙත්. ඔහු දිව්‍යමය ආයුෂයෙන් ද ... දිව්‍යමය ස්ප්‍රෂ්ටව්‍යයෙන් ද යන දශ කරුණෙන් සෙසු දෙවියන් යටපත් කෙරෙත්.

සාධු ඛො මාරිස මොග්ගල්ලාන අරියකන්තෙහි සීලෙහි සමන්නාගමනං හොති, අඛණ්ඩෙහි -පෙ- සමාධිසංවත්තනිකෙහි. අරියකන්තෙහි සීලෙහි සමන්නාගමනහෙතු ඛො මාරිස මොග්ගල්ලාන එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති, තෙ අඤ්ඤෙ දෙවෙ දසහි ඨානෙහි අධිගණ්හන්ති දිබ්බෙන ආයුනා දිබ්බෙන වණ්ණෙන දිබ්බෙන සුඛෙන දිබ්බෙන යසෙන දිබ්බෙන ආධිපතෙය්‍යෙන දිබ්බෙහි රූපෙහි දිබ්බෙහි සද්දෙහි දිබ්බෙහි ගන්ධෙහි දිබ්බෙහි රසෙහි දිබ්බෙහි ඵොට්ඨබ්බෙහීති.

## 6. 1. 17

## අට්ඨම සක්කසුත්තං

364. අථ ඛො සක්කො දෙවානමින්දො ඡහි දෙවතාසතෙහි සද්ධිං -පෙ- අථ ඛො සක්කො දෙවානමින්දො සත්තහි දෙවතාසතෙහි සද්ධිං -පෙ- අථ ඛො සක්කො දෙවානමින්දො අට්ඨහි දෙවතාසතෙහි සද්ධිං -පෙ- අථ ඛො සක්කො දෙවානමින්දො අසීතියා දෙවතාසහස්සෙහි සද්ධිං යෙනායස්මා මහාමොග්ගල්ලානො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාමොග්ගල්ලානං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතං ඛො සක්කං දෙවානමින්දං ආයස්මා මහාමොග්ගල්ලානො එතදවොච:

සාධු ඛො දෙවානමින්ද, බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනං හොති: "ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථී සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති. බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනහෙතු ඛො දෙවානමින්ද එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති: තෙ අඤ්ඤෙ දෙවෙ දසහි ඨානෙහි අධිගණ්හන්ති දිබ්බෙන ආයුනා දිබ්බෙන වණ්ණෙන දිබ්බෙන සුඛෙන දිබ්බෙන යසෙන දිබ්බෙන ආධිපතෙය්‍යෙන දිබ්බෙහි රූපෙහි දිබ්බෙහි සද්දෙහි දිබ්බෙහි ගන්ධෙහි දිබ්බෙහි රසෙහි දිබ්බෙහි ඵොට්ඨබ්බෙහි;

සාධු ඛො දෙවානමින්ද ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනං හොති "ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී"ති, ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනහෙතු ඛො දෙවානමින්ද එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති, තෙ අඤ්ඤෙ දෙවෙ දසහි ඨානෙහි අධිගණ්හන්ති දිබ්බෙන ආයුනා -පෙ- දිබ්බෙහි ඵොට්ඨබ්බෙහි.

තිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, නොකඩ වූ ... සමාධිය පිණිස පවත්නා වූ ආර්යකාන්ත ශීලයෙන් යුතු වීම මැනවි. තිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, මෙසේ ආර්යකාන්ත ශීලයෙන් යුතු වීම හේතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙත්. ඔහු දිව්‍යමය ආයුෂයෙන් ද දිව්‍යමය වර්ණයෙන් ද දිව්‍යමය සුවයෙන් ද දිව්‍යමය යසසින් ද දිව්‍යමය ආධිපත්‍යයෙන් ද දිව්‍යමය රූපයෙන් ද දිව්‍යමය ශබ්දයෙන් ද දිව්‍යමය ගන්ධයෙන් ද දිව්‍යමය රසයෙන් ද දිව්‍යමය ස්ප්‍රෂ්ටව්‍යයෙන් ද යන දශ කරුණින් සෙසු දෙවියන් යටපත් කෙරෙති යි.

## 6. 1. 17

## අට්ඨම සක්ක සූත්‍රය

364. ඉක්බිති සක්දෙවරජ සසියයක් දෙවියන් සමග ... ඉක්බිති සක්දෙවරජ සත්සියයක් දෙවියන් සමග ... ඉක්බිති සක්දෙවරජ අට සියයක් දෙවියන් සමග ... ඉක්බිති සක්දෙවරජ අසූදහසක් දෙවියන් සමග ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන් වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන් වැඳ එකත්පස් ව සිටියේ ය. එකත් පස් ව සිටි සක්දෙවරජුට ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ මෙය වදාළහ:

දේවානමින්ද බුදුන් කෙරෙහි නො සැලෙන පැහැදීමෙන් යුතු වීම මැනවි. ඒ භගවත්හු මෙකරුණෙනුදු අර්හත්හ, සම්‍යක්සම්බුද්ධයහ, විද්‍යාචරණ සම්පන්නයහ, සුගතයහ, ලොකවිදූහ, අනුත්තරපුරුෂදම්‍යසාරථිහ, දෙව්මිනිසුන්ට ශාස්තෘය හ, බුද්ධය හ, භගවත්හ යි. දෙවානමින්ද මෙසේ බුදුන් කෙරෙහි නො සැලෙන පැහැදීමෙන් යුතු වීම හෙතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙත්. ඔහු දිව්‍යමය ආයුෂයෙන් ද දිව්‍යමය වර්ණයෙන් ද දිව්‍යමය සුවයෙන් ද දිව්‍යමය යසසින් ද දිව්‍යමය ආධිපත්‍යයෙන් ද දිව්‍යමය රූපයෙන් ද දිව්‍යමය ශබ්දයෙන් ද දිව්‍යමය ගන්ධයෙන් ද දිව්‍යමය ස්ප්‍රෂ්ටව්‍යයෙන් ද යන දශකරුණෙන් සෙසු දෙවියන් යටපත් කෙරෙති.

දේවානමින්ද, දහම්හි නො සැලෙන පැහැදීමෙන් යුතු වීම මැනවි. භගවත්හු විසින් ධර්මය ස්වාඛ්‍යාත ය. සාන්දෘෂ්ටික ය, අකාලික ය, එහිපස්සික ය, ඔපනයික ය, නුවණැත්තන් විසින් තමතමා කෙරෙහි ලා දතයුත්තේ ය යි. දෙවානමින්ද මෙසේ දහම්හි නො සැලෙන පැහැදීමෙන් යුතු වීම හෙතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙත්. ඔහු දිව්‍යමය ආයුෂයෙන් ද ... දිව්‍යමය ස්ප්‍රෂ්ටව්‍යයෙන් ද යන දශකරුණෙන් සෙසු දෙවියන් යටපත් කෙරෙති.

සාධු ඛො දෙවානමින්ද සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනං හොති: "සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො උජුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො ඤායපටිපන්නො භගවතො සාවකසඞ්ඝො සාමීචිපටිපන්නො භගවතො සාවකසඞ්ඝො යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිසපුග්ගලා එස භගවතො සාවකසඞ්ඝො ආහුනෙය්‍යො පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා"ති සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනහෙතු ඛො දෙවානමින්ද එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. තෙ අඤ්ඤෙ දෙවෙ දසහි ඨානෙහි අධිගණ්හන්ති දිබ්බෙන ආයුනා -පෙ- දිබ්බෙහි ඵොට්ඨබ්බෙහි සාධු ඛො දෙවානමින්ද, අරියකන්තෙහි සීලෙහි සමන්නාගමනං හොති අඛණ්ඩෙහි අච්ඡිද්දෙහි අසබලෙහි අකම්මාසෙහි භුජිස්සෙහි විඤ්ඤුප්පසත්ථෙහි අපරාමට්ඨෙහි සමාධිසංවත්තනිකෙහි. අරියකන්තෙහි සීලෙහි සමන්නාගමනහෙතු ඛො දෙවානමින්ද එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. තෙ අඤ්ඤෙ දෙවෙ දසහි ඨානෙහි අධිගණ්හන්ති: දිබ්බෙන ආයුනා දිබ්බෙන වණ්ණෙන දිබ්බෙන සුඛෙන දිබ්බෙන යසෙන දිබ්බෙන ආධිපතෙය්‍යෙන දිබ්බෙහි රූපෙහි දිබ්බෙහි සද්දෙහි දිබ්බෙහි ගන්ධෙහි දිබ්බෙහි ඵොට්ඨබ්බෙහීති.

සාධු ඛො මාරිස මොග්ගල්ලාන බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනං හොති "ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමන හෙතු ඛො මාරිස මොග්ගල්ලාන, එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති තෙ අඤ්ඤෙ දෙවෙ දසහි ඨානෙහි අධිගණ්හන්ති දිබ්බෙන ආයුනා -පෙ- දිබ්බෙහි ඵොට්ඨබ්බෙහි.

සාධු ඛො මාරිස මොග්ගල්ලාන ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනං හොති "ස්වාක්ඛාතො භගවතා ධම්මො -පෙ- පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී"ති. ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමන හෙතු ඛො මාරිස මොග්ගල්ලාන එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. තෙ අඤ්ඤෙ දෙවෙ දසහි ඨානෙහි අධිගණ්හන්ති දිබ්බෙන ආයුනා -පෙ- දිබ්බෙහි ඵොට්ඨබ්බෙහි.

සාධු ඛො මාරිස මොග්ගල්ලාන සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනං හොති "සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා"ති. සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගමනහෙතු ඛො මාරිස මොග්ගල්ලාන එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති තෙ අඤ්ඤෙ දෙවෙ දසහි ඨානෙහි අධිගණ්හන්ති දිබ්බෙන ආයුනා -පෙ- දිබ්බෙහි ඵොට්ඨබ්බෙහි:

දේවානමින්ද, සඟුන් කෙරෙහි නො සැලෙන පැහැදීමෙන් යුතු වීම මැනවි. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සඞ්ඝ තෙමේ සුප්‍රතිපන්න ය, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සඞ්ඝ තෙමේ ඍජුප්‍රතිපන්න ය, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සඞ්ඝ තෙමේ න්‍යායප්‍රතිපන්න ය, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සඞ්ඝ තෙමේ සාමීචිප්‍රතිපන්න ය, යම් මේ පුරුෂයුග සතරෙක් වේ නම් (එහි) පුරුෂ පුද්ගලයෝ අටදෙනෙකි, භාග්‍යවතුන් වහන්සේගේ මේ ශ්‍රාවක සඞ්ඝ තෙමේ ආහවනාර්හ ය. ප්‍රාඝුණාර්හ ය. දක්ෂිණාර්හ ය, අඤ්ජලිකරණාර්හ ය, ලොකයාට අනුත්තරපුණ්‍යක්‍ෂෙත්‍ර ය යි. දේවානමින්ද, මෙසේ සඟුන් කෙරෙහි නො සැලෙන පැහැදීමෙන් යුතු වීම හේතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙත්. ඔහු දිව්‍යමය ආයුෂයෙන් ... දිව්‍යමය ස්ප්‍රෂ්ටව්‍යයෙන් ද යන දශකරුණෙන් සෙසු දෙවියන් යටපත් කෙරෙත්. දේවානමින්ද, නො කඩ වූ නො සිදුරු වූ නො කැලැල් වූ නො කබර වූ නිදහස් වූ නුවණැත්තන් විසින් පසස්නා ලද තෘෂ්ණාදෘෂ්ටීන් නො පහස්නා ලද සමාධිය පිණිස පවත්නා වූ ආර්‍ය්‍යකාන්ත ශීලයෙන් යුතු වීම මැනවි. දේවානමින්ද, මෙසේ ආර්‍ය්‍යකාන්ත ශීලයෙන් යුතුවීම හේතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙත්. ඔහු දිව්‍යමය ආයුෂයෙන් ද දිව්‍යමය වර්ණයෙන් ද දිව්‍යමය සුවයෙන් ද දිව්‍යමය යසසින් ද දිව්‍යමය ආධිපත්‍යයෙන් ද දිව්‍යමය රූපයෙන් ද දිව්‍යමය ශබ්දයෙන් ද දිව්‍යමය ගන්ධයෙන් ද දිව්‍යමය රස යෙන් ද දිව්‍යමය ස්ප්‍රෂ්ටව්‍යයෙන් ද යන දශකරුණෙන් සෙසු දෙවියන් යටපත් කෙරෙති යි.

නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, බුදුන් කෙරෙහි නො සැලෙන පැහැදීමෙන් යුතු වීම මැනවි. ඒ භගවත්හු මෙකරුණෙනුදු ... දෙව්මිනිසුන්ට ශාස්තෲහ, බුද්ධයහ, භගවත්හ යි. නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, මෙසේ බුදුන් කෙරෙහි නො සැලෙන පැහැදීමෙන් යුතු වීම හේතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙත්. ඔහු දිව්‍යමය ආයුෂයෙන් ද ... දිව්‍යමය ස්ප්‍රෂ්ටව්‍යයෙන් ද යන දශකරුණෙන් සෙසු දෙවියන් යටපත් කෙරෙත්.

නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, දහම්හි නො සැලෙන පැහැදීමෙන් යුතු වීම මැනවි. භගවත්හු විසින් ධර්මය ස්වාඛ්‍යාත ය ... විඥයන් විසින් තමතමා කෙරෙහි ලා දතයුත්තේ ය යි. නිදුකාණෙනි මොග්ගල්ලාන යෙනි මෙසේ දහම්හි නො සැලෙන පැහැදීමෙන් යුතු වීම හේතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙත්. ඔහු දිව්‍යමය ආයුෂයෙන් ද ... දිව්‍යමය ස්ප්‍රෂ්ටව්‍යයෙන් ද යන දශකරුණෙන් සෙසු දෙවියන් යටපත් කෙරෙත්.

නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, සඟුන් කෙරෙහි නො සැලෙන පැහැදීමෙන් යුතු වීම මැනවි. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සඞ්ඝ තෙමේ සුප්‍රතිපන්න ය. ... ලෝකයාට අනුත්තරපුණ්‍යක්‍ෂෙත්‍ර ය යි. නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, මෙසේ සඟුන් කෙරෙහි නො සැලෙන පැහැදීමෙන් යුතු වීම හේතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙත්. ඔහු දිව්‍යමය ආයුෂයෙන් ද ... දිව්‍යමය ස්ප්‍රෂ්ටව්‍යයෙන් ද යන දශකරුණෙන් සෙසු දෙවියන් යටපත් කෙරෙත්.

සාධු ඛො මාරිස මොග්ගල්ලාන අරියකන්තෙහි සීලෙහි සමන්නාගමනං හොති. අඛණ්ඩෙහි -පෙ- සමාධිසංවත්තනිකෙහි. අරියකන්තෙහි සීලෙහි සමන්නාගමනහෙතු ඛො මාරිස මොග්ගල්ලාන එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති, තෙ අඤ්ඤෙ දෙවෙ දසහි ඨානෙහි අධිගණ්හන්ති දිබ්බෙන ආයුනා දිබ්බෙන වණ්ණෙන දිබ්බෙන සුඛෙන දිබ්බෙන යසෙන දිබ්බෙන ආධිපතෙය්‍යෙන දිබ්බෙහි රූපෙහි දිබ්බෙහි සද්දෙහි දිබ්බෙහි ගන්ධෙහි දිබ්බෙහි රසෙහි දිබ්බෙහි ඵොට්ඨබ්බෙහීති.

## 6. 1. 18-25

### නන්දන[1]සුත්තානි

365—372 අථ ඛො නන්දනො දෙවපුත්තො -පෙ- ඵොට්ඨබ්බෙහීති.

## 6. 1. 26-33

### සුයාමසුත්තානි

373—380 අථ ඛො සුයාමො දෙවපුත්තො -පෙ- ඵොට්ඨබ්බෙහීති.

## 6. 1. 34-41

### සන්තුසිතසුත්තානි

381—388 අථ ඛො සන්තුසිතො දෙවපුත්තො -පෙ- ඵොට්ඨබ්බෙහීති.

## 6. 1. 42-49

### සුනිම්මිතසුත්තානි

389—396 අථ ඛො සුනිම්මිතො දෙවපුත්තො -පෙ- ඵොට්ඨබ්බෙහීති.

## 6. 1. 50-57

### වසවත්තිසුත්තානි

397—404 අථ ඛො වසවත්ති දෙවපුත්තො -පෙ- ඵොට්ඨබ්බෙහීති.
(යථා සක්කසුත්තානි තථා ඉමෙ සුත්තන්තාපි විත්ථාරෙතබ්බා)

**මොග්ගල්ලානවග්ගො පඨමො.**

**තත්‍රුද්දානං:**

සවිතක්කාවිතක්කඤ්ච සුඛෙන ච උපෙක්ඛකො
ආකාසානඤ්ච විඤ්ඤාණං ආකිඤ්චඤ්ඤං නෙවසඤ්ඤං ච
අනිමිත්තො චෙති නව සක්කො ච නන්දනෙන ච
සුයාමො ච සන්තුසිතො සුනිම්මිතො වසවත්ති
අට්ඨ අට්ඨ භවන්තීති සත්තපඤ්ඤාස හොන්ති තෙ' ති.

**මොග්ගල්ලානසංයුත්තං නිට්ඨිතං**

1. චන්දන - මජසං., ස්‍යා.

නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, නො කඩ වූ ... සමාධිය පිණිස පවත්නා වූ ආර්යකාන්ත ශීලයෙන් යුතු වීම මැනවි. නිදුකාණෙනි මොග්ගල්ලානයෙනි, මෙසේ ආර්යකාන්ත ශීලයෙන් යුතු වීම හේතු කොට මෙහි ඇතැම් සත්ත්ව කෙනෙක් කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙත්. ඔහු දිව්‍යමය ආයුෂයෙන් ද දිව්‍යමය වර්ණයෙන් ද දිව්‍යමය සුවයෙන් ද දිව්‍යමය යසසින් ද දිව්‍යමය ආධිපත්‍යයෙන් ද දිව්‍යමය රූපයෙන් ද දිව්‍යමය ශබ්දයෙන් ද දිව්‍යමය ගන්ධයෙන් ද දිව්‍යමය රසයෙන් ද දිව්‍යමය ස්ප්‍රෂ්ටව්‍යයෙන් ද යන දශකරුණෙන් සෙසු දෙවියන් යටපත් කෙරෙති යි.

## 6. 1. 18-25

## නන්දන සූත්‍ර

365-372 එකල්හි **නන්දන දෙව්පුත්** තෙමේ ... ස්ප්‍රෂ්ටව්‍යයෙන් ද (යටපත් කෙරෙති යි)

## 6. 1. 26-33

## සුයාම සූත්‍ර

373-380 එකල්හි **සුයාම දෙව්පුත්** තෙමේ ... ස්ප්‍රෂ්ටව්‍යයෙන් ද (යටපත් කෙරෙති යි)

## 6. 1. 34-41

## සන්තුසිත සූත්‍ර

381-388 එකල්හි **සන්තුසිත දෙව්පුත්** තෙමේ ... ස්ප්‍රෂ්ටව්‍යයෙන් ද (යටපත් කෙරෙති යි)

## 6. 1. 42-49

## සුනිම්මිත සූත්‍ර

389-396 එකල්හි **සුනිම්මිත දෙව්පුත්** තෙමේ ... ස්ප්‍රෂ්ටව්‍යයෙන් ද (යටපත් කෙරෙති යි)

## 6. 1. 50-57

## වසවත්ති සූත්‍ර

397-404 එකල්හි **වසවත්ති දෙව්පුත්** තෙමේ ... ස්ප්‍රෂ්ටව්‍යයෙන් ද (යටපත් කෙරෙති යි)

(සක්ක සූත්‍ර යම්සේ නම් මේ සූත්‍රාන්ත ද එසේ විස්තර කටයුතු යි.)

**පළමු මොග්ගල්ලාන වර්ග යි.**

**එහි සූත්‍රනාමාවලිය:**

සවිතක්ක, අවිතක්ක, සුඛ, උපෙක්ඛා, ආකාසානඤ්චායතන, විඤ්ඤාණඤ්චායතන, ආකිඤ්චඤ්ඤායතන, නේවසඤ්ඤානාසඤ්ඤායතන, අනිමිත්ත ය යි සූත්‍ර නවයෙක් ද සක්ක, නන්දන, සුයාම, සන්තුසිත, සුනිම්මිත, වසවත්ති යන සයෙහි සූත්‍ර අට අට බැගින් ද වෙති යි වර්ගයෙහි ඒ සූත්‍ර මුළුල්ල සත් පනසෙක් වේ යි.

**මොග්ගල්ලාන සංයුත්තය නිමි.**

# 7. චිත්තසංයුත්තං

## 1. චිත්තවග්ගො

### 7. 1. 1

### සංයොජනසුත්තං

405. ඒකං සමයං සම්බහුලා ථෙරා භික්ඛූ මච්ඡිකාසණ්ඩෙ විහරන්ති අම්බාටකවනෙ. තෙන ඛො පන සමයෙන සම්බහුලානං ථෙරානං භික්ඛූනං පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තානං මණ්ඩලමාළෙ සන්නිසින්නානං සන්නිපතිතානං අයමන්තරා කථා උදපාදි: සඤ්ඤොජනන්ති වා ආවුසො සඤ්ඤොජනියා ධම්මාති වා ඉමෙ ධම්මා නානත්ථා නානාව්‍යඤ්ජනා, උදාහු එකත්ථා ව්‍යඤ්ජනමෙව නානන්ති?

තත්‍රෙකච්චෙහි ථෙරෙහි භික්ඛූහි එවං ව්‍යාකතං හොති: "සඤ්ඤොජනන්ති වා ආවුසො[1] සඤ්ඤොජනියා ධම්මාති වා ඉමෙ ධම්මා නානත්ථා චෙව නානාව්‍යඤ්ජනා චා"ති, එකච්චෙහි ථෙරෙහි භික්ඛූහි එවං ව්‍යාකතං හොති: සඤ්ඤොජනන්ති වා ආවුසො සඤ්ඤොජනියා ධම්මාති වා ඉමෙ ධම්මා එකත්ථා ව්‍යඤ්ජනමෙව නාන"න්ති.

තෙන ඛො පන සමයෙන චිත්තො ගහපති මිගපථකං අනුප්පත්තො හොති කෙනචිදෙව කරණීයෙන, අස්සොසි ඛො චිත්තො ගහපති සම්බහුලානං කිර ථෙරානං භික්ඛූනං පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තානං මණ්ඩලමාළෙ සන්නිසින්නානං සන්නිපතිතානං අයමන්තරාකථා උදපාදි: "සඤ්ඤොජනන්ති වා ආවුසො සඤ්ඤොජනියා ධම්මාති වා ඉමෙ ධම්මා නානත්ථා නානාව්‍යඤ්ජනා, උදාහු එකත්ථා ව්‍යඤ්ජනමෙව නානන්ති? තත්‍රෙකච්චෙහි ථෙරෙහි භික්ඛූහි එවං ව්‍යාකතං: සඤ්ඤොජනන්ති වා ආවුසො සඤ්ඤොජනියා ධම්මාති වා ඉමෙ ධම්මා නානත්ථා චෙව නානාව්‍යඤ්ජනා චා"ති එකච්චෙහි ථෙරෙහි භික්ඛූහි එවං ව්‍යාකතං: සඤ්ඤොජනන්ති වා ආවුසො සඤ්ඤොජනියා ධම්මාති වා ඉමෙ ධම්මා එකත්ථා ව්‍යඤ්ජනමෙව නානන්ති". අථ ඛො චිත්තො ගහපති යෙන ථෙරා භික්ඛූ තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ථෙරෙ භික්ඛූ අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො චිත්තො ගහපති ථෙරෙ භික්ඛූ එතදවොච:

1. වාවුසො - සී 1 යසා

# 7. චිත්තසංයුත්තය

## 1. චිත්ත වර්ගය

### 7. 1. 1

### සංයෝජන සූත්‍රය

405. එක්කලෙක බොහෝ ස්ථවිර භික්ෂූහු මච්ඡිකාසණ්ඩ වන ලැහැබෙහි අම්බාටක වනයෙහි වැඩවෙසෙති. එකල්හි පසුබත පිණ්ඩපාතයෙන් වැළකුණු මණ්ඩලමාලයෙ (රැස්වීම් හලෙ)හි රැස් ව වැඩහුන් ස්ථවිර භික්ෂූන් අතර මේ අතුරුකථාව පහළවිය: ඇවැත්නි, සංයෝජන ය යි හෝ සංයෝජනිය ධර්මයෝ ය යි හෝ මේ දහම්හු වෙනස් වෙනස් අර්‍ථ ඇත්තාහු වෙනස් වෙනස් ව්‍යඤ්ජන ඇත්තාහු ද? නැතහොත් එක ම අර්‍ථ ඇත්තාහු ව්‍යඤ්ජන පමණක් වෙනස් වූවාහු ද? යි.

එහි ඇතැම් ස්ථවිර භික්ෂූන් විසින් "ඇවැත්නි, සංයොජන ය යි හෝ සංයොජනිය ධර්මයෝ ය යි හෝ මේ දහම්හු වෙනස් වෙනස් අර්‍ථ ඇත්තාහු ද වෙනස් වෙනස් ව්‍යඤ්ජන ඇත්තාහු ද වෙති" යි මෙසේ විසඳන ලද්දේ වෙයි. ඇතැම් ස්ථවිර භික්ෂූන් විසින් "ඇවැත්නි, සංයෝජන ය යි හෝ සංයෝජනිය ධර්මයෝ ය යි හෝ මේ දහම්හු එක ම අර්‍ථ ඇත්තාහු ව්‍යඤ්ජන පමණක් වෙනස් වූවාහු වෙති" යි. මෙසේ විසඳන ලද්දේ වෙයි.

එසමයෙහි චිත්ත ගැහැවි කිසියම් කටයුත්තක් නිමිති කොට මිගපථක ගමට පැමිණියේ වෙයි. චිත්ත ගැහැවි පසුබත පිණ්ඩපාතයෙන් වැළකුණු මණ්ඩලමාලයෙහි රැස් ව වැඩහුන් ස්ථවිර භික්ෂූන් අතර "ඇවැත්නි, සංයෝජන ය යි හෝ සංයෝජනිය ධර්මයෝ ය යි හෝ මේ දහම්හු වෙනස් වෙනස් අර්‍ථ ඇත්තාහු ද වෙනස් වෙනස් ව්‍යඤ්ජන ඇත්තාහු ද වෙද්ද, නැතහොත් එක ම අර්‍ථ ඇත්තාහු ද ව්‍යඤ්ජන පමණක් වෙනස් වූවාහු ද වෙත් ද? යි. මේ අතුරු කථාව පහළවී ය" යි ද එහි ඇතැම් ස්ථවිර භික්ෂූන් විසින් ඇවැත්නි, සංයෝජනය යි හෝ සංයෝජනිය ධර්මයෝ ය යි හෝ මේ දහම්හු වෙනස් වෙනස් අර්‍ථ ඇත්තාහු ද වෙනස් වෙනස් ව්‍යඤ්ජන ඇත්තාහු ද වෙති යි මෙසේ විසඳන ලද යි ද, ඇතැම් ස්ථවිර භික්ෂූන් විසින් ඇවැත්නි, සංයෝජන ය යි හෝ සංයෝජනිය ධර්මයෝ ය යි හෝ මේ දහම්හු එක ම අර්‍ථ ඇත්තාහු ව්‍යඤ්ජන පමණක් වෙනස් වූවාහු වෙති යි මෙසේ විසඳන ලද යි ද, ඇසුයේ ම ය. එකල්හි චිත්ත ගැහැවි ස්ථවිර භික්ෂූන් වෙත එළඹියේ ය. එළඹ ස්ථවිර භික්ෂූන් වැඳ එකත්පස් ව හුන්නේ ය. එකත්පස් ව හුන් චිත්ත ගැහැවි ස්ථවිර භික්ෂූන්ට මෙය කී ය:

සුතං මෙතං භන්තෙ සම්බහුලානං කිර ථෙරානං භික්ඛූනං පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තානං මණ්ඩලමාලෙ සන්නිසින්නානං සන්නිපතිතානං අයමන්තරාකථා උදපාදි: "සඤ්ඤොජනන්ති වා ආවුසො සඤ්ඤොජනියා ධම්මාති වා ඉමෙ ධම්මා නානත්ථා නානාබ්‍යඤ්ජනා? උදාහු එකත්ථා බ්‍යඤ්ජනමෙව නානන්ති? එකච්චෙහි ථෙරෙහි භික්ඛූහි එවං බ්‍යාකතං: සඤ්ඤොජනන්ති වා ආවුසො සඤ්ඤොජනියා ධම්මාති වා ඉමෙ ධම්මා නානත්ථා චෙව නානාබ්‍යඤ්ජනා චාති. එකච්චෙහි ථෙරෙහි භික්ඛූහි එවං බ්‍යාකතං: සඤ්ඤොජනන්ති වා ආවුසො සඤ්ඤොජනියා ධම්මාති වා ඉමෙ ධම්මා එකත්ථා බ්‍යඤ්ජනමෙව නානන්ති". එවං ගහපතීති.

සඤ්ඤොජනන්ති වා භන්තෙ සඤ්ඤොජනියා ධම්මාති වා ඉමෙ ධම්මා නානත්ථා චෙව නානා බ්‍යඤ්ජනා ච. තෙනහි භන්තෙ උපමං වො කරිස්සාමි, උපමායපිධෙකච්චෙ විඤ්ඤූ පුරිසා භාසිතස්ස අත්ථං ආජානන්ති. සෙය්‍යථාපි භන්තෙ කාළො ච බලිවද්දො ඔදාතො ච බලිවද්දො එකෙන දාමෙන වා යොත්තෙන වා සඤ්ඤුත්තා අස්සු, යො නු ඛො එවං වදෙය්‍ය: කාළො බලිවද්දො ඔදාතස්ස බලිවද්දස්ස සඤ්ඤොජනං, ඔදාතො ච[1] බලිවද්දො කාළස්ස බලිවද්දස්ස සඤ්ඤොජනන්ති සම්මා නු ඛො වදමානො වදෙය්‍යාති? නො හෙතං ගහපති.

න ඛො ගහපති කාළො බලිවද්දො ඔදාතස්ස බලිවද්දස්ස සඤ්ඤොජනං, නපි ඔදාතො බලිවද්දො කාළස්ස බලිවද්දස්ස සඤ්ඤොජනං, යෙන ච ඛො තෙ එකෙන දාමෙන වා යොත්තෙන වා සඤ්ඤුත්තා තං තත්ථ සඤ්ඤොජනන්ති. එවමෙව ඛො භන්තෙ, න චක්ඛු රූපානං සඤ්ඤොජනං, න රූපා චක්ඛුස්ස සඤ්ඤොජනං, යඤ්ච තත්ථ තදුභයං පටිච්ච උප්පජ්ජති ඡන්දරාගො තං තත්ථ සඤ්ඤොජනං.

න සොතං සද්දානං සඤ්ඤොජනං, න සද්දා සොතස්ස සඤ්ඤොජනං. යඤ්ච තත්ථ තදුභයං පටිච්ච උප්පජ්ජති ඡන්දරාගො තං තත්ථ සඤ්ඤොජනං; න ඝානං ගන්ධානං සඤ්ඤොජනං, න ගන්ධා ඝානස්ස සඤ්ඤොජනං, යඤ්ච තත්ථ තදුභයං පටිච්ච උප්පජ්ජති ඡන්දරාගො තං තත්ථ සඤ්ඤොජනං. න ජිව්හා රසානං සඤ්ඤොජනං, න රසා ජිව්හාය සඤ්ඤොජනං, යඤ්ච තත්ථ තදුභයං පටිච්ච උප්පජ්ජති ඡන්දරාගො තං තත්ථ සඤ්ඤොජනං. න කායො ඵොට්ඨබ්බානං සඤ්ඤොජනං, න ඵොට්ඨබ්බා කායස්ස සඤ්ඤොජනං, යඤ්ච තත්ථ තදුභයං පටිච්ච උප්පජ්ජති ඡන්දරාගො තං තත්ථ සඤ්ඤොජනං. න මනො ධම්මානං සඤ්ඤොජනං, න ධම්මා මනස්ස සඤ්ඤොජනං යඤ්ච තත්ථ තදුභයං පටිච්ච උප්පජ්ජති ඡන්දරාගො තං තත්ථ සඤ්ඤොජනන්ති. ලාභා තෙ ගහපති සුලද්ධං තෙ ගහපති, යස්ස තෙ ගම්භීරෙ බුද්ධවචනෙ පඤ්ඤාචක්ඛු කමතීති.

---

1 ඔදාතො - ස්‍යා, සී, 1, මජ්සං

"වහන්ස, පසුබත පිණ්ඩපාතයෙන් වැළකුණු මණ්ඩලමාලයෙහි රැස් ව වැඩහුන් ස්ථවිර භික්ෂූන් අතර "ඇවැත්නි, සංයෝජන ය යි හෝ සංයෝජනීය ධර්මයෝ ය යි හෝ මේ දහම්හු වෙනස් වෙනස් අර්ථ ඇත්තාහු ද වෙනස් වෙනස් ව්‍යඤ්ජන ඇත්තාහු ද වෙද්ද? නැතහොත් එක ම අර්ථ ඇත්තාහු ව්‍යඤ්ජන පමණක් වෙනස් වූවාහු වෙත් ද? යි මේ අතුරු කථාව පහළවී ය යි ද ඇතැම් ස්ථවිර භික්ෂූන් විසින් ඇවැත්නි, සංයෝජන යයි හෝ සංයෝජනීය ධර්මයෝ ය යි හෝ මේ දහම්හු වෙනස් වෙනස් අර්ථ ඇත්තාහු ද වෙනස් වෙනස් ව්‍යඤ්ජන ඇත්තාහු ද වෙති"යි මෙසේ විසඳන ලද්දු යි ද "ඇතැම් ස්ථවිර භික්ෂූන් විසින් ඇවැත්නි, සංයෝජන ය යි හෝ සංයෝජනීය ධර්මයෝ ය යි හෝ මේ දහම්හු එක ම අර්ථ ඇත්තාහු ව්‍යඤ්ජන පමණක් වෙනස් වූවාහු වෙති" යි මෙසේ විසඳන ලද්දු යි ද මා විසින් මෙය අසන ලද්දේ" යි. ගැහැවි, එසේ ය යි.

"වහන්ස, සංයෝජන ය යි හෝ සංයෝජනීය ධර්මයෝ ය"යි හෝ මේ දහම්හු වෙනස් වෙනස් අර්ථ ඇත්තාහු ද වෙනස් වෙනස් ව්‍යඤ්ජන ඇත්තාහු ද වෙති. වහන්ස, එසේ වී නම් මුඹ වහන්සේට උපමාවක් කරන්නෙමි: මෙහි ඇතැම් නුවණැති මිනිස්සු උපමාවෙන් ද දේශනාවේ අරුත දනගනිත්. වහන්ස, යම්සේ කළුගොනෙකුත් සුදු ගොනෙකුත් එක් දමෙකින් හෝ එක් යොතෙකින් හෝ බඳනා ලද්දහු වෙද්ද, කළු ගොන් සුදු ගොනුගේ බැඳුම ය. සුදුගොන් කළු ගොනුගේ බැඳුම ය යි යමෙක් මෙසේ කියන්නේ නම් (ඒ) කියන්නා මැනවින් කියන්නේ දැ යි. ගැහැවි, මෙය නො වේ ම ය.

ගැහැවි, කළු ගොන් සුදු ගොනුගේ බැඳුම නො වේ. සුදු ගොන් කළුගොනුගේ බැඳුම නො ද වේ. යම් එක් දමෙකින් හෝ යොතෙකින් හෝ ඔහු බඳනා ලද්දහු වෙත් නම් ඒය එහි සංයෝජන යි. වහන්ස, එසෙයින් ම ඇස රූපයනට සංයෝජන නො වේ. රූපයෝ ඇසට සංයෝජන නො වෙති. එහි දෙක නිසා යම් ඡන්දරාගයෙක් උපදී නම් එය එහි සංයෝජන යි.

කන සදට සංයෝජනය නො වේ. සද කනට සංයෝජන නො වේ. එහි එදෙක නිසා යම් ඡන්දරාගයෙක් උපදී නම් එය එහි සංයෝජන යි. නැහැය ගඳට සංයෝජන නො වේ. ගඳ නැහැයට සංයෝජන නො වේ. එහි එදෙක නිසා යම් ඡන්දරාගයෙක් උපදී නම් එය එහි සංයෝජන යි. දිව රසට සංයෝජන නො වේ. රස දිවට සංයෝජන නො වේ. එහි එදෙක නිසා යම් ඡන්දරාගයෙක් උපදී නම් ඒය එහි සංයෝජන යි. කය පහසට සංයෝජන නො වේ. පහස කයට සංයෝජන නො වේ. එහි ඒදෙක නිසා යම් ඡන්දරාගයෙක් උපදී නම් එහි සංයෝජන යි. සිත දහමට සංයෝජන නො වේ. දහම් සිතට සංයෝජන නො වේ. එහි ඒදෙක නිසා යම් ඡන්දරාගයෙක් උපදී නම් එය එහි සංයෝජන යි. ගැහැවි, යම්බඳු තොපගේ පැනැය ගැඹුරු බුදුවදනෙහි පවතී ද ඒ තොපට ලාභයෙකි. ගැහැවි, තොපට මනා ලැබීමෙකි යි.

# 7. 1. 2

## ඉසිදත්තසුත්තං

406. එකං සමයං සම්බහුලා ථෙරා භික්ඛූ **මච්ඡිකාසණ්ඩෙ** විහරන්ති **අම්බාටකවනෙ**. අථ ඛො **චිත්තො ගහපති** යෙන ථෙරා භික්ඛූ තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ථෙරෙ භික්ඛූ අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො චිත්තො ගහපති. ථෙරෙ භික්ඛූ එතදවොච: "අධිවාසෙන්තු මෙ භන්තෙ ථෙරා ස්වාතනාය භත්තන්ති" අධිවාසෙසුං ච ඛො ථෙරා භික්ඛූ තුණ්හීභාවෙන. අථ ඛො චිත්තො ගහපති ථෙරානං භික්ඛූනං අධිවාසනං විදිත්වා උට්ඨායාසනා ථෙරෙ භික්ඛූ අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

අථ ඛො ථෙරා භික්ඛූ තස්සා රත්තියා අච්චයෙන පුබ්බන්හ සමයං නිවාසෙත්වා පත්තචීවරමාදය යෙන චිත්තස්ස ගහපතිනො නිවෙසනං තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදිංසු. අථ ඛො චිත්තො ගහපති යෙන ථෙරා භික්ඛූ තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ථෙරෙ භික්ඛූ අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො චිත්තො ගහපති ආයස්මන්තං ථෙරං එතදවොච:

ධාතුනානත්තං ධාතුනානත්තන්ති භන්තෙ ථෙර වුච්චති, කිත්තාවතා නු ඛො භන්තෙ ධාතුනානත්තං වුත්තං භගවතාති? එවං වුත්තෙ ආයස්මා ථෙරො තුණ්හී අහොසි. දුතියම්පි ඛො චිත්තො, ගහපති ආයස්මන්තං ථෙරං එතදවොච: ධාතුනානත්තං ධාතුනානත්තන්ති භන්තෙ ථෙර වුච්චති කිත්තාවතා නු ඛො භන්තෙ ධාතුනානත්තං වුත්තං භගවතාති දුතියම්පි ඛො ආයස්මා ථෙරො තුණ්හී අහොසි. තතියම්පි ඛො චිත්තො ගහපති ආයස්මන්තං ථෙරං එතදවොච: ධාතුනානත්තං ධාතුනානත්තන්ති භන්තෙ ථෙර වුච්චති, කිත්තාවතා නු ඛො භන්තෙ ධාතුනානත්තං වුත්තං භගවතාති? තතියම්පි ඛො ආයස්මා ථෙරො තුණ්හී අහොසි.

තෙන ඛො පන සමයෙන ආයස්මා ඉසිදත්තො තස්මිං භික්ඛුසඞ්ඝෙ සබ්බනවකො හොති. අථ ඛො ආයස්මා ඉසිදත්තො ආයස්මන්තං ථෙරං එතදවොච: ව්‍යාකරොමහං භන්තෙ ථෙර චිත්තස්ස ගහපතිනො එතං පඤ්හන්ති? ව්‍යාකරොහි ත්වං ආවුසො ඉසිදත්ත චිත්තස්ස ගහපතිනො එතං පඤ්හන්ති.

එවං හි ත්වං ගහපති පුච්ඡසි: ධාතුනානත්තං ධාතුනානත්තන්ති භන්තෙ ථෙර වුච්චති. කිත්තාවතා නු ඛො භන්තෙ ධාතුනානත්තං වුත්තං භගවතාති? එවං භන්තෙ. ඉදං ඛො ගහපති ධාතුනානත්තං වුත්තං භගවතා: චක්ඛුධාතු රූපධාතු චක්ඛුවිඤ්ඤාණධාතු, සොතධාතු සද්දධාතු සොතවිඤ්ඤාණධාතු, ඝානධාතු ගන්ධධාතු ඝානවිඤ්ඤාණධාතු, ජිව්හාධාතු රසධාතු ජිව්හාවිඤ්ඤාණධාතු, කායධාතු ඵොට්ඨබ්බධාතු කායවිඤ්ඤාණධාතු, මනොධාතු ධම්මධාතු මනොවිඤ්ඤාණධාතු. එත්තාවතා ඛො ගහපති ධාතුනානත්තං වුත්තං භගවතාති.

## 7. 1. 2

## ඉසිදත්ත සූත්‍රය

406. එක්කලෙක බොහෝ ස්ථවිර භික්ෂූහු **මච්ඡිකාසණ්ඩයෙහි අම්බාටක වනයෙහි** වැඩවෙසෙති. එකල්හි **චිත්ත** ගෘහපති තෙමේ ස්ථවිර භික්ෂූන් වෙත එළඹියේ ය. එළඹ ස්ථවිර භික්ෂූන් වැඳ එකත්පස් ව හුන්නේ ය. එකත්පස් ව හුන් චිත්‍ත ගෘහපති ස්ථවිර භික්ෂූන්ට "වහන්ස, ස්ථවිර භික්ෂූහු සෙට පිණිස මාගේ බත ඉවසත්වා" යි මෙය කී ය. ස්ථවිර භික්ෂූහු නිශ්ශබ්ද භාවයෙන් ඉවසූහ. එකල්හි චිත්‍ත ගෘහපති ස්ථවිර භික්ෂූන්ගේ ඉවසීම දැන හුනස්නෙන් නැඟිට ස්ථවිර භික්ෂූන් වැඳ පැදකුණු කොට ගියේ ය.

ඉක්බිති ස්ථවිර භික්ෂූහු ඒ රැය ගෙවීමෙන් පෙරවරු හැඳ පෙරව පා සිවුරු ගෙන චිත්‍ත ගෘහපතිහුගේ නිවස වෙත එළඹියහ. එළඹ පැන වූ අසුන්හි වැඩහුන්හ. එකල්හි චිත්‍ත ගෘහපති ස්ථවිර භික්ෂූන් වෙත එළඹියේ ය. එළඹ ස්ථවිර භික්ෂූන් වැඳ එකත්පස් ව හුන්නේ ය. එකත් පස් ව හුන් චිත්‍ත ගෘහපති ආයුෂ්මත් තෙරුන්ට මෙය කීය:

වහන්ස, තෙරණුවනි, ධාතුනානාත්වය ධාතුනානාත්වය යි කියනු ලැබේ. වහන්ස, කොපමණකින් ධාතුනානාත්වය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද්දේ දැ? යි මෙසේ කී කල්හි ආයුෂ්මත් තෙරණුවෝ නිශ්ශබ්ද වූහ. දෙවනවට ද චිත්‍ත ගෘහපති ආයුෂ්මත් තෙරුන්ට මෙය කී ය: වහන්ස, තෙරණුවනි, ධාතුනානාත්වය ධාතුනානාත්වයයි කියනු ලැබේ. වහන්ස, කොපමණකින් ධාතු-නානාත්වය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද්දේ දැ? යි. දෙවනවට ද ආයුෂ්මත් තෙරණුවෝ නිශ්ශබ්ද වූහ. තෙවනවට ද චිත්ත ගෘහපති ආයුෂ්මත් තෙරුන්ට මෙය කී ය: වහන්ස, තෙරණුවනි, ධාතුනානාත්වය ධාතුනානාත්වය යි කියනු ලැබේ. වහන්ස, කොපමණකින් ධාතුනානාත්වය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද්දේ දැ? යි. තෙවනවට ද ආයුෂ්මත් තෙරණුවෝ නිශ්ශබ්ද වූහ.

එසමයෙහි ආයුෂ්මත් **ඉසිදත්ත** තෙරණුවෝ ඒ භික්සඝන අතර සියල්ලන් ට නවක වෙති. ඉක්බිති ආයුෂ්මත් ඉසිදත්ත ආයුෂ්මත් තෙරුනට මෙය කී ය: වහන්ස, තෙරණුවනි, චිත්තගෘහපති-හුගේ මේ පැනය මම විසඳම් දැ? යි. ඇවැත්නි ඉසිදත්තයෙනි, චිත්‍ත ගෘහපතිහුගේ මේ පැනය තෙපි විසඳව යි.

ගෘහපති, තෙපි "වහන්ස තෙරණුවනි, ධාතුනානාත්වය ධාතු-නානාත්වයයි කියනු ලැබේ. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් කෙතෙකින් ධාතුනානාත්වය වදාරන ලද්දේ දැ" යි මෙසේ විචාරවු දැ? යි. වහන්ස, එසේ ය. ගෘහපති, භාග්‍යවතුන් වහන්සේ විසින් මේ ධාතුනානාත්වය වදාරන ලදී. චක්ඛුධාතු ය රූපධාතු ය චක්ඛුවිඤ්ඤාණ-ධාතු ය, සොතධාතු ය සද්දධාතු ය සොතවිඤ්ඤාණධාතු ය, ඝානධාතු ය ගන්ධධාතු ය ඝානවිඤ්ඤාණධාතු ය, ජිව්හාධාතු ය රසධාතු ය ජිව්හාවිඤ්ඤාණධාතු ය, කායධාතු ය ඵොට්ඨබ්බධාතු ය, කායවිඤ්ඤාණධාතු ය, මනොධාතු ය ධම්මධාතු ය මනොවිඤ්ඤාණ-ධාතු යයි. ගෘහපති, භාග්‍යවතුන් වහන්සේ විසින් ධාතුනානාත්වය මෙතෙකින් වදාරන ලද්දේ ය යි.

අථ ඛො චිත්තො ගහපති ආයස්මතො ඉසිදත්තස්ස භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා ථෙරෙ භික්ඛූ පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙසි, සම්පවාරෙසි. අථ ඛො ථෙරා භික්ඛූ භුත්තාවිනො ඔනීතපත්තපාණිනො උට්ඨායාසනා පක්කමිංසු. අථ ඛො ආයස්මා ථෙරො ආයස්මන්තං ඉසිදත්තං එතදවොච: සාධු ඛො තං[1] ආවුසො ඉසිදත්ත එසො පඤ්හො පටිභාසි[2], නෙසො පඤ්හො මං පටිභාසි, තෙනහාවුසො[3] ඉසිදත්ත යදා අඤ්ඤදපි[4] එවරූපො පඤ්හො ආගච්ඡෙය්‍ය තංයෙවෙත්ථ පටිභාසෙය්‍යාති[5]

## 7. 1. 3

## දුතියඉසිදත්තසුත්තං

407. එකං සමයං සම්බහුලා ථෙරා භික්ඛූ මච්ඡිකාසණ්ඩෙ විහරන්ති අම්බාටකවනෙ, අථ ඛො **චිත්තො ගහපති** යෙන ථෙරා භික්ඛූ තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ථෙරෙ භික්ඛූ අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො චිත්තො ගහපති ථෙරෙ භික්ඛූ එතදවොච: අධිවාසෙන්තු මෙ භන්තෙ ථෙරා ස්වාතනාය භත්තන්ති. අධිවාසෙසුං ඛො ථෙරා භික්ඛූ තුණ්හීභාවෙන. අථ ඛො චිත්තො ගහපති ථෙරානං භික්ඛූනං අධිවාසනං විදිත්වා උට්ඨායාසනා ථෙරෙ භික්ඛූ අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

අථ ඛො ථෙරා භික්ඛූ තස්සා රත්තියා අච්චයෙන පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන චිත්තස්ස ගහපතිස්ස නිවෙසනං තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදිංසු. අථ ඛො චිත්තො ගහපති යෙන ථෙරා භික්ඛූ තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ථෙරෙ භික්ඛූ අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො චිත්තො ගහපති ආයස්මන්තං ථෙරං එතදවොච:

යා ඉමා භන්තෙ ථෙර අනෙකවිහිතා දිට්ඨියො ලොකෙ උප්පජ්ජන්ති: සස්සතො ලොකො,ති වා, අසස්සතො ලොකොති,වා, අන්තවා ලොකො,ති වා අනන්තවා ලොකො,ති වා, තං ජීවං තං සරීර,න්ති වා, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීර,න්ති වා, හොති තථාගතො පරම්මරණාති වා, න හොති තථාගතො පරම්මරණා,ති වා, හොති ච න ච හොති තථාගතො පරම්මරණාති වා, නෙව හොති න න හොති තථාගතො පරම්මරණා,ති වා, යානිචිමානි ද්වාසට්ඨිදිට්ඨිගතානි බ්‍රහ්මජාලෙ භණිතානි. ඉමා නු ඛො භන්තෙ දිට්ඨියො කිස්මිං සති හොන්ති කිස්මිං අසති න හොන්තීති?

1. තං - සබ්බත්ථ
2. අභාසි - සී. 1, 2.
3. තෙන ආවුසො - සීමු, සී 1, 2
4. අඤ්ඤදාපි-මජසං, ස්‍යා
5. භාසෙය්‍යාසීති-සී 1, 2 භාසෙය්‍යාසීති-ස්‍යා

ඉක්බිති චිත්ත ගැහැවි ආයුෂ්මත් ඉසිදත්ත තෙරුන්ගේ දේශනාව පිළිගෙන අනුමෝදන් ව ස්ථවිර භික්ෂූන් ප්‍රණීත වූ කැයුතු දැයින් ද බීදිය යුතු දැයින් ද සියතින් සැතැප්පී ය මැනවින් පැවරී ය. ඉක්බිති ස්ථවිර භික්ෂූහු වැළඳුවාහු පාත්‍රයෙන් ඉවත් කළ අත් ඇත්තාහු හුනස්නෙන් නැඟී වැඩියහ. එකල්හි ආයුෂ්මත් තෙරණුවෝ ආයුෂ්මත් ඉසිදත්තහට මෙය කීහ: ඇවැත්නි, ඉසිදත්තයෙනි, මේ ප්‍රශ්නය තොපට මැනවින් වැටහුණේ ය. මේ ප්‍රශ්නය මට නො වැටහුණේ ය. ඇවැත්නි, ඉසිදත්තයෙනි, එසේ වී නම් යම් අන් කලෙක්හි දු මෙබඳු ප්‍රශ්නයක් එන්නේ නම් එහි ලා තොපට ම වැටහෙන්නේ ය යි.

## 7. 1. 3

## දුතිය ඉසිදත්ත සූත්‍රය

407. එක්කලෙක බොහෝ ස්ථවිර භික්ෂූහු මච්ඡිකාසණ්ඩයෙහි අම්බාටක වනයෙහි වැඩවෙසෙති. එකල්හි **චිත්ත ගැහැවි** තෙමේ ස්ථවිර භික්ෂූන් වෙත එළඹියේ ය. එළඹ ස්ථවිර භික්ෂූන් වැඳ එකත් පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් චිත්ත ගැහැවි ස්ථවිර භික්ෂූන්ට මෙය කී ය: වහන්ස, තෙරහු හෙට පිණිස වූ මාගේ බත ඉවසත්වා යි. ස්ථවිර භික්ෂූහු නිශ්ශබ්ද භාවයෙන් ඉවසූහ. එකල්හි චිත්ත ගැහැවි ස්ථවිර භික්ෂූන්ගේ ඉවසීම දැන හුනස්නෙන් නැඟී ස්ථවිර භික්ෂූන් වැඳ පැදකුණු කොට ගියේ ය.

ඉක්බිති ස්ථවිර භික්ෂූහු ඒ රැය ඇවෑමෙන් පෙරවරු හැඳ පෙරව පා සිවුරු ගෙන චිත්ත ගැහැවිහුගේ නිවෙස්නට එළඹියහ. එළඹ පැනවූ අසුන්හි හුන්හ. එකල්හි චිත්ත ගැහැවි ස්ථවිර භික්ෂූන් වෙත එළඹියේ ය. එළඹ ස්ථවිර භික්ෂූන් වැඳ එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් චිත්ත ගැහැවි ආයුෂ්මත් තෙරුන්ට මෙය කීය:

වහන්ස තෙරණුවනි, "ලෝකය ශාස්වත ය යි හෝ ලෝකය අශාස්වත ය යි හෝ ලෝකය අන්තවත් ය යි හෝ ලෝකය අන්තරහිත ය යි හෝ එ ම ජීව ය එ ය ම ශරීර ය යි හෝ ජීවය අනිකෙක ශරීරය අනිකකැ යි හෝ සත්ත්වයා මරණින් මතු වේ යයි හෝ සත්ත්වයා මරණින් මතු නො වේ යයි හෝ සත්ත්වයා මරණින් මතු වෙයි නො ද වේ යයි හෝ සත්ත්වයා මරණින් මතු නො ම වෙයි නො ම නො වේ"ය යි හෝ යම් මේ නන්වැදෑරුම් දිටුහු ලොව උපදිද් ද, යම් මේ දෙසැට මිසදිටු කෙනෙකුත් බ්‍රහ්මජාල සූත්‍රයෙහි වදරන ලද්දාහු ද, වහන්ස, මේ දිටුහු කුමක් ඇති කල්හි වෙත් ද? කුමක් නැති කල්හි නො වෙද්ද? යි.

එවං වුත්තෙ ආයස්මා ථෙරො තුණ්හී අහොසි. දුතියම්පි ඛො චිත්තො ගහපති -පෙ- තතියම්පි ඛො චිත්තො ගහපති ආයස්මන්තං ථෙරං එතදවොච: යා ඉමා භන්තෙ ථෙර අනෙකවිහිතා දිට්ඨියො ලොකෙ උප්පජ්ජන්ති. සස්සතො ලොකොති වා, අසස්සතො ලොකොති වා අන්තවා ලොකොති වා, අනන්තවා ලොකොති වා, තං ජීවං තං සරීරන්ති වා, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා, හොති තථාගතො පරම්මරණාති වා න හොති තථාගතො පරම්මරණාති වා, හොති ච න ච හොති තථාගතො පරම්මරණාති වා, නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වා යානිචිමානි ද්වාසට්ඨිදිට්ඨිගතානි බ්‍රහ්මජාලෙ භණිතානි. ඉමා නු ඛො භන්තෙ දිට්ඨියො කිස්මිං සති හොන්ති, කිස්මිං අසති න හොන්තීති? තතියම්පි ඛො ආයස්මා ථෙරො තුණ්හී අහොසි.

තෙන ඛො පන සමයෙන ආයස්මා ඉසිදත්තො තස්මිං භික්ඛුසඞ්ඝෙ සබ්බනවො හොති. අථ ඛො ආයස්මා ඉසිදත්තො ආයස්මන්තං ථෙරං එතදවොච: ව්‍යාකරොමහං භන්තෙ ථෙර චිත්තස්ස ගහපතිනො එතං පඤ්හන්ති? ව්‍යාකරොහි ත්වං ආවුසො ඉසිදත්ත චිත්තස්ස ගහපතිනො එතං පඤ්හන්ති. එවං ත්වං ගහපති පුච්ඡසි: යා ඉමා භන්තෙ ථෙර අනෙකවිහිතා දිට්ඨියො ලොකෙ උප්පජ්ජන්ති: සස්සතො ලොකොති වා -පෙ- ඉමා නු ඛො භන්තෙ දිට්ඨියො කිස්මිං සති හොන්ති කිස්මිං අසති න හොන්තීති? එවං භන්තෙ.

යා ඉමා ගහපති අනෙකවිහිතා දිට්ඨියො ලොකෙ උප්පජ්ජන්ති: සස්සතො ලොකොති වා, අසස්සතො ලොකොති වා, අන්තවා ලොකොති වා, අනන්තවා ලොකොති වා, තං ජීවං තං සරීරන්ති වා, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා, හොති තථාගතො පරම්මරණාති වා, න හොති තථාගතො පරම්මරණාති වා, හොති ච න ච හොති තථාගතො පරම්මරණාති වා, නෙව හොති න නහොති තථාගතො පරම්මරණාති වා, යානිචිමානි ද්වාසට්ඨි දිට්ඨිගතානි බ්‍රහ්මජාලෙ භණිතානි. ඉමා ඛො ගහපති දිට්ඨියො සක්කාය දිට්ඨියා සති හොන්ති සක්කාය දිට්ඨියා අසති න හොන්තීති.

කථම්පන භන්තෙ සක්කාය දිට්ඨි හොතීති? ඉධ ගහපති අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො රූපං අත්තතො සමනුපස්සති, රූපවන්තං වා අත්තානං, අත්තනි වා රූපං, රූපස්මිං වා අත්තානං; වෙදනං අත්තතො සමනුපස්සති -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, විඤ්ඤාණවන්තං වා අත්තානං, අත්තනි වා විඤ්ඤාණං, විඤ්ඤාණස්මිං වා අත්තානං; එවං ඛො ගහපති සක්කායදිට්ඨි හොතීති.

මෙසේ කී කල්හි ආයුෂ්මත් තෙරණුවෝ නිශ්ශබ්ද වූහ. දෙවනවට දු චිත්තගැහැවි තෙමේ ... තෙවනවටදු චිත්තගැහැවි තෙමේ ආයුෂ්මත් තෙරුන්ට මෙය කී ය: වහන්ස තෙරණුවනි, "ලෝකය ශාස්වත යයි හෝ ලෝකය අශාස්වත යයි හෝ ලෝකය අන්තවත් යයි හෝ ලෝකය අන්ත රහිත යයි හෝ එය ම ජීවය එය ම ශරීරය යි හෝ ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැ යි හෝ සත්ත්වයා මරණින් මතු වේ යයි හෝ සත්ත්වයා මරණින් මතු නො වේ යයි හෝ සත්ත්වයා මරණින් මතු වෙයි නො ද වේ යයි හෝ සත්ත්වයා මරණින් මතු නො ම වෙයි නො ම නො වේ යයි" හෝ යම් මේ නන් වැදෑරුම් දිට්ඨිහු නූපදිද් ද? යම් මේ දෙසැට මිසදිටු කෙනෙකුත් බ්‍රහ්මජාල සූත්‍රයෙහි වදරන ලද්දාහු ද, වහන්ස, මේ දිට්ඨිහු කුමක් ඇතිකල්හි වෙත් ද? කුමක් නැති කල්හි නො වෙද්ද? යි තෙවනවට දු ආයුෂ්මත් තෙරණුවෝ නිශ්ශබ්ද වූහ.

එසමයෙහි ආයුෂ්මත් ඉසිදත්ත තෙරණුවෝ ඒ භික්සඝන කෙරෙහි සියල්ලන්ට නවක වෙති. එකල්හි ආයුෂ්මත් ඉසිදත්ත තෙරණුවෝ ආයුෂ්මත් තෙරුන්ට මෙය කිහ: වහන්ස තෙරණුවනි, චිත්ත ගැහැවිහුගේ මේ පැනය මම විසඳම් ද? යි: ඇවැත්නි ඉසිදත්තයෙනි, චිත්ත ගැහැවිහු ගේ මේ පැනය තෙපි විසඳුව යි. ගැහැවි, තෙපි "වහන්ස, තෙරණුවනි, ලෝකය ශාස්වත යයි හෝ ... යම් මේ නන්වැදෑරුම් දිට්ඨිහු ලොව උපදිද් ද? වහන්ස, මේ දිට්ඨිහු කුමක් ඇති කල්හි වෙත් ද? කුමක් නැති කල්හි නො වෙත් දැ යි? මෙසේ විචාරවු දැ යි. වහන්ස, එසේ ය.

ගැහැවිය, ලෝකය ශාස්වත යයි හෝ ලෝකය අශාස්වත යයි හෝ ලෝකය අන්තවත් යයි හෝ ලෝකය අන්ත රහිතය යි හෝ එ ම ජීවය එ ම ශරීරය යි හෝ ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැ යි හෝ සත්ත්වයා මරණින් මතු වේ යයි හෝ සත්ත්වයා මරණින් මතු නො වේ යයි හෝ සත්ත්වයා මරණින් මතු වෙයි නොද වේ යයි හෝ සත්ත්වයා මරණින් මතු නො ම වෙයි නො ම නො වේ යයි හෝ යම් මේ නන්වැදෑරුම් දිට්ඨිහු ලොව උපදිද් ද, යම් මේ දෙසැට මිසදිටු කෙනෙකුත් බ්‍රහ්මජාල සූත්‍රයෙහි වදරන ලද්දාහු ද, ගැහැවිය මේ දිට්ඨිහු සක්කායදිට්ඨිය ඇතිකල්හි වෙත් සක්කායදිට්ඨිය නැති කල්හි නො වෙති යි.

වහන්ස, සක්කායදිට්ඨිය කෙසේ වේ ද? යි, ගැහැවි, මෙහි ආර්‍ය්‍යයන් නො දක්නාසුලු ආර්‍ය්‍යධර්මයෙහි අදක්ෂ වූ ආර්‍ය්‍යධර්මයෙහි නො හික්මුණු සත්පුරුෂයන් නො දක්නාසුලු සත්පුරුෂ ධර්මයෙහි අදක්ෂ වූ සත්පුරුෂ ධර්මයෙහි නො හික්මුනු අශ්‍රැවත් පෘථග්ජන තෙමේ රූපය ආත්මය යි හෝ ආත්මය රූපවත් යයි හෝ ආත්මයෙහි රූපය පවතී යයි හෝ රූපයෙහි ආත්මය පවතීය යි හෝ දකී. වේදනාව ආත්ම යයි හෝ ... දකී. සංඥාව ... සංස්කාර ... විඥානය ආත්ම යයි හෝ ආත්මය විඥානවත් යයි හෝ ආත්මයෙහි විඥානය පවතී යයි හෝ විඥානයෙහි ආත්මය පවතී යයි හෝ දකී. ගැහැවිය, මෙසේ සක්කායදිට්ඨිය වේ යි.

කථම්පන භන්තෙ සක්කායදිට්ඨි න හොතීති? ඉධ ගහපති සුතවා අරියසාවකො අරියානං දස්සාවී අරියධම්මස්ස කොවිදො අරියධම්මෙ සුවිනීතො සප්පුරිසානං දස්සාවී සප්පුරිසධම්මස්ස කොවිදො සප්පුරිසධම්මෙ සුවිනීතො න රූපං අත්තතො සමනුපස්සති, න රූපවන්තං වා අත්තානං, න අත්තනි වා රූපං, න රූපස්මිං වා අත්තානං; න වෙදනං -පෙ- න සඤ්ඤං -පෙ- න සඞ්ඛාරෙ -පෙ- න විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, න විඤ්ඤාණවන්තං වා අත්තානං, න අත්තනි වා විඤ්ඤාණං, න විඤ්ඤාණස්මිං වා අත්තානං; එවං ඛො ගහපති සක්කායදිට්ඨි න හොතීති.

කුතො භන්තෙ අය්‍යො ඉසිදත්තො ආගච්ඡතීති? අවන්තියා ඛ්වාහං ගහපති ආගච්ඡාමීති. අත්ථි භන්තෙ අවන්තියා ඉසිදත්තො නාම කුලපුත්තො අම්හාකං අදිට්ඨසහායො පබ්බජිතො දිට්ඨො සො ආයස්මතාති? එවං ගහපතීති. කහං නු ඛො සො භන්තෙ ආයස්මා එතරහි විහරතීති? එවං වුත්තෙ ආයස්මා ඉසිදත්තො තුණ්හී අහොසි. අය්‍යො නො භන්තෙ ඉසිදත්තොති? එවං ගහපතීති. අභිරමතු භන්තෙ අය්‍යො ඉසිදත්තො මච්ඡිකාසණ්ඩෙ, රමණීයං අම්බාටකවනං, අහං අය්‍යස්ස ඉසිදත්තස්ස උස්සුක්කං කරිස්සාමි චීවර-පිණ්ඩපාත-සෙනාසන ගිලානපච්චය-භෙසජ්ජපරික්ඛාරානන්ති. කල්‍යාණං වුච්චති ගහපතීති.

අථ ඛො චිත්තො ගහපති ආයස්මතො ඉසිදත්තස්ස භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා ථෙරෙ භික්ඛූ පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙසි සම්පවාරෙසි, අථ ඛො ථෙරා භික්ඛූ භුත්තාවිනො ඔනීතපත්තපාණිනො උට්ඨායාසනා පක්කමිංසු,

අථ ඛො ආයස්මා ථෙරො ආයස්මන්තං ඉසිදත්තං එතදවොච: සාධු ඛො තං ආවුසො ඉසිදත්ත එසො පඤ්හො පටිභාසි, නෙසො පඤ්හො මං පටිභාසි. තෙනහාවුසො[1] ඉසිදත්ත යද අඤ්ඤදපි එවරූපො පඤ්හො ආගච්ඡෙය්‍ය තං යෙවෙත්ථ පටිභායෙය්‍යාති අථ ඛො ආයස්මා ඉසිදත්තො සෙනාසනං සංසාමෙත්වා පත්තචීවරං ආදාය මච්ඡිකාසණ්ඩම්හා පක්කාමි, යං මච්ඡිකාසණ්ඩම්හා පක්කාමි තථා පක්කන්තොව අහොසි, න පුන පච්චාගඤ්ජීති.

1. තෙන ආවුසො - සී 1, 2

වහන්ස, කෙසේ නම් සක්කායදිට්ඨිය නො වේ ද? යි. ගැහැවිය, මෙහි ආර්‍ය්‍යයන් දක්නාසුලු ආර්‍ය්‍යධර්මයෙහි දක්ෂ වූ ආර්‍ය්‍යධර්මයෙහි හික්මුණු සත්පුරුෂයන් දක්නාසුලු සත්පුරුෂ ධර්මයෙහි දක්ෂවූ සත්පුරුෂ-ධර්මයෙහි හික්මුණු ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ රූපය ආත්මය යි නො දකී, ආත්මය රූපවත් යයි හෝ නො දකී, ආත්මයෙහි රූපය පවතී යයි හෝ නො දකී, රූපයෙහි ආත්මය පවතී යයි හෝ නො දකී. වේදනාව ... නො දකී, සංඥාව ... නො දකී, සංස්කාර ... නො දකී. විඥානය ආත්ම යයි නො දකී, ආත්මය විඥානවත් යයි හෝ නො දකී, ආත්මයෙහි විඥානය පවතී යයි හෝ නො දකී. ගැහැවිය, මෙසේ සත්කායදෘෂ්ටිය නො වේ යි.

වහන්ස, ආර්‍ය්‍ය වූ ඉසිදත්ත තෙරණුවෝ කොහි සිට වඩිද්ද? යි. ගැහැවිය, මම අවන්ති දනව්වෙන් එමි යි. වහන්ස, අපගේ නුදුටු යහළු වූ ඉසිදත්ත නම් පැවිදි කුලපුතෙක් අවන්ති දනව්වෙහි ඇත. ආයුෂ්මතුන් වහන්සේ විසින් හෙතෙමේ දක්නා ලද්දේ ද? යි. ගැහැවිය, එසේ යයි. වහන්ස, ඒ ආයුෂ්මතුන් වහන්සේ දැන් කොහි වෙසත්ද යි. මෙසේ කී කල්හි ආයුෂ්මත් ඉසිදත්ත තෙරණුවෝ නිශ්ශබ්ද වූහ. වහන්ස, ආර්‍ය්‍යයෝ අපගේ ඉසිදත්තයෝ ද? යි. ගැහැවිය, එසේ යයි. වහන්ස, ආර්‍ය්‍ය වූ ඉසිදත්ත තෙරණුවෝ මච්ඡිකාසණ්ඩයෙහි සිත් අලවා වෙසෙත සේක්වා, අම්බාටක වනය සිත්කලු ය, මම ආර්‍ය්‍ය වූ ඉසිදත්ත තෙරණුවන්ට සිවුරු පිඩුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර සැපයීමෙහි උත්සාහ කරන්නෙමි. ගැහැවිය, යහපතෙක් කියනු ලැබේ යි.

ඉක්බිති චිත්ත ගැහැවි ආයුෂ්මත් ඉසිදත්ත තෙරණුවන්ගේ දේශනාව පිළිගෙන අනුමෝදන් ව ස්ථවිර භික්ෂූන් ප්‍රණීත වූ කෑයුතු බිදිය යුතු දෑයින් සියතින් සැතැප්පී ය. මැනවින් පැවරී ය. ඉක්බිති ආයුෂ්මත් ස්ථවිර භික්ෂූහු වැළඳුවාහු පාත්‍රයෙන් ඉවත් කළ අත් ඇත්තාහු හුනස්නෙන් නැඟී වැඩියහ.

ඉන්පසු ආයුෂ්මත් තෙරණුවෝ ආයුෂ්මත් ඉසිදත්තයනට මෙය කීහ: ඇවැත්නි ඉසිදත්තයෙනි, මේ පැනය තොපට මැනවින් වැටහුණේ ය. මේ පැනය මට නො වැටහුණේ ය. ඇවැත්නි ඉසිදත්තයෙනි, එහෙයින් යම් අන්කලෙකැදු මෙබඳු පැනයෙක් එන්නේ නම් එහි ලා තොපට ම වැටහේවා යයි . ඉක්බිති ආයුෂ්මත් ඉසිදත්ත තෙරණුවෝ සෙනසුන සකසා තබා පා සිවුරු ගෙන මච්ඡිකාසණ්ඩයෙන් නික්ම ගියාහ. යම්සේ මච්ඡිකාසණ්ඩයෙන් ගියාහු ද එසේ ගියාහු ම වූහ. යළි පෙරළා නො ආහ යි.

## 7. 1. 4

## මහකසුත්තං

408. එකං සමයං සම්බහුලා ථෙරා භික්ඛූ මච්ඡිකාසණ්ඩෙ විහරති අම්බාටකවනෙ, අථ ඛො චිත්තො ගහපති යෙන ථෙරා භික්ඛූ තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ථෙරෙ භික්ඛූ අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො චිත්තො ගහපති ථෙරෙ භික්ඛූ එතදවොච: අධිවාසෙන්තු මෙ භන්තෙ ථෙරා ස්වාතනාය ගොකුලෙ භත්තන්ති, අධිවාසෙසුං ඛො ථෙරා භික්ඛූ තුණ්හීභාවෙන. අථ ඛො චිත්තො ගහපති ථෙරානං භික්ඛූනං අධිවාසනං විදිත්වා උට්ඨායාසනා ථෙරෙ භික්ඛූ අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

අථ ඛො ථෙරා භික්ඛූ තස්සා රත්තියා අච්චයෙන පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන චිත්තස්ස ගහපතිනො ගොකුලං තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදිංසු, අථ ඛො චිත්තො ගහපති ථෙරෙ භික්ඛූ පණීතෙන සප්පිපායාසෙන සහත්ථා සන්තප්පෙසි සම්පවාරෙසි, අථ ඛො ථෙරා භික්ඛූ භුත්තාවිනො ඔනීතපත්තපාණිනො උට්ඨායාසනා පක්කමිංසු, චිත්තොපි ඛො ගහපති සෙසකං විස්සජ්ජෙථාති වත්වා ථෙරෙ භික්ඛූ පිට්ඨිතො පිට්ඨිතො අනුබන්ධි.

තෙන ඛො පන සමයෙන උණ්හං හොති කුථිතං[1], තෙ ච ථෙරා භික්ඛූ පවෙලියමානෙන මඤ්ඤෙ කායෙන ගච්ඡන්ති යථා තං සුභොජනං භුත්තාවිනො. තෙන ඛො පන සමයෙන ආයස්මා මහකො තස්මිං භික්ඛුසඞ්ඝෙ සබ්බනවකො හොති, අථ ඛො ආයස්මා මහකො ආයස්මන්තං ථෙරං එතදවොච: සාධු ඛ්වස්ස භන්තෙ ථෙර[2] යං සීතකො වාතො වායෙය්‍ය, අබ්භසම්පිලාපො[3] ච අස්ස, දෙවො ච එකමෙකං ඵුසායෙය්‍යාති[4]. සාධු ඛ්වස්ස ආවුසො මහක යං සීතකො ච වාතො වායෙය්‍ය, අබ්භසම්පිලාපො ච අස්ස දෙවො ච එකමෙකං ඵුසායෙය්‍යාති. අථ ඛො ආයස්මා මහකො තථාරූපං ඉද්ධාභිසඞ්ඛාරං අභිසඞ්ඛාසි[5] යථා[6] සීතකො ච වාතො වායිත්ථ[7] අබ්භසම්පිලාපො ච අස්ස, දෙවො ච එකමෙකං ඵුසි.

අථ ඛො චිත්තස්ස ගහපතිස්ස[8] එතදහොසි: යො ඛො ඉමස්මිං භික්ඛුසඞ්ඝෙ සබ්බනවකො භික්ඛු, තස්ස[9] එවරූපො ඉද්ධානුභාවොති. අථ ඛො ආයස්මා මහකො ආරාමං සම්පාපුණිත්වා ආයස්මන්තං ථෙරං එතදවොච: අලමෙත්තාවතා භන්තෙ ථෙරාති, අලමෙත්තාවතා ආවුසො මහක, කතමෙත්තාවතා ආවුසො මහක, පූජිතමෙත්තාවතා ආවුසො මහකාති. අථ ඛො ථෙරා භික්ඛූ යථාවිහාරං අගමංසු, ආයස්මාපි ඛො මහකො සකං විහාරං අගමාසි.

---

1 කුට්ඨිතං සයා, අට්ඨකථා කිඤ්චි - සී 1, 2, කුථිතං?
2 ථෙරස්ස - සයා
3 අබ්භිසම්භිලාපො - සී 1, 2
4 ඵුසෙය්‍ය - සයා
5 අභිසඞ්ඛරි – මජ්ඣං, සයා
6 යථායං - මජ්ඣං සයා
7 වායි – මජ්ඣං
8 ගහපතිනො - මජ්ඣං
9 තස්සායං – මජ්ඣං, සයා

## 7. 1. 4

## මහක සූත්‍රය

408. එක්කලෙක බොහෝ වූ තෙර මහණහු **මච්ඡිකාසණ්ඩයෙහි අම්බාටක වනයෙහි** වැඩවෙසෙති. එකල්හි **චිත්ත ගැහැවි** තෙමේ තෙර මහණුන් වෙත එළඹියේ ය. එළඹ තෙර මහණුන් වැඳ එකත්පස් ව හුන්නේ ය. එකත්පස් ව හුන් චිත්තගැහැවි තෙර මහණුන්ට මෙය කීය: වහන්ස, තෙරහු සෙට දවස පිණිස වූ මාගේ ගෝකුලයෙහි බත ඉවසත්වා යි. තෙර මහණහු නිහඬබැවින් ඉවසූහ. එකල්හි චිත්තගැහැවි තෙර මහණුන්ගේ ඉවසීම දැන හුනස්නෙන් නැඟී තෙර මහණහු වැඳ පැදකුණු කොට ගියේ ය.

ඉක්බිති තෙර මහණහු ඒ රැය ඇවෑමෙන් පෙරවරු හැඳ පෙරව පා සිවුරු ගෙන චිත්තගැහැවිහුගේ ගෝකුලය වෙත එළඹියහ. එළඹ පැන වූ අසුන්හි හිඳගත්හ. එකල්හි චිත්ත ගැහැවි තෙර මහණුන් ප්‍රණීත වූ ගිතෙල්මුසු කිරිබතින් සියතින් සැතැප්පී ය, මැනවින් පැවරී ය. ඉක්බිති තෙර මහණහු වැළඳුවාහු පාත්‍රයෙන් ඉවත් කළ අත් ඇත්තාහු හුනස්නෙන් නැඟී වැඩියහ. චිත්ත ගැහැවි තෙමේ ද සෙස්ස බැහැර කරව යි කියා තෙර මහණුන් පසුපස අනුගමන් කෙළේ ය.

එසමයෙහි කැකෑරෙන උණුසුම වෙයි. ඒ තෙර මහණහු ද මීහිරි බොජුන් වැළඳුවන් සේ පැසෙන හැකිළෙන කයින් යුතු ව මෙන් යෙති. එකල්හි ආයුෂ්මත් මහක තෙරණුවෝ ඒ භික්සඝන අතර සියල්ලන්ට නවක වෙති. එකල ආයුෂ්මත් මහක තෙරණුවෝ ආයුෂ්මත් තෙරුන්ට මෙය කීහ: වහන්ස, තෙරණුවනි, ''යම් හෙයෙකින් සිහිල් සුළඟ හමන්නේ නම් වලාකුළු පාවීමෙකුත් වන්නේ නම් වැස්සත් එක එක පොද හෙළන්නේ වී නම් යහපත් වන්නේ දැ?'' යි. ඇවැත්නි, මහකයෙනි, යම් හෙයෙකින් සිහිල් සුළඟ හමන්නේ නම් වලාකුළු පාවීමෙකුත් වන්නේ නම් වැස්සත් එක එක පොද හෙළන්නේ නම් යහපතැ යි. එකල්හි ආයුෂ්මත් මහක තෙමේ යම්සේ සිහිල් සුළඟත් හැමී ද වලාකුළු පාවීමත් වී ද වැස්සත් එක එක පොද හෙළී ද එබඳු සෘද්ධියක් කෙළේ ය.

එකල්හි චිත්ත ගැහැවිහට මෙබඳු සිතෙක් විය: ''මේ භික්සඝන අතර සියල්ලන්ට නවක වූ යම් මහක කෙනෙක් වෙත් නම් මෙබඳු සෘද්ධ්‍යනුභාවය උන්වහන්සේගේ ය''යි. ඉක්බිති ආයුෂ්මත් මහක අරමට පැමිණ ආයුෂ්මත් තෙරණුවන්ට ''වහන්ස, තෙරණුවනි, මෙතෙකින් පමණ දැ?''යි මෙය කී ය. ඇවැත්නි, මහකයෙනි, මෙතෙකින් පමණ ය. ඇවැත්නි, මහකයෙනි, මෙතෙකින් කරන ලද්දේ ය. ඇවැත්නි, මහකයෙනි, මෙතෙකින් පුදන ලද්දේ යයි. ඉන්පසු තෙර මහණහු සිය සිය වෙහෙරෙට ගියහ. ආයුෂ්මත් මහක ද සිය වෙහෙරට ගියේය.

අථ ඛො චිත්තො ගහපති යෙනායස්මා මහකො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මන්තං මහකං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො චිත්තො ගහපති ආයස්මන්තං මහකං එතදවොච: සාධු මෙ භන්තෙ අය්‍යො මහකො උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං දස්සෙතූති. තෙන හි ත්වං ගහපති ආලින්දෙ උත්තරාසඞ්ගං පඤ්ඤපෙත්වා තිණකලාපං ඔකාසෙහීති. එවම්භන්තෙති ඛො චිත්තො ගහපති ආයස්මතො මහකස්ස පටිස්සුත්වා ආලින්දෙ උත්තරාසඞ්ගං පඤ්ඤපෙත්වා තිණකලාපං ඔකාසෙසි.

අථ ඛො ආයස්මා මහකො විහාරං පවිසිත්වා සූචිඝටිකං දත්වා තථාරූපං ඉද්ධාභිසඞ්ඛාරං අභිසඞ්ඛාසි, යථා තාලච්ඡිග්ගලෙන ච අග්ගලන්තරිකාය ච අච්චි නික්ඛමිත්වා තිණානි ඣාපෙසි, උත්තරාසඞ්ගං න ඣාපෙසි. අථ ඛො චිත්තො ගහපති උත්තරාසඞ්ගං පප්ඵොටෙත්වා සංවිග්ගො ලොමහට්ඨජාතො එකමන්තං අට්ඨාසි. අථ ඛො ආයස්මා මහකො විහාරා නික්ඛමිත්වා චිත්තං ගහපතිං එතදවොච: "අලමෙත්තාවතා ගහපතී"ති. අලමෙත්තාවතා භන්තෙ මහක, කතමෙත්තාවතා භන්තෙ මහක, පූජිතමෙත්තාවතා භන්තෙ මහක, අභිරමතු භන්තෙ අය්‍යො මහකො මච්ඡිකාසණ්ඩෙ, රමණීයං අම්බාටකවනං, අහං අය්‍යස්ස මහකස්ස උස්සුක්කං කරිස්සාමි චීවර – පිණ්ඩපාත – සෙනාසන ගිලානප්පච්චය – භෙසජ්ජපරික්ඛාරානන්ති. කල්‍යාණං වුච්චති ගහපතීති. අථ ඛො ආයස්මා මහකො සෙනාසනං සංසාමෙත්වා පත්තචීවරං ආදාය මච්ඡිකාසණ්ඩම්හා පක්කාමි, යං මච්ඡිකාසණ්ඩම්හා පක්කාමි තථා පක්කන්තොව අහොසි. න පුන පච්චාගඤ්ඡීති.

## 7. 1. 5

## කාමභූසුත්තං

409. එකං සමයං ආයස්මා **කාමභූ** **මච්ඡිකාසණ්ඩෙ** විහරති **අම්බාටකවනෙ.** අථ ඛො **චිත්තො ගහපති** යෙනායස්මා කාමභූ තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මන්තං කාමභුං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො චිත්තං ගහපතිං ආයස්මා කාමභූ එතදවොච: වුත්තමිදං ගහපති:

නෙලඞ්ගො සෙතපච්ඡාදො එකාරො වත්තතී රථො
අනීඝං පස්ස ආයන්තං[1] ඡින්නසොතං අබන්ධනන්ති.

ඉමස්ස ඛො ගහපති සංඛිත්තෙන භාසිතස්ස කථං විත්ථාරෙන අත්ථො දට්ඨබ්බොති? කින්නු ඛො එතං භන්තෙ භගවතා භාසිතන්ති? එවං ගහපතීති, තෙන හි භන්තෙ මුහුත්තං ආගමෙහි යාවස්ස අත්ථං පෙක්ඛාමීති. අථ ඛො චිත්තො ගහපති මුහුත්තං තුණ්හී හුත්වා ආයස්මන්තං කාමභුං එතදවොච:

1 අපායන්තං – ස්‍යා

ඉක්බිති චිත්ත ගැහැවි ආයුෂ්මත් මහක වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් මහකයන් වැඳ එකත්පස් ව හුන්නේ ය. එකත්පස් ව හුන් චිත්ත ගැහැවි ආයුෂ්මත් මහකට මෙය කී ය: වහන්ස, "මහක ආයර්‍යයන් වහන්සේ මට උතුරුම්නිස්දමින් ඉදු පෙළහරක් දක්වන සේක්වා" යි. ගැහැවි, එසේ වී නම් තෙපි පිලෙහි උතුරු සළුව අතුරා තණමිටියක් විසුරුව යි. වහන්ස, එසේ යයි චිත්ත ගැහැවි ආයුෂ්මත් මහකහට පිළිතුරු දී පිලෙහි උතුරු සළුව අතුරා තණමිටි-යක් විසුරු වී ය.

ඉක්බිති ආයුෂ්මත් මහක වෙහෙරට පිවිස යතුරු අගුළ දමා යම් සේ කෙසි සිදුරෙන් ද අගුළ අතරින් ද ගිනිදලු නික්ම තණකොළ දැවී ද, උතුරු සළුව නො දැවී ද එබඳු සෘද්ධියක් කෙළේ ය. එකල්හි චිත්තගැහැවි උතුරු සළුව පොළා සංවේගයට පැමිණියේ හටගත් ලොමුදහගැනුම් ඇත්තේ එකත්පස් ව සිටියේ ය. එවිට ආයුෂ්මත් මහක වෙහෙරින් නික්ම චිත්තගැහැවිහට ගැහැවි, මෙතෙකින් පමණ දැ? යි මෙය කී ය. වහන්ස, මහකයෙනි, මෙතෙකින් පමණ ය. වහන්ස මහකයෙනි, මෙතෙකින් කරන, ලද්දේ ය. වහන්ස, මහකයෙනි, මෙතෙකින් පුදන ලද්දේ ය, වහන්ස මහක ආයර්‍යයන් වහන්සේ මච්ඡිකාසණ්ඩයෙහි සිත් අලවා වෙසෙන සේක්වා, අම්බාටකවනය සිත්කලු ය, මම මහක ආයර්‍යයන් වහන්සේට සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර පිළිබඳ ව උත්සාහ කරන්නෙමි යි. ගැහැවිය, යහපතෙක් කියනු ලැබේ යි. එකල්හි ආයුෂ්මත් මහක සෙනසුන සකසා තබා පාසිවුරු ගෙන මච්ඡිකා-සණ්ඩයෙන් නික්ම ගියේ ය. යම්සේ මච්ඡිකාසණ්ඩයෙන් ගියේ ද එසේ ගියේ ම විය. යළි පෙරළා නො ආයේ යි.

## 7. 1. 5

## කාමභූ සූත්‍රය

409. එක්කලෙක ආයුෂ්මත් **කාමභූ තෙරණුවෝ මච්ඡිකාසණ්ඩ-යෙහි අම්බාටකවනයෙහි** වැඩවෙසෙති. එකල්හි **චිත්තගැහැවි** තෙමේ ආයුෂ්මත් කාමභූ තෙරුන් වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් කාමභූ තෙරණුවන් වැඳ එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් චිත්තගැහැවිහට ආයුෂ්මත් කාමභූ තෙරණුවෝ මෙය වදළහ: ගැහැවිය, මෙය වදරන ලද්දේ ය:

"නිදෙස් වූ සුදුවැස්මක් ඇති එක්දැවියක් ඇති රියෙක් තිබේ. දුක් නැති සුන් සැඩපහර ඇති බැඳුම් රහිත එන්නහු බලව" යි.

ගැහැවිය, සැකෙවින් වදළ මේ දේශනාවේ අරුත විතර විසින් කෙසේ දත යුතු දැ? යි. වහන්ස, කිමෙක් ද? මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද්දේ දැ? යි. ගැහැවිය, එසේ යයි. වහන්ස, එසේ වී නම් යම්තාක් මෙහි අරුත පිරික්සා බලම් ද, ඒතාක් මොහොතක් පොරොත්තු වනු මැනවැ යි. ඉක්බිති චිත්තගැහැවි මොහොතක් නිහඬ ව ආයුෂ්මත් කාමභූ තෙරණුවන්ට මෙය කීය:

නෙලඞ්ගන්ති ඛො භන්තෙ සීලානමෙතං අධිවචනං, සෙතපච්ඡාදෙති ඛො භන්තෙ විමුත්තියා එතං අධිවචනං, එකාරොති ඛො භන්තෙ සතියා එතං අධිවචනං, වත්තතීති ඛො භන්තෙ අභික්කමපටික්කමස්සෙතං අධිවචනං, රථොති ඛො භන්තෙ ඉමස්සෙතං චාතුම්මහාභූතිකස්ස කායස්ස අධිවචනං මාතාපෙත්තිකසම්භවස්ස ඔදනකුම්මාසූපචයස්ස අනිච්චුච්ඡාදන පරිමද්දන භෙදන විද්ධංසන ධම්මස්ස, රාගො ඛො භන්තෙ නීඝො දොසො නීඝො මොහො නීඝො, තෙ ඛීණාසවස්ස භික්ඛුනො පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා, තස්මා ඛීණාසවො භික්ඛු අනීඝොති වුච්චති. ආයන්තන්ති[1] ඛො භන්තෙ අරහතො එතං අධිවචනං. සොතොති ඛො භන්තෙ තණ්හාය එතං අධිවචනං, සා ඛීණාසවස්ස භික්ඛුනො පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා. තස්මා ඛීණාසවො භික්ඛු ඡින්නසොතොති වුච්චති. රාගො ඛො භන්තෙ බන්ධනං, දොසො බන්ධනං, මොහො බන්ධනං, තෙ ඛීණාසවස්ස භික්ඛුනො පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා. තස්මා ඛීණාසවො භික්ඛු අබන්ධනොති වුච්චති. ඉති ඛො භන්තෙ යන්තං වුත්තං භගවතා;

"නෙලඞ්ගො සෙතපච්ඡාදො එකාරො වත්තතී රථො
අනීඝං පස්ස ආයන්තං[1] ඡින්නසොතං අබන්ධන"න්ති.

ඉමස්ස ඛ්වාහං භන්තෙ[2] භගවතා සංඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානාමීති. ලාභා වත තෙ ගහපති, සුලද්ධන්තෙ ගහපති, යස්ස තෙ ගම්භීරෙ බුද්ධවචනෙ පඤ්ඤාචක්ඛු කමතීති.

## 7. 1. 6

## දුතියකාමභූසුත්තං

410. එකං සමයං ආයස්මා කාමභූ මච්ඡිකාසණ්ඩෙ විහරති අම්බාටකවනෙ. අථ ඛො චිත්තො ගහපති යෙනායස්මා කාමභූ –පෙ– එකමන්තං නිසින්නො ඛො චිත්තො ගහපති ආයස්මන්තං කාමභූං එතදවොච: කති නු ඛො භන්තෙ සඞ්ඛාරාති. තයො ඛො ගහපති සඞ්ඛාරා කායසඞ්ඛාරො වචීසඞ්ඛාරො චිත්තසඞ්ඛාරොති. සාධු භන්තෙති ඛො චිත්තො ගහපති ආයස්මතො කාමභූස්ස භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා ආයස්මන්තං කාමභූං උත්තරිං පඤ්හං ආපුච්ඡි. කතමො පන භන්තෙ කායසඞ්ඛාරො? කතමො වචී සඞ්ඛාරො? කතමො චිත්තසඞ්ඛාරොති? අස්සාසපස්සාසා ඛො ගහපති කායසඞ්ඛාරො. විතක්කවිචාරා වචීසඞ්ඛාරො, සඤ්ඤා ච වෙදනා ච චිත්තසඞ්ඛාරොති. සාධු භන්තෙති ඛො චිත්තො ගහපති –පෙ– උත්තරිං පඤ්හං ආපුච්ඡි:

---

1. අප්පත්තං – සයා
2. ඉමස්ස ඛො භන්තෙ මයං ඉමස්ස ඛොහං – සයා

වහන්ස, "නෙලඬග" යනු සීලයන්ට මේ නමෙකි. වහන්ස, "සෙතපච්ඡාද" යනු විමුක්තියට මේ නමෙකි. වහන්ස, "ඒකාර" යනු සිහියට මේ නමෙකි, වහන්ස, "වත්තති" යනු ඉදිරි ගමනට හා පසුගමනට මේ නමෙකි. වහන්ස, "රථ" යනු මවුපියන්ගෙන් උපන් බත්කොමුපිඩුවලින් වැඩුනු නිතර ඉලීම් පිරිමැදීම් කෙරෙතු ද බිඳෙන වැනසෙන ස්වභාව ඇති සතර මහාභූතයන්ගෙන් හටගත් මේ කයට මේ නමෙකි. වහන්ස, රාගය නීඝයෙකි, දෙසය නීඝයෙකි, මොහය නීඝයෙකි. රහත් මහණුන් වහන්සේ විසින් ඔහු ප්‍රහීණයහ. උසුන් මුල් ඇතියහ. හිස් සුන් තල් ගසක් මෙන් කරන ලදහ. නැවත නො හටගන්නා බව කරන ලදහ. මතු නූපදනා ස්වභාව ඇතියහ. එහෙයින් රහත් මහණහු අනීඝ යයි කියනු ලැබෙත්. වහන්ස, "ආයන්ත" යනු රහතුන් වහන්සේට මේ නමෙකි. වහන්ස, "සොත" යනු තෘෂ්ණාවට මේ නමෙකි. රහත් මහණුන් වහන්සේ විසින් එය ප්‍රහීණ ය. උසුන්මුල් ඇතියෙ ය. හිස්සුන් තල්ගසක් මෙන් කරන ලද්දේ ය. යළි නොහටගන්නා බව කරන ලද්දේ ය. මතු නූපදනා ස්වභාව ඇත්තේ ය. එහෙයින් රහත් මහණහු "ඡින්නසොත ය" යි කියනු ලැබෙත්. වහන්ස, රාගය බැඳුමෙකි. දෙසය බැඳුමෙකි. මෝහය බැඳුමෙකි. රහත් මහණුන් වහන්සේ විසින් ඔහු ප්‍රහීණයහ. උසුන්මුල් ඇතියහ. හිස්සුන් තල්ගසක් මෙන් කරන ලදහ. යළි නො හටගන්නා බව කරන ලදහ. මතු නූපදනා ස්වභාව ඇතියහ. එහෙයින් රහත් මහණහු "අබන්ධනය" යි කියනු ලැබෙති යි. වහන්ස, මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් ඒ යමක් වදරන ලද්දේ ද:

"නිදෙස් වූ සුදුවැස්මක් ඇති එක්දැවියක් ඇති රියෙක් තිබේ. දුක් නැති සුන්සැඩපහර ඇති බැඳුම් රහිත එන්නහු බලව යි."

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් වදළ මේ දේශනාවේ අරුත විතර විසින් මම මෙසේ දනිමි යි. ගැහැවිය, යම්බඳු තොපගේ පැනැස ගැඹුරු බුදුවදනෙහි පවතී ද ගැහැවිය, ඒ තොපට ඒකාන්තයෙන් ලාභයෙකි. තොපට මනා ලැබීමෙකි යි.

## 7. 1. 6

## දුතිය කාමභූ සූත්‍රය

410. එක්කලෙක ආයුෂ්මත් කාමභූ තෙරණුවෝ මච්ඡිකාසණ්ඩයෙහි අම්බාටකවනයෙහි වැඩවෙසෙති. එකල්හි චිත්තගැහැවි තෙමේ ආයුෂ්මත් කාමභූ තෙරණුවන් වෙත ... එකත්පස් ව හුන් චිත්තගැහැවි ආයුෂ්මත් කාමභූ තෙරුන්ට මෙය කී ය: වහන්ස, "සඞ්ඛාර කෙතෙක් ද?" යි ගැහැවි ය, සඞ්ඛාර තුනෙකි. කායසඞ්ඛාර ය, වචීසඞ්ඛාර ය, චිත්තසඞ්ඛාර යි. මැනව වහන්සැ යි චිත්ත ගැහැවි ආයුෂ්මත් කාමභූ තෙරණුවන්ගේ වචනය පිළිගෙන අනුමෝදන් ව ආයුෂ්මත් කාමභූ තෙරුන් මතු දක්වෙන පැනය පුළුවුත. වහන්ස, කායසඞ්ඛාර කවරේ ද? වචීසඞ්ඛාර කවරේ ද? චිත්තසඞ්ඛාර කවරේ ද? යි. ගැහැවි, ආශ්වාස ප්‍රශ්වාස කායසඞ්ඛාර ය, විතර්කවිචාර වචීසඞ්ඛාර ය, සංඥාත් වෙදනාත් චිත්තසඞ්ඛාර යි. මැනව වහන්සැ යි චිත්තගැහැවි ... මතු දක්වෙන පැනය පුළුවුත.

කස්මා පන භන්තෙ අස්සාසපස්සාසා, කායසඞ්ඛාරො? කස්මා විතක්කවිචාරා වචීසඞ්ඛාරො? කස්මා සඤ්ඤා ච වෙදනා ච චිත්තසඞ්ඛාරොති? අස්සාසපස්සාසා ඛො ගහපති කායිකා, එතෙ ධම්මා කායපටිබද්ධා, තස්මා අස්සාසපස්සාසා කායසඞ්ඛාරො. පුබ්බෙ ඛො ගහපති විතක්කෙත්වා විචාරෙත්වා පච්ඡා වාචං භින්දති, තස්මා විතක්කවිචාරා වචීසඞ්ඛාරො. සඤ්ඤා ච වෙදනා ච චෙතසිකා, එතෙ ධම්මා චිත්තපටිබද්ධා, තස්මා සඤ්ඤා ච වෙදනා ච චිත්තසඞ්ඛාරොති. සාධු භන්තෙති ඛො චිත්තො ගහපති -පෙ- උත්තරිං පඤ්හං ආපුච්ඡි:

කථං පන භන්තෙ සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්ති හොතීති? න ඛො ගහපති සඤ්ඤාවෙදයිත නිරොධං සමාපජ්ජන්තස්ස භික්ඛුනො එවං හොති: "අහං සඤ්ඤාවෙදයිතනිරොධං සමාපජ්ජිස්සන්ති වා අහං සඤ්ඤාවෙදයිතනිරොධං සමාපජ්ජාමීති වා අහං සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නො'ති වා[1] ති, අථ ඛ්වස්ස පුබ්බෙව තථා චිත්තං භාවිතං හොති යංතං තථත්තාය උපනෙතීති. සාධු භන්තෙති ඛො චිත්තො ගහපති -පෙ- උත්තරිං පඤ්හං ආපුච්ඡි:

සඤ්ඤාවෙදයිතනිරොධං සමාපජ්ජන්තස්ස පන භන්තෙ භික්ඛුනො කතමෙ ධම්මා පඨමං නිරුජ්ඣන්ති යදි වා කායසඞ්ඛාරො යදි වා වචීසඞ්ඛාරො යදි වා චිත්තසඞ්ඛාරො? ති. සඤ්ඤාවෙදයිතනිරොධං සමාපජ්ජන්තස්ස ඛො ගහපති භික්ඛුනො වචීසඞ්ඛාරො පඨමං නිරුජ්ඣති, තතො කායසඞ්ඛාරො, තතො චිත්තසඞ්ඛාරොති. සාධු භන්තෙති ඛො චිත්තො ගහපති -පෙ- උත්තරිං පඤ්හං ආපුච්ඡි:

යොයං භන්තෙ මතො කාලකතො, යො චායං භික්ඛු සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නො, ඉමෙසං කිං නානාකරණන්ති? ය්වායං ගහපති මතො කාලකතො, තස්ස කායසඞ්ඛාරො නිරුද්ධො පටිප්පස්සද්ධො, වචීසඞ්ඛාරො නිරුද්ධො පටිප්පස්සද්ධො චිත්තසඞ්ඛාරො නිරුද්ධො පටිප්පස්සද්ධො, ආයු පරික්ඛීණං උස්මා වූපසන්තා, ඉන්ද්‍රියානි විපරිභින්නානි[2] යො ච ඛ්වායං ගහපති භික්ඛු සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නො, තස්සපි කායසඞ්ඛාරො නිරුද්ධො පටිප්පස්සද්ධො, වචීසඞ්ඛාරො නිරුද්ධො පටිප්පස්සද්ධො, චිත්තසඞ්ඛාරො නිරුද්ධො පටිප්පස්සද්ධො, ආයු අපරික්ඛීණං, උස්මා අවූපසන්තා, ඉන්ද්‍රියානි විප්පසන්නානි. ය්වායං ගහපති මතො කාලකතො, යො චායං භික්ඛු සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නො, ඉදං තෙසං නානාකරණන්ති. සාධු භන්තෙති ඛො චිත්තො ගහපති -පෙ- උත්තරිං පඤ්හං ආපුච්ඡි:

කථං පන භන්තෙ සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තියා වුට්ඨානං හොතීති. න ඛො ගහපති සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තියා වුට්ඨහන්තස්ස භික්ඛුනො එවං හොති: "අහං සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තියා වුට්ඨහිස්සන්ති වා අහං සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තියා වුට්ඨහාමීති වා අහං සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තියා වුට්ඨිතො වා"ති, අථ ඛ්වාස්ස පුබ්බෙව තථා චිත්තං භාවිතං හොති යං තං තථත්තාය උපනෙතීති. සාධු භන්තෙති ඛො චිත්තො ගහපති -පෙ- උත්තරිං පඤ්හං ආපුච්ඡි:

1 වාති – ඉති භවිතබ්බන්ති මඤ්ඤෙ
2 පරිභින්නානි සී 1,2

වහන්ස, කුමක් හෙයින් ආස්වාසප්‍රස්වාස කායසඞ්ඛාරවේ ද? කුමක් හෙයින් විතර්ක විචාර වචීසඞ්ඛාරවේ ද? කුමක් හෙයින් සංඥාත් වේදනාත් චිත්තසඞ්ඛාරවේ දැ? යි. ගැහැවි, ආස්වාස ප්‍රස්වාස කායික ය. මේ දහම්හු කය පිළිබඳහ. එහෙයින් ආස්වාසප්‍රස්වාස කායසඞ්ඛාර වේ. ගැහැවි, පළමු තර්කණය කොට විචාරණය කොට පසුව වාග් භේදය කරයි. එහෙයින් විතර්කවිචාර වචීසඞ්ඛාර වේ. සංඥාත් වේදනාත් චෛතසිකයහ. මේ දහම්හු සිත පිළිබඳහ. එහෙයින් සංඥාත් වේදනාත් චිත්තසඞ්ඛාර වේ යි. මැනව වහන්සැ යි චිත්ත ගැහැවි ... මත්තෙහි ද පැනයක් පුළුවුත.

වහන්ස, කෙසේ නම් සඤ්ඤාවේදයිතනිරෝධසමාපත්තිය වේ දැ? යි ගැහැවි, සඤ්ඤාවේදයිතනිරෝධසමාපත්තියට සමවදනා මහණහුට මම සඤ්ඤාවේදයිතනිරෝධයට සමවදින්නෙමි යි හෝ මම සඤ්ඤා-වේදයිතනිරෝධයට සමවදීමි යි හෝ මම සඤ්ඤාවේදයිතනිරෝධයට සමවනිමි යි හෝ මෙබඳු සිතෙක් නො වේ. වැලිදු යම් සිතක් ඔහු ඒ බැව් පිණිස පමුණුවා නම් එසේ පළමු ම ඔහුගේ සිත වඩන ලද්දේ වේ යි. මැනව වහන්සැ යි චිත්ත ගැහැවි ... මත්තෙහි පැනයක් පුළුවුත.

වහන්ස, සඤ්ඤාවේදයිතනිරෝධයට සමවදනා මහණුන් වහන්සේගේ කවර දහම්හු පළමු නිරුද්ධ වෙද්ද ? ඉදින් කායසඞ්ඛාර හෝ ඉදින් වචීසඞ්ඛාර හෝ ඉදින් චිත්තසඞ්ඛාර හෝ දැ? යි. ගැහැවි, සඤ්ඤාවේදයිතනිරෝධයට සමවදනා මහණහුගේ වචීසඞ්ඛාර පළමු නිරුද්ධ වේ. ඉන්පසු කායසඞ්ඛාර ද ඉන්පසු චිත්තසඞ්ඛාර ද නිරුද්ධ වේ යි. මැනව වහන්සැ යි චිත්තගැහැවි ... මත්තෙහි පැනයක් පුළුවුත.

වහන්ස, මේ යමෙක් මළේ ද කලුරිය කෙළේ ද යම් මේ මහණ කෙනෙකුත් සඤ්ඤාවේදයිතනිරෝධයට සමවන්හු ද මොවුන්ගේ වෙනස කිමෙක් දැ ? යි. ගැහැවි, මේ යමෙක් මළේ ද කලුරිය කෙළේ ද ඔහුගේ කායසඞ්ඛාර නිරුද්ධ ය, සන්හිනි. වචීසඞ්ඛාර නිරුද්ධ ය, සන්හිනි. චිත්තසඞ්ඛාර නිරුද්ධ ය, සන්හිනි. ආයු පිරිහුණේ උණුසුම සන්හිනි, ඉඳුරෝ නටහ. ගැහැවි, යම් මේ මහණෙකුත් සඤ්ඤාවේදයිතනිරෝධයට සමවනි ද ඔහුගේත් කායසඞ්ඛාර නිරුද්ධ ය, සන්හිනි. වචීසඞ්ඛාර නිරුද්ධ ය, සන්හිනි. චිත්තසඞ්ඛාර නිරුද්ධ ය, සන්හිනි. ආයු නො පිරිහිත, උණුසුම නො සන්හිත, ඉඳුරෝ වෙසෙසින් පහන්හ. ගැහැවි, මේ යමෙක් මළේ ද කලුරිය කෙළේ ද යම් මේ මහණෙකුත් සඤ්ඤාවේදයිතනිරෝධයට සමවනි ද මේ ඔවුන්ගේ වෙනස යි. මැනව වහන්සැ යි චිත්ත ගැහැවි තෙමේ ... මතු පැන පිළිවිසී ය.

වහන්ස, කෙසේ නම් සඤ්ඤාවේදයිතනිරෝධසමාපත්තියෙන් නැගී සිටීම වේ දැ? යි. ගැහැවි, සඤ්ඤාවේදයිතනිරෝධසමාපත්තියෙන් නැගී සිටින මහණහුට මම සඤ්ඤාවේදයිතනිරෝධසමාපත්තියෙන් නැගී සිටින්නෙමි යි හෝ මම සඤ්ඤාවේදයිතනිරෝධසමාපත්තියෙන් නැගී සිටිමි යි හෝ මම සඤ්ඤාවේදයිතනිරෝධසමාපත්තියෙන් නැගී සිටියෙමි යි හෝ මෙබඳු සිතෙක් නො වෙයි. වැලිදු යම් සිතක් ඒ බව පිණිස ඔහු පමුණුවා නම් එසේ ඔහුගේ සිත පළමු මැ වඩන ලද්දේ වේ යි. මැනවි වහන්සැ යි චිත්තගැහැවි ... මත්තෙහි ද පැනයක් පුළුවුත.

සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තියා වුට්ඨහන්තස්ස පන භන්තෙ භික්ඛුනො කතමෙ ධම්මා පඨමං උප්පජ්ජන්ති යදි වා කායසඞ්ඛාරො යදි වා වචීසඞ්ඛාරො යදි වා චිත්තසඞ්ඛාරොති? සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තියා වුට්ඨහන්තස්ස ඛො ගහපති භික්ඛුනො චිත්තසඞ්ඛාරො පඨමං උප්පජ්ජති, තතො කායසඞ්ඛාරො, තතො වචීසඞ්ඛාරොති. සාධු භන්තෙති ඛො චිත්තො ගහපති -පෙ- උත්තරිං පඤ්හං ආපුච්ඡි:

සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තියා වුට්ඨිතං පන භන්තෙ භික්ඛුං කති ඵස්සා ඵුසන්තීති? සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තියා වුට්ඨිතං ඛො ගහපති භික්ඛුං තයො ඵස්සා ඵුසන්ති සුඤ්ඤතො ඵස්සො අනිමිත්තො ඵස්සො අප්පණිහිතො ඵස්සොති. සාධු භන්තෙති ඛො චිත්තො ගහපති -පෙ- උත්තරිං පඤ්හං ආපුච්ඡි:

සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තියා වුට්ඨිතස්ස පන භන්තෙ භික්ඛුනො කිං නින්නං චිත්තං හොති කිං පොණං කිං පබ්භාරන්ති? සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තියා වුට්ඨිතස්ස ඛො ගහපති භික්ඛුනො විවෙකනින්නං චිත්තං හොති විවෙකපොණං විවෙකපබ්භාරන්ති. සාධු භන්තෙති ඛො චිත්තො ගහපති ආයස්මතො කාමභුස්ස භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා ආයස්මන්තං කාමභුං උත්තරිං පඤ්හං ආපුච්ඡි:

සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තියා පන භන්තෙ කති ධම්මා බහුකාරාති. අද්ධා ඛො ත්වං ගහපති යං පඨමං පුච්ඡිතබ්බං තං පච්ඡා පුච්ඡසි, අපි ච ත්යාහං ව්‍යාකරිස්සාමි; සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තියා ඛො ගහපති ද්වෙ ධම්මා බහුකාරා සමථො ච විපස්සනා චාති.

## 7. 1. 7

### ගොදත්තසුත්තං

411. එකං සමයං ආයස්මා ගොදත්තො මච්ඡිකාසණ්ඩෙ විහරති අම්බාටකවනෙ, අථ ඛො චිත්තො ගහපති යෙනායස්මා ගොදත්තො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මන්තං ගොදත්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො චිත්තං ගහපතිං ආයස්මා ගොදත්තො එතදවොච:

යා චායං ගහපති අප්පමාණා චෙතොවිමුත්ති, යා ච ආකිඤ්චඤ්ඤා චෙතොවිමුත්ති යා ච සුඤ්ඤතා චෙතොවිමුත්ති යා ච අනිමිත්තා චෙතොවිමුත්ති, ඉමෙ ධම්මා නානත්ථා[1] නානා ව්‍යඤ්ජනා? උදාහු එකත්ථා[2] ව්‍යඤ්ජනමෙව නානන්ති?

1. නානට්ඨා - සී 1, 2.
2. එකට්ඨා - සී 1, 2

වහන්ස, සඤ්ඤාවෙදයිතනිරෝධසමාපත්තියෙන් නැගී සිටුනා මහණුන් වහන්සේගේ කවර දහම්හු පළමු උපදිද් ද? ඉදින් කායසඞ්ඛාර හෝ ඉදින් වචීසඞ්ඛාර හෝ ඉදින් චිත්තසඞ්ඛාර හෝ ද? යි. ගැහැවි, සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තියෙන් නැගී සිටුනා මහණහුට චිත්තසඞ්ඛාර පළමු උපදී. ඉන්පසු කායසඞ්ඛාර ද ඉන්පසු වචීසඞ්ඛාර ද උපදි යි. මැනව වහන්සැ යි චිත්ත ගැහැවි ... මත්තෙහි ද පැනයක් පුළුවුත.

වහන්ස, සඤ්ඤාවේදයිතනිරෝධසමාපත්තියෙන් නැගී සිටුනා මහණුන් වහන්සේ කෙතෙක් පහස්හු පුසිද්ද? යි. ගැහැවි, සඤ්ඤා-වෙදයිතනිරොධසමාපත්තියෙන් නැගී සිටි මහණහු සුඤ්ඤතඵස්ස ය අනිමිත්තඵස්ස ය අප්පණිහිතඵස්ස ය යන තුන් පහස්හු පුසිති යි. මැනව වහන්සැ යි චිත්තගැහැවි ... මත්තෙහි පැනයක් පුළුවුත.

වහන්ස, සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තියෙන් නැගී සිටි මහණුන් වහන්සේගේ සිත කුමකට නැමුණේ කුමකට නැඹුරු වූයේ කුමකට බර වූයේ වේ ද? යි. ගැහැවි, සඤ්ඤාවෙදයිතනිරොධ සමාපත්තියෙන් නැගී සිටි මහණහුගේ සිත විවෙකයට (නිවනට) නැමුණේ විවෙකයට නැඹුරු වූයේ විවෙකයට බර වූයේ වේ යි. මැනව වහන්සැ යි චිත්තගැහැවි ආයුෂ්මත් කාමභූ තෙරණුවන්ගේ වදන පිළිගෙන අනුමෝදන් ව ආයුෂ්මත් කාමභූ තෙරණුවන් මත්තෙහි පැනයක් පුළුවුත.

වහන්ස, සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තියට කොතෙක් දහම්හු බොහෝ උපකාර ඇත්තේ ද? යි. ගැහැවි, තෙපි ඒකාන්තයෙන් යමක් පළමු පිළිවිසිය යුතු නම් එය පසුව පුළුවුත්හු. එහෙත් තොපට මම විසඳන්නෙමි. ගැහැවි, සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තියට සමථය ද විපස්සනාව ද යන දෙදහම්හු බොහෝ උපකාර ඇත්තේ යි.

## 7. 1. 7

## ගෝදත්ත සූත්‍රය

411. එක්කලෙක ආයුෂ්මත් ගෝදත්ත තෙරණුවෝ මච්ඡිකාසණ්ඩයෙහි අම්බාටක වනයෙහි වැඩවෙසෙති. එකල්හි චිත්ත ගැහැවි තෙමේ ආයුෂ්මත් ගෝදත්ත තෙරණුවන් වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් ගෝදත්ත තෙරණුවන් වැඳ එකත්පස් ව හුන්නේ ය. එකත්පස් ව හුන් චිත්තගැහැවිහට ආයුෂ්මත් ගෝදත්ත තෙරණුවෝ මේ වදාළහ:

ගැහැවි, යම් මේ අප්පමාණ චෙතොවිමුත්තියෙකුත් යම් ආකිඤ්චඤ්ඤචෙතො විමුත්තියෙකුත්, යම් සුඤ්ඤතචෙතො විමුත්තියෙකුත් යම් අනිමිත්තචෙතො විමුත්තියෙකුත් වේ නම් මේ දහම්හු නොයෙක් නොයෙක් අර්ථ ඇත්තාහුත් නොයෙක් නොයෙක් ව්‍යඤ්ජන ඇත්තාහුත් වෙත් ද? නැතහොත් එක ම අර්ථ ඇත්තාහු ව්‍යඤ්ජන පමණක් වෙනස් වූවාහු වෙත් ද? යි.

අත්ථි භන්තෙ පරියායො යං පරියායං ආගම්ම ඉමෙ ධම්මා නානත්ථා චෙව නානාබ්‍යඤ්ජනා ච, අත්ථි පන භන්තෙ පරියායො යං පරියායං ආගම්ම ඉමෙ ධම්මා එකත්ථා බ්‍යඤ්ජනමෙව නානන්ති.

කතමො ච පන භන්තෙ පරියායො යං පරියායං ආගම්ම ඉමෙ ධම්මා නානත්ථා චෙව නානාබ්‍යඤ්ජනා ච:

ඉධ භන්තෙ භික්ඛු මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති, තථා දුතියං තථා තතියං, තථා චතුත්ථිං,[1] ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන[2] ඵරිත්වා විහරති. කරුණාසහගතෙන චෙතසා -පෙ- මුදිතාසහගතෙන චෙතසා -පෙ- උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති, තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථිං, ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං උපෙක්ඛාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරති. අයං වුච්චති භන්තෙ අප්පමාණා චෙතොවිමුත්ති.

කතමා ච භන්තෙ ආකිඤ්චඤ්ඤාචෙතොවිමුත්ති:

ඉධ භන්තෙ භික්ඛු සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති, අයං වුච්චති භන්තෙ ආකිඤ්චඤ්ඤාචෙතොවිමුත්ති.

කතමා ච භන්තෙ සුඤ්ඤතාචෙතොවිමුත්ති:

ඉධ භන්තෙ භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා ඉතිපටිසංචික්ඛති සුඤ්ඤමිදං අත්තෙන වා අත්තනියෙන වා, අයං වුච්චති භන්තෙ සුඤ්ඤතාචෙතොවිමුත්ති.

කතමා ච භන්තෙ අනිමිත්තාචෙතොවිමුත්ති:

ඉධ භන්තෙ භික්ඛු සබ්බනිමිත්තානං අමනසිකාරා අනිමිත්තං චෙතො සමාධිං උපසම්පජ්ජ විහරති, අයං වුච්චති භන්තෙ අනිමිත්තාචෙතොවිමුත්ති. අයං ඛො භන්තෙ පරියායො යං පරියායං ආගම්ම ඉමෙ ධම්මා නානත්ථා චෙව නානාබ්‍යඤ්ජනා ච.

කතමො ච භන්තෙ පරියායො යං පරියායං ආගම්ම ඉමෙ ධම්මා එකත්ථා බ්‍යඤ්ජනමෙව නානං:

---

1 චතුත්ථං - සී 1, 2, ස්‍යා 2 අව්‍යාපජ්ජෙන - මජසං

වහන්ස, යම් නයකට පැමිණ මේ දහම්හු නානා අර්ථ ඇත්තාහුත් නානාව්‍යඤ්ජන ඇත්තාහුත් වෙත් නම් එබඳු නයෙක් ඇත. වහන්ස, යම් නයකට පැමිණ මේ දහම්හු එකම අර්ථ ඇත්තාහු ව්‍යඤ්ජන පමණක් වෙනස් වූවාහු වෙත් නම් එබඳු නයෙකුත් ඇත.

වහන්ස, යම් නයකට පැමිණ මේ දහම්හු නානා අර්ථ ඇත්තාහුත් නානා ව්‍යඤ්ජන ඇත්තාහුත් වෙත් නම් ඒ නය කවරේ ද යත්:

වහන්ස, මෙහි මහණුන් වහන්සේ මෛත්‍රීසහගත සිතින් එක්දිගක් පැතිරගෙන වෙසෙති. දෙවන දිග ද එසේ ය. තෙවන දිග ද එසේ ය. සිවුවන දිග ද එසේ ය. මෙසේ උඩ යට සරස සියලු තැන්හි සර්වාත්මභාවයෙන් සියල්ලෙන් යුත් ලොව පැතුරුණු මහත්බවට ගිය අපමණ වූ නිදෙස් වූ නිදුක් වූ මෙත්සහගිය සිතින් පතුරුවා වෙසෙති. කුළුණු සහගිය සිතින් ... මුදිතා සහගත සිතින් ... මැදහත් බැවු සහගිය සිතින් එක් දිගක් පැතිරගෙන වෙසෙති. දෙවන දිග ද එසේ ය. තෙවන දිග ද එසේ ය සිවුවන දිග ද එසේ ය. මෙසේ උඩ යට සරස සියලු තැන්හි සර්වාත්මභාවයෙන් සියල්ලෙන් යුත් ලොව පැතුරුණු මහත්බවට ගිය අපමණ වූ නිදෙස් වූ නිදුක් වූ මැදහත් වූ උපේක්ෂා සහගිය සිතින් පැතිරගෙන වෙසෙති. වහන්ස, මේ අප්පමාණචෙතොවිමුත්තිය යි කියනු ලැබෙ.

වහන්ස, ආකිඤ්චඤ්ඤචෙතොවිමුත්තිය කවර යත්:

වහන්ස, මේ මහණුන් වහන්සේ සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චා-යතනය ඉක්මැ කිසිවක් නැතැ යි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වෙසෙති. වහන්ස, මේ ආකිඤ්චඤ්ඤචෙතොවිමුත්තිය යි කියනු ලැබෙ.

වහන්ස, සුඤ්ඤතචෙතොවිමුත්තිය කවර යත්:

වහන්ස, මෙහි මහණුන් වහන්සේ අරණකට ගියාහු හෝ රුක්මුලකට ගියාහු හෝ හිස් ගෙයකට ගියාහු හෝ මෙය තමාගෙන් හෝ තමාසතු දෙයකින් හෝ හිස් යයි මෙසේ නුවණින් සලකා බලති. වහන්ස, මේ සුඤ්ඤතචෙතොවිමුත්තිය යි කියනු ලැබෙ.

වහන්ස, අනිමිත්තචෙතොවිමුත්තිය කවර යත්:

වහන්ස, මෙහි මහණුන් වහන්සේ සියලු නිමිති නොමෙනෙහි කිරීමෙන් නිමිති රහිත චෙතොසමාධියට පැමිණ වෙසෙති, වහන්ස, මේ අනිමිත්තචෙතොවිමුත්තිය යි කියනු ලැබෙ. වහන්ස, යම් නයකට පැමිණ මේ දහම්හු නානා අර්ථ ඇත්තාහුත් නානා ව්‍යඤ්ජන ඇත්තාහුත් වෙත් නම් මේ ඒ නය යි.

වහන්ස, යම් නයකට පැමිණ මේ දහම්හු එකාර්ථ වූවාහු ව්‍යඤ්ජන පමණක් වෙනස් වුවාහු වෙත් නම් ඒ නය කවරේ ද යත්.

රාගො බො භන්තෙ පමාණකරණො දොසො පමාණකරණො මොහො පමාණකරණො, තෙ ඛීණාසවස්ස භික්ඛුනො පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා. යාවතා බො භන්තෙ අප්පමාණා චෙතොවිමුත්තියො අකුප්පා තාසං චෙතොවිමුත්ති අග්ගමක්ඛායති. සා බො පනාකුප්පා චෙතොවිමුත්ති සුඤ්ඤා රාගෙන සුඤ්ඤා දොසෙන සුඤ්ඤා මොහෙන. රාගො බො භන්තෙ කිඤ්චනං දොසො කිඤ්චනං මොහො කිඤ්චනං, තෙ ඛීණාසවස්ස භික්ඛුනො පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා. යාවතා බො භන්තෙ ආකිඤ්චඤ්ඤා චෙතොවිමුත්තියො අකුප්පා තාසං චෙතොවිමුත්ති අග්ගමක්ඛායති; සා බො පනාකුප්පා චෙතොවිමුත්ති සුඤ්ඤා රාගෙන සුඤ්ඤා දොසෙන සුඤ්ඤා මොහෙන.

රාගො බො භන්තෙ නිමිත්තකරණො දොසො නිමිත්තකරණො මොහො නිමිත්තකරණො, තෙ ඛීණාසවස්ස භික්ඛුනො පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා. යාවතා බො භන්තෙ අනිමිත්තා චෙතොවිමුත්තියො අකුප්පා තාසං චෙතොවිමුත්ති අග්ගමක්ඛායති; සා බො පනාකුප්පා චෙතොවිමුත්ති සුඤ්ඤා රාගෙන සුඤ්ඤා දොසෙන සුඤ්ඤා මොහෙන. අයං බො භන්තෙ පරියායො යං පරියායං ආගම්ම ඉමෙ ධම්මා එකත්ථා ව්‍යඤ්ජනමෙව නානන්ති. ලාභා තෙ ගහපති සුලද්ධන්තෙ ගහපති යස්ස තෙ ගම්භීරෙ බුද්ධවචනෙ පඤ්ඤාචක්ඛු කමතීති.

## 7. 1. 8

## නිගණ්ඨසුත්තං

තෙන බො පන සමයෙන නිගණ්ඨො නාතපුත්තො[1] මච්ඡිකාසණ්ඩං අනුප්පත්තො හොති මහතියා නිගණ්ඨපරිසාය සද්ධිං, අස්සොසි බො චිත්තො ගහපති නිගණ්ඨො කිර නාතපුත්තො මච්ඡිකාසණ්ඩං අනුප්පත්තො මහතියා නිගණ්ඨපරිසාය සද්ධින්ති. අථ බො චිත්තො ගහපති සම්බහුලෙහි උපාසකෙහි සද්ධිං යෙන නිගණ්ඨො නාතපුත්තො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා නිගණ්ඨෙන නාතපුත්තෙන සද්ධිං සම්මොදි සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නං බො චිත්තං ගහපතිං නිගණ්ඨො නාතපුත්තො එතදවොච: සද්දහසි ත්වං ගහපති සමණස්ස ගොතමස්ස අත්ථි අවිතක්කො අවිචාරො සමාධි, අත්ථි විතක්ක විචාරානං නිරොධොති.

1 නාට පුත්තො - මජසං

වහන්ස, රාගය පමණ කරන්නෙකි, ද්වේෂය පමණ කරන්නෙකි, මෝහය පමණ කරන්නෙකි. රහත් මහණුන් වහන්සේ විසින් ඔහු ප්‍රහීණයහ, උසුන්මුල්හ, හිස්සුන් තල්ගසක් මෙන් කරන ලදහ, යළි නො හටගන්නාබව කරන ලදහ, මතු නූපදනා ස්වභාව ඇතියහ. වහන්ස, යම්තාක් අප්පමාණචෙතොවිමුත්තිහු වෙත් නම් (රාගාදීන්) අකොප්‍ය වූ චෙතොවිමුත්තිය ඔවුන්ට අග්‍ර ය යි කියනු ලැබේ. ඒ අකොප්‍ය චෙතොවිමුත්තිය රාගයෙන් හිස් ය, ද්වෙෂයෙන් හිස් ය, මොහයෙන් හිස් ය. වහන්ස, රාගය පළිබොධයෙකි, ද්වෙෂය පළිබොධයෙකි, මොහය පළිබොධයෙකි. රහත් මහණුන් වහන්සේ විසින් ඔහු ප්‍රහීණයහ, උසුන්මුල්හ, හිස්සුන් තල්ගසක් මෙන් කරන ලදහ, යළි නො හටගන්නාබව කරන ලදහ, මතු නූපදනා ස්වභාව ඇතියහ. වහන්ස, යම්තාක් ආකිඤ්චඤ්ඤචෙතොවිමුත්තිහු වෙත් නම් අකොප්‍යචෙතොවිමුත්තිය ඔවුන්ට අග්‍ර ය යි කියනු ලැබේ. ඒ අකොප්‍ය චෙතොවිමුත්තිය රාගයෙන් හිස් ය, ද්වේෂයෙන් හිස් ය, මෝහයෙන් හිස් ය.

වහන්ස, රාගය නිමිති කරන්නෙකි, ද්වේෂය නිමිති කරන්නෙකි, මෝහය නිමිති කරන්නෙකි. රහත් මහණුන් වහන්සේ විසින් ඔහු ප්‍රහීණයහ, උසුන්මුල්හ, හිස්සුන් තල්ගසක් මෙන් කරන ලදහ, නැවත නො හටගන්නා බව කරන ලදහ. මතු නූපදනා ස්වභාව ඇතියහ. වහන්ස, යම්තාක් අනිමිත්තචෙතොවිමුත්තිහු වෙත් නම් අකොප්‍යචෙතොවිමුත්තිය ඔවුන්ට අග්‍රය යි කියනු ලැබේ. ඒ අකොප්‍ය චෙතොවිමුත්තිය රාගයෙන් හිස් ය, ද්වේෂයෙන් හිස් ය, මෝහයෙන් හිස් ය. වහන්ස, යම් නයකට පැමිණ මේ දහම්හු ඒකාර්ථ වූවාහු ව්‍යඤ්ජන පමණක් වෙනස් වූවාහු වෙත් නම් මේ ඒ නයයි. ගැහැවි, යම්බඳු තොපගේ පැනැස ගැඹුරු බුදුවදනෙහි පවතී නම් ගැහැවි, ඒ තොපට ලාභයෙකි. තොපට මනා ලැබීමෙකි යි.

## 7. 1. 8

## නිගණ්ඨ සූත්‍රය

412. එසමයෙහි නිගණ්ඨනාතපුත්ත තෙමේ මහත් නිගණ්ඨ පිරිසක් සමග මච්ඡිකාසණ්ඩයට පැමිණියේ වෙයි. නිගණ්ඨනාතපුත්ත තෙමේ මහත් නිගණ්ඨ පිරිසක් සමග මච්ඡිකාසණ්ඩයට පැමිණියේ ය යි චිත්තගැහැවි ඇසුයේ ය. එකල්හි චිත්තගැහැවි බොහෝ උවසුවන් සමග නිගණ්ඨනාතපුත්ත වෙත එළඹියේ ය. එළඹ නිගණ්ඨනාතපුත්ත සමග සතුටු විය. සතුටු විය යුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පසෙක හුන්නෙ ය. එකත්පසෙක හුන් චිත්තගැහැවිහට නිගණ්ඨනාතපුත්ත මෙය කී ය : ගැහැවි, තෙපි, අවිතර්කඅවිචාර සමාධියෙක් ඇත, විතර්ක විචාරයන්ගේ නිරෝධයෙක් ඇතැ යි යන මහණ ගොයුම්ගේ වචනය අදහවු දැ? යි.

න ඛ්වාහං එත්ථ භන්තෙ භගවතො සද්ධාය ගච්ඡාමි: අත්ථි අවිතක්කො අවිචාරො සමාධි, අත්ථි විතක්කවිචාරානං නිරොධොති. එවං වුත්තෙ නිගණ්ඨො නාතපුත්තො සකං පරිසං උල්ලොකෙත්වා[1] එතදවොච: ඉදං භවන්තො පස්සන්තු යාවඋජුකො[2] චායං චිත්තො ගහපති, යාව අසඨො චායං චිත්තො ගහපති, යාව අමායාවී චායං චිත්තො ගහපති, වාතං වා සො ජාලෙන බාධෙතබ්බං මඤ්ඤෙය්‍ය යො විතක්කවිචාරෙ නිරොධෙතබ්බං මඤ්ඤෙය්‍ය, සකමුට්ඨිනා වා සො ගඞ්ගාය සොතං ආවාරෙතබ්බං මඤ්ඤෙය්‍යාති. යො විතක්ක විචාරෙ නිරොධෙතබ්බං මඤ්ඤෙය්‍යාති.

තං කිම්මඤ්ඤසි භන්තෙ කතමං නු ඛො පණීතතරං ඤාණං වා සද්ධා වාති. සද්ධාය ඛො ගහපති ඤාණං යෙව පණීතතරං.

අහං ඛො භන්තෙ යාවදෙව ආකඞ්ඛාමි විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරාමි, අහං ඛො භන්තෙ යාවදෙව ආකඞ්ඛාමි විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං උප සම්පජ්ජ විහරාමි, අහං ඛො භන්තෙ යාවදෙව ආකඞ්ඛාමි පීතියා ච විරාගා -පෙ- තතියං ඣානං උපසම්පජ්ජ විහරාමි, අහං ඛො භන්තෙ යාවදෙව ආකඞ්ඛාමි සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරාමි. න සො ඛ්වාහං භන්තෙ එවං ජානන්තො එවං පස්සන්තො කස්ස අඤ්ඤස්ස සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා සද්ධාය ගමිස්සාමි "අත්ථි අවිතක්කො අවිචාරො සමාධි අත්ථි විතක්කවිචාරානං නිරොධො"ති.

එවං වුත්තෙ නිගණ්ඨො නාතපුත්තො සකං පරිසං උල්ලොකෙත්වා එතදවොච: ඉදං භවන්තො පස්සන්තු: යාව අනුජ්ජුකො[3] චායං චිත්තො ගහපති, යාව සඨො චායං චිත්තො ගහපති, යාව මායාවී චායං චිත්තො ගහපතීති ඉදානෙව[4] ඛො තෙ මයං භන්තෙ භාසිතං එවං ආජානාම: "ඉදං භවන්තො පස්සන්තු යාව උජුකො චායං චිත්තො ගහපති, යාව අසඨො චායං චිත්තො ගහපති, යාව අමායාවී-චායං චිත්තො ගහපති, ඉදානෙව ච පන තෙ මයං භන්තෙ භාසිතං එවං ආජානාම: "ඉදං භවන්තො පස්සන්තු, යාව අනුජ්ජු-කො චායං චිත්තො ගහපති, යාව සඨො චායං චිත්තො ගහපති, යාව මායාවී චායං චිත්තො ගහපතී"ති. සචෙ තෙ භන්තෙ පුරිමං සච්චං පච්ඡිමං තෙ මිච්ඡා, සචෙ පන තෙ භන්තෙ පච්ඡිමං සච්චං පුරිමං තෙ මිච්ඡා.

---

1 අපලොකෙත්වා සී මු - සී 1, 2, ස්‍යා
2 යාවජ්ජුකො සී 1.
3 අනුජුකො - මජසං.
4 ඉදානෙව ච පන — ස්‍යා

හිමියනි, අවිතර්කඅවිචාර සමාධියෙක් ඇත, විතර්ක විචාරයන්ගේ නිරෝධයෙක් ඇත යන මෙහි ලා මම භාග්‍යවතුන් වහන්සේගේ විශ්වාසයට නො යමි යි. මෙසේ කී කල්හි නිගණ්ඨනාතපුත්ත තෙමේ සිය පිරිස හිස ඔසවා බලා මෙය කී ය: භවත්හු මෙය දකිත්වා මේ චිත්තගැහැවි කෙතෙක් ඍජු ද? මේ චිත්තගැහැවි කෙතෙක් අසට (නොකපටි) ද? මේ චිත්ත ගැහැවි කෙතෙක් රැවටිලි රහිත ද? යමෙක් විතර්කවිචාර නිරුද්ධ කටයුතු යයි හඟනේ නම් හේ දැලින් සුළං බැදිය යුතු යයි හඟනේ ය. යමෙක් විතර්ක විචාර නිරුද්ධ කටයුතු යයි හඟනේ නම් හෙ සිය මිටින් ගඞ්ගානදී සැඩපහර වැළැක්වියයුතු යයි හඟනේ යි.

හිමියනි, ඒ කිමැ? යි හඟිවූ ද? කුමක් වඩා ප්‍රණීත ද? නැණහෝ සැදහැ හෝ යි. ගැහැවි, සැදැහැයට වඩා නැණ ම ප්‍රණීත ය.

හිමියනි, මම යම්තාක් කැමැත්තෙම් නම් (ඒ තාක්) කාමයන්ගෙන් වෙන්ව ම අකුශල ධර්මයන්ගෙන් වෙන්ව ම විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සුවය ඇති පළමු වන ද්‍යානට පැමිණ වෙසෙමි. හිමියනි, මම යම්තාක් කැමැත්තෙම් නම් ඒ තාක් විතර්කවිචාර සන්හිඳීමෙන් ... දෙවැනි ද්‍යානට පැමිණ වෙසෙමි. හිමියනි, මම යම් තාක් කැමැත්තෙම් නම් ඒ තාක් ප්‍රීතියත් වැළැක්මෙන් ... තෙවැනි ද්‍යානට පැමිණ වෙසෙමි. හිමියනි, මම යම් තාක් කැමැත්තෙම් නම් ඒ තාක් සුවත් ප්‍රහීණ කිරීමෙන් දුකත් ප්‍රහීණ කිරීමෙන් කැලැම සොම්නස් දොම්නසුන් දුරු කිරීමෙන් නොදුක් වූ නොසුව වූ මැදහත් බැවින් හා සිහියෙන් හටගත් පිරිසිදු බව ඇති සිවුවන ද්‍යානට පැමිණ වෙසෙමි. හිමියනි, ඒ මම මෙසේ දන්නෙම් මෙසේ දක්නෙම් "අවිතර්කඅවිචාර සමාධියෙක් ඇත. විතර්කවිචාරයන්ගේ නිරොධයෙක් ඇතැ"යි අන් කවර මහණකුගේ හෝ බමුණකුගේ හෝ හැදහීමට යන්නෙම් ද?

මෙසේ කී කල්හි නිගණ්ඨනාතපුත්ත සිය පිරිස දෙස බලා මෙය කී ය: භවත්හු මෙය දකිත්වා, මේ චිත්ත ගැහැවි වඬකත් වේද, මේ චිත්ත ගැහැවි කොතරම් සඨත් (කපටත්) වේ ද, මේ චිත්ත ගැහැවි කොතරම් රැවටිලි ඇත්තේත් වේ දැ යි. හිමියනි, "භවත්හු මෙය දකිත්වා, මේ චිත්ත ගැහැවි කොතෙක් ඍජුත් වේ ද, මේ චිත්ත ගැහැවි කොතෙක් අසඨත් වේ ද, මේ චිත්ත ගැහැවි කොතෙක් රැවටිලි නැත්තේත් වේ දැ" යි. ඔබ විසින් දැන් ම කියන ලද්ද අපි මෙසේ දනිමු. හිමියනි, "භවත්හු මෙය දකිත්වා මේ චිත්ත ගැහැවි කොතෙක් වඬකත් වේ ද, මේ චිත්ත ගැහැවි කොතෙක් සඨත් වේ ද, මේ චිත්ත ගැහැවි කොතෙක් රැවටිලි ඇත්තේත් වේ දැ යි. ඔබ විසින් දැන් ම කියන ලද්ද අපි මෙසේ දනිමු. හිමියනි, ඉදින් ඔබ විසින් පළමු කියන ලද්ද සැබෑ නම් ඔබ විසින් පසුව කියන ලද්ද මුසා ය. හිමියනි, ඉදින් ඔබ විසින් පසුව කියන ලද්ද සැබෑ නම් ඔබ විසින් පළමු කියන ලද්ද මුසා ය.

ඉමෙ ඛො පන භන්තෙ දස සහධම්මිකා පඤ්හා ආගච්ඡන්ති, යද තෙසං අත්ථං ආජානෙය්‍යාසි අථ මං පටිභරෙය්‍යාසි සද්ධිං නිගණ්ඨ පරිසාය, 'එකො පඤ්හො එකො උද්දෙසො එකං වෙය්‍යාකරණං ද්වෙ පඤ්හා ද්වෙ උද්දෙසා ද්වෙ වෙය්‍යාකරණානි, තයො පඤ්හා තයො උද්දෙසා තීණි වෙය්‍යාකරණානි, චත්තාරො පඤ්හා චත්තාරො උද්දෙසා චත්තාරි වෙය්‍යාකරණානි, පඤ්ච පඤ්හා පඤ්ච උද්දෙසා පඤ්ච වෙය්‍යාකරණානි, ඡ පඤ්හා ඡ උද්දෙසා ඡ වෙය්‍යාකරණානි, සත්ත පඤ්හා සත්ත උද්දෙසා සත්ත වෙය්‍යාකරණානි, අට්ඨ පඤ්හා අට්ඨ උද්දෙසා අට්ඨ වෙය්‍යාකරණානි, නව පඤ්හා නව උද්දෙසා නව වෙය්‍යාකරණානි, දස පඤ්හා දස උද්දෙසා දස වෙය්‍යාකරණානී'ති. අථ ඛො චිත්තො ගහපති නිගණ්ඨං නාතපුත්තං ඉමෙ දස සහධම්මිකෙ පඤ්හෙ ආපුච්ඡිත්වා උට්ඨායාසනා පක්කාමීති.

## 7. 1. 9

## අචෙලසුත්තං

413. තෙන ඛො පන සමයෙන **අචෙලො කස්සපො මච්ඡිකාසණ්ඩං** අනුප්පත්තො හොති, **චිත්තස්ස ගහපතිනො** පුරාණගිහී සහායකො. අස්සොසි ඛො චිත්තො ගහපති අචෙලො කිර කස්සපො මච්ඡිකාසණ්ඩං අනුප්පත්තො අම්හාකං පුරාණගිහීසහායොති. අථ ඛො චිත්තො ගහපති යෙන අචෙලො කස්සපො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා අචෙලෙන කස්සපෙන සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො චිත්තො ගහපති අචෙලං කස්සපං එතදවොච: කීව චිරං පබ්බජිතොසි[1] භන්තෙ කස්සපාති? තිංස මත්තානි ඛො මෙ ගහපති වස්සානි පබ්බජිතස්සාති. ඉමෙහි පන තෙ භන්තෙ තිංස මත්තෙහි වස්සෙහි අත්ථි කොචි උත්තරිමනුස්සධම්මො[2] අලමරියඤාණදස්සන විසෙසො අධිගතො ඵාසුවිහාරොති? ඉමෙහි ඛො මෙ ගහපති තිංස මත්තෙහි වස්සෙහි[3] නත්ථි කොචි උත්තරිමනුස්සධම්මො අලමරියඤාණදස්සනවිසෙසො අධිගතො ඵාසුවිහාරො, අඤ්ඤත්‍ර නග්ගෙය්‍යා ච මුණ්ඩෙය්‍යා ච පාවළනිප්ඵොටනාය[4] චාති.

එවං වුත්තෙ චිත්තො ගහපති අචෙලං කස්සපං එතදවොච: අච්ඡරියං වත භො අබ්භුතං වත භො ධම්මස්ස ස්වාක්ඛාතතා යත්‍ර හි නාම තිංසමත්තෙහි වස්සෙහි න කොචි උත්තරිමනුස්සධම්මො අලමරියඤාණදස්සනවිසෙසො අධිගතො[5] භවිස්සති[6] ඵාසුවිහාරො අඤ්ඤත්‍ර නග්ගෙය්‍යා ච මුණ්ඩෙය්‍යා ච පාවළනිප්ඵොටනාය චාති.

---

1 පබ්බජිතස්ස - මජ්ඣං
2 උත්තරිමනුස්ස ධම්මෙ - සතා
3 වස්සානි පබ්බජිතස්ස - මජ්ඣං,
4 වාළි නිප්පොථනාය - අට්ඨකථා, පාවාතු සී 1, 2 වාළනිප්පොතනාය - සතා
5. අධිගමො - සී, 1, 2, 3
6. අභවිස්ස - මජ්ඣං

හිමියනි, කරුණු සහිත මේ දශ පැනයෙක් එයි. යම් කලෙක එහි අරුත් දන්නෙහි නම් එකල්හි නිගණ්ඨ පිරිස සමග ම වෙත එන්නෙහි ය: එක් පැනයෙකි, එක් උදෙසුමෙකි, එක් විසඳුමෙකි. දෙ පැනයෙකි, දෙ උදෙසුමෙකි. දෙ විසඳුමෙකි. තුන් පැනයෙකි, තුන් උදෙසුමෙකි, තුන් විසඳුමෙකි. සිවු පැනයෙකි, සිවු උදෙසුමෙකි, සිවු විසඳුමෙකි. පස් පැනයෙකි, පස් උදෙසුමෙකි, පස් විසඳුමෙකි. ස පැනයෙකි, ස උදෙසුමෙකි, ස විසඳුමෙකි. සත් පැනයෙකි, සත් උදෙසුමෙකි, සත් විසඳුමෙකි. අට පැනයෙකි, අට උදෙසුමෙකි, අට විසඳුමෙකි. නව පැනයෙකි, නව උදෙසුමෙකි, නව විසඳුමෙකි. දස පැනයෙකි, දස උදෙසුමෙකි, දස විසඳුමෙකි යි. ඉක්බිති චිත්ත ගැහැවි නිගණ්ඨනාතපුත්‍රයන්ගෙන් කරුණු සහිත මේ දස පැනය පිළිවිස හුනස්නෙන් නැඟීට ගියේ ය.

## 7. 1. 9

## අචෙල සූත්‍රය

413. එකල්හි **චිත්ත ගැහැවිහුගේ** පැරණි ගිහි යහළුවකු වූ **අචෙලකස්සප** තෙමේ **මච්ඡිකාසණ්ඩයට** පැමිණියේ වෙයි. චිත්ත ගැහැවි අපගේ පැරණි ගිහි යහළුවකු වූ අචෙලකස්සප මච්ඡිකාසණ්ඩයට පැමිණියේ ලැ යි ඇසී ය. ඉක්බිති චිත්තගැහැවි අචෙලකස්සපයන් වෙත එළඹියේ ය. එළඹ අචෙලකස්සපයන් සමග සතුටු විය. සතුටු වියයුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් චිත්තගැහැවි අචෙලකස්සපයනට හිමියනි කස්සපයෙනි, පැවිදි ව කොතෙක් කල් ඇත්තහු ද? යි මෙය කී ය. ගැහැවිය, පැවිදි වූ මට වස් තිසෙක් පමණ වෙ යි. හිමියනි, මේ තිසක් පමණ වසින් ඔබ විසින් ලබන ලද මිනිස් දහමින් වැඩි අරිබව කිරීමෙහි සමත් නැණදසුන් වෙසෙසක් වූ කිසියම් පහසුවිහරණයෙක් ඇද්ද යි. ගැහැවි, මේ තිසක් පමණ වසින් මවිසින් මිනිස් දහමින් මතු ලබනලද සෙලුබවත් මුඩු බවත් වැලි පිසීමට ගන්නා මොනරපිල්කලඹත් හැර අරිබව කිරීමෙහි සමත් නැණදසුන් වෙසෙසක් වූ කිසියම් පහසුවිහරණයෙක් නැතැ යි.

මෙසේ කී කල්හි චිත්තගැහැවි අචෙලකස්සපයනට මෙය කී ය: යම් හෙයෙකින් තිසක් පමණ වසෙකින් සෙලුබවත් මුඩුබවත් වැලි පිසීමට ගන්නා මොනරපිල් කලඹත් හැර මිනිස් දහමින් මත්තෙහි වූ පහසුවිහරණ වූ අරිබව කිරීමෙහි සමත් කිසියම් නැණදසුන් වෙසෙසක් නො ලද්දේ වී නම් පින්වත, දහම්හි ස්වාඛ්‍යාතබව ඒකාන්තයෙන් ආශ්චර්‍ය්‍යයෙකි. පින්වත ඒකාන්තයෙන් පුදුමයෙකි යි.

තුය්හං පන ගහපති කීව චිරං උපාසකත්තං උපගතස්සාති? මය්හම්පි ඛො භන්තෙ තිංස මත්තානි වස්සානි. උපාසකත්තං උපගතස්සාති. ඉමෙහි ඛො පන තෙ ගහපති, තිංසමත්තෙහි වස්සෙහි අත්ථි කොචි උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසො අධිගතො ඵාසුවිහාරොති? කිං හි නො සියා භන්තෙ අහං හි භන්තෙ යාවදෙව ආකඞ්ඛාමි විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරාමි. අහං හි භන්තෙ යාවදෙව ආකඞ්ඛාමි. විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං උපසම්පජ්ජ විහරාමි. අහං හි භන්තෙ, යාවදෙව ආකඞ්ඛාමි පීතියා ච විරාගා -පෙ- තතියං ඣානං උපසම්පජ්ජ විහරාමි අහං හි භන්තෙ යාවදෙව ආකඞ්ඛාමි සුඛස්ස ච පහානා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරාමි. සචෙ ඛො පනාහං භන්තෙ භගවතො[1] පඨමතරං කාලං කරෙය්‍යං අනච්ඡරියං ඛො පනෙතං යං මං භගවා එවං ව්‍යාකරෙය්‍ය: නත්ථිතං සංයොජනං යෙන සංයොජනෙන සඤ්ඤුත්තො චිත්තො ගහපති පුන ඉමං ලොකං ආගච්ඡෙය්‍යාති.

එවං වුත්තෙ අචෙලො කස්සපො චිත්තං ගහපතිං එතදවොච: අච්ඡරියං වත භො අබ්භුතං වත භො ධම්මස්ස ස්වාක්ඛාතතා, යත්‍ර හි නාම ගිහී ඔදාතවසනා[2] එවරූපං උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසං අධිගමිස්සන්ති[3] ඵාසුවිහාරං, ලභෙය්‍යාහං ගහපති ඉමස්මිං ධම්මවිනයෙ පබ්බජ්ජං, ලභෙය්‍යං උපසම්පදන්ති.

අථ ඛො චිත්තො ගහපති අචෙලං කස්සපං ආදාය යෙන ථෙරා භික්ඛූ තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ථෙරෙ භික්ඛූ එතදවොච: අයං භන්තෙ අචෙලො කස්සපො අම්හාකං පුරාණගිහිසහායො, ඉමං ථෙරා පබ්බාජෙන්තු උපසම්පාදෙන්තු අහමස්ස උස්සුක්කං කරිස්සාමි චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානන්ති.

අලත්ථ ඛො අචෙලො කස්සපො ඉමස්මිං ධම්මවිනයෙ පබ්බජ්ජං අලත්ථ උපසම්පදං. අචිරූපසම්පන්නො ච පනායස්මා කස්සපො එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි, ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසි; අඤ්ඤතරො ච පනායස්මා කස්සපො අරහතං අහොසීති.

1. භගවතා-සයා
2. ඔදාතවසනො-මජ්සං, සයා
3. අධිගමිස්සති - මජ්සං, සයා

ගැහැවි, උවසු බවට පැමිණි තොපට කෙතෙක් කල් දැ? යි. හිමියනි, උවසු බවට පැමිණි මට ද තිසෙක් පමණ වසැ යි. ගැහැවි, මේ තිසක් පමණ වසින් මිනිස්දහමින් වැඩි පහසුවිහරණ වූ අරි බව කිරීමෙහි සමත් කිසියම් නැණදසුන් වෙසෙසක් ලබන ලද දැ? යි හිමියනි, කිම නො වන්නේ ද? හිමියනි, මම යම් තාක් කැමති වෙම් නම් ඒ තාක් කාමයන්ගෙන් වෙන් ව ම අකුශල ධර්‍මයන්ගෙන් වෙන් ව ම විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සුවය ඇති පළමු වන දැහැනට එළඹ වෙසෙමි. හිමියනි, මම යම් තාක් කැමති වෙම් නම් ඒ තාක් විතර්ක විචාර සන්හිඳීමෙන් ... දෙවන දැහැනට එළඹ වෙසෙමි. හිමියනි, මම යම් තාක් කැමති වෙම් නම් ඒ තාක් ප්‍රීතියත් වැළැක් වීමෙන් ... තෙවන දැහැනට එළඹ වෙසෙමි. හිමියනි, මම යම් තාක් කැමති වෙම් නම් ඒ තාක් සුවත් පැහීමෙන් ... සිවුවන දැහැනට එළඹ වෙසෙමි. හිමියනි, ඉදින් මම භාග්‍යවතුන් වහන්සේට පළමුකොට කලුරිය කරන්නෙම් නම් "යම් සංයෝජනයකින් යෙදුණු චිත්‍ත ගැහැවි තෙමේ යළි මෙලොවට එන්නේ ද එබඳු සංයෝජනයෙක් නැතැයි භාග්‍යවතුන් වහන්සේ මා ගැන යමක් මෙසේ වදරන්නාහු නම් මේ පුදුමයෙක් නො වේ මැ යි.

මෙසේ කී කල්හි අචෙලකස්සප තෙමේ චිත්‍ත ගැහැවිහට මෙය කී ය: යම් හෙයකින් සුදුවත් හැඳගත් ගිහියෝ මිනිස්දහමින් වැඩි පහසු විහරණ වූ අරිබව කිරීමෙහි සමත් මෙබඳු නැණ-දසුන් වෙසෙසක් ලැබුවාහු නම් පින්වත, දහම්හි ස්වාඛ්‍යාත බව ඒකාන්තයෙන් ආශ්චර්‍ය්‍යයෙකි. පින්වත ඒකාන්තයෙන් පුදුමයෙකි. ගැහැවි, මම මෙසස්නෙහි පැවිද්ද ලබන්නෙමි. උපසපුව ලබන්නෙමි යි.

ඉක්බිති චිත්‍ත ගැහැවි තෙමේ අචෙලකස්සපයන් රැගෙන ස්ථවිර භික්‍ෂූන් වෙත එළඹියේ ය. එළඹ ස්ථවිර භික්ෂූන්ට මෙය කී ය: වහන්ස, මේ අචෙලකස්සප තෙමේ අපගේ පැරණි ගිහි යහළුවෙකි. තෙරහු මොහු පැවිදි කෙරෙත්වා. උපසපන් කෙරෙත්වා. මම මොහුට සිවුරු පිඩු සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර පිළිබඳ ව උත්සාහ කරන්නෙමි යි.

අචෙලකස්සප තෙමේ මෙසසුනෙහි පැවිද්ද ලදි. උපසපුව ලදී. උපසපන් වූ නො බෝකල් ඇති ආයුෂ්මත් කස්සප තෙමේ එකලාව ගණයා කෙරෙන් වෙන් ව නො පමා ව කෙලෙස් තවන වෙර ඇති ව නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති ව වෙසෙන්නේ නොබෝ-කලකින් ම කුලපුත්තු යමක් පිණිස මැනවින් ම ගිහිගෙන් නික් ම සස්නෙහි පැවිදි වෙත් නම් අනුතුරු වූ බඹසර කෙළවර වූ ඒ රහත් බව දිටුදැම්යෙහි ම තෙමේ ම වෙසෙසින් දැන පසක් කොට එයට පැමිණ විසී ය. ඉපැද්ම ගෙවුණි. බඹසර වැස නිමවන ලදී. රහත්බව පිණිස කටයුතු කරන ලදී. මේ රහත්බව පිණිස අනෙකක් නැතැ යි දැනගත්තේ ය. ආයුෂ්මත් කස්සප තෙරණුවෝ රහතුන් අතුරෙන් එක්තරා කෙනෙක් ද වූ හ යි.

## 7. 1. 10

## ගිලානසුත්තං

414. තෙන ඛො පන සමයෙන චිත්තො ගහපති ආබාධිකො හොති දුක්ඛිතො බාළ්හගිලානො. අථ ඛො සම්බහුලා ආරාමදෙවතා වනදෙවතා රුක්ඛදෙවතා ඔසධී තිණ වනස්පතීසු[1] අධිවත්ථා දෙවතා සඞ්ගම්ම සමාගම්ම චිත්තං ගහපතිං එතදවොචුං: පණිධෙහි ගහපති අනාගතමද්ධානං රාජා අස්සං චක්කවත්තීති. එවං වුත්තෙ චිත්තො ගහපති තා ආරාමදෙවතා වනදෙවතා රුක්ඛදෙවතා ඔසධී තිණ වනස්පතීසු අධිවත්ථා දෙවතා එතදවොච: 'තම්පි අනිච්චං, තම්පි අද්ධුවං තම්පි පහාය ගමනීයන්ති'. එවං වුත්තෙ චිත්තස්ස ගහපතිනො මිත්තාමච්චා ඤාතිසාලොහිතා චිත්තං ගහපතිං එතදවොචුං: 'සතිං අය්‍යපුත්ත උපට්ඨපෙහි මා විප්පලපී'ති[2]

කින්තාහං[3] වදාමි යං මං තුම්හෙ එවං වදෙථ: 'සතිං අය්‍යපුත්ත උපට්ඨපෙහි මා විප්පලපී'ති. එවං ඛො ත්වං අය්‍යපුත්ත වදෙසි: "තම්පි අනිච්චං තම්පි අද්ධුවං තම්පි පහාය ගමනීය'න්ති. තථා හි පන මං ආරාමදෙවතා වනදෙවතා රුක්ඛදෙවතා ඔසධී තිණ වනස්පතීසු අධිවත්ථා දෙවතා එවමාහංසු: 'පණිධෙහි ගහපති අනාගතමද්ධානං රාජා අස්සං චක්කවත්තී'ති. තාසාහං එවං වදමි: තම්පි අනිච්චං තම්පි අද්ධුවං තම්පි පහාය ගමනීයන්ති. කින්නෙතා[4] අය්‍යපුත්ත ආරාමදෙවතා වනදෙවතා රුක්ඛදෙවතා ඔසධී තිණ වනස්පතීසු අධිවත්ථා දෙවතා අත්ථවසං සම්පස්සමානා එවමාහංසු: පණිධෙහි ගහපති අනාගතමද්ධානං රාජා අස්සං චක්කවත්තීති.

තාසං ඛො ආරාමදෙවතානං වනදෙවතානං රුක්ඛදෙවතානං ඔසධී තිණ වනස්පතීසු අධිවත්ථානං දෙවතානං එවං හොති: අයං ඛො චිත්තො ගහපති සීලවා කල්‍යාණධම්මො, සචෙ පණිදහිස්සති අනාගතමද්ධානං රාජා අස්සං චක්කවත්තීති,[5] ඉජ්ඣිස්සති සීලවතො චෙතොපණිධි, විසුද්ධත්තා සීලස්ස, ධම්මිකො ධම්මරාජා ධම්මිකං බලිං[6] අනුප්පදස්සතීති[7]. ඉමං[8] ඛො ආරාමදෙවතා වනදෙවතා රුක්ඛදෙවතා ඔසධීතිණවනස්පතීසු අධිවත්ථා දෙවතා අත්ථවසං සම්පස්සමානා එවමාහංසු: 'පණිධෙහි ගහපති අනාගතමද්ධානං රාජා අස්සං චක්කවත්තී'ති, තාසාහං එවං වදමි: 'තම්පි අනිච්චං තම්පි අද්ධුවං තම්පි පහාය ගමනීය'න්ති.

1 වනප්පතීසු - මජසං.
2 විප්පලපසි - සයා.
3 කින්තාහං - සී 1, 2
4 කිම්පනතා - සයා, මජසං,
5 තස්ස ඛො අයං - මජසං, සයා,
6 ඵල – මජසං. බලං - සයා
7 අනුපදස්සතීති - මජසං
8 ඉමා ඛො තා - සයා.

# 7. 1. 10

## ගිලාන සූත්‍රය

414. එසමයෙහි **චිත්ත ගැහැවි** තෙමේ හටගත් ආබාධ ඇත්තේ දුකට පැමිණියේ දැඩිසේ ගිලන් වූයේ වෙයි. එකල්හි බොහෝ වූ අරම්වැසි දෙවියෝ ද වනවැසි දෙවියෝ ද රුක්දෙවියෝ ද ඔසධිතෘණ වනදෙටුරුක්හි අරක්ගත් දෙවියෝ ද එක්ව රැස්ව චිත්ත ගැහැවිහට ගැහැවි, මතු සක්විතිරජ වෙම් ව යි සිත පිහිටුවවයි කීහ. එසේ කී කල්හි චිත්ත ගැහැවි තෙමේ ඒ අරම්වැසි දෙවියන්ට වනවැසි දෙවියන්ට රුක්දෙවියන්ට ඔසධිතෘණවනදෙටුරුක්හි අරක්ගත් දෙවියන්ට "එ ද අනිස ය. එ ද නො තිර ය. එ ද හැර දමා යා යුතු ය"යි මෙය කීය. එසේ කී කල්හි චිත්ත ගැහැවිහුගේ මිතුඇමති නෑ සහලේ නෑයෝ චිත්ත ගැහැවිහට 'හිමියනි, සිහි එලවා ගනු මැනවි, නහමක් නන්දෙඩනු මැනවැ'යි කීහ.

මා කුමක් කී හෙයින් තෙපි මට "හිමියනි, සිහි එළවා ගනු මැනව, නහමක් නන්දෙඩනු මැනවැ" යි මෙසේ කියවු ද. "හිමියනි, තෙපි එ ද අනිස ය එ ද නො තිරය. එ ද හැර දමා යා යුතුයයි මෙසේ කියවු"යි. ඒ එසේ මැයි. අරම්වැසි දෙවියෝත් වනවැසි දෙවියෝත් රුක්දෙවියෝත් ඔසධිතෘණ වනදෙටුරුක්හි අරක්ගත් දෙවියෝත් මට ගැහැවි මතු සක්විති රජ වෙම්ව යි සිත පිහිටුව යි මෙසේ කීහ. ඔවුන්ට මම "එ ද අනිස ය. එ ද නො තිර ය. එ ද හැරදමා යා යුතු ය"යි මෙසේ කියමි යි. හිමියනි, ඒ අරම්වැසි දෙවියෝ වනවැසි දෙවියෝ රුක්දෙවියෝ ඔසධිතෘණ වනදෙටුරුක්හි අරක්ගත් දෙවියෝ කුමන ප්‍රයෝජනයක් දක්නාහු 'ගැහැවි මතු සක්විතිරජ වෙම්වයි සිත පිහිටුව' යි මෙසේ කීහු දැ යි.

ඒ අරම්වැසි දෙවියන්ට වනවැසි දෙවියන්ට රුක්දෙවියන්ට ඔසධිතෘණ වනදෙටුරුක්හි අරක්ගත් දෙවියන්ට මෙබඳු සිතෙක් වෙයි. මේ චිත්ත ගැහැවි තෙමේ සිල්වත් ය. කලණ දහම් ඇත්තේ ය. ඉදින් මතු සක්විති රජ වෙම්ව යි පතන්නේ නම් සිල්වත්හුගේ පැතීම සමෘද්ධ වන්නේය. ශීලය පිරිසිදු බැවිනි. දැහැමි දහම්රජ තෙමේ දැහැමි බිලි දෙන්නේ යයි මේ ප්‍රයෝජනය දක්නා අරම්වැසි දෙවියෝ වනවැසි දෙවියෝ රුක්දෙවියෝ ඔසධිතෘණ වනදෙටුරුක්හි අරක්ගත් දෙවියෝ ගැහැවි, මතු සක්විති රජ වෙම්ව යි සිත පිහිටුව යි මෙසේ කීහ. ඔවුන්ට මම එ ද අනිස ය. එ ද නො තිරය. එ ද හැරදමා යා යුතු යයි මෙසේ කියමි යි.

තෙන හි අය්‍යපුත්තා අම්හෙපි ඔවදෙහීති.[1] තස්මාතිහ වො එවං සික්ඛිතබ්බං: බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතා භවිස්සාම, ඉතිපි සො භගවා අරහං සම්මා සම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථී සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති. ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතා භවිස්සාම: ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති. සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතා භවිස්සාම: සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, උජුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, ඤායපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, සාමීචිපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිසපුග්ගලා එස භගවතො සාවකසඞ්ඝො ආහුනෙය්‍යො පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති. යං ඛො පන කිඤ්චි කුලෙ දෙය්‍යධම්මං සබ්බන්තං අප්පටිවිභත්තං භවිස්සති සීලවන්තෙහි කල්‍යාණධම්මෙහීති. එවං හි වො සික්ඛිතබ්බන්ති.

අථ ඛො චිත්තො ගහපති මිත්තාමච්චෙ ඤාතිසාලොහිතෙ බුද්ධෙ ච ධම්මෙ ච සඞ්ඝෙ ච පසාදෙ චාගෙ ච[2] සමාදපෙත්වා කාලමකාසීති

**චිත්තවග්ගො පඨමො.**

**තත්‍රුද්දානං:**

සංයොජනං ද්වෙ ඉසිදත්තා මහකො කාමභූපි ච
ගොදත්තො ච නිගණ්ඨො ච අචෙලෙන ගිලානන්ති.

**චිත්තසංයුත්තං සමත්තං**

1. ඔවදථාති - ස්‍යා, මජසං.
2. සඞ්ඝෙ ච චාගෙ ච - මජසං, ස්‍යා.

හිමියනි එසේ නම් අපටත් ඔවදන් දෙනු මැනවැ යි. එහෙයින් මෙහි ලා තොප විසින් මෙසේ හික්මිය යුතු යි. ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු රහත්හ, සම්මාසම්බුද්ධහ, විජ්ජාචරණ සම්පන්නහ, සුගතහ, ලොකවිදූහ, අනුත්තරපුරිසදම්මසාරථීහ, දෙව්-මිනිසුන්ට ශාස්තෘහ, බුද්ධහ, භගවත්හ යි මෙසේ බුදුන් කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වන්නෙමු. භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය ස්වාඛ්‍යාත ය, සන්දිට්ඨික ය, අකාලික ය, එහිපස්සික ය, ඔපනයික ය, නුවණැත්තවුන් විසින් තමතමා කෙරෙහි ලා දත යුතු යයි මෙසේ දහම්හි ගුණ දැන පැහැදීමෙන් යුතු වන්නෙමු. භගවත්හුගේ ශ්‍රාවකසඞ්ඝ තෙමේ සුපටිපන්න ය, භගවත්හුගේ ශ්‍රාවක සඞ්ඝ තෙමේ උජුපටිපන්න ය, භගවත්හුගේ ශ්‍රාවක සඞ්ඝ තෙමේ ඤායපටිපන්න ය, භගවත්හුගේ ශ්‍රාවක සඞ්ඝ තෙමේ සාමීචි-පටිපන්න ය, යම් මේ පුරිසයුග සතරෙක් වේ ද එහි පුරිස පුග්ගලයෝ අටදෙනෙකි, භගවත්හුගේ මේ ශ්‍රාවක සඞ්ඝ තෙමේ ආහුනෙය්‍ය ය, පාහුනෙය්‍ය ය, දක්ඛිණෙය්‍ය ය, අඤ්ජලිකරණීය ය. ලෝවැස්සාට උතුම් පින්කෙතැ යි මෙසේ සඟුන් කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වන්නෙමු. ගෙහි යම් කිසි දියයුතු දැයක් වේ නම් ඒ සියල්ල කලණ දහම් ඇති සිල්වතුන් හා නො බෙදන ලද්දේ (සාධාරණ) වන්නේ යයි තොප විසින් මෙසේ හික්මිය යුතු යි.

ඉක්බිති චිත්තගැහැවි තෙමේ මිතු ඇමති නෑ සහලේනෑයන් බුදුන් කෙරෙහිත් දහම්හිත් සඞ්ඝයා කෙරෙහිත් පැහැදීමෙහි ද ත්‍යාග ගුණයෙහි ද සමාදන් කරවා කළුරිය කෙළේ යි.

**පළමුවැනි චිත්තවර්ග යි.**

**එහි සූත්‍රනාමාවලිය :**

සංයෝජනසූත්‍රය, ඉසිදත්තසූත්‍ර දෙක ය, මහකසූත්‍රය, කාමභූසූත්‍ර දෙක ය, ගොදත්ත, නිගණ්ඨ, අචෙල, ගිලාන සූත්‍ර සතර යයි සූත්‍ර දශයෙකි.

**චිත්තසංයුත්තය නිමියේ යි.**

# 8. ගාමණීසංයුත්තං

## 8. ගාමණීවග්ගො

### 8. 1. 1

### චණ්ඩගාමණීසුත්තං

415. එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො චණ්ඩො ගාමණී යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො චණ්ඩො ගාමණී භගවන්තං එතදවොච: කො නු ඛො භන්තෙ හෙතු කො පච්චයො යෙන මිධෙකච්චො චණ්ඩො[1]තෙව සඞ්ඛං ගච්ඡති, කො පන භන්තෙ හෙතු කො පච්චයො යෙන මිධෙකච්චො සොරතො[2]තෙව සඞ්ඛං ගච්ඡතීති.

ඉධ ගාමණී එකච්චස්ස රාගො අප්පහීනො හොති, රාගස්ස අප්පහීනත්තා පරෙ කොපෙන්ති, පරෙහි කොපියමානො කොපං පාතුකරොති, සො චණ්ඩොතෙව සඞ්ඛං ගච්ඡති, දොසො අප්පහීනො හොති, දොසස්ස අප්පහීනත්තා පරෙ කොපෙන්ති, පරෙහි කොපියමානො කොපං පාතුකරොති, සො චණ්ඩොතෙව සඞ්ඛං ගච්ඡති, මොහො අප්පහීනො හොති, මොහස්ස අප්පහීනත්තා පරෙ කොපෙන්ති, පරෙහි කොපියමානො කොපං පාතුකරොති, සො චණ්ඩොතෙව සඞ්ඛං ගච්ඡති. අයං ඛො ගාමණී හෙතු අයං පච්චයො යෙනමිධෙකච්චො චණ්ඩොතෙව සඞ්ඛං ගච්ඡති.

ඉධ පන ගාමණී එකච්චස්ස රාගො පහීනො හොති, රාගස්ස පහීනත්තා පරෙ න කොපෙන්ති, පරෙහි කොපියමානො කොපං න පාතුකරොති, සො සොරතොතෙව සඞ්ඛං ගච්ඡති, දොසො පහීනො හොති, දොසස්ස පහීනත්තා පරෙ න කොපෙන්ති, පරෙහි කොපියමානො කොපං න පාතුකරොති, සො සොරතොතෙව සඞ්ඛං ගච්ඡති. මොහො පහීනො හොති, මොහස්ස පහීනත්තා පරෙ න කොපෙන්ති, පරෙහි කොපියමානො කොපං න පාතුකරොති, සො සොරතොතෙව සඞ්ඛං ගච්ඡති. අයං ඛො ගාමණී හෙතු අයං පච්චයො යෙනමිධෙකච්චො සොරතොතෙව සඞ්ඛං ගච්ඡතීති.

---

1. චණ්ඩො චණ්ඩො තෙව - මජසං, චණ්ඩො චණ්ඩො තෙව - සයා
2. සොරතො සොරතො තෙව - මජසං, සොරතො සොරතො තෙව - සයා, සුරතො තෙව - සී 1,2

# 8. ග්‍රාමණි සංයුත්තය

## 8. ග්‍රාමණී වර්ගය

### 8. 1. 1

### චණ්ඩගාමණී සූත්‍රය

415. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවත සමීපයෙහි ජේතවන නම් අනේපිඬුසිටුහුගේ අරමෙහි වැඩවසන සේක. එකල්හි චණ්ඩගාමණී තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස්ව හුන්නේ ය. එකත්පස්ව හුන් චණ්ඩගාමණී තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: වහන්ස, යම් හෙයෙකින් මෙහි එකෙක් සැඩ යයි ම ගණනට යේ නම් එයට කිමෙක් හේතු ද? කිමෙක් ප්‍රත්‍යය ද? වහන්ස, යම් හෙයෙකින් මෙහි එකෙක් මොලොක් ය යි ම ගණනට යේ නම් එයට කිමෙක් හේතු ද? කිමෙක් ප්‍රත්‍යය ද යි.

ගාමණී, මෙහි එකකුගේ රාගය අප්‍රහීනවූයේ වෙයි. රාගය අප්‍රහීන බැවින් අන්හු කුප්පත්. මෙරමා විසින් කුප්පනු ලබන්නේ කෝපය පහළ කෙරෙයි. හෙතෙමේ සැඩය යි ම ගණනට යේ. දෙසය අප්‍රහීනවූයේ වෙයි. දෙසය අප්‍රහීන බැවින් අන්හු කුප්පත්. මෙරමා විසින් කුප්පනු ලබන්නේ කෝපය පහළ කෙරෙයි. හෙතෙමේ සැඩ ය යි ම ගණනට යේ. මෝහය අප්‍රහීනවූයේ වෙයි. මෝහය අප්‍රහීන බැවින් අන්හු කුප්පත්. මෙරමා විසින් කුප්පනු ලබන්නේ කෝපය පහළ කෙරෙයි. හෙතෙමේ සැඩ ය යිම ගණනට යේ. ගාමණී යම් හෙයෙකින් මෙහි එකෙක් සැඩ ය යි ම ගණනට යේ නම් එයට මේ හේතු යි මේ ප්‍රත්‍ය ය යි.

ගාමණී, මෙහි එකකුගේ රාගය ප්‍රහීනවූයේ වෙයි. රාගය ප්‍රහීන බැවින් අන්හු නොකුප්පත්, මෙරමා විසින් කුප්පනු ලබන්නේ කෝපය නො පහළ කෙරෙයි. හෙතෙමේ මොළොක් ය යි ම ගණනට යේ. දෙසය ප්‍රහීන වෙයි. දෙසය ප්‍රහීන බැවින් අන්හු නොකුප්පත්. මෙරමා විසින් කුප්පනු ලබන්නේත් කෝපය නො පහළකෙරෙයි. හෙතෙමේ මොළොක් ය යි ම ගණනට යේ. මෝහය ප්‍රහීන වෙයි. මෝහය ප්‍රහීන බැවින් අන්හු නොකුප්පත්. මෙරමා විසින් කුප්පනු ලබන්නේත් කෝපය නොපහළ කෙරෙයි. හෙතෙමේ මොළොක් ය යි ම ගණනට යේ. ගාමණී, යම් හෙයෙකින් මෙහි එකෙක් මොළොක් ය යි ම ගණනට යේ නම් එයට මේ හේතු යි. මේ ප්‍රත්‍යය යි.

එවං වුත්තෙ චණ්ඩො ගාමණී භගවන්තං එතදවොච: අභික්කන්තං භන්තෙ අභික්කන්තං භන්තෙ, සෙය්‍යථාපි භන්තෙ නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය අන්ධකාරෙ වා තෙල පජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති, එවමෙවං භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො, එසාහං භන්තෙ භගවන්තං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච, උපාසකං මං භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

## 8. 1. 2

## තාලපුටසුත්තං

416. එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දක නිවාපෙ. අථ ඛො තාලපුටො[1] නටගාමණී යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො තාලපුටො නටගාමණී භගවන්තං එතදවොච: සුතං මෙතං භන්තෙ පුබ්බකානං ආචරියපාචරියානං නටානං භාසමානානං යො සො නටො රඞ්ගමජ්ඣෙ සමජ්ජමජ්ඣෙ සච්චාලිකෙන ජනං හාසෙති රමෙති, සො කායස්ස භෙදා පරම්මරණා පහාසානං දෙවානං සහව්‍යතං උපපජ්ජතීති. ඉධ භගවා කිමාහාති.

අලං ගාමණී තිට්ඨතෙතං, මා මං එතං පුච්ඡී[2]ති. දුතියම්පි ඛො තාලපුටො නටගාමණී භගවන්තං එතදවොච: සුතං මෙතං භන්තෙ පුබ්බකානං ආචරියපාචරියානං නටානං භාසමානානං යො සො නටො රඞ්ගමජ්ඣෙ සමජ්ජමජ්ඣෙ සච්චාලිකෙන ජනං හාසෙති රමෙති, සො කායස්ස භෙදා පරම්මරණා පහාසානං දෙවානං සහව්‍යතං උපපජ්ජතී ති ඉධ භගවා කිමාහාති. අලං ගාමණී තිට්ඨතෙතං මා මං එතං පුච්ඡීති. තතියම්පි ඛො තාලපුටො නටගාමණී භගවන්තං එතදවොච, සුතං මෙතං භන්තෙ පුබ්බකානං ආචරියපාචරියානං නටානං භාසමානානං යො සො නටො රඞ්ගමජ්ඣෙ සමජ්ජමජ්ඣෙ සච්චාලිකෙන ජනං හාසෙති රමෙති, සො කායස්ස භෙදා පරම්මරණා පහාසානං දෙවානං සහව්‍යතං උපපජ්ජතීති. ඉධ භගවා කිමාහාති.

---

1. තාලපුත්තො සත්‍යා, අට්ඨකථා
2. පුච්ඡාති සී 1

මෙසේ වදළ කල්හි චණ්ඩගාමණි තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: වහන්ස ඉතා මැනවි. වහන්ස ඉතා මැනවි. වහන්ස යම් සේ යටිකුරුවූවක් හෝ උඩුකුරු කරන්නේ ද, වැසුණු දෙයක් හෝ වැසුම් හරින්නේ ද, මංමුළාවූවකුට හෝ මග කියා දෙන්නේ ද, ඇස් ඇත්තෝ රූ දකින්නාහ යි අඳුරෙහි හෝ තෙල් පහනක් දරන්නේ ද, එසෙයින් ම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් නයින් දහම් පවසන ලදී. වහන්ස ඒ මම භාග්‍යවතුන් වහන්සේත් දහමත් බික්සඟනත් සරණ යෙමි. අද පටන් දිවිහිමියෙන් සරණ ගිය උවසුවකු කොට මා දරන සේක්වා යි.

## 8. 1. 2

## තාලපුට සූත්‍රය

416. එක්සමයෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර සමීපයෙහි කලන්දකනිවාප නම් වේළුවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි තාලපුට නම් නටගාමණි තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස්ව හුන්නේ ය. එකත්පස්ව හුන් තාලපුට නටගාමණි තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: වහන්ස යම් ඒ නළුවෙක් රඟමැද නැටුම් මැද ඇත්තෙනුත් බොරුවෙනුත් ජනයා සතුටු කරවා ද, ඇලුම් කරවා ද, හෙතෙමේ කාබුන් මරණින් මතු පහාස දෙවියන්ගේ සහභාවයට පැමිණේ යයි. මෙය මා විසින් පෙර විසූ ඇජර පැජර නළුවන් කියද්දී අසන ලදී. මෙහිලා භාග්‍යවතුන් වහන්සේ කුමක් වදරන සේක්දැ යි.

ගාමණි, කම් නැත. මෙය තිබේවා. මෙය නහමක් මා පුළුවුස් වයි. දෙවනවට ද තාලපුට නටගාමණි තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: වහන්ස, යම් ඒ නළුවෙක් රඟමැද නැටුම් මැද ඇත්තෙනුත් බොරුවෙනුත් ජනයා සතුටු කරවා ද, ඇලුම් කරවා ද, හෙතෙමේ කාබුන් මරණින් මතු පහාස දෙවියන්ගේ සහභාවයට පැමිණේ ය යි මෙය මා විසින් පෙරවිසූ ඇජර පැජර නළුවන් කියද්දී අසන ලදී. මෙහිලා භාග්‍යවතුන් වහන්සේ කුමක් වදරන සේක් දැ යි. ගාමණි, කම් නැත. මෙය තිබේවා. මෙය නහමක් මා පුළුවුස්වයි. තෙවන වට ද තාලපුට නටගාමණි තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: වහන්ස, යම් ඒ නළුවෙක් රඟමැද නැටුම්මැද සැබෑවෙනුත් බොරුවෙනුත් ජනයා සිනා ගන්වා ද ඇලුම් කරවා ද හෙතෙමේ කාබුන් මරණින් මතු පහාස දෙවියන්ගේ සහභාවයට පැමිණේ ය යි මෙය මා විසින් පෙර විසූ ඇජර පැජර නළුවන් කියද්දී අසන ලදී. මෙහි ලා භාග්‍යවතුන් වහන්සේ කුමක් වදරන සේක්දැ යි.

අද්ධා ඛො ත්‍යාහං ගාමණි, න ලභාමි[1] "අලං ගාමණි තිට්ඨතෙතං මා මං එතං පුච්ඡී"ති. අපිච ත්‍යාහං ව්‍යාකරිස්සාමි. පුබ්බෙ ඛො ගාමණි, සත්තා අවීතරාගා රාගබන්ධනබද්ධා,[2] තෙසං නටො රඞ්ගමජ්ඣෙ සමජ්ජමජ්ඣෙ යෙ ධම්මා රජනීයා තෙ උපසංහරති භීය්‍යො සරාගාය[3]. පුබ්බෙ ඛො ගාමණි සත්තා අවීතදොසා දොසබන්ධනබද්ධා, තෙසං නටො රඞ්ගමජ්ඣෙ සමජ්ජමජ්ඣෙ යෙ ධම්මා දොසනීයා තෙ උපසංහරති භීය්‍යො සදොසාය[3]. පුබ්බෙ ඛො ගාමණි, සත්තා අවීතමොහා මොහබන්ධනබද්ධා, තෙසං නටො රඞ්ගමජ්ඣෙ සමජ්ජමජ්ඣෙ යෙ ධම්මා මොහනීයා තෙ උපසංහරති භීය්‍යො සමොහාය[3]. සො අත්තනා මත්තො පමත්තො පරෙ මදෙත්වා පමාදෙත්වා කායස්ස භෙදා පරම්මරණා පහාසො නාම නිරයො තත්‍රූපපජ්ජති[4].

සචෙ ඛො පනස්ස එවං දිට්ඨි හොති "යො සො නටො රඞ්ගමජ්ඣෙ සමජ්ජමජ්ඣෙ සච්චාලිකෙන ජනං හාසෙති රමෙති, සො කායස්ස භෙදා පරම්මරණා පහාසානං දෙවානං සහබ්‍යතං උපපජ්ජතී"ති සාස්ස හොති මිච්ඡා දිට්ඨි, මිච්ඡා දිට්ඨිකස්ස ඛො පනාහං ගාමණි පුරිසපුග්ගලස්ස ද්වින්නං ගතීනං අඤ්ඤතරං ගතිං වදාමි නිරයං වා තිරච්ඡානයොනිං වාති.

එවං වුත්තෙ තාලපුටො නටගාමණි පරොදි, අස්සූනි පවත්තෙසි. "එතං ඛො ත්‍යාහං ගාමණි නාලත්ථං, අලං ගාමණි තිට්ඨතෙතං මා මං එතං පුච්ඡී"ති.

නාහං භන්තෙ එතං රොදාමි, යං මං භගවා එවමාහ, අපිචාහං භන්තෙ පුබ්බකෙහි ආචරියපාචරියෙහි නටෙහි දීඝරත්තං නිකතො වඤ්චිතො පරද්ධො[5]: "යො සො නටො රඞ්ගමජ්ඣෙ සමජ්ජමජ්ඣෙ සච්චාලිකෙන ජනං හාසෙති රමෙති, සො කායස්ස භෙදා පරම්මරණා පහාසානං දෙවානං සහබ්‍යතං උපපජ්ජතී"ති.

අභික්කන්තං භන්තෙ, අභික්කන්තං භන්තෙ, සෙය්‍යථාපි භන්තෙ නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති. එවමෙවං භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භන්තෙ භගවන්තං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච, ලභෙය්‍යාහං භන්තෙ භගවතො සන්තිකෙ පබ්බජ්ජං ලභෙය්‍යං උපසම්පදන්ති. අලත්ථ ඛො තාලපුටො නටගාමණි භගවතො සන්තිකෙ පබ්බජ්ජං, අලත්ථූපසම්පදං, අචිරූපසම්පන්නො ච පනායස්මා තාලපුටො එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො -පෙ- අඤ්ඤතරො ච පනායස්මා තාලපුටො අරහතං අහොසීති.

---

1. නාලත්ථං — ස්‍යා, PTS
2. බන්ධා — ස්‍යා.
3. භීය්‍යොසොමත්තාය — මජ්ඣං
4. තත්ථ උපපජ්ජති — මජ්ඣං. ස්‍යා.
5. පලුද්ධො—මජ්ඣං, ස්‍යා

ගාමණී මම "ගාමණී, කම් නැත, මෙය තිබේවා. මෙය නහමක් මා පුළුවුස් ව" යි තොපගෙන් එකාන්තයෙන් නො ලබමි. යළිදු තොපට මම විසඳන්නෙමි. ගාමණී, පෙර සත්ත්‍වයෝ නො පහ වූ රාග ඇතියහ. රාග බැඳුමෙන් බැඳුණහ. ඔවුන්ට නළු තෙමේ රඟමැද නැටුම්මැද යම් දහම්හු ඇලුම් කටයුත්තාහු නම් ඔවුන් බෙහෙවින් රාග සහිත වීම පිණිස එළවා දක්වයි. ගාමණී, පෙර සත්ත්‍වයෝ නො පහ වූ දෙස ඇතියහ. දෙසබැඳුමෙන් බැඳුණහ. ඔවුන්ට නළු තෙමේ රඟ මැද නැටුම් මැද යම් දහම්හු දෙසයට කරුණු වෙති නම් ඔවුන් බෙහෙවින් දෙස සහිත වීම පිණිස එලවා දක්වයි. ගාමණී, පෙර සත්ත්‍වයෝ නොපහ වූ මොහ ඇතියහ. මොහබැඳුමෙන් බැඳුණහ. ඔවුන්ට නළු තෙමේ රඟ මැද නැටුම් මැද යම් දහම්හු මොහයට කරුණු වෙත් නම් ඔවුන් බෙහෙවින් මොහ සහිත වීම පිණිස එළවා දක්වයි.

හේ තෙමේ මත්වූයේ පමා වූයේ මෙරමා මත් කරවා පමා කරවා කාබුන් මරණින් මතු පහාස නම් නිරයෙක් වේ නම් එහි උපදී. ඉදින් ඔහුට "යම් ඒ නළුවෙක් රඟමැද නැටුම් මැද සැබැවෙනුත් බොරුවෙනුත් ජනයා සිනා ගන්වා ද ඇලුම් කරවා ද හෙතෙමේ කාබුන් මරණින් මතු පහාස නම් දෙවියන්ගේ සහභාවයට පැමිණේ ය" යි මෙබඳු දිටෙක් වේ නම් ඒ ඔහුගේ මිසදිටු වේ. ගාමණී, මිසදිටු ගත් පුරිස පුඟුල්හට නිරය හෝ තිරිසන් යොනිය හෝ දෙගති අතුරෙන් එක්තරා ගතියක් කියමි යි.

මෙසේ වදළ කල්හි තාලපුට නටගාමණී තෙමේ හැඩී ය. කඳුලු හෙළී ය. ගාමණී මම "ගාමණී, කම් නැත. මෙය තිබේවා, මෙය නහමක් මා පුළුවුස්ව" යි මෙය තොපගෙන් නො ලදිමි.

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මට යමක් වදළ සේක් නම් මේ ගැන මම නො හඬමි. වහන්ස, වැලිදු "යම් ඒ නළුවෙක් රඟමැද නැටුම්මැද සැබැවෙනුත් බොරුවෙනුත් ජනයා සිනා ගන්වා ද ඇලුම් කරවාද හෙතෙමේ කාබුන් මරණින් මතු පහාස දෙවියන්ගේ සහභාවයට පැමිණේ ය" යි පෙර විසූ ඇජර පැජර නළුවන් විසින් මම දිගුකලක් මුළුල්ලෙහි මුළා කරන ලද්දෙමි. රවටන ලද්දෙමි. වරද්දන ලද්දෙමි.

වහන්ස ඉතා මැනවි. වහන්ස, යම්සේ යටිකුරු වූවක් හෝ උඩුකුරු කරන්නේ ද වැසුණු දෑයක් හෝ වැසුම් හරින්නේ ද මංමුළා වූවකුට හෝ මඟ කියා දෙන්නේ ද ඇස් ඇත්තෝ රූ දක්නාහයි අඳුරෙහි හෝ තෙල් පහනක් දරන්නේ ද එසෙයින් ම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් නයින් දහම් පවසන ලදි. වහන්ස, මේ මම භාග්‍යවතුන් වහන්සේත් දහමත් බික්සඟනත් සරණ යෙමි. වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේ ළඟ පැවිද්ද ලබන්නෙමි. උපසපුව ලබන්නෙමි යි. තාලපුට නටගාමණී තෙමේ භාග්‍යවතුන් වහන්සේ ළඟ පැවිද්ද ලදි. උපසපුව ලදි. උපසපන් වූ නොබෝ කල් ඇති ආයුෂ්මත් තාලපුට තෙරණුවෝ එකලා ව ගණයා කෙරෙන් වෙන් ව නො පමා ව කෙලෙස් තවන වෙර ඇති ව නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති ව වෙසෙන්නාහු ... ආයුෂ්මත් තාලපුට තෙරණුවෝ රහතුන් අතුරෙන් එක්තරා කෙනෙක් ද වූහ යි.

## 8. 1. 3

## යොධාජීවසුත්තං

417. අථ ඛො **යොධාජීවො ගාමණී** යෙන භගවා තෙනුප-සඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො යොධාජීවො ගාමණී භගවන්තං එතදවොච: සුතං මෙතං භන්තෙ පුබ්බකානං ආචරිය පාචරියානං යොධාජීවානං භාසමානානං යො සො යොධාජීවො සඞ්ගාමෙ උස්සහති වායමති, තමෙනං උස්සහන්තං වායමන්තං පරෙ හනන්ති පරියාපාදෙන්ති, සො කායස්ස භෙදා පරම්මරණා සරඤ්ජිතානං[1] දෙවානං සහබ්‍යතං උපපජ්ජතීති, ඉධ භගවා කිමාහාති.

අලං ගාමණි, තිට්ඨතෙතං, මා මං එතං පුච්ඡීති. දුතියම්පි ඛො -පෙ- තතියම්පි ඛො යොධාජීවො ගාමණී භගවන්තං එතදවොච: සුතං මෙතං භන්තෙ පුබ්බකානං ආචරියපාචරියානං යොධාජීවානං භාසමානානං "යො සො යොධාජීවො සඞ්ගාමෙ උස්සහති වායමති, තමෙනං උස්සහන්තං වායමන්තං පරෙ හනන්ති පරියාපාදෙන්ති, සො කායස්ස භෙදා පරම්මරණා සරඤ්ජිතානං දෙවානං සහබ්‍යතං උපපජ්ජතීති. ඉධ භගවා කිමාහාති.

අද්ධා ඛො ත්‍යාහං ගාමණි න ලභාමි: අලං ගාමණි, තිට්ඨ-තෙතං, මා මං එතං පුච්ඡීති. අපි ච ත්‍යාහං ව්‍යාකරිස්සාමි යො සො ගාමණි යොධාජීවො සඞ්ගාමෙ උස්සහති වායමති, තස්ස තං චිත්තං පුබ්බෙ හීනං[2] දුක්කටං දුප්පණිහිතං: "ඉමෙ සත්තා හඤ්ඤන්තු වා බජ්ඣන්තු වා උච්ඡිජ්ජන්තු වා විනස්සන්තු වා මා වා අහෙසුං ඉති වාති, තමෙනං උස්සහන්තං වායමන්තං පරෙ හනන්ති පරියාපාදෙන්ති, සො කායස්ස භෙදා පරම්මරණා සරඤ්ජිතො නාම නිරයො තත්ථුපපජ්ජති. සචෙ ඛො පනස්ස එවං දිට්ඨි හොති: "යො සො යොධාජීවො සඞ්ගාමෙ උස්සහති වායමති, තමෙනං උස්සහන්තං වායමන්තං පරෙ හනන්ති පරියාපාදෙන්ති, සො කායස්ස භෙදා පරම්මරණා සරඤ්ජිතානං දෙවානං සහබ්‍යතං උපපජ්ජතී"ති, සාස්ස හොති මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨි-කස්ස ඛො පනාහං ගාමණි පුරිසපුග්ගලස්ස ද්වින්නං ගතීනං අඤ්ඤතරං ගතිං වදාමි නිරයං වා තිරච්ඡානයොනිං වාති.

---

1. සරජිතානං—ස්‍යා, පරජිතානං—මජසං
2. ගහිකං — මජසං

## 8. 1. 3

## යෝධාජීව සූත්‍රය

417. එකල්හි **යෝධාජීවගාමණී** තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය: ... එකත්පස්ව හුන් යෝධාජීව ගාමණී තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: ''වහන්ස, යම් ඒ යෝධාජීවයෙක් (යුද්ධයෙන් ජීවත් වන්නෙක්) යුද්ධයෙහි උත්සාහ කෙරේ ද වෑයම් කෙරේ ද උත්සාහ කරන වෑයම් කරන ඒ මොහු සතුරෝ නසත්. මරණයට පමුණුවත්. හෙතෙමේ කාබුන් මරණින් මතු **සරඤ්ජිත දෙවියන්ගේ** සහභාවයට පැමිණේ ය'' යි මෙය පෙර විසූ ඇජර පැජර යෝධාජීවයන් කියද්දී මවිසින් අසන ලදී. මෙහි ලා භාග්‍යවතුන් වහන්සේ කුමක් වදරන සේක් ද යි.

ගාමණී කම් නැත. මෙය තිබේවා. මා මෙය නහමක් පුළුවුස්ව යි. දෙවනවට දු ... තෙවන වටදු ... යෝධාජීව ගාමණී තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: වහන්ස, ''යම් ඒ යෝධාජීවයෙක් යුද්ධයෙහි උත්සාහ කෙරේ ද, වෑයම් කෙරේද, උත්සාහ කරන වෑයම් කරන ඒ මොහු සතුරෝ නසත්. මරණයට පමුණුවත්. හෙතෙමේ කාබුන් මරණින් මතු සරඤ්ජිත දෙවියන්ගේ සහභාවයට පැමිණේ ය'' යි මෙය මා විසින් පෙර විසූ ඇජර පැජර යෝධාජීවයන් කියද්දී අසන ලදී. මෙහි ලා භාග්‍යවතුන් වහන්සේ කුමක් වදරන සේක් ද යි.

ගාමණී මම ''ගාමණී, කම් නැත. මෙය තිබේවා. මෙය නහමක් මා පුළුවුස්ව'' යි ඒකාන්තයෙන් මෙය තොපගෙන් නො ලබමි. එහෙත් මම තොපට විසඳන්නෙමි. ගාමණී, යම් ඒ යොධාජීවයෙක් යුද්ධයෙහි මේ සත්ත්වයෝ ''නැසෙත්වා හෝ බැඳෙත්වා හෝ සිඳෙත්වා හෝ වැනසෙත්වා හෝ නොවෙත්වා හෝ'' යි උත්සාහ කෙරේ ද වෑයම් කෙරේ ද, ඔහුගේ ඒ සිත පළමු ම ලාමකය. නපුරු කොට කරන ලද්දේ ය. වරදවා පිහිටුවන ලද්දේ ය. (එසේ) උත්සාහ කරන වෑයම් කරන ඒ මොහු සතුරෝ නසත් මරණයට පමුණුවත්. හෙතෙමේ කාබුන් මරණින් මතු සරඤ්ජිත නම් නිරයෙක් වේ නම් එහි උපදී. ඉදින් ඔහුට යම් ඒ යෝධාජීවයෙක්'' යුද්ධයෙහි උත්සාහ කෙරේ ද, වෑයම් කෙරේ ද, උත්සාහ කරන වෑයම් කරන ඒ මොහු සතුරෝ නසත්. මරණයට පමුණුවත්. හෙතෙමේ කාබුන් මරණින් මතු සරඤ්ජිත දෙවියන්ගේ සහභාවයට පැමිණේ ය'' යි මෙබඳු දිට්ඨියක් වේ නම් ඒ ඔහුගේ මිසදිටු වෙයි. ගාමණී, මිසදිටු ගත් පුරිසපුග්ගල් හට නිරය හෝ තිරිසන් යෝනිය හෝ දෙගති අතුරෙන් එක්තරා එකක් කියමි යි.

එවං වුත්තෙ යොධාජීවො ගාමණි පරොදි, අස්සූනි පවත්තෙසි. "එතං ඛො ත්‍යාහං ගාමණි නාලත්ථං, අලං ගාමණි, තිට්ඨතෙතං, මා මං එතං පුච්ඡී"ති.

නාහං භන්තෙ එතං රොදාමි යං මං භගවා එවමාහ, අපිචාහං භන්තෙ පුබ්බකෙහි ආචරියපාචරියෙහි යොධාජීවෙහි දීඝරත්තං නිකතො වඤ්චිතො පලුද්ධො, "යො සො යොධාජීවො සඞ්ගාමෙ උස්සහති වායමති, තමෙනං උස්සහන්තං වායමන්තං පරෙ හනන්ති පරියාපාදෙන්ති, සො කායස්ස භෙදා පරම්මරණා සරඤ්ජිතානං දෙවානං සහව්‍යතං උපපජ්ජතී"ති.

අභික්කන්තං භන්තෙ අභික්කන්තං භන්තෙ -පෙ- අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

## 8. 1. 4

## හත්ථාරොහසුත්තං

418. අථ ඛො **හත්ථාරොහො[1] ගාමණි** යෙන භගවා තෙනුප-සඞ්කමි -පෙ- අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

## 8. 1. 5

## අස්සාරොහසුත්තං

419. අථ ඛො **අස්සාරොහො[2] ගාමණි** යෙන භගවා තෙනුප-සඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො අස්සාරොහො ගාමණි භගවන්තං එතදවොච: සුතං මෙතං භන්තෙ පුබ්බකානං ආචරියපාචරියානං අස්සාරොහානං භාසමා-නානං: යො සො අස්සාරොහො සඞ්ගාමෙ උස්සහති වායමති, තමෙනං උස්සහන්තං වායමන්තං පරෙ හනන්ති පරියාපාදෙන්ති, සො කායස්ස භෙදා පරම්මරණා සරඤ්ජිතානං දෙවානං සහව්‍යතං උප පජ්ජතීති. ඉධ භගවා කිමාහාති. අලං ගාමණි, තිට්ඨතෙතං, මා මං එතං පුච්ඡීති.

දුතියම්පි ඛො -පෙ- තතියම්පි ඛො අස්සාරොහො ගාමණි භගවන්තං එතදවොච: සුතං මෙතං භන්තෙ පුබ්බකානං ආචරිය පාචරියානං අස්සාරොහානං භාසමානානං, යො සො අස්සාරොහො සඞ්ගාමෙ උස්සහති වායමති, තමෙනං උස්සහන්තං වායමන්තං පරෙ හනන්ති, පරියාපාදෙන්ති, සො කායස්ස භෙදා පරම්මරණා සරඤ්ජිතානං දෙවානං සහව්‍යතං උපපජ්ජතීති. ඉධ භගවා කිමාහාති.

1. හත්ථාරුහො — සී 1,2
2. අස්සාරුහො — සී

මෙසේ වදාළ කල්හි යෝධාජීව ගාමණි තෙමේ හැඬී ය. කඳුලු හෙලීය. ගාමණි මම "ගාමණි, කම් නැත. මෙය තිබේවා. මා මෙය නහමක් පුළුවුස්ව යි මෙය තොපගෙන් නො ලදිමි" යි.

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මට යමක් මෙසේ වදාළ සේක් නම් මේ ගැන මම නොහඬමි. වහන්ස වැලිදු "යම් ඒ යෝධාජීවයෙක් යුද්ධයෙහි උත්සාහ කෙරේ ද, වෑයම් කෙරේ ද, (එසේ) උත්සාහ කරන වෑයම් කරන ඒ මොහු සතුරෝ නසත්. මරණයට පමුණුවත්. හෙතෙමේ කාබුන් මරණින් මතු සරඤ්ජිත දෙවියන්ගේ සහභාවයට පැමිණේ ය" යි පෙර විසූ ඇජර පැජර යෝධාජීවයන් විසින් දිගු කලක් මුළුල්ලෙහි මම මුළා කරන ලද්දෙමි. රවටන ලද්දෙමි. වරද්දන ලද්දෙමි.

වහන්ස ඉතා මැනවි, වහන්ස ඉතා මැනවි. ... අද පටන් දිවිහිමියෙන් සරණගිය (උවසුවෙකු කොට මා දරන සේක්වා යි.)

## 8. 1. 4

## හත්ථාරොහ සූත්‍රය

418. එකල්හි **හත්ථාරොහගාමණි** තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. ... අද පටන් දිවිහිමියෙන් සරණගිය (උවසුවකු කොට මා දරන සේක්වා යි.)

## 8. 1. 5

## අස්සාරොහ සූත්‍රය

419. එකල්හි **අස්සාරොහගාමණි** තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් ව හුන්නේ ය. එකත්පස් ව හුන් අස්සාරොහගාමණි තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: වහන්ස "යම් ඒ අසරුවෙක් යුද්ධයෙහි උත්සාහ කෙරේ ද වෑයම් කෙරේ ද උත්සාහ කරන වෑයම් කරන ඒ මොහු සතුරෝ නසත් මරණයට පමුණුවත්. හෙතෙමේ කාබුන් මරණින් මතු **සරඤ්ජිත දෙවියන්ගේ** සහභාවයට පැමිණේ ය" යි මෙය පෙර විසූ ඇජර පැජර අසරුවන් කියද්දී මවිසින් අසන ලදි. මෙහි ලා භාග්‍යවතුන් වහන්සේ කුමක් වදාරන සේක් ද" යි. 'ගාමණි, කම් නැත. මෙය තිබේවා. මා මෙය නහමක් පුළුවුස්ව යි.

දෙවන වට දු ... තෙවන වට දු අස්සාරොහ ගාමණි තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: වහන්ස, යම් ඒ අසරුවෙක් යුද්ධයෙහි උත්සාහ කෙරේ ද, වෑයම් කෙරේ ද උත්සාහ කරන වෑයම් කරන ඒ මොහු සතුරෝ නසත්. මරණයට පමුණුවත්. හෙතෙමේ කාබුන් මරණින් මතු සරඤ්ජිත දෙවියන්ගේ සහභාවයට පැමිණේය" යි මෙය පෙර විසූ ඇජර පැජර අසරුවන් කියද්දී මවිසින් අසන ලදි. මෙහි ලා භාග්‍යවතුන් වහන්සේ කුමක් වදාරන සේක් ද" යි.

අද්ධා ඛො ත්‍යාහං ගාමිණි න ලභාමි, ''අලං ගාමණි, තිට්ඨතෙතං, මා මං එතං පුච්ඡී''ති. අපිච ත්‍යාහං ව්‍යාකරිස්සාමි. යො සො ගාමණි, අස්සාරොහො සඞ්ගාමෙ උස්සහති, වායමති, තස්ස තං චිත්තං පුබ්බෙව[1] හීනං දුක්කටං දුප්පණිහිතං ''ඉමෙ සත්තා හඤ්ඤන්තු වා බජ්ඣන්තු වා උච්ඡිජ්ජන්තු වා විනස්සන්තු වා මා වා අහෙසුං ඉති වාති. තමෙනං උස්සහන්තං වායමන්තං පරෙ හනන්ති පරියාපාදෙන්ති, සො කායස්සභෙදා පරම්මරණා සරඤ්ජිතො නාම නිරයො තත්ථුපපජ්ජති, සචෙ ඛො පනස්ස එවං දිට්ඨි හොති, ''යො සො අස්සාරොහො සඞ්ගාමෙ උස්සහති වායමති, තමෙනං උස්සහන්තං වායමන්තං පරෙ හනන්ති. පරියාපාදෙන්ති, සො කායස්සභෙදා පරම්මරණා සරඤ්ජිතානං දෙවානං සහව්‍යතං උපපජ්ජතීති, සාස්ස හොති මිච්ඡාදිට්ඨි. මිච්ඡාදිට්ඨිකස්ස ඛො පනාහං ගාමණි පුරිසපුග්ගලස්ස ද්වින්නං ගතීනං අඤ්ඤතරං ගතිං වදාමි නිරයං වා තිරච්ඡානයොනිං වාති.

එවං වුත්තෙ අස්සාරොහො ගාමණි පරොදි, අස්සුනි පවත්තෙසි, එතං ඛො ත්‍යාහං ගාමණි නාලත්ථං ''අලං ගාමණි තිට්ඨතෙතං, මා මං එතං පුච්ඡී''ති. නාහං භන්තෙ එතං රොදාමි, යං මං භගවා එවමාහ. අපි චාහං භන්තෙ පුබ්බකෙහි ආචරියපාචරියෙහි අස්සාරොහෙහි දීඝරත්තං නිකතො වඤ්චිතො පලුද්ධො ''යො සො අස්සාරොහො සඞ්ගාමෙ උස්සහති වායමති, තමෙනං උස්සහන්තං වායමන්තං පරෙ හනන්ති පරියාපාදෙන්ති, සො කායස්සභෙදා පරම්මරණා සරඤ්ජිතානං දෙවානං සහව්‍යතං උපපජ්ජතීති. අභික්කන්තං භන්තෙ අභික්කන්තං භන්තෙ -පෙ- අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

## 8. 1. 6

## අසිබන්ධකසුත්තං

420. එකං සමයං භගවා නාලන්දායං විහරති පාවාරිකම්බවනෙ අථ ඛො **අසිබන්ධකපුත්තො ගාමණි** යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො අසිබන්ධකපුත්තො ගාමණි භගවන්තං එතදවොච: බ්‍රාහ්මණා භන්තෙ පච්ඡාභූමකා කාමණ්ඩලුකා සෙවාලමාලිකා උදකොරොහකා අග්ගිපරිචාරකා[2] තෙ මතං කාලකතං උය්‍යාපෙන්ති නාම සඤ්ඤාපෙන්ති නාම සග්ගං නාම ඔක්කාමෙන්ති.[3] භගවා පන භන්තෙ අරහං සම්මාසම්බුද්ධො පහොති තථා කාතුං යථා සබ්බො ලොකො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජෙය්‍යාති.

---

1. පුබ්බෙ - ස්‍යා. මජ්සං.
2. වාරිකා - සී 1,2
3. ඔක්කාපෙන්ති - ස්‍යා, අට්ඨකථා, ඔක්කමෙන්ති සී 1,2

ගාමණී මම "ගාමණී, කම් නැත. මෙය තිබේවා. මෙය නහමක් මා පුළුවුස්ව" යි තොපගෙන් ඒකාන්තයෙන් නො ලබමි. එහෙත් තොපට මම විසඳන්නෙමි. ගාමණී යම් ඒ අසරුවෙක් යුද්ධයෙහි "මේ සත්ත්වයෝ නැසෙත්වා, හෝ බැඳෙත්වා හෝ සිඳෙත්වා හෝ වැනසෙත්වා හෝ නො වෙත්වා හෝ යි උත්සාහ කෙරේ ද වෑයම් කෙරේ ද ඔහුගේ ඒ සිත පළමු ම ලාමක ය. නපුරු කොට කරන ලද්දේ ය. වරදවා පිහිටුවන ලද්දේ ය. (එසේ) උත්සාහ කරන වෑයම් කරන ඒ මොහු සතුරෝ නසත්. මරණයට පමුණුවත්. හෙතෙමේ කාබුන් මරණින් මතු සරඤ්ජිත නම් නිරයෙක් වේ නම් එහි උපදී. ඉදින් ඔහුට "යම් ඒ අසරුවෙක් යුද්ධයෙහි උත්සාහ කරන වෑයම් කරන ඒ මොහු සතුරෝ නසත්. මරණයට පමුණුවත්. හෙතෙමේ කාබුන් මරණින් මතු සරඤ්ජිත දෙවියන්ගේ සහභාවයට පැමිණේ ය" යි මෙබඳු දිටෙක් වේ නම් එය ඔහුගේ මිසදිට වේ. ගාමණී, මිසදිටු ගත් පුරිස් පුහුල්හට නිරය හෝ තිරිසන් යෝනිය හෝ දෙගති අතුරෙන් එක්තරා ගතියක් මම කියමි.

මෙසේ වදළ කල්හි අස්සාරොහ ගාමණී තෙමේ හැඬී ය. කඳුළු හෙළී ය. ගාමණී මම "ගාමණී, කම් නැත. මෙය තිබේවා. මා මෙය නහමක් පුළුවුස්ව" යි මෙය තොපගෙන් නො ලදිමි යි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මට යමක් මෙසේ වදළ සේක් නම් ඒ ගැන මම නො හඬමි. වැලි දු වහන්ස, "යම් ඒ අසරුවෙක් යුද්ධයෙහි උත්සාහ කෙරේ ද, වෑයම් කෙරේ ද උත්සාහ කරන වෑයම් කරන ඒ මොහු සතුරෝ නසත්. මරණයට පමුණුවත්. හෙතෙමේ කාබුන් මරණින් මතු සරඤ්ජිත දෙවියන්ගේ සහභාවයට පැමිණේ ය යි පෙර විසූ ඇජර පැජර අසරුවන් විසින් දිගුකලක් මුළුල්ලෙහි මම මුළා කරන ලද්දෙමි. රවටන ලද්දෙමි. වරද්දන ලද්දෙමි. වහන්ස ඉතා මැනවි. වහන්ස ඉතා මැනවි ... අද පටන් දිවිහිමිසෙන් සරණ ගිය (උවසුවකු කොට මා දරන සේක්වා යි.)

## 8. 1. 6

## අසිබන්ධක සූත්‍රය

420. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **නාලන්දාව** සමීපයෙහි **පාවාරික අඹවෙනෙහි** වැඩවසන සේක. එකල්හි **අසිබන්ධකපුත්ත** නම් ගාමණී තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් ව හුන්නේ ය. එකත්පස් ව හුන් අසිබන්ධකපුත්ත ගාමණී තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේ ය: වහන්ස, පච්ඡාභූමි වැසි කෙණ්ඩි දරන සෙවෙල් මාලා ඇති දියට බස්නා ගිනි පුදන ඒ බමුණෝ මළහු කලුරිය කළහු උඩට යවත්. හඳුන්වත්. දෙව්ලොවට යවත්. වහන්ස, අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ භාග්‍යවතුන් වහන්සේ යම්සේ සියලු ලෝකයා කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණේ නම් එසේ කරන්නට පොහෝනාහු වෙත් දැයි.

තෙන හි ගාමණි තඤ්ඤෙවෙත්ථ පටිපුච්ඡිස්සාමි, යථා තෙ ඛමෙය්‍ය තථා නං ව්‍යාකරෙය්‍යාසි. තං කිම්මඤ්ඤසි ගාමණි ඉධස්ස පුරිසො පාණාතිපාතී අදින්නාදායී කාමෙසු මිච්ඡාචාරී මුසාවාදී පිසුනාවාචො ඵරුසවාචො[1] සම්ඵප්පලාපී අභිජ්ඣාලු ව්‍යාපන්නචිත්තො මිච්ඡාදිට්ඨිකො, තමෙනං මහාජනකායො සඞ්ගම්ම සමාගම්ම ආයාචෙය්‍ය ථොමෙය්‍ය පඤ්ජලිකො අනුපරිසක්කෙය්‍ය: "අයං පුරිසො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජතූ"ති. තං කිම්මඤ්ඤසි ගාමණි, අපි නු සො පුරිසො මහතො ජනකායස්ස ආයාචනහෙතු වා ථොමනහෙතු වා පඤ්ජලිකා අනුපරිසක්කනහෙතු වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජෙය්‍යාති. නො හෙතං භන්තෙ.

සෙය්‍යථාපි ගාමණි, පුරිසො මහතිං පුථුසිලං ගම්භීරෙ උදකරහදෙ පක්ඛිපෙය්‍ය, තමෙනං මහාජනකායො සඞ්ගම්ම සමාගම්ම ආයාචෙය්‍ය ථොමෙය්‍ය පඤ්ජලිකො අනුපරිසක්කෙය්‍ය: උම්මුජ්ජ භො පුථුසිලෙ උප්ලව භො පුථුසිලෙ, ථලමුප්ලව භො පුථුසිලෙති. තං කිම්මඤ්ඤසි ගාමණි, අපිනු සා පුථුසිලා මහතො ජනකායස්ස ආයාචනහෙතු වා ථොමනහෙතු වා පඤ්ජලිකා අනුපරිසක්කනහෙතු වා උම්මුජ්ජෙය්‍ය වා උප්ලවෙය්‍ය වා ථලං වා උප්ලවෙය්‍යාති. නො හෙතං භන්තෙ.

එවමෙව ඛො ගාමණි යො සො පුරිසො පාණාතිපාතී අදින්නාදායී කාමෙසු මිච්ඡාචාරී මුසාවාදී පිසුනාවාචො ඵරුසවාචො සම්ඵප්පලාපී අභිජ්ඣාලු ව්‍යාපන්නචිත්තො මිච්ඡාදිට්ඨිකො, කිඤ්චාපි තං මහාජනකායො සඞ්ගම්ම සමාගම්ම ආයාචෙය්‍ය ථොමෙය්‍ය පඤ්ජලිකො අනුපරිසක්කෙය්‍ය: "අයං පුරිසො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජතූ"ති. අථ ඛො සො පුරිසො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍ය.

තං කිම්මඤ්ඤසි ගාමණි, ඉධස්ස පුරිසො පාණාතිපාතා පටිවිරතො අදින්නාදානා පටිවිරතො කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො මුසාවාදා පටිවිරතො පිසුනාවාචා පටිවිරතො ඵරුසා වාචා පටිවිරතො සම්ඵප්පලාපා පටිවිරතො අනභිජ්ඣාලු අව්‍යාපන්නචිත්තො සම්මාදිට්ඨිකො, තමෙනං මහාජනකායො සඞ්ගම්ම සමාගම්ම ආයාචෙය්‍ය ථොමෙය්‍ය පඤ්ජලිකො අනුපරිසක්කෙය්‍ය: "අයං පුරිසො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජතූ"ති. තං කිම්මඤ්ඤසි ගාමණි, අපිනු සො පුරිසො මහතො ජනකායස්ස ආයාචනහෙතු වා ථොමනහෙතු වා පඤ්ජලිකා අනුපරිසක්කනහෙතු වා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍යාති. නො හෙතං භන්තෙ.

1. පිසුණාවාචොඵරුසාවාචො-සී 1,2

ගාමණි, එසේ වී නම් මෙහි ලා තා ම පුළුවුස්නෙමි. යම් සේ තොපට වැටහේ නම් එසේ එය විසඳන්නහුය. ගාමණි, ඒ කිමැ යි හඟිවු ද? මෙහි පරපණ නසන නුදුන් දෑ ගන්නා කාමයෙහි වරදවා හැසිරෙන මුසවා බෙණෙන පිසුනුබස් ඇති රළු වදන් ඇති හිස්බස් බෙණෙන දැඩි ලෝබ ඇති කිපුණු සිත් ඇති මිසදිටු ගත් පුරුෂයෙක් වන්නේ ය. මහාජන සමූහයා ඒ මොහු වෙත එක්ව රැස්ව ''මේ පුරිස් තෙමේ කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණේවා''යි යදින්නේ ය. පසසන්නේ ය. බඳැදිලි ව පැදකුණු කරන්නේ ය. ගාමණි, ඒ කිමැ යි හඟිවු ද? මහත් ජනසමූහයාගේ යැදීම හේතු කොට ගෙන හෝ පැසසීම හේතු කොට ගෙන හෝ බඳැදිලි ව පැදකුණු කිරීම හේතු කොට ගෙන හෝ ඒ පුරිස් තෙමේ කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණේ දූ යි. වහන්ස මෙය නො වේ ම ය.

ගාමණි, යම් සේ පුරුෂයෙක් මහ ගලක් ගැඹුරු දියවිලෙක බහා ලන්නේ ද මහජන සමූහයා ඒ මෙය වෙත එක්ව රැස්ව එම්බා මහගල මතු වෙව. එම්බා මහගල පා වෙව. එම්බා මහගල ගොඩ නැගෙව යි යදින්නේ ය. පසසන්නේ ය. බඳුදිලිව පැදකුණු කරන්නේ ය. ගාමණි, ඒ කිමැ යි හඟිවු ද? මහජන සමූහයාගේ යැදීම හේතු කොට ගෙන හෝ පැසසීම හේතු කොට ගෙන හෝ බඳුදිලි ව පැදකුණු කිරීම හේතු කොට ගෙන හෝ ඒ මහගල මතු වන්නේ හෝ පා වන්නේ හෝ ගොඩ නැගෙන්නේ හෝ වේදූ යි. වහන්ස මෙය නො වේ මැ යි.

ගාමණි, එසෙයින් ම යම් ඒ පුරුෂයෙක් පරපණ නසන්නේ නුදුන් දෑ ගන්නේ කාමයෙහි වරදවා හැසිරෙන්නේ මුසවා බෙණෙන්නේ පිසුනු බස් ඇත්තේ රළු බස් ඇත්තේ හිස් බස් බෙණෙන්නේ දැඩි ලෝබ ඇත්තේ කිපුණු සිත් ඇත්තේ මිසදිටු ගත්තේ වේ ද, හුදෙක් මහජන සමූහයා ඔහු වෙත එක් ව රැස් ව ''මේ පුරිස් තෙමේ කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණේවා''යි යදින්නේ ද පසසන්නේ ද බඳුදිලි ව පැදකුණු කරන්නේ ද එහෙත් ඒ පුරිස් තෙමේ කාබුන් මරණින් මතු සැපයෙන් පහ වූ නපුරු ගති ඇති විවස ව පතිත වන නිරයට පැමිණෙන්නේ ය.

ගාමණි, ඒ කිමැ යි හඟිවු ද? මෙහි පණිවායෙන් වෙන් වූ අයිනාදනින් වෙන් වූ කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකුණු මුසවායෙන් වැළකුණු පිසුනු බසින් වෙන් වූ රළු වදනින් වෙන් වූ හිස් බස් බිණීමෙන් වැළකුණු දැඩි ලෝබ නැති නොකිපුණු සිත් ඇති සම්දිටු ගත් පුරුෂයෙක් වන්නේ ය. මහජන සමූහයා ඒ මොහු වෙත එක් ව රැස් ව ''මේ පුරිස් තෙමේ කාබුන් මරණින් මතු අපාය දුගති විනිපාත වූ නිරයට පැමිණේව'' යි යදින්නේ ය. පසසන්නේ ය. බඳුදිලි ව පැදකුණු කරන්නේ ය. ගාමණි, ඒ කිමැ යි හඟිවු ද? මහත් ජනසමූයාගේ යැදුම හේතු කොට ගෙන හෝ පැසසුම හේතු කොට ගෙන හෝ බඳුදිලි ව පැදකුණු කිරීම හේතු කොට ගෙන හෝ ඒ පුරිස් තෙමේ කාබුන් මරණින් මතු අපාය දුගති විනිපාත වූ නිරයට පැමිණෙන්නේ දූ යි. වහන්ස මෙය නො වේ ම ය.

සෙය්‍යථාපි ගාමණි, පුරිසො සප්පිකුම්භං වා තෙලකුම්භං වා ගම්භීරං උදකරහදං ඔගාහෙත්වා භින්දෙය්‍ය, තත්‍ර යාස්ස[1] සක්ඛරා වා කඨලා වා සා අධොගාමී[2] අස්ස, යඤ්ච ඛ්වාස්ස තත්‍ර සප්පි[3] වා තෙලං වා තං උද්ධගාමී[4] අස්ස, තමෙතං මහාජනකායො සඞ්ගම්ම සමාගම්ම ආයාචෙය්‍ය ථොමෙය්‍ය පඤ්ජලිකො අනුපරිසක්කෙය්‍ය: ඔසීද භො සප්පි තෙල, සංසීද භො සප්පි තෙල අධොගච්ඡ භො සප්පි තෙලාති. තං කිම්මඤ්ඤසි ගාමණි, අපිනු තං සප්පි තෙලං මහා ජනකායස්ස ආයාචනහෙතු වා ථොමනහෙතු වා පඤ්ජලිකා අනුපරිසක්කනහෙතු වා ඔසීදෙය්‍ය වා සංසීදෙය්‍ය වා අධො වා ගච්ඡෙය්‍යාති. නො හෙතං භන්තෙ.

එවමෙව ඛො ගාමණි, යො සො පුරිසො පාණාතිපාතා පටිවිරතො අදින්නාදානා පටිවිරතො කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො මුසාවාදා පටිවිරතො පිසුනාවාචා[5] පටිවිරතො ඵරුසා වාචා[6] පටිවිරතො සම්ඵප්පලාපා පටිවිරතො අනභිජ්ඣාලු අව්‍යාපන්නචිත්තො සම්මාදිට්ඨිකො, කිඤ්චාපි තං මහාජනකායො සඞ්ගම්ම සමාගම්ම ආයාචෙය්‍ය ථොමෙය්‍ය පඤ්ජලිකො අනුපරිසක්කෙය්‍ය: "අයං පුරිසො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජතූ"ති, අථ ඛො සො පුරිසො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජෙය්‍යාති.

එවං වුත්තෙ අසිබන්ධකපුත්තො ගාමණී භගවන්තං එතදවොච: අභික්කන්තං භන්තෙ අභික්කන්තං භන්තෙ -පෙ- අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

## 8. 1. 7

## ඛෙත්තූපමසුත්තං

421. එකං සමයං භගවා **නාලන්දායං** විහරති **පාවාරිකම්බවනෙ.** අථ ඛො **අසිබන්ධකපුත්තො** ගාමණී යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො අසිබන්ධකපුත්තො ගාමණී භගවන්තං එතදවොච: නනු භන්තෙ භගවා සබ්බපාණභූතහිතානුකම්පී[7] විහරතීති. එවං ගාමණි තථාගතො සබ්බපාණභූතහිතානුකම්පී විහරතීති. අථ කිඤ්චරහි භන්තෙ භගවා එකච්චානං සක්කච්චං ධම්මං දෙසෙති, එකච්චානං නො තථා සක්කච්චං ධම්මං දෙසෙතීති. තෙන හි ගාමණි, තං යෙවෙත්ථ පටිපුච්ඡිස්සාමි, යථා තෙ ඛමෙය්‍ය තථා නං ව්‍යාකරෙය්‍යාසි.

---

1. යවාස්ස — සී, යස්ස—ස්‍යා, අට්ඨකථා.
2. සාධොගාමී—අට්ඨකථා (අධොගාමිනීති භවිතබ්බන්ති මඤ්ඤෙ)
3. සප්පී—සී 1,2.
4. උද්ධංගාමී—මජසං
5. පිසුනාය වාචාය—මජසං, ස්‍යා,
6. ඵරුසාය වාචාය—මජසං, ස්‍යා,
7. සබ්බභූතහිතානුකම්පී—සීමු.

ගාමණි, යම්සේ පුරුෂයෙක් ගිතෙල් කුඹක් හෝ තලතෙල් කුඹක් හෝ ගැඹුරු දියවිලක ගිල්වා බිඳින්නේ ද එහි යම් කැට හෝ කැබිලිති හෝ වන්නේ නම් එය කිඳෙනසුලු වන්නේ ය. එහි යම් ගිතෙල් හෝ තලතෙල් හෝ වන්නේ නම් එය උඩ ඉල්පෙනසුලු වන්නේ ය. මහජන සමූහයා ඒ මෙය වෙත එක් ව රැස් ව භවත් ගිතෙල තලතෙල කිඳෙව. භවත් ගිතෙල තලතෙල ගිලෙව. භවත් ගිතෙල තලතෙල යට යවයි යදින්නේ ය. පසසන්නේ ය. බඳැදිලි ව පැදකුණු කරන්නේ ය. ගාමණි, ඒ කිමැයි හඟිවු ද? මහජන සමූහයාගේ යැදුම හේතු කොට ගෙන හෝ පැසසුම හේතු කොට ගෙන හෝ බඳැදිලි ව පැදකුණු කිරීම හේතු කොට ගෙන හෝ ඒ ගිතෙල තලතෙල කිඳෙන්නේ හෝ ගිලෙන්නේ හෝ යට යන්නේ හෝ වේ දැයි. වහන්ස, මේ නො වේ ම ය.

ගාමණි, එසෙයින් ම යම් ඒ පුරුෂයෙක් පණිවායෙන් වෙන් වූයේ අයිනාදනින් වෙන් වූයේ කාමයෙහි වරදවා හැසුරුමෙන් වැළකුනේ මුසවායෙන් වෙන් වූයේ පිසුනු බසින් වැළකුනේ රළු වදනින් වැළකුනේ හිස් බස් බිණීමෙන් වැළකුනේ දැඩි ලෝබ නැත්තේ නොකිපුණු සිත් ඇත්තේ සම්දිටු ගත්තේ වේ ද, හුදෙක් බහුජනසමූහයා එක් ව රැස් ව "මේ පුරිස් තෙමේ කාබුන් මරණින් මතු අපාය දුගති විනිපාත වූ නිරයට පැමිණේවා" යි යදින්නේ ය. පසසන්නේ ය. බඳැදිලි ව පැදකුණු කරන්නේ ය. එහෙත් ඒ පුරිස් තෙමේ කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙන්නේ යි.

මෙසේ වදළ කල්හි අසිබන්ධකපුත්ත ගාමණී තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේ ය: "වහන්ස, ඉතා මැනවි. වහන්ස, ඉතා මැනවි ... අද පටන් දිවිහිමි කොට සරණ ගිය උවසුවකු කොට මා දරන සේක්වා"යි.

## 8. 1. 7

## ඛෙත්තූපම සූත්‍රය

421. එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ **නාලන්දාව** සමීපයෙහි **පාවාරික අඹවෙනෙහි** වැඩවසන සේක. එකල්හි අසිබන්ධකපුත්ත ගාමණී තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් ව හුන්නේ ය. එකත්පස් ව හුන් අසිබන්ධකපුත්ත ගාමණී තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේ ය: වහන්ස, භාග්‍යවතුන් වහන්සේ සියලු සතුන් කෙරෙහි හිතානුකම්පා ඇති ව වැඩ වෙසෙන සේක් නො වෙද්ද යි. ගාමණි, එසේ ය. තථාගත තෙමේ සියලු සතුන් කෙරෙහි හිතානුකම්පා ඇති ව වෙසේය යි. වහන්ස, එසේ නම් කුමක් හෙයින් භාග්‍යවතුන් වහන්සේ ඇතැමුන්ට සකසා දහම් දෙසන සේක් ද, ඇතැමුන්ට එසේ සකසා දහම් නො දෙසන සේක් දැ යි. ගාමණි, එසේ වී නම් මෙහි ලා තොප ම පුළුවුස්නෙමි. යම් සේ තොපට වැටහේ නම් එසේ එය විසඳන්නහු.

තං කිම්මඤ්ඤසි ගාමණි කස්සකස්ස ගහපතිනො තීනි ඛෙත්තානි; එකං ඛෙත්තං අග්ගං, එකං ඛෙත්තං මජ්ඣිමං, එකං ඛෙත්තං හීනං ජඞ්ගලං ඌසරං[1] පාපභූමි, තං කිම්මඤ්ඤසි ගාමණි අසු කස්සකො ගහපති බීජානි පතිට්ඨාපෙතුකාමො කත්ථ පඨමං පතිට්ඨාපෙය්‍ය, යං වා අදුං ඛෙත්තං අග්ගං යං වා අදුං ඛෙත්තං මජ්ඣිමං යං වා අදුං ඛෙත්තං හීනං ජඞ්ගලං ඌසරං පාපභූමින්ති. අසු භන්තෙ කස්සකො ගහපති බීජානි පතිට්ඨාපෙතුකාමො යං අදුං ඛෙත්තං අග්ගං තත්ථ පතිට්ඨාපෙය්‍ය, තත්ථ පතිට්ඨාපෙත්වා යං අදුං ඛෙත්තං මජ්ඣිමං තත්ථ පතිට්ඨාපෙය්‍ය, තත්ථ පතිට්ඨාපෙත්වා යං අදුං ඛෙත්තං හීනං ජඞ්ගලං ඌසරං පාපභූමි තත්ථ පතිට්ඨාපෙය්‍යපි නොපි පතිට්ඨාපෙය්‍ය. තං කිස්ස හෙතු? අන්තමසො ගොභත්තම්පි භවිස්සතීති.

සෙය්‍යථාපි ගාමණි යං අදුං ඛෙත්තං අග්ගං, එවමෙව මය්හං භික්ඛුභික්ඛුනියො, තෙසාහං ධම්මං දෙසෙමි ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙමි, තං කිස්ස හෙතු? එතෙ හි ගාමණි, මංදීපා මංලෙණා මංතාණා මංසරණා විහරන්ති.

සෙය්‍යථාපි ගාමණි, යං අදුං ඛෙත්තං මජ්ඣිමං, එවමෙව මය්හං උපාසකඋපාසිකායො. තෙසම්පහං[2] ධම්මං දෙසෙමි ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙමි, තං කිස්ස හෙතු? එතෙ හි ගාමණි මංදීපා මංලෙණා මංතාණා මංසරණා විහරන්ති.

සෙය්‍යථාපි ගාමණි, යං අදුං ඛෙත්තං හීනං ජඞ්ගලං ඌසරං පාපභූමි. එවමෙව මය්හං අඤ්ඤතිත්ථියා සමණබ්‍රාහ්මණා පරිබ්බාජකා, තෙසම්පහං ධම්මං දෙසෙමි ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙමි. තං කිස්ස හෙතු? අප්පෙවනාම එකපදම්පි ආජානෙය්‍යුං, තං තෙසං අස්ස දීඝරත්තං හිතාය සුඛාය.

සෙය්‍යථාපි ගාමණි, පුරිසස්ස තයො උදකමණිකා, එකො උදකමණිකො අච්ඡිද්දො අහාරී[3] අපරිහාරී, එකො උදකමණිකො අච්ඡිද්දො හාරී පරිහාරී, එකො උදකමණිකො ඡිද්දො හාරී පරිහාරී. තං කිම්මඤ්ඤසි ගාමණි අසු පුරිසො උදකං නික්ඛිපිතුකාමො කත්ථ පඨමං නික්ඛිපෙය්‍ය යො වා සො උදකමණිකො අච්ඡිද්දො අහාරී පරිහාරී, යො වා සො උදකමණිකො අච්ඡිද්දො හාරී පරිහාරී, යො වා සො උදකමණිකො ඡිද්දො හාරී පරිහාරීති.

---

1. ඔසරං – අට්ඨකථා, සයා.
2. තෙසාහං – සයා,
   තෙසම්පාහං – මජ්ඣං
3. ආහාරී – සී: සබ්බත්ථ

ගාමණී, ඒ කිමැ යි හඟිවු ද? මෙහි ගොවි ගැහැවියකුට කෙත් තුනෙක් වේ. එක් කෙතක් අග ය. එක් කෙතක් මැදුම් ය. එක් කෙතක් නිසරු ය. තද ය. කරමැටි සහිත ය. මුඩු බිමෙකි. ගාමණී, ඒ කිමැ යි හඟිවු ද? ඒ ගොවි ගැහැවි තෙමේ බිජු වපුරනු කැමැත්තේ කොතැන්හි පළමු කොට වපුරන්නේ ද, යම් ඒ අග කෙත ද, යම් ඒ මැදුම් කෙත ද, යම් ඒ නිසරු ද කරමැටි සහිත මුඩු බිම දැයි. වහන්ස, ඒ ගොවිවූ කෙත ගැහැවි තෙමේ බිජු වපුරනු කැමැත්තේ යම් ඒ අග කෙතෙක් වේ ද, එහි වපුරන්නේ ය. එහි වපුරා යම් ඒ මැදුම් කෙතෙක් වේ ද, එහි වපුරන්නේ ය. එහි වපුරා යම් ඒ නිසරු තද කරමැටි සහිත මුඩු බිමෙක් වේ ද, එහි වපුරන්නේ හෝ නො ද වපුරන්නේ හෝ වෙයි. ඒ කවර හෙයින යත්: යටත් පිරිසෙයින් ගෙරින්ට අහර පිණිස වත් වන්නේ ය යි කියා යි.

ගාමණී යම් සේ යම් ඒ කෙත අග ද, මට මහණ මෙහෙණහු එබඳු හ. ඔවුන්ට මම දහම් දෙසමි. මුල කලණ වූ මැද කලණ වූ අග කලණ වූ අරුත් සහිත ව්‍යඤ්ජන සහිත හුදෙක් පිරිපුන් පිරිසිදු බඹසර පවසමි. ඒ කවර හෙයින යත්: ගාමණී, මොහු මා පිහිට කොට ඇත්තෝ මා ලෙන් කොට ඇත්තෝ මා රැකවරණ කොට ඇත්තෝ මා පිළිසරණ කොට ඇත්තෝ ව වෙසෙති. (එහෙයිනි)

ගාමණී යම් ඒ මැදුම් කෙත යම් සේ ද, මට උවසු උවැසියෝ එබඳු හ. ඔවුන්ට ද මම දහම් දෙසමි. මුල කලණ වූ මැද කලණ වූ අග කලණ වූ අරුත් සහිත ව්‍යඤ්ජන සහිත හුදු පිරිපුන් පිරිසිදු බඹසර පවසමි. ඒ කවර හෙයින යත්: ගාමණී, මොහු වනාහි මා පිහිට කොට ඇත්තෝ මා ලෙන් කොට ඇත්තෝ මා රැකවරණ කොට ඇත්තෝ මා පිළිසරණ කොට ඇත්තෝ ව වෙසෙති. (එහෙයිනි)

ගාමණී, යම් ඒ නිසරු තද කරමැටි සහිත මුඩු බිම වූ කෙත යම් සේ ද, මට අන්තොටු මහණ බමුණු පිරිවැජ්ජෝ එබඳු හ. ඔවුන්ට ද මම දහම් දෙසමි. මුල කලණ වූ මැද කලණ වූ අග කලණ වූ අරුත් සහිත ව්‍යඤ්ජන සහිත හුදු පිරිපුන් පිරිසිදු බඹසර පවසමි. ඒ කවර හෙයින යත්: එක් පදයකුදු දැනගන්නාහු නම් ඉතා මැනවි. එය ඔවුන්ට දිගු කලක් මුළුල්ලෙහි හිත පිණිස සුව පිණිස වන්නේ ය කියා යි.

ගාමණී, යම් සේ පුරුෂයකුට මහ දියබඳුන් තුනෙක් වේ ද, එක් දියබඳුනෙක් සිදුරු රහිත ය. නො වැගිරෙන්නේ ය. නො සිඳෙන්නේ ය. එක් දියබඳුනෙක් සිදුරු රහිත ය. වැගිරෙන්නේ ය. සිඳෙන්නේ ය. එක් දියබඳුනෙක් සිදුරු සහිත ය. වැගිරෙන්නේ ය. සිඳෙන්නේ ය. ගාමණී, ඒ කිමැ යි හඟිවු ද? ඒ පුරිස් තෙමේ දිය බහාලනු කැමැත්තේ යම් ඒ සිදුරු රහිත නො වැගිරෙන නො සිඳෙන බඳුනෙක් වේ ද, යම් ඒ සිදුරු රහිත වැගිරෙන සිඳෙන බඳුනෙකුත් වේ ද, යම් ඒ සිදුරු රහිත වැගිරෙන සිඳෙන බඳුනෙකුත් වේ ද (මෙයින්) කොහි පළමු කොට බහා ලන්නේ දැ යි.

අසු භන්තෙ පුරිසො උදකං නික්ඛිපිතුකාමො යො සො උදක මණිකො අච්ඡිද්දො අහාරී අපරිහාරී තත්ථ නික්ඛිපෙය්‍ය, තත්ථ නික්ඛිපිත්වා යො සො උදකමණිකො අච්ඡිද්දො හාරී පරිහාරී තත්ථ නික්ඛිපෙය්‍ය, තත්ථ නික්ඛිපිත්වා යො සො උදකමණිකො ඡිද්දො හාරී පරිහාරී තත්ථ නික්ඛිපෙය්‍යාපි නොපි නික්ඛිපෙය්‍ය, තං කිස්ස හෙතු? අන්තමසො භණ්ඩධොවනම්පි[1] භවිස්සතීති.

සෙය්‍යථාපි ගාමණි යො සො උදකමණිකො අච්ඡිද්දො අහාරී අපරිහාරී, එවමෙව මය්හං භික්ඛුභික්ඛුනියො, තෙසාහං ධම්මං දෙසෙමි ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සව්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙමි, තං කිස්ස හෙතු? එතෙ හි ගාමණි මංදීපා මංලෙණා මංතාණා මංසරණා විහරන්ති.

සෙය්‍යථාපි ගාමණි යො සො උදකමණිකො අච්ඡිද්දො හාරී පරිහාරී, එවමෙව මය්හං උපාසකඋපාසිකායො, තෙසම්පහං ධම්මං දෙසෙමි ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සව්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙමි. තං කිස්ස හෙතු? එතෙ හි ගාමණි මංදීපා මංලෙණා මංතාණා මංසරණා විහරන්ති.

සෙය්‍යථාපි ගාමණි යො සො උදකමණිකො ඡිද්දො හාරී පරිහාරී, එවමෙව මය්හං අඤ්ඤතිත්ථියා සමණබ්‍රාහ්මණපරිබ්බාජකා, තෙසම්පහං ධම්මං දෙසෙමි ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සව්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙමි. තං කිස්ස හෙතු? අප්පෙවනාම එකපදම්පි ආජානෙය්‍යුං, තං තෙසං අස්ස දීඝරත්තං හිතාය සුඛායාති.

එවං වුත්තෙ අසිබන්ධකපුත්තො ගාමණි භගවන්තං එතදවොච: අභික්කන්තං භන්තෙ අභික්කන්තං භන්තෙ -පෙ- අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

## 8. 1. 8

## සඞ්ඛධමසුත්තං

422. එකං සමයං භගවා නාලන්දායං විහරති පාවාරිකම්බවනෙ. අථ ඛො අසිබන්ධකපුත්තො ගාමණි නිගණ්ඨසාවකො යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නං ඛො අසිබන්ධකපුත්තං ගාමණිං භගවා එතදවොච: කථන්නු ඛො ගාමණි, නිගණ්ඨො නාතපුත්තො සාවකානං ධම්මං දෙසෙතීති.

1. භණ්ඩධොවනමත්තමපි—සිමු.

වහන්ස, ඒ පුරිස් තෙමේ දිය බහාලනු කැමැත්තේ යම් ඒ සිදුරු රහිත නො වැගිරෙන නො සිඳෙන බඳුනෙක් වේ නම් එහි බහා ලන්නේ ය. එහි බහා තබා සිදුරු රහිත වැගිරෙන සිඳෙන යම් ඒ දියබඳුනෙක් වේ නම් එහි බහාලන්නේ ය. එහි බහා තබා සිදුරු සහිත වැගිරෙන සිඳෙන යම් ඒ දියබඳුනෙක් වේ නම් එහි බහා ලන්නේ හෝ නො ද බහාලන්නේ හෝ වෙයි. ඒ කවර හෙයින යත්: යටත් පිරිසෙයින් බඩු සේදීම් පමණකු දු වන්නේ ය කියා යි.

ගාමණි, සිදුරු රහිත නො වැගිරෙන නො සිඳෙන යම් ඒ දියබඳුන යම් සේ ද, මහණ මෙහෙණහු මට එබඳු ම වෙති. ඔවුන්ට මම දහම් දෙසමි. මුල කලණ වූ මැද කලණ වූ අග කලණ වූ අරුත් සහිත ව්‍යඤ්ජන සහිත හුදු පිරිපුන් පිරිසුදු බඹසර පවසමි. ඒ කවර හෙයින යත්: ගාමණි මොහු වනාහි මා පිහිට කොට ඇත්තෝ මා ලෙන් කොට ඇත්තෝ මා රැකවරණ කොට ඇත්තෝ මා පිළිසරණ කොට ඇත්තෝ ව වෙසෙති. (එහෙයිනි)

ගාමණි සිදුරු රහිත වැගිරෙන සිඳෙන යම් ඒ දියබඳුන යම්සේ ද උවසු උවැසියෝ මට එබඳු ම වෙති. ඔවුන්ට ද මම දහම් දෙසමි. මුල කලණ වූ මැද කලණ වූ අග කලණ වූ අරුත් සහිත ව්‍යඤ්ජන සහිත හුදු පිරිපුන් පිරිසිදු බඹසර පවසමි. ඒ කවර හෙයින යත්: ගාමණි. මොහු වනාහි මා පිහිට කොට ඇත්තෝ මා ලෙන් කොට ඇත්තෝ මා රැකවරණ කොට ඇත්තෝ මා පිළිසරණ කොට ඇත්තෝ ව වෙසෙති. (එහෙයිනි)

ගාමණි, සිදුරු සහිත වැගිරෙන සිඳෙන යම් ඒ දියබඳුන යම්සේ ද, අන්තොටු මහණ බමුණු පිරිවැජ්ජෝ මට එබඳු ම වෙති. ඔවුන්ට ද මම දහම් දෙසමි. මුල කලණ වූ මැද කලණ වූ අග කලණ වූ අරුත් සහිත ව්‍යඤ්ජන සහිත හුදු පිරිපුන් පිරිසුදු බඹසර පවසමි. ඒ කවර හෙයින යත්: එක් පදයකුදු දැනගන්නාහු නම් ඉතා මැනවි. එය ඔවුන්ට දිගුකලක් මුළුල්ලෙහි හිත පිණිස සුව පිණිස වන්නේ ය කියා යි.

මෙසේ වදාළ කල්හි අසිබන්ධකපුත්තගාමණී තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: වහන්ස ඉතා මැනවි. වහන්ස ඉතා මැනවි ... අද පටන් දිවිහිම් කොට සරණ ගිය (උවසුවකු කොට මා දරන සේක්වා යි).

## 8. 1. 8

## සඞ්ඛධම සූත්‍රය

422. එක්සමයෙක භාග්‍යවතුන් වහන්සේ **නාලන්දාව** සමීපයෙහි **පාවාරිකඅඹවෙනෙහි** වැඩවසන සේක. එකල්හි නිගණ්ඨශ්‍රාවක වූ **අසිබන්ධකපුත්තගාමණී** තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේය ... එකත්පස් ව හුන් අසිබන්ධකපුත්ත ගාමණිහට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක: ගාමණි **නිගණ්ඨනාථපුත්ත** කෙසේ නම් සව්වන්ට දහම් දෙසා ද යි.

එවං ඛො භන්තෙ නිගණ්ඨො නාතපුත්තො සාවකානං ධම්මං දෙසෙති: යො කොචි පාණමතිපාතෙති[1] සබ්බො සො ආපායිකො නෙරයිකො. යො කොචි අදින්නමාදියති සබ්බො සො ආපායිකො නෙරයිකො. යො කොචි කාමෙසු මිච්ඡා චරති සබ්බො සො ආපායිකො නෙරයිකො. යො කොචි මුසා භණති සබ්බො සො ආපායිකො නෙරයිකො. යං බහුලං යං බහුලං විහරති තෙන තෙන නියායතීති.[2] එවං ඛො භන්තෙ නිගණ්ඨො නාතපුත්තො සාවකානං ධම්මං දෙසෙතීති.

යං බහුලං යං බහුලඤ්ච ගාමණි විහරති තෙන තෙන නීයාතීති එවං සන්තෙ න කොචි ආපායිකො නෙරයිකො භවිස්සති යථා නිගණ්ඨස්ස නාතපුත්තස්ස වචනං. තං කිම්මඤ්ඤසි ගාමණි යො සො පුරිසො පාණාතිපාතී, රත්තියා වා දිවසස්ස වා සමයාසමයං උපාදය, කතමො බහුතරො සමයො යං වා සො පාණං අතිපාතෙති යං වා සො පාණං නාතිපාතෙතීති.

යො සො භන්තෙ පුරිසො පාණාතිපාතී, රත්තියා වා දිවසස්ස වා සමයාසමයං උපාදය අප්පතරො සො සමයො යං සො පාණං අතිපාතෙති. අථ ඛො සො ව බහුතරො සමයො යං සො පාණං නාතිපාතෙතීති. යං බහුලං යං බහුලඤ්ච ගාමණි විහරති තෙන තෙන නීයාතීති එවං සන්තෙ න කොචි ආපායිකො නෙරයිකො භවිස්සති යථා නිගණ්ඨස්ස නාතපුත්තස්ස වචනං.

තං කිම්මඤ්ඤසි ගාමණි, යො සො පුරිසො අදින්නාදයී, රත්තියා වා දිවසස්ස වා සමයාසමයං උපාදය කතමො බහුතරො සමයො යං වා සො අදින්නං ආදියති යං වා සො අදින්නං නාදියතීති. යො සො භන්තෙ පුරිසො අදින්නාදයී රත්තියා වා දිවසස්ස වා සමයාසමයං උපාදය, අප්පතරො සො සමයො යං සො අදින්නං ආදියති, අථ ඛො සොව බහුතරො සමයො යං සො අදින්නං නාදියතීති. යං බහුලං යං බහුලඤ්ච ගාමණි විහරති තෙන තෙන නීයාතීති, එවං සන්තෙ න කොචි ආපායිකො නෙරයිකො භවිස්සති යථා නිගණ්ඨස්ස නාතපුත්තස්ස වචනං.

1. මතිමාපෙති - සී 1, 2, සෲා
2. සියාතීති -නි 1

වහන්ස, නිගණ්ඨනාතපුත්‍රයෝ සව්වන්ට මෙසේ දහම් දෙසති: ''යම් කිසි කෙනෙක් පරපණ නසත් ද ඒ සියලු දෙන අපායට යන්නෝ ය. නිරයට යන්නෝ ය. යම්කිසි කෙනෙක් නුදුන් දෑ ගන්නෝ ද ඒ සියලු දෙන අපායට යන්නෝ ය. නිරයට යන්නෝ ය. යම්කිසි කෙනෙක් කාමයෙහි වරදවා හැසිරෙද් ද ඒ සියලු දෙන අපායට යන්නෝ ය. නිරයට යන්නෝ ය. යම්කිසි කෙනෙක් මුසවා බෙණෙද් ද ඒ සියලු දෙන අපායට යන්නෝ ය. නිරයට යන්නෝ ය. යමක් බහුල කොට යමක් බහුල කොට වෙසේ නම් එයින් එයින් (නිරයට) පමුණුවනු ලැබේ යයි. වහන්ස නිගණ්ඨනාතපුත්‍රයෝ සව්වන්ට මෙසේ දහම් දෙසති යි.

ගාමණි, යමක් බහුල කොට යමක් බහුල කොට වෙසේ නම් එයින් එයින් පමුණුවනු ලැබේ ය යි මෙසේ ඇති කල්හි නිගණ්ඨනාතපුත්‍රගේ වචනය පරිදි කිසිවෙක් අපායට යන්නෙක් නිරයට යන්නෙක් නො වන්නේ ය. ගාමණි ඒ කිමැ යි හඟිවු ද? යම් ඒ පුරුෂයෙක් පරපණ නසා ද රැය හෝ දවාල හෝ කල් නොකල් ගෙන (සලකන විට) හෙ යම් කලෙක හෝ පරපණ නසා ද, හේ යම් කලෙක හෝ පරපණ නො නසා ද එයින් කවර කලෙක් ඉතා වැඩී දැ යි.

වහන්ස, යම් ඒ පුරුෂයෙක් පරපණ නසා ද, රැය හෝ දවාල හෝ කල් නො කල් ගෙන (සලකන විට) හේ යම් කලෙක පරපණ නසා නම් ඒ කාලය ඉතා මඳ ය. වැලිදු හෙ යම් කාලෙක පරපණ නො නසා නම් ඒ කාලයම ඉතා වැඩී ය යි. ගාමණි, යමක් බහුල කොට යමක් බහුල කොට වෙසේ නම් එයින් එයින් පමුණුවනු ලැබේයයි. මෙසේ ඇති කල්හි නිගණ්ඨනාතපුත්‍රගේ වචනය පරිදි කිසිවෙක් අපායට යන්නෙක් නිරයට යන්නෙක් නො වන්නේ ය.

ගාමණි, ඒ කිමැ යි හඟිවු ද? යම් ඒ පුරුෂයෙක් නුදුන් දෑ ගන්නේ නම් රැය හෝ දවාල හෝ කල් නො කල් ගෙන (සලකන විට) යම් කලෙක හේ නුදුන් දෑ ගනී ද යම් කලෙක හෙ නුදුන් දෑ නො ගනී ද එයින් කවර කාලෙක් ඉතා වැඩීදැ යි. වහන්ස යම් පුරුෂයෙක් නුදුන් දෑ ගන්නේ නම් රැය හෝ දවාල හෝ කල් නො කල් ගෙන (සලකන විට) යම් කලෙක හෙ නුදුන් දෑ ගනී ද ඒ කාලය ඉතා මඳ ය. යලි දු යම්කලෙක හෙ නුදුන් දෑ නො ගනී ද ඒ කාලයම ඉතා වැඩී ය යි. ගාමණි යමක් බහුල කොට යමක් බහුල කොට වෙසේ නම් එයින් එයින් පමුණුවනු ලැබේය යි මෙසේ ඇති කල්හි නිගණ්ඨනාත-පුත්‍රගේ වචනය පරිදි කිසිවෙක් අපායට යන්නෙක් නිරයට යන්නෙක් නො වන්නේ ය.

තං කිමඤ්ඤසි ගාමණි යො සො පුරිසො කාමෙසු මිච්ඡාචාරී, රත්තියා වා දිවසස්ස වා සමයාසමයං උපාදය කතමො බහුතරො සමයො යං වා සො කාමෙසු මිච්ඡා චරති, යං වා සො කාමෙසු මිච්ඡා න චරතීති. යො සො භන්තෙ පුරිසො කාමෙසු මිච්ඡාචාරී, රත්තියා වා දිවසස්ස වා සමයාසමයං උපාදය අප්පතරො සො සමයො යං සො කාමෙසු මිච්ඡා චරති, අථ ඛො සොව බහුතරො සමයො යං සො කාමෙසු මිච්ඡා න චරති. යං බහුලං යං බහුලං ඛො ගාමණි විහරති තෙන තෙන නීයතීති, එවං සන්තෙ න කොචි ආපායිකො නෙරයිකො භවිස්සති යථා නිගණ්ඨස්ස නාතපුත්තස්ස වචනං.

තං කිමඤ්ඤසි ගාමණි, යො සො පුරිසො මුසාවාදී රත්තියා වා දිවසස්ස වා සමයාසමයං උපාදය කතමො බහුතරො සමයො යං වා සො මුසා භණති යං වා සො මුසා න භණතීති. යො සො භන්තෙ පුරිසො මුසාවාදී රත්තියා වා දිවසස්ස වා සමයාසමයං උපාදය අප්පතරො සො සමයො යං සො මුසා භණති. අථ ඛො සොව බහුතරො සමයො යං සො මුසා න භණතීති. යං බහුලං යං බහුලං ඛො ගාමණි විහරති තෙන තෙන නීයතීති එවං සන්තෙ න කොචි ආපායිකො නෙරයිකො භවිස්සති යථා නිගණ්ඨස්ස නාතපුත්තස්ස වචනං.

ඉධ ගාමණි එකච්චො සත්ථා එවංවාදී හොති එවං දිට්ඨි: යො කොචි පාණමතිපාතෙති සබ්බො සො ආපායිකො නෙරයිකො, යො කොචි අදින්නං ආදියති සබ්බො සො ආපායිකො නෙරයිකො, යො කොචි කාමෙසු මිච්ඡා චරති සබ්බො සො ආපායිකො නෙරයිකො, යො කොචි මුසා භණති සබ්බො සො ආපායිකො නෙරයිකොති. තස්මිං ඛො පන ගාමණි සත්ථරි සාවකො අභිප්පසන්නො හොති, තස්ස එවං හොති මය්හං ඛො සත්ථා එවං වාදී එවං දිට්ඨි: "යො කොචි පාණමතිපාතෙති සබ්බො සො ආපායිකො නෙරයිකොති. අත්ථි ඛො පන මයා පාණො අතිපාතිතො[1] අහම්පි ආපායිකො නෙරයිකොති දිට්ඨිං පටිලභති. තං ගාමණි වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා[2] යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

1. අතිමාපිතො - සී 1, 2, සත්‍යා
2 නිස්සජිත්වා - සත්‍යා

ගාමණි ඒ කිමැ යි හඟිවු ද? යම් ඒ පුරුෂයෙක් කාමයෙහි වරදවා හැසිරෙන සුලු නම් රැය හෝ දවාල හෝ කල් නො කල් ගෙන (සලකනවිට) යම් කලෙක හේ කාමයෙහි වරදවා හැසිරේ ද යම් කලෙක හෝ හේ කාමයෙහි වරදවා නො හැසිරේ ද එයින් කවර කලෙක් ඉතා වැඩි දැ යි. වහන්ස, යම් ඒ පුරුෂයෙක් කාමයෙහි වරදවා හැසිරෙන සුලු ද රැය හෝ දවාල හෝ කල් නො කල් අතු-රෙහි යම් කලෙක හෙතෙමේ කාමයෙහි වරදවා හැසිරේ නම් ඒ කාලය ඉතා මඳ ය. යලි දූ යම් කලෙක හෙතෙමේ කාමයෙහි වරදවා නො හැසිරේ නම් ඒ කාලය ම ඉතා වැඩි ය. ගාමණි, යමක් බහුල කොට යමක් බහුල කොට වෙසේ නම් එයින් එයින් පමුණුවනු ලැබේය යි මෙසේ ඇති කල්හි නිගණ්ඨනාතපුත්‍රගේ වචනය පරිදි කිසිවෙක් අපායට යන්නෙක් නිරයට යන්නෙක් නො වන්නේ ය.

ගාමණි ඒ කිමැ යි හඟිවු ද? යම් ඒ පුරුෂයෙක් මුසවා බෙණෙන සුලු නම් රැය හෝ දවාල හෝ කල් නො කල් අතුරෙහි යම් කලෙක හෙ මුසවා බෙණේ ද යම්කලෙක හෝ හෙතෙමේ මුසවා නො බෙණේ ද එයින් කවර කලෙක් ඉතා වැඩි දැ යි. වහන්ස යම් ඒ පුරුෂයෙක් මුසවා බණන සුලු නම් රැය හෝ දවාල හෝ කල් නො කල් අතුරෙහි යම් කලෙක හෙතෙමේ මුසවා බෙණේ නම් ඒ කාලය ඉතා මඳ ය. වැලි දූ හේ යම් කලෙක මුසවා නො බෙණේ නම් ඒ කාලය ම ඉතා බොහෝ ය. ගාමණි යමක් බහුල කොට යමක් බහුල කොට වෙසේ නම් එයින් එයින් පමුණුවනු ලැබේ ය යි මෙසේ ඇති කල්හි නිගණ්ඨනාතපුත්‍රගේ වචනය පරිදි කිසිවෙක් අපායට යන්නෙක් නිරයට යන්නෙක් නො වන්නේ ය.

ගාමණි මෙහි ඇතැම් ශාස්තෘවරයෙක් මෙබඳු වාද ඇත්තේ මෙබඳු දෘෂ්ටි ඇත්තේ වෙයි: යම්කිසි කෙනෙක් පරපණ නසද්ද ඒ සියලු දෙන අපායට යන්නෝ ය. නිරයට යන්නෝ ය. යම්කිසි කෙනෙක් නුදුන් දැ ගනිද්ද ඒ සියලු දෙන අපායට යන්නෝ ය. නිරයට යන්නෝ ය. යම්කිසි කෙනෙක් කාමයෙහි වරදවා හැසිරෙද්ද එ සියලු දෙන අපායට යන්නෝ ය, නිරයට යන්නෝ ය. යම්කිසි කෙනෙක් මුසවා බෙණෙද්ද ඒ සියලු දෙන අපායට යන්නෝ ය. නිරයට යන්නෝ ය. ගාමණි ඒ ශාස්තෘවරයා කෙරෙහි ශ්‍රාවක තෙමේ ඉතා පැහැදුනේ වේ නම් ඔහුට මෙබඳු සිතෙක් වෙයි: "මාගේ ශාස්තෘ තෙමේ යම්කිසි කෙනෙක් පරපණ නසත් නම් ඒ සියලු දෙන අපායට යන්නෝ ය නිරයට යන්නෝ ය'' යි මෙබඳු වාද ඇත්තේ මෙබඳු දෘෂ්ටි ඇත්තේ වෙ යි. මවිසින් පරපණ නසන ලද්දේ ඇත. මම ද අපායට යන්නෙම් නිරයට යන්නෙම් වෙමියි දිට පිළිලබයි. ගාමණි ඒ වචනය අත්නොහැර ඒ සිත අත් නොහැර ඒ දිට නො බැහැර කොට ගෙනෙන ලද්දක් බහා තබන ලද්දේ යම් සේ නම් එමෙන් නිරයෙහි වේ.

මය්හං ඛො සත්ථා එවං වාදී එවං දිට්ඨි: "යො කොචි අදින්නං ආදියති සබ්බො සො ආපායිකො නෙරයිකො"ති. අත්ථි ඛො පන මයා අදින්නං ආදින්නං, අහම්පම්හි ආපායිකො නෙරයිකොති දිට්ඨිං පටිලභති, තං ගාමණි වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

මය්හං ඛො සත්ථා එවං වාදී එවං දිට්ඨි: "යො කොචි කාමෙසු මිච්ඡා චරති, සබ්බො සො ආපායිකො නෙරයිකො"ති. අත්ථි ඛො පන මයා කාමෙසු මිච්ඡාචිණ්ණං,[1] අහම්පම්හි ආපායිකො නෙරයිකොති දිට්ඨිං පටිලභති, තං ගාමණි වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

මය්හං ඛො සත්ථා එවංවාදී එවංදිට්ඨි: "යො කොචි මුසා භණති සබ්බො සො ආපායිකො නෙරයිකො"ති. අත්ථි ඛො පන මයා මුසා භණිතං, අහම්පම්හි ආපායිකො නෙරයිකොති දිට්ඨිං පටිලභති. තං ගාමණි වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

ඉධ පන ගාමණි තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මා-සම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථී සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා. සො අනෙක පරියායෙන පාණාතිපාතං ගරහති විගරහති පාණාතිපාතා විරමථාති චාහ, අදින්නාදානං ගරහති විගරහති අදින්නාදානා විරමථාති චාහ, කාමෙසු මිච්ඡාචාරං ගරහති විගරහති කාමෙසු මිච්ඡාචාරා විරමථාති චාහ, මුසාවාදං ගරහති විගරහති මුසාවාදා විරමථාති චාහ.

තස්මිං ඛො පන ගාමණි සත්ථරි සාවකො අභිප්පසන්නො හොති, සො ඉති පටිසංචික්ඛති: භගවා ඛො අනෙකපරියායෙන පාණාතිපාතං ගරහති විගරහති පාණාතිපාතා විරමථාති චාහ; අත්ථි ඛො පන මයා පාණො අතිපාතිතො යාවතකො වා තාවතකො වා; යො ඛො පන මයා පාණො අතිපාතිතො යාවතකො වා තාවතකො වා, තං න සුට්ඨු තං න සාධු. අහඤ්චෙව ඛො පන තප්පච්චයා විප්පටිසාරී අස්සං න මෙ තං පාපකං[2] කම්මං අකතං භවිස්සතීති, සො ඉති පටිසඞ්ඛාය තං චෙව පාණාතිපාතං පජහති, ආයතිඤ්ච පාණාතිපාතා පටිවිරතො හොති; එවමෙතස්ස පාපස්ස කම්මස්ස පහානං හොති, එවමෙතස්ස පාපස්ස කම්මස්ස සමතික්කමො හොති.

---

1. මිච්ඡාචාරාචිණ්ණං සතා
2. පාපං - සී.

මාගේ ශාස්තෘ තෙමේ යම් කිසි කෙනෙක් නුදුන් දෑ ගනිද්ද ඒ සියලු දෙන අපායට යන්නෝ ය, නිරයට යන්නෝ ය යි මෙබඳු වාද ඇත්තේ මෙබඳු දෘෂ්ටි ඇත්තේ වෙ යි. මවිසින් නුදුන් දෑ ගන්නා ලද්දේ ඇත. මම ද අපායට යන්නෙම් නිරයට යන්නෙම් වෙමි යි දිට පිළිලබ යි. ගාමණි ඒ වචනය අත් නොහැර ඒ සිත අත් නො හැර ඒ දිට නො බැහැර කොට ගෙනෙන ලද්දක් යම් සේ බහා තබන ලද්දේ නම් එමෙන් නිරයෙහි වේ.

මාගේ ශාස්තෘ තෙමේ යම්කිසි කෙනෙක් කාමයෙහි වරදවා හැසිරෙත් නම් ඒ සියලු දෙන අපායට යන්නෝ ය, නිරයට යන්නෝ යයි මෙබඳු වාද ඇත්තේ මෙබඳු දෘෂ්ටි ඇත්තේ වෙ යි. මවිසින් කාමයෙහි වරදවා හැසිරෙන ලද්දේ ඇත. මම ද අපායට යන්නෙම් නිරයට යන්නෙම් වෙමි යි දිට පිළිලබ යි. ගාමණි ඒ වචනය අත් නො හැර ඒ සිත අත් නො හැර ඒ සිත නො බැහැර කොට ගෙනෙන ලද්දක් බහා තබන ලද්දේ යම් සේ ද එමෙන් නිරයෙහි වේ.

මාගේ ශාස්තෘ තෙමේ යම් කිසි කෙනෙක් මුසවා බෙණෙත් නම් ඒ සියලු දෙන අපායට යන්නෝ නිරයට යන්නෝ ය යි මෙබඳු වාද ඇත්තේ මෙබඳු දෘෂ්ටි ඇත්තේ වෙයි. මවිසින් මුසවා බණන ලද්දේ ඇත. මම ද අපායට යන්නෙම් නිරයට යන්නෙම් වෙමි යි දිට පිළිලබයි. ගාමණි ඒ වචනය අත් නො හැර ඒ සිත අත් නො හැර ඒ දිට නො බැහැර කොට ගෙනෙන ලද්දක් බහා තබන ලද්දේ යම් සේ ද එමෙන් නිරයෙහි වේ.

ගාමණි, අර්හත් වූ සම්මාසම්බුද්ධ වූ විජ්ජාචරණ සම්පන්න වූ සුගතවූ ලෝකවිදූ වූ අනුත්තරපුරිසදම්මසාරථී වූ දෙවිමිනිසුන්ට ශාස්තෘ වූ බුද්ධ වූ භගවත් වූ තථාගතයන් වහන්සේ මේ ලෝකයෙහි උපදීත්. උන් වහන්සේ නන් අයුරෙන් පණිවායට ගරහත්. වෙසෙසින් ගරහත්. පණිවායෙන් වළකිවු ය යි ද කියත්. අයිනාදනට ගරහත්. දැඩි සේ ගරහත්. අයිනාදනින් වළකිවු ය යි ද කියත්. කාමයෙහි වරදවා හැසිරීමට ගරහත්. දැඩි සේ ගරහත්. කාමයෙහි වරදවා හැසිරීමෙන් වළකිවු ය යි ද කියත්. මුසවායට ගරහත් වෙසෙසින් ගරහත්. මුසවායෙන් වළකිවු ය යි ද කියත්.

ගාමණි ඒ ශාස්තෘවරයා කෙරෙහි ශ්‍රාවක තෙමේ වෙසෙසින් පහන් වේ නම් හේ මෙසේ නුවණින් සලක යි. භාග්‍යවතුන් වහන්සේ නන් අයුරින් පණිවායට ගරහත්. දැඩි සේ ගරහත්. පණිවායෙන් වළකිවු ය යි ද වදරත්. මවිසින් යම් පමණ වූ හෝ පරපණෙක් නසන ලද්දේ ඇත්ම ය. මාවිසින් යම් පමණ වූ හෝ පරපණෙක් නසන ලද ද එය යහපත් නො වේ. එය නො මැනවි. ඉදින් මම ඒ හේතුවෙන් විපිළිසර ඇත්තෙම් වන්නෙම් නමුදු මවිසින් ඒ ලාමක කර්මය නො කරන ලද්දේ නො වන්නේ ය යි හෙතෙමේ මෙසේ නුවණින් සලකා ඒ පණිවායත් දුරු කෙරෙ යි. මතු ද පණිවායෙන් වැළකුනේ වෙයි. මෙසේ මේ පවිකම ප්‍රහාණය වෙයි. මෙසේ මේ පවිකම ඉක්මවීම වෙයි.

භගවා ඛො අනෙකපරියායෙන අදින්නාදානං ගරහති විගරහති අදින්නාදානා විරමථාති චාහ. අත්ථි ඛො පන මයා අදින්නං ආදින්නං යාවතකං වා තාවතකං වා; යං ඛො පන මයා අදින්නං ආදින්නං යාවතකං වා තාවතකං වා, තං න සුට්ඨු තං න සාධු. අහඤ්චෙව ඛො පන තප්පච්චයා විප්පටිසාරී අස්සං න මෙ තං පාපකං කම්මං අකතං භවිස්සතීති, සො ඉතිපටිසඞ්ඛාය තඤ්චෙව අදින්නාදානං පජහති, ආයතිඤ්ච අදින්නාදානා පටිවිරතො හොති. එවමෙතස්ස පාපස්ස කම්මස්ස පහානං හොති, එවමෙතස්ස පාපස්ස කම්මස්ස සමතික්කමො හොති.

භගවා ඛො අනෙකපරියායෙන කාමෙසු මිච්ඡාචාරං ගරහති විගරහති, කාමෙසු මිච්ඡාචාරා විරමථාති චාහ. අත්ථි ඛො පන මයා කාමෙසු මිච්ඡාචිණ්ණං යාවතකං වා තාවතකං වා, යං ඛො පන මයා කාමෙසු මිච්ඡාචිණ්ණං යාවතකං වා තාවතකං වා තං න සුට්ඨු තං න සාධු. අහඤ්චෙව ඛො පන තප්පච්චයා විප්පටිසාරී අස්සං න මෙ තං පාපකං කම්මං අකතං භවිස්සතීති. සො ඉති පටිසඞ්ඛාය තඤ්චෙව කාමෙසු මිච්ඡාචාරං පජහති, ආයතිඤ්ච කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති; එවමෙතස්ස පාපස්ස කම්මස්ස පහානං හොති, එවමෙතස්ස පාපස්ස කම්මස්ස සමතික්කමො හොති.

භගවා ඛො අනෙකපරියායෙන මුසාවාදං ගරහති විගරහති, මුසාවාදා විරමථාති චාහ. අත්ථි ඛො පන මයා මුසා භණිතං යාවතකං වා තාවතකං වා, යං ඛො පන මයා මුසා භණිතං යාවතකං වා තාවතකං වා, තං න සුට්ඨු, තං න සාධු. අහඤ්චෙව ඛො පන තප්පච්චයා විප්පටිසාරී අස්සං න මෙ තං පාපකං කම්මං අකතං භවිස්සතීති. සො ඉති පටිසඞ්ඛාය තඤ්චෙව මුසාවාදං පජහති, ආයතිඤ්ච මුසාවාදා පටිවිරතො හොති, එවමෙතස්ස පාපස්ස කම්මස්ස පහානං හොති, එවමෙතස්ස පාපස්ස කම්මස්ස සමතික්කමො හොති.

සො පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො හොති, කාමෙසු මිච්ඡාචාරං පහාය කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති, මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොති, පිසුණාවාචං පහාය පිසුණායවාචාය පටිවිරතො හොති, ඵරුසංවාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතො හොති, සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො හොති, අභිජ්ඣං පහාය අනභිජ්ඣාලු හොති, ව්‍යාපාදපදොසං පහාය අබ්‍යාපන්නචිත්තො හොති, මිච්ඡාදිට්ඨිං පහාය සම්මාදිට්ඨිකො හොති.

ස ඛො සො ගාමණි අරියසාවකො එවං විගතාභිජ්ඣො විගතව්‍යාපාදො අසම්මූළ්හො සම්පජානො පතිස්සතො මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති, තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථිං; ඉති උද්ධමධොතිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අව්‍යාපජ්ජෙන ඵරිත්වා විහරති. සෙය්‍යථාපි ගාමණි බලවා සඞ්ඛධමො අප්පකසිරෙනෙව චතුද්දිසා විඤ්ඤාපෙය්‍ය, එවමෙව ඛො ගාමණි එවං භාවිතාය මෙත්තාය චෙතොවිමුත්තියා එවං බහුලීකතාය යං පමාණකතං කම්මං න තං තත්‍රාවසිස්සති, න තං තත්‍රාවතිට්ඨති.

භාග්‍යවතුන් වහන්සේ නන් අයුරින් අයිනාදනට ගරහත්. දැඩිසේ ගරහත්. අයිනාදනින් වැළකෙවූ යි ද වදරත්. මවිසින් යම් පමණ වූ නුදුන් දෑයෙක් ගන්නා ලද්දේ ඇත් ම ය. මවිසින් යම් පමණ වූ යම් නුදුන් දෑයෙක් ගන්නා ලද නම් එය නොයෙහෙකි. එය නො මැනවි. ඉදින් මම ඒ හේතු කොට ගෙන විපිළිසර වන්නෙම් නමුදු මවිසින් ඒ පව්වූ කර්මය නො කරන ලද්දේ නො වන්නේ ය යි හෙතෙමේ මෙසේ නුවණින් සලකා ඒ අයිනාදනත් දුරු කෙරෙ යි. මතු ද අයිනාදනින් වැළකුනේ වෙයි. මෙසේ මේ පව්කම ප්‍රහාණය වෙයි. මෙසේ මේ පව්කම ඉක්මවීම වෙයි,

භාග්‍යවතුන් වහන්සේ නන් අයුරින් කම්හි මිසහසරට ගරහත්. දැඩි සේ ගරහත්. කම්හි මිසහසරින් වැළකෙවූ යි ද වදරත්. මවිසින් යම් පමණ වූ හෝ කාමයෙහි වරදවා හැසිරෙන ලද්දේ ඇත් ම ය. මවිසින් යම් පමණ වූ හෝ යම් කාමයෙහි වරදවා හැසිරෙන ලද්දෙක් වේ නම් එය නො යෙහෙකි. එය නො මැනවි, ඉදින් මම ඒ හේතු කොට ගෙන විපිළිසර ඇත්තෙම් වන්නෙම් නමුදු මවිසින් ඒ පව්කම නො කරන ලද්දේ නො වන්නේ ය යි හෙතෙමේ මෙසේ නුවණින් සලකා ඒ කම්හි මිසහසරත් දුරු කෙරෙයි. මතු ද කම්හි මිසහසරින් වැළකුනේ වෙයි, මෙසේ මේ පව්කම ප්‍රහාණය වෙයි, මෙසේ මේ පව්කම ඉක්මවීම වෙයි.

භාග්‍යවතුන් වහන්සේ නන් අයුරින් මුසවායට ගරහත්. දැඩි සේ ගරහත්. මුසවායෙන් වැළකෙවූ යි ද වදරත්. මවිසින් යම් පමණ වූ හෝ මුසා බණන ලද්දේ ඇත් ම ය. මවිසින් යම් ඒ පමණ වූ යම් මුසා බණන ලද්දේ වේ නම් එය නො යෙහෙකි. එය නො මැනවි. ඉදින් මම ඒ හේතුවෙන් විපිළිසර ඇතතෙම් වන්නෙම් නමුදු මවිසින් ඒ පව්කම නො කරන ලද්දේ නො වන්නේ ය යි හෙතෙමේ මෙසේ නුවණින් සලකා ඒ මුසවායත් දුරු කෙරෙයි. මතු ද මුසවායෙන් වැළකුනේ වෙයි. මෙසේ මේ පව්කම ප්‍රහාණය වෙයි. මෙසේ මේ පව්කම ඉක්මවීම වෙයි.

හෙතෙමේ පණිවාය පහා පණිවායෙන් වැළකුනේ වෙයි. අයිනාදන පහා අයිනාදනින් වැළකුනේ වෙයි. කම්හි මිසහසර පහා කම්හි මිසහසරින් වැළකුනේ වෙයි. මුසවා පහා මුසවායෙන් වැළකුනේ වෙයි. පිසුනු-වදන පහා පිසුනු වදනින් වැළකුනේ වෙයි. රළුවදන පහා රළුවදනින් වැළකුනේ වෙයි. හිස්තෙපුල පහා හිස්තෙපුලෙන් වැළකුනේ වෙයි. දැඩිලොබ පහා දැඩිලොබින් වැළකුනේ වෙයි. ව්‍යාපාද සිතුවිලි දෙස පහා අව්‍යාපාද සිත් ඇත්තේ වෙයි. මිසදිට පහා සම්දිටු ගත්තේ වෙයි.

ගාමණි ඒ මේ අරිසවු තෙමේ මෙසේ පහ ව ගිය දැඩිලොබ ඇත්තේ පහ ව ගිය ව්‍යාපාද සිතිවිලි ඇත්තේ නොමුළා වූ යේ මනාදනුම් ඇත්තේ එළඹසිටි සිහි ඇත්තේ මෙත්සහගිය සිතින් එක්දිගක් පතුරුවා වෙසෙයි. එසේ දෙවැන්න ද එසේ තෙවැන්න ද එසේ සිවු-වැන්න ද යි මෙසේ උඩ යට සරස සියලු තන්හි සියල්ලන් තමා හා සම බැවින් සියලු සතුන්ගෙන් යුත් ලොව පැතුරුණු මහත්බවට ගිය නො පමණ වෙර රහිත දුක් නැති මෙත්සහගිය සිතින් පතුරුවා වෙසෙ යි. ගාමණි යම්සේ බලවත් සක්පිඹින්නෙක් පහසුවෙන් ම සිවුදිග හඟවන්නේ ද, ගාමණි එසෙයින් ම මෛත්‍රී සමාධිය මෙසේ වඩන ලද කල්හි මෙසේ බහුල කරන ලද කල්හි යම් කාමාවචර කර්මයෙක් වේ නම් එය එහි ඉතිරි නො වේ. එය එහි නො සිටී.

ස ඛො සො ගාමණි අරියසාවකො එවං විගතාභිජ්ඣො විගතබ්‍යාපාදො අසම්මූළ්හො සම්පජානො පතිස්සතො කරුණාසහගතෙන චෙතසා -පෙ- මුදිතාසහගතෙන චෙතසා -පෙ- උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති, තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථිං ඉති උද්ධමධොතිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං උපෙක්ඛාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරති. සෙය්‍යථාපි ගාමණි බලවා සඞ්ඛධමො අප්පකසිරෙනෙව චතුද්දිසා විඤ්ඤාපෙය්‍ය, එවමෙව ඛො ගාමණි එවං භාවිතාය උපෙක්ඛාය චෙතොවිමුත්තියා එවං බහුලීකතාය යං පමාණකතං කම්මං න තං තත්‍රාවසිස්සති, න තං තත්‍රාවතිට්ඨතීති. එවං වුත්තෙ අසිබන්ධකපුත්තො ගාමණි භගවන්තං එතදවොච: අභික්කන්තං භන්තෙ අභික්කන්තං භන්තෙ -පෙ- අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

## 8. 1. 9

## කුලසුත්තං

423. එකං සමයං භගවා **කොසලෙසු** චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං යෙන **නාලන්දා** තදවසරි. තත්‍ර සුදං භගවා **නාලන්දායං** විහරති **පාවාරිකම්බවනෙ**. තෙන ඛො පන සමයෙන නාලන්දා දුබ්භික්ඛා හොති ද්වීහිතිකා[1] සෙතට්ඨිකා[2] සලාකාවුත්තා. තෙන ඛො පන සමයෙන **නිගණ්ඨො නාතපුත්තො** නාලන්දායං පටිවසති මහතියා නිගණ්ඨපරිසාය සද්ධිං. අථ ඛො **අසිබන්ධකපුත්තො** ගාමණි නිගණ්ඨසාවකො යෙන නිගණ්ඨො නාතපුත්තො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා නිගණ්ඨං නාතපුත්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො අසිබන්ධකපුත්තං ගාමණිං නිගණ්ඨො නාතපුත්තො එතදවොච:

එහි ත්වං ගාමණි, සමණස්ස ගොතමස්ස වාදං ආරොපෙහි, එවන්තෙ කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති: "අසිබන්ධකපුත්තෙන ගාමණිනා සමණස්ස ගොතමස්ස එවං මහිද්ධිකස්ස එවං මහානුභාවස්ස වාදො ආරොපිතො"ති. කථං පනාහං භන්තෙ සමණස්ස ගොතමස්ස එවං මහිද්ධිකස්ස එවං මහානුභාවස්ස වාදං ආරොපෙස්සාමීති. එහි ත්වං ගාමණි, යෙන සමණො ගොතමො තෙනුපසඞ්කම උපසඞ්කමිත්වා සමණං ගොතමං එවං වදෙහි: නනු භන්තෙ භගවා අනෙකපරියායෙන කුලානං අනුද්දයං[3] වණ්ණෙති, අනුරක්ඛං වණ්ණෙති, අනුකම්පං වණ්ණෙතීති.

---

1. දුහිතිකා කත්ථචි
2. සෙතට්ටිකා - අඞ්ගුත්තර
3. අනුදයං - සී 1, 2. ස්‍යා.

ගාමණි, ඒ මේ අරිසවු තෙමේ මෙසේ පහ ව ගිය දැඩි ලෝබ ඇත්තේ පහ ව ගිය වනස් සිතිවිලි ඇත්තේ නුමුළා වූයේ මනා දැනුම් ඇත්තේ එළඹ සිටි සිහි ඇත්තේ කුළුණු සහගිය සිතින්... මුදු බැව් සහගිය සිතින් ... මැදහත්බැව් සහගිය සිතින් එක්දිගක් පතුරුවා වෙසෙයි. එසේ දෙවැන්න ද එසේ තෙවැන්න ද එසේ සිවු වැන්න ද යි මෙසේ උඩ යට සරස සියලු තන්හි සියල්ලන් තමා හා සමබැවින් සියලු සතුන්ගෙන් යුත් ලොව පැතුරුණු මහත්බවට ගිය නොපමණ වෙර රහිත දුක් නැති මැදහත්බැව් සහගිය සිතින් පතුරුවා වෙසෙ යි. ගාමණි, යම්සේ බලවත් සක්පිඹින්නෙක් පහසුවෙන් ම සිවුදිග හඟවන්නේ ද, ගාමණි එසෙයින් ම උපේක්ෂා සමාධිය මෙසේ වඩන ලද කල්හි මෙසේ බහුල කරන ලද කල්හි යම් කාමාවචර කර්මයෙක් වේ නම් එය එහි ඉතිරි නො වේ. එය එහි නො සිටී යි. මෙසේ වදාළ කල්හි අසිබන්ධකපුත්ත ගාමණි තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේ ය: වහන්ස ඉතා මැනවි. වහන්ස ඉතා මැනවි ... අද පටන් දිවිහිමියෙන් සරණ ගිය (උවසුවකු කොට මා දරන සේක්වා) යි.

## 8. 1. 9

## කුල සූත්‍රය

423. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ මහත් බික්සඟන සමග කොසොල් දනව්වෙහි චාරිකාවෙහි හැසිරෙන සේක් නාලන්දාව වෙත වැඩමකළ සේක. භාග්‍යවතුන් වහන්සේ එහි නාලන්දාවෙහි පාවාරික අඹවෙනෙහි වැඩවසන සේක. එසමයෙහි නාලන්දාව දුබික් වූවා (දිවි පැවත්ම) ගැන සැක ඇත්තී (මළමිනිසුන්ගේ) සුදු ඇට ඇත්තී නොහොත් (බොල්වීමෙන්) සුදු ඇට ඇත්තී ලහයෙන් පැවතුම් ඇත්තී වපුළ ගොයම පිදුරු පමණක් වූවා වෙයි. එකල්හි නිගණ්ඨනාතපුත්ත මහත් වූ නිගණ්ඨ පිරිස සමග නාලන්දාවෙහි වෙසෙයි. ඉක්බිති නිගණ්ඨශ්‍රාවක වූ අසිබන්ධකපුත්ත ගාමණි තෙමේ නිගණ්ඨනාතපුත්ත වෙත එළඹියේ ය. එළඹ නිගණ්ඨනාතපුත්ත වැඳ එකත්පස්ව හුන්නේය. එකත්පස් ව හුන් අසිබන්ධකපුත්ත ගාමණිහට නිගණ්ඨනාතපුත්ත මෙය කී ය:

ගාමණි එවු, තෙපි මහණ ගොයුම්හට වාද නගවු. මෙසේ තොපට "මෙසේ මහත් ඉදුහ ඇති මෙසේ මහත් අනුභාව ඇති මහණ ගොයුම්හට අසිබන්ධකපුත්ත ගාමණි විසින් වාද නගන ලද"යි කලණ කිතු ගොසෙක් පැන නගී යි. හිමියනි මෙසේ මහත් ඉදුහ ඇති මෙසේ මහත් අනුභාව ඇති මහණ ගොයුම්හට කෙසේ මම වාද නගන්නෙම් දැ යි. ගාමණි, එව තෙපි මහණ ගොයුම් වෙත එළඹෙව. එළඹ මහණ ගොයුම්හට මෙසේ කියව: වහන්ස, භාග්‍යවතුන් වහන්සේ නන් අයුරින් කුලයන්ට දයාව වණත් නු, රැකවරණ වණත් නු, අනුකම්පාව වණත් නු යි.

සචෙ තෙ ගාමණි සමණො ගොතමො එවං පුට්ඨො එවං ව්‍යාකරොති: "එවං ගාමණි තථාගතො අනෙකපරියායෙන කුලානං අනුද්දයං වණ්ණෙති, අනුරක්ඛං වණ්ණෙති, අනුකම්පං වණ්ණෙතී"ති තමෙනං ත්වං එවං වදෙය්‍යාසි: අථ කිඤ්චරහි භන්තෙ භගවා දුබ්භික්ඛෙ ද්වීහිතිකෙ සෙතට්ඨිකෙ සලාකාවුත්තෙ මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං චාරිකං චරති? උච්ඡෙදාය භගවා කුලානං පටිපන්නො, අනයාය භගවා කුලානං පටිපන්නො, උපඝාතාය භගවා කුලානං පටිපන්නොති. ඉමං ඛො තෙ ගාමණි සමණො ගොතමො උභතො කොටිකං පඤ්හං පුට්ඨො නෙව සක්ඛිති උග්ගිලිතුං නෙව සක්ඛිති ඔගිලිතුන්ති.

එවං භන්තෙති ඛො අසිබන්ධකපුත්තො ගාමණි නිගණ්ඨස්ස නාතපුත්තස්ස පටිස්සුත්වා උට්ඨායාසනා නිගණ්ඨං නාතපුත්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො අසිබන්ධකපුත්තො ගාමණි භගවන්තං එතදවොච: "නනු භන්තෙ භගවා අනෙකපරියායෙන කුලානං අනුද්දයං වණ්ණෙති, අනුරක්ඛං වණ්ණෙති, අනුකම්පං වණ්ණෙතීති." එවං ගාමණි තථාගතො අනෙකපරියායෙන කුලානං අනුද්දයං වණ්ණෙති, අනුරක්ඛං වණ්ණෙති, අනුකම්පං වණ්ණෙතීති. අථ කිඤ්චරහි භන්තෙ භගවා දුබ්භික්ඛෙ ද්වීහිතිකෙ සෙතට්ඨිකෙ, සලාකාවුත්තෙ මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං චාරිකං චරති? උච්ඡෙදාය භගවා කුලානං පටිපන්නො, අනයාය භගවා කුලානං පටිපන්නො, උපඝාතාය භගවා කුලානං පටිපන්නොති.

ඉතො සො ගාමණි එකනවුතො කප්පො[2], යමහං අනුස්සරාමි. නාභිජානාමි කිඤ්චිකුලං පක්කභික්ඛාඅනුප්පදානමත්තෙන[3] උපහතපුබ්බං අථ ඛො යානි තානි කුලානි අඩ්ඪානි මහද්ධනානි මහාභොගානි පහූතජාතරූපරජතානි පහූතවිත්තූපකරණානි පහූතධනධඤ්ඤානි, සබ්බානි තානි දානසම්භූතානි චෙව සච්චසම්භූතානි ච සඤ්ඤමසම්භූතානි ච[4].

අට්ඨ ඛො ගාමණි හෙතූ අට්ඨ පච්චයා කුලානං උපඝාතාය. රාජතො වා කුලානි උපඝාතං ගච්ඡන්ති, චොරතො වා කුලානි උපඝාතං ගච්ඡන්ති, අග්ගිතො වා කුලානි උපඝාතං ගච්ඡන්ති, උදකතො වා කුලානි උපඝාතං ගච්ඡන්ති, නිහිතං වා නාධිගච්ඡන්ති,[5] දුප්පයුත්තා වා කම්මන්තා ජහන්ති,[6] කුලානං වා කුලඞ්ගාරො උප්පජ්ජති යො තෙ භොගෙ විකිරති විධමති විද්ධංසෙති, අනිච්චතායෙව අට්ඨමීති. ඉමෙ ඛො ගාමණි අට්ඨහෙතූ අට්ඨපච්චයා කුලානං උපඝාතාය. ඉමෙසු ඛො ගාමිණි අට්ඨසු හෙතූසු අට්ඨසු පච්චයෙසු සන්තෙසු සංවිජ්ජමානෙසු යො මං එවං වදෙය්‍ය: "උච්ඡෙදාය භගවා කුලානං පටිපන්නො, අනයාය භගවා කුලානං පටිපන්නො, උපඝාතාය භගවා කුලානං පටිපන්නොති. තං ගාමණි වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා යථාභතං නික්ඛිත්තො එවං නිරයෙති.

1. සක්ඛති – මජසං, ස්‍යා, සී 2
2. එකනවුතිකප්පෙ – සීමු. මජසං
3. පක්කභික්ඛාදානෙන – ස්‍යා
4. සාමඤ්ඤසම්භූතානි ච - මජසං.
5. ඨානාවිගච්ඡන්ති–මජසං, ස්‍යා.
6. කම්මන්තා ජහන්ති – සීමු.

ගාමණි, මෙසේ පුළුවුස්නා ලද මහණ ගොයුම් තෙමේ ඉදින් තොපට "ගාමණි එසේ ය. තථාගත තෙමේ නන් අයුරින් කුලයන්ට දයාව වණයි, රැකවරණ වණයි, අනුපම්පාව වණා යැ යි මෙසේ පවසා නම් ඒ මොහුට තෙපි මෙසේ කියන්නහු ය: වහන්ස, එසේ නම් කුමක් හෙයින් සැක පහළකරන සුදු ඇට ඇති ලහයෙන් පැවතුම් ඇති දුබික් පවත්නා කල භාග්‍යවතුන් වහන්සේ මහත් බික්සඟන සමග චාරිකාවෙහි හැසිරෙද් ද? භාග්‍යවතුන් වහන්සේ කුල නැසීම පිණිස පිළිපන්හ. භාග්‍යවතුන් වහන්සේ කුල පිරිහෙළීම පිණිස පිළිපන්හ. භාග්‍යවතුන් වහන්සේ කුල පෙළීම පිණිස පිළිපන්හ යි. ගාමණි, තොප විසින් මේ දෙ කෙළවරක් ඇති පැන පුළුවුස්නා ලද මහණ ගොයුම් තෙමේ වමාරන්නට නො ම හැකි වන්නේ ය. ගිලින්නට නො ම හැකිවන්නේ යි.

එසේ ය හිමියනි යි අසිබන්ධකපුත්ත ගාමණි නිගණ්ඨනාතපුත්තහට පිළිවදන් අස්වා හුනස්නෙන් නැගිට නිගණ්ඨනාතපුත්ත වැඳ පැදකුණු කොට භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස්ව හුන්නේ ය. එකත්පස්ව හුන් අසිබන්ධකපුත්ත ගාමණි භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: වහන්ස, භාග්‍යවතුන් වහන්සේ නන් අයුරෙන් කුලයන්ට දයාව වණත් නු? රැකවරණ වණත් නු? අනුකම්පාව වණත් නු යි. ගාමණි, එසේ ය. තථාගත තෙමේ නන් අයුරෙන් කුලයන්ට දයාව වණා, රැකවරණ වණා. අනුකම්පාව වණා යි. වහන්ස, එසේ නම් කුමක් හෙයින් භාග්‍යවතුන් වහන්සේ සැක පහළ කරන සුදු ඇට ඇති ලහයෙන් පැවතුම් ඇති දුබික් පවත්නා කල්හි මහත් බික්සඟන සමග චාරිකාවෙහි හැසිරෙද් ද? භාග්‍යවතුන් වහන්සේ කුල නැසීම පිණිස පිළිපන් හ. භාග්‍යවතුන් වහන්සේ කුල පිරිහෙළීම පිණිස පිළිපන්හ. භාග්‍යවතුන් වහන්සේ කුල පෙළීම පිණිස පිළිපන්හ යි.

ගාමණි, මම යමක් සිහි කෙරෙම් නම් එය මෙයින් එකානුවන කප ය. (මෙදූකුර) පැසුණු අහරක් දීම් පමණකින් නටවිරූ කිසි කුලයක් නො දනිමි. යලිදු ආඪ්‍ය වූ මහත් ධන ඇති මහත් භොග ඇති බොහෝ රන් රිදී ඇති බොහෝ ප්‍රීත්‍යුපකරණ ඇති බොහෝ ධන ධාන්‍ය ඇති යම් ඒ කුලයෝ වෙත් නම් ඒ සියල්ලෝ දන් දීමෙන් හටගත්තාහු ද සබවසින් හටගත්තාහු ද ශීලසංයමයෙන් හටගත්තාහු ද වෙති.

ගාමණි, කුල නැසීම පිණිස හේතු අටෙකි. ප්‍රත්‍යය අටෙකි. රජුන්ගෙන් හෝ කුල නැසීමට යේ. සොරුන්ගෙන් හෝ කුල නැසීමට යේ. ගින්නෙන් හෝ කුල නැසීමට යේ. දියෙන් හෝ කුල නැසීමට යේ. තැන්පත් කරන ලද්ද හෝ නො ලබත්. වරදවා යොදන ලද සේවකයෝ හෝ කර්මාන්ත අත්හරිත්. යමෙක් ඒ භෝගයන් විසුරුවා ද පිඹ හරී ද වනසා දමා ද කුලයෙහි එබඳු කුල අඟුරෙක් හෝ උපදී. අනිස බවම අටවැන්න ය. ගාමණි, කුලනැසීම පිණිස මේ හේතු අට ය, ප්‍රත්‍යය අටය. ගාමණි මේ හේතු අට මේ ප්‍රත්‍යය අට ඇති කල්හි පවත්නා කල්හි යමෙක් "භාග්‍යවතුන් වහන්සේ කුල සිඳීම පිණිස පිළිපන්හ, භාග්‍යවතුන් වහන්සේ කුල පිරිහෙළීම පිණිස පිළිපන්හ, භාග්‍යවතුන් වහන්සේ කුල නැසීම පිණිස පිළිපන්හ'යි මට මෙසේ කියන්නේ නම් ගාමණි, ඒ වචනය අත් නො හැර ඒ සිත අත් නො හැර ඒ දිට නො බැහැර කොට ගෙනෙන ලද්දක් බහා තබන ලද්දේ යම් සේ නම් එමෙන් නිරයෙහි වේ යී.

එවං වුත්තෙ අසිබන්ධකපුත්තො ගාමණී භගවන්තං එතදවොච: අභික්කන්තං භන්තෙ -පෙ- උපාසකං මං භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

## 8. 1. 10

## මණිචූළකසුත්තං

424. එකං සමයං භගවා **රාජගහෙ** විහරති **වෙළුවනෙ කලන්දකනිවාපෙ**. තෙන ඛො පන සමයෙන රාජන්තෙපුරෙ රාජපරිසායං සන්නිසින්නානං සන්නිපතිතානං අයමන්තරා කථා උදපාදි: ''කප්පති සමණානං සක්‍යපුත්තියානං ජාතරූපරජතං, සාදියන්ති සමණා සක්‍යපුත්තියා ජාතරූපරජතං. පතිගණ්හන්ති සමණා සක්‍යපුත්තියා ජාතරූපරජත''න්ති.

තෙන ඛො පන සමයෙන **මණිචූළකො ගාමණී** තස්සං පරිසායං නිසින්නො හොති. අථ ඛො මණිචූළකො ගාමණී තං පරිසං එතදවොච: මා අය්‍යා එවං අවචුත්ථ, න කප්පති සමණානං සක්‍යපුත්තියානං ජාතරූපරජතං, න සාදියන්ති සමණා සක්‍යපුත්තියා ජාතරූපරජතං, න පතිගණ්හන්ති සමණා සක්‍යපුත්තියා ජාතරූපරජතං, නික්ඛිත්තමණිසුවණ්ණා සමණා සක්‍යපුත්තියා අපෙතජාතරූපරජතාති. අසක්ඛි ඛො මණිචූළකො ගාමණී තං පරිසං සඤ්ඤාපෙතුං. අථ ඛො මණිචූළකො ගාමණී යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො මණිළචූකො ගාමණී භගවන්තං එතදවොච:

ඉධ භන්තෙ රාජන්තෙපුරෙ රාජපරිසායං සන්නිසින්නානං සන්නිපතිතානං අයමන්තරා කථා උදපාදි: කප්පති සමණානං සක්‍යපුත්තියානං ජාතරූපරජතං, සාදියන්ති සමණා සාක්‍යපුත්තියා ජාතරූපරජතං, පතිගණ්හන්ති සමණා සක්‍යපුත්තියා ජාතරූපරජතන්ති. එවං වුත්තාහං භන්තෙ තං පරිසං එතදවොච: මා අය්‍යා එවං අවචුත්ථ, න කප්පති සමණානං සක්‍යපුත්තියානං ජාතරූපරජතං, න සාදියන්ති සමණා සක්‍යපුත්තියා ජාතරූපරජතං, න පතිගණ්හන්ති සමණා සක්‍යපුත්තියා ජාතරූපරජතං, නික්ඛිත්තමණිසුවණ්ණා සමණා සක්‍යපුත්තියා අපෙතජාතරූපරජතාති. අසක්ඛිං ඛොහං තං භන්තෙ පරිසං සඤ්ඤාපෙතුං. කච්චාහං භන්තෙ එවං ව්‍යාකරමානො වුත්තවාදී චෙව භගවතො හොමි, න ච භගවන්තං අභූතෙන අබ්භාචික්ඛාමි, ධම්මස්ස චානුධම්මං ව්‍යාකරොමි, න ච කොචි සහධම්මිකො වාදානුපාතො ගාරය්හං ඨානං ආගච්ඡතීති.

මෙසේ වදාළ කල්හි අසිබන්ධකපුත්ත ගාමණි තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: වහන්ස, ඉතා මැනවි .. භාග්‍යවතුන් වහන්සේ අද පටන් දිවිහිමියෙන් සරණ ගිය උවසුවකු කොට මා දරන සේක්වා යි.

## 8. 1. 10

## මණිචූලක සූත්‍රය

424. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **රජගහනුවර සමීපයෙහි කලන්දකනිවාප** නම් **වෙළුවනාරාමයෙහි** වැඩවසන සේක. එසමයෙහි රජුගේ ඇතුළු පුර රජපිරිසෙහි එක්රැස් ව හිඳගත්තවුන් අතර මේ අතුරු කථාව පහළ විය: ශ්‍රමණ ශාක්‍යපුත්‍රයන්ට රන්රිදී කැප ය. ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ රන්රිදී ඉවසත්. ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ රන් රිදී පිළිගනිති යි.

එකල්හි **මණිචූලකගාමණි** තෙමේ ඒ පිරිසෙහි හුන්නේ වෙයි. ඉක්බිති මණිචූලක ගාමණි තෙමේ ඒ පිරිසට මෙය කී ය: ආයුෂ්මයෙනි, මෙසේ නො කියනු මැනව. ශ්‍රමණ ශාක්‍යපුත්‍රයන්ට රන්රිදී නො කැප ය. ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ රන්රිදී නො ඉවසත්. ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ රන්රිදී නො පිළිගනිත්. ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ බහා තැබූ රන්රුවන් ඇතියහ. ඉවත් වූ රන්රිදී ඇතියහ යි. මණිචූලක ගාමණි තෙමේ ඒ පිරිස හඟවන්නට හැකි විය. එකල්හි මණිචූලක ගාමණි තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැද එකත්පස් ව හුන්නේ ය. එකත්පස් ව හුන් මණිචූලක ගාමණි තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය:

වහන්ස, මෙහි රජුගේ ඇතුළු පුර රජපිරිසෙහි එක්රැස්ව හිඳ ගත්තවුන් අතර මේ අතුරු කථාව පහළ විය: ශ්‍රමණ ශාක්‍යපුත්‍රයන්ට රන්රිදී කැපය, ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ රන්රිදී ඉවසත්, ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ රන්රිදී පිළිගනිති යි. වහන්ස, මෙසේ කී කල්හි මම ඒ පිරිසට මෙය කීමි: ආයුෂ්මයෙනි, මෙසේ නො කියනු මැනවි. ශ්‍රමණ ශාක්‍යපුත්‍රයන්ට රන්රිදී නො කැපය. ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ රන්රිදී නො ඉවසත්. ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ රන්රිදී නො පිළිගනිත්. ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ බහා තැබූ රන් රුවන් ඇතියහ. ඉවත් වූ රන්රිදී ඇතියහ යි. වහන්ස, මම ඒ පිරිස හඟවන්නට හැකි වීමි. වහන්ස කිම, මම මෙසේ පවසන්නෙම් භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද්දක් කියන්නෙක් වෙම් ද? භාග්‍යවතුන් වහන්සේට බොරුවෙන් නො ද චෝදනා කෙරෙම් ද? දහමට අනුදහමක් පවසන්නෙම් ද? කරුණු සහිත කිසියම් වාදනුපාතයෙක් ගැරහිය යුතු තැනට නො ද පැමිණේ දැ යි.

තස්ස ත්වං ගාමණි එවං ව්‍යාකරමානො වුත්තවාදී චෙව මෙ හොසි, න ච මං අභූතෙන අබ්භාචික්ඛසි, ධම්මස්ස චානුධම්මං ව්‍යාකරොසි, න ච කොචි සහධම්මිකො වාදනුපාතො ගාරය්හං ඨානං ආගච්ඡති. න හි කප්පති ගාමණි සමණානං සක්‍යපුත්තියානං ජාතරූපරජතං, න සාදියන්ති සමණා සක්‍යපුත්තියා ජාතරූපරජතං, න පතිගණ්හන්ති සමණා සක්‍යපුත්තියා ජාතරූපරජතං, නික්ඛිත්තමණිසුවණ්ණා සමණා සාක්‍යපුත්තියා අපෙතජාතරූපරජතා.

යස්ස ඛො ගාමණි ජාතරූපරජතං කප්පති, පඤ්චපි තස්ස කාමගුණා කප්පන්ති. යස්ස පඤ්චකාමගුණා කප්පන්ති, එකංසෙනෙතං ගාමණි ධාරෙය්‍යාසි: අස්සමණධම්මො අසක්‍යපුත්තියධම්මොති. අපිචාහං ගාමණි එවං වදමි: තිණං තිණත්ථිකෙන පරියෙසිතබ්බං, දරුං දරුත්ථිකෙන පරියෙසිතබ්බං, සකටං සකටත්ථිකෙන පරියෙසිතබ්බං පුරිසො පුරිසත්ථිකෙන පරියෙසිතබ්බො. නත්වෙවාහං ගාමණි කෙනචි පරියායෙන ජාතරූපරජතං සාදිතබ්බං පරියෙසිතබ්බන්ති වදමීති.

## 8. 1. 11

### භද්‍රකසුත්තං

425. එකං සමයං භගවා මල්ලෙසු[1] විහරති උරුවෙලකප්පං නාම මල්ලානං නිගමො. අථ ඛො භද්‍රකො[2] ගාමණී යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො භද්‍රකො ගාමණී භගවන්තං එතදවොච: සාධු මෙ භන්තෙ භගවා දුක්ඛස්ස සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච දෙසෙතූති. අහඤ්චෙ[3] තෙ ගාමණි අතීතං අද්ධානං ආරබ්භ දුක්ඛස්ස සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච දෙසෙය්‍යං: "එවං අහොසි අතීතමද්ධාන"න්ති තත්‍ර තෙ සියා කඞ්ඛා සියා විමති. අහඤ්චෙ තෙ ගාමණි අනාගතමද්ධානං ආරබ්භ දුක්ඛස්ස සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච දෙසෙය්‍යං: "එවං භවිස්සති අනාගතමද්ධාන"න්ති තත්‍රාපි තෙ සියා කඞ්ඛා සියා විමති. අපිචාහං ගාමණි ඉධෙව නිසින්නො එත්ථ ච තෙ නිසින්නස්ස දුක්ඛස්ස සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච දෙසිස්සාමි. තං සුණාහි, සාධුකං මනසි කරොහි, භාසිස්සාමීති. එවං භන්තෙති ඛො භද්‍රකො ගාමණී භගවතො පච්චස්සොසි භගවා එතදවොච:

1. මලතෙසු - සී 1, 2
2. භද්‍රගතො - සී 1, ගන්ධභකො - ස්‍යා
3. අහඤ්ච සී 1, ස්‍යා

ගාමණි, ඒකාන්තයෙන් තෙපි මෙසේ පවසන්නාහු මවිසින් කියන ලද්දක් කියන්නෙක් ද වවු. මට බොරුවෙන් නො ද චෝදනා කරවු. දහමට ද අනුදහමක් පවසවු. කරුණු සහිත කිසියම් වාදනුපාතයෙක් ගැරහිය යුතු තැනට නො ද පැමිණේ. ගාමණි ශ්‍රමණ ශාක්‍යපුත්‍රයන්ට රන්රිදී නො ම කැපය. ශ්‍රමණශාක්‍යපුත්‍රයෝ රන්රිදී නො ඉවසත්. ශ්‍රමණ-ශාක්‍යපුත්‍රයෝ රන්රිදී නො පිළිගනිත්. ශ්‍රමණශාක්‍යපුත්‍රයෝ බහා තැබූ රන්රුවන් ඇතියහ. ඉවත් වූ රන්රිදී ඇතියහ.

ගාමණි යමකුට රන්රිදී කැප වේ නම් ඔහුට පස්කම් ගුණ ම කැප වේ. යමකුට පස් කම්ගුණ කැප වේ නම් ඒකාන්තයෙන් අශ්‍රමණ ධර්ම ඇත්තෙක. අශාක්‍යපුත්‍රීය ධර්ම ඇත්තෙකැ යි මෙය දරන්නෙහි ය. ගාමණි වැලි දු මම මෙසේ කියමි. තණවලින් ප්‍රයෝජන ඇත්තහු විසින් තණ සෙවිය යුතු ය. දුවවලින් ප්‍රයෝජන ඇත්තහු විසින් දුව සෙවිය යුතු ය. ගැලින් ප්‍රයෝජන ඇත්තහු විසින් ගැල සෙවිය යුතු ය. පුරුෂයාගෙන් ප්‍රයෝජන ඇත්තහු විසින් පුරුෂයා සෙවිය යුතු ය. ගාමණි කිසි අයුරකින් රන්රිදී ඉවසිය යුතු ය, සෙවිය යුතු යයි මම නො ම කියමි යි.

## 8. 1. 11

## භද්‍රක සූත්‍රය

425. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ මල්ලදනව්වෙහි උරුවෙලකප්ප නම් මල්ලයන්ගේ නියම්ගමෙහි වැඩවසන සේක. එකල්හි භද්‍රක ගාමණි තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් ව හුන්නේ ය. එකත්පස් ව හුන් භද්‍රක ගාමණි භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: "මැනවැ වහන්ස, මට භාග්‍යවතුන් වහන්සේ දුකෙහි හටගැනීමත් අස්තගමයත් දේශනා කරන සේක්වා" යි. ගාමණි ඉදින් මම තොපට ඉකුත් කල ඇරබ "ඉකුත් කල මෙසේ වීය"යි දුකෙහි හටගැනීමත් අස්තගමයත් දෙසන්නෙම් නම් එහි ලා තොපට සැකයෙක් වන්නේ ය, විමතියෙක් වන්නේ ය. ගාමණි ඉදින් මම තොපට මතු කල ඇරබ "මතු කල මෙසේ වන්නේය"යි දුකෙහි හටගැනීමත් අස්තගමයත් දෙසන්නෙම් නම් එහි ලා ද තොපට සැකයෙක් වන්නේ ය, විමතියෙක් වන්නේ ය. ගාමණි වැලි දු මම මෙහි ම හුන්නෙම් මෙහි ම හුන් තොපට දුකෙහි හටගැනීමත් අස්තගමයත් දෙසන්නෙමි එය අසවු. මැනවින් මෙනෙහි කරවු. කියන්නෙමි යි. එසේ ය වහන්සැ යි භද්‍රක ගාමණි භාග්‍යවතුන් වහන්සේ ට පිළිවදන් ඇස්වීය. භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක:

තං කිම්මඤ්ඤසි ගාමණි අත්ථි තෙ උරුවෙලකප්පෙ මනුස්සා යෙසන්තෙ වධෙන වා බන්ධෙන වා ජානියා වා ගරහාය වා උප්පජ්ජෙය්‍යුං සොකපරිදෙවදුක්ඛදෙමනස්සුපායාසාති. අත්ථි මෙ භන්තෙ උරුවෙලකප්පෙ මනුස්සා යෙසං මෙ වධෙන වා බන්ධෙන වා ජානියා වා ගරහාය වා උප්පජ්ජෙය්‍යුං සොකපරිදෙවදුක්ඛදෙමනස්සුපායාසාති. අත්ථි පන තෙ ගාමණි උරුවෙලකප්පෙ මනුස්සා යෙසන්තෙ වධෙන වා බන්ධෙන වා ජානියා වා ගරහාය වා නුප්පජ්ජෙය්‍යුං සොකපරිදෙවදුක්ඛදෙමනස්සුපායාසාති. අත්ථි මෙ භන්තෙ උරුවෙලකප්පෙ මනුස්සා යෙසං මෙ වධෙන වා බන්ධෙන වා ජානියා වා ගරහාය වා නුප්පජ්ජෙය්‍යුං සොකපරිදෙවදුක්ඛදෙමනස්සුපායාසාති.

කො නු ඛො ගාමණි හෙතු කො පච්චයො යෙන තෙ එකච්චානං උරුවෙලකප්පියානං මනුස්සානං වධෙන වා බන්ධෙන වා ජානියා වා ගරහාය වා උප්පජ්ජෙය්‍යුං සොකපරිදෙවදුක්ඛදෙමනස්සුපායාසා? කො පන ගාමණි හෙතු කො පච්චයො යෙන තෙ එකච්චානං උරුවෙලකප්පියානං මනුස්සානං වධෙන වා බන්ධෙන වා ජානියා වා ගරහාය වා නුප්පජ්ජෙය්‍යුං සොකපරිදෙවදුක්ඛදෙමනස්සුපායාසාති. යෙසං මෙ භන්තෙ උරුවෙලකප්පියානං මනුස්සානං වධෙන වා බන්ධෙන වා ජානියා වා ගරහාය වා උප්පජ්ජෙය්‍යුං සොකපරිදෙවදුක්ඛදෙමනස්සුපායාසා, අත්ථි මෙ තෙසු ඡන්දරාගො. යෙසං පන මෙ භන්තෙ උරුවෙලකප්පියානං මනුස්සානං වධෙන වා බන්ධෙන වා ජානියා වා ගරහාය වා නුප්පජ්ජෙය්‍යුං සොකපරිදෙවදුක්ඛදෙමනස්සුපායාසා, නත්ථි මෙ තෙසු ඡන්දරාගොති.

ඉමිනා ත්වං ගාමණි ධම්මෙන දිට්ඨෙන විදිතෙන අකාලිකෙන පත්තෙන පරියොගාළ්හෙන අතීතානාගතෙ නයං නෙහි, යං ඛො කිඤ්චි අතීතමද්ධානං දුක්ඛං උප්පජ්ජමානං උප්පජ්ජි, සබ්බන්තං ඡන්දමූලකං ඡන්දනිදානං, ඡන්දො හි මූලං දුක්ඛස්ස යං හි කිඤ්චි අනාගතමද්ධානං දුක්ඛං උප්පජ්ජමානං උප්පජ්ජිස්සති, සබ්බන්තං ඡන්දමූලකං ඡන්දනිදානං ඡන්දො හි මූලං දුක්ඛස්සාති. අච්ඡරියං භන්තෙ අබ්භුතං භන්තෙ යාව සුභාසිතමිදං භන්තෙ භගවතා "යං කිඤ්චි [1]අතීතමද්ධානං දුක්ඛං උප්පජ්ජමානං උප්පජ්ජි සබ්බන්තං ඡන්දමූලකං ඡන්දනිදානං, ඡන්දො හි මූලං දුක්ඛස්ස. යං කිඤ්චි අනාගතමද්ධානං දුක්ඛං උප්පජ්ජමානං උප්පජ්ජිස්සති සබ්බන්තං ඡන්දමූලකං ඡන්දනිදානං, ඡන්දො හි මූලං දුක්ඛස්සාති.[2]

1 අතීතමද්ධානන්ති පාඨො මරම්මපොත්ථකෙ න දිස්සතෙ

2 අනන්තරිත පාඨොපි මරම්මපොත්ථකෙ න දිස්සතෙ

ගාමණි ඒ කිමැ යි හඟිවූ ද? යම් කෙනකුන්ගේ නැසීමෙන් හෝ බැඳීමෙන් හෝ පිරිහීමෙන් හෝ ගැරහීමෙන් හෝ තොපට සොකපරිදෙව දුක්ඛදෙමනස්ස උපායාසයෝ උපදනාහු නම් උරුවෙලකප්පයෙහි තොපට එබඳු මිනිස්සු ඇද්ද යි. වහන්ස, යම් කෙනෙකුන්ගේ නැසීමෙන් හෝ බැඳීමෙන් හෝ පිරිහීමෙන් හෝ ගැරහීමෙන් හෝ මට සොකපරිදෙව දුක්ඛදෙමනස්ස උපායාසයෝ උපදනාහු නම් උරුවෙලකප්පයෙහි මට එබඳු මිනිස්සු ඇතැ යි. ගාමණි යම් කෙනකුන්ගේ නැසීමෙන් හෝ බැඳීමෙන් හෝ පිරිහීමෙන් හෝ ගැරහීමෙන් හෝ තොපට සොකපරිදෙව දුක්ඛ දෙමනස්ස උපායාසයෝ නූපදනාහු නම් උරුවෙලකප්පයෙහි තොපට එබඳු මිනිස්සු ඇද්ද යි. වහන්ස යම් කෙනකුන්ගේ නැසීමෙන් හෝ බැඳීමෙන් හෝ පිරිහීමෙන් හෝ ගැරහීමෙන් හෝ මට සොක-පරිදෙව දුක්ඛ දෙමනස්ස උපායාසයෝ නූපදනාහු නම් උරුවෙලකප්ප-යෙහි මට මෙබඳු මිනිස්සු ඇතැ යි.

ගාමණි, යම් හෙයකින් තොපට උරුවෙලකප්ප වැසි ඇතැම් මිනිසුන්ගේ නැසීමෙන් හෝ බැඳීමෙන් හෝ පිරිහීමෙන් හෝ ගැරහීමෙන් හෝ සොකපරිදෙවදුක්ඛදෙමනස්සඋපායාසයෝ උපදනාහු නම් එයට කිමෙක් හෙතු ද?' කිමෙක් ප්‍රත්‍යය ද? ගාමණි යම් හෙයකින් තොපට උරුවෙලකප්ප වැසි ඇතැම් මිනිසුන්ගේ නැසීමෙන් හෝ බැඳීමෙන් හෝ පිරිහීමෙන් හෝ ගැරහීමෙන් හෝ තොපට සොක පරිදෙව දුක්ඛ දෙමනස්ස උපායාසයෝ නූපදනාහු නම් එයට කිමෙක් හේතු ද? කිමෙක් ප්‍රත්‍යය ද යි. වහන්ස උරුවෙලකප්ප වැසි යම් මිනිසුන්ගේ නැසීමෙන් හෝ බැඳීමෙන් හෝ පිරිහීමෙන් හෝ ගැරහීමෙන් හෝ මට සෝක පරිදේව දුක්ඛ දෙමනස්ස උපායාසයෝ උපදනාහු නම් ඔවුන් කෙරෙහි මට ඡන්දරාගය ඇත. වහන්ස, උරුවෙලකප්පවැසි යම් මිනිසුන්ගේ නැසීමෙන් හෝ බැඳීමෙන් හෝ පිරිහීමෙන් හෝ ගැරහීමෙන් හෝ මට සෝක පරිදේව දුක්ඛ දෙමනස්ස උපායාසයෝ නූපදනාහු නම් ඔවුන් කෙරෙහි මට ඡන්ද රාගය නැතැ යි.

ගාමණි, දුටු දත් අකාලික වූ පැමිණි බැසගත් මේ දහමින් තෙපි අතීතානාගත දෙක්හි නය පමුණුවවූ. ඉකුත් කල යම් කිසි දුකක් උපදනේ උපදී ද, ඒ සියල්ල ආසාව මුල් කොට ඇත්තේ ය. ආසාව නිදන කොට ඇත්තේ ය. දුකට ආසාව ම මුල් ය. මතු කල යම් කිසි දුකක් උපදනේ උපදින්නේ ද ඒ සියල්ල ආසාව මුල් කොට ඇත්තේ ය. ආසාව නිදන කොට ඇත්තේ ය. දුකට ආසාව ම මුලැ යි. වහන්ස අසිරියෙකි. වහන්ස පුදුමයෙකි. වහන්ස ඉකුත් කල යම් කිසි දුකක් උපදනේ උපදී නම් ඒ සියල්ල ආසාව මුල් කොට ඇත්තේ ය. ආසාව නිදන කොට ඇත්තේ ය. දුකට ආසාව ම මුල් ය. මතු කල යම් කිසි දුකක් උපදනේ උපදින්නේ නම් ඒ සියල්ල ආසාව මුල් කොට ඇත්තේ ය. ආසාව නිදන කොට ඇත්තේ ය. දුකට ආසාව ම මුලැ යි. මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් කෙතරම් මැනැවින් වදරන ලද්දේ ද?

අත්ථි මෙ භන්තෙ චිරවාසී[1] නාම කුමාරො, බහි ආවසථෙ[2] පටිවසති, සො ඛ්වාහං භන්තෙ කාලස්සෙව වුට්ඨාය පුරිසං උය්‍යොජෙමි: "ගච්ඡ භණෙ චිරවාසිං කුමාරං ජානාහීති. යාවකීවඤ්ච භන්තෙ සො පුරිසො නාගච්ඡති තස්ස මෙ හොතෙව අඤ්ඤථත්තං; මා හෙව[3] චිරවාසිස්ස කුමාරස්ස කිඤ්චි ආබාධයිත්ථාති.[4] තං කිම්මඤ්ඤසි ගාමණි, චිරවාසිස්ස තෙ කුමාරස්ස වධෙන වා බන්ධෙන වා ජානියා වා ගරහාය වා උප්පජ්ජෙය්‍යුං සොකපරිදෙවදුක්ඛදොමනස්සු- පායාසාති. චිරවාසිස්ස මෙ භන්තෙ කුමාරස්ස වධෙන වා බන්ධෙන වා ජානියා වා ගරහාය වා ජීවිතස්සපි සියා අඤ්ඤථත්තං, කිම්පන මෙ නුප්පජ්ජිස්සන්ති සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසාති. ඉමිනාපි ඛො එතං ගාමණි පරියායෙන වෙදිතබ්බං "යං කිඤ්චි දුක්ඛං උප්පජ්ජමානං උප්පජ්ජති, සබ්බන්තං ඡන්දමූලකං ඡන්දනිදානං ඡන්දො හි මූලං දුක්ඛස්සා''ති.

තං කිම්මඤ්ඤසි ගාමණි යදා තෙ චිරවාසිස්ස මාතා අදිට්ඨා ආසි අස්සුතා, අහොසි චිරවාසිස්ස මාතුයා ඡන්දො වා රාගො වා පෙමං වාති. නො හෙතං භන්තෙ. දස්සනං වා තෙ ගාමණි ආගම්ම සවනං වා තෙ ගාමණි ආගම්ම එවන්තෙ අහොසි: චිරවාසිස්ස මාතුයා ඡන්දො වා රාගො වා පෙමං වාති. එවං භන්තෙ. තං කිම්මඤ්ඤසි ගාමණි. චිරවාසිස්ස මාතුයා තෙ වධෙන වා බන්ධෙන වා ජානියා වා ගරහාය වා උප්පජ්ජෙය්‍යුං සොකපරිදෙවදුක්ඛ දොමනස්සුපායාසාති. චිරවාසිස්ස මාතුයා මෙ භන්තෙ වධෙන වා බන්ධෙන වා ජානියා වා ගරහාය වා ජීවිතස්සපි සියා අඤ්ඤථත්තං, කිම්පන මෙ නුප්පජ්ජිස්සන්ති සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසාති. ඉමිනාපි ඛො එතං ගාමණි පරියායෙන වෙදිතබ්බං යං කිඤ්චි දුක්ඛං උප්පජ්ජමානං උප්පජ්ජති සබ්බන්තං ඡන්දමූලකං ඡන්දනිදානං, ඡන්දොහි මූලං දුක්ඛස්සාති.

## 8. 1. 12

## රාසියසුත්තං

426. අථ ඛො රාසියො ගාමණි යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො රාසියො ගාමණි භගවන්තං එතදවොච: සුතං මෙතං භන්තෙ සමණො ගොතමො සබ්බං තපං ගරහති, සබ්බං තපස්සිං ලූඛාජීවිං එකංසෙන උපවදති උපක්කොසතීති. යෙ තෙ භන්තෙ එවමාහංසු: සමණො ගොතමො සබ්බං තපං ගරහති, සබ්බං තපස්සිං ලූඛජීවිං එකංසෙන උපවදති උපක්කොසතීති. කච්චි තෙ භන්තෙ භගවතො වුත්තවාදිනො න ච භගවන්තං අභූතෙන අබ්භාචික්ඛන්ති, ධම්මස්ස චානුධම්මං ව්‍යාකරොන්ති, න ච කොචි සහධම්මිකො වාදනුපාතො ගාරය්හං ඨානං ආගච්ඡතීති.

---

1 චිරනිවාසී - සී 1, 2
2 ආවාසකෙ - අට්ඨකථා
3 හෙවං - ස්‍යා
4 ආබාධයෙථාති-ස්‍යා

වහන්ස මට චිරවාසී නම් කුමරෙක් ඇත. නුවරින් බැහැර වෙසෙ යි. වහන්ස, ඒ මම කලින් ම නැගිට "කොල යව, චිරවාසී කුමරු දනුව" යි පුරුෂයකු පිටත් කොට යවමි. වහන්ස, යම්තාක් ඒ පුරුෂ තෙමේ නො පැමිණේ ද (ඒ තාක්) චිරවාසී කුමරුට කිසි පීඩාවක් නො වේ වා යි ඒ මට අන් අයුරෙක් වේ මැ යි. ගාමණී ඒ කිමැ යි හඟිවු ද? චිරවාසි කුමරහුගේ නැසීමෙන් හෝ බැඳීමෙන් හෝ පිරිහීමෙන් හෝ ගැරහීමෙන් හෝ තොපට සෝක පරිදේව දුක්ඛ දෙමනස්ස උපායාසයෝ උපදනාහු දැ යි. වහන්ස චිරවාසි කුමරහුගේ නැසීමෙන් හෝ බැඳීමෙන් හෝ පිරිහීමෙන් හෝ ගැරහීමෙන් හෝ මාගේ දිවියෙහි ද අන් අයුරෙක් වන්නේ ය. කිමෙක් ද මට සොක පරිදෙව දුක්ඛ දෙමනස්ස උපායාසයෝ නූපදනාහු දැ යි. ගාමණී, යම්කිසි දුකක් උපදනේ උපදී නම් ඒ සියල්ල ආසාව මුල්කොට ඇත්තේ ය. ආසාව නිදන කොට ඇත්තේ ය. දුකට ආසාව ම මුලැ යි මෙය මේ නයෙනුදු දතයුත්තේ ය.

ගාමණී, ඒ කිමැ යි හඟිවු ද? යම් කලෙක තා විසින් චිරවාසිගේ මව නො දක්නා ලද්දී වූවා ද නො අසන ලද්දී වූවා ද (එකල්හි) චිරවාසිගේ මව කෙරෙහි ඡන්දයෙක් හෝ රාගයෙක් හෝ ප්‍රෙමයෙක් හෝ වී දැ යි. වහන්ස මෙය නො වේ ම ය. ගාමණී තාගේ දැකීමට පැමිණ හෝ තාගේ ඇසීමට පැමිණ හෝ මෙසේ තොපට චිරවාසි මව කෙරෙහි ඡන්දයෙක් හෝ රාගයෙක් හෝ ප්‍රෙමයෙක් හෝ වී දැ යි. වහන්ස එසේ ය. ගාමණී ඒ කිමැ යි හඟිහි ද, චිරවාසිමවගේ නැසීමෙන් හෝ බැඳීමෙන් හෝ පිරිහීමෙන් හෝ ගැරහීමෙන් හෝ තොපට සෝක පරිදේව දුක්ඛ දෙමනස්ස උපායාසයෝ උපදනාහු දැ යි. වහන්ස චිරවාසිමවගේ නැසීමෙන් හෝ බැඳීමෙන් හෝ පිරිහීමෙන් හෝ ගැරහීමෙන් හෝ මාගේ දිවියෙහි ද අන් අයුරෙක් වන්නේ ය. කිමෙක් ද මට සෝක පරිදේව දුක්ඛ දෙමනස්ස උපායාසයෝ නූපදින්නාහු දැ යි. ගාමණී යම් කිසි දුකෙක් උපදනේ උපදී නම් ඒ සියල්ල ආසාව මුල් කොට ඇත්තේ ය. ආසාව නිදන කොට ඇත්තේය. දුකට ආසාව ම මුලැ යි. මෙය මේ නයෙනුදු දත යුත්තේ යි.

## 8. 1. 12

## රාසිය සූත්‍රය

426. එකල්හි රාසියගාමණී තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් රාසිය ගාමණී තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය, වහන්ස, ශ්‍රමණ ගෞතම සියලු තපස ගරහයි. රූක්ෂජීවිකා ඇති සියලු තපසුන්ට ඒකාන්තයෙන් දෙස් කියයි. අපහාස කෙරේ'' යි මවිසින් මෙය අසන ලදී. වහන්ස "ශ්‍රමණ ගෞතම සියලු තපස ගරහයි. රළු දිවි ඇති සියලු තපසුන්ට එකැතින් දෙස් කියයි, අපහාස කෙරේ''යි යම් ඒ කෙනෙක් මෙසේ කීහු නම්, වහන්ස කිම ඔහු භාග්‍යවතුන් වහන්සේ විසින් කියන ලද්දක් කියනසුලු ද? භාග්‍යවතුන් වහන්සේට අභූතයෙන් චෝදනා නො කෙරෙද් ද? දහමට අනුකූල දහමක් ප්‍රකාශ කෙරෙද් ද? කිසියම් කරුණු සහිත වාදනුපාතයෙක් ගැරහිය යුතු බවට නො ම පැමිණේද යි.

යෙ තෙ ගාමණි එවමාහංසු: සමණො ගොතමො සබ්බං තපං ගරහති, සබ්බං තපස්සිං ලූඛජීවිං එකංසෙන උපවදති, උපක්කොසතීති, න මෙ තෙ වුත්තවාදිනො, අබ්භාචික්ඛන්ති ච පන මං තෙ අසතා අභූතෙන[1]. ද්වෙ මෙ ගාමණි අන්තා පබ්බජිතෙන න සෙවිතබ්බා: යො චායං කාමෙසු කාමසුඛල්ලිකානුයොගො හීනො ගම්මො පොථුජ්ජනිකො අනරියො අනත්ථසංහිතො. යො චායං අත්තකිලමථානුයොගො දුක්ඛො අනරියො අනත්ථසංහිතො, එතෙ තෙ ගාමණි උභො අන්තෙ අනුපගම්ම මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති. කතමා ච සා ගාමණි මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති, අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො, සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. අයං ඛො සා ගාමණි මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති.

තයො ඛො මෙ ගාමණි කාමභොගිනො සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ තයො, ඉධ ගාමණි එකච්චො කාමභොගී අධම්මෙන භොගෙ පරියෙසති සාහසෙන අධම්මෙන භොගෙ පරියෙසිත්වා සාහසෙන න අත්තානං සුඛෙති පීණෙති න සංවිභජති[2] න පුඤ්ඤානි කරොති, ඉධ පන ගාමණි, එකච්චො කාමභොගී අධම්මෙන භොගෙ පරියෙසති සාහසෙන, අධම්මෙන භොගෙ පරියෙසිත්වා සාහසෙන අත්තානං සුඛෙති පීණෙති න සංවිභජති න පුඤ්ඤානි කරොති. ඉධ පන ගාමණි එකච්චො කාමභොගී අධම්මෙන භොගෙ පරියෙසති සාහසෙන, අධම්මෙන භොගෙ පරියෙසිත්වා සාහසෙන අත්තානං සුඛෙති පීණෙති සංවිභජති පුඤ්ඤානි ච කරොති.

ඉධ පන ගාමණි එකච්චො කාමභොගී ධම්මාධම්මෙන භොගෙ පරියෙසති සාහසෙනපි අසාහසෙනපි. ධම්මාධම්මෙන භොගෙ පරියෙසිත්වා සාහසෙනපි අසාහසෙනපි න අත්තානං සුඛෙති පීණෙති, න සංවිභජති, න පුඤ්ඤානි කරොති. ඉධ පන ගාමණි එකච්චො කාමභොගී ධම්මාධම්මෙන භොගෙ පරියෙසති සාහසෙනපි අසාහසෙනපි. ධම්මාධම්මෙන භොගෙ පරියෙසිත්වා සාහසෙනපි අසාහසෙනපි අත්තානං සුඛෙති පීණෙති න සංවිභජති න පුඤ්ඤානි කරොති. ඉධ පන ගාමණි එකච්චො කාමභොගී ධම්මාධම්මෙන භොගෙ පරියෙසති සාහසෙනපි අසාහසෙනපි, ධම්මාධම්මෙන භොගෙ පරියෙසිත්වා සාහසෙනපි අසාහසෙනපි අත්තානං සුඛෙති පීණෙති සංවිභජති පුඤ්ඤානි ච කරොති.

---

1. අසතා තුච්ඡා අභූතෙන - මජ්සං
2. සංවිභජ්ජති - සී 1, 2

ගාමණි, ශ්‍රමණ ගෞතම සියලු තපස ගරහයි. රළු දිවි ඇති තපසුන්ට එකාන්තයෙන් දෙස් කියයි අපහාස කෙරේ යි යම් කෙනෙක් මෙසේ කීහු නම් ඔහු මවිසින් කියන ලද්දක් කියනසුලු නො වෙති. ඔහු අසත්‍යයෙන් අභූතයෙන් මට චෝදනා ද කෙරෙති, ගාමණි පැවිද්දහු විසින් නො සෙවියයුතු මේ අන්ත දෙකෙකි: ලාමක වූ ගැමි දහමක් වූ පුහුදුන්හට අයත් අනාර්ය වූ අනර්ථයෙන් යුක්ත වූ කාමයන්හි යම් මේ කම්සුවය අනු ව යෙදීමෙකුත් වේ ද, දුක් වූ අනාර්ය වූ අනර්ථයෙන් යුක්ත වූ යම් මේ සිරුරට දුක් දීමෙහි යෙදීමෙකුත් වේ ද (යන මේ දෙකයි). ගාමණි තථාගතයන් විසින් ඒ මේ අන්ත දෙකට නො පැමිණ වෙසෙසින් අවබොධ කරන ලද මැදුම් පිළිවෙත ඇස ඇති කරන්නේ ය. නැණ ඇතිකරන්නේ ය වෙසෙස් දැනුම පිණිස සිවුසස් දැනුම පිණිස නිවන් පිණිස පවතී. තථාගතයන් විසින් අවබොධ කරන ලද ඇස ඇති කරන නැණ ඇති කරන ඒ කවර නම් මැදුම් පිළිවෙතෙක් කෙලෙස් සන්සිඳීම පිණිස වෙසෙස් දැනුම පිණිස සිවුසස් දැනුම පිණිස නිවන් පිණිස පවතී ද, මේ අරිඅටඟිමඟ මැ යි, එනම්: සම්මාදිට්ඨි ... සම්මාසමාධි යි. ගාමණි තථාගතයන් විසින් අවබෝධ කරන ලද ඒ මේ මැදුම් පිළිවෙත ඇස ඇති කරන්නේ ය. නැණ ඇති කරන්නේ ය. සන්හිඳීම පිණිස වෙසෙස් දැනුම පිණිස සිවුසස් දැනුම පිණිස නිවන් පිණිස පවතී.

ගාමණි මේ කාමභෝගිහු තිදෙනෙක් ලොව ඇතියහ. විද්‍යමානයහ. කවර තිදෙනෙක් ද යත්: ගාමණි මෙහි ඇතැම් කාමභෝගියෙක් නො දැහැමින් සැහැසිකමින් භෝග සොය යි. නො දැහැමින් සැහැසිකමින් භොග සොයා තමා සුවපත් නො කෙරෙ යි. නො පිණවයි. අනුන්ට නො බෙදයි. පින් නො කෙරෙයි. ගාමණි මෙහි ඇතැම් කම් සුව විඳින්නෙක් නො දැහැමින් සැහැසිකමින් භොග සොයයි. නො දැහැමින් සැහැසිකමින් භොග සොයා තමා සුවපත් කෙරෙයි. පිණවයි. අනුන්ට නො බෙදයි. පින් නො කෙරෙයි. ගාමණි මෙහි ඇතැම් කම් සුව විඳින්නෙක් නොදැහැමින් සැහැසිකමින් භොග සොයයි. නො දැහැමින් සැහැසිකමින් භොග සොයා තමා සුවපත් කෙරෙයි. පිණවයි. අනුන්ට බෙදයි. පින් ද කෙරෙයි.

ගාමණි මෙහි ඇතැම් කම්සැප විඳින්නෙක් දැහැමින් හා නො දැහැමින් ද සැහැසිකමින් හා නො සැහැසිකමින් ද භෝග සොය යි. දැහැමිනුත් නො දැහැමිනුත් සැහැසිකමිනුත් නො සැහැසිකමිනුත් භෝග සොයා තමා සුවපත් නො කෙරෙයි. නො පිණවයි. නො බෙදයි. පින් නො කරයි. ගාමණි මෙහි ඇතැම් කම්සුව විඳින්නෙක් දැහැමිනුත් නො දැහැමිනුත් සැහැසිකමිනුත් නො සැහැසිකමිනුත් භොග සොයයි. දැහැමිනුත් නො දැහැමිනුත් සැහැසිකමිනුත් නො සැහැසිකමිනුත් භොග සොයා තමා සැපවත් කෙරෙයි. පිණවයි. නො බෙදයි. පින් නො කෙරෙයි. ගාමණි මෙහි ඇතැම් කම්සුව විඳින්නෙක් දැහැමිනුත් නො දැහැමිනුත් සැහැසිකමිනුත් නො සැහැසිකමිනුත් භෝග සොයයි. දැහැමිනුත් නො දැහැමිනුත් සැහැසිකමිනුත් නො සැහැසිකමිනුත් භෝග සොයා තමා සැපවත් කෙරෙයි. පිණවයි. බෙදයි. පින් ද කෙරෙයි.

ඉධ පන ගාමණි එකච්චො කාමභොගී ධම්මේන භොගෙ පරියෙසති අසාහසෙන, ධම්මේන භොගෙ පරියෙසිත්වා අසාහසෙන න අත්තානං සුඛෙති පීණෙති න සංවිභජති න පුඤ්ඤානි කරොති. ඉධ පන ගාමණි, එකච්චො කාමභොගී ධම්මේන භොගෙ පරියෙසති අසාහසෙන. ධම්මේන භොගෙ පරියෙසිත්වා අසාහසෙන අත්තානං සුඛෙති පීණෙති න සංවිභජති න පුඤ්ඤානි කරොති. ඉධ පන ගාමණි එකච්චො කාමභොගී ධම්මේන භොගෙ පරියෙසති අසාහසෙන. ධම්මේන භොගෙ පරියෙසිත්වා අසාහසෙන අත්තානං සුඛෙති පීණෙති සංවිභජති පුඤ්ඤානි ච කරොති. තෙ ච භොගෙ ගථිතො[1] මුච්ඡිතො අජ්ඣාපන්නො අනාදීනවදස්සාවී අනිස්සරණපඤ්ඤෝ පරිභුඤ්ජති. ඉධ පන ගාමණි එකච්චො කාමභොගී ධම්මේන භොගෙ පරියෙසති අසාහසෙන, ධම්මේන භොගෙ පරියෙසිත්වා අසාහසෙන අත්තානං සුඛෙති පීණෙති සංවිභජති පුඤ්ඤානි ච කරොති. තෙ ච භොගෙ අගථිතො අමුච්ඡිතො අනජ්ඣාපන්නො ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤෝ පරිභුඤ්ජති.

තත්‍ර ගාමණි ය්වායං කාමභොගී අධම්මේන භොගෙ පරියෙසති සාහසෙන, අධම්මේන භොගෙ පරියෙසිත්වා සාහසෙන න අත්තානං සුඛෙති පීණෙති න සංවිභජති න පුඤ්ඤානි කරොති, අයං ගාමණි කාමභොගී තීහි ඨානෙහි ගාරය්හො. කතමෙහි තීහි ඨානෙහි ගාරය්හො. අධම්මේන භොගෙ පරියෙසති සාහසෙනාති ඉමිනා පඨමෙන ඨානෙන ගාරය්හො, න අත්තානං සුඛෙති පීණෙතීති ඉමිනා දුතියෙන ඨානෙන ගාරය්හො, න සංවිභජති න පුඤ්ඤානි කරොතීති ඉමිනා තතියෙන ඨානෙන ගාරය්හො. අයං ගාමණි කාමභොගී ඉමෙහි තීහි ඨානෙහි ගාරය්හො.

තත්‍ර ගාමණි ය්වායං කාමභොගී අධම්මේන භොගෙ පරියෙසති සාහසෙන, අධම්මේන භොගෙ පරියෙසිත්වා සාහසෙන අත්තානං සුඛෙති පීණෙති න සංවිභජති න පුඤ්ඤානි කරොති. අයං ගාමණි කාමභොගී ද්වීහි ඨානෙහි ගාරය්හො, එකෙන ඨානෙන පාසංසො. කතමෙහි ද්වීහි ඨානෙහි ගාරය්හො? අධම්මේන භොගෙ පරියෙසති සාහසෙනාති ඉමිනා පඨමෙන ඨානෙන ගාරය්හො, න සංවිභජති න පුඤ්ඤානි කරොතීති ඉමිනා දුතියෙන ඨානෙන ගාරය්හො. කතමෙන එකෙන ඨානෙන පාසංසො; අත්තානං සුඛෙති පීණෙතීති ඉමිනා එකෙන ඨානෙන පාසංසො. අයං ගාමණි කාමභොගී ඉමෙහි ද්වීහි ඨානෙහි ගාරය්හො, ඉමිනා එකෙන ඨානෙන පාසංසො.

1. ගධිතො - මජ්ඣං, සයා.

ගාමණි මෙහි ඇතැම් කම්සැප විඳින්නෙක් දැහැමිනුත් නො සැහැසිකමිනුත් භෝග සොයයි. දැහැමින් නො සැහැසිකමින් භෝග සොයා තමා සැපවත් නො කෙරෙයි. නො පිණවයි. නො බෙදයි. පින් නො කෙරෙයි. ගාමණි මෙහි ඇතැම් කම්සැප විඳින්නෙක් දැහැමින් නො සැහැසිකමින් භොග සොයයි. දැහැමින් නො සැහැසිකමින් භොග සොයා තමා සැපවත් කෙරෙයි, පිණවයි. නො බෙදයි. පින් නො කෙරෙයි. ගාමිණි මෙහි ඇතැම් කම්සැප විඳින්නෙක් දැහැමින් නො සැහැසිකමින් භොග සොයයි. දැහැමින් නො සැහැසිකමින් භොග සොයා තමා සැපවත් කෙරෙයි. පිණවයි. බෙදයි. පින් ද කෙරෙයි. ඒ භොග ද ඇලුනෝ මුසපත් වූයේ ගැලුනේ දෙස් නො දක්නාසුලු ව නික්ම යෑමේ නුවණ නැති ව වළඳයි. ගාමණි, මෙහි ඇතැම් කම්සැප විඳින්නෙක් දැහැමින් නො සැහැසිකමින් භොග සායයි. දැහැමින් නො සැහැසිකමින් භොග සොයා තමා සැපවත් කෙරෙයි. පිණවයි. බෙදයි. පින් ද කෙරෙයි. ඒ භොග ද නො ඇලී නො මුසපත් ව නො ගැලී දෙස් දක්නාසුලු ව නික්ම යෑමේ නුවණ ඇති ව වළඳයි.

ගාමණි එහි යම් කම්සැප විඳින්නෙක් නොදැහැමින් සැහැයිකමන් භොග සොයා ද නො දැහැමින් සැහැසිකමින් භොග සොයා තමා සැපවත් කෙරේ ද පිණවා ද නො බෙද ද පින් නො කෙරේ ද, ගාමණි මේ කම්සැප විඳින්නා කරුණු තුනකින් ගැරහියයුතු ය. කවර කරුණු තුනකින් ද යත්: නො දැහැමින් සැහැසිකමින් භොග සොයායි මේ පළමුවැනි කරුණින් ගැරහිය යුතු ය. තමා සුවපත් නො කෙරෙයි, නො පිණවා යි මේ දෙවෙනි කරුණෙන් ද ගැරහියයුතු ය. නො බෙද යි. පින් නො කෙරේ යි මේ තෙවෙනි කරුණෙන් ද ගැරහිය යුතු ය. ගාමණි මේ කාමභොගි තෙමේ මේ තෙකරුණෙන් ගැරහිය යුතු වේ.

ගාමණි එහි යම් මේ කාමභොගියෙක් නො දැහැමින් සැහැසිකමින් භොග සොයයි. නො දැහැමින් සැහැසිකමින් භෝග සොයා තමා සුවපත් කෙරේ ද පිණවා ද නො බෙද ද පින් නො කෙරේ ද, ගාමණි මේ කාමභෝගි තෙමේ දෙකරුණෙකින් ගැරහියයුතු වේ. එක් කරුණෙකින් පැසසියයුතු වේ. කවර දෙකරුණෙකින් ගැරහිය යුතු වේ ද යත්: නො දැහැමින් සැහැසිකමින් භෝග සොයා යි මේ පළමුවැනි කරුණින් ගැරහියයුතු වේ. නො බෙදයි. පින් නො කෙරේ යි මේ දෙවෙනි කරුණින් ගැරහියයුතු වේ. කවර එක් කරුණෙකින් පැසසියයුතු වේ ද යත්: තමා සැපවත් කෙරෙයි. පිණවා යි මේ එක්කරුණෙන් පැසසියයුතු වේ. ගාමණි මේ කාමභෝගි තෙමේ මේ දෙකරුණෙන් ගැරහියයුතු වේ. මේ එක්කරුණෙන් පැසසියයුතු වේ.

තත්‍ර ගාමණි යඩායං[1] කාමභොගී අධම්මෙන භොගෙ පරියෙසති සාහසෙන, අධම්මෙන භොගෙ පරියෙසිත්වා සාහසෙන අත්තානං සුඛෙති පීණෙති සංවිභජති පුඤ්ඤානි කරොති. අයං ගාමණි කාමභොගී එකෙන ඨානෙන ගාරය්හො, ද්වීහි ඨානෙහි පාසංසො. කතමෙන එකෙන ඨානෙන ගාරය්හො: අධම්මෙන භොගෙ පරියෙසති සාහසෙනාති ඉමිනා එකෙන ඨානෙන ගාරය්හො. කතමෙහි ද්වීහි ඨානෙහි පාසංසො: අත්තානං සුඛෙති පීණෙතීති ඉමිනා පඨමෙන ඨානෙන පාසංසො. සංවිභජති පුඤ්ඤානි කරොතීති ඉමිනා දුතියෙන ඨානෙන පාසංසො. අයං ගාමණි කාමභොගී ඉමිනා එකෙන ඨානෙන ගාරය්හො. ඉමෙහි ද්වීහි ඨානෙහි පාසංසො.

තත්‍ර ගාමණි යඩායං කාමභොගී ධම්මාධම්මෙන භොගෙ පරියෙසති සාහසෙනපි අසාහසෙනපි. ධම්මාධම්මෙන භොගෙ පරියෙසිත්වා සාහසෙනපි අසාහසෙනපි න අත්තානං සුඛෙති පීණෙති න සංවිභජති න පුඤ්ඤානි කරොති, අයං ගාමණි කාමභොගී එකෙන ඨානෙන පාසංසො, තීහි ඨානෙහි ගාරය්හො. කතමෙන එකෙන ඨානෙන පාසංසො: ධම්මෙන භොගෙ පරියෙසති අසාහසෙනාති ඉමිනා එකෙන ඨානෙන පාසංසො. කතමෙහි තීහි ඨානෙහි ගාරය්හො: අධම්මෙන භොගෙ පරියෙසති සාහසෙනාති ඉමිනා පඨමෙන ඨානෙන ගාරය්හො, න අත්තානං සුඛෙති පීණෙතීති ඉමිනා දුතියෙන ඨානෙන ගාරය්හො, න සංවිභජති න පුඤ්ඤානි කරොතීති ඉමිනා තතියෙන ඨානෙන ගාරය්හො. අයං ගාමණි කාමභොගී ඉමිනා එකෙන ඨානෙන පාසංසො, ඉමෙහි තීහි ඨානෙහි ගාරය්හො.

තත්‍ර ගාමණි යඩායං කාමභොගී ධම්මාධම්මෙන භොගෙ පරියෙසති සාහසෙනපි අසාහසෙනපි. ධම්මාධම්මෙන භොගෙ පරියෙසිත්වා සාහසෙනපි අසාහසෙනපි අත්තානං සුඛෙති පීණෙති, න සංවිභජති න පුඤ්ඤානි කරොති. අයං ගාමණි කාමභොගී ද්වීහි ඨානෙහි පාසංසො, ද්වීහි ඨානෙහි ගාරය්හො. කතමෙහි ද්වීහි ඨානෙහි පාසංසො: ධම්මෙන භොගෙ පරියෙසති අසාහසෙනාති ඉමිනා පඨමෙන ඨානෙන පාසංසො, අත්තානං සුඛෙති පීණෙතීති ඉමිනා දුතියෙන ඨානෙන පාසංසො, කතමෙහි ද්වීහි ඨානෙහි ගාරය්හො: අධම්මෙන භොගෙ පරියෙසති සාහසෙනාති ඉමිනා පඨමෙන ඨානෙන ගාරය්හො, න සංවිභජති න පුඤ්ඤානි කරොතීති ඉමිනා දුතියෙන ඨානෙන ගාරය්හො. අයං ගාමණි කාමභොගී ඉමෙහි ද්වීහි ඨානෙහි පාසංසො, ඉමෙහි ද්වීහි ඨානෙහි ගාරය්හො.

---

1. යොයං - සී 1.

ගාමණී එහි යම් කාමභෝගියෙක් නො දැහැමින් සැහැසිකමින් භෝග සොයා ද නොදැහැමින් සැහැසිකමින් භෝග සොයා තමා සැපවත් කෙරේද පිණවා ද, බෙදා ද, පින් කෙරේ ද, ගාමණී මේ කාමභෝගී තෙමේ එක්කරුණකින් ගැරහිය යුතු වේ. දෙකරුණෙකින් පැසසිය යුතු වේ. කවර එක්කරුණෙකින් ගැරහිය යුතු වේ ද යත්: නො දැහැමින් සැහැසිකමින් භෝග සොයා යි මේ එක්කරුණින් ගැරහිය යුතු වේ. කවර දෙකරුණකින් පැසසිය යුතු වේ ද යත්; තමා සැපවත් කෙරේ, පිණවා යි මේ පළමුවන කරුණින් පැසසිය යුතු වේ. බෙදයි, පින් කෙරේ යි මේ දෙවන කරුණෙන් පැසසිය යුතු වේ. ගාමණී මේ කාමභෝගී තෙමේ මේ එක්කරුණින් ගැරහිය යුතු වේ. මේ දෙකරුණින් පැසසිය යුතු වේ.

ගාමණී එහි යම් කාමභෝගියෙක් දැහැමිනුත් නො දැහැමිනුත් සැහැසිකමිනුත් නො සැහැසිකමිනුත් භෝග සොයා ද දැහැමිනුත් නො දැහැමිනුත් සැහැසිකමිනුත් නො සැහැසිකමිනුත් භෝග සොයා තමා සැපවත් නො කෙරේ ද නො පිණවා ද නො බෙදා ද පින් නො කෙරේ ද, ගාමණී මේ කාමභෝගී තෙමේ එක්කරුණෙකින් පැසසිය යුතු වේ. තෙකරුණෙකින් ගැරහිය යුතු වේ. කවර එක්කරුණෙකින් පැසසිය යුතු වේ ද යත්: දැහැමින් නො සැහැසිකමින් භෝග සොයා යි මේ එක්කරුණෙන් පැසසියයුතු වේ. කවර තෙකරුණෙන් ගැරහිය යුතු වේ ද යත්: නො දැහැමින් සැහැසිකමින් භෝග සොයා යි මේ පළමුවන කරුණින් ගැරහිය යුතු වේ. තමා සැපවත් නො කෙරෙයි නො පිණවා යි මේ දෙවන කරුණෙන් ගැරහිය යුතු වේ. නො බෙදයි, පින් නො කෙරේ යි මේ තෙවන කරුණෙන් ගැරහිය යුතු වේ. ගාමණී මේ කාමභෝගී තෙමේ මේ එක්කරුණෙන් පැසසිය යුතු වේ. මේ තෙකරුණෙන් ගැරහිය යුතුවේ.

ගාමණී එහි යම් කාමභෝගියෙක් දැහැමිනුත් නො දැහැමිනුත් සැහැසිකමිනුත් නො සැහැසිකමිනුත් භෝග සොයා ද, දැහැමිනුත් නො දැහැමිනුත් සැහැසිකමිනුත් නො සැහැසිකමිනුත් භෝග සොයා තමා සැපවත් කෙරේ ද පිණවා ද, නො බෙදා ද පින් නො කෙරේ ද, ගාමණී මේ කාමභොගී තෙමේ දෙකරුණකින් පැසසිය යුතු වේ. දෙකරුණ-කින් ගැරහිය යුතු වේ. කවර දෙකරුණෙකින් පැසසිය යුතු වේ ද යත්; දැහැමින් නො සැහැසිකමින් භෝග සොයා යි මේ පළමුවන කරුණෙන් පැසසිය යුතු වේ. තමා සැපවත් කෙරෙයි පිණවා යි මේ දෙවන කරුණෙන් පැසසිය යුතු වේ. කවර දෙකරුණෙකින් ගැරහිය යුතු වේ ද යත්; නො දැහැමින් සැහැසිකමින් භෝග සොයා යී මේ පළමුවන කරුණින් ගැරහිය යුතු වේ. නො බෙදයි පින් නො කෙරේ යි මේ දෙවන කරුණෙන් ගැරහිය යුතු වේ. ගාමණී මේ කාමභෝගී තෙමේ මේ දෙකරුණෙන් පැසසියයුතු වේ. මේ දෙකරුණෙන් ගැරහියයුතු වේ.

තත්‍ර ගාමණි ය්වායං කාමභොගී ධම්මාධම්මෙන භොගෙ පරියෙසති සාහසෙනපි අසාහසෙනපි, ධම්මාධම්මෙන භොගෙ පරියෙසිත්වා සාහසෙනපි අසාහසෙනපි අත්තානං සුඛෙති පීණෙති සංවිභජති පුඤ්ඤානි කරොති. අයං ගාමණි කාමභොගී තීහි ඨානෙහි පාසංසො, එකෙන ඨානෙන ගාරය්හො. කතමෙහි තීහි ඨානෙහි පාසංසො: ධම්මෙන භොගෙ පරියෙසති අසාහසෙනාති ඉමිනා පඨමෙන ඨානෙන පාසංසො, අත්තානං සුඛෙති පීණෙතීති ඉමිනා දුතියෙන ඨානෙන පාසංසො, සංවිභජති පුඤ්ඤානි කරොතීති ඉමිනා තතියෙන ඨානෙන පාසංසො. කතමෙන එකෙන ඨානෙන ගාරය්හො: අධම්මෙන භොගෙ පරියෙසති සාහසෙනාති ඉමිනා එකෙන ඨානෙන ගාරය්හො. අයං ගාමණි කාමභොගී ඉමෙහි තීහි ඨානෙහි පාසංසො, ඉමිනා එකෙන ඨානෙන ගාරය්හො.

තත්‍ර ගාමණි ය්වායං කාමභොගී ධම්මෙන භොගෙ පරියෙසති අසාහසෙන, ධම්මෙන භොගෙ පරියෙසිත්වා අසාහසෙන න අත්තානං සුඛෙති පීණෙති න සංවිභජති න පුඤ්ඤානි කරොති. අයං ගාමණි කාමභොගී එකෙන ඨානෙන පාසංසො, ද්වීහි ඨානෙහි ගාරය්හො. කතමෙන එකෙන ඨානෙන පාසංසො: ධම්මෙන භොගෙ පරියෙසති අසාහසෙනාති ඉමිනා එකෙන ඨානෙන පාසංසො. කතමෙහි ද්වීහි ඨානෙහි ගාරය්හො: න අත්තානං සුඛෙති පීණෙතීති ඉමිනා පඨමෙන ඨානෙන ගාරය්හො, න සංවිභජති න පුඤ්ඤානි කරොතීති ඉමිනා දුතියෙන ඨානෙන ගාරය්හො. අයං ගාමණි කාමභොගී ඉමිනා එකෙන ඨානෙන පාසංසො, ඉමෙහි ද්වීහි ඨානෙහි ගාරය්හො.

තත්‍ර ගාමණි ය්වායං කාමභොගී ධම්මෙන භොගෙ පරියෙසති අසාහසෙන, ධම්මෙන භොගෙ පරියෙසිත්වා අසාහසෙන අත්තානං සුඛෙති පීණෙති, න සංවිභජති, න පුඤ්ඤානි කරොති, අයං ගාමණි කාමභොගී ද්වීහි ඨානෙහි පාසංසො, එකෙන ඨානෙන ගාරය්හො. කතමෙහි ද්වීහි ඨානෙහි පාසංසො: ධම්මෙන භොගෙ පරියෙසති අසාහසෙනාති ඉමිනා පඨමෙන ඨානෙන පාසංසො, අත්තානං සුඛෙති පීණෙතීති ඉමිනා දුතියෙන ඨානෙන පාසංසො. කතමෙන එකෙන ඨානෙන ගාරය්හො: න සංවිභජති න පුඤ්ඤානි කරොතීති ඉමිනා එකෙන ඨානෙන ගාරය්හො. අයං ගාමණි කාමභොගී ඉමෙහි ද්වීහි ඨානෙහි පාසංසො, ඉමිනා එකෙන ඨානෙන ගාරය්හො.

ගාමණි එහි යම් කාමභෝගියෙක් දැහැමිනුත් නො දැහැමිනුත් සැහැසිකමිනුත් නො සැහැසිකමිනුත් භෝග සොයා ද, දැහැමිනුත් නො දැහැමිනුත් සැහැසිකමිනුත් නො සැහැසිකමිනුත් භෝග සොයා තමා සැපවත් කෙරේ ද පිණවා ද බෙදා ද පින් කෙරේ ද, ගාමණි මේ කාමභෝගි තෙමේ තෙකරුණකින් පැසසිය යුතු වේ. එක් කරුණකින් ගැරහිය යුතු වේ. කවර තෙකරුණකින් පැසසිය යුතු වේ ද යත්: දැහැමින් නො සැහැසිකමින් භොග සොයා යි මේ පළමුවන කරුණෙන් පැසසිය යුතු වේ. තමා සැපවත් කෙරේ පිණවා යි මේ දෙවන කරුණෙන් පැසසිය යුතු වේ. බෙදයි පින් කෙරේ යි මේ තෙවන කරුණෙන් පැසසිය යුතු වේ. කවර එක් කරුණකින් ගැරහිය යුතු වේ ද යත්: නො දැහැමින් සැහැසිකමින් භොග සොයා යි මේ එක් කරුණින් ගැරහියයුතු වේ. ගාමණි මේ කාම භොගි තෙමේ මේ තෙකරුණින් පැසසියයුතු වේ. මේ එක් කරුණින් ගැරහිය යුතු වේ.

ගාමණි එහි යම් කාමභෝගියෙක් දැහැමින් නො සැහැසිකමින් භොග සොයා ද, දැහැමින් නො සැහැසිකමින් භෝග සොයා තමා සැපවත් නො කෙරේ ද, නො පිණවා ද, නො බෙදා ද, පින් නො කෙරේ ද, ගාමණි මේ කාමභෝගි තෙමේ එක් කරුණකින් පැසසිය යුතු වේ. දෙ කරුණකින් ගැරහිය යුතු වේ. කවර එක් කරුණ-කින් පැසසිය යුතු වේ ද යත්: දැහැමින් නො සැහැසිකමින් භෝග සොයා යි මේ එක් කරුණින් පැසසිය යුතු වේ. කවර දෙකරුණින් ගැරහිය යුතු වේ ද යත්: තමා සැපවත් නො කෙරෙයි නො පිණවා යි මේ පළමුවන කරුණින් ගැරහිය යුතු වේ. නො බෙදයි පින් නො කෙරේ යි මේ දෙවන කරුණින් ගැරහියයුතු වේ. ගාමණි මේ කාමභෝගි තෙමේ මේ එක් කරුණින් පැසසිය යුතු වේ. මේ දෙකරුණින් ගැරහිය යුතු වේ.

ගාමණි එහි යම් කාමභෝගියෙක් දැහැමින් නො සැහැසිකමින් භෝග සොයා ද, දැහැමින් නො සැහැසිකමින් භෝග සොයා තමා සැපවත් කෙරේ ද, පිණවා ද, නො බෙදා ද, පින් නො කෙරේ ද, ගාමණි මේ කාමභොගි තෙමේ දෙකරුණකින් පැසසිය යුතු වේ. එක් කරුණකින් ගැරහිය යුතු වේ. කවර දෙකරුණකින් පැසසිය යුතු වේ ද යත්: දැහැමින් නො සැහැසිකමින් භෝග සොයා යි මේ පළමුවන කරුණින් පැසසිය යුතු වේ. තමා සැපවත් කෙරෙයි පිණවා යි මේ දෙවන කරුණින් පැසසියයුතු වේ. කවර එක් කරුණකින් ගැරහියයුතු වේ ද යත්: නො බෙදයි. පින් නො කෙරේ යි මේ එක් කරුණින් ගැරහියයුතු වේ. ගාමණි මේ කාමභෝගි තෙමේ මේ දෙකරුණින් පැසසියයුතු වේ. මේ එක් කරුණින් ගැරහියයුතු වේ.

තත්‍ර ගාමණි ය්වායං කාමභොගී ධම්මේන භොගෙ පරියෙසති අසාහසෙන, ධම්මේන භොගෙ පරියෙසිත්වා අසාහසෙන අත්තානං සුඛෙති පීණෙති සංවිභජති පුඤ්ඤානි කරොති. තෙ ච භොගෙ ගථිතො මුච්ඡිතො අජ්ඣාපන්නො අනාදීනවදස්සාවී අනිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති, අයං ගාමණි කාමභොගී තීහි ඨානෙහි පාසංසො, එකෙන ඨානෙන ගාරය්හො. කතමෙහි තීහි ඨානෙහි පාසංසො: ධම්මේන භොගෙ පරියෙසති අසාහසෙනාති ඉමිනා පඨමෙන ඨානෙන පාසංසො. අත්තානං සුඛෙති පීණෙතීති ඉමිනා දුතියෙන ඨානෙන පාසංසො, සංවිභජති පුඤ්ඤානි කරොතීති ඉමිනා තතියෙන ඨානෙන පාසංසො, කතමෙන එකෙන ඨානෙන ගාරය්හො: තෙ ච භොගෙ ගථිතො මුච්ඡිතො අජ්ඣාපන්නො අනාදීනවදස්සාවී අනිස්සරණපඤ්ඤො පරිභුඤ්ජතීති ඉමිනා එකෙන ඨානෙන ගාරය්හො. අයං ගාමණි කාමභොගී ඉමෙහි තීහි ඨානෙහි පාසංසො, ඉමිනා එකෙන ඨානෙන ගාරය්හො.

තත්‍ර ගාමණි ය්වායං කාමභොගී ධම්මේන භොගෙ පරියෙසති අසාහසෙන, ධම්මේන භොගෙ පරියෙසිත්වා අසාහසෙන අත්තානං සුඛෙති පීණෙති සංවිභජති පුඤ්ඤානි කරොති, තෙ ච භොගෙ අගථිතො අමුච්ඡිතො අනජ්ඣාපන්නො ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති, අයං ගාමණි කාමභොගී චතූහි ඨානෙහි පාසංසො. කතමෙහි චතූහි ඨානෙහි පාසංසො: ධම්මේන භොගෙ පරියෙසති අසාහසෙනාති ඉමිනා පඨමෙන ඨානෙන පාසංසො, අත්තානං සුඛෙති පීණෙතීති ඉමිනා දුතියෙන ඨානෙන පාසංසො, සංවිභජති පුඤ්ඤානි කරොතීති ඉමිනා තතියෙන ඨානෙන පාසංසො, තෙ ච භොගෙ අගථිතො අමුච්ඡිතො අනජ්ඣාපන්නො ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජතීති ඉමිනා චතුත්ථෙන ඨානෙන පාසංසො. අයං ගාමණි කාමභොගී ඉමෙහි චතූහි ඨානෙහි පාසංසො.

තයොමෙ ගාමණි තපස්සිනො ලූඛජීවිනො[1] සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ තයො: ඉධ ගාමණි එකච්චො තපස්සී ලූඛජීවී සද්ධා[2] අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති: "අප්පෙවනාම කුසලං ධම්මං අධිගච්ඡෙය්‍යං, අප්පෙවනාම උත්තරිමනුස්සධම්මා[3] අලමරියඤාණදස්සනවිසෙසං සච්ඡිකරෙය්‍යං"න්ති. සො අත්තානං ආතාපෙති පරිතාපෙති, කුසලඤ්ච ධම්මං නාධිගච්ඡති, උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසං න සච්ඡිකරොති.

ඉධ පන ගාමණි එකච්චො තපස්සී ලූඛජීවී සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති: "අප්පෙවනාම කුසලං ධම්මං අධිගච්ඡෙය්‍යං, අප්පෙවනාම උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසං සච්ඡිකරෙය්‍යං"න්ති. සො අත්තානං ආතාපෙති පරිතාපෙති, කුසලඤ්ච ඛො ධම්මං අධිගච්ඡති, උත්තරිඤ්ච මනුස්සධම්මා අලමරියඤාණදස්සන විසෙසං න සච්ඡිකරොති.

---

1. ලූඛාජීවිනො - සී 1, 2
2. සද්ධා - ස්‍යා.
3. උත්තරිමනුස්සධම්මං - ස්‍යා.

ගාමණි එහි යම් කාමභෝගියෙක් දැහැමින් නො සැහැසිකමින් භෝග සොයා ද, දැහැමින් නො සැහැසිකමින් භෝග සොයා තමා සැපවත් කෙරේ ද, පිණවා ද, බෙදා ද, පින් කෙරේ ද, ඒ භෝගත් ඇලුණේ මුසපත් වූයේ ගැලුණේ දෙස් නො දක්නාසුලු වූයේ නික්ම යන නුවණ නැත්තේ වළඳා ද, ගාමණි මේ කාමභෝගි තෙමේ තෙකරුණෙකින් පැසසිය යුතු වේ. එක්කරුණෙකින් ගැරහිය යුතු වේ. කවර තෙකරුණෙකින් පැසසිය යුතු වේ ද යත්: දැහැමින් නො සැහැසිකමින් භෝග සොයා යි මේ පළමුවන කරුණින් පැසසිය යුතු වේ. තමා සැපවත් කෙරෙ යි, පිණවායි මේ දෙවන කරුණෙන් පැසසිය යුතු වේ. බෙදායි පින් කෙරේ යි මේ තෙවන කරුණෙන් පැසසිය යුතු වේ. කවර එක් කරුණෙකින් ගැරහිය යුතු වේ ද යත්: ඒ භොගත් ඇලී මුසපත් ව ගැලී දෙස් නො දක්නාසුලු ව නික්ම යන නුවණ නැති ව වළඳා යි මේ එක් කරුණෙන් ගැරහිය යුතු වේ. ගාමණි මේ කාමභෝගි තෙමේ මේ තෙකරුණෙන් පැසසිය යුතු වේ. මේ එක්කරුණෙන් ගැරහිය යුතු වේ.

ගාමණි එහි යම් කාමභෝගියෙක් දැහැමින් නො සැහැසිකමින් භෝග සොයා ද, දැහැමින් නො සැහැසිකමින් භෝග සොයා තමා සැපවත් කෙරේ ද, පිණවා ද බෙදා ද පින් කෙරේ ද ඒ භෝගත් නො ඇලී නො මුසපත් ව නො ගැලී දෙස් දක්නාසුලු ව නික්මයන නුවණ ඇති ව වළඳා ද, ගාමණි මේ කාමභෝගි තෙමේ සිවුකරුණෙකින් පැසසිය යුතු වේ. කවර සිවුකරුණෙකින් පැසසියයුතු වේ ද යත්: දැහැමින් නො සැහැසිකමින් භෝග සොයා යි මේ පළමුවන කරුණින් පැසසියයුතු වේ. තමා සැපවත් කෙරේ යි පිණවා යි මේ දෙවන කරුණින් පැසසියයුතු වේ. බෙදායි පින් කෙරේ යි මේ තෙවන කරුණින් පැසසියයුතු වේ. ඒ භෝගත් නො ඇලී නො මුසපත් ව නො ගැලී දෙස් දක්නාසුලු ව නික්මයන නුවණ ඇති ව වළඳා යි මේ සිවුවන කරුණින් පැසසිය යුතු වේ. ගාමණි මේ කාමභෝගි තෙමෙ මේ සිවුකරුණින් පැසසිය යුතු වේ.

ගාමණි රළු දිවි ඇති මේ තවුසෝ තිදෙනෙක් ලොව ඇතියහ. දක්නා ලැබෙති. කවර තිදෙනෙක් ද යත්: ගාමණි මෙහි රළු දිවි ඇති ඇතැම් තවුසෙක් ''කුසල් දහම් අවබෝධ කරන්නෙම් නම් මැනවි. මිනිස් දහමින් වැඩි අරිබැව් කිරීමෙහි සමත් නැණදසුන් වෙසෙසක් පසක් කරන්නෙම් නම් මැනවැ''යි සැදැහැයෙන් ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වූයේ වෙයි. හෙතෙමේ තමා තවයි හාත්පසින් තවයි. කුසල්දහමකුත් අවබෝධ නො කෙරෙයි. මිනිස්දහමින් වැඩි අරිබැව් කිරීමෙහි සමත් නැණදසුන් වෙසෙසකුත් නො පසක් කෙරෙයි.

ගාමණි, මෙහි රළුදිවි ඇති ඇතැම් තවුසෙක් ''කුසල්දහමක් අවබෝධ කරන්නෙම් නම් මැනවි. මිනිස්දහමින් වැඩි අරිබැව් කිරීමෙහි සමත් නැණදසුන් වෙසෙසක් පසක්කරන්නෙම් නම් මැනවැ''යි සැදැහැයෙන් ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වූයේ වෙයි. හේ තමා තවයි, හාත්පසින් තවයි. කුසල්දහමක් අවබොධ කෙරෙයි. මිනිස්දහමින් වැඩි අරිබැව් කිරීමෙහි සමත් නැණදසුන් වෙසෙසක් නො පසක්කෙරෙයි.

ඉධ පන ගාමණි එකච්චො තපස්සී ලූඛජීවී සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති: "අප්පෙවනාම කුසලං ධම්මං අධිගච්ඡෙය්‍යං, අප්පෙවනාම උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සන විසෙසං සච්ඡිකරෙය්‍ය"න්ති. සො අත්තානං ආතාපෙති පරිතාපෙති, කුසලඤ්ච ධම්මං අධිගච්ඡති, උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සන විසෙසං සච්ඡිකරොති.

තත්‍ර ගාමණි ය්වායං තපස්සී ලූඛජීවී අත්තානං ආතාපෙති පරිතාපෙති, කුසලඤ්ච ධම්මං නාධිගච්ඡති, උත්තරිඤ්ච මනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසං න සච්ඡිකරොති. අයං ගාමණි තපස්සී ලූඛජීවී තීහි ඨානෙහි ගාරය්හො. කතමෙහි තීහි ඨානෙහි ගාරය්හො: අත්තානං ආතාපෙති පරිතාපෙතීති ඉමිනා පඨමෙන ඨානෙන ගාරය්හො, කුසලඤ්ච ධම්මං නාධිගච්ඡතීති ඉමිනා දුතියෙන ඨානෙන ගාරය්හො, උත්තරිඤ්ච මනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසං න සච්ඡිකරොතීති ඉමිනා තතියෙන ඨානෙන ගාරය්හො. අයං ගාමණි තපස්සී ලූඛජීවී ඉමෙහි තීහි ඨානෙහි ගාරය්හො.

තත්‍ර ගාමණි ය්වායං තපස්සී ලූඛජීවී අත්තානං ආතාපෙති පරිතාපෙති, කුසලං හි ඛො ධම්මං අධිගච්ඡති, උත්තරිඤ්ච මනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසං න සච්ඡිකරොති. අයං ගාමණි තපස්සී ලූඛජීවී ද්වීහි ඨානෙහි ගාරය්හො, එකෙන ඨානෙන පාසංසො. කතමෙහි ද්වීහි ඨානෙහි ගාරය්හො: අත්තානං ආතාපෙති පරිතාපෙතීති ඉමිනා පඨමෙන ඨානෙන ගාරය්හො. උත්තරිඤ්ච මනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසං න සච්ඡිකරොතීති ඉමිනා දුතියෙන ඨානෙන ගාරය්හො. කතමෙන එකෙන ඨානෙන පාසංසො, කුසලං හි ඛො ධම්මං අධිගච්ඡතීති ඉමිනා එකෙන ඨානෙන පාසංසො. අයං ගාමණි තපස්සී ලූඛජීවී ඉමෙහි ද්වීහි ඨානෙහි ගාරය්හො, ඉමිනා එකෙන ඨානෙන පාසංසො.

තත්‍ර ගාමණි ය්වායං තපස්සී ලූඛජීවී අත්තානං ආතාපෙති පරිතාපෙති, කුසලඤ්ච ධම්මං අධිගච්ඡති, උත්තරිඤ්ච මනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසං සච්ඡිකරොති. අයං ගාමණි, තපස්සී ලූඛජීවී එකෙන ඨානෙන ගාරය්හො, ද්වීහි ඨානෙහි පාසංසො. කතමෙන එකෙන ඨානෙන ගාරය්හො: අත්තානං ආතාපෙති පරිතාපෙතීති ඉමිනා එකෙන ඨානෙන ගාරය්හො. කතමෙහි ද්වීහි ඨානෙහි පාසංසො: කුසලඤ්ච ධම්මං අධිගච්ඡතීති ඉමිනා පඨමෙන ඨානෙන පාසංසො, උත්තරිඤ්ච මනුස්සධම්මා අලමරියඤාණදස්සන විසෙසං සච්ඡිකරොතීති ඉමිනා දුතියෙන ඨානෙන පාසංසො. අයං ගාමණි තපස්සී ලූඛජීවී ඉමිනා එකෙන ඨානෙන ගාරය්හො, ඉමෙහි ද්වීහි ඨානෙහි පාසංසො.

ගාමණි, මෙහි රළුදිවි ඇති ඇතැම් තවුසෙක් ''කුසල්දහමක් අවබෝධ කරන්නෙම් නම් මැනවි. මිනිස් දහමින් වැඩි අරිබැව් කිරීමෙහි සමත් නැණදසුන් වෙසෙසක් පසක් කරන්නෙම් නම් මැනවැ''යි සැදැහැයෙන් ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වූයේ වෙයි. හේ තමා තවයි. වෙයෙසින් තවයි. කුසල්දහමක් අවබෝධ කෙරෙයි. මිනිස්දහමින් වැඩි අරිබැව් කිරීමෙහි සමත් නැණදසුන් වෙසෙසත් පසක් කෙරෙයි.

ගාමණි, එහි රළුදිවි ඇති යම් තවුසෙක් තමා තවා ද වෙසෙසින් තවා ද කුසල්දහමත් අවබෝධ නො කෙරේ ද මිනිස් දහමින් වැඩි අරිබැව් කිරීමෙහි සමත් නැණදසුන් වෙසෙසත් නො පසක් කෙරේ ද, ගාමණි රළුදිවි ඇති මේ තවුස් තෙමේ තෙකරුණෙකින් ගැරහිය යුතු වේ. කවර තෙකරුණෙකින් ගැරහිය යුතු වේ ද යත්: තමා තවයි. වෙසෙසින් තවා යි මේ පළමුවන කරුණින් ගැරහියයුතු වේ. කුසල්දහමත් අවබොධ නො කෙරේ යි මේ දෙවන කරුණෙන් ගැරහිය යුතු වේ. මිනිස්දහමින් වැඩි අරිබැව් කිරීමෙහි සමත් නැණදසුන් වෙසෙසත් නො පසක් කෙරේ යි මේ තෙවන කරුණින් ගැරහියයුතු වේ. ගාමණි රළුදිවි ඇති තවුස්තෙමේ මේ තෙකරුණෙන් ගැරහිය යුතු වේ.

ගාමණි එහි රළුදිවි ඇති යම් තවුසෙක් තමා තවා ද වෙසෙසින් තවා ද කුසල්දහමත් අවබෝධ කෙරේ ද මිනිස්දහමින් වැඩි අරිබැව් කිරීමෙහි සමත් නැණදසුන් වෙසෙසත් නො පසක් කෙරේ ද, ගාමණි රළුදිවි ඇති මේ තවුස් තෙමේ දෙකරුණකින් ගැරහිය යුතු වේ. එක් කරුණකින් පැසසිය යුතු වේ. කවර දෙකරුණකින් ගැරහිය යුතු වේ ද යත්: තමා තවයි. වෙසෙසින් තවා යි මේ පළමුවන කරුණින් ගැරහියයුතු වේ. මිනිස්දහමින් වැඩි අරිබැව් කිරීමෙහි සමත් නැණදසුන් වෙසෙසක් නො පසක් කෙරේ යි මේ දෙවන කරුණින් ගැරහියයුතු වේ. කවර එක් කරුණකින් පැසසියයුතු වේ ද යත්: කුසල්දහමක් අවබෝධ කෙරේ යි මේ එක් කරුණින් පැසසියයුතු වේ. ගාමණි රළුදිවි ඇති මේ තවුස්තෙමේ මේ දෙකරුණින් ගැරහිය යුතු වේ. මේ එක් කරුණින් පැසසිය යුතු වේ.

ගාමණි එහි රළුදිවි ඇති යම් තවුසෙක් තෙමේ තමා තවා ද වෙසෙසින් තවා ද කුසල්දහමත් අවබෝධ කෙරේ ද, මිනීස්දහමින් වැඩි අරිබැව් කිරීමෙහි සමත් නැණදසුන් වෙසෙසක් පසක් කෙරේ ද, ගාමණි රළුදිවි ඇති මේ තවුස්තෙමේ එක් කරුණකින් ගැරහියයුතු වේ. දෙකරුණකින් පැසසියයුතු වේ. කවර එක් කරුණකින් ගැරහියයුතු වේ ද යත්: තමා තවයි. වෙසෙසින් තවා යි මේ එක් කරුණින් ගැරහියයුතු වේ. කවර දෙකරුණකින් පැසසියයුතු වේ ද යත්: කුසල්දහමත් අවබෝධ කෙරේයි මේ පළමුවන කරුණින් පැසසියයුතු වේ. මිනිස්දහමින් වැඩි අරිබැව් කිරීමෙහි සමත් නැණදසුන් විසෙසත් පසක් කෙරේයි මේ දෙවන කරුණින් පැසසියයුතු වේ. ගාමණි, රළුදිවි ඇති මේ තවුස්තෙමේ මේ එක් කරුණින් ගැරහියයුතු වේ. මේ දෙකරුණින් පැසසියයුතු වේ.

තිස්සො ඉමා ගාමණි සන්දිට්ඨිකා නිජ්ජරා අකාලිකා එහිපස්සිකා ඔපනයිකා පච්චත්තං වෙදිතබ්බා විඤ්ඤූහි. කතමා තිස්සො:

යං රත්තො රාගාධිකරණං අත්තව්‍යාබාධායපි චෙතෙති, පරව්‍යාබාධායපි චෙතෙති, උභයව්‍යාබාධායපි චෙතෙති, රාගෙ පහීනෙ නෙව අත්තව්‍යාබාධායපි චෙතෙති, න පරව්‍යාබාධායපි චෙතෙති, න උභයව්‍යාබාධායපි චෙතෙති. සන්දිට්ඨිකා නිජ්ජරා අකාලිකා එහිපස්සිකා ඔපනයිකා පච්චත්තං වෙදිතබ්බා විඤ්ඤූහි. යං දුට්ඨො දොසාධිකරණං අත්තව්‍යාබාධායපි චෙතෙති, පරව්‍යාබාධායපි චෙතෙති, උභයව්‍යාබාධායපි චෙතෙති. දොසෙ පහීනෙ නෙව අත්තව්‍යාබාධායපි චෙතෙති, න පරව්‍යාබාධායපි චෙතෙති, න උභයව්‍යාබාධායපි චෙතෙති, සන්දිට්ඨිකා නිජ්ජරා අකාලිකා එහිපස්සිකා ඔපනයිකා පච්චත්තං වෙදිතබ්බා විඤ්ඤූහි. යං මූළ්හො මොහාධිකරණං අත්තව්‍යාබාධායපි චෙතෙති පරව්‍යාබාධායපි චෙතෙති, උභයව්‍යාබාධායපි චෙතෙති, මොහෙ පහීනෙ නෙව අත්තව්‍යාබාධායපි චෙතෙති, න පරව්‍යාබාධායපි චෙතෙති, න උභයව්‍යාබාධායපි චෙතෙති. සන්දිට්ඨිකා නිජ්ජරා අකාලිකා එහිපස්සිකා ඔපනයිකා පච්චත්තං වෙදිතබ්බා විඤ්ඤූහි. ඉමා ඛො ගාමණි තිස්සො සන්දිට්ඨිකා නිජ්ජරා අකාලිකා එහිපස්සිකා ඔපනයිකා පච්චත්තං වෙදිතබ්බා විඤ්ඤූහීති.

එවං වුත්තෙ රාසියො ගාමණි භගවන්තං එතදවොච: අභික්කන්තං භන්තෙ අභික්කන්තං භන්තෙ -පෙ- උපාසකං මං භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

ගාමණී තමා විසින් දැක්කයුතු කල් නො යවා විපාක දෙන එව බලවයි දක්වීමට සුදුසු තමා සතන්හි එළවාලීමට සුදුසු නුවණැත්තවුන් විසින් තම තමන් කෙරෙහි ලා දතයුතු මේ නිජ්ජරා (කෙලෙස්දිරවීම්) තුනෙකි. කවර තුනෙක් ද යත්:

රාගයෙන් රත් වූයේ රාගය හේතු කොට ගෙන තමා පෙළීම පිණිසත් සිතයි. මෙරමා පෙළීම පිණිසත් සිතයි. දෙපසම පෙළීම පිණිසත් සිතයි. රාගය ප්‍රහීණ කල්හි තමා පෙළීම පිණිසත් නො ම සිතයි. මෙරමා පෙළීම පිණිසත් නො ම සිතයි. දෙපස ම පෙළීම පිණිසත් නො ම සිතයි යන යමෙක් ඇද්ද, (එය) තමා විසින් දැක්කයුතු කල් නො යවා විපාක දෙන එව බලව යි කීමට සුදුසු තමා සතන්හි එළවාලීමට සුදුසු නුවණැත්තන් විසින් තමන් තමන් කෙරෙහි ලා දතයුතු නිජ්ජරාවෙකි. ද්වේෂයෙන් දුෂ්ට වූයේ ද්වේෂය හේතුකොට ගෙන තමා පෙළීම පිණිසත් සිතයි. මෙරමා පෙළීම පිණිසත් සිතයි. දෙපස ම පෙළීම පිණිසත් සිතයි. ද්වේෂය ප්‍රහීණ කල්හි තමා පෙළීම පිණිසත් නො ම සිතයි. මෙරමා පෙළීම පිණිසත් නො ම සිතයි. දෙපස ම පෙළීම පිණිසත් නො ම සිතයි යන යමෙක් ඇද්ද (එය) තමා විසින් දැක්ක යුතු කල් නො යවා විපාක දෙන එව බලව යි කීමට සුදුසු තමා කෙරෙහි එළවා ලීමට සුදුසු නුවණැත්තන් විසින් තමන් තමන් කෙරෙහි ලා දතයුතු නිජ්ජරාවෙකි. මෝහයෙන් මුළා වූයේ මෝහය හේතු කොට ගෙන තමා පෙළීම පිණිසත් සිතයි. මෙරමා පෙළීම පිණිසත් සිතයි. දෙපස ම පෙළීම පිණිසත් සිතයි. මොහය ප්‍රහීණ කල්හි තමා පෙළීම පිණිසත් නො ම සිතයි. මෙරමා පෙළීම පිණිසත් නො ම සිතයි. දෙපස ම පෙළීම පිණිසත් නො ම සිතයි යන යමෙක් ඇද්ද එය තමා විසින් දැක්කයුතු කල් නො යවා විපාක දෙන එව බලව යි කීමට සුදුසු තමා කෙරෙහි එළවා ලීමට සුදුසු නුවණැත්තන් විසින් තමන් තමන් කෙරෙහි ලා දා යුතු නිජ්ජරාවෙකි. ගාමණී මේ තමා විසින් දැක්ක යුතු කල් නො යවා විපාක දෙන එව බලව යි කීමට සුදුසු තමන් කෙරෙහි එළවා ලීමට සුදුසු නුවණැත්තවුන් විසින් තමන් තමන් කෙරෙහි ලා දතයුතු නිජ්ජරා තුනයි.

මෙසේ වදාළ කල්හි රාසිය ගාමණී තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: වහන්ස ඉතා මැනවි. වහන්ස ඉතා මැනවි ... භාග්‍යවතුන් වහන්සේ අද පටන් දිවිහිමියෙන් සරණ ගිය උවසුවකු කොට මා දරන සේක්වා යි.

## 8. 1. 13

## පාටලියසුත්තං

427. එකං සමයං භගවා **කොලියෙසු** විහරති **උත්තරකං**[1] නාම කොලියානං නිගමො.[2] අථ ඛො **පාටලියො ගාමණි** යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො පාටලියො ගාමණි භගවන්තං එතදවොච: සුතං මෙතං භන්තෙ "සමණො ගොතමො මායං ජානාතී"ති. යෙ තෙ භන්තෙ එවමාහංසු: "සමණො ගොතමො මායං ජානාතී"ති, කච්චි තෙ භන්තෙ භගවතො වුත්තවාදිනො, න ච භගවන්තං අභූතෙන අබ්භාචික්ඛන්ති, ධම්මස්ස චානුධම්මං ව්‍යාකරොන්ති, න ච කොචි සහධම්මිකො වාදානුපාතො ගාරය්හං ඨානං ආගච්ඡති, අනබ්භක්ඛාතුකාමා[3] හි මයං භන්තෙ භගවන්තන්ති.

යෙ තෙ ගාමණි එවමාහංසු: "සමණො ගොතමො මායං ජානාතී"ති, වුත්තවාදිනො චෙව මෙ තෙ, න ච මං අභූතෙන අබ්භාචික්ඛන්ති, ධම්මස්ස චානුධම්මං ව්‍යාකරොන්ති, නච කොචි සහධම්මිකො වාදානුපාතො ගාරය්හං ඨානං ආගච්ඡතීති. සච්චං යෙව කිර භො මයං තෙසං සමණබ්‍රාහ්මණානං න සද්දහාම: සමණො ගොතමො මායං ජානාතීති. සමණො ඛලු භො ගොතමො මායාවීති. යොනු ඛො ගාමණි එවං වදෙති, "අහං මායං ජානාමී"ති, සො එවං වදෙති, "අහං මායාවී"ති. තථෙව තං භගවා හොති, තථෙව තං සුගත හොතීති. තෙන හි ගාමණි තඤ්ඤෙවෙත්ථ පටිපුච්ඡිස්සාමි, යථා තෙ ඛමෙය්‍ය තථා නං ව්‍යාකරෙය්‍යාසි.

තං කිම්මඤ්ඤසි ගාමණි, ජානාසි ත්වං ගාමණි, කොලියානං ලම්බචූළකෙ භටෙති, ජානාමහං භන්තෙ කොලියානං ලම්බචූළකෙ භටෙති. තං කිම්මඤ්ඤසි ගාමණි කිමත්ථියා කොලියානං ලම්බචූළකා භටාති· යෙ ච භන්තෙ කොලියානං චොරා තෙ ච පටිසෙධෙතුං, යානි ච කොලියානං දූතෙය්‍යානි තානි වහාතුං[4], එතදත්ථාය[5] භන්තෙ කොලියානං ලම්බචූළකා භටාති. තං කිම්මඤ්ඤසි ගාමණි, ජානාසි ත්වං කොලියානං ලම්බචූළකෙ භටෙ සීලවන්තෙ වා තෙ දුස්සීලෙ වාති. ජානාමහං භන්තෙ කොලියානං ලම්බචූළකෙ භටෙ දුස්සීලෙ පාපධම්මෙ, යෙ ච ලොකෙ දුස්සීලා පාපධම්මා කොලියානං ලම්බචූළකා භටා තෙසං අඤ්ඤතරාති.

---

1. උත්තර-මජසං, ස්‍යා
2. නිගමෙ - සී 2.
3 අනබ්භාචික්ඛාතුකාමා - මජසං
4. පහාතුං - ස්‍යා
5. එතදත්ථියා - මජසං

## 8. 1. 13

## පාටලිය සූත්‍රය

427. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **කෝලිය දනව්වෙහි උත්තරක** නම් කෝලියයන්ගේ නියම්ගමහි වැඩවසන සේක. එකල්හි **පාටලිය ගාමණි** තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස්ව හුන්නේ ය. එකත්පස් ව හුන් පාටලිය ගාමණි තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: වහන්ස, මහණ ගොයුම්හු 'මායා දනිති'යි මෙය මා විසින් අසන ලදී. වහන්ස, යම් ඒ කෙනෙක් මහණ ගොයුම්හු මායා දනිති යි මෙසේ කියත් නම් වහන්ස, කිම ඔහු භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද්දක් කියන්නෝ ද, භාග්‍යවතුන් වහන්සේට බොරුවෙන් චෝදනා නො ද කෙරෙත් ද, දහමට ද අනුදහමක් පවසද්ද, කරුණු සහිත කිසියම් වාදනුපාතයෙක් ගැරහිය යුතු තැනට නො ද පැමිණේ ද වහන්ස, අපි වනාහි භාග්‍යවතුන් වහන්සේ අබ්බවා නො කියනු කැමැත්තෝ වෙමු යි.

ගාමණි, යම් කෙනෙක් 'මහණ ගොයුම්හු මායා දනිති'යි මෙසේ කියත් නම් ඔහු මවිසින් කියන ලද්දක් කියන්නෝත් වෙති. බොරුවෙන් මා අබ්බවා නො ද කියති. දහමට ද අනුදහමක් පවසති. කරුණු සහිත කිසියම් වාදනුපාතයෙක් ගැරහියයුතු තැනට නො ද පැමිණේ යි. පින්වත්නි, මහණගොයුම්හු මායා දනිති යි ඒ මහණ බමුණන්ගේ සැබෑ වූ ම තෙපුල අපි නො අදහමු. පින්වත්නි, මහණ ගොයුම්හු ඒකාන්තයෙන් මායා ඇති සේකැ යි. ගාමණි, යමෙක් මම මායා දනිමි යි මෙසේ කිය නම් හෙතෙමේ මම මායා ඇත්තෙක්මි යි මෙසේ කිය යි. භාග්‍යවතුන් වහන්ස, එය එසේම වේ. සුගතයන් වහන්ස, එය එසේ ම වේ . ගාමණි, එසේ වී නම් මෙහිලා තොප ම පුළුවුස්නෙමි. යම්සේ තොපට වැටහේ නම් එසේ එය විසඳන්නහු ය.

ගාමණි ඒ කිමැ යි හඟිහු ද, ගාමණි තෙපි **කෝලියරජුන්ගේ ලම්බචූළක** සෙබළුන් දනිවු ද යි. වහන්ස, මම කෝලියරජුන්ගේ ලම්බචූළක සෙබළුන් දනිමි යි. ගාමණි, ඒ කිමැයි හඟිවු ද, කෝලිය රජුන්ගේ ලම්බචූලක සෙබළහු කුමක් ප්‍රයෝජන කොට ඇත්තෝ දැ යි. වහන්ස, කෝලියරජුන්ගේ යම් සොරු වෙත් නම් ඔවුන් වළක්වන්නටත් කෝලියරජුන්ගේ යම් පණිවුඩ පනත් වෙ නම් ඒවා ගෙන යැමටත් ය. වහන්ස, කෝලියරජුන්ගේ ලම්බචූළක සෙබළහු මේ ප්‍රයෝජනය පිණිස වෙති යි. ගාමණි, ඒ කිමැයි හඟිවු ද, තෙපි කෝලිය රජුන්ගේ ඒ ලම්බචූළක සෙබළුන් සිල්වතුන් කොට හෝ දුසිලුන් කොට හෝ දනිවු දැ යි. වහන්ස, මම කෝලිය රජුන්ගේ ලම්බචූළක සෙබළුන් දුසිලුන් කොට පාපස්වභාව ඇත්තවුන් කොට දනිමි. ලොව යම් කෙනෙක් දුසිල්හු නම් පාපස්වභාව ඇත්තාහු නම් කෝලියරජුන්ගේ ලම්බචූළක හටයෝ ඔවුනතුරෙන් එක්තරා කෙනෙක් වෙති යි.

යො නු ඛො ගාමණි එවං වදෙය්‍ය: ''පාටලියො ගාමණි ජානාති කොලියානං ලම්බචූළකෙ භටෙ දුස්සීලෙ පාපධම්මෙ, පාටලියොපි ගාමණි දුස්සීලො පාපධම්මො''ති, සම්මා නු ඛො සො වදමානො වදෙය්‍යාති. නො හෙතං භන්තෙ, අඤ්ඤෙ භන්තෙ කොලියානං ලම්බචූළකා භටා, අඤ්ඤො'හමස්මි, අඤ්ඤථාධම්මා කොලියානං ලම්බචූළකා භටා, අඤ්ඤථාධම්මො'හමස්මීති. ත්වං හි ගාමණි[1] ලච්ඡසි[2] ''පාටලියො ගාමණි ජානාති කොලියානං ලම්බචූළකෙ භටෙ දුස්සීලෙ පාපධම්මෙ, න ච පාටලියො ගාමණි දුස්සීලො පාපධම්මො''ති. කස්මා[3] තථාගතො න ලච්ඡති ''තථාගතො මායං ජානාති, න ච තථාගතො මායාවී''ති.

මායං චාහං ගාමණි පජානාමි මායාය ච විපාකං, යථා පටිපන්නො ච මායාවී කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, තඤ්ච පජානාමි. පාණාතිපාතං චාහං ගාමණි පජානාමි පාණාතිපාතස්ස ච විපාකං, යථා පටිපන්නො ච පාණාතිපාතී කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, තඤ්ච පජානාමි. අදින්නාදානං චාහං ගාමණි පජානාමි අදින්නාදානස්ස ච විපාකං, යථාපටිපන්නො ච අදින්නාදායී කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, තඤ්ච පජානාමි, කාමෙසු මිච්ඡාචාරං චාහං ගාමණි පජානාමි, කාමෙසු මිච්ඡාචාරස්ස ච විපාකං, යථාපටිපන්නො ච කාමෙසු මිච්ඡාචාරී කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, තඤ්ච පජානාමි.

මුසාවාදං චාහං ගාමණි පජානාමි මුසාවාදස්ස ච විපාකං, යථා පටිපන්නො ච මුසාවාදී කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, තඤ්ච පජානාමි. පිසුනාවාචං චාහං ගාමණි පජානාමි පිසුනාවාචාය ච විපාකං, යථාපටිපන්නො ච පිසුනාවාචො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, තඤ්ච පජානාමි. ඵරුසවාචං චාහං ගාමණි පජානාමි ඵරුසවාචාය ච විපාකං, යථාපටිපන්නො ච ඵරුසවාචො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, තඤ්ච පජානාමි. සම්ඵප්පලාපං චාහං ගාමණි පජානාමි සම්ඵප්පලාපස්ස ච විපාකං, යථාපටිපන්නො ච සම්ඵප්පලාපී කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති තඤ්ච පජානාමි.

අභිජ්ඣං චාහං ගාමණි පජානාමි අභිජ්ඣාය ච විපාකං, යථාපටිපන්නො ච අභිජ්ඣාලු කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, තඤ්ච පජානාමි. ව්‍යාපාදපදෙසඤ්චාහං ගාමණි පජානාමි ව්‍යාපාදපදෙසස්ස ච විපාකං, යථාපටිපන්නො ච ව්‍යාපන්නචිත්තො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, තඤ්ච පජානාමි. මිච්ඡාදිට්ඨිඤ්චාහං ගාමණි පජානාමි මිච්ඡාදිට්ඨියා ච විපාකං, යථාපටිපන්නො ච මිච්ඡාදිට්ඨිකො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, තඤ්ච පජානාමි.

1. ත්වං හි නාම ගාමණි - මජසං, සයා.
2. නච ලච්ඡසි - සයා.
3. තස්මා - සයා.

ගාමණී, යමෙක් "පාටලිය ගාමණී තෙමේ කෝලියරජුන්ගේ ලම්බචූළක සෙබළුන් දුසිලුන් කොට පාපසවභාව ඇත්තවුන් කොට දනී. පාටලියගාමණී තෙමේ ද දුසිලෙකි. පාපසවභාව ඇත්තෙකි" යි මෙසේ කියන්නේ නම් ඒ කියන්නා මැනවින් කියන්නේ දැයි. වහන්ස, මෙය නොවේ ම ය. වහන්ස, කෝලියරජුන්ගේ ලම්බචූළක භටයෝ අන්‍යයෝ යැ මම අනෙකෙක්මි. කෝලියරජුන්ගේ ලම්බචූළක භටයෝ අන් සවභාව ඇතියහ. මම අන්සවභාව ඇත්තෙක්මියි. ගාමණී, තෙපි "පාටලිය ගාමණී තෙමේ කොලියරජුන්ගේ ලම්බචූළක සෙබළුන් දුසිලුන් කොට පාපසවභාව ඇත්තවුන් කොට දනී. පාටලිය ගාමණී තෙමේ දුසිලෙක් පාපසවභාව ඇත්තෙක් නො ද වේ" යි කියමන ලබන්නහු නම් කුමක් හෙයින් තථාගත තෙමේ "තථාගතයෝ මායා දනිති. තථාගතයෝ මායා ඇත්තෝ නො ද වෙති" යි කියමන නො ලබන්නේ දැ යි.

ගාමණී, මම මායාවත් මායාවේ විපාකයත් දනිමි. මායා ඇත්තේ යම්සේ පිළිපන්නේ කාබුන් මරණින් මතු සැපයෙන් පහවූ දුකටගති වූ විවසව පතිත වන නිරයට පැමිණේ නම් එ ද දනිමි. ගාමණී, මම පණිවායත් පණිවායෙහි විපාකයත් දනිමි. පණිවායෙන් යුත් පුහුල් තෙමේ යම් සේ පිළිපන්නේ කාබුන් මරණින් මතු අපාය දුගගති විනිපාත නිරයට පැමිණේ නම් එ ද දනිමි. ගාමණී මම අයිනාදනත් අයිනාදනෙහි විපාකයත් දනිමි. අයිනාදනැති පුහුල් තෙමේ යම්සේ පිළිපන්නේ කාබුන් මරණින් මතු අපාය දුගගති විනිපාත නිරයට පැමිණේ නම් එ ද දනිමි. ගාමණී මම කම්හි මිසහසරත් කම්හි මිසහසරෙහි විපාකයත් දනිමි. කම්හි මිසහසරැති පුහුල් තෙමේ යම්සේ පිළිපන්නේ අපාය දුගගති විනිපාත නිරයට පැමිණේ නම් එ ද දනිමි.

ගාමණී, මම මුසවාත් මුසවාහි විපාකත් දනිමි. මුසවා ඇති පුහුල් යම්සේ පිළිපන්නේ කාබුන් මරණින් මතු අපාය දුගගති විනිපාත නිරයට පැමිණේ නම් එ ද දනිමි. ගාමණී, මම පිසුනු වදනත් පිසුනු වදන්හි විපාකයත් දනිමි. පිසුනු වදන් ඇත්තේ යම්සේ පිළිපන්නේ කාබුන් මරණින් මතු අපාය දුගගති විනිපාත නිරයට පැමිණේ නම් එ ද දනිමි. ගාමණී, මම රළු බසත් රළු බස්හි විපාකත් දනිමි. රළු බසැති පුහුල් යම්සේ පිළිපන්නේ කාබුන් මරණින් මතු අපාය දුගගති විනිපාත නිරයට පැමිණේ නම් එ ද දනිමි. ගාමණී, මම හිස් බසත් හිස් බස්හි විපාකත් දනිමි. හිස් බසැති පුහුල් යම්සේ පිළිපන්නේ කාබුන් මරණින් මතු අපාය දුගගති විනිපාත නිරයට පැමිණේ නම් එ ද දනිමි.

ගාමණී, මම දැඩිලොබත් දැඩිලොබෙහි විපාකත් දනිමි. දැඩිලොබැති පුහුල් යම්සේ පිළිපන්නේ කාබුන් මරණින් මතු අපාය දුගගති විනිපාත නිරයට පැමිණේ නම් එ ද දනිමි. ගාමණී මම කිපුම් දෙසත් කිපුම් දෙස්හි විපාකත් දනිමි. කෝපයට පැමිණි සිතැති පුහුල් යම් සේ පිළිපන්නේ කාබුන් මරණින් මතු අපාය දුගගති විනිපාත නිරයට පැමිණේ නම් එ ද දනිමි. ගාමණී මම මිසදිටුත් මිසදිටුහි විපාකත් දනිමි. මිසදිටු පුහුල් යම්සේ පිළිපන්නේ කාබුන් මරණින් මතු අපාය දුගගති විනිපාත නිරයට පැමිණේ නම් එද දනිමි.

සන්ති හි ගාමණි එකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: යො කොචි පාණමතිපාතෙති, සබ්බො සො දිට්ඨෙව ධම්මෙ දුක්ඛං දොමනස්සං පටිසංවෙදියති, යො කොචි අදින්නං ආදියති, සබ්බො සො දිට්ඨෙව ධම්මෙ දුක්ඛං දොමනස්සං පටිසංවෙදියති, යො කොචි කාමෙසු මිච්ඡා චරති සබ්බො සො දිට්ඨෙව ධම්මෙ දුක්ඛං දොමනස්සං පටිසංවෙදියති, යො කොචි මුසා භණති, සබ්බො සො දිට්ඨෙව ධම්මෙ දුක්ඛං දොමනස්සං පටිසංවෙදියතීති.

දිස්සති ඛො පන ගාමණි ඉධෙකච්චො මාලි කුණ්ඩලි සුන්හාතො[1] සුවිලිත්තො කප්පිතකෙසමස්සු ඉත්ථිකාමෙහි[2] රාජා මඤ්ඤෙ පරිචාරෙන්තො, තමෙනං එවමාහංසු: අම්භො අයං පුරිසො කිං අකාසි මාලී කුණ්ඩලී සුන්හාතො සුවිලිත්තො කප්පිතකෙසමස්සු ඉත්ථිකාමෙහි රාජා මඤ්ඤෙ පරිචාරෙතීති? තමෙනං එවමාහංසු: අම්භො අයං පුරිසො රඤ්ඤො පච්චත්ථිකං පසය්හ ජීවිතා වොරොපෙසි[3] තස්ස රාජා අත්තමනො අභිහාරමදසි. තෙනායං පුරිසො මාලී කුණ්ඩලී සුන්හාතො සුවිලිත්තො කප්පිතකෙසමස්සු ඉත්ථිකාමෙහි රාජා මඤ්ඤෙ පරිචාරෙතීති.

දිස්සති ඛො පන ගාමණි ඉධෙකච්චො දළ්හාය රජ්ජුයා පච්ඡාබාහං ගාළ්හබන්ධනං බන්ධිත්වා ඛුරමුණ්ඩං කරිත්වා ඛරස්සරෙන පණවෙන රථිකාය රථිකං සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං පරිනෙත්වා දක්ඛිණෙන ද්වාරෙන නික්ඛාමෙත්වා[4] දක්ඛිණතො නගරස්ස සීසං ඡිජ්ජමානො, තමෙනං එවමාහංසු: අම්භො අයං පුරිසො කිං අකාසි දළ්හාය රජ්ජුයා පච්ඡාබාහං ගාළ්හබන්ධනං බන්ධිත්වා ඛුරමුණ්ඩං කරිත්වා ඛරස්සරෙන පණවෙන රථිකාය රථිකං සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං පරිනෙත්වා දක්ඛිණෙන ද්වාරෙන නික්ඛාමෙත්වා දක්ඛිණතො නගරස්ස සීසං ඡින්දතීති. තමෙනං එවමාහංසු: අම්භො, අයං පුරිසො රාජවෙරී ඉත්ථිං වා පුරිසං වා ජීවිතා වොරොපෙසි, තෙන නං රාජානො ගහෙත්වා එවරූපං කම්මකාරණං කාරෙන්ති[5]ති. තං කිම්මඤ්ඤසි ගාමණි අපි නු තෙ එවරූපං දිට්ඨං වා සුතං වාති. දිට්ඨඤ්ච නො භන්තෙ සුතඤ්ච සූයිස්සති චාති.

තත්‍ර ගාමණි යෙ තෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: "යො කොචි පාණමතිපාතෙති, සබ්බො සො දිට්ඨෙව ධම්මෙ දුක්ඛං දොමනස්සං පටිසංවෙදියතී"ති, සච්චං වා තෙ ආහංසු මුසා වාති. මුසා භන්තෙ. යෙ පන තෙ තුච්ඡං[6] මුසා විලපන්ති, සීලවන්තො වා තෙ දුස්සීලා වාති. දුස්සීලා භන්තෙ. යෙ පන තෙ දුස්සීලා පාපධම්මා මිච්ඡාපටිපන්නා වා තෙ සම්මාපටිපන්නා වාති. මිච්ඡාපටිපන්නා භන්තෙ. යෙ පන තෙ මිච්ඡාපටිපන්නා මිච්ඡාදිට්ඨිකා වා තෙ සම්මාදිට්ඨිකා වාති. මිච්ඡාදිට්ඨිකා භන්තෙ. යෙ පන තෙ මිච්ඡාදිට්ඨිකා කල්ලන්නු තෙසු පසීදිතුන්ති. නො හෙතං භන්තෙ.

---

1. සුනහාතො - මජසං, සයා.
2. කාමෙසුහි - සී 1, 2.
3. වොරොපති - සයා.
4. නික්ඛමිත්වා - සයා.
5. කරණානි කාරෙන්තීති - සයා.
   කරණං කරොන්ති - සී 1, 2.
6. තුච්ඡා - සී 1, 2.

ගාමණී මෙබඳු වාද ඇතිමෙබඳු දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණෝ ඇතියහ. යම්කිසිවෙක් පරපණ නසා නම් ඒ සියලු දෙන දිටු දැමියෙහි ම දුක් දොම්නස් විඳී. යම්කිසිවෙක් නුදුන් දැ ගනී නම් ඒ සියලු දෙන දිටු දැමියෙහිම දුක් දොම්නස් විඳී. යම් කිසිවෙක් කාමයෙහි වරදවා හැසිරේ නම් ඒ සියලු දෙන දිටු දැමියෙහි ම දුක් දොම්නස් විඳී. යම් කිසිවෙක් මුසා බෙණේ නම් ඒ සියලු දෙන දිටු දැමියෙහි ම දුක් දොම්නස් විඳී.

ගාමණී, මාලා ඇති කොඬොල් ඇති මැනවින් ස්නානය කළ මොනවට සුවඳ විලවුන් ගැල්වූ සැදූ කෙස් රැවුල් ඇති ස්ත්‍රීන් සහිත කාමයෙන් රජකු මෙන් ඉඳුරන් පිණවන එකෙක් මෙහි දක්නා ලැබේ. ඒ මොහුට මෙසේ කියත්: පින්වත්නි, මේ පුරිස් තෙමේ මාලා ඇත්තේ කොඬොල් ඇත්තේ මැනවින් ස්නාන කෙළේ මොනවට සුවඳ විලවුන් ගල්වන ලද්දේ සැදූ කෙස්රැවුල් ඇත්තේ ස්ත්‍රීන් සහිත කාමයෙන් රජකු මෙන් ඉඳුරන් පිණවයි. (හෙතෙමේ පෙර) කුමක් කෙළේ ද යි. ඒ මොහුට මෙසේ කියත්: පින්වත්නි, මේ පුරුෂ තෙමේ රජුගේ සතුරකු මැඩ දිවියෙන් තොර කෙළේ ය. රජ ඔහුට සතුටුවූයේ පඬුරුත් දිනි. එහෙයින් මේ පුරිස් තෙමේ මාලා ඇත්තේ කොඬොල් ඇත්තේ මැනවින් ස්නානය කළේ මොනවට සුවඳ විලවුන් ගල්වන ලද්දේ සැදූ කෙස්රැවුල් ඇත්තේ ස්ත්‍රීන් සහිත කාමයෙන් රජකු මෙන් ඉඳුරන් පිණවා යි.

ගාමණී, මෙහි දැඩි රැහැනින් පිටිතල හයා දැඩි බැඳුමෙන් බැඳ කරයෙන් හිස මුඩු කොට රළුහඬ ඇති බෙරයෙන් යුතුව වෙයින් වෙයට සිවුමංසලින් සිවුමංසලට පමුණුවා දකුණු දෙරින් නික්මවා නුවර දකුණු දිග හිස සිඳිනු ලබන එකෙක් දක්නා ලැබේ. ඒ මොහුට මෙසේ කියත්: පින්වත්නි, දැඩි රැහැනින් පිටිතල හයා දැඩි බැඳුමෙන් බැඳ කරයෙන් මුඩු කොට රළු හඬැති බෙරයෙන් යුතුව වෙයින් වෙයට සිවුමංසලින් සිවුමංසලට පමුණුවා දකුණු දෙරින් නික්මවා නුවර දකුණු දිග යමකුගේ හිස සිඳී නම් මේ පුරිස් තෙමේ කුමක් කෙළේ ද යි. ඒ මොහුට මෙසේ කියත්: පින්වත්නි, මේ පුරිස් තෙමේ රජුගේ සතුරෙකි. ස්ත්‍රියක හෝ පුරුෂයකු හෝ දිවියෙන් තොර කෙළේ ය. එහෙයින් රජහු ඔහු ගෙන මෙබඳු කම් කටොලු කරවති යි. ගාමණී, ඒ කිමැ යි හඟිවු ද? තොප විසින් මෙබන්දෙක් දක්නා ලද්දේ හෝ අසන ලද්දේ හෝ වේද යි. වහන්ස, අප විසින් දක්නා ලද්දේ ද අසන ලද්දේ ද අසනු ලබන්නේ ද වේ යි.

ගාමණී, එහි යම් ඒ මහණ බමුණු කෙනෙක් ''යම් කිසිවෙක් පරපණ නසා නම් ඒ සියලු දෙන දිටු දැමියෙහි ම දුක්දොම්නස් විඳී ය''යි මෙබඳු වාද ඇත්තාහු මෙබඳු දෘෂ්ටි ඇත්තාහු වෙත් නම් ඔහු ඇත්ත හෝ මුසා හෝ කියත් ද යි. වහන්ස මුසා ය. යම් ඒ කෙනෙක් හිස් මුසා බෙණෙද් ද, ඔහු සිල්වත්හු හෝ දුසිල්හු හෝ වෙත් ද යි. වහන්ස, දුසිල්හු වෙති. යම් ඒ කෙනෙක් දුසිල්හු නම් පාපස්වභාව ඇත්තාහු නම් ඔහු වරදවා පිළිපන්හු හෝ මැනවින් පිළිපන්හු හෝ වෙත් ද යි. වහන්ස, වරදවා පිළිපන්හු වෙති. යම් ඒ කෙනෙක් වරදවා පිළිපන්හු නම් ඔහු මිසදිටු ඇත්තෝ හෝ සම්දිටු ඇත්තෝ හෝ වෙත් ද යි වහන්ස මිසදිටු ඇත්තහ. යම් ඒ කෙනෙක් මිසදිටු ඇත්තාහු නම් ඔවුන් කෙරෙහි පහදින්නට සුදුසු ද යි. වහන්ස මෙය නො වේ ම ය.

දිස්සති ඛො පන ගාමණි, ඉධෙකච්චො මාලී කුණ්ඩලී -පෙ- ඉත්ථිකාමෙහි රාජා මඤ්ඤෙ පරිචාරෙන්තො. තමෙනං එවමාහංසු: අම්භො, අයං පුරිසො කිං අකාසි මාලී කුණ්ඩලී -පෙ- ඉත්ථිකාමෙහි රාජා මඤ්ඤෙ පරිචාරෙතීති? තමෙනං එවමාහංසු: අම්භො අයං පුරිසො රඤ්ඤො පච්චත්ථිකස්ස පසය්හ රතනං අහාසි[1] තස්ස රාජා අත්තමනො උපහාර[2]මදාසි, තෙනායං පුරිසො මාලී කුණ්ඩලී -පෙ- ඉත්ථිකාමෙහි රාජා මඤ්ඤෙ පරිචාරෙතීති.

දිස්සති ඛො පන ගාමණි, ඉධෙකච්චො දළ්හාය රජ්ජුයා -පෙ- දක්ඛිණතො නගරස්ස සීසං ඡිජ්ජමානො. තමෙනං එවමාහංසු: අම්භො, අයං පුරිසො කිං අකාසි දළ්හාය රජ්ජුයා -පෙ- දක්ඛිණතො නගරස්ස සීසං ඡින්දන්තීති, තමෙනං එවමාහංසු: අම්භො, අයං පුරිසො ගාමා වා අරඤ්ඤා වා අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියි[3] තෙන තං රාජානො ගහෙත්වා එවරූපං කම්මකාරණං කාරෙන්තීති. තං කිම්මඤ්ඤසි ගාමණි, අපි නු තෙ එවරූපං දිට්ඨං වා සුතං වාති? දිට්ඨඤ්ච නො භන්තෙ සුතඤ්ච සුයිස්සති චාති. තත්‍ර[4] ගාමණි, යෙ තෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො "යො කොචි අදින්නං ආදියති, සබ්බො සො දිට්ඨෙව ධම්මෙ දුක්ඛං දොමනස්සං පටිසංවෙදියතී"ති. සච්චං වා තෙ ආහංසු මුසා වාති? -පෙ- කල්ලන්නු තෙසු පසීදිතුන්ති? නොහෙතං භන්තෙ.

දිස්සති ඛො පන ගාමණි, ඉධෙකච්චො මාලී කුණ්ඩලී -පෙ- ඉත්ථිකාමෙහි රාජා මඤ්ඤෙ පරිචාරෙන්තො. තමෙනං එවමාහංසු: අම්භො, අයං පුරිසො කිං අකාසි මාලී කුණ්ඩලී -පෙ- ඉත්ථිකාමෙහි රාජා මඤ්ඤෙ පරිචාරෙතීති. තමෙනං එවමාහංසු: අම්භො, අයං පුරිසො රඤ්ඤො පච්චත්ථිකස්ස දාරෙසු සඤ්චරිත්තං ආපජ්ජි. තස්ස රාජා අත්තමනො අභිහාරමදාසි. තෙනායං පුරිසො මාලී කුණ්ඩලී -පෙ- ඉත්ථිකාමෙහි රාජා මඤ්ඤෙ පරිචාරෙතීති.

දිස්සති ඛො පන ගාමණි, ඉධෙකච්චො දළ්හාය රජ්ජුයා -පෙ- දක්ඛිණතො නගරස්ස සීසං ඡිජ්ජමානො. තමෙනං එවමාහංසු: අම්භො, අයං පුරිසො කිං අකාසි දළ්හාය රජ්ජුයා -පෙ- දක්ඛිණතො නගරස්ස සීසං ඡින්දන්තීති? තමෙනං එවමාහංසු: අම්භො, අයං පුරිසො කුලිත්ථීසු කුලකුමාරීසු චාරිත්තං ආපජ්ජි. තෙන තං රාජානො ගහෙත්වා එවරූපං කම්මකාරණං කාරෙන්තීති. තං කිම්මඤ්ඤසි ගාමණි, අපිනු තෙ එවරූපං දිට්ඨං වා සුතං වාති? දිට්ඨඤ්ච නො භන්තෙ සුතඤ්ච සුයිස්සති චාති. තත්‍ර ගාමණි, යෙ තෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො "යො කොචි කාමෙසු මිච්ඡා චරති, සබ්බො සො දිට්ඨෙව ධම්මෙ දුක්ඛං දොමනස්සං පටිසංවෙදියතී"ති. සච්චං වා තෙ ආහංසු මුසා වාති -පෙ- කල්ලන්නු තෙසු පසීදිතුන්ති? නො හෙතං භන්තෙ.

---

1. අදින්නං ආදියති - ස්‍යා,
2. අභිහාර - මජසං, ස්‍යා
3. ආදියති - ස්‍යා
4. තත්‍ථ - සී 1, 2.

ගාමණි, මෙහි මාලා ඇති කොඩොල් ඇති ... ස්ත්‍රීන් සහිත කාමයෙන් රජකු මෙන් ඉඳුරන් පිණවන එකෙක් දක්නා ලැබේ. ඒ මොහුට මෙසේ කියත්: පින්වත්නි, මේ පුරිස් තෙමේ මාලා ඇත්තේ කොඩොල් ඇත්තේ ... ස්ත්‍රීන් සහිත කාමයෙන් රජකු මෙන් ඉඳුරන් පිණවයි. (හෙ) කුමක් කෙළේ ද? යි. ඒ මොහුට මෙසේ කියත්: පින්වත්නි, මේ පුරිස් තෙමේ රජුගේ සතුරකුට අයත් රුවන් බලයෙන් පැහැර ගත්තේ ය. රජ ඔහුට සතුටු වූයේ පඩුරු දිනි. එහෙයින් මේ පුරිස් තෙමේ මාලා ඇත්තේ කොඩොල් ඇත්තේ ... ස්ත්‍රීන් සහිත කාමයෙන් රජකු මෙන් ඉඳුරන් පිණවා යි.

ගාමණි, මෙහි දැඩි රැහැනින් ... නුවර දකුණුදිග හිස සිඳිනු ලබන එකෙක් දක්නා ලැබේ. ඒ මොහුට මෙසේ කියත්: පින්වත්නි, දැඩි රැහැනින් ... නුවර දකුණු දිග (යමකුගේ) හිස සිඳී නම් මේ පුරිස් තෙමේ කුමක් කෙළේ ද? යි ඒ මොහුට මෙසේ කියත්: පින්වත්නි, මේ පුරිස් තෙමේ ගමින් හෝ අරණින් හෝ නුදුන් දෑ සොරසිතින් ගත්තේ ය. එහෙයින් රජහු ඔහු ගෙන මෙබඳු කම්කටොලු කරවති යි. ගාමණි, ඒ කිමැ යි හඟිවූ ද? තොප විසින් මෙබන්දෙක් දක්නා ලද්දේ හෝ අසන ලද්දේ හෝ ද? යි. වහන්ස, අප විසින් දක්නා ලද්දේත් අසන ලද්දේත් අසනු ලබන්නේත් වේ යයි. ගාමණි, එහි යම් ඒ මහණ බමුණු කෙනෙක් "යම් කිසිවෙක් නුදුන් දෑ ගනී නම් ඒ සියලු දෙන දිටු දැමියෙහි ම දුක්දොම්නස් විඳී" යි. මෙබඳු වාද ඇත්තාහු මෙබඳු දෘෂ්ටි ඇත්තාහු වෙත් නම් ඔහු ඇත්ත හෝ මුසා හෝ කියත් ද යි ... ඔවුන් කෙරෙහි පහදින්නට සුදුසු ද? යි. වහන්ස, මෙය නො වේ ම ය.

ගාමණි, මෙහි මාලා ඇති කොඩොල් ඇති ... ස්ත්‍රීන් සහිත කාමයෙන් රජකු මෙන් ඉඳුරන් පිණවන එකෙක් දක්නා ලැබේ. ඒ මොහුට මෙසේ කියත්: පින්වත්නි, මේ පුරිස් තෙමේ මාලා ඇත්තේ කොඩොල් ඇත්තේ ... ස්ත්‍රීන් සහිත කාමයෙන් රජකු මෙන් ඉඳුරන් පිණවයි. (හෙ) කුමක් කෙළේ ද? යි ඒ මොහුට මෙසේ කියත්: පින්වත්නි, මේ පුරිස් තෙමේ රජුගේ සතුරකුට අයත් අඹුවන් අතරෙහි හැසිරෙන බවට පැමිණියේ ය. රජ තෙමේ ඔහුට සතුටු ව පඩුරු දින. එහෙයින් මේ පුරිස් තෙමේ මාලා ඇත්තේ කොඩොල් ඇත්තේ ... ස්ත්‍රීන් සහිත කාමයෙන් රජකු මෙන් ඉඳුරන් පිණවා යි.

ගාමණි, මෙහි දැඩි රැහැණින් ... නුවර දකුණු දිග හිස සිඳුනා ලබන එකෙක් දක්නා ලැබේ. ඒ මොහුට මෙසේ කියත්: පින්වත, දැඩි රැහැණින් ... නුවර දකුණුපස (යමකුගේ) හිස සිඳී නම් මේ පුරුෂ තෙමේ කුමක් කෙළේ ද? යි. ඒ මොහුට මෙසේ කියත්: පින්වත, මේ පුරිස් තෙමේ කුලස්ත්‍රීන් කෙරෙහි කුලකුමාරීන් කෙරෙහි වරදවා පිළිපන්නේ ය. එහෙයින් රජහු ඔහු ගෙන මෙබඳු කම්කටුලු කරවති යි. ගාමණි, ඒ කිමැ යි හඟිවූ ද? තොප විසින් මෙබන්දෙක් දක්නා ලද්දේ හෝ අසන ලද්දේ හෝ ද? යි. වහන්ස, අප විසින් දක්නා ලද්දේත් අසන ලද්දේත් අසනු ලබන්නේත් වේ ය යි. ගාමණි, එහි යම් ඒ මහණ බමුණු කෙනෙක් "යම් කිසිවෙක් කාමයෙහි වරදවා හැසිරේ නම් ඒ සියලු දෙන දිටුදැමියෙහි ම දුක් දොම්නස් විඳී" යි. මෙබඳු වාද ඇත්තෝ මෙබඳු දෘෂ්ටි ඇත්තෝ වෙත් නම් ඔහු ඇත්ත හෝ මුසා හෝ කියද්ද? යි ... ඔවුන් කෙරෙහි පහදින්නට සුදුසු ද? යි. වහන්ස, මෙය නො වේ ම ය.

දිස්සන්ති ඛො පන ගාමණි, ඉධෙකච්චෙ මාලී කුණ්ඩලී සුන්හාතො සුවිලිත්තො කප්පිතකෙසමස්සු ඉත්ථිකාමෙහි රාජා මඤ්ඤෙ පරිචාරෙන්තා. තමෙනං එවමාහංසු: අම්භො, අයං පුරිසො කිං අකාසි මාලි කුණ්ඩලී සුන්හාතො සුවිලිත්තො කප්පිතකෙසමස්සු ඉත්ථිකාමෙහි රාජා මඤ්ඤෙ පරිචාරෙතීති. තමෙනං එවමාහංසු: අම්භො, අයං පුරිසො රාජානං මුසාවාදෙන හාසෙසි[1] තස්ස රාජා අත්තමනො අභිහාරමදසි. තෙනායං පුරිසො මාලී කුණ්ඩලී සුන්හාතො සුවිලිත්තො කප්පිතකෙසමස්සු ඉත්ථිකාමෙහි රාජා මඤ්ඤෙ පරිචාරෙතීති.

දිස්සන්ති ඛො පන ගාමණි, ඉධෙකච්චෙ දළ්හාය රජ්ජුයා පච්ඡාබාහං ගාළ්හබන්ධනං බන්ධිත්වා ඛුරමුණ්ඩං කරිත්වා ඛරස්සරෙන පණවෙන රථිකාය රථිකං සිංඝාටකෙන සිංඝාටකං පරිනෙත්වා දක්ඛිණෙන ද්වාරෙන නික්ඛාමෙත්වා දක්ඛිණතො නගරස්ස සීසං ඡිජ්ජමානො. තමෙනං එවමාහංසු: අම්භො, අයං පුරිසො කිං අකාසි දළ්හාය රජ්ජුයා පච්ඡාබාහං ගාළ්හබන්ධනං බන්ධිත්වා ඛුරමුණ්ඩං කරිත්වා ඛරස්සරෙන පණවෙන රථිකාය රථිකං සිංඝාටකෙන සිංඝාටකං පරිනෙත්වා දක්ඛිණෙන ද්වාරෙන නික්ඛාමෙත්වා දක්ඛිණතො නගරස්ස සීසං ඡින්දන්තීති. තමෙනං එවමාහංසු: අම්භො අයං පුරිසො ගහපතිස්ස වා ගහපතිපුත්තස්ස වා මුසාවාදෙන අත්ථං භඤ්ජි. තෙන නං රාජානො ගහෙත්වා එවරූපං කම්මකාරණං කාරෙන්තීති. තං කිම්මඤ්ඤසි ගාමණි, අපිනු තෙ එවරූපං දිට්ඨං වා සුතං වාති? දිට්ඨඤ්ච නො භන්තෙ, සුතඤ්ච සුයිස්සති චාති. තත්‍ර ගාමණි, යෙ තෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො “යො කොචි මුසා භණති, සබ්බො සො දිට්ඨෙව ධම්මෙ දුක්ඛං දොමනස්සං පටිසංවෙදියතී”ති. සච්චං වා තෙ ආහංසු මුසා වාති? මුසා භන්තෙ. යෙ පන තෙ තුච්ඡං මුසා විලපන්ති, සීලවන්තො වා තෙ දුස්සීලා වාති? දුස්සීලා භන්තෙ. යෙ පන තෙ දුස්සීලා පාපධම්මා, මිච්ඡාපටිපන්නා වා තෙ සම්මාපටිපන්නා වාති? මිච්ඡාපටිපන්නා භන්තෙ. යෙ පන තෙ මිච්ඡාපටිපන්නා මිච්ඡාදිට්ඨිකා වා තෙ සම්මාදිට්ඨිකා වාති? මිච්ඡාදිට්ඨිකා භන්තෙ. යෙ පන තෙ මිච්ඡාදිට්ඨිකා, කල්ලන්නු තෙසු පසීදිතුන්ති? නො හෙතං භන්තෙ.

අච්ඡරියං භන්තෙ අබ්භුතං භන්තෙ, අත්ථි මෙ භන්තෙ ආවසථාගාරං, තත්ථ මඤ්චකානි අත්ථි, ආසනානි අත්ථි, උදකමණිකො අත්ථි, තෙලප්පදීපො අත්ථි, තත්ථ යො සමණො වා බ්‍රාහ්මණො වා වාසං උපෙති, තෙනාහං යථාසත්ති යථාබලං සංවිභජාමි.[2] භූතපුබ්බං භන්තෙ, චත්තාරො සත්ථාරො නානාදිට්ඨිකා නානාඛන්තිකා නානාරුචිකා තස්මිං ආවසථාගාරෙ වාසං උපගච්ඡිංසු. එකො සත්ථා එවංවාදී එවංදිට්ඨී: නත්ථි දින්නං, නත්ථි යිට්ඨං නත්ථි හුතං, නත්ථි සුකට-දුක්කටානං කම්මානං ඵලං විපාකො, නත්ථි අයං ලොකො, නත්ථි පරො ලොකො, නත්ථි මාතා, නත්ථි පිතා, නත්ථි සත්තා ඕපපාතිකා, නත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරං ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තීති.

1. හාසෙති – සයා
2. සම්භජාමි - අට්ඨකථා.

ගාමණී, මෙහි මාලා ඇති කොඬොල් ඇති, මැනවින් නෑ සුවඳ විලවුන් ගැල්වුණු සෑදූ කෙස්රැවුල් ඇති ස්ත්‍රීන් සහිත කාමයෙන් රජකු මෙන් ඉඳුරන් පිණවන එකෙක් දක්නා ලැබේ. ඒ මොහු ගැනමෙසේ කියත්: පින්වත, මේ පුරිස් තෙමේ මාලා ඇත්තේ කොඬොල් ඇත්තේ මැනවින් නෑයේ මොනවට සුවඳ විලවුන් ගැල්වූණේ සෑදූ කෙස්රැවුල් ඇත්තේ ස්ත්‍රීන් සහිත කාමයෙන් රජකු මෙන් ඉඳුරන් පිණවයි. (හෙ) කුමක් කෙළේ ද? යි. ඒ මොහුට මෙසේ කියත්: පින්වත, මේ පුරිස් තෙමේ බොරුවෙන් රජු සිනාසෙවීය. රජ තෙමේ සතුටු ව ඔහුට පඬුරු දිනි. එහෙයින් මේ පුරිස් තෙමේ මාලා ඇත්තේ කොඬොල් ඇත්තේ මැනැවින් නෑයේ මොනවට සුවඳ විලවුන් ගැල්වුණේ සෑදූ කෙස්රැවුල් ඇත්තේ ස්ත්‍රීන් සහිත කාමයෙන් රජකු මෙන් ඉඳුරන් පිණවා යි.

ගාමණී, මෙහි දැඩි රැහැණින් පිටිතල හයා දැඩි බැම්මෙන් බැඳ කරයෙන් මුඩු කොට රළුහඬ ඇති බෙරයෙන් යුතු වැ වෙයින් වෙයට සිවුමංසලින් සිවුමංසලට පමුණුවා දකුණු දෙරින් නික්මවා නුවර දකුණු දිග හිස සිඳිනු ලබන එකෙක් දක්නා ලැබේ. ඒ මොහු ගැන මෙසේ කියත්: පින්වත, දැඩි රැහැණින් පිටිතල හයා. දැඩි බැම්මෙන් බැඳ කරයෙන් මුඩු කොට රළුහඬ ඇති බෙරයෙන් යුතු වැ වෙයින් වෙයට සිවුමංසලින් සිවුමංසලට පමුණුවා දකුණු දෙරින් නික්මවා නුවර දකුණු දිග (යමකුගේ) හිස සිඳී නම් මේ පුරුෂ තෙමේ කුමක් කෙළේ ද? යි. ඒ මොහුට මෙසේ කියත්: පින්වත, මේ පුරුෂ තෙමේ ගැහැවියකුට හෝ ගැහැවි පුතකුට හෝ බොරුවෙන් අර්ථහානි කෙළේ ය. එහෙයින් රජහු ඔහු ගෙන මෙබඳු කම්කටුලු කරවති යි. ගාමණී, ඒ කිමැ?යි හඟිවු ද? තොප විසින් මෙබන්දෙක් දක්නා ලද්දේ හෝ අසන ලද්දේ හෝ ද? යි. වහන්ස, අප විසින් දක්නා ලද්දේත් අසන ලද්දේත් අසනු ලබන්නේත් වේ යයි. ගාමණී, එහි යම් ඒ මහණ බමුණු කෙනෙක් "යම් කිසිවෙක් මුසා බෙණේ ද, ඒ සියලු දෙන දිටු දම්යෙහි ම දුක්දෙම්නස් විඳිති" යි මෙබඳු වාද ඇත්තෝ මෙබඳු දෘෂ්ටි ඇත්තෝ වෙත් නම් ඔහු ඇත්ත හෝ මුසා හෝ කියත් ද ?යි. වහන්ස, මුසා ය. යම් ඒ කෙනෙක් හිස් මුසා බෙණෙත් නම් ඔහු සිල්වත්හු හෝ දුසිල්හු ද ?යි. වහන්ස, දුසිල්හු ය. යම් ඒ කෙනෙක් දුසිල්හු නම් පාපස්වභාව ඇත්තාහු නම් ඔහු වරදවා පිළිපන්හු හෝ මැනවින් පිළිපන්හු හෝ ද? යි. වහන්ස, වරදවා පිළිපන්හු ය. යම් ඒ කෙනෙක් වරදවා පිළිපන්හු නම් ඔහු මිසදිටු ඇත්තෝ හෝ සම්දිටු ඇත්තෝ හෝ ද? යි. වහන්ස, මිසදිටු ඇත්තහ. යම් ඒ කෙනෙක් මිසදිටු ඇත්තෝ නම් ඔවුන් කෙරෙහි පහදින්නට සුදුසු ද? යි. වහන්ස, තෙල නො වේ ම ය.

වහන්ස, අසිරියෙකි, පුදුමයෙකි. වහන්ස, මට ආවාස ගෙයක් ඇත. එහි ඇඳන් ඇත, අසුන් ඇත, මහදියසැළක් ඇත, තෙල් පහනක් ඇත. එහි යම් මහණෙක් හෝ බමුණෙක් හෝ වාසයට එළඹේ නම් ඔහු සමග මම හැකි පමණින් බල පමණින් බෙදා ගනිමි. වහන්ස, පෙර වූවක් කියමි. නොයෙක් දිටු ඇති නොයෙක් මත ඇති නොයෙක් රුචි ඇති ශාස්තෘහු සිවුදෙනෙක් ඒ ආවාස ගෙහි විසුමට එළඹියහ. එක් ශාස්තෘවරයෙක් මෙබඳු වාද ඇත්තේ ය, මෙබඳු දෘෂ්ටි ඇත්තේ ය: දෙන ලද්දෙහි විපාක නැත, පුදන ලද්දෙහි විපාක නැත, සත්කාරයෙහි විපාක නැත, සුකෘත දුෂ්කෘත කර්මයන්ගේ ඵලයෙක් විපාකයෙක් නැත, මෙලොවෙක් නැත, පරලොවෙක් නැත, මවෙක් නැත, පියෙක් නැත, ඔපපාතික සත්තු නැත, යම් කෙනෙක් මෙලොවත් පරලොවත් තුමූ වෙසෙසින් දැන පසක් කොට පවසත් නම් මැනවින් ගිය මැනවින් පිළිපන් එබඳු මහණබමුණෝ ලොව නැතැ යි.

එකො සත්ථා එවංවාදී එවංදිට්ඨී: අත්ථි දින්නං අත්ථි යිට්ඨං අත්ථි හුතං අත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො, අත්ථි අයං ලොකො, අත්ථි පරො ලොකො, අත්ථි මාතා, අත්ථි පිතා, අත්ථි සත්තා ඔපපාතිකා, අත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තීති.

එකො සත්ථා එවංවාදී එවංදිට්ඨී: කරතො[1] කාරයතො ඡින්දතො ඡෙදපයතො පචතො පාචයතො සොචයතො කිලමයතො ඵන්දතො ඵන්දපයතො පාණමතිපාතයතො ආදින්නං ආදියතො සන්ධිං ඡින්දතො නිල්ලොපං හරතො එකාගාරිකං කරොතො පරිපන්ථෙ තිට්ඨතො පරදාරං ගච්ඡතො මුසා භණතො කරතො න කරීයති පාපං, ඛුරපරියන්තෙන චෙපි චක්කෙන යො ඉමිස්සා පථවියා පාණෙ එකමංසඛලං එකමංසපුඤ්ජං කරෙය්‍ය, නත්ථි තතොනිදානං පාපං, නත්ථි පාපස්ස ආගමො, දක්ඛිණඤ්චෙපි ගඞ්ගාය තීරං ගච්ඡෙය්‍ය හනන්තො ඝාතෙන්තො ඡින්දන්තො ඡෙදපෙන්තො පචන්තො පාචෙන්තො නත්ථි තතොනිදානං පාපං, නත්ථි පාපස්ස ආගමො, උත්තරඤ්චෙපි ගඞ්ගාය තීරං ගච්ඡෙය්‍ය දදන්තො දපෙන්තො යජන්තො යාජෙන්තො නත්ථි තතොනිදානං පුඤ්ඤං, නත්ථි පුඤ්ඤස්ස ආගමො. දනෙන දමෙන සඤ්ඤමෙන සච්චවජ්ජෙන නත්ථි පුඤ්ඤං නත්ථි පුඤ්ඤස්ස ආගමොති.

එකො සත්ථා එවංවාදී එවංදිට්ඨී: කරතො කාරයතො ඡින්දතො ඡෙදපයතො පචතො පාචයතො සොචයතො කිලමයතො ඵන්දතො ඵන්දපයතො පාණමතිපාතයතො අදින්නං ආදියතො සන්ධිං ඡින්දතො නිල්ලොපං හරතො එකාගාරිකං කරොතො පරිපන්ථෙ තිට්ඨතො පරදාරං ගච්ඡතො මුසා භණතො කරතො කරියති පාපං, ඛුරපරියන්තෙනපි චක්කෙන යො ඉමිස්සා පථවියා පාණෙ එකමංසඛලං එකමංසපුඤ්ජං කරෙය්‍ය, අත්ථි තතොනිදානං පාපං, අත්ථි පාපස්ස ආගමො, දක්ඛිණඤ්චෙපි ගඞ්ගාය[2] තීරං ගච්ඡෙය්‍ය හනන්තො ඝාතෙන්තො ඡින්දන්තො ඡෙදපෙන්තො පචන්තො පාචෙන්තො අත්ථි තතොනිදානං පාපං, අත්ථි පාපස්ස ආගමො, උත්තරඤ්චෙපි ගඞ්ගාය තීරං ගච්ඡෙය්‍ය දදන්තො දපෙන්තො යජන්තො යාජෙන්තො අත්ථි තතොනිදානං පුඤ්ඤං, අත්ථි පුඤ්ඤස්ස ආගමො, දනෙන දමෙන සඤ්ඤමෙන සච්චවජ්ජෙන අත්ථි පුඤ්ඤං අත්ථි පුඤ්ඤස්ස ආගමොති.

තස්ස මය්හං භන්තෙ අහුදෙව කඞ්ඛා අහුදෙව විචිකිච්ඡා: කො සු නාම ඉමෙසං භවතං සමණබ්‍රාහ්මණානං සච්චං ආහ, කො මුසාති.

අලං හි තෙ ගාමණි, කඞ්ඛිතුං, අලං විචිකිච්ඡිතුං, කඞ්ඛනීයෙ ච පන තෙ ඨානෙ විචිකිච්ඡා උප්පන්නාති. එවං පසන්නොහං[3] භන්තෙ භගවති, පහොති මෙ භගවා තථා ධම්මං දෙසෙතුං යථාහං ඉමං කඞ්ඛාධම්මං පජහෙය්‍යන්ති.

---

1. කරොතො – මජසං
2. ගඞ්ගා - සී 1, 2.
3. පසන්නාහං - ස්‍යා

එක් ශාස්තෘවරයෙක් මෙබඳු වාද ඇත්තේ ය, මෙබඳු දෘෂ්ටි ඇත්තේ ය: දෙන ලද්දෙහි විපාක ඇත, පුදන ලද්දෙහි විපාක ඇත, සත්කාරයෙහි විපාක ඇත, සුකෘත දුෂ්කෘත කර්මයන්හි ඵලවිපාක ඇත, මෙලොව ඇත, පරලොව ඇත, මව ඇත, පියා ඇත, ඕපපාතික සත්තු ඇත, යම් කෙනෙක් මෙලොවත් පරලොවත් තුමූ වෙසෙසින් දැන පසක් කොට පවසත් නම් මැනවින් ගිය මැනවින් පිළිපන් එබඳු මහණබමුණෝ ලොව ඇතැ යි.

එක් ශාස්තෘවරයෙක් මෙබඳු වාද ඇත්තේ ය, මෙබඳු දෘෂ්ටි ඇත්තේ ය: කරන්නාට කරවන්නාට සිඳින්නාට සිඳුවන්නාට පිසන්නාට පිසවන්නාට ශෝක කරවන්නාට ක්ලාන්ත කරන්නාට කම්පිත කරන්නාට කම්පිත කරවන්නාට පරපණ නසන්නාට නුදුන් දැ ගන්නාට ගෙවල් බිඳින්නාට ගම් පැහැර ගන්නාට එක්ගෙයක් පැහැර ගන්නාට මං පහරන්නාට පරඹුන් කරා යන්නාට මුසා බණන්නාට කිරීමෙන් පවෙක් නො කෙරේ, ඉදිනුදු කර වැනි නිම්වළලු ඇති සකෙකින් යමෙක් මේ පොළොවෙහි සතුන් එක් මස්ගොඩක් එක් මස් පිඩක් කරන්නේ නම් ඒ හේතු කොටගෙන පවෙක් නැත, පවෙහි ඊමෙක් නැත, ඉදිනුදු නසමින් නස්වමින් සිඳිමින් සිඳුවමින් පිසමින් පිසවමින් දකුණු ගංඉවුරට යන්නේ ද ඒ හේතුවෙන් පවෙක් නැත, පවෙහි ඊමෙක් නැත, ඉදිනුදු දෙමින් දෙවමින් යාග කරමින් යාග කරවමින් උතුරු ගංඉවුරට යන්නේ ද, ඒ හේතුවෙන් පිනෙක් නැත, පිනෙහි ඊමෙක් නැත, දීමෙන් ඉන්ද්‍රියදමනයෙන් සීලසංයමයෙන් සත්‍යවචනයෙන් පිනෙක් නැත, පිනෙහි ඊමෙක් නැතැ යි.

එක් ශාස්තෘවරයෙක් මෙබඳු වාද ඇත්තේ ය, මෙබඳු දෘෂ්ටි ඇත්තේ ය: කරන්නාට කරවන්නාට සිඳින්නාට සිඳුවන්නාට පිසන්නාට පිසවන්නාට ශෝක කරවන්නාට ක්ලාන්ත කරන්නාට කම්පිත කරන්නාට කම්පිත කරවන්නාට පරපණ නසන්නාට නුදුන් දැ ගන්නාට ගෙවල් බිඳින්නාට ගම් පැහැර ගන්නාට එක් ගෙයක් පැහැර ගන්නාට මංපහරන්නාට පරඹුන් කරා යන්නාට මුසා බණන්නාට කිරීමෙන් පවෙක් කෙරේ, කර වැනි නිම්වළලු ඇති සකෙකිනුදු යමෙක් මේ පොළොවෙහි සතුන් එක් මස්ගොඩක් එක් මස්පිඩක් කරන්නේ නම් ඒ හේතුවෙන් පවෙක් ඇත, පවෙහි ඊමෙක් ඇත, ඉදින් නසමින් නස්වමින් සිඳිමින් සිඳුවමින් පිසමින් පිසවමින් දකුණු ගං ඉවුරට යන්නේ ද ඒ හේතුවෙන් පවෙක් ඇත, පවෙහි ඊමෙක් ඇත, ඉදින් දෙමින් දෙවමින් යාග කරමින් යාග කරවමින් උතුරු ගං ඉවුරට යන්නේ ද ඒ හේතුවෙන් පිනෙක් ඇත, පිනෙහි ඊමෙක් ඇත, දීමෙන් ඉන්ද්‍රිය දමනයෙන් ශීලසංයමයෙන් සත්‍යවචනයෙන් පිනෙක් ඇත, පිනෙහි ඊමෙක් ඇතැ යි.

වහන්ස, ඒ මට මේ භවත් මහණබමුණන්ගෙන් කවරෙක් නම් ඇත්ත කියා ද? කවරෙක් බොරු කියා දැ? යි සැකයෙක් වූයේ ම ය, විචිකිච්ඡායෙක් වූයේ මැ යි.

ගාමණි, තොප විසින් සැක කරන්නට නිසි ය, විචිකිච්ඡා කරන්නට නිසි ය. සැක කටයුතු තන්හි තොපට විචිකිච්ඡාව උපනැ යි. වහන්ස, යම්සේ මම මේ සැකය දුරු කරන්නෙම් නම් එසේ මට දහම් දෙසන්නට භාග්‍යවතුන් වහන්සේ පොහෝනා සේකැ යි මෙසේ මම භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පහන්මි යි.

අත්ථි ගාමණි, ධම්මසමාධි. තත්‍ර චෙ ත්වං චිත්තසමාධිං පටිලභෙය්‍යාසි, එවං ත්වං ඉමං කඞ්ඛාධම්මං පජහෙය්‍යාසි. කතමො ච ගාමණි, ධම්මසමාධි: ඉධ ගාමණි, අරියසාවකො පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති, නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූතහිතානුකම්පී විහරති. අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො හොති, කාමෙසු මිච්ඡාචාරං පහාය කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති, මුසාවාදං පහාය මුසාවාද පටිවිරතො හොති, පිසුනං වාචං පහාය පිසුනාය වාචාය පටිවිරතො හොති, ඵරුසං වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතො හොති, සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො හොති, අභිජ්ඣං පහාය අනභිජ්ඣාලු හොති, ව්‍යාපාදපදොසං පහාය අව්‍යාපන්නචිත්තො හොති, මිච්ඡාදිට්ඨිං පහාය සම්මාදිට්ඨිකො හොති.

ස ඛො සො ගාමණි, අරියසාවකො එවං විගතාභිජ්ඣො විගතව්‍යාපාදො අසම්මූළ්හො සම්පජානො පතිස්සතො[1] මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති, තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථිං, ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අව්‍යාපජ්ඣෙන[2] ඵරිත්වා විහරති. සො ඉති පටිසංචික්ඛති: යො'යං සත්ථා එවංවාදී එවංදිට්ඨි: ''නත්ථි දින්නං, නත්ථි යිට්ඨං, නත්ථි හුතං, නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො, නත්ථි අයං ලොකො, නත්ථි පරො ලොකො, නත්ථි මාතා, නත්ථි පිතා, නත්ථි සත්තා ඔපපාතිකා, නත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තී''ති. සචෙ තස්ස හොතො සත්ථුනො සච්චං වචනං අපණ්ණකතාය මය්හං, යො'හං න කිඤ්චි ව්‍යාබාධෙමි තසං වා ථාවරං වා, උභයමෙත්ථ කටග්ගාහො: යඤ්චම්හි කායෙන සංවුතො වාචාය සංවුතො මනසා සංවුතො, යඤ්ච කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජිස්සාමීති. තස්ස පාමුජ්ජං ජායති, පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදියති. සුඛිනො චිත්තං සමාධියති, අයං ඛො සො ගාමණි, ධම්මසමාධි. තත්‍ර චෙ ත්වං චිත්තසමාධිං පටිලභෙය්‍යාසි, එවං ත්වං ඉමං කඞ්ඛාධම්මං පජහෙය්‍යාසි.

ස ඛො සො ගාමණි, අරියසාවකො එවං විගතාභිජ්ඣො විගතව්‍යාපාදො අසම්මූළ්හො සම්පජානො පතිස්සතො[1] මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති, තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථිං, ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අව්‍යාපජ්ඣෙන[2] ඵරිත්වා විහරති.

1. පටිස්සතො - ස්‍යා, මජ්සං.
2. අව්‍යාපජ්ජෙන - සී 2.

ගාමණි, ධම්මසමාධියෙක් ඇත. ඉදින් තෙපි එහි ලා චිත්තසමාධිය පිළිලබන්නහු නම් මෙසේ තෙපි මේ සැකය දුරුකරන්නහු. ගාමණි, ධම්මසමාධිය කවරේ ද යත්: ගාමණි, මෙහි අරිසවු තෙමේ පණිවා පහා පණිවායෙන් වැළකුණේ වෙයි, බහා තැබූ දඬු ඇත්තේ බහා තැබූ අවි ඇත්තේ ලජ්ජා ඇත්තේ දයාවට පැමිණියේ සියලු සතුන් කෙරෙහි හිතානුකම්පා ඇත්තේ වෙසෙයි. අයිනාදන් පහා අයිනාදනින් වැළකුණේ වෙයි. කාමයෙහි මිසහසර පහා කාමයෙහි මිසහසරින් වැළකුණේ වෙයි. මුසවා පහා මුසවායෙන් වැළකුණේ වෙයි. පිසුනු බස පහා පිසුනු බසින් වැළකුණේ වෙයි. රළු වදන පහා රළු වදනින් වැළකුණේ වෙයි. හිස් වදන පහා හිස් වදනින් වැළකුණේ වෙයි. දැඩි ලොබ පහා දැඩි ලොබ නැත්තේ වෙයි. කිපුම් දෙස පහා නොකිපුණු සිත් ඇත්තේ වෙයි. මිසදිටු පහා සම්දිටු ඇත්තේ වෙයි.

ගාමණි, ඒ මේ අරිසවු තෙමේ මෙසේ පහ ව ගිය දැඩි ලොබ ඇතියේ පහ ව ගිය කිපුම් ඇතියේ නුමුළා වූයේ මනා දැනුම් ඇත්තේ සිහි ඇත්තේ මෙත් සහගිය සිතින් එක්දිගක් පතුරුවා වෙසෙයි. දෙවැන්න ද එසේ ය, තෙවැන්න ද එසේ ය, සිවුවැන්න ද එසේ ය. මෙසේ උඩ යට සරස සියලු තැන්හි සියල්ලන් තමා හා සමභාවයෙන් සියලුසතුන් යුත් ලොව දුක් නැති මෙත් සහගිය සිතින් පතුරුවා වෙසේ. හේ මෙසේ නුවණින් සලකා බලයි. යම් මේ ශාස්තෘවරයෙක් "දෙන ලද්දෙහි විපාක නැත, පුදන ලද්දෙහි විපාක නැත, සත්කාරයෙහි විපාක නැත, සුකෘත දුෂ්කෘත කර්‍මයන්ගේ ඵලයෙක් විපාකයෙක් නැත, මෙලොවෙක් නැත, පරලොවෙක් නැත, මවෙක් නැත, පියෙක් නැත, ඕපපාතික සත්තු නැත, යම් කෙනෙක් මෙලොවත් පරලොවත් තුමූ වෙසෙසින් දැන පසක් කොට පවසත් නම් මැනවින් ගිය මැනවින් පිළිපන් එබඳු මහණබමුණෝ ලොව නැත" යි මෙබඳු වාද ඇත්තාහු ද මෙබඳු දෘෂ්ටි ඇත්තාහු ද, ඉදින් ඒ භවත් ශාස්තෘහුගේ වදන ඇත්ත නම් යම්බඳු මම තැති ගන්නා වූ හෝ නොතැති ගන්නා වූ හෝ කිසිවකු නො පෙළම් ද (ඒ පිළිවෙත) මාගේ නිරපරාධබව පිණිස වේ. කයින් සංවෘත වූයෙම් වචනයෙන් සංවෘත වූයෙම් සිතින් සංවෘත වූයෙම් වෙමි යි යන යමෙක් ඇද්ද, කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙන්නෙමි යි යන යමෙකුත් ඇද්ද මෙහිලා දෙක ම ජයගැනීම වේ. ඔහුට ප්‍රමෝදය උපදී. හටගත් ප්‍රමෝද ඇත්තහුට ප්‍රීතිය උපදී. ප්‍රීතිසිත් ඇත්තහුගේ නාම කය සන්හිඳේ. සන්හුන් කය ඇත්තේ සුව විඳියි. සුව ඇත්තහුගේ සිත එකඟවෙයි. ගාමණි, මේ ඒ ධම්මසමාධිය යි. ඉදින් තෙපි එහි ලා චිත්තසමාධිය පිළිලබන්නහු නම් මෙසේ තෙපි මේ සැකය දුරු කරන්නහු.

ගාමණි, ඒ මේ අරිසවු තෙමේ මෙසේ පහ ව ගිය දැඩිලෝබ ඇත්තේ පහ ව ගිය කිපුම් ඇත්තේ නුමුළා වූයේ මනා දැනුම් ඇත්තේ සිහි ඇත්තේ මෙත් සහගිය සිතින් එක්දිගක් පතුරුවා වෙසෙයි. දෙවැන්න ද එසේ ය, තෙවැන්න ද එසේ ය, සිවුවැන්න ද එසේ ය. මෙසේ උඩ යට සරස සියලු තැන්හි සියල්ලන් තමා හා සමභාවයෙන් සියල්ලෙන් යුත් ලොව විපුල වූ මහත්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ නිදුක් වූ මෙත් සහගිය සිතින් පතුරුවා වෙසෙයි.

සො ඉති පටිසංචික්ඛති: යො'යං සත්ථා එවංවාදී එවංදිට්ඨි: "අත්ථි දින්නං, අත්ථි යිට්ඨං, අත්ථි හුතං, අත්ථි සුකතදුක්කටානං කම්මානං ඵලං විපාකො, අත්ථි අයං ලොකො, අත්ථි පරො ලොකො, අත්ථි මාතා, අත්ථි පිතා, අත්ථි සත්තා ඔපපාතිකා, අත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා, යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තී"ති. සචෙ තස්ස භොතො සත්ථුනො[1] සච්චං වචනං, අපණ්ණකතාය මය්හං, සො'හං[2] න කිඤ්චි ව්‍යාබාධෙමි තසං වා ථාවරං වා, උභයමෙත්ථ කටග්ගාහො: යඤ්චම්හි කායෙන සංවුතො වාචාය සංවුතො මනසා සංවුතො, යඤ්ච කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජිස්සාමීති. තස්ස පාමොජ්ජං[3] ජායති, පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදියති, සුඛිනො චිත්තං සමාධියති. අයං ඛො සො ගාමණි, ධම්මසමාධි. තත්‍ර චෙ ත්වං චිත්තසමාධිං පටිලභෙය්‍යාසි, එවං ත්වං ඉමං කඞ්ඛාධම්මං පජහෙය්‍යාසි.

ස ඛො සො ගාමණි, අරියසාවකො එවං විගතාභිජ්ඣො විගතව්‍යාපාදො අසම්මූළ්හො සම්පජානො පතිස්සතො මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති, තථා දුතියං තථා තතියං, තථා චතුත්ථිං. ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අව්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරති. සො ඉති පටිසංචික්ඛති: යො'යං සත්ථා එවංවාදී එවංදිට්ඨි: "කරතො කාරයතො ඡින්දතො ඡෙදාපයතො පචතො පාචයතො සොචයතො කිලමයතො ඵන්දතො ඵන්දාපයතො පාණමතිපාතයතො අදින්නං ආදියතො සන්ධිං ඡින්දතො නිල්ලොපං හරතො එකාගාරිකං කරොතො පරිපන්ථෙ තිට්ඨතො පරදාරං ගච්ඡතො මුසා භණතො කරතො න කරීයති පාපං, ඛුරපරියන්තෙන චෙපි චක්කෙන යො ඉමිස්සා පථවියා පාණෙ එකමංසඛලං එකමංසපුඤ්ජං කරෙය්‍ය, නත්ථි තතො නිදානං පාපං, නත්ථි පාපස්ස ආගමො; දක්ඛිණඤ්චෙපි ගඞ්ගාය තීරං ගච්ඡෙය්‍ය හනන්තො ඝාතෙන්තො ඡින්දන්තො ඡෙදාපෙන්තො පචන්තො පාචෙන්තො නත්ථි තතො නිදානං පාපං, නත්ථි පාපස්ස ආගමො; උත්තරඤ්චෙපි ගඞ්ගාය තීරං ගච්ඡෙය්‍ය දදන්තො දාපෙන්තො යජන්තො යාජෙන්තො නත්ථි තතො නිදානං පුඤ්ඤං, නත්ථි තතො නිදානං පුඤ්ඤස්ස ආගමො; දානෙන දමෙන සඤ්ඤමෙන සච්චවජ්ජෙන නත්ථි පුඤ්ඤං නත්ථි පුඤ්ඤස්ස ආගමො"ති. සචෙ තස්ස භොතො සත්ථුනො සච්චං වචනං, අපණ්ණකතාය මය්හං, සො'හං න කිඤ්චි ව්‍යාබාධෙමි තසං වා ථාවරං වා, උභයමෙත්ථ කටග්ගාහො: යඤ්චම්හි කායෙන සංවුතො වාචාය සංවුතො මනසා සංවුතො, යඤ්ච කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජිස්සාමීති. තස්ස පාමොජ්ජං[3] ජායති, පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදියති සුඛිනො චිත්තං සමාධියති. අයං ඛො සො ගාමණි, ධම්මසමාධි. තත්‍ර චෙ ත්වං චිත්තසමාධිං පටිලභෙය්‍යාසි, එවං ත්වං ඉමං කඞ්ඛාධම්මං පජහෙය්‍යාසි.

1. සත්ථුස්ස - සීමු.
2. යොහං - සීමු.
3. පාමුජ්ජං - සීමු, සයා.

හේ මෙසේ නුවණින් සලකා බලයි, "යම් මේ ශාස්තෘවරයෙක් දෙන ලද්දෙහි විපාක ඇත, පුදන ලද්දෙහි විපාක ඇත, සත්කාරයෙහි විපාක ඇත, සුකෘත දුෂ්කෘත කර්මයන්ගේ ඵලවිපාක ඇත, මෙලොව ඇත, පරලොව ඇත, මව ඇත, පියා ඇත, ඕපපාතික සත්ත්වයෝ ඇත, යම් කෙනෙක් මෙලොවත් පරලොවත් තුමූ වෙසෙසින් දැන පසක් කොට පවසත් නම් මැනවින් ගිය මැනවින් පිළිපන් එබඳු මහණ බමුණෝ ඇතැ" යි මෙබඳු වාද ඇත්තාහු ද මෙබඳු දෘෂ්ටි ඇත්තාහු ද ඉදින් ඒ භවත් ශාස්තෘහුගේ වදන ඇත්ත නම් ඒ මම තැතිගන්නා වූ හෝ නො තැතිගන්නා වූ හෝ කිසිවකු නො පෙළමි. (ඒ පිළිවෙත) මාගේ නිරපරාධබව පිණිස වේ. කයින් සංවෘත වූයෙම් වචනයෙන් සංවෘත වූයෙම් සිතින් සංවෘත වූයෙම් වෙමි යන යමෙක් වේ ද කාබුන් මරණින් මතු සුගතිවූ සගලොවට පැමිණෙන්නෙමි යන යමෙකුත් වේ ද මෙහි ලා දෙක ම ජයගැනීම වේ. ඔහුට ප්‍රමෝදය උපදී. හටගත් ප්‍රමෝද ඇත්තහුට ප්‍රීතිය උපදී. ප්‍රීතිසිත් ඇත්තහුගේ කය සන්හිඳෙයි. සන්හුන් කය ඇත්තේ සුව විඳී. සුව ඇත්තහුගේ සිත එකඟ වෙයි. ගාමණි, මේ ඒ ධර්මසමාධිය යි. ඉදින් තෙපි එහි ලා චිත්තසමාධිය පිළිලබන්නහු නම් මෙසේ තෙපි මේ සැකය දුරු කරන්නහු ය.

ගාමණි, ඒ මේ අරීසවු තෙමේ පහ ව ගිය දැඩි ලොබ ඇත්තේ පහ ව ගිය කිපුම් ඇත්තේ නුමුළා වූයේ මනා දැනුම් ඇත්තේ සිහි ඇත්තේ මෙත් සහගිය සිතින් එක්දිගක් පතුරුවා වෙසෙයි. දෙවැන්න ද එසේ ය, තෙවැන්න ද එසේ ය, සිවුවැන්න ද එසේ ය. මෙසේ උඩ යට සරස සියලු තැන්හි සියල්ලන් තමා හා සමභාවයෙන් සියලුසතුන් යුත් ලොව පැතුරුණු මහත් බවට ගිය නො පමණ වූ වෙර නැති නිදුක් වූ මෙත් සහගිය සිතින් පතුරුවා වෙසෙයි. හේ මෙසේ නුවණින් සලකා බලයි. යම් ඒ ශාස්තෘවරයෙක් "කරන්නාට කරවන්නාට සිඳින්නාට සිඳුවන්නාට පිසන්නාට පිසවන්නාට ශෝක කරවන්නාට ක්ලාන්ත කරන්නාට සලන්නාට සලවන්නාට පරපණ නසන්නාට නුදුන් දෑ ගන්නාට ගෙවල් බිඳින්නාට ගම් පැහැර ගන්නාට එක්ගෙයක් පැහැරගන්නාහට මං පහරන්නාට පරඹුන් කරා යන්නාට මුසා බණන්නාට කිරීමෙන් පවෙක් නො කෙරෙයි. ඉදින් කර වැනි කෙළවර ඇති සකෙකින් යමෙක් මේ පොළවෙහි සතුන් එක්මස් ගොඩක් එක්මස් පිඩක් කරන්නේ නම් ඒ හේතුවෙන් පවෙක් නැත, පවෙහි ඊමෙක් නැත. ඉදින් නසමින් නස්වමින් සිඳිමින් සිඳුවමින් පිසමින් පිසවමින් දකුණු ගංඉවුරට යන්නේ නමුදු ඒ හේතුවෙන් පවෙක් නැත. ඉදින් දෙමින් දෙවමින් යාග කරමින් යාග කරවමින් උතුරු ගංඉවුරට යන්නේ නමුදු ඒ හේතුවෙන් පිනෙක් නැත, පිනෙහි ඊමෙක් නැත. දීමෙන් ඉන්ද්‍රිය දමනයෙන් ශීලසංයමයෙන් සත්‍යවචනයෙන් පිනෙක් නැත, පිනෙහි ඊමෙක් නැතැ" යි මෙබඳු වාද ඇත්තාහු ද මෙබඳු දෘෂ්ටි ඇත්තාහු ද ඉදින් ඒ භවත් ශාස්තෘහුගේ වදන ඇත්ත නම් ඒ මම තැති-ගන්නා වූ හෝ නො තැතිගන්නා වූ හෝ කිසිවකු නො පෙළමි. (ඒ පිළිවෙත) මාගේ නිරපරාධ බව පිණිස වේ. කයින් සංවෘත වූයෙම් වචනයෙන් සංවෘත වූයෙම් සිතින් සංවෘත වූයෙම් වෙමි යන යමෙක් වේ ද, කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙන්නෙමි යන යමෙකුත් වේ ද මෙහිලා දෙක ම ජය ගැනීම වේ. ඔහුට ප්‍රමෝදය උපදී. හටගත් ප්‍රමෝද ඇත්තහුට ප්‍රීතිය උපදී. ප්‍රීති සිත් ඇත්තහුගේ කය සන්හිඳේ. සන්හුන් කය ඇත්තේ සුව විඳියි. සුව ඇත්තහුගේ සිත එකඟ වේ. ගාමණි, මේ ඒ ධම්මසමාධිය යි. ඉදින් එහි ලා තෙපි චිත්තසමාධිය පිළිලබන්නහු නම් මෙසේ තෙපි මේ සැකය දුරු කරන්නහු ය.

ස ඛො සො ගාමණි, අරියසාවකො එවං විගතාභිජ්ඣො විගතව්‍යාපාදො අසම්මූළ්හො සම්පජානො පතිස්සතො මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති, තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථිං. ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අව්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරති. සො ඉති පටිසංචික්ඛති: යො'යං සත්ථා එවංවාදී එවංදිට්ඨි: "කරතො කාරයතො ඡින්දතො ඡෙදාපයතො පචතො පාචයතො සොචයතො කිලමයතො ඵන්දතො ඵන්දාපයතො පාණමතිපාතයතො අදින්නං ආදියතො සන්ධිං ඡින්දතො නිල්ලොපං හරතො එකාගාරිකං කරොතො පරිපන්ථෙ තිට්ඨතො පරදාරං ගච්ඡතො මුසා භණතො කරතො කරියති පාපං. ඛුරපරියන්තෙන චෙපි චක්කෙන යො ඉමිස්සා පථවියා පාණෙ එකමංසඛලං එකමංසපුඤ්ජං කරෙය්‍ය, නත්ථි තතො නිදානං පාපං, නත්ථි පාපස්ස ආගමො. දක්ඛිණඤ්චෙපි ගඞ්ගාය තීරං ගච්ඡෙය්‍ය හනන්තො ඝාතෙන්තො ඡින්දන්තො ඡෙදාපෙන්තො පචන්තො පාචෙන්තො, නත්ථි තතො නිදානං පාපං, නත්ථි පාපස්ස ආගමො. උත්තරඤ්චෙපි ගඞ්ගාය තීරං ගච්ඡෙය්‍ය දදන්තො දාපෙන්තො යජන්තො යාජෙන්තො, නත්ථි තතො නිදානං පුඤ්ඤං, නත්ථි පුඤ්ඤස්ස ආගමො, දානෙන දමෙන සඤ්ඤමෙන සච්චවජ්ජෙන නත්ථි පුඤ්ඤං නත්ථි පුඤ්ඤස්ස ආගමො"ති. සචෙ තස්ස භොතො සත්ථුනො සච්චං වචනං, අපණ්ණකතාය මය්හං; සො'හං න කිඤ්චි ව්‍යාබාධෙමි තසං වා ථාවරං වා, උභයමෙත්ථ කටග්ගාහො, යඤ්චම්හි කායෙන සංවුතො වාචාය සංවුතො මනසා සංවුතො, යඤ්ච කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උප්පජ්ජිස්සාමීති, තස්ස පාමොජ්ජං ජායති, පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදියති, සුඛිනො චිත්තං සමාධියති. අයං ඛො සො ගාමණි, ධම්මසමාධි. තත්‍ර චෙ ත්වං චිත්තසමාධිං පටිලභෙය්‍යාසි, එවං ත්වං ඉමං කඞ්ඛාධම්මං පජහෙය්‍යාසි.

ස ඛො සො ගාමණි, අරියසාවකො එවං විගතාභිජ්ඣො විගතව්‍යාපාදො අසම්මූළ්හො සම්පජානො පතිස්සතො කරුණාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති -පෙ- මුදිතාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති -පෙ-

ස ඛො සො ගාමණි, අරියසාවකො එවං විගතාභිජ්ඣො විගතව්‍යාපාදො අසම්මූළ්හො සම්පජානො පතිස්සතො උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති, තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථිං. ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං උපෙක්ඛාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අව්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරති. සො ඉති පටිසංචික්ඛති: යො'යං සත්ථා එවංවාදී එවංදිට්ඨි: "නත්ථි දින්නං, නත්ථි යිට්ඨං, නත්ථි හුතං, නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො, නත්ථි අයං ලොකො, නත්ථි පරො ලොකො,

ගාමණි, ඒ මේ අරිසවු තෙමේ මෙසේ පහ ව ගිය දැඩි ලොබ ඇත්තේ පහ ව ගිය කිපුම් ඇත්තේ නුමුළා වූයේ මනා දැනුම් ඇත්තේ සිහි ඇත්තේ මෙත් සහගිය සිතින් එක් දිගක් පතුරුවා වෙසෙයි. දෙවැන්න ද එසේ ය, තෙවැන්න ද එසේ ය, සිවුවැන්න ද එසේ ය. මෙසේ උඩ යට සරස සියලු තැන්හි සියල්ලන් තමා හා සමභාවයෙන් සියලු සතුන් යුත් ලොව පැතුරුණු මහත්බවට ගිය නොපමණ වූ වෙර නැති නිදුක් වූ මෙත් සහගිය සිතින් පතුරුවා වෙසෙයි. හෙ මෙසේ නුවණින් සලකා බලයි: "යම් මේ ශාස්තෘවරයෙක් කරන්නාට කරවන්නාට සිඳින්නාට සිඳුවන්නාට පිසන්නාට පිසවන්නාට ශොක කරවන්නාට ක්ලාන්ත කරවන්නාට සලන්නාට සලවන්නාට පරපණ නසන්නාට නුදුන් දෑ ගන්නාට ගෙවල් බිඳින්නාට ගම් පැහැර ගන්නාට එක් ගෙයක් පැහැර ගන්නාට මංපහරන්නාට පරඹුන් වෙත යන්නාට මුසා බණන්නාට කිරීමෙන් පවක් නො කෙරෙයි. ඉදිනුදු කර වැනි නිම්වලලු ඇති සකෙකින් යමෙක් මේ පොළවෙහි සතුන් එක් මස්ගොඩක් එක් මස්පිඩක් කරන්නේ නම් ඒ හෙතුවෙන් පවෙක් ඇත, පවෙහි ඊමෙක් ඇත. ඉදිනුදු නසමින් නස්වමින් සිඳමින් සිඳුවමින් පිසමින් පිසවමින් දකුණු ගංඉවුරට යන්නේ නම් ඒ හෙතුවෙන් පවෙක් ඇත, පවෙහි ඊමෙක් ඇත. ඉදුනුදු දෙමින් දෙවමින් යාග කරමින් යාග කරවමින් උතුරු ගංඉවුරට යන්නේ නම් ඒ හෙතුවෙන් පිනෙක් ඇත, පිනෙහි ඊමෙක් ඇත. දීමෙන් ඉන්ද්‍රිය දමනයෙන් ශීලසංයමයෙන් සත්‍යවචනයෙන් පිනෙක් ඇත, පිනෙහි ඊමෙක් ඇතැ" යි මෙබඳු වාද ඇත්තාහු ද මෙබඳු දෘෂ්ටි ඇත්තාහු ද ඉදින් ඒ හවත් ශාස්තෘහුගේ වදන ඇත්ත නම් ඒ මම තැතිගන්නා වූ හෝ නො තැති ගන්නා වූ හෝ කිසිවකු නො පෙළමි. ඒ පිළිවෙත මාගේ නිරපරාධබව පිණිස වේ. කයින් සංවෘත වූයෙම් වචනයෙන් සංවෘත වූයෙම් සිතින් සංවෘත වූයෙම් වෙමි යන යමෙක් වේ ද, කාබුන් මරණින් මතු සුගතිසගලොවට පැමිණෙන්නෙමි යන යමෙකුත් වේද දෙක ම මෙහි ලා ජයගැනීම වේ. ඔහුට ප්‍රමොදය උපදී. හටගත් ප්‍රමොද ඇත්තහුට ප්‍රීතිය උපදී. ප්‍රීති සිත් ඇත්තහුගේ කය සන්හිඳෙයි සන්හුන් කය ඇත්තේ සුව ඇත්තහුගේ සිත එකඟ වෙයි. ගාමණි, මේ ඒ ධම්මසමාධි යි. ඉදින් එහි ලා තෙපි චිත්තසමාධිය පිළිලබන්නහු නම් මෙසේ තෙපි මේ සැකය දුරු කරන්නහු ය.

ගාමණි, ඒ මේ අරිසවු තෙමේ මෙසේ පහව ගිය දැඩිලොබ ඇත්තේ පහ ව ගිය කිපුම් ඇත්තේ නුමුළා වූයේ මනා දැනුම් ඇත්තේ සිහි ඇත්තේ කුළුණුසහගිය සිතින් එක් දිගක් පතුරුවා වෙසෙයි ... මුදුබැව් සහගිය සිතින් එක්දිගක් පතුරුවා වෙසෙයි ...

ගාමණි, ඒ මේ අරිසවු තෙමේ මෙසේ පහ ව ගිය දැඩිලොබ ඇත්තේ පහ ව ගිය කිපුම් ඇත්තේ නුමුළා වූයේ මනා දැනුම් ඇත්තේ සිහි ඇත්තේ මැදහත්බැව් සහගිය සිතින් එක් දිගක් පතුරුවා වෙසෙයි. දෙවැන්න ද එසේ ය, තෙවැන්න ද එසේ ය, සිවුවැන්න ද එසේ ය. මෙසේ උඩ යට සරස සියලු තැන්හි සියල්ලන් හා සමභාවයෙන් සියලු සතුන් යුත් ලොව පැතුරුණු මහත්බවට ගිය නො පමණ වූ වෙර නැති නිදුක් වූ මැදහත් බැව් සහගිය සිතින් පතුරුවා වෙසෙයි. හෙ මෙසේ නුවණින් සලකා බලයි. යම් මේ ශාස්තෘවරයෙක් "දෙන ලද්දෙහි විපාක නැත, පුදන ලද්දෙහි විපාක නැත, සත්කාරයෙහි විපාක නැත, සුකෘත දුෂ්කෘත කර්මයන්ගේ ඵලයෙක් විපාකයෙක් නැත, මෙලොවෙක් නැත, පරලොවෙක් නැත.

නත්ථි මාතා, නත්ථි පිතා, නත්ථි සත්තා ඔපපාතිකා, නත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තී''ති. සචෙ තස්ස භොතො සත්ථුනො සච්චං වචනං, අපණ්ණකතාය මය්හං, සො'හං න කිඤ්චි ව්‍යාබාධෙමි තසං වා ථාවරං වා. උභයමෙත්ථ කටග්ගාහො: යඤ්චම්හි කායෙන සංවුතො වාචාය සංවුතො මනසා සංවුතො, යඤ්ච කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජිස්සාමීති. තස්ස පාමොජ්ජං ජායති, පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදියති, සුඛිනො චිත්තං සමාධියති. අයං ඛො සො ගාමණි, ධම්මසමාධි. තත්‍ර චෙ ත්වං චිත්තසමාධිං පටිලභෙය්‍යාසි, එවං ත්වං ඉමං කඞ්ඛාධම්මං පජහෙය්‍යාසි.

ස ඛො සො ගාමණි, අරියසාවකො එවං විගතාභිජ්ඣො විගතව්‍යාපාදො අසම්මූළ්හො සම්පජානො පතිස්සතො උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති, තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථිං, ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං උපෙක්ඛාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අව්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරති, සො ඉති පටිසංචික්ඛති: යවා'යං[1] සත්ථා එවංවාදී එවංදිට්ඨී: ''අත්ථි දින්නං, අත්ථි යිට්ඨං, අත්ථි හුතං, අත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො, අත්ථි අයං ලොකො, අත්ථි පරො ලොකො, අත්ථි මාතා, අත්ථි පිතා, අත්ථි සත්තා ඔපපාතිකා, අත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තී''ති, සචෙ තස්ස භොතො සත්ථුනො සච්චං වචනං, අපණ්ණකතාය මය්හං, සො'හං න කිඤ්චි ව්‍යාබාධෙමි තසං වා ථාවරං වා, උභයමෙත්ථ කටග්ගාහො: යඤ්චම්හි කායෙන සංවුතො වාචාය සංවුතො මනසා සංවුතො, යඤ්ච කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජිස්සාමීති. තස්ස පාමොජ්ජං ජායති, පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදියති, සුඛිනො චිත්තං සමාධියති. අයං ඛො සො ගාමණි, ධම්මසමාධි. තත්‍ර චෙ ත්වං චිත්තසමාධිං පටිලභෙය්‍යාසි, එවං ත්වං ඉමං කඞ්ඛාධම්මං පජහෙය්‍යාසි.

---

1. යොයං - මජසං.

මවෙක් නැත, පියෙක් නැත, ඕපපාතික සත්තු නැත, යම් කෙනෙක් මෙලොවත් පරලොවත් තුමූ වෙසෙසින් දැන පසක් කොට පවසත් නම් මැනවින් ගිය මැනවින් පිළිපන් එබඳු මහණබමුණෝ නැතැ'' යි මෙබඳු වාද ඇත්තාහු ද මෙබඳු දෘෂ්ටි ඇත්තාහු ද ඉදින් ඒ භවත් ශාස්තෘහුගේ වදන ඇත්ත නම් ඒ මම තැති ගන්නා වූ හෝ නො තැති ගන්නා වූ හෝ කිසිවකු නො පෙළමි. (ඒ පිළිවෙත) මාගේ නිරපරාධ බව පිණිස වේ. කයින් සංවෘත වූයෙම් වචනයෙන් සංවෘත වූයෙම් සිතින් සංවෘත වූයෙම් වෙමි යන යමෙක් වේ ද කාබුන් මරණින් මතු සුගති වූ සගලොවට පැමිණෙන්නෙමි යන යමෙකුත් වේ ද දෙක ම මෙහි ලා ජය ගැනීම වේ. ඔහුට ප්‍රමෝදය උපදී. හටගත් ප්‍රමෝද ඇත්තහුට ප්‍රීතිය උපදී. ප්‍රීති සිත් ඇත්තහුගේ කය සන්හිඳේ. සන්හුන් කය ඇත්තේ සුව විඳී. සුව ඇත්තහුගේ සිත එකඟ වෙයි. ගාමණි, මේ ඒ චිත්තසමාධි යි. ඉදින් එහි ලා තෙපි චිත්ත සමාධිය පිළිලබන්නහු නම් මෙසේ තෙපි මේ සැකය දුරු කරන්නහු ය.

ගාමණි, ඒ මේ අරිසවු තෙමේ මෙසේ පහ ව ගිය දැඩිලෝබ ඇත්තේ පහ ව ගිය කිපුම් ඇත්තේ නො මුළා වූයේ මනා දැනුම් ඇත්තේ සිහි ඇත්තේ මැදහත්බැව් සහගිය සිතින් එක් දිගක් පතුරුවා වෙසෙයි. දෙවැන්න ද එසේ ය, තෙවැන්න ද එසේ ය, සිවුවැන්න ද එසේ ය. මෙසේ උඩ යට සරස සියලු තැන්හි සියල්ලන් තමා හා සමභාවයෙන් සියලු සතුන් යුත් ලොව පැතුරුණු මහත් බවට ගිය නො පමණ වූ වෙර නැති නිදුක් වූ මැදහත් බැව් සහගිය සිතින් පතුරුවා වෙසෙයි. හේ මෙසේ නුවණින් සලකා බලයි: යම් ඒ ශාස්තෘවරයෙක් ''දෙන ලද්දෙහි විපාක ඇත, පුදන ලද්දෙහි විපාක ඇත, සත්කාරයෙහි විපාක ඇත. සුකෘත දුෂ්කෘත කර්‍මයන්ගේ ඵලවිපාක ඇත, මෙලොව ඇත, පරලොව ඇත, මව ඇත, පියා ඇත, ඕපපාතික සත්තු ඇත, යම් කෙනෙක් මෙලොවත් පරලොවත් තුමූ වෙසෙසින් දැන පසක් කොට පවසත් නම් මැනවින් ගිය මැනවින් පිළිපන් එබඳු මහණබමුණෝ ලොව ඇතැ'' යි මෙබඳු වාද ඇත්තාහු ද මෙබඳු දෘෂ්ටි ඇත්තාහු ද ඉදින් ඒ භවත් ශාස්තෘහුගේ වදන ඇත්ත නම් ඒ මම තැති ගන්නා වූ හෝ නො තැතිගන්නා වූ හෝ කිසිවකු නො පෙළමි. (ඒ පිළිවෙත) මාගේ නිරපරාධබව පිණිස වේ. කයින් සංවෘත වූයෙම් වචනයෙන් සංවෘත වූයෙම් සිතින් සංවෘත වූයෙම් වෙමි යන යමෙක් වේ ද කාබුන් මරණින් මතු සුගති වූ සගලොවට පැමිණෙන්නෙමි යන යමෙකුත් වේ ද දෙක ම මෙහි ලා ජය ගැනීම වේ. ඔහුට ප්‍රමොදය උපදී. හටගත් ප්‍රමෝද ඇත්තහුට ප්‍රීතිය උපදී. ප්‍රීතිසිත් ඇත්තහුගේ කය සන්හිඳෙයි. සන්හුන් කය ඇත්තේ සුව විඳී. සුව ඇත්තහුගේ සිත එකග වෙයි. ගාමණි, මේ ඒ ධම්මසමාධි යි. ඉදින් තෙපි එහි ලා චිත්තසමාධිය පිළිලබන්නහු නාම මෙසේ තෙපි මේ සැකය පහන්නාහු ය.

ස ඛො සො ගාමණි, අරියසාවකො එවං විගතාභිජ්ඣො විගත ව්‍යාපාදො අසම්මූළ්හො සම්පජානො පතිස්සතො උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති, තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථිං. ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං උපෙක්ඛාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අව්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරති. සො ඉති පටිසංචික්ඛති: යවා'යං සත්ථා එවංවාදී එවංදිට්ඨී: ''කරතො කාරයතො ඡින්දතො ඡෙදාපයතො පචතො පාචයතො සොචයතො කිලමයතො ඵන්දතො ඵන්දාපයතො පාණමතිපාතයතො අදින්නං ආදියතො සන්ධිං ඡින්දතො නිල්ලොපං හරතො එකාගාරිකං කරොතො පරිපන්ථෙ තිට්ඨතො පරදාරං ගච්ඡතො මුසා භණතො කරතො න කරීයති පාපං. ඛුරපරියන්තෙන චෙපි චක්කෙන යො ඉමිස්සා පඨවියා පාණෙ එකමංසඛලං එකමංසපුඤ්ජං කරෙය්‍ය, නත්ථි තතො නිදානං පාපං, නත්ථි පාපස්ස ආගමො. දක්ඛිණඤ්චෙපි ගඞ්ගාය තීරං ගච්ඡෙය්‍ය හනන්තො ඝාතෙන්තො ඡින්දන්තො ඡෙදාපෙන්තො පචන්තො පාචෙන්තො, නත්ථි තතො නිදානං පාපං, නත්ථි පාපස්ස ආගමො. උත්තරඤ්චෙපි ගඞ්ගාය තීරං ගච්ඡෙය්‍ය දදන්තො දාපෙන්තො යජන්තො යාජෙන්තො, නත්ථි තතො නිදානං පුඤ්ඤං නත්ථි පුඤ්ඤස්ස ආගමො, දානෙන දමෙන සඤ්ඤමෙන සච්චවජ්ජෙන නත්ථි පුඤ්ඤං නත්ථි පුඤ්ඤස්ස ආගමො''ති. සචෙ තස්ස භොතො සත්ථුනො සච්චං වචනං, අපණ්ණකතාය මය්හං, සො'හං න කිඤ්චි ව්‍යාබාධෙමි තසං වා ථාවරං වා, උභයමෙත්ථ කටග්ගාහො: යඤ්චම්හි කායෙන සංවුතො වාචාය සංවුතො මනසා සංවුතො, යඤ්ච කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජිස්සාමීති. තස්ස පාමොජ්ජං ජායති, පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදියති. සුඛිනො චිත්තං සමාධියති. අයං ඛො සො ගාමණි, ධම්මසමාධි. තත්‍ර චෙ ත්වං චිත්තසමාධිං පටිලභෙය්‍යාසි, එවං ත්වං ඉමං කඞ්ඛාධම්මං පජහෙය්‍යාසි.

ස ඛො සො ගාමණි, අරියසාවකො එවං විගතාභිජ්ඣො විගත ව්‍යාපාදො අසම්මූළ්හො සම්පජානො පතිස්සතො උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති, තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථිං. ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං උපෙක්ඛාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අව්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරති, සො ඉති පටිසංචික්ඛති, යවා'යං සත්ථා එවංවාදී එවංදිට්ඨී: ''කරතො කාරයතො ඡින්දතො

ගාමණි, ඒ මේ අරිසවු තෙමේ මෙසේ පහ ව ගිය දැඩිලෝබ ඇත්තේ පහ ව ගිය කිපුම් ඇත්තේ නුමුළා වූයේ මනා දනුම් ඇත්තේ සිහි ඇත්තේ මැදහත් බැව් සහගිය සිතින් එක්දිගක් පතුරුවා වෙසෙයි. දෙවැන්න ද එසේ ය, තෙවැන්න ද එසේ ය, සිවුවැන්න ද එසේ ය. මෙසේ උඩ යට සරස සියලු තැන්හි සියල්ලන් තමා හා සමභාවයෙන් සියලු සතුන් යුත් ලොව පැතුරුණු මහත් බවට ගිය නොපමණ වූ වෙර නැති නිදුක් වූ මැදහත් බැව් සහගිය සිතින් පතුරුවා වෙසෙයි. හෙ මෙසේ නුවණින් සලකා බලයි: යම් මේ ශාස්තෘවරයෙක් "කරන්නහුට කරවන්නහුට සිඳින්නහුට සිඳුවන්නහුට පිසන්නහුට පිසවන්නහුට ශෝක කරවන්නහුට ක්ලාන්ත කරවන්නහුට සලන්නහුට සලවන්නහුට පරපණ නසන්නහුට නුදුන් දෑ ගන්නහුට ගෙවල් බිඳින්නහුට ගම් පැහැර ගන්නහුට එක්ගෙයක් පැහැර ගන්නහුට මංපහරන්නහුට පරඹුන් වෙත යන්නහුට මුසා බණන්නහුට කිරීමෙන් පවෙක් නො කෙරේ. ඉදින් කර වැනි නිම්වළලු ඇති සකෙකින් යමෙක් මේ පොළොවෙහි සතුන් එක් මස්ගොඩක් එක් මස්පිඩක් කරන්නේ නමුදු ඒ හේතුවෙන් පවෙක් නැත, පවෙහි ඊමෙක් නැත. ඉදින් නසමින් නස්වමින් සිඳමින් සිඳුවමින් පිසමින් පිසවමින් දකුණු ගංඉවුරට යන්නේ නමුදු ඒ හේතුවෙන් පවෙක් නැත, පවෙහි ඊමෙක් නැත. ඉදින් දෙමින් දෙවමින් යාග කරමින් යාග කරවමින් උතුරු ගංඉවුරට යන්නේ නමුදු ඒ හෙතුවෙන් පිනෙක් නැත, පිනෙහි ඊමෙක් නැත. දීමෙන් ඉන්ද්‍රිය දමනයෙන් ශීලසංයමයෙන් සත්‍ය වචනයෙන් පිනෙක් නැත. පිනෙහි ඊමෙක් නැතැ යි මෙබඳු වාද ඇත්තාහු ද මෙබඳු දෘෂ්ටි ඇත්තාහු ද ඉදින් ඒ භවත් ශාස්තෘහුගේ වදන ඇත්ත නම් ඒ මම තැතිගන්නා වූ හෝ නො තැතිගන්නා වූ හෝ කිසිවකු නො පෙළමි (ඒ පිළිවෙත) මාගේ නිරපරාධබව පිණිස වේ. කයින් සංවෘත වූයෙම් වචනයෙන් සංවෘත වූයෙම් සිතින් සංවෘත වූයෙම් වෙමි යන යමෙක් වේ ද කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙන්නෙමි යන යමෙකුත් වේ ද දෙක ම මෙහි ලා ජය ගැනීම වේ. ඔහුට ප්‍රමෝදය උපදී. හටගත් ප්‍රමෝදය ඇත්තහුට ප්‍රීතිය උපදී. ප්‍රීතිසිත් ඇත්තහුගේ කය සන්හිඳෙයි. සන්හුන් කය ඇත්තේ සුව විඳියි. සුව ඇත්තහුගේ සිත එකඟ වෙයි. ගාමණි, මේ ඒ ධම්මසමාධි යි. ඉදින් තෙපි එහිලා චිත්තසමාධිය පිළිලබන්නහු නම් මෙසේ තෙපි මේ සැකය හරනහු ය.

ගාමණි, ඒ මේ අරිසවු තෙමේ මෙසේ පහව ගිය දැඩිලෝබ ඇත්තේ පහව ගිය ව්‍යාපාද ඇත්තේ නුමුළා වූයේ මනා දනුම් ඇත්තේ සිහි ඇත්තේ මැදහත්බැව් සහගිය සිතින් එක් දිගක් පතුරුවා වෙසෙයි. දෙවැන්න ද එසේ ය, තෙවැන්න ද එසේ ය, සිවුවැන්න ද එසේ ය. මෙසේ උඩ යට සරස සියලු තන්හි සියල්ලන් තමා හා සමභාවයෙන් සියලු සතුන් යුත් ලොව පැතුරුණු මහත් බවට ගිය නො පමණ වූ වෙර නැති නිදුක් වූ මැදහත්බැව් සහගිය සිතින් පතුරුවා වෙසෙයි. හෙ මෙසේ නුවණින් සලකා බලයි: යම් මෙ ශාස්තෘවරයෙක් "කරන්නහුට කරවන්නහුට සිඳින්නහුට

ඡෙදාපයතො පචතො පාචයතො සොචයතො කිලමයතො ඵන්දතො ඵන්දාපයතො පාණමතිපාතයතො අදින්නං ආදියතො සන්ධිං ඡින්දතො නිල්ලොපං හරතො එකාගාරිකං කරොතො පරිපන්ථෙ තිට්ඨතො පරදාරං ගච්ඡතො මුසා භණතො කරතො කරීයති පාපං, ඛුරපරියන්තෙන චෙපි චක්කෙන යො ඉමිස්සා පථවියා පාණෙ එකමංසඛලං එකමංසපුඤ්ජං කරෙය්‍ය, අත්ථි තතො නිදානං පාපං අත්ථි පාපස්ස ආගමො. දක්ඛිණඤ්චෙපි ගඞ්ගාය තීරං ගච්ඡෙය්‍ය හනන්තො ඝාතෙන්තො ඡින්දන්තො ඡෙදාපෙන්තො පචන්තො පාචෙන්තො අත්ථි තතො නිදානං පාපං, අත්ථි පාපස්ස ආගමො. උත්තරඤ්චෙපි ගඞ්ගාය තීරං ගච්ඡෙය්‍ය. දදන්තො දාපෙන්තො යජන්තො යාජෙන්තො අත්ථි තතො නිදානං පුඤ්ඤං, අත්ථි පුඤ්ඤස්ස ආගමො, දානෙන දමෙන සඤ්ඤමෙන සච්චවජ්ජෙන අත්ථි පුඤ්ඤං, අත්ථි පුඤ්ඤස්ස ආගමො''ති. සචෙ තස්ස භොතො සත්ථුනො සච්චං වචනං, අපණ්ණකතාය මය්හං, සො'හං න කිඤ්චි ව්‍යාබාධෙමි තසං වා ථාවරං වා උභයමෙත්ථ කටග්ගාහො; යඤ්චම්හි කායෙන සංවුතො වාචාය සංවුතො මනසා සංවුතො යඤ්ච කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජිස්සාමීති. තස්ස පාමොජ්ජං ජායති, පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදියති, සුඛිනො චිත්තං සමාධියති, අයං ඛො සො ගාමණි, ධම්මසමාධි. තත්‍ර චෙ ත්වං චිත්තසමාධිං පටිලභෙය්‍යාසි, එවං ත්වං ඉමං කඞ්ඛාධම්මං පජහෙය්‍යාසීති.

එවං වුත්තෙ පාටලියො ගාමණි භගවන්තං එතදවොච: අභික්කන්තං භන්තෙ, අභික්කන්තං භන්තෙ -පෙ- අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

ගාමණිවග්ගො පඨමො.

තත්‍රුද්දානං:

චණ්ඩො තාලො යොධාජීවො
හත්‍ථස්සාසි ච ඛෙත්තකා,
සඞ්ඛ කුලමණිභද්දකා ච
රාසිය පාටලියෙන තෙරසාති.

ගාමණිසංයුත්තං සමත්තං

සිඳුවන්නහුට පිසන්නහුට පිසවන්නහුට ශෝක කරවන්නහුට ක්ලාන්ත කරවන්නහුට සලන්නහුට සලවන්නහුට පරපණ නසන්නහුට නුදුන් දෑ ගන්නහුට ගෙවල් බිඳින්නහුට ගම්පැහැර ගන්නහුට එක් ගෙයක් පැහැර ගන්නහුට මංපහරන්නහුට පරඹුන් වෙත යන්නහුට මුසා බණන්නහුට කිරීමෙන් පවෙක් කෙරේ. ඉදිනුදු කරවැනි නිම්වලලු ඇති සකෙකින් යමෙක් මේ පොළොවෙහි සතුන් එක් මස්ගොඩක් එක් මස්පිඩක් කරන්නේ නම් ඒ හේතුවෙන් පවෙක් ඇත, පවෙහි ඊමෙක් ඇත. ඉදිනුදු නසමින් නස්වමින් සිදිමින් සිඳුවමින් පිසමින් පිසවමින් දකුණු ගංතෙරට යන්නේ නම් ඒ හේතුවෙන් පවෙක් ඇත, පවෙහි ඊමෙක් ඇත. ඉදිනුදු දෙමින් දෙවමින් යාග කරමින් යාග කරවමින් උතුරු ගංතෙරට යන්නේ නම් ඒ හේතුවෙන් පවෙක් ඇත, පවෙහි ඊමෙක් ඇත. ඉදිනුදු දෙමින් දෙවමින් යාග කරමින් යාග කරවමින් උතුරු ගංතෙරට යන්නේ නම් හේතුවෙන් පිනෙක් ඇත, පිනෙහි ඊමෙක් ඇත. දීමෙන් ඉන්ද්‍රිය දමනයෙන් ශීලසංයමයෙන් සත්‍ය වචනයෙන් පිනෙක් ඇත, පිනෙහි ඊමෙක් ඇතැ යි. මෙබඳු වාද ඇත්තාහු ද මෙබඳු දෘෂ්ටි ඇත්තාහු ද, ඉදින් ඒ භවත් ශාස්තෘහුගේ වදන ඇත්ත නම් යම්බඳු මම තැතිගන්නා වූ හෝ නොතැතිගන්නා වූ හෝ කිසිවකු නො පෙළම් ද (ඒ පිළිවෙත) මාගේ නිරපරාද බව පිණිස වේ. කයින් සංවෘත වූයෙම් වචනයෙන් සංවෘත වූයෙම් සිතින් සංවෘත වූයෙම් වෙමි යන යමෙක් වේ ද කාබුන් මරණින් මතු සුගති සගලොවට පැමිණෙන්නෙමි යන යමෙකුත් වේ ද දෙක ම මෙහි ලා ජය ගැනීම වේ. ඔහුට ප්‍රමෝදය උපදී. හටගත් ප්‍රමෝද ඇත්තහුට ප්‍රීතිය උපදී. ප්‍රීතිසිත් ඇත්තහුගේ කය සන්හිඳෙයි. සන්හුන් කය ඇත්තේ සුව විඳියි. සුව ඇත්තහුගේ සිත එකඟ වෙයි. ගාමණි, මේ ඒ ධම්මසමාධි යි. ඉදින් එහි ලා තෙපි චිත්තසමාධිය පිළිලබන්නහු නම් මෙසේ තෙපි මේ සැකය පහන්නහු යි.

මෙසේ වදළ කල්හි පාටලී ගාමණි තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: වහන්ස, ඉතා මැනවි. වහන්ස, ඉතා මැනවි ... අද පටන් මා දිවිහිමියෙන් සරණ ගිය (උවසුවකු කොට දරණ සේක්වා) යි.

**පළමුවැනි ගාමණිවර්ග යි.**

**එහි සූත්‍රනාමාවලිය:**

චණ්ඩ, තාලපුට, යෝධාජීව, හත්‍ථාරොහ, අස්සාරොහ, අසිබන්ධක, ඛෙත්තූපම, සඞ්ඛධම, කුල, මණිචූළක, භද්‍රක, රාසිය, පාටලිය සූත්‍රය යි තෙළෙසෙකි.

**ගාමණිසංයුත්තය නිමි.**

# 9. අසඞ්ඛතසංයුත්තං

## 1. අසඞ්ඛතවග්ගො

### 9. 1. 1

### කායගතාසතිසුත්තං

428. අසඞ්ඛතඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි අසඞ්ඛතගාමිඤ්ච මග්ගං, තං සුණාථ. කතමඤ්ච භික්ඛවෙ අසඞ්ඛතං: යො භික්ඛවෙ රාගක්ඛයො දොසක්ඛයො මොහක්ඛයො, ඉදං වුච්චති භික්ඛවෙ අසඞ්ඛතං. කතමො ච භික්ඛවෙ අසඞ්ඛතගාමී මග්ගො: කායගතාසති. අයං වුච්චති භික්ඛවෙ අසඞ්ඛතගාමී මග්ගො.

ඉති ඛො භික්ඛවෙ දෙසිතං වො මයා අසඞ්ඛතං දෙසිතො අසඞ්ඛතගාමී මග්ගො. යං භික්ඛවෙ සත්ථාරා කරණීයං සාවකානං හිතෙසිනා අනුකම්පකෙන අනුකම්පං උපාදාය, කතං වො තං මයා එතානි භික්ඛවෙ රුක්ඛමූලානි එතානි සුඤ්ඤාගාරානි, ඣායථ භික්ඛවෙ, මා පමාදත්ථ, මා පච්ඡා විප්පටිසාරිනො අහුවත්ථ, අයං ඛො අම්හාකං අනුසාසනී.

### 9. 1. 2

### සමථවිපස්සනාසුත්තං

429. අසඞ්ඛතඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි අසඞ්ඛතගාමිඤ්ච මග්ගං, තං සුණාථ. කතමඤ්ච භික්ඛවෙ අසඞ්ඛතං: යො භික්ඛවෙ රාගක්ඛයො දොසක්ඛයො මොහක්ඛයො, ඉදං වුච්චති භික්ඛවෙ අසඞ්ඛතං. කතමො ච භික්ඛවෙ අසඞ්ඛතගාමී මග්ගො: සමථො ච විපස්සනා ච, අයං වුච්චති භික්ඛවෙ අසඞ්ඛතගාමී මග්ගො. ඉති ඛො භික්ඛවෙ දෙසිතං වො මයා අසඞ්ඛතං -පෙ- අයං වො අම්හාකං අනුසාසනීති.

### 9. 1. 3

### සවිතක්කසවිචාරසුත්තං

430. අසඞ්ඛතඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි අසඞ්ඛතගාමිඤ්ච මග්ගං, තං සුණාථ. කතමඤ්ච භික්ඛවෙ අසඞ්ඛතං යො භික්ඛවෙ රාගක්ඛයො දොසක්ඛයො මොහක්ඛයො ඉදං වුච්චති භික්ඛවෙ අසඞ්ඛතං. කතමොච භික්ඛවෙ අසඞ්ඛතගාමීමග්ගො සවිතක්කො[1] සවිචාරො සමාධි, අවිතක්කො[2] විචාරමත්තො සමාධි, අවිතක්කො අවිචාරො සමාධි. අයං වුච්චති භික්ඛවෙ අසඞ්ඛතගාමී මග්ගො -පෙ- අනුසාසනීති.

---

1. සවිතක්ක - මජසං. ස්‍යා

අවිතක්ක - මජසං. ස්‍යා

# 9. අසඞ්ඛත සංයුත්තය

## 1. අසඞ්ඛත වර්ගය

### 9. 1. 1

### කායගතාසති සූත්‍රය

428. මහණෙනි, තොපට අසඞ්ඛතය (නිවන) ද අසඞ්ඛත (නිවන්) මඟ ද දේශනා කරන්නෙමි. එය අසවු. මහණෙනි, අසඞ්ඛතය කවරේ ද යත්: මහණෙනි, යම් රාගක්ෂයයෙක් ද්වේෂක්ෂයයෙක් මෝහක්ෂයයෙක් වේ නම් මහණෙනි, මෙය අසඞ්ඛත යි කියනු ලැබේ. මහණෙනි, අසඞ්ඛතමග කවරේ ද යත්: කායගතාසති යි. මහණෙනි, මේ අසඞ්ඛත මඟ යි කියනු ලැබේ.

මහණෙනි, මෙසේ තොපට මා විසින් අසඞ්ඛතය දෙසන ලදි. අසඞ්ඛත මඟ දෙසන ලදී. මහණෙනි, සව්වන්ට හිතවැඩ කැමති අනුකම්පා කරන ශාස්තෘවරයකු විසින් අනුකම්පාව නිසා යමක් කටයුතු නම් එය මවිසින් තොපට කරන ලදි. මහණෙනි, තෙල රුක්මුල් ශූන්‍යාගාර ඇත. මහණෙනි, ධ්‍යාන කරවු, නහමක් පමා වවු, පසු ව නහමක් විපිළිසර වවු. මේ තොපට අපගේ අනුසාසනා යි.

### 9. 1. 2

### සමථවිපස්සනා සූත්‍රය

429. මහණෙනි, තොපට නිවනත් නිවන්මඟත් දෙසන්නෙමි. එය අසවු. මහණෙනි, නිවන කවරේ ද යත්: මහණෙනි, යම් රාගක්ෂයයෙක් ද්වේෂක්ෂයයෙක් මෝහක්ෂයයෙක් වේ ද මහණෙනි, මේ නිවන ය යි කියනු ලැබේ. මහණෙනි, නිවන් මඟ කවරේ ද යත්: සමථය ද විදර්ශනාව ද යන දෙක යි. මහණෙනි, මේ නිවන් මඟ යයි කියනු ලැබේ. මහණෙනි, මෙසේ මා විසින් තොපට නිවන දෙසන ලදි. ... මේ තොපට අපගේ අනුසාසනා යි.

### 9. 1. 3

### සවිතක්කසවිචාර සූත්‍රය

430. මහණෙනි, තොපට නිවනත් නිවන්මඟත් දෙසන්නෙමි. එය අසවු. මහණෙනි, නිවන කවරේ ද යත්: මහණෙනි, යම් රාගක්ෂයයෙක් ද්වේෂක්ෂයයෙක් මෝහක්ෂයයෙක් වේ නම් මහණෙනි, මේ නිවන යි කියනු ලැබේ. මහණෙනි, නිවන්මඟ කවරේ ද යත්: සවිතර්කසවිචාරසමාධි ය අවිතර්කවිචාරමාත්‍රසමාධි ය අවිතර්කඅවිචාර සමාධි යි. මහණෙනි, මේ නිවන්මඟ යි කියනු ලැබේ ... අනුසාසනා යි.

## 9. 1. 4

### සුඤ්ඤතසමාධිසුත්තං

431. කතමො ච භික්ඛවෙ අසඞ්ඛතගාමීමග්ගො: සුඤ්ඤතො සමාධි අනිමිත්තො සමාධි අප්පණිහිතො සමාධි. අයං වුච්චති භික්ඛවෙ අසඞ්ඛතගාමීමග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 1. 5

### සතිපට්ඨානසුත්තං

432. කතමො ච භික්ඛවෙ අසඞ්ඛතගාමීමග්ගො: චත්තාරො සතිපට්ඨානා, අයං වුච්චති භික්ඛවෙ අසඞ්ඛතගාමීමග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 1. 6

### සම්මප්පධානසුත්තං

433. කතමො ච භික්ඛවෙ අසඞ්ඛතගාමීමග්ගො: චත්තාරො සම්මප්පධානා. අයං වුච්චති භික්ඛවෙ අසඞ්ඛතගාමීමග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 1. 7

### ඉද්ධිපාදසුත්තං

434. කතමො ච භික්ඛවෙ අසඞ්ඛතගාමීමග්ගො: චත්තාරො ඉද්ධිපාදා. අයං වුච්චති භික්ඛවෙ අසඞ්ඛතගාමීමග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 1. 8

### ඉන්ද්‍රියසුත්තං

435. කතමො ච භික්ඛවෙ අසඞ්ඛතගාමීමග්ගො: පඤ්චින්ද්‍රියානි. අයං වුච්චති භික්ඛවෙ අසඞ්ඛතගාමීමග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 1. 9

### බලසුත්තං

436. කතමො ච භික්ඛවෙ අසඞ්ඛතගාමීමග්ගො: පඤ්ච බලානි. අයං වුච්චති භික්ඛවෙ අසඞ්ඛතගාමීමග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 1. 10

### බොජ්ඣඞ්ගසුත්තං

437. කතමො ච භික්ඛවෙ අසඞ්ඛතගාමීමග්ගො: සත්ත-බොජ්ඣඞ්ගා. අයං වුච්චති භික්ඛවෙ අසඞ්ඛතගාමීමග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 1. 4

## සුඤ්ඤතසමාධි සූත්‍රය

431. මහණෙනි, නිවන්මඟ කවරේ ද යත්: සුඤ්ඤතසමාධි ය අනිමිත්තසමාධි ය අප්පණිහිතසමාධි යි. මහණෙනි, මේ නිවන්මඟ යි කියනු ලැබේ. ... අනුසාසනා යි.

## 9. 1. 5

## සතිපට්ඨාන සූත්‍රය

432. මහණෙනි, නිවන්මඟ කවරේ ද යත්: සතර සිවටන්හු ය. මහණෙනි, මේ නිවන්මඟ යි කියනු ලැබේ. ... අනුසාසනා යි.

## 9. 1. 6

## සම්මප්පධාන සූත්‍රය

433. මහණෙනි, නිවන්මඟ කවරේ ද යත්: සතර සම්මප්පධාන-යෝ ය. මහණෙනි, මේ නිවන්මඟ යි කියනු ලැබේ. ... අනුසාසනා යි.

## 9. 1. 7

## ඉද්ධිපාද සූත්‍රය

434. මහණෙනි, නිවන්මඟ කවරේ ද යත්: සතර ඉද්ධිපාදයෝ ය. මහණෙනි, මේ නිවන්මඟ යි කියනු ලැබේ. ... අනුසාසනා යි.

## 9. 1. 8

## ඉන්ද්‍රිය සූත්‍රය

435. මහණෙනි, නිවන්මඟ කවරේ ද යත්: පඤ්ච ඉන්ද්‍රියයෝ ය. මහණෙනි, මේ නිවන්මඟ යි කියනු ලැබේ. ... අනුසාසනා යි.

## 9. 1. 9

## බල සූත්‍රය

436. මහණෙනි, නිවන්මඟ කවරේ ද යත්: පඤ්ච බලයෝ ය. මහණෙනි, මේ නිවන්මඟ යි කියනු ලැබේ. ... අනුසාසනා යි.

## 9. 1. 10

## බොජ්ඣඞ්ග සූත්‍රය

437. මහණෙනි, නිවන්මඟ කවරේ ද යත්: සත්ත බොජ්ඣඞ්ග-යෝ ය. මහණෙනි, මේ නිවන්මඟ යි කියනු ලැබේ. ... අනුසාසනා යි.

## 9. 1. 11

### මග්ගඞ්ගසුත්තං

438. කතමො ච භික්ඛවෙ අසඞ්ඛතගාමීමග්ගො අරියො අට්ඨඞ්ගිකො මග්ගො. අයං වුච්චති භික්ඛවෙ අසඞ්ඛතගාමීමග්ගො. ඉති ඛො භික්ඛවෙ දෙසිතං වො මයා අසඞ්ඛතං, දෙසිතො අසඞ්ඛතගාමී මග්ගො යං භික්ඛවෙ සත්ථාරා කරණීයං සාවකානං හිතෙසිනා අනුකම්පකෙන අනුකම්පං උපාදය, කතං වො තං මයා. එතානි භික්ඛවෙ රුක්ඛමූලානි, එතානි සුඤ්ඤාගාරානි, ඣායථ භික්ඛවෙ මා පමාදත්ථ, මා පච්ඡා විප්පටිසාරිනො අහුවත්ථ. අයං වො අම්හාකං අනුසාසනීති.

**අසඞ්ඛතවග්ගො පඨමො.**

**තත්‍රුද්දානං :**

කායසමථ[1] සවිතක්කො
සුඤ්ඤතො සතිපට්ඨානා,
සම්මප්පධානඤ්ච ඉද්ධිපාද
ඉන්ද්‍රියබලබොජ්ඣඞ්ගමග්ගාති.

1. සමාධි - සී 1,2.

## 9. 1. 11

## මග්ගඞ්ග සූත්‍රය

438. මහණෙනි, නිවන්මඟ කවරේ ද යත්: අරිඅටඟිමඟ යි. මහණෙනි, මේ නිවන්මඟ යි කියනු ලැබේ. මහණෙනි, මෙසේ මා විසින් තොපට නිවන දෙසන ලදි. නිවන්මඟ දෙසන ලදි. මහණෙනි, සව්වන් කෙරෙහි හිතවැඩ කැමති අනුකම්පා කරන ශාස්තෘවරයකු විසින් අනුකම්පාව නිසා යමක් කටයුතු නම් මා විසින් එය තොපට කරන ලදි. මහණෙනි, තෙල රුක්මුල් ශූන්‍යාගාර ඇත. මහණෙනි, ධ්‍යාන කරවූ, නහමක් පමා වවූ, පසු ව නහමක් විපිළිසර වවූ. මේ තොපට අපගේ අනුශාසනා යි.

**පළමුවැනි අසඞ්ඛතවර්ග යි.**

**එහි සූත්‍රනාමාවලිය:**

කායගතාසති, සමථ විපස්සනා, සවිතක්කසවිචාර, සුඤ්ඤතසමාධි, සතිපට්ඨාන, සම්මප්පධාන, ඉද්ධිපාද, ඉන්ද්‍රිය, බල, බොජ්ඣඞ්ග, මග්ගඞ්ග යි සූත්‍ර එකොළොසෙකි.

# 2. දුතිය අසඞ්ඛත වග්ගො

## 9. 2. 1

### අසඞ්ඛතසුත්තං

439. අසඞ්ඛතඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි අසඞ්ඛතගාමිඤ්ච මග්ගං, තං සුණාථ. කතමඤ්ච භික්ඛවෙ අසඞ්ඛතං: යො භික්ඛවෙ රාගක්ඛයො දොසක්ඛයො මොහක්ඛයො, ඉදං වුච්චති භික්ඛවෙ අසඞ්ඛතං. කතමො ච භික්ඛවෙ අසඞ්ඛතගාමිමග්ගො: සමථො. අයං වුච්චති භික්ඛවෙ අසඞ්ඛතගාමිමග්ගො.

ඉති ඛො භික්ඛවෙ දෙසිතං වො මයා අසඞ්ඛතං, දෙසිතො අසඞ්ඛතගාමිමග්ගො. යං භික්ඛවෙ සත්ථාරා කරණීයං සාවකානං හිතෙසිනා අනුකම්පකෙන, අනුකම්පං උපාදය. කතං වො තං මයා, එතානි භික්ඛවෙ රුක්ඛමූලානි, එතානි සුඤ්ඤාගාරානි, ඣායථ භික්ඛවෙ, මා පමාදත්ථ, මා පච්ඡා විප්පටිසාරිනො අහුවත්ථ, අයං වො අම්හාකං අනුසාසනීති.

## 9. 2. 2

### විපස්සනාසුත්තං

440. අසඞ්ඛතඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි, අසඞ්ඛතගාමිඤ්ච මග්ගං, තං සුණාථ. කතමඤ්ච භික්ඛවෙ අසඞ්ඛතං: යො භික්ඛවෙ රාගක්ඛයො දොසක්ඛයො මොහක්ඛයො, ඉදං වුච්චති භික්ඛවෙ අසඞ්ඛතං. කතමො ච භික්ඛවෙ අසඞ්ඛතගාමිමග්ගො: විපස්සනා. අයං වුච්චති භික්ඛවෙ අසඞ්ඛතගාමිමග්ගො. ඉති ඛො භික්ඛවෙ දෙසිතං වො මයා අසඞ්ඛතං –පෙ– අයං වො අම්හාකං අනුසාසනීති.

## 9. 2. 3

### සවිතක්කසවිචාරසුත්තං

441. කතමො ච භික්ඛවෙ අසඞ්ඛතගාමි මග්ගො: සවිතක්කො සවිචාරො සමාධි. අයං වුච්චති භික්ඛවෙ අසඞ්ඛතගාමිමග්ගො –පෙ– අනුසාසනීති.

## 9. 2. 4

### අවිතක්කවිචාරමත්තසුත්තං

442. කතමො ච භික්ඛවෙ අසඞ්ඛතගාමිමග්ගො: අවිතක්කො විචාරමත්තො සමාධි, අයං වුච්චති භික්ඛවෙ අසඞ්ඛතගාමිමග්ගො –පෙ– අනුසාසනීතිං

# 2. දුතියඅසඞ්ඛත වර්ගය

## 9. 2. 1

## අසඞ්ඛත සූත්‍රය

439. මහණෙනි, තොපට නිවනත් නිවන් මඟත් දෙසන්නෙමි. එය අසවු. මහණෙනි, නිවන කවරේ ද යත්: මහණෙනි, යම් රාගක්ෂයයෙක් ද්වේෂක්ෂයයෙක් මෝහක්ෂයයෙක් වේ ද, මහණෙනි, මේ නිවනැ යි කියනු ලැබේ. මහණෙනි, නිවන්මඟ කවරේ ද යත්: සමථය යි. මහණෙනි, මේ නිවන්මගැ යි කියනු ලැබේ.

මහණෙනි, මෙසේ තොපට මා විසින් නිවන දෙසන ලදි. නිවන්මඟ දෙසන ලදි. සව්වන්ට හිත වැඩ කැමති අනුකම්පා කරන ශාස්තෘවරයකු විසින් අනුකම්පාව නිසා යමක් කටයුතු නම් එය තොපට මා විසින් කරන ලදි. මහණෙනි, තෙල රුක්මුල් ශූන්‍යාගාර ඇත. මහණෙනි, ධ්‍යාන කරවු, නහමක් පමා වවු, පසු ව නහමක් විපිළිසර වවු. මේ තොපට අපගේ අනුශාසනා යි.

## 9. 2. 2

## විපස්සනා සූත්‍රය

440. මහණෙනි, තොපට නිවනත් නිවන්මඟත් දෙසන්නෙමි. එය අසවු. මහණෙනි, නිවන කවරේ ද යත්: මහණෙනි, යම් රාගක්ෂයයෙක් ද්වේෂක්ෂයයෙක් මෝහක්ෂයයෙක් වේ නම් මහණෙනි, මේ නිවනැ යි කියනු ලැබේ. මහණෙනි, නිවන්මඟ කවරේ ද යත්: විපස්සනා යි. මහණෙනි, මේ නිවන්මඟැ යි කියනු ලැබේ. මහණෙනි, මෙසේ මා විසින් තොපට නිවන දෙසන ලදි ... මේ තොපට අපගේ අනුශාසනා යි.

## 9. 2. 3

## සවිතක්කසවිචාර සූත්‍රය

441. මහණෙනි, නිවන්මඟ කවරේ ද යත්: සවිතක්කසවිචාර සමාධි යි. මහණෙනි, මේ නිවන්මඟැ යි කියනු ලැබේ ... අනුසාසනා යි.

## 9. 2. 4

## අවිතක්කවිචාරමත්ත සූත්‍රය

442. මහණෙනි, නිවන්මඟ කවරේ ද යත්: අවිතක්කවිචාරමත්ත සමාධි යි. මහණෙනි, මේ නිවන් මඟැ යි කියනු ලැබේ ... අනුසාසනා යි.

## 9. 2. 5

## අවිතක්කඅවිචාරසුත්තං

443. කතමො ච භික්ඛවෙ අසඞ්ඛතගාමී මග්ගො: අවිතක්කො අවිචාරො සමාධි. අයං වුච්චති භික්ඛවෙ අසඞ්ඛතගාමිමග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 2. 6

## සුඤ්ඤතසමාධිසුත්තං

444. කතමො ච භික්ඛවෙ අසඞ්ඛතගාමිමග්ගො: සුඤ්ඤතො සමාධි. අයං වුච්චති භික්ඛවෙ අසඞ්ඛතගාමිමග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 2. 7

## අනිමිත්තසමාධිසුත්තං

445. කතමො ච භික්ඛවෙ අසඞ්ඛතගාමිමග්ගො: අනිමිත්තො සමාධි. අයං වුච්චති භික්ඛවෙ අසඞ්ඛතගාමිමග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 2. 8

## අප්පණිහිතසමාධිසුත්තං

446. කතමො ච භික්ඛවෙ අසඞ්ඛතගාමිමග්ගො: අප්පණිහිතො සමාධි, අයං වුච්චති භික්ඛවෙ අසඞ්ඛතගාමිමග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 2. 9

## කායානුපස්සනාසුත්තං

447. කතමො ච භික්ඛවෙ අසඞ්ඛතගාමිමග්ගො: ඉධ භික්ඛවෙ භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං, අයං වුච්චති භික්ඛවෙ අසඞ්ඛතගාමිමග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 2. 10

## වෙදනානුපස්සනාසුත්තං

448. කතමො ච භික්ඛවෙ අසඞ්ඛතගාමිමග්ගො: ඉධ භික්ඛවෙ භික්ඛු වෙදනාසු වෙදනානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං අයං වුච්චති භික්ඛවෙ අසඞ්ඛතගාමිමග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 2. 5

## අවිතක්කඅවිචාර සූත්‍රය

443. මහණෙනි, නිවන්මඟ කවරේ ද යත්: අවිතක්කඅවිචාර සමාධි යි. මහණෙනි මේ නිවන්මඟැ යි කියනු ලැබේ ... අනුසාසනා යි.

## 9. 2. 6

## සුඤ්ඤතසමාධි සූත්‍රය

444. මහණෙනි, නිවන්මඟ කවරේ ද යත්: සුඤ්ඤතසමාධි යි. මහණෙනි, මේ නිවන්මඟැ යි කියනු ලැබේ ... අනුසාසනා යි.

## 9. 2. 7

## අනිමිත්තසමාධි සූත්‍රය

445. මහණෙනි, නිවන්මඟ කවරේ ද යත්: අනිමිත්තසමාධි යි. මහණෙනි, මේ නිවන්මඟැ යි කියනු ලැබේ ... අනුසාසනා යි.

## 9. 2. 8

## අප්පණිහිතසමාධි සූත්‍රය

446. මහණෙනි, නිවන්මඟ කවරේ ද යත්: අප්පණිහිතසමාධි යි. මහණෙනි, මේ නිවන්මඟැ යි කියනු ලැබේ ... අනුසාසනා යි.

## 9. 2. 9

## කායානුපස්සනා සූත්‍රය

447. මහණෙනි, නිවන්මඟ කවරේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ කයෙහි කය අනුව බලනසුලු ව කෙලෙස් තවන වෙර ඇති ව මනා දැනුම් ඇතිව සිහි ඇතිව කායලෝකයෙහි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසෙයි. මහණෙනි, මේ නිවන්මඟැ යි කියනු ලැබේ ... අනුසාසනා යි.

## 9. 2. 10

## වේදනානුපස්සනා සූත්‍රය

448. මහණෙනි, නිවන්මඟ කවරේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ වේදනායෙහි, වේදනා අනුව බලනසුලු ව කෙලෙස් තවන වෙර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව වෙදනා ලෝකයෙහි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසෙයි. මහණෙනි, මේ නිවන්මඟැ යි කියනු ලැබේ ... අනුසාසනා යි.

## 9. 2. 11

### චිත්තානුපස්සනාසුත්තං

449. කතමො ච භික්ඛවෙ අසඞ්ඛතගාමීමග්ගො: ඉධ භික්ඛවෙ භික්ඛු චිත්තෙ චිත්තානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දොමනස්සං. අයං වුච්චති භික්ඛවෙ අසඞ්ඛතගාමී මග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 2. 12

### ධම්මානුපස්සනාසුත්තං

450. කතමො ච භික්ඛවෙ අසඞ්ඛතගාමීමග්ගො: ඉධ භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං, අයං වුච්චති භික්ඛවෙ අසඞ්ඛත-ගාමීමග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 2. 13

### පඨමසම්මප්පධානසුත්තං

451. කතමො ච භික්ඛවෙ අසඞ්ඛතගාමීමග්ගො: ඉධ භික්ඛවෙ භික්ඛු අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. අයං වුච්චති භික්ඛවෙ අසඞ්ඛතගාමී මග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 2. 14

### දුතියසම්මප්පධානසුත්තං

452. කතමො ච භික්ඛවෙ අසඞ්ඛතගාමී මග්ගො: ඉධ භික්ඛවෙ භික්ඛු උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. අයං වුච්චති භික්ඛවෙ අසඞ්ඛතගාමී මග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 2. 15

### තතියසම්මප්පධානසුත්තං

453. කතමො ච භික්ඛවෙ අසඞ්ඛතගාමීමග්ගො: ඉධ භික්ඛවෙ භික්ඛු අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති -පෙ- අයං වුච්චති භික්ඛවෙ අසඞ්ඛතගාමී මග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 2. 11

## චිත්තානුපස්සනා සූත්‍රය

449. මහණෙනි, නිවන්මඟ කවරේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ සිත්හි සිත අනුව බලනසුලු ව කෙලෙස් තවන වෙර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව සිත්ලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසෙයි. මහණෙනි, මේ නිවන්මඟැ යි කියනු ලැබේ ... අනුසාසනා යි.

## 9. 2. 12

## ධම්මානුපස්සනා සූත්‍රය

450. මහණෙනි, නිවන්මඟ කවරේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ දහම්හි දහම් අනුව බලනසුලු ව කෙලෙස් තවන වෙර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇතිව දහම්ලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසෙයි, මහණෙනි, මේ නිවන්මඟැයි කියනු ලැබේ ... අනුසාසනා යි.

## 9. 2. 13

## පඨමසම්මප්පධාන සූත්‍රය

451. මහණෙනි, නිවන්මඟ කවරේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ නූපන් ලාමක අකුසල් දහම් නූපදවීම පිණිස ඡන්දය දනවයි, වෑයම් කෙරෙයි, වෙර පවත්වයි, සිත දැඩි කොට ගනී, ප්‍රධන් වීර්‍ය්‍යය කෙරෙයි. මහණෙනි, මේ නිවන් මඟැ යි කියනු ලැබේ ... අනුසාසනා යි.

## 9. 2. 14

## දුතිය සම්මප්පධාන සූත්‍රය

452. මහණෙනි, නිවන්මඟ කවරේ ද යත්: මහණෙනි මෙසස්නෙහි මහණ උපන් ලාමක අකුසල් දහම් ප්‍රහාණය පිණිස ඡන්දය දනවයි, වෑයම් කෙරෙයි, වෙර පවත්වයි, සිත තර කොට ගනී, ප්‍රධන්වීර්‍ය්‍යය කෙරෙයි. මහණෙනි, මේ නිවන්මඟැ යි කියනු ලැබේ .... අනුසාසනා යි.

## 9. 2. 15

## තතිය සම්මප්පධාන සූත්‍රය

453. මහණෙනි, නිවන්මඟ කවරේ ද යත්: මහණෙනි මෙසස්නෙහි මහණ නූපන් කුසල් දහම් ඉපදවීම පිණිස ඡන්දය දනවයි, වෑයම් කෙරෙයි. වෙර පවත්වයි ... මහණෙනි, මේ නිවන්මඟැ යි කියනු ලැබේ ... අනුසාසනා යි.

## 9. 2. 16

## චතුත්ථසම්මප්පධානසුත්තං

454. කතමො ච භික්ඛවෙ අසඞ්ඛතගාමීමග්ගො: ඉධ භික්ඛවෙ භික්ඛු උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති -පෙ- අයං වුච්චති භික්ඛවෙ අසඞ්ඛතගාමීමග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 2. 17

## ඡන්දිද්ධිපාදසුත්තං

455. කතමො ච භික්ඛවෙ අසඞ්ඛතගාමීමග්ගො ඉධ භික්ඛවෙ භික්ඛු ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති, අයං වුච්චති භික්ඛවෙ අසඞ්ඛතගාමීමග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 2. 18

## විරියිද්ධිපාදසුත්තං

456. කතමො ච භික්ඛවෙ අසඞ්ඛතගාමීමග්ගො ඉධ භික්ඛවෙ භික්ඛු විරියසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. අයං වුච්චති භික්ඛවෙ අසඞ්ඛතගාමීමග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 2. 19

## චිත්තිද්ධිපාදසුත්තං

457. කතමො ච භික්ඛවෙ අසඞ්ඛතගාමීමග්ගො: ඉධ භික්ඛවෙ භික්ඛු චිත්තසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. අයං වුච්චති භික්ඛවෙ අසඞ්ඛතගාමී මග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 2. 20

## වීමංසිද්ධිපාදසුත්තං

458. කතමො ච භික්ඛවෙ අසඞ්ඛතගාමීමග්ගො ඉධ භික්ඛවෙ භික්ඛු වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. අයං වුච්චති භික්ඛවෙ අසඞ්ඛගගාමීමග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 2. 16

## චතුත්ථ සම්මප්පධාන සූත්‍රය

454. මහණෙනි, නිවන්මඟ කවරේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ උපන් කුසල් දහමුන්ගේ පැවැත්ම පිණිස නුමුළා බව පිණිස බොහෝ බව පිණිස විපුලබව පිණිස භාවනාවෙහි පිරීම පිණිස ඡන්දය දනවයි මහණෙනි මේ නිවන්මඟැ යි කියනු ලැබේ .. අනුසාසනා යි.

## 9. 2. 17

## ඡන්දිද්ධිපාද සූත්‍රය

455. මහණෙනි, නිවන්මඟ කවරේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ ඡන්දය අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක්ප්‍රධානවීර්‍ය්‍යයෙන් සමන්විත ඉද්ධිපාදය වඩයි. මහණෙනි, මේ නිවන්මඟැ යි කියනු ලැබේ... අනුසාසනා යි.

## 9. 2. 18

## විරියිද්ධිපාද සූත්‍රය

456. මහණෙනි, නිවන්මඟ කවරේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ වීර්‍ය්‍යය ප්‍රධාන කොට ඇති සමාධියෙන් හා සම්‍යක්ප්‍රධානවීර්‍ය්‍යයෙන් සමන්විත ඉද්ධිපාදය වඩයි. මහණෙනි, මේ නිවන්මඟැ යි කියනු ලැබේ. ... අනුසාසනා යි.

## 9. 2. 19

## චිත්තිද්ධිපාද සූත්‍රය

457. මහණෙනි, නිවන්මඟ කවරේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ සිත ප්‍රධාන කොට ඇති සමාධියෙන් හා සම්‍යක්ප්‍රධානවීර්‍ය්‍යයෙන් සමන්විත ඉද්ධිපාදය වඩයි. මහණෙනි, මේ නිවන්මඟැ යි කියනු ලැබේ... අනුසාසනා යි.

## 9. 2. 20

## වීමංසිද්ධිපාද සූත්‍රය

458. මහණෙනි, නිවන්මඟ කවරේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ ප්‍රඥාව ප්‍රධාන කොට ඇති සමාධියෙන් හා සම්‍යක්ප්‍රධාන වීර්‍ය්‍යයෙන් සමන්විත ඉද්ධිපාදය වඩයි. මහණෙනි, මේ නිවන්මඟැ යි කියනු ලැබේ ... අනුසාසනා යි.

## 9. 2. 21

### සද්ධින්ද්‍රියසුත්තං

459. කතමො ච භික්ඛවෙ අසඞ්ඛතගාමී මග්ගො: ඉධ භික්ඛවෙ භික්ඛු සද්ධින්ද්‍රියං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං, අයං වුච්චති භික්ඛවෙ අසඞ්ඛතගාමී මග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 2. 22

### විරියින්ද්‍රියසුත්තං

460. කතමො ච භික්ඛවෙ අසංඛතගාමී මග්ගො: ඉධ භික්ඛවෙ භික්ඛු විරියින්ද්‍රියං භාවෙති විවෙකනිස්සිතං -පෙ- අයං වුච්චති භික්ඛවෙ අසංඛතගාමී මග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 2. 23

### සතින්ද්‍රියසුත්තං

461. කතමො ච භික්ඛවෙ අසංඛතගාමී මග්ගො: ඉධ භික්ඛවෙ භික්ඛු සතින්ද්‍රියං භාවෙති විවෙකනිස්සිතං -පෙ- අයං වුච්චති භික්ඛවෙ අසංඛතගාමී මග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 2. 24

### සමාධින්ද්‍රියසුත්තං

462. කතමො ච භික්ඛවෙ අසංඛතගාමී මග්ගො: ඉධ භික්ඛවෙ භික්ඛු සමාධින්ද්‍රියං භාවෙති විවෙකනිස්සිතං -පෙ- අයං වුච්චති භික්ඛවෙ අසංඛතගාමී මග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 2. 25

### පඤ්ඤින්ද්‍රියසුත්තං

463. කතමො ච භික්ඛවෙ අසංඛතගාමී මග්ගො: ඉධ භික්ඛවෙ භික්ඛු පඤ්ඤින්ද්‍රියං භාවෙති විවෙකනිස්සිතං -පෙ- අයං වුච්චති භික්ඛවෙ අසංඛතගාමී මග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 2. 26

### සද්ධාබලසුත්තං

464. කතමො ච භික්ඛවෙ අසංඛතගාමී මග්ගො: ඉධ භික්ඛවෙ භික්ඛු සද්ධාබලං භාවෙති විවෙකනිස්සිතං -පෙ- අයං වුච්චති භික්ඛවෙ අසංඛතගාමීමග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 2. 21

## සද්ධින්ද්‍රිය සූත්‍රය

459. මහණෙනි නිවන්මඟ කවරේ ද යත්: මහණෙනි මෙසස්නෙහි මහණ විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරොධය ඇසුරු කළ නිවනට නැමුණු සද්ධින්ද්‍රිය වඩයි. මහණෙනි මේ නිවන්මඟැ යි කියනු ලැබේ ... අනුසාසනා යි.

## 9. 2. 22

## විරියින්ද්‍රිය සූත්‍රය

460. මහණෙනි නිවන්මඟ කවරේ ද යත් : මහණෙනි මෙසස්නෙහි මහණ විවේකය ඇසුරු කළ ... විරියින්ද්‍රිය වඩයි. මහණෙනි මේ නිවන්-මඟැ යි කියනු ලැබේ ... අනුසාසනා යි.

## 9. 2. 23

## සතින්ද්‍රිය සූත්‍රය

461. මහණෙනි නිවන්මඟ කවරේ ද යත් : මහණෙනි මෙසස්නෙහි මහණ විවේකය ඇසුරු කළ ... සතින්ද්‍රිය වඩයි. මහණෙනි මේ නිවන් මඟැ යි කියනු ලැබේ ... අනුසාසනා යි.

## 9. 2. 24

## සමාධින්ද්‍රිය සූත්‍රය

462. මහණෙනි නිවන්මඟ කවරේ ද යත් : මහණෙනි මෙසස්නෙහි මහණ විවේකය ඇසුරු කළ ... සමාධින්ද්‍රිය වඩයි. මහණෙනි මේ නිවන් මඟැ යි කියනු ලැබේ ... අනුසාසනා යි.

## 9. 2. 25

## පඤ්ඤින්ද්‍රිය සූත්‍රය

463. මහණෙනි නිවන්මඟ කවරේ ද යත් : මහණෙනි මෙසස්නෙහි මහණ විවේකය ඇසුරු කළ ... පඤ්ඤින්ද්‍රිය වඩයි. මහණෙනි මේ නිවන්මඟැ යි කියනු ලැබේ .. අනුසාසනා යි.

## 9. 2. 26

## සද්ධාබල සූත්‍රය

464. මහණෙනි නිවන්මඟ කවරේ ද යත්: මහණෙනි මෙසස්නෙහි මහණ විවේකය ඇසුරු කළ ... සද්ධාබලය වඩයි. මහණෙනි මේ නිවන්මඟැ යි කියනු ලැබේ. ... අනුසාසනා යි.

## 9. 2. 27

### විරියබලසුත්තං

465. කතමො ච භික්ඛවෙ අසංඛතගාමී මග්ගො: ඉධ භික්ඛවෙ භික්ඛු විරියබලං භාවෙති විවෙකනිස්සිතං -පෙ- අයං වුච්චති භික්ඛවෙ අසංඛතගාමී මග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 2. 28

### සතිබලසුත්තං

466. කතමො ච භික්ඛවෙ අසංඛතගාමී මග්ගො: ඉධ භික්ඛවෙ භික්ඛු සතිබලං භාවෙති විවෙකනිස්සිතං -පෙ- අයං වුච්චති භික්ඛවෙ අසංඛතගාමී මග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 2. 29

### සමාධිබලසුත්තං

467 කතමො ච භික්ඛවෙ අසංඛතගාමී මග්ගො: ඉධ භික්ඛවෙ භික්ඛු සමාධිබලං භාවෙති විවෙකනිස්සිතං -පෙ- අයං වුච්චති භික්ඛවෙ අසංඛතගාමී මග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 2. 30

### පඤ්ඤාබලසුත්තං

468. කතමො ච භික්ඛවෙ අසංඛතගාමී මග්ගො: ඉධ භික්ඛවෙ භික්ඛු පඤ්ඤාබලං භාවෙති විවෙකනිස්සිතං -පෙ- අයං වුච්චති භික්ඛවෙ අසංඛතගාමී මග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 2. 31

### සතිසම්බොජ්ඣඞ්ගසුත්තං

469. කතමො ච භික්ඛවෙ අසංඛතගාමී මග්ගො: ඉධ භික්ඛවෙ භික්ඛු සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං -පෙ- අයං වුච්චති භික්ඛවෙ අසංඛතගාමී මග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 2. 32

### ධම්මවිචය සම්බොජ්ඣඞ්ගසුත්තං

470. කතමො ච භික්ඛවෙ අසංඛතගාමී මග්ගො: ඉධ භික්ඛවෙ භික්ඛු ධම්මවිචයසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං -පෙ- අයං වුච්චති භික්ඛවෙ අසංඛතගාමී මග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 2. 27

## විරියබල සූත්‍රය

465. මහණෙනි නිවන්මඟ කවරේ ද යත්: මහණෙනි මෙසස්නෙහි මහණ විවේකය ඇසුරු කළ ... විරියබලය වඩයි. මහණෙනි මේ නිවන් මඟැ යි කියනු ලැබේ. ... අනුසාසනා යි.

## 9. 2. 28

## සතිබල සූත්‍රය

466. මහණෙනි නිවන්මඟ කවරේ ද යත්: මහණෙනි මෙහි මහණ විවේකය ඇසුරු කළ ... සතිබලය වඩයි. මහණෙනි මේ නිවන් මඟැ යි කියනු ලැබේ ... අනුසාසනා යි.

## 9. 2. 29

## සමාධිබල සූත්‍රය

467. මහණෙනි නිවන්මඟ කවරේ ද යත්: මහණෙනි මෙසස්නෙහි මහණ විවේකය ඇසුරු කළ ... සතිබලය වඩයි. මහණෙනි මේ නිවන් මඟැ යි කියනු ලැබේ ... අනුසාසනා යි.

## 9. 2. 30

## පඤ්ඤාබල සූත්‍රය

468 මහණෙනි නිවන්මඟ කවරේ ද යත්: මහණෙනි මෙසස්නෙහි මහණ විවේකය ඇසුරු කළ ... පඤ්ඤාබලය වඩයි. මහණෙනි මේ නිවන්මඟැ යි කියනු ලැබේ ... අනුසාසනා යි.

## 9. 2. 31

## සතිසම්බොජ්ඣඞ්ග සූත්‍රය

469. මහණෙනි නිවන්මඟ කවරේ දය ත්: මහණෙනි මෙසස්නෙහි මහණ විවේකය ඇසුරු කළ ... සතිසම්බොජ්ඣඞ්ගය වඩයි. මහණෙනි මේ නිවන් මඟැ යි කියනු ලැබේ. ... අනුසාසනා යි.

## 9. 2. 32

## ධම්මවිචයසම්බොජ්ඣඞ්ග සූත්‍රය

470 මහණෙනි නිවන්මඟ කවරේ ද යත්: මහණෙනි මෙසස්නෙහි මහණ විවේකය ඇසුරු කළ ... ධම්මවිචයසම්බොජ්ඣඞ්ගය වඩයි. මහණෙනි මේ නිවන්මඟැ යි කියනු ලැබේ .... අනුසාසනා යි.

## 9. 2. 33

### විරියසම්බොජ්ඣඞ්ගසුත්තං

471. කතමො ච භික්ඛවෙ අසංඛතගාමී මග්ගො: ඉධ භික්ඛවෙ භික්ඛු විරියසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං -පෙ- අයං වුච්චති භික්ඛවෙ අසංඛතගාමී මග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 2. 34

### පීතිසම්බොජ්ඣඞ්ගසුත්තං

472. කතමො ච භික්ඛවෙ අසංඛතගාමී මග්ගො: ඉධ භික්ඛවෙ භික්ඛු පීතිසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං -පෙ- අයං වුච්චති භික්ඛවෙ අසංඛතගාමී මග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 2. 35

### පස්සද්ධිසම්බොජ්ඣඞ්ගසුත්තං

473. කතමො ච භික්ඛවෙ අසංඛතගාමී මග්ගො: ඉධ භික්ඛවෙ භික්ඛු පස්සද්ධිසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං -පෙ- අයං වුච්චති භික්ඛවෙ අසංඛතගාමී මග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 2. 36

### සමාධිසම්බොජ්ඣඞ්ගසුත්තං

474. කතමො ච භික්ඛවෙ අසංඛතගාමී මග්ගො: ඉධ භික්ඛවෙ භික්ඛු සමාධිසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං -පෙ- අයං වුච්චති භික්ඛවෙ අසංඛතගාමී මග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 2. 37

### උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගසුත්තං

475. කතමො ච භික්ඛවෙ අසංඛතගාමී මග්ගො: ඉධ භික්ඛවෙ භික්ඛු උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං -පෙ- අයං වුච්චති භික්ඛවෙ අසංඛතගාමී මග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 2. 38

### සම්මාදිට්ඨිසුත්තං

476. කතමො ච භික්ඛවෙ අසංඛතගාමී මග්ගො: ඉධ භික්ඛවෙ භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති විවෙකනිස්සිතං -පෙ- අයං වුච්චති භික්ඛවෙ අසංඛතගාමී මග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 2. 33

## විරියසම්බොජ්ඣඞ්ග සූත්‍රය

471. මහණෙනි නිවන්මඟ කවරේ ද යත්: මහණෙනි මෙසස්නෙහි මහණ විවේකය ඇසුරු කළ ... විරියසම්බොජ්ඣඞ්ගය වඩයි. මහණෙනි මේ නිවන්මඟැ යි කියනු ලැබෙ ... අනුසාසනා යි.

## 9. 2. 34

## පීතිසම්බොජ්ඣඞ්ග සූත්‍රය

472. මහණෙනි නිවන්මඟ කවරේ ද යත්: මහණෙනි මෙසස්නෙහි මහණ විවේකය ඇසුරු කළ ... පීතිසම්බොජ්ඣඞ්ගය වඩයි. මහණෙනි, මේ නිවන්මඟැ යි කියනු ලැබෙ ... අනුසාසනා යි.

## 9. 2. 35

## පස්සද්ධිසම්බොජ්ඣඞ්ග සූත්‍රය

473. මහණෙනි නිවන්මඟ කවරේ ද? යත්: මහණෙනි මෙසස්නෙහි මහණ විවේකය ඇසුරු කළ ... පස්සද්ධිසම්බොජ්ඣඞ්ගය වඩයි. මහණෙනි මේ නිවන් මඟැ යි කියනු ලැබෙ ... අනුසාසනා යි.

## 9. 2. 36

## සමාධිසම්බොජ්ඣඞ්ග සූත්‍රය

474. මහණෙනි නිවන්මඟ කවරේ ද යත්: මහණෙනි මෙසස්නෙහි මහණ විවේකය ඇසුරු කළ ... සමාධිසම්බොජ්ඣඞ්ගය වඩයි. මහණෙනි මේ නිවන්මඟැ යි කියනු ලැබෙ .. අනුසාසනා යි.

## 9. 2. 37

## උපෙක්ඛාසම්බොජ්ඣඞ්ග සූත්‍රය

475. මහණෙනි නිවන්මඟ කවරේ ද යත්: මහණෙනි මෙසස්නෙහි මහණ විවේකය ඇසුරු කළ...උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වඩයි. මහණෙනි මේ නිවන්මඟැ යි කියනු ලැබෙ ... අනුසාසනා යි.

## 9. 2. 38

## සම්මාදිට්ඨි සූත්‍රය

476. මහණෙනි නිවන්මඟ කවරේ ද යත්: මහණෙනි මෙසස්නෙහි මහණ විවේකය ඇසුරු කළ ... සම්මාදිට්ඨිය වඩයි. මහණෙනි මේ නිවන්මඟැ යි කියනු ලැබෙ ... අනුසාසනා යි.

## 9. 2. 39

### සම්මාසඞ්කප්පසුත්තං

477. කතමො ච භික්ඛවෙ අසංඛතගාමී මග්ගො: ඉධ භික්ඛවෙ භික්ඛු සම්මාසඞ්කප්පං භාවෙති විවෙකනිස්සිතං -පෙ- අයං වුච්චති භික්ඛවෙ අසංඛතගාමී මග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 2. 40

### සම්මාවාචාසුත්තං

478. කතමො ච භික්ඛවෙ අසංඛතගාමී මග්ගො: ඉධ භික්ඛවෙ භික්ඛු සම්මාවාචං භාවෙති විවෙකනිස්සිතං -පෙ- අයං වුච්චති භික්ඛවෙ අසංඛතගාමී මග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 2. 41

### සම්මාකම්මන්තසුත්තං

479. කතමො ච භික්ඛවෙ අසංඛතගාමී මග්ගො: ඉධ භික්ඛවෙ භික්ඛු සම්මාකම්මන්තං භාවෙති විවෙකනිස්සිතං -පෙ- අයං වුච්චති භික්ඛවෙ අසංඛතගාමී මග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 2. 42

### සම්මාආජීවසුත්තං

480. කතමො ච භික්ඛවෙ අසංඛතගාමී මග්ගො: ඉධ භික්ඛවෙ භික්ඛු සම්මාආජීවං භාවෙති විවෙකනිස්සිතං -පෙ- අයං වුච්චති භික්ඛවෙ අසංඛතගාමී මග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 2. 43

### සම්මාවායාමසුත්තං

481. කතමො ච භික්ඛවෙ අසංඛතගාමී මග්ගො: ඉධ භික්ඛවෙ භික්ඛු සම්මාවායාමං භාවෙති විවෙකනිස්සිතං -පෙ- අයං වුච්චති භික්ඛවෙ අසංඛතගාමී මග්ගො -පෙ- අනුසාසනීති.

## 9. 2. 44

### සම්මාසතිසුත්තං

482. කතමො ච භික්ඛවෙ අසංඛතගාමී මග්ගො: ඉධ භික්ඛවෙ භික්ඛු සම්මාසතිං භාවෙති විවෙකනිස්සිතං -පෙ- අයං වුච්චති භික්ඛවෙ අසංඛතගාමී මග්ගො -පෙ- අනුසාසන්ති.

## 9. 2. 39

## සම්මාසඞ්කප්ප සූත්‍රය

477. මහණෙනි නිවන්මඟ කවරේ ද යත්: මහණෙනි මෙසස්නෙහි මහණ විවේකය ඇසුරු කළ ... සම්මාසඞ්කප්පය වඩයි. මහණෙනි මේ නිවන් මඟ යි කියනු ලැබේ ... අනුසාසනා යි.

## 9. 2. 40

## සම්මාවාචා සූත්‍රය

478. මහණෙනි නිවන්මඟ කවරේ ද යත්: මහණෙනි මෙසස්නෙහි මහණ විවේකය ඇසුරු කළ ... සම්මාවාචාව වඩයි. මහණෙනි මේ නිවන්මඟ යි කියනු ලැබේ ... අනුසාසනා යි.

## 9. 2. 41

## සම්මාකම්මන්ත සූත්‍රය

479. මහණෙනි නිවන්මඟ කවරේ ද යත්: මහණෙනි මෙසස්නෙහි මහණ විවේකය ඇසුරු කළ ... සම්මාකම්මන්තය වඩයි. මහණෙනි මේ නිවන් මඟ යි කියනු ලැබේ ... අනුසාසනා යි.

## 9. 2. 42

## සම්මාආජීව සූත්‍රය

480. මහණෙනි නිවන් මඟ කවරේ ද යත්: මහණෙනි මෙසස්නෙහි මහණ විවේකය ඇසුරු කළ ... සම්මාආජීවය වඩයි. මහණෙනි මේ නිවන් මඟ යි කියනු ලැබේ ... අනුසාසනා යි.

## 9. 2. 43

## සම්මාවායාම සූත්‍රය

481. මහණෙනි නිවන්මඟ කවරේ ද යත්: මහණෙනි මෙසස්නෙහි මහණ විවෙකය ඇසුරු කළ ... සම්මාවායාමය වඩයි. මහණෙනි මේ නිවන්මඟ යි කියනු ලැබේ ... අනුසාසනා යි.

## 9. 2. 44

## සම්මාසති සූත්‍රය

482. මහණෙනි නිවන්මඟ කවරේ ද යත්: මහණෙනි මෙසස්නෙහි මහණ විවෙකය ඇසුරු කළ ... සම්මාසතිය වඩයි. මහණෙනි මේ නිවන් මඟ යි කියනු ලැබේ ... අනුසාසනා යි.

## 9. 2. 45

## සම්මාසමාධිසුත්තං

483. අසඞ්ඛතඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි අසඞ්ඛතගාමිඤ්ච මග්ගං, තං සුණාථ. කතමඤ්ච භික්ඛවෙ අසඞ්ඛතං: යො භික්ඛවෙ රාගක්ඛයො දොසක්ඛයො මොහක්ඛයො, ඉදං වුච්චති භික්ඛවෙ අසඞ්ඛතං. කතමො ච භික්ඛවෙ අසඞ්ඛතගාමී මග්ගො: ඉධ භික්ඛවෙ භික්ඛු සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං, අයං වුච්චති භික්ඛවෙ අසඞ්ඛතගාමී මග්ගො.

ඉති ඛො භික්ඛවෙ දෙසිතං වො මයා අසඞ්ඛතං, දෙසිතො අසඞ්ඛතගාමී මග්ගො. යං භික්ඛවෙ සත්ථාරා කරණීයං සාවකානං හිතෙසිනා අනුකම්පකෙන අනුකම්පං උපාදාය, කතං වො තං මයා. එතානි භික්ඛවෙ රුක්ඛමූලානි, එතානි සුඤ්ඤාගාරානි, ඣායථ භික්ඛවෙ මා පමාදත්ථ, මා පච්ඡා විප්පටිසාරිනො අහුවත්ථ. අයං වො අම්හාකං අනුසාසනීති.

## 9. 2. 46-101

## අනතසුත්තානි

484-539. අනතඤ්ච[1] වො භික්ඛවෙ දෙසිස්සාමි අනතගාමිඤ්ච[2] මග්ගං තං සුණාථ. කතමඤ්ච භික්ඛවෙ අනතං -පෙ- අනුසාසනීති.

(යථා අසඞ්ඛතං තථා විත්ථාරෙතබ්බං)

## 9. 2. 102-157

## අනාසවසුත්තානි

540-595. අනාසවඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි අනාසවගාමිඤ්ච මග්ගං -පෙ- අනුසාසනීති.

## 9. 2. 158-213

## සච්චසුත්තානි

596-651. සච්චඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි සච්චගාමිඤ්ච මග්ගං -පෙ- අනුසාසනීති.

## 9. 2. 214-269

## පාරසුත්තානි

652-707. පාරඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි පාරගාමිඤ්ච මග්ගං -පෙ- අනුසාසනීති.

---

1. අමතඤ්ච —ස්‍යා
2. අමතගාමිඤ්ච — ස්‍යා

## 9. 2. 45

## සම්මාසමාධි සූත්‍රය

483. මහණෙනි තොපට නිවනත් නිවන්මඟත් දෙසන්නෙමි. එය අසවු. මහණෙනි නිවන කවරේ ද යත්: මහණෙනි යම් රාගක්ෂයයෙක් ද්වේෂක්ෂයයෙක් මෝහක්ෂයයෙක් වේ ද මහණෙනි මේ නිවනැ යි කියනු ලැබේ.

මහණෙනි නිවන්මඟ කවරේ ද යත්: මහණෙනි මෙහි මහණ විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුණු සම්මාසමාධිය වඩයි. මහණෙනි මේ නිවන්මඟැ යි කියනු ලැබේ.

මහණෙනි මෙසේ මවිසින් තොපට නිවන දෙසන ලදි. නිවන්මඟ දෙසන ලදි. මහණෙනි සව්වන්ට හිතවැඩ කැමති අනුකම්පා කරන ශාස්තෘවරයකු විසින් අනුකම්පාව නිසා යමක් කටයුතු නම් එය මවිසින් තොපට කරන ලදි. මහණෙනි තෙල රුක්මුල් ඇත. තෙල ශූන්‍යාගාර ඇත. මහණෙනි ධ්‍යාන කරවු. නහමක් පමා වවු. පසුව නහමක් විපිළිසර ඇත්තෝ වවු. මේ තොපට අපගේ අනුශාසනා යි.

## 9. 2. 46-101

## අන්ත සූත්‍ර

484-539. මහණෙනි තොපට (තෘෂ්ණාවේ කෙළවර වූ) නිවනත් නිවන් මඟත් දෙසන්නෙමි, එය අසවු. මහණෙනි නිවන කවරේ ද යත් ... අනුශාසනා යි. (අසඞ්ඛත වාරය යම්සේ නම් එසේ විස්තර කට යුතුයි)

## 9. 2. 102-157

## අනාසව සූත්‍ර

540-595. මහණෙනි තොපට (ආශ්‍රව රහිත ධර්මය වූ) නිවනත් නිවන් මඟත් දෙසන්නෙමි ... අනුශාසනා යි.

## 9. 2. 158-213

## සච්ච සූත්‍ර

596-651. මහණෙනි තොපට (පරමාර්ථ සත්‍යවූ) නිවනත් නිවන් මඟත් දෙසන්නෙමි. ... අනුශාසනා යි.

## 9. 2. 214-269

## පාර සූත්‍ර

652-707. මහණෙනි තොපට (සසර පර තෙර වූ) නිවනත් නිවන් මඟත් දෙසන්නෙමි .. අනුශාසනා යි.

## 9. 2. 270-325

### නිපුණසුත්තානි

708-763. නිපුණඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි නිපුණගාමිඤ්ච මග්ගං -පෙ- අනුසාසනීති.

## 9. 2. 326-381

### සුදුද්දසසුත්තානි

764-819. සුදුද්දසඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි සුදුද්දසගාමිඤ්ච මග්ගං -පෙ- අනුසාසනීත

## 9. 2. 382-437

### අජරසුත්තානි

820-875. අජරඤ්ච[1] වො භික්ඛවෙ දෙසිස්සාමි අජරගාමිඤ්ච මග්ගං -පෙ- අනුසාසනීති.

## 9. 2. 438-493

### ධුවසුත්තානි

876-931. ධුවඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි ධුවගාමිඤ්ච මග්ගං -පෙ- අනුසාසනීති.

## 9. 2. 494-549

### අපලොකිතසුත්තානි

932-987. අපලොකිතඤ්ච[2] වො භික්ඛවෙ දෙසිස්සාමි අපලොකිත ගාමිඤ්ච මග්ගං -පෙ- අනුසාසනීති.

## 9. 2. 550-605

### අනිදස්සනසුත්තානි

988-1043. අනිදස්සනඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි අනිදස්සන-ගාමිඤ්ච මග්ගං -පෙ- අනුසාසනීති.

## 9. 2. 606-661

### නිප්පපඤ්චසුත්තානි

1044-1099. නිප්පපඤ්චඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි නිප්පපඤ්ච ගාමිඤ්ච මග්ගං -පෙ- අනුසාසනීති.

---

1. අජ්ජරඤ්ච - සී 1,2 අජ්ජජරං - සයා
2. අපලොකඤ්ච - සී. 1, 2
   අපලොඛිතඤ්ච - සයා

## 9. 2. 270–325

## නිපුණ සූත්‍ර

708–763. මහණෙනි තොපට (සියුම් ධර්මයවූ) නිවනත් නිවන්මඟත් දෙසන්නෙමි ... අනුශාසනා යි.

## 9. 2. 326–381

## සුදුද්දස සූත්‍ර

764–819. මහණෙනි තොපට (දක්නට ඉතා අපහසු ධර්මය වූ) නිවනත් නිවන්මඟත් දෙසන්නෙමි ... අනුශාසනා යි.

## 9. 2. 382–437

## අජර සූත්‍ර

820–875. මහණෙනි තොපට (ජරාවෙන් දුදුරු නොවන ධර්මය වූ) නිවනත් නිවන් මඟත් දෙසන්නෙමි ... අනුශාසනා යි.

## 9. 2. 438–493

## ධ්‍රුව සූත්‍ර

876–931. මහණෙනි තොපට (ස්ථිර ධර්මය වූ) නිවනත් නිවන්මඟත් දෙසන්නෙමි ... අනුශාසනා යි.

## 9. 2. 494–549

## අපලොකිත සූත්‍ර

932–987. මහණෙනි තොපට (නොනැසෙන ධර්මය වූ) නිවනත් නිවන්මඟත් දෙසන්නෙමි ... අනුශාසනා යි.

## 9. 2. 550–605

## අනිදස්සන සූත්‍ර

988–1043. මහණෙනි තොපට (ඇසින් නොදක්කහැකි ධර්මය වූ) නිවනත් නිවන්මඟත් දෙසන්නෙමි ... අනුශාසනා යි.

## 9. 2. 606–661

## නිප්පපඤ්ච සූත්‍ර

1044–1099. මහණෙනි තොපට (තෘෂ්ණාදි ප්‍රපඤ්ච රහිත ධර්මය වූ නිවනත් නිවන්මඟත් දෙසන්නෙමි .. අනුශාසනා යි.

## 9. 2. 662–717

### සන්තසුත්තානි

1100–1155. සන්තඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි සන්තගාමිඤ්ච මග්ගං –පෙ– අනුසාසනීති.

## 9. 2. 718–773

### අමතසුත්තානි

1156–1211. අමතඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි අමතගාමිඤ්ච මග්ගං –පෙ– අනුසාසනීති.

## 9. 2. 774–829

### පණීතසුත්තානි

1212–1267. පණීතඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි පණීතගාමිඤ්ච මග්ගං –පෙ– අනුසාසනීති.

## 9. 2. 830–885

### සිවසුත්තානි

1268–1323. සිවඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි සිවගාමිඤ්ච මග්ගං –පෙ– අනුසාසනීති.

## 9. 2. 886–941

### ඛෙමසුත්තානි

1324–1379. ඛෙමඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි ඛෙමගාමිඤ්ච මග්ගං –පෙ– අනුසාසනීති.

## 9. 2. 942–997

### තණ්හක්ඛයසුත්තානි

1380–1435. තණ්හක්ඛයඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි තණ්හක්ඛය-ගාමිඤ්ච මග්ගං –පෙ– අනුසාසනීති.

## 9. 2. 998–1053

### අච්ඡරියසුත්තානි

1436–1491. අච්ඡරියඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි අච්ඡරියගාමිඤ්ච මග්ගං –පෙ– අනුසාසනීති.

## 9. 2. 662-717

## සන්ත සූත්‍ර

1100-1155. මහණෙනි තොපට (ශාන්ත ධර්මය වූ) නිවනත් නිවන් මඟත් දෙසන්නෙමි ... අනුසාසනා යි.

## 9. 2. 718-773

## අමත සූත්‍ර

1156-1211. මහණෙනි තොපට (මරණ රහිත ධර්මය වූ) නිවනත් නිවන් මඟත් දෙසන්නෙමි ... අනුසාසනා යි.

## 9. 2. 774-829

## පණීත සූත්‍ර

1212-1267. මහණෙනි තොපට (උතුම ධර්මය වූ) නිවනත් නිවන් මඟත් දෙසන්නෙමි ... අනුසාසනා යි.

## 9. 2. 830-885

## සිව සූත්‍ර

1268-1323. මහණෙනි තොපට (භය රහිත ධර්මය වූ) නිවනත් නිවන් මඟත් දෙසන්නෙමි ... අනුසාසනා යි.

## 9. 2. 886-941

## ඛෙම සූත්‍ර

1324-1379. මහණෙනි තොපට (උපද්‍රව රහිත ධර්මය වූ) නිවනත් නිවන් මඟත් දෙසන්නෙමි ... අනුසාසනා යි.

## 9. 2. 942-997

## තණ්හක්ඛය සූත්‍ර

1380-1435. මහණෙනි තොපට (තෘෂ්ණාක්ෂය ධර්මය වූ) නිවනත් නිවන් මඟත් දෙසන්නෙමි ... අනුසාසනා යි.

## 9. 2. 998-1053

## අච්ඡරිය සූත්‍ර

1436-1491. මහණෙනි තොපට (ආශ්චර්ය ධර්මය වූ) නිවනත් නිවන් මඟත් දෙසන්නෙමි .. අනුසාසනා යි.

## 9. 2. 1054–1109

### අබ්භූතසුත්තානි

1492–1547. අබ්භූතඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි අබ්භූතගාමිඤ්ච මග්ගං -පෙ- අනුසාසනීති.

## 9. 2. 1110–1165

### අනීතිකසුත්තානි

1548–1603. අනීතිකඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි අනීතිකගාමිඤ්ච මග්ගං -පෙ- අනුසාසනීති.

## 9. 2. 1166–1221

### අනීතිකධම්මසුත්තානි

1604–1659. අනීතිකධම්මඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි අනීතික ධම්මගාමිඤ්ච මග්ගං -පෙ- අනුසාසනීති.

## 9. 2. 1222–1277

### නිබ්බානසුත්තානි

1660–1715. නිබ්බානඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි නිබ්බාන-ගාමිඤ්ච මග්ගං -පෙ- අනුසාසනීති.

## 9. 2. 1278–1333

### අබ්‍යාපජ්ඣසුත්තානි

1716–1771. අබ්‍යාපජ්ඣඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි අබ්‍යාපජ්ඣ-ගාමිඤ්ච මග්ගං -පෙ- අනුසාසනීති.

## 9. 2. 1334–1389

### විරාගසුත්තානි

1772–1827. විරාගඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි විරාගගාමිඤ්ච මග්ගං -පෙ- අනුසාසනීති.

## 9. 2. 1390–1445

### සුද්ධිසුත්තානි

1828–1883. සුද්ධිඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි සුද්ධිගාමිඤ්ච මග්ගං -පෙ- අනුසාසනීති.

## 9. 2. 1054-1109

### අබ්භූත සූත්‍ර

1492-1547. මහණෙනි තොපට (නොහටගත් ධර්මය වූ) නිවනත් නිවන් මඟත් දෙසන්නෙමි ... අනුසාසනා යි.

## 9. 2. 1110-1165

### අනීතික සූත්‍ර

1548-1603. මහණෙනි තොපට (නිදුක් ධර්මය වූ) නිවනත් නිවන් මඟත් දෙසන්නෙමි ... අනුසාසනා යි.

## 9. 2. 1166-1221

### අනීතිකධම්ම සූත්‍ර

1604-1659. මහණෙනි, තොපට (නිදුක් ස්වභාව ධර්මය වූ) නිවනත් නිවන් මඟත් දෙසන්නෙමි ... අනුසාසනා යි.

## 9. 2. 1222-1277

### නිබ්බාන සූත්‍ර

1660-1715 මහණෙනි තොපට (තෘෂ්ණා රහිත ධර්මය වූ) නිවනත් නිවන් මඟත් දෙසන්නෙමි ... අනුසාසනා යි.

## 9. 2. 1278-1333

### අබ්‍යාපජ්ඣ සූත්‍ර

1716-1771. මහණෙනි තොපට (දුක් රහිත ධර්මය වූ) නිවනත් නිවන් මඟත් දෙසන්නෙමි ... අනුසාසනා යි.

## 9. 2. 1334-1389

### විරාග සූත්‍ර

1772-1827. මහණෙනි තොපට (විරාග ධර්මය වූ) නිවනත් නිවන් මඟත් දෙසන්නෙමි ... අනුසාසනා යි.

## 9. 2. 1390-1445

### සුද්ධි සූත්‍ර

1828-1883. මහණෙනි තොපට (පරමාර්ථ ශුද්ධිය වූ) නිවනත් නිවන් මඟත් දෙසන්නෙමි ... අනුසාසනා යි.

## 9. 2. 1446-1501

### මුත්තිසුත්තානි

1884-1939. මුත්තිඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි මුත්තිගාමිඤ්ච මග්ගං -පෙ- අනුසාසන්තීති.

## 9. 2. 1502-1557

### අනාලයසුත්තානි

1940-1995. අනාලයඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි අනාලයගාමිඤ්ච මග්ගං -පෙ- අනුසාසන්තීති.

## 9. 2. 1558-1613

### දීපසුත්තානි

1996-2051. දීපඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි දීපගාමිඤ්ච මග්ගං -පෙ- අනුසාසන්තීති.

## 9. 2. 1614-1669

### ලෙණසුත්තානි

2052-2107. ලෙණඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි ලෙණගාමිඤ්ච මග්ගං -පෙ- අනුසාසන්තීති.

## 9. 2. 1670-1725

### තාණසුත්තානි

2108-2163. තාණඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි තාණගාමිඤ්ච මග්ගං -පෙ- අනුසාසන්තීති.

## 9. 2. 1726-1781

### සරණසුත්තානි

2164-2219. සරණඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි සරණගාමිඤ්ච මග්ගං -පෙ- අනුසාසන්තීති.

## 9. 2. 1782-1837

### පරායණසුත්තානි

2220-2275. පරායණඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි පරායණගාමිඤ්ච මග්ගං, තං සුණාථ. කතමඤ්ච භික්ඛවෙ පරායණං: යො භික්ඛවෙ රාගක්ඛයො දොසක්ඛයො මොහක්ඛයො, ඉදං වුච්චති භික්ඛවෙ පරායණං. කතමො ච භික්ඛවෙ පරායණගාමී මග්ගො: කායගතාසති. අයං වුච්චති භික්ඛවෙ පරායණගාමී මග්ගො.

## 9. 2. 1446–1501

### මුත්ති සූත්‍ර

1884–1939. මහණෙනි තොපට (භවත්‍රයෙන් මිදීම වූ) නිවනත් නිවන් මඟත් දෙසන්නෙමි ... අනුශාසනා යි.

## 9. 2. 1502–1557

### අනාලය සූත්‍ර

1940–1995. මහණෙනි තොපට (කාමාලය රහිත ධර්මය වූ) නිවනත් නිවන් මඟත් දෙසන්නෙමි ... අනුශාසනා යි.

## 9. 2. 1558–1613

### දීප සූත්‍ර

1996-2051 මහණෙනි තොපට (පිහිට වන ධර්මය වූ) නිවනත් නිවන් මඟත් දෙසන්නෙමි ... අනුශාසනා යි.

## 9. 2. 1614–1669

### ලෙණ සූත්‍ර

2052-2107. මහණෙනි තොපට (ලෙන ධර්මය වූ) නිවනත් නිවන් මඟත් දෙසන්නෙමි ... අනුශාසනා යි.

## 9. 2. 1679–1725

### තාණ සූත්‍ර

2108-2163. මහණෙනි තොපට (රැකවරණ ධර්මය වූ) නිවනත් නිවන් මඟත් දෙසන්නෙමි ... අනුශාසනා යි.

## 9. 2. 1726–1781

### සරණ සූත්‍ර

2164–2219 මහණෙනි තොපට (බිය නසන ධර්මය වූ) නිවනත් නිවන් මඟත් දෙසන්නෙමි ... අනුශාසනා යි.

## 9. 2. 1782–1837

### පරායණ සූත්‍ර

2220–2275. මහණෙනි තොපට (පිහිට වූ) නිවනත් නිවන් මඟත් දෙසන්නෙමි. එය අසවු. මහණෙනි නිවන කවරේ ද යත්: මහණෙනි යම් රාගක්ෂයයෙක් ද්වේෂක්ෂයයෙක් මෝහක්ෂයයෙක් වේ ද, මහණෙනි මේ නිවනැ යි කියනු ලැබේ. මහණෙනි නිවන්මඟ කවරේ ද යත්: කායගතාසතිය යි. මහණෙනි මේ නිවන්මඟැ යි කියනු ලැබේ.

ඉති ඛො භික්ඛවෙ දෙසිතං වො මයා පරායණං, දෙසිතො පරායණගාමී මග්ගො. යං භික්ඛවෙ සත්ථාරා කරණීයං සාවකානං හිතෙසිනා අනුකම්පකෙන අනුකම්පං උපාදය. කතං වො තං මයා එතානි භික්ඛවෙ රුක්ඛමූලානි, එතානි සුඤ්ඤාගාරානි, ඣායථ භික්ඛවෙ මා පමාදත්ථ, මා පච්ඡා විප්පටිසාරිනො අහුවත්ථ, අයං වො අම්හාකං අනුසාසනීති.

(යථා අසඞ්ඛතං තථා විත්ථාරෙතබ්බං)

**දුතියඅසඞ්ඛතවග්ගො.**

**තත්‍රුද්දානං :**

අසඞ්ඛතං අනතං අනාසවං සච්චඤ්ච පාරං නිපුණං සුදුද්දසං
අජරත්තං ධුවං අපලොකිතං අනිදස්සනං නිප්පපඤ්ච සන්තං

අමතං පණීතඤ්ච සිවඤ්ච ඛෙමං තණ්හක්ඛයො අච්ඡරියඤ්ච අබ්භුතං
අනීතිකං අනීතිකධම්මං නිබ්බානමෙතං සුගතෙන දෙසිතං

අබ්‍යාපජ්ඣො විරාගො ච සුද්ධි මුත්ති අනාලයො
දීපො ලෙණඤ්ච තාණඤ්ච සරණඤ්ච පරායණඤ්චාති.

**අසඞ්ඛතසංයුත්තං සමත්තං.**

මහණෙනි මෙසේ මවිසින් තොපට නිවන දෙසන ලදි. නිවන්මඟ දෙසන ලදි. මහණෙනි සව්වන්ට හිත වැඩ කැමති අනුකම්පා කරන ශාස්තෘවරයකු විසින් අනුකම්පාව නිසා යමක් කටයුතු නම් මවිසින් එය තොපට කරන ලදි. මහණෙනි තෙල රුක්මුල් ඇත. තෙලශූන්‍යාගාර ඇත. මහණෙනි ධ්‍යාන කරවු. නහමක් පමා වවු. පසු ව නහමක් විපිළිසර ඇත්තෝ වවු. මේ තොපට අපගේ අනුශාසනා යි.

(අසඞ්ඛත වාරය යම් සේ නම් එසේ විස්තර කට යුතු යි.)

**දෙවැනි දුතිය අසඞ්ඛත වර්ග යි.**

**එහි වාරනාමාවලිය:**

අසඞ්ඛත, අන්ත, අනාසව, සච්ච, පාර, නිපුණ, සුදුද්දස, අජර, ධුව, අපලොකිත, අනිදස්සන, නිප්පපඤ්ච, සන්ත, අමත, පණීත, සිව, ඛෙම, තණ්හක්ඛය, අච්ඡරිය අබ්භුත, අනීතික, අනීතික ධම්ම, නිබ්බාන අබ්‍යාපජ්ඣ, විරාග, සුද්ධි, මුත්ති, අනාලය, දීප, ලෙණ, තාණ, සරණ, පරායණවාරය යි වාර තෙතිසෙකි. එක් එක් වාරයෙහි සූත්‍ර සපනස බැගින් අසඞ්ඛත සංයුත්තයෙහි සූත්‍ර මුළුල්ල 1848 කි. අසඞ්ඛත සංයුත්ත දෙවෙනි වර්ගයෙහි පමණක් සූත්‍ර 1837 කි.

**අසඞ්ඛත සංයුත්තය නිමියේ ය.**

# 10. අබ්‍යාකත සංයුත්තං

## 1. අබ්‍යාකතවග්ගො

### 10. 1. 1

### ඛෙමාසුත්තං

2276. එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන **ඛෙමා භික්ඛුනී** කොසලෙසු චාරිකං චරමානා අන්තරා ච **සාවත්ථිං**[1] අන්තරා ච **සාකෙතං තොරණවත්ථුස්මිං** වාසං උපගතා හොති. අථ ඛො **රාජා පසෙනදි-කොසලො** සාකෙතා සාවත්ථිං ගච්ඡන්තො අන්තරා ච සාකෙතං අන්තරා ච සාවත්ථිං තොරණවත්ථුස්මිං එකරත්තිවාසං උපගච්ඡි. අථ ඛො රාජා පසෙනදිකොසලො අඤ්ඤතරං පුරිසං ආමන්තෙසි: එහි ත්වං අම්භො පුරිස තොරණවත්ථුස්මිං තථාරූපං සමණං වා බ්‍රාහ්මණං වා ජාන, යමහං අජ්ජ පයිරුපාසෙය්‍යන්ති.

එවං දෙවාති ඛො සො පුරිසො රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස පටිස්සුත්වා කෙවලකප්පං තොරණවත්ථුං[2] අනුවාහිණ්ඩන්තො[3] නාද්දස තථාරූපං සමණං වා බ්‍රාහ්මණං වා යං රාජා පසෙනදි කොසලො පයිරුපාසෙය්‍ය. අද්දසා ඛො සො පුරිසො ඛෙමං භික්ඛුනිං තොරණවත්ථුස්මිං වාසං උපගතං, දිස්වාන යෙන පසෙනදිකොසලො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා රාජානං පසෙනදි. කොසලං එතදවොච: නත්ථි ඛො දෙව, තොරණවත්ථුස්මිං තථාරූපො සමණො වා බ්‍රාහ්මණො වා යං දෙවො පයිරුපාසෙය්‍ය. අත්ථි ච ඛො දෙව, ඛෙමා නාම භික්ඛුනී තස්ස භගවතො සාවිකා අරහතො සම්මාසම්බුද්ධස්ස, තස්සා ඛො පනය්‍යාය එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: ''පණ්ඩිතා වියත්තා මෙධාවිනී බහුස්සුතා චිත්තකථා කල්‍යාණපටිභානා''ති. තං දෙවො පයිරුපාසතූති.

අථ ඛො රාජා පසෙනදිකොසලො යෙන ඛෙමා භික්ඛුනී තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ඛෙමං භික්ඛුනිං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො රාජා පසෙනදිකොසලො ඛෙමං භික්ඛුනිං එතදවොච: කින්නු ඛො අය්‍යෙ හොති තථාගතො පරම්මරණාති. අව්‍යාකතං එතං මහාරාජ භගවතා: ''හොති තථාගතො පරම්මරණා''ති. කිම්පනය්‍යෙ න හොති තථාගතො පරම්මරණාති. එතම්පි ඛො මහාරාජ අව්‍යාකතං භගවතා: ''න හොති තථාගතො පරම්මරණා''ති. කින්නු ඛො අය්‍යෙ, හොති ච න ච හොති තථාගතො පරම්මරණාති. අව්‍යාකතං ඛො එතං මහාරාජ භගවතා: ''හොති ච න ච හොති තථාගතො පරම්මරණා''ති. කිම්පනය්‍යෙ, නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති. එතම්පි ඛො මහාරාජ අව්‍යාකතං භගවතා: ''නෙව හොති න න හොති තථාගතො පරම්මරණා''ති.

---

1. සාවත්ථියං සී 1, 2,
2. වත්ථුස්මිං සී 2, 1,
3. ආහිණ්ඩන්තො - මජසං ස්‍යා

# 10 අබ්‍යාකතසංයුත්තය

## 1. අබ්‍යාකත වර්ගය

### 10. 1. 1

### ඛෙමා සූත්‍රය

2276. එක්සමයෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි **ජේතවන නම් අනේපිඩු සිටුහුගේ** අරම්හි වැඩ වසන සේක. එසමයෙහි **ඛෙමා මෙහෙණ කොසොල්** දනව්වෙහි සැරිසරන්නී **සැවැත්නුවරටත් සාකෙතනුවරටත්** අතර **තොරණවත්ථුගම්හි** විසීමට පැමිණියා වෙයි. එකල්හි **පසෙනදි කොසොල්රජ** සාකේතයෙන් සැවතට යන්නේ සාකේතයටත් සැවතටත් අතර තොරණවත්ථුගම්හි එක්රැයක් විසීමට පැමිණියේ ය. එකල පසේනදි කොසොල් රජ එක්තරා පුරුෂයකු ඇමතී ය. එම්බල පුරුෂය ''එව මම අද යමකු ඇසුරු කරන්නෙම් නම් තෝ එබඳු මහණකු හෝ බමුණකු හෝ තොරණවත්ථුවෙහි දනුව''යි.

එසේ ය දේවයන් වහන්සැ යි ඒ පුරිස් තෙමේ පසේනදි කොසොල් රජුට පිළිතුරු දී මුළු තොරණවත්ථුවෙහි ඇවිදින්නේ පසේනදි කොසොල් රජ යමකු ඇසුරු කරන්නේ නම් එබඳු මහණකු හෝ බමුණකු හෝ නො දක්කේය. ඒ පුරිස් තෙමේ තොරණවත්ථුවෙහි වාසයට එළඹි ඛෙමා මෙහෙණ දිටී. දක පසේනදි කොසොල් රජු වෙත එළඹියේ ය. එළඹ පසේනදි කොසොල් රජහට මෙය සැලකෙළේ ය: දේවයන් වහන්ස, දේවයන් වහන්සේ යමකු ඇසුරු කරන සේක් නම් එබඳු මහණෙක් හෝ බමුණෙක් හෝ තොරණවත්ථුවෙහි නැත. දේවයන් වහන්ස, ඒ භාග්‍යවත් අර්හත් සම්මාසම්බුද්ධරජාණන් වහන්සේගේ ශ්‍රාවිකා වූ ඛෙමා නම් මෙහෙණක් ඇත. ''පණ්ඩිත ය ව්‍යක්තය නුවණැත්තීය බහුශ්‍රැත ය විසිතුරු කතා ඇත්තී ය. මැනවින් වැටහෙන නුවණ ඇත්තී ය''යි ඒ ආයඖවගේ මෙබඳු කලණ කිතුගොසෙක් පැන නැංගේ ය. දේවයන් වහන්සේ ඇය ඇසුරු කරන සේක්වා යි.

එකල්හි පසේනදි කොසොල් රජ ඛෙමා මෙහෙණ වෙත එළඹියේ ය. එළඹ ඛෙමා මෙහෙණ වැඳ එකත්පස් ව හුන්නේ ය. එකත්පස් ව හුන් පසේනදි කොසොල්රජ ඛෙමා මෙහෙණහට මෙය කීය: ආයඖවෙනි, කිමෙක් ද සත්ත්වයා මරණින් මතු වේ ද යි. මහරජ සත්ත්වයා මරණින් මතු වෙයි යන මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් නො වදරන ලදී. ආයඖවෙනි කිමෙක් ද, සත්ත්වයා මරණින් මතු නො වේ දැ යි. මහරජ සත්ත්වයා මරණින් මතු නො වෙයි යන මෙ ද භාග්‍යවතුන් වහන්සේ විසින් නො වදරන ලදී. ආයඖවෙනි කිමෙක් ද සත්ත්වයා මරණින් මතු වෙයි, නො ද වේ දැ යි. මහරජ සත්ත්වයා මරණින් මතු වෙයි, නො ද වෙයි යන මෙ ද භාග්‍යවතුන් වහන්සේ විසින් නො වදරන ලදී. ආයඖවෙනි කිමෙක් ද සත්ත්වයා මරණින් මතු නො ම වෙයි, නො ම නො වේ දැ යි. මහරජ සත්ත්වයා මරණින් මතු නොම වෙයි, නො ම නො වෙයි යන මෙ ද භාග්‍යවතුන් වහන්සේ විසින් නො වදරන ලදී.

කිනනු ඛො අය්‍යෙ, හොති තථාගතො පරම්මරණාති ඉති පුට්ඨා සමානා අව්‍යාකතං ඛො එතං මහාරාජ භගවතා: "හොති තථාගතො පරම්මරණා"ති වදෙසි, කිම්පනය්‍යෙ න හොති තථාගතො පරම්මරණාති ඉති පුට්ඨා සමානා එතම්පි ඛො මහාරාජ අව්‍යාකතං භගවතා: "න හොති තථාගතො පරම්මරණාති" වදෙසි, කිනනු ඛො අය්‍යෙ, හොති ච න ච හොති තථාගතො පරම්මරණාති ඉති පුට්ඨා සමානා අව්‍යාකතං ඛො එතං මහාරාජ භගවතා: "හොති ච න ච හොති තථාගතො පරම්මරණා"ති වදෙසි, කිම්පනය්‍යෙ නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති ඉති පුට්ඨා සමානා එතම්පි ඛො මහාරාජ අව්‍යාකතං භගවතා: "නෙව හොති න න හොති තථාගතො පරම්මරණා"ති වදෙසි. කො නු ඛො අය්‍යෙ, හෙතු කො පච්චයො යෙන තං[1] අව්‍යාකතං භගවතාති.

තෙන හි මහාරාජ තඤ්ඤෙවෙත්ථ පටිපුච්ඡිස්සාමි,[2] යථා තෙ ඛමෙය්‍ය, තථා නං ව්‍යාකරෙය්‍යාසි.

තං කිම්මඤ්ඤසි මහාරාජ, අත්ථි තෙ කොචි ගණකො වා මුද්දිකො වා සඞ්ඛායකො වා යො පහොති ගඞ්ගාය වාලිකං[3] ගණෙතුං: "එත්තකා වාලිකා ඉති වා එත්තකානි[4] වාලිකාසතානි ඉති වා එත්තකානි වාලිකාසහස්සානි ඉති වා එත්තකානි වාලිකාසතසහස්සානි ඉති වා"ති. නො හෙතං අය්‍යෙ. අත්ථි පන තෙ කොචි ගණකො වා මුද්දිකො වා සඞ්ඛායකො වා යො පහොති මහාසමුද්දෙ උදකං මිණිතුං: "එත්තකානි උදකාළ්හකානීති[5] වා එත්තකානි උදකාළ්හකසතානීති වා එත්තකානි උදකාළ්හකසහස්සානීති වා එත්තකානි උදකාළ්හකසතසහස්සානීති වා"ති. නොහෙතං අය්‍යෙ. තං කිස්ස හෙතු? මහාය්‍යෙ,[6] සමුද්දො ගම්භීරො අප්පමෙය්‍යො අප්පරියොගාහොති.

එවමෙව ඛො මහාරාජ, යෙන රූපෙන තථාගතං පඤ්ඤාපයමානො පඤ්ඤාපෙය්‍ය, තං රූපං තථාගතස්ස පහීනං උච්ඡින්නමූලං තාලාවත්ථුකතං අනභාවකතං ආයතිං අනුප්පාදධම්මං. රූපසඞ්ඛය[7]විමුත්තො ඛො මහාරාජ තථාගතො ගම්භීරො අප්පමෙය්‍යො අප්පරියොගාහො, සෙය්‍යථාපි මහාසමුද්දො. හොති තථාගතො පරම්මරණාතිපි න උපෙති, න හොති තථාගතො පරම්මරණාති පි න උපෙති. හොති ච න ච හොති තථාගතො පරම්මරණාතිපි න උපෙති. නෙව හොති න න හොති තථාගතො පරම්මරණාතිපි න උපෙති.

1. යෙනෙතං - ස්‍යා. මජ්සං
2. පරිපුච්ඡිස්සාමි - සිමු.
3. වාලුකං - මජ්සං.
4. එත්තිකානි - සී, 1, 2,
5. උදකාළ්හානි වා - සී 1, 2,
6. මහය්‍යා - ස්‍යා, සී 2
7. සඞ්ඛයා - ස්‍යා, සඞ්ඛාය - මජ්සං.

ආයුෂ්මාවෙනි, කිමෙක් ද සත්ත්වයා මරණින් මතු වේ දැ යි මෙසේ පුළුවුස්නා ලද්දී සත්ත්වයා මරණින් මතු වෙයි යන මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් නො වදරන ලද යි කියහි, ආයුෂ්මාවෙනි කිමෙක් ද සත්ත්වයා මරණින් මතු නො වේ දැ යි මෙසේ පුළුවුස්නා ලද්දී මහරජ සත්ත්වයා මරණින් මතු නො වෙයි යන මෙ ද භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදරන ලදැයි කියහි, ආයුෂ්මාවෙනි, කිමෙක් ද සත්ත්වයා මරණින් මතු වෙයි නො ද වේ ද යි මෙසේ පුළුවුස්නා ලද්දී මහරජ සත්ත්වයා මරණින් මතු වෙයි නොද වෙයි යන මෙද භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදරන ලද යි කියහි. ආයුෂ්මාවෙනි, කිමෙක් ද? සත්ත්වයා මරණින් මතු නො ම වෙයි නො ම නො වේ දැ යි මෙසේ පුළුවුස්නා ලද්දී මහරජ සත්ත්වයා මරණින් මතු නො ම වෙයි නො ම නො වෙයි යන මෙ ද භාග්‍යවතුන් වහන්සේ විසින් නො වදරන ලද යි කියහි. ආයුෂ්මාවෙනි යම්හෙයෙකින් එය භාග්‍යවතුන් වහන්සේ විසින් නො වදරන ලද්දේ නම් එයට හේතු කිම? ප්‍රත්‍යය කිමැ යි.

මහරජ එසේ වී නම් මෙහි ලා තොප ම පුළුවුස්නෙමි. යම් සේ තොපට වැටහෙන්නේ නම් එසේ එය විසඳන්නහු ය.

මහරජ ඒ කිමැ යි හඟිවු ද? යමෙක් ''වැලි මෙතෙකැ යි හෝ වැලි මෙතෙක් සියයකැ යි හෝ වැලි මෙතෙක් දහසකැ යි හෝ වැලි මෙතෙක් සිය-දහසකැ''යි හෝ ගංගා නදියෙහි වැලි ගණින්නට පොහෝනේ නම් එබඳු කිසි ගණන් කරන්නෙක් හෝ මුද්‍රා තබන්නෙක් හෝ පිඩුගණන් දක්වන්-නෙක් හෝ තොපට ඇද්ද යි. ආයුෂ්මාවෙනි මෙය නො වේ ම ය. යමෙක් ''දිය ලාස් මෙතෙකැයි හෝ දිය ලාස් මෙතෙක් සියයකැ යි හෝ දිය ලාස් මෙතෙක් දහසකැ යි හෝ දිය ලාස් මෙතෙක් සියදහසකැ''යි හෝ මහමුහුදෙහි දිය මනින්නට පොහෝනේ නම් එබඳු කිසි ගණන් කරන්-නෙක් හෝ මුද්‍රා තබන්නෙක් හෝ පිඩුගණන් දක්වන්නෙක් හෝ තොපට ඇද්ද යි. ආයුෂ්මාවෙනි මෙය නො වේ ම ය. ඒ කවර හෙයින යත්: ආයුෂ්මාවෙනි මුහුද මහත් ය. ගැඹුරු ය. නො පමණ ය. නො බැසගත හැක්කේ යි.

මහරජ එසෙයින් ම පනවන්නෙක් යම් රූපයෙකින් සත්ත්වයා පනවන්නේ නම් ඒ රූපය තථාගතයන් වහන්සේට ප්‍රහීණ ය. උසුන් මුල් ඇත්තේය. හිස් සුන් තල්රුකක් මෙන් කරන ලද්දේ ය. නැවත නොහටගන්නා බව කරන ලද්දේ ය. මතු නූපදනා ස්වභාව ඇත්තේ ය. මහරජ, තථාගතයන් වහන්සේ රූ පැනවීමෙන් මිදුණහ, ගැඹුරුවහ, නොපමණහ, නොබැසගත හැකියහ, මහසමුදුර මෙනි, සත්ත්වයා මරණින් මතු වේ යයි පැනවීමට ද නො පැමිණෙති, සත්ත්වයා මරණින් මතු නො වේ යයි පැනවීමට ද නො පැමිණෙති, සත්ත්වයා මරණින් මතු වෙයි නො ද වේ යයි පැනවීමට ද නො පැමිණෙති, සත්ත්වයා මරණින් මතු නො ම වෙයි නො ම නො වේ යයි පැනවීමට ද නො පැමිණෙති.

යාය වෙදනාය තථාගතං පඤ්ඤපයමානො පඤ්ඤපෙය්‍ය, සා වෙදනා තථාගතස්ස පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා, වෙදනාසඞ්ඛයවිමුත්තො ඛො මහාරාජ තථාගතො ගම්භීරො අප්පමෙය්‍යො දුප්පරියොගාහො සෙය්‍යථාපි මහාසමුද්දො. හොති තථාගතො පරම්මරණාතිපි න උපෙති, න හොති තථාගතො පරම්මරණාතිපි න උපෙති, හොති ච න ච හොති තථාගතො පරම්මරණාතිපි න උපෙති, නෙව හොති න න හොති තථාගතො පරම්මරණාතිපි න උපෙති. යාය සඤ්ඤාය තථාගතං – පෙ –

යෙහි සඞ්ඛාරෙහි තථාගතං පඤ්ඤපයමානො පඤ්ඤපෙය්‍ය, තෙ සඞ්ඛාරා තථාගතස්ස පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා, සඞ්ඛාරසඞ්ඛයවිමුත්තො ඛො මහාරාජ තථාගතො ගම්භීරො අප්පමෙය්‍යො දුප්පරියොගාහො සෙය්‍යථාපි මහාසමුද්දො. හොති තථාගතො පරම්මරණාතිපි න උපෙති, න හොති තථාගතො පරම්මරණාතිපි න උපෙති, හොති ච න ච හොති තථාගතො පරම්මරණාතිපි න උපෙති, නෙව හොති න න හොති තථාගතො පරම්මරණාතිපි න උපෙති.

යෙන විඤ්ඤාණෙන තථාගතං පඤ්ඤපයමානො පඤ්ඤපෙය්‍ය, තං විඤ්ඤාණං තථාගතස්ස පහීනං උච්ඡින්නමූලං තාලාවත්ථුකතං අනභාවකතං ආයතිං අනුප්පාදධම්මං, විඤ්ඤාණසඞ්ඛයවිමුත්තො ඛො මහාරාජ තථාගතො ගම්භීරො අප්පමෙය්‍යො අප්පරියොගාහො සෙය්‍යථාපි මහාසමුද්දො. හොති තථාගතො පරම්මරණාතිපි න උපෙති, න හොති තථාගතො පරම්මරණාතිපි න උපෙති, හොති ච න ච හොති තථාගතො පරම්මරණාතිපි න උපෙති, නෙව හොති න න හොති තථාගතො පරම්මරණාතිපි න උපෙතීති.

අථ ඛො රාජා පසෙනදිකොසලො ඛෙමාය භික්ඛුනියා භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා ඛෙමං භික්ඛුනිං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි. අථ ඛො රාජා පසෙනදිකොසලො අපරෙන සමයෙන යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො රාජා පසෙනදිකොසලො භගවන්තං එතදවොච: කින්නු ඛො භන්තෙ හොති තථාගතො පරම්මරණාති. අව්‍යාකතං ඛො එතං මහාරාජ මයා: "හොති තථාගතො පරම්මරණාති." කිම්පන භන්තෙ න හොති තථාගතො පරම්මරණාති. තම්පි ඛො මහාරාජ, අව්‍යාකතං මයා: "න හොති තථාගතො පරම්මරණා"ති. – පෙ –

පනවන්නෙක් යම් වේදනාවකින් සත්ත්වයා පනවන්නේ නම් ඒ වේදනාව තථාගතයන් වහන්සේට ප්‍රහීණ ය, උපුත් මුල් ඇත්තී ය, හිස්සුන් තල්ගසක් මෙන් කරන ලද්දී ය, නැවත නො හටගන්නා බව කරන ලද්දී ය, මතු නූපදනා ස්වභාව ඇත්තී ය. මහරජ තථාගතයන් වහන්සේ විඳුම් පැනවීමෙන් මිදුණහ, ගැඹුරුවහ, නො පමණයහ, නො බැසගත හැක්කහ, මහසමුදුර මෙනි. සත්ත්වයා මරණින් මතු-වේ ය යි පැනවීමට ද නො පැමිණෙති, සත්ත්වයා මරණින් මතු නො වේ ය යි පැනවීමට ද නො පැමිණෙති, සත්ත්වයා මරණින් මතු වෙයි නො ද වේ යයි පැනවීමට ද නො පැමිණෙති, සත්ත්වයා මරණින් මතු නො ම වෙයි නො ම නො වේ ය යි පැනවීමට ද නො පැමිණෙති. යම් සංඥාවකින් සත්ත්වයා...

පනවන්නෙක් යම් සංස්කාර කෙනකුන්ගෙන් සත්ත්වයා පනවන්නේ නම් ඒ සංස්කාරයෝ තථාගතයන් වහන්සේට ප්‍රහීණයහ, උපුත් මුල් ඇතියහ, හිස්සුන් තල්ගසක් මෙන් කරන ලදහ, නැවත නොහට ගන්නා බව කරන ලදහ, මතු නූපදනා ස්වභාව ඇතියහ. මහරජ තථාගතයන් වහන්සේ සංස්කාර පැනවීමෙන් මිදුණහ, ගැඹුරුවහ, නොපමණයහ, නොබැස ගත හැක්කහ, මහසමුදුර මෙනි. සත්ත්වයා මරණින් මතු වේ යයි පැනවීමට ද නො පැමිණෙති, සත්ත්වයා මරණින් මතු නො වේ යයි පැනවීමට ද නො පැමිණෙති, සත්ත්වයා මරණින් මතු වෙයි නො ද වේ යි පැනවීමට ද නො පැමිණෙති, සත්ත්වයා මරණින් මතු නො ම වෙයි නො ම නො වේ යි පැනවීමට ද නො පැමිණෙති.

පනවන්නෙක් යම් විඥානයෙකින් සත්ත්වයා පනවන්නේ නම් ඒ විඥානය තථාගතයන් වහන්සේට ප්‍රහීණ ය, උපුත් මුල් ඇත්තේ ය, හිස්සුන් තල්ගසක් මෙන් කරන ලද්දේ ය, නැවත නොහටගන්නා බව කරන ලද්දේ ය, මතු නූපදනා ස්වභාව ඇත්තේ ය, මහරජ තථාගතයන් වහන්සේ විඥාන පැනවීමෙන් මිදුණහ, ගැඹුරුවහ, නොපමණයහ, නොබැස ගත හැක්කහ, මහසමුදුර මෙනි. සත්ත්වයා මරණින් මතු වේ යි පැනවීමට ද නො පැමිණෙති, සත්ත්වයා මරණින් මතු නො වේ යි පැනවීමට ද නො පැමිණෙති, සත්ත්වයා මරණින් මතු වේ නො ද වේ යි පැනවීමට ද නො පැමිණෙති, සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ යි පැනවීමට ද නො පැමිණෙති යි.

ඉක්බිති පසේනදි කොසොල් රජ ඛෙමා මෙහෙණගේ දේශනාව පිළිගෙන අනුමෝදන් ව හුනස්නෙන් නැඟී ඛෙමා මෙහෙණ වැඳ පැදකුණු කොට ගියේ ය. එකල්හි පසේනදි කොසොල් රජ පසු කලෙක භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්-පස් ව හුන්නේ ය. එකත් පස් ව හුන් පසේනදි කොසොල් රජ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: වහන්ස, කිමෙක් ද සත්ත්වයා මරණින් මතු වේ ද යි. මහරජ සත්ත්වයා මරණින් මතු වේ''යි මෙය මවිසින් නො පවසන ලදි. වහන්ස කිමෙක් ද, සත්ත්වයා මරණින් මතු නො වේ ද යි. මහරජ සත්ත්වයා මරණින් මතු නො වේය යි ද මා විසින් නො පවසන ලදි...

කින්නු ඛො භන්තෙ හොති තථාගතො පරම්මරණාති ඉති පුට්ඨො සමානො අව්‍යාකතං ඛො එතං මහාරාජ මයා: "හොති තථාගතො පරම්මරණා"ති වදෙසි -පෙ- කිම්පන භන්තෙ නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති ඉති පුට්ඨො සමානො තම්පි ඛො මහාරාජ අව්‍යාකතං මයා: "නෙව හොති න න හොති තථාගතො පරම්මරණා"ති වදෙසි. කො නු ඛො භන්තෙ හෙතු කො පච්චයො, යෙන තං අව්‍යාකතං භගවතාති.

තෙන හි මහාරාජ තඤ්ඤෙවෙත්ථ පටිපුච්ඡිස්සාමි, යථා තෙ ඛමෙය්‍ය තථා නං ව්‍යාකරෙය්‍යාසි. තං කිම්මඤ්ඤසි මහාරාජ, අත්ථි තෙ කොචි ගණකො වා මුද්දිකො වා සඞ්ඛායකො වා යො පහොති ගඞ්ගාය වාලිකං ගණෙතුං "එත්තකා වාලිකාති වා -පෙ- එත්තකානි වාලිකා සත සහස්සානීති වා"ති. නො හෙතං භන්තෙ. අත්ථි පන තෙ කොචි ගණකො වා මුද්දිකො වා සඞ්ඛායකො වා යො පහොති මහාසමුද්දෙ උදකං පමෙතුං "එත්තකානි උදකාළ්හකානීති වා -පෙ- එත්තකානි උදකාළ්හකසතසහස්සානීති වා"ති. නො හෙතං භන්තෙ. තං කිස්ස හෙතු: මහා භන්තෙ සමුද්දෙ ගම්භීරො අප්පමෙය්‍යො අප්පරියොගාහොති.

එවමෙව ඛො මහාරාජ, යෙන රූපෙන තථාගතං පඤ්ඤාපයමානො පඤ්ඤාපෙය්‍ය, තං රූපං තථාගතස්ස පහීනං උච්ඡින්නමූලං තාලාවත්ථුකතං අනභාවකතං ආයතිං අනුප්පාදධම්මං, රූපසඞ්ඛයවිමුත්තො ඛො මහාරාජ තථාගතො ගම්භීරො අප්පමෙය්‍යො දුප්පරියොගාහො සෙය්‍යථාපි මහාසමුද්දෙ, හොති තථාගතො පරම්මරණාතිපි න උපෙති -පෙ- නෙව හොති න නහොති තථාගතො පරම්මරණාතිපි න උපෙති.

යාය වෙදනාය -පෙ- යාය සඤ්ඤාය -පෙ- යෙහි සඞ්ඛාරෙහි -පෙ- යෙන විඤ්ඤාණෙන තථාගතං පඤ්ඤාපයමානො පඤ්ඤාපෙය්‍ය, තං විඤ්ඤාණං තථාගතස්ස පහීනං උච්ඡින්නමූලං තාලාවත්ථුකතං අනභාවකතං ආයතිං අනුප්පාදධම්මං, විඤ්ඤාණසඞ්ඛයවිමුත්තො ඛො මහාරාජ තථාගතො ගම්භීරො අප්පමෙය්‍යො දුප්පරියොගාහො සෙය්‍යථාපි සමුද්දෙ, හොති තථාගතො පරම්මරණාතිපි න උපෙති -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාතිපි න උපෙතීති.

වහන්ස, කිමෙක් ද සත්ත්වයා මරණින් මතු වේ ද යි මෙසේ පුළුවුස්නා ලද්දහු මහරජ සත්ත්වයා මරණින් මතු වේ යයි මෙය මවිසින් නො පවසන ලද යි වදරවු ... වහන්ස කිමෙක් ද සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ ද යි මෙසේ පුළුවුස්නා ලද්දහු මහරජ සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේය යි එ ද මවිසින් නොපවසන ලද යි වදරවූ. වහන්ස යම් හෙයෙකින් භාග්‍යවතුන් වහන්සේ විසින් එය නොවදරන ලද්දේ නම් එයට හේතු කිම ප්‍රත්‍යය කිමැ යි.

මහරජ එසේ වී නම් මෙහි ලා තොප ම පුළුවුස්නෙමි. යම්සේ තොපට වැටහෙන්නේ නම් එසේ එය විසඳන්නහු ය. මහරජ ඒ කිමැ යි හඟිහි ද? යමෙක් ගංගානදියෙහි වැලි මෙතෙකැ යි හෝ ... වැලි මෙතෙක් සියදහසෙකැ යි හෝ ගණින්නට පොහෝනේ නම් එබඳු කිසි ගණන් කරන්නෙක් හෝ මුද්‍රා ගණනායෙහි කුශලයෙක් හෝ පිඩුගණන් දක්වන්නෙක් හෝ තොපට ඇද්ද යි. වහන්ස, මෙය නො වේ ම ය. යමෙක් මහ මුහුදෙහි දිය ලහසු මෙතෙකැ යි හෝ ... දිය ලහසු මෙතෙක් සියදහසකැ යි හෝ දිය පමණ කරන්නට පොහෝනේ නම් එබඳු කිසි ගණන් කරන්නෙක් හෝ මුද්‍රා ගණකයෙක් හෝ පිඩුගණන් දක්වන්නෙක් හෝ තොපට ඇද්ද යි. වහන්ස මෙය නො වේ ම ය. ඒ කවර හෙයින් ද? වහන්ස මුහුද විශාල ය, ගැඹුරු ය, නොපමණ ය. නො බැස ගත හැක්කේ යි.

මහරජ, එසෙයින් ම පනවන්නෙක් යම්රූවෙකින් සත්ත්වයා පනවන්නේ නම් ඒ රූව තථාගතයන්ට ප්‍රහීණ ය, උසුන්මුල් ඇත්තේ ය, හිස්සුන් තල් ගසක් මෙන් කරන ලද්දේ ය, නැවත නොහටගන්නා බව කරන ලද්දේ ය, මතු නූපදනා ස්වභාව ඇත්තේ ය. මහරජ තථාගත රූ පැනවීමෙන් මිදුණේ ය, ගැඹුරු ය, නොපමණ ය, නොබැසගත හැක්කේ ය, මහමුහුද මෙනි. සත්ත්වයා මරණින් මතු වේය යි පැනවීමට ද නො පැමිණෙයි ... සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේය යි පැනවීමට ද නො පැමිණේ යි.

යම් වේදනාවකින් ... යම් සංඥාවකින් ... යම් සංස්කාර කෙනකුන්ගෙන් ... පනවන්නෙක් යම් විඥානයෙකින් සත්ත්වයා පනවන්නේ නම් ඒ විඥානය තථාගතයන්ට ප්‍රහීණ ය, උසුන්මුල් ඇත්තේය, හිස්සුන් තල්ගසක් මෙන් කරන ලද්දේ ය, නැවත නොහටගන්නා බව කරන ලද්දේ ය, මතු නූපදනා ස්වභාව ඇත්තේ ය. මහරජ, තථාගත තෙමේ විඥාන පැනවීමෙන් මිදුණේ ය, ගැඹුරු ය, නො පමණ ය, නොබැස ගත හැක්කේ ය. මහමුහුද මෙනි. සත්ත්වයා මරණින් මතු වේය යි පැනවීමට ද නො පැමිණෙයි ... සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේය යි පැනවීමට ද නො පැමිණේ යි.

අච්ඡරියං භන්තෙ, අබ්භුතං භන්තෙ, යත්‍ර හි නාම සත්‍ථු[1] චෙව සාවිකාය ච අත්‍ථෙන අත්‍ථො ව්‍යඤ්ජනෙන ව්‍යඤ්ජනං සංසන්දිස්සති සමෙස්සති න විහායිස්සති[2] යදිදං අග්ගපදස්මිං. එකමිදාහං භන්තෙ සමයං ඛෙමං භික්ඛුනිං උපසඞ්කමිත්‍වා එතමත්‍ථං ආපුච්ඡිං. සා පි මෙ අය්‍යා එතෙහි පදෙහි එතෙහි ව්‍යඤ්ජනෙහි එතමත්‍ථං ව්‍යාකාසි සෙය්‍යථාපි භගවා. අච්ඡරියං භන්තෙ අබ්භුතං භන්තෙ, යත්‍ර හි නාම සත්‍ථු චෙව සාවිකාය ච අත්‍ථෙන අත්‍ථො ව්‍යඤ්ජනෙන ව්‍යඤ්ජනං සංසන්දිස්සති සමෙස්සති න විහායිස්සති යදිදං අග්ගපදස්මිං. හන්‍ද ච දානි මයං භන්තෙ ගච්ඡාම, බහුකිච්චා මයං බහුකරණීයාති. යස්සදානි ත්‍වං මහාරාජ කාලං මඤ්ඤසීති. අථ ඛො රාජා පසෙනදි කොසලො භගවතො භාසිතං අභිනන්‍දිත්‍වා අනුමොදිත්‍වා උට්ඨායාසනා භගවන්‍තං අභිවාදෙත්‍වා පදක්ඛිණං කත්‍වා පක්කාමීති.

## 10. 1. 2

## අනුරාධසුත්තං

2277. එකං සමයං භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං. තෙන ඛො පන සමයෙන ආයස්මා අනුරාධො භගවතො අවිදූරෙ අරඤ්ඤකුටිකායං විහරති. අථ ඛො සම්බහුලා අඤ්ඤතිත්‍ථියා පරිබ්බාජකා යෙනායස්මා අනුරාධො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්‍වා ආයස්මතා අනුරාධෙන සද්ධිං සම්මොදිංසු. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්‍වා එකමන්‍තං නිසීදිංසු. එකමන්‍තං නිසින්නා ඛො තෙ අඤ්ඤතිත්‍ථියා පරිබ්බාජකා ආයස්මන්‍තං අනුරාධං එතදවොචුං: යො සො ආවුසො අනුරාධ, තථාගතො උත්තමපුරිසො පරමපුරිසො පරමපත්තිපත්තො, තං තථාගතො ඉමෙසු චතුසු ඨානෙසු පඤ්ඤපයමානො පඤ්ඤපෙති: "හොති තථාගතො පරම්මරණාති වා, න හොති තථාගතො පරම්මරණාති වා, හොති ච න ච හොති තථාගතො පරම්මරණාති වා, නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වා"ති.

යො සො ආවුසො තථාගතො උත්තමපුරිසො පරමපුරිසො පරමපත්තිපත්තො, තං තථාගතො අඤ්ඤත්‍ර ඉමෙහි චතූහි ඨානෙහි පඤ්ඤපයමානො පඤ්ඤපෙති: "හොති තථාගතො පරම්මරණාති වා න හොති තථාගතො පරම්මරණාති වා හොති ච න ච හොති තථාගතො පරම්මරණාති වා නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වා"ති. එවං වුත්තෙ අඤ්ඤතිත්‍ථියා පරිබ්බාජකා ආයස්මන්‍තං අනුරාධං එතදවොචුං: යො[3] චායං භික්ඛු නවො භවිස්සති අචිරපබ්බජිතො, ථෙරො වා පන බාලො අව්‍යත්තොති. අථ තෙ අඤ්ඤතිත්‍ථියා පරිබ්බාජකා ආයස්මන්‍තං අනුරාධං නව වාදෙන ච බාලවාදෙන ච අපසාදෙත්‍වා උට්ඨායාසනා පක්කමිංසු.

1. සත්‍ථුනො – සී, 1, සීමු.
2. විරොධයිස්සති – මජසං.
3. යො – සමා.

වහන්ස අසිරියෙකි, වහන්ස අද්භූත ය. යම්හෙයෙකින් දේශනායෙහි ලා ශාස්තෲන් වහන්සේගේ ද ශ්‍රාවිකාවගේ ද අර්ථයෙන් අර්ථය ව්‍යඤ්ජනයෙන් ව්‍යඤ්ජනය සැසඳේ ද සමවේ ද විරුද්ධ නො වේ ද (එහෙයිනි). වහන්ස එක්සමයක මම ඛේමා මෙහෙණ වෙත එළඹ මේ අරුත පිළිවිසීමි. ඒ ආයසීාව ද භාග්‍යවතුන් වහන්සේ මෙන් මේ පදවලින් මේ ව්‍යඤ්ජනවලින් මෙ අර්ථය මට පැවසූවා ය. වහන්ස අසිරියෙකි, වහන්ස අද්භූත ය. යම් හෙයෙකින් දෙශනාවෙහි ලා ශාස්තෲන් වහන්සේගේත් ශ්‍රාවිකාවගේත් අර්ථයෙන් අර්ථය ව්‍යඤ්ජනයෙන් ව්‍යඤ්ජනය සැසඳේ ද සම වේ ද විරුද්ධ නො වේ ද (එහෙයිනි). වහන්ස අපි දැන් යම්හ, අපි බොහෝ කිස ඇත්තමෝ බොහෝ කටයුතු ඇත්තමෝ වම්හ යි. මහරජ තෙපි දැන් ඒ සඳහා කල් දැනැ යි. එකල්හි පසේනදි කොසොල් රජ භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව පිළිගෙන අනුමෝදන් ව හුනස්නෙන් නැඟී භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට ගියේ ය.

## 10. 1. 2

## අනුරාධ සූත්‍රය

2277. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **විසල්පුර** සමීපයෙහි **මහවෙනෙහි** කූටාගාරශාලායෙහි වැඩවසන සේක. එසමයෙහි ආයුෂ්මත් **අනුරාධ තෙරණුවෝ** භාග්‍යවතුන් වහන්සේට නුදුරෙහි වනකිළියෙක වෙසෙති. එකල්හි බොහෝ වූ අන්තොටු පිරිවැජ්ජෝ ආයුෂ්මත් අනුරාධ තෙරුන් වෙත එළඹියහ. එළඹ ආයුෂ්මත් අනුරාධ තෙරුන් සමහ සතුටු වූහ. සතුටු වියයුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් ඒ අන්තොටු පිරිවැජ්ජෝ ආයුෂ්මත් අනුරාධ තෙරුන්ට මෙය කීහ: ඇවැත්නි අනුරාධයෙනි, උත්තමපුරුෂ වූ පරම පුරුෂ වූ ශ්‍රෙෂ්ඨ ප්‍රාප්තියට පැමිණි යම් ඒ සත්ත්වයෙක් වේ නම් තථාගත තෙමේ ඔහු පනවන්නේ ''සත්ත්වයා මරණින් මතු වේ යයි හෝ සත්ත්වයා මරණින් මතු නො වේ යයි හෝ සත්ත්වයා මරණින් මතු වේ නො ද වේ යි හෝ සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නොවේ යයි හෝ යන මේ සිවුකරුණෙහි ලා පනවා දැ යි.

ඇවැත්නි, උත්තම පුරුෂ වූ පරම පුරුෂ වූ ශ්‍රෙෂ්ඨප්‍රාප්තියට පැමිණි යම් ඒ සත්ත්වයෙක් වේ නම් ඔහු පනවන තථාගතයන් වහන්සේ සත්ත්වයා මරණින් මතු වේ යයි හෝ සත්ත්වයා මරණින් මතු නො වේ යයි හෝ සත්ත්වයා මරණින් මතු වේ නො ද වේ යයි හෝ සත්ත්වයා මරණින් මතු නොම වේ නොම නො වේ යයි හෝ'' යන මේ සිවු කරුණෙන් වෙන්ව පනවන සේකැයි. මෙසේ කීකල්හි ඒ අන්තොටු පිරිවැජ්ජෝ ආයුෂ්මත් අනුරාධ තෙරණුවන්ට මෙය කීහ: මෙ මහණ අලුත පැවිදි වූ නවකයෙක් වන. මහලු වූයේ ද බාලයෙක අව්‍යක්තයෙකැ යි. ඉක්බිති ඒ අන්තොටු පිරිවැජ්ජෝ නවකවාදයෙනුත් බාලවාදයෙනුත් ආයුෂ්මත් අනුරාධ තෙරුන්ට අවමන් කොට හුනස්නෙන් නැඟී ගියහ.

අථ ඛො ආයස්මතො අනුරාධස්ස අචිරපක්කන්තෙසු තෙසු අඤ්ඤතිත්ථියෙසු පරිබ්බාජකෙසු එතදහොසි: සචෙ ඛො මං තෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා උත්තරිං පුච්ඡෙය්‍යුං, කථං ව්‍යාකරමානො නු ඛ්වාහං තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං වුත්තවාදී චෙව භගවතො අස්සං, න ච භගවන්තං අභූතෙන අබ්භාචික්ඛෙය්‍යං, ධම්මස්ස චානුධම්මං ව්‍යාකරෙය්‍යං, න ච කොචි සහධම්මිකො වාදනුවාදො ගාරය්හං ඨානං ආගච්ඡෙය්‍යාති. අථ ඛො ආයස්මා අනුරාධො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා අනුරාධො භගවන්තං එතදවොච:

ඉධාහං භන්තෙ, භගවතො අවිදූරෙ අරඤ්ඤකුටිකායං විහරාමි, අථ ඛො භන්තෙ සම්බහුලා අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා යෙනාහං තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා මම සද්ධිං සම්මොදිංසු, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො භන්තෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා මං එතදවොචුං: යො සො ආවුසො අනුරාධ තථාගතො උත්තමපුරිසො පරමපුරිසො පරමපත්තිප්පත්තො තං තථාගතො ඉමෙසු චතූසු ඨානෙසු පඤ්ඤපයමානො පඤ්ඤපෙති: ''හොති තථාගතො පරම්මරණාති වා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වා''ති. එවං වුත්තාහං භන්තෙ තෙ අඤ්ඤතිත්ථියෙ පරිබ්බාජකෙ එතදවොචුං: යො සො ආවුසො තථාගතො උත්තමපුරිසො පරමපුරිසො පරමපත්තිප්පත්තො තං තථාගතො අඤ්ඤත්‍රිමෙහි චතූහි ඨානෙහි පඤ්ඤපයමානො පඤ්ඤපෙති: ''හොති තථාගතො පරම්මරණාති වා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වා''ති.

එවං වුත්තෙ භන්තෙ තෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා මං එතදවොචුං: යො චායං භික්ඛු නවො භවිස්සති අචිරපබ්බජිතො, ථෙරො වා පන බාලො අව්‍යත්තොති. අථ ඛො මං භන්තෙ තෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා නවවාදෙන ච බාලවාදෙන ච අපසාදෙත්වා උට්ඨායාසනා පක්කමිංසු. තස්ස මය්හං භන්තෙ අචිරපක්කන්තෙසු තෙසු අඤ්ඤතිත්ථියෙසු පරිබ්බාජකෙසු එතදහොසි: සචෙ ඛො මං තෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා උත්තරිං පුච්ඡෙය්‍යුං, කථං ව්‍යාකරමානො නු ඛ්වාහං තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං වුත්තවාදී චෙව භගවතො අස්සං, න ච භගවන්තං අභූතෙන අබ්භාචික්ඛෙය්‍යං, ධම්මස්ස චානුධම්මං ව්‍යාකරෙය්‍යං, න ච කොචි සහධම්මිකො වාදනුවාදො ගාරය්හං ඨානං ආගච්ඡෙය්‍යාති.

තං කිම්මඤ්ඤසි අනුරාධ, රූපං නිච්චං වා අනිච්චං වාති. අනිච්චං භන්තෙ. යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති. දුක්ඛං භන්තෙ, යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං: ''එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා''ති. නො හෙතං භන්තෙ. වෙදනා නිච්චා වා අනිච්චා වාති -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති. අනිච්චං භන්තෙ. යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති. දුක්ඛං භන්තෙ. යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං: ''එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා''ති. නො හෙතං භන්තෙ.

ඉක්බිති ඒ අන්තොටු පිරිවැජ්ජන් ගිය නොබෝ වේලාවෙකින් ආයුෂ්මත් අනුරාධ තෙරුන්ට මෙබඳු සිතෙක් විය: ඉදින් ඒ අන්තොටු පිරිවැජ්ජෝ මතු මා පැන පුළුවුස්නාහු නම් මම ඒ අන්තොටු පිරිවැජ්ජන්ට කෙසේ විසඳන්නෙම් භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද්දක් කියන්නෙකුත් වන්නෙම් ද, භාග්‍යවතුන් වහන්සේට අභූතයෙන් නො ද ගරහා කියන්නෙම් ද, දහමට ද අනුදහමක් පවසන්නෙම් ද, කරුණු සහිත කිසිවාදනුවාදයෙක් ගැරහියයුතු තැනට නො ද පැමිණෙන්නේ දැ යි. ඉක්බිති ආයුෂ්මත් අනුරාධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස්ව හුන්හ: එකත් පස් ව හුන් ආයුෂ්මත් අනුරාධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ.

වහන්ස, මෙහි මම භාග්‍යවතුන් වහන්සේට නුදුරෙහි වනකිළියක වෙසෙමි. වහන්ස, එකල්හි බොහෝවූ අන්තොටු පිරිවැජ්ජෝ මා වෙත එළඹියහ. එළඹ මා සමඟ සතුටු වූහ. සතුටු වියයුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පස් ව හුන්හ. වහන්ස, එකත්පස්ව හුන් අන්තොටු පිරිවැජ්ජෝ මට මෙය කීහ: ඇවැත්නි අනුරාධයෙනි, උත්තම පුරුෂ වූ පරම පුරුෂ වූ ශ්‍රෙෂ්ඨප්‍රාප්තියට පැමිණි යම් මේ සත්ත්වයෙක් වේ නම් ඔහු පනවන තථාගත තෙමේ "සත්ත්වයා මරණින් මතු වේ'යයි හෝ ... සත්ත්වයා මරණින් මතු නොම වේ නොම නො වේ යයි" හෝ යන මේ සිවු කරුණෙහි ලා පනවා ද යි. වහන්ස, එසේ කී කල්හි ඒ අන්තොටු පිරිවැජ්ජන්ට මම මෙය කීයෙමි. ඇවැත්නි උත්තම පුරුෂ වූ පරම පුරුෂ වූ ශ්‍රෙෂ්ඨ ප්‍රාප්තියට පැමිණි යම් මේ සත්ත්වයෙක් වේ නම් ඔහු පනවන තථාගතයන් වහන්සේ "සත්ත්වයා මරණින් මතු වේයයි හෝ සත්ත්වයා මරණින් මතු නො ම වේ යයි...නො ම නො වේ යයි" හෝ යන මේ සිවුකරුණෙන් වෙන්ව පනවති යි.

වහන්ස, මෙසේ කීකල්හි ඒ අන්තොටු පිරිවැජ්ජෝ මට මෙය කීහ. මේ මහණෙක් අලුත පැවිදි වූ නවකයෙක් වන. මහලු වූයේ නමුත් බාලයෙක, අව්‍යක්තයෙකැ යි. වහන්ස, ඉක්බිති ඒ අන්තොටු පිරිවැජ්ජෝ නවකවාදයෙනුත් බාලවාදයෙනුත් මට අවමන් කොට හුනස්නෙන් නැඟී ගියහ. වහන්ස, ඒ අන්තොටු පිරිවැජ්ජන් ගිය නොබෝ වේලාවෙකින් මට මෙබඳු සිතෙක් විය: ඉදින් ඒ අන්තොටු පිරිවැජ්ජෝ මතු මා පැන පුළුවුස්නාහු නම් මම ඒ අන්තොටු පිරිවැජ්ජන්ට කෙසේ විසඳන්නෙම් භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද්දක් කියන්නෙකුත් වන්නෙම් ද, භාග්‍යවතුන් වහන්සේට අභූතයෙන් නො ද ගරහා කියන්නෙම් ද, දහමට ද අනුදහමක් පවසන්නෙම් ද, කරුණු සහිත කිසිවාදනුවාදයෙක් ගැරහියයුතු තැනට නො ද පැමිණෙන්නේ දැ යි.

අනුරාධ, ඒ කිමැයි හඟිවූ ද? රූප නිත්‍ය වේ ද නොහොත් අනිත්‍ය වේ දැ යි. වහන්ස අනිත්‍ය ය. යමක් අනිත්‍ය වේ නම් එය දුක් වේ ද නොහොත් සුව වේ දැ යි. වහන්ස දුක් වෙයි. යමෙක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වනසුලු නම් තෙල මෙය මාගේ ය, මේ මම වෙමි, මේ මාගේ ආත්ම යයි දක්නට සුදුසු වේ දැ යි. වහන්ස මෙය නො වේ ම ය. වෙදනාව නිත්‍ය වේ ද නොහොත් අනිත්‍ය වේ ද.. සංඥාව.. සංස්කාර... විඥානය නිත්‍ය වේ ද නොහොත් අනිත්‍ය වේ දැ යි. වහන්ස අනිත්‍ය ය. යමෙක් අනිත්‍ය නම් එය දුක් වේ ද, නොහොත් සුව වේ දැ යි. වහන්ස දුක් ය. යමක් අනිස නම් දුක් නම් වෙනස් වනසුලු නම් එය "මෙය මාගේ ය මේ මම වෙමි, මේ මාගේ ආත්මය" යි දක්නට සුදුසු දැ යි. වහන්ස මෙය නො වේ ම ය.

තස්මාතිහ අනුරාධ, යං කිඤ්චිරූපං අතීතානාගත පච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා, සබ්බං රූපං: "නෙතං මම, නෙසො-'හමස්මි, න මෙසො අත්තා"ති. එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. යා කාචි වෙදනා අතීතානාගතපච්චුප්පන්නා -පෙ- යා කාචි සඤ්ඤා -පෙ- යෙ කෙචි සඞ්ඛාරා -පෙ- යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා, යං දූරෙ සන්තිකෙ වා සබ්බං විඤ්ඤාණං: "නෙතං මම, නෙසො'හමස්මි, නමෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

එවං පස්සං අනුරාධ, සුතවා අරියසාවකො රූපස්මිම්පි නිබ්බින්දති. වෙදනායපි නිබ්බින්දති, සඤ්ඤායපි නිබ්බින්දති, සඞ්ඛාරෙසුපි නිබ්බින්දති, විඤ්ඤාණස්මිම්පි නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති. විරාගා විමුච්චති විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති.

තං කිංමඤ්ඤසි අනුරාධ, රූපං තථාගතොති සමනුපස්සසීති? නො හෙතං භන්තෙ. වෙදනං තථාගතොති සමනුපස්සසීති? නො හෙතං භන්තෙ, සඤ්ඤං තථාගතොති සමනුපස්සසීති? නො හෙතං භන්තෙ, සඞ්ඛාරෙ තථාගතොති සමනුපස්සසීති? නො හෙතං භන්තෙ, විඤ්ඤාණං තථාගතොති සමනුපස්සසීති? නො හෙතං භන්තෙ, තං කිංමඤ්ඤසි අනුරාධ, රූපස්මිං තථාගතොති සමනු-පස්සසීති? නො හෙතං භන්තෙ. අඤ්ඤත්‍ර රූපා තථාගතොති සමනුපස්සසීති? නො හෙතං භන්තෙ. වෙදනාය තථාගතොති සමනුපස්සසීති? නො හෙතං භන්තෙ, අඤ්ඤත්‍ර වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- අඤ්ඤත්‍ර සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- අඤ්ඤත්‍ර සඞ්ඛාරෙහි -පෙ- විඤ්ඤාණස්මිං තථාගතොති සමනුපස්සසීති? නො හෙතං භන්තෙ, අඤ්ඤත්‍ර විඤ්ඤාණා තථාගතොති සමනු-පස්සසීති? නො හෙතං භන්තෙ. තං කිං මඤ්ඤසි අනුරාධ, රූපං -පෙ- වෙදනං -පෙ- සඤ්ඤං[1] -පෙ- සඞ්ඛාරෙ. -පෙ- විඤ්ඤාණං තථාගතොති සමනුපස්සසීති? නො හෙතං භන්තෙ.

තං කිං මඤ්ඤසි අනුරාධ, අයං සො අරූපී අවෙදනො අසඤ්ඤී අසඞ්ඛාරො අවිඤ්ඤාණො තථාගතොති සමනුපස්සසීති? නො හෙතං භන්තෙ. එත්ථ තෙ අනුරාධ, දිට්ඨෙව ධම්මෙ සච්චතො ථෙතතො[2] තථාගතෙ අනුපලබ්භියමානෙ[3] කල්ලන්නු තෙ තං ව්‍යාකරණාය:[4] "යො සො ආවුසො තථාගතො උත්තමපුරිසො පරමපුරිසො පරමපත්තිපත්තො., තං තථාගතො අඤ්ඤත්‍රිමෙහි චතූහි ඨානෙහි පඤ්ඤාපයමානො පඤ්ඤාපෙති: හොති තථාගතො පරම්මරණාති වා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වා"ති? නො හෙතං භන්තෙ: සාධු සාධු[5] අනුරාධ, පුබ්බෙ චාහං අනුරාධ, එතරහි ච දුක්ඛඤ්චෙව පඤ්ඤාපෙමි දුක්ඛස්ස ච නිරොධන්ති.

---

1. වෙදනා, සඤ්ඤා - සී 1, 2
2. සච්චතො වා - ස්‍යා.
   ථෙතතො වා - ස්‍යා
3. තථාගතො අනුපලබ්භියමානො - මජසං.
   අනුපලබ්භනීයසභාවො - ස්‍යා
   ලබ්භනීයසභාවො - ස්‍යා
4. වෙය්‍යාකරණාය - ස්‍යා මජසං.
5. සාධු, සීමු

අනුරාධ, එහෙයින් මෙහි ලා අතීත වූ හෝ අනාගත වූ හෝ පච්චුප්පන්න වූ හෝ ආධ්‍යාත්මික වූ හෝ බාහිර වූ හෝ ඖදරික වූ හෝ සූක්ෂ්ම වූ හෝ හීන වූ හෝ ප්‍රණීත වූ හෝ යම් කිසි රූපයෙක් වේ ද දුර වූ හෝ ළඟ වූ හෝ යම් රූපයෙකුත් වේ ද ඒ සියලු රූපය "මෙය මාගේ නො වෙයි, මේ මම නො වෙමි, මේ මාගේ ආත්මය නො වේ" යයි මෙසේ මෙය තතු සේ මනා නුවණින් දක්ක යුතු. අතීත වූ හෝ අනාගත වූ හෝ පච්චුප්පන්න වූ හෝ යම්කිසි වේදනාවක් වේ ද...යම්කිසි සංඥාවක් වේ ද...යම්කිසි සංස්කාර කෙනෙක් වෙත් ද...අතීත වූ හෝ අනාගත වූ හෝ පච්චුප්පන්න වූ හෝ ආධ්‍යාත්මික වූ හෝ බාහිර වූ හෝ ඖදරික වූ හෝ සූක්ෂ්ම වූ හෝ හීන වූ හෝ ප්‍රණීත වූ හෝ යම්කිසි විඥානයෙක් වේ ද, දුර වූ හෝ ළඟ වූ හෝ යම් විඥානයෙකුත් වේ ද, ඒ සියලු විඥානය "මේ මාගේ නො වේ, මේ මම නො වෙමි, මේ මාගේ ආත්මය නො වේ" යයි මෙසේ මෙය තතුසේ මනා නුවණින් දක්ක යුතු.

අනුරාධ, මෙසේ දක්නා ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ රූපයෙහිත් කලකිරෙයි, වෙදනාවෙහිත් කලකිරෙයි, සංඥාවෙහිත් කලකිරෙයි, සංස්කාරයන්හිත් කලකිරෙයි, විඥානයෙහිත් කලකිරෙයි. කලකිරෙන්නේ නො ඇලෙයි. නො ඇල්මෙන් මිදෙයි. මිදුණු කල්හි මිදුණේ යයි දැනීම වෙයි. ඉපැද්ම ගෙවිණ. බඹසර වැස නිමවන ලදී. කටයුතු කරන ලදී. මේ බැව් පිණිස අනෙකක් නැතැ යි දැනගනී.

අනුරාධ, ඒ කිමැ යි හඟිවු ද? රූපය සත්ත්වයා යයි දකිවු දැ? යි. වහන්ස, මෙය නො වේ ම ය. වෙදනාව සත්ත්වයා යයි දකිවු දැ?යි. වහන්ස, මෙය නො වේ ම ය. සංඥාව සත්ත්වයා යයි දකිවු දැ? යි, වහන්ස, මෙය නො වේ ම ය. සංස්කාර සත්ත්වයා යයි දකිවු දැ? යි. වහන්ස, මෙය නො වේ ම ය. විඥානය සත්ත්වයා යයි දකිවු දැ? යි. වහන්ස, මෙය නො වේ ම ය. අනුරාධ, ඒ කිමැ යි හඟිවු ද? රූපයෙහි සත්ත්වයා වේ යයි දකිවු දැ? යි වහන්ස මෙය නො වේ මය. රූපයෙන් වෙන් ව සත්ත්වයා වේ යයි දකිවු දැ? යි. වහන්ස, මෙය නො වේ ම ය. වෙදනාවෙහි සත්ත්වයා වේයයි දකිවු දැ? යි වහන්ස, මෙය නො වේ ම ය. වෙදනාවෙන් වෙන් ව... සංඥාවෙහි...සංඥාවෙන් වෙන් ව ..සංස්කාරයන්හි...සංස්කාරයන්ගෙන් වෙන් ව ...විඥානයෙහි සත්ත්වයා වේ යයි දකිවු දැ? යි වහන්ස, මෙය නො වේ ම ය. විඥානයෙන් වෙන් ව සත්ත්වයා වේ යයි දකිවු දැ?යි, වහන්ස, මෙය නො වේ ම ය. අනුරාධ, ඒ කිමැ යි හඟිවු ද? රූපය...වෙදනාව... සංඥාව ... සංස්කාර ... විඥානය සත්ත්වයා වේ යයි දකිවු දැ?යි. වහන්ස, මෙය නො වේ ම ය.

අනුරාධ, ඒ කිමැ යි හඟිවු ද? මේ ඒ රූපය නැත්තෙක් වෙදනා නැත්තෙක් සංඥා නැත්තෙක් සංස්කාර නැත්තෙක් විඥානය නැත්තෙක් සත්ත්වයා වේ යයි දකිවු දැ? යි වහන්ස, මෙය නො වේ ම ය. අනුරාධ, මෙහි ලා තොපට දිටුදැමියෙහි ම සත්‍ය වශයෙන් ස්ථිර වශයෙන් සත්ත්වයකු නොලැබෙන කල්හි "ඇවැත්නි, උත්තමපුරුෂ වූ පරමපුරුෂ වූ ශ්‍රෙෂ්ඨප්‍රාප්තියට පැමිණි යම් ඒ සත්ත්වයෙක් වේ නම් ඔහු පනවන තථාගතයන් වහන්සේ සත්ත්වයා මරණින් මතු වේ යයි හෝ .. සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නොවේ යයි හෝ යන මේ සි වුකරුණින් වෙන් ව පනවති"යි එය තොප විසින් පැවසීමට සුදුසු දැ?යි. වහන්ස, මෙය නො වේ ම ය. අනුරාධ, මැනවි මැනවි. අනුරාධ, මම පෙරත් දැනුත් දුකත් දුක්ඛනිරොධයත් පනවමි යි.

# 10. 1. 3

## උපගතසුත්තං

2278. එකං සමයං ආයස්මා සාරිපුත්තො ආයස්මා ච මහාකොට්ඨිතො බාරාණසියං විහරන්ති ඉසිපතනෙ මිගදායෙ. අථ ඛො ආයස්මා මහාකොට්ඨිතො සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙනායස්මා සාරිපුත්තො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මතා සාරිපුත්තෙන සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො ආයස්මා මහාකොට්ඨිතො ආයස්මන්තං සාරිපුත්තං එතදවොච:

කින්නු ඛො ආවුසො සාරිපුත්ත, හොති තථාගතො පරම්මරණාති? අව්‍යාකතං ඛො එතං ආවුසො, භගවතා: "හොති තථාගතො පරම්මරණා"ති. කිං පනාවුසො, න හොති තථාගතො පරම්මරණාති? එතම්පි ඛො ආවුසො, අව්‍යාකතං භගවතා: "න හොති තථාගතො පරම්මරණා"ති. කින්නු ඛො ආවුසො, හොති ච න ච හොති තථාගතො පරම්මරණාති? එතම්පි ඛො ආවුසො, අව්‍යාකතං භගවතා: "හොති ච න ච හොති තථාගතො පරම්මරණා"ති. කිං පනාවුසො, නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති? එතම්පි ඛො ආවුසො, අව්‍යාකතං භගවතා: නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති.

කින්නු ඛො ආවුසො, හොති තථාගතො පරම්මරණාති ඉති පුට්ඨො සමානො අව්‍යාකතං ඛො ආවුසො, එතං භගවතා: "හොති තථාගතො පරම්මරණා"ති වදෙසි -පෙ- කිං පනාවුසො, නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති ඉති පුට්ඨො සමානො එතම්පි ඛො ආවුසො, අව්‍යාකතං භගවතා: "නෙව හොති න න හොති තථාගතො පරම්මරණා"ති වදෙසි, කො නු ඛො ආවුසො, හෙතු කො පච්චයො යෙන තං අව්‍යාකතං භගවතාති.

හොති තථාගතො පරම්මරණාති ඛො ආවුසො, රූපගතමෙතං, න හොති තථාගතො පරම්මරණාති රූපගතමෙතං, හොති ච න ච හොති තථාගතො පරම්මරණාති රූපගතමෙතං, නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති රූපගතමෙතං. හොති තථාගතො පරම්මරණාති ඛො ආවුසො, වෙදනාගතමෙතං, න හොති තථාගතො පරම්මරණාති වෙදනාගතමෙතං, හොති ච න ච හොති තථාගතො පරම්මරණාති වෙදනාගතමෙතං, නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වෙදනාගතමෙතං. හොති තථාගතො පරම්මරණාති

## 10. 1. 3

## උපගත සූත්‍රය

2278. එක්කලෙක **ආයුෂ්මත් සාරිපුත්ත තෙරණුවෝත්** ආයුෂ්මත් **කොට්ඨිත තෙරණුවෝත් බරණැස් නුවර** සමීපයෙහි මිගදය නම් වූ ඉසිපතනාරාමයෙහි වැඩවෙසෙති. එකල්හි ආයුෂ්මත් **මහාකොට්ඨිත** තෙරණුවෝ සවස්කල පලසමවතින් නැගීසිටි සේක් ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් වෙත එළඹියහ. එළඹ සැරියුත් තෙරණුවන් සමඟ සතුටු වූහ. සතුටු වියයුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පසෙක වැඩ හුන්හ. එකත්පසෙක වැඩහුන් ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවෝ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට මෙය වදළහ:

ඇවැත්නි ශාරිපුත්‍රයෙනි, කිම ''සත්ත්වයා මරණින් මතු වේ ද?''යි ඇවැත්නි, ''සත්ත්වයා මරණින් මතු වේ යයි මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදරන ලදි. ඇවැත්නි, කිම ''සත්ත්වයා මරණින් මතු නො වේ ද?''යි ඇවැත්නි, ''සත්ත්වයා මරණින් මතු නො වේ''යයි මෙ ද භාග්‍යවතුන් වහන්සේ විසින් නො වදරන ලදි. ඇවැත්නි, කිම ''සත්ත්වයා මරණින් මතු වේ නො ද වේ ද?''යි. ඇවැත්නි, ''සත්ත්වයා මරණින් මතු වේ නො ද වේ''යයි මෙ ද භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදරන ලදි. ඇවැත්නි, කිම ''සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ ද?''යි ඇවැත්නි, ''සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ''යයි මෙ ද භාග්‍යවතුන් වහන්සේ විසින් නො වදරන ලදි.

ඇවැත්නි කිම, ''සත්ත්වයා මරණින් මතු වේ ද?''යි මෙසේ පුළුවුස්නා ලද්දහු ඇවැත්නි, ''සත්ත්වයා මරණින් මතු වේ''යයි මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදරන ලද''යි කියවු ... ඇවැත්නි, කිම? ''සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ ද?''යි මෙසේ පුළුවුස්නා ලද්දහු ඇවැත්නි ''සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ''යයිමෙ ද භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදරන ලද යි කියවු. ඇවැත්නි, යම් හෙයෙකින් එය භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදරන ලද්දේ නම් එයට හෙතු කිම? ප්‍රත්‍යය කිමැ?යි.

ඇවැත්නි, සත්ත්වයා මරණින් මතු වේ යන මෙය රූපමාත්‍රයෙකි. සත්ත්වයා මරණින් මතු නො වේ යන මෙය රූපමාත්‍රයෙකි. සත්ත්වයා මරණින් මතු වේ නො ද වේ යන මෙය රූපමාත්‍රයෙකි. සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ යන මෙය රූපමාත්‍රයෙකි. ඇවැත්නි, සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ යන මෙය වෙදනා මාත්‍රයෙකි. සත්ත්වයා මරණින් මතු වේ යන මෙය වෙදනාමාත්‍රයෙකි. සත්ත්වයා මරණින් මතු නො වේ යන මෙය වෙදනාමාත්‍රයෙකි. සත්ත්වයා මරණින් මතු වේ නො ද වේ යන මෙය වෙදනාමාත්‍රයෙකි. ඇවැත්නි, සත්ත්වයා මරණින් මතු වේ යන මෙය සංඥාමාත්‍රයෙකි. සත්ත්වයා මරණින් මතු නො වේ යන මෙය සංඥාමාත්‍රයෙකි. සත්ත්වයා මරණින් මතු වේ නො ද වේ යන මෙය සංඥාමාත්‍රයෙකි. සත්ත්වයා මරණින් මතු

බො ආවුසො **සඤ්ඤ**ගතමෙතං, න හොති තථාගතො පරම්මරණාති **සඤ්ඤ**ගතමෙතං, හොති ච න ච හොති තථාගතො පරම්මරණාති **සඤ්ඤ**ගතමෙතං, නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති **සඤ්ඤ**ගතමෙතං. හොති තථාගතො පරම්මරණාති බො ආවුසො, **සඞ්ඛාර**ගතමෙතං, න හොති තථාගතො පරම්මරණාති **සඞ්ඛාර**ගතමෙතං හොති ච න ච හොති තථාගතො පරම්මරණාති **සඞ්ඛාර**ගතමෙතං, නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති **සඞ්ඛාර**ගතමෙතං. හොති තථාගතො පරම්මරණාති බො ආවුසො, **විඤ්ඤාණ**ගතමෙතං, න හොති තථාගතො පරම්මරණාති **විඤ්ඤාණ**ගතමෙතං, හොති ච න ච හොති තථාගතො පරම්මරණාති **විඤ්ඤාණ**ගතමෙතං, නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති **විඤ්ඤාණ**ගතමෙතං.

අයං බො ආවුසො, හෙතු අයං පච්චයො යෙන තං අව්‍යාකතං භගවතාති.

## 10. 1. 4

## සමුදයසුත්තං

2279. එකං සමයං ආයස්මා ච **සාරිපුත්තො** ආයස්මා ච **මහා කොට්ඨිතො බාරාණසියං** විහරන්ති **ඉසිපතනෙ මිගදායෙ**, -පෙ- කො නු බො ආවුසො, හෙතු කො පච්චයො යෙන තං අව්‍යාකතං භගවතාති. රූපං බො ආවුසො, අජානතො අපස්සතො යථාභූතං, රූපසමුදයං අජානතො අපස්සතො යථාභූතං, රූපනිරොධං අජානතො අපස්සතො යථාභූතං, රූපනිරොධගාමිනිං පටිපදං අජානතො අපස්සතො යථාභූතං: හොති තථාගතො පරම්මරණාතිපිස්ස හොති, න හොති තථාගතො පරම්මරණාතිපිස්ස හොති, හොති ච න ච හොති තථාගතො පරම්මරණාතිපිස්ස හොති, නෙව හොති න න හොති තථාගතො පරම්මරණාතිපිස්ස හොති.

වෙදනං අජානතො අපස්සතො යථාභූතං, වෙදනාසමුදයං -පෙ- **සඤ්ඤං** -පෙ- **සඞ්ඛාරෙ** -පෙ- **විඤ්ඤාණං** අජානතො අපස්සතො යථාභූතං, **විඤ්ඤාණ**සමුදයං අජානතො අපස්සතො යථාභූතං, **විඤ්ඤාණ**නිරොධං අජානතො අපස්සතො යථාභූතං, **විඤ්ඤාණ**නිරොධගාමිනිං පටිපදං අජානතො අපස්සතො යථාභූතං හොති තථාගතො පරම්මරණාතිපිස්ස හොති, න හොති තථාගතො පරම්මරණාතිපිස්ස හොති, හොති ච න ච හොති තථාගතො පරම්මරණාතිපිස්ස හොති, නෙව හොති න න හොති තථාගතො පරම්මරණාතිපිස්ස හොති.

රූපඤ්ච බො ආවුසො, ජානතො පස්සතො යථාභූතං, රූපසමුදයං ජානතො පස්සතො යථාභූතං, රූපනිරොධං ජානතො පස්සතො යථාභූතං රූපනිරොධගාමිනිං පටිපදං ජානතො පස්සතො යථාභූතං හොති තථාගතො පරම්මරණාතිපිස්ස න හොති -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාතිපිස්ස න හොති. වෙදනං ජානතො පස්සතො යථාභූතං, වෙදනාසමුදයං -පෙ- **සඤ්ඤං** -පෙ- **සඞ්ඛාරෙ** -පෙ- **විඤ්ඤාණං** ජානතො පස්සතො යථාභූතං, **විඤ්ඤාණ**සමුදයං ජානතො පස්සතො යථාභූතං, **විඤ්ඤාණ**නිරොධං ජානතො පස්සතො යථාභූතං, **විඤ්ඤාණ**නිරොධගාමිනිං පටිපදං ජානතො පස්සතො යථාභූතං හොති තථාගතො පරම්මරණාතිපිස්ස න හොති, න හොති තථාගතො පරම්මරණාතිපිස්ස න හොති, හොති ච න ච හොති තථාගතො පරම්මරණාතිපිස්ස න හොති, නෙව හොති න න හොති තථාගතො පරම්මරණාතිපිස්ස න හොති. අයං බො ආවුසො, හෙතු අයං පච්චයො යෙන තං අව්‍යාකතං භගවතාති.

නො ම වේ නො ම නො වේ යන මෙය සංඥාමාත්‍රයෙකි. ඇවැත්නි, සත්ත්වයා මරණින් මතු වේ යන මෙය සංස්කාරමාත්‍රයෙකි. සත්ත්වයා මරණින් මතු නො වේ යන මෙය සංස්කාරමාත්‍රයෙකි. සත්ත්වයා මරණින් මතු වේ නොද වේ යන මෙය සංස්කාරමාත්‍රයෙකි. සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ යන මෙය සංස්කාරමාත්‍රයෙකි. ඇවැත්නි, සත්ත්වයා මරණින් මතු වේ යන මෙය විඥානමාත්‍රයෙකි. සත්ත්වයා මරණින් මතු නො වේ යන මෙය විඥානමාත්‍රයෙකි. සත්ත්වයා මරණින් මතු වේ නො ද වේ යන මෙය විඥානමාත්‍රයෙකි. සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ යන මෙය විඥානමාත්‍රයෙකි.

ඇවැත්නි, යම් හෙයෙකින් එය භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදරන ලද්දේ නම් එයට මේ හේතු යි, මේ ප්‍රත්‍යය යි.

## 10. 1. 4

## සමුදය සූත්‍රය

2279. එක් කලෙක ආයුෂ්මත් **සාරිපුත්ත** තෙරණුවෝත් ආයුෂ්මත් **මහා කොට්ඨිත** තෙරණුවෝත් බරණැස සමීපයෙහි **මිගදය** නම් වූ **ඉසිපත**-නාරාමයෙහි වැඩවෙසෙති ... ඇවැත්නි, යම් හෙයෙකින් එය භාග්‍යවතුන් වහන්සේ විසින් නො වදරන ලද්දේ නම් එයට හේතු කිම? ප්‍රත්‍යය කිමැ?යි. ඇවැත්නි, රූපය තතු සේ නො දන්නා නො දක්නා රූප සමුදය තතු සේ නො දන්නා නො දක්නා රූපනිරොධය තතු සේ නො-දන්නා නො දක්නා රූප නිරොධගාමිනීපටිපදව තතු සේ නොදන්නා නො දක්නා ඔහුට සත්ත්වයා මරණින් මතු වේ යයි ද ලබ්ධි වෙයි. ඔහුට සත්ත්වයා මරණින් මතු නො වේ යයි ද ලබ්ධි වෙයි. ඔහුට සත්ත්වයා මරණින් මතු වේ නො ද වේ යයි ද ලබ්ධි වෙයි. ඔහුට සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ යයි ද ලබ්ධි වේ.

වේදනාව තතු සේ නො දන්නා නොදක්නා වෙදනා සමුදය...සංඥාව... සංස්කාර...විඥානය තතු සේ නො දන්නා නොදක්නා විඥානසමුදය තතු සේ නො දන්නා නො දක්නා විඥාන නිරොධය තතුසේ නො දන්නා නො දක්නා විඥාන නිරොධගාමිනීපටිපදව තතු සේ නො දන්නා නො-දක්නා ඔහුට සත්ත්වයා මරණින් මතු වේ යයි ද ලබ්ධි වෙයි. ඔහුට සත්ත්වයා මරණින් මතු නො වේ යයි ද ලබ්ධි වෙයි. ඔහුට සත්ත්වයා මරණින් මතු වේ නො ද වේ යයි ද ලබ්ධි වෙයි. ඔහුට සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ යයි ද ලබ්ධි වේ.

ඇවැත්නි, රූපය තතු සේ දන්නා දක්නා රූපසමුදයය තතුසේ දන්නා දක්නා රූපනිරොධය තතු සේ දන්නා දක්නා රූපනිරොධගාමිනීපටිපදව තතු සේ දන්නා දක්නා ඔහුට සත්ත්වයා මරණින් මතු වේ යයි ද ලබ්ධි නො වෙයි. .. සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ යයි ද ලබ්ධි නො වෙයි. වේදනාව තතුසේ දන්නා දක්නා වේදනා සමුදය...සංඥාව... සංස්කාර .. විඥානය තතු සේ දන්නා දක්නා විඥානසමුදය තතු සේ දන්නා දක්නා විඥාන නිරොධය තතු සේ දන්නා දක්නා විඥාන නිරොධ ගාමිනිපටිපදව තතුසේ දන්නා දක්නා ඔහුට සත්ත්වයා මරණින් මතු වේ යයිද ලබ්ධි නො වෙයි. සත්ත්වයා මරණින් මතු නො වේ යයි ද ලබ්ධි නො වෙයි. සත්ත්වයා මරණින් මතු වේ නො ද වේ යයි ද ලබ්ධි නො වෙයි. සත්ත්වයා මරණින් මතු නොම වේ නොම නොවේ යයි ද ලබ්ධි නො වේ. ඇවැත්නි, යම් හෙයෙකින් එය භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදරන ලද්දේ නම් එයට මේ හේතු යැ. මේ ප්‍රත්‍යය යි.

## 10. 1. 5

## පෙමසුත්තං

2280. එකං සමයං ආයස්මා ච **සාරිපුත්තො** ආයස්මා ච **මහාකොට්ඨිතො බාරාණසියං** විහරන්ති **ඉසිපතනෙ මිගදායෙ** -පෙ- කො නු ඛො ආවුසො, හෙතු කො පච්චයො යෙන තං අව්‍යාකතං භගවතාති? රූපෙ ඛො ආවුසො අවිගතරාගස්ස අවිගතච්ඡන්දස්ස අවිගතපෙමස්ස අවිගතපිපාසස්ස අවිගතපරිළාහස්ස අවිගතතණ්හස්ස: හොති තථාගතො පරම්මරණාතිපිස්ස හොති -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාතිපිස්ස හොති.

වෙදනාය අවිගතරාගස්ස අවිගතච්ඡන්දස්ස අවිගතපෙමස්ස අවිගතපිපාසස්ස අවිගතපරිළාහස්ස අවිගතතණ්හස්ස -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ අවිගතරාගස්ස අවිගතච්ඡන්දස්ස අවිගතපෙමස්ස අවිගතපිපාසස්ස අවිගතපරිළාහස්ස අවිගතතණ්හස්ස හොති තථාගතො පරම්මරණාතිපිස්ස හොති, -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාතිපිස්ස හොති.

රූපෙ ච ඛො ආවුසො විගතරාගස්ස විගතච්ඡන්දස්ස විගතපෙමස්ස විගතපිපාසස්ස විගතපරිළාහස්ස විගතතණ්හස්ස හොති තථාගතො පරම්මරණාතිපිස්ස න හොති -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාතිපිස්ස න හොති. වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ විගතරාගස්ස විගතච්ඡන්දස්ස විගතපෙමස්ස විගතපිපාසස්ස විගතපරිළාහස්ස විගතතණ්හස්ස හොති තථාගතො පරම්මරණාතිපිස්ස න හොති -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාතිපිස්ස න හොති. අයං ඛො ආවුසො, හෙතු අයං පච්චයො යෙන තං අව්‍යාකතං භගවතාති.

## 10. 1. 6

## ආරාමසුත්තං

2281. එකං සමයං ආයස්මා ච **සාරිපුත්තො** ආයස්මා ච **මහාකොට්ඨිතො බාරාණසියං** විහරන්ති **ඉසිපතනෙ මිගදායෙ,** අථ ඛො ආයස්මා සාරිපුත්තො සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙනායස්මා මහාකොට්ඨිතො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මතා මහාකොට්ඨිතෙන සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සාරිපුත්තො ආයස්මන්තං මහාකොට්ඨිතං එතදවොච: කින්නු ඛො ආවුසො කොට්ඨිත, හොති තථාගතො පරම්මරණාති? -පෙ- කිං පනාවුසො, නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති ඉති පුට්ඨො සමානො එතම්පි ඛො ආවුසො, අව්‍යාකතං භගවතා: "නෙව හොති න න හොති තථාගතො පරම්මරණා''ති වදෙසි. කො නු ඛො ආවුසො, හෙතු කො පච්චයො යෙන තං අව්‍යාකතං භගවතාති.

## 10. 1. 5
## පෙම සූත්‍රය

2280. එක් කලෙක ආයුෂ්මත් **සාරිපුත්ත** තෙරණුවෝත් ආයුෂ්මත් **මහාකොට්ඨිත** තෙරණුවෝත් **බරණැස** සමීපයෙහි **මිගදය** නම් වූ **ඉසිපතනාරාමයෙහි** වැඩ වෙසෙති ... ඇවැත්නි, යම් හෙයෙකින් එය භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදරන ලද්දේ නම් එයට හේතු කිම? ප්‍රත්‍යය කිමැ? යි. ඇවැත්නි, රූපයෙහි නො පහවූ රාග ඇති නො පහවූ ඡන්ද ඇති නො පහවූ ප්‍රේම ඇති නො පහවූ පවස් ඇති නො පහවූ පරිදහ ඇති නො පහ වූ තෘෂ්ණා ඇති ඔහුට සත්ත්වයා මරණින් මතු වේ යයි ද ලබ්යි වෙයි....සත්ත්වයා මරණින් මතු නො ම වෙයි නො ම නො වේ යයි ද ලබ්යි වේ.

වේදනාවෙහි නො පහවූ රාග ඇති නො පහවූ ඡන්ද ඇති නො පහවූ ප්‍රේම ඇති නො පහවූ පවස් ඇති නො පහවූ පරිදහ ඇති නො පහවූ තෘෂ්ණා ඇති...සංඥාවෙහි...සංස්කාරයන්හි ... විඥානයෙහි නො පහවූ රාග ඇති නො පහවූ ඡන්ද ඇති නො පහවූ ප්‍රේම ඇති නො පහවූ පවස් ඇති නො පහවූ පරිදහ ඇති නො පහවූ තෘෂ්ණා ඇති ඔහුට සත්ත්වයා මරණින් මතු වේ යයි ද ලබ්යි වෙයි....සත්ත්වයා මරණින් මතු නොම වේ නොම නො වේ යයි ද ලබ්යි වේ.

ඇවැත්නි, රූපයෙහි පහවූ රාග ඇති පහවූ ඡන්ද ඇති පහවූ ප්‍රේම ඇති පහවූ පවස් ඇති පහවූ පරිදහ ඇති පහවූ තෘෂ්ණා ඇති ඔහුට සත්ත්වයා මරණින් මතු වේ යයි ද ලබ්යි නො වෙයි ... සත්ත්වයා මරණින් මතු නොම වේ නො ම නො වේ යයි ද ලබ්යි නො වේ. වේදනාවෙහි... සංඥාවෙහි ... සංස්කාරයන්හි .. විඥානයෙහි පහවූ රාග ඇති පහවූ ඡන්ද ඇති පහවූ ප්‍රේම ඇති පහවූ පවස් ඇති පහවූ පරිදහ ඇති පහවූ තෘෂ්ණා ඇති ඔහුට සත්ත්වයා මරණින් මතු වේ යයි ද ලබ්යි නො වෙයි ...සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ යයි ද ලබ්යි නො වේ. ඇවැත්නි, යම් හෙයෙකින් භාග්‍යවතුන් වහන්සේ විසින් එය නොවදරන ලද්දේ නම් එයට මේ හේතු ය, මේ ප්‍රත්‍යය යි.

## 10. 1. 6
## ආරාම සූත්‍රය

2281. එක්කලෙක ආයුෂ්මත් **සාරිපුත්ත** තෙරණුවෝත් ආයුෂ්මත් **මහාකොට්ඨිත** තෙරණුවෝත් **බරණැස** සමීපයෙහි **මිගදය** නම් වූ **ඉසිපතනාරාමයෙහි** වැඩවෙසෙති. එකල්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ සවස්කල පලසමවතින් නැගීසිටි සේක් ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවන් වෙත එළඹියහ. එළඹ ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවන් සමග සතුටු වූහ. සතුටු වියයුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පස්ව වැඩහුන්හ. එකත්පස් ව වැඩහුන් ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවන්ට මෙය වදළහ: ඇවැත්නි, කොට්ඨිතයෙනි, කිම සත්ත්වයා මරණින් මතු වේ ද? යි...ඇවැත්නි, කිම සත්ත්වයා මරණින් මතු නො ම වේ, නො ම නො වේ ද යි. මෙසේ පුළුවුස්නා ලද්දහු ඇවැත්නි, සත්ත්වයා මරණින් මතු නො ම වේ, නො ම නො වේ යයි මෙද භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදරන ලද යි කියවූ. ඇවැත්නි, යම් හෙයෙකින් එය භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදරන ලද නම් එයට හේතු කිම ප්‍රත්‍යය කිමැ? යි.

රූපාරාමස්ස ඛො ආවුසො, රූපරතස්ස රූපසම්මුදිතස්ස රූපනිරොධං අජානතො අපස්සතො යථාභූතං හොති තථාගතො පරම්මරණාතිපිස්ස හොති; න හොති තථාගතො පරම්මරණාතිපිස්ස හොති, හොති ච න ච හොති තථාගතො පරම්මරණාතිපිස්ස හොති, නෙව හොති න නහොති තථාගතො පරම්මරණාතිපිස්ස හොති. වෙදනාරාමස්ස ඛො ආවුසො, වෙදනාරතස්ස වෙදනාසම්මුදිතස්ස වෙදනානිරොධං අජානතො අපස්සතො යථාභූතං හොති තථාගතො පරම්මරණාතිපිස්ස හොති -පෙ- සඤ්ඤාරාමස්ස ඛො ආවුසො -පෙ- සඞ්ඛාරාරාමස්ස ඛො ආවුසො -පෙ- විඤ්ඤාණාරාමස්ස ඛො ආවුසො, විඤ්ඤාණරතස්ස විඤ්ඤාණසම්මුදිතස්ස විඤ්ඤාණනිරොධං අජානතො අපස්සතො යථාභූතං හොති තථාගතො පරම්මරණාතිපිස්ස හොති -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාතිපිස්ස හොති.

න රූපාරාමස්ස ඛො ආවුසො, න රූපරතස්ස න රූපසම්මුදිතස්ස රූපනිරොධං ජානතො පස්සතො යථාභූතං හොති තථාගතො පරම්මරණාතිපිස්ස න හොති -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාතිපිස්ස න හොති. න වෙදනාරාමස්ස ඛො ආවුසො, න වෙදනාරතස්ස න වෙදනාසම්මුදිතස්ස -පෙ- න සඤ්ඤාරාමස්ස ඛො ආවුසො -පෙ- න ඛාරාරාමස්ස ඛො ආවුසො -පෙ- න විඤ්ඤාණාරාමස්ස ඛො ආවුසො, න විඤ්ඤාණරතස්ස න විඤ්ඤාණසම්මුදිතස්ස විඤ්ඤාණනිරොධං ජානතො පස්සතො යථාභූතං හොති තථාගතො පරම්මරණාතිපිස්ස න හොති -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාතිපිස්ස න හොති. අයං ඛො ආවුසො, හෙතු අයං පච්චයො යෙන තං අව්‍යාකතං භගවතාති.

සියා පනාවුසො, අඤ්ඤොපි පරියායො යෙන තං අව්‍යාකතං භගවතාති? සියා ආවුසො, භවාරාමස්ස ඛො ආවුසො, භවරතස්ස භවසම්මුදිතස්ස භවනිරොධං අජානතො අපස්සතො යථාභූතං හොති තථාගතො පරම්මරණාතිපිස්ස හොති -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාතිපිස්ස හොති.

න භවාරාමස්ස ඛො ආවුසො, න භවරතස්ස න භවසම්මුදිතස්ස භවනිරොධං ජානතො පස්සතො යථාභූතං හොති තථාගතො පරම්මරණාතිපිස්ස න හොති -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාතිපිස්ස න හොති. අයම්පි ඛො ආවුසො, පරියායො යෙන තං අව්‍යාකතං භගවතාති.

සියා පනාවුසො අඤ්ඤොපි පරියායො යෙන තං අව්‍යාකතං භගවතාති? සියා ආවුසො. උපාදනාරාමස්ස ඛො ආවුසො, උපාදනරතස්ස උපාදනසම්මුදිතස්ස උපාදනනිරොධං අජානතො අපස්සතො යථාභූතං හොති තථාගතො පරම්මරණාතිපිස්ස හොති -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාතිපිස්ස හොති.

ඇවැත්නි, රූපයෙහි ඇලෙන රූපයෙහි ඇලුණු රූපයෙහි සතුටු වූ රූපනිරෝධය තතුසේ නොදන්නා නොදක්නා ඔහුට සත්ත්වයා මරණින් මතු වේ යයි ද සිත් වෙයි. ඔහුට සත්ත්වයා මරණින් මතු නො වේ යයි ද සිත් වෙයි. ඔහුට සත්ත්වයා මරණින් මතු වේ නො ද වේ යයි ද සිත් වෙයි. ඔහුට සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ යයි ද සිත් වේ. ඇවැත්නි, වේදනාවෙහි ඇලෙන වේදනාවෙහි ඇලුණු වේදනාවෙහි සතුටු වූ වේදනා නිරෝධය තතුසේ නොදන්නා නොදක්නා ඔහුට සත්ත්වයා මරණින් මතු වේ යයි ද වේ... ඇවැත්නි, සඤ්ඤායෙහි ඇලෙන... ඇවැත්නි, සඞ්ඛාරයෙහි ඇලෙන ... ඇවැත්නි, විඤ්ඤාණයෙහි ඇලෙන විඤ්ඤාණයෙහි ඇලුණු විඤ්ඤාණයෙහි සතුටු වූ විඤ්ඤාණනිරෝධය තතුසේ නොදන්නා නොදක්නා ඔහුට සත්ත්වයා මරණින් මතු වේ යයි ද ලබ්ධි වෙයි...ඔහුට සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ යයි ද ලබ්ධි වේ.

ඇවැත්නි, රූපයෙහි නොඇලෙන රූපයෙහි නොඇලුණු රූපයෙහි සතුටු නුවූ රූප නිරෝධය තතුසේ දන්නා දක්නා ඔහුට සත්ත්වයා මරණින් මතු වේ යයි ද ලබ්ධි නො වෙයි... ඔහුට සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ යයි ද ලබ්ධි නො වේ. ඇවැත්නි, වේදනාවෙහි නො ඇලෙන වේදනාවෙහි නො ඇලුණු වේදනාවෙහි සතුටු නො වූ... ඇවැත්නි, සඤ්ඤාවෙහි නො ඇලෙන ... ඇවැත්නි, සඞ්ඛාරයෙහි නොඇලෙන ... ඇවැත්නි, විඥ්ඥාණයෙහි නොඇලෙන විඥ්ඥාණයෙහි නොඇලුණු විඤ්ඤාණයෙහි සතුටු නො වූ විඤ්ඤාණනිරෝධය තතුසේ දන්නා දක්නා ඔහුට සත්ත්වයා මරණින් මතු වේ යයි ද ලබ්ධි නො වෙයි. ... ඔහුට සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ යයි ද ලබ්ධි නො වේ. ඇවැත්නි, යම් හෙයෙකින් භාග්‍යවතුන් වහන්සේ විසින් එය නොවදරන ලද නම් එයට මේ හේතු ය, මේ ප්‍රත්‍යය යි.

ඇවැත්නි, යම් හෙයෙකින් එය භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදරන ලද නම් එයට අන් නයෙකුත් වන්නේ ද ?යි. ඇවැත්නි, වන්නේ ය. ඇවැත්නි, භවයෙහි ඇලෙන භවයෙහි ඇලුණු භවයෙහි සතුටු වූ භවනිරෝධය තතුසේ නොදන්නා නොදක්නා ඔහුට සත්ත්වයා මරණින් මතු වේ යයි ද ලබ්ධි වෙයි ... ඔහුට සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ යයි ද ලබ්ධි වේ.

ඇවැත්නි, භවයෙහි නොඇලෙන භවයෙහි නොඇලුණු භවයෙහි සතුටු නො වූ භවනිරෝධය තතුසේ දන්නා දක්නා ඔහුට සත්ත්වයා මරණින් මතු වේ යයි ද ලබ්ධි නො වෙයි ... ඔහුට සත්ත්වයා මරණින් මතු නො ම වේ. නො ම නො වේ යයි ද ලබ්ධි නො වේ. ඇවැත්නි, යම හෙයෙකින් එය භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද නම් එයට මෙ ද කරුණෙකි යි.

ඇවැත්නි, යම් හෙයෙකින් භාග්‍යවතුන් වහන්සේ විසින් එය නොවදරන ලද නම් එයට අන් කරුණෙකු දු වන්නේ ද ? යි. ඇවැත්නි, වන්නේ ය. ඇවැත්නි, උපාදනයෙහි ඇලෙන උපාදනයෙහි ඇලුණු උපාදනයෙහි සතුටු වූ උපාදනනිරෝධය තතුසේ නොදන්නා නොදක්නා ඔහුට සත්ත්වයා මරණින් මතු වේ යයි ද ලබ්ධි වෙයි. ... ඔහුට සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ යයි ද ලබ්ධි වේ.

න උපාදානාරාමස්ස ඛො ආවුසො, න උපාදානරතස්ස න උපාදානසම්මුදිතස්ස උපාදානනිරොධං ජානතො පස්සතො යථාභූතං හොති තථාගතො පරම්මරණාතිපිස්ස න හොති. -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාතිපිස්ස න හොති. අයම්පි ඛො ආවුසො, පරියායො යෙන තං අව්‍යාකතං භගවතාති.

සියා පනාවුසො, අඤ්ඤොපි පරියායො යෙන තං අව්‍යාකතං භගවතාති? සියා ආවුසො. තණ්හාරාමස්ස ඛො ආවුසො, තණ්හාරතස්ස තණ්හාසම්මුදිතස්ස තණ්හානිරොධං අජානතො අපස්සතො යථාභූතං හොති තථාගතො පරම්මරණාතිපිස්ස හොති -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාතිපිස්ස හොති.

න තණ්හාරාමස්ස ඛො ආවුසො, න තණ්හාරතස්ස න තණ්හාසම්මුදිතස්ස තණ්හානිරොධං ජානතො පස්සතො යථාභූතං හොති තථාගතො පරම්මරණාතිපිස්ස න හොති -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාතිපිස්ස න හොති. අයං ඛො ආවුසො, පරියායො යෙන තං අව්‍යාකතං භගවතාති.

සියා පනාවුසො, අඤ්ඤොපි පරියායො යෙන තං අව්‍යාකතං භගවතාති. එත්තාවතා ආවුසො සාරිපුත්ත, ඉතො උත්තරිං කිං ඉච්ඡසි? තණ්හාසඞ්ඛයවිමුත්තස්ස ආවුසො, සාරිපුත්ත, භික්ඛුනො වට්ටං[1] නත්ථි පඤ්ඤාපනායාති.

## 10. 1. 7

### ආයතනසුත්තං

2282. අථ ඛො වච්ඡගොත්තො පරිබ්බාජකො යෙනායස්මා මහාමොග්ගල්ලානො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මතා මහාමොග්ගල්ලානෙන සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො වච්ඡගොත්තො පරිබ්බාජකො ආයස්මන්තං මහාමොග්ගල්ලානං එතදවොච: කින්නු ඛො භො මොග්ගල්ලාන, සස්සතො ලොකොති? අව්‍යාකතං ඛො එතං වච්ඡ[2] භගවතා: "සස්සතො ලොකො"ති. කිං පන භො මොග්ගල්ලාන, අසස්සතො ලොකොති? එතම්පි ඛො වච්ඡ, අව්‍යාකතං භගවතා: "අසස්සතො ලොකො"ති. කින්නු ඛො භො මොග්ගල්ලාන, අන්තවා ලොකොති? අව්‍යාකතං ඛො එතං වච්ඡ, භගවතා: "අන්තවා ලොකො"ති. කිං පන භො මොග්ගල්ලාන, අනන්තවා ලොකොති? එතම්පි ඛො වච්ඡ, අව්‍යාකතං භගවතා "අනන්තවා ලොකො"ති.

---

1. වත්තං - සයා
   වද්ධං - සී 1, 2, PTS.
2. වච්ඡගොත්ත -- සීමු.

ඇවැත්නි, උපාදානයෙහි නො ඇලෙන උපාදානයෙහි නො ඇලුණු උපාදානයෙහි සතුටු නො වූ උපාදානනිරොධය තතුසේ දන්නා දක්නා ඔහුට සත්ත්වයා මරණින් මතු වේ යයි ද ලබ්ධි නො වෙයි ... ඔහුට සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ යයි ද ලබ්ධි නො වේ. ඇවැත්නි, යම් හෙයෙකින් එය භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදරන ලද නම් එයට මෙ ද කරුණෙකි යි.

ඇවැත්නි, යම් හෙයෙකින් එය භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදරන ලද නම් එයට අන් කරුණෙකු දු වන්නේ දෑ? යි. ඇවැත්නි, වන්නේ ය. ඇවැත්නි, තණ්හාවෙහි ඇලෙන තණ්හාවෙහි ඇලුණු තණ්හාවෙහි සතුටු වූ තණ්හා නිරොධය තතුසේ නොදන්නා නොදක්නා ඔහුට සත්ත්වයා මරණින් මතු වේ යයි ද ලබ්ධි වෙයි ... ඔහුට සත්ත්වයා මරණින් මතු නොම වේ නො ම නො වේ යයි ද ලබ්ධි වේ.

ඇවැත්නි තණ්හාවෙහි නොඇලෙන තණ්හාවෙහි නොඇලුණු තණ්හාවෙහි සතුටු නුවූ තණ්හානිරොධය තතුසේ දන්නා දක්නා ඔහුට සත්ත්වයා මරණින් මතු වේ යයි ද ලබ්ධි නො වෙයි ... ඔහුට සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ යයි ද ලබ්ධි නො වේ. ඇවැත්නි, යම් හෙයෙකින් එය භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදරන ලද නම් එයට මෙ ද කරුණෙකි යි.

ඇවැත්නි, යම් හෙයෙකින් එය භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදරන ලද නම් එයට අන් කරුණෙකුදු වන්නේ දෑ? යි. ඇවැත්නි ශාරිපුත්‍රයෙනි, මෙහි දැන් මෙයින් මතු කුමක් කැමැති වවු ද? ඇවැත්නි ශාරිපුත්‍රයෙනි, තෘෂ්ණා ප්‍රහාණයෙන් මිදුණු මහණහට පැනවීම පිණිස සසරවටෙක් නැතැ යි.

## 10. 1. 7

## ආයතන සූත්‍රය

2282. එකල්හි **වච්ඡගොත්ත** පිරිවැජි තෙමේ ආයුෂ්මත් **මහමුගලන්** තෙරණුවන් වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන් සමග සතුටු විය. සතුටු විය යුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පස්ව හුන්නේ ය. එකත්පස්ව හුන් වච්ඡගොත්ත පිරිවැජි ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන්ට මෙය කීය: භවත් මොග්ගල්ලානයෙනි, කිම ලෝකය ශාශ්වත දෑ? යි වච්ඡයෙනි, ලෝකය ශාශ්වත යයි මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් නො වදරන ලදී. භවත් මොග්ගල්ලානයෙනි, කිම ලෝකය අශාශ්වත දෑ? යි වච්ඡයෙනි, ලෝකය අශාශ්වත යයි මෙ ද භාග්‍යවතුන් වහන්සේ විසින් නො වදරන ලදී. භවත් මොග්ගල්ලානයෙනි, කිම ලෝකය අන්තවත් දෑ? යි. වච්ඡයෙනි, ලෝකය අන්තවත් යයි මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදරන ලදී. භවත් මොග්ගල්ලානයෙනි, කිම ලෝකය අනන්තවත් දෑ?යි. වච්ඡයෙනි, ලෝකය අනන්තවත් යයි මෙ ද භාග්‍යවතුන් වහන්සේ විසින් නො වදරන ලදී.

කින්නු ඛො භො මොග්ගල්ලාන, තං ජීවං තං සරීරන්ති? අව්‍යාකතං ඛො එතං වච්ඡ, භගවතා: "තං ජීවං තං සරීර"න්ති. කිං පන භො මොග්ගල්ලාන, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති? එතම්පි ඛො වච්ඡ, අව්‍යාකතං භගවතා: "අඤ්ඤං ජීවං අඤ්ඤං සරීර"න්ති. කින්නු ඛො භො මොග්ගල්ලාන, හොති තථාගතො පරම්මරණාති? අව්‍යාකතං ඛො එතං[1] වච්ඡ භගවතා: "හොති තථාගතො පරම්මරණා"ති. කිං පන භො මොග්ගල්ලාන, න හොති තථාගතො පරම්මරණාති? එතම්පි ඛො වච්ඡ, අව්‍යාකතං භගවතා: "න හොති තථාගතො පරම්මරණා"ති. කින්නු ඛො මොග්ගල්ලාන, හොති ච න ච හොති තථාගතො පරම්මරණාති? අව්‍යාකතං ඛො එතං වච්ඡ, භගවතා: "හොති ච න ච හොති තථාගතො පරම්මරණා"ති. කිං පන භො මොග්ගල්ලාන, නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති? එතම්පි ඛො වච්ඡ, අව්‍යාකතං භගවතා "නෙව හොති න න හොති තථාගතො පරම්මරණා"ති.

කො නු ඛො භො මොග්ගල්ලාන, හෙතු කො පච්චයො යෙන අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං පුට්ඨානං එවං ව්‍යාකරණං හොති: "සස්සතො ලොකොති වා, අසස්සතො ලොකොති වා අන්තවා ලොකොති වා, අනන්තවා ලොකොති වා, තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා, හොති තථාගතො පරම්මරණාති වා, න හොති තථාගතො පරම්මරණාති වා, හොති ච න ච හොති තථාගතො පරම්මරණාති වා, නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති"වා?

කො පන භො මොග්ගල්ලාන, හෙතු කො පච්චයො යෙන සමණස්ස ගොතමස්ස එවං පුට්ඨස්ස න එවං ව්‍යාකරණං හොති: "සස්සතො ලොකොතිපි, අසස්සතො ලොකොතිපි, අන්තවා ලොකොතිපි, අනන්තවා ලොකොතිපි, තං ජීවං තං සරීරන්තිපි, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්තිපි, හොති තථාගතො පරම්මරණාතිපි, න හොති තථාගතො පරම්මරණාතිපි, හොති ච න ච හොති තථාගතො පරම්මරණාතිපි, නෙව හොති න න හොති තථාගතො පරම්මරණාතිපී"ති?

අඤ්ඤතිත්ථියා ඛො වච්ඡ, පරිබ්බාජකා චක්ඛුං: "එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා"ති සමනුපස්සන්ති. සොතං -පෙ- ඝානං -පෙ- ජිව්හං: "එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා"ති සමනුපස්සන්ති. කායං -පෙ- මනං: එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා"ති සමනුපස්සන්ති. තස්මා අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං පුට්ඨානං එවං ව්‍යාකරණං හොති: "සස්සතො ලොකොති වා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති"වා.

1. එතම්පි ඛො වච්ඡ අව්‍යාකතං - සිමු

භවත් මොග්ගල්ලානයෙනි, කිම එ ම ජීවය, එ ම සරීරය දැ? යි. වච්ඡයෙනි, එ ම ජීවය එ ම ශරීරය යි මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදාරන ලදී. භවත් මොග්ගල්ලානයෙනි, කිම ජීවය අනෙකක් ද? ශරීරය අනෙකක් දැ?යි. වච්ඡයෙනි, ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැ යි මෙ ද භාග්‍යවතුන් වහන්සේ විසින් නො වදාරන ලදී. භවත් මොග්ගල්ලානයෙනි, කිම සත්ත්වයා මරණින් මතු වේ දැ?යි. වච්ඡයෙනි, සත්ත්වයා මරණින් මතු වේ ය යන මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදාරන ලදී. භවත් මොග්ගල්ලානයෙනි, කිම සත්ත්වයා මරණින්මතු නො වේ දැ? යි. වච්ඡයෙනි, සත්ත්වයා මරණින් මතු නො වේ ය යන මෙ ද භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදාරන ලදී. භවත් මොග්ගල්ලානයෙනි, කිම සත්ත්වයා මරණින් මතු වේ නො ද වේ දැ? යි වච්ඡයෙනි, සත්ත්වයා මරණින් මතු වේ නො ද වෙයි යන මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් නො වදාරන ලදී. භවත් මොග්ගල්ලානයෙනි, කිම? සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ දැ? යි වච්ඡයෙනි, සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වෙයි යන මෙ ද භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදාරන ලදී.

භවත් මොග්ගල්ලානයෙනි, මෙසේ පුළුවුස්නා ලද අන්තොටු පිරිවැජ්ජන්ගේ "ලෝකය ශාශ්වත ය යි හෝ ලෝකය අශාශ්වත ය යි හෝ ලෝකය අන්තවත් ය යි හෝ ලෝකය අනන්තවත් ය යි හෝ එ ම ජීවය ය එ ම ශරීරය යයි හෝ ජීවය අනෙකක ශරීරය අනෙකකැ යි හෝ සත්ත්වයා මරණින් මතු වේ යයි හෝ සත්ත්වයා මරණින් මතු නො වේ යයි හෝ සත්ත්වයා මරණින් මතු වේ නො ද වේ යයි හෝ සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ"යයි හෝ යම් හෙයෙකින් මෙසේ විසඳීමෙක් වේ නම් එයට හේතු කිම ප්‍රත්‍යය කිමැ යි.

භවත් මොග්ගල්ලානයෙනි, මෙසේ පුළුවුස්නා ලද මහණගොයුම්හු "ලෝකය ශාශ්වත යයි දු ලෝකය අශාශ්වත යයි දු ලෝකය අන්තවත් යයි දු ලෝකය අනන්තවත් යයි දු එ ම ජීවය ය එ ම ශරීරය යයි දු ජීවය අනෙකක ශරීරය අනෙකකැ යි දු සත්ත්වයා මරණින් මතු වේ යයි දු සත්ත්වයා මරණින් මතු නො වේ යයි දු සත්ත්වයා මරණින් මතු වේ නො ද වේ යයි දු සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ"යි දු යම් හෙයෙකින් මෙසේ විසඳීමෙක් නො වේ නම් එයට හේතු කිම? ප්‍රත්‍යය කිමැ? යි.

වච්ඡයෙනි, අන්තොටු පිරිවැජ්ජෝ ඇස ... "මෙය මාගේ ය මේ මම වෙමි, මේ මාගේ ආත්මය"යි දකිත්. කන ... නැහැය ... දිව මෙය මාගේ ය මේ මම වෙමි, මේ මාගේ ආත්මය"යි දකිත්. කය...සිත "මේ මාගේ ය මේ මම වෙමි. මේ මාගේ ආත්මය යි දකිත්. එහෙයින් මෙසේ පුළුවුස්නා ලද අන්තොටු පිරිවැජ්ජන්ගේ "ලෝකය ශාශ්වත යයි හෝ... සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නොවේ"යයි හෝ මෙසේ විසඳීම වෙයි.

තථාගතො ච ඛො වච්ඡ, අරහං සම්මාසම්බුද්ධො චක්ඛුං: "නෙතං මම, නෙසො'හමස්මි, න මෙසො අත්තා"ති සමනුපස්සති. සොතං -පෙ- ඝානං -පෙ- ජිව්හං: "නෙතං මම, නෙසො'හමස්මි, න මෙසො අත්තා"ති සමනුපස්සති. කායං -පෙ- මනං; "නෙතං මම, නෙසො'හමස්මි, න මෙසො අත්තා"ති සමනුපස්සති. තස්මා තථාගතස්ස එවං පුට්ඨස්ස න එවං ව්‍යාකරණං හොති: "සස්සතො ලොකොතිපි -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාතිපී"ති.

අථ ඛො වච්ඡගොත්තො පරිබ්බාජකො උට්ඨායාසනා යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො වච්ඡගොත්තො පරිබ්බාජකො භගවන්තං එතදවොච: කින්නු ඛො භො ගොතම, සස්සතො ලොකොති? අව්‍යාකතං ඛො එතං වච්ඡ, මයා: "සස්සතො ලොකො"ති -පෙ- කිං පන භො ගොතම, නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති? එතම්පි ඛො වච්ඡ, අව්‍යාකතං මයා: "නෙව හොති න න හොති තථාගතො පරම්මරණා"ති.

කො නු ඛො භො ගොතම හෙතු කො පච්චයො යෙන අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං පුට්ඨානං එවං ව්‍යාකරණං හොති; "සස්සතො ලොකොති වා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති"වා? කො පන භො ගොතම, හෙතු කො පච්චයො යෙන භොතො ගොතමස්ස එවං පුට්ඨස්ස න එවං ව්‍යාකරණං හොති: "සස්සතො ලොකොතිපි -පෙ- නෙව හොති තථාගතො පරම්මරණාතිපී"ති?

අඤ්ඤතිත්ථියා ඛො වච්ඡ, පරිබ්බාජකා චක්ඛුං: "එතං මම එසො'හමස්මි, එසො මෙ අත්තාති" සමනුපස්සන්ති, සොතං -පෙ- ඝානං -පෙ- ජිව්හං; "එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තාති" සමනුපස්සන්ති. කායං -පෙ- මනං "එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තාති" සමනුපස්සන්ති. තස්මා අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං පුට්ඨානං එවං ව්‍යාකරණං හොති: "සස්සතො ලොකොති වා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති"වා.

තථාගතො ච ඛො වච්ඡ, අරහං සම්මාසම්බුද්ධො චක්ඛුං: "නෙතං මම, නෙසො'හමස්මි, න මෙසො අත්තා"ති සමනුපස්සති. සොතං -පෙ- ඝානං -පෙ- ජිව්හං -පෙ- කායං -පෙ- මනං ; "නෙතං මම, නෙසො'හමස්මි, න මෙසො අත්තා"ති සමනුපස්සති. තස්මා තථාගතස්ස එවං පුට්ඨස්ස න එවං ව්‍යාකරණං හොති: "සස්සතො ලොකොතිපි, අසස්සතො ලොකොතිපි, අන්තවා ලොකොතිපි, අනන්තවා ලොකොතිපි, තං ජීවං තං සරීරන්තිපි, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්තිපි, හොති තථාගතො පරම්මරණාතිපි, න හොති තථාගතො පරම්මරණාතිපි, හොති ච න ච හොති තථාගතො පරම්මරණාතිපි නෙව හොති න න හොති තථාගතො පරම්මරණාතිපී"ති.

වච්ඡයෙනි, අර්හත් සම්මා සම්බුද්ධ වූ තථාගතයන් වහන්සේ වනාහි ඇස: ''මෙය මාගේ නො වේ මේ මම නො වෙමි මේ මාගේ ආත්මය නො වේ''යයි දකිත්. කන ... නැහැය ... දිව: ''මෙය මාගේ නො වේ මේ මම නො වෙමි මේ මාගේ ආත්මය නො වේ'' යයි දකිත්. කය... සිත... ''මෙය මාගේ නො වේ මේ මම නො වෙමි මේ මාගේ ආත්මය නො වේ'' යයි දකිත්. එහෙයින් මෙසේ පුළුවුස්නා ලද තථාගතයන් වහන්සේගේ ''ලෝකය ශාශ්වත ය යි දු... සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ'' යයි දු මෙසේ පැවසීම වෙයි.

ඉක්බිති වච්ඡගොත්ත පිරිවැජි තෙමේ හුනස්නෙන් නැඟී භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමඟ සතුටු විය. සතුටු වියයුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් වච්ඡගොත්ත පිරිවැජි තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: භවත් ගෞතමයෙනි, කිම ලෝකය ශාශ්වත දැ? යි. වච්ඡ, ලෝකය ශාශ්වත ය යි මෙය මා විසින් නො පවසන ලදි. භවත් ගෞතමයෙනි, කිම සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ දැ? යි. වච්ඡ ''සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ''යි මෙ ද මා විසින් නො පවසන ලදී.

භවත් ගෞතමයෙනි, මෙසේ පුළුවුස්නා ලද අන්තොටු පිරිවැජ්ජන් ''ලෝකය ශාශ්වත යයි හෝ... සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ''යි හෝ යම්හෙයකින් මෙසේ විසඳීමෙක් වේ නම් එයට හෙතු කිම? ප්‍රත්‍යය කිමැය? යි. භවත් ගෞතමයෙනි, මෙසේ පුළුවුස්නා ලද භවත් ගොයුම්හුගේ ''ලෝකය ශාශ්වත යයි දු ... සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ''යයි දු යම් හෙයෙකින් මෙසේ පැවසීමෙක් වේ නම් එයට හේතු කිම? ප්‍රත්‍යය කිමැ ?යි.

වච්ඡ, අන්තොටු පිරිවැජ්ජෝ ඇස: ''මෙය මාගේය, මේ මම වෙමි, මේ මාගේ ආත්මය''යි දකිත්, කන... නැහැය... දිව: ''මෙය මාගේය, මේ මම වෙමි, මේ මාගේ ආත්මය''යි දකිත්. කය... සිත: ''මෙය මාගේ ය, මේ මම වෙමි, මේ මාගේ ආත්මය''යි දකිත්. එහෙයින් මෙසේ පුළුවුස්නා ලද අන්තොටු පිරිවැජ්ජන්ගේ ''ලෝකය ශාශ්වත ය යි හෝ... සත්ත්වයා මරණින් මතු නොම වේ නො ම නොවේ'' යයි හෝ මෙසේ විසඳීම වෙයි.

වච්ඡ, අර්හත් සම්මා සම්බුද්ධ වූ තථාගත තෙමේ වනාහි ඇස: ''මෙය මාගේ නො වේ, මේ මම නො වෙමි, මේ මාගේ ආත්මය නොවේ''යයි දකී. කන... නැහැය... දිව... කය... සිත: ''මේ මාගේ නො වේ, මේ මම නො වෙමි, මේ මාගේ ආත්මය නො වේ''යයි දකී. එහෙයින් මෙසේ පුළුවුස්නා ලද තථාගතයන්ගේ ''ලෝකය ශාශ්වත යයි දු, ලෝකය අශාශ්වතය යි දු ලෝකය අන්තවත් යයි දු ලෝකය අනන්තවත් යයි දු, එ ම ජීවය එ ම ශරීර යයි දු ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැ යි දු සත්ත්වයා මරණින් මතු වේ යයි දු සත්ත්වයා මරණින් මතු නො වේ යයි දු සත්ත්වයා මරණින් මතු වේ නො ද වේ යයි දු සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ''යයිදු මෙසේ පැවසීමෙක් නො වේ.

අච්ඡරියං භො ගොතම, අබ්භුතං භො ගොතම, යත්‍ර හි නාම සත්ථුස්ස ච සාවකස්ස ච අත්ථෙන අත්ථො ව්‍යඤ්ජනෙන ව්‍යඤ්ජනං සංසන්දිස්සති සමෙස්සති න විහායිස්සති යදිදං අග්ගපදස්මිං. ඉදනාහං භො ගොතම, සමණං මොග්ගල්ලානං උපසඞ්කමිත්වා එතමත්ථං ආපුච්ඡිං, සමණොපි මෙ මොග්ගල්ලානො එතෙහි පදෙහි එතෙහි ව්‍යඤ්ජනෙහි එතමත්ථං ව්‍යාකාසි සෙය්‍යථාපි භවං ගොතමො. අච්ඡරියං භො ගොතම, අබ්භුතං භො ගොතම, යත්‍ර හි නාම සත්ථුස්ස ච සාවකස්ස ච අත්ථෙන අත්ථො ව්‍යඤ්ජනෙන ව්‍යඤ්ජනං සංසන්දිස්සති සමෙස්සති න විහායිස්සති යදිදං අග්ගපදස්මින්ති.

## 10. 1. 8

## ඛන්ධසුත්තං

2283. අථ ඛො වච්ඡගොත්තො පරිබ්බාජකො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො වච්ඡගොත්තො පරිබ්බාජකො භගවන්තං එතදවොච: කින්නු ඛො භො ගොතම, සස්සතො ලොකොති? අව්‍යාකතං ඛො එතං වච්ඡ මයා: ''සස්සතො ලොකො''ති -පෙ- කිම්පන භො ගොතම, නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති? එතම්පි ඛො වච්ඡ, අව්‍යාකතං මයා: ''නෙව හොති න න හොති තථාගතො පරම්මරණා''ති.

කො නු ඛො භො ගොතම, හෙතු කො පච්චයො යෙන අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං පුට්ඨානං එවං ව්‍යාකරණං හොති: ''සස්සතො ලොකොති වා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වා?'' කො පන භො ගොතම, හෙතු කො පච්චයො යෙන භොතො ගොතමස්ස එවං පුට්ඨස්ස න එවං ව්‍යාකරණං හොති: ''සස්සතො ලොකොතිපි -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාතිපී''ති?

අඤ්ඤතිත්ථියා ඛො වච්ඡ, පරිබ්බාජකා රූපං අත්තතො සමනුපස්සන්ති, රූපවන්තං වා අත්තානං, අත්තනි වා රූපං, රූපස්මිං වා අත්තානං; වෙදනං අත්තතො සමනුපස්සන්ති, -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං අත්තතො සමනුපස්සන්ති විඤ්ඤාණවන්තං වා අත්තානං, අත්තනි වා විඤ්ඤාණං, විඤ්ඤාණස්මිං වා අත්තානං. තස්මා අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං පුට්ඨානං එවං ව්‍යාකරණං හොති: ''සස්සතො ලොකොති වා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වා.''

භවත් ගෞතමයෙනි, අරුමයෙකි. භවත් ගෞතමයෙනි, පුදුමයෙකි. යම් හෙයෙකින් දේශනායෙහි ලා ශාස්තෘහුගේ ද ශ්‍රාවකයාගේ ද, අර්ථයෙන් අර්ත්ථය ව්‍යඤ්ජනයෙන් ව්‍යඤ්ජනය සැසඳෙන්නේ ද සම වින්නේ ද විරුද්ධ නො වන්නේ ද (එහෙයිනි) භවත් ගෞතමයෙනි මම දැන් මුගලන් මහණහු වෙත එළඹ මේ අරුත පිළිවිසීමි. මුගලන් මහණ ද භවත් ගොයුම්හු මෙන් මේ අරුත මේ පදවලින් මේ ව්‍යඤ්ජනවලින් මට පැවසී ය. භවත් ගෞතමයෙනි, අසිරියෙකි. භවත් ගෞතමයෙනි, පුදුමයෙකි. යම් හෙයෙකින් දේශනායෙහි ලා ශාස්තෘහුගේ ද ශ්‍රාවකයාගේ ද අර්ථයෙන් අර්ත්ථය ව්‍යඤ්ජනයෙන් ව්‍යඤ්ජනය සැසඳෙන්නේ ද සම වන්නේ ද විරුද්ධ නො වන්නේ ද (එහෙයිනි) යි.

## 10. 1. 8

## බන්ධ සූත්‍රය

2283. එකල්හි **වච්ඡගොත්ත** පිරිවැජි තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමඟ සතුටු විය. සතුටු වියයුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පස් ව හුන්නේ ය. එකත්පස් ව හුන් වච්ඡගොත්ත පිරිවැජි තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: භවත් ගෞතමයෙනි, කිම ලෝකය ශාශ්වත ද යි. වච්ඡ, ලෝකය ශාශ්වත යයි මෙය මා විසින් නො පවසන ලදී ... භවත් ගෞතමයෙනි, කිම සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නොවේ ද ?යි, වච්ඡ සත්ත්වයා මරණින් මතු නො ම වේ, නො ම නො වේ ය යි. මේ ද මවිසින් නොපවසන ලදී.

භවත් ගෞතමයෙනි, මෙසේ පුළුවුස්නා ලද අන්තොටු පිරිවැජ්ජන්ගේ ''ලෝකය ශාශ්වත යයි හෝ ... සත්ත්වයා මරණින් මතු නො ම වේ, නො ම නො වේ''යයි හෝ යම් හෙයෙකින් මෙසේ විසඳීමෙක් වේ නම් එයට හේතු කිමැ ප්‍රත්‍යය කිමැ යි? භවත් ගෞතමයෙනි, මෙසේ පුළුවුස්නා ලද භවත් ගොයුම්හුගේ ''ලෝකය ශාශ්වත යයි ද ... සත්ත්වයා මරණින් මතු නො ම වේ, නො ම නො වේ''යයි ද යම් හෙයෙකින් මෙසේ පැවසීමෙක් නො වේ නම් එයට හේතු කිම? ප්‍රත්‍යය කිමැ? යි.

වච්ඡ, අන්තොටු පිරිවැජ්ජෝ රූපය ආත්ම යයි හෝ ආත්මය රූප ඇත්තකැ යි හෝ ආත්මයෙහි රූපය පවතී යයි හෝ රූපයෙහි ආත්මය පවතී යයි හෝ දකිත්. වේදනාව ආත්ම යයි හෝ ... දකිත්. සංඥාව ... සංස්කාර ... විඥානය... ආත්මය යි හෝ ආත්මය විඥාන ඇත්තකැ යි හෝ ආත්මයෙහි විඥානය පවතී යයි හෝ විඥානයෙහි ආත්මය පවතී යයි හෝ දකිත්. එහෙයින් මෙසේ පුළුවුස්නා ලද අන්තොටු පිරිවැජ්ජන්ගේ ''ලොකය ශාශ්වත යයි හෝ ... සත්ත්වයා මරණින් මතු නො ම වේ, නොම් නො වේ'' යයි හෝ මෙසේ විසඳීම වෙයි.

තථාගතො ච ඛො වච්ඡ, අරහං සම්මාසම්බුද්ධො න රූපං අත්තතො සමනුපස්සති. න රූපවන්තං වා අත්තානං, න අත්තනි වා රූපං, න රූපස්මිං වා අත්තානං. න වෙදනං අත්තතො සමනුපස්සති -පෙ- න සඤ්ඤං -පෙ- න සඞ්ඛාරෙ -පෙ- න විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, න විඤ්ඤාණවන්තං වා අත්තානං, න අත්තනි වා විඤ්ඤාණං, න විඤ්ඤාණස්මිං වා අත්තානං. තස්මා තථාගතස්ස එවං පුට්ඨස්ස න එවං ව්‍යාකරණං හොති: "සස්සතො ලොකොතිපි -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාතිපී"ති.

අථ ඛො වච්ඡගොත්තො පරිබ්බාජකො යෙනායස්මා **මහාමොග්ගල්ලානො** තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මතා මහාමොග්ගල්ලානෙන සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො වච්ඡගොත්තො පරිබ්බාජකො ආයස්මන්තං මහාමොග්ගල්ලානං එතදවොච: කින්නු ඛො භො මොග්ගල්ලාන, සස්සතො ලොකොති? අව්‍යාකතං ඛො එතං වච්ඡ, භගවතා, "සස්සතො ලොකො"ති -පෙ- කිං පන භො මොග්ගල්ලාන, නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති? එතම්පි ඛො වච්ඡ, අව්‍යාකතං භගවතා "නෙව හොති න න හොති තථාගතො පරම්මරණා"ති.

කො නු ඛො භො මොග්ගල්ලාන, හෙතු කො පච්චයො යෙන අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං පුට්ඨානං එවං ව්‍යාකරණං හොති: "සස්සතො ලොකොති වා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති"වා? කො පන භො මොග්ගල්ලාන, හෙතු කො පච්චයො යෙන සමණස්ස ගොතමස්ස එවං පුට්ඨස්ස න එවං ව්‍යාකරණං හොති: "සස්සතො ලොකොතිපි -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාතිපී"ති?

අඤ්ඤතිත්ථියා ඛො වච්ඡ, පරිබ්බාජකා රූපං අත්තතො සමනුපස්සන්ති, රූපවන්තං වා අත්තානං, අත්තනි වා රූපං රූපස්මිං වා අත්තානං. වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං අත්තතො සමනුපස්සන්ති. විඤ්ඤාණවන්තං වා අත්තානං. අත්තනි වා විඤ්ඤාණං විඤ්ඤාණස්මිං වා අත්තානං. තස්මා අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං පුට්ඨානං එවං ව්‍යාකරණං හොති: "සස්සතො ලොකොති වා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වා."

වච්ඡ, අර්හත් සම්මාසම්බුද්ධ වූ තථාගත වනාහි රූපය ආත්මය යි නො දකී. ආත්මය රූප ඇත්තකැ යි හෝ නො දකී. ආත්මයෙහි රූපය පවතී යයි හෝ නො දකී. රූපයෙහි ආත්මය පවතී යයි හෝ නො දකී. වෙදනාව ආත්මය යි නො දකී.. සංඥාව...නො දකී...සංස්කාර...නො දකී. විඥානය ආත්මය යි නො දකී. ආත්මය විඥාන ඇත්තකැ යි හෝ නො දකී. ආත්මයෙහි විඥානය පවතී යයි හෝ නො දකී. විඥානයෙහි ආත්මය පවතී යයි හෝ නො දකී. එහෙයින් මෙසේ පුළුවුස්නා ලද තථාගතයන්ගේ ''ලෝකය ශාශ්වත යයි ද.. සත්ත්වයා මරණින් මතු නො ම වේ, නො ම නො වේ''යයි ද මෙසේ පැවසීමෙක් නො වේ.

ඉක්බිති වච්ඡගොත්ත පිරිවැජි තෙමේ හුනස්නෙන් නැඟිට ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන් වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන් සමග සතුටු විය. සතුටු වියයුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පස් ව හුන්නේ ය. එකත්පස් ව හුන් වච්ඡගොත්ත පිරිවැජි තෙමේ ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන්ට මෙය කී ය: භවත් මොග්ගල්ලානයෙනි, කිම ලෝකය ශාශ්වත ද? යි. වච්ඡයෙනි, ලොකය ශාශ්වත ය යි මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදරන ලදී ... භවත් මොග්ගල්ලානයෙනි, කිමෙක් ද සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ ද?යි. වච්ඡයෙනි, සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ යයි මෙ ද භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදරන ලදී.

භවත් මොග්ගල්ලානයෙනි, මෙසේ පුළුවුස්නා ලද අන්තොටු පිරිවැජ්ජන්ගේ ''ලෝකය ශාශ්වත ය''යි හෝ ... ''සත්ත්වයා මරණින්මතු නො ම වේ නො ම නො වේ''යයි හෝ යම්හෙයෙකින් මෙසේ විසඳීමෙක් වේ නම් එයට හෙතු කිම ප්‍රත්‍යය කිම? භවත් මොග්ගල්ලානයෙනි, මෙසේ පුළුවුස්නා ලද භවත් ගොයුම්හුගේ ''ලෝකය ශාශ්වතයයි ''ද...''සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ''යයි ද යම් හෙයෙකින් මෙසේ පැවසීමෙක් වේ නම් එයට හෙතු කිම? ප්‍රත්‍යය කිමැ? යි.

වච්ඡයෙනි, අන්තොටු පිරිවැජ්ජෝ ''රූපය ආත්ම යයි හෝ ආත්මය රූප ඇත්තකැ යි හෝ ආත්මයෙහි රූපය පවතී යයි හෝ රූපයෙහි ආත්මය පවතී''යයි හෝ දකිත්. වේදනාව ... සංඥාව ... සංස්කාර ... විඥානය ආත්මය යි හෝ ආත්මය විඥානය ඇත්තකැ යි හෝ ආත්මයෙහි විඥානය පවතී යයි හෝ විඥානයෙහි ආත්මය පවතී යයි හෝ දකිත්. එහෙයින් මෙසේ පුළුවුස්නා ලද අන්තොටු පිරිවැජ්ජන්ගේ ''ලෝකය ශාශ්වත යයි හෝ ... සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ''යයි හෝ මෙසේ විසඳීම වෙයි.

තථාගතො ච ඛො වච්ඡ අරහං සම්මාසම්බුද්ධො න රූපං අත්තතො සමනුපස්සති, න රූපවන්තං වා අත්තානං, න අත්තනි වා රූපං, න රූපස්මිං වා අත්තානං. න වෙදනං -පෙ- න සඤ්ඤං -පෙ- න සඞ්ඛාරෙ -පෙ- න විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, න විඤ්ඤාණවන්තං වා අත්තානං, න අත්තනි වා විඤ්ඤාණං, න විඤ්ඤාණස්මිං වා අත්තානං. තස්මා තථාගතස්ස එවං පුට්ඨස්ස න එවං ව්‍යාකරණං හොති: "සස්සතො ලොකොතිපි, අසස්සතො ලොකොතිපි, අන්තවා ලොකොතිපි, අනන්තවා ලොකොතිපි, තං ජීවං තං සරීරන්තිපි, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්තිපි හොති තථාගතො පරම්මරණාතිපි න හොති තථාගතො පරම්මරණාතිපි, හොති ච න ච හොති තථාගතො පරම්මරණාතිපි, නෙව හොති න න හොති තථාගතො පරම්මරණාතිපී"ති.

අච්ඡරියං භො මොග්ගල්ලාන, අබ්භුතං භො මොග්ගල්ලාන, යත්‍ර හි නාම සත්ථු ච සාවකස්ස ච අත්ථෙන අත්ථො ව්‍යඤ්ජනෙන ව්‍යඤ්ජනං සංසන්දිස්සති සමෙස්සති න විහායිස්සති යදිදං අග්ගපදස්මිං. ඉදනාහං භො මොග්ගල්ලාන, සමණං ගොතමං උපසඞ්කමිත්වා එතමත්ථං ආපුච්ඡිං. සමණොපි මෙ ගොතමො එතෙහි පදෙහි එතෙහි ව්‍යඤ්ජනෙහි එතමත්ථං ව්‍යාකාසි සෙය්‍යථාපි භවං මොග්ගල්ලානො. අච්ඡරියං භො මොග්ගල්ලාන, අබ්භුතං භො මොග්ගල්ලාන, යත්‍ර හි නාම සත්ථු ච සාවකස්ස ච අත්ථෙන අත්ථො ව්‍යඤ්ජනෙන ව්‍යඤ්ජනං සංසන්දියති සමෙස්සති න විහායිස්සති යදිදං අග්ගපදස්මින්ති.

## 10. 1. 9

## කුතූහලසාලාසුත්තං

2284. අථ ඛො වච්ඡගොත්තො පරිබ්බාජකො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො වච්ඡගොත්තො පරිබ්බාජකො භගවන්තං එතදවොච: පුරිමානි භො ගොතම දිවසානි පුරිමතරානි සම්බහුලානං නානාතිත්ථිය[1] සමණබ්‍රාහ්මණ-පරිබ්බාජකානං කුතූහලසාලායං සන්නිසින්නානං සන්නිපතිතානං අයමන්තරා කථා උදපාදි.

අයං ඛො පූරණො[2] කස්සපො සඞ්ඝී චෙව ගණී ච ගණාචරියො ච ඤාතො යසස්සී තිත්ථකරො සාධුසම්මතො බහුජනස්ස. සොපි සාවකං අබ්භතීතං කාලකතං උපපත්තීසු[3] ව්‍යාකරොති: අසු අමුත්‍ර උපපන්නො[4] අසු අමුත්‍ර උපපන්නොති. යො[5] පිස්ස සාවකො උත්තමපුරිසො පරමපුරිසො පරමපත්තිපත්තො, තම්පි සාවකං අබ්භතීතං කාලකතං උපපත්තීසු ව්‍යාකරොති: අසු අමුත්‍ර උපපන්නො, අසු අමුත්‍ර උපපන්නොති.

1. නානාතිත්ථියානං සමණබ්‍රාහ්මණානං පරිබ්බාජිකානං - මජසං
අඤ්ඤතිත්ථියානං සමණබ්‍රාහ්මණානං පරිබ්බාජකානං - සයා.
2. පූරාණො - සී 1, 2.
3. උපපත්තීසු – මජසං සයා,
4. උපපන්නො – මජසං සයා,
5. යො - සී, 1. 2.

වච්ඡයෙනි, අරහත් සම්මාසම්බුද්ධ වූ තථාගතයන් වහන්සේ වූ කලී රූපය ආත්මය යි නො දකිත්. ආත්මය රූප ඇත්තකැ යි හෝ නො දකිත්, ආත්මයෙහි රූපය පවතී ය යි හෝ නො දකිත්. රූපයෙහි ආත්මය පවතී ය යි හෝ නො දකිත්. වේදනාව ... නො දකිත්. සංඥාව ... නො දකිත්. සංස්කාර...නො දකිත්. විඥානය ආත්මය යි නො දකිත්. ආත්මය විඥාන ඇත්තකැ යි හෝ නො දකිත්. ආත්මයෙහි විඥානය පවතී ය යි හෝ නො දකිත්. විඥානයෙහි ආත්මය පවතී ය යි හෝ නො දකිත්. එහෙයින් මෙසේ පුළුවුස්නා ලද තථාගතයන් වහන්සේගේ "ලොකය ශාශ්වත ය යි දු ලොකය අශාශ්වත යයි දු ලෝකය අන්තවත් යයි දු ලෝකය අනන්තවත් යයි දු ඒ ම ජීව ය යිදු ඒ ම ශරීරය යි දු ජීවය අනෙකක ශරීරය අනෙකකැ යි දු සත්ත්වයා මරණින් මතු වේ යයි දු සත්ත්වයා මරණින් මතු නො වේ යයි දු සත්ත්වයා මරණින් මතු වේ නො ද වේ යයි දු සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ යි දු මෙසේ වැදැරීමෙක් නො වේ.

භවත් මොග්ගල්ලානයෙනි, අරුමයෙකි, භවත් මොග්ගල්ලානයෙනි, පුදුමයෙකි, යම් හෙයෙකින් යම් මේ දේශනායෙහි ලා ශාස්තෘහුගේ ද ශ්‍රාවකයාගේ ද අර්ත්ථයෙන් අර්ත්ථය ව්‍යඤ්ජනයෙන් ව්‍යඤ්ජනය සැසඳෙන්නේ ද සම වන්නේ ද විරුද්ධ නො වන්නේ ද (එහෙයිනි). භවත් මොග්ගල්ලානයෙනි, මම දන් මහණගොයුම්හු වෙත එළඹ මේ අරුත පිළිවිසීමි. මහණ ගොයුම්හු ද භවත් මුගලන්හු මෙන් මේ පදවලින් මේ ව්‍යඤ්ජනවලින් මේ අරුත මට පැවසූහ. භවත් මොග්ගල්ලානයෙනි, අරුමයෙකි, භවත් මොග්ගල්ලානයෙනි පුදුමයෙකි, යම් හෙයෙකින් යම් මේ දේශනායෙහි ලා ශාස්තෘහුගේ ද ශ්‍රාවකයාගේ ද අර්ථයෙන් අර්ත්ථය ව්‍යඤ්ජනයෙන් ව්‍යඤ්ජනය සැසඳෙන්නේ ද සම වන්නේ ද විරුද්ධ නො වන්නේ ද (එහෙයිනි) යි.

## 10. 1. 9

## කුතූහලශාලා සූත්‍රය

2284. එකල්හි **වච්ඡගොත්ත** පිරිවැජි තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමඟ සතුටු විය. සතුටු වියයුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පස් ව හුන්නේ ය. එකත් පස් ව හුන් වච්ඡගොත්ත පිරිවැජි තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේය: භවත් ගෞතමයෙනි, පළමු ඉතා පළමු දවස්හි කුතුහලශාලාවෙහි එක් රැස්ව හුන් බොහෝ වූ නන්තොටු මහණ බමුණු පිරිවැජ්ජන් අතර මේ අතුරු කථාව පහළ විය.

මේ **පූරණකස්සප** තෙමේ සමූහයා ඇත්තේ ද ගණයා ඇත්තේ ද ගණයාට ඇදුරු වූයේ ද ප්‍රසිද්ධ වූයේ ද යසස් ඇත්තේ ද ලබ්ධි පහළ කරන්නේ ද බොහෝ දෙන විසින් මැනැවැ යි සම්මත ද වෙයි. හෙතෙමේ ද "අසෝ පුහුලා අසෝ තැන්හි උපන අසෝ පුහුලා අසෝ තැන උපනැ යි ඉකුත් වූ කලුරිය කළ සව්වා උපත්හි ලා පවසයි. උත්තමපුරිස වූ පරම පුරිස වූ උතුම්පියට පැමිණි ඔහුගේ යම් සව්වෙකුත් වේ ද, ඉකුත් කලුරිය කළ ඒ සව්වා ද අසෝ පුහුලා අසෝතැන උපන, අසෝ පුහුලා අසෝ තැන උපනැ" යි උපත්හි ලා පවසයි.

අයම්පි ඛො **මක්ඛලිගොසාලො** -පෙ- අයම්පි ඛො **නිගණ්ඨො නාතපුත්තො**[1] -පෙ- අයම්පි ඛො **සඤ්ජයො බෙල්ලට්ඨිපුත්තො**[2] -පෙ- අයම්පි ඛො **පකුධො කච්චායනො**[3] -පෙ- අයම්පි ඛො **අජිතො කෙසකම්බලො** **සඞ්ඝී** චෙව ගණී ච ගණාචරියො ච ඤාතො යසස්සී තිත්ථකරො සාධුසම්මතො බහුජනස්ස. සොපි සාවකං අබ්භතීතං කාලකතං උපපත්තීසු ව්‍යාකරොති: අසු අමුත්‍ර උපපන්නො, අසු අමුත්‍ර උපපන්නොති. යොපිස්ස සාවකො උත්තමපුරිසො පරමපුරිසො පරමපත්තිප්පත්තො, තම්පි සාවකං අබ්භතීතං කාලකතං උපපත්තීසු ව්‍යාකරොති; අසු අමුත්‍ර උපපන්නො අසු අමුත්‍ර උපපන්නොති.

අයම්පි ඛො සමණො ගොතමො සඞ්ඝී චෙව ගණී ච ගණාචරියො ච ඤාතො යසස්සී තිත්ථකරො සාධුසම්මතො බහුජනස්ස. සො'පි සාවකං අබ්භතීතං කාලකතං උපපත්තීසු ව්‍යාකරොති: අසු අමුත්‍ර උපපන්නො, අසු අමුත්‍ර උපපන්නොති, යො පිස්ස සාවකො උත්තමපුරිසො පරමපුරිසො පරමපත්තිප්පත්තො, තම්පි සාවකං අබ්භතීතං කාලකතං උපපත්තීසු න ව්‍යාකරොති: අසු අමුත්‍ර උපපන්නො, අසු අමුත්‍ර උපපන්නොති. අපිච ඛො නං එවං ව්‍යාකරොති: "අච්ඡෙච්ඡි තණ්හං විවත්තයි[4] සඤ්ඤොජනං සම්මා මානාභිසමයා අන්තමකාසි දුක්ඛස්සා"ති. තස්ස මය්හං භො ගොතම අහුදෙව කඞ්ඛා අහු විචිකිච්ඡා කථංනාම[5] සමණස්ස ගොතමස්ස ධම්මො අභිඤ්ඤෙය්‍යො.

අලං හි තෙ වච්ඡ, කඞ්ඛිතුං අලං විචිකිච්ඡිතුං, කඞ්ඛනීයෙ ච පන තෙ ඨානෙ විචිකිච්ඡා උප්පන්නා. සඋපාදානස්ස ඛො'හං වච්ඡ උපපත්තිං පඤ්ඤපෙමි, නො අනුපාදානස්ස; සෙය්‍යථාපි වච්ඡ, අග්ගි සඋපාදානො ජලති, නො අනුපාදානො; එවමෙව ඛො'හං වච්ඡ සඋපාදානස්ස උපපත්තිං පඤ්ඤපෙමි, නො අනුපාදානස්සාති. යස්මිං පන භො ගොතම සමයෙ අච්චි වාතෙන ඛිත්තා දූරම්පි ගච්ඡති, ඉමස්ස[6] පන භවං ගොතමො කිං උපාදානස්මිං පඤ්ඤපෙතීති. යස්මිං වච්ඡ සමයෙ අච්චි වාතෙන ඛිත්තා දූරම්පි ගච්ඡති, තමහං වාතූපාදානං වදමි.[7] වාතොහිස්ස වච්ඡ තස්මිං සමයෙ උපාදානං හොතීති.

යස්මිඤ්ච පන භො ගොතම, සමයෙ ඉමඤ්ච කායං නික්ඛිපති, සත්තො ච අඤ්ඤතරං කායං අනුපපන්නො[8] හොති, ඉමස්ස පන භවං ගොතමො කිං උපාදානස්මිං පඤ්ඤපෙති? යස්මිං ඛො වච්ඡ සමයෙ ඉමඤ්ච කායං නික්ඛිපති, සත්තො ච අඤ්ඤතරං කායං අනුපපන්නො හොති, තමහං තණ්හූපාදානං වදමි. තණ්හාහිස්ස වච්ඡ තස්මිං සමයෙ උපාදානං හොතීති.

1. නාටපුත්තො - මජසං, ස්‍යා.
2. බෙලට්ඨ - මජසං ස්‍යා.
3. පකුධො - PTS.
4. වාවත්තයි - අඤ්ඤත්‍ර
5. කථඤ්හි නාම - ස්‍යා. PTS.
6. ඉමිස්සා ස්‍යා,
7. පඤ්ඤපෙමි - ස්‍යා, මජසං.
8. අනුපපන්නො - සී. 1, 2
9. තණ්හා සම්බන්ධිස්ස - සී 1, 2,

**මේ මක්ඛලි ගොසාල** තෙමේත් මේ **නිගණ්ඨනාතපුත්ත** තෙමේත්... මේ **සඤ්ජයබෙල්ලට්ඨිපුත්ත** තෙමේත් මේ **පකුධකච්චායන** තෙමේත් මේ **අජිතකේසකම්බල** තෙමේත් සමූහයා ඇත්තේ ද ගණයා ඇත්තේ ද ගණයාට ඇදුරු වූයේ ද ප්‍රසිද්ධ වූයේ ද යසස් ඇත්තේ ද ලබ්ධි පහළ කරන්නේ ද බොහෝදෙනා විසින් මැනවැ යි සම්මත ද වේ. හෙ ද අසෝ පුහුලා අසෝ තැන උපන, අසෝ පුහුලා අසෝ තැන උපනැ යි ඉකුත් කලුරිය කළ සච්වා උපත්හි ලා පවසයි. උත්තමපුරුෂ වූ පරමපුරුෂ වූ උතුම්පියට පැමිණි ඔහුගේ යම් සච්වෙකුත් වේ නම් ඉකුත් කලුරිය කළ ඒ සච්වා ද අසෝ පුහුලා අසෝ තැන උපන අසෝ පුහුලා අසෝ තැන උපනැ යි උපත් හි ලා පවසයි.

මේ මහණ ගොයුම් තෙමේ ත් සමූහයා ඇත්තේ ද ගණයා ඇත්තේ ද ගණයාට ඇදුරු වූයේ ද ප්‍රසිද්ධ වූයේ ද යසස් ඇත්තේ ද ලබ්ධි පහළ කරන්නේ ද බොහෝ දෙන විසින් මැනවැ යි සම්මත ද වේ. හෙ ද අසෝ පුහුලා අසෝ තැන උපන, අසෝ පුහුලා අසෝ තැන උපනැ යි ඉකුත් කලුරිය කළ සච්වා උපත්හි ලා පවසයි. උතුම් පුරුෂ වූ පරම පුරුෂ වූ උතුම් පියට පැමිණි ඔහුගේ යම් සච්වෙකුත් වේ නම් ඉකුත් කලුරිය කළ ඒ සච්වා ද අසෝ පුහුලා අසෝ තැන උපන, අසෝ පුහුලා අසෝ තැන උපනැ යි උපත්හි ලා පවසයි. වැලි දු ''තෘෂ්ණාව සිඳලූයේ ය. සංයොජන මුලුසුන් කෙළේ ය. මැනවින් මානය දුර ලීමෙන් දුක් කෙළවර කෙළේ ය යි ඔහු ගැන මෙසේ පවසයි. භවත් ගෞතමයෙනි, ඒ මට කෙසේ නම් මහණගොයුම්හුගේ දහම දතයුතු දැ යි. සැකයෙක් වූයේ ම ය. විමතියෙක් වූයේ ම ය.

වච්ඡ, තා විසින් සැක කරන්නට සුදුසු ම ය. විචිකිච්ඡා කරන්නට සුදුසු ම ය. තොපට සැක කටයුතු තන්හි විචිකිච්ඡාව උපන. වච්ඡ, මම උපාදන ඇත්තහුගේ උපත පනවමි. උපාදන රහිත වූවහුගේ (උපත) නො පනවමි. වච්ඡ, යම්සේ ගින්න දර සහිත වූයේ දිලේ ද, දර රහිත වූයේ නො දිලේ ද, වච්ඡ, එසෙයින් ම මම උපාදන සහිත වූවහුගේ උපත පනවමි. උපාදන රහිතයාගේ (උපත) නො පනවමි යි. භවත් ගෞතමයෙනි, යම් කලෙක ගිනිසිල සුළඟින් මෙහෙයන ලදු ව දුරටත් යේ ද භවත් ගෞතම තෙමේ මෙයට කිමෙක් උපාදන ය යි පනවා දැ යි. වච්ඡ, යම් කලෙක ගිනිසිල සුළඟින් මෙහෙයන ලදුව දුරටත් යේ ද, එයට මම වාතූපාදන යයි කියමි. වච්ඡ, එසමයෙහි සුළඟ එයට උපාදන වේ යි.

භවත් ගෞතමයෙනි, යම් කලෙක මේ කයත් බහා තබා ද, සත්ත්වයාත් එක්තරා කයකට නො පැමිණියේ වේ ද, භවත් ගෞතම තෙමේ මොහුට කිමෙක් උපාදන යයි පනවා දැ'යි. වච්ඡ යම් කලෙක මේ කයත් බහා තබාද, සත්ත්වයාත් එක්තරා කයකට නොපැමිණියේ වේ ද, එයට මම තණ්හූපාදන යයි කියමි. වච්ඡ එසමයෙහි ඔහුට තණ්හාව උපාදන වේ යි.

## 10. 1. 10

### අත්ථත්තසුත්තං

2285. අථ ඛො වච්ඡගොත්තො පරිබ්බාජකො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො වච්ඡගොත්තො පරිබ්බාජකො භගවන්තං එතදවොච: කින්නු ඛො භො ගොතම, අත්ථත්තාති. එවං වුත්තෙ භගවා තුණ්හී අහොසි. කිං පන භො ගොතම, නත්ථත්තාති. දුතියම්පි ඛො භගවා තුණ්හී අහොසි. අථ ඛො වච්ඡගොත්තො පරිබ්බාජකො උට්ඨායාසනා පක්කාමි. අථ ඛො ආයස්මා ආනන්දො අචිරපක්කන්තෙ වච්ඡගොත්තෙ පරිබ්බාජකෙ භගවන්තං එතදවොච: කින්නු ඛො භන්තෙ භගවා වච්ඡගොත්තස්ස පරිබ්බාජකස්ස පඤ්හං පුට්ඨො න ව්‍යාකාසීති.

අහඤ්ච ආනන්ද වච්ඡගොත්තස්ස පරිබ්බාජකස්ස අත්ථත්තාති පුට්ඨො සමානො අත්ථත්තාති ව්‍යාකරෙය්‍යං, යෙ තෙ ආනන්ද සමණබ්‍රාහ්මණා සස්සතවාද, තෙසමෙතං ලද්ධි අභවිස්ස. අහඤ්ච ආනන්ද වච්ඡගොත්තස්ස පරිබ්බාජකස්ස නත්ථත්තාති පුට්ඨො සමානො නත්ථත්තාති ව්‍යාකරෙය්‍යං, යෙ තෙ ආනන්ද සමණබ්‍රාහ්මණා උච්ඡෙදවාද, තෙසමෙතං ලද්ධි අභවිස්ස. අහඤ්ච ආනන්ද, වච්ඡගොත්තස්ස පරිබ්බාජකස්ස අත්ථත්තාති පුට්ඨො සමානො අත්ථත්තාති ව්‍යාකරෙය්‍යං, අපිනු මෙතං ආනන්ද, අනුලොමං අභවිස්ස ඤාණස්ස උප්පාදය' සබ්බෙ ධම්මා[1] අනත්තාති නො හෙතං භන්තෙ. අහඤ්ච ආනන්ද[2] වච්ඡගොත්තස්ස පරිබ්බාජකස්ස නත්ථත්තාති පුට්ඨො සමානො නත්ථත්තාති ව්‍යාකරෙය්‍යං, සම්මූළ්හස්ස ආනන්ද, වච්ඡගොත්තස්ස පරිබ්බාජකස්ස භීය්‍යො සම්මොහාය අභවිස්ස: අහු වා මෙ නූන පුබ්බෙ අත්තා, සො එතරහි නත්ථීති.

## 10. 1. 11

### සභියසුත්තං

2286. එකං සමයං ආයස්මා සභියො කච්චානො ඤාතිකෙ විහරති ගිඤ්ජකාවසථෙ අථ ඛො වච්ඡගොත්තො පරිබ්බාජකො යෙනායස්මා සභියො කච්චානො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා සභියෙන කච්චානෙන සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො වච්ඡගොත්තො පරිබ්බාජකො ආයස්මන්තං සභියං කච්චානං එතදවොච:

1. උප්පාදය සබ්බෙ ධම්මා - සී 1, 2,
2. අහඤ්චානන්ද - සීමු, 1, 2,

## 10. 1. 10

## අත්ථත්ත සූත්‍රය

2285. එකල්හි **වච්ඡගොත්ත** පිරිවැජි තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත **එළඹියේ** ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමඟ සතුටු විය. සතුටු වියයුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පස් ව හුන්නේ ය. එකත්පස්ව හුන් වච්ඡගොත්ත පිරිවැජි තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේ ය: භවත් ගෞතමයෙනි, කිමෙක් ද ආත්මය ඇද්ද යි. මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්ද වූ සේක. භවත් ගෞතමයෙනි, කිමෙක් ද ආත්මය නැද්ද යි. දෙවනවට ද භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්ද වූ සේක. එකල්හි වච්ඡගොත්ත පිරිවැජි තෙමේ හුනස්නෙන් නැඟී ගියේ ය. ඉක්බිති ආයුෂ්මත් **ආනන්ද** තෙරණුවෝ වච්ඡගොත්ත පිරිවැජ්ජා ගිය නො බෝ වේලාවෙකින් භාග්‍යවතුන්වහන්සේට මෙය සැලකෙළේ ය: වහන්ස, පුළුවුස්නා ලද්දහු වච්ඡගොත්ත පිරිවැජ්ජාගේ පැන කුමක් හෙයින් නො විසඳූසේක් ද යි.

ආනන්ද, මමත් ආත්මය ඇද්ද යි පුළුවුස්නා ලද්දෙම් ආත්මය ඇතැයි වච්ඡගොත්ත පිරිවැජ්ජාට පැවසූයෙම් නම්, ආනන්ද යම් ඒ මහණ බමුණු කෙනෙක් ශාශ්වතවාද ඇත්තාහු ද මෙය ඔවුන්ගේ ලබ්ධිය වූයේ ය. ආනන්ද මමත් ආත්මය නැද්ද යි පුළුවුස්නා ලද්දෙම් ආත්මය නැතැ යි වච්ඡගොත්ත පිරිවැජ්ජාට පැවසූයෙම් නම්, ආනන්ද යම් ඒ මහණ බමුණු කෙනෙක් උච්ඡෙදවාද ඇත්තාහු ද මෙය ඔවුන්ගේ ලබ්ධිය වූයේ ය. ආනන්ද, මමත් ආත්මය ඇද්ද යි පුළුවුස්නා ලද්දෙම් ආත්මය ඇතැ යි වච්ඡගොත්ත පිරිවැජ්ජාට පැවසූයෙම් නම් ආනන්ද, සියලු ධර්මයෝ අනාත්මයහ යි විවසුන් නැණ ඉපදීම් පිණිස මෙය මට සුදුසු වූයේ ද යි. වහන්ස, මෙය නොවේ ම ය. ආනන්ද, මමත් ආත්මය නැද්ද යි පුළුවුස්නා ලද්දෙම් ආත්මය නැතැ යි වච්ඡගොත්ත පිරිවැජ්ජාට පැවසූයෙම් නම් මුළා වූ වච්ඡගොත්ත පිරිවැජ්ජාට පෙර මට ඒකාන්තයෙන් ආත්මය වූයේ ය, එය දැන් නැතැ යි බෙහෙවින් මුළාවීම පිණිස වූයේ යි.

## 10. 1. 11

## සභිය සූත්‍රය

2286. එක් කලෙක ආයුෂ්මත් **සභිය කච්චාන** තෙරණුවෝ **ඤාතික** ගම්හි **ගිඤ්ජකාවසථයෙහි** වැඩවෙසෙති. එකල්හි **වච්ඡගොත්ත** පිරිවැජි තෙමේ ආයුෂ්මත් සභිය කච්චාන තෙරණුවන් වෙත **එළඹියේ** ය. එළඹ ආයුෂ්මත් සභිය කච්චාන තෙරණුවන් සමඟ සතුටු විය. සතුටු වියයුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පස් ව හුන්නේ ය. එකත්පස් ව හුන් ආයුෂ්මත් වච්ඡගොත්ත පිරිවැජි තෙමේ ආයුෂ්මත් සභිය කච්චාන තෙරණුවන්ට මෙය කී ය:

කින්නු ඛො භො කච්චාන හොති තථාගතො පරම්මරණාති. අව්‍යාකතං ඛො එතං වච්ඡ, භගවතා "හොති තථාගතො පරම්මරණා"ති. කිං පන භො කච්චාන න හොති තථාගතො පරම්මරණාති. එතම්පි ඛො වච්ඡ අව්‍යාකතං භගවතා "න හොති තථාගතො පරම්මරණා"ති. කින්නු ඛො භො කච්චාන හොති ච න ච හොති තථාගතො පරම්මරණාති. අව්‍යාකතං ඛො එතං වච්ඡ භගවතා "හොති ච න ච හොති තථාගතො පරම්මරණා"ති. කිං පන භො කච්චාන නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති එතම්පි ඛො වච්ඡ අව්‍යාකතං භගවතා "නෙව හොති න න හොති තථාගතො පරම්මරණා"ති.

කින්නු ඛො භො කච්චාන, හොති තථාගතො පරම්මරණාති ඉති පුට්ඨො සමානො අව්‍යාකතං ඛො එතං වච්ඡ භගවතා "හොති තථාගතො පරම්මරණා"ති වදෙසි. කිං පන භො කච්චාන න හොති තථාගතො පරම්මරණාති ඉති පුට්ඨො සමානො එතම්පි ඛො වච්ඡ අව්‍යාකතං භගවතා "න හොති තථාගතො පරම්මරණා"ති වදෙසි. කින්නු ඛො භො කච්චාන, හොති ච න ච හොති තථාගතො පරම්මරණාති ඉති පුට්ඨො සමානො අව්‍යාකතං ඛො එතං වච්ඡ භගවතා "හොති ච න ච හොති තථාගතො පරම්මරණා"ති වදෙසි. කිං පන භො කච්චාන, නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති ඉති පුට්ඨො සමානො එතම්පි ඛො වච්ඡ අව්‍යාකතං භගවතා: "නෙව හොති න න හොති තථාගතො පරම්මරණා"ති වදෙසි. කො නු ඛො භො කච්චාන හෙතු කො පච්චයො යෙන තං අව්‍යාකතං සමණෙන ගොතමෙනාති.

යො ච ආවුසො,[1] හෙතු යො ච පච්චයො පඤ්ඤාපනාය: රූපීති වා අරූපීති වා සඤ්ඤීති වා අසඤ්ඤීති වා නෙවසඤ්ඤීනාසඤ්ඤීති වා, සො ච හෙතු සො ච පච්චයො සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං අපරිසෙසං නිරුජ්ඣෙය්‍ය, කෙන තං පඤ්ඤාපයමානො පඤ්ඤාපෙය්‍ය, "රූපීති වා අරූපීති වා සඤ්ඤීති වා අසඤ්ඤීති වා නෙවසඤ්ඤීති නාසඤ්ඤීති වා"ති.

1. වච්ඡ - මජසං.

භවත් කච්චානයෙනි, කිමෙක් ද සත්ත්වයා මරණින් මතු වේ ද යි. වච්ඡයෙනි, "සත්ත්වයා මරණින් මතු වේ"යයි මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් නො වදරන ලදි. භවත් කච්චානයෙනි, කිමෙක් ද "සත්ත්වයා මරණින් මතු නො වේ ද"යි. වච්ඡයෙනි, "සත්ත්වයා මරණින් මතු නො වේ "යයි මෙ ද භාග්‍යවතුන් වහන්සේ විසින් නො වදරන ලදී. භවත් කච්චානයෙනි, කිමෙක් ද "සත්ත්වයා මරණින් මතු වේ නො ද වේ ද"යි. වච්ඡයෙනි, "සත්ත්වයා මරණින් මතු වේ නො ද වේ"යයි මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් නො වදරන ලදි. භවත් කච්චානයෙනි, කිමෙක් ද "සත්ත්වයා මරණින් මතු නො ම වේ නොම නොවේ ද"යි. වච්ඡයෙනි, "සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ"යයි මෙ ද භාග්‍යවතුන් වහන්සේ විසින් නො වදරන ලදී.

භවත් කච්චානයෙනි, කිමෙක් ද සත්ත්වයා මරණින් මතු වේ ද යි මෙසේ පුළුවුස්නා ලද්දහු වච්ඡයෙනි, "සත්ත්වයා මරණින් මතු වේ"යයි මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් නො වදරන ලද යි කියවු. භවත් කච්චානයෙනි, කිමෙක් ද සත්ත්වයා මරණින් මතු නො වේ ද යි මෙසේ පුළුවුස්නා ලද්දහු වච්ඡයෙනි, "සත්ත්වයා මරණින් මතු නො වේ"යයි මෙද භාග්‍යවතුන් වහන්සේ නොවදරන ලද යි කියවු. භවත් කච්චානයෙනි, කිමෙක් ද "සත්ත්වයා මරණින් මතු වේ නො ද වේ ද"යි මෙසේ පුළුවුස්නා ලද්දහු වච්ඡයෙනි, "සත්ත්වයා මරණින් මතු වේ නො ද වේ"යයි මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් නොවදරන ලද යි කියවු. භවත් කච්චානයෙනි, කිමෙක් ද "සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ ද"යි මෙසේ පුළුවුස්නා ලද්දහු වච්ඡයෙනි, "සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ"යයි මෙ ද භාග්‍යවතුන් වහන්සේ විසින් නො වදරන ලද යි කියවු. භවත් කච්චානයෙනි, යම් හෙයෙකින් එය මහණ ගොයුම්හු විසින් නො වදරන ලද නම් එයට හේතු කිම ප්‍රත්‍යය කිමැ? යි.

ඇවැත්නි, "රූප ඇත්තේ"යි හෝ "රූප නැත්තේ"යි හෝ "සංඥා ඇත්තේ"යි හෝ "සංඥා නැත්තේ"යි හෝ "නො ම සංඥා ඇත්තේ නො ම සංඥා නැත්තේ "යි හෝ පැනවීමට යමෙකුත් හේතු ද යමෙකුත් ප්‍රත්‍යය ද ඒ හේතුවත් ඒ ප්‍රත්‍යයත් සියල්ලෙන් සියල්ල සියලු අයුරෙන් සියල්ල ඉතිරි නැතිව නිරුද්ධ වන්නේ නම් පනවන්නෙක් "රූප ඇත්තේ" යි හෝ "රූප නැත්තේ"යි හෝ "සංඥා ඇත්තේ "යි හෝ "සංඥා නැත්තේ"යි හෝ "නො ම සංඥා ඇත්තේත් නො ම සංඥා නැත්තේ"යි හෝ කවර හේතුවකින් ඔහු පනවන්නේ ද? (නො පනවන්නේ මැයි).

කීවචිරං පබ්බජිතො'සි භො කච්චානාති න චිරං ආවුසො, තීණි වස්සානීති. යස්සපස්ස ආවුසො, එතමෙත්තකෙන, එත්තකමෙව තම්පස්ස බහු. කො පන වාදෙ එවං[1] අභික්කන්තෙනාති.

අබ්‍යාකතවග්ගො පඨමො.

තත්‍රුද්දානං:

ඛෙමා අනුරාධොපගතං සමුද්දය පෙම ආරාමං,
ආයතන බන්ධං කුතූහලසාලා අත්තෙනා සභියෙන චාති.

අබ්‍යාකතසංයුත්තං සමත්තං.

සළායතනවග්ග සංයුත්ත උද්දානං:

සළායතන වෙදනා මාතුගාමො ජම්බුඛාදකො
සාමණ්ඩො මොග්ගල්ලානො චිත්තො ගාමණී සඞ්ඛතං අබ්‍යාකතන්ති

දසබලසෙලප්පභවා නිබ්බානමහාසමුද්දපරියන්තා
අට්ඨඞ්ග මග්ගසලිලා ජිනවචනනදී චිරං වහතූති.

සළායතනවග්ගො නිට්ඨිතො.

1. එවං - ස්‍යා. මජසං

භවත් කච්චානයෙනි, පැවිදි වූ ඔබට කෙතෙක් කල් දැ යි. ඇවැත්නි, වැඩි කලෙක් නැත. තෙවසෙකැ යි. ඇවැත්නි මෙතෙක් (සුළු) කලෙකින් යමකුගේත් දේශනාව මෙය වන්නේ නම් මෙපමණක් වූ ම එ ද ලොකු දේශනාවක් වන්නේ ය. ඉතා මනාප දේශනායෙහි ලා කතාවෙක් ම නැතැ යි.

**පළමුවැනි අව්‍යාකත වර්ග යි.**

**එහි සූත්‍ර නාමාවළිය:**

ඛෙමා, අනුරාධ, උපගත, සමුදය, පෙම, ආරාම, ආයතන, ඛනධ, කුතුහලසාලා, අත්ථත්ත, සභිය සූත්‍ර යයි එකොළොසෙකි.

## අව්‍යාකත සංයුත්තය නිමි.

**සළායතන වර්ගයෙහි සංයුත්ත නාමාවළිය:**

සළායතන, වෙදනා, මාතුගාම, ජම්බුඛාදක, සාමණ්ඩ, මොග්ගල්ලාන චිත්ත, ගාමණී, අසඞ්ඛත, අව්‍යාකත සංයුත්ත යයි සංයුත්ත දසයෙකි.

දසබල සෙලින් හටගත් නිවන් මහසමුදුර කෙළවර කොට ඇති අටැඟිමඟ සිලිල ඇති බුදුවදන් ගඟ දිගු කලක් මුළුල්ලෙහි ගලාබසීවා යි.

## සළායතන වර්ගය නිමි.

# සංයුත්තනිකාය

## ගාථාදිපාද අනුක්කමණිකා

අක්කන්දන්ති පරොදන්ති 392
අගුත්තද්වාරස්ස භවන්ති මොසං 242
අදුක්ඛමසුඛං සන්තං 392
අබ්‍යාපජ්ජා විරාගො ච 666
අමතං පණීතඤ්ච සිවඤ්ච ඛෙමං 666
අසඞ්ඛතං අනන්තං අනාසවං 666
ඉදං ජාතු වෙදගූ 176, 178
එතං දුක්ඛන්ති ඤත්වාන 390
එවං මනො ඡස්සු යදා සුභාවිතො 154
කුම්මොව අඞ්ගානි සකෙ කපාලෙ 350
කුහකා වඤ්චකා දණ්ඩා ච 242
කොනු අඤ්ඤත්‍ර මරියෙහි 256
ගන්ධං ඝාත්වා සති මුට්ඨා 158
ගන්ධඤ්ච ඝාත්වා සුරභිං මනොරමං 154
චිත්තං චෙ සුසමාහිතං 242
ඡළෙව ඵස්සායතනානි භික්ඛවො 154
තථෙවිමස්මිං කායස්මිං 414
තස්සානුරොධා අථවා විරොධා 398
දිස්වාන රූපානි මනොරමානි 154
දුක්ඛං වෙදියමානස්ස 392
ධම්මං ඤත්වා සතිමුට්ඨා 160
ධම්මෙ ච ඣානෙ ච රතා අහෙසුං 242
න වෙදනං වෙදියති සපඤ්ඤො 398
න සො රජ්ජති ගන්ධෙසු 160
න සො රජ්ජති ධම්මෙසු 162
න සො රජ්ජති ඵස්සෙසු 162
න සො රජ්ජති රසෙසු 160
න සො රජ්ජති රූපෙසු 160
න සො රජ්ජති සද්දෙසු 160
පපඤ්ච සඤ්ඤා ඉතරීතරා නරා 154
පාතො සිනානඤ්ච තයො ච වෙද 242
ඵස්සං ඵුස්ස සති මුට්ඨා 214
ඵස්සෙන ඵුට්ඨො න සුඛෙන මජ්ජෙ 154
භවරාගපරෙතෙහි 256
යං පරෙ සුඛතො ආහු 256
යතො ච භික්ඛු ආතාපී 414
යතො වා භික්ඛු ආතාපී 392
යත්ථ චෙතා නිරුජ්ඣන්ති 390
යථාපි වාතා ආකාසෙ 414
යො ඉමං සමුද්දං සගාහං 312
යො එතා නාධිවාසෙති 392
යො චෙතා අධිවාසෙති 392
රසඤ්ච භොත්වා සාදිතං ච සාදුං 159
රසං භොත්වා සතිමුට්ඨා 160
රූපං දිස්වා සති මුට්ඨා 158, 162
රූපා සද්දා රසා ගන්ධා 256
සඞ්ඛාතධම්මස්ස බහුස්සුතස්ස 398
සඞ්ගාතිගො මච්චුජහො නිරූපධි 314
සතඤ්ච විවටං හොති 256
සරජා අරජා වාපි 414
සද්දඤ්ච සුත්වා දුභයං පියාප්පියං 154
සද්දං සුත්වා සතිමුට්ඨා 158
සද්ධාය සීලෙන ච යාධ වඩ්ඪන්ති 472
සදෙවකස්ස ලොකස්ස 256
සීලුත්තමා පුබ්බතරා අහෙසුං 240, 244
සුඛන්ති දිට්ඨමරියෙහි 256
සුඛං වා යදිවා දුක්ඛං 390
සුඛං වෙදියමානස්ස 392
සො වෙදනා පරිඤ්ඤාය 392, 414

# සංයුත්තනිකාය

## සඤ්ඤානාමානුක්කමණිකා


අ — පිට්ඨංකා

අචෙල කස්සප 548
අජිත කෙසකම්බල 702
අනාථ පිණ්ඩික 2, 4, 6, 490, 500
අනුරාධ 676
අනුරුද්ධ 460
අම්බාටකවන 520, 524, 526, 530, 532, 540
අයොජ්ඣා 350
අවන්තිසු 236, 240
අසිබන්ධකපුත්තගාමණී 566
අස්සාරොහගාමණී 564

ආ

ආනන්ද 120, 234, 328, 416, 418, 704

ඉ

ඉසිපතන 322
ඉසිදත්ත 524, 530

උ

උක්කචෙලා 488
උග්ගගහපති 226
උත්තරක 610
උදයී 246, 328, 424
උදෙන 228
උද්දකරාමපුත්ත 176
උපවාණ 92
උපසෙන 90
උපාලි 228

ක

කච්චාන 705
කපිලවත්ථු 354
කලන්දකනිවාප 42, 124, 232, 436, 558, 588
කාමණ්ඩා 246
කාමභූ 326, 534
කිම්බිලා 354

ක — පිට්ඨංකා

කුරරඝරපවත්තපබ්බත 236
කුතුහලසලා 700
කොසල (ජනපද) 584
කොළිය (ජනපද) 610

ඛ

ඛෙමා 668

ග

ගයා 38
ගිජ්ඣකූට 124
ගිඤ්ජකාවසථ 190
ගොදත්ත 540

ඝ

ඝොසිත 234
ඝොසිතාරාම 228, 234, 328

ච

චණ්ඩගාමණී 556
චිත්තගහපති 520, 524, 526, 532, 534, 540

ඡ

ඡන්න 124

ජ

ජම්බුඛාදකපරිබ්බාජක 474
ජීවකම්බවන 284
ජෙතවන 2, 90, 500

ත

තාලපුටනටගාමණී 558
තාවතිංස 500
තොදෙය්‍ය 246

ද

දෙවදහ 252

**න** පිට්ඨඞ්කා

නකුලපිතුගහපති 238
නන්දගොපාල 352
නාලගාමක 474
නාලන්ද 228, 584
නිගණ්ඨනාතපුත්ත 544, 584

**ප**

පකුධකච්චායන 702
පඤ්චකඞ්ගථපති 424
පසෙනදිකොසල 668
පාටලියගාමණී 610
පාවාරිකම්බවන 228, 570
පිණ්ඩොලභාරද්වාජ 228
පුණ්ණ 132
පුබ්බවිරං 132

**එ**

එගගුන 118

**බ**

බාරාණසී 322
බාහිය 138

**භ**

භග්ග (ජනපද) 238
භද්‍රකගාමණී 590
භෙසකලාවන 238

**ම**

මක්කරකට 240
මක්ඛලිගොසාල 702
මගධ (ජනපද) 474
මච්ඡිකාසණ්ඩ 520, 524, 526, 530, 532, 540
මණිචූලකගාමණී 588
මල්ල (ජනපද) 590
මහක 532
මහාකච්චාන 236, 240
මහාකොට්ඨිත 286, 322, 702
මහාචුන්ද 124
මහාමොග්ගල්ලාන 490, 500 514, 704
මාලුඞ්ක්‍යපුත්ත 156
මිගජාල 80, 82
මිගපථක 520
මොළියසීවක 436

**ය** පිට්ඨඞ්කා

යොධාජීවගාමණී 562

**ර**

රාධ 108, 110
රාමපුත්ත (උද්දක) 176
රාහුල 220

**ල**

ලොහිච්ච 240

**ව**

වච්ඡගොත්ත 704
වජ්ජී (ජනපද) 228, 488
වසවත්ති 518
වෙපචිත්ති 384
වෙරහච්චානිගොත්ත බ්‍රාහ්මණී 246
වෙසාලී 226, 228, 398 404, 676
වෙළුවන 42, 124, 232, 436, 558, 588

**ස**

සක්ක (ජනපද) 354
සක්කදෙවානමින්ද 384, 500, 514
සඤ්ජයබෙලට්ඨිපුත්ත 702
සන්තුසිත 578
සප්පසොණ්ඩිකපබ්භාර 90
සමිද්ධි 86
සාකෙත 668
සාමණ්ඩකානි (පරිබ්බාජක) 488
සාරිපුත්ත 124, 322, 474, 480, 488, 682
සාවත්ථි 2, 4, 6, 8, 10, 14, 490, 500
සීතවන 90
සුධම්මාදෙවසභා 384
සුනාපරන්ත (ජනපද) 134
සුනිම්මිත 518
සුයාම 518
සුංසුමාරගිර 238
සොණ 232

**හ**

හත්ථාරොහගාමණී 564
හත්ථිගාම 228
හාලිද්දකානි 236

# සංයුත්තනිකාය

## විසෙසපදානුක්කමණිකා


අ

අක්ඛාතො 328
අඝො 330
අට්ඨකපරියායො ධම්මො 438
අත්ථංගමො 28
අන්තොපූතිභාවො 352
අනත්තා 2
අනභිජානං 34
අනික්කීළිතාවිනො 230
අනිච්චං 6, 14
අනීතිකධම්මං 664
අනුප්පත්තසදත්ථො 252
අනුපවජ්ජං 132
අනුපවජ්ජතා 132
අනුස්සවා 276
අනුසයා 72, 74
අප්පජහං 34
අපරිජානං 34
අබ්භසම්පිලාපො 532
අභිනිබ්බත්ති 28
අමනුස්සග්ගාහො 352
අමායාවී 546
අයොකටාහෙ 366
අයොසඞ්කුනා 334
අයොසලාකා 332
අරියසාවකො 4
අවිජ්ජා 112
අවිජ්ජානුසයො 390
අවිජ්ජොඝස්ස 344
අවිරාජයං 34
අස්සත්ථො 320
අස්සදම්මසාරථී 346
අස්සාදපරියෙසනං 18
අස්සාදො 14
අසඞ්ඛතං 634
අසඞ්ඛතගාමිං 634
අසඨො 546
අසුරපුරං 384
අහඞ්කාර 92

ආ

ආකාරපරිවිතක්කා 276
ආගන්තුකාගාරං 416
ආදානනික්ඛෙපනං 336
ආදිත්තපරියායං 332
ආදීනවපරියෙසනං 18
ආදීනවො 14
ආපොධාතුයා 342
ආයතනානං 14
ආවට්ටග්ගාහො 352
ආසවා 72
ආසිවිසා 340
ආසිවිසො 90

ඉ

ඉඤ්ජිතං 386
ඉද්ධාභිසඞ්ඛාරං 532
ඉද්ධිපාටිහාරියං 534
ඉන්ද්‍රියසම්පන්නො 278
ඉන්ද්‍රියානං 90

උ

උජුකො 546
උට්ඨානසඤ්ඤං 356
උත්තරිමනුස්සධම්මා 534
උදකණ්ණවං 342
උදකමණිකං 356
උදකාචමනානි 242
උප්පාදො 28
උපවෙණං 378
උපස්සට්ඨං 64
උපස්සුතිං 192
උපසමාය 346
උපායාසෙහි 38

ඌ

ඌසරං 572

එ

එකවිහාරී 80

ඔ

ඔතාරං 348
ඔධස්තපතොදො 346
ඔවීරකජාතො 372
ඔහිතභාරා 252

**ක**

කච්ඡපො 348
කදලික්ඛන්ධං 330, 332
කම්මනිරොධං 266
කරණීයං 4
කසම්බුජාතො 352

**කා**

කාමොඝස්ස 344
කායො 4

**කි**

කිංසුකො 370
කිට්ඨං 376
කිට්ඨාරක්ඛකො 376

**කු**

කුක්කුච්චං 102
කුක්කුරං 380
කුඨාරිං 330, 332
කුම්මො 348
කුලලං 342
කුලඞ්ගාරො 586
කුහනා 242

**කූ**

කූටාගාරකා 362
කූටාගාරසාලා 362

**ඛ**

ඛන්ධධාතු ආයතනං 50
ඛයධම්මං 58
ඛරාජිනං 242

**ඛු**

ඛුරෙන 332

**ග**

ගණිකො 670
ගණ්ඩා 6

**ගි**

ගිලානවාදං 102

**ගො**

ගොවිකත්තෙන 126

**ඝ**

ඝානං 2

**ච**

චක්ඛුං 2
චණ්ඩභූතො 200

**චෙ**

චෙතොපණිධි 552
චෙතොවිමුත්ති 14

**ඡ**

ඡන්දරාගං 324
ඡන්දරාගප්පහානං 14
ඡන්දරාගවිනයො 14

**ඡි**

ඡින්නපපඤ්චෙ 118
ඡින්නවටුමෙ 118

**ජ**

ජඞ්ගලං 572
ජටා 242
ජරාධම්මං 58
ජරාමරණස්ස 28
ජරාමරණෙන 38

**ජා**

ජාති 4
ජාතිධම්මං 56
ජාතියා 38

**ජි**

ජිඝච්ඡා 336
ජිව්හා 4

**ඤා**

ඤාණභූතො 200

**ත**

තපො 242
තසං 524
තිණාගාරං 358
තිරච්ඡානයොනිං 332
තෙජොධාතුයා 342
තෙලප්පදීපං 356

ඨා

ඨාවරං 624

ති

තිරොධො 28

ද්ව

ද්වාසට්ඨිදිට්ඨිගතානි 526
ද්වීහිතිකා 584
ද්වාය 346
දස්සනං 14

ද

දමෙන 324

දි

දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා 276
දිට්ඨාසස්ස 344
දුක්ඛං 2
දූසෙබ්භි 38
දෙණී 378
දෙමනස්සෙහි 38
දෙසග්ගිනා 38

ධ

ධම්මපරියායො 332
ධම්මභූතො 200
ධම්මසමාධි 622
ධම්මස්සාමි 200
ධම්මා 6
ධම්මාධිකරණං 138
ධාතුනානත්තං 524
ධීතුවිත්තං 230
ධීතුමත්තීසු 230

න

නගෙහයා 548
නති 130
නන්දි 86
නවවාදං 102
නළාගාරං 358

නි

නිබාදනෙන 334
නිග්‍රොධො 320
නිබ්බානසප්පායං 268
නිරයං 332

නි

නිරොධධම්මං 60
නිරොධො 28
නිස්සටා 22, 24
නිස්සරණං 14
නිස්සරණපරියෙසනං 18
නීසො 536
නෙලඞ්ගං 536

ප

පකාසිතො 328
පඬෙකා 242
පච්චපාදි 138
පඤ්චවධකා 340
පටිසානුසයො 390
පඨවීධාතුයා 342
පත්තං 330, 332
පතොදං 346
පපඤ්චනං 388
පරමස්සාසප්පත්තා 478
පරායණං 664
පරික්ඛීණභවසඤ්ඤොජනා 252
පරිදෙවෙහි 38
පරියාදින්නවට්ට 118
පාපභූමි 572
පාපිමතො 194
පිපාසා 336
පුනබ්භවො 14

එ

එඤ්ජිතං 386
එකග්ගං 330
ඵොට්ඨබ්බා 6

බ

බ්‍රහ්මචරියං 4
බ්‍රහ්මචරියවාසො 324
බ්‍රහ්මභූතො 200
බලිවද්දෙ 324
බහලපත්තපලාසො 372

භ

භගිනිචිත්තං 230
භගිනිමත්තීසු 230
භවොසස්ස 344
භුසමුට්ඨි 90

ම

මක්කටං 380
මඤ්චකං 90
මඤ්ඤිතං 386
මණ්ඩලමාලෙ 522
මත්තා 242
මනුස්සග්ගාහො 352
මනො 4
මමිංකාර 92
මරණධම්මං 50
මාතුචිත්තං 230
මාතුමත්තීසු 230
මානගතං 388
මානානුසයො 92
මාරපඤ්ඤත්ති 86
මාරො 86
මුණ්ඩයා 548
මුත්තිං 664
මුද්දිකො 670
මූලෙ 330
මොහග්ගිනා 38

ය

යවකලාපී 384
යොග්ගාචරියො 346
යොත්තෙන 324

ර

රඞ්ගමජ්ඣෙ 558
රස්මියො 346
රසා 6

රා

රාගග්ගිනා 38
රාගානුසයො 390

රු

රුචියා 276
රූපං 6

රො

රොගාතං 28

ල

ලම්බචූළකෙ (භටෙ) 610

ලො

ලොකපඤ්ඤත්ති 88
ලොකමානී 200
ලොකො 88

ව

ව්‍යාධිධම්මං 58
වඩ්ඪදණ්ඩා 242
වනපත්ථානි පන්තානි සෙනාසනානි 80
වයධම්මං 58
වරත්තඛණ්ඩන 126
වායොධාතුයා 342

වි

විජ්ජා 68,112
විප්පටිසාරො 102
විප්පමුත්තා 22,24
විපරිණාමධම්මං 14
විපරිණාමො 90
විවටො 328
විසංයුත්තා 22,24
වීණා 376

වූ

වූපසමො 28

වෙ

වෙපචිත්තිබන්ධනං 389

ස

සඞ්කස්සරසමාචාරො 352
සඞ්ඛායකො 670
සඞ්ඝාටිං 356
සඤ්ඤාමය 346
සඤ්ඤාවෙදයිතනිරොධං 538
සඤ්ඤොගො 80
සඤ්ඤොජනා 70
සත්තපඤ්ඤත්ති 86
සත්තියා 332,334
සත්තො 86
සද්ද 6
සන්ථාගාරං 356
සබ්බනිමිත්තානි 114

ස


සබ්බප්පහානාය 28
සබ්බමඤ්ඤිතසමුග්ඝාත 44
සබ්බෙන සබ්බං සාරුප්පං 330
සමජ්ජමජ්ඣෙ 558
සමුදයධම්මං 58
සම්මදඤ්ඤා විමුත්තො 252
සම්මප්පඤ්ඤාය 2, 4
සම්මාසම්බොධිං 14
සම්මොහං 396
සංකිලෙසධම්මං 58


සා


සාචරියකො 274
සාන්තෙවාසිකො 272
සාරං 330
සාරාගො 80


සි


සිඛරෙන 126
සිගාලං 380
සිගාලො 348
සිංඝාටකො 372


සී


සීලබ්බතං 242
සීලවිසුද්ධත්ථං 106


සු


සුඛං 14
සුද්ධිං 664
සුංසුමාරං 380
සූචිඝටිකං 534


සෙ


සෙඛා 252
සෙතට්ඨිකා 584


සො


සොකධම්මං 58
සොකෙහි 38
සොතං 2
සොත්තං 334
සොමනස්සං 14


හ


හුරං 158

## සම්බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා - නැවත මුද්‍රණය

| | | |
|---|---|---|
| 1 | පාරාජිකා පාලි | |
| 2 | පාචිත්තිය පාලි | I |
| 3 | පාචිත්තිය පාලි | II |
| 4 | මහාවග්ග පාලි | I |
| 5 | මහාවග්ග පාලි | II |
| 6 | චුල්ලවග්ග පාලි | I |
| 7 | චුල්ලවග්ග පාලි | II |
| 8 | පරිවාර පාලි | I |
| 9 | පරිවාර පාලි | II |
| 10 | දීඝනිකාය 1 | |
| 11 | දීඝනිකාය 2 | |
| 12 | දීඝනිකාය 3 | |
| 13 | මජ්ඣිම නිකාය | I |
| 14 | මජ්ඣිම නිකාය | II |
| 15 | මජ්ඣිම නිකාය | III |
| 16 | සංයුක්ත නිකාය | I |
| 17 | සංයුක්ත නිකාය | II |
| 18 | සංයුක්ත නිකාය | III |
| 19 | සංයුක්ත නිකාය | IV |
| 20 | සංයුක්ත නිකාය පඤ්චම භාගය (1) | |
| 21 | සංයුක්ත නිකාය පඤ්චම භාගය (2) | |
| 22 | අංගුත්තර නිකාය | I |
| 23 | අංගුත්තර නිකාය | II |
| 24 | අංගුත්තර නිකාය | III |
| 25 | අංගුත්තර නිකාය | IV |
| 26 | අංගුත්තර නිකාය | V |
| 27 | අංගුත්තර නිකාය | VI |
| 28 | ඛුද්දක නිකාය - ඛුද්දකපාඨ - ධම්මපදපාළි - උදානපාළි - ඉතිවුත්තකපාළි | |

| | | |
|---|---|---|
| 29 | ඛුද්දක නිකාය - සුත්ත නිපාත | |
| 30 | ඛුද්දක නිකාය - විමානවත්ථු - පේතවත්ථු | |
| 31 | ඛුද්දක නිකාය - ථෙරගාථා පාලි - ථෙරීගාථා පාලි | |
| 32 | ඛුද්දක නිකාය - ජාතක පාලි | I |
| 33 | ඛුද්දක නිකාය - ජාතක පාලි | II |
| 34 | ඛුද්දක නිකාය - ජාතක පාලි | III |
| 35 | ඛුද්දක නිකාය - මහා නිද්දේස පාලි | |
| 36 | ඛුද්දක නිකාය - චූල්ල නිද්දේස පාලි | |
| 37 | ඛුද්දක නිකාය - පටිසම්භිදාමග්ගප්පකරණ I | |
| 38 | ඛුද්දක නිකාය - පටිසම්භිදාමග්ගප්පකරණ II | |
| 39 | ඛුද්දක නිකාය - අපදාන පාලි 1 | |
| 40 | ඛුද්දක නිකාය - අපදාන පාලි 2 - 1 | |
| 41 | ඛුද්දක නිකාය - අපදාන පාලි 2 - 2 | |
| 42 | ඛුද්දක නිකාය - බුද්ධවංසපාලි - චරියා පිටක පාලි | |
| 43 | නෙත්තිප්පකරණය | |
| 44 | පෙටකොපදේස | |
| 45 | ධම්මසංගණිප්පකරණ | |
| 46 | විභංගප්පකරණ | I |
| 47 | විභංගප්පකරණ | II |
| 48 | කථාවත්ථුප්පකරණ | I |
| 49 | කථාවත්ථුප්පකරණ | II |
| 50 | කථාවත්ථුප්පකරණ | III |
| 51 | ධාතුකථාප්පකරණ - පුග්ගලපඤ්ඤත්තිප්පකරණ | |
| 52 | යමකප්පකරණ | I |
| 53 | යමකප්පකරණ | 2 - I |
| 54 | යමකප්පකරණ | 2 - II |
| 55 | පට්ඨාප්පකරණය | I |
| 56 | පට්ඨානප්පකරණය | II |
| 57 | පට්ඨානප්පකරණය | III |

## ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනමේ සත්කාරයන් හා ආගමික සේවාවන්

1. රජය පිළිගත් පුණ්‍යායතනයක් වශයෙන් කටයුතු කිරීම.
2. බණ්ඩාරගම වීදාගම දරුවන් සියයක් සඳහා ධර්මචක්‍ර ළමා නිවාසය පිහිටුවා දැනට රුදැවන් 50 දෙනෙකුට සෙවණ ලබාදීම.
3. පූර්ණ පහසුකම් සහිත නේවාසික පහසුකම් හා විධිමත් අධ්‍යාපනික පහසුකම් ලබාදීම.
4. ධර්මචක්‍ර ළමා නිවාස සංකීර්ණය තුළ විහාර මන්දිරය, චෛත්‍යය, බෝධිය, භාවනා කුටි හා භාවනා මන්දිරය තනා නිම කිරීම.
5. ලියෙන් සිං ළදරු පාසල ආරම්භ කොට පූර්ව ළමාවිය සංවර්ධන අධ්‍යාපනය ආරම්භ කිරීම.
6. තණමල්විල ප්‍රදේශයේ ලියෙන් සිං ළදරු අධ්‍යාපන මධ්‍යස්ථාන කීපයක් ආරම්භ කිරීම.
7. දේශීය විදේශීය ධර්ම ග්‍රන්ථ මුද්‍රණය කොට බෙදා හැරීම.
8. පිරුවානා පොත් වහන්සේ මුද්‍රණය කොට සෑම නිවසකටම ලබාදීම සඳහා වසරින් වසර මුද්‍රණය කොට බෙදා දීම. දැනට පිටපත් ලක්ෂ දෙකක් බෙදා හැර ඇත.
9. වියතුන් විසින් රචිත සිංහල ධර්මග්‍රන්ථ ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කොට මුද්‍රණය කොට බෙදා හැරීම.
10. ජාතක පොත් වහන්සේ කාටූන් චිත්‍ර වශයෙන් කුඩා දරුවන් සඳහා සිංහල ඉංග්‍රීසි හා චීන භාෂාවන්ගෙන් මුද්‍රණය කිරීම.
11. වෛද්‍ය ශිෂ්‍යයන්, පාසල් දරුවන්, ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ලබන විදේශික ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම.
12. දිළිඳු පවුල් සඳහා රෙදි පිළි හා අධ්‍යාපනික උපකරණ පරිත්‍යාග කිරීම.
13. 2003 ජල ගැල්මට ලක්වූ හම්බන්තොට, මාතර, ගාල්ල, කළුතර, රත්නපුර හා අම්පාර දිස්ත්‍රික්කවල විහාරස්ථාන 63ක් සඳහා රුපියල් කෝටි 2 1/2ක මූල්‍යමය ආධාර සැපයීම.
14. 2004 සුනාමි විපතට භාජනය වූ පිරිස් සඳහා නිවාස දහසක් ඉදිකිරීම හා අවශ්‍ය ද්‍රව්‍යමය ආධාර සැපයීම.
15. වාර්ෂිකව විදේශීය හා දේශීය වෛද්‍යවරුන්ගේ සහභාගිත්වයෙන් වෛද්‍ය සායන පැවැත්වීම.
16. කැළණිය බොල්ලෑගල මානෙල්වතු විහාරයේ ජාත්‍යන්තර බෞද්ධ විශ්ව විද්‍යාලයක් ආරම්භ කිරීම.
17. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ නැවත මුද්‍රණය කොට නොමිලයේ බෙදා හැරීම.

### ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනමේ නිර්මාතෘවරයාණෝ :

තායිවානයේ ප්‍රධාන සංඝනායක තායිපේ ශ්‍රී රතනජෝති ථේරවාදී බෞද්ධ මධ්‍යස්ථානයේ අධිපති, තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනමේ අනුශාසක ලෝක බෞද්ධ සංඝ සම්මේලනයේ සංස්කෘතික අංශයේ සභාපති, තායිවානයේ සමාධි අධ්‍යාපන සංගමයේ නිර්මාතෘ සහ අනුශාසක, මහා බෝධි චර්යා සංගමයේ නිර්මාතෘ සහ සභාපති,

රත්මලාන ශ්‍රී විජයාරාම වාසී

**පූජ්‍ය ආචාර්ය බෝදාගම චන්දිම නාහිමිපාණන් වහන්සේයි.**

*"Wherever the Buddha's teachings have flourished,*

*either in cities or countrysides,*

*people would gain inconceivable benefits.*

*The land and people would be enveloped in peace.*

*The sun and moon will shine clear and bright.*

*Wind and rain would appear accordingly,*

*and there will be no disasters.*

*Nations would be prosperous*

*and there would be no use for soldiers or weapons.*

*People would abide by morality and accord with laws.*

*They would be courteous and humble,*

*and everyone would be content without injustices.*

*There would be no thefts or violence.*

*The strong would not dominate the weak*

*and everyone would get their fair share."*

~THE BUDDHA SPEAKS OF
THE INFINITE LIFE SUTRA OF
ADORNMENT, PURITY, EQUALITY
AND ENLIGHTENMENT OF
THE MAHAYANA SCHOOL~

With bad advisors forever left behind,
From paths of evil he departs for eternity,
Soon to see the Buddha of Limitless Light
And perfect Samantabhadra's Supreme Vows.

The supreme and endless blessings
of Samantabhadra's deeds,
I now universally transfer.
May every living being, drowning and adrift,
Soon return to the Pure Land of Limitless Light!

**✻ The Vows of Samantabhadra ✻**

I vow that when my life approaches its end,
All obstructions will be swept away;
I will see Amitabha Buddha,
And be born in His Western Pure Land of
Ultimate Bliss and Peace.

When reborn in the Western Pure Land,
I will perfect and completely fulfill
Without exception these Great Vows,
To delight and benefit all beings.

**✻ The Vows of Samantabhadra Avatamsaka Sutra ✻**

# NAME OF SPONSOR
## 助印功德主名錄

**Book Title：SRI LANKA PALI BUDDHA JAYANTI TRIPITAKA SERIES, Volume 15～Volume 28**

**書名：斯里蘭卡巴利文大藏經，第十五冊～第二十八冊**
**Book Serial No., 書號：SR215～SR228**

**N.T. Dollars：**

321,100：美國淨宗學會, AMITABHA BUDDHIST SOCIETY OF USA
1,206,373：財團法人佛陀教育基金會

**Amount：N.T. Dollars 1,527,473；Print 1,000 sets**
**以上合計，新台幣 1,527,473 元；恭印壹仟套。**

回向：天下和順，日月清明，風雨以時，災厲不起，國豐民安，兵戈無用，崇德興仁，務修禮讓，國無盜賊，無有怨枉，強不淩弱，各得其所。
祝願法界一切有情，所有六道四生，宿世冤親，現世業債，咸憑法力，悉得解脫。
祝願現生者增福延壽，發菩提心，常隨佛學，勤修精進，利濟群生。
祝願已故者往生淨土，同出苦輪，共登覺岸，直證阿鞞跋致，圓滿無上菩提。

**附記：本會接受善信委託，代印經書、佛像，其必要之費用，皆經本會審慎評估；若有結餘，均續作本會之印(購)經書及運費使用，為施主廣積陰德；此印經案所需金額龐大，分四批出版，由本會發起印贈，捐助款項若有不足，則由本會負擔其餘之經費。**

# DEDICATION OF MERIT

May the merit and virtue
accrued from this work
adorn Amitabha Buddha's Pure Land,
repay the four great kindnesses above,
and relieve the suffering of
those on the three paths below.
May those who see or hear of these efforts
generate Bodhi-mind,
spend their lives devoted to the Buddha Dharma,
and finally be reborn together in
the Land of Ultimate Bliss.

Homage to Amita Buddha!

**NAMO AMITABHA**

**南無阿彌陀佛**

《斯里蘭卡巴利文大藏經 第十九冊》

財團法人佛陀教育基金會 印贈
台北市杭州南路一段五十五號十一樓
Printed and donated for free distribution by
**The Corporate Body of the Buddha Educational Foundation**
11F., 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.
Tel: 886-2-23951198 , Fax: 886-2-23913415
Email: overseas@budaedu.org
Website: http://www.budaedu.org
**This book is strictly for free distribution, it is not for sale.**
**නොමිලයේ බෙදාදීම පිණිසයි.**
Printed in Taiwan
1,000 copies; June 2013
SR219 - 11247